
# සරසවි කුරුටු ගී

## සාහිත්‍යමය සහ සමාජ විද්‍යාත්මක විග්‍රහයක්



cepa
centre for poverty analysis

# සරසවි කුරුටු ගී

සාහිත්‍යමය සහ සමාජ විද්‍යාත්මක විග්‍රහයක්

නන්දන අජිත්
ප්‍රභාත් ජයසිංහ
ඩබ්ලිව්.ඒ. අබේසිංහ

දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයේ (CEPA) ප්‍රකාශනයකි
2016 අගෝස්තු

**Think Tank Initiative** අනුග්‍රහයෙනි

© දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය 2016
පළමු වන මුද්‍රණය - 2016

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලය - ප්‍රකාශනගත සූචිකරණ දත්ත

අජිත්, නන්දන

සරසවි කුරුටු ගී : සාහිත්‍යමය සහ සමාජ විද්‍යාත්මක විග්‍රහයක් / නන්දන අජිත්, ප්‍රභාත් ජයසිංහ සහ ඩබ්ලිව්.ඒ. අබේසිංහ - කොළඹ : දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය, 2016

පි. 115 ; සෙමී. 26

ISBN: 978-955-1040-94-9

I. 891.481 ඩිවි 23     II. ග්‍රන්ථ නාමය

III. ජයසිංහ, ප්‍රභාත්     IV. අබේසිංහ, ඩබ්ලිව්.ඒ

1. විශ්වවිද්‍යාල කවි, සිංහල
2. සිංහල පද්‍ය - සමාජ විද්‍යාත්මක දෘෂ්ටියෙන්

මෙම ප්‍රකාශනයේ ප්‍රකාශන හිමිකම දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය සතුය. මෙම පොතේ යම් කොටසක් ප්‍රතිනිෂ්පාදනය කරන්නේ නම් ඊට පෙර කතුවරයාගෙන් සහ ප්‍රකාශකයාගෙන් නිසි අවසරය ලබා ගත යුතු වේ.

CEPA ප්‍රකාශන මාලාව මේ වන විට අධ්‍යයනයන්ගෙන්, සංස්කරණය කරන ලද වෙළුම්වලින්, කාර්ය පත්‍රිකාවලින් හාසංක්ෂිප්ත ලියවිලිවලින් සමන්විත වේ. මෙම අධ්‍යයනයෙහි ලා ප්‍රකාශිත අර්ථ නිරූපණ හා නිගමන ඒ ඒ කතුවරයාගේ වන අතර, CEPA ආයතනයේ හෝ ප්‍රකාශන අනුග්‍රාහකයන්ගේ දැක්මවල් හෝ ප්‍රතිපත්ති නියෝජනය නො කරයි.

මෙම ප්‍රකාශනයෙහි ලා යොදා ගෙන ඇති ඡායාරූපවල අයිතිය CEPA කාර්ය මණ්ඩලය සතු ය.

ISBN: 978-955-1040-94-9

මෙම ප්‍රකාශනය පිළිබඳ සියලු විමසීම්
පහත සම්බන්ධතා වෙත යොමු කළ යුතු යः

**දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය**
29, ආර්.ජී. සේනානායක මාවත, කොළඹ 7, ශ්‍රී ලංකාව.
දුර : +94(011) 4690200, 2676955
විද්‍යුත් තැපෑල : info@cepa.lk
වෙබ් අඩවිය : www.cepa.lk

**නන්දන අජිත්** බාහිර කථිකාචාර්ය වරයෙකු, සමාජ පර්යේෂකයෙකු මෙන්ම භූගෝල විද්‍යා තොරතුරු (GIS) පිළිබඳ උපදේශකයෙකු වේ. ඔහු තම වෘත්තිමය ජීවිතය ආරම්භ කළේ කොළඹ විශ්වවිද්‍යාලයේ සහකාර කථිකාචාර්ය වරයෙක් වශයෙනි. කොළඹ විශ්වවිද්‍යාලයෙන් භූගෝල විද්‍යාව පිළිබඳව ගෞරව උපාධියක් ලබා ගත් ඔහු පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධිධාරියෙකි. තවද සම්පත් දායකයෙකු වශයෙන් මෙරට පර්යේෂණ ආයතන රැසකට සිය දායකත්වය ලබාදී ඇති ඔහු, වර්තමානයේ ආපදා කළමනාකරණ අමාත්‍යංශයට අනුබද්ධ ව්‍යාපෘතියක ජ්‍යේෂ්ඨ කළමනාකරු වශයෙන් කටයුතු කරණු ලබයි.

**ප්‍රභාත් ජයසිංහ** කොළඹ විශ්වවිද්‍යාලයේ, මූල්‍ය සහ කළමනාකරණ අංශයේ මහාචාර්ය වරයෙකි. ඊට අමතරව ඔහු විචාර පැසසුමට ලක්වූ කවියෙක් සහ කෙටි කතා රචකයෙකි. ඔහු කවි එකතුවක්, අඛ්‍යාන කාව්‍යක් සහ කෙටි කතා පොත් තුනක් ප්‍රකාශයට පත් කර ඇත.

**ඩබ්ලිව්. ඒ. අබේසිංහ** ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ ලේඛකයකු වේ. මෙරට විද්වත් පර්ෂදය විසින් හඳුනාගෙන ඇත්තේ කවියකු, ප්‍රබන්ධකරුවකු, පරිවර්තකයකු හා සාහිත්‍ය විචාරකයකු හැටියටය. මේ වන විට ඔහු විසින් ප්‍රකාශයට පත් කර ඇති ග්‍රන්ථ සංඛ්‍යාව, සියයක් පමණ වන ළමා සාහිත්‍යය නිර්මාණද ඇතුළුව, සංඛ්‍යාත්මක වශයෙන් තුන්සියයක් පමණ වෙයි. පළපුරුදු අධිනීතිඥවරයකුද වන හෙතෙම, රජයටද, පෞද්ගලික අංශයටද අයත් ආයතන කිහිපයකම ඉහළම විධායක තනතුරු හොබවා ඇත. දැනට ඔහු ජාතික පුස්තකාල සහ ප්‍රලේඛන සේවා මණ්ඩලයෙහි සභාපතිවරයාය.

**දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA)** යනු දරිද්‍රතාව ආශ්‍රිත සංවර්ධන ගැටලු පිළිබඳ වෘත්තීය පර්යේෂණ සේවා සම්පාදනය කරන ස්වාධීන ශ්‍රී ලාංකික විශේෂඥ සංවිධානයකි. CEPA ආයතනය 2011 අප්‍රේල් 24 දින 1982 අංක 17 දරණ ශ්‍රී ලංකා සමාගම් පණත යටතේ ඇප වීමෙන් සීමිත සමාගමක් ලෙස ලියාපදිංචි කර ඇති අතර, 2008 ජුලි 28 දින 2007 අංක 7 දරණ සමාගම් පණත යටතේ නැවත ලියාපදිංචි කර ඇත. CEPA ආයතනය යටිතල පහසුකම්, සංක්‍රමණය, පරිසරය, ගැටුම හා අවදානමට ලක් වීමට ඇති ඉඩකඩ යන CEPA තේමාත්මක ක්ෂේත්‍ර යටතේ පර්යේෂණය, උපදේශනය, ඇගයීම හා පුහුණුව ඇතුළු විවිධ සේවාදායක සේවා ගණනාවක් සම්පාදනය කරයි.

## ස්තුතිය

මෙම ප්‍රකාශනය එළි දුටුවේ බොහෝ දෙනාගේ දායකත්වයේ ප්‍රතිඵලයක් ලෙසය.

ප්‍රකාශනය සඳහා රචනා සැපයීමෙන් දායක වූ නන්දන අජිත්, ප්‍රභාත් ජයසිංහ සහ ඩබ්ලිව්. ඒ. අබේසිංහ හට ප්‍රථමයෙන් අපගේ ස්තුතිය.

තරමක් පර්යේෂණාත්මක වූ මෙම අධ්‍යනය සඳහා පසුබිම සැකසූ දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයේ හිටපු පර්යේෂක වෘතිකාවන් වන තිලක්ෂි ද සිල්වා හට සහ නේරංජනා ගුණතිලකට ද ස්තුතියි.

ප්‍රකාශනයේ "අවසානය" ලිවීමට දායක වූ සුනිල් ජයසේකරට ද ස්තුතියි.

නන් ආකාරයෙන් සහය දැක්වූ CEPA හී පර්යේෂක වෘතික අමිල බාලසූරිය හටද, පුස්තකාලාධිපතිනි චතුරංගා විරසේකරටද, ප්‍රකාශනය සංස්කරණය කළ ධනුක බංඩාරට හා ක්‍රිෂාන් සිරිවර්ධනට ද ස්තුතියි.

පිටකවරය සඳහා ජායාරූප www.sl-unlimited.com වෙබ්අඩවියෙන් උපුටා ගැනිණ.

අනුග්‍රහය **Think Tank Initiative**

## පෙරවදන

දරිද්‍රතාව නිරායාසයෙන් දැනෙන නමුත් විස්තර කිරීම, අවබෝධ කර ගැනීම හා අධ්‍යයනය කිරීම දුෂ්කර ය. දරිද්‍රතාව අධ්‍යයනය කිරීම සඳහා නොයෙක් පර්යේෂණ විධික්‍රම හා ප්‍රවිෂ්ටයන් යොදා ගෙන ඇති නමුත් දරිද්‍රතාව යනු කුමක් දැයි අප මුළුමනින් ම අවබෝධ කර ගෙන නැති බවට හැඟීමක් තවමත් පවතී. දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රයේ (CEPA) අදහස නම් නොයෙක් ආකාරයේ දැක්මවල් හා විධික්‍රම යොදා ගනිමින් දරිද්‍රතාව වෙත ප්‍රවිෂ්ට විය යුතු බව යි; එමගින් දරිද්‍රතාව හා එහි ක්‍රියාකාරිත්වය පිළිබඳව වඩාත් සම්පූර්ණ අදහසක් ගොඩ නැගිය යුතු බව යි. මෙම කැප වීම CEPA ආයතනයේ ප්‍රධාන පර්යේෂණ කටයුතුවලින් පිළිබිඹු වන නමුත් "නවෝත්පාදක අරමුදල" නමින් හැඳින්වෙන කාර්ය මණ්ඩලීය මුල පිරීම හරහා මෙය පැහැදිලිවම පෙනේ.

නවීකරණ අරමුදල නිර්මාණය කෙරුණේ CEPA ආයතනයේ වාර්ෂික සේවා ගාස්තුවලින් ප්‍රතිශතයක් ඒ සඳහා වෙන් කිරීමෙනි. මෙම අරමුදල දරිද්‍රතාවට විසඳුම් සොයන නව නිර්මාණාත්මක මුල පිරීම් තෝරා ගැනීමේ දීත්, ඒවාට සහාය දීමේ දීත්, ඒවා නිරීක්ෂණය කිරීමේ දීත් නොයෙක් පාර්ශ්වකරුවන් සමග එක්ව වැඩ කිරීමට CEPA ආයතනයට අවකාශයක් සම්පාදනය කරයි. පර්යේෂණාත්මක අධ්‍යයන, ක්‍රියාකාරකම් පිළිබඳ පර්යේෂණ, දැනුවත්කම ඉහළ නැංවීම හා ඉලක්කගත මැදිහත් වීම් යනාදි වශයෙන් යට කී මුල පිරීම් විවිධ ය. අරමුදල මේ වන විට 13න් වසරක් තිස්සේ ක්‍රියාත්මක අතර මේ දක්වා කාලය තුළ එවැනි නවීකරණයන් 41කට සහාය දී ඇත.

සරසවි කුරුටු ගී අධ්‍යයනය කිරීම පිළිබඳ අදහස අරමුදල හමුවේ ඉදිරිපත් කරන ලද්දේ 2008 දී ය. යෝජනාව වඩාත් යෝග්‍ය වීමට ප්‍රධාන හේතුව වූයේ අධ්‍යයනය කිරීමට යන දත්තවල - කුරුටු ගීවල - සුවිශේෂී ස්වභාවය යි. CEPA ආයතනය සිය පර්යේෂණවල දී කතන්දර, වැටහීම්, ඓතිහාසික කාල ප්‍රස්තාර සහ ඡායාරූපමය ප්‍රලේඛන වැනි විවිධාකාර දත්ත අත්හදා බලා ඇති නමුත් දත්ත ලෙස කුරුටු ගී (කවි) යොදා ගැනීම තරමක නව අදහසක් විය.

ප්‍රථමයෙන්, බොහෝ පර්යේෂණාත්මක අධ්‍යයනයන්හි දී මෙන් නො ව මෙහි දී දත්ත දැනටමත් පවතී. කුරුටු ගී නිර්මාණය කෙරුණේ සන්නිවේදන හා අදහස් ප්‍රකාශන ක්‍රමයක් ලෙස බව නිසැක වුව ද පර්යේෂණාත්මක අධ්‍යයනයක දත්ත ලෙස යොදා ගැනීමට රචනා කෙරුණේ හෝ අදහස් කෙරුණේ නැත. කිසිදු පර්යේෂකයෙක් ප්‍රශ්න හා සම්මුඛ සාකච්ඡා අත්පිටපත් සම්පාදනය නොකළේ ය. අධ්‍යයනයේ සංකල්පමය රාමුව සකස් කරන විටත් දත්ත සොයා ගෙන අවසන් කර තිබිණ. මෙය සැබවින් ම අලුත් යමක් වූ අතර සාමාන්‍යයෙන් පර්යේෂණාත්මක අධ්‍යයනයන් සිදු කෙරෙන ආකාරයට වෙනස් විය.

දෙවනුව, මෙම අධ්‍යයනයේ දී පර්යේෂකයා/දත්ත රැස් කරන්නා සහ දත්ත සම්පාදකයා අතර කිසිදු අන්‍යෝන්‍ය ක්‍රියාකාරිත්වයක් ඇති නො වේ. 'දත්ත සම්පාදකයා' වූයේ කුරුටු ගී රචකයා බැවින් නිශ්චිතව ම අදහස් හුවමාරුවක් සිදු වූ නමුත් පර්යේෂකයා එවැනි අදහස් හුවමාරුවක් සැලසුම් කළේ හෝ එවැන්නකට පහසුකම් සැපයුවේ නැත. පර්යේෂණ කණ්ඩායම හා දත්ත සම්පාදකයා - 'ප්‍රතිචාර දක්වන්නා' - කිසි විටෙක එකිනෙකා හමු නො විය හැකි ය. අධ්‍යයනය ඉදිරියට යද්දී බොහෝ සමාජ විද්‍යාත්මක පර්යේෂණවල මූලික පියවරක් වන ප්‍රතිචාර දක්වන්නන්ගේ මූලික ජන විද්‍යාත්මක තොරතුරු ඉදිරිපත් කිරීමක් පවා කළ නොහැකි බව පැහැදිලි විය. කුරුටු ගී හරහා පළ වන හැඟීම් හා අදහස් ලබා ගත්තේ වෙන යම් පුද්ගලයෙකුගේ මැදිහත් වීමෙන් නොවන බැවින් ඒවායේ කිසිදු 'පර්යේෂණාත්මක රාමු නැඹුරුවක්' නොපැවති අතර ප්‍රබල නිසග බවක් හා අව්‍යාජ බවක් ගැබ් වූයේ ය.

CEPA ආයතනයේ සහ අධ්‍යයන කණ්ඩායමේ අදහස වූයේ දරිද්‍රතා අධ්‍යයනයක් සඳහා පදනමක් ලෙස කුරුටු ගී යොදා ගැනීම ආශ්‍රිත මෙම සාධක ගුණාත්මක පර්යේෂණ විධික්‍රම ක්ෂේත්‍රය පුළුල් කිරීම හා නවීකරණය කිරීම සඳහා ප්‍රයෝජනවත් අවස්ථාවක් සම්පාදනය කළ බව යි. පර්යේෂණ දත්ත නැවුම් වුවත් සංකල්පමය රාමුවක් සකස් කර ගෙන හා විශ්ලේෂණය කිරීමට පෙර නියැදි තෝරා ගෙන සාහිත්‍යය පිළිබඳ අධ්‍යයනයක් කිරීමේ දී යොදා ගන්නා පොදුවේ පිළිගත් පර්යේෂණ පියවරයන් අනුගමනය කරමින් පර්යේෂණය සිදු කිරීමට අධ්‍යයන කණ්ඩායම පරිශ්‍රම දැරී ය. මෙම කටයුතු බොහෝ දුරට සාර්ථක වී ඇත. එම නිසා, ගුණාත්මක පර්යේෂණ විධික්‍රම ක්ෂේත්‍රය තුළ සංකල්ප හා මෙවලම් තව දුරටත් පුළුල් කිරීම හා අත්හදා බැලීම සඳහා මෙම අත්දැකීමෙන් පාඩම් ඉගෙනීමට තිබෙන ඉඩකඩ ඉමහත්ය.

දිවයින පුරා විශ්වවිද්‍යාලවලින් කුරුටු ගී එකතු කිරීමේ දී CEPA පර්යේෂකයන් අධ්‍යයන කණ්ඩායම සමග සමීප සම්බන්ධතාවකින් කටයුතු කළ හෙයින් මෙම පර්යේෂණාත්මක අධ්‍යයනය සහයෝගී පරිශ්‍රමයක් විය. විශේෂයෙන් ම විශ්ව විද්‍යාලීය නඩත්තු කටයුතුවල දී මෙම කුරුටු ගීවලින් බොහොමයක් ඒවා තිබෙන මුල් ස්ථානවලින් මකා දැමෙන නිසා මෙම අධ්‍යයන ක්‍රියාවලියේ දී රැස් කර ගත් කුරුටු ගී එකතුවේ සිත් ගන්නාසුලු බව හා පරිපූර්ණ බව හේතුවෙන් සම්පාදනය වන්නේ මාහැඟි ලේඛනයකි. මෙම වාර්තාවේ දී ඉදිරිපත් කෙරෙන විශ්ලේෂණය සඳහා යොදා ගන්නා ලද්දේ එම දත්ත කට්ටලයෙන් නියැදියක් පමණකි.

නව පන්නයේ අදහසක් අත්හදා බැලෙන විට අපේක්ෂා කළ හැකි පරිදි ම බොහෝ දුෂ්කරතාවන්ට හා අභියෝගයන්ට මුහුණ දීමට සිදු විය. ඉන් සමහරක් ජය ගත හැකි වූ අතර සමහරක් ජය ගත නොහැකි විය. එසේ වුවත්, ඉන් ලද ප්‍රතිඵලය ගුණාත්මක පර්යේෂණ විධික්‍රම පුළුල් කිරීම සඳහා කෙටි කාලීනව නමුත් ධෛර්ය සම්පන්නව දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA) ලද නවීකාරක ප්‍රයත්නයකැයි ද,

එමගින් දරිද්‍රතාව හා බැඳි විවිධ දැක්මවල් පිළිබඳව මෙන් ම (දත්ත සපයා ගත් මොහොත වන විට ආදායම අතින් දුප්පතුන් විය හැකි වුවත් නො වුවත්, අනාගතයේ දී ඉහළට නැග ගැනීමේ අපේක්ෂාවන් සහ ඒ සඳහා මනා හැකියාවන් සහිත වුවත්) සුවිශේෂ පුද්ගලයන් කණ්ඩායමක් විසින් අත්දකින ලද දරිද්‍රතාවේ විවිධ පැතිකඩවල් පිළිබඳව තියුණු අවබෝධයක් සම්පාදනය වෙති යි ද අපි විශ්වාස කරමු. මෙම අධ්‍යයන වාර්තාව මෙම පොහොසත් පර්යේෂණ ක්ෂේත්‍රය තව දුරටත් ගවේෂණය කර බැලීමට තවත් අය දිරි ගන්වනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු.

සාහිත්‍ය විශ්ලේෂණයේ දෘෂ්ටි කෝණයෙන් ද දරිද්‍රතාව විශ්ලේෂණය කිරීම සඳහා එවැනි දත්ත යොදා ගැනීමේ ක්‍රමවේදාත්මක දෘෂ්ටි කෝණයකින් ද රචිත ලිපි දෙකක් සම්පාදනය කර දුන් මහාචාර්ය ප්‍රභාත් ජයසිංහට සහ ආචාර්ය ඩබ්ලිව්.ඒ. අබේසිංහට ද CEPA ආයතනය කෘතඥතාව පළ කර සිටී. මෙම වාර්තාවේ ඇතුළත් පරිච්ඡේද සමාජ විද්‍යාත්මක පර්යේෂණ විධික්‍රම සම්බන්ධයෙන් මෙන් ම අදහස් හුවමාරු ක්‍රමයක් ලෙස කුරුටු ගී යොදා ගැනීම පිළිබඳව ද අපගේ අවබෝධය තව දුරටත් පුළුල් කළේ ය. එම අවබෝධය තව දුර පර්යේෂණ සඳහා තවත් මාවත් විවර කරන අතර මෙම අධ්‍යයනය ඉමහත් ලෙස පෝෂණය කර ඇතැයි අපි විශ්වාස කරමු.

අවසන් වශයෙන්, පළ කළ ධෛර්යය හා උනන්දුව පර්යේෂණාත්මක අදහසකට උර දීම හා මුහුණ දුන් අනල්ප අභියෝග හා දුෂ්කරතාවන් නො තකා අවසානය දක්වා නොපසුබටව මෙම කාර්යය ඉටු කිරීම ද සම්බන්ධයෙන් අධ්‍යයන කණ්ඩායමට ප්‍රශංසාව පුද කිරීමට අපි කැමැත්තෙමු. ඔවුන්ගේ පරිශ්‍රමය අප සමාජය තුළ පවත්නා දරිද්‍රතාව බඳු චිරස්ථායී වූ සමාජ සංසිද්ධීන් විශ්ලේෂණය කිරීම හා අවබෝධ කර ගැනීම සඳහා වෙනස් හා නිර්මාණශීලී ක්‍රම සොයා යාමට අඩු ගණනේ සිතා බැලීම පිණිස වත් අන් අයට අභියෝගයක් හා ජවයක් සම්පාදනය කරති යි අපි අපේක්ෂා කරමු.

**නිලක්ෂි ද සිල්වා සහ නෙරංජලා ගුණතිලක විසිනි.**

## පටුන

දරිද්‍රතාව සහ විශ්වවිද්‍යාල ජීවිතය: සරසවි කුරුටු ගී
ආශ්‍රයෙන් මතු කර ගත හැකි ලක්ෂණ සමහරක්
**ප්‍රභාත් ජයසිංහ** ............................................................................................ 01

සරසවි කුරුටු ගී - කාව්‍යමය විමර්ශනයක්
**ආචාර්ය ඩබ්ලියු. ඒ. අබේසිංහ** ............................................................................. 33

කුරුටු ගීවල සමාජ වැදගත්කම
**නන්දන අජිත් සහ ඒ. එම්. අබේරත්න** ..................................................................... 48

අවසානය ............................................................................................................. 89

ඇමුණුම - අධ්‍යයනය සඳහා රැස්කළ කුරුටු ගී එකතුව ....................................... 93

# දරිද්‍රතාව සහ විශ්වවිද්‍යාල ජීවිතයෘ සරසවි කුරුටු ගී ආශ්‍රයෙන් මතු කර ගත හැකි ලක්ෂණ සමහරක්

ප්‍රභාත් ජයසිංහ

## I. සාකච්ඡාමය ප්‍රවේශයක්

කුරුටු ගී යනුවෙන් හැඳින්වුන ද, සරසවි කුරුටු ගී යනු නිර්මාණ විශේෂයක්ම නොවේ. කුරුටු ගී අතර අතිශයින් නිර්මාණශීලී ඒවා තිබිය හැකි වුවත්, ඉතා ඍජු අදහස් ප්‍රකාශ කිරීම් ද ඒවා අතර සුලභව දැකිය හැක.

මේ ලිපියේ අරමුණ කිසියම් විශාල සරසවි කුරුටු ගී සමුච්චයකින් තෝරා ගැනුණු ගී එකතුවක් ආශ්‍රයෙන් දරිද්‍රතාවය හේතු කොට ගෙන ශ්‍රී ලාංකීය විශ්වවිද්‍යාල ජීවිතයේ ප්‍රකට වන ලක්ෂණ සමහරක් මතු කර ගැනීමයි. කුරුටු ගී සම්බන්ධ එවැනි අධ්‍යයනයක දී ආරම්භයේ දී ම නිරවුල් කර ගත යුතු කාරණා කීපයක් පහතින් දැක්වේ.

1. කුරුටු ගීවලින් ප්‍රකාශිත දේ කර්තෘගේ නිර්ව්‍යාජ අදහස් ලෙස සැලකිය හැකි ද?
2. කුරුටු ගීවල කර්තෘ හැම විටම අඥාත ද?
3. කුරුටු ගීවලින් යමක් විස්තර කෙරෙනුයේ ඇති සැටියෙන්ම ද?

ලිපියේ මේ කොටස සමන්විත වන්නේ අදාළ අරමුණ ඉටු කර ගැනීමේ දී අවශ්‍ය ආස්ථානයක් නිර්මාණය කර ගැනීම සඳහා ඉහත දැක්වෙන ප්‍රථම ප්‍රශ්න දෙකට පිළිතුරු දීම ආශ්‍රයෙන් කෙරෙන කෙටි සාකච්ඡාවකිනි.

කුරුටු ගීයක් පිළිබඳ සරල නිදසුනකින් පටන් ගනිමු. එය දරිද්‍රතාව යන තේමාව යටතේ ලියැවුණු එකක් නොවූව ද, මේ සාකච්ඡාව සඳහා එය ඉතා හොඳ ආරම්භයක් ලබා දෙයි. ඒ, 1988-89 භීෂණ යුගයට පසුව ගෙවෙමින් පැවැති අනූව දශකයේ මුල් භාගයයි. ජනාධිපති ප්‍රේමදාස අනාථ දරුවන්ට කැපකරු මාපිය ක්‍රමය හඳුන්වා දුන්නේ ඒ කාලයේ දීය. මේ පසුබිම යටතේ අප අතර සිටි එක් ශිෂ්‍යයෙක් කොළඹ විශ්වවිද්‍යාලයේ (එකල) දොඹ ගහ යට කුඩා කැන්ටිමේ පිට බිත්තියක අඟුරු කෑල්ලකින් පහත දැක්වෙන කෙටි කවිය ලීවේය ෘ

මාපියා<br>
කල්ලියෙන්<br>
මා පියා<br>
ගෙන ගියා<br>
මා පියා<br>
නැති කලට<br>
කුමට<br>
කැප කරු පියා

මා දන්නා තරමින් අපේ මිත්‍රයාගේ පියා පැහැර ගැනීමකට භාජනය වී සිටියේ නැත. එහෙත් ඒ කාලයේ සිදු වූ එක් සංසිද්ධියක් මේ කවියෙන් හොඳින් නිරූපිතය.

සමකාලීන ශිෂ්‍යයන්ට මේ කුරුටු ගීයේ කර්තෘ අඥාත වූයේ නැත. ඒ කවිය බොහෝ දෙනෙකුගේ පැසසුමට ලක් වූ අතර කවිය ලියූ ශිෂ්‍යයාට එය කිසියම් ආශ්වාදජනක අත්දැකීමක් වූවාට සැක නැත. එසේ වුව ද, අවුරුදු ගණනාවකට පසුව දත්ත එකතු කරන්නෙක් මේ කවිය පිටපත් කොට පර්යේෂකයෙකුට දුන්නා නම්, ඒ දෙදෙනාටම මේ කවියේ කර්තෘ අඥාත විය හැකිය. මේ අනුව, කුරුටු ගීවල කර්තෘ අඥාත යැයි කියන ජනප්‍රිය මතය ප්‍රශ්න කළ හැකිය. මෙහි දී කර්තෘ අඥාත වන්නේ දත්ත එකතු කරන්නාට සහ පර්යේෂකයාටය. නමුත් කර්තෘගේ සමකාලීනයන්ට කර්තෘ අඥාත නොවිය හැකිය.

එමෙන්ම, එම කුරුටු ගීයේ පළමු පේළියේ එන මාපියා යන යෙදුම බලන්න. මාෆියා වෙනුවට මාපියා යොදා ගත්තේ ඇයි? මේ සඳහා පිළිතුරු කීපයක් තිබිය හැකිය.

1. අනෙක් පේළිවලත් මාපියා යන්න වෙනස් අරුතකින් යෙදෙන නිසා පද විජ්ජාවකට කර්තෘ තුළ ඇති කැමැත්ත.
2. කථකයාගේ (කර්තෘගේ නොවේ) සමාජ වටපිටාව නිරූපණය කිරීමට.
3. කර්තෘ මාෆියා යන වචනය ශබ්ද කරන්නට පුරුදු වී සිටින්නේ ද මාපියා ලෙස වීම.
4. හුදු වැරදීමක්.

මේ අතුරින් කවර හේතුවක් නිසා එම පදය යොදා ගත්තේ ද යන්නට නිශ්චිත උත්තරක් දීම සඳහා යමෙක් කර්තෘ ගැන පෞද්ගලිකව දැන සිටිය යුතුය. සමහර විට ඔහු හෝ ඇය සමඟ කතා කළ යුතුය. ඒ ආකාරයටම මෙම කුරුටු ගීයේ එන ''කැපකරු පියා'' යන්න තේරුම් ගැනීමට අඩු තරමින් කැපකරු මාපිය ක්‍රමය ගැන අසා තිබිය යුතුය.

මේ අනුව පෙනී යන්නේ කුරුටු ගීයක අරුත් හරිහැටි පාදා ගැනීමට නම් එය බිහි වූ සන්දර්භය ගැන දැනීමක් තිබිය යුතු බවයි. මේ සන්දර්භය ගැන දැන ගැනීමේ එක් කොටසක් ප්‍රකාශිත ඉතිහාසය හැදෑරීමෙන් ඉටු කර ගත හැකිය. නිදසුනක් ලෙස කැපකරු මාපිය ක්‍රමය යනු කුමක්ද යන්න ලිපි ලේඛන ආශ්‍රයෙන් සොයා ගැනීමට යමෙකුට ගත වනු ඇත්තේ විනාඩි ගණනකි. නමුත් පළමු පේළියේ එන මාපියා පදය යෙදුවේ ඇයි ද යන්න ප්‍රශ්නයට පිළිතුරු දීමට අවශ්‍ය සන්දර්භය පිළිබඳ දැනුම එසේ ලබා ගත නොහැකිය. සරසවි කුරුටු ගීවල රචකයා මෙන්ම, බොහෝ කුරුටු ගීවලට හේතු වූ කාරණා ඒ කුඩා ප්‍රජාවෙන් එළියට දැන ගන්නට ලැබෙන්නේ කලාතුරකිනි. ඒ දැනුම කාලයත් සමඟ ඉදිරියට නොනැසී පවත්නේ ඊටත් වඩා අඩුවෙනි.

මේ ලිපියේ අරමුණ අනුව කළ යුතු කාර්යය කුරුටු ගී පිළිබඳ සාහිත්‍ය විචාරයකින් වෙනස් වෙයි. පුළුල්ව ගතහොත්, සාහිත්‍ය විචාරයක දී කෙරෙනුයේ අදාළ ප්‍රස්තුතය නිර්මාණය තුළ කොතරම් හොඳින් සාර්ථකව ප්‍රතිනිර්මාණය වී ඇත්ද යන්න සොයා බැලීමයි. එහි දී නිර්මාණය පාදක වන්නේ කර්තෘගේම අත්දැකීම් මත ද යන්නත්, නිර්මාණයෙන් ප්‍රකාශිත අදහස් අදාළ ප්‍රස්තුතය ගැන කර්තෘගේ නිර්ව්‍යාජ අදහස් ද යන්නත් එතරම් වැදගත් නොවේ. මේ සන්දර්භයට අදාළ නිදසුනක් ගතහොත්, දරිද්‍රතාව තේමාව කර ගත් නිර්මාණයක් කිරීමට කර්තෘ දිළින්දෙක්ම විය යුතු නැත. එමෙන්ම නිර්මාණයෙන් පිළිබිඹු වන අදහස් කර්තෘගේ පෞද්ගලික අදහස්ම විය යුතු නැත.

එසේ වුව ද, සරසවි කුරුටු ගී එකතුවක් ආශ්‍රයෙන් ඒවා ලියනු ලැබූ සරසවි ශිෂ්‍ය ප්‍රජාවගේ ජීවිතවල දරිද්‍රතාව නිසා ප්‍රකට වන ලක්ෂණ සමහරක් මතු කර ගැනීමේ උත්සාහයක දී ඒ අත්දැකීම් කර්තෘගේම වන්නේ ද යන්නත්, ඒ ප්‍රකාශිත අදහස් ඔහුගේ හෝ ඇයගේ නිර්ව්‍යාජ අදහස් ද යන්නත් සාහිත්‍ය විචාරයක දී ඒ කරුණු වැදගත් වෙනවාට වඩා වැඩි ප්‍රමාණයකට වැදගත් වෙයි.

සරසවි කුරුටු ගී විවිධ හේතු නිසා ලියැවිය හැකිය. මේ ලිපිය සඳහා කුරුටු ගී තෝරා ගැනුණු ගී සමුච්චය දෙස බලන විට ඒවා පහත දැක්වෙන අවස්ථාවලින් එකක් හෝ කීපයක් යටතේ ලියැවී ඇතැයි යෝජනා කළ හැකිය.

1. ස්වකීය අදහස් ඍජුව අන් අයෙකුට ප්‍රකාශ කිරීමේ නොහැකියාව හෝ ඊට ඇති නොකැමැත්ත තිබුණත් එය ප්‍රකාශ කිරීමේ අවශ්‍යතාව නිසා කිසියම් තැනක ලියැවුණු කුරුටු ගී ඇත. බොහෝ විට කලකිරීම්, කෝපය, නැති බැරිකම්, දුරක සිට ආදරය පළ කිරීම්, විවිධ දුෂ්කරතා සහ අසභ්‍ය හෝ අසම්මත අදහස් ආදිය මේ ආකාරයට ප්‍රකාශ කළ හැකිය. අරමුණේ ස්වභාවය අනුවම, මේ නිර්මාණ නිර්නාමික වෙයි. මේ නිර්නාමික බව කුරුටු ගී දත්ත එකතු කරන්නන්ට හා පර්යේෂකයන්ට පමණක් නොව කර්තෘගේ සමකාලීනයන්ට ද අදාළ වෙයි. මෙබඳු ගී බොහෝ විට කර්තෘගේ අත්දැකීම් මතම පාදක විය හැකි අතර, එහි එන අදහස් කර්තෘගේ නිර්ව්‍යාජ අදහස්ම වීමට ඉතා ඉහළ සම්භාවිතාවක් පවතී.

2. අදහසක් ප්‍රකාශ කිරීමේ උවමනාව ඇතත් එය ඍජුව අදාළ පාර්ශ්වයට සන්නිවේදනය කිරීමට ඇති නොකැමැත්ත හෝ අපහසුව නිසා එය කිසියම් තැනක ලියා තැබීම මගින් සන්නිවේදනය කිරීමට තැත් කිරීමේ අවස්ථා කුරුටු ගී අතර ඇත. බොහෝ විට ඒවාට පිළිතුරු ද ඒ ආකාරයෙන්ම ලැබිය හැකිය. නිදසුනක් ලෙස, ආදර සම්බන්ධයක් ආරම්භ වීම මේ ආකාරයට සිදු වීමට ඉඩ තිබේ. එමෙන්ම, තම පණ්ඩිතමානී බව, තමා දුක් විඳිමින් සිටින බව හෝ

වෙනත් ඕනෑම දෙයක් වක්‍රව අන් අයට සන්නිවේදනය කිරීමට මේ මාර්ගය යොදා ගැනීමට හැක. මෙහි දී දත්ත එකතු කරන්නන්ට, පර්යේෂකයන්ට මෙන්ම සමහර සමකාලීනයන්ට කර්තෘ අඥාත වුව ද අදාළ පාර්ශවයට කර්තෘ අඥාත නැත. ඒ නිසාම, මෙබඳු කුරුටු ගීවල කර්තෘගේ අදහස් ප්‍රකාශ කිරීම් කොතරම් දුරට නිර්ව්‍යාජදැයි සැක සහිතය.

3. කුරුටු ගී යනුවෙන් ශානරයක් ඇතැයි සිතුවහොත්, ඒ ශානරය තුළ නිර්මාණකරණයේ යෙදෙන්නන් අතින් බිහිවන කුරුටු ගී දැකිය හැක. මෙහි දී සමකාලීනයන්ට ඇතැම් විටක කර්තෘ නිර්නාමික වුව ද, එසේ නොවන අවස්ථාවන් තිබිය හැක. (ඉහතින් දැක්වුණු කුරුටු ගීය මීට නිදසුනකි) එමෙන්ම, අදාළ නිර්මාණය කර්තෘගේම අත්දැකීම් මත පාදක වේද යන්නත්, ඉන් ප්‍රකාශිත අදහස් කර්තෘගේම නිර්ව්‍යාජ අදහස් ද යන්නත් ගැන සහතිකයක් නැත. සමහර විට එසේ නොවිය හැකිය.

4. කිසිදු පූර්ව නිශ්චිත හැඟීමකින් තොරව තමා සිටින තැන සොයාගත හැකි බිත්තියක් හෝ මේසයක් මත යමෙක් යමක් කුරුටු ගෑ හැකිය. එය ඒ මොහොතේ ඔහුගේ හෝ ඇයගේ මනසට ක්ෂණිකව එන අදහසක් නිසා සිදුවන්නකි. එය සමහර විට ඒ මොහොතේ ශ්‍රවණය වන යමක් විය හැකිය. ප්‍රසිද්ධ ගීයක හෝ කවියක බන්ධයක් එසේ සටහන් විය හැක. ස්වකීය අදහසක් වුව එසේ සටහන් තැබෙන අවස්ථා තිබේ. එබඳු අවස්ථාවක දී ඒවා තම අත්දැකීම් මත පාදක විය හැකි අතර ඒවා තමාගේම නිර්ව්‍යාජ අදහස් දැක්වීමක් ද විය හැකිය. මේ වර්ගයේ කුරුටු ගීවල ද කර්තෘ සමකාලීනයන්ට අඥාත වීමට හෝ නොවීමට ඉඩ ඇත. බොහෝ විට එය තීරණය වන්නේ ලියැවෙන්නේ කවරක් ද යන්න සහ එය සිදු වන්නේ කෙබඳු වටපිටාවක ද යන්න මතය.

5. බිත්ති පුවත්පත්වල ප්‍රදර්ශනය වූ නිර්මාණ ද මේ කුරුටු ගී සමුච්චයෙහි තිබේ. ඒවා එම ශානරය තුළ කෙරුණු නිර්මාණය. කර්තෘගේ නමින්, කිසියම් මාතෘකාවක් යටතේ පළ වන, සාපේක්ෂව දිගු කවි වන මේවා සම්මත අර්ථයෙන් කොයිතරම් දුරට කුරුටු ගී ගණයට අයත් වේද යන්න ප්‍රශ්න කළ හැකිය. ඒ නිසාම මේ වර්ගයට අයත් වන 'කුරුටු ගී' මේ ලිපියේ කෙරෙන විමසුම සඳහා සලකා බැලෙන්නේ නැත.

කිසියම් වර්ගීකරණයක අවශ්‍යතාව නිසා යෝජනා කෙරුණ ද, මෙහි අඩුපාඩු පවතී. මූලික වශයෙන්ම, මේ එක් එක් කාණ්ඩය මුළුමනින්ම අන්‍යෝන්‍ය වශයෙන් බහිෂ්කාර නැත. නිදසුනක් ලෙස 1 හා 4 මෙන්ම, 1 හා 3 ද සමපාත විය හැක. ඒ අන්දමටම 2 හා 3 ද සමපාත වීමේ හැකියාවක් පවතී.

මේ කෙටි සාකච්ඡාව පාදක කොට ගෙන මෙහි දී මතු කළ යුතු මූලික කාරණය වන්නේ මේ ලිපියේ ඉදිරි කොටස්වල දී මතු කරගනු ලබන බොහොමයක් කරුණු විශාල වශයෙන් අනුමාන මත ගොඩනැගෙන ඒවාය යන්නයි. ඒ සඳහා හේතු කීපයක් දැක්විය හැක.

1. කිසියම් කුරුටු ගීයක එන අදහස් කර්තෘගේ නිර්ව්‍යාජ අදහස්ම දැයි යන්න සම්බන්ධයෙන් සහතිකයක් නොමැති වීම. නිදසුනක් ලෙස, අදාළ කුරුටු ගීය ඉහත වර්ගීකරණයේ 1 සිට 4 දක්වා කාණ්ඩවලින් කුමකට අයත් වේදැයි නිශ්චිතව පැවසීම දුෂ්කරය.

2. එක් එක් කුරුටු ගීය ලියැවී ඇත්තේ කුමන සන්දර්භයක් යටතේ ද යන්න ගැන නිශ්චිත අදහසක් එම ගීය කියවීමෙන් පමණක් ලබා ගත නොහැකි වීම. බොහෝ කුරුටු ගී හා සම්බන්ධ පසුබිම් කරුණු පිළිබඳ දැනුම අදාළ කුඩා ප්‍රජාවට සීමා වන අතර එය කාලය සමඟ ඉදිරියට ගෙන යෑම සහතික කෙරෙන යාන්ත්‍රණයක් නොමැත.

3. බොහොමයක් කුරුටු ගීවල තත්ත්වය අතිශයෝක්තියෙන් ප්‍රකාශිත වීම. විශ්වවිද්‍යාල ආපන ශාලාවක ආහාර පානවල ස්වභාවය කියන පහත කුරුටු ගීය ඊට හොඳ නිදසුනක් සපයයි.

බත් ඇටවලට වැඩියෙන් ගල් අහුවෙනවා
පලා මැල්ලුමේ පණුවන් දඟලනවා
පරිප්පු හොද්දේ ඇට හොයලා පීනනවා
කැන්ටින් බත කද්දි අම්මා සිහි වෙනවා

## II. තේමාවට අදාළ කුරුටු ගී තෝරා ගැනීමේ දී මතුවන දුෂ්කරතාවක්

මේ ග්‍රන්ථයේ එන ප්‍රධාන විමර්ශනයට කුරුටු ගී ලබාගෙන ඇත්තේ දෙවන උප ග්‍රන්ථයේ එන දහස් ගණනක ගී සමුච්චයකින් ලබා ගත් කුරුටු ගී 674ක නියැදියකිනි. එසේ වුව ද, මේ ලිපිය සඳහා දරිද්‍රතාව නමැති තේමාවට සම්බන්ධ ගී එකසිය විස්සක් පමණ තෝරා ගැනුණේ දෙවන උප ග්‍රන්ථයේ එන සමස්ත කුරුටු ගී සමුච්චය ඇසුරෙනි. එහි දී පැන නැගුණු ප්‍රධාන දුෂ්කරතාව වූයේ දරිද්‍රතාව නමැති තේමාව පිළිබිඹු වන කුරුටු ගී තෝරා ගැනීමේ දී ය.

හුදෙක් කුසගින්න, දිළිඳුකම, කඳුළු, අසරණකම ආදී වචන නොමැති නිසාම කිසියම් කුරුටු ගීයක් දරිද්‍රතාව පිළිබඳ අදහස් පිළිබිඹු නොවන එකක් ලෙස සලකා ඉවත දැමිය නොහැකිය. මේ ගී සමුච්චය අතුරින්ම තෝරා ගන්නා ලද පහත නිදසුන ආශ්‍රයෙන් මේ කරුණ පැහැදිලි කළ හැකිය.

හැම පාට කුඩ අතර
මම කළු කුඩයක්

(කැලණිය)

මේ කෙටි කුරුටු ගීය විවිධ අර්ථ නැගෙන පරිදි කියවිය හැකිය. අන්‍යයන් අතර මම සරල පුද්ගලයෙක්, අල්පේච්ඡ පුද්ගලයෙක්, අවලක්ෂණ පුද්ගලයෙක්, එතරම් කැපී නොපෙනෙන පුද්ගලයෙක් ආදී වශයෙනි. එමෙන්ම, අන්‍යයන් අතර මම අතමිට හිඟ පුද්ගලයෙක්ය යන අදහසක් ඉන් ගම්‍ය වේ යැයි යමෙක් යෝජනා කළහොත්, එය පහසුවෙන් ප්‍රතික්ෂේප කළ නොහැකිය.

මේ ගී සමුච්චය අතරින් ලබා ගන්නා ලද පහත කුරුටු ගීය ද එබඳුය.

ඉගිල්ලෙන්න කාක්කන්ට අයිතියක් ඇත
අහස උඩින්
අහස අපේ නොවන හින්ද
ඒත් අපේ හිස මුදුනේ
කුඩු තනන්න
බිජු දමන්න
අයිතිය නැත කාක්කන්ට
ඔලුව තාම අපේ හින්ද

(කැලණිය)

මෙය සමහර විට එක් ශිෂ්‍ය සංවිධානයක් තවත් ශිෂ්‍ය සංවිධානයකට එරෙහිව නගන චෝදනාවක් විය හැක. නිදසුනක් ලෙස, ප්‍රතිවාදියා තම මතවාද විවේචනය කිරීම ඉවසිය යුතු වුවත්, ප්‍රතිවාදියා විසින් කරනු ලබන පෞද්ගලික චරිත ඝාතන හෝ එබඳු වෙනත් තාඩන පීඩන ඉවසිය යුතු නැතිය යන්න ඉන් අදහස් වේ යැයි යමෙකුට කිව හැකිය. එමෙන්ම මෙය ආර්ථික වශයෙන් පීඩිත ශිෂ්‍ය සමූහයක් විසින් එසේ නොවන ශිෂ්‍ය සමූහයක් වෙත හෝ විශ්වවිද්‍යාල පරිපාලනය වෙත හෝ පවතින ආණ්ඩුව වෙත එල්ල කෙරෙන විරෝධාකල්ප ගීයක් ලෙස ද ගත හැකිය.

## III. දරිද්‍රතාව සහ විශ්වවිද්‍යාල ජීවිතය ගැන කුරුටු ගී ආශ්‍රයෙන් මතු කර ගත හැකි වූ කරුණු මැදින් ලියූ නිගමනාත්මක සටහන්

ශිෂ්‍යයින්ගේ විශ්වවිද්‍යාල ජීවිතයට දරිද්‍රතාව දෙයාකාරයකින් බලපානු දැකිය හැක. එකක් වක්‍රවය. ඒ අනුව, දරිද්‍රතාව නිසා විශ්වවිද්‍යාලවල මූලික පහසුකම්වල සහ අධ්‍යයන ප්‍රමිතීන්ගේ නොයෙකුත් අඩුපාඩු දක්නට ලැබේ. මේ අඩුපාඩු ශිෂ්‍යයන්ගේ අධ්‍යයන කටයුතු සහ ආහාර, නවාතැන් ආදී විශ්වවිද්‍යාල ජීවිතය හා සම්බන්ධ

එදිනෙදා කටයුතු කෙරෙහි සෘණාත්මක බලපෑමක් එල්ල කරයි. ඊට අමතරව, දරිද්‍රතාව ශිෂ්‍යයන්ගේ අධ්‍යයන කටයුතු හා විශ්වවිද්‍යාල ජීවිතය හා සම්බන්ධ එදිනෙදා කටයුතු කෙරෙහි ඍජුව ද බලපෑමක් එල්ල කරයි. මේ දෙආකාරයේම බලපෑම් යටතේ මතු කර ගන්නා ලද කරුණු ගණනාවකි. විශ්වවිද්‍යාලවල මූලික පහසුකම්වල ඌනතාවය, අනුබද්ධ විශ්වවිද්‍යාල ලෙස තිබී පසු කලෙක විශ්වවිද්‍යාල බවට පරිවර්තනය කරන ලද ආයතනවල පැවති අඩුපාඩු, ශිෂ්‍යයින්ගේ අඩු ඉංග්‍රීසි දැනුම සහ ඉන් ඇති වන කලකිරීම, ශිෂ්‍යයින්ගේ අධ්‍යයන කටයුතු අඩාල වීම, ඒ නිසාම රැකියාවක් සොයා ගැනීම පිළිබඳව සිසුන් අතර ඇති අවිනිශ්චිතතාවය, ශිෂ්‍යයින්ගේ විශ්වවිද්‍යාල ජීවිතයේ දැකිය හැකි දුක්ඛිත බව ආදිය ඒවා අතර වෙයි.

මේ බලපෑම්වලට විශ්වවිද්‍යාල ශිෂ්‍යයා පෙරලා ප්‍රතිචාර දක්වනු පෙනේ. කුරුටු ගී අතරින් සොයා ගත හැකි සාක්ෂි අනුව, එබඳු ප්‍රතිචාර තෙයාකාරය. පළමුවැන්න විරෝධය දැක්වීමයි. මෙය හුදෙක් පුද්ගලිකව සිතේ හට ගන්නා කෝපයක සිට සාමූහික විරෝධය පෑමක් දක්වා පරාසයක විහිදෙනු පෙනේ. දෙවනුව, සමහර ශිෂ්‍යයන් දරිද්‍රතාවය නිසා එල්ල වන සමහර බලපෑම් උපේක්ෂාවෙන් හෝ විනෝදයෙන් භාර ගන්නා බවත්, එබඳු බලපෑම් විශ්වවිද්‍යාල ජීවිතයේම කොටසක් ලෙස සලකන බවත් පෙනීයයි. තෙවනුව, සමහර ශිෂ්‍යයන් දරිද්‍රතාවය නිසා ඇති වන බලපෑම් හමුවේ නොසැලී අධ්‍යයන කටයුතු අඛණ්ඩව පවත්වා ගනිමින් අධිෂ්ඨානශීලීව සිටිනු දැකිය හැක.

මීට අමතරව ශිෂ්‍යයන් සහ ඔවුන්ගේ පවුල් අතර සබඳතාවලත්, ඔවුනොවුන් අතර ගොඩනැගෙන ආදර සම්බන්ධතාවලත් දරිද්‍රතාවයේ පිළිබිඹුව සටහන් වී ඇති බවට කුරුටු ගී ඇසුරෙන් සාක්ෂි සොයා ගත හැකිය.

ලිපියේ IV සහ V කොටස්වලින් මේ කරුණු සනිදර්ශනාත්මකව තහවුරු කෙරෙයි.

## IV. දරිද්‍රතාව, විශ්වවිද්‍යාල සහ ශිෂ්‍යයින්ගේ විශ්වවිද්‍යාල ජීවිතය

මේ යටතේ මූලික වශයෙන් දෙයාකාරයක කරුණු මතු කර ගත හැකිය. ඉන් පළමුවැන්න දරිද්‍රතාව විශ්වවිද්‍යාලවල මූලික පහසුකම් වෙත කර ඇති බලපෑම ශිෂ්‍යයන්ට දැනෙන ආකාරය සහ ශිෂ්‍යයන් ඊට ප්‍රතිචාර දක්වන්නේ කෙසේද යන්නයි. දෙවැන්න, දරිද්‍රතාව ශිෂ්‍යයන්ගේ විශ්වවිද්‍යාල ජීවිතයට ඍජුවම ඇති කරන බලපෑම සහ ඔවුන් ඒ කෙරෙහි පෙරලා ප්‍රතිචාර දක්වන්නේ කෙසේද යන්නයි. කෙසේ නමුත් මේ කාරණා දෙක උප තේමාවන් දෙකක් යටතේ වෙන් නොකර සාකච්ඡා කෙරෙනුයේ ඒ දෙක ඉරක් ගසා පහසුවෙන් වෙන් කළ නොහැකි ලෙස එකිනෙක හා මිශ්‍ර වී තිබීම නිසාය.

''කැම්පස් කැන්ටිමේ තොරතුරු සෝබරය''

විශ්වවිද්‍යාලවල ආපන ශාලාවල තත්ත්වය, ඒවායේ අලෙවි කෙරෙන ආහාරපානවල ප්‍රමිතිය, නේවාසිකාගාරවල මූලික පහසුකම්වත් නොමැති වීම, අවශ්‍ය ප්‍රමාණයට සාපේක්ෂව නේවාසිකාගාර පහසුකම්වල ඇති හිඟකම, ඒ නිසා ඒවායේ ඇති තදබදය සහ පිටස්තර අඩු පහසුකම් නවාතැන්වල නැවතීමට සිදු වීම, ඒවායේ දුක්ඛිත තත්ත්වය, මැසි මදුරු කරදර, මේ සියල්ල අධ්‍යයන පරිසරයට කරන හානිදායක බලපෑම ආදී විශාල කරුණු ගණනාවක් කුරුටු ගී ආශ්‍රයෙන් මතු කර ගත හැකිය.

මේ කුරුටු ගීයෙන් නිරූපණය වන්නේ කොළඹ විශ්වවිද්‍යාලයේ කිත්‍යාකර නේවාසිකාගාරයේ තතුය.

තට්ටු පහයි කිත්‍යාකර සිර ගෙදර
ඒ උනාට මෙහි නම් ඉඩ කඩ මදිය
බිත්තිවලට සවි කර ඇති පයිප්ප වතුර
ඔට්ටු නොවී මම යන්නයි හෙට ගෙදර

(කොළඹ)

මේ, විශ්වවිද්‍යාලයේ නේවාසිකාගාරය හැර යාමේ සැහැල්ලුව එතෙක් එහි සිටියදී විඳි ගැහැටවලින් මිදීම ආශ්‍රයෙන් විස්තර කරන කුරුටු ගීයකි.

උඩ ඉඳ ලේ බිව්ව බිහිසුනු මදුරුවන්ට
යට ඉඳ ලේ බිව්ව ගොරහැඩි මකුණන්ට
අද සිදුවේය වෙනෙකෙකු වෙත යන්ට
මම සමු ගනිමි ආයෙත් මෙහි නොම එන්ට

(කොළඹ)

තරමක් අතිශයෝක්තියෙන් ලියැවුන ද විශ්වවිද්‍යාල ආපන ශාලාවල සහ ඒවායේ අලෙවි කෙරෙන ආහාරපානවල තත්ත්වය පහත කුරුටු ගී දෙකෙන් පැහැදිලි කෙරෙයි.

කැම්පස් කැන්ටිමේ තොරතුරු සෝ බරය
හැමදාමත් කන්නෙ පරිප්පු හා පලා මය
කුසගිනි නිවෙන්නේ මලකඩ වතුරෙන්ය
මෙහෙමයි ගෙවෙන්නේ සරසවි ජීවිතය

(රුහුණ)

බත් ඇටවලට වැඩියෙන් ගල් අහු වෙනවා
පලා මැල්ලුමේ පණුවන් දඟලනවා
පරිප්පු හොද්දේ ඇට හොයලා පීනනවා
කැන්ටින් බත කද්දි අම්මා සිහි වෙනවා

(කැලණිය)

විශ්වවිද්‍යාල නේවාසිකාගාරවල ඉඩ මඳකම නිසා බොහෝ ශිෂ්‍ය ශිෂ්‍යාවෝ වෙනත් පෞද්ගලික නවාතැන් පොලවල නැවතී අධ්‍යයන කටයුතු කරගෙන යති. බොහොමයක් විශ්වවිද්‍යාල අසල අඩු කුලියකට ලබා ගත හැකි මෙබඳු පෞද්ගලික නවාතැන් පොලවල් ඇත. කාමරයක් හෝ කාමර කීපයක් ශිෂ්‍යයන්ට කුලියට දෙන මේ බොහෝ කුටුම්භවලට එය ප්‍රධාන ආදායම් මාර්ගයක් ද වෙයි. ප්‍රමාණයෙන් කුඩා මේ කාමරවල කීප දෙනෙක් නැවතීම සුලභ දෙයකි. විභාග කාලෙට ඒවා තුළ තදබදය කොතෙක් ද යත්, නිදා ගැනීමට සිදු වන්නේ එක ඇඳේ තුන් දෙනෙකුට හරහට ගජේටය.

එග්සැම් ළඟ ළඟය සහනය නැත හිතට
චමරියෙ පාන්වත් නැත බඩගිනි වුනු කලට
ගජේට තුන්දෙනයි හරහට එක ඇඳට
මෙහෙම වෙලා මදි සරසවි ආවාට

(රුහුණ)

තමා එතෙක් අත්පත් කරගෙන සිටි කුඩා ඉඩකඩ කණිෂ්ඨ ශිෂ්‍යාවකට භාරදී නික්ම යන ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යාවක් මේ කුරුටු ගීයේ කථකයා වෙයි. ඉඩකඩ ප්‍රමාණයේ තරම එහි දී ඍජුවම කියැවෙයි.

අවුරුද්දක් අකුරු කරපු
මගේ පුංචි අඩි හයේ රජ දහන
අද ඉඳන්
නුඹට භාරයි නංගියේ

(සබරගමුව)

දේශනශාලාවල නිසි පහසුකම් නොමැත. සමහර විදුලි පංකා ක්‍රියාවිරහිතය. ජනෙල් දොරවල් කැඩිලාය. පුටු මකුණන්ගෙන් පිරිලාය. පහත කවියේ මුඛ්‍ය තේමාව දේශන ශාලාවල තත්ත්වය ගැන කීම නොවන නමුත් ඉන් දේශන ශාලාවල තත්ත්වය ගැන යම් අදහසක් ගත හැකිය.

අල්ලට සිඟාවත් රස නැති කැවිලි කකා
ලෙක්චර් හෝල්වල ලැග්ගා මකුණො කකා
සිව් අවුරුද්ද ගෙවනව මරු පහර නොකා
පිං දී ගන්නවා මහ පොළ හිඟා කකා

(රුහුණ)

මේ කුරුටු ගීවලින් විශ්වවිද්‍යාලවල මූලික පහසුකම්වල තත්ත්වය විස්තර කෙරෙන්නේ තරමක් අතිශයෝක්තියෙන් බව සැබෑය. එමෙන්ම මේ කවි ලියැවී ඇති කාලයට සාපේක්ෂව අඩු තරමින් සමහර විශ්වවිද්‍යාලවලවත් තත්ත්වය

තරමක් හොඳ අතට හැරී තිබෙන්නත් පුළුවන. කෙසේ නමුත් තත්ත්වය මුළුමනින්ම සතුටුදායක නොවන බවත්, හොඳ අධ්‍යයන පරිසරයක් නිර්මාණය කරන්නට මේ ලක්ෂණ බාධාවක් බවත් පැහැදිලිය. රටේ අඩු ආදායම් තත්ත්වය මීට එක් ප්‍රබල හේතුවක් බව සැබෑය. රජය අවශ්‍ය තරම් මුදල් ප්‍රමාණයක් උසස් අධ්‍යාපනයට වියදම් නොකිරීමත් ඒ තරමටම සැබෑවකි.

''අනුබද්ධය මලබද්ධය''

සබරගමුව හා රජරට විශ්වවිද්‍යාල දෙක මුලින් අනුබද්ධ විශ්වවිද්‍යාල මට්ටමින් ආරම්භ කෙරුණු ඒවාය. අනුබද්ධ විශ්වවිද්‍යාල නවයක් ඒකාබද්ධ කරමින් මේ විශ්වවිද්‍යාල දෙක පිහිටවුණු බව ඒවායේ ඉතිහාසයෙන් කියැවෙයි. මුලින් අනුබද්ධ විශ්වවිද්‍යාලවල තිබූ සම්පත් මේ විශ්වවිද්‍යාල දෙකටම අවශෝෂණය කර ගනු ලැබීය. මේ විශ්වවිද්‍යාල දෙකම ආරම්භ වූයේ වෙනත් උවමනාවත් සඳහා ඉදිවුණු ගොඩනැගිලි පාදක කොට ගෙන බවත් ප්‍රකට කරුණකි. ආරම්භයේ දී, මේවායේ පහසුකම්වල මෙන්ම, විෂයමාලාවල ද අධ්‍යයන ප්‍රමිතීන්වල ද, පාඨමාලා සම්පූර්ණ වීමට ගත වන කාල සීමාවේ ද කොතෙකුත් අඩුපාඩු තිබී ඇති බවට එක සාක්ෂියක් ලෙස සබරගමු විශ්වවිද්‍යාලයෙන් ලැබුණු කුරුටු ගී භාවිත කළ හැකිය.

පහත නිදසුනෙන් මුල් පදය පමණක් වුව ද රචකයාගේ කළකිරීමේ සහ කෝපයේ ස්වභාවය සහ තරම කියන්නට ප්‍රමාණවත්ය.

අනුබද්ධය මලබද්ධය
අනුබද්ධ වාසිටිය
වසා ගණ කඩතුරාව
ලබා ගත් මෙලෝ දෙයක් නැත

(සබරගමුව)

සමහර විට මේ ශිෂ්‍යයන් සබරගමුව විශ්වවිද්‍යාලය ගැන දැන ගන්නට ඇත්තේ දිනමිණ පුවත්පතේ පළ වූ දැන්වීමක් ඇසුරෙන් විය හැක. ප්‍රකට ගායකයෙක් වූ කරුණාරත්න දිවුල්ගනේගේ ''අතීතය සිහිනයක් පමණයි'' ගීයේ පද රචනයේ මාත්‍රාවලට අනුව රචිත මේ කුරුටු ගීය අනුබද්ධ විශ්වවිද්‍යාලවල තත්ත්වය තව දුරටත් ප්‍රශ්න කෙරෙන්නකි.

උපාධිය සිහිනයක් පමණයි
ලැබෙන දිනයක් නෑ
එදා දිනමිණ නොබැලුවා නම්
මෙදා මේ දුක නෑ

(සබරගමුව)

දිනමිණ බලා වැරදි තීරණයක් ගෙන සබරගමු විශ්වවිද්‍යාලයට පැමිණ පාර වරද්දා ගත්තා යැයි සිතන තවත් අය සිටින බව පහත කවියෙන් නිදර්ශිතය.

බැලූ පාපටෙ එදා දිනමිණ
මෙදා සරසවි බිමට ආවා
කෙරූ පාපෙට විෂය වාණිජ
අතරමං වී පාර සෙව්වා

(සබරගමුව)

''ඉංග්‍රීසි අරහං''

තෝරා ගත් කුරුටු ගී එකතුවේ එන සමහර ගීවල සිසුන්ගේ ඉංග්‍රීසි භාෂා දැනුම මඳකම නිසා අධ්‍යයන කාර්යයේ දී මුහුණ පාන්නට සිදුවන දුෂ්කරතා සහ එම දුෂ්කරතා මඟහැරීමට නොහැකි වීම නිසා ඇතිවන කලකිරීම නිරූපිතය. මෙහි දී මේ කරුණ වෙත අවධානය යොමු කෙරෙන්නේ ඉංග්‍රීසි නොදැනීම දරිද්‍රතාවේ ලක්ෂණයක්ය වැනි සරල සම්බන්ධයක් පාදක කොට ගෙන නොවන නමුත්, දරුවන්ට ප්‍රමාණවත් ඉංග්‍රීසි දැනුමක් නොමැති බව විශාල වශයෙන් පවුලේ ආදායම අඩු වීම ද, දෙමව්පියන්ගේ අඩු අධ්‍යාපන තත්ත්වය ද, එම බස හැසිරවීමට දෙමව්පියන්ට නොහැකි වීම ද, දුෂ්කර පළාත්වල ඉංග්‍රීසි ගුරුවරුන් හිඟවීම ද ආදී කාරණා සමඟ අඩු වැඩි වශයෙන් සම්බන්ධ වන බව ප්‍රකට කරුණකි.

ඉංග්‍රීසි භාෂා නිපුණත්වයක් නැතිවීමේ අඩුපාඩුව ශිෂ්‍යයින්ට දැනෙන ආකාරය පහත කුරුටු ගී දෙකෙන්ම කියැවෙයි.

ගෙවූ පාපෙට තද පැමිලියක
බැරුව පර බස වාත වූවා
මලලසේකර ළඟ තබාගෙන
උපාධියෙ සිහින මැව්වා

(සබරගමුව)

අපි සබරේ එන්න කලින්
කඩ්ඩ පොලිෂ්
කර ගත්තේ නැතේ
ලෙචා ඇවිත් දේශන
දෙන කාලේ
මට සිංහලවත්
මතක් වෙන්නෙ නැතේ

(සබරගමුව)

පහත කවියේ කථකයා කියන්නේ විශ්වවිද්‍යාල ජීවිතයේ තමා අධික ලෙසම අකමැති දේවල් කීපයෙන් එකක් ඉංග්‍රීසි බවයි. සරලවම, ඔහුට හෝ ඇයට ඉංග්‍රීසි අරහංය. බොහෝ විට, එසේ වී ඇත්තේ එය ආයාසයකින් තොරව භාවිත කිරීමට නොහැකි වීම නිසා බරක් වී ඇති බැවිනි.

ජීවිතය දුකක්
පාඩම් කිරීම අති මහත් දුකක්
ඉංග්‍රීසි අරහං
ඇස් රිදුම පාපයකි
පොත් කියැවීම කරුමයකි
විභාගය අරුමයකි
පාස්වීම විස්මයකි

(සබරගමුව)

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයෙක් තරමක් විහිළුකාර ස්වරයෙන් මේ ගී ඛණ්ඩයෙන් කියන්නේ ඉංග්‍රීසි විෂයයේ දුර්වල ප්‍රතිඵල තිබියදී වුව ඊළඟ වසරට යවන ලෙස විය හැකිය.

වැඳල කියන්නම් ගැටඹෙට කඩ්ඩ රිපීට් යවන්න

(පේරාදෙණිය)

''සෙමෙස්තරේ මේ සැරෙ ඇණ වෙන්න එපා''

දරිද්‍රතාව අධ්‍යයන කටයුතු සඳහා බලපාන අවස්ථා විශ්වවිද්‍යාල ශිෂ්‍ය ජීවිතයේ සුලභය. සමහරු රාත්‍රියේ ආරක්ෂක සේවා සමාගමක රැකියාව කොට දවල්ට දේශනවලට එති. නැත්නම් දේශනවලට නැවිත් නිදා ගනිති. නමුත් වාරාවසාන විභාගවලට එති. තවත් සමහරු ගෙදරින් ගෙන්නා ගන්නා සුළු මුදලකින් හෝ මහපොළ දීමනාවෙන් අපහසුවෙන් විශ්වවිද්‍යාල අධ්‍යාපනය රැක ගන්නට වෙර දරති. මේ අත්දැකීම් විෂය කොට ගත් කුරුටු ගී ගණනාවක් තෝරා ගත් ගී එකතුවෙහි තිබේ.

බස්වල ගණන් තව තව වැඩි වෙන්න එපා
කැන්ටිමෙ කෑමවල මිල වැඩි වෙන්න එපා
ජීවිත සටන හැමදා පරදින්න එපා
සෙමෙස්තරේ මේ සැරෙ ඇණ වෙන්න එපා

(කොළඹ)

ආර්ථික අගහිඟකම් ඇති පසුබිමකින් එන ශිෂ්‍යයෙකුට වසර හතරක විශ්වවිද්‍යාල ජීවිතය අඛණ්ඩව පවත්වාගෙන යාමේ උත්සාහයේ දී මහපොළ දීමනාවෙන් ලැබෙන සුළු මුදල පවා කිසියම් පිහිටක් වෙයි.

අල්ලට සිඟාවත් රස නැති කැවිලි කකා
ලෙක්චර් හෝල්වල ලැග්ගා මකුණො කකා
සිව් අවුරුද්ද ගෙවනට මරු පහර කකා
පිං දී ගන්නවා මහපොළ හිඟා කකා

(කොළඹ)

මෙතෙක් උපුටා දක්වන ලද කුරුටු ගීවලට වෙනස් ලෙස පහත කුරුටු ගීයේ රචකයා කාව්‍යෝක්තියක් මගින් ව්‍යංග්‍යයෙන් කියන්නට උත්සාහ කරන්නේ ද දරිද්‍රතාව හමුවේ අධ්‍යයන කටයුතු කරගෙන යෑම දුෂ්කර බවයි.

ඇවිලෙන තුරු
ගින්නෙන් කුස
නිදි වරමින් සොයා ආව
සොඳුරිය ඔබ
කොහෙද?
නිසලව දෙ අත
පන්හිඳ උරණව
ඈතට ගියාද ඔබ
වඩින් නැවතත්
සරස්වතිය

(පේරාදෙණිය)

''රස්සාවක් නැතිව ඔහු තාමත් ගෙදර ඇති''

අඩු ආදායම් පවුල්වලින් විශ්වවිද්‍යාලයට එන ශිෂ්‍ය ශිෂ්‍යාවෝ බොහෝ විට පවුලේ අනෙක් අයගේ සුභ සිද්ධිය තම ඉගෙනීම වෙනුවෙන් කැප කරන්නට වක්‍රාකාරයෙන් බල කරන්නෝ වෙති. එය ඉඩකඩම්, යාන වාහන මෙන්ම කණකර උගස් තැබීම්, ණය ගැනීම්, සහෝදර සහෝදරියන්ගේ ඉගෙනීම සීමා කිරීම් ආදී විවිධ ස්වරූපවලින් සිදු විය හැක. එබඳු පරිසරයක, විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙන් පසුව හොඳ රැකියාවක් ලබා ගෙන පවුලම ''ගොඩ දැමීම'' විශ්වවිද්‍යාල ව්‍යාපෘතියේම පශ්චාත් අංගය බවට පත්වෙයි. කෙසේ නමුත්, අත මිට හිඟකම නිසා අධ්‍යයන කටයුතු අඩාල වීම ද, ඒ අනුව ලැබෙන ප්‍රතිඵල දුර්වල වීම ද නිසා එබඳු වගකීමක් ඉටු කළ නොහැකි වේය යන අපේක්ෂා කඩවීම සමහරක් කුරුටු ගීවලින් ගම්‍ය වෙයි.

රස්සාවක් හම්බ වෙයිද?
මේ දුක් ගිනි හෙට නිවෙයිද?
ඩිග්‍රිය පැත්තක දාලා
හේනෙ කුඹුරෙ යන්න වෙයිද?

(රුහුණ)

රචකයා විශ්වවිද්‍යාලයට පැමිණි පරිසරය පැහැදිලිය. වසර ගණනාවක විශ්වවිද්‍යාල ජීවිතයෙන් පසු නැවතත් පටන් ගත් තැනටම යාමට සිදුවේද යන ප්‍රශ්නය තමාගෙන්ම විමසීමට තරම්ම රැකියාවක් ලැබීම පිළිබඳ බලාපොරොත්තුව හීන වී ඇත. පහත කුරුටු ගීය ඊට වඩා දුක්ඛිත ස්වරයකින් අවිනිශ්චිත අනාගතය ගැන සැක සංකා මතු කරයි.

හිඟා කන්න බෑ අතපය නැති හින්දා
මැරී වැඩක් නෑ යළි ඉපදෙන හින්දා
ඉගෙනීමත් දුකයි බර බර වැඩි හින්දා
අනාගතයෙ මොනවා වේවිද මන්දා

(ශ්‍රී ජයවර්ධනපුර)

පහතින් දැක්වෙන කුරුටු ගීයේ ස්වරය ඊටත් වඩා වෙනස්ය. එහි කිසියම් උපේක්ෂා සහගත බවක් තිබුණ ද, රචකයා අඟවන්නේ රැකියාවක් නැතිව ගෙවීමට නියමිත අනාගත කාලය පිළිබඳ අවිනිශ්චිතතාවයි.

මා වගෙ එවුන් මේ කාමරෙ ඉන්න ඇති
නිදි මර මරා රෑ ක්‍රැමත් දමන්නැති
කෑමට කියා ඔහු අඩුවක් කන්න ඇති
රස්සාවක් නැතිව ඔහු තාමත් ගෙදර ඇති

(රුහුණ)

පහතින් දැක්වෙන කුරුටු ගීයට ප්‍රවේශයක් පාදාගත යුත්තේ තරමක් වෙනස් ලෙස වන්නේ එහි රැකියාවක් ගැන මොනම සඳහනක්වත් නැති බැවිනි.

ජීවිතය ගෙවී යනුයේ
පොතේ පිටු අතරේය
කැත්තයි උදැල්ලයි උරුම වූ
අපහට
පොතයි පෑනයි හුරු වී ඇති
ඵලය කුමක්ද?

(කොළඹ)

මෙහි රැකියාවක් නොලැබීම ගැන ඍජුව පැවසෙන්නේ නැත. රචකයා විශ්වවිද්‍යාලයට එන විට එහි කෙරෙන්නේ අධ්‍යයන කටයුතු මිස කැත්තේ උදැල්ලේ වැඩ නොවේ යයි නොදන සිටියා විය නොහැක. එසේ නම් විශ්වවිද්‍යාලයේ ගත වූ වසර කීපයකට පසු උන් හිටි හැටියේම මේ ප්‍රශ්නය අසන්නට හිතෙන්නේ ඇයි? ආර්ථික දුෂ්කරතා නිසා හෝ වෙනත් හේතු නිසා විශ්වවිද්‍යාල අධ්‍යාපනයෙන් අපේක්ෂිත ප්‍රතිඵල නොලැබීමේ කලකිරීම සහ අනාගතයේ රැකියාවක් ලබා ගැනීම පිළිබඳව ඇති අවිනිශ්චිතතාවය නිසා යැයි අනුමාන කළ හැකිය.

''සැපක් කොහිද දුක නම් නිරතුරු උරුමයි''

දරිද්‍රතාව යන තේමාව යටතේ කුරුටු ගී තෝරා ගන්නා විට ලැබුණු කුරුටු ගී වැඩි ප්‍රමාණයක නිරූපණය වන්නේ දරිද්‍රතාවය නිසා විශ්වවිද්‍යාල ශිෂ්‍ය ජීවිතයේ දී මුහුණ දීමට සිදුවන අනේකවිධ කම්කටොලුය. කුසගින්නේ සිටීමට සිදුවීම, ණය වීමට සිදුවීම, මහපොළ හෝ ශිෂ්‍යාධාර මත අධික ලෙස යැපීමට සිදුවීම, නවාතැන්වල තදබදය, මැසි, මදුරු හා මකුණු කරදර ඇතුළු නවාතැන්වල දී මුහුණදෙන ප්‍රශ්න, ආහාරපානවල දුක්ඛිත තත්ත්වය, ඇඳුම් පැළඳුම් හිඟකම, ජලය හා විදුලිය වැනි පහසුකම් ලබා ගැනීමේ දුෂ්කරතාව ආදී වශයෙන් අතිවිශාල පරාසයක මේ පිළිබඳව කුරුටු ගී ලියැවී ඇත. මෙහි පහතින් දැක්වෙන කුරුටු ගී කිහිපය ඊට නිදසුන් කීපයක් පමණි.

කුසට නැත අහරක්
නෙත නොදනී නිදි සුවය
සරසවිය සරසවිය
මරා දැමුවේය නුඹ අපේ
සොඳුරු වූ යෞවනය

(කොළඹ)

අපි ආවේ ඉගෙන ගන්න
අපිට උනේ නොකා ඉන්න
ණය තිබෙනවා ඉහ පිරෙන්න
අපි යනවා ගෙදර යන්න

(කොළඹ)

පිහිටක් නොමැත ඇත්තේ මහපොළ පිහිටයි
සරණක් නොමැත ඇත්තේ නුඹගේ සරණයි
සෙවණක් නොමැත ඇත්තේ ගස් යට සෙවණයි
සැපක් කොහිද දුක නම් නිරතුරු උරුමයි

(කොළඹ)

උඩ ඉඳ ලේ බිව්ව බිහිසුනු මදුරුවන්ට
යට ඉඳ ලේ බිව්ව ගොරහැඩි මකුනන්ට
අද සිදුවේය වෙනකෙකු වෙත යන්ට
මම සමුගනිමි ආයෙත් මෙහි නොම එන්ට

(කොළඹ)

එන්නේ කැම්පසුයි හොස්ටල් එකේ සිට
කන්නේ වතුර සහ බත් කැන්ටිමේ සිට
මාස ගනන් නැත දිය බිඳු නාන්නට
මේ දිවි කතර දුක් උසුලන්නේ කුමට?

(කොළඹ)

කයෝර සුළඟ හමනා විට
ගිනි අව්ව දැනෙන විට
කරවටක් ගිලෙන තරු
වන පොත් කරමින්
ඇල්මැරුනු බත් පතේ
හැම දාම ගත වැටෙන
කඩ මලු කමිසයට
කිසි දිනෙක දොස් නොනගා මද සිතින් ඉවසමින්
රෑ යාමේ බෝඩිමේ
රලු ඇඳන් මතට වී
දුම්වැටිය උරමින්
මදුරුවන් පලවමින්
අනේක දුක් සිහි කරමි

(සබරගමුව)

රඹ කැන් ඉදිලා
සුවඳේ බැරුවා
බඩගිනි දා
බඩගිනි නෑ
මගේ කෑම
අද මෙය පමනි

(සබරගමුව)

Campus ආවේ මොන හේතුවකටද අනේ
මගේ පෙර පවක් පල දුන්නද මගේ අම්මේ
සිදුවන හැමදේම දුකටයි බර වෙන්නේ
ජීවිතයම දුකක් බවයි හැඟෙමින් යන්නේ

(කැලණිය)

බඩගිනි වෙලා මා ගිය කල කැන්ටිමට
දහයේ බත් එකක් දුන්නයි මා අතට
ගන්දෝ නොගන්දෝ කියලා සිතුනි මට
බඩගිනි නිසා ගත්තයි එය මා අතට

(පේරාදෙණිය)

ඉන්නේ බෝඩිමක මහ ලොකු ලිඳක් ළඟ
කන්නේ ජිම් එකෙන් රුපියල් 20 කට
බොන්නේ ප්ලේන්ටි එහි කිසි රහක් නැත
ඩිග්‍රිය නිසා මා විඳින දුක

(ශ්‍රී ජයවර්ධනපුර)

''කැන්ටින් එක කරන නෝනා මැරියන්''

තමාට විඳීමට සිදුවී ඇති ගැහැට සම්බන්ධයෙන් විරෝධාකල්ප මතුවීම විශ්වවිද්‍යාලය තුළ නිතර දකිය හැකි දෙයකි. දරිද්‍රතාවය හා සම්බන්ධ හේතු නිසා විඳීමට සිදු වූ ගැහැට හේතු කොටගෙන ඇති වූ ආවේග පිළිබිඹු වන කුරුටු ගී ගණනාවක් ද ගී එකතුවෙහි වෙයි. මේවා පුද්ගල සන්තානයේ මතුවන කෝපය ප්‍රකාශ කිරීම්වල සිට සාමූහික විරෝධයපෑම් දක්වා පුළුල් පරාසයක දිවෙයි.

පහත කුරුටු ගීය කිසියම් දුරකට පුද්ගල නෝක්කාඩු කීමකින් එහාට නොයයි.

ගල් ඇති බතේ
කිරි නැති හොද්ද
හොවා දී මට
එපා කෙරුවා සරසවි දිවියම

(පේරාදෙණිය)

නමුත් පහත දැක්වෙන ගීයේ රචකයා තමාට සිදුවන අසාධාරණය ප්‍රශ්න කරයි.

බඩගිනි වෙලා මා ගිය කල කැන්ටිමට
පානුයි පරිප්පුයි දුන්නා විස්සකට
කම්දෝ නොකම්දෝ කියලා සිතුනි මට
මෙහෙමද යකෝ කන්නට දෙන්නේ අපට

(කොළඹ)

පහත දැක්වෙන කවියේ රචකයා අදාළ පාර්ශ්වයට සාප කිරීමට තරම් දුරදිග යයි.

වාසිටියේ 'පචගහ' බිම වැටීයන්
කැන්ටින් එක කරන නෝනා මැරීයන්
ගුණෙ අයියගෙ දෙසුම අදවත් ඉවර වෙයන්
බූට් දුන්නු කෙල්ලම මට වැටීයන්

(පේරාදෙණිය)

සාමූහික ස්වරයකින් ඇසෙන විරෝධාකල්ප අඩංගු කුරුටු ගී ද ඇත. දිගු කවි පංතියක ස්වරූපයෙන් තිබූ කුරුටු ගීයකින් උපුටා ගැනුණු පහත ගී ඛණ්ඩ දෙක ඉදිරිපත් කෙරෙන්නේ කිසියම් විරෝධතාවක දී සාමූහිකව සටන් පාඨ කියන ස්වරයෙනි.

දමනු දමනු - ඉහළ දමනු
ශිෂ්‍යාදාර - ඉහළ දමනු
කරනු කරනු - නතර කරනු
සිසු මර්ධන - නතර කරනු

(කැලණිය)

කනවා කනවා - හොරා කනවා
පාලකයන් - හොරා කනවා
රට කරනා - පාලකයින්
ඇති පදමට - හොරා කනවා
කනවා කනවා - ලෙව කනවා
නොකා නොබී - ලෙව කනවා
සරසවිවල - අපි ඔක්කොම
නොකා නොබී - ලෙව කනවා

(කැලණිය)

විරෝධාකල්පයක් වුව ද පහත කුරුටු ගීය ඉදිරිපත් කෙරෙනුයේ ඊට වඩා වෙනස් තරමක හික්මුණු ස්වරයකිනි.

දහඩිය සුවඳ වැගිරෙන රතු දිනට මලේ
අපෙ උන් නැලවෙනව වැද ලොකු උන්ගෙ දූලේ
පෙර මග ගන්න බැහැ මට සරසවියෙ මලේ
මතුදා දිනේවා කම්කරු සමගි බලේ

(රුහුණ)

''බඩගින්න ඉවසං බොලං - නින්ද නං පරමං සුඛං''

දරිද්‍රතාව නිසා ශිෂ්‍ය ජීවිතවලට එල්ල වන බලපෑම් සඳහා විරෝධය එල්ල වීම හැම විටම, හැම ශිෂ්‍යයෙකුගෙන්ම සිදුවන දෙයක් නොවේ. ඒ පිළිබඳ විරෝධය පෑම් මෙන්ම ඒවා උපේක්ෂාවෙන් හෝ විනෝදයෙන් භාර ගැනීම් ද ශිෂ්‍යයන්ගේ විශ්වවිද්‍යාල ජීවිතයේ දී දැකිය හැකිය. මේ සම්බන්ධ කරුණු පාදා ගැනීම සඳහා සමහර කුරුටු ගී වචනාර්ථයෙන් ඔබ්බට කියවිය යුතුය.

ඇතැම් කුරුටු ගීවල වචනවල කේවල තේරුම පසුපස හඹා නොගොස් ඒවායේ එන අදහස සමස්තයක් ලෙස ගෙන සලකා බැලූ විට පෙනී යන්නේ, විශ්වවිද්‍යාල ජීවිතය තුළ දැකිය හැකි කුසගින්න හා වෙනත් දුෂ්කරතා පසු කලෙක ස්මරණය කොට විනෝද විය හැකි ගණයේ අත්දැකීම් ලෙස සිසුන් විසින් එම කුරුටු ගීවල නිරූපණය කරනු ලැබ ඇති බවයි. දුෂ්කර වුවද, එම අත්දැකීම් කිසියම් විදියකට නියම විශ්වවිද්‍යාල ජීවිතයේ සාමූහිකව විනෝදයෙන් භාර ගත යුතු දේ බවත්, එබඳු අත්දැකීම් නැතිව විශ්වවිද්‍යාල ජීවිතය අසම්පූර්ණ එකක්ය යන්නත් ඒවා කියවන පාඨකයාට හැඟෙයි. පහත සඳහන් නිදසුන් දෙස බලන්න.

කෑමෙන් හොඳ කෑම කැන්ටින් බත් කෑම
බීමෙන් හොඳ බීම ඇල්වතුරම බීම
දීමෙන් හොඳ දීම අනුනට ලනු දීම
නෑමෙන් හොඳ නෑම සරසවියේ නෑම

(කොළඹ)

පාඩමං අරහං තානං
විභාගං භයං කරං
බඩගින්න ඉවසං බොලං
නින්දනං පරමං සුඛං

(කොළඹ)

| | |
|---|---|
| ක්‍රෑමදාන විට බොග සෙට් වෙන්න | එපා |
| අතේ සතේ නැති අපට බඩගිනි වෙන්න | එපා |
| මෙදා පොටේ එග්සෑමය ඇනෙනු | එපා |
| යලිත් මේ බිමට එන්නට සිදු වෙන්න | එපා |

(කොළඹ)

| | |
|---|---|
| අනේ සුසානෝ ඉස්සර | වාසිටියේ |
| මේසෙට කෑම ඇරලලු දීලා | හිටියේ |
| අලුතින් හිලක් විදලා ඉන වට | පටියේ |
| බඩ තද කර ගනින් හොඳ හැටි කිටි | කිටියේ |

(කොළඹ)

| | |
|---|---|
| අල්ලට සිඟා මෙන් දෙවරුව පාන් | කකා |
| පස්ස ඉරුනු කලිසම දූලියෙන් | වකා |
| නැති බැරි නමුත් ඉවසා දත් කුරු | කකා |
| ලැක්චස් දුවමු බී.ඒ. අකුරු දෙක | තකා |

(කොළඹ)

| | |
|---|---|
| ලෙක්චර්ස් යනවා හොස්ටල් | එනවා |
| බෙල් එක වැදුනම නිදිමත | යනවා |
| පහළට | එනවා |
| බතා | බලනවා |
| බතාගෙ පරිප්පුව - කව්පිය | වෙනවා |
| කව්පි ජලාශේ අපි | පීනනවා |
| වේළුණු පානා දියේ | ගිලෙනවා |
| බතා උඹත් මතු නිවන් | දකිනවා |

(කොළඹ)

මේ අන්තිම කුරුටු ගීයේ එන බතා නේවාසිකාගාර අවන්හල පවත්වාගෙන යන්නා විය හැකිය.

ගජේ ගැසීම හෙවත් අනුන්ගේ දේ බෙදා ගැනීම විශ්වවිද්‍යාල ජීවිතය තුළ, විශේෂයෙන්ම නේවාසිකාගාරවල සිටින ශිෂ්‍යයන් අතර, ඉතාමත් සුලභ පුරුද්දකි. ඇඳුම්, සපත්තු, සුවඳ විලවුන්, නිදන ඇඳ පමණක් නොව දත් බුරුසුවට ද ගජේ ගසන්නෝ සිටිති. ජොලියට ගජේ ගසන්නෝ ද සිටිය හැකි වුවත්, බොහෝ විට ගජේ ගසන්නේ නැතිකම නිසාය. මේ කුරුටු ගීය ගජේ ගසන්නන් ගැන කෙරෙන පණ්ඩිතමානී විවරණයකි.

ඇඳුම් ගජයා හැන්ඩියාය
සෙන්ට් වර්ග ගජයා චාම් වුවත්
බඳුන් හිස් වූ දාට මලපෙරේතයාය
බ්‍රෂ් ගජයාගේ දත් පිරිසිදුය, නිරෝගිය
කෙටියෙන් කියතොත් ගජයා වනාහි
නැතත් ඇත්තා සේ ඉන්නා තදයාය

(රුහුණ)

පහතින් දැක්වෙන එක් එක් කුරුටු ගීය ලියා ඇත්තේ කිසියම් ප්‍රසිද්ධ ගීයක තනුවකට අනුවය. මුල් ගීයේ අදහස ද, තනුව ද පසුබිමින් තබාගෙන ඒවා කියවද්දී, දුගී දුප්පත්කම වැනි වචන තිබුණ ද ඒවා වාච්‍යාර්ථයෙන් ගැනීම අර්ථ විරහිත ක්‍රියාවක්ය යන්න හොඳින් තහවුරු වෙයි.

නිකං කකා ඉන්නම්
ගෙදරින් දෙනවා නම්
දස වසරක් ඉන්නම්
සරසවියේ
හැමදා පොල දේ නම්...

(කොළඹ)

බඩගින්න කුසගින්න
ඇවිලෙයි ඉතින්
විඳවන්නෙ රිදවන්නෙ
ඇයි මේ ලෙසින්
කොයි කවුරු දුන්නාද
මේ ගිනි ඉතින්
ඉවසන්න පුළුවන්න බඩගිනි අනේ
බඩ දන්නෙ බඩගින්න වැඩි හින්ද නේ
පිටි බිව්වෙ ඒ ගින්න දුරලන්න නේ

(රුහුණ)

එක ඇඳේ ගජේ ගහලා
මදුරු මැරූ කාලය නෑ
ආයෙත් එන්නේ

(රුහුණ)

මොනව කරන්නද රාළේ
පොල ඉවරයි මේ කාලේ
සිවු අවුරුදු අපි හිටියේ
මේ දුක් එයි නැහැ සිතුවේ

(රුහුණ)

සතයක් නැති - පොකුරක් නැති
කෑමක් නැති - බොග නම් ඇති
මේ කරුම වසන්තේ
අපි අසරණ වෙලා වගේ
හිතට දැනෙනවා
උප කුලපති තුමනේ

(පේරාදෙණිය)

මේ කුරුටු ගීවල ද දරිද්‍රතාව නිසා ශිෂ්‍ය ජීවිතවලට එල්ල වී ඇති බලපෑම් දැකිය හැකිය. එසේ වුව ද, ශිෂ්‍යයා ඒ බලපෑම භාර ගන්නා ආකාරය වෙනස්ය. දුක්බර අත්දැකීම් වුවත් සාමූහිකව විඳීමට සිදුවීම නිසා ඒවා විනෝදයෙන් භාර ගන්නා බවක් මෙන්ම, කිසියම් උපේක්ෂාවක්ද මේ කුරුටු ගීවලින් ධ්වනිත වෙයි. ඒ අනුව, හුදෙක් කුසගින්න, දිළිඳුකම වැනි යෙදුම් තිබූ පමණින්ම කුරුටු ගීයකින් ඇඟ වෙන්නේ දරිද්‍රතාවය නිසා අසහනයට පත් වූ ශිෂ්‍යයන්ගේ මානසිකත්වයය යනුවෙන් නිගමනය කිරීම තරමක් හදිස්සිකාරී තීරණයක් බව පෙනේ.

''අම්මෙ මම කවද හරි අපේ ගේ හදනවා''

දරිද්‍රතාව ද ඇතුළු විවිධාකාර හේතු නිසා තමා විඳින සියලුම දුෂ්කරතා මධ්‍යයේ වුව ද, අධිෂ්ඨානශීලීව අධ්‍යයන කටයුතු නිසි ලෙස කරගෙන යාමට සමහර ශිෂ්‍යයෝ සමත් වෙති. වඩා යහපත් හෙට දවසක් පිළිබඳ සිහිනය අත් නොහරින්නට උත්සාහ කරති. මේ අධිෂ්ඨානය හා අපේක්ෂාව කුරුටු ගීවලට නැඟුණු අවස්ථා සුලභය.

පහත කුරුටු ගී දෙකෙන්ම ඇඟවෙන්නේ දුෂ්කරතා මධ්‍යයේ වුව තම අවසාන ඉලක්කයට ළඟා වීමේ අපේක්ෂාව අත් නොහරින්නෙමැයි රචකයා විසින් තම මවට දෙනු ලැබූ ප්‍රතිඥාවන්ය.

අව පස ඝන තිමිර ඉරා
පුර පස සඳ නැගෙන තුරා
මහ පෝ ගණනක් යනතුරු
මා වෙනුවෙන් වින්ද දුකට
වන්දි ගෙවන්නට හෙට දින
උපාධි ලෝගුව පොරවන්
මං එනතුරු ලොවම දිනා
බලං ඉන්න අම්මේ
ඉඳිකඩ ළඟට වෙලා

(කොළඹ)

වැහිදාට හැමදාම අපේ ගේ තෙමෙනවා
අම්මගේ ජීවිතේ ලණු ඇදේ දිරනවා
අයියලා, අක්කලා තව ගෙවල් හදනවා
අම්මෙ මම කවද හරි අපේ ගේ හදනවා

(ශ්‍රී ජයවර්ධනපුර)

පහතින් දැක්වෙන කුරුටු ගීයෙන් කියැවෙන්නේ රචකයා විසින් සැබැවින්ම තමා විසින් තමාටම දමා ගනු ලැබූ තහංචියක් නම්, එය සකල විධ දුෂ්කරතාවන් ඉවසා දරා ගැනීමට කළ අධිෂ්ඨානයක් ලෙස දැකිය හැක. (කෙසේ වුව ද, මෙය ලියා ඇත්තේ වෙනකෙකු ආමන්ත්‍රණය කරමින් නම්, ඉන් අදහස් කෙරෙන දේ මීට ඉඳුරා වෙනස්ය. නිදසුනක් ලෙස මෙය නවකවදය කාලයේ දී ජ්‍යෙෂ්ඨයෙක් කණිෂ්ඨයෙකුට කියන දෙයක් ලෙස ගතහොත්, ඉන් ගම්‍ය වන්නේ වෙනත් දෙයකි.)

මෙහෙ No කඳුළු
ඉවසා දරා හිටු

(සබරගමුව)

විශ්වවිද්‍යාලයේ ගත කරන සිව් වසරක අඳුරු උමග කෙළවර එළිය ගැන බලාපොරොත්තුව විශිෂ්ඨ ලෙස කුරුටු ගීයකට පරිවර්තනය වීමේ නිදසුනකි මේ.

කැරට්, අල, බෝංචි, බිත්තර
හීටරයෙන් තම්බලා කන මේ සොඳුරු
වසන්තයේ හෙට මල් පිපේවි
ලස්සනම ලස්සන
(කැලණිය)

දරිද්‍රතාව හෝ වෙනත් හේතු නිසා විශ්වවිද්‍යාල ශිෂ්‍ය ජීවිතයේ මතුවන දුෂ්කරතා ඉදිරියේ නොසැලී හිඳීම සම්බන්ධයෙන් මේ කුරුටු ගී අතර දැකිය හැකි වඩාත්ම ප්‍රබල සන්නිවේදනය කෙරෙන්නේ පහත කුරුටු ගීයෙන් යැයි සිතේ.

අමාරුවෙන්
කට්ට කාපු එකා
දවසක
මදය කනවාමයි

(ශ්‍රී ජයවර්ධනපුර)

## V. දරිද්‍රතාව සහ ශිෂ්‍යයින්ගේ පෞද්ගලික ජීවිතය

මේ යටතේ මූලික වශයෙන්ම සලකා බැලෙන්නේ විශ්වවිද්‍යාල ශිෂ්‍යයා/ශිෂ්‍යාව සහ ඔහුගේ/ඇයගේ පවුල් අතර සබඳතා කෙරෙහිත්, ඔවුනොවුන් අතර ඇතිවන ආදර සම්බන්ධතා කෙරෙහිත් දරිද්‍රතාවයේ බලපෑම ගැන කුරුටු ගී ආශ්‍රයෙන් මතු කර ගත හැකි ලක්ෂණ කීපයකි.

''අය්යෝ අම්මේ අය්යෝ මට බැරිය''

ඈත පළාත්වල ආර්ථික දුෂ්කරතා ඇති පවුල්වලින් එන ශිෂ්‍යයන් නැවතී සිටින්නේ විශ්වවිද්‍යාල නේවාසිකාගාරවල හෝ සැප පහසුකම් අඩු දුෂ්කර නවාතැන්වලය. එහි දී බොහෝ විට ශිෂ්‍ය ජීවිතය ද ගෙදර දී ගෙවූ දුෂ්කර ජීවිතයේම දිගුවක් වෙයි. මෙවැනි ශිෂ්‍යයෝ උඩිනුත් ගින්දර - යටිනුත් ගින්දර තත්ත්වයේ පසු වන්නෝ වෙති. ගෙදරින් බොහෝ දුරක් ඈත විශ්වවිද්‍යාල අසල නැවතී තමා දුක්විඳින අතරම ගෙදර අය ද දුක්විඳින බව ඔහු හෝ ඇය දනියි. පහතින් දැක්වෙන කුරුටු ගී තුනම මේ සඳහා නිදසුන් සපයයි.

නින්ද නැති රැයේ
පොත දෙස බලා සිටියෙමි මම
දෑස් දල්වා
සියලු දුක් වේදනාවන් ඉවසා
දෑස රිදුම ඉවරයක් නැත
කුසගින්න කියනු නොහැකිය
දිනුම ඈත පෙනෙන දුර
නැත කිසිවෙකු මා තුළ
එකම එක දෙයක්
ඇත මා හදවත තුළ
මාගේ ලේ මස් නහර
ඇට මිදුළුවලට
කා වැදී
ඒ නුඹයි මගේ
සුදු අම්මේ
නුඹේ කුස ගින්දරයි
සුදු අම්මේ

(කැලණිය)

අයියෝ සරසවිය අයියෝ    සරසවිය
කියන දෙයක් ඔළුවට ගන්නට    බැරිය
තාත්තා ලෙඩ ඇඳේ මහපොල තව    නැතිය
අයියෝ අම්මේ අයියෝ මට    බැරිය

(කොළඹ)

කුසගින්නේ සිටිනා විට අපෙ    අම්මේ
නෑ වැලපුනේ කිසිදා මම බඩ    ගින්නේ
මේ හැම වෙලේ නුඹ සිහි වන විට    අම්මේ
සරසවි උපාධිය කටු ඔටුන්නක්    අම්මේ

(ශ්‍රී ජයවර්ධනපුර)

මේ අවසාන කුරුටු ගීයෙන් කියැවෙන පරිදි කථකයා ගෙදර සිටියදීත් හාමතේ සිටින්නට ඇත. ඒත් ඒ ගැන මැසිවිලි නැගුවේවත් වැලපුනේවත් නැත. එහෙත් මේ පරිසරයේ ගෙදරින් වෙන් වී සිටින විට සුපුරුදු කුසගින්න වුව දැරිය නොහැකිය.

පහත කුරුටු ගීයෙන් දැක්වෙන්නේ රචකයාට පහළ වූ හැබෑම සිතිවිල්ලක් නම් (එනම්, මෙම ලිපියේ එන වර්ගීකරණයට අනුව මේ ගීය හුදෙක් 3 යටතට නොවැටී 1 යටතට වැටේ නම්), තත්ත්වය කොතරම් ඛේදජනක දැයි සිතා ගැනීම අපහසු නැත.

සඳ රොටිය
හිරු ලිපේ ලා පුළුස්සා
මැද තබා
තරු ලුනු මිරිස්
කන්නද අම්මේ මං
බඩගින්නට

(සබරගමුව)

උපාධිය ගන්නට විත් මේ ගැහැට වින්දත්, ඊට විසඳුම ඇත්තේත් උපාධිය ලබා ගැනීම තුළ යයි සිතන ශිෂ්‍යයෝ ද ඒ අතර සිටිති. මේ නිදසුන බලන්න.

නංගී මගේ දුක් විඳිනවා අර    ගෙදර
මමත් මෙහේ දුක් විඳිනවා හැම    නිතර
ඩිග්‍රිය තමයි මේ හැම එකටම    පිහිට
අනේ මගේ ඩිග්‍රිය නුඹ දුක්    ගොඩක

(පේරාදෙණිය)

ගෙදර තත්ත්වය මතක් වන විට විශ්වවිද්‍යාල ජීවිතය හැරදා පෙරලා ගෙදර යන්න සිත් වුව ද, එය විසඳුමක් නොවේ යැයි සිතන ශිෂ්‍යයෝ ද සිටිති. මේ කුරුටු ගීයෙහි එය වඩාත් ප්‍රකාශිත ආකාරයෙන් ඉදිරිපත් කෙරෙයි.

ගම් දනවු පහුකර ආවත් සරසවියට
යන්නට හිතෙනවා ආයෙත් ගෙදරට
එහෙම කළොත් කන්න දෙන්නෙ කවුද අපට
බෑ බෑ ඉගෙන ගත යුතුයි පොළොවේ පය ගහන්නට

(කැලණිය)

තවත් සමහරකගේ කරපිට ප්‍රතිඋපකාර කිරීමේ වගකීම ඇත. තමා අද සිටිනා තැන තවත් කෙනෙකුගේ කැප වීම නිසා ලැබුණු දෙයකි. ඒ නිසා පෙරලා ඒ අයගේ සැප දුක් බැලීම යුතුකමක් සේ සැලකේ.

ඇඳුම් මැසුවේ අක්කා සත් වසරක් තිස්සේ
ඒ පිහිටෙන් තමයි අද මේ පුටුවේ ඉන්නේ
හොරොව්පතානේ ඇය අද ජීවත් වන්නේ
මගේ පැතුම ඇය පණ මෙන් රැක ගන්නේ

(ශ්‍රී ජයවර්ධනපුර)

''කැන්ටින් බත කද්දි අම්මා සිහි වෙනවා''

දරිද්‍රතාව තේමා කොට ගත් කුරුටු ගී ගණනාවක නිරූපණය කෙරෙන තවත් කරුණක් වන්නේ විශ්වවිද්‍යාල ජීවිතය කොතරම් දුෂ්කර හා දුක්බර ද යත්, ලුණුයි බතුයි කා ගෙදර ගත කළ ජීවිතය ඊට වඩා සැපතක්ය යන්න සිසුන් සිතන බවයි. පහතින් දැක්වෙන කුරුටු ගී තුනේම අඩු වැඩි වශයෙන් මේ කරුණ සනාථ වෙයි.

සරසවියට වෙලා ගෙවු පසුගිය අවුරුද්ද
කී දවසක් මගේ බඩ වේලෙන්නට ඇද්ද
දැනෙන විටදි හෙට දිත් මට කුස යුද්ධ
අම්මා දුන්න බත් පත සිහි නොම වෙද්ද

(කොළඹ)

නැවත් වතුර මල යට හිඳ නල වතුර
තාමත් සිතින් කිමිදෙයි ගඟ දිය වතුර
කැම්පස් කැන්ටිමේ බත හරි නැහැ මිතුර
තාමත් සිහි වෙතිය පෙර කෑ අල බතල

(කොළඹ)

බත් ඇටවලට වැඩියෙන් ගල් අහු වෙනවා
පළා මැල්ලුවේ පනුවන් නලියනවා
පරිප්පු හොද්දෙ ඇට හොයලා පීනනවා
කැන්ටින් බත කද්දි අම්මා සිහි වෙනවා

(කැලණිය)

''මසුරන් කෙතකට හිමිකම් නැති මට ඇයි ඔබ පෙම් බැන්දේ''

අගහිඟකම් ආදරයට බලපාන්නේ විවිධාකාර අන්දමටය. සමහර ආදර සම්බන්ධතා අගහිඟකම් හමුවේ දියාරු වී ගිය ද, තවත් විටෙක එය එබඳු සම්බන්ධතා සඳහා බාධාවක් නොවේ. තම ආදර සම්බන්ධය ඇනහිටියේ අත මිට හිඟවීම නිසා යැයි සිතූ ශිෂ්‍යයෙකුගෙන් බිහි වූ කුරුටු ගීයකි මේ.

විරහ කඳුළක් හොරාගෙන විත්
හදේ සැනසුම නැති කළා
අනේ රුපියල උඹේ හිඟකම
සිරා ලව් එක නැති කළා

(කොළඹ)

මේ රචකයාගේ අත්දැකීම ඊට වෙනස්ය. නැති බැරිකම් තිබුණත් ඒවා බෙදාගෙන ඔවුහු එක්ව හිඳිති.

අල්ලට සිල්ප ගෙන
රොන්සුනු පිරුණු දිනේ
නුඹ මා ළඟ උන්නා
වල් කොළ අතු ද නිගා
වැරහැලි ඇඟලූදා
නුඹ මා ළඟ උන්නා
කල් ගිය සිහින මකා
වල් වැද මිලින උනත්
පෙම් සිත හැඳින ඇතත්
අපි අපි ළඟ ඉන්නා

(කැලණිය)

පහතින් දැක්වෙන කුරුටු ගීය මේ දෙස වෙනත්ම කෝණයකින් බලන්නට අපට බල කරයි.

ආවේ ගෙදර සිට ඩිග්‍රිය අර ගන්න
කෑවේ පාං අප හට නැත බත් කන්න
කොක්කක් ගැහුවොත් හැක මට බත් කන්න
කවුරුද කැමති මට බත් අම්මා වෙන්න

(ශ්‍රී ජයවර්ධනපුර)

කථකයා ඈත පළාතකින් පැමිණියෙක් වන අතර ආර්ථික දුෂ්කරතා ඇති අයෙක් විය යුතුය. ඔහු ආදරයක් ගෙනයන්නේ හිත පුරා බත් කටක් කන්නටය. පෙම්වතිය හැමදාම නිවසේ සිට විශ්වවිද්‍යාලයට එන කෙනෙක් නම් ඔහුගේ බලාපොරොත්තුව ඉෂ්ට වනු ඇත. මෙය ලියූ රචකයා සැබැවින්ම මෙවැන්නක් අදහස් කළා නම් (මෙහි එන වර්ගීකරණය අනුව මේ කුරුටු ගීය 1 යටතට වැටේ නම්), එය බරපතල ලෙස අනෙකා රැවටීමක් වුව ද, කිසියම් අහිංසක උවමනාවක් ද ඒ පිටුපස ඇති බව පෙනේ. නමුත් බොහෝ විට මෙය අතිශයෝක්තියෙන් ලියූවක් විය යුතුය. ඒ කෙසේ වුවත්, නිවසේ සිට පැමිණෙන පෙම්වතියන් සිටින නේවාසිකාගාරගත සිසුන් ගෙදර උයන බත් මාළුවල රස බැලීමේ වරප්‍රසාදය භුක්ති විඳින්නෝ බව විශ්වවිද්‍යාල ජීවිතය පුරුදු අය දන්නා කරුණකි.

පහත දැක්වෙන කුරුටු ගීයේ රචකයා සැබැවින්ම උපාධිය සම්පූර්ණ කළ අයෙක් ද යන්න සම්බන්ධයෙන් සාක්ෂි නැත. සමහර විට ඔහු එවැන්නෙක් වීමට ද ඉඩ ඇත්තේ උපාධිය ලැබූ පසුවත් හරිහමන් රැකියාවක් ලැබෙන තෙක් සමහර උපාධිධාරීන් විශ්වවිද්‍යාලය තුළම වර්තමාන ශිෂ්‍යයින්ගේ පහසුකම් බෙදා ගනිමින් රැඳී සිටීමේ ප්‍රවණතාවක් ඇති හෙයිනි. මේ අය සාමාන්‍යයෙන් ඈත පළාත්වලින් විශ්වවිද්‍යාලයට පැමිණියෝ වෙති. රැකියාවකුත් නැතිව වෙනත් නවාතැනක් සොයා ගැනීම දුෂ්කර හා වියදම් අධික කාරියක් බැවින්, ඔවුහු ශිෂ්‍ය නේවාසිකාගාරවල නැවතී පහසුකම් ගජේ ගසති. එවැන්නෙක් තම පෙම්වතියගෙන් අසා සිටින්නේ තමා වැනි පුද්ගලයෙකුට ආදරය කිරීමට සිතක් පහළ වූයේ ඇයි ද යන්නයි.

උපාධි කොළපත මාත් සමග අඬනව අද කුසගින්නේ
මගේ උගත්කම බිඳක් නොදුටු හිස් (පැහැදිලි නැත) වැන්නේ
මසුරන් කෙතකට හිමිකම් නැති මට ඇයි ඔබ පෙම් බැන්දේ
මගේ උගත්කම ලීවෙමි කුමරියෙ සරසවියේ බැම්මේ
(ශ්‍රී ජයවර්ධනපුර)

පහතින් දැක්වෙන කෙටි කුරුටු ගීය පෙම් පලහිලව්වක් පිළිබඳව කිසියම් සරදමක් යයි ද, අදාළ තරුණිය දිළිඳු පසුබිමකින් පැමිණි අයෙකු වෙන්නට ඇතැයි ද අනුමාන කළ හැකිය.

ලෙලි තලන පල් වතුර පොකුණේ
රං පියුම නැතිද තව පිපුණේ
කුරට OK
අපිට Soke
(සබරගමුව)

මෙහි පළමු පද දෙක ගුණදාස කපුගේ ගයන ගීයක දෙපදයක් වන අතර ඉන් කියැවෙන්නේ පොල් ලෙලි තලන තරුණියක් ගැනය. එම ගීයේ එන, කුරුටු ගීයට ඇතුළත් දෙපදයට කලින් ගැයෙන දෙපදය මෙසේය.

මනමාලකම් කරන නිවට දුප්පත් කුමරු

බින්න බැහැලා වගෙයි ගෙපැලේ

ඉන් කියැවෙන්නේ දුප්පත්කම නම් නිවට කුමාරයා ගෙදර අරක්ගෙන ඇති බවයි. ඇඟවුම දුගී බව නිසාම ඇය තවමත් අවිවාහක තරුණියක වන බවයි.

තෝරා ගැනුණු කුරුටු ගී සමුච්චය ආශ්‍රයෙන් විමසා බලන කල ශිෂ්‍යයන්ගේ විශ්වවිද්‍යාල ජීවිතය සහ පෞද්ගලික ජීවිතය යන දෙකෙහිම දරිද්‍රතාව නිසා ප්‍රකට වන ලක්ෂණ ගණනාවක් හඳුනා ගත හැකි බව මේ ලිපියේ IV සහ V කොටස් දෙකෙහි දැක්වෙන නිදර්ශනවලින් පෙනීයයි. මෙතෙක් සාකච්ඡා කළ දෙයෙහි සම්පිණ්ඩනයක් අවශ්‍ය පාඨකයෙකුට නැවතත් 'මැදින් ලියූ නිගමනාත්මක සටහන්' හිසින් යුතු III වන කොටස කියවා බැලිය හැකිය.

## VI. ''හැම පාට කුඩ අතර මම කළු කුඩයක්'': තෝරා ගැනුණු කුරුටු ගී කිහිපයක් ගැන ඉතා කෙටි සාහිත්‍ය විමසුමක්

දරිද්‍රතාව නමැති තේමාව යටතේ එකතු කරනු ලැබූ කුරුටු ගී සමුච්චය අතර අතිශයින් නිර්මාණශීලී කුරුටු ගී ගණනාවක් වෙයි. මෙම ලිපියේ මුඛ්‍ය අරමුණ අනුව කරන ලද ප්‍රධාන සාකච්ඡාව අහවර වීමෙන් පසුව, එම අරමුණෙන් මඳක් අපගමනය වී වුව ද, තෝරා ගැනුණු කුරුටු ගී කිහිපයක් ගැන පමණක් ඉතා කෙටි සාහිත්‍ය විමසුමක් කරන්නට අප පොළඹවාලූයේ කුරුටු ගීවල ඇති ඒ නිර්මාණාත්මක ගුණයයි. මෙම කොටසෙහි මාතෘකාවේ ඇතුළත් වන ඉතා සංක්ෂිප්ත කුරුටු ගීය මේ එකතුවෙන් ලබා ගත් කුරුටු ගීවල නිර්මාණාත්මක බවේ සංකේතයක් ලෙස ගත හැකිය. පහත නිදසුන බලන්න.

සිද්ධාර්ථයෙනි
නුඹට මෙන්
අපට අභිනිෂ්ක්‍රමණය
කළ නොහැක.
මන්ද

නුඹට මෙන් අපට
සෘතුවෙන් සෘතුවට
සත් මහල් ප්‍රාසාද
රජ බොජුන් ද
නොමැති බැවිනි.

(කොළඹ)

සිද්ධාර්ථ අභිනිෂ්ක්‍රමණය කළේය. එහෙත්, අභිනිෂ්ක්‍රමණය කරන්නට නම් හැර යාමට දෙයක් තිබිය යුතුය. හැර යාමට දෙයක් නැති තැන හැර යාමක් ගැන සිතීම තේරුමක් නැති දෙයකි. මෙහි දී රචකයා අභිනිෂ්ක්‍රමණය යනු ගිහිගෙය හැර යාමය යන්න වෙනුවට සැප සම්පත් හැර දැමීම ලෙස ගත්තත් ඉන් රස වින්දනයට බාධාවක් නොවන්නේ එදිනෙදා ව්‍යවහාරයේ දී බොහෝ දුරට අභිනිෂ්ක්‍රමණය යනුවෙන් ගැනෙන්නේ සැප සම්පත් හැර යාම බැවිනි.

සඳුන් ගැටක් මා අත නම් නෑ රැඳුනේ
පියුම් හතක් පා යට නම් නෑ පිපුනේ
මුඩුක්කු සල්ගස හෙවණේ වැඩුනේ
සිද්ධාර්ථ නම පමණයි මට තිබුණේ

(කොළඹ)

සිද්ධාර්ථට තිබූ සුව පහසු දිවියේ සේයාවක්වත් තමන්ගේ ජීවිතයට වැටී නොමැති මේ කථකයාට සිද්ධාර්ථ යැයි නම් තබනු ලැබ තිබේ. ජීවිතයේ එබඳු උත්ප්‍රාසයකට මුහුණදීම තරම් තවත් සරදමක් තිබේ ද?

අවසානයි
සිව් වසරක යුද්ධය
නමුත්
සුදු පරෙවියා නම් රැකියාව
අහලකවත් නැත

(කොළඹ)

උපාධිය ලබා ගැනීම යුද්ධයකි. එය කොතෙකුත් දුෂ්කරතාවලින් පිරුණු අරගලයකි. සිව් වසරක් ගෙවී ඇත. ඒ මුළු මහත් කාලය පුරා අඛන්ඩව තිබූ යුද්ධය නිමා වී ඇත. යුද්ධය අවසානයේ සාමයේ සුදු පරෙවියා ප්‍රාදුර්භූත විය යුතුය. එහෙත් රැකියාව නම් සාමයේ පරෙවියා පේන තෙක් මානයක නැත. එහි තේරුම යුද්ධය තවම අවසාන නැති බවයි. ආයුධ බිම තබා ඉසුඹුලන්නට ඉස්පාසුවක් නැති බවයි. තව දුරටත් යුද්ධයේම නිරත වන්නට සිදු වන බවයි.

හයිකු කවියක හැඩ රුව ඇති පහත කුරුටු ගීය දරිද්‍රතාව පිළිබඳ ප්‍රබල ප්‍රකාශයකි.

කැන්ටින් තේ එක
අද හරිම රස්නෙයි
කෝප්පෙට උනත් දැනෙනවා
අඬුව නැති එකේ
පාඩුව

(කොළඹ)

අඬුව ඇත්නම් තේ එක අත පුච්චා නොගෙන බොන හැකිය. එහෙත් විශ්වවිද්‍යාල කැන්ටිමේ තේ බොන කෝප්පවල අඬුව නැත. විශ්වවිද්‍යාල එහෙමය. අඬුව නැති උනත් තේ බොන්නට සිදුවන්නේ ඒ කැන්ටිමෙන්මය. ඒ මිලට තේ ලැබෙන්නේ විශ්වවිද්‍යාල කැන්ටිමෙන් පමණක් බැවිනි. තේ එක කොතරම් රස්නෙද යත් කෝප්පෙට උනත් අඬුව නැති අඬුව දැනෙයි. අඬුව නැති නිසාවෙන් කෝප්පයට දා ගත් තේ ටිකවත් රස්නෙන් බොන්නට බැරිය. ඇල් මැරෙන තෙක් සිටිය යුතුය. තේ බොන්නාත් විශ්වවිද්‍යාලයත් දෙකම අඬුව නැති කෝප්පය වැනිය. දුප්පත්කමත් වලිගය නැති ගොනා වැනිය යන්නත් ඒ අස්සේ අපේ මතකයට එයි. අඬුව නැති කෝප්පයෙන් තේ බොන්නාත්, විශ්වවිද්‍යාලයත් යන දෙපාර්ශවයේම දරිද්‍රතාවත්, අසරණ බවත් ගම්‍ය වෙයි.

අනේ දෙවියනේ
දෙනෝ දාහක්
යාන්තම් කුස පුරවගෙන
අකුරු කරනා සඳ
නුඹේ පඬුපුල් අසුන
උනු නොවන්නේ
එය පුද්ගලීකරණය වුනා වත්ද?

(පේරාදෙණිය)

මෙච්චර දෙනෝ දාහක් කුසගින්නේ අකුරු කරද්දීත් පඬුපුල් අසුන උණු වන පාටක් පේන්නට නැත. ඊට හේතුව පඬුපුල් අසුන පුද්ගලීකරණය වීම දැයි කථකයා අසන්නේ සමච්චලයෙනි. මෙතෙක් කලක් රජයේ විශ්වවිද්‍යාලවලට රත්වෙන පඬුපුල් අසුනක් තිබුණේය. ලාභ ඉපැයීමේ චේතනාවෙන් ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි අංකයක් ලබාගෙන ක්‍රියාත්මක වන පුද්ගලික අධ්‍යාපන ආයතනවල පඬුපුල් අසුන ක්‍රියා විරහිතය. දැන් දැන් රජයේ විශ්වවිද්‍යාලවලත් පඬුපුල් අසුන ක්‍රියා විරහිත වේගෙන එයි. අධ්‍යාපනය ශීඝ්‍ර ලෙස පුද්ගලීකරණය වෙමින් ඇති, රාජ්‍ය අධ්‍යාපනය වෙළඳපොළ බලවේගවලට අසුවී ඇති රටක කථකයා අසන ප්‍රශ්නය අතිශයින් සාධාරණය.

අග්නිදිග විශ්වවිද්‍යාලයෙන් ලැබුණු මේ කුරුටු ගීය දරිද්‍රතාවට වර්ණයක් යෝජනා කරයි. ඒ කාල වර්ණයයි.

කුසගින්නේ පීඩාවෙන්
ඇස් අන්ධ වී අගුළු වැටුණු කන්
දිව ගිලී ක්ලාන්තව වැටුණු විට
හැඟුනි මට
ඇති බව වර්ණයක් දිළිඳුකමට ද
එය කාල වර්ණවයි

(අග්නිදිග)

දරිද්‍රතාවයට කාල වර්ණය යෝජනා කිරීම ඉතා උචිතය. මක් නිසා ද යත්, කාල වර්ණයට අන් සියලු වර්ණ ගිල ගත හැකි බැවිනි.

# සරසවි කුරුටු ගී - කාව්‍යමය විමර්ශනයක්

**ඩබ්ලියු. ඒ. අබේසිංහ**

පෙර අපර දෙදිග කවර මුත් සාහිත්‍යයක් දෙස බැලුවද, කවිය හෙවත් පද්‍යය තරම් නිර්වචනවලට භාජනය වූ අනෙක් සාහිත්‍යාංගයක් දැකිය නොහෙයි. සැබැවින්ම, කවියට දක්වන ලද නිර්වචන සංඛ්‍යාව අතිවිශාලය. අද වුව, කවියට අලුතින් එකතු වන නිර්වචන සංඛ්‍යාව සුළුපටු නොවෙයි.

පණ්ඩිත වැලිවිටියේ සෝරත නාහිමියෝ ස්වකීය අතිප්‍රශස්ත ශ්‍රී සුමංගල ශබ්දකෝෂයෙහි "කවි" යන පදයට මෙසේ අරුත් දක්වති.

(1) කාව්‍යය, (2) කාව්‍යයක් කරන්නා, (3) උගතා, පණ්ඩිතයා, ප්‍රතිභානයෙන් යුක්තයා, (4) සිතුරා.

මහාචාර්ය ගුණපාල මලලසේකර "Poetry" යන ඉංගිරිසි වදනට අරුත් කියන්නේ මෙලෙසිනි.

''කාව්‍යය, පද්‍යය, කවිත්වය, කාව්‍ය සංග්‍රහය, කාව්‍ය ශාස්ත්‍රය, උසස් චේතනා ඇති කිරීමේ ශක්තිය.''

කාව්‍යය යන පුළුල් වදන, පොදුවේ ගද්‍ය-පද්‍ය, චම්පු යන කාව්‍ය ප්‍රභේද තුනම හැඳින්වීම සඳහා යෙදුණේ වී නමුත්, සාමාන්‍ය සාහිත්‍ය විග්‍රහයේදී කවිය යනු, පද්‍යය - පැදිය - උදෙසාම යොදා ගැනෙන බැව් ප්‍රකට කාරණයකි. එසේ හෙයින්, මෙතැන්හිදී කවිය යනුවෙන් පද්‍යයම ගැනෙන බැව් සැලකුවමනාය.

කවිය පිළිබඳ වන පුළුල් නිර්වචනවලට පැමිණෙන්ට පෙර, ශබ්දාර්ථ විසින් ගත්තද, කවිය යනු, ප්‍රතිභාන ශක්තියෙන් යුක්ත වූ, උසස් සද් චේතනාවලින් යුතු වූ තැනැත්තකු විසින් නිමවන ලද, සහෘද සිත්හි චමත්කාරය දැනවෙන පරිදි නිර්මිත, අපූර්ව හෙවත් අභූතපූර්ව - පෙර නොවූ විරූ - නිර්මාණ විශේෂයක් බැව් නිගමනය කිරීම අපහසු නොවෙයි.

අතිශයින්ම සුප්‍රකට වූත් සම්භාවනාවට පාත්‍ර වූත් නිර්වචනය වනුයේ, "රසය ආත්ම කොටගත් වාක්‍යය" කවිය බවය. විශ්වනාථ නමැති පඬිවරයා "වාක්‍යං රසාත්මකං කාව්‍යම්" යන සම්භාවිත වැකියෙන් පැවසුවේ, එම කාරණයයි. ඒ අනුව, කවියෙහි ආත්මය රසය විය යුතු වන්නේය. තවත් වචනවලින් කිවහොත්, කවියක අභ්‍යන්තරයෙහි ගැබ්ව තිබිය යුත්තේ, මෙම රසය යන මූලික කාරණයයි.

එ කරුණම තවත් ඉදිරියට ගෙන යන කවිකණ්ඨාභරණය පවසන්නේ, "විශිෂ්ට වූ ශබ්දයෙන්ද අර්ථයෙන්ද අලංකාර වූ වාක්‍යය" කවිය බවය. "කාව්‍යං විශිෂ්ට ශබ්දාර්ථ සාහිත්‍ය සදලංකෘති."

එපරිදි කවිය අභ්‍යන්තරයෙහි, අරුත හා ශබ්දය පැවතිය යුතුය. මේ අරුතත් ශබ්දයත් විශිෂ්ට විය යුතුය.

ඇරිස්ටෝටල් නමැති සම්භාව්‍ය ග්‍රීක පඬිවරයා කාව්‍ය ශාස්ත්‍ර වේදයෙහි (Poetics) කියා සිටින්නේ, "අභ්‍යන්තර ගුණ සමුදායකින් විශිෂ්ටත්වයට පත් වූ රචනාවම" කවිය බවය.

ඇරිස්ටෝටල්ගේ ඒ මතයට එන විට, රසය පිළිබඳ මූලික සංකල්පය වඩාත් විශේෂණය කොට දැක්වෙන බැව් පෙනී යයි. ඉන් පැවසෙනුයේ, සහෘද මනසෙහි ඇති කෙරෙන හුදු චමත්කාරයම රසය නොවන බවය. රස නිෂ්පත්තිය - රස නිපදවීම - කවිය වුවද, එසේ උපදවනු ලබන රසයෙහි විශේෂ ගුණයක් තුබුවමනාය. කවරක්ද, ඒ ගුණය? අන් කිසිවක් නොවේ. ඇරිස්ටෝටල් කියන "අභ්‍යන්තර ගුණ සමුදායයි." ඒ අනුව, නිර්මාතෘගේ සද් චේතනාව, කවියෙහි හරය තුළ හඳුනාගත හැකි විය යුතුය.

කවිය පිළිබඳව පෙරදිග මෙන්ම අපරදිගද, නොයෙකුත් වාද විවාද - මත ගැටුම් - ඇති වූ බව නොරහසකි. එහෙත් මේ හැම මතවාදයන්ගෙන්ම සිදුව ඇත්තේ, කවිය වඩ වඩාත් සංකීර්ණ වූද විදග්ධ වූද නිර්මාණ විශේෂයක් හැටියට හුවා තැබීමය. වෙනත් වචනවලින් කිවහොත්, සහෘදයා තුළ චමත්කාරය දැනවෙන වඩ වඩාත් සංකීර්ණ වූද, සියුම් වූද, කලාවක් හැටියට - නිර්මාණ විශේෂයක් හැටියට - කවියට හැඩ ගැසෙන්ට වූයේය.

## II

සරසවි කුරුටු ගීත සාහිත්‍යමය සහ සමාජ විද්‍යාත්මක විග්‍රහයක් යන හිසින් සම්පාදිත මෙම කෘතිය, විශේෂ වශයෙන්ම ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සිප්සත හදාළ සහ හදාරන සිසු සිසුවියන් විසින් වරින් වර ලියන ලද, නම් සඳහන් නොවන හෙයින් ''අඥාත'' වූ, නිර්මාණ සංඛ්‍යාවක් පිළිබඳ අධ්‍යයනයකි.

ඒ වනාහි, එකතු කරගන්නා ලද රචනා අතිවිශාල සංඛ්‍යාවකින් තෝරාගත් නිර්මාණ ප්‍රමාණයක් මගින් කරන ලද පර්යේෂණයක් හෙවත් අධ්‍යයනයක් බැව් සැලකුවමනාය. ප්‍රස්තුත කෘතියෙහි මූලික අභිප්‍රාය වී ඇත්තේ, මෙහිලා සංගෘහිත නිර්මාණයන්ගේ සමාජ වැදගත්කම විමසා බැලීමය.

එතෙකුදු, මෙම ලේඛනයෙහි මූලික අභිප්‍රාය වනුයේ, ඒවායේ සමාජ විද්‍යාත්මක වැදගත්කම හා විශේෂත්වය විශ්ලේෂණය කිරීම නොව, එකී නිර්මාණයන් කාව්‍ය කෘතීන් වශයෙන් කවර තත්ත්වයක් භජනය කෙරෙන්නේද යන වග විමසා බැලීමය.

මෙහිලා සංගෘහිත නිර්මාණ සම්බන්ධයෙන් නමෝ විත්තියෙන්ම සඳහන් කළ යුතු මූලිකම කාරණය වනුයේ, ඒවා කාව්‍ය විචාරය පිළිබඳ දැඩි ශික්ෂණයක පිහිටා විමර්ශනය කිරීම අසීරු බවත්, එසේ කිරීම අසාධාරණ බවත්ය. පූර්ණ වශයෙන් කාව්‍ය නිර්මාණයකට අවශ්‍ය වන්නා වූ මූලික ශික්ෂණය, මෙම ශානරයේ නිර්මාණවල - කුරුටු ගීවල - දක්නා නොලැබෙන බැවිනි. කාව්‍ය නිර්මාණයක් බිහි වීමට අවශ්‍ය වන්නා වූ කාව්‍යානුභූතීන් හෙවත් අත්දැකීම්, ප්‍රතිභාවෙන් උපත ලැබ, ව්‍යුත්පත්තියෙන් පෝෂණයව, සතතාභ්‍යාසයෙන් පරිසමාප්තියට පත්ව ප්‍රතිනිර්මාණය විය යුතු බැව් අවිවාදිත කාරණයකි.

එකී ආස්ථානයෙහි පිහිටා මෙම රචනාවන් විමර්ශනයට භාජනය කිරීම අසීරු බැව් පෙන්වා දිය යුතු මූලිකම කාරණය වෙයි.

මෙම නිර්මාණයන්හි විශේෂතා අධ්‍යයනය කළ යුත්තේද, ඒවා විමර්ශනය කළ යුත්තේද, ඒවා තුළ කිසියම් ප්‍රමාණයක කාව්‍යමය ගුණයක් ඇතොත් එය විග්‍රහ කළ යුත්තේද, ඉහත කී කරුණු සැලකිල්ලට ගැනීමෙනි. එසේ හෙයින් මෙම කෘතීන්ගෙන් බහුතරය 'කාව්‍ය රචනා' හැටියට නොව, 'හුදු පද්‍ය රචනා' හැටියට සැලකීම මැනවැයි සිතේ. පරිසමාප්ත කාව්‍ය නිර්මාණයකින් ලැබිය යුතු ගැඹුරු භාවමය ප්‍රකම්පනය මෙම රචනාවන්ගෙන් අපේක්ෂා කිරීම යුක්තිසහගත වෙතැයි කිව නොහෙන හෙයිනි.

එපරිදි මේ රචනාවලින් බහුතරය හැඳින්විය යුත්තේ, කවි හැටියටම නොව, පද්‍යකරණ (Versifications) හැටියටය. මලලසේකර ශබ්දකෝෂය "Poet" යන වචනයට අරුත් කියන්නේ, කවියා, කිවිවරයා යනුවෙනි. "Versifier" යන වදනට අරුත් දක්වන්නේ කවිකාරයා යනුවෙනි.

එසේ හෙයින් මෙම 'නිර්මාණයන්හි' රසය විමසනුවට වඩා, ඒවායේ අපූර්වත්වය - ප්‍රකාශන විෂයයේ - ප්‍රකාශන විධියේ සහ ප්‍රකාශන ශක්තියේ අපූර්වයම විමසා බැලීම උචිත සේ පෙනී යයි.

මූලික වශයෙන්ම සැලකිල්ලට ගත යුතු කාරණය වනුයේ, මෙම රචනා කුරුටු ගී "Graffiti" නමැති ශානරයට අයත් වන බවය. සුප්‍රකට වෙබ්ස්ටර් ජාත්‍යන්තර ශබ්ද කෝෂය "Graffiti" යන වදනට අරුත් කියන්නේ මෙලෙසයඃ

"Any design or scribbled motto etc., drawn on a wall or other exposed surface."

"බිත්තියක හෝ වෙනත් ආවරණය කරන ලද මතුපිටක අඳින ලද චිත්‍ර සටහන හෝ කුරුටු ගා ලියන ලද ආදර්ශ වාක්‍යය."

එකී නිර්වචනයට අනුව කුරුටු ගීයක් රසය ආත්ම කොටගත යුතු බවක්, කැලම පැවසෙන්නේ නැත.

එතෙකුදු, මෙම අධ්‍යයන කෘතියෙහි එන කුරුටු ගීවල අපූර්වයක් ඇත්තේය. ඒ අපූර්වය ඇත්තේ ඒවායෙහි ප්‍රකාශන ශක්තියෙහිය. තවත් විස්තර කොට කිවහොත්, ඒ අපූර්වය රඳා පවත්නේ, ප්‍රකාශන විෂයයෙහි මෙන්ම ප්‍රකාශන විධියෙහිය.

මෙම අධ්‍යයනයට යොදාගෙන ඇති කුරුටු ගීවල විෂයභූමි විමර්ශනයෙහිදී ඒවායේ විවිධත්වය තරමටම ඒකාකාරිත්වයක්ද ඇති බැව් පෙනී යයි.

උපාධි ඉරණම, දෙගුරුන් නැමඳුම, යුද්ධය, සරසවි අධ්‍යාපනය, සමුගැනීම, නිදහස් චින්තනය, දරිද්‍රතාව, ආදරය, මිතු දම, විරහව යන කාරණා දශකය මෙම අධ්‍යයනයෙහි විමර්ශනය කෙරෙන බැව් දක්වා ඇත.

## III

තෝරාගත් රචනා කිහිපයක් විෂය කොටගෙන මතු දැක්වෙන විමර්ශනය කෙරෙනුයේ එකී පදනම මත පිහිටාය.

බොහෝ රචනාවන්ට විෂය වී ඇත්තේ, සරසවි ජීවිතයේ කටුකභාවයයි. ඇතැම් රචනයක කිසියම් කවිත්වයක ඡායාමාත්‍රයක්ද දැකිය හැක.

"නිදිමරලා ක්‍රෑම දාල තට්ටෙ ටිකක් පෑදිලාය
දවස තිස්සෙ වාඩි වෙලා ඇට කුට්ටම් පොඩිවෙලාය
ක්‍රෑම දාලා මුළු දවසෙම ඇස් දෙක ලොවි ගෙඩි වෙලාය
කවදාහරි තෝ මැරෙන්නෙ පොතක් අස්සෙ හිරවෙලාය"

රුහුණු සරසවියෙන් සොයාගත් ඉහත දැක්වුණු රචනයෙහිලා, කවියා අමතන්නේ තමාටමය. එහි කිසියම් ආත්ම කථනයක (soliloquy) සේයාවක්ද, දැකගත හැක්කේය. "ඇස් දෙක ලොවිගෙඩි වෙලාය" වැනි යෙදුම්වල කවි ගුණය ඉස්මතුව පෙනෙයි.

තවත් රචනාවකදී කුරුටු ගී රචකයා උපාධිය නිසා තමා විඳින දුක දක්වන්නේ මෙපරිදිය.

"ඉන්නේ බෝඩිමක මහ ලොකු ළිඳක් ළඟ
කන්නේ ජිම් එකෙන් රුපියල් 20කට
බොන්නේ ප්ලේන්ටිය එහි කිසි රහක් නැත
ඩිග්රිය නිසා මා විඳිනා දුක"

එකී කවිය අවසන් කර ඇති බවක් නොපෙනෙයි. මෙද, ආත්මභාෂණයක් වැන්න.

ඇතැම් රචනයකින් මතුව පෙනෙන්නේ ප්‍රබල උත්ප්‍රාසයකි.

"විශ්වවිද්‍යාලය
නිසරු මුඩු කෙතයි
කෙතට බැඳී ඇදුරු
පඹයන් රැසකි
අරුණෝදයේ සිට රෑ බෝ
වන තෙක්
මොට වූ නගුල් අදින
කැහැටු හරක් රැසකි
කපක් සීසෑවත්
නොලැබෙන
අස්වැන්නකි....
(සත්‍යයේ සටහන බුද්දියේ විමසුම)"

කොළඹ සරසවියේ මෙම රචකයා, තම විශ්වවිද්‍යාලය දකින්නේ නිසරු මුඩු කෙතක් සේය. එහිලා ඔහු යොදාගන්නා කාව්‍ය රූපයන්හි සුවිශේෂ වූ ප්‍රබලත්වයක් දැකිය හැක. සරසවි ඇදුරු පෙළ, ඒ නිසරු ඒ කෙතට බඳින ලද පඹයන් වැන්න. සිසු සිසුවියෝ උදේ සිට රෑ බෝවන තෙක් නගුල් අදින කැහැටු අම්බරුවන් රැනකි. එවන් රූපක භාවිතය හේතුකොටගෙන, මෙම පද්‍යයේ කාව්‍යමය ගුණය ඉස්මතුව පෙනෙයි.

තවත් රචනා පෙළක දැකිය හැකි විශේෂත්වය නම්, ඒවායේ පද සංඝටනාව හෙවත් ශබ්ද රසයයි. රිද්මයානුකූලබව මෙන්ම, රචකයින් විසින් උපයෝගීකොටගෙන ඇති ජනකවි රීතියද, ඔවුන්ගේ කවි ශික්ෂණය පළ කරයි.

"හිඟා කන්න බෑ අතපය ඇති හින්දා
මැරී වැඩක් නෑ යළි ඉපදෙන හින්දා
ඉගෙනීමත් දුකයි බර බර වැඩි හින්දා
අනාගතේ මොනවා වේවිද මන්දා"
"කුසගින්නේ සිටිනා විට අපෙ අම්මේ
නෑ වැලපුණේ කිසිදා මම බඩගින්නේ
මේ හැම වෙලේ නුඹ සිහි වන විට අම්මේ
සරසවි උපාධිය කටු ඔටුන්නක් අම්මේ"

එකී රචනා දෙකම පිටපත් කරගෙන ඇත්තේ, ශ්‍රී ජයවර්ධනපුර සරසවි බිත්තියකිනි.

"අල්ලට සිඟාවත් රස නැති කැවිලි කකා
ලෙක්චර් හෝල්වල ලැග්ගා මකුණො කකා
සිව් අවුරුද්ද ගෙවනට මරු පහර නොකා
පිං දී ගන්නවා මහපොළ සිඟා කකා"

රුහුණු සරසවියෙන් සොයාගත් එම රචනය ලියැවී ඇත්තේද ජනකවි රීතියෙනි. එහි සැඟව ඇති උත්ප්‍රාස හඬද කවිය එළිය කරයි.

තරුණ වියේ සරසවි සිසු සිසුවියන් වඩාත්ම හැඟුම්බර වන්නේ, සරසවි ජීවිතයේ නිමාව දකින අවධිය ළං වන විටය. පේරාදෙණිය සරසවියේ කුරුටු ගී රචකයකු පවසන්නේ, සරසවිය දමා යන්ට තමාට හිතක් නැති බවය. ඒ, ඔහුගේ පෙම්වතියද එහි දමා තනිකර යා යුතු වන නිසාය. එවිට හන්තාන ඔවුන් වෙන් කරන පවුරක් වනු ඇත්තේය. පෙම්වතිය සරසවි බිමෙහි තනි වන්නේ වියෝ දුකිනි. හන්තාන ඇගේ ඒ දුක සඟවන්ට බැඳි පවුරකි. මහවැලිය ඒ දුක කියාගෙන ඇදී යන සෝ ගඟකි. භාවාතිශය වන නමුදු, රචකයාගේ ප්‍රේමයේ අව්‍යාජත්වය පහත දැක්වෙන රචනයෙන් මොනවට පළ වෙයි.

"නැත යන්න සිතක්
දමා ඔබ සරසවිය
අද ඔබට සහ මට
සෙවණක් දුන් හන්තාන
සිහිල දුන් මහවැලිය
මා ඔබ දමා ගිය පසු
සරසවියේ තනිකර
පවුරක් වේවි හන්තාන
ඔබෙ දුක් මගෙන් සඟවන්නට බැඳි
සෝ ගඟක් වේවි මහවැලිය
ඒ දුක කියා දිව ඇදෙන"

එපරිදි සරසවි ප්‍රේමය මෙම අධ්‍යයනයෙහි දක්වෙන රචනා රසක නිමිත්ත වෙයි. සරසවි ප්‍රේමය පිළිබඳව විශේෂ කොට දක්විය යුතු තවත් රචනා කිහිපයක් මෙසේය.

"කළුවර රැක වැස්ස වී වහින්නම්
තෙමෙන්නට එනවාද අතින් අත
අල්ලාන හුඟක් දුර ඇවිදින්න නෙමෙයි
ළං වෙලා මට
අඬන්නට එනවාද?"

මෙම රචකයා මොරටුව සරසවියේ ශිෂ්‍යයෙකි. "කළුවර රැක වැස්ස වී වහින්නම්" යන යෙදුම ඔහුගේ සියුම් කවි ශික්ෂණයට නිදසුනි.

කොළඹ සරසවියේ කුරුටු ගී රචකයකු කියන්නේ, "ආදරය.... නොසිඟන අය සිඟමන් යවන, නොදැවෙන අය දවා අළු කරන, නොමැරෙන අය නොමරා මරන" බන්ධනයක් බවය.

"මැලවුණු මල් බිම පතිත කරන්නට
සුළඟට ඉඩ දෙන ගහට දුකක් නෑ
හදවත සැනසූ එකම මලක් ගැන
මට ඇති කැක්කුම ලොවට දැනෙන් නෑ"

එසේ පවසනුයේ පේරාදෙණිය සරසවියේ අංකුර කවියෙකි. කොළඹ සරසවියේ රචකයකු ලියන පහත දැක්වෙන කවිය තුළ නිරූපිත ප්‍රේමය, වඩාත් භාවාත්මක අයුරින් පළ කෙරෙයි.

"සඳ එළිය සුන්දරයි
හැමදාම
ඒත් මම දුර වැඩියි
නුඹ සේම
තරුවක්ව හිත ළඟින්
රැඳුණාම
නුඹට සිත පෙම් බැන්දා
පෙර බෝම
කඳුළක්ව නෙතින් දුර
ඇදුණාම
අමතකව යයිද මට
හැමදේම
අහිමි බව දැන දැනම
ඉඳුරාම
මම නුඹට ආදරෙයි
හැමදාම...."

ජයවර්ධනපුර සරසවියෙන් සොයාගැනුණු ආදරය ගැන ලියූ රචනා අතර දක්නට ලැබුණු විශේෂ රචනයක්, මේ බැලුව මැනවි.

"විදුලිය සේ මෘදු කෝල බැලුම් ඇති
මහ අකුණක් සේ කෝමල බස් ඇති
සිංහ ධේනුවක් සේ හුරතල් ඇති
නුඹෙන් ලැබුණ උණුසුම පමණක් මදි;"

මෙම රචනයේ ව්‍යංග්‍ය රීතිය ප්‍රබලය. ඔහු සිය පෙම්වතිය අමතා කියන්නේ, ඇගේ කෝල බැල්ම විදුලිය වැනි බවකි; ඇගේ බස මහ අකුණක් සේ කෝමල බවකි;. ඇගේ හුරතලය සිංහ ධේනුවකගේ වැන්න. තමාට ඒ උණුසුම පමණක් මදි යයි කවියා කියයි. මෙම කවිය තුළ වන ප්‍රතිවිරුද්ධාභාෂය (paradox), හොඳ කාව්‍යමය ප්‍රකාශනයකට මඟ පාදයි. තමා පෙම් කරන්නේ අහංකාර තරුණියකට බැව් කවියා පවසන්නේ ප්‍රබල රීතියකිනි.

එබඳුම උත්ප්‍රාසයකින් ලියවුණු තවත් රචනයක් මෙසේය.

"හීනෙන් ඔබ මට පෙනෙනව නම්
කොට්ට පුළුං කන්නම්
කිසිදා ඔබේ අත නොලැබේ නම්
මෙට්ට කොහුත් කන්නම්"

මෙම රචනයේ විශේෂත්වය වනුයේ, කවියාගේ ඇතුළු හදට යොමු වුණු සිතිවිල්ලයි. ඔහුගේ කාව්‍ය රචනා ආස්වාදකර වන්නේ, එතුළ සැඟවුණු හාස්‍යයේ ඡායා මාත්‍රයද නිසාය.

දැන් පහත දැක්වෙන රචනා දෙක කෙරෙහි අවධානය යොමු කළ මැනවි.

"දෙනෙත් කඳුළැලි- ගලයි නැහැවෙයි
සුසුම් හදවත - දවයි රිදවයි
මගේ ලොව අද - තනියි පාළුයි
ඇයි රිදෙව්වේ - මටයි හිතටයි"

"හන්තානේ කඳු මුදුන වගෙයි නුඹ
අහසට ළං වී කවි කියනා
කඳු පාමුල තණ පඳුරක් වී
ඉන්නම් පොළොවට දුක් මුමුණා"

මේ නම්, දිනාගත නොහැකි ප්‍රේමයකි. එය පැවසෙනුයේ නැවුම් වූ නිර්මාණාත්මක රීතියකිනි. එහිලා උපයුක්ත කවි රූප හෙවත් උපමා රූපක රචකයන්ගේ සියුම් කවි ශික්ෂණයට නිදසුනක් වැන්න. දෙවැනියට දැක්වුණු රචනයෙහි කවියාගේ පෙම්වතිය,

හන්තානේ කඳු මුදුන වගේය. ඇය අහසට ළං වී කවි කියන්නීය. කවියා පොළොවට දුක් මුමුණන කඳු පාමුල තණ පඳුරකි. "හන්තානේ කඳු මුදුන" ගැන පැවසුවද, එකව ලියා ඇත්තේ කොළඹ සරසවියේ සිසුවෙකි.

"සඳ නැති නිල් අහස
මුළු ලොවම එළි කරයි
ඒත් නුඹ දන්නවද
සඳ එළිය පොළවටයි
සඳ අයිති අහසටයි
මල් පිපී නටු අගක
මුළු ලොවම සුවඳ දෙයි
ඒත් නුඹ දන්නවාද
මල් සුවඳ ලොවටමයි
මල් අයිති ගහටමයි"

මෙයද එබඳුම ප්‍රේමායාචනයකි. කවියාගේ සිතිවිලි ගැටලු සහගත වුවත්, සිය පෙම්වතිය තමා සතු විය යුතුම බැව් ඔහු කියන්නේ, ඍජුව නොවෙයි. ව්‍යංග යෙනි. ඇඟවෙන පරිද්දෙනි.

"පැතුම් ඉටු වෙන දිනක් ඒවිද
පෑ පැතුම් හැම බොඳ වෙලා
සිනා සෙන්නට වරම් නෑ මට
කඳුළු නෙතු අග පරවෙලා
සුසුම් ලන්නට නෑ තවත් ඉඩ
සුසුම් හද තුළ සිරවෙලා
නික්ම යන්නට අවසරයි මට
නුඹේ ලෝකෙන් වෙන් වෙලා"

ජයවර්ධනපුර සරසවියෙන් සොයාගත් රචනයකි. බලාපොරොත්තු සුන් වුණු කවියා කොළඹ යුගයේ කවි රීතියෙන් ලබන ලද ශික්ෂණය මෙම කවියෙන් පළ වෙයි. සරසවි බිත්තිවල කවි ලියූ ඇතැම් රචකයෝ ඊට කලින් කවියෙහි කිසියම් හුරුවක් - හික්මීමක් - ලැබූ අය වෙති. මෙවන් රචනයක් කළ හැක්කේ, කලින් ලබන ලද ඒ හැකියාවත් ප්‍රවීණත්වයත් ඇත්නම් පමණි.

# IV

කැලණිය සරසවියෙහි ලියා තිබුණු කුරුටු ගීයක පද පෙළ මෙසේය.

"නරියා හූ තියයි උෟ ළඟ ඩිග්රි නැතී
එළුවට රැවුළ ඇත, වාසිටි ආවෙ නැති
මට ඒ දෙකම ඇත, එනමුත් නුවණ නැති
සහතිකවලට මිස ඩිග්රිය පලක් නැති"

කාව්‍යමය උත්ප්‍රාසයකින් යුතු එම පැදිය තුළ සැඟව ඇති යථාර්ථයට පිටුපාන්නට කෙනෙකුට බැරිය. නරියාට හූ කිව හැකි මුත්, ඔහු සතු වන උපාධියක් නැත. එළුවාට රැවුළ ඇති මුත්, උෟ සරසවි පැමිණියේ නැත. මෙම පැදිය ලියන තරුණ ශිෂ්‍යයාට හූ කීමේ හැකියාව ඇත. ඔහුට එළු රැවුළක්ද ඇත. ඒ දෙකම ඇතත්, තමා තුළ නුවණක් නැතැයි ඔහු ළත වෙයි. උපාධිය හුදු සහතිකයක්ම පමණි.

වක්‍රෝක්තිය මොනවට යොදා ගනිමින් ලියා ඇති එම පැදිය ගෙනහැර දක්වන යථාර්ථය ප්‍රබලය. උගත්කම ලැබූ තරුණයකු තම ලෝකය අවලෝකනය කරන්නේ, තියුණු නුවණැසිනි. තමාම හාස්‍යයට ලක් කරගැනීමෙන් ඔහු දක්වන නිහතමානි ගුණය, මෙම රචනයේ කවි ගුණය තවත් එළිය කරයි.

"මා මළ කලක සොයුරනි නිදහස මත්තේ
විදුදය මවට ගෞරවයක් විය යුත්තේ
සියලුන් නොබැලුවත් මගෙ මළ කඳ මත්තේ
ජපුරට හිස නමා මිහිදන් කළ යුත්තේ"

ඉහතින් දැක්වුණේ, එදවස විදුදය සරසවිය වූ මෙදවස ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් සොයාගත් කුරුටු ගීයකි. සිසු වහරෙහි මෙම සරසවිය හැඳින්වෙන්නේ, "ජපුර" කියාය. මෙම රචකයා ශිෂ්‍ය සටන්වල - සිසු අරගලවල - කැපව සිටියකු බැව් පළ වෙයි. ඔහු උපාධියක් ලද හෝ නොලද හෝ වගක් එහිලා නොපැවසෙයි. සිසු දිවියෙහිදී ඔහුගේ එකම අරමුණව ඇත්තේ, සිසු සටන්ම පමණි. තම සටන පොදු අරමුණක් උදෙසාය. රචකයා කියන ''නිදහස'' කවරක්ද යනු පැහැදිලිව නැති නමුදු, ඔහු සටන් කරන්නේ විදුදය සරසවිය වෙනුවෙනි. තමා මළ පසුව ජපුරට හිස නමා (ඇතැම් විට හිස එදෙසට තබා) මළ සිරුර මිහිදන් කළ යුතු යයි ඔහු කියන්නේ එබැවිනි.

භාවාතිශය වූ මෙම පැදියෙහි ඇත්තේ හුදු රොමාන්තික ගුණයම බැව්, අමුතුවෙන් පහදා දිය යුතු නැත. එතෙකුදු, මෙම භාවාතිශය ගුණය, ඒ වයසේ තරුණ සරසවි සිසුවෙකුගේ මනස හෙළි කරන අපූරු කැඩපතකි.

"පුරවර සරසවි බිමේ සිව්වසරක් සොඳුරු
වනපොත් කළා දිවි මග බැඳගන්නට පවුරු
එකබත කා උන්නෙ නොම වී සතුරු
සකිසඳ අසනු මැන සැමදාමත් මිතුරු"

එවන් කවි ලියන අංකුර කවීන් හෙවත් පැදි පබඳින්නන්, කිසියම් පමණකට සිංහල කවිය පිළිබඳ දැනීමක් හා හික්මීමක් ලබා ඇති බැව්ද පෙනී යයි.

ඔවුන් විසින් ප්‍රකාශනයෙහිදී වඩාත්ම යොදාගෙන ඇත්තේ, ඍජු රීතියකි. ව්‍යංග්‍ය රීතිය යොදාගැනෙන්නේ විරල වශයෙනි. ප්‍රකාශනයේ අපූර්වය මිස, නිර්මාණයේ අපූර්වය ඉස්මතුව නොපෙනෙන්නේ එහෙයිනි.

මවකගේ චරිතයට ආරෝපණය වෙමින් ලියන ලද අපූරු රචනයක් මෙම නිර්මාණ අතර දැකගන්නට ලැබුණි. මේ බැලුව මැනවි.

"සරසවි බිමේ සත්වසරක් ගත කෙරුව
මගෙ ලොකු දුවේ ඇයි අද ඔබ මට බැරුව
කුමරෙක් සොයා දෙන්නට මම නිදි මැරුව
අත් දෙක වන වනා ආවේ කිම දරුව"

කවිය උත්ප්‍රාසාත්මක වුවද, එතුළ සැඟව ඇත්තේ පොදු සමාජ යථාර්ථයයි. මවකගේ පැතුම දුවකට අධ්‍යාපනය ලබා දීම පමණක්ම නොවෙයි. ඇයට ජීවන සහකරුවකුද සොයා දීමය. ඒ වනාහි, මෙකල්හි දුප්පත් දෙමාපියන් ඉදිරියේ ඇති සමාජ ප්‍රශ්නයකි. මෙම රචනය ලියන්නේ ජීවිතය නමැති තක්සලාවෙන් නුවණ ලැබූ කවියෙකි. නොවේ නම් කිවිඳයකි.

## V

දශක තුනක් පමණ කාලය තුළ ශ්‍රී ලාංකික ජන ජීවිතය පීඩනයට පත් කළ බලවත්ම සාධකය වූයේ ජනවාර්ගික යුද්ධයයි. ඒ වූකලී සිවිල් අරගලයක් නොව, සමාජ දේශපාලන අයිතිවාසිකම් උදෙසා තරුණ දෙමළ ජනතාව අවි අතට ගෙන නැඟී සිටි අභ්‍යන්තර කැරැල්ලකි. පාලක පක්ෂය විසින් යුද්ධයක් සේ හුවා දක්වන ලද්දේ, එකී සන්නද්ධ අරගලයයි.

මෙම ජන අරගලය දෙස විවිධ දෘෂ්ටි කෝණයන්ගෙන් බලා කුරුටු ගී ලියූ සරසවි රචකයෝ, තම මතවාදයද එමගින් පළ කර සිටිති.

පහත දැක්වෙන පැදි තුනේ රචකයන් සන්නද්ධ ජන අරගලය දෙස බලන්නේ, මානවහිතවාදී දෘෂ්ටියකිනි. ගිනි දැල් සිහිල් වනුද, දිනෙක රතු මල් පිපෙනුද එක් කවියෙක් දකියි. දෙවැනි කවියාගේ ප්‍රාර්ථනය, භේද නැති ලෝකයකි. රටක් බෙදා වෙන් කිරීමේ විපාකය අනාගත දරු පරපුරටම බැව් අනෙක් කවියකින් පැවසෙයි.

"ඔබ අප ඉන්නේ ගිනි ගෙන දැවෙනා රටක
ඔබ අද ඉන්නේ ගිනිගෙන දැවෙනා ඒ රට කොනක
ගිනිදැල් සිසිල් වැස්සක් වෙනවා නිසැක
රතුමල් පිපෙනු ඇත යන්නේ මැද දිනෙක"

(ජයවර්ධනපුර)

"යුද්ධයට කෙළවරක් නැත
හේතු ඇත එකකට පසු
තව එකක්
මිනිසාගේ ජීවිතයට කාලයක් ඇත
ලැබේද දිනයක්
භේද නොමැති ලෝකයක
හෙළන්න සුසුමක්"

(පේරාදෙණිය)

"බිමේ උරුමකරුවෝ
කැකුළුය අපේ දරුවෝ
බිඳී වෙන්ව ගිය
ශාපලත් දේශයක
කෙසේ දකිනුව
හෙටට පායන
නැවුම් අරුණලු"

(රජරට)

යුද්ධය ගැනම ලියවුණු මෙම කුඩා පැදියෙහි නිර්මාණාත්මක ලකුණු මඳ වුවද, ඉන් පළ වන සමාජ ජීවන දෘෂ්ටිය වැදගත්ය.

"නෑයන් නැති කරන
සතුරන් ඇති කරන
ලේ රුහිරු උරා බොන
එකම සතුරා යුද්ධයයි"

(පේරාදෙණිය)

මෙම කාරණයම විෂය කරගන්නා රජරට සරසවියෙන් සොයාගන්නා ලද තවත් රචනයකින් නැඟෙන්නේ, ජාතිවාදී අඳෝනාවකි. "නිදයන් පුතේ තව වකුටුව දුටුගැමුණු" යනුවෙන් ප්‍රතිරාව නැඟෙන්නේ, ඊනියා පටු දේශප්‍රේමය තොරොම්බල් කරන පාලකයින්ගේම හඬය.

"සුදු පරෙවියන් ළඟ නෑදෑයන් මැරෙනු
හෙම්බත් බවින් වියළුණු දෑසින් බලනු
අනියත බිමේ පෙර මහ සෑ ගොඩ නැගුණු
නිදියන් පුතේ තව වකුටුව දුටුගැමුණු"

ජනවර්ග අරගලය විෂයයට ගෙන ලියන ලද බොහෝ රචනාවල එම පටු දෘෂ්ටිය දක්නට නොලැබීම, ප්‍රශස්ත කරුණක් බැව් මෙම අධ්‍යයනය තුළින් අනාවරණය වෙයි.

## VI

සරසවි කුරුටු ගී රචකයින් ජීවිතය දෙසත් සමාජය දෙසත් හෙළන බැල්ම තියුණු බැව්, මෙම අධ්‍යයනයෙහි වූ ඇතැම් රචනාවලින් මොනවට පළ වෙයි.

අග්නිදිග විශ්වවිද්‍යාලයේ රචකයකු කියා සිටින්නේ, "මහ පඬුවන් පවා උෟරන් බවට පත් කරන, කුමකින් හෝ කුස පුරවන, තැනට පොළඹවන බලයක්" බඩගින්නට ඇති බවකි.

"දිලිසෙන රන්වැට" යන හිසින් ලියන ලද අපූරු රචනයක්, මෙම නිර්මාණ සමුච්චය තුළින් දැකගත හැකි විය. එකී රචනය කුරුටු ගීයක ලකුණු පළ කරනුවට වඩා, පරිසමාප්තියට පත් කවියක (හෝ ගීතයක) ලකුණු පළ කරයි.

"කිරි කළ ගෙන පිරුවට බැඳ
සිරි මහ බෝ මළුවට එන
පිරිවර තවමත් හිමියනි
දිලිසෙන රන් වැට පාමුල
"හිමි ඔබ පිට දුන් එදවස
රන්වැට නැත බෝ හිමි වට
බෝ හිමි අද රන්වැට මැද
පිරිවර රන්වැට පාමුල
"ඇති හැකි අය රන්වැට පැන
සිතු ලෙස බෝ හිමි වැන්දට

නැතිබැරි පිරිවර හිමියනි
තවමත් රන්වැට පාමුල"
රන්වැටක් බැඳ එතුළ වට කරන ලද බෝ සමිඳු පාමුල

"නැතිබැරි පිරිවර" ළත වන අයුරු මෙම කවියා කියන්නේ, කවි ශික්ෂණයක පිහිටා රස නුසුන් කොටය.

"කතරගමේ දෙවොල් බිමේ
නෑ දෙවියන් දුටුවේ
සිඟා යදින මල් කැකුළකි
නෙතු අද්දර පිපුණේ
කතරගමේ දෙවිවරුණේ
පතළ වෙලා දෙරණේ
සීනු හඬයි ඉකි බිඳුමට
වඩා තදින් ඇසුණේ"
මැණික් ගඟේ දිය දෝතක
මලේ කඳුළු තිබුණේ
දෝතට ගත් කඳුළක තෙත
නෑ හිතකට දැනුණේ"

ඒ කවි ගුණයම - ශික්ෂණයම - පළ කරන තවත් මහරු රචනයකි, "කතරග මේ දෙවොල් බිමේ" යන හිසින් එන ඉහත දැක්වුණු නිර්මාණය. සීනු හඬින් දේව වරුණාව හඬගා කියන කතරගම දෙවොල් බිම සිඟා යදින පුංචි දැරිය කිසිවකු දුටුවේ නැත. අතිශයින්ම භාවාත්මක වූ මෙම රචනය අපගේ හදවත ප්‍රකම්පනයට පත් කරන්නේ නිතැතින්මය.

* * *

මීට පෙර සඳහන් කළ පරිදි මෙම අධ්‍යයනය සඳහා තෝරාගන්නා ලද සරසවි කුරුටු ගීවලින් බහුතරය, පරිසමාප්ත කාව්‍ය කෘතීන් වනුවට වඩා, හුදු පද්‍යකරණ බැව් පෙනී යයි. එකී පද්‍යකරණයන් ප්‍රබල බැව්ද, එතුළ රචකයින්ගේ ජීවිතය කිසියම් පමණකට ප්‍රතිබිම්බනය වන බැව්ද, ඊටද අමතරව ඔවුන් ජීවත් වන සමාජ යථාර්ථය හෙළිදරව් වන බැව්ද අමතක කරනු නොයෙදෙයි. ඒ අතින් බලන විට, මෙම රචනා අපගේ විශේෂ අවධානයට ලක් විය යුතු නිර්මාණයෝ වෙති.

එකී රචනාවලින් ඇතැම් නිර්මාණයන්හි, කුරුටු ගී ස්වරූපය ඒ හැටියෙන්ම නොදක්නා ලද බැව්ද සඳහන් කළ යුතු කාරණයකි. මන්ද යත්, ඇතැම් රචනාවන් කුරුටු ගී රීතියෙන් බැහැරව තරමක් දිගට ලියන ලද පද්‍යකරණයන් වන හෙයිනි.

එකෙතුදු වුවත්, මෙම රචනා අතර කාව්‍ය කෘතීන් හැටියට විමසා අගය කළ යුතු නිර්මාණ ප්‍රමාණවත් සංඛ්‍යාවක්ද දක්නා ලද බැව් සඳහන් කළ යුතු වෙයි. ඉහතින් දැක්වුණේ, අප විසින් කාව්‍ය නිර්මාණ සේ අගය කළ යුතු රචනාවලින් කිහිපයක් පිළිබඳව කරන ලද විමසුමක් බැව් සලකනු මැනවි. එම විමසුමද, පූර්ණ සාහිත්‍ය විමර්ශනයක් සේ හඳුන්වා දීමට මම නොකැමැත්තෙමි.

# කුරුටු ගී වල සමාජ වැදගත්කම
## නන්දන අජිත් සහ ඒ. එම්. අබේරත්න

### ප්‍රවේශය

කුරුටු ගී, කිසියම් පුද්ගලයකු තුළ මතුවන හැඟීම් අවංකව හා නිර්ව්‍යාජව ප්‍රකාශ කිරීමට යොදාගත් මාධ්‍යයකි. මෙහි වැදගත්ම අංශය නම් කර්තෘ සැඟව සිට ප්‍රකාශිත අදහසම ඉස්මතු කිරීමට උත්සාහ කිරීමය. 'බුදල්මි සියොවැ ආමි - සීගිරි බැලීමි - බැලු බැලූ බොහෝ දෙනා ලියූ හෙයින් නොලීමි' යන්නෙන් එය පැහැදිලි වේ. කුරුටු ප්‍රකාශන පළ වන්නේ ප්‍රසිද්ධ මාධ්‍ය ඔස්සේ නොව බොහෝ දෙනකු ගැවසෙන අප්‍රකට ස්ථාන තුළය. තම හිත තුළ කැකෑරෙන පීඩනය හා අසහනය පිට කර ගැනීම කුරුටු ගීකරුගේ එක් පරමාර්ථයකි. සමහර අවස්ථාවලදී මෙමගින් ප්‍රකාශ වන අදහස ප්‍රබල උපහාසයෙන් යුතුය.

කුරුටු ගී ප්‍රධාන වශයෙන් කොටස් තුනකට වර්ග කොට දැක්විය හැකිය. තමන්ගේම නිර්මාණ, පවතින ගීතයක් හෝ කවියක් අවස්ථෝචිතව සකසා යොදා ගැනීම, පවත්නා ජනප්‍රිය ගීත භාවිත කිරීම යනුවෙනි.

පේරාදෙණිය සරසවියේ රාමනාදන් ශාලාවේ සමහර සිසුන් සිටි කාමර කාලයක් යන තුරුම සුණු පිරියම් නොකර තැබුවේ ඒවායේ සටහන් වූ කුරුටු ගීවල සුන්දර බව නිසාම යැයි ප්‍රකාශ වී ඇත.

සරසවි කුරුටු ගී කරුණු කිහිපයක් නිසාම වැදගත් වේ. ප්‍රධානම කරුණ නම් ලංකාවේ අධ්‍යාපනය ලබන සිසුන් අතර බුද්ධිමත්ම පිරිස සරසවිවලට ඇතුළත් වන නිසා මෙම ප්‍රකාශන බුද්ධිමත් යෞවනයන්ගේ සමාජ විමර්ශන ලෙස දැකිය හැකිය. දෙවනුව ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයකින්ම හා සෑම සමාජ කණ්ඩායමකින්ම දරුවන් සරසවියට ඇතුළත් වන නිසා එය සමාජ හරස්කඩක් ලෙසද දැකිය හැකිය.

තුන්වන කරුණ වන්නේ මෙම කාලවකවානුව, නව යොවුන් විය පසු කරමින් වැඩිහිටි වියට පා තබන තරුණ ජීවිතවල පුද්ගලික මෙන්ම සමාජ සිදුවීම් සම්බන්ධයෙන්ද වඩාත් සංවේදී අවධියක් වීමය. ඒ අරභයා පවතින සම්මත අදහස් විශ්ලේෂණය කිරීමේ හා සිතීමේ හැකියාවෙන් යුත් නිර්මාණශීලී අවධියක් වීමය.

පසුගිය දසක කිහිපය තුළ සමාජය වෙළාගත් යුද්ධය මෙන්ම වෙනත් සමාජ ප්‍රවණතාවන් නිසා අධ්‍යාපනයේ අරමුණු, ස්වභාවය හා සංයුතියද වෙනස් වීම, සමාජ නිර්මාණශීලිත්වය යටපත් කිරීමට බලපා ඇතැයි යන හැඟීම සමාජය තුළ ජනප්‍රිය වී ඇත. අධ්‍යාපනය සඳහා විදේශගත වන ප්‍රමාණය වර්ධනය වීමත් ලාංකික විශ්වවිද්‍යාලවලින් ලබාගන්නා උපාධිය අවතක්සේරුවකට ලක් වීමත්

උපාධි අධ්‍යාපනය ලබන්නා වූ තරුණයන් තුළ අසහනය හා අවිනිශ්චිතභාවය වර්ධනය කිරීමට හේතු වී ඇත. සමාජයේ සෑම සංසිද්ධියක්ම දේශපාලන වශයෙන් භාවිත කිරීමද පසුගිය කාලය තුළ තීව්‍ර වූ ප්‍රවණතාවකි. මෙම ප්‍රවණතාව තුළ සරසවි සිසුන්ද දේශපාලන අතකොලු බවට පත් වී ඇතැයි පිළිගැනීමට සිදු වේ.

සරසවි සිසුන්ගේ ප්‍රකාශන ඔවුන් සමාජය විනිවිද දකින ආකාරය හඳුනාගත හැකි එක් ප්‍රබල මාධ්‍යයක් වේ. එම නිසා සරසවි කුරුටු ගී පිළිබඳව විමසීම කාලෝචිත යැයි සිතමු.

**පර්යේෂණ ක්‍රමවේදය විමසීම**

මෙම අධ්‍යයනයෙහි මූලික අරමුණු දෙකක් විය. පළමුවැන්න නම් බාහිර සමාජයේ විවිධ පුද්ගලයින් විවිධ කෝණවලින් දකින සරසවි ජීවිතය හා අධ්‍යාපනය, සරසවි ශිෂ්‍යයන්ගේම දෘෂ්ටියෙන් විවරණය වන ආකාරය බැලීමයි. දෙවැන්න නම් සරසවි කුරුටු ගී පර්යේෂණ දත්ත ලෙස භාවිත කිරීමේ හැකියාව සොයා බැලීමයි.

සමාජ පර්යේෂණවලට අදාළ වන කරුණු කිහිපයක් නිසාම සරසවි කුරුටු ගී පිළිබඳව සිදු කෙරෙන මෙම පර්යේෂණය වෙනත් සමාජ පර්යේෂණවලින් වෙනස් වේ. ප්‍රධාන වශයෙන්ම වෙනත් සමාජ පර්යේෂණවලදී අදාළ ක්ෂේත්‍රයට/ගැටලුවලට අදාළව ඉලක්ක ප්‍රජාව තෝරාගැනීමේ ඉඩකඩ හා නිදහස පර්යේෂකයාට ලැබේ. ගැටලුවට අදාළ තොරතුරු රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලි හා සාකච්ඡා උපදෙස් සැකසීමට හැකිය. පර්යේෂණය කරන ක්ෂේත්‍රය, තේමාව හා ඉලක්ක ප්‍රජාව තම අධ්‍යයනයේ ක්‍රමවේදය හා සංකල්පීය රාමුව මත අභිමතය අනුව තෝරාගැනීමේ හැකියාව ඇති නිසාය.

සරසවි කුරුටු ගී පිළිබඳව කරනු ලබන මෙම පර්යේෂණයේදී රැස් කිරීමට සිදුවන්නේ දැනටමත් පවතින තොරතුරුය. එම තොරතුරු (කුරුටු ගී) කිසියම් රටාවකට හෝ අරමුණකට අනුව ලියැවුණු ඒවා නොව, ඒ ඒ පුද්ගලයන්ගේ නිදහස් ප්‍රකාශන ලෙස ලියැවුණු ඒවාය.

එම කුරුටු ගී විමර්ශනය කිරීමට උත්සාහ දැරීමේදී මතුවන ගැටලු කිහිපයකි. ලියූ පුද්ගලයාගේ පසුබිම, ඔවුන්ගේ අරමුණු, ලියන ලද කාල වකවානුව ආදී තොරතුරු නිශ්චය කර ගැනීමට අපහසුවීම ඉන් සමහරකි. ශ්‍රී ලංකාවේ විවිධ පසුබිම්වලින් සරසවියට පිවිසෙන තරුණ තරුණියන් සරසවි උප සංස්කෘතියට අනුගත වීම මඟින්, ඔවුන් තුළ විශාල ආකල්පමය වෙනසක් සිදුවීම ස්වභාවිකය. ඒ අතරම 'සරසවිය' යන පොදු නමින් හැඳින්වුවද සරසවිය තුළ හදාරන පාඨමාලාව, එම පාඨමාලාව සඳහා බාහිර වැඩලෝකය තුළ ඇති ඉල්ලුම හා වෙනත් වරප්‍රසාද ආදියද සරසවි සිසුවාගේ ආකල්ප කෙරෙහි දැඩි බලපෑමක් ඇති කිරීම වැළැක්විය නොහැක. වෛද්‍ය,

ඉංජිනේරු ආදී පීඨවලට වඩා කලා පීඨ සිසුන් සිය අපේක්ෂාවන් මෙන්ම අසහනයද ප්‍රකාශ කිරීම සඳහා කුරුටු ගී ලිවීම මෙන්ම උද්ඝෝෂණ පැවැත්වීම, උදාහරණයක් ලෙස ගත හැකිය. මෙම සංකීර්ණතාව විසඳා ගැනීම සඳහා භාවිත කළ හැකි එක් උපක්‍රමයක් නම් අදාළ ගීතය ලියා තිබූ ස්ථානය පිළිබඳව වැඩි අවධානයක් යොමු කිරීමය.

## සාහිත්‍යමය විමසුමක්

කුරුටු ගී සාහිත්‍යමය වශයෙන් විචාරයට ලක් කිරීමද වැදගත්ය.

කෙසේ වෙතත් කර්තෘ අඥාත ප්‍රකාශන ගී/කවි හෝ චිත්‍ර පිළිබඳව ජාත්‍යන්තර වශයෙන් පර්යේෂණ රාශියක් සිදු කර එමඟින් පිළිඹිබු වන සමාජ යථාර්ථයන් පිළිබඳව නිගමන ඉදිරිපත් කරන ලද වාර්තා විශාල ප්‍රමාණයක් දැකිය හැකිය. එවැනි එක් වාර්තාවක සඳහන් වන්නේ:

"කුරුටු ගී යනු පෞද්ගලික හා සාමාන්‍යයෙන් මිනිසාගේ සිතුවිලි නිදහසේ ප්‍රකාශ වීමෙන් වළකාලන එදිනෙදා ජීවිතයට බලපාන සමාජ තහංචිවලින් නිදහස් වූ ප්‍රකාශන ලෙස ගත හැකිය."

මෙම අදහස ලංකාවේ සරසවිවල දැකිය හැකි 'කුරුටු ගී' පිළිබඳවද පොදු අදහසක් ලෙස ගත හැක්කේ එම කවි බොහෝ ප්‍රමාණයක්, ප්‍රකාශනය පිළිබඳ සමාජ තහංචි නොසලකා ලියා ඇති බව පෙනෙන විටය.

පේරාදෙණිය

1. අපත වූ මිතුරු කැළක්
   අසංවර වූ ලිඟුවක්
   අසාමාන්‍ය වූ නිදිමතක්
   නොමැති වූයේ නම්
   අපිත්
   ලෙචාලාය
   ප්‍රොපාලාය

රුහුණ

1. මසකට දෙතුන් වරක්වත් නංගිව දකින යකා
   දූන් මක් වෙලාදැයි කම්පා කරන එකා
   ඌ දමනය කරගන්නෙ අත වමනය කරන නිසා
   අනේ මොනවා කරන්නද සෙමෙස්ත්‍රි කරන විනා

සමහර එවුන් නම් කොක්කක් ගැහුවා යකෝ
තව තව එවුන් ඇණ පිට ඇණ ගත්තා යකෝ
තව කට්ටියක් කවුන්සිලියේ ගියා යකෝ
මේකේ ඉඳන් අපි මොනවද කෙරුවෙ යකෝ

කුරුටු ගීය කාලයක් තිස්සේ හිතා මතා රචනා කරන ලද ප්‍රකාශනයකට වඩා කිසියම් සමාජ හෝ පෞද්ගලික ගැටලුවක් හෝ පීඩනයක් හේතු කොට ගෙන පුද්ගලයකුගේ හිත තුළ මතුවන අදහස සංස්කරණයකින් තොරව ප්‍රකාශ කිරීමක් ලෙස හැඳින්වීම නිවැරදි යැයි සිතමි. ලියූ පුද්ගලයාගේ නම, ගම නොව මුඛ්‍ය අදහස ප්‍රචලිත කිරීමේ අරමුණ ඇතිව කුරුටු ගී ලිවීමට පුද්ගලයන් පොළඹවන හේතු සාධක පිළිබඳ අධ්‍යයනයක් ඇමරිකා එක්සත් ජනපද සෞඛ්‍ය හා අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් 1978දී **Research on School Vandalism** මින් ප්‍රකාශයට පත්කර ඇත. එහි සඳහන් වන කරුණු අතර ප්‍රධාන තැනක් ගන්නේ ආයතන විසින් ශිෂ්‍ය සුභසාධනය හා ඉගෙනුම් පරිසරය සුභවාදී අයුරින් සංවිධානය නොකිරීම, අධ්‍යාපන කටයුතු උනන්දු කරවන පරිසරයක් නොමැති වීම. ශිෂ්‍යයන් තුළ තම ආයතන පිළිබඳව ගෞරවණීය හැඟීමක් නොමැති වීම වැනි කරුණුය. මෙම කරුණු ලංකාවේ සරසවි කුරුටු ගීවලටද පොදු බවට උදාහරණ දැක්විය හැකිය.

කැලණිය

1. අපි ආවේ - ඉගෙනගන්න
අපිට වුණේ - පාරේ ඉන්න
ආණ්ඩුවේ - බහිරවයන්
පිස්සු කෙළින - හැටි බලන්න
මොකද වුණේ - චින්තනේට
මහින්දගේ - චින්තනේට
අධ්‍යාපනේ - විකුණන්නට
ඉඩදුන්නේ - කවුරුද බොල

දමනු - දමනු ඉහළ දමනු
ශිෂ්‍යාධාර - ඉහළ දමනු
කරනු කරනු - නතර කරනු
සිසු මර්දන - නතර කරනු

මේක හරිම - ආණ්ඩුවක්
පිස්සු කෙළින - ආණ්ඩුවක්
අධ්‍යාපනේ - විකුණං කන
මේක හරිම - පාණ්ඩුවක්

කුරුටු ගී යනු සමාජ දේශපාලන ප්‍රකාශන (socio-political expression) ලෙස අර්ථකථනය කළ හැක. එම අදහස ලංකාවේ සරසවි කුරුටු ගී සම්බන්ධයෙන්ද සාධාරණ බව බොහෝ කුරුටු ගී තුළ දේශපාලන සමාජ පීඩනය පිළිබඳව සඳහන්ව තිබීමෙන් පැහැදිලි වේ.

කැලණිය

1. දහසකුත් පැතුම් පොදි බැඳන්
   සුපුරුදු පරිසරයෙන් දුරස් වී
   සතුට දුක හා පුංචි බියක්ද
   මේ පුංචි හිත්වල තබාගෙන
   පිය නැගුවෙමි සොඳුරු කලණ අසපුව වෙත.

2. නොදැනිම ගෙවී ගිය කාලය බොහො කෙටී
   සතුටින් සමගියෙන් හිනැහුණු කාලේ කෙටී
   ඩිග්‍රිය ගන්න කළ වැයම බොහොම වැඩි
   ගොට්ටිය අල්ලන්න යන කාලය ඊට වැඩි

කුරුටු ගී ප්‍රකාශන පිළිබඳව පර්යේෂණ පැවැත්වූ පර්යේෂකයින් විසින් ඉදිරිපත් කර ඇති තවත් කරුණක් නම් එම කුරුටු ප්‍රකාශන Graffity හෙවත් සාමාන්‍ය සමාජ ක්‍රමය පිළිබඳව විශ්වාසය නොමැති, එයින් පිට පැනීමට උත්සාහ දරන අපගාමී පුද්ගලයන් (Deviance) ගේ ප්‍රකාශන බවය. ඔක්ස්ෆර්ඩ් ඉංග්‍රීසි ශබ්ද කෝෂයට අනුව මෙම අපගාමීන් යනු (Person who departs from accepted rules and conduct) සාමාන්‍යයෙන් පිළිගත් නීතිරීති හා චර්යාවන්ගෙන් බැහැර වූ පුද්ගලයින්ය.

බටහිරදී කුරුටු ගීවලින් කුමක් අදහස් කළේද හා ඒවා බටහිර ලෝකයේ කෙසේ පැවතියේද යන්න නැවත සිතා බැලිය යුතුය. බටහිර රටවල ඒවා වචන, වාක්‍ය පමණක් වන අතර සංස්කෘතිකමය 'ගී' ස්වභාවයක් නැත. එකම කලාත්මක කුරුටු ස්වභාවය වන්නේ දෘෂ්‍යාත්මක කුරුටුය. ඔවුන් එම මාධ්‍යය දිගින් දිගට යොදා ගන්නේ නම් වීදි කලාකරුවන් ලෙසද ගැනේ. නිතරම එය කෝපය හා ව්‍යාකූල බව නිරූපණය කරයි. සිංහල කුරුටු ගීවල සෞන්දර්යාත්මක හා සංස්කෘතිකමය වටිනාකමක් ඇත.

සරසවි කුරුටු ගී තුළ සුලබව දැකිය හැකි විරෝධාකල්ප සහිත සටහන් ලියා ඇත්තේ මෙවැනි මානසිකත්වයෙන් යුතු සිසුන් යැයි අනුමාන කිරීම සාධාරණය. මෙම සිසුන් විසින් ලියා ඇති කවි බහුතරයක් තුළින් පැහැදිලි වන්නේ ජීවිතය ඉදිරියට ගෙන යන ගමනේදී හමු වන අභියෝගවලට මුහුණ දෙනවාට වඩා එම අභියෝග අනවශ්‍ය කරදරයක්, හිරිහැරයක් ලෙස දකින මානසිකත්වයකි. බොහෝ සරසවි කුරුටු ගී මෙයට නිදසුන් වේ.

ජයවර්ධනපුර

1. නිදිවරා දුක්විඳ
   සරසවි ආ සඳ
   යළි විඳින දුක්කඳ
   නොදනීද දෙවි රද?

2. 1st year එක ගෙවුණේ රැග් කෑමෙන්
   2nd year එක ගෙවුණේ රැග් දීමෙන්
   3rd year එක ගෙවුණේ සිහින වලින්
   Final year එක ගෙවී ගියා research වලින්

පේරාදෙණිය

3. විභාගය හිතට මහ බරක්
   අවකලනය කිරීමට නොහැකිව
   ඔද්දල් වී ඇත මසිත
   සාපේක්ෂවාසි නිරපේක්ෂවාසි
   නිශ්චායක අතර ගෙවී යයි යෞවනය
   Mid, END, Semester දක්කයි
   අරුත් සුන් ලොවකට....

රුහුණ

4. ඉගෙන ගත්තෙ හිස කෙස් මල දරන්නයි
   අපි පැතුවේ ලෝකෙට සෙත සදන්නයි
   අහෝ මිතුර ඉගෙනුම ජය ලබන්නයි
   අද සිදු වුණේ මහ මඟ දුක් විඳින්නයි

5. නිදිමරලා ක්‍රෑම දාල තට්ටෙ ටිකක පෑදිලාය
   දවස තිස්සෙ වාඩිවෙලා ඇට කුට්ටම පොඩි වෙලාය
   ක්‍රෑම දාල මුළු දවසෙම ඇස් දෙක ලොවිගෙඩි වෙලාය
   කවදා හරි තෝ මැරෙන්නෙ පොතක් අස්සෙ හිරවෙලාය

විශාල අභියෝග ජයගෙන සරසවියට ඇතුළු වන සිසුන් තුළ මෙවැනි අදහස් කිඳාබැස තිබීම ඔවුන්ගේ පෞරුෂය පිළිබඳව ඉඟියක් සපයන බව පැහැදිලිය. මෙයින් අදහස් වන්නේ ඔවුන් සමාජ විරෝධීන් බව නොවේ. එයින් ප්‍රකට වනුයේ ඔවුන්ගේ අපේක්ෂාභංගයයි.

විවිධ සමාජ සංසිද්ධීන් නිසා කම්පනයට පත් වූ සිත තුළ ජනිත වන අදහස් කුරුටු ප්‍රකාශන/ගී ලෙසින් එළිදැක්වීමට පුද්ගලයින් පොළඹවන සාධක වර්ගීකරණයක් [Blume Model] 1995දී Blume නම් පර්යේෂිකාව නිර්මාණය කර ඇත.

එහි සඳහන් කරුණු ලංකාවේ සරසවි කුරුටු ගී ලිවීම පසුපස ඇති සමාජ බලපෑම් අවබෝධ කර ගැනීම සඳහා කිසියම් ආලෝකයක් ලබාදෙනු ඇතැයි විශ්වාස කරමු.

**කුරුටු ප්‍රකාශන ලිවීම සඳහා පෙළඹවීම්**

| **ජන සන්නිවේදනය හා** | **ප්‍රවර්ගය** |
|---|---|
| සන්නිවේදනය පිළිබිඹු කිරීමේ සන්නිවේදනය | කළකිරීම, විරෝධය, විවේචන ඉදිරිපත් කිරීම |
| පැවති/සිටි බවට සලකුණක් තැබීම | Expression of Protest, Criticism and rejection |
| Existence Proof | සීමාවක් සටහන් කිරීම |
| ප්‍රකාශනයක් කිරීමේ අවශ්‍යතාව | Marking out territory |
| Need to express one self | සබඳතාව සෙවීම |
| සුන්දරත්වය, නිර්මාණශීලීත්වය අත්විඳීම | Search for contact |
| Creativity and aesthetic | කළකිරීම හා පීඩනය |
| | Boredom |

සරසවි කුරුටු ගී නිර්මාණය කිරීමට සිසුන් පෙළඹවූ සාධාරණ මානසික තත්ත්වයන් වටහාගැනීමට හා එම කවිවලින් කියැවෙන ප්‍රකාශන දෙස සාධාරණව බැලීමට මෙම වර්ගීකරණය පදනමක් ලෙස ගත හැකිය.

**දත්ත (කුරුටු ගී) රැස් කිරීම**

කුරුටු ගී පිළිබඳ මෙම පර්යේෂණය ආරම්භයේදී අරමුණ වූයේ උතුරු නැගෙනහිර ඇතුළු සියලුම විශ්වවිද්‍යාලවලින් තොරතුරු රැස් කර ගැනීමය. එම කාල සීමාවේදී පැවති යුදමය වාතාවරණය නිසා යාපනය විශ්වවිද්‍යාලය සමඟ සබඳතා ගොඩනැගීම අපහසු වූ අතර, ලංකාවේ අනෙකුත් සියලුම විශ්වවිද්‍යාලවලින් තොරතුරු රැස් කිරීම ආරම්භ කරන ලදි. මඩකළපුවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ සිසුන් දෙදෙනෙකු තොරතුරු රැස්කිරීමට සහභාගි වුවත් උත්සන්න වූ යුද වාතාවරණය නිසා එම තොරතුරු ලබාගැනීම වැළකී ගිය අතර. නැගෙනහිර පළාතට අයත් අග්නිදිග විශ්වවිද්‍යාලයේ (ඔලුවිල්) දෙමළ භාෂාවෙන් ලියූ කවි රැස් කර ගැනීමට හැකිවිය. ඒ අනුව ලංකාවේ සරසවි සමාජයේ හරස්කඩක් මෙම දත්ත ඇසුරින් පිළිබිඹු වන බව කිව හැකිය.

නියැදිය

යාපනය/නැගෙනහිර හැර සියලුම විශ්වවිද්‍යාලවලින් කවි රැස් කර ගැනීමට සමත් වූ අතර සියලුම කවි පර්යේෂණය සඳහා යොදා ගැනීමේදී සිදු වන අපහසුතා මගහරවාගැනීම සඳහා නියැදියක් සකස් කරගන්නා ලදි. එහිදී එකතු කරගත් තොරතුරු පද්ධතිය සාධාරණව නියෝජනය වීම සඳහා එක් සරසවියකින් එකතු වූ කවි ප්‍රමාණය සමස්ත කවි එකතුවේ ප්‍රතිශතයක් ලෙස ගෙන එයට අනුකූල වන පරිදි නියැදිය සඳහා ඒ ඒ සරසවිවලින් කවි ලබා ගැනිණි. කෙසේ වුවත් උනන්දුව දක්වන අයට බලා ගැනීම සඳහා සමස්ත කවි එකතුවම මෙහි අවසානයේ දක්වා ඇත. කවි අංකනය කර ඇත්තේ පහසුවෙන් හඳුනාගැනීම සඳහාය.

## සංවාදය

### සරසවි සිසුන්ගේ ඇසින් සරසවි අධ්‍යාපනය

සරසවියට ඇතුළු වීම, අධ්‍යාපනය ලබන බහුතරයක් සිසු දරු දැරියන්ගේ සිහිනය යැයි පැවසීම අතිශයෝක්තියක් නොවේ. බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදයේ ප්‍රතිඵලයක් ලෙස වර්ධනය වූ වර්තමාන අධ්‍යාපන ක්‍රමයේ වර්ධනය හා ව්‍යාප්තිය සමඟ සරසවිය විවිධ ස්වරූපයෙන් බාහිර ලෝකයට දිස් විය. 1950 හා 1960 දසකයේදී බුද්ධිමතුන්ගේ හා ප්‍රාඥයන්ගේ එක්ටැම් ගෙය ලෙසින් හැඳින්වූ සරසවිය 1970න් පසු දසක කීපයක්ම අරගලකාරීන්ගේ තිඹිරිගෙය ලෙස හැඳින්විණි. එවකට විදුදය නමින් හැඳින්වූ වර්තමානයේ ජයවර්ධනපුර නමින් හඳුන්වන සරසවියේ සෝරත හිමියන්ගේ ප්‍රසිද්ධ ප්‍රකාශයම මෙයට හොඳ නිදසුනකි.

'සරසවි සිසුන් අරගල කිරීමට ඉගෙනගත යුතුය. එසේම ඉගෙනගැනීමට අරගල කළ යුතුය.' එහෙත් මෙම ප්‍රකාශය අනවබෝධයෙන් ක්‍රියාත්මක කිරීම හා අන්ධානුකරණයෙන් දඩමීමා කරගැනීම නිසා ලංකාවේ සරසවිවල 1980-90 දශකවල සිදුවූ මහා විනාශය බුද්ධියෙන් හා මානව දයාවෙන් සමාජය නිරීක්ෂණය කරන සියල්ලන්ගේ ඇඟ කිළිපොළා යන තරම් දරුණුය. මෙම සංකීර්ණ හා ශෝකජනක තත්ත්වයන්ට පිළියම් ලෙස විවිධ කණ්ඩායම්, බලවේග හා ආණ්ඩු විසින් වරින් වර ක්‍රියාත්මක කරන ලද ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලයක් ලෙස නිර්මාණය වූ සරසවිය එහි ඉගෙනුම් ලබන සිසු සිසුවියන් දකින ආකාරයයි බොහෝ කුරුටු ගීවල සටහන් වී ඇත්තේ.

මුල් පරිච්ඡේදයේ සඳහන් කරන ලද පරිදි විමර්ශනයේ පහසුව සඳහා විවිධ තේමා යටතේ සරසවි කුරුටු ගී වර්ග කිරීමේදී සරසවි අධ්‍යාපනය හා ජීවිතය, උපාධිය පිළිබඳ ආකල්පය යන තේමාවන් යටතට ලියැවුණු කවි ප්‍රමාණය 142 කි. මෙය නියැදිය වූ කවි 674ට සාපේක්ෂව විශාල ප්‍රමාණයකි. මෙම කවි බහුතරයකින් ප්‍රකාශ වන්නේ සරසවිය අපායකි, සිරගෙයකි, කෝලම් මඩුවකි වැනි අදහස්ය.

බොහෝ බලාපොරොත්තු හිස මත තබාගෙන සරසවියට පැමිණි නව යොවුන් තරුණ තරුණියන් සරසවිය අමිහිරි, අර්ථ විරහිත තැනක් ලෙස විස්තර කිරීම ඒ පිළිබඳව සැලකිල්ලක් දක්වන පිරිසගේ දැඩි අවධානයට යොමු විය යුතු ප්‍රවණතාවකි. සෑම සරසවියකම මෙබඳු අදහස් බහුලව සටහන්ව තිබූ අතර එක සරසවියකින් එක කවියක් බැගින් කියවීම වුවත් තත්ත්වය අවබෝධ කරගැනීමට ප්‍රමාණවත්ය.

ජයවර්ධනපුර

1. ඉන්නේ බෝඩිමක මහ ලොකු ළිඳක් ළඟ
කන්නේ ජිම් එකෙන් රුපියල් 20 කට
බොන්නේ ප්ලේන්ටි එහි කිසි රහක් නැත
ඩිග්‍රිය නිසා මා විඳින දුක

2. 1st year එක ගෙවුණේ රැග් කෑමෙන්
2nd year එක ගෙවුණේ රැග් දීමෙන්
3rd year එක ගෙවුණේ සිහින වලින්
Final year එක ගෙවී ගියා research වලින්

පේරාදෙණිය

1. විභාගය හිතට මහ බරක්
අවකලනය කිරීමට නොහැකිව
ඔද්දල් වී ඇත මසිත
සාපේක්ෂවාසි නිරපේක්ෂවාසි
නිශ්චායක අතර ගෙවී යයි යෞවනය
Mid, END, Semester දක්කයි
අරුත් සුන් ලොවකට....

2. විශ්ව දැනුමක් පතා ආ මුත්
නොලැබ මද දැනුමක්
පතා ආ මඟ නොලැබ දැනුමක
යන්නට නොදී ඉඩ හසර
බොග දමන්නට පටන් ගත්තෙමි
තවත් එක සැරයක්

රුහුණ

1. පූරුවෙ කළ පවට සරසවි ආවාට
යන්නට වුණේ නැත ගම කලකින් බෝම
නිවාඩුවක් නැත ගම යන්නේ කෝම
නන් ඇකඩමිය වැඩ වරපන් හැමදාම

2. ඉගෙන ගත්තෙ හිස කෙස් මල් දරන්නයි
අපි පැතුවේ ලෝකෙට සෙත සදන්නයි
අහෝ මිතුර ඉගෙනුම ජය ලබන්නයි
අද සිදු වුණේ මහ මඟ දුක් විඳින්නයි

කොළඹ

1. විශ්ව විද්‍යාලය
නිසරු මුඩු කෙතයි
කෙතට බැඳි ඇදුරු
පඹයන් රැසකි
අරුණෝදයේ සිට රෑබෝ
වන තෙක්
මොට වූ නගුල් අදින
කැහැටු හරක් රැසකි
කපක් සීසෑවත්
නොලැබෙන
අස්වැන්නකි.....
(සත්‍යයේ සටහන බුද්ධියේ විමසුම)

කැලණිය

1. සරසවි දිවිය මෙහෙමද අපෙ ගත වෙන්නේ
ඩෙංගු බරවා සහ අපි ඇඳ යට ඉන්නේ
අල්මාරියද අපේ නිවහන වන්නේ
අපි වැඩකාරයෝ කවුරුත් නැහැ දන්නේ.

2. අපි සරසවි බිමට පිය නැගුවේ
කොතරම් බලාපොරොත්තු
පොදි බැඳගෙනද
නමුත්
විඳින්නට ඇත්තේ
කොතරම් කටුක
අත්දැකීම්ද යයි
කනගාටුවක්
මසිත නැගේ.....

3. අපි හරක්ද ?
Lectures, Practical
Tute ගොඩ මළ වදේ
උදේට රැයකට
නිදන්නටවත් කෙසේ

ගව රැළක් මතක් වෙයි උදයට
දිගේලි කරන
බෝඩිමේ වමාරන
ආතල්ද Campus
ගමට ගොස් අසන විට
කෙසේ නම් කියන්නද
අපි සැවොම කන කට්ට.

සරසවි ජීවිතය හා අධ්‍යාපනය පිළිබඳව සුභවාදීව ලියූ කවි තුනක් මෙම කවි අතර තිබීම අභියෝග මැද වුවත් බලාපොරොත්තුසහගත සිසුන් සිටින බවට නිදසුනකි.

මොරටුව

1. සරසවිය
   ගිම්හානයේ උදෑසනක
   සුපිපි රෝස කුසුම
   ළතැවුල් කිමද
   අද නැතත් හෙට දිනක
   වසන්තය උදා වේ නම්
   දෝතින්ම දරාගෙන බලාපොරොත්තු
   පෙළගැසී බලා හිඳී
   ඇස් කෙවෙනි යට රැඳී
   තුටු කඳුළු ඉහිරවන්න.

කැලණිය

1. දහසකුත් පැතුම් පොදි බැඳන්
   සුපුරුදු පරිසරයෙන් දුරස් වී
   සතුට දුක හා පුංචි බියක්ද
   මේ පුංචි හිත්වල තබාගෙන
   පිය නැගුවෙමි සොඳුරු කලණ අසපුව වෙත.

සබරගමුව

1. මම පාඩම් කරමි
   මගේ අරමුණ කරා
   මම යමි.

පසුගිය දශක කිහිපය තිස්සේම සරසවිය තුළ මෙන්ම බාහිර සමාජයේද සිදු වූ විවිධ හැලහැප්පීම් නිසාම බොහෝ දුක් විඳ ලබාගන්නා සරසවි උපාධිය පිළිබඳ විශ්වාසය හා ගෞරවය උපාධි අපේක්ෂකයා තුළින් ගිළිහී ගොස් ඇති බවද, සෑම සරසවියකම කුරුටු ගීවලින් ප්‍රකාශ වී ඇත. ජයවර්ධනපුර සිසුන් උපාධිය ඇතැතිව රැකියා පෝලිමේ සිටීමට සිදුවීම පවක්, කරුමයක් ලෙස දකින අතර රුහුණේ දරුවන්, සරසවියේ ලැබූ ඉගෙනුම හා කුසලතා සියල්ල අමතක කර ඡායාරූප පෙන්වා රැකියාවක් ඉල්ලීම සමස්ත පද්ධතියටම එල්ල කරන උපහාසයක් නොවන්නේද?

1. කැන්ටිමේ බත් පතේ
   ලුණු ඇඹුල් දෙකම නෑ
   බත් කන්න හදන විට
   ටැප් එකේ වතුර නෑ
   විභාගය මතක් වී නිදන්නට හිතක් නෑ
   උපාධිය ගත් දිනක
   කොයි යම් ද දන්නෙ නෑ
   ජීවිතය ජය ගන්න කියා
   සරසවියටයි පිවිසුණේ
   ඒත් මට ආ ලෙසට
   ජීවිතය ජය ගන්න
   ලැබේදැයි
   මහා ප්‍රශ්නයකයි
   පැටලුණේ

2. Notes ටිකයි
   photo ටිකයි
   උපාධියයි
   විතරක් ගෙන
   හෙට යන අපි
   Notes ටිකෙන් වැඩක් නොමැත
   එහි කිසිවක් හිතේ නොමැත
   උපාධියත් ඒ වගෙමයි
   කවුද ඕක ගණන් ගන්නෙ
   ඉතිරි වෙන්නෙ Photo ටිකයි
   කරුණාකර පාලකයිනි
   දෙන්න අපට රැකියාවක්
   සිව් වසරක Photo ටිකට

ජයවර්ධනපුර

1. උසස් පෙළ ආතලං | චේවං
කැම්පස් ජීවිතං | හියං
බී.ඒ නම් අරහං | තං
රැකියා පෝලිං ගතං | සිතං

2. හිඟා කන්න බෑ අතපය ඇති | හින්දා
මැරී වැඩක් නෑ යළි ඉපදෙන | හින්දා
ඉගෙනීමත් දුකයි බර බර වැඩි | හින්දා
අනාගතයේ මොනවා වේවිද | මන්දා

3. කුසගින්නේ සිටිනා විට අපෙ | අම්මේ
නෑ වැලපුණේ කිසිදා මම | බඩගින්නේ
මේ හැම වෙලේ නුඹ සිහිවෙන විට | අම්මේ
සරසවි උපාධිය කටු ඔටුන්නක් | අම්මේ

පේරාදෙණිය

1. පැය ගණන් නිදිවරා
ලබාගත් උපාධිය
සොච්චන් පඩියකට
හැල්ලු වී යද්දී
විටෙක මට සිතේ
ජීවිතේ මා ලැබූ
ලොකුම පරාජය
උපාධිය ලබා ගත් බව

2. අනිච්චා මට තම්මානා
උප්පාද කළ දැනුම්නෝ
උපාධි අරගෙන ඕන තරං
අපි වැන්නන් තව නිකං බලං

කොළඹ

1. දවල් සිහින දකින
සරසවි සොයුරනි
රු.7500 වැටුපක
දුෂ්කර සේවයට
තෙල් නියෝජිතයන්
බවට පත්වන
කෙසඟ සිරුරු
අනාගතය බිලිදෙති...(සුභ ගමන්)

2. සැමට ලැබිය යුතු රැකියාව
සැමට නොලැබෙන රැකියාව
සැමට ලැබිය යුතු උපාධිය
සැමට නොලැබෙන උපාධිය
අහෝ! උපාධියට නොලැබෙන රැකියාව
රැකියාව නොලැබෙන උපාධියක්!

කැලණිය

1. නරියා හූ තියයි උෟ ළඟ ඩිග්රි නැති
එළුවට රැවුළ ඇත වාසිටි ආවෙ නැති
මට ඒ දෙකම ඇත, එනමුත් නුවණ නැති
සහතිකවලට මිස ඩිග්රිය පලක් නැති

යම් සම්පතක් හෝ අවස්ථාවක් භුක්ති විඳින විට එහි වටිනාකම නොදැනෙන අය එම අවස්ථාව අවසන් වූ පසු එහි වටිනාකම හා ගුණය මහ ඉහළින් වර්ණනා කරන්නේ යැයි පිළිගැනීමක් සාමාන්‍ය සමාජයේ ඇත. එම ධර්මතාව සරසවි සිසුන් හටද පොදු යැයි සිතෙන තත්ත්වයක් සරසවි කුරුටු ගී තුළින්ම මතුවීම සැලකිල්ලට භාජනය විය යුතු කරුණකි. කුරුටු ගී වර්ග කිරීමේදී සමුගැනීම නමින් වර්ගීකරණයනයට ලක් වූ කවි එකතුව විමසීමේදී සිසුන් විසින් සරසවිය ජීවන තක්සලාවේ පහන් ටැඹක් හා යෞවනයේ සුන්දරත්වය රිසි සේ අත්විඳීමට හා ජීවිතයේ නිම් වළලු පුළුල් වීමට අවස්ථාව උදා කළ කෙම්බිමක් ලෙසින් හඳුන්වා දී ඇත.

මෙම කවි මගින් සරසවිය යෞවනයන් හට මඟ පෙන්වන හා අවස්ථාව ලබාදෙන සරුසාර තෝතැන්නක් ලෙස ඇගැයීමට ලක් වේ.

සාපේක්ෂ වශයෙන් අරගලය පිළිබඳව වැඩියෙන් කවි ලියා ඇති ජයවර්ධනපුර සරසවියෙන් අරගලයට ගැළපෙන සමුගැනීමේ ගීතයක් හමු වීම එක්තරා සමාජ ප්‍රවණතාවක් පැහැදිලි කරන ආකාරයක් දැකිය හැකිය.

ජයවර්ධනපුර

1. හිරු කිරණ බැස ගියා
මැයි මලත් පර වුණා
විදුදැයේ පින් බිමෙන්
ඔබ අපව හැර ගියා

2. මා මළ කලක සොයුරනි නිදහස මත්තේ
විදුදය මවට ගෞරවයක් විය යුත්තේ
සියලුන් නොබැලුවත් මගේ මළ කඳ මත්තේ
ජ'පුරට හිස නමා මිහිදන් කළ යුත්තේ

තමාගේ මෘත දේහය සරසවිය දෙසට හිස ලා වළලන ලෙස පැවසීම අරගලයට මෙන්ම සරසවියටද එකසේ ගෞරව කිරීමක් ලෙස සැලකීම වැරදි නැත.

මොරටුව සිසුහු, සරසවියෙන් ලද සොඳුරු පහස මෙන්ම ජීවිතය ශක්තිමත් කරගැනීමට ලැබුණු පිටිවහලද ගෞරවයෙන් යුතුව සිහිපත් කරති.

මොරටුව

1. දිනක්-
සිත කැගැසුවා ලොවට නොපෙනෙන්නට
මනස හැඬුවා මටම නොදැනෙන්න
ඒත් එනමුත්
සිතම සසල විය
කඳුළ බොඳ විය
ඒ සොඳුරු දිනේ
අපේ රැගුම් අපේ වැයුම්
ලොවම දකින කල
දැනුණ හැඟුමන් අප සිතේ
ආ ගමනෙ සොඳුරු බව හැගේ
පියමනින්නට විදුබිමේ
හැඬුම නවතා
සිනාසෙමු අපි
මව් තුරුලේ.

2. සිප්හලෙන් ඉගෙන ගෙන
දැනුම දෝතක් සිතට ගෙන
ගතින් පාසල හැර දමා
ගියත් විදුමවුනි මා
සිතින් පාසල හැර දමා
නොයන්නෙමි දිවි ඇති තුරා
හොඳ සිරිත් මට කියා දී
නිසි මඟ යන්නට මඟ පහදා දී
කෙසේ තුති පුදමිද මා.

පේරාදෙණිය සිසුන්ද සරසවිය හැර යන්නේ සරසවියට ගෞරවයෙන් හා හැර යාමට සිදුවීම පිළිබඳ දුකිනි. එහෙත් තවත් පිරිසකට ඉඩ දී යාම සමාජය හා යෞවනය පිළිබඳව සිතන බවට ඉඟියක් ලෙස ගත හැකිද?

පේරාදෙණිය

1. නැත යන්න සිතක්
   දමා ඔබ සරසවිය
   අද ඔබට සහ මට
   සෙවනක් දුන් හන්තාන
   සිහිල දුන් මහවැලිය
   මා ඔබ දමා ගිය පසු
   සරසවියේ තනිකර
   පවුරක් වේවි හන්තාන
   ඔබෙ දුක් මගෙන් සඟවන්නට බැඳි
   සෝ ගඟක් වේවි මහවැලිය
   ඒ දුක කියා දිව ඇදෙන

2. තෙවසරක අවසානය උදා විය
   නමුත් සරසවි මවුනි
   ඔබ හැරදමා ගමට යන්නේ කෙසේද
   නමුත් අප යා යුතුය
   තවත් පිරිසකට ඉඩ දී
   මේ සරසවි බිම

සරසවිය අපායක්, සිපිරිගෙයක් ලෙස විස්තර කළ රුහුණු සරසවි සිසුන් සමුගන්නේ කාලය ඉගිලී ගොස් නිම වූ සිව් වසරක උණුසුම් හැඟීම් මතකයට ගනිමිනි.

රුහුණ

1. ජීවිතයේ පැතිකඩ
   විවරණය කරන්නට
   මඟ පෙහෙළි කළා වූ
   නුඹ තුරුළ
   හැරදමා යමි
   තවත් කල් හිඳින්නට
   වරම් නැති හෙයින්

2. සිව් වසරක සරසවි
දිවි මගේ
බොහෝ සන්ධිස්ථානයන්
පසු කොට
අද අප ඉන්නේ
කොතැනකද
හෙට දිනයේ සමුගන්නේ
කෙලෙසකද
අපේ අතීතය අමතක
කර දමා
සරසවි මවුනි
අප ඔබගේ දූ දරුවන්
ගොන්නෙන් තවත් එක්
කොටසකි
සමුගන්නම් හෙට දිනයේ
ඔබ උණුසුම තුරුළු කරන්"

කොළඹ සරසවි සිසුන් සමුගන්නේ අපෙන් දැයට වන සේවය සරසවි දියණියට උපහාරයක් ලෙස පුදන බව පවසමිනි.

| | |
|---|---|
| පුරවර සරසවි බිමේ සිව් වසරක් | සොඳුරු |
| වනපොත් කළා දිවි මග බැඳ ගන්නට | පවුරු |
| එක බත කා උන්නේ නොම වී | සතුරු |
| සකිසඳ අසනු අප සැමදාමත් | මිතුරු |

සරසවි ජීවිතය සමනළ ලෝකයක් ලෙස දකින සබරගමුව යෞවනයෝ වෙන් වීමේ යථාර්ථයට මුහුණ දිය යුතු බවද පසුපසින් එන පිරිසට ඉඩ දිය යුතු බවද පවසමින් සියල්ලේ ගෞරවය සරසවියට හිමි කර දෙමින් සමුගනිති.

1. සමනළයට සමුදෙන දවස ඇවිදින්
දුකින් වුවත් යථාර්ථයට අපි
මුහුණ දිය යුතුය
ඉතිං සමනළයෙනි පියමං කරන්නට
අවසරයි
තවත් සමනළයන් පිරිසකට
සමනළයේ පහස විඳගන්නට
ඉඩදී

2. අපි අපෙන් වෙන්ව යමු
අපි අතින් ගිලිහී ගිය
සියලු දේ අතීතයට පවරලා

විවිධ පුද්ගලයින්ට සමාජය විවිධ ආකාරයෙන් සංජානනය වීම ස්වභාවිකය. 'යථාර්ථය කියා දෙයක් නොමැත. ඇත්තේ සංජානනය පමණි.' (There is nothing called reality; Only perception.) යන කියමන මෙහිදී නැවත වරක් තහවුරු වේ. එහෙත් එකම අරමුණක් සඳහා සාමූහිකව මෙන්ම පෞද්ගලිකවද උත්සාහ දරන යෞවනයන් පිරිසක් තුළ මෙවැනි පරස්පර විරෝධී අදහස් මතු වීම සරසවියේ කටුක බව මෙන්ම විශ්ව ස්වභාවයද විදහා පෙන්වන ලකුණක් ලෙස සැලකිය හැකිද?

**ආදරය පිළිබඳ සරසවි සිසුන්ගේ ආකල්ප**

සරසවියට පියමනින්නේ නව යොවුන් තරුණ තරුණියන්ය. සරසවි අධ්‍යාපනයේ අරමුණ ජීවිතය ඔසවා තබා ගැනීමට අවශ්‍ය තිරසාර පදනමක් දමා ගැනීමය. ග්‍රාමීය ප්‍රදේශවල වරප්‍රසාද හා පහසුකම් අඩු පවුල්වල දරුවන් වෙහෙස මහන්සි වී පාසල් අධ්‍යාපනය තරගකාරීව නිම කර සරසවි වරම් ලබාගැනීම සැබවින්ම නව ගමනක ආරම්භයක් බව එම දරුවන් මෙන්ම ඔවුන්ගේ දෙමාපියෝ ද විශ්වාස කරති. සරසවි අධ්‍යාපනය හමාර වන විට ලබාගන්නා උපාධියට අමතරව සාර්ථක ජීවිතයකට අවශ්‍ය අනෙකුත් කාරණාවන්ද සම්පූර්ණකර ගැනීම අවශ්‍ය බව සමස්ත සමාජයම විශ්වාස කරයි. රස්සාවට පසු පරස්ථාව යනු ලාංකික සමාජයේ ප්‍රකට ජනවහරකි. මෙයින් ඇඟවෙන්නේ උපාධිය මෙන්ම අනාගත සහකරුද සරසවියෙන්ම ලැබෙන්නේ නම් හොඳ යැයි දරුවන් මෙන්ම දෙමාපියන්ද බලාපොරොත්තු වන බවය. සමහර විටෙක මෙය උත්ප්‍රාසජනක කවියක්ද විය හැක.

සරසවි බිමේ සත්වසරක් ගත කෙරුව
මගෙ ලොකු දුවේ ඇයි අද ඔබ මට බැරුව
කුමරෙක් සොයා දෙන්නට මා නිදි මැරුව
අත් දෙක වන වනා ආවේ කිම දරුව

**ආදරය සහ ලිංගිකත්වය පිළිබඳව අදහස් ප්‍රකාශ වන අනෙකුත් කුරුටු ගී**

ජයවර්ධනපුර

1. ගහනකං ඉවසිලි නෑ
ගහ ගත්තම විසුමක් නෑ
ඇත්තටම නැතුවත් බෑ
මට නම් මෙහෙ කොක්කක් නෑ

2. විදුලිය සේ මෑදු කෝල බැලුම් ඇති
මහ අකුණක් සේ කෝමළ බස් ඇති
සිංහ ධේනුවක් සේ හුරතල් ඇති
නුඹෙන් ලැබුණ උණුසුම පමණක් මදි

කොළඹ

3. සිනා සලන ඔය දෑසට
මගේ කඳුළු නොපෙනෙන්නට
ටිකක් දුරස් වුණා මිසක
ඔබ අමතක කළා නොවෙයි

මොරටුව

4. කළුවර රෑක වැස්ස වී වහින්නම්
තෙමෙන්නට එනවාද අතින් අත
අල්ලාන හුඟක් දුර ඇවිදින්න නෙමෙයි
ළංවෙලා මට
අඬන්නට එනවාද?

පේරාදෙණිය

| | | |
|---|---|---|
| 5. | සරසවි ඇවිත් කල් මැරුවේ අපි | එකට |
| | පැකල්ටියේ වාත වුණේ අපි | එකට |
| | ගෙදර ගිහින් හිටි සතියේ | පමාවට |
| | ඇයි බැජියේ අහිමි වුණේ ඔය | ලෙසට |
| 6. | අක්කණ්ඩියේ නුඹ නොසලන් කඳුළු | කැට |
| | පෙම්වත් කුමාරෙක් ඒවිය හෙට නුඹ | වෙතට |
| | ලැම්බට් වේවි පව් නොකරන් ඔය | ලෙසට |
| | හිටියෙත් මෙය යහපත නුඹේ | අනාවට |

කොළඹ

| | | |
|---|---|---|
| 7. | අයියෝ මේ නම් කාගේ | දෝසා |
| | අලයන්ගේ මුදු වදනේ | දෝසා |
| | අයියෝ මීයා කෑවයි | පූසා |
| | ඩිග්රිය මොකටද නොමැතිව | පුසා |

8. ආදරය.....
නොසිඟන අය සිඟමන් යවන
නොදැවෙන අය දවා අළු කරන
නොමැරෙන අයව නොමරා මරන
සිතා ගත නොහැක එය නම්

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

9. බජිරිට උදව්වට මග තනි නො   තනියට
යන ලෙසටයි යන්නේ අයියගෙ   බෝඩිමට
අයියගේ කතාවට පෙම්බර   හිනාවට
බඹරී වහ වැටී ඇති හැටි   හැබෑවට

උදයෙම උයා නාලා බජිරියා   ගියා
නාගන්නට කියා බඹරි එහේ   ගියා
තව දවසක් යන්නට හැදුවොත් එහේ   එයා
බඹරිට හයි කරමි මැටි තටු දෙකක්   තියා

යොවුන් වියේ හදවතේ උපදින සිහිල් ආදරය බෙදා ගැනීමට කෙරෙන ආරාධනාවලින් කුරුටු ගී පොහොසත්ය. ආදරයේ පිවිතුරු බව, සොඳුරු බව මෙන්ම, ළෙන්ගතු බවද මෙම කවිවල සටහන් කිරීමට ඒවා ලියූවන් උත්සහ දරා ඇත.

මොරටුව

1. ජීවිතය ජීවත් කරවන්නට
පැතුම් එක් කළ නුඹ
ආදරය නම් කිමැයි
මට පසක් ගැන්විය
මහද ගැහෙන රාවය
හැඳින ගත් එකදු
සෙනෙහෙබර හදවතක්
මා අඳුරු සිත් ගැබේ
ආලෝකමත් පහන් සිළුව වූ නුඹ
ගත දැවටී හමා ආ
මුදු සිහිලැල් මඳ පවනයි
ආත්මය වසා පැතිරුණ
විශ්වාසයේ සෙවණැල්ලයි
මා ජීවිතයේ පිදුම් ලද
ඔබේ සෙනෙහස
දෙවොලක්මයි.

පේරාදෙණිය

2. හයියෙන් හිනාවෙන්න
   පුළුවන්නම් ලස්සනට
   ඒත්
   ඒ හඬ අතරින් කඩා හැළෙන
   කඳුළු බිංදු හංගන්න
   වෙන මඟක් හොයා ගන්න

   මා වෙතට ළං වෙන්න
   නුඹෙ හිත දෝරෙ ගලන දුක
   මගේ හදවතට බරක් නොවේ ඉන්
   දරා ගන්නම් මම
   සැහැල්ලු වේ නම්
   නුඹේ හදවත ඉන්....!

3. දැඩි තාපයෙන්
   මා දවාලන
   රිවි මඬලක් නොවී
   බැරිද නුඹට
   මා ළඟ පායන
   සෞම්‍ය සඳ වන්න

4. පෙනෙන නොපෙනෙන තරම්
   දුර ඈත නැවතිලා
   නුඹ වෙතිත් නොමැකී ගලා එන
   සිහිල් සෙනෙහස් දියර
   නැති කරයි
   ගිනියම් රස්නයෙන් පරඬැලක් වී
   මගේ හදවතට
   දරාගන්න බැරි තරම් සීතලයි මට
   නිදහසේ කියාගන්න බැරිව
   සිත හඬයි හැමදාම
   මගේ හදවතේ තෙරපෙන
   ඔබට බැඳි සෙනෙහස
   මහ මේරුවටත් වඩා
   බර වැඩියි මට
   එනමුදු රත්තරං
   දිවි තිබෙන තුරාවට
   ආදරෙයි මං

කොළඹ

5. සිනාවකට වඩා නුඹේ
කඳුළුවලට මං ආසයි
මා වෙනුවෙන් නැගෙන
කඳුළු නම්.....

6. ඔබගේ දෑසින්
මගේ ජීවිතය දකිමි
ඔබගේ සුසුමින්
මම ප්‍රාණවත් වෙමි
ඔබගේ හදගැස්මෙන්
මම ජීවත් වෙමි
ඉදින්
ඔබ මමමය
මම ඔබමය

රුහුණ

7. බ්‍රහ්මචාරි වන්නයි ආවත් සරසවිය බලා
තනිකඩ මගේ සිත කකියයි ඔකඳ වෙලා
කවදා ලබන්නද පෙම් බස් දොඩනු සොබා
පිහිටක් වෙතොත් නුඹ විතරයි නංගි බබා

පේරාදෙණියේ පවතින ස්වභාවික සුන්දරත්වය බොහෝ තරුණ හදවත් ප්‍රේමයට පොළඹවා ඇත.

1. මැලවුණු මල් බිම පතිත කරන්නට
සුළඟට ඉඩදෙන ගහට දුකක් නෑ
හදවත සැනසූ එකම මලක් ගැන
මට ඇති කැක්කුම ලොවට දැනෙන් නෑ

2. රතු පාටින් කහ පාටින් මල් ඇතුවත්
තෝර ගන්නෙ කොහොමද මා එකම මලක්
පැණි බේරෙන මල් සේරම මගේ උනත්
බලාගෙනයි ඇණ තියන්නේ වදී උලක්

සමහර අවස්ථාවල සරසවි සිසුන් අතර ආදරය යතාර්ථයක් බවට පත්වන්නේ නැත. එය හුදු හිතලුවකට පමණක් සීමා වන අවස්ථාද ඇත. පහත කුරුටු ගී වලින් මේ බව ගම්‍ය වේ.

කොළඹ

1. සැමදාම පෙරඹරට
   පායනා හිරු සේම
   මගෙ ලොව පහන් කළ
   ළෙංගතුම නුඹේ පෙම
   හදවතින් සිපගන්න
   පාරමී පිරුව බව
   නුඹ දන්නේ නෑ
   නුඹ තවම දන්නෙ නෑ.

2. සඳ එළිය සුන්දරයි
   හැමදාම
   එත් මම දුර වැඩියි
   නුඹ සේම
   තරුවක්ව හිත ළඟින්
   රැඳුණාම
   නුඹට සිත පෙම් බැන්දා
   පෙර බෝම
   කඳුළක්ව නෙතින් දුර
   ඇඳුණාම
   අමතකව යයිද මට
   හැමදේම
   අහිමි බව දැන දැනම
   ඉඳුරාම
   මම නුඹට ආදරෙයි
   හැමදාම...

සරසවිය තුළ සමහර තරුණ තරුණියෝ ආදරය පසුපස හඹා නොයති. එහෙත් ඔවුන්ගේ හදවත් ප්‍රේමයේ හිගකමින් වැළපෙන අයුරු ඇතැම් කුරුටු ගීවල නිරූපිතය.

1. සුනංගු මිතුරාගේ සිතුවිල්ල
   කෙල්ලේ
   නුඹට වගේම මටත් ආදරය කරන්න අතීතයක් තිබුණා
   ඒ වගේම අනාගතයකුත් තියෙනවා
   අපි හැමෝටම ඒ අනාගතය වටිනවා කෙල්ලේ
   එම නිසාම සුනංගු වී පැමිණි සුනංගු සිතුවිල්ලට තිත තියමු

2. පිපෙන තෙක් මා උන්නත් - කටු අකුලේ රෝස කුසුම
නෙළා ගන්න මට ලැබුණේ - මල නොව විස කටු අත්ත.

3. උඹ මගෙන්
අහපන් මම උඹට කැමතියි
නැත්නම් මට පිස්සු හැදෙයි
නුඹට තෙරෙන්නේ නැද්ද
මම ආදරෙද කියලා
මට කෙළින් කියන්න බෑ
මම කෙල්ලක් වුණු කරුමෙට
උඹ කියලා ඇමතුවේ
හිතේ දුක වැඩිකමට සුදූ...
දැන් ඔයා out වෙන්න ළඟයි නේද?
මට ඔයා නැතිව ඉන්න බෑ
දන්නවනේ මම කවුද කියලා...
ඔයාව මට හමුවුණේ පළවෙනි
දවසෙ NAT එකේදි.
ඔයා මට රැග් කළෙත් නෑ
මාව බේරුවා රැග් එකෙන්...
එදා ඉඳන් මම
ඔයාට කැමතියි...
දැන්වත් මට කැමතිද
අයියේ....

විවිධාකාර හේතු නිසා තමන්ට ප්‍රේමයේ සුන්දරත්වය අත්විඳීමට නොලැබෙන චරිත සරසවිවල හිඟ නැත. ඔවුන් තම හිතේ ඇති අසහනය පිටකරන ආකාරය විවිධ වේ.

කොළඹ

1. හීනෙන් ඔබ මට පෙනෙනවා නම්
කොට්ට පුළුං කන්නම්
කිසිදා ඔබේ අත නොලැබේ නම්
මෙට්ටෙ කොහුත් කන්නම්

කැලණිය

2. රසය විඳිමි කුණුගොඩවල එය නොවේ සුවේ
ගින්න නිවන රසට කෑම එළඟි තෙල් ප්‍රියේ
තිත්ත නොම බලා කෑවෙමි කොත්තුවක් පවා
කොත්තු කන්නවත් ඔබ මා ළඟට එයි කියා

රජරට

3. දියකර හරිම් කඳුළකින්
පාකර හරිම් සුසුමින්
නැගෙන ආවේගය
සිදුවිය හැකි නිසා අවැඩක්

**ඉතා සරල එහෙත් ළෙන්ගතු ආදරය**

ප්‍රේමයේ වේදනාව මෙන්ම සුන්දරත්වයද විඳි පෙම්වතුන් බොහෝ දෙනෙකු තම හැඟීම කවියකට ගොනුකර ගැනීමට නොහැකිව මෙන් ප්‍රසිද්ධ ප්‍රේම ගීත ලියා තැබූ අවස්ථා සෑම සරසවියකින්ම දක ගත හැකි විය. ඒ අතර මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ මෙම කවිය සෑම සරසවියකම දක්නට ලැබීම සරසවි පද්ධතිය පුරාම සරච්චන්ද්‍ර මහඇදුරුතුමන්ගේ කවිත්වයේ සෙවණැල්ල වැටී ඇති බවට සලකුණක් සේ සැලකිය හැකිය.

ජයවර්ධනපුර

1. ප්‍රේමය නම් අසෙනිය කුසුමක් වේ
රිසි වූ කෙනෙකුට පූජා කෙරුමට
ලෝබ සිතින් තොර පිදුව මනාවේ
පෙරළා ලබනට නොසිතා කිසිවක්

**විරහව**

විරහව හා ප්‍රේමය එකම කාසියේ දෙපැත්ත ලෙස සැලකීමේ වරදක් නැත. ඒ තරම්ම ඉක්මනට ප්‍රේමය බොඳ වී අහස උසට ඉදි කළ ප්‍රේම මාලිගා බිඳ වැටී විරහ වේදනා විඳීමට පෙම්වතුන්ට සිදුවන නිසාය. සරසවි පෙම්වතුන් සම්බන්ධයෙන් නම් මෙම ප්‍රවණතාව වඩාත් ඉහළය. ආදරය ඇඟවන කවි පදයකින් හැඟවුණා සේ 'නොවේ යන්නට බෝ දුරක් - තෙමෙන්නට පොද වැස්සේ අතිනත් අල්ලා ගෙන' ආරම්භ වන ප්‍රේම සබඳතා බිඳ වැටීම සාමාන්‍ය දෙයකි.

ජයවර්ධනපුර

1. නුඹද මා විය මාද නුඹ විය
නුඹ අන්සතු විය
මට කෙළවිය.

2. කඩා වැටෙන තුරුම දැන
   නොසිටියෙමි
   වීදුරු මාලිගා
   ශක්තිමත් නොවන බව

ආදරයේ මිහිරට වඩා විරහවේ වේදනාව කලාත්මක සිතුවිලි පිබිදවීමට උපකාරී වන බව බෝහෝ කලා නිර්මාණ විමසීමෙන් පැහැදිලි වේ. සරසවි බිම තුළද එය එසේමය. විරහ වේදනාව විඳින යෞවන යෞවනියන් තම වේදනාව පදවැල් ලෙස කුරුටු ගා ඇත්තේ රසවත් අයුරිනි.

ජයවර්ධනපුර

1. දෙනෙත් කඳුළැලි - ගලයි නැහැවෙයි
   සුසුම් හදවත - දවයි රිදවයි
   මගේ ලොව අද - තනියි පාළුයි
   ඇයි රිදෙව්වේ - මටයි හිතටයි

2. නෙත් හසරැල්ල නුඹ දුන් ගත සිත නිවන
   මුව හසරැල්ල නුග සෙවණකි හද පිනන
   දොඩමලු මුදු වදන් අම මී ලෙස හැඟුණ
   අද මතකයන් පමණකි සියොළඟ දවන

3. පැතුම් ඉටුවන දිනක් ඒවිද
   පෑ පැතුම් හැම බොඳවෙලා
   සිනාසෙන්නට වරම් නෑ මට
   කඳුළු නෙතු අග පරවෙලා
   සුසුම් ලන්නට නෑ තවත් ඉඩ
   සුසුම් හද තුළ සිරවෙලා
   නික්ම යන්නට අවසරයි මට
   නුඹෙ ලෝකෙන් වෙන් වෙලා

4. මගේ පැතුම් බොල් අහසේ පාවී යාදෝ
   නුඹේ සිතින් මා අමතක වී යාදෝ
   සරසවියේ බැඳි සිහිනය නිමා වේවිදෝ
   හෙට දිනයේ නුඹ මගෙන් වෙන්ව යාවිදෝ

5. සොඳුරු ජීවිත ගමනේ
ගිමන් හල වූ මේ විදු බිමේ
මා ලද කටුකම අත් දැකුම
නුඹ දැකීමෙන් දැනුණ වේදනාවන්
පමණමය

සරසවිය තුළ අවංකවම ආදරය කිරීම අම්හිරිම වේදනාව ලැබීමට සුදුසුකමක් බවට ඇතැම් කුරුටු ගී නිදසුන්ය.

මොරටුව

1. අහිංසක මගේ සිතට
දුන්නු මේ ගින්දරින්
වාවනු නොහැකිව
තවමත් මා වැලපෙන්නෙමි
මෙසේ මසිත රිදවන්නට
ඔබට සිත් වූයේ
අවංකවම මුළු හදින්ම
පෙම් කළ නිසාමද

**සරසවි සිසුන් යුද්ධය වැනි සමාජ සංසිද්ධීන් දකින අයුරු**

සරසවි සිසු දරුවන්ගේ දැනුම හා විමසුම ඔවුන්ගේ පෞද්ගලික විමුක්තිය හා අධ්‍යාපන කටයුතුවලට සීමා නොවීම අනිවාර්යෙන්ම සිදුවිය යුත්තකි. උදාහරණයක් ලෙස නියැදියට ඇතුළත් වූ කවි වර්ග කිරීමේදී 'යුද්ධය' මාතෘකාවක් ලෙස නම් කරන ලදදේ ඒ නිසාමය. තිස් වසරකට කිට්ටු කාලයක් ශ්‍රී ලාංකික සමාජය කම්පාවට පත් කළ පිපුරුම් හඬ ඇසුණේ කලාතුරකින් නොවේ. එසේම උතුරේ මෙන්ම දකුණේද සමාජයේ සෑම තරාතිරමකම පවුල්වලින් කිසියම් පුද්ගලයකු යුද්ධය නිසා පීඩාවට පත්වීම සාමාන්‍ය දෙයක් විය.

එහෙත් පුදුමයට කරුණක් නම් සරසවි දරුවන්ට මෙම කම්පනය තදින් දැනුණු බවක් නොපෙනීමයි. නියැදිය තුළ යුද්ධය පිළිබඳ ලියැවුණු කවි තිබුණේ ස්වල්පයක් පමණි. ඒ අතර යුද්ධය පිළිබඳ වැඩියෙන් කවි ලියා තිබුණේ අග්නිදිග විශ්වවිද්‍යාලය හා රජරට විශ්වවිද්‍යාලයයි.

මෙසේ ලියැවී ඇති කවි වර්ග කීපයකට අයත් වේ. යුද්ධයෙන් ඇතිවන විනාශය පිළිබඳව පොදුවේ ලියූ කවි මෙන්ම යුද්ධය ජයග්‍රහණය පදනම් කරගෙන ලියූ කවිද දැකිය හැක.

ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙහි විප්ලවයට හා අරගලයට සම්බන්ධ කවි රාශියක් ලියැවී තිබුණු අයුරු මතකය. ඔවුන් යුද්ධය පිළිබඳවද ලියා ඇත්තේද එම දෘෂ්ටි කෝණයෙන්මය.

ජයවර්ධනපුර

1. ඔබ අප ඉන්නෙ ගිනි ගෙන දැවෙනා රටක
ඔබ අද ඉන්නෙ දැවෙනා ඒ රට කොණක
ගිනිදැල් සිසිල් වැස්සක් වෙනවා නිසැක
රතුමල් පිපෙනු ඇත යන්නේ මැද දිනෙක

**සරසවියෙන් රණවිරුවන් හට සුභ පැතීමට කවි ලියා ඇත.**

මොරටුව

1. සුලෝහිත රුධිරය හෙළා
හෙළූ දෑ පිපාසිත හදවතින්
වැගිරෙන දා බිඳු වැටෙන
දෙරණත නැගි වැද රණ මතින්
අවි දරා රුපුන් තෙද බිඳ
පෙරට ඇදෙනා සිව් දිගින්
එඩි පතමි
ජය දද නගන්නට
නුඹ නොදත් නුඹ සොයුරෙකි.

පේරාදෙණිය

2. සොඳුරු පැතුමන් පොදි බැඳන්
හන්තාන පාමුල කල් යවන්නට
අහිංසක සිත් තුරුළු කරගෙන
කුරුළු දෙනෙත් ඉගිලුණා....
මහා කුණාටුව පැමිණෙන තුරු
නොදත් ඒ විහඟුන් සියල්ලන්
සුළඟ හමන දිශාවන් හට
දස අතේ උන් ඉගිලුණා....
තෙරක් නොපෙනෙන අනන්තය දෙස
දෑස් දල්වා මුව අයාගෙන
යනෙන සීමා අත බදාගෙන
අනේ උන්හැම විඳි දුකක්....
නොමැත කිසි සරණක් අදත්....

අග්නිදිග විශ්වවිද්‍යාලයේ සිසුන් යුද්ධයෙන් සිදුවන පොදු විනාශය පිළිබඳව මෙන්ම සමකාලීන යුද්ධය පිළිබඳවද ලියා ඇත. එම සටහන් යුද්ධය නිසා විනාශ වන මිනිසුන් ගැන මෙන්ම මානව ගතිගුණ ගැනද, විවරණයක යෙදෙයි.

බලවතුන් කුමන හෝ හේතුවක් ගෙන එකකට පසු එකක් ලෙස යුද්ධයට පැටලෙන නිසා නිදහසේ හුස්මක් හෙළීමට ඉඩක් ලැබේදැයි මේ කුරුටු ගීය ප්‍රශ්න කරයි.

යුද්ධයට කෙළවරක් නැත
හේතු ඇත එකකට පසු
තව එකක්
මිනිසාගේ ජීවිතයට කාලයක් ඇත
ලැබේද දිනයක්
භේද නොමැති ලෝකයක
හෙළන්න සුසුමක්

යුද්ධය ඉදිරියට ඇදෙන විට, මිනිසුන් පමණක් නොව සතුරු පෙදෙසක සිටින බළල් පැටවාද සතුරකු ලෙස දිස්වීම යුධවාදීන් හට එල්ල කෙරෙන තියුණු විවේචනයකි.

යුද්ධය එන විට
නොනැවතී ඉදිරියට
සතුරු නිවාස
අබියස උන්
පූස් පැටවාද
සතුරකු ලෙසම දිස් විය

යුද්ධයෙන් ජනතාවට කිසිම සෙතක් නොවනවා පමණක් නොව වෛරයේ මහා ගස වවන බව පැවසීම, යුධ විරෝධී වීමට වඩා මානව දායාව ඉස්මතු කර දැක්වීමකි.

1. යුද්ධය නැමැති පසෙහි පැළවූ
   මහා ගස වෛරයයි
   එහි වැඩුණු ගෙඩි කෑ
   සියලු මිනිසුන්
   එකිනෙකා මරාගන්න

2. නෑයන් නැති කරන
   සතුරන් ඇති කරන
   ලේ රුහිරු උරා බොන
   එකම සතුරා යුද්ධයයි

රජරට විශ්වවිද්‍යාලයද කවි ලිවීමට පොළඹවාලූයේ යුද්ධයේ පීඩාව තදින්ම දැනුණු ප්‍රදේශවල දරුවන් වැඩිපුර එහි සිටි නිසා විය

එකිනෙකා ඇන කොටා ගත යුතුය අප
කොළ රතු නිල් වූ බැවින්
බෙදා වෙන් විය යුතුය අප
සිහල දමිළ මුස්ලිම් වූ බැවින්
සෝල්හයිම්ලාද මැදිහත් විය
එකිනෙකා විශ්වාස නොවූ බැවින්
සමාසිතින් බලා ඉඳ ඇත
අප නොදත් වූ සයුර මේ දෙස
කම් නැත දේපළ මිනිසුන් වැළලුණද
විසඳුමක් දී ඇත සයුර අප වෙත
පෙන්වන්න යැයි දම්වැල් ලෙසින්

රජරට

1. නෙත් පැහැර
ඇවිල ගිය ගිණිසිළුව
වැසි කල කුණාටුව
හඹා ගිය
මුරණ්ඩු බට්ටිච්චෙක්
ඇඟිලි තුඩඟින් ගිලිහී
සලිත වී බිම වැටුණා
අනේ පව්
අහිංසක බට්ටිච්චෙක්

2. බිමේ උරුමකරුවෝ
කැකුළුය අපේ දරුවෝ
බිඳී වෙන්ව ගිය
ශාපලත් දේශයක
කෙසේ දකිනුව
හෙටට පායන
නැවුම් අරුණලු

සියලු අර්බුද නිසාම නිදහසේ සැබෑ අර්ථය විමසීම සාධාරණය.

යුද්ධයේ විනාශය පලවා හැරීමෙන් පසු රට නිදිගැට හැර නැගිටිය යුතු බව සරසවි සිසුන්ගේ අපේක්ෂාවය.

රජරට

සිහිනයක අරුමය
අනෝරා වැස්ස මෙන් කන් රිදවනා
යුද්ධයේ මියුරු හඬ පාවෙලා ගියා ඈතට
මඳ පවන හා මුසුව....
දෙනාසාපුඩුවලට වධ දුන් මිනී ගඳ
අශෝභන මිනී ඇටකටු මොහොතකින්
නැතිවුණා දේශයේම....
අඳුරු සෙවණැලි අතර සැඟව වුන්
යුද්ධයේ රුදුරු රකුසන්
පලාගියා මගේ දේශයම දමා.....
ඒ නිසාම අසරණවුන් අඩු කළා දේශයේම නිදිගැට හැර.....

ලාංකික සමාජය තුළ යුද්ධය සමඟම කියැවෙන නමකි දුටුගැමුණු. සරසවි සිසුන්ද ඒ අයුරින්ම යුද්ධය දැක ඇත.

සුදු පරෙවියන් ළග නෑදෑයන් මැරෙනු
හෙම්බත් බැවින් වියළුණු දෑසින් බලනු
අනියත බිමේ පෙර මහ සෑ ගොඩ නැගුණු
නිදියන් පුතේ තව වකුටුව දුටුගැමුණු

**දරිද්‍රතාව**

දීර්ඝ කාලයක් තිස්සේ ආර්ථික හා දේශපාලන විපර්යාසයන්ට බඳුන් වුවද දරිද්‍රතාවය මෙරට ග්‍රාමීය හා නාගරික සමාජයන්හි සුලබව දක්නට ලැබේ. සරසවිය සමාජයේ හරස්කඩක් නියෝජනය කරන නිසාත් බොහෝ සරසවි සිසුන් ගම්බද දුප්පත් දෙමාපියන්ගේ පවුල්වලින් එන නිසාත්, විවිධ අගහිගකම් නිසාම සරසවිය තුළදීත් අපහසුතාවන්ට හා පීඩාවන්ට මුහුණ දෙන නිසාත් 'දුප්පත්කම' කුරුටු ගී අතර ප්‍රබල හා ජනප්‍රිය මාතෘකාවක් වනු ඇතැයි අපි අපේක්ෂා කළෙමු. එහෙත් නියැදියට ඇතුළත් කවි අතර සාපේක්ෂ වශයෙන් ගත් කළ දරිද්‍රතාවය තේමා කරගෙන ඇත්තේ කවි කුඩා ප්‍රමාණයක් පමණි. දුප්පත්කම ගැන ලියැවී ඇති මුළු කවි සංඛ්‍යාව 25ක් හෙවත් 4%කි. එම කවි බහුතරයකින් ප්‍රකාශ වන්නේ දුප්පත්කම ජය ගැනීමට වෙහෙස නොබලා වැඩ කළ යුතු බවය.

ජයවර්ධනපුර

1. අමාරුවෙන්
   කට්ට කාපු එකා
   දවසක
   මදය කනවාමයි

කැලණිය

2. ගම් දනව් පහු කර ආවත් සරසවියට
යන්නට හිතෙනවා ආයෙත් ගෙදරට
එහෙම කළොත් කන්නට දෙන්නෙ කවුද අපට
බෑ බෑ ඉගෙන ගත යුතු පොළොවේ පය ගහන්නට

දුප්පත්කම ගතින් මෙන්ම මනසින්ද දරාගෙන සිටින සමහර සරසවි දරුවන් සෘජුවම දැනෙන බඩගින්නේ පීඩාව සටහන් කොට ඇත.

රුහුණ

1. අපි ආවේ ඉගෙන ගන්න
අපිට වුණේ නොකා ඉන්න
ණය තියෙනවා ඉහ පිරෙන්න
අපි යනවා ගෙදර යන්න

2. බඩගින්න කුසගින්න
ඇවිළෙයි ඉතින්
විඳවන්නෙ රිදවන්නෙ
ඇයි මේ ලෙසින්
කොයි කවුරු දුන්නාද
මේ ගිනි ඉතින්
ඉවසන්න පුළුවන්ද බඩගිනි අපේ
බඩ දන්නෙ බඩගින්න වැඩි හන්ද නේ
පිටි බිව්වෙ ඒ ගින්න දුරලන්නනේ

3. අල්ලට සිඟාවත් රස නැති කැවිලි කකා
ලෙක්චර් හෝල්වල ලැග්ගා මකුණෝ කකා
සිව් අවුරුද්ද ගෙවනට මරු පහර නොකා
පිං දී ගන්නවා මහපොළ සිඟා කකා

අග්නිදිග විශ්වවිද්‍යාලයේ දරුවන් දුප්පත්කමේ බියකරු පීඩනය සටහන් කර ඇත්තේ මෙලෙසිනි.

1. මහ පඬුවන් පවා
ඌරන් බවට පත්කරවන
කුමකින් හෝ කුස පුරවන
තැනට පොළඹවන
බලයකි බඩගින්න

2. නොසිතූ විලසින්
පුදුමාකාර ලෙසින්
සියල්ල දවාලන
සුළි සුළඟකි
සාගතය

දිළිඳුකම පිටුදැකීමට සටන් වදින සරසවි දරුවන් ඒ වෙනුවෙන් බොහෝ දේ කැප කිරීමට සූදානම් බව සටහන් වී ඇත.

මා මිය ගියත් මේ දෙරණේ අසම සම
රතු මල් පිපේවා පොහොරට රැගෙන ළැම
ලෝකය පිටු දකින දිනයක දිළිඳුකම
නැගිටිම් ආත්මය සමගින් එදින මම

දුප්පත්කම සරසවි ආදරයට හරස් වූ සැටි සටහන් ඇත්තේ මෙසේය.

විරහ කඳුළක් නෙළා ගෙන විත්
හදේ සැනසුම නැති කළා
අනේ රුපියල නුඹේ හිඟකම
සිරා ලව් එක නැති කළා

සරසවිය තුළදී මුහුණදීමට සිදුවන විවිධ කායික හා මානසික පීඩාවන් මැදහත් සිතින් විඳ දරාගනිමින් අනාගතය සඳහා සූදානම් විය යුතු බව සබරගමු සිසුවෙක් සටහන් කර ඇති අයුරු:

කයෝර සුළඟ හමනා විට
ගිනි අව්ව දැනෙන විට
කරවටක් ගිලෙන තුරු
වන පොත් කරමින්
ඇල්මැරුණු බත් පතේ
හැමදාම ගත වැටෙන
කඩමලු කමිසයට
කිසි දිනෙක දොස් නොගා මැද සිතින් ඉවසමින්
රෑ යාමේ බෝඩිමේ
රළු ඇඳන් මතට වී
දුම්වැටිය උරමින්
මදුරුවන් පළවමින්
අනේක දුක් සිහිකරමි

කතරගමේ දෙවොල් බිමේ

කතරගමේ දෙවොල් බිමේ
නෑ දෙවියන් දුටුවේ
සිඟා යදින මල් කැකුළකි
නෙතු අද්දර පිපුණේ
කතරගමේ දෙවිවරුණේ
පතළ වෙලා දෙරණේ
සීනු හඬයි ඉකිබිඳුමට
වඩා තදින් ඇසුණේ
මැණික් ගඟේ දිය දෝතක
මලේ කඳුළු තිබුණේ
දෝතට ගත් කඳුළක තෙත
නෑ හිතකට දැනුණේ

පූජනීය භූමිවලද ඇති නැති පරතරය ඇති හැකි අයගේ වාසියට විසඳන අතර නැති බැරි අය කන්ද පාමුල සුසුම් හෙළන ආකාරය තවත් කවියකින් කියැවෙයි.

දිලිසෙන රන්වැට

කිරි කළ ගෙන පිරුවට බැඳ
සිරි මහ බෝ මළුවට එන
පිරිවර තවමත් හිමියනි
දිලිසෙන රන්වැට පාමුල

හිමි ඔබ පිට දුන් එදවස
රන්වැට නැත බෝ හිමි වට
බෝ හිමි අද රන් වැට මැද
පිරිවර රන්වැට පාමුල
ඇති හැකි අය රන්වැට පැන
සිතු ලෙස බෝ හිමි වැන්දට
නැති බැරි පිරිවර හිමියනි
තවමත් රන්වැට පාමුල

සරසවි සිසුන් නිසි පෝෂණයක් නොලැබ අසීරුවෙන් වේල පිරිමසා ගන්නා ආකාරය සටහන් වන්නේ සමාජය කෙරෙහි එල්ලවන දෝෂාරෝපණයක ස්වරයෙන්ද?

1. සේරු දෙකක බත් කොරහක් මගේ බඩට  මදී
   ගැහුවත් සිම්බල් කොපමණ මගේ හිතට  මදී
   පිළියන්දල නංගියාගේ වයස ටිකක්  මදී
   gim එකේදි රොටි කන්නට bursary යත්  මදී

2. බඩගිනි වෙලා මා ගිය කල  කැන්ටිමට
   10 නෝට්ටුව දී ඉල්ලාගත් බත්  එකට
   අඩු එළවළු සමග වැඩි පොල්කුඩු  එකට
   දිස්නය දිදී හිටියයි මැස්සන් කන ඇට  එකට

3. උපාධි කොළපත මාත් සමඟ අද හඬනව  කුසගින්නේ
   මගේ උගත්කම බිඳක් නොදුටු හිස් සඳගේ බියක්  වැන්නේ
   මසුරන් කෙතකට හිමිකම් නැති මට ඇයි ඔබ පෙම්  බැන්දේ
   මගේ උගත්කම ලීවෙමි කුමරියෙ සරසවියේ  බැම්මේ

**සරසවි සිසුන්ගේ මිතුදම**

සරසවි මානව මානවිකාවන් ගතකරන යොවුන් කාලය මිනිස් ජීවිතයේ සබඳතා සොයා යන අවධියයි. එම නිසා ඔවුන් අතර ඇතිවන සබඳතාවල ස්වරූපය හා නැඹුරුව වෙනස්ය. එම වෙනසට පුද්ගල වෙනස්කම් මෙන්ම, සාමූහිකත්වය පිළිබඳව ඔවුන් දක්වන ආකල්පද බලපාන බව පෙනේ.

කැම්පස් එකේ බත් කෑවේ අපි  එකට
ලයිබ්රියේ නිදි කිරුවේ අපි  එකට
අවුරුදු තුනක් කුප්පි දැම්මෙ අපි  එකට
අපි යහළුවේ මෙහි ආවේ පෙර  පවට

එසේම සතුට කඳුළ මැද, මිහිරි අමිහිරි මතකයන් හදේ රුවාගෙන එහි මිහිර සදාකාලික මතකය තුළ තබා ගැනීමට සිතන තරුණ තරුණියන්ද දැකිය හැකිය.

1. සිහින නිම්තෙර
   කඳුළු පිරුවට
   නුවන් දැහැනේ
   සැඟවුණාදෙන්
   සිතුම් අහුරක
   පැතුම් සුන්කළ
   හැඬුම් කවියක්
   නොම වුණාදෙන්
   සවන් පත් මත
   ගොළු වුණාදෙන්
   සදාකාලික
   අපේ මිතුදම
   හදේ ගැඹුරක
   ලියවුණාදෙන්

2. එක් සුන්දර දවසක
   පිය නැගුවා කැලණි සරසවි අසපුවට
   සිව් දෙසින් පැමිණි
   ආදරණීය මිතුරියන් සමග
   ගත කළ ඒ අවසන් කාලය
   කෙතරම් සුන්දරද.

3. පුරා වසරක් - සරසවි ගැබ තුළ
   සැප සම්පත් අතරින් - දුකද උරුමව
   සදාදර මිතුරියන්ගේ - අමිල සෙනෙහස
   කිසිදා අමතක නොවේ මට.

සරසවියට පැමිණීමට පෙරුම් පුරන සුවහසක් දරුවන්ට මඟ පෙන්වීම සඳහාම තාවකාලික දුක අමතක කර අකුරු කරන ලෙස දයාබර මිතුරියට ආරාධනය කරන මිතුරන්:

1. ජීවිතයේ ගිරිදුර්ග
   නගන්ට වෙර දරන
   පුංචි අතැඟිලි අතර
   පන්හිදේ අරුමයෙන්
   බුද්ධියට පණපොවන
   නුඹවන්ම

සා පිපාසයෙන් පෙළෙන
සුවහසක් දනන්හට
ගොතන්නට ජීවිතය
අකුරු කරපන් ඉතින්
දයාබර මිතුරියේ...

**සරසවිය තුළ විහිළු තහලු කර ඇති කරගන්නා සුළු අමනාපකම්:**

කැලණිය

1. මිතුදමේ නාමයෙන් දුක් කඳුළු දරන්නෙමි
සෙනෙහසේ නාමයෙන් මගේ පෙම පුදන්නෙමි
සිනා මල් විසිරුවා ජීවිතේ ගෙවන්නෙමි
විහිළුවෙන් දැස් රතු වූ බවක් කියන්නෙමි

සබරගමුව

2. සිනා සරදම් පිරුණු
මහවැලියෙ කාමර අතර
ගෙවී ගිය මල් සමය සිහිනෙකි
සඳට ඉකි බිඳ හඬන
නොදරුවන් නොවී අපි
සිනාසෙමු අතීතෙට සෙනෙහසින්

3. සමනළයෝ කතා කරන අන්තිම
මොහොත අවුරුද්දක් තරම්
කාලයක් ඇතුළත අපි අතරේ
කොතරම් බැඳීමක් ඇති වුණාද
අපි වෙලාවකට රණ්ඩු වුණා
ආයෙ යාළු වුණා කොච්චර
සුන්දර කාලයක්ද?

4. මම වැඩියෙන්ම ආදරය කළ
යාළුවා නුඹයි
මගෙ හිත වැඩියෙන්ම රිදෙව්ව
යාළුවාද නුඹමයි
තරහක් නැහැ හිතේ කොණකවත්
හිඳින්න සතුටින් සදාකල්

සරසවියට නන් දෙසින් පැමිණි මානවකයෝ එකම මග යන මිතුරන් වී අනාගතය ජයගැනීමටද මිතුදම භාවිත කිරීමට අපේක්ෂා කරති.

සිතුවිල්ලක්
පිබිදුණාවූ සිතින්
අනන්ත සිහින දකිමින්
පියනැගි පින් බිම
සුන්දරයි දස අතින්
නිදහසේ නිදන්නට
ඉඩ ලැබුණු දින අදයි
එකාමෙන් සිතන්නට
එකම සිහිනය දකින්නට
කවදා ලැබේවිද
නොආවානම් පුණ්‍ය භූමියට
මේ තරම් ළෙන්ගතුව
පරපුරක් හදන්නට
ජීවිතය දකින්නට
කම්කටොලු දරන්නට
හැකිවේද ඔබ නැතිව....
දිනෙන ලොව ජයගන්න
එකම එක මග යන්න
සපතවෙමි මා ඔබට
මා ළබැඳි සොහොයුරනි....

සරසවියේ අවසාන පරීක්ෂණය ලිවීමට සැරසෙන විට ජීවිතය ගොඩනගා ගැනීමට සහය වූ සැමට ගෞරව කිරීමේ අහිංසක ආශාව සටහන් වෙන්නේ මෙසේය.

ජීවිත සරසවියේ අන්තිම exam 1
ලියන්නයි මම යන්නේ
හෝඩියෙ ඉඳන් මට උගන්නපු
හැම ගුරුවරයෙකුටම පිං
මගෙත් එක්ක හිටපු හැම
යාළුවෙකුටත් ඒ වගේම....

**සරසවි සිසුන්ගේ කළගුණ සැලකීම (දෙගුරුන් නැමදීම)**

සමාජ ක්‍රමය පිළිබඳව විවේචනාත්මකව අදහස් ඉදිරිපත් කරන සිසුන් අතරම තමන්ගේ දියුණුවට අතහිත දුන් සමාජය හා පුද්ගලයින් දෙස කෘතඥතා පූර්වකව බලන සිසුන්ද සෑම සරසවියකම පාහේ දැකිය හැක. ගුරු දෙගුරුන් පිළිබඳව ප්‍රසංසාත්මකව ලියවුණු කවි 43ක් (5%) නියැදියට ඇතුළත් විය. මොන දුක් ගැහැට වින්දත් තමන් පැමිණි පරිසරය හා එහිදී සහය වූ පිරිස් පිළිබඳව ස්නේහයෙන් මතක් කිරීම මෙහි විශේෂ ලක්ෂණයක් ලෙස දැකිය හැකිය.

1. පැනපැන විත් ඉදිරියට
   විභාගය ඉදිරියේ
   පරඬැලක් නොවී
   කළු ගලක් මෙන්
   දිරිය ගැනුම ශක්තියයි....
   විභාගය ඉදිරියේ
   පරඬැලක් නොවී
   දිරිය ගැන්මට
   සිප්කිරින් මා ගතට
   ශක්තියක් දුන්
   නිබඳ සිටි මගේ
   ගුරු ඇදුරන්ට
   උදාවන තත්පරය
   ගෙවන හැම මොහොතකට
   මගේ ආයුත් රැගෙන
   ඔබ සසර රැඳේවා දයාබර
   මව්නි,
   පියාණෙනි....

2. ජීවිත ගමනේ 'අ' යනු
   'ආ' යනු කියාදී
   සෙනෙහසේ අස්වනු ලබාදුන්
   ආදරණීය මව්නි
   දැත් කරගැට වන තෙක්
   අප වෙනුවෙන් දහදිය වැපුරූ
   ආදරණීය පියතුමනි
   සිහිවන වාරයක් වාරයක් පාසා
   සරසවි බිම හැරදා
   ඔබ තුරුළට එන්න සිතුණු වාර
   අනන්තය
   එහෙත් කුමක් කරම්ද

3. මව් තුරුලේ දහඩිය සුවඳයි
පිය සෙනෙහේ ගෙයි පියස දරයි
සඳ හිරු පරදා දිවිය එළිය කළ
ඒ සෙනෙහස ගඟ දෙගොඩ ගලයි

සමාජ මතවාද ආකල්ප කොතරම් වෙනස් වුවත් 'අම්මා' පිළිබඳ ආදරණීය ගෞරවය හා මතකය සියලු දෙනාගේම ඇට මිදුළු තුළ පවා රැඳී තිබීම විද්‍යාමාන වන කවි දක්නට ලැබේ. එය සනාථ කරමින් මෙම කවි 43 අතර අම්මා වෙනුවෙන් ලියවුණු කවි 30 කට වැඩිය. පියාණන් ගැන පොදුවේ ලියවී ඇති අතර එක් දිගු සිතුවිල්ලක් දිග හැරෙන්නේ මෙසේය.

**නොඑන ගමන් ගිය අප්පච්චි**

අප්පච්චියේ නුඹ ගියාට
අපි හැමෝටමත් ඉස්සර
තාමත් දුක් වෙනවද අපි
දන්නවාද නුඹ කොච්චර
සරම් පොටත් අතට අරං
නුඹ ගෙට එනකොට ඉස්සර
මල් පිපුණද තැන් තැන්වල
කොච්චර නම් අපේ හිත්වල
නුඹේ දෑතින් ඇති දැඩි කළ
ගස්වැල් වල මල් කොච්චර
බිම හැලි හැලි දුක්වෙනවද
නුඹට දැනෙනවද කොච්චර
අව් වැසි නොබලා වැඩකළ
අප්පච්චියේ ඉක්මන් කර
ගෙදරට එන්න තාමත්
පමා වුණේ ඇයි මෙච්චර
කඳුළැලි බොනවා අපි හැම
නුඹ ගියදා පටන් තාමත්
තුන් මස පිරිලා වුණාට
නුඹ ආවේ නෑ මෙහාට
පාර බලා ඉන්නේ අපි
හැමදාමත් ගෙළ දික්කර
ගෙදර එන්ට පාර තොටත්
නුඹට අමතකද එච්චර

සරසවියට එන සමහර දරුවන් සම්ප්‍රදායෙන් හා පවුලෙන් එන ගුණාංග වෙනස් කළද එම ගුණාංග රෝපණය කිරීමට වෙර දරන මාපියන් පිළිබඳව සානුකම්පිතව බැලීමෙන් පිළිබිඹු වන්නේද මාපියන්ට ඇති ගරුත්වයමය.

ගමෙන් රැගෙන ආ
කොතරම් වටිනා මිණිකැට
මේ සරසවි බිම දමා යන්නට ඇත්ද
ජීවිතය තරම් වටිනා ඒ මිණිපහන්
දල්වනු පිණිස
දෙමාපියන් කොතරම් සිහින දකින්ටැත්ද

# අවසානය

සරසවි කුරුටු ගී, කවිය පිළිබඳ අපගේ ඇති සම්ප්‍රදායික අදහස් අභියෝගයට ලක් කරයි. කවිය යනු කුමක්ද යන ප්‍රශ්නය එක අතකට පොට පටලවා ගැනීමකි. කවිය යනු මෙයයි කියා නිර්වචනය කොට, එම නිර්වචනයට අනුගත නොවන සියල්ල කුකවි කියා බැහැර කිරීම අපට සිතන හැටියටනම් වරදකි. සරසවි කුරුටු ගී කවිද? යන ප්‍රශ්ණය මතු වන්නේ අපි කවිය යන්න පිළිබද පොත පතේ දක්වා ඇති අර්ථකතන වලට වහල් වෙමින් ඒවා කියවන නිසාය. මෙතනදී අපි සැලකිල්ලට ගත යුතු තවත් කරුණක් නම් සරසවි කුරුටු ගී වලට "කවි" වීමට අවශ්‍යද යන්නයි. මෙම ප්‍රකාශනයේ එන ආචාර්ය ඩබ්ලිව්. ඒ. අබේසිංහ විසින් රචිත "සරසවි කුරුටු ගී - කාව්‍යමය විමර්ශනයක්" හි කවිය පහත පරිදි අර්ථ දක්වා ඇත.

"කවිය පිළිබඳ වන පුළුල් නිර්වචනවලට පැමිණෙන්ට පෙර, ශබ්දාර්ථ විසින් ගත්තද, කවිය යනු, ප්‍රතිභාන ශක්තියෙන් යුක්ත වූ, උසස් සද් චේතනාවලින් යුතු වූ තැනැත්තකු විසින් නිමවන ලද, සහෘද සිත්හි චමත්කාරය දැනවෙන පරිදි නිර්මිත, අපූර්ව හෙවත් අභූතපූර්ව - පෙර නොවූ විරූ - නිර්මාණ විශේෂයක් බැව් නිගමනය කිරීම අපහසු නොවෙයි."

ප්‍රතිභාන ශක්තිය යනු මෙයයි කියා අර්ථ දැක්වීම ඉතා අසීරුය. තවද කවි ලියන සියලූ දෙනා "උසස් සද්" පුරුෂයන් හෝ ස්ත්‍රියන් ලෙස හැඳින්වීමට නොහැකිය. උදාහරණයක් වශයෙන් විසිවෙනි සියවසේ ශ්‍රේෂ්ඨතම කවියෙක් කියා සැලකෙන එස්රා පවුන්ඩ් ෆැසිස්ට් වාදියෙකි, දෙවැනි ලෝක යුධ සමයේදී ඉතාලි ඒකාධිපති බෙනිටෝ මුසෝලිනි හට ප්‍රසිද්ධියේම සහය දැක්වූවෙකි. ඔහු "සද් චේතනා යුතු තැනැත්තෙකු" කියා සිතීම විහිළුවකි. ඔහු එසේ නොවන නිසා කවියෙක් නොවේ කියා පැවසීම ඊටත් වඩා විහිලුවකි. ප්‍රකට නූතනවාදී කවියෙක් වන ටී. එස්. එලියට් ගේ කවි වලින් යුදෙව් ජාතිකයන් සහ ගැහැණුන් පිළිබඳ ප්‍රකට වන අදහස් ඉතා ප්‍රශ්නකාරීය. නමුත් එලියට් යනු විසි වන සියවසේ විශිෂ්ඨතම කවියෙක් බව බොහෝ දෙනා පිළිගන්නා කරුණකි. කවිය සෑම විටම, සමහර විට කිසිම විටෙක, පෙර නොවූ විරූ එසේ නැත්නම් අසහාය හෝ ඉංග්‍රීසියෙන් කියන්නේනම් "original" වන්නේ නැත. ටී.එස්. එලියට් "Tradition and the Individual Talent" හී ප්‍රකාශ කරණ පරිදී කවිය සහ සියලූ සාහිත්‍ය සම්ප්‍රදායෙන් පැනනගින්නක් වේ. ඔහුට අනුව විශිෂ්ට සාහිත්‍යකරුවන්, තම පුද්ගලත්වය සම්ප්‍රදායට කැප කරයි. ශ්‍රේෂ්ඨ කලා නිර්මාණ සියල්ල බිහිවන්නේ සම්ප්‍රදාය ගුරු කොට ගෙනය. එනයින් ගත කළ පෙර නොවූ විරූ කවියක් සැබවින්ම බිහි කළ හැකිද? බොහෝ කුරුටු ගී වල අපට සිංහල ජන කවි, නිසදැස් සහ ජනප්‍රිය සිංහල ගීත වල අභාෂය දක්නට ලැබේ. සරසවි කුරුටු ගී ද සම්ප්‍රදායේ කොටසක් බවට පත්වන්නේ මේ ආකාරයෙනි.

සමහර විට කුරුටු ගී වලට කවි වීමට උවමනාවක් නැති බව අප ඉහත දී සඳහන් කර ඇත. එය එසේ වන්නේ කවිය, කවියක් කියා අර්ථ දක්වන්නේ ප්‍රභුවාදී සාහිත්‍යමය

කතිකාවක් මගින් නිසාය. මෙම ප්‍රභුවාදී කතිකාව බිහිවන්නේ විශ්වවිද්‍යාල උගතුන්, කලා විචාරකයන් යන අතලොස්සකගේ සම්මාදම් වීමෙනි. කුරුටු ගී නිර්-ප්‍රභූ (non-elite) කලා මාධ්‍යක් ලෙස අර්ථ ගැන්විය හැකිය. නිර්-ප්‍රභූ කලා මාධ්‍යන් සම්ප්‍රදායික කලාවේ ඇති ඇතැම් ලක්ෂණ ප්‍රතික්ෂේප කරයි. එම ප්‍රතික්ෂේප කිරීම දේශපාලනික ප්‍රතික්ෂේප කිරීමක් ලෙසද අපට අවබෝධ කර ගත හැක. සෞන්දර්යයට මුල්තැන් දුන් සම්ප්‍රදායික කලා විචාරය අභියෝගයට ලක් කිරීමක්ද අපට කුරුටු ගී තුළ දැකිය හැක.

සමාජයේ අධිපති කතිකාවන්ට යටි තලයෙහි නිර්ප්‍රභූ මිනිසාගේ දුක්ඛ දෝමනස්සයන්, වෛරී හැඟීම් මෙන්ම විරෝධතා, ආවේග, අසැබියැයි හැඟෙන මෙන්ම අසම්මත ප්‍රකාශන කුරුටු ගී මගින් පළ කෙරේ.

එනයින් කුරුටු ගීය, බලාධිකාරයන් රහිත, ප්‍රභූන් නොවන, ප්‍රකාශන මාධ්‍යයක් අහිමි ජන කොටස්වල ප්‍රකාශන මාධ්‍යයක් ලෙස සැලකිය හැකිය. සම්මත, අධිපති කතිකාවන් තුළ ප්‍රකාශ කළ නොහැකි විරෝධතා, අසම්මත මෙන්ම සමාජ විරෝධී හෝ අධිකාර විරෝධී සිතිවිලි බොහෝ විට මෙමගින් පිළිබිඹු වේ. නිර්ප්‍රභූ මිනිසාගේ මානුෂික හැඟීම් මෙමගින් පිළිබිඹු වන අවස්ථාවද විරල නොවේ.

මෙම සන්දර්භය තුළ සරසවි කුරුටු ගී විමසා බැලීමේදී සරසවි සිසු සිසුවියන්ගේ ජීවිතවල, ඔවුන්ගේ උපසංස්කෘතියේ, ඔවුන්ගේ සමාජ ආර්ථික ජීවිතයේ සහ පොදුවේ ගත්කල තාරුණ්‍යයේ හරස්කඩක් එමගින් නියෝජනය කරන බව පැහැදිලි වේ. කුරුටු ගී රචකයන් අඥාතව සිටින බැවින් ඔවුහු සිය නාමය හෝ පුද්ගලභාවය ඉස්මතු කරගැනීමේ අරමුණින් තොර වෙති. එහෙයින් මෙම ප්‍රකාශන ඔවුන්ගේ අව්‍යාජ අදහස් පිළිබිඹු කරන අගනා මූලාශ්‍ර ලෙස සැලකිය හැකිය.

සාමාන්‍යයෙන් සරසවි සිසු ප්‍රජාව සැලකෙන්නේ සම්මත සදාචාර සීමාවන්ට වඩාත්ම අභියෝග කරන පිරිසක් වශයෙනි. සරසවි උපසංස්කෘතිය නිරන්තරව බාහිර සමාජයේ කුතුහලය මුසු විමසිල්ලට නිමිති වූවකි. හැඟීම් හා අදහස් ප්‍රකාශනයේදී මෙන්ම අන්‍යොන්‍ය සබඳතාවලදීද ඔවුහු බාහිර සමාජයට සාපේක්ෂව වැඩි නිදහසක් භුක්ති විඳිති. එහෙත් මෙම කුරුටු ගී වලින් පිළිබිඹු වන අදහස් සම්මත සදාචාර සීමාවන්ගෙන් බැහැර වන්නේ ඉතා මඳ වශයෙනි. සැබැවින්ම 'අසැබි' හෝ අසම්මත යැයි කිව හැකි කිසිවක්ම නොමැති තරම්ය. කර්තෘන් අඥාතව සිටින අවස්ථාවක පවා ප්‍රකට කරන මෙම සාධකය සරසවි උප සංස්කෘතිය පිළිබඳ ස්ථාපිත මතවාදවලට අභියෝගයකි. අනෙක් අතට කුරුටු ගීය අදහස් ප්‍රකාශනයෙහි අසීමිත නිදහසක් සහිත අවකාශයක් පිළිබඳ නිදර්ශනයක් ලෙස සලකතොත්, එයින් ප්‍රකට කෙරෙන ඉහත සාධකය, අදහස් වාරණයට පක්ෂ වන්නන්ගේ සාම්ප්‍රදායික තර්ක නිශේධනය කරයි.

මෙම කාරණය තවදුරටත් විමසා බැලිය යුත්තකි. සරසවි කුරුටු ගීයෙහි ආකල්ප හා සදාචාර සීමාවන් බාහිර සමාජය හා බොහෝ දුරට සමපාත වීමෙන්

පෙන්නුම් කරන්නේ සරසවි උප සංස්කෘතිය හා බාහිර සමාජය අතර පරතරය තුනී වී ඇති බවද? පර්යේෂණයට පාදක කරගත් කුරුටු ගීවල සංයුතිය පරීක්ෂා කිරීමේදී එම අදහස තව දුරටත් තහවුරු කරන සාධක හඳුනාගත හැකිය. ඉන් ප්‍රධාන කරුණක් නම්, කලක් විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ප්‍රබල වශයෙන් ප්‍රකාශ වූ විප්ලවවාදී ආකල්ප හා සමාජ වෙනසක් පිළිබඳ අපේක්ෂාසහගත බව ප්‍රකට කරන ප්‍රකාශන මෙම නියැදිය තුළ ඉතා අල්ප වීමය. සරසවි උප සංස්කෘතිය (sub-culture) උප සංස්කෘතියක් වූ පමණින්ම එය ප්‍රති-සංස්කෘතියක් (counter-culture) නොවේ. එක අතකට සරසවි උප සංස්කෘතිය යනු, අධිපති මතවාදයන් අභියෝගයට ලක්කිරීමට වඩා නවක වදය ආශ්‍රය කොට ගෙන බල ධුරාවලියක් ගොඩ නැගීමට ගන්නා අභිප්‍රායකි. සාමාන්‍යකරණය කළ නොහැකි වුවද අධිපති කතිකාවන් පිළිබඳ ප්‍රබල විචාරයක් සරසවි උප සංස්කෘතිය තුළින් මතු වන්නේ කලාතුරකිනි.

අනෙක් අතට මෙම නියැදියට අයත් කුරුටු ගී රටේ කේන්ද්‍රීය ප්‍රශ්න කෙරෙහි ඉතා අඩු අවධානයක් ප්‍රකට කිරීමද විශේෂයෙන් විමසා බැලිය යුත්තකි. තිස් වසරක් පුරා පැවති, රටේ සියලුම ක්ෂේත්‍ර කෙරෙහි බලපෑම් ඇති කළ යුද්ධය, නියැදියෙන් 20%කට පමණ නිමිති වී ඇතත් ඒවායින් බහුතරය යුද්ධයේ බලපෑම සෘජුව දැනෙන අග්නිදිග හා රජරට විශ්වවිද්‍යාලවලට අයත් වේ. කොළඹ හා රුහුණ විශ්වවිද්‍යාලවලින් ඒ විෂය පිළිබඳ ලියැවුණු එක් කුරුටු ගීයක් හෝ හමුවී නැත. අග්නිදිග හා රජරට සිසුන් යුද්ධයේ ආදීනව දකින විට ජයවර්ධනපුර, මොරටුව යන සරසවිවල සිසුන් රණවිරුවන් කෙරෙහි වඩාත් සංවේදී වී ඇති අයුරු පෙනේ. කලක් සරසවිවලින් රටේ කේන්ද්‍රීය ප්‍රශ්න සම්බන්ධයෙන් තියුණු ප්‍රතිචාර පළ වූ නමුත් මෙම නියැදිය තුළ පළ වී ඇති අදහස්වලින් එබඳු තත්ත්වයක් නිරූපණය නොවේ.

අදාළ නියැදිය තුළ වැඩිම කුරුටු ගී ප්‍රමාණයකට වස්තුවිෂය වී ඇත්තේ ප්‍රේමය හා විරහවයි. එය කුරුටු ගී පමණක් නොව සියලුම නිර්මාණ ක්ෂේත්‍රවලට පොදු තත්ත්වයක් ලෙස හඳුනාගත හැකි සාධකයකි. ප්‍රේමය සම්බන්ධ විවිධ සංකීර්ණතා මෙන්ම ප්‍රේමයේ වින්දනීය පක්ෂයද මෙම කුරුටු ගී අතර පොදුවේ නිරූපිතය. විශේෂයක් ලෙස පෙනෙන්නේ විරහව සම්බන්ධ රචනාවලදී පිළිබිඹුවන නිවුණු ස්වභාවයයි. ප්‍රචණ්ඩත්වය හෝ වෛරය ප්‍රකට කරන අදහස් ඒ තුළ හමු නොවේ.

අදාළ නියැදිය තුළ ප්‍රේමය හැරුණුවිට වැඩිම කුරුටු ගී ප්‍රමාණයකට විෂය වී ඇත්තේ සරසවි ජීවිතය හා උපාධියයි. සමස්තයක් ලෙස ගත් විට එම අදහස් ප්‍රස්තුතය පිළිබඳ නිෂේධනීය ආකල්ප ප්‍රකට කරයි. එය එක්තරා ආකාරයට සරසවි කුරුටු ගී වල අතීතයේ පටන්ම පැවති ප්‍රවණතාවකි. සරසවි සිසු ජීවිතයේ දුෂ්කරතා, ආර්ථික දුෂ්කරතා, අධ්‍යාපන කටයුතු වෙනුවෙන් දරන්නට සිදුවී ඇති වෙහෙස, විභාග පීඩනය, උපාධියේ වටිනාකම පිළිබඳ ගැටලු, අනාගතය පිළිබඳ අවිනිශ්චිතබව ආදිය ඔවුන් අතර සුලබ මාතෘකාය. සරසවි සිසු ජීවිත කාලානුරූපීව වෙනස් වී ඇතත් මේ කරුණු පිළිබඳව ලියැවී ඇති කුරුටු ගී වල සාම්‍යයක් දැකිය හැකිය. එසේ වුවද හුදු කලකිරීම, අපේක්ෂාභංගත්වය මිස එම සාධකවලට එරෙහි

අරගලකාරී ප්‍රවේශයක් දැකිය නොහැකි වීමද කැපී පෙනෙයි. සරසවිය පිළිබඳ භක්තිමත්ව පළ කෙරෙන අදහස්ද සැලකිය යුතු ප්‍රමාණයක් ඒ අතර හමුවේ. දෙමාපියන් කෙරෙහි වන භක්තිය ප්‍රකාශ කිරීමද මේ නියැදිය තුළ කැපී පෙනෙන තේමාවකි.

සරසවි කුරුටු ගී පුරුෂ මූලික ප්‍රකාශන මාධ්‍යයක්ද, නැතහොත් ස්ත්‍රීන්ගේද ප්‍රකාශන මාධ්‍යයක් වශයෙන් සැලකිය හැකිද? ඊට ඍජු පිළිතුරක් සපයාගැනීම දුෂ්කර වුවද එයින් බහුතරය පිරිමින් විසින් රචිත ඒවා බව පැහැදිලිය. රචකයාගේ ස්ත්‍රී-පුරුෂභාවය හඳුනාගැනීමට හෝ අනුමාන කිරීමට නොහැකි නිර්මාණ ඊළඟ වැඩිම පංගුවයි. ස්ත්‍රී අනන්‍යතාව ප්‍රකට කරන කුරුටු ගී ඊට සාපේක්ෂව ඉතා අල්පය.

සරසවි කුරුටු ගීය සමස්ත සරසවි සිසුන්ගේ අදහස්වල නියෝජනයක් ලෙස ගතහැකිද යන ගැටලුවටද නිශ්චිත පිළිතුරක් සැපයීම දුෂ්කරය. මේ වන විට සමාජ මාධ්‍ය කෙරෙහි විශාල නැඹුරුවක් දක්වන, එය තම අදහස් ප්‍රකාශනයේ ප්‍රමුඛ මාධ්‍යය බවට පත් කරගෙන සිටින තරුණ පරපුර අතර කුරුටු ගීය අප්‍රධාන අංගයක් බවට පත්ව ඇත්ද යන්න විමසා බැලිය යුතුය. එය කළ හැකි වන්නේ මෙම නියැදියට අමතරව සරසවි සිසුන් අදහස් ප්‍රකාශනයෙහි යොදාගන්නා අනෙකුත් මාධ්‍යද සමග සන්සන්දනාත්මකව විමසා බැලෙන පුළුල් පර්යේෂණයක් තුළිනි. කෙසේ වුවද කුරුටු ගී අපේ රටේ සරසවි අධ්‍යාපනයේ වන ප්‍රතිවිරෝධතාවන්හි සහ තාරුණ්‍යයේ අභියෝගයන්හි දර්ශකයක් වශයෙන් සැලකිය හැකිය.

මෙම අධ්‍යයනයේ ප්‍රධාන ලිපිය සම්පාදනය කර ඇත්තේ නන්දන අජිත් විසිනි. මෙම ලිපියේ ප්‍රධාන අඩුවක් නම්, සාහිත්‍යමය කියවීමක් සඳහා ප්‍රමාණාත්මක ප්‍රවේශයක් ලබා ගැනීමය. "උපාධි ඉරණම", "දෙගුරුන් නැමදුම", "සරසවි අධ්‍යාපනය" ආදී තේමාවන්ට කුරුටු ගී බෙදා දක්වා සංඛ්‍යාත්මක වටිනාකම් ලබා දී තිබීමයි. සාහිත්‍ය/ කුරුටු ගී මෙසේ වර්ග කළ හැක්කේ කෙසේද යන්න ගැටලුවකි. බොහෝ විට එක කුරුටු ගීය තුළ තේමාවන් කිහිපයක්ම දැකිය හැක. කිසිම කුරුටු ගීයක් එක තේමාවකට ලඝු කළ හැකිද යන්න ගැටලුවකි.

මෙම විමර්ශනය සඳහා අපි භාවිත කර ඇත්තේ අප සතු සරසවි කුරුටු ගී එකතුවෙන් අතලොස්සක් පමණි. එම නිසා කුරුටු ගී පිළිබඳව සාමාන්‍යකරණයන් හට එළඹීමට අපට නොහැකිය. කවි සියල්ලම සැලකිල්ලට ගෙන මෙම විමර්ශනය සිදු කළද එසේ සාමාන්‍යකරණයන් හට එළඹිය හැකිද යන්න සැකසහිතය. එයට හේතුව වන්නේ විශ්වවිද්‍යාල තුළ ලියවී ඇති අති විශාල කුරුටු ගී සම්භාරය තේමාත්මක වශයෙන්ද, දෘෂ්ටිවාදීමය වශයෙන්ද විවිදාකාර වන නිසාය. එම නිසා මෙම කුරුටු ගී විමර්ශනයේ අභිප්‍රාය වන්නේ ඉන් අතැඹුලක් විචාරයට ලක් කිරීම පමණි.

# කොළඹ සරසවිය

| අංකය | ගීතය |
|---|---|
| 1 | පත් ඉරුව පන්හිදද<br>රැය පුරා සටන් වැද<br>කුළුදුලේ කවිපිංච<br>ලියන්නට වෙර දරයි...<br><br>එකිනෙකට නොපැහෙන කවි දෙපළ<br>නෙත් අගින්<br>ඔච්චමට සිනාසෙයි....<br>දෙතොල හසරැලි පැතූ<br>නෙතුදැල තෙමා ගිය<br>නුඹ මගේ<br>ආදරය වගේ මැයි... |
| 2 | දැන හඳුනාගත්<br>කාලේ ඉඳලා<br>ළබැඳි දයාවෙන් සිටිය නිසා<br>අප වෙනුවෙන්<br>අප නමින් හෙලන්නට<br>හෙටටත් කඳුලක්<br>ඉතිරිවෙලා.... |
| 3 | ඔබ මගේ හදවත මත<br>පිපුණු මල් පොකුරයි.<br>මම නුඹේ මල් පොකුර තුළ<br>එක මලක් පමණි. |
| 4 | සඳ පලුව ඉරුවාලු<br>ඔවුහු පවසති...<br>නිදහස් ඉරෙන් එළිය ගෙන<br>නැවත පුන් සඳක් හදමු. |
| 5 | පා තබනා බිම<br>වැලි කැටයක් වෙමි<br>දෙපා සිඹින්නට<br>අවසර නැති ද. |
| 6 | මට අහිමි වුනත් ඔබ<br>මංම කුරුටු ගෑ තවත්<br>එ කවියේ දුක නොවි<br>නොනිමි ප්‍රේමය වෙයන්. |
| 7 | කවිය ඔබ<br>මගෙ නොවෙයි<br>කුළුදුලේ ඔබ මැව්වේ<br>මගේ පන්හිද නොවෙයි<br>එත්...<br>එ නොනිමි ප්‍රේමයේ<br>දොර යන පදපෙලේ<br>පුංචි අකුරක් මමත්... |
| 8 | ජිවිතය නුඹ...<br>මට කියා දුන් ප්‍රේමය<br>අරුමයි...<br>පුදුමයි...<br>ඉස්තරම්... |
| 9 | ඉස්සර අපි දෙන්නා<br>දෙන්නම තමුන්ගේ<br>දැන් අපි දෙන්නා<br>දෙන්නම අනුන්ගේ |
| 10 | සිනාසි සිනාසි<br>දෙතොල් ඉරි තැලෙද්දි<br>හඬන්නට මිසක වෙන<br>කුමකටද නෙතු අපට |
| 11 | මේ සඳ යාමයේ<br>තනිවිය මා අද |
| 12 | හැකියාවට රැකියාවක්<br>බඩගින්නට නිමාවක්<br>මහින්ද ඉන්නකල්... |
| 13 | සපුමල් සුවඳක් සේ<br>යළි නැහැර යන්නේ<br>මහමෙර ලෙස ඔබ<br>නොසැලි සිටියා<br>ඇයි මුළු ලොව දුටුවේ |
| 14 | සිතට බොහෝ දේ<br>හිතෙන නමුත්<br>හදවතට ඇතැම් දේ<br>නොදැනෙයි. |
| 15 | දනසුන් මේ මහෙහි<br>සල මල් පෙති මතින්<br>යමු එන්න අත් බැඳන්<br>නොදෙයි කඩඉම්කරා<br>මේ මහට සිසිල දෙන<br>නිල තුරු පෙල නිමයි<br>රුදුරු රිවි කිරණ හිස<br>නොබෝ දුර පතිත වෙයි.<br>එන්න අපි යන්න යමු<br>නොගිලිහී මේ දැත්<br>අපි පතන අපේ ලොව<br>තව දුරයි, යා යුතුයි. |
| 16 | දෙනෝ දාහක් සිටියත්<br>ඔබ නැති අඩුව දැනේ<br>That is true<br>ඇයි මම ඉන්නේ...<br>තමුසේ මොකෙක්ද?<br>යකෙක්..... |
| 17 | ඔබ ළග නැති<br>අරුම දැනෙයි<br>නෙතු ළග<br>මහමෙර වැස්ස වහියි<br>හිත් කතරේ<br>සුසුම් සුළග<br>මහ කුණාටුවක්ව<br>හමයි... |
| 18 | නිදි වරා උන් රාත්‍රියක<br>පෙනි නොපෙනි ගියා<br>මිහිරිතම සිහිනයක<br>අමිහිරිම චරිතයයි<br>නුඹ... |

| | |
|---|---|
| 19 | සියල්ල අවසන<br>හිස්ය...<br>සුන්ය...<br>නිමිය... |
| 20 | ඉවක් නොපෙනෙන දුක්<br>කරපින්නා ගත්<br>දනව්වක් සොයා<br>ඇවිදගෙන...<br>ඇවිදගෙන...<br>.................<br>...................<br>ගියත්,<br>ඇත්තේ,<br>දුක් ගොන්නක් නම්?.. |
| 21 | පාඩම්පොතේ පුරා පිපුණු<br>අතුරු මල් යාය බොඳකර<br>දෙනෙත් ඉගි මරා හිනැහෙන<br>නුඹට පෙනෙයි නම්<br>නිති පොතේ පිටු මඟ හැර<br>ඉස්පිලි පාපිලි සරිකොට<br>ජිවිත පොත පය පාමුල<br>ඉතිලන අන්දම් |
| 22 | නවාතැන් පොලයැයි<br>සිතූ තැන ...<br>මාර්ග බාධකයක් පමනක්ම විය... |
| 23 | ලෝ...<br>එලෝ...<br>අනේ දෙයියනේ...<br>මේ මොන දුකක්ද?<br>cases අමතකයි.<br>කරුමේ තමයි. |
| 24 | නිල් මහනෙල් මලේ<br>නුඹ විකසිත කල<br>ගොහොරුවට වඩා<br>අහසෙන් එන වැහි බිඳකට<br>කිම පෙම් කලේ...? |
| 25 | සරසවියේ සඳ මතක<br>අතු පතර දල්වා තබා<br>මේ බිමේ අප මතක<br>දුර ඈත ගමනක් යන්න<br>දැන් ඉතිං සැරසිලා<br>දයාබර මිතුරු තෙම<br>හදවතේ සොයුරු පෙම<br>පොවා ළය උණුසුමට<br>ඔබ ඉන්න හැමදාම<br>සිත් යාව වැළපෙන්න<br>සිත් යාව හිනැහෙන්න. |
| 26 | ඉංග්‍රිසි හෝඩියේ මුළු අකුරු 26යි<br>ඒ අකුරු 26න් මුල් අකුර A තමයි<br>ඒ කාලේ A අකුර ඔහේ කිව්වා තමයි<br>එහෙත් A අකුරේ හැටි දැනෙන්නෙ<br>දැන් තමයි...<br>පුංචි අපිත් A දිහා බැලුවෙ නෑ<br>එහෙත් අද A අකුර අපි දිහා බලන්නෑ...<br>ලකුණු 75ක් සුළු පටු ද දෙයියනේ<br>A අකුර මේතරම් වටින්නේ ඇයි |
| 27 | උණුසුම් වු මේ කුරිරු ලොවේ<br>ඇයි ද මා මෙලෙස තනි කෙරුවේ |

| | |
|---|---|
| 28 | දැස වසා ගම්<br>ඔබ නොපෙනෙන්නට<br>සිහිනෙක දැවටි ඔබ එනවා...<br>සිත සිරකරගම්<br>ඔබටනොඑන්නට<br>සිතුවිල්ලක් වි ඔබ එනවා... |
| 29 | දැස් අභියස<br>නිකිණි සිහිනය<br>ඉකිගසා හැඬුවා<br>ඇගිලි තුඩකින්<br>කඳුළු පිසලන<br>වරම් මට නැතුවා |
| 30 | ගංදෑල නිසලයි<br>නිසලව ගලායයි<br>පෙරසේම ගොළුවි<br>දෙහදක්<br>පෙම්වරා ඉකි බිදියි. |
| 31 | L.T.T.E<br>Simple but powerful |
| 32 | දෙලොවක් අතරේ<br>සරන ඔබේ සිත<br>මගේ මෙන්<br>සසැලෙන් නැතිව ඇති |
| 33 | ඔබේම<br>ලොවේ ම<br>හිරු පායා<br>සුදට සිනා සේවා. |
| 34 | බුද්ධිය සොයා යන්න<br>නමුත්....<br>විචිත්‍ර වු යෞවනය<br>අමතක නොකරන්න<br>මිතුරන් සමඟ විනෝදවන්න<br>ප්‍රේමය සුව පහසවිඳින්න.. |
| 35 | දුන්නද පාසලේ කෙල්ලන් හට මගේ සිත<br>දුක්විඳ ගිල් ලැබ ආවෙමි සරසවිය වෙත<br>සිව් වසරක් පණ ඇද්දත් සරසවිය මත<br>උපාධියට දවසයි කෙල්ලෙකුත් තවම නැත |
| 36 | යොවුන් විය එලිපත්ත<br>මත ඉඳන් බැතිබරව<br>අනුහසින් මවාලු<br>සෙනෙහසේ සේයාව<br>ඉරා සුණුවිසුනු කර<br>සැනසුමක් සොයන කල<br>සිහින සිතුවමක් වි<br>දෙනෙත් නොහඩනු මැනවි |
| 37 | ආදරය අසනිය කුසුමක් වේ<br>ලෝබ සිතින් තොර පිදුව මනා<br>කිසිවක් ආපසුනොම ගන්න සිතා. |
| 38 | නවාතැන් පොල ඔබයි<br>ඔබගේ සිනාවයි...<br>ජිවිතයෙ දිගු වන්දනා<br>ගමනේ.... |
| 39 | මටම හිමි වෙලා<br>මා ළඟ ඉන්න සඳා |

| | |
|---|---|
| 40 | ඩෙන්න ඩෙනා නා ඩෙන ඩෙන<br>විහාගෙ ළං වෙනවෝ...<br>කොච්චර පාඩම් කෙරුවත්<br>මට පාඩම් නැතියෝ.... |
| 41 | විශ්ව විද්‍යාලය<br>නිසරු මුඩු කෙතයි<br>කෙතටබැඳි ඇදුරු<br>පඹයන් රැසකි<br>අරුණෝදයේ සිට රැබෝ<br>වන තෙක්<br>මොට වු නඟුල් අදින<br>කැහැටු හරක් රැසකි<br>වහුට බොලේ විය<br>කපක් සීසැවත්<br>නෙලැබෙන<br>අස්වැන්නකි...<br>(සත්‍යයේ සටහන බුද්ධියේ විමසුම) |
| 42 | මේ නිහඬ බව බිඳින්න<br>තව මොනව හරි කියන්න<br>ඕප දූපඅහන්න හරි ආසයි නේද? |
| 43 | ඔබ ළඟ නැති විරාමයේ<br>හිත අද්දර රැඳෙන කඳුළු<br>බැහැ පිසලනු එමල් පැතුම්<br>සදාතනික සිහින වුවද<br>මල් පිබිදෙන හමිඳිරියේ<br>තණ'ග තුෂාර වියැකුණාට<br>වසන්තයක් හිම් නැති ලොව<br>කොයිද කැකුළු මල් පොපියනු<br>හෙමන්තේ වියැළුණු දළු<br>කෙදිනක හෝ යළි දිලෙවි<br>අනන්තක අපි කවදා<br>කොතැනක හරි මුණ<br>ගැසෙවි... |
| 44 | Love Knows<br>Not it's depth<br>Until the hour<br>Of separation |
| 45 | සිත් ලොවේ සෙනෙහසේ පහන්සිල<br>දැල් වුයේ ඔබේ නමින් පුදා....<br>අමාවකේ නිලඹර හැඩ කරනා<br>තරුව නුඹයි මගේ දිවිය පුරා. |
| 46 | මා සඳට කැමති බව දැනෙගෙන<br>ඔබ සඳ අයින් කලා අහසින්.<br>මා මලට කැමති බව දැනගෙන<br>ඔබ මල අයින් කලා නටුවෙන්. |
| 47 | ජිවිතේ කවියක්<br>ආදරේ සොඳුරුතම වදනක්. |
| 48 | නිල්වන් තලාවට වැටිලා වෙල්යාය<br>සඳසේ ගලයි පිදෙන රන් කරල් මත<br>සිත සුළං ගත දැවටෙයි නොකියාම<br>නෙත් දෙක වැසෙයි ඔබගේ රත්දෙතොල් ළඟ |
| 49 | පාසලෙන් ආවේ<br>අපි විහාගෙන් බේරිලා<br>එහෙත් අපි ආයෙමත්<br>විහාගෙට හිරවෙලා. |

| | |
|---|---|
| 50 | ජිවන කතරේ<br>බොහෝ දුර ආවෙමි<br>කටු අකුලේ ගල් බොරළු<br>මා දෙපා රිදවිය<br>ආපසු හැරෙන්නට<br>මසිත මට ඉඩ නොදේ<br>මැවෙයි මට ඔබේ දුක්බර<br>ආදරය අම්මේ... |
| 51 | රැ හි හඬනා පාළු අඳුරේ<br>මගේ තනිකම ළඟ ඉඳන්<br>සහන් එලියක් පතුරුවන්නට<br>පුංචි තරුවෙ පායපන්.... |
| 52 | අද පැ පෙම් සිනා<br>අම්මාට අහුවුණා<br>කොහු මිටින් තල තලා<br>අප දෙන්නා වෙන් කලා |
| 53 | සඳ එළිය සුන්දරයි හැමදාම<br>එත් මම දුර වැඩියි නුඹ සේම<br>තරුවක්ව හිත ළඟින් රැඳුනාම<br>නුඹට සිත පෙම් බැන්දා පෙර බෝම<br>කඳුලක්ව නෙතින්දුර ඇදුනාම<br>අමතකව යයිද මට හැමදේම<br>අහිමි බව දැන දැනම ඉඳුරාම<br>මම නුඹට ආදරෙයිහැමදාම... |
| 54 | සැමදාම පෙරඹරට<br>පායනා හිරු සේම<br>මගෙ ලොව පහන් කළ<br>ළෙංගතුම නුඹේ පෙම<br>හදවතින් සිපගන්න<br>පාරමී පිරුව බව<br>නුඹ දන්නේ නෑ<br>නුඹ තවම දන්නෙ නෑ. |
| 55 | අලුත් මල් එපා නම්<br>සකි නුඹේ පයට<br>කිමද කියන්<br>දිය දෙන්නේ<br>ගසමුලට.... |
| 56 | ගස වෙනුවෙන් පිපී<br>ගසටම සුවඳ දෙන<br>එපා වී බිම හෙලුවද<br>කොප සිතකුද නුපදින<br>පුංචිම පුංචි<br>කහපාට මල මම... |
| 57 | අවසන් දිනය සරසවියේ රැඳෙන<br>සමුගන්නේ කෙලෙසින්ද? |
| 58 | ලෙංගතුකම විදවමි කැපවෙමි ශෝකවෙමි<br>සදාකල් නුඹ නිසා. |
| 59 | පෙරුම්පුරාගෙන<br>අහස බැලුකල<br>සඳ ඇත අහසේ<br>සිනාසිසී. |
| 60 | හිරු මැකී යයි නිල අහසේ<br>සේද මිදුම් මාරුතේ<br>නිමා වී යයි මේ වසන්තේ<br>යලිත් නොම එ කිසිදිනේ<br>ගිනි කඳු පුපුරා ලෝ දියගලනා තරම්<br>රිදුම් දෙයි ආදරේ.... |

| | |
|---|---|
| 61 | ඉකුත් වත<br>නිකුත් වෙන<br>සරත් මත<br>මුකුත් නැත.<br>කියන්නට දෙයක් නැත<br>සිතන්නට දෙයක් නැත<br>පතන්නට කිසිවක්ම නැත<br>සියල්ල අහිමි සඳ |
| 62 | මා දැස් කවුළුවෙන්<br>හද ගෙතුලට කෙටු<br>විදුලිය<br>ඔබගේ<br>ඇස් දෙකයි. |
| 63 | උඹ මගෙන්<br>අහපන් මම උඹට කැමතියි<br>නැත්නම් මට පිස්සු හැදෙයි<br>නුඹට තෙරෙන්නේ නැද්ද<br>මම ආදරෙද කියලා<br>මට කෙලින් කියන්න බෑ<br>මම කෙල්ලක් වුණු කරුමෙට<br>උඹ කියලා ඇමතුවේ<br>හිතේ දුක වැඩි කමට සුදූ...<br>දැන් ඔයා out වෙන්න ලගයි නේද?<br>මට ඔයා නැතිව ඉන්න බෑ<br>දන්නවනේ මම කවුද කියලා.. |
| 64 | කලා වැව හිඳෙනවා<br>ආයෙමත් පිරෙනවා<br>මගේ හිත බිඳෙනවා<br>ආයෙමත් හැදෙනවා.... |
| 65 | "ඔබ ගැන මා කල්පනා කල<br>මට කල්පනාවක් නැත...." |
| 66 | ඉර රැගෙන යන්න<br>සඳ රැගෙන යන්න<br>මා පෙම් හිත පමණක්<br>තබා යන්න..... |
| 67 | ලස්සන දවසක මං<br>ඔබ වෙනුවෙන් සිටියා<br>මාගෙ නෙතු අද්දර<br>ඔබගේ සිනහව මැවුනා<br>ඔබගේ හදවතටයි<br>ආදරේ කරන්නට සිතුනේ<br>මගේ ආදරේ.... |
| 68 | ඔබ හිනැහෙන විට<br>මුළු ලොවම<br>ඔබ සමගින් සිනාසෙයි. |
| 69 | ජීවිතං පුබ්බෝ<br>ඉලෙක්ට්‍රික් බල්බෝ.. |
| 70 | දවල් සිහින  දකින<br>සරසවි සොයුරනි<br>රු.7500 වැටුපක<br>දුෂ්කර සේවයට<br>තෙල් නියෝජිතයන්<br>බවටපත්වන<br>කෙසඟ සිරුරු<br>අනාගතය බිලිදෙති...(සුභ ගමන්) |

| | |
|---|---|
| 71 | ඔබේ නම් ඇස් දෙක<br>මගෙයි ඉන් ගලා යන හැම කඳුළු බිඳුවක්ම |
| 72 | අනේ පිලෝ<br>ඇවිත් පලෝ<br>උඹේ ක්‍රිමිනල්<br>අරං පලෝ |
| 73 | ඉගිල්ලුනා කාලය වේගයෙන්<br>නිමවුනා සිව්වසර ප්‍රිතියෙන්<br>යායුතුයි සමුඅරන් සරසවියෙන්<br>කෙසේ යන්නද අමතක කර<br>අකුරු කෙරූ මේ පින්බිම<br>ආදරණිය මිතුරු මිතුරියන්<br>නමුත් යායුතුයි<br>එ තමයි යථාර්ථය<br>සුන්දර එ අතීතය<br>ගෙනදුන්න ඒ පන්නරය<br>ගෙනයාවි අනාගත ජිවිතය<br>දියුණුවේ දොරකඩට<br>දුකක් නෑ සමුගන්න |
| 74 | ඔබ සොයාගත් දිනේ<br>මා සිතුවේ මම<br>කොලොම්බස් කියලා<br>නමුත් මට දැන්<br>තේරෙනවා මම<br>කම්බස් කියලා. |
| 75 | ගං දිය මත<br>සුදු සඳරැස් වැටුණාට<br>ගංදිය කවද<br>සඳෙහි ස්පර්ශයක් නම්<br>ලබයිද?.... |
| 76 | අත ලග විභාගේ<br>අසමත් වුණොතින්<br>ශාප කරමි<br>උඹට<br>මටම අකීකරු<br>මුරණ්ඩු මගේ හිත<br>උඹ මට හතුරෙක්.... |
| 77 | "පිපි විකසිතව<br>ඔබ<br>මදෙස බලනා විටදී<br>ආදරෙයි කියන්නට<br>වචන නෑ<br>මා ගාව...." |
| 78 | ඔබ නැති මේ සරසවි බිම<br>මට මල් වත්තකි..... |
| 79 | මට විතරද<br>දුක හිතෙන්නේ<br>ඔබ දවසක්<br>නොදුටුවාම<br>මගේ විතරද හිත අඩන්නේ<br>ඔය ඇස්දෙක නොදුටුවාම. |
| 80 | මතු රැකෙනා ශිල්පයමයි උගතමනා. |

| | |
|---|---|
| 81 | ජීවිතත් සහස් කවි<br>මා අතින් ලියවුණා<br>සතුට සැනසුම කඳුල<br>ඒ අතර සැඟවුණා<br>නිහඬ වූ නිමේෂෙක<br>ඉතිං මා තනිවුණා<br>නුඹ නමින් ලියන්නට නොහැකි සිත<br>ගොළුවුණා. |
| 82 | අහිම වේ නම්<br>ඔබේ ලෝකය<br>දුරස් වි මං හිඳින්නම් |
| 83 | දයාබර සරසවිය<br>ඔබයි මගේ<br>ප්‍රේමය<br>දයාවිය මැණියන්. |
| 84 | ඔබය<br>සරසවිය<br>සංග්‍රාම භූමිය<br>ප්‍රේම පරාදිසය<br>මම මහළු විය<br>ඔබ තරුණ ය<br>වෙන්ව යා යුතුය අප. |
| 85 | සියවසරක් කියවුයෙමි<br>එහෙත් නොවැටහුණි<br>එබැවින්<br>ගංදියට විසිකළ<br>සොඳුරු කවියේ<br>සැඟවුණි ජිවිතය... |
| 86 | රැවුල කපන්නේ ආයෙමත් වැවෙන්නේ<br>මොකක්ද මේ කරුමේ<br>පිරිමි අපට හිමි රැවුල’ ලෙඩේ ගැන<br>නැද්ද සොයා බැලුවේ |
| 87 | පෙරුම් පුරාගෙන<br>අහස බැලු දා<br>සඳ නැත අහසේ අමාවකයි<br>දොදොල් හදාගෙන<br>නුඹට ගෙනාවත්<br>නුඹ අද තරහියි<br>අනේ දුකයි. |
| 88 | අගලකඩ දෙසුම<br>හොඳටම යල් පැන්න<br>J B ව්‍යාකරනයේ හිඳ<br>පල්වේලා<br>සරත් හැමදාම ලොකු<br>පොත් කියවනවා<br>ජයවර්ධන තිස්ස<br>හැමදා දොඩවනවා. |
| 89 | විසල්<br>මන්දිර<br>සිදි බිඳි ගියදා<br>අපේ පැල්පත...... |
| 90 | පුංචි තරුකැට කොටියක්<br>පෑයුවත්<br>සඳ නැති අඩුව<br>අහසට දැනෙනවාමයි<br>අමාවක දවසට.... |

| | |
|---|---|
| 91 | ආදරය<br>කියන්නට වරම් නැති<br>දකින්නට වරම් නැති<br>විදින්නට වර නැති<br>සිහිනයක අපුරුව. |
| 92 | ආලය සිගමනකි නොසිඟන<br>අය සිඟන<br>ආලය ගිනි ගොඩකි නොදැවෙන<br>අය දැවෙන<br>ආලය මඩ වලකි නොගිලෙන<br>අය ගිලෙන<br>කාලය ගෙවනු මැන<br>සොයුරනි හිතට ගෙන.... |
| 93 | ව්ලිය යනු අඳුරමය<br>සීතලය උණුසුය<br>එබැවින්<br>ජිවිතය ම වේ මරණය. |
| 94 | දැතට ගොඩ මේ<br>ජිවිතයෙ කුණු<br>නොමැකෙන<br>කිරි සුවදේ..... |
| 95 | ආදරේ....<br>පුළුන් වළා එහෙ මහෙ<br>පාවෙන නිල් අහස වගේ<br>සැනින් කළු වලාවන්ගෙන් බරවි<br>මහ වැසි වසි....<br>ඉනික්බිති<br>නැවතත් පැහැබර අහස..... |
| 96 | දුක හිතෙන්නැ මට<br>දැනෙන මුත් පාලුව...<br>වෙන් වුණෙ නැ නොවැ<br>හමුනොවුණා මිසක අප... |
| 97 | රඟන නුඹ හොඳයි<br>මිතුරන්ටත් වඩා. |
| 98 | හිරුපායා මට උණුහුම දැනෙනු එපා<br>සඳු පායා මට සිසිලය දැනෙනු එපා<br>නෙතු රතු වි කඳුළු මගේ වැටෙනු එපා<br>නුඹ සුළගක් වි සිත ගිනි අවුලන්න එපා... |
| 99 | තාරුනයය නුඹ<br>කියා දුන් ප්‍රේමය...<br>ඉස්තරම් යැයි සිතුවද<br>එය හිස් බවක්<br>පමනක්ම විය.... |
| 100 | සිහිනෙන් පවා මගේ සුබවිහරනය පැතු.....<br>රජකම තකා මම රජගෙට යතැයි සිතු.....<br>අම්මා දනිනම් සරසවි දිවියෙ තතු.....<br>අදම අරන් යයි මේ දුක් විදින පුතු..... |
| 101 | මේ දුෂ්කර ක්‍රියාව<br>උපාධිය ලැබෙන තුරු විතරද? |
| 102 | ගත වු හැම නිමේෂයකම<br>මා සිතුවේ ඔබ ගැනය<br>නමුදු ඔබ සිතුවේ ඇය<br>ගැන පමණි.<br>පැරදෙන්න<br>දිනුම දි එකම එක සැරයක්<br>ජිවිතේ පුරාවට දිනවන්න මට ඔබව |

| | |
|---|---|
| 103 | කවදාවත් හමුවුණේ නැහැ<br>කියා අමතක කරනු හැකි නම්<br>ආදරෙ නෑ බින්දුවක්වත්<br>කියා ඔබ හට යන්න හැකි නම්<br>ගෙවන මතුජීවිතයේ කිසිම දවසක්<br>මට ඔබව යලි හමු නොවෙනවානම්<br>ඇත්තමයි ඔබ දුරින් හිටියට<br>බින්දුවක්වත් තරහ නෑ මම... |
| 104 | මුළු ලොව පුරාම<br>නුඹ සුවඳක් වී<br>විසිරෙන අයුරු.... |
| 105 | මගේ සිතට අමාවක ආ<br>වෙලාවට<br>කාටත් හොරා නුඹ<br>පුන් සඳ වුණා මට<br>මතු මා යතොත්<br>මට වෙන්වුනු අපායට<br>නැවිත් ඉන්න ඔබ<br>දෙව්ලොව වලා පිට.... |
| 106 | සයුරක් තරම්<br>මම නුඹට<br>පෙම් කලද<br>වැසි බිදුවක් තරම්වත්<br>නුඹ මට<br>ආදරේ නැති<br>බව දැන දැනම<br>මම නුඹට පෙම් කරමි |
| 107 | තනිව උපන් සිත<br>තනිව මියෙන සිත<br>කුමට වැලපෙනවද<br>තනිකමට.... |
| 108 | පරි කල්පනයෙන් තොර පර්යාලොකයක්<br>කොණ්ඩය භාගයකි<br>ඇන බැරල් එකකි<br>උදේ පාන්දර පිස්සු නටති<br>මෙලො දෙයක් තේරෙන්නේ නෑ. |
| 109 | I would do anything for you<br>Anything u want me to<br>I wanted go any where for you<br>Any where u ask me to<br>Please get any from me. |
| 110 | **ප්‍රේමය**<br>පරමානන්දනිය බව<br>මම දැන් දැන සිටිමි<br>එකි පරමානන්දය<br>මරණීය වේදනාවක<br>සටහනක් නොකරන්න<br>ඔබට හැකි වේ නම් |
| 111 | පාඩම් අවසානය<br>විභාග අවසානය<br>ඉතින් සමුදිය යුතුය නුඹට<br>ආදරය කරමි නුඹට<br>පොතට පතට අමතරව<br>නුඹ නිසා දුටු නරි කතුන්ගේ<br>හැඩ වැටුනු රුව මත<br>ගැසුණු විට<br>පොත් සොයන විට. |

| | |
|---|---|
| 112 | සඳ බැස ගොස් ඇත<br>මෙහි ගනඳුර ඇත<br>එත් ඉතිං කිම<br>සඳ කොහි හෝ ඇත<br>ආයෙත් දවසක<br>සඳ මෙහි එනු ඇත |
| 113 | සඳ බැස ගොස් නැත<br>ඔබ ළග මෙහි ඇත<br>ගණඳුරු වූ ලොව<br>පායන්නේ නැත<br>ගණදුරු එළිවූ කල<br>ඔබේ හදවත<br>ආයෙත් දවසක<br>සඳ පායනු ඇත. |
| 114 | සඳ දුටු<br>නෙතකට<br>තරු කැට පල කිම<br>මට නුඹ<br>මිස වෙන කවුරුද<br>සැනසුම. |
| 115 | නෙතු පිය රවටන<br>තරු මිණි කැටමිස<br>පායන්නේ නැත<br>හැම දින පුන්සඳ<br>දුක සැප එක ලෙස<br>එළිය අඳුර ලෙස<br>ලොවටම හිමි මිස<br>අප හට පැරදිය<br>හැකිවෙද ලෝ දම. |
| 116 | සුරතින්<br>ඔබ පිඳු<br>නෙතු කුසලානයෙ<br>හලා හල විෂම බව<br>දැන දැනම<br>මුව තැබු හින්දා කිසිත් දොස්<br>ඔබ වෙත නොදෙන්නෙමි<br>වරද මා අතේමය<br>මියෙන්නෙමි. |
| 117 | කටු කොහොල්<br>පිරි මාවතේ<br>දෙපය පිරිමදිමින්<br>සැනසුම් සුවක්<br>සොයා පියනැගුවෙමි.... |
| 118 | සිත බිඳුණද<br>තරු කඩා වැටුණා<br>මං ඉකි ගසා හැඩුවා..... |
| 119 | උතුරන සුවඳ නැති රතු වද මලක් වගේ<br>මතු කර පෙන්නුවේ වතු සුදු මලකි වගේ<br>වතු සුදු සුවඳ වද මලකින් පැතුව යුගේ<br>රතු වද මලෙන් වතු සුදු මල වැසුණි මගේ. |
| 120 | ගැහැණිය සංවේදී විම<br>ඇයගේ දුර්වලතාවයයි. |
| 121 | දරාගන්න බැරි සෙනෙහසක<br>ආදරණීය සුවඳක් වෙලා<br>ඔබ මගේ හිත අද්දරින්<br>පිපෙන කොට<br>කඳුළු වැස්ස අරන්<br>සමුගත්ත හෝරාව<br>මේ තරම් ඉක්මනින් ඒවි කියලා<br>අදහගන්නේ කොහොමද? |

| | |
|---|---|
| 122 | ඔබට රිදවිය හැක්කේ<br>ඔබට ආදරය කරන අයට පමණි<br>කෙනෙකු ඔබේ සිත දවයි නම්<br>ඔහුට හෝ ඇයට ඔබ ආදරෙ කරන්න<br>නමුත්<br>ඊට වඩා වටින්නේ කෙනෙකුගේ සිත<br>නොරිදූ විමයි. |
| 123 | ජිවිතයේ මිහිරියාව<br>ලබා දෙන්නට<br>සිතු ඔබ මට<br>නොසිතු නිමේෂයක<br>අහිමි විය<br>සදහටම<br>මා තනිවිය<br>යලිත් පාලු ජිවිතය තුළ<br>එහෙත් ඔබයි<br>මාගේ පැතුම. |
| 124 | දෙවියන් විසින් දුන්<br>පඬුරක් ලෙසින්<br>ප්‍රියයාණනේ ඔබ<br>සුරකිමි බැතින්..... |
| 125 | සුළඟක් වෙලා<br>ඔබ සොයා එන්න එහි<br>සෙවනැල්ල වගේ ඔබ<br>ළඟින් ඉන්න එහි. |
| 126 | කලක් ඇවෑමෙන්<br>පෙරුම් පුරා<br>ආවෙමි මම සරසවිය කරා<br>ආපසුයි වැටහුනේ<br>මෙය දුක් ගොඩක් කියා. |
| 127 | යළිත් හමුවන්න<br>නොපැතු හදවතේ<br>සැඟවී තිබුණි<br>පැතුමක්<br>යළි යලිත්<br>හමුවන්න. |
| 128 | සරසවිය පින්මකි<br>ශිල්ප ලබන්නාට<br>සරසවිය යුධ බිමකි<br>ගැටුම් කරන්නාට<br>සරසවිය දෙව්ලොවකි<br>පෙම් කරන්නාට<br>සරසවියදෙ ලොවකි<br>පෙම බිදුන ද<br>සරසවිය අපායකි. |
| 129 | අන් හදකට පෙමින් බැඳුනත් මා පෙම් සුවදින්<br>මට දුක් සෙනෙහෙ අඩු නැති බව දනිමි ඉතිං<br>දරුවන් කොතෙක් වෙහෙසක් සඟවන්න සිතින්<br>බැහැ රත්තරං නුඹ මගේ හිත අනේ ගිහින්. |
| 130 | මෙහෙම පාඩම් කලෝ<br>කවදා ගොඩ යන්නද<br>මොනව කරන්නද පාඩම් කලාට<br>මතක හිටින්නේ නැත්නම්. |
| 131 | වසන්තය නිමා විය<br>සදතනික යැයි සිතු |

| | |
|---|---|
| 132 | තල්පත් පවුරයි<br>පැලයි මාළිගෙයි<br>දෙහදක පැතුමන් බිඳ දැමුවා<br>හඬා වැටි ලොව ජයක් ලැබේවිද<br>බලා හිදිමු දෙතැනකට වෙලා. |
| 133 | සයුරම කැළඹී<br>පිටාර ගැලුවත්<br>යන එන මං නැති රළවාගේ<br>එපා උමතු වී සිත හඬන්නට<br>මතු භවයක හමුවෙමු ආයේ..... |
| 134 | අඹ යාළුවො<br>නිබඳ සෙවනැල්ල සේ<br>මගේ ලොකයේ<br>ඔබ මිණි පහන වේ. |
| 135 | දකින  විට මල් හිනැහිලා<br>බලන විට මල් පරවෙලා<br>ආදරණීය මල් වත්තේ.... |
| 136 | සමුගෙන යන්නට අවැසින ඔබට<br>සමුගෙන යන්න මගෙන්<br>නෙත් කෙවෙණි අග රැඳි කඳුළු බිඳු මැදින්<br>සමුදෙන්නම් සබඳ මා ඉතිං. |
| 137 | ඔබ<br>සුවඳ මල ....<br>මම<br>සුළඟ<br>අනන්තයට යන...... |
| 138 | **පොතේ සටහනක්**<br>ඇදවෙන ජිවිතය<br>හිනාවෙන මොහොතක්<br>කාලය පමණයි<br>නොදන්වා.....<br>මහ උළු ගෙදරට<br>මුවහත් පිහිහක්<br>පෝරකයට බෙලිතියම්<br>මතක බනට<br>පිරිවටක්<br>ඔක්කොම ලැස්තිනම්<br>ලිවරය පහලට<br>එල්ලන්න<br>ජිවිතයට<br>කවදවත්ම<br>යලි නුපදිනලෙසට. |
| 139 | **"මම"**<br>ආදරය දොතින් අරන්<br>වැඩියදා සෙනෙහස<br>අරං.....<br>ඔබෙන් හඳුනා<br>ගතිමි සකිසද<br>ජිවිතය නම්<br>කිමැයි.... |
| 140 | සඳක් වෙලා<br>රෑ අහසේ පායාලා<br>මලක් වෙලා<br>හද උයනේ පිදිලා<br>පවන් රොදක් සේ<br>ඔබ ලඟ දැවටිලා<br>ඉන්න හැකිද<br>ආත්මයක් පෙරුම්පුරා. |

| | |
|---|---|
| 141 | සිද්ධාර්ථයෙනි<br>නුඹට මෙන්<br>අපට අභිනිෂ්ක්‍රමණය<br>කල නොහැක<br>මන්ද......<br>නුඹට මෙන් අපට<br>සෘතුවෙන් සෘතුවට<br>සත්මහල් ප්‍රාසාද<br>රජ බොජුන්<br>නොමැති බැවිනි.... |
| 142 | මටත් රහසින් දෙනෙත්<br>ඇය දෙසම බලනවා<br>මටම හිමි මගේ සිත<br>ඇයට පෙම්බදිනවා<br>පෙබඳින සිතුවිල්ල<br>හද තුලම මියෙනවා<br>මගෙනෙතේ කඳුළු බිඳු<br>නෙතු ළඟම සිඳෙනවා. |
| 143 | අප හැම සරසවි දිනුවෝය... |
| 144 | විරහ ගියක<br>තනුව කියා දුන්<br>ඇඳුරු නුඹ.... |
| 145 | හමා ගිය වැහිකෝඩය<br>තුලේ වී ගිය නමුත්<br>මට තාම බැරි වුණා<br>සෙමෙන් ඇද හැලෙන<br>පින්නෙන් බේරෙන්න..... |
| 146 | හැරගිය දිනේ නැවත<br>මා හද දොරට<br>ආවේ ඇයිද<br>විරහින් සිත අද්දරට.... |
| 147 | එච්.එස්..සි විභාගංච<br>සම්මානෝ අති දුර්භං<br>රැකියා විරහිතං දුක්ඛං<br>BA ඩිග්‍රීම භාගයං. |
| 148 | සෙමෙස්තරය අවසාන<br>විභාගය<br>මාගේ නිදහස....<br>කාර්යාල වෙලාවක<br>පෞද්ගලික බස් රථයක.....<br>වොප්ප වුණු මගියෙක්<br>පමණි....<br>කාර්යාලය තුළ<br>පොත් මත හිස තියා<br>නිදියන මාගේ<br>සිහිනය මේපමණයි<br>එත්හෙට විභාගය. |
| 149 | O.L<br>A.L<br>B.A<br>Diploma<br>M.ed<br>ඉතිං තව වෙන මොනවද? |

| | |
|---|---|
| 150 | අපට I.R එපා<br>SOC එපා<br>DMG එපා<br>එත්<br>.........ඕන.... |
| 151 | විභාගය අත ළඟ<br>ශිෂ්‍යභාවය V.C ලඟ<br>මාර්ටල්ලා ගේට්ටුව ළඟ<br>ෆොටෝ අලවලා දැන් විම් පුවරු ලඟ<br>උපාධිය ගෙනෙන තුරු<br>මව්පියෝ<br>ඉදිකඩ ළඟ.... |
| 152 | ලාහිරු කිරණයි පෝද ඔබ මට<br>දුරින් ඉදන් ඔබ දිලි හන්දා<br>සොමි සඳ කිරණයි ගතහිත නිවනා<br>මටත් හොරෙන් මම පෙම් බැන්ද |
| 153 | හිරු සමුදුන් ඔබ එපාමට එපා<br>ගනදුරේ හෙලා මා යන්න යනවානම්<br>කිරණ සහවමින් අඳුර නොදි මට<br>හිරු සඳු වි මතු පායන් සකි සඳ |
| 154 | සසරපුරා පාරමි දම් පෙරු සිත<br>නුඹ ලඟ පමණකි නතර වුණේ<br>නුඹ අන් සතු බව නොදැනුණි මා හට<br>එකයි මෙතරම් පෙම් කරුවේ..... |
| 155 | සරසවි නිවාඩුවට<br>නුඹ ලඟට දුවලා එන්න ආසයි අම්මේ<br>එත්<br>මගේ නෙත ගැටුණ<br>ඒ පුංචි සුරංගනාවිය<br>වෙනතක පියාඹයි<br>කියලා හරිම බයක්දැනෙනවා අම්මේ |
| 156 | මේ පුස්තකාලේ<br>මහා පුස්තක ඇත්තේ<br>එහෙත් හදිසියකදි ගන්නට<br>ඕන කරනා පොතක් නැත්තේ...... |
| 157 | සරසවි මැණියනි<br>සිව්වසරක් පුරාවට<br>ඔබෙන් ලද පන්නරය<br>මගේ දිවිය එකළු<br>කලා<br>ඒනයින්<br>මගෙන් දැයට වන<br>සේවය<br>ඔබට උපහාරයක්ම<br>වේවා....! |
| 158 | හිත හිරිකඩ<br>සොඳුරු වැස්සක්<br>හාදු වැටුණේ<br>හිත පුරා<br>හිනාවේ ගෙන<br>බලා හිටියද<br>සුදු මැණිකේ<br>ඇස් දෙක<br>පුරා..... |

| | |
|---|---|
| 159 | අමාවකට<br>සඳක්වෙලා<br>ඉන්න බැරිද<br>ළඟට වෙලා<br>මං වලාකුලට<br>මුවා වෙලා<br>දුරින්<br>ඉන්නවා බලාන. |
| 160 | ඔබෙන් උගත්තෙමි<br>විඳින්න දිවියම<br>කඳුළ වුවත් ඒය<br>සිනාවකි.... |
| 161 | සුරිය මඩල<br>නුඹ මට පුදමි ඒ රැස් දහරයට<br>මා හැදූ<br>ගසටත් වඩා මට<br>ඔබට පෙම්කල<br>නිසයි මේ දුක.... |
| 162 | නොහඬන්න<br>ගිය කලට<br>නොඑනු ඇත<br>යළි යළිත්<br>සැනසෙන්න හිතහදා<br>නොසිදුවුණු ලෙස කිසිත් |
| 163 | පින්සර නුඹේ පොත්<br>මුල් වරට දුටුව දින<br>වරද නෙදනිමි තවම<br>හදවතින් මං බැඳුන..... |
| 164 | සිතන්නට පවා<br>වරම් අහිමි වු<br>හැගිමක්<br>රිදුම් දෙයි<br>හෙටත් උරුමවු..... |
| 165 | සැමට ලැබිය යුතු රැකියාව<br>සැමට නොලැබෙන රැකියාව<br>සැමට ලැබිය යුතු උපාධිය<br>සැමට නොලැබෙන උපාධිය<br>අහෝ ! උපායට නෙලැබෙන රැකියාව !<br>රැකියාවට නොලැබෙන උපාධියක් ! |
| 166 | දුෂ්කරය කියා<br>හැර යා යුතුද<br>පිවිතේ.....<br>කටු පෙකුර සිපගනිමි<br>හෙට මුලක් වනුපිණිස...... |
| 167 | හදෙහි පිටාතර ගැලු<br>කඳුළු මතින් පිදුණ<br>නුඹයි මහද ඇඳි<br>මිල කළ නොහැකි<br>නොමැකෙන සිත්තම. |
| 168 | සියවරක් කියවුයෙමි<br>එහෙත් නොවැටහුණි<br>එබැවින්<br>ගං දියට විසිකල<br>සොඳුරු කවියේ<br>පිවිතය සැඟවුණි. |

| | |
|---|---|
| 169 | උදේට වැටෙන තුෂර බිඳු<br>මට නුඹ යැයි සිතුණා<br>රැට පායන තරු කැට<br>මට නුඹ යැයි සිතුණා<br>උදා හිරු තුෂර බිඳු<br>පැහැ ගත්තම<br>කැප වෙලා තරුකැට වහගත්තම<br>මට දුක හිතුණා<br>මගේ නෙතේ<br>කඳුලක් ඉනුවා.... |
| 170 | Life is struggle<br>Between feeling<br>And interest…… |
| 171 | මගේ ආදරේ.....<br>නිල් අහසසේ සිතනු එපා<br>මන්ද අඳුරෙන් වැසෙන නිසා<br>මගේ ආදරේ....<br>නොනිමි තරු සේ සිතනු එපා<br>මන්ද දහවල මැකෙන නිසා<br>මගේ ආදරේ....<br>මහ මෙරක් සේ සිතනු එපා<br>මන්ද දිනෙකදි සැලෙන නිසා<br>මගේ ආදරේ.....<br>කුමක් ලෙසවත් සිතනු එපා<br>මන්ද සමකළ නොහැකි නිසා. |
| 172 | සිනාවකට වඩා නුඹේ<br>කඳුළුවලට මං ආසයි<br>මා වෙනුවෙන් නැගෙන<br>කඳුළු නම්..... |
| 173 | නොවැලපෙමි ඔබ යන්න<br>වැලප ඇති ඵල කිම්ද<br>පිවිතේ වැරදුනේ මෙතන විතරක් නොවේ<br>සුරලා ගෙන යන්න මා හදේ පිපුණු මල්<br>මල් නඟන වසන්තය<br>ඔබට ගෙන යා හැකිද? |
| 174 | බිඳි විසිරෙන<br>සිතේ සිතුවිලි<br>ඔහේ විසිරි ගියාදෙන්.....<br>නොයෙක් පැතුමන්<br>පරව යද්දි<br>දුකක් නම් නොදැනුනාවේ.....<br>කාලයෙ වැලි තලා අතරේ<br>බොහෝ දේ සැඟවුණාවේ....<br>සඳකාලික අපේ ඇසුරේ<br>සුවඳ නම් නොමැකුණාවේ |
| 175 | සරසවි ගුරු මැණියනි,<br>ඉතිං ආයුබොවන්......<br>කඳුළු අතරින්<br>සමාජය<br>දකින්නට<br>කියා දුන්<br>ඔබට අප<br>සඳ ණයගැතියි.... |
| 176 | අතිතයේ සවන් රැඳි<br>අපේ පිවිතුරැයි සිනා<br>නෙතින් කඳුලක් නැගෙන<br>සුසුම් රැල්ලක් වෙලා<br>අහිමිවු වසන්තය<br>නෙතු අගින් සඟවලා<br>සෙනෙහසින් සමුගනිමු<br>යළිඳු හමුවුන තුරා... |

| | |
|---|---|
| 177 | මා නොදන්න මා නොදන්න<br>වෙනසක් හිතේ වෙලා....<br>යාළුවේ ඉතිං කියන්න<br>පිළිගන්නවාද....... මං..... |
| 178 | හැමදෙයක්ම<br>හැමතිස්සෙම<br>සැහැල්ලුවෙන් හිතන<br>හිනාවෙලා පිස්සු නටන<br>දඟකාර හිත්වලට<br>ලොකුම ලොකු පාඩුවක් වුණත්<br>එකම එක ලස්සන හිනාවකින්<br>දරාගනිම්.....<br>එත් සමහර පුංචි දේවල්<br>දරා ගන්නවත් බැරි වේවි |
| 179 | If only tears<br>Were laughter<br>If only night<br>Was day |
| 180 | You made the world<br>Brighter …..<br>Just for me |
| 181 | Smile<br>A/L  ot<br>If costs<br>Nothings |
| 182 | Heart to heart…..<br>Thought miles a part…..<br>My love for you ,<br>Will never depart…… |
| 183 | විභාගය අත ළග<br>ශිෂ්‍යභාවය V.C ළඟ<br>මාර්ෂල්ලා ගේට්ටුව ළග<br>දෙමාපියෝ ඉදිකඩ ළඟ |
| 184 | පහන් තරුව පායාවිත්<br>ඔබ එන බව පවසන විට<br>සරසවියේ රැහැනින් ඔබ<br>ඉඟිල ගිහිල්ලා<br>සුවඳ හදේ රඳවලා<br>යන්න ගිහිල්ලා |
| 185 | තියාගෙන මහ දුකක් හිත යට<br>හොරෙන් රහසින් හඬා වැටුනම<br>ඔයයි ඔය ඇස් දෙකයි දුටුවම<br>දුකින් යන්නට හිතෙනවා මට. |
| 186 | එදා වගේ අදත්<br>පොද වැස්ස වැටෙනවා<br>මල් පිපුණු ගහ ගාව<br>තවම ඉඩ තියෙනවා<br>නුඹ මගේ ළඟින් නැති<br>අඩු  මට දැනෙනවා<br>මම තවම මට අහිම්<br>මගේ කවිය ලියනවා |
| 187 | වස්සානේ සුළං රැගෙන<br>ඔබ ආවා මගේ ලොවට<br>වෙන් නොවන්න<br>සඳඑකට බැඳී<br>ජිවිතයේ කුළුඳුල් පෙම<br>මා තැබුවා ඔබ අභියස |

| | |
|---|---|
| 188 | සෙනෙහසේ අරුත මට<br>පසක් කර ගම් සිතට<br>නුඹෙන් මා දුර වුවද<br>සුවද දැනෙනවා සිතට<br>නුඹ නැතිව නොහැක මට<br>කොහොවත් දුර යන්න<br>එ නිසයි පතන්නේ<br>නුඹේ ම සුරත සැමදාම |
| 189 | පන්හිඳ<br>නුඹ තුඩගේ<br>දැවටෙන දහස් මානුෂිය සිතුවිලි<br>අකම්පිත එකාධිපතියකු<br>කාරුණික කළ හැකිය<br>මන්ද එය නුඹේ සොඳුරු<br>නිම වුවක් නිසාය.... |
| 190 | මගේ සෙනෙහස මෙතෙක් වේයැයි<br>මනින්නට ඔබ උගෙන නැත තව<br>මගේ අවසන් සුසුම පමණද<br>අවැසි ඔබ හට මා දකින්නට<br>වසර ගණනක යොදුන් ගනණක<br>මගක් දුර අප ගෙවා ඇත්තෙමු<br>තුරුවියන් යට කුසුම් පෙති මත<br>දෑත් පටලා ඇවිද ඇත්තෙමු<br>එහෙත් සුහදිනි මගේ සෙනෙහස<br>මිලින කුසුමක මිලින ප්‍රේමෙක<br>මගේ සිත |
| 191 | නිමල ඔබ<br>මල් කුමරියක්නේ<br>පෙති විදා සතුටින්<br>නොයින්නේ<br>රහස නැතිවද<br>මම නොදන්නේ<br>තුරුලෙ බමරුන්<br>නොවෙද ඉන්නේ |
| 192 | තරුයාය තනිකරන<br>අමාවක සඳකි නුඹ<br>හද විලම කලඹවන<br>අනෝරා වැස්ස නුඹ<br>කල්පයක් පුරා හැඩුවත්<br>නොවියලෙන කඳුල නුඹ<br>තුන්යමට සඳනොරදන<br>නොනවතින සුසුම නුඹ |
| 193 | දොතින්ම ගෙන<br>වැළඳගන්නට<br>නොහැකි මුත් සඳ<br>දුරින් හිඳගෙන<br>විඳිනු හැකිනම්<br>හදේ සිසිලස |
| 194 | දිප්ත අයියා කියවන හැටියට<br>එයාට නම් ජිවිතේ අපභ්‍රංසයක්<br>අපේ තාත්තා කියන විදියට නම් කලට වහිනවා නම්<br>වගාවන් කරන්න අතේ පයේ හයිය තියෙනවා නම්<br>එතන ජිවිතේ තියෙනවා කියලා.....<br>උන්ද සද්දන්තය උස්සල පොලෙවේ ගහපු දා පටන්<br>අපේ ජිවිතය අපායක්.. |

| | |
|---|---|
| 195 | නිල් අහසෙ පියාඹා යන<br>රන් සමනල පැටියකු ලෙස<br>මටත් ඇහැකි නම් යන්නට<br>නිල් අහසේ පියාඹාගෙන<br>මුළු ගගනම මගෙ නිවසයි<br>මෙහි රජයනු මගේ අණයි<br>අන් අය මා හට පහලයි<br>සියළු දේම මගේ යංයි<br>අත්තටු දෙක ගැස්සෙනවා<br>මද සුළඟට විසිවෙනවා<br>මල් පැනි හොරැහට උරලා<br>මම යනවා පසු නොබලා |
| 196 | හෙමිහිට ගී මුමුණවා<br>එ තාලෙට පියඹනවා<br>පුංචි ඇයෝ දැක්කොත් හෙම<br>හනිහනිකෙට හැංගෙනවා.<br>දුක්බාධා නැත දිවියේ<br>ජයගන්නට දෙයක් නැතේ<br>බලාපොරොත්තුවක් නැතේ<br>නිදහස අත් විදිමි එසේ. |
| 197 | **අම්මේ......**<br>සුසුම් දැවටෙනා හදවතං<br>නුඹේ සිසිල තිබේනම්<br>වුලි ආනෙන බත්පතං<br>නුඹේ සුවඳ තියේ නම්<br>ගොඩවෙන්නට තනතන<br>මේ මහගිරි දුර්ගය<br>අඹමලේ රේණුවක<br>වඩා සුහුඹුල්ය මට<br>අම්මේ නුඹ නෙත<br>මා වෙතට ගැටේනම් |
| 198 | අපිට මේ හෙවනේ..<br>ඉන්න අවසර තව ටික කලයි<br>අපේ සැහැල්ලු පි විතේ ඉවරයි<br>ෆ්‍රස්රම එක්ක විනෝද වුනා<br>පිස්සු කලා<br>හරිම දුකයි<br>අපිට යන්න වෙලා |
| 199 | Essiment දුක්ඛං<br>presentation අරහං<br>අපිටත් එහෙමයි |
| 200 | සුන්දර සරසවිය<br>විභාගවලින් පිරිපුන්ය<br>කවුද දන්නේ<br>සරසවි පිවිතේ කියන්නේ<br>විභාග සාගරයක් බව |
| 201 | වසර තුනක්<br>ගෙවිගොස් නොදැනිම<br>දුකයි<br>හොදටෝම දුකයි<br>ආදරණීය ඔබලාගෙන්<br>වෙන් වෙන එක<br>අපි සමුගන්නම්<br>මතු දිනෙක<br>හමුවෙන සිතින් |
| 202 | ආපසු යන්නට පාර කියනවද<br>දැන් සමුගන්නට ලගයි<br>ආයෙත් දවසක හමුවන්නට<br>කළ පිං මදිද සිතෙයි |

| | |
|---|---|
| 203 | පාඩම් කර ඉවර නොමැත දෙවියනේ<br>කුමටද මා සරසවියට තේරුනේ |
| 204 | නිදිමත දැනේ දහවල මට<br>රැයට වඩා<br>වෙනසක් එහෙම තියෙනවද එහි<br>රැයට වඩා<br>උරුමය වෙන්න තිබුනෙ ඒ<br>ඇඳුම තමා<br>නිදිමත අනේ යනවද පිං<br>පතමි මෙමා |
| 205 | කෑමෙන් හොදම කෑම කැන්ටින් බත් කෑම<br>බිමෙන් හොඳ බිම ඇල්වතුරම බිම<br>දිමෙන් හොඳ දිම අනුනට ලනු දිම<br>නැමෙන් හොඳ නැම සරසවියේ නැම |
| 206 | සිටියේ සතුටකින් නම් නම් නොව ස්ටඩියේ<br>වදයක් පාඩම්කෙරුම මට නම් පිවිතයේ<br>කාලය ගෙවී සිවීවසරක් සරසවියේ<br>යන්නට වෙල සමුදි මේ ස්ටඩියෙන් |
| 207 | මුළු හදින් මම<br>ඔබට love කොට<br>ෆියුචර් Love ගැන<br>ඩ්‍රිමස් මැවුයෙමි<br>මගේ ලව් එක<br>තවත් පොරකට<br>පැනලා දෙනහැටි<br>බලා වොරිවෙමි<br>poison |
| 208 | ඉංග්‍රිසි හෝඩියේ මුළු අකුරු 26යි<br>A අකුරු 26න් මුල් අකුර A තමයි<br>එ කාලේ A අකුර ඔහේ කිවා තමයි<br>පුංචි කාලේ අපි A දිහා බැලුවෙ නෑ<br>එත් අද A අකුර අපි දිහා බලන්නෑ...<br>ලකුණු 75ක් සුළු පටු ද දෙයියනේ<br>A අකුර මේතරම් වටින්නේ ඇයි අනේ |
| 209 | ඉස්සර වගේම<br>ආයෙමත් රොමරොසි<br>මල් පිපි පරවෙලා<br>වැටෙනවා.....<br>රිඩි මාවත දිගේ<br>මාර ගස් පෙළ යටින්<br>නවකයන් දෙපා පිය මනිනවා<br>දුරක සිට මම බලා<br>ඉන්නවා......<br>අතිතය කඳුලක් මිය ඇදි<br>බොහො කල්<br>තවත් මට විරහ ගී<br>කියනවා<br>හිතන්නට තවත් බැහැ<br>ආයෙමත් යමු අනේ<br>දුරක පිය මනිනවා. |

| | |
|---|---|
| 210 | සරසවියට පිවිසි අයට<br>මොකද මේවුනේ<br>සෙමෙස්තරය හැමදාමත්<br>දුකම මුල් වුනේ<br>හිනාවෙලා සන්තොෂයෙන්<br>හිටපු අපි අතේ<br>අහස පොළව ගැටලන්නට<br>වෙරදරනවා අනේ<br>තරුණ දිවිය පොත පෑනට<br>දියවී යනවා නේ<br>ඉගෙනිමට ෂාප කරන්<br>ගෙදර යනවා නේ |
| 211 | සරසවි කවියක්<br>විභාගය එහි අඳුරුතම වදනක්<br>සෙමෙස්තරයක් දෙකක්<br>එකට එක් වු විට දැනේ<br>පෙර නොවිදි වදයක්. |
| 212 | My dearest amma<br>Ewery night<br>In my dreams<br>I see you<br>I feel your fegrance<br>You are my sunshine |
| 213 | Hostal එකේ එක් තොටුපලක් වු stady ය.<br>අපි යොදා ගන්නේ පාඩම් කිරීමට පමනක් නොවේ<br>එය සිනාසිමට විහිළු තහළු කිරීමටහොඳ තොතැන්නත්වුණා.<br>සමහර වෙලාවට කිරා වැටෙමින් රෑ එලාවෙනකම්ගතකල<br>කාලය යලිත් ජිවිතයටවත් ලැබේවිදැයි සැක සහිතය. |
| 214 | උනුන් පෙරලා ගෙන<br>ඉහළට යන්නට<br>හිණිමං තනන්නෝ<br>මහ ගිරි දඹය<br>නොනගිනු ඇත. |
| 215 | H.S.C විභාගයක්ව<br>සම්මානෝ අති දූර්ලභං<br>රැකියා විරහිතං දූක්ඛං<br>BA digree මහා භයං.. |
| 216 | ආදර වමියා ඉන්නේ E 22 කේ<br>වැඩියෙන් නිදන්නේ studyයේ මේසයේ<br>කැම්පස් ඇවිත් B.E.D ම තේරුනේ<br>රහස හැමදාම නිදන හින්දයි මේසයේ |
| 217 | කතා කරන්නට හැකිනම්<br>මේ බිත්ති හතරට<br>බොහෝ දේ පවසනු ඇත<br>සිව් වසක් පුරා<br>බෝ දූක් නෙත<br>නිදි වරා වනපොත්<br>කලා හදට<br>යෞවනය වියපත්ව<br>හැගිම් විරහිතව<br>කැපකල ජිවිතය<br>යලි කවදා ලබාගන්නද<br>දූක් කඳුළු සෝ සුසුම්<br>කෙලි කවට සිනා රැලි<br>සියල්ලම හැරපියා<br>සමුගැන්මේ නිමේෂය<br>එළඹ ඇත<br>එදිනට |
| 218 | මාසෙන් මාසයම කැම්පස් වහගන්නා<br>පුරසාරම් දෙඩු අය හනිකට ගෙදරට යනවා<br>යුක්තිය යටවී අයුක්තිය රජවෙනවා<br>දින සති ගෙවිගොස් අපි තව වයසට යනවා. |
| 219 | පාලු සීතල රැයක<br>පොත් මිටිය තුරුළු කරන්<br>මවන සහින පැතුමන්<br>අද වගේම හෙටත්<br>මමත් ඔබත්<br>සිහින ලොව තුල සැරිසරාවි. |
| 220 | හැමදාම මම 1st year උනානම්<br>Genaral digree අරගෙන<br>ගෙදර නොගිහිල්ලා<br>යාලුවොත් එක්ක ඉන්න<br>වාසනාව තියෙනවනෙ<br>අනේ මම<br>1st year වුනානම් |
| 221 | නිකං කකා ඉන්නම්<br>ගෙදරින් දෙනවානම්<br>දසවසරක් ඉන්නම්<br>සරසවියේ<br>හැමදා පොලදේනම්.... |
| 222 | තක්සලාවෙන් නික්ම<br>සරසවිය වෙත පැමිණ<br>තරුණ විය රස බලන-<br>සිහිනයක් විය හදෙහි<br>නමුදූ ඒ සිහිනයක්<br>කිසිඳු කල ඉටුනොවුන<br>දයාබර විලස උන්<br>යෙහෙලියක් පවා අද<br>වෙන්වෙලා ගිහිල්ලා<br>මන්ද මෙ වෙනස්කම්<br>පෙර දාක නොවුලෙස<br>නුඹේ සිත දැඩිකලේ<br>නැවත නොහැදෙනා ලෙස<br>විභාගය නේද මේ... |

| | |
|---|---|
| 223 | රාත්‍රි 8ට පෙර නේවාසිකාගාරයට<br>පැමිණීමට නොහැකි වූ ළමයෙකුසේ<br>නිදිමත දොරටුව අභියස බලා හිඳි<br>රාත්‍රි 7ට පෙර යායුතු නිසා ගිය<br>අමුත්තකු සේ<br>නිදහස පලාගොස්<br>කුමට මෙතරම් කළ කිරිම්දැයි<br>සිතුනේ විභාගපත්‍රය දුටු සැනින්...... |
| 224 | අදින් පසුව කිසිදාක ඔබට<br>මගෙ දෙපය මේstady එක<br>තුල දක්නට නොලැබේ<br>මා යන්නට යනවා මේ<br>නේවාසිකාගාරයෙන් |
| 225 | ඔබගේ දැසින්<br>මගේ ජිවිතය දකිමි<br>ඔබගේ සුසුමින්<br>මම ප්‍රාණවත් වෙමි<br>ඔබගේ හදගැස්මෙන්<br>මම ජිවත් වෙමි<br>ඉදින්<br>ඔබ මමමය<br>මම ඔබමය. |
| 226 | ආපසු යන්නට පාරකියනවද<br>දැන් සමුගන්න ලගයි |
| 227 | නුඹ හිරුම වි හිඳි<br>මම තරුවක්ව වැලපෙමි<br>මා එනවිට නුඹ යන්නේය<br>මා හඩනා විට<br>සිනාසෙන්නට වත් නුඹ නැත<br>නුඹ සඳක් වි<br>මං එලිමඩල වුවා නම්<br>සවිදිය පුරා<br>යෙහෙන් ඉහිලැස්පා<br>ඉන්නට තිබුනා නොවෙද<br>එහෙයින්<br>නුඹ සඳක් වන්න<br>මම එළිමඩල වි<br>සදාකල් නුඹ ළඟින්<br>රැඳෙන්නම්. |
| 228 | මිරිගු ඔබ මට පෙනෙන්න<br>කතරේ මට ලුහු බඳින්න<br>පවසට පුන් පොදක් දෙන්න<br>බැරිමුත් දිය සේ පෙනෙන්න. |
| 229 | දෑතේ ගෑවෙයි ඔබ ඉන්නා දුර<br>එනමුත් ඒ දුර ගව් ගනනාවකි<br>දෑසේ පැටලෙයි දිනෙන් දිනම ඔබ<br>එනමුත් මා දැයට ඔබ හිමි නැත<br>ක්ෂිතිජය සේ අප සමිප විඉන්නේ<br>මිරිඟු දියෙහි සා පවස නිවාගන්නේ |
| 230 | හීනෙන් ඔබ මට පෙනෙනවානම්<br>කොට්ටේ පුළුං කන්නම්<br>කිසිදා ඔබේ අත නොලැබේ නම්<br>මෙට්ටේ කොහුත් කන්නම්. |

| | |
|---|---|
| 231 | ජිවිතය ආපස්සට ගෙනියන්න<br>පුළුවන්නම්<br>අතිතෙදි මාව රිද්දවපු හැම කෙනෙක්ම<br>මග ඇරලා<br>ආපසු වර්තමානෙට එනවා මං<br>එත්<br>හෙට දවසේ මගේ හිත රිද්දන අයගෙන්<br>ගැලවෙන්න අත්දැකිම් කෝ මට<br>නෑ<br>අතිතෙදි හිත රිද්දගෙන ලබාගත්<br>අත්දැකිම් තුලින්<br>හෙට දිනේට මුහුණදෙන එක ලේසියි<br>එතකොට |
| 232 | නිශාචරයන් ළඟින<br>මේ සොඳුරු සිනඳුරේ<br>අප තවම පොත් අතර<br>සැවොම නිදනා මේ රැයේ. |
| 233 | ජිවිතය නම් හරිම දුක්බරයි<br>ඉගෙන ගන්නා විට<br>හරිම කරුමයක් පාඩම විභාග ලෙක්චර්<br>dissietion,bones , antibodies,<br>optimal behavior, fisheris , IPM<br>කවදා මේ කරුමේ නිමවේවිද |
| 234 | විභාගේ අතලඟ<br>අත පොත ලඟ<br>පොත හිත ලඟ<br>හිත ඔහු ලඟ<br>ඔහු ඇය ලඟ |
| 235 | දසන් පෙන්වා සිනාසුන මුත්<br>දිනක ඔබට විරුද්දව<br>සිනාසෙන්නට පුලුවන<br>පියාදර සොයුර යනුවෙන් මුමුණන ඔවුන්<br>දිනක ඔබට විරුද්දව ගල්මුගුරු ඔසවාවි<br>සමාජයේ යථාර්තය මෙයවුවත්<br>කෙසේ හෝ දුඟද මේ සමාජය තුල<br>ගැටිය යුතුමය<br>බොළඳ නොවි<br>යථාර්තයට මුහුණ දිමට<br>“ඕනම දෙයක් ඕනෙම නැත”<br>සං |
| 236 | ජිවිතය ජයගන්න<br>නව ඉරක් දැකගන්න<br>නෙක පැතුම සිතදරා<br>තුටින් ඔබ හිනැහෙන්න. |
| 237 | අද ගෙවිගියත්<br>හෙටක් ඇතැයි මැලි නොවන්න<br>හෙටත් අදමෙන් ගෙවි යනු ඇත<br>හෙටක් ගැන නොසිතා<br>අද කළයුතුදේ අදම කරන්න.. |

| | |
|---|---|
| 238 | දුරින් හිනැහෙන<br>සඳක් ගැන කවි<br>නුඹට ලියම්ද<br>සඳ දුරක් බව දැනදැනත්<br>සබඳ නුඹගැන<br>කුමට ලියම්ද<br>නොලැබෙන බව දැනගෙනත්<br>යලිත් හිරු නැග<br>අඳුර පරව නැගෙයි<br>නව අරුනළු හෙටක්<br>අදට විතරක් සමුගතිමි මම<br>යළිත් ඔබ හමුවෙයි සිතින්... |
| 239 | අබිසෙස් ලැබුදා<br>එපා හිනැහෙන්න<br>ලොවම ගිගුම් දෙනසේ<br>අහිමිව ගියදා සම්මත<br>එපා හඩන්නට<br>සාගරය පරදින සේ |
| 240 | “තාරුණ්‍යයම”<br>යෞවනයම<br>කැපකරන්න<br>අනාගතය වෙනුවෙන් |
| 241 | ලද මනුෂ්‍යත්වය තුළින්<br>මිනිසත් බව අර්ථවත්<br>කරගන්න ගුණ දමින්<br>ආදරයෙන් බුද්දියෙන්<br>සහෝදරත්වයෙන්<br>පරිපුර්ණ විමෙන්.. |
| 242 | සුළගට පාවෙන<br>වරාමලක් සේ<br>සිතිවිලි දැහැනට<br>සමවැදිලා<br>පෙම්වත් හිනයේ<br>දොරකඩ ඉඳගෙන<br>කඳුළු පේලිමට<br>කතා කලා<br>රිදුනත් පෙම්හිත<br>දුක උහුලා ගෙන<br>සිත නැවතුන තැන<br>නතර වෙලා<br>සත්තයි මේ ඇස්<br>තාම රිදෙනවා<br>නුඹ එනතුරු<br>පෙර මග බලලා. |
| 243 | සඳ ඔබ දුර බව දනිමි<br>හැකි වුවොත් යානාවක නැගි හෝ<br>ඉදින් නොලද්දෙ<br>මිහිමත හිඳ එළිය විමි |
| 244 | දුෂ්කරය කියා හැරයා යුතුද ජිවිතය<br>කටු පොකුරු සිපගතමි<br>හෙට මලක් වනු පිණිස. |
| 245 | සඳ දෙස බලබල<br>මා පැතු පැතුමන්<br>මෙතැකැයි කියන්න බෑ<br>හිරු මා දැව්වත්<br>මා ලද උණුසුම<br>අමතක කරන්න බෑ |
| 246 | නිදහස් දිනය අද<br>අපට නිදහසක් නැත. |
| 247 | පිය නැගු අපේ<br>      එත් නවාතැන්පලකට<br>සමුගනිමු අපි<br>        ඒ නවාතැන් පලින් අපි |
| 248 | මේ ලෙස හමුවි<br>වෙන්වි යන්නට<br>ඇයි අප මිතුදමකින් වෙළුනේ |
| 249 | සමනල වැව පුරවන්නට<br>බෙලිහුල් ඔය ගලා ඇවිත්<br>ආදර කඳු තරනය කර<br>දෙහදක් අද වෙන්ව ගිහින්<br>සුවඳ හදේ තවරලා<br>යන්න ගිහිල්ලා |
| 250 | සරසවි දිවියේ<br>සොදුරු මතකයන් තුළ<br>ලැඟුම් ගත් අපගේ<br>වෙන් වෙනා නිමේෂය<br>අප කරාඇදෙනා විට<br>ඉතිං මා<br>කුමක් කරම්ද?..... |
| 251 | නිදි දෙවි දුව<br>පමාවෙලා අද වඩින්න<br>තව චුට්ටක් අකුර එක්ක<br>කල් ගෙවන්න<br>ඉඩක් දෙන්න...... |
| 252 | Friends are Like<br>Diamands……<br>They Shine more<br>When It Is Dark |
| 253 | ළං වෙන්න විදියක් නෑ<br>සිතින් විතරමයි.....<br>සුවදක්  මිස ඔබ ළඟ නෑ.....<br>හීනයක් වගෙයි..... |
| 254 | මතකයන් ළග සැරිසරමින්<br>පුරවයි සිත සෙනෙහෙන්<br>ළංවුන් අතිතයේ සිරිත්<br>පිරි ඇත මා නුවන් .....<br>දුකක් දැනුනම හඩා විත්<br>සෙයයි නුඹ ළයාදර වදන්<br>ඇසෙයි තවමත් දෙසවන් අසලින්....<br>අනේ එක්ව ඉන්නට තිබුනානම් අදත්<br>මුළු ලොවම මල් වසන්තයක් සැබවින් |
| 255 | ඇල්මෙන් අකුරට ඇවිදින්<br>අකුරු ඇහිදගෙන<br>කඳු මුදුනට නැග බලන්න<br>ජිවිතේ උස |
| 256 | සඳ හිනැහෙනවිට<br>හිම්දිරි උදයේ<br>ඔබ මා ළග යැයි<br>මට හිතුනා...<br>හිරු දිලෙනා විට<br>සැන්දැ අහසේ<br>නුඹ මට තරුවක් වි<br>දිලුනා<br>හිරු මියැදි<br>ඝනදුරු නැග එද්දි<br>නුඹ මට ඇතයි<br>මට හිතුනා.... |

| | |
|---|---|
| 257 | නුඹ නැතිව ගෙවන පැය<br>කල්පයක් වගේ මට<br>සිහිල් පවනක් විලස<br>එන්න හැකිදෝ ළගට. |
| 258 | ජොර්ජ් සැන්ඩර්ගේ  දේශනාව<br>අපිට හරිම  වේදිනාව<br>දන්නේ නෑ ඊට  කාරනාව<br>I.R  ගැනයි නිතර  කල්පනාව |
| 259 | තරුකැට වැටෙනවා<br>ඔබට ඇහෙනවද එවා<br>ගනින්නට හනිකට එවා<br>සේපාලිකා මල් පිපෙන වෙලාවට<br>සුන්දර හිත ළග හීන දකින්නට<br>හිනෙන් ඔබ දෙස බලා සිටිනවිට<br>ඔබ ඇවිදින් මා ළඟ දැවටෙනවද |
| 260 | මොන ජිවිතයක්ද යකෝ මේක???<br>විභාගේ අතේ තියන් ඉපදුනා වගෙයි<br>කරුමේ කරුමේ |
| 261 | අභවරයි ඔබ අහමි වි<br>ජිවිතෙන් යයි මා දමා<br>කඳුල දොම්නස<br>මට තිළින වුව<br>දුක දරන්නෙමි<br>සිනහ වි..... |
| 262 | රොගි වු වර්ථමානයට<br>අතිත සොඳුරු මතක<br>ඖෂධ කර දිවි ගෙවන්නෝ. |
| 263 | ප්‍රදිප්<br>කලාවෙන් තලාවට<br>වැඩෙන පුන්සද එම<br>ආදරය සමගින්ම<br>දුක වැඩෙයි හැමදාම<br>අපට අප අහිමිවුන<br>නමුත් මට නොදැනිම<br>සාගරය තරමට<br>ආදරෙයි මට තාම. |
| 264 | කවියකට සිතේ දුක ගොනුකර<br>නුඹනමින් තුන් තිස් පැයක වැලපෙන<br>නෙතට අහිමි කදුලකින් බොඳව ගිය<br>දොඩමලු නොවන මේහාගය<br>සංසාරක පැතුමකට හදව.....තේ සැගව ඇත. |
| 265 | ආගාව<br>බලා පොරොත්තු<br>අවම කරන්න<br>සිත සැහැල්ලු වේ<br>එයයි ජිවිතයේ සැනසිම |
| 266 | These we love<br>Don’t  go way<br>They walk besides us<br>Evry day<br>Unsen """un heard<br>But always near' |
| 267 | සරසවිය යනු<br>1. පාරාදිසයකි<br>2. අහසකි<br>3. මගුල් මඩුවකි<br>4. පිස්සන් කොටුවකි<br>5. පෙර පාසලකි |

| | |
|---|---|
| 268 | සොහොන් කොතක<br>සොහොන් බිමක<br>මා තනිවුන දවසක<br>මාහැරදා නොයන් සොදුර |
| 269 | සියළු දේ තේරෙන ඔය සිතට<br>මගෙ මේ නොතේරෙන සිත<br>නොතෙරුනෙ මන්දැයි<br>නොතේරේ මට...... |
| 270 | ආසයි මට හිනාවෙන්න<br>ජවිතයම ඔබත් එක්ක<br>නොවැරදිම ඔබත් එනවිට<br>සිනා මලක් රැගෙන එන්න. |
| 271 | අම්මා සදකි<br>පියා හිරුය<br>මා ඒ පහසින්<br>විකසිත කුමුදු මලකි |
| 272 | ජිවිතය ඉල්ලමින්<br>හිගාකන<br>ආදරය ඉල්ලමින්<br>පසුතැවෙන<br>ජිවිතයත් ආදරයත් නොමැති<br>පවිකාරියකි මා..... |
| 273 | මගේ නෙත රැදි<br>කඳුළු බිංදුව<br>මකා දැමුවට<br>ඔබට ඕනැද<br>ළගාවිණි යැයි<br>කියා සිතුමුත්<br>කඳුළු ගංගා<br>දෙගොඩ ගැලුමට<br>ඔබේ සිතුමන්<br>සමත් වුවා. |
| 274 | තවම කැකුලියකි<br>පුදින්න ඉඩදෙන්න<br>හදවතට හෙම්හිට. |
| 275 | සංසාරේ<br>පැතුපැතුම්<br>අහස් මාලිගා<br>වෙන් නොවෙනා<br>ලෙසින් සිතා<br>පැතු පෙම්සිනා<br>අතර මගදි නතර කරල<br>මං මුලා කලා....<br>සියුමැලියේ ඔබට පමනි<br>ආදරේ මෙමා.... |
| 276 | පුංචි මල් පෙති<br>තලා පොඩිකර<br>අතරමං වු ආදරේ<br>සයුරු වෙරළට<br>නැගෙන රළමෙන්<br>ඔබයි මගේ ආදරේ.....<br>නිම්නයේ නිල්සේද<br>සළුමෙනි අපගේ ආදරේ<br>වෙන් නොවෙමු අපි<br>භවෙන් භවේ<br>එයයි අපගේ ආදරේ..... |
| 277 | උපාධිය කලත් මගේ<br>ඉටු දෙවියාය<br>දැන් මගේ ජිවිතය<br>නැති කල පරම සතුරාය. |

| | |
|---|---|
| 278 | මුතු හැදෙන තුරා මුතු බෙල්ලෙකු මෙන්<br>දුක ලයේ තියාගෙන<br>හිටියා මං මා නැතිව ගියත්<br>යම් දිනෙක ඉතින්<br>දියයට පිනා හරි ඔබ එනවා |
| 279 | සිනා සලන ඔය දෑසට<br>මගේ කඳුළු නොපෙනේන්නට<br>මිකක් දුරස් වුනා මිසක<br>ඔබ අමතක කලා නොවෙයි |
| 280 | පෙරමග බලමින්<br>සඳ වඩින තුරාවට<br>නෙතේ රැඳි කඳුළු බිඳු<br>ඉකිබිඳින තුන්යමේ<br>සිහිනයක සුවඳගෙන වත් මගේ ලෝකයට<br>ඔබ නේන බව දනිමි<br>ආයෙ මතු කිසි දිනෙක |
| 281 | දරා ගන්න බැරි සෙනෙහසක<br>ආදරණීය කුසුමක් වෙලා<br>ඔබ මගේ හිත අද්දරින්<br>පිපෙනකොට<br>කඳුළු වැස්සක් අරං<br>මේ තරම් ඉක්මනට<br>සමුගන්න වෙවි කියා<br>අදහන්නේ කෙසේද? |
| 282 | It's tree that no words<br>Spell my lips ……<br>No happy brings my Love<br>No tuch feels my hand<br>No beuty see my eyes<br>No songs hear my ears |
| 283 | පැල දිග අහසේ<br>පාට දේදුනු සේ<br>රැඳි නොරැඳි මගේ මතකය<br>තිබේ ඔබ රහසේ<br>ලබැඳි මියුලැසියේ |
| 284 | කරදර පසකින් තබන්න<br>කරදර ගැන කරදර වීමට<br>ඔබේ හිතට ඉඩ නොතබන්න |
| 285 | හන්තාන දෙසින් එන<br>ඔය සීත සුළං රැළි<br>ඔබ තාමහොඳින් හඳුනනවානම්<br>මේ පහන මගේ සුරතින් දැල්වූ<br>මම බොහොම ප්‍රවේසම් කරගන්නම් |
| 286 | කඳුලක්<br>නෙතු අද්දර තවරා<br>ජීවිතයම කඳුලට පවරා<br>නුඹ යන්න ගියා |
| 287 | ඔබ සක්විති විය යුතු නැත<br>ඔබ පතනා බිරිඳක් මිස<br>මට රැජිනක්වනු රිසි නැත. |
| 288 | ඈත අතීතයේ පියවර නගමින්<br>කණවැල අල්ලන් කවුදෝ එනවා<br>බලාපොරොත්තුව ළයට තුරුළු වී<br>ඈ එන පෙරමග බලාහිඳිනවා |
| 289 | එක්වුණි තෙවසරක් සිටිනට සරසවියේ<br>බැරිවුණි සිටින්නට වැඩිකල් විනෝදයේ<br>වෙන්වුණි දෙපිළකට අපි සැම මරණ භයේ<br>ඇතිවුණි අඬදබර ඉන්පසු සරසවියේ |

| | |
|---|---|
| 290 | ආවේ යන්නද<br>ඇවිදින් යන්නද<br>නොපැමිණියෙකු විලසින්<br>හිඳ යන්නද....<br>කිවේ ඇයි නුඹ<br>මා නුඹගේ බව<br>මා ගෙන යනු බැරි නම්<br>නුඹ යන තැන. |
| 291 | ඈත ඉඳන් සිනා සලා<br>හද තුළ රන්දා...<br>ඔබ යන්න එපා<br>හදට මගේ සුසුමක් දීලා... |
| 292 | නිදහසේ ගලන ඟගුලට<br>පා දමා<br>එපා කරන්නට<br>මඩ වලක් |
| 293 | පොත නුඹ හොඳයි<br>හිත නැති මිතුරන්ටවඩා. |
| 294 | ගෙළු බෙල්ලාගේ<br>කටුව,<br>මගේ ඔළුව වැනිය. |
| 295 | සඳගිමන් නිවා<br>සුදුවලාකුලක වැතිරී<br>පෙම්කතාවක් තියනවා<br>ආදරයට නොනිමි....<br>ඒ සදට වඩා.....<br>තනි තනි තරුවත් දනිමි<br>ඒ තරුව නුඹයි<br>මම නිති නුඹට<br>තනි රකිමි..... |
| 296 | රෑ ආකාසේ<br>තරු සේ දිලිසි<br>උන්නද ඔහු ඔබ<br>දෙනෙත් අරා<br>විටකදි සිහි වෙයි<br>එලියක් නොව එය ......<br>පරාවර්ථයක් පමනි කියා. |
| 297 | ආදරය ......<br>නොසිඟන අය සිගමන් යවන<br>නොදැවෙන අය දවා අලුකරන<br>නොමැරෙන අයව නොමරා මරන<br>සිතා ගත නොහැක එය නම් |
| 298 | මම<br>මගේ මයි .....<br>නුඹ.....<br>මගේ වගෙයි.....<br>ඒත් නුඹ මටම<br>නොවෙයි.... |
| 299 | මිනිසුන්ට<br>ආදරය කලහැකිය<br>නමුත් එක් අයෙකුට<br>ආදරය කිරීම<br>අපහසුය.. |

| | |
|---|---|
| 300 | ජීවිය බොහො දුරයි<br>නොපෙනෙන මානයට විහිදෙන<br>ඇස් කෙවෙනි බොඳ කරන්<br>වෙහෙස වුවත් සොයන්නට.....ජීවිතය<br>පෙනෙන මානයක නෑ<br>සුන්දර දසුනක්<br>එකොමත් එක අතිත දිනයක<br>දෙනයනට සුවය ගෙන<br>සිත අද්දර රැඳුනු<br>ඒ සොඳුරු රුවම<br>තවමත් සිත තුල රැදෙන්<br>හදවත හා දවන කල<br>පවනේ විද<br>පව්කාර මගේ |
| 301 | හන්තානේ කඳු මුදුන වගෙයි ඔබ<br>අහසට ලංවි කවි කියනා<br>කඳු පාමුල තණ පඳුරක් වි<br>ඉන්නම් පොලොවට දුක මුමුණා. |
| 302 | හද සිසිල ගෙන දෙන්න<br>මුදු සුවද විදගන්න<br>සිත සතුට පුරවන්න<br>මගෙ සතුට ඔබ ගන්න |
| 303 | එක්තරා වස්සානයක<br>මල් නටුව හැරගිය. |
| 304 | ප්‍රේමය නම් අසෙනිය කුසුමක් වේ<br>රිසි වු කෙනෙකුට පුජා කරන්නට<br>ලොභ සිතින් තොර<br>පිදුව මනා වේ<br>පෙරලා ලබනට<br>නොසිතා බිදකුත් |
| 305 | පලා හද ගැබ<br>බලා ඉනු මැන<br>පතා ඔබේ පෙම<br>ගලා ගිය දුක |
| 306 | කොහෙදෝ<br>ඈතක සිට පියඹා ගෙන එන<br>ජේලි ජේලි එන රන් සමනළුනේ<br>නිවන් පුරට පාරසොයනවාද<br>කඳුමුදුනේ<br>සමනල කඳුමුදුනේ...... |
| 307 | නුඹ ලබා ගන්න කැපකල<br>හැමකවි පදයක<br>කඳුළු කඩා හැලෙවි<br>පැතුමක එළිවැට බිඳ<br>හමුවූ බව මිස එකමත් එක<br>දවසක අප<br>වෙන්වූ දුක කියන්න<br>හරි....දිළිඳු කවි පද..... |
| 308 | දහස් දනන් සරනා මේ නුවර මැද<br>තනිකම දැනෙ නුඹ නැති දා මගේ සිතට<br>සොයා නුඹේ රුව සැරමුවත් මගේ නෙත<br>මගෙ ලොවට බොහෝ දුරයි ඉන්නේ නුඹ... |
| 309 | තෙවසරක් අකුරු කළ<br>සොඳුරු සරසවිය<br>යළි කවදා කෙලෙස ඔබ<br>වෙත එන්නද? |
| 310 | දහස් දනන් සරණා<br>මේ නුවර මැද<br>තනිකම දැනේ නුඹ නැතිදා<br>මගේ සිතට |

| | |
|---|---|
| 311 | Moon+Night =Romantic nigtht<br>Bird+Sky =Wonderful day<br>Forest+Animal=Refreshing world |
| 312 | සිත සොයන<br>ඇස ගැටෙන<br>පියා සලන<br>යෞවනය<br>සෙයා යන්නට<br>අවසරයි |
| 313 | ජීවිතය නම් සයුරේ<br>තරනය කරන්නට<br>අවැසි<br>හබල<br>ආලයද ? ප්‍රේමයද? හබලද? |
| 314 | කඳුළු බිඳු දෙකක්<br>පාරමී පුරා<br>මල් දෙකක් වෙලා පිපුනයි<br>කටු කම්බි මාවතේ |
| 315 | ලත් නිමේෂයේ<br>සොයමි රුවන්<br>මසැසින්<br>නුඹව<br>මම සැමදා<br>සොයමි<br>දෙනුවන් අයා |
| 316 | අතිතයට වඩා පැරණි<br>මගේ ආදරේ....<br>මං ඔබ ගැන පැතු පැතුම්<br>දනියි සාගරේ.... |
| 317 | සුමුදු සඳරැස් ගලන<br>සරාසඳ වගෙයිනුඹ<br>නුඹේ ලඟ මලානික<br>තාරුකා ඇසකි මට |
| 318 | ගනන් අතින් මට වැඩි බර දුන්නා<br>ලකුණු ටිකක් මට වැඩි පුර දෙන්න<br>ගනන් සර්..... මගේ හිටි තැන මට දෙන්න<br>අනේ .සර්.... කරුනාවෙන් සලකන්න. |
| 319 | මල්සුවඳ ඇවිත් තිබුනට<br>මල් යායක පෙති සිඹ<br>එක මලක සුවඳ අහිමි වෙලා<br>ඇයි මෙතරම් දුක.... |
| 320 | මතකය දෙස වරක්<br>හැරි බලන්නට මට සිතේ<br>සිය දහස් වර ඔබ<br>ඇතැයි මට සිතේ<br>මතකය මළගමත්<br>ඒ මතකයෙහිම හිද<br>මිය යන්න සිතේ.... |
| 321 | හෙට ගලන නැවුම් ගඟ<br>නරඹන්න.....<br>අපිත් එමු.......ගංතෙරට<br>මා නොවන මා එක්ක<br>නුඹ නොවන නුඹ එක්ක<br>අපි නොවන අපි එක්ක |
| 322 | ඔබ යන්න මධුර ස්වර අරං<br>මගේ රට මැදිරියට මගේ ඉරහඳ අරං<br>ඔබ යන්න මහද තෙත් වැහි වලාකුළ අරං<br>කමක් නෑ ඔබ යන්න මගේ ආයුං අරං |

| | |
|---|---|
| 323 | එක්ටැම් ගෙයි<br>සී මැදුරු කවුළුව<br>මම......<br>අනන්ත අහසටම<br>මිස<br>පොලොවට පෙම් නොකරන..... |
| 324 | එකඳු තරුවක්වත්<br>නොමැති රැය<br>පහන් කළ මැන<br>අසෙනි වැහි දිය<br>දොතක්ම ගෙන<br>පුරන් වු හද<br>තෙමා ලනු මැන......<br>පුදන්නට සියපතක්<br>බැතියෙන්<br>අංජලිකරණීය<br>නුඹේ හද<br>තවත් ගුලි කර<br>ළගම නොතබා<br>ස්නේහයෙන්<br>දෝතටම දෙනු මැන. |
| 325 | සඳුට සදහටම සෙනෙහ පැමුත්<br>උදුල තරු කැටයම්<br>හිරුට පෙම්බැදි එකද තරුවක්<br>සිටිය නොහැකිද යම් |
| 326 | ආදරේ සුන්දරයි<br>පිවිතේ මල් මීටයි<br>ආදරේ ඔබටමයි |
| 327 | පැතුම් පිවිතුරු ප්‍රේමය නාමෙන්<br>සහස් සුවහස් පැතුම් ඔබ මහිමෙන්<br>ඉනු කඳුලද සිදෙන්නට<br>යදින්නම් ඔබ මැකි යනු මතකෙන්. |
| 328 | මට වඩා<br>ඔබ සුව විදින<br>ඔබේ ගම් පියස<br>වඩා පින්කර ඇතැයි<br>මට හැඟේ. |
| 329 | ඇයි හිරුනි මටත් හොරා මගේ හිත හොරා ගත්තේ<br>අනේ එක මට දෙන්න....කෝ<br>(එදා බැංකු කවුන්ටරයේදි ඔයා මගේ පුංචි හිත සේරම<br>සොරා ගත් නිසා මම අසරණව මෙච්චර කාලයක් එය<br>සෙව්වා) වෙන කෙනෙකුට දෙන්න එපා ඔයා ඉතිරි නොකර ගත්<br>නිසා මා දුකින් කල් ගෙවන්නේ Dear'<br>මීට Pබට්ට්ච් |
| 330 | දෙවියන් විසින්<br>දුන් පඩුරක් ලෙසින්<br>ප්‍රියාණනේ ඔබ<br>සුරකිම් බැතින්..... |
| 331 | මල් පොකුරු<br>සිත පිණි මියැදෙයි<br>නිදහසේ මළගමට<br>දින ලගයි. |

| | |
|---|---|
| 332 | මල් සුවද වගේ මල මතම රැදි<br>විලේ ජලය වාගේ විල තුලම රැදි<br>සදේ සදාතන ආදර සිසිල වැදි<br>අපේ ආදරේ පවති සුවඳ දිදි |
| 333 | ආදරේ කියා කියන්නේ<br>හරිම වාතයක් |
| 334 | සදෙන් සිසිල<br>හිරු උණුසුම<br>දෙන අහස් තලේ<br>තරු බිඳුවක ආදරයෙන්<br>පලක් නැ ඉතිං..... |
| 335 | උපාධිය ඇයි මෙතරම්<br>වෙහෙසකර? |
| 336 | Don’t look out<br>My face<br>My fece like a<br>Galde face"" |
| 337 | සඳ පෙම් කරන්නට<br>ළග රැඳුණු තරුවකට<br>කියා ගනු හැකිවේද<br>සඳට පෙම් කරන වග |
| 338 | ළග නැති වුනත්<br>සිත ළග ඇති<br>ආදරේ භාවනාවකි |
| 339 | තව එකම එක වරක්<br>පරදින්න දිනුම දි<br>දිනවන්නම් ඔබ<br>පිවිතය පුරා |
| 340 | කඳුළ හිනැහෙන විටදි<br>නෙතු අග<br>අසරණයි යලි තනියි<br>පෙම් ලොව. |
| 341 | අස්ථාන ගත වුනත් හදවත<br>මිට කලකට ඉහතදී<br>වැයමින් මම රඳව ගත්තෙමි<br>යලි නොයන ලෙස දුර ඇදී<br>සිහින කඩතොලු කලක් දවසක්<br>දැස් මතටම දුක දිදී<br>වැලි කුණාටුව මීස නුඹට බැ<br>සඳුන් සිසිලක් විය හැකී...., |
| 342 | පිවිතද කවියක්<br>ආදරය එහි සොඳුරුතම වදනක් |
| 343 | නඩුපද වගන්තිය ඇතුලත් නිතියට<br>පි.එල්. දුන්නු ක්‍රිමිනල් වහකදුරුමට<br>නිදිවර වරා පාඩම් කල අපේ උන්ට<br>ලෙඩා දුන්නේ D විතරයි කොළයකට |
| 344 | සොඳුරු සරසවි දිවිය<br>නිමාවිය නොදැනුවම<br>එහෙත් මෙහි රැඳුනු මතකයන්<br>අමතක නොවේ කිසිදින |
| 345 | සරසවි මවිනි<br>වෙන් වෙන්න හොරාව අත ළගයි |
| 346 | සදපායන නිල් අහසට<br>හිරු කොහොමද එබෙන්නේ<br>මගේ හිත ගත් සුදු මැනිකෙට<br>හිත කොහොමද කියන්නේ |

| | |
|---|---|
| 347 | සිනා සුනේ ඔබ මදෙස බලා<br>පෙමින් බැඳුනේ මා හද ඔබ නිසා<br>වදනක් පැවසිමට ඉඩ නොලැබු නිසා<br>ඔබට නොදැනේද මේ හද<br>බැඳුනු ආදරය එදා<br>කටා නායක නම් ඔබ<br>සිත තුල රැදේ සිව් වසරක්<br>පුරාවට<br>කෙතරම් නවකයන් පැමිනියේද මේ<br>සරසවි බිමට<br>ගොඩ නොයන ලෙස ප්‍රාර්ථනා කරමි මම |
| 348 | මා දන්නේ ඔබම පමනයි<br>එයම සිහිනයකි |
| 349 | ප්‍රාර්ථනා නොපුරමු<br>අප කිසිදා<br>සරසවි එන්නට<br>මේ වාගේ |
| 350 | වෙන්ව යන ඉමට<br>ඇවිත් අප<br>දුක දරන්නට බැරි තරම්<br>මේ දුකම ඔබටත් දැනෙනවාද<br>මට හිතා ගන්නට බැරි තරම් |
| 351 | සරසවියේ අසරන වී සිටින         විට<br>ඔබ හමුවුයේ දිය බිඳුවක් විලස      මට<br>පැමිණිය නමුඳුසිවු වසරක්           කෙලවරට<br>යම්දෝ කෙසේ ඔබ හැර මම          ගමට |
| 352 | දිල්රුක් ක්‍රිස් බ්‍රියට්‍රිස්<br>කුමට ලි මම ලව්  ලෙටර්ස්<br>සඳවත් වේය මා බරි පෙම්<br>සිටිනේ අනුර්පුර්<br>ගම් පියස් මැද්<br>කෙසේ වැනෙත් වත් දැයි<br>අහා<br>වලාවටි සඳක් මැයි ඈ<br>සතක් මයි මකිය මේ කුරුටිගා<br>fiáuefhï මම ඈ සොයා |
| 353 | සිහිනයකි ප්‍රේමය<br>රෝස පැහැ කම්මුල් අතර රූටා වැටෙන<br>කඳුළු බිදකට පබැඳුවේ<br>මාවතේ යනෙන<br>ඉඳුල් යදින අයගේ නෙතු අතර<br>හෙමින් හෙමින් රූටා වැටෙන<br>කඳුලු බිඳු නොදකින්න<br>ඔබේ කවි බස කිමද<br>සබඳ පින් මදි වුයේ |
| 354 | මම බලා ගෙන සිටියා<br>කාලයේ නිම්වළලු අතරින් ඇය සැගව<br>යනඅයුරු<br>හදවතින්ම ඇයට ශුභ පැතුවද<br>නැහැ<br>කඳුලක් කිව්වේ ඒ සකුරා මලට<br>ආයෙත් එන්න<br>සයොනාරා කියලා |
| 355 | මින්මතු අප හමුවේද          ආයේ<br>කසගස් සෙවනේදි            ආදරයෙන්<br>හින් සැරෙ ඔබ සිතටම          එනවා<br>දයාබරයි මා එදා               වගේ |
| 356 | සිප්සතර දැන උගෙන<br>මගේ ලොවට ඔබ රැගෙන<br>හදවතේ ගිනි නිවන<br>ඒ සොඳුරු දින කොතැන |
| 357 | සුදු වලා කැටිව ගත්<br>අඳුරු අහස් කුසයට<br>සිහිල් මද පවන් මදින්<br>දුවයි සිත ඈවෙතට |
| 358 | ආදරය තුළින් එන<br>ඉමිහිර වු සතුට මෙන්ම<br>ඒතුළින් ඇතිවන වේදනාව ද<br>හදවතට බොහෝ සේ උණුසුම්ය |
| 359 | ඔළු කුහර කකියන<br>ගිල්ප කතරේ<br>දිය බිදකි සොඳුරිය<br>දුම්වලා ගිනි පිඹින<br>කොන්ක්‍රිට් කතරේ<br>නුඹ මට<br>සිහිල් පවනකි සොඳුරිය |
| 360 | සටහන්  අතරේ නෙත්  සිර      වෙනවා<br>හදවත  මාගේ ඔබ වෙත          එනවා<br>මා මෙහි තනිවම ඔබ  මෙහි       තනිවම<br>දෙදෙනා දෙතැනක සුසුම්       හෙලෙනවා |
| 361 | මා ද  ඔබ විය<br>ඔබ ද මා විය<br>ඔබ අන්සතු විය<br>මට කෙල විය |
| 362 | සිව් විසි පැයෙම සිහි වෙනවා ඔබගේ   වත<br>කය මෙහි උවත් ඇත ඔබ ලග මගේ   හිත<br>දෛවය මගින් ගිලිහුනොතින් ඔබගේ    අත<br>එදිනට මගේ අවසන් ගඳ දැනෙනු       ඇත |
| 363 | ඇලක දොළක ගංගාවක ගැඹුරු දියේ<br>යම් දිනෙක මා සතු සිරුර          තියේ<br>ඒ රුදුජලතරයට නොවෙයි          බියේ<br>ඒ රුදු ගැහැණියට සැඟවී සිටිම්    බියේ |
| 364 | කැදැල්ලේ උන් කිරිල්ලි  මා<br>චන්ඩ මාරුතයේ හැපි ගියා<br>ආලයේ දඩයකට හසුවි<br>සොවින් ඉකි ගසමින්<br>සිනාසි උනිමි |
| 365 | නංගි මිය ගියා එය දුක් ගොඩක්  උනා<br>සරසවි බිමේ නුඹ මගේ නංගියෙක් උනා<br>අපේ ඇසුර දැන නොයෙකුත් පදබැදුනා<br>නුඹේ හොදට මම මෙහි හුදකලා   වුනා |
| 366 | සුවද විහිද මල් පුබුදින    වෙලාවට<br>පවන් පොදින් නව සුවදක් දැනේ මට<br>සිනා කවට සපිරුණු පිරි සැදැවක<br>දෙනෝ දහක් මදිකම දැනේ මට |
| 367 | දයාබර.....<br>පැතු සෙනේ බිලිවුනත්<br>කඳුළු ගංගා දියට<br>ඔබ මගේ මා ඔබේ<br>කිව් වදන් සිහිපත්ව<br>මතකයෙන් ඇත් කර<br>තබන්නට නොහැකිවුව<br>කදුළු දිය එකතු කර<br>පුදම් සෙනෙහස නමට |

| | |
|---|---|
| 368 | කඳුලැල් සලා<br>මමත් වැලපෙමි<br>ආදරය නිසා<br>ඔබ දන්නේනැ<br>සෙනෙහෙ කඳුලක<br>වෙදනා පවා |
| 369 | ගනඳුර කැටි වුන හදවත්<br>කුටියේ<br>බලාහිඳින්නෙමි තනිය දරා<br>ගනඳුර දුරලන සඳරුල්ලක් වී<br>මගේ ලොවට ඔබ වඩින තුරා |
| 370 | ශිල්ප කබලෙන්<br>ලිපට වැටුනි<br>ඇය මගෙන්<br>වෙන් වූ දිනේ |
| 371 | නිමා විය වසන්තය සරසවියේ සැරි සරා<br>ගම රටට යායුතුය දැන් ඉතිං පය ගසා<br>කාටවත් නොපෙනෙන්න සිතින් ඉකි ගස<br>ගසා<br>නුඹෙන් සමුගනිමි මම සමුනොගෙන බැරි<br>නිසා |
| 372 | දවසක් එක් සැදෑවක<br>අපි උන්නා මෙහි තනි වී<br>ජීවිතය තේරුම් ගැනිමට අසිරුව<br>බලා සිටිය උනුන් දිහා |
| 373 | ජීවිතයේ එක්වරක්<br>එකම එක වතාවක්<br>මුදු දෙතොල් විවර කොට<br>මිමුණුවොත් ආදරයෙන්<br>වැලඳ ගෙන අනාගතය<br>ඒ මොහොත පටන් යලි<br>ලබන්නෙමි ජීවිතය |
| 374 | ඔහු හෝ ඇය<br>ලංවෙයි හදකට<br>සෙනෙහසින්<br>සරසවි බිමෙදි<br>එහෙත් වෙන්කර දමා යනු එපා<br>ඔහු හෝ ඇය<br>කුරිරු විලසින් |
| 375 | ලවර්ස් ලේන් එකේ සුදුමල් පිබිදේවා<br>වෙනදා වගෙ සවසට වැසි නොවැටෙවා<br>මගේ කාමරය ගනඅඳුරින් නොවැසේවා<br>ප්‍රවීණතා ප්‍රතිඵල පිට නෙවේවා |
| 376 | සුදෝ සුදු ඔබේ කළුවන් කොන්බේ සුදො<br>සුදො සුදු ඔබේ නිල්වන් දෙනෙත් සුදෝ<br>සුදෝ සුදු ඔබේ පියකරු මුහුණ සුදෝ<br>සුදෝ සුදු ඔබේ මුළු ඇඟකළුයි සුදො |
| 377 | සිරිපාලගේ දේශනාව<br>අපට හරිම වේදනාව<br>කිමද ඊට කාරනාව<br>මාජි ගැනයි කල්පනාව |
| 378 | පෙම් කරනා හැටි මාහට<br>කියා දුන්නේ ඔබය සොඳුර<br>එසේ නමුත් ඔබ තවමත්<br>කියා දුන්නේ නැහැ නොවේද?<br>ඉන් ගැලවෙන අන්දම ගැන |

| | |
|---|---|
| 379 | නැත යන්නට සිතක්<br>දමා ඔබ සරසවියෙ<br>අද ඔබට සහ මට<br>සෙවන දුන් හන්තාන<br>සිහිල දුන් මහවැලිය<br>මා ඔබ දමා ගිය පසු<br>සරසවියේ තනිකර<br>පවිරක් වේවි හන්තාන<br>ඔබේ දුක් මගෙන් සගවන්නට බැඳි<br>සෝ ගඟක් වේවි මහ වැලිය<br>ඒ දුක කියා දිව ඇදෙන |
| 380 | ලස්සන නැති කෙල්ලක් ආවයි<br>වාසිටියේ<br>ලස්සන නැති නමුත් සිදේවිය<br>වාසිටියේ<br>ගියෙමි ගියෙමි පස්සෙන් සිත ගන්නට<br>බැරියේ<br>මම කෙල්ලෙක් නැති කොල්ලා<br>වාසිටියේ |
| 381 | ප්‍රේමය සාගරයක් වගෙයි<br>ගැඹුරුයි රුදුරුයි<br>චංචලයි පියකරුයි<br>විඩාවට ප්‍රයෝජන නැත<br>ලුණු රස වැඩියි |
| 382 | ආදරය විද්වතුන්ට<br>පඬිවරුන්ට<br>දර්ශනිකයින්ට<br>හෝ<br>මිහිමත කිසිවෙකුට<br>නිර්වචනය කල නොහැකි<br>එකම දෙයවේ |
| 383 | සඳරැස් ගලන මල්මිටියාවතේ<br>නිහඬ වූ යාමයක<br>සුසුම් පොදි මුසු වී<br>මිහිතලයට<br>හදවත විසින් කරන දෙය<br>සුන්දරත්වය යයි<br>හැගේ සබැඳිය |
| 384 | ඔබහට පෙම් කල යුගය නිමාකර<br>වෙන් වියන්නට දවස පැමින ඇත<br>සමාව දෙන් මට<br>සෙනෙහෙ සිතින් |
| 385 | පහන් කණුව මම<br>දැවී ගිය දියබුබුළ ඇය |
| 386 | වෙන තරුණියකගේ දෑත් අරන් ඔබ<br>පියමන් කරනා සරසවියේ<br>කෙසේ බලන්නද ඔබ යනෙන මග<br>දැස හඬයි මගේ කඳුළු නැතත් |
| 387 | සඳුන් ගැටක් මා අත නම් නැ රැඳුනේ<br>පියුම් හතක් පා යට නම් නැ පිපුනේ<br>මුඩුක්කු සල්ගස හෙම නැ වැඩුනේ<br>සිද්ධාර්ථ නම පමනයි මට තිබුනේ |
| 388 | සිගන්නෙක් තුන්මුල්ලේදි සිගමන් යදියේ<br>පිහිටක් නැතිව මා වෙත හැරුනයි හදියේ<br>යමක් ලැබේදැයි ඔහු තුල සැක වුයේ<br>රටක් ඇතිද අනාතයෙකි මා සරසවියේ |
| 389 | කුසගින්න කුසගින්න<br>කාට කියන්නද<br>එවු මුදල් ඉවරයි<br>අම්මේ : අම්මේ |

| | |
|---|---|
| 390 | ගල්බැම්ම වට කරපු අඳුරු සිර කුටියේ<br>තුල<br>නිතර මසිතට නැගෙයි සොයුර නුඹ විදින<br>දුක<br>පොත් ගුලට වැදෙන මුත් අපේ<br>ගත<br>ගත සිතට පණ නැතිව බිම වැටෙයි අං තබා<br>පොත |
| 391 | එස්.එස්.සි විනාශාය<br>සම්මානෝ අති දුර්ලභා<br>රැකියා විරහිතං දුක්කං<br>බි.ඒ ඩිග්රී මහා භයං |
| 392 | නිතර හමුවන ඔබේ සුවඳයි මගේ හිත යට<br>ඇති හැගුම්<br>කෙලෙස සිතුවත් බැහැ මකන්නට නැගි එයි<br>කුළුදුල් පැතුම්<br>රුදුරු මිනිසුන් සිටින මේලවේ කෙලෙස<br>ඉටුවෙවිද පැතුම්<br>පැතුම්ඉටුවෙන තුරු ඉදින්නෙමි වෙලා යැම විට<br>දුක් සුසුම් |
| 393 | ඇත අතිතයේ සිහින මැවු<br>සරසවි දිවිය සුන්දර  සිහිනයකි<br>සිනහවක් වත් නොව<br>කඩු පහරින් තුවාල ලද තුවාලයක කැලලක්<br>මෙනි |
| 394 | පාඩමං අරහං තානං<br>විභාගං භයං කරං<br>බඩගින්න ඉවසං බොලං<br>නින්දනං පරමං සුඛං |
| 395 | ක්‍රෑම දන විට බොග සෙට්වෙන්න එපා<br>අතේ සතේ නැති අපට බඩගිනි වෙන්න එපා<br>මෙදා පොටේ එග්සැමය ඇනෙනු එපා<br>යලිත මේ බිමට එන්නට සිදු වන්න එපා |
| 396 | ලබන්නට උපාධිය ඇන නොගන්නට<br>නිදිමරයි ලියන්නට අප සැම විභාගය<br>ඇඟ බඩියි අඳින්නට බැරිය කලිසම<br>සැමදා පිම්එකේ කන්නට බැරිය පරිප්පුව |
| 397 | ඉගෙන ගත්තේ හිසේ කොඩිමල් බඳින්නයි<br>අපිපැතුවේ ලෝකෙට සෙත කරන්නයි<br>අහො මිතුර ඉගෙනුම ඵල ලබන්නයි<br>අද සිදුවුනේ මහ මග දුක් විදින්නයි |
| 398 | මදුරු පිරිස ඇඟ හැම තැන දැවටෙනවා<br>නෝට් පොදිය අත්තල මත   වැලපෙනවා<br>නිදිමත දැනෙයි නොදැනම නෙතු පියවෙනවා<br>ඩිග්රිය ලැබෙන තුරු මේ දුක පළ දෙනවා |
| 399 | සරසවි බිමේ සත් වසරක් ගත      කෙරුව<br>මගෙ ලොකු දුවේ ඇයි අද ඔබ මට බැරුව<br>කුමරෙක් සොයා දෙන්නට මා නිදි      මැරුව<br>අත් දෙක වන වනා ආවේ කිම        දරුව |
| 400 | අනේ සුසානෝ ඉස්සර            වාසිට්යේ<br>මේසේට කැම ඇරලලු දිලා        හිටියේ<br>අලුතින් හිලක් විදලා ඉනවට       පටියේ<br>බඩ තදකර ගනින් හොදැහැටි කිටි   කිටියේ |
| 401 | අල්ලට සිඟාමෙන් දෙවරුව පාන්    කකා<br>පස්ස ඉරුණු කලිසම දුලියෙන්       වකා<br>නැති බැරි කමුත් ඉවසා දත් කුරු   විකා<br>ලැක් වැස් දුවමු බී. ඒ. අකුරු දෙක තකා |
| 402 | පානුයි පරිප්පුයි දවසක බුදු      වේවා<br>ගෝවයි අලයි සැරියුත් මුගලන් වේවා<br>කැන්ටින්  හොද්ද නේරංජා ගඟ වේවා<br>සුප්පයියා මුදලාලි කන්ථක අසු   වේවා |
| 403 | පිදුරු සෙවිලි කළ පැල්පතේ ඇත<br>මිට සැප අනෙ දෙවියනේ |
| 404 | කැන්ටිමේ පල්වෙච්චි<br>හොද්ද ගා පාංකා<br>ශිල්ප කලත් හත් අවුරුද්දක්<br>බඩපනුවෝ නිදැල්ලේ<br>පුටි  බොල් කෙලිනවෝ |
| 405 | බොඩිමේ ඇන්ටි<br>දාහක් රුපියල් ගත්තත්<br>උදේට දෙනවා පාං වා<br>කැන්ටිෙ මුදලාලි<br>දේය මුදලට ටැප් වතුර<br>ප්ලේන ටි දුකෙන් කොල්ලනි<br>කරවි පෙරලි |
| 406 | අයියෝ සරසවිය අයියෝ        සරසවිය<br>කියන දෙයක් ඔළුවට ගන්නට       බැරිය<br>තාත්තා ලෙඩ ඇඳේ මහ පොල තව නැතිය<br>අයියෝ අම්මේ අයියෝ මට          බැරිය |
| 407 | දහවල් කලට ඇදිරිදූ වාසනාවන්<br>සැන්දෑ කලට කෙල්ලන්ගේ පනාවන්<br>රෑ තුන්යමේ මදුරුගෙ  ගායනාවන්<br>එලිවෙන පැයට නිදි  දුව වාසනාවන් |
| 408 | කුසට නැත අහරක්<br>නෙත නොදනි නිදි සුවය<br>සරසවිය සරසවිය<br>මරා දැමුවේය නුඹ අපේ<br>සොඳුරුවු යෞවනය |
| 409 | එන්නේ කැම්පසුයි හොස්ටල් එකේ සිට<br>කන්නේ වතුර සහ බත් කැන්ටිමේ සිට<br>මාස ගනන් නැත දිය බිදු  නාන්නට<br>මේ දිවි කතර දුක් උසුලන්නේ කුමට ? |
| 410 | අපි ආවේ ඉගෙන ගන්න<br>අපිට උනේ නොකා ඉන්න<br>ණය තිබෙනවා ඉහ පිරෙන්න<br>අපි යනවා ගෙදර යන්න |
| 411 | පිපි මල් පරව විසිරි ඇත දෙරණ  මත<br>විහිදු සුවඳ තවදුරටත් මියෙනු     නැත<br>ඔපවත් කරන්නට එසුවඳ අපරි     මිත<br>නිමා නැති තර තව මල් පිපෙනු ඇත |
| 412 | ආදරයේ කඳුලකට ජිවිතය උකස් කර<br>සුසුම්ලන යෙහෙළියේ<br>තියා ගන් නුඹ නේතේ රැදි කඳුල<br>අපේ ලෙව ගොඩනඟන උන් නන් පුදන්නට |
| 413 | දැහැමි රජයක පවි ගෙවන්නට ජනිත වු පොඩි<br>දරුවනේ<br>අහිංසක මවි වරුන්ගේ කුස ඇයිද නුඹලා<br>ඉපදුනේ<br>විදේශිකයින් නුඹව ගෙන ගොස් මරා දැමුවත්<br>හෙට දිනේ<br>එයට එරෙහිව යුද වදින්නට ඉපදියවි මේ<br>දිවයිනේ |
| 414 | සුදුසරමේ ලේ හැලුවේ තොප බව අමතක<br>වුනාද?<br>බුලත් විටෙපස් පංගුව ජාතියකට අයිත් වේද?<br>ඔසිගේ මඩ වලේ ඉදං සැබෑ වෙනස<br>ඇතිකලාද?<br>ප්ලාමය දිනා ගන්නට කැණහිල් හඩ<br>තවනැගේද? |

| | |
|---|---|
| 415 | ටයරය ගිනි දළුව යෞවන සිරුර මැඩ<br>දුටුවෙමු දකින්නෙමු බුරමින් නැඟෙන හඬ<br>අවනිතිය එරෙහිව උන් නගන හඬ<br>යලියලි ඇසෙයි දළුවල සිරස මැඩ |
| 416 | කන්හිරි වැටෙන ළයපුපුරන වෙඩි සද්දෙන්<br>ජනාසැලෙන පිරිස පමණක් අප හා එද්දෙන්<br>යන්නට දෙපා පණ නැති වුන් නවතිද්දෙන්<br>ජය බිම කරා අපි යමු පෝරක මැද්දෙන් |
| 417 | නේවාසිකාගාරයෙ වන පොත් කරන<br>මැදියම් රැයේ ඇසුනා නම් දෙඩන<br>දුටුවෙමි රුැහිරු බිත්තියෙ පෙරදිග ගැටුන<br>සැඟවූ මලනුවෙනි සිහිවිය නුඹ වුවන |
| 418 | අපේ අරුනළු නෙලා ගන්නට<br>හැකි වුනොත් මේ භවයේ<br>ගොඩනගනු නවලෝකය<br>සඳ රැකගමු දිවි දෙවෙනි කොට |
| 419 | විප්ලව කාරයින් බනින්නේ<br>දුප්පත් කම නිසා නොව<br>දුප්පත් කම ලඟින් ධනවත්කම<br>පෙනෙන්නට තිබෙන නිසාය |
| 420 | සිඳ බිඳ දමා දිවි මග සහ අදුරු වැල<br>ශිල්පය පිබිදියන් පුරහඳ මඩල වෙලා<br>ඒ පුර හඳ මඩල සිරිලක හැඩය වෙලා<br>අනුරපුරේදි ජනපතියට පිස්සු කලා |
| 421 | තබන තබන වෙඩි ආපිට හැරියන්<br>මරණ මරණ මිනියට පණ ලැබියන්<br>ගහන ගහන ගැටවල් ටික ලිහියන්<br>සිසුන් මරණ තොපිලට හෙන වැදියන් |
| 422 | වඳුරන් ඇවිත් රට අල්ලන වෙලාවේ<br>කොල්ලන් මරන්නේ ඇයි හත් වලාමේ<br>පාදඩ එවුන් ඉන්නා අප හමුදවේ<br>ජාතක කළේ බල්ලොද ඉන්දියාවේ |
| 423 | මාමිය ගියත් දෛරනෙණ් අසම සම<br>රතුමල් පිපේවා පොහොරට රැගෙන ලැම<br>ලෝකය පිටු දකින දිනයක දිළිඳු කම<br>නැගිටිමි ආත්මය සමගින් එදින මම |
| 424 | යුක්තිය පතා මවුබිම රතුලෙයින් තෙමු<br>සතුරන් ඉදිරියේ නොසැලි සිටින්නෙමු<br>මිනි කඳුළඩින් අපි පිය මනින්නෙමු<br>මව්බිම නැතොත් මරණය අපි දිනින්නෙමු |
| 425 | යුක්තියට එරෙහිව ඇති දෙනෙත් වසා<br>බුද්ධිය ඉකි ගසයි වැඩකට නොගත් නිසා<br>සත්‍යය මරාගෙන සතුරන් සැනින් නසා<br>නව ලොව නඟන්නට නැගිටින් කඳුළු පිසා |
| 426 | බැටන් පොලු කර පිටම දෙං<br>කඳුළු ගැස් වෙඩි උන්ඩ දුං<br>කොයිද සගයින් එරං<br>නැතිය ඉහිලුම් කරන තෙක් සුං |
| 427 | නැවත වතුර මල යට හිඳ නල වතුර<br>තාමත් සිතින් කිදෙයි ගඟ දිය වතුර<br>කැම්පස් කැන්ටිමේ බත හරි නැහැ මිතුර<br>තාමත් සිහි වෙතිය පෙර කැ අල බතල |
| 428 | ජිවිතය<br>ගෙවි යනුයේ<br>පොත් පිටු අතරේ ය<br>කැත්තයි උදැල්ලයි උරුමවු<br>අප හට<br>පොතයි පැනයි හුරු වී ඇති<br>ඵලය කුමටද? |
| 429 | මොහොතට සුවදෙන<br>උපාධි කබායේ අප්‍රිය සුවඳට වඩා<br>පිඩිත පංතියේ වැරහැලිවලින්<br>නැඟෙන දහඩිය සුවද උදරය |
| 430 | විදුලි එළියයි පඩුවු පැහැයෙන් රැයෙ සිත<br>නෙත පෙළන්නේ<br>පාට බොඳවුණු අකුරු මතු විදුක කියා ගෙන<br>ඉකි බිඳින්නේ<br>ඇත පැළ තුළ කුප්පි එළියෙන් අකුරු කරනා<br>ළමුන්නේ<br>විසල් ලෝකෙක අතරමං මට එන්න පාරක්<br>කියන්නේ |
| 431 | ඇත විලේ රන් වන් රන් නෙළුම් මල<br>ගෙන ගියා නගරයට<br>විෂමයි පුදුමයි දැඟකාරයි<br>මම නොදනිමි මේ කිසිවක්<br>ඉතිං කියාපං සබඳ මම කොහොම<br>නුඹව ආමන්ත්‍රණය කරන්නද<br>මටම නොතේරේ<br>ඉඩ දිපං සහෝදරය<br>මට නුඹව සත්‍ය තුළින්<br>යම් දුරක් ප්‍රතිරුපනය දැක ගන්න<br>ඉන් අනතුරුව මට නුඹ ශාප කරපන්<br>මාව අමුනුෂ්‍යය |
| 432 | මිනිසුන් අතර තනි විම<br>මිනිසුන් නොමැති පරිසරයක<br>තනිවීමට වඩා<br>ඛේද ජනකය |
| 433 | දේශන මොටද මතකයේ රඳවන්න බැරි<br>සටහන් මොටද කියවා නිමවන්න බැරි<br>බුද්දිය මොටද සත්‍යය ජයගන්න බැරි<br>ඩිග්‍රිය මොටද රක්ෂාවක් ගන්න බැරි |
| 434 | සතුට සැනසුම<br>සුහදතාවය<br>නොමැත සැමවිට<br>මෙලොව අප සතු<br>කඳුළු අතරින් සිනාසෙන්නට<br>නොහැක එනමුත්<br>එයයි කළයුතු |
| 435 | උදුරා විසි කොට වසන්තය මහපාරට<br>හාමතේ ගියෙ කුමකටද?<br>කඳු හෙල් අතර පිපී පරවෙන්නට-රහසේ<br>නොකියාම නුඹෙ සුවද<br>නොහඳුනන මිනිසුන් වෙනුවෙනි<br>දැත පාලය දි ආදරයෙන් වැලදගෙන<br>වෙඩි උණ්ඩ කැවේ කුමකටද? |
| 436 | මා මළ පසු<br>සොහොන් කොතේ<br>බලු පැටියෙක් බඳිනු<br>මැනවි<br>එතකොට ඌ හින්<br>හඩින්<br>මහ රැවත් මට බුරාවි |

| | |
|---|---|
| 437 | ප්‍රථම වසරින් පාස් වී බිමට පැමිණි<br>නුඹ විප්ලවයේ රතු කොඩිය ඔසවා<br>සමාජයට කියාපාන්නේ යහපත්<br>සමාජයක් හද දිපල්ලා<br>නිදහසේ ඉන්න දිපල්ලා කියා<br>නමුත් නුඹ<br>සරසවි බිමෙන් අවසන් වසරින්<br>සමාජයට ගොස් රතු ධජය<br>ඔසවා යන්නේද?<br>ප්‍රථම වසරේ කියූ කරපු දේ<br>අවසන් වසරින් පසු ක්‍රියාත්මක වන්නේ |
| 438 | ජිවිතය නැවතිලා<br>සරසවිය මවු කටේ<br>හැල්ලුවට ලක් වුයේ<br>උපාධිය නුඹනොවේ<br>බුද්ධි යැයි මේ රටේ<br>මන්ද බුද්දිය රජ වෙලා<br>නාඬන්න උපාධිය<br>නාඬන්න සරසවිය<br>ජනසවි හිනැහිලා |
| 439 | හිතමිතුරු මානවකය<br>මේ දළ සිවුරු පටින් වසා ඇති තරුණ සිරුර<br>ඔබ පතන බොහෝ දේ පැතිමට නොහැකිව<br>බොහෝ දේ<br>ප්‍රතික්ෂේප කර බොහෝ දේ ඉවසා දරාසිටිනු<br>ඇත.<br>භික්ෂුවක් |
| 440 | සොරකු ඉල්ලන්නේ<br>මුදල් හෝ ජිවිතයයි<br>නමුත් ගැහැණියක්<br>මේ දෙකම ඉල්ලයි |
| 441 | දිවි ඇති තුරා මේ දිවියෙහි  පසුවන්න<br>සිතු මුත් නිදහසක් නැත මෙහි විදගන්න<br>යන එන තැනක සිදුවෙයි දෙස්  අහගන්නට<br>මට බැහැ ඉන්න සම්දුනි යන්නෙම් යන්න |
| 442 | එකෙකුගෙ සැපට තවකෙකු ඉරිසියා  කොට<br>අරගල කරනවා මත නැති  කිරිමට<br>ආගම  දහම යටවීඇති  පගාවට<br>මිනිසුන් අපේ බය නැත  අද  අපායට |
| 443 | ගුනයේ ගුණය අගුණය අගුණය  ගුණය<br>ගුණයේ ගුණය දුටු මිනිසා  අසරණය<br>මම ගුණමකුය එ  මගේ පුරුවෙ  පිනය<br>මට දුක නුඹට ඒ පින නැති එක  ගැනය |
| 444 | ජිවිතය තෙරුම් ගැනිමට අපහසුයි<br>මන්ද ජිවිතයත් මායාවක්  වනබැවිනි<br>මායාවක් වු ජිවිතය ගත කරන්නේද<br>මයා මන්දිරයක බැවින්<br>ජිවිතය සදාකාලිකවම මායාවක් වේ |
| 445 | ගන්නට සිතා සිටියත් අපි ඉහළ  අතු<br>නැත්නම් පෙර පිනක් ඉටුවෙයි පැතුම්  සිතු<br>කල පවිනිසා ගිලිහුනොතින් ඉහළ  අතු<br>ලද හැටියකට සැනසුම මයි මෙයින්  මතු |
| 446 | අලුත් ලොවක් ගැන සිතිම<br>දඩුම් දෙන වරද නම්<br>කුමට එරට අධිකරනය නිතිය මිනිසුනේ |
| 447 | ලේ කඳුළු මල් පිපුනු<br>නිලමය රාත්‍රිය<br>රතැස් යුග බමවමින්<br>නුඹ වටා රැක සිටියි<br>නෙතු පියන් විවර කර<br>අසාපන් නුඹ නමින්<br>නැගු හඩ<br>නුඹනමින් මිය ඇදුණු<br>උන් නමින්<br>දුබල වී අසරණ වු<br>දේශයේ මාතාව<br>අත් ගසා ලෙහි නිබඳ<br>හඩ නඟනවිලාපය<br>සම වතට සමවැදි<br>රැක් මුලක බුදුනොවි<br>නැගි සිට හදවතින්<br>අසාපන්<br>හෙට |
| 448 | උදුරා විසි කොට වසන්තය මහ පාරට<br>හාමතේ ගියෙ කුමකටද?<br>කඳුහෙල් අතර පිපි පරවන්නට රහසේ<br>නොකියාම නුඹේ සුවඳ<br>නොහඳුන මිනිසුන් වෙනුවෙන්<br>දැත පා ළය දි ආදරෙන් වැලඳගෙන<br>වෙඩි උන්ඩ කැවේ කුමකටද? |
| 449 | පියාඹන්නට කාක්කන්ට<br>අයිතිය ඇත හිසට උඩින්<br>අහස අපේ නොවන හින්දා !<br>එත් අපේ හිස මුදුනේ<br>කුඩු තනා බිජු දමන්නට<br>අයිතිය නැත කාක්කන්ට<br>තවම ඔළුව අපේ හින්දා ! |
| 450 | කාලයත් පඩයක් හා සමානය<br>ගියොත් ගියාමය. |
| 451 | සිහිනෙන් පවා මගේ සුබ විහරණය පැතු<br>අම්මා දනිනම් මේ සරසවියේ  තතු<br>වර බොල කොළුවෝ යයි දෙනතින් කඳුළු යුතු<br>ගෙනගොස් බොහො කල් මේ දුක් විඳින  පුතු |
| 452 | අව පස ඝන තිමිර ඉරා<br>පුරපස සඳ නැඟෙන තුරා<br>මහ පෝ ගණනක් යන තුරු<br>මා වෙනුවෙන් වින්ද දුකට<br>වන්දි ගෙවන්නට හෙටදින<br>උපාධිලෝගුව පොරවන්<br>මං එන තුරු ලොවම දිනා<br>බලං ඉන්න අම්මේ<br>ඉදිකඩ ළගට වෙලා. |
| 453 | ජිවිතයේ තුරුණු බව<br>මා වෙනුවෙන් කැප කළ<br>මගේ ආදර අම්මේ<br>සසර සැරි සරන තෙක්<br>සදා ණය ගැතිය ඔබට<br>ඉතිං<br>කෙලෙස අදහන්නද<br>ඔබට දැක්වු ලබැදි<br>සෙනෙහස ඔහුට මා. |
| 454 | ඇදූරු දිසාපාමොක් ආගිය තැනක්  නැත<br>සාමා අමර වැලිකඩ හිරගෙදර  ඇත<br>හෝඩිය බොදව සිතුවම් පොත මැකි  ඇත<br>දින නියමයක් නැත සරසවි වැසි  ඇත |

| | |
|---|---|
| 455 | මම බාලේ සිට අකුරට ලොබ බැන්ද<br>කැම්පස් ආවේ දෙටුළුතුමන් ඒ හින්ද<br>මෙතැනට එන්න රැග් අතොරක් නැත හින්ද<br>මෙතැනත් තව රැගක් මොන එකටද මන්ද |
| 456 | ඔරවා රවා බැලුවා මොහොතක තුටුව<br>ගොරවා රවා පැන්නා කන්නට බොටුව<br>හිනැහුනි යලිත් මොහොතක් ගිය පසු තුටුව<br>හිතුනා මේක වත්දැයි පිස්සන් කොටුව |
| 457 | කැම්පස් එන්න පෙර නම්සුරලොව මැවුණි<br>ආ දින පෙනුනෙ වධකා ගාරයක් මෙනි<br>දවසින් දවස ගොස් විභාගයලඟා වුනි<br>ප්‍රථම වසර අගදි මෙහි රඟ දැනුනි |
| 458 | කර්කශ බිමට වට වැහි බිංදුවක් වගේ<br>සරසවියට රැග්එක මී විතක් වගේ<br>හද හඬවමින් සිත් රිදවන බාධක කම්කටොළු දිගේ<br>පියමැන යමු එකා වගෙකිරුල පතා ශිල්ප මගේ |
| 459 | මා වැනි ප්‍රෙෂාලා<br>තෙල දි ළඟට කැන්ද<br>මුරුංගත්තේ තියා<br>කඩේ යැව්ළුන් දැන් කොයින්ද |
| 460 | ගමේ හොල්මං<br>නුදුටු මේ මං<br>මෙහේ හොල්මං<br>දැකලා හොල්මං |
| 461 | **කවි පැනය**<br>වසර හතරක් නොයෙක් දුක් විඳ<br>ඇතත් කාලය නිමවෙලා<br>ගමට යන්නට<br>හිතක් නැමට තට්ටයද<br>හොඳටම පැදිලා |
| 462 | **පිලිතුර**<br>තට්ට හිසගැන කුමට කම්පා<br>පිරුණු මොලයක් තිබේ නම්<br>මොලය යොදවා<br>සිතා සැනසෙනු<br>ගමට ගොස් සතුටින් ලොලේ |
| 463 | **කවි පැනය**<br>ලයිබ්‍රියේ ඉඳගෙන මට ක්‍රම බැරි<br>බඩුවක් ලගින් යනකොට ඇස් නොහැර බැරි<br>බැලුවොත් එවිට කොහොමටවත් ඉන්න බැරි<br>සිත ඒ වෙතය පොත වෙත නම් ගන්න බැරි |
| 464 | **පිලිතුර**<br>ක්‍රමට කියා නුඹ ආවත් ලයිබ්‍රිරි<br>කැමට යමක් නොතිබුබව කිම හරි<br>ක්‍රමට කලින් කැමක් දාගන්න බැරි<br>නුඹවැනි එකෙක් කුමකට කරනෙම්ද සරි |
| 465 | **කවි පැනය**<br>ශාලාව වෙත ඇදෙති<br>ලොකුපොත් ගොඩක් පෙරලති<br>ඇස් බැන්දුමක් කරති<br>නොදත්තෙමු දේශනා කරති |
| 466 | **පිලිතුර**<br>නොම්හිරිද දේශන<br>ඇසුනද වඩා භාෂණ<br>නැතහොත් නැන නුවන<br>කියව්නොසතුට වන්න කාරන |
| 467 | **පිලිතුර**<br>නොලැබුන විටදි කවුරුත් ඔහොමයි කියන්නේ<br>තත්ත්වය නම්බුවයි කවුරුත් සොයන්නේ |

| | |
|---|---|
| 468 | **කවි පැනය**<br>මල් මල් කිවාට හැම මල් සුවඳ නැත<br>සමන් පිච්ච මල මුදුනේ රේණු නැත<br>පිටතට තිබෙන හිතවත් කම් ඇතුලේ නැත<br>ආදිම මිනිසවත් මෙතරම් දරුණු නැත |
| 469 | **පිලිතුර**<br>එසේ වුවත් සුවඳැති මල් එමට ඇත<br>රේණු නැතත් මලපුරාම සුවඳ ඇත<br>ඇතුලේ තිබෙන දේ පිටතට පෙනෙනු නැත<br>එදාතරම් අද නිසා දරුණු නැත |
| 470 | එම්බා පොත් ගොන්න<br>මා ඔබට කෘතඥවන්නේ<br>මා දැනුම දියුණු කළාට නොව<br>ඇයත් මාත්<br>සිප වැළඳ ගන්නාවිට<br>ලොව කුරිරු ඇසින්<br>අප මුවා කළාටය |
| 471 | දයාබර වූ පුස්තකය<br>තොප පිරිපුන්ය<br>මානුෂික ගතියෙන්<br>තොප ළඟට එන්නවුන්<br>පිරිපුන්ය තිරිසන් ගතියෙන්<br>තොප තුරුලෙහි රදනා පුස්තක<br>නොයෙක් තැන්වල සඟවන්නට<br>ඒ තිරිසනුන් හට<br>තොප අවසර දෙන්නේද?<br>එසේ නම් තොප ද<br>ඔවුන්ට ම<br>සම කළ යුතුය |
| 472 | සරසවි පියසේ<br>දෙවැනි කඩුල්ලෙන්<br>එතෙර විමට<br>අවකාශය<br>රිසියේ ලබා දුන්<br>මා හැඟි පොත් ගුල<br>ඔබට අප<br>සඳ ණයගැතියි |
| 473 | පොත් කඳුමැදින් වටවූ මේ පුටු මේස<br>අප දෙදෙනාට සෙනෙහස පැවා නිබඳ<br>දහසක් නෙතු වලින් අප සඟවා ගන්නට<br>ඔබ කළ මෙහෙය අප හට අමතක වේද? |
| 474 | ආලය සිඟමනකි නොසිඟන අය සිඟන<br>ආලය ගිනි ගොඩකි නොදැවෙන අය දැවෙන<br>ආලය මරණයකි නොමැරෙන අය මැරෙන<br>කාලය ගෙවනු මැන සොයුරනි හිතට ගෙන |
| 475 | වැදුනත් හිසට හෙන<br>දත්ටික ඇතොත් හිසි තැන<br>නොතකා හෙනය ගැන<br>සිනාසෙනු උඩ පැන පැන |
| 476 | මලක් වෙලා ඔබ පිපුනා සරසවියේ<br>කලක් ගියා හති වැටුනා රුවැති මලේ<br>නිලක් කොලක් නොදකින මේ යකඩ කැලේ<br>මලක් වෙලා ඔබ පිපුනේ කිමද මලේ |
| 477 | විසකටු මතින් සරසවියට ඇදුන<br>සිප්සත උගන්නත් රැය නිදි මරාගෙන<br>අනාගතය අප දිවි මග සරුකරන<br>සිහිනයක් නොවෙද සරසවියේ දිවි ගමන |
| 478 | ආදරය තුල ඇති මුත් බොහෝ අරුතක්<br>සැඟව ඇතිමුත් ලොවට නොදැනෙන<br>පිවිතේ නව මං පෙතක හිඳ<br>ආදරේ හට නොකරං දෙවැනි තැන |

| | |
|---|---|
| 479 | පඩිපෙලේ හිඳ<br>සිහින සරුංගල් අරිනා<br>මානවිකාවියනේ සිතවි<br>මලපොතේ අකුරකුත්<br>නොදත්තවුන්<br>මේ බිමේ ඇත කියා |
| 480 | තකට තක නොතක නොතකට කකන එකා<br>එකට එක නොකර පසුබා දුවන එකා<br>දුකට පිහිට වුවන් නොතකනා එකා<br>කුමට වැදුවාද උගේ මවී නොඉඳ නිකා |
| 481 | අතුරු මිතුරු දඹදිවතුරු එකට ඉදිල්ලා<br>උඩින් මිතුරු යටින් හතුරු අත ඇරපල්ලා |
| 482 | ලෙවෙක් වෙන්න පොත්වල කොල කඩාපිය<br>ක්ලාස් ගන්න ජෙල හොදහැටි කරාපිය<br>එක්සැම් එකෙන් ඒ.බී ගොඩදමාපිය<br>ලෙඩෙක් ඩොටෙක් වී මිනිසුන් මරාපිය |
| 483 | කොටියා සිංහයා වලසා රවා පනි<br>මිනිසා උගේ රුදු බව ලෝකයා දනි<br>මිනිසා සිනාසි කරුණා දයාවෙනි<br>හද සහ කැවුතු අමු අමුවේ කඩා කති |
| 484 | කවියක් ලියන්නම් මතු සැම දැන ගන්න<br>ලස්සන කෙල්ලො ඇත අප සැම බිලි ගන්න<br>උන්ගේ ගොඩට වදනට රුවටී මන්ද<br>බාඳුරා මලට ගිය බිගුවකු නොම වන්න |
| 485 | ඇතිවී වෙනස් වී නැති වන බව ඇත්ත<br>එය දැන ගැනිම අප හැමකල යුත්ත<br>කොතරම්සිතුවමුත් බැලුවත් පිට පැත්ත<br>යම් කිසි දිනක සිදුවනවා විය යුත්ත |
| 486 | ළබැඳි මිතුරන් හදවතින් නිරතුරුවම රහස්<br>ගිවිසුමකට බැඳි සිටි<br>අවංක මිතුරන් පිවිතයට ඖෂධයකි |
| 487 | හැඩියාවක් ඇතැයි සලකා මේ දිය දම<br>කිරුලක් ලබා සරසවියට අසම සම<br>ඔළුවක් ඇතත් හිතුවට හරි වැරදි කිම<br>නොසරුප් ලියනු කිම සරසවි මවගෙ ලැම |
| 488 | ගන්නට සිතා සිටියත් දිග ඉහල අතු<br>ඇත්නම් පෙර පිනක් තුටුවෙයි පැතුම සිතු<br>කළ පව් නිසා ගිලිහුන හොත් ඉහල අතු<br>ලද හැටියකට සැනසුමමයි මෙයින් මතු |
| 489 | වානේ පන්නරය ලබන්නේ ගින්දරෙනි<br>එහෙත් වානේ මෙන් ශක්තිමත් වීමටත්<br>සැපතේදි ගින්දර මෙන් උණුසුම් නොවීමටත්<br>මිනිස් සිත පන්නරය ලබන්නේ අත්දැකිමෙනි |
| 490 | මරණය සොයා වෙන් වුනඅය අපට කලිං<br>අතපත් කරන්නට තොරතුරු සුවද මලින්<br>ආපසු නොආවෝ එහි ගිය පරිදි මුලින්<br>තොරතුරු සොයා යමු මරණයේ දොරටු තුළින් |
| 491 | සුදුසරමක් ඇන්දා කියා සිසු ලේ පිස දැමිය හැකිද?<br>බුලත් විටක් කැවාකියා සිංහල කම රැකිය හැකිද?<br>මඩ පහරක් ගැසුවා කියා චින්තන ගොඩ නැඟිය හැකිද?<br>තුවක්කුවක් ගත්තා කියා සිසු හඩයට ගැසිය හැකිද? |

| | |
|---|---|
| 492 | මැත කඩුවලට සි ඩි ලැබෙන විට<br>කොස් සයින් උඩ පනිමින් ඇදෙන විට<br>හිච්චිමට ආසා ඇනගන්න විට<br>කැම්පස් මොකට ආවාදැයි සිතුනි මට |
| 493 | සිංහල බි සි හොදහැටි උණුකරලා<br>ඉකොන් ලොජික් දෙක එකට වත්කරලා<br>අමබානකට තුන්වසරක් ජපකරලා<br>කැමපස් ආවේ එලිවෙනතුරු නිදිමරලා |
| 494 | අහඹු වු අනුගැටුමක<br>ප්‍රතිඵලයක් වුනි අප ජිවය<br>නැත එහි දෛවයක්<br>ශාප කරමි මා වේදනා හදින්<br>අධෝ රක්ත කිරණවලට<br>ඇයි නිර්මාණය කළේ<br>ඔක්සිකාරක වායුගෝලය |
| 495 | නැත ලොවේ අන් රසඳුනා<br>පුමතිරිලිඟුදෙක විනා |
| 496 | දිනක අප මියයාවි<br>පිරිවැය වක්‍රයක හිරවි |
| 497 | බුද්දියේ හිස ගසා<br>වැමැරු මන්තර<br>එකින් එක පෙළ ගසා<br>ගහුවා මං<br>කලාස් එකක් |
| 498 | විහාගේ අත ළඟ<br>අත පොත ළඟ<br>පොත හිත ළඟ<br>හිත ඇය ළඟ<br>විහාගේ ඇ ළඟ |
| 499 | දෙව්ලොවකැයි සිතා<br>ආ නමුත් මේ බිමට<br>අපායක සිරි ඇත්තේ<br>දෙව්ලොවකි මට මේක |
| 500 | අපේ දුක<br>ලොවින් වසන් කිරීමට<br>බැඳී පවුර හන්තානයයි<br>අපේ දුක<br>ලොවට හඩගා කියමින්<br>ගලනා නදිය<br>මහවැලියයි |
| 501 | සිනහව කඳුල පරදා රජයන මෙබිම<br>කඳුලක් නැගෙන්නට නොමදී ගෙනම<br>දහසක් පැතුම් වෙනුවෙන් දුක් පැරදීම<br>මේ බිම එදා මෙන් පවතී හැමදාම |
| 502 | කිරිල්ලියක් වාගේ මව්පිය අතරින්<br>ඉගිල්ලිලා ආවට සරසවී එතෙරින්<br>ගොඩවී යන්න වෙහෙසෙන හැටියට කතරින්<br>සුවයක් ලබනු බැහැ කිසිවකුටත් මෙතනින් |
| 503 | සරසවිය වනාහි කටුක රළු දුක් ගෙනෙනා<br>උණ්ඩ හද පසා යන -අවමන්ද දෝර ගලනා<br>මරණයද සැඟව ඇවිදින -වියතුන්ට උරුම කළ<br>එළිමහන් සිරගෙයයි<br>මිලේච්ජයන්ගේ බිලි පුදට ගොදුරු සොයන අඩවියයි |

| | |
|---|---|
| 504 | අවසානයයි<br>සිව් වසරක යුද්ධය<br>නමුත්<br>සුදු පරවියා නම් රැකියාව<br>අහලකවත් නැත |
| 505 | සටන් , අරගල, වර්ජන,නිබන්ධන<br>පෙළපාලි, පිකටිං, උද්ඝෝෂණ, දේශන<br>පත අට එකට සිඳගෙන<br>සීනි මී පැණි දමා වළඳනු |
| 506 | නරියා හු කියයි ඩිග්‍රිය ඌට නැත<br>එළුවට රැවුල ඇත වාසිටි ආවෙ නැත<br>මේ දෙක අපට ඇත එනමුදු දැනුම නැත<br>සහතික මිසක් ඩිග්‍රිය නම් වැඩක් නැත |
| 507 | කටු පිරුණු සරසවියෙ සිසාරා හමා එන<br>කරදිය මුසු පවන සිහිලසක් නොවේමය<br>රිදවනා දහසකුත් පැන සරින්<br>කඳුළු නොහෙලා අපේ නෙත්වල<br>දුකින් හිරිතව හදින් ඉතිරෙන<br>සුසුම් කැටිවල එකතුවයි |
| 508 | දිසාපාමොක් ඇදුරිඳුනි<br>ඔබ කෙරෙහි කෝපයෙන්<br>මා මෙය ලියනුයේ<br>ඔබ ශිල්පයේ අනුහසින්<br>සිප් සතර පරතෙරට<br>පැමිනියෙමි පසු වු දිනෙක<br>එද පටන් මම<br>සහතික පොදි බැදන්<br>රට වටේ සැරිසැරුවෙමි<br>රැකියාවක් සොයා<br>සහතික පොදියගෙන<br>තොප ඉදිරියේ දවා අළු කරමි<br>දිසාපාමොක් ඇදුර<br>තොපට ඒ දේ |
| 509 | සාමා අමර අමතක කර හෝඩි<br>පොතේ<br>මහ පොත් ඇතුළෙ සිර කෙරුවා<br>අනාගතේ<br>සය වසරකුත් දැන් ඉක්මවා ගොස්<br>ඇත්තේ<br>මේකෙන් වැඩක් වෙන පාටක් නම්<br>නැත්තේ |
| 510 | නොහඩන් සරසවිය සලමින් කඳුළු කැට<br>වැඩ නැත මොලේ ඇති වුන්ගෙන් ඔවුන් හට<br>විරැකියාව අවසන් කොට දැනෙන හෙට<br>රැකියාවක් ලබා ආවෙමි සිපිරි ගෙට |
| 511 | විභාගයේ මහා මේරු පර්වතයෙන් පහලට<br>පැන<br>කටු පඳුරක මල් නෙලන්න සරසවියට අප<br>ආදින<br>ගෙවා ගන්න පින් නැත මහා පවක් උනා අප<br>කල පින<br>සිහිනෙන් පමණකි යන්නේ අනාගතය වෙත පිය<br>මැන (1-ඒ) |
| 512 | අවසන් දෙදින අප අද සරසවිය<br>තුළ<br>බලමින් සතුටු වෙමි මතු දින ලබන<br>ඵල<br>වෙන්ව් යන්න අතරින් හෙට මිතුරු<br>කැළ<br>කෙලෙසක සිතනවද සිහිවෙයි ගැසුව<br>වල |

| | |
|---|---|
| 513 | අසිරිමත් ලෙස ඇසුව එද මොළ කැටි<br>වියේ<br>අසිරියක් නොදුටුවෙමි දැවෙන මේ<br>නගරයේ<br>සිහිනයක් සොඳුරු වු නොදුටුකුවුත් මේ<br>රැයේ<br>සිහිනයකි උපාධිය මේ සිහින<br>නගරයේ |
| 514 | පෙර කාලේ කරපු අකුසල්වල<br>අපලා<br>මෙමකාලේ විදිමු කැම්පස් එකට<br>වෙලා<br>මට බාලේ පටන් පුරුදුයි බොරු<br>කරලා<br>එමු රාලේ ගොසින් ජේපර් එක<br>ලියලා |
| 515 | ලෙක්චර්ස් යනවා -හොස්ටල් එනවා<br>බෙල් එක වැදුනම -නිදි මත යනවා<br>පහළට එනවා<br>බතා බලනවා<br>බතාගෙ පරිප්පුව-කව්පිය වෙනවා<br>කව්පි ජලාසේ අපි පිනනවා<br>වේළුණු පානා දියේ ගිලෙනවා<br>බතා උඹත් මතු නිවන් දකිනවා |
| 516 | හිෂණය ලඟම ඇත<br>දේශනය ඉවර නැත<br>භාෂණය කවර සෙත<br>සාසනය සාසනය |
| 517 | සොම්නස පිරි බලාපොරොත්තුවකි<br>සරසවිය<br>දොම්නස සමග අවතැන් වන කතරකි<br>සරසවිය<br>ජිවිතයෙ තවත් එක් නොලැබූ පාර්ථනයකි<br>සරසවිය<br>පැමිණි උන් සිනාසෙන ගියාවුන් තැවෙන බිමකි<br>සරසවිය |
| 518 | සිව් වසරක් ගෙවු කාලය නිමාවිය<br>සිනාසිම ඔරොප්විම අලුත්ය<br>මාසයකින් අවසානය විභාගය<br>ගෙදර යමන් මගෙ හොඳ පුත උපාධිය |
| 519 | කැපස් තේරුනේ පෙර පව් කළ හන්ද<br>තට්ටය පැදුනේ එහි සැර වැඩි හින්ද<br>නිවනක් හිතට කවද ඒව්ද මන්ද<br>අන්නන්ට එපා පිරිස් මම වැන්ද |
| 520 | සරසවි ගොස් බැලුවෝ<br>ඇදුරන් අදහස්<br>නොබෙනෙයි අන්නවයි<br>ගලැකළ තද්ල<br>ඇත්තන්සේ |
| 521 | නලින් විකාරය<br>පිරිස් දුමාරය<br>ජේ බි සිරාමය<br>අහෝ වී සි භයංකාරය |
| 522 | විභාගය වනාහි<br>නිසක ු මරා උපදවන<br>මහත් වු පාප කර්මයකි |

| | |
|---|---|
| 523 | විභාග භයින් වෙව්ලා<br>සටහන අතට ගත් විට<br>නිදිමත දැනුනි මා හට<br>මා හිස මේසය මතහෙලිය<br>නිදිමත<br>නමුදු නැවත මා<br>හිස එසවිය<br>විභාග භීතිය විසින් |
| 524 | එච් එස් සී විභාගයං ච<br>සම්මානෝ අතිදුර්ලභංච<br>රැකියා විරහිතං දුක්ඛං<br>බී ඒ ඩිග්රී මහාභයං |
| 525 | සිහින දකින අපි නොදකින දෙයක් තමා   එම් එස් සි<br>නෙලාගන්න බැරිඅත්තක පිපුන මලක්   බී එස් සි<br>දෙලොව මැද අතරමං ව අපි ලිව්වා<br>එච් එස් සි<br>අමාරුවෙන් ලබාගත්තු දෙයක් තමයි   එස් එස් සි |
| 526 | විභාගය ලගයි මම ලයිබ්‍රරි   ආවා<br>වැඩවර්ජනය දිගටම යනබව   පෙනුනා<br>කාලගුණේ අද මරු බව මට   දැනුනා<br>විභාගය කොහෙද කොක්ට තුරුළු   වුනා |
| 527 | විභාගය   කරුමය<br>පාඩම් කරනු   බැරිමය<br>එය නොවේ   අරුමය<br>ක්‍රම දැම්මත් ඇනෙන එකමය. |
| 528 | මදුරුපිරිස හැමතැනම   දැවටෙනවා<br>නෝට්පොදිය අත්තල මත වැලපෙනවා<br>නිදිමත දැනි නොදැනිම නෙතු පියවෙනවා<br>ඩිග්‍රිය ලැබෙනතුරු මේ දුක පලදෙනවා |
| 529 | අහෝ සක් දෙව්   රජින්ද<br>දිග වේට්ටියක්   ඇන්ද<br>විනිවිද පෙනෙන   හින්ද<br>යටින් කොට කලිසමක් ඇන්ද |
| 530 | අවසන් දෙදින අපි අද සරසවිය   තුල<br>බලමින් සතුටු වෙමි මතුදින ලබන   ඵල<br>වෙන්වි යන්න අතරින් හෙට මිතුරු   කැල<br>කෙලෙසක සිතනවද සිහිවෙයි ගැසුව වල |
| 531 | හඳුනා ගනිමු බැඳුනෙමුසෙනෙහසින්   අපි<br>මුමුනා ගතිමු කිවෙමු ගිතුටින්   අපි<br>උයා ගතිමු කෑවෙමු රස කරන්   අපි<br>වෙන් වී නොයමු දිවියෙන් තොර වුවත්   අපි |
| 532 | **නොකී ප්‍රේමය**<br>පුංචිම පුංචි කැබලි එකතු කර<br>ගේ තුළ තැනූ<br>විශාල එළිය කුසුම<br>කඩා බිඳ දමන්නත් බැරි<br>එළියට ගන්නත් බැරි |
| 533 | අසම්මත ප්‍රේමය<br>සමාන ආරෝපිත<br>චුම්බක දෙකක්<br>ලංකරන්න ලංකරන්න<br>ඈත් වෙනවා |
| 534 | ඇටෝනි<br>හිතේ තියෙන දේ<br>ලියා ගන්න බැරි<br>කැමති කුමක් දැයි<br>සිතාගන්න බැරි<br>ට්‍රයි කෙරුවොතින්<br>දා ගන්නට හැකි<br>දා ගත්තොත්<br>හොඳ හැටි වැඩ ඇති<br>අහංකාර<br>හැඩනැති බඩුව<br>ඇටෝනි |
| 535 | අද රාත්‍රියේ මම<br>ඔබ වෙත එන්නෙමි<br>කිසිවකුට එය<br>නොපෙනෙනු ඇත<br>කිසිවෙකු එය ගැන<br>නො අසනු ඇත<br>දොර හැර තබන්න<br>අමතක නොකරන්න |
| 536 | දුරකථනය<br>ඉදලා හිටලා<br>මගේ කනට<br>සුවය ගෙනෙන<br>යන්තරයයි<br>හිස රුදාවට<br>ඇස්ප්‍රින් දෙන |
| 537 | දුකේදී හැඩුවෙමු<br>සතුටෙදී සිනාසුනෙමි<br>එකිනෙකා වැලද ගතිමු<br>සොයුරු පෙමින්<br>මහමෙරක් පැරයු අපි<br>සරසවිය වෙන් කලත්<br>නැවත භවයක උපදිමු<br>අපි<br>එකම මව් කුස සොයුරන්<br>ලෙසින් |
| 538 | කැන්ටින් තේ එක<br>අද හරිම රස්නෙයි<br>කොප්පෙට උනත් දැනෙනවා<br>අඩුව නැති එකේ<br>පාඩුව |
| 539 | උඹ අපට ඉගැන්වුයේ මාක්ස් ගැන<br>අපි උඹට කියලා දුන්නේ<br>මල්වලට පිණිවැටෙන හැටි |
| 540 | අපබිත්ති වලින් ලැබු ආදරය<br>ඔබට කම්බි වැටෙන් ලැබෙනවා |
| 541 | කම්බි වැටකට වලාකාලිය හැකිද<br>අපට<br>තිමිර පට ඉරා එන<br>පුරුෂ ලිංගයක් සේ<br>අප ඔබව සොයාඑන්නෙමු |
| 542 | වළාකුළු පලාගෙන<br>ඇපලෝව ඇදෙනකොට<br>අමතකයි මට<br>පෙති දෙකක් සොයාගන්න<br>මම විදපු දුක |

| | |
|---|---|
| 543 | රතුතොල් සිඹින<br>පෙති ගිලින<br>වැහිකබා ඇඳගෙන<br>අහසේම හමුවෙන<br>අනේ පව්<br>අසම්මත ප්‍රේමය |
| 544 | අපිත් එක්ක හදට<br>වෙඩි තියන්න එන්න |
| 545 | අතට  ගෙන ලැබූ අධ්‍යාපනය<br>තබලා මල් වැටෙට ඉහලින්<br>වෙරළු මල් සුවඳකට ඉවකර<br>අපිත් යමු සයිබිරියාවෙන් |
| 546 | "අමාවක වුනත්<br>මෙහි කොහේ හරි<br>හඳ පායලා තිබුණොත්<br>ඒ ඇති" |
| 547 | අයියෝ මේ නම් කාගේ දෝසා<br>අලයන්ගේ මුදු වදනේ දෝසා<br>අයියෝ මියා කැවයි පුසා<br>ඕග්‍රිය මොකටද නොමැතිව පුසා |
| 548 | අනේ බුදුහාමුදුරුවනේ<br>මලක් පහනක් තියා<br>කවියක්වත් ලියන්නේ කොහොමද<br>සමර වගේ නොවෙයි<br>රබර් ජේන්ටි<br>හරි ගණන් |
| 549 | මට කියලා හිටපු එකම<br>බඩුව<br>අපේ සර් දා ගත්තා |
| 550 | සිගන්නෙක් තුන්මුල්ලෙදි සිගමන් යදියේ<br>පිහිටක් නැතිව මා වෙත හැරුනයි හදියේ<br>යමක් ලැබේදැයි ඔහු තුල සැක ඇතියේ<br>රටක් ඇතත් අනාථයෙකි මා සරසවියේ |
| 551 | සාර්ථකව ප්‍රේමයෙන් ජය ගැනිමට නම්<br>ප්‍රේම නොකර ඉන්න |
| 552 | සිහිනෙන් පවා මගේ සුබවිහරණය පැතූ<br>අම්මා දනීනම් මේ සරසවියේ තතු<br>වර බොල කොළුවෝ යයි දෙනෙතින් කඳුළු යුතු<br>ගෙන ගොස් බොහෝ කල් මේ දුක් විඳින පුතු |
| 553 | මලක් පිපෙනැයි සිතෙන තැනක<br>ඇති කටුව ගලවා<br>එතැන<br>මලක් සිටවූ අයෙකු ලෙස<br>මා සමුගන්නා දිනෙක<br>මා ගැන සඳහන් කරනවා නම්<br>මා ඉතා කැමතිය |
| 554 | කුරුලැ වුවන කෙටි වරලස උඩ නැගුන<br>නොවැඩුන දෙතන උල් රට බොඩියෙන් වැසුනු<br>හිනි කොටු දෙකකුල් යන එන ගමන<br>දුටුවේය මිහිපිට ඇති සරසවි හොල්මන |
| 555 | අවුරුද්ධ ආවා නේද<br>ඒත් අපට කවදා අවුරුදු එයිද<br>පාර තොටේ බඩු මලු කරපින්නා ගෙන<br>දෙනෝ දාහක් යන දෙස<br>බලා සිටින්නද මේ කාළ කන්නි<br>අවුරුද්ද  එන්නේ |

| | |
|---|---|
| 556 | මා මිය ගියත් මේ දෙරණේ අසම සම<br>රතු මල් පිජේවා පොහොරට රැගෙන ලැම<br>ලෝකය පිටු දකින දිනයක දිළිඳුකම<br>නැගිටීම් ආත්මය සමගින් එදින මම |
| 557 | අවසන් මාස තුන අපි සරසවිය තුළ<br>බලමින් සතුටු වෙමි මතුදින ලබන ඵල<br>වෙන්වී යන්න පෙර සමගින් මිතුරු කැළ<br>සිහාවෙයි එදා අප එකතුව ගැසුව වල |
| 558 | එළිය හඳුනන<br>රෑ කුරුල්ලනි<br>ඵල නෙලා ගන්නට<br>උදැසනක වරෙල්ලා |
| 559 | විසල් තුරු අතු පතර වියනින්<br>සඳුගේ මුදු රැස් නොලද මේ<br>බිම් කඩ<br>අන්ධකාරයේ ගිලී වැලපෙන<br>නිසල තණ පත් තිරුවේ<br>සොදුරු සඳු වෙත සාප නොකරමි<br>තිමිර පට හැර කිරණ ලන්නට<br>තුරු වියන සිඳ දමාපන් |
| 560 | මෙහෙට පායන සඳ<br>මහ විසල් මැදුරු වලට<br>සඳඑතල වලටත්<br>පායලා ඇත්නම් |
| 561 | ඔබ මට ආදරය කරන කළ<br>ඔබට මා ආදරය කලේ නැත<br>මා අද ඔබට ආදරය කරමි<br>ඒත් අද<br>ඔබ මට ආදරේ නැත |
| 562 | දුරාතිතේ අපේ බුල්කං<br>ආවර්ජනං කරතං<br>කාලෝ ඝට්ටනෝ චිත්තං<br>අනාගත බිය වඩ්ඩති |
| 563 | සොදුරු වූ පැතුම් මැද තනි වේවී මාවතේ<br>පැතුම් බිඳ නුවන් යුග නුඹ වෙතට යා වෙතේ<br>මානයෙන් වැට බැන්ද ලොකයා අහිමන්<br>හමුවෙමුද අපි නිතර හදවතින් හිතුමතේ |
| 564 | පින් නුඹ ලබන්නට පෙර කල මදිවුවා<br>තුන් යාමයේ නුඹ සිහිනෙන් නොපෙනේවා<br>දැන් සමුගනිමි දෙනුවන් කඳුලින් නහවා<br>මං නැති ලොවක නුඹ සතුටින් හිනැහේවා |
| 565 | රොඩු කුණු ගසාගෙන<br>මහමුහුදට යාවි<br>කෙදිනක නමුදු හොඳ<br>රතුමල් පිදේවි |
| 566 | පිහිටක් නොමැත ඇත්තේ මහපොළ පිහිටයි<br>සරණක් නොමැත ඇත්තේ නුඹගේ සරණයි<br>සෙවනක් නොමැත ඇත්තේ ගස්යට සෙවණයි<br>සැපක් කොහිද දුකනම් නිරතුරු උරුමයි |
| 567 | ඔබ ගොඩනැගූ සියල්ල<br>බිඳවැටුණු කල<br>සුන්බුන් එකතුකර<br>යලිගොඩනැගිය හැකිනම්<br>ඔබ<br>සැබෑ විප්ලව වාදියෙකු වනු ඇතත |
| 568 | සරසවි ඇවිත් සති දහයක් ගෙවිල ගියා<br>වන පොත් කරන්නට ඇත බොහෝ දේ ඉතිරි<br>වෙලා<br>වැසිදිය රැගෙන යයි සිහිනය දෙගොඩතලා |

| | |
|---|---|
| 569 | දිවා රෑ ඔබේ නම රැව්දිදී ඇතසිතේ<br>එදත් මම ආදරෙයි<br>අදත් මම ආදරෙයි<br>හෙටත් මම ආදරෙයි<br>මැරෙන තුරුආදරෙයි |
| 570 | සඳට පැතු නියාවෙන් තරුද හිමි නොවුනි මට<br>මලම පැහැ නියාවෙන් තුරුද හිමි නොවුණිටි<br>මට<br>ගගම පැතු නියාවෙන් සයුර හිමි නොවුණි මට<br>නුඹම පැතු නියාවෙන් හිමි නොවුණි කෙනෙකු<br>මට |
| 571 | වේදනාවෙන් වේදනාවට<br>පීඩාවෙන් පීඩාවට<br>අසරණ බවින් අසරණ බවට<br>මොහොතින් මොහොත<br>අප පන්වන විට<br>ඉන් මිදෙනු වස්<br>අප යන ගමන<br>රිද්මයානුකූලව වැයෙන<br>ගීතයක් නොව<br>සුළං පහරට එරෙහි<br>නිම්නාද වන<br>ඒක ස්වරයකි |
| 572 | මිනිසුනේ<br>අහපල්ලා<br>නුඹලාට ජිවිතයක්<br>ලැබිලා තියෙන්නේ<br>එක එකාට වහල් වෙලා<br>ජිවත් වෙන්න<br>නෙවෙයි<br>දුක සැප බෙදාගෙන<br>එකට ජිවත් වෙන්න |
| 573 | කුසට සාගිනි හදට සෝගිනි ඉහට වැරහැලි<br>කැබලි එල්ලා<br>සතුට සොම්නස අහිමි කරවු අදුරු දිගුකාලය<br>ගිහිල්ලා<br>නෙසිට මැරි මැරි සතුටු පායට වකුටු වී<br>අතපය හකුල්ලා<br>නැගිට පල්ලා උඹලගේ වාරය ඇවිල්ලා |
| 574 | ජිවිතේ බොහෝ දුරයි<br>අරජේන දුර ඇත<br>නෙත් කෙවෙනි බොඳ කරයි<br>කෙසේ නම් නවතිම්ද හතිවැටී<br>දෙතින් ගත් නුඹේ සෙනෙහස<br>පවන් සලනවා<br>සත්තකයි |
| 575 | සීතම සීත රාත්‍රියක<br>සඳටත් අමතක<br>තනි තරුවකි<br>මම |
| 576 | ජිවිතය තුල<br>හැඩුවෙමු සිනාසුනෙමු<br>නමුත්<br>ධෛර්‍යය කර ගතිමු<br>එවන් ගමනක සොඳුරුතම<br>නවාතැන් හමු විය<br>සැබැවින්ම මෙය<br>සොඳුරුතම නවාතැනකි |

| | |
|---|---|
| 577 | අඳුර පැමිණි විටදී<br>සුපුරුදු පරිදි ගෙවී යන<br>දිනය<br>අදට සමුදී නොයන<br>විඩාබර මගේ සිත<br>සමු නොදී වැලපෙන්නේ<br>මගේ ප්‍රාණය අදයි<br>කෙසේ එය හැරයම්ද |
| 578 | මැවුනේ නුඹේ රුවයි<br>දිවා රැයේ<br>කල් යැවුයේ වැඩිපුර<br>දොඩමළු වෙන්නටයි<br>මගේ අම්මේ<br>සිත හැඩුවේ නුඹ<br>විදිනා දුක සිහිවීලා<br>නමුත්<br>කාසිය සිරවුණි<br>දු .ක . යන්තරේ<br>සිහිනය බිදිමින් |
| 579 | ප්‍රේමය නම්<br>අසෙනිය කුසුමක් වේ<br>රිසිවූ කෙනෙකුට<br>පුජාකරනට<br>ලෝභ සිතින් තොර<br>පිදුව මනා වේ<br>පෙරලා ලබන්නට<br>නොසිතා බිදකුදත් |
| 580 | සසර මග කොහේ හෝ<br>නුඹ මගෙම වී<br>සිටියද<br>එන කාටත් මා දවන<br>මහ ගින්න<br>නුඹ මටම දුන්නද |
| 581 | කටු කොහොලින් පිරි මගක<br>යන අපට<br>රතුපලස් කුමටද<br>වෙන වෙනම පතුල් පැලිලා ගියාද<br>සත්කඩව<br>ඉදිරියට ඇදෙමු<br>ඔව්<br>අපි එක්ට |
| 582 | විරහ කඳුලක් නෙරා ගෙන විත්<br>හදේ සැනසුම නැති කලා<br>අනේ රුපියල නුඹේ හිගකම<br>සිරා ලව් එක නැතිකලා |
| 583 | දුම්රියකදි හමු වූ ඔබ<br>දුම්රියේදිම මගෙන් වෙන්වූ<br>අපුරුව<br>කොහොම හිතන්නද<br>උඩරට මැණිකේ<br>මේ ජිවිතයට කල<br>සරදමක තරම |

| | |
|---|---|
| 584 | අහස උසින් තනා ගත්ත<br>මහමන්දිර ගිලිහෙන විට<br>පොලොවට ඇද වැටෙන්න පෙර<br>මම ආවා මහ පොලොවට<br>උඩ නගිද්දි බලා උන්න<br>අම්මා ලය දරා ගන්න<br>පරණ පුරුදු මහ පොලොවම<br>අදත් ඉදි පුරුදු ලෙසම<br>ඉතින් සමාවී අවසර<br>මෙතැන මගේ තැන තනන්න |
| 585 | නින්දට ණයවී<br>වණ පොත් කල දෑ<br>සුදු පාට කඩදාසියක වමාරන<br>පැය දෙක තුනක කාලය<br>විභාගයයි |
| 586 | සුදු සිත හිමට වී<br>ඉසිඹුලන පියාපත්<br>උණුහුමත දවටමින්<br>විදාපන් කුරුල්ලනි<br>තුඩග ලූ බිජු අහුර<br>ගම් නියම් ගම් සිසාරා<br>පුරන් වූ කෙත් යලිත්<br>අස්විදින් වපුරන්න<br>තෙරපෙනා පොලෝ කුස<br>සුවඳ මල් පුබුදන්න<br>ඔන්න කාලයක් ඇවිත් |
| 587 | උඩ ඉඳ ලේ බිව්ව බිහිසුනු මදුරුවන්ට<br>යට ඉඳ ලේ බිව්ව ගොරහැඩි මකුනන්ට<br>අද සිදුවේය වෙන කෙකු වෙත යන්නට<br>මම සමුගනිමි ආයෙත් මෙහි නොම එන්ට |
| 588 | වල්මත් වුනුදාට අපි සැම කොලොම්පුරේ<br>හොස්ටල් එකට එනවාමයි හෙමින් සැරේ<br>රස්නෙයි දාඩියයි දුවිලි යටින් පෙරේ<br>ජය වෙයි කෙලවලට දමසකම නගමු හුරේ |
| 589 | සරසවියට වෙලා ගෙවු පසුගිය අවුරුද්ද<br>කීදවසක් මගේ බඩ වේලෙන්නට ඇත්ද<br>දැනෙන විදියට හෙට දිත් මට කුසයුද්ධ<br>අම්මා දුන්න බත්පත සිහි නොම වෙද්ද |
| 590 | සිත ගිනි නැගෙන විට මව්පියො මතක් වෙලා<br>දෑසට නැගෙන කඳුලැලි යන විටදි ගලා<br>නිරතුරු දකින මගෙ සිහිනය සැබෑවෙලා<br>යන්නට හැකිවේද කවදා out වෙලා |
| 591 | බස්වල ගනන් තවතව වැඩි වෙන්න එපා<br>කැන්ටිමෙ කෑම වල මිල වැඩි වෙන්න එපා<br>ජීවිත සටන සැමදා පරදින්න එපා<br>සෙමෙස්තරේ මේ සැරේ ඇණ වෙන්න එපා |
| 592 | බඩගිනි වෙලා මා ගිය කල කැන්ටිමට<br>පානුයි පරිප්පුයි දුන්නයි විස්සකට<br>කම්දෝ නොකම්දෝ කියලා සිතුනි මට<br>මෙහෙමද යකෝ කන්නට දෙන්නේ අපිට |
| 593 | ඉවසනා දනා රුපු යුධයට ජයකොඩිය<br>මේ කිව් එකාගේ කට කැවත් මදිය<br>ඇත්තන් හට එකා නොව බඩු හත අටය<br>මට බඩුවක් නොමැත මම දැන් කොට උඩය |
| 594 | පානුයි පරිප්පුයි දවසක බුදුවේවා<br>ලුණුයි පොලුයි සැරියුත් මුගලන් වේවා<br>කැන්ටින් හොද්ද නේරංජන ගඟවේවා<br>කැන්ටින් මුදලාලි කන්ටක අසු වේවා |

| | |
|---|---|
| 595 | කොළඹ කෙටුවේ ඉස්ටේසන් තිබුණට<br>නුවර එලියෙ කානේෂන් පිපුනාට<br>ගෙදර බල්ලා ඇල්ටේෂන් වුවාට<br>රුවටෙනු එපා ඉමිටේෂන් කෙල්ලන්ට |
| 596 | අනේ මිණිවන්<br>ඔබේ දෙසුමන්<br>උසා දෙනුවන්<br>කරයි අඩවන් |
| 597 | ගහක් දෙකක් දැක්ක තැනදි නිතරම මම<br>බැලුවා<br>ශරීරෙ මගෙ ලොකු කරන්න ඖරුබෙහෙත්<br>බිව්වා<br>යොග කරලා රුව හදන්න නිතරම වෙර<br>දැරුවා<br>ගොඩ යන්නට තැනු විටදි යාළුවො මට<br>කෙලියා |
| 598 | කළුවර ඇතිදා ඇවිදින කොට මා දත්ටික<br>පමණයි බැබලෙන්නේ<br>social දවසේ හොඳටම බීගෙන හතර වටේ<br>දැම්මනේ වමනේ<br>වගුරක් ගහගෙන හෙම්හිට ඇණගෙන කාළය<br>ගෙවෙනව දුකින් අනේ<br>මකුළුව කිව්වම මුලු සරසියම හඳුනනවා මා<br>හොඳට අනේ |
| 599 | සේරු දෙකක බත් කොරහක් මගේ බඩට මදි<br>ගැහුවත් සිම්බල් කොපමණ මගේ හිතට මදි<br>පිලියන්දල නංගියාගේ වයස ටිකක් මදි<br>ටැප එකේදි රෙටි කන්නට ඉමරීංච යන් මදි |
| 600 | වෙන්නප්පුවේ සිට ආවේ කලු ඉම්ටි මට<br>මටත් වැඩිය වයස වැඩිය ඉතිං මොකද බං<br>පළමු වසරේ දෙන්නොක්නෙන් ඇනයක්නේ මං<br>ලබන නැවෙන් හොද කෙල්ලෙක් පාරයිද බං |
| 601 | හරියටමයි මට ගමක් නෑ බං ගෙමේ ඉඳලයි<br>කොළඹ ආවේ<br>පලමු වසරට ඇණ තුනක් බං මගේ කෙරුවෙට<br>උරුම මුවේ<br>අලුත් බේත් එක ආපු දා සිට පරණ බඩු<br>අමතක වුයේ<br>ජයියා මං සැලය එක්කන් නිතර හවසට කුඩු<br>වුයේ |
| 602 | කාගෙන් වුණත් වැඩ ගැනිම කලාවකි<br>දුන්දේ වුණත් ගන්නට වෙන වෙලාවකි<br>නගරේ වුණත් ඇවිදින්නට විදියකි<br>පන්සල වුණත් හරියට එය කැලාවකි |
| 603 | ප්‍රිතියි දුකයි අසලා එය මට මිතුර<br>මිතුරී මෙමට ඇය නම් වේ දිවිකතර<br>නොකලා නම් එදා ඔබෙ බදගේ විවර<br>නොදනම් යොදන බව ප්‍රිති කර කවර |
| 604 | පහනක් නිවෙන්නේ තෙල් නැතිවූ දාට<br>අස්වනු ලැබෙන්නේ ආලය කල සිතට<br>සෙනෙහස ලැබෙන්නේ ආලය කල සිතට<br>ගැහැනිය කියන්නේ මායාවකි නිසැක |
| 605 | ලත් දේ නොලත් දේ අපමෙහි බොහෝ ඇත<br>සිත්සේ ගෙවුකාලය දැන් නිමා විය<br>උගත් සිතින් කාලය අපි ගෙවා ඇත<br>නුගත් අයට මෙහි ඒමට ඉඩක් නැත |

| | |
|---|---|
| 606 | පාරක් දුන්නොතින් මිතුරෙක් වරදකට<br>ඉවසාපන් ඒ පහර එක දවසකට<br>දවසක් ඒවි පෙන්වන්නට නුඹට<br>වරදද මී උරා තම වේවිද නුඹේ සැපට |
| 383 | මේ බිත්ති හතර<br>නවාතැන් පොලක් පමණි<br>සංසාර ගමන තුල<br>එක් ආත්මයක් බඳු<br>ආදරය කරමි මම<br>මේ පුංචි කුටියට<br>මක් නිසාද යත්<br>ජිවිතයට අලුත් දෙයක්<br>මේ කුඩා කාමරය<br>මට කියාදුන් බැවින් |
| 384 | ජිවිතේ ප්‍රශ්න ලොකයට<br>දෙන්න එපා<br>ලොකයත් සමග සිනාසෙන්න |
| 385 | සදා කාලික ආදරය ගැන විරහගි කියමින්<br>සයුර ඉකිබිඳ හැඬු මොහොතක වෙරල<br>සිප ගනිමින්<br>ඔබේ නලලත නළල දෙවා දෙතොල්<br>සිප ගනිමින්<br>ආදරේ රස රහස් මුමුන මින් සිරසා<br>පිරිමදිමින් |

| | |
|---|---|
| 386 | ඇත් වෙන්න ඔබ<br>මට නොපෙනෙන ලෙස<br>තරහක් නැ මට<br>ඇත් වුනත් ඔබ<br>කඳුළු උරුම වුනත්<br>මගේ මේ ඇස් දෙක<br>තවත් අඩනු බැහැ<br>නුඹ වෙනුවෙන් මට<br>සිනාවෙන්න මට<br>කියාදුන්න ඔබ<br>හඩා වැටෙන්නට<br>කඳුළු දුන්න නුඹ<br>එපා තවත් නම්<br>මසිත පෙලන්නට<br>යලිත් හඩනු බැහැ<br>අදමෙන් මතුවට |
| 387 | සම්බුදු බසින් තුන් හෙලයම අවදි කෙරූ<br>ජිවිතයක් ගෙවන ලද ගුණ සුවඳ පිරූ<br>නොසිතුව නියායෙන් වන් වසඟයට මරූ<br>ගංගොඩවිල සෝම හාමුදුරුවෙනි ගරූ |
| 388 | අනුදැන වදාරන පෙර තිලොව පියා<br>බෝසත් හැඟුම අද හදවත් අතර තියා<br>සමුගත් මහිම් සඳ සසරෙහි අනිස කියා<br>සැනසුම ලබත්වා ලොව්තුරු නිවන සොයා |
| 389 | විහඟ ගීතය<br>නිහඬ ඇයි<br>කියනු මැන කොඳුරා<br>නොපෙනෙනා දුර<br>ඈත කුටියක<br>සිරවෙලා<br>විහඟ ගීතය<br>නිහඬ සුසුමක<br>නැවතිලා.... |
| 390 | ආපසු යන්නට පාර කියනවද<br>දැන් සමු ගන්න ළඟයි<br>ආයෙත් දවසක අප හමුවන්නට<br>කල පිං මදිද සිතෙයි |
| 391 | මහ පොළව පෙමින් පුරවා<br>නිල් අහස කිරෙන් නහවා<br>දරුවන්ට ලොවක් කරවා<br>රජ කිරුළු නැතත්<br>උන් සිනා නැගුනදා.....<br>දුකින් මිදෙයි<br>අම්මා.... |
| 392 | අනන්ත ප්‍රේම ලෝකෙ<br>වියෝවක් නොවේවා |
| 393 | සම්මතය අසම්මතය වු<br>අසම්මත සමාජයකදී<br>සම්මතය දෝත දරා ගන්නා<br>අසම්මතයෙක් වෙයි |
| 394 | ජීවිතයේ තනි මංසල<br>අතරමංවෙලා<br>ඔබේ තුරුල්ලේ කාලය<br>අතීතයේ ගිලිහි ගිය<br>යලි වසන්ත<br>ආරාධනා ආරාධනා |

| | |
|---|---|
| 395 | අපි හිනාවුනා<br>අපි කතා කලා<br>අපි සැවොම එකතු වී හැඩුවා<br>මේ සොදුරු මොහෙතේදි හනැහෙන අපි<br>වේදනාත්මක මොහොතේදි හඩනවා<br>අපි ලංවෙලා කරන කියනදේ<br>අපිට ලස්සනයි<br>නමුත් යම් දිනෙක වේදනාවක් වෙන්නෙත්<br>අපගේ ලංවීමය<br>ඇයි අපට හිනාවෙන්න බැරි |
| 396 | සිත අතරමං වෙලා<br>සොදුරු ගිම්හානයේ<br>වැහි වලාකුලක් නෑ<br>පෙනෙන තෙක් මානයේ |
| 397 | Brothers are special<br>Becauce they Love cary and understand us<br>In a special way |
| 398 | නෙළුම් පතේ බත් වේලක් කවන්නට ඔයා<br>එන දවසක් දන්වල මට එවනවද ඔයා<br>නෙළුම් මලක් පූජ කරලා දඹුලුලෙන පුරා<br>සැරිසරමින් මම පැතුවා ඔබ මගෙම කියා |
| 399 | ඔබ ඈත සඳවී පායා<br>මම මෑත තරුවක පිපලා<br>මේ නිසල රැයේ ලොව හිදිනා<br>මා ඔබ ඔබ මා ළඟ උන්නා |
| 400 | සිහින දකින්න<br>නමුත් ,<br>අවදියෙන් සිටින්න<br>සිහිනය තුළම<br>කිඳා නොබසින්න |
| 401 | ජිවිතය මගේ<br>උගත්කම සොයන විට<br>වල් වැදි.....<br>ජිවිතය නුඹේ<br>ආදරය සෙවීයේ<br>වල් වැදි<br>මද වු නිසාද<br>ආදරය මගේ |
| 402 | You will never know<br>What you can do<br>Until you try |
| 403 | ජිවිතය වටහා ගැනිමට<br>ජිවිතය දෙසම බලනු මීස<br>රූ පහන් වන තුරා<br>පොත් පිටු අතර<br>මැරි මැරි ඉපදිම<br>කවර විලක්ද<br>විලක් ඇත<br>එය නිසියාකාර<br>කල යුතුය. |

| | |
|---|---|
| 404 | සඳ ගිනි ගෙන<br>වස්සානය වියැකි<br>ඉරි තැලුණු ජිවිතයට<br>යලිත් අරුතක් දී<br>දිවි මග පහන් කල<br>සදාදරණීය යෞවනය<br>සරසවිය නම් මංසලේ<br>තවත් එක වසරක අවසානය<br>යෞවනයට තවත් එක්<br>අත්දැකීමක් සමග<br>සමුගත්තෙමි නුඹෙන්<br>නොතැවෙන් කිසිදක<br>තවකෙකු නුඹ සොයා<br>පැමිණෙනු ඇත මා මෙන්ම |
| 405 | පොතට නොව<br>වෙනතක හිත<br>සැලෙන හදකට<br>කුමන ශිල්පද? |
| 406 | හීන පිපෙන රාත්‍රිය සුන්දරයි<br>මට අයිති නුඹ ලඟ<br>සෙනෙහසින් දැවෙටෙන<br>නෙතු පියන් ලෙන්ගතුයි<br>හැබැහින් විඳගන්න<br>ඔය ආදරේ<br>පිං මදියි මට සිතේ |
| 407 | Out of sight is Out of mind. |
| 408 | We can get nothing<br>Without loosing anything . |
| 409 | My weekness was you sweetnes. |
| 410 | වහිනදට ෂා නියමයි කියලා<br>බෙඩ්ෂිට් එක පොරව ගන්නවා<br>එකක් දෙකක් අයියෝ<br>පැච්චාට ගොයියෝ<br>මොකක්ද මේ සබරෙ අහනවා |
| 411 | ආදරය විශ්වාස නොකරන්න<br>විශ්වාසයට ආදරය කරන්න |
| 412 | සංසාරේ භවේ දුකා<br>සබරේට නම් එන්න එපා |
| 413 | **අපි**<br>ජිවිතේ දවසක හමුවුනා වගේ<br>වෙන්වෙලා යන දිනය ලංවුනාම<br>දුක පුරවගෙන හිත්වල<br>ඈත දුර යන්නැතුව<br>ඔබ... අප මතකයන් තුල සදාකාලිකයි<br>නම්.....<br>එයම නොවෙද අපි ලබපු<br>සෙනෙහේ සිත්වල අරුම පුදුම<br>සැනසිල්ල.....සතුට.....දිනුම.....<br>මිතුදම.... |
| 414 | මම පාඩම් කරමි<br>මගේ අරමුණ කරා<br>මම යමි. |
| 415 | පැතුම් පොදි බැදගත්<br>අපේ තුරුණු විය<br>ලස්සන හීන මවාගෙන<br>අපේම ලෝකවල ජිවත් වුණු..... අපි<br>නිදහස් කිරිල්ලියක් සේ පියමැන්නෙමු<br>සරසවිය වෙත<br>ඉතිං දැන් අපි<br>පොතට මුහුණ ඔබාගෙන<br>විභාගයටම ජිවිතය පූජා කර<br>වෙහෙසෙන්නෙමු<br>ඇත්තටම<br>ජිවිතය නුඹ පුදුමාකාරයි<br>හරියට විභාගයක් වගේ---- |
| 416 | ස්ථිර අධිෂ්ඨානයෙන්<br>නිරන්තර උත්සාහයෙන්<br>අවංක හදවත් ඇත්තෙමි<br>ප්‍රාර්ථනාවන් සුන්විය නොහැක |
| 417 | අවුරුද්දක් අකුරු කරපු<br>මගේ පුංචි අඩි හයේ රජදහක<br>අද ඉදන්<br>නුඹට බාරයි නංගියේ<br>තුන්තිස් පැයපුරා නිදා ගෙන<br>මම වගේ<br>පහක් දාගනිං |
| 418 | සිතට සිතෙන තුරු<br>ඔබට රිදෙන තුරු<br>සිබිමි ඔය දෙතොල්<br>මට ඇතිවන තුරු |
| 419 | සරසවිය ඔබ නම් කතරකි---<br>උපාධිය නම් මිරිගුව පසුපස<br>ලුහුබදිනා මුවපොව්වන් වන්නෙමු<br>අපි --- |
| 420 | පෙර කල පව් ගෙවමි<br>සබරගමු සිපිරි ගෙයි |
| 421 | වරම් ලබා නෙතු සිපගනු හැකි නම්<br>මා ලද සැනසුම නිමක් නැති |
| 422 | එකම එක පැතුමයි සිතා මා ඔබට<br>පෙම් කරමි මහදින්<br>සිනහ වැල් අමුණාඅමුණා<br>ගොතමි මා ගෙලෙහි  ආලයෙ දම්වැල<br>දනිමි මා<br>නුඹ මිරිගුව යැයි<br>නමුදු සොයමි නුඹව මා<br>සසර පුරාවට<br>ලයෙහි පිරි ඇති<br>නොඉඳුල් සෙනෙහස<br>මිරිගුව<br>නුඹට මාපුදමි |
| 423 | සිද්ධාර්ථ උනාට නුඹ<br>විලිරුදාව හැදුණු<br>රැක ----<br>දාලා ගියා නේද<br>මාව---- |
| 424 | අනේ අරුණ<br>ECO කරන<br>කිමද කරුන<br>අපිව මරණ |

# කැළණිය සරසවිය

| අංකය | ගීතය |
|---|---|
| 1 | ගුරුපාර පහුකරන්<br>කඩුළු ඉම පැනලා<br>සිප් කරන්නට කොලොම්පුර ආහැටි<br>සිහිනයක් වගෙයි මට මාත් එක්ක රංඩුවෙන<br>මගේ පුංචි මල්ලියේ....<br>නුබේ උණුවෙන සිතතරම්වත්<br>දයාබර හිතක් දකින්න නෑ මේ ඉමේ<br>කැකුල සිත් හිත් පෙලන හිත් මිසක්<br>ඉතින් මගේ සුදු අම්මේ<br>හැම දෙයක්ම සිහිවෙලා<br>නෙතු පොකුනු කලතනවා<br>හඬනු බැහැ ඒ හිතේ දුක නිවන්නට<br>බොහො අය ඒවි වාටුබස් කියාගෙන<br>මගේ හිත රවටන්න ඉතින් මගේ සුදු අම්මේ<br>එපා දුක්වෙන්න සිතා මා ගැන<br>අමතක නෑ මට තවම<br>ඉඩ ලැබුනු විගසින්ම<br>නුඹ වැලඳ හාදුවක් ගන්න<br>උණුසුමේ වැතිරෙන්න<br>එ චුටී දුව විලසින්ම<br>සත්තකයි එනවා හනික මම |
| 2 | පිවිතය නුඹ<br>සිතූ දේ එලෙස නොවන<br>පැතූ පැතුමන් ඉටු නොවන<br>මෙයමද සරසවිය<br>මා ලැබූ මිණි කිරුළ. |
| 3 | වසන්තය මලක් වි පෙති සලයි<br>පෙති සලයි නුඹ වටා දැවටේවි<br>මුදුලෙසින් රැකගන්න<br>වෙර ගනින් බොහෝ කල්<br>සොඳ ලෙසින්<br>එම නොව වටින්නේ<br>මලෙහි ඇති මල් සුවඳ. |
| 4 | ඉර හංගා වලාකුලකි<br>අහස ඔරවයි තරහින්<br>ගස් අතු අඹරවාගෙන<br>මද මරුත් සැඩවෙයි රළුවෙයි<br>ටියුෂන් ඇරියන නුතන විශාකාවන්<br>ඇවිද යති<br>පාර දිග<br>ඉවසිල්ලෙන් සෙමෙන්<br>පටු සාය ඉරේවිදො බියෙන්<br>උල් අඩි සෙරෙප්පු වැටෙවිදෝ<br>සැකයෙන්. |
| 5 | හන්තාන පිස එන<br>සුවඳ මඳනල<br>විතරක්ම නොවි<br>කන් බිහිරි කරවන<br>නලාහඬ මැද<br>දහඩියෙන් තෙත බරිත වන<br>සරසවි යෞවනයට<br>කඳුල සිනහ ගෙන එන<br>බිම් කඩට . |
| 6 | නිශ්මී එකේ යාල් දේවි පොත් කියවනවා<br>එ අතරේ මොන්ටිගෙ රුව හිතේ ඇදෙනවා<br>ෆෑන් එකේ මද සුළගට පිටු පෙරලෙනවා<br>පෙරලන පිට හොදයි කියා ඇය කියවනවා |
| 7 | පරතෙරක් නැති විසල් මනු ලොව<br>අහිමි කවි මිස නොවිද පුර සැප<br>නෙතක හසරැල් නගන සෝ ගී<br>යා ද අතහැර නෙතු පියන් සදහට<br>උතුම් බණ පද සිතට සම වැද<br>බෝ මළුව යට බවුන් වඩනා<br>මෙහෙනි ඔබ මුව ශාන්තයි මට<br>ගිනි සඳක් ලෙස පෙලන ගතසිත<br>නිවන සැනසුම කසාවත ඔබ<br>මළුව සිපලන වියළි බොපත්<br>හදට සොයුරනි අහිංසක ලෙස..... |
| 8 | දෙපයින් නැගි සිටින්නට වෙර දුන්නේ නුඹයි<br>කඳුල වෙනුවට සිනහව<br>කියාදුන්නේ නුඹයි<br>ජිවියේ ගැඹුරුතම<br>අරුත දුන්නෙත් ඔබයි<br>මා පුදන එකම දෙවි<br>මගේ තාත්තා නුඹයි ..... |
| 9 | වසන්තය ලෙස සිතට පැමිණ<br>දුරින් හිඳගෙන සුවඳ විහිදන<br>නෙලන්නට බැරි දුරක සුපිපුන<br>මලක් විය නුඹ රුවට දිදුලන |
| 10 | නිල ඉදුවර<br>පෑම කාල්මෙක්<br>බොඳවෙලා වැටුනේ<br>සිනා මල් පෙති<br>පිපුණ මුව අග<br>කළු වලා නැගුනේ<br>පහන් දැල්ලක<br>අළුවෙලා යන<br>සොඳුරුතම සිහිනේ<br>හින් හෙම්හිට<br>දෑස් බොඳ කර<br>යනු මෙනි දැනුනේ. |

| | |
|---|---|
| 11 | තරුවක් වෙන්න එපා මට<br>ඈත අහසේ<br>අඳුර මැද<br>මං<br>පුංචිම පුංචි බිම්මලක්<br>විතරයි<br>කෙතරම් දුරස් බවක්ද<br>අනේ ඔබ<br>තනිතරුවක් නොවි<br>දුර නැති<br>පිනි බිංදුවක් වුවානම්... |
| 12 | බත් ඇටවලට වැඩියෙන් ගල් අහුවෙනවා<br>පලා මැල්ලුමේ පණුවන් දඟලනවා<br>පරිප්පු හොද්දේ ඇට හොයලා පිනනවා<br>කැන්ටින් බත කද්දි අම්මා සිහිවෙනවා |
| 13 | ශේෂ වු වෘක්ෂයේ<br>නිලෙන් පිරි අතු අතර<br>වියපත්ව යන්නට පෙර<br>ගල් පරලු අහිබවා<br>දෙපාපොඩි ඔසවන්න<br>නිසල ගං දිය තුලින්<br>සැඟව ඇත බොහෝ දේ<br>දිනෙක<br>නුඹ ගෙන ගියත්<br>තුරුලතා ගැවසි ගත්<br>ක්ෂේම භූමිය කරා<br>දිරි ගනින් රැදෙන්නට<br>හොයා හිස්<br>අහස වෙත..... |
| 14 | පරස්පර විරොධි වු<br>ජිවිතය<br>ව්‍යුත්පන්නයෙන්<br>අභ්‍යාගම්‍ය වු<br>දිවියේ<br>ගම්‍ය<br>සදා<br>අමරණියයි. |
| 15 | මිතුරන් අතර මිනිසකු වන්නට හැකිනම්<br>දෙවියෙක් නුඹත් මේ ලෝකයට වේ උතුම්. |
| 16 | අහස් කුස නිහඩයි<br>ඔබ සේම<br>පරිසරය අඳුරුැයි<br>මම සේම<br>සඳඑළිය සිසිලස්<br>පෙරසේම. |
| 17 | සිහින නම්තෙර කඳුලු පිරුවට නුවන් දැහැනේ සැගවුනාදෙන්<br>සිතුම් අහුරක පැතුම් සුන්කල හැඩුම් කවියක් නොම උනාදෙන්<br>සවන් පත් මත ගොළු වුනාදෙන්<br>සදාකාලික අපේ මිතුදම හදේ ගැරැඹුරක ලියවුනාදෙන් |
| 18 | සරසවි දිවිය මෙහෙමද අපේ ගත වෙන්නේ<br>ඩෙංගු බරවා සහ අපි ඇඳයට ඉන්නේ<br>අල්මාරියද අපේ නිවහන වන්නේ<br>අපි වැඩකාරයෝ කවුරුත් නැහැ දන්නේ. |

| | |
|---|---|
| 19 | උඳුවප් සිතලට<br>ගුලිවෙන්න නම් හිතෙයි<br>විභාගය ළඟ නිසා<br>නිදියන්න නම් බයයි<br>පොරව ගෙන හිසේ සිට<br>ඉදගත්තේ නිදියන්න නොවේ නම්<br>කිමද මේ<br>ඔළුව හොලවන්නෙ<br>ගොනිබිල්ලකු මෙන්<br>නිදිමත නිදිමත පාඩමක් උගන්වනවද? |
| 20 | මහ ඉඩෝරයට<br>හසුව<br>කොලොම්තොට<br>පොලොව ගිණිගෙන<br>දැවෙන්නෙ<br>යම්සේද<br>මාසිතක් එසේමය<br>විභාගය<br>විභාගය. |
| 21 | රැන් රැන් ඉගිල එන දග සිතුවිලි<br>සේනාවෝ සිත් අහසේ කළබලෙන් ඒ මේ අත පියඹනවා<br>හීන් හීන් හඩක් නගා මොනවාදෝ ඉල්ලනවා<br>ඉල්ලු දේ නොලැබෙන විට කඳුළු සලා යැදෙනවා. |
| 22 | වසන්තයේ පිපුණ කුසුම් සියොතුන් හා හිනැහෙන විට<br>සිසිල් සුළඟ ගී ගයමින් තුරුපත් හා නැලවෙන විට<br>සදවත මත දුහුල් වලා තුරුළු වෙන්න දිවයන විට<br>මතකෙට හිම් නුඹේ මුහුණ මකා දමයි හනි හනිකට . |
| 23 | පිපෙන තෙක් මා උන්නත් - කටු අකුලේ රෝස කුසුම<br>නෙලා ගන්න මට ලැබුනේ - මල නොව විස කටු අත්ත. |
| 24 | විනාසවන්නට දෙයක් නුඹ<br>ඉපැද්දුවේද<br>අද ඔබ සතු දෙය<br>ඊයේ කවරකුගේ හෝ<br>විය හැකිය<br>මන්ද වෙනස්විම. |
| 25 | ජිවිතයේ මහ ගිරි දඹ<br>තරණයට<br>සෙවනැල්ලක්ව සිටිනා<br>මතකයයි<br>අඳුරුැ ජිවිතයේ<br>පහන් එලියවී<br>ආලොකයක්ව<br>ජිවිතයේ ගමන් මගට<br>පන්නරයක්ම විය<br>නුඹ මා හට<br>දයාබර<br>තනිකම |

| | |
|---|---|
| 26 | ළමාවිය<br>තුරුනුවිය<br>සතුට සොම්නස ආදරය<br>සියල්ල උකස් කොට<br>ලබාගත් සියල්ලෙන්<br>සැරසුනෙමි විභාගයට<br>Tute මිටි හිස තබා<br>පන්ති යමින් දුෂ්කර ක්‍රියාකොට<br>මුහුණ දුනි භාගයට<br>අවසාන විභාගය සමත් වීමි<br>ජයග්‍රහනයෙන් උදම්ව<br>ආපසු හැරී බැලුවෙමි<br>අවාසනාව<br>සියල්ල සින්න වී හමාරය. |
| 27 | පැනි මීරි සොයන<br>නෙක මල් සිඹින<br>රන් සමනලුන් යන<br>මගපිපෙන<br>අතු අග දිසිලෙන<br>මල් කැකුල නුඹ<br>නැත නැත<br>මල් සුවඳ නුඹ. |
| 28 | අල්ලට සිල්ප ගෙන<br>රොන්සුනු පිරුනු දිනේ<br>නුඹ මා ළග උන්නා<br>වල් කොළ අතුද නිගා<br>වැරහැලි ඇගළු දා<br>නුඹ මා ළග උන්නා<br>කල් ගිය සිහින මකා<br>වල් වැද මිලින උනත්<br>පෙම් සිත හැඩින ඇතත්<br>අපි අපි ළග ඉන්නා. |
| 29 | අනන්තය සිසාරා<br>දෙනෙත ගෙන ගිය විටෙක<br>බොඳව ගිය දෙනෙත් යුග පෙනෙයි<br>ගිම්හානයක<br>වසන්තය උගත නැත<br>විහග හඬ මෙතෙක් නද<br>කෙසේ කවදා ඒද<br>පතන ඒ සදෙව්ලොව . |
| 30 | සහොදරයෝ තාරෝ සහ මුරුද අයියා<br>කැන්ටිම කරන්නට ආයෙත් පැමිනිලා<br>ආයෙත් බඩට තද පාරක් වැදිලා<br>බඩ පණුවන්ට රජකරනට කාලය ඇවිල්ලා. |
| 31 | ඇත ඉමේ<br>තරු මඩලේ<br>සත් සමුදුරු වලින් එහා<br>ඇති නොලැබෙන දෙයම පතා<br>නිරන්තරේ බැඳෙන සිතට<br>සදාකල්හි නැත සැනසුම |

| | |
|---|---|
| 32 | ජිවිතයේ දුක් ගිතය<br>හඬ නගා කියන්නට<br>අත් වැලක් වු ආදරණිය<br>මැණියනි<br>හදවතින් හඬනා<br>ශෝක ගිතය<br>ඉකිබිදින හඬ අසන්නට<br>හදවතට තුරුළු වු පියාණෙනි<br>අ - ආ - යනු කියන්නට<br>ජිවිතයේ දුක සැප බෙරාගන්නට<br>අම්මා තාත්තා වෙහෙසෙනු සිහිව<br>සරසවි බිම අතරමං විමි<br>මම. |
| 33 | ජිවිත ගමනේ "අ" යනු<br>"ආ" යනු කියාදි<br>සෙනෙහසේ අස්වනු ලබාදුන්<br>ආදරණිය මව්නි<br>දැත් කරගැට වන තෙක්<br>අප වෙනුවෙන් දහදිය වැපුරු<br>ආදරණිය පියතුමණි<br>සිහිවන වාරයක් වාරයක් පාසා<br>සරසවි බිම හැරදා<br>ඔබ තුරුලට එන්න සිතුනු වාර<br>අනන්තය<br>එහෙත් කුමක් කරම්ද . |
| 34 | දං ඔිව්ටිය දෙවැට මතින්<br>අපි ආවා ලක්දිව හතර කොනින්<br>කාලය ගියා අපට නොදැනිම අපට හොරෙන්<br>බොරු කිය කියා පුටු රත් කල පෙර දවසක<br>සාරා තමයි අම්මා උනේ දුක සැප හමුවේ. |
| 35 | දහසකුත් පැතුම් පොදි බැඳන්<br>සුපුරුදු පරිසරයෙන් දුරස් වී<br>සතුට දුක හා පුංචි බියක්ද<br>මේ පුංචි හිත්වල තබාගෙන<br>පිය නැගුවෙමි සොඳුරු කලණ අසපුව වෙත. |
| 36 | මාගේ මිතුරියනි<br>ආවෙමි හමුවුනෙමි<br>සතුටු වුනෙමි වෙන්වෙනවද<br>ජිවිතය තුලම<br>ජිවිතයට දුකක් වන්නද<br>අද යන්න වුනද යන්නද<br>හෙට හමුවෙයිද නුඹ<br>නංගියේ අපි යන්නෙමු<br>ඔබව බලන්නට එන්නෙමු<br>එහෙත් නොමැත අවසර. |
| 37 | එක් සුන්දර දවසක<br>පිය නැගුවා කැලණි සරසවි අසපුවට<br>සිව් දෙසින් පැමිණි<br>ආදරණිය මිතුරියන් සමග<br>ගත කල ඒ අවසන් කාලය<br>කෙතරම් සුන්දරද. |

| | |
|---|---|
| 38 | ඉගිලෙන්නට කාක්කන්ට අයිතියක් ඇත<br>අහස උසින්<br>අහස අපේ නොවන හන්ද<br>එත් අපේ හිස මුදුනේ<br>කුඩු තනන්න<br>බිජු දමන්න<br>අයිතිය නැත කාක්කන්ට<br>ඔළුව තාම අපේ හන්ද |
| 39 | නොලද නොලැබෙන<br>සියළු සම්පත්<br>මතකයෙන් ඇතට මුදා හැර<br>ලැබෙන දේ ඒ ලෙසින්<br>පිලිගත් විටදි<br>නුඹයි<br>පරමවු තෘප්තිය |
| 40 | මගේ හදවත බිම වැටි ඇත<br>පාග පාගා නටාපන්<br>එයින් වැගිරෙන උණුම උණුලේ<br>ඇගේ තවරා නටාපන්<br>මගේ ළයෙහිම වැයෙන බෙර හඬ<br>තාලෙටම නුඹ නටාපන් |
| 41 | දේශන මොටද මතකයේ රදවන්න බැරි<br>සටහන් මොටද කියවා නිමවන්න බැරි<br>බුද්ධිය මොටද සිතනා දේ කරනු බැරි<br>ඩිග්රිය මොටද රැකියාවක් ගන්න බැරි |
| 42 | නිශ්චල වැඩක සිව්වසරක නිරත වෙලා<br>ආපසු යනවා අපි ගම්රටවල් සොයලා<br>බැහැ අදුරන්න ගම නගරය වෙනස් වෙලා<br>අරමුණු නොමැති මේ ගමනක නිරත වෙලා. |
| 43 | සබද මේ පෙර යමයි<br>නිසල උවද රාත්‍රියයි<br>ලහිරු රැස් නැගඒවි<br>සෙනෙහසින්<br>පැනසර කෙලින්නෙක්<br>නුවන් පෙත්<br>සිත් පහන් වෙයි<br>දල්වන්ට කාලයයි. |
| 44 | පාඩම් කරලම්<br>ඇතිවන තුරු<br>පොත් දිහා<br>නෙතු පියන්<br>විභාගයට ගිය<br>කළට<br>සියලු දේ<br>සිහිවෙයන්. |
| 45 | ජිවිතයට අගයක්<br>නැති තැන<br>මරණයට මිලක් තියෙන<br>මිනිස් දඩයක්කරුවන්<br>බිහි වුයේ ඒනිසාය. |
| 46 | කෝටු පිරුණු ජනේලය<br>හුදකලා පියන්පත්<br>ඉකිගසයි තුන්යමේ කාමරේ<br>නිඳිවරන පොත් අතර<br>වකුටු නිදන සිත<br>සැනසෙන්න මොහොතකට<br>දිගාවි. |
| 47 | සිත චංචලයි - බියකරුයි<br>වෙනස්වෙයි දුක්බරයි<br>මේ වෙනස කිමද<br>කියා ගන්න බැහැ දෙවියනි<br>ලියන්නට පුළුවන්නම් මේ වෙනස<br>බැහැ ලියන්නට මේ වෙනස<br>කිමද කියා<br>තේරෙන්නේ නැති කල . |
| 48 | දෑස නිදිබරයි වෙහෙස වැඩි හන්දා<br>ක්‍රැමෙන් දාන්නද Exam ළග හන්දා<br>දින ගෙවෙනවා නොදැනිම වැඩ වැඩි හන්දා<br>තව ටික දිනයි අපි යාළුවෝ ලග ඉන්නා |
| 49 | උදේ හිටන් වකුටු කොන්ද දිග ඇරපල්ලා<br>අතේ තිබෙන ෆයිල් කවර බිම දාපල්ලා<br>හිසේ තියෙන ඔක්කොම බර අහක දමල්ලා<br>ඇදේ ටිකක් හාන්සි වී විඩා හරිල්ලා. |
| 50 | තියාගන්න හිස පොඩ්ඩක් ඇඳක් අපට<br>නැද්දෝ<br>දුක බලන්න කෙනෙක් අපේ ලොවේ ඉපිද<br>නැද්දෝ<br>තෙල් ගාන්න හිස අතගා කෙනෙක් අපට<br>නැද්දෝ<br>හැමදා මම මේ විදිහට මෙහෙමම ගත<br>වෙයිදෝ . |
| 51 | උදේ හිටන් වකුටු කොන්ද දිග ඇරුමත්<br>නැත්තේ<br>පොත් බැලුමෙහි ඇස් රිදුමෙන් ගැලවීමක්<br>නැත්තේ<br>හිතේ තියෙන දුක් ගින්නට සිසිල බිදක්<br>නැත්තේ<br>හිතේ තියෙන කාන්සියට සැනසිමක්<br>නැත්තේ |
| 52 | ළංවෙන්නට මට සිතෙන<br>එත් ළංවෙන්න බැරි<br>දුර ඇත හිනහ වෙන<br>පුර පෝය අහස් කුස<br>එළිය කළ නුඹව දැක<br>පහන් වු මගේ සිත<br>බවුන් වඩවයි මෙලෙස<br>අතිතය සමග බැඳි<br>සොඳුරු වත්මනද මට<br>මැවී මැවී නැගේ යලි<br>දුක සිතුන හදවතට<br>කනක හෝ පැහැසරව<br>අහස් ගං තෙර මතින්<br>සිනහ පා එබෙන සඳ<br>හැමදාම මේ ලෙසම<br>මගේ මතක අවදි කරවයි. |
| 53 | තවම නොගැයුන තනුව වයමි<br>නොලියවුනු ගිතයක් ගයමි<br>මගේ මියැදෙන හදවතේ ගනිමි<br>නිසල අහසට සුසුම් පාරමී<br>සිනා සැගවී ඇත ගොසිනි<br>එත් සද සේ සිසිල ගෙනෙමි<br>මගේ හද රැඳි වේදනාවන්<br>කඳුළු දිය කර ගලා යවමි<br>සබඳ දුක් ගී තවම ගයමි<br>අසන්නට කිසිවකුද නොමැති<br>මගේ ලෝකය සුනුවිසුනු කර<br>අනන්තය වෙත පලා ගොසිනි . |

| | |
|---|---|
| 54 | මල් තියන්න හිතෙන පංසලක් දුටුවාම<br>දෑත එසවෙන්නේ භව හුරුවක්ද මන්ද<br>දෑස නොපෙනෙන දෙපා සොර දනෝ දුටුවාම<br>නිබඳ දත් දෙන්න හිත් දෙව්ද මන්ද. |
| 55 | දුක නිසා ඉකිබිදින දෑත අපේ සනසන<br>මුළු හිතට දැනෙන දුක හිතිලද මන්දා<br>කඳුළු දොතින් පිසින සිනාවෙන් මුව සිබින<br>කියන් සද මගෙන් වරදක් උනිද මන්දා. |
| 56 | සඳ ඉතින් නුඹට යන්න කියන්නේ කෙලෙසින්ද<br>දස දහස් වර හිතම වැලපෙයිද මංදා<br>සිත් කලත් සංසාරේ නොකල සිත මේ නොමද<br>ඒ දනන් දෙන්නේ මං විතරද මංදා |
| 57 | මව්පිය සෙනෙහසින් මිදි<br>අතිතයේ දිනකදි<br>පියඹා ලගාවු<br>මේ සංසාරයේ දි<br>ඔබෙන් ලද මිතුදම<br>සදා සොඳුරුයි<br>ඉතින් වසරක් ගෙවෙන<br>හෙට දින<br>ඔබෙන් මිදි සමුගන්න වෙයි. |
| 58 | හිනා මල් පෙත්තක<br>නුහුරු හැගුම් එකිනෙක ගෙන<br>ජේලියකට ගොතා ගත්ත<br>පුංචි පද අතරටය<br>සත්සර මුසු නාද රටා<br>වෙන පරදා මුසු කරන්න<br>මේ සෙනෙහස<br>හැර තනුවක්<br>මිහිපිට මට තියෙනවද. |
| 59 | කට පාඩම්<br>කට පාඩම්<br>ගී ගයන්න මුඛවාඩම්<br>අම්මේ මට දරා ගන්න බෑ<br>තරග බිමේ මට වෙහෙසයි<br>තව දුවන්න බෑ. |
| 60 | මොන කරුමයක්ද මේ පඩිසන් දෙන්නේ<br>කැම්පස් දමායන්න මගේ සිත දෙන්නේ. |

| | |
|---|---|
| 61 | නෙතු පලා එන කඳුළු වගුරන දරු සොවින් ඉකිබිඳින<br>සිතා පා එම කඳුළු පාකර සෙනෙහසම පොදිබඳින<br>මහා සාගර සිසිල අරගෙන උණුසුමට පණ පොවනා<br>සදා නමදිමි දෙපා පාමුල පුදා සුදුමල් පිපෙනා<br>සදා කාලික අරුත නුඹ වෙයි අඳි අඳුරම හඬනා<br>මහා පන්හිඳ කුරුටු ගෑ බැති සිලෝ ගීතය සෝබනා<br>පතා මහනක් නිවන සදහට හෙලා වනමල් පුදනා<br>බුදුන් නොදුටිමි භවේ මිනිසත් ගිය නුඹ මැයි ගැයෙනා<br>කවා රසමුසු පුතුනගේ කුසට සෙනෙහස පොවනා<br>මවා ලොකය කිරට දියකර සෙනෙහසට කවි කරනා<br>දයා දිය ගෙන දෙතොලට පෙරලන සිනා දුක් විදිනා<br>සදා කාලික බුදුන් වේ නුඹ මගේ ලොකය නිවනා . |
| 62 | නිරුදක කතරේ ගිනිදැල් අතරේ<br>ලස්සන ගමනක් අපි යනවා<br>සිතුම් පැතුම් පොදි බැදන් වලාවක්<br>අහසෙ ඈතට පාවෙනවා----<br>ඉමක් කොනක් නැති මේ භව කතරේ<br>කෙදිනක හෝ අපි වෙන් වෙනවා<br>යහ මඟ සොයමින් මගේ මිතුරිය<br>යන මගට ආසිරි ගෙනෙනවා. |
| 63 | ජිවිතයේ ලස්සනම දේවල් දරාගන්න<br>ඒ ලස්සනම දේවල සතුට සැනසුම<br>විඳගන්න හදවත<br>ඒත්<br>ඒ ලස්සනම දේ අහිමි උනාම<br>හඬන්නට වෙන්නෙ<br>ඇස් දෙකට . |
| 64 | ගෙවුන පෙරදින<br>ගෙවෙන අද දින<br>එළඹෙන හෙට දින<br>කෙසේ වේවිද<br>අනාගතය. |
| 65 | සෙවන ඇති ගසක් මුලට ගොස්<br>විඩාව සංසිදුවා ගන්නා තැනැත්තා<br>එම ගසෙහිම අත්තක්<br>කඩාදමන්නේ නම්<br>හෙතෙම මිත්‍ර ද්‍රෝහියෙකි<br>අධමයෙකි<br>මිත්‍ර ඝාතකයෙකි. |
| 66 | මිතු දමේ මල්පිපි<br>සෙවන ලෙස මගෙ හදේ<br>මා සමග අකුරු කළ<br>මගේ කළණ මිතුරියේ<br>ආසිරි සෙනෙහෙ මල්<br>හදපිරි සතුටින්<br>පුදනුයේ.... |

| | |
|---|---|
| 67 | ගිරිදුර්ග ජිවිතේ<br>ගෙවන්නට ඉසිඹුවක්<br>පැමිණියා පෙරදිනක<br>මේ පුංචි කැළණියට .....<br><br>මාපියන් ලග නොමැති<br>ජිවිතේ තනිකමට<br>අපිට අපි එක්වුවා<br>දයාබර මිතුරියේ .....<br><br>සිතබැදුනු මිතුදමට<br>කෙලිකවට සිනහවට<br>සත්තමයි දුර ගියා<br>මනෙත රැදි කදුළු බිදු ......<br><br>කුසගිණ දැනෙන මුත්<br>කෙලිකවට වදන් වැල්<br>එපා දුර හරින්නට<br>අපිට අපි සිටින තුරු.....<br><br>රැහැනක රැදි කළුළු බිදු<br>උඩු සුළගේ පාකරන්<br>සිනාසියන් සොයුරියේ<br>මේ අපේ වසන්තයයි...... |
| 68 | දහසක් නෙත්වලට<br>හොරෙන් බැදි සෙනෙහසින්<br>ඉතිරි තනි මතක පොද<br>පමණක්ම කර තියන්. |
| 69 | ඉකිගසා හඬන සිත<br>නුඹ දුකින් උදුරගෙන<br>පරවෙච්ච මල් රැදුන<br>මලසුනක තබන්නට<br>පුර පසක් අතවැනු<br>කවි පැතුම් අකුලාන<br>අඩසඳ ගුලිවෙලා<br>නුඹ නමින් සිතන්නට. |
| 70 | අද පුදුම දුකක් වින්දේ<br>කැම්පස් එනවා කියන්නේ<br>දුක්විදින්න පුරුදු වෙනවා<br>කියන එකටද<br>එහෙමත් නැතිනම් මැරෙන්න<br>පුරුදුවෙන එකටද |
| 71 | බඹර සෙනෙහස පතා ඇදි යන<br>වන මලේ<br>අවැසිද සුවහසක් ....<br>මදිද? එක් බඹරෙක්<br>නොදනිද ආයු අඩුබව<br>මල්පෙතිවල<br>දැන ගනුව<br>රැව නෙව<br>සුවඳ.....<br>බඹර පැතුම |
| 72 | වරද හැමදාමත්<br>කළයුත්තක් නොවේ<br>වරඳ අත් හල යුත්තේය<br>කවුරුන් වැරදි කළඳ<br>වටින්නේ වැරඳ හඳාගන්නා<br>පුද්ගලයාය. |
| 73 | තරහ ඇත්තවුන් මෙතින් පිරේවා<br>ගැටිම ඇත්තවුන් ගැටි නැතිවෙත්වා<br>බොරුව කියනවුන් සත්‍ය දකිත්වා<br>සියලු දෙනාටම සත්‍ය වඩත්වා |
| 74 | පාලුව හුදෙකලාව<br>මසිත වෙලාගත් මොහොතක<br>සිතු නුඹ ගැනයි මෙලෙස<br>තනි කරන බව මසිත<br>මීරිගුකි ජිවිතය<br>මායාව අතවනන<br>කවුරුවත් මට නොමැත<br>මා මිසක මගෙ සිතට |
| 75 | අපි සරසවි බිමට පිය නැගුවේ<br>කොතරම් බලාපොරොත්තු<br>පොදි බැදගෙනද<br>නමුත්<br>විඳින්නට ඇත්තේ<br>කොතරම් කටුක<br>අත්දැකිම්ද යයි<br>කනගාටුවක්<br>මසිත නැගේ..... |
| 76 | හෙට වැරදුනත්<br>ඊලග දවසේ හැදෙන්න<br>දවසින් දවස හැදි හැදි යන<br>මේජිවිත ගමන<br>බොහොම සුන්දරයි. |
| 77 | ගෙවි ගිය දේ ගැන<br>දුක්වෙලා පලක් නැහැ<br>කදුළු පිරුනු අතිතය ගැන<br>සිහිනොකර<br>පැහැබර හෙට දිනකට<br>සැරසෙන්න |
| 78 | කැලණි ආවේ දහමට ආස හන්දා<br>කැම්පස් ආවේ ඩිග්රිය ඕනැ හන්දා<br>picket කලේ අපගේ පොදුකම හන්දා<br>කදුළු ගැස් ගැහුවේ මොකටද මංදා |
| 79 | අතිතයේ එක් දවසක<br>දයාබර ඔබෙන් ලැබු<br>සෙනෙහසේ ආනන්දය<br>ඇතින් හමා එන<br>සුළං කෝඩයක දැවටිලා<br>බොහෝ දුරකට පාවෙලා ගිහිං<br>සිතින් නම් තනි වෙලා නෑ මං<br>නුඹේ සෙනෙහස සුවඳ<br>දැනෙනවා මට තවම. |
| 80 | මේ බිත්ති හතර<br>නවාතැන් පලක් පමණිය<br>සංසාර ගමන තුල<br>එක් ආත්මයක් බදු<br>ආදරය කරමි මම<br>මේ පුංචි කුටියට<br>මක්නිසාද යත්<br>ජිවිතයට අලුත් දෙයක්<br>මේ කුඩා කාමරය<br>මට කියා දුන් බැවින්. |

| | |
|---|---|
| 81 | මේ කැම්පස් ජිවිතයේ<br>එකම අරමුණ උපාධිය නොව<br>මේ විශ්වයේ ඇති දැනුම<br>සොයා යන්නයි<br>එහෙත් මෙම අධ්‍යයන<br>ක්‍රමයෙන් එය ලැබේ දැයි<br>ගැටළුවකි. |
| 82 | සිත් මල් යායේ<br>කොද කැකුළු විල්තෙරේ<br>ගෙවුනු සුන්දර නිමේෂක්<br>අතිතම මතකයන්ට එක්කර<br>සමුගෙන යන්න සිදුවෙයි<br>සුවඳ නුඹ ලගින්<br>අතිතයේ පැතුම් පරවි<br>සිනහ වසා හඬා වැටෙයි<br>නුඹ සිතින් හැර දමා<br>යන්නේ කෙලෙසකද<br>කියනු මැන<br>සිතින් දුක් වේදනා<br>නෙතින් දුක් කඳුළු බිඳ<br>මා කෙසේ දරන්නද<br>වසත් සමේ යොවුන් වියේ<br>නුඹට මවු වූ වග. |
| 83 | පුංචි කඳු ගැටය නැග<br>බලාපොරොත්තුතු සිතේ දරත් ආවෙමි<br>සියල් බාධක බිඳ දමා<br>කල්‍යාණී සරසවි මව්නි<br>ආවෙමි නුඹ තුරුලට<br>ඉතින් සිව් වසරක් රැදෙන්නට<br>දෙනු මැන මට අවසර |
| 84 | නිමල පැහැ මෘදු හදින් පැතු<br>සුදු පැහැ පැතුම්<br>පාට දේදුනු යටින්<br>ගිලි ගිය මුත් තදින්<br>කිම නොවුනි පැහපත්<br>හඬන්නද මා ඉතිං<br>අඳුරු පැහැ වළාකුළු<br>වසන්තය වෙනු<br>නුඹ නොවෙයි<br>බොඩිම සතර කොන<br>සිර ගතව<br>කල්ගතව<br>රාත්‍රියක<br>ගෙවුනු<br>තනිකම....... |
| 85 | ජිවිතයේ අලුත් පැතුමක් පොදිබැදන්<br>පිය නැගු මේ සරසවි බිමට<br>ලෙන්ගතුවන්නට සිතුවත්<br>අපට එරෙහිව<br>මිතුදම සදා එරෙහි වෙයි<br>බුරබුරා නැගෙන ගිනිදැල් සේ...... |
| 86 | කැකුළු මල් පෙල ගැසී<br>නුඹ වෙන්න<br>සඳ කුමරි තරුවරා<br>ළය සැනසී යන්න<br>වලාපෙල සේදිනා<br>කිරි සුදට බබලනා<br>අහුරු මීදුම ඉරා<br>රන් තාරකා විහිදන්න<br>විහග දුඩු පොඹයන<br>ගී සින්දු පවසන්න<br>බඹර තුඩු මත්වෙනා<br>මී බිංදු පුරවන්න<br>පිනි බිංදු සිපගන්න<br>සිසිල් සුලගක් වෙලා<br>මුළුඅහස පිසයන්න<br>දුක් කඳුළු වියළිලා<br>සිනාමල් පුදින්න<br>මුවින් මුව රැව්දෙනා<br>සුභපැතුම් ඉටුවන්න<br>නැවුම් සිතුවිලිවෙලා<br>සිතින්සිත පිබිදෙන්න<br>අලුත් දවසක්වෙලා<br>අපේ ලෝකයට එන්න. |
| 87 | ඉඩොරය ගලාවිත්<br>ඉරි අඳිද්දි වැව් පතුලක<br>ගෙබ්බන් .....<br>අහස් කුසහඬන හැටි බලාගෙන<br>හිනා වෙද්දිත් කලාවැව<br>කඳුළු පොරෝගෙන<br>රැක් අත්තන<br>මල් සුවඳ උරාගෙන හමන<br>මද නලින් සමවත්ව<br>කලාවැව බලාගෙන<br>අනිමිස ලොචනය කරන<br>අවුකන බුදුහිමි සඳිසිව<br>මම දැක<br>නෙතු පියන් රඳවාන<br>සමවත්ව සිටි බවත්<br>නුඹ දිගු හදවතින්<br>අබැටක් තරම්වත්<br>මතකයක් ඉතිරිනම්<br>පිං සිද්ධ වෙයි නුඹට. |
| 88 | දවසින් දවස දිරුවා<br>ඇග හොඳටම කෙට්ටු උනා<br>සැනසිමක් නැහැ තවමත්<br>මහත් වෙන්න බැරිම හැඩයි<br>හරි හරියට වැඩ කෙරුවා<br>ඩිග්රිය මහතට ගත්තට. |
| 89 | සේද සිහින සුදු දුන්හිද නුඹ<br>දුර සීත නුමුන කුල ගිරි හිස නුඹ<br>මූණ බලාගෙන මෙලෙස<br>ජාති ජාති යලි උපදින්නට |
| 90 | දැහැනක බැඳුණු නුඹ වෙත<br>සසර දිගු කරති<br>රැහැනක් වී බැඳුනාම<br>දසුනක් පමණක්ය<br>මම. |

| | |
|---|---|
| 91 | සහසක් පැතුම් දරා<br>පුදින්න වෙර අදින<br>නෙක විද මල් කැකුළු<br>පැමිණියා අසපුවට<br>බඹර කැල මත්වන්නට<br>නෙලා ගන්නට සිතන<br>තවකෙකුට ඉස්සරව<br>රඟති<br>මල්වෙලා<br>මල් කැකුළු සිපගන්න<br>අසරණයි සිතුන විට. |
| 92 | මා<br>සුලැගිල්ලෙන් ගෙන<br>ලක සිසාරා ඇවිදුවා<br>පොත පතෙහි දිමෙහි කිමෙහි<br>ගිජු කරවූ ඔබ පිය පද<br>මා නියත වියරනයක් ලදිමි<br>දැස්<br>අඳුරු පටලයෙන්<br>වැසි යන තෙක්ම<br>නිඳිවරා මා සඳ සෙවනැල්ලක් වූයේ<br>මෑණියෙනි නුඹයි<br>ඔබෙන් දිවි ලද නිසාම<br>ඔබ පුතු ලොව ගොඩනගා ගන්නට<br>දිරිදෙන දිවිදෙන<br>දියණියයි මම.... |
| 93 | හාද වී සොඳුරු හැගුමන්<br>කිව මිතුරු ගී අසමින්<br>සාර සිප් සොයා වෙහෙසින්<br>ශිල්ප කලාදෝ<br><br>තක්සලාවියන් නිමවී<br>මිතුරු සිත් සොචින් ගොළුවී<br>බාල කාලයක් නොකියාම සැගව ගියාදෝ<br><br>සොයුරියන් ලෙසින් බැඳි සිත<br>මුදාගෙන යන්නට බැරිවීම<br>බාලිකාවියන් සැවොම<br>කඳුළු සලයිදෝ |
| 94 | අනන්තයට යන පාර දිගේ<br>පුංචිම පුංචි නවාතැනක පිපුන<br>ලස්සනම ලස්සන මල් ටිකක්<br>එකතු වුනේ හරිම සුන්දර විදිහට<br>ඒත්<br>ඒ මල් මිටේ මල් ටික<br>ඉහිරිලා යන්න කාලය ඇවිත්<br>මහ ගොඩක් දුක තුරුළු කරගෙන<br>අපි වෙන්ව යමු ඉතින්. |
| 95 | කැරට්, අල, බෝංචි,බිත්තර<br>හිටරයෙන් තම්බලා කන මේ සොඳුරු<br>වසන්තයේ හෙට මල් පිපේවි<br>ලස්සනම ලස්සන. |
| 96 | ජීවිතයේ වස්සානය එළඹී ඇතත්<br>වසන්තය ඉක්ම ගොස්<br>වස්සානය නෙතු මානයේ රැඳෙයි<br>එත් මම වසන්තයට බිය වුනෙමි<br>කටුක සමාජයේ රුදුරු වගවලසුන්ට. |
| 97 | ඉපලක් උනත් නුඹ මට මහ බෝධියකි<br>වියනක් නැතත් ඔය හද ගැඹ දාගැබකි<br>මට පමනක්ම හිමි නොඉදුල් දාහයකි<br>ඔබ මගේ කසුන් පුදසුනමත බුදුරුවකි. |
| 98 | අද වලි දවසක් අපේ DH එකට<br>Lecture ගිය අපේ කෙවුටු සරා<br>මූණ රතු කරන් ආපහු ආවා<br>අලයෝ අපේ Lecture එකක් දාලා |
| 99 | අකාල සුසුමින් හද නද නොරිදා<br>මා ලග සිටි බව බිදකුදු නොසිතා<br>සැනසුම් සුසුමින් ඉසුරින් සැනහි හැමවර<br>හැමදා හිනැහෙන් ජය ලැබ දිවි මග . |
| 100 | පුරා වසරක් -සරසවි ගැඹ තුල<br>සැපසම්පත් අතරින් - දුකද උරුමව<br>සදාදර මිතුරියන්ගේ - අමිල සෙනෙහස<br>කිසිදා අමතක නොවේ මට. |
| 101 | රැග් සියක් එක ගෙවමින් සිටින විට<br>ආවා අපිට හොල්ලන්නට යන්න<br>උදේපාන්දර නැගිටලා අපි සැවොම<br>ලැස්ති වී ගිය ඔක්කොම පිම් එකට<br>team එකක් වශයෙන් යන්නට සිතුවත්<br>අපි කට්ටිය ගියේ වාරිය පොල යන්න<br>යන්න වුනේ set එක කුලියා පිටියේ<br>යැව්ව දෙන්න දෙන්නා කැටේ හොල්ලන්න<br>මායා බ්ලේඩ් තොක්ටෝ හා සැගියා<br>සියඹලි මඩුවා ගියේ පොල දෙසට<br>කොවුලි පොඩි පිනේ දිල් පොන්ටින්<br>දිබුලි මරුෂි ගියේ බස් හොල්ලන්න<br>අපි තාම විනොදෙන් කැට හොල්ලා<br>මුදල් එකතු කර ආපහු ආවා<br>ගෙවී ගියත් ඒ දිනය පසු වීලා<br>අමතක නොවේ බැනු ඇසුමෙන් කන් පිරිලා. |
| 102 | ජීවිතයේ එක්වූ<br>තීරණාත්මක කඩ ඉමක් පසු කොට<br>සුවහසක් පැතුමන්<br>හදගැබෙහි රදවාගෙන<br>දෙමාපිය ආශිර්වාදය මැද<br>ගැහෙන හදවතින් යුතුව<br>පා තැබූ මේ සරසවි බිමේ<br>හදවත බඳු වූ<br>බණ්ඩාරනායකය<br>සැබවින්ම සුන්දරය<br>දිවයිනේ නන් දෙසින් පැමිණි සොයුරියන්<br>නොබෝ දිනකින්<br>එකම මවකගේ සොයුරියක් ලෙස<br>දුක සතුට බිය රැදුන සැම විටම<br>සැම දෙන එක් විය.<br>සැබවින්ම මෙය අපේ නිවහනයි<br>රජ බොජුන් නැතත්<br>මා පියන් නැතත්<br>අප අපට පිලිසරණවන . |
| 103 | කාලය උදා වූ විට කාටත් කරදර ඇතිවෙනවා<br>දවස උනත් ඉද හිට වැඩ දෙල් වෙනවා<br>යන්නට සිතා සිටි දුර යන්නට බැරි වෙනවා<br>අද බැරි උනත් හෙට තව දවසක් එනවා |
| 104 | නිදිමත දැනේ දහවල මට රැයට වඩා<br>වෙනසක් එහි තිබේ චර්යා මාරු වෙලා<br>පාඩම් කල නිසා මනසත් අවුල් වෙලා<br>දෙවියනි අහනවද මගේ දුක කමා වෙලා. |

| | |
|---|---|
| 105 | කුසට සාගිනි හදට සෝගිනි ඉනට වැරහැලි<br>කැබලි එල්ලා<br>සතුට සැනසුම අහිමි කරලූ අදුර දිනූ කාලය<br>ගිහිල්ලා<br>නොසිට මැරි මැරි සතුරු පායට වකුටු වී<br>අතපය හකුල්ලා<br>නැගිටපල්ලා නැගිටපල්ලා නුඹේ වාරය<br>ඇවිල්ලා |
| 106 | පැමිණියා එක කැදැල්ලකට<br>තුරුළු උනේ එක මවකගේ<br>දරුවන් ලෙසින්<br>එත් කාලය පියඹලා ගිහින්<br>බණමෙන් සමුගන්න වෙයි හෙට<br>දුක් ගැහැට නම් අපමණයි<br>ජීත් කාලය සොඳුරුයි |
| 107 | යහළුවන් පිරී සිටි අපේ කාමරේ<br>අද කිසිවකුද නැත<br>තනිව ඇත මා පාළුවේ<br>තනිකමින් හුදකලාව<br>අදමා දවයි<br>ගත සිත. |
| 108 | වෙන සැප කුමකට නිදියන්නට හැකි වේ නම්<br>රස ගුණ කුමට ද ඇති පමණට ලැබේනව නම්<br>මැසිවිලි කුමට හොඳ ක්‍රමත් දා නවනම්<br>ඇණ මට කුමට මේතරමට කැප වේනම් |
| 109 | පැනට පොතට පෙම් කෙරුවේ එදා සිට<br>පෙම් කළ පවට එය උරුමයි සඳහටම<br>කුරුටු ගෑම කියවීමයි සඳහටම<br>සරසවි හැර මේ දුක වෙන කොහිද මට |
| 110 | සඳ ඇත සිනාසෙයි<br>දිගු කතාවක් කියා<br>තරු කැකුළු දිලිසෙයි<br>සිතට රහසක් කියා<br>සෙනෙහසින් ළං වෙලා<br>දෑත දෑතෙහි තියා<br>ඉන්නා නුඹ වගේ |
| 111 | රන්වැට මැද රනේ රුවට වැජඹෙනවා සාමි<br>සඳ එළියට රන් බෝපත් ලෙළදෙනවා සාමි<br>පුදසුන මත මල් පිපුනා අපට වරම් දෙන්න<br>සාමි<br>වැලි මළුවේ වැලි තරමට අපේ පැතුම්<br>බෝවේ |

| | |
|---|---|
| 112 | දයාබරවූ සෙවනින්<br>සමුගන්න අවසරයි<br>වෙන්වුවද අප<br>ආදරයෙන් ඇසුරු කළ<br>සහෝදරත්වය ජීවත් කළ<br>සැබෑම වූ සහෝදරත්වයෙන් මිදුනෙමු අප<br>හමුවේවිද අප නැවත මේ පුංචි විශ්වයේ<br>මතු දවසක<br>පුංචිම පුංචි ළදරුවන් සේ<br>එකට සිටියෙමු අපි<br>අතැගිලි බැඳපු සහෝදරත්වය<br>ඒ දයාබරත්වය<br>එකම මව්කුස නොයිපදුනමුත්<br>එකම බත් පත බෙදා ගනිමින්<br>අප සැබැවින්ම ජීවත් කල සහෝදරත්වය<br>නැවත මුණ නොගැහේවි<br>මගතොට හමු වුනොත්<br>එදිනට ළඟ තිබේවිද<br>අද අප හැඳිනූ දයාබරත්වය<br>කාලයේ ළඟ දිනක සමුගත්තාවූ<br>මෙවන් නිමේෂයක<br>හදේ දුක ළඟතියන්<br>අප අපේම දයාබරත්වය<br>සදා හදවත් තුල<br>රඳවා ගනිමු |
| 113 | විදුබිමට සමුදිලා ඔබ මතකය අරන්<br>තල් වැටෙන් හිරු එබෙන සරසවිය වෙත ආවා<br>දෙමාපිය සිත් නොරිද තුරුණු අප දෙසිත<br>සත් වසක ප්‍රේමයට අවසන් තිත තැබුවා<br>අහිමි වන මා ගැන ඔබේ සිතුම් දුක් දෙන්න<br>එපා කුමරුවනි නිබඳවම<br>කියා අවසන් දිනයේ<br>නෙතින් කඳුලැලි හැලුවා. |
| 114 | හෙටට පිපි මල්......<br>මං හසර දැනගත්තද<br>ගමනාන්තය නොදත්<br>නොනිමි අහසක සැඩ සුළං මැද<br>ඉමක් සොයා<br>සරණ විහඟක තටු සැලී.....<br>නමුදු<br>ගෙවා යන්නට තවත් සිය ගව්<br>වළාවෙන් විවරණ යදි......<br>පියාඹන්නට සරසරින් වරම් නොලද සියොත්<br>රල පෙල<br>මගට නෙතු දල්වා හිඳි....<br>පිදෙන්නට හෝ මියෙන්නට මිස නැවුම්<br>කැකුලක්ව යලි පිදෙන්නට මලක් යාච්ද කෙදින<br>නටුව අතහැර.... |

| | |
|---|---|
| 115 | පිපී නිල්නෙළුම<br>තනිවම......<br>ගඟ දිය නොදනී<br>තනිකම....<br>බලා පෙම් නොකර<br>දුර සිට.....<br>අනේ ! සඳ ඇවිත්<br>මං වෙතට....<br>තනිකම නිවා දමාපන්<br>විඩාබර පෙති මතින්<br>පහලට....<br>ගලා යන කඳුළු<br>පිණි කැට<br>අනේ ! තවදුරනු<br>බැහැ මට<br>සිහිනය නිමා වුනාදෙන්...... |
| 116 | නුඹ නැතිදා......<br>ඈත එපිට හේන පුරා<br>කුරහන් මල් පිපුණා<br>කුරහන් මල් යාය උඩින්<br>නුඹේ සුවඳ දැනුනා.....<br><br>තනිකම කවියක් වීලා<br>යාය පුරා ඇසුණා<br>නුඹේ මතක සිහිනෙන් විත්<br>නෙතු අද්දර රැඳුනා.....<br><br>සඳ නැතිදා රෑ අහසේ<br>සඳ සේ නුඹ නැගුණා<br>මල් නැතිදා වන ගොමුවේ<br>මල සේ නුඹ පිපුණා....<br><br>නුඹේ සුවඳ වැටට උඩින්<br>රෑ යාමේ දැනුණා<br>ඒ සුවඳින් සිත සැලුණා<br>සත්තයි මං හැඩුවා...... |
| 117 | **මානව අතෘප්තිය** .......<br>නිල් කැටේට<br>හෝ ගා ගලන<br>ගඟ හැඩුවා<br>තිබහයි කියා....! |
| 118 | **නොහඳුනන ඔබ....**<br>කැලණි පාලම ලගදි හමුවුනා<br>දයාබර යැයි හැගුන හදවත<br>කොතැනකද ඔබ සොයනු රිසිවෙමි<br>අඳුරු කළුවර සමග මුසුවුනු<br>අමුතු අඳුරකි එදා කළුවර<br>බැඳුණු මිතුදම නොමැත කෙළවර<br>නමුදු ඔබ මම නොහඳුනන කල<br>අරුම පුදුමයි නේද මිතුදම<br>එද වෙන්වී ගියත් ඔබේ ඒ හඬ<br>ඉඩක් ලැබුණොත් තවත් දවසක<br>කැලණි පාළම ළඟට එනවද? |
| 119 | මතු බුදුවන මව්වරුනි<br>මාවැනිම ගැබි දැරු<br>නුඹ විඳි විළිරුදා<br>මමද වින්දෙමි<br>හයමසක ගැබ උසුල<br>දරදියද ඇද්දෙමි<br>නුඹ නොවිඳි අපා දුක්<br>පරිභවද වින්දෙමි<br>සිඳී ගිය කිරකට<br>තොල් සලන පුතනුවනි<br>නුඹේ නෙත කඳුළු දැක<br>මැරී මැරී උපදිමි....<br>පලා ගිය කල්හිදි<br>උරුම කරු පිය පදවි<br>මතු බුදුවන මව්ම<br>වේද අවලම් ගැහැණී..... |
| 120 | අරුමය<br>හදේ හැගුම්වලින් නැහැවු<br>සසිලසක් වනේ රැඳවු<br>සරසවියට පය එසවු<br>ඒ සොඳුරු නිමේෂයේ<br>ගුරු දෙගුරුන් පොදි බැඳ<br>සොඳුරු පාරමිතා පෙරූ<br>අප රජ වන සැටි බලන්නට<br>මායිමේ ඔබ තවම සිටී -<br>පය ඔසවා තව ඉදිරියට<br>තල්වැටේ සිසිලසින්<br>බියගුලු හදවත් තුල<br>මිලින වූ ප්‍රාර්ථනා<br>නොබෝ දිනකින් ආපු ඒ<br>සොඳුරුතම නිමේෂයකින්<br>ජීවිතයම වෙනස්විය<br>ප්‍රාර්ථනා එක්ටැම්විය<br>කෙසේද මෙම ජීවිතය<br>අරුමයක් යැයි සිතේ මට. |
| 121 | ඔබ තුරුලේ හිඳ<br>චපල වදන් තෙපලන<br>මායාකාරී පෙම්වතිය<br>මටද ඉගිවරා<br>එලක් නොලද කල<br>දැලේ පැටලුණු<br>නුඹ ගැන<br>මගේ<br>ලබැඳි සකි සඳ<br>වාවනු නොහැකිමට.... |
| 122 | අපි හරක්ද ?<br>Lectures , Practical<br>Tute ගොඩ මල වදේ<br>උදේට රැයකට<br>නිදන්නටවත් කෙසේ<br><br>ගව රැලක් මතක් වෙයි උදයට<br>දි හේලි කරන<br>බොඩිමේ වමාරන<br>ආතල්ද Campus<br>ගමට ගොස් අසන විට<br>කෙසේ නම් කියන්නද<br>අපි සැවොම කන කට්ට. |

| | |
|---|---|
| 123 | **සිහිනය**<br>නිහඬවම මා<br>සෙවූ ඒ රුව<br>ලැබුණි දක්නට<br>මිරිඟුවක් ලෙස<br><br>අහෝ කෙලෙස මම<br>ලබන්නද එය<br>මගෙන් ඈතට<br>නොපෙනී යනකොට<br><br>සිතේ සැම විට<br>ළංව ඉන්නට<br>නමුත් කාලය<br>වලක්වයි එය<br><br>තවත් නොහැක මට<br>බලා ඉන්නට<br>කෙලෙස හෝ එම<br>වැළඳ ගන්නට. |
| 124 | නිල් තුරු ගොමු මල් වැල් මැද<br>සොඳුරු සිහින සිතේ වඩන<br>මේ සරසවි බිම නුඹේය<br>සතුටු කඳුළු මුහුව තැනුණ<br><br>නුඹ හිනැහෙන හෙටක් පතා<br>හදට දිරිය නිතින දෙමින<br>නගේ මලේ අපි ඉන්නෙමු<br>නුඹ පසුපස පුරුදු ලෙසින<br><br>නුඹ හැමමය අද සොයුරෝ<br>සරසවි මග සතුට විඳින<br>හෙට දිනයේ අත් වැල් බැඳ<br>ජයගත් ලොව නැණනුවණින.... |
| 125 | සිහිනය හා ඔබ<br>පුංචි තරු අතර දඟකරන සමනලිය<br>ඔබ.....<br>නිදි සුවය බිඳ දමන සිහිනයයි<br>ඔබ...<br>මතකයි තිබුණ පුරුකක දුරක් අතර<br>අප අතර....<br>තිබුනා සොඳුරු මතකයන් රැසක්<br>ඉතිරිව...<br>සුදු කොඩි මැදින් ගිය ද දුර ඈතක<br>ඔබ....<br>ඉතිරි වුණා සිතල උණු කඳුළු<br>මට....<br>ඈත අප අතර අනන්තයක දුරක්<br>අද.....<br>ගෙවී ගිය පසු මේ රැයත්<br>බොඳ වුණු තවත් සිහිනයකි. |

| | |
|---|---|
| 126 | සඳවතිය.....<br>සඳවතිය එපා එන්න<br>සරසන්න මගේ හද<br>නුඹ රැස් කිරණින්<br>ගණදුරු රැයට නොව<br>අරුණෝදයේ විකසිත වන<br>අරවින්දයකි ඈය<br>විලියෙන් ඔකද වූ<br>රිවි බලයි ඇගේ අරුම<br>එපා නුඹ යලි එන්න<br>මල හිරුත් සමග හෙට<br>සුන්දරව විකසිත ඇගේ මුතු වතකමල<br>මුකුලිත කරනට...... |
| 127 | **Campus නිදහස**<br>ලොකු පිම්මක් නේද<br>ඔව් පළවෙනි පාරනේ<br>ලොකුම ලොකු පිම්මක්<br>chemistry o Biology ද physics ද<br>නැහැ ඊටත් වඩා<br>බලාපොරොත්තුවේ සිහින මවාගෙන<br>ලිව්වා නොවෙයි ලියැවුණා<br>හරිම සතුටුයි එත් මාස තුනයි<br>result එනවලු හෙට<br>හිතට බයයි<br>නැහැ ඒ අදලු<br>ආවා.....B2.....C1.....<br>අනේ<br>මටම කියවුණා<br>මොනවා කරන්නද?<br>කම්මැලි කමේ ආපහු පොත්ගුල් අතර<br>බැහැ බැහැ මේ දුක ....<br>වාසනාව cut off mark'''''<br>කැලණියට.....ඔව්මයි හරි සතුටුයි<br>නිදහස ඔව් සැබෑ නිදහස<br>ඒත් නමට විතරයි<br>මම ආපහු පොත්ගුල් අතර<br>නිදිවරාන......<br>මේකද campus නිදහස<br>අප වල්මත්ව බුක්ති විඳින<br>එළිය අඳුරන<br>රෑ කුරුල්ලෙනි<br>උදෑසනකට වරෙල්ලා...... |
| 128 | හඬන්නට වරම් නැති මලක් හිනැහෙන කලට<br>බඹරිඳුට දැණුනෙ නෑ එමල උහුලන තරම<br>දරන්නට නොහැකි තැන විඳින්නට වූ ගැහැට<br>මලක් මිය ගිය වගයි ලොවට නොදැනි දුකට<br><br>පිපුණ මල් දස දෙසම සුවඳ පතුරන කලට<br>බඹරිඳුට දැනේවිද එක මලක් මැරුණු වග<br>සුමුදු පෙති මුකුලිතව විසිරිලා යන කලට<br>එකම කඳුලක්වත් හෙලාවිද මල නමට<br><br>නව කැකුළු විකසිතව වසන්තය එළඹිවිට<br>බඹරිඳුට සිහිවේද මගහැරුණු වසන්තය<br>මල්වරවූ මකරන්ද ඇරයුමක් කරනවිට<br>එන්නවත් හැකිවේද ඒ මලේ මලගමට<br><br>මල්වරවූ නව කුසුම් දැනගනීවිද දිනෙක<br>බඹරිඳුට පෙම් බැඳ මලක් මිය ඇදුන වග<br>ඒ මලේ උණුහුමින් මිදෙන්නට වත් පෙරම<br>බඹරිඳුට නව මලක පහස හිමි වූ පුවත. |

| | |
|---|---|
| 129 | පිය සෙනෙහස<br>පුජනියයි ,තේජනියයි<br>පියාණනි ඔබේ ආදරේ<br>හදේ ගිනි කන්දක් නිවාලයි<br>ඔබේ උතුම්කරුණා ගුණේ<br>මහ බඹුන් විසින්<br>මවා තබන ලද<br>උතුම්ම වස්තුව ඔබයි සිතේ<br>ආදර වදනින් මා සනසන්නට<br>ඔබ සිටියානම් කියා සිතේ..... |
| 130 | සඳ.<br>සද රැස් විසිරි නැහැවී<br>ගස් වැල් මනරම්<br>මුළු ලොව නිදියයි<br>නෑ පිබිදෙන්නේ<br>දැනුනේ නම් මේ සඳෙ අගේ<br>බලවන්ත මේ රාත්‍රියේ<br>නිසලයි නිහඬයි මේසද<br>නිහඬව නිසලව සිටියත් ඒ සඳ<br>දකියි බොහෝ දේ මැදියම සිදුවන<br>මිහිර නොවින්දත් සැමදෙන එක ලෙස<br>කිරණ බෙදා දෙයි ලොවටම එක ලෙස<br>සඳ හිමි අහසට<br>කිරණෙහි අයිතිය පමණයි පොළවට<br>හිමිවන්නේ<br>මිහිර විදින්නෙට සිමාවක් නැත ! දුරටයි එය<br>ලස්සන වන්නේ..... |
| 131 | පිළිගන්න ඉඩදෙන්න<br>ඔබටද මටද හමු නොවු යමක්.....<br>ඔබටද මටද එකවිට හමු වු විට....<br>ඔබද මමද එකවිටම තිගැස්සුනු බව<br>පිලිගන්නට ඔබ සුදානම්ද ?<br>අපිට අපි හමුවෙලා !!!<br>ඒ බව ගැස්සුනු මගේ හිත කියනවා<br>ඒ බව ඔබේ කතාකරන ඇස් කියනවා<br>ඒ ඇස් කථාකලාට ......<br>ඒ  බව හිතට කීවම.....<br>අමාවක සඳකට පුන්සදක් පායපු වග<br>ඉරි තලා ගිය වියලි පොලවට වැසි බිදු වැටුනු<br>වග<br>පිලිගන්නට,<br>සොදුරිය ඔබ සුදානම් නම්?.....<br>අසිමිත වු ලෙන්ගතු කම<br>කොන්දේසි විරහිත ස්නේහය<br>සේනාවක් බදු ආරක්ෂාව<br>පාරාදිසයක් බදු සතුට<br>සදාකාලික ආදරය,<br>ඔබට පුද දෙමි , සෙනෙහසින් ......<br>මගේ නිහඬබව....<br>ඔබේ කතාකරන ඇස් කොදුරන රහස,<br>අහන්නයි! |

| | |
|---|---|
| 132 | කොටු වෙලා ගිය මා ගත තෙමන්න<br>අනේ නුඹේ නෙත හැඩුතරම්<br>පමා වුණා මා මම පමා වුණා යයි<br>නුඹේ මුවින් ගිලිහුණ සුසුමන්<br>එහෙත් මගේ පණ සුරැකිව ඇති බව<br>දුටුව නුඹේ වතකමල මතින්<br>රිදි හුයෙන් කල විසිතුරු මැස්මක<br>සොබා මවන හසරැල් දුටුවෙමි......<br><br>අනේ මගේ ගත වසා සිටිය පත්<br>කොලපැහැයෙන් මඩ පැහැ වෙද්දි<br>මගේ හිසේ රැදි මගේ අතේ රැදි<br>මල්දම් එකිනෙක මැලවෙද්දි<br>උජාරුවට සුදු පිලි ඇදගෙන නුඹ<br>සුළඟ එක්ක හුරතල් වෙද්දි<br>නියං පොළොව මෙන් හිත ඉරිතැලුණා<br>මා මිය යන බව වැටහෙද්දි ....<br><br>ඔය තරමට නුඹ වියලුණු අරුමය<br>තාමත් මිතුරිය දන්නැ මං<br>දැන් ඔය පහුගිය දේවල් මොකටද<br>යලි දල්වමි නුඹ දුන් කදුලින්<br>මෙතුවක් කලකට අපට පෙලු ඉර<br>හෙටත් නැගෙනවිට නැගෙනහිරින්<br>මා හිස පිදෙන මලේ පැහැය ගෙන -<br>හැන්දෑ අහසේ රැදි ඉදින්..... |
| 133 | ඔබ නිහඬයි !ලොවම හඬයි !<br>දයාබර සොයුර.....!<br>ජිවිතය නැමැති කටු ඉත්තෙහි සුපිපි කුසුම<br>ඔබයි<br>ගනදුරු අහසේ පෑයු තාරකාව ඔබයි.<br>විදු බිමේ, මිතුදමේ පහන් දැල්වුයේ.....<br>නෙක වර ජිවිතයේ මුණගැසුනේ මෙලෙස<br>ජිවිතයට සමුදෙන්නද?<br>සබඳ......<br>නෙතට නැගෙනා කදුළු බිදු අමෝරා<br>වැස්සක් වී ඔබේ සොහොනේ ගලා ගියේ,<br>ඔබේ සොයුරු පෙම දරාගනු බැරිවම නොවේ....<br>ඔබ වැනි සුන්දර මිනිසකු මෙලොව කිසිම<br>දිනක<br>මා හට......<br>මුණ නොගැසෙන බැවිනි...... |
| 134 | **මං නැති දා----**<br>මං නැතිදා<br>මා නිදනා මිහිමත<br>දල්වනු මැන පහන් සිලක්<br>මතක මගේ බොදව ගියත්<br>දැසට නැගෙවි කදුලක්<br>මතකයන් සිත අද්දර මැවී<br>මා ඔබ අතගෙන තෙපලන වදන්<br>මතකයේ ඇදී<br>මේ මදනල පවසයි<br>මා ඔබට ආදරය කලවග------ |

| | |
|---|---|
| 135 | සිසිලසක් ලදත් ,සඳ කැණින් පුරත්......<br>සඳ දුරයි දනිමි අසරණයි මෙමා....<br>තරුකැලක් අතර දිලි සඳක් වුවත් නුඹ....<br>කුමක් කරම් ආදරෙයි සඳා---<br>ගඟන දසත සැරූ , පවන හමන යුරු---<br>සැසඳි හැගුම් ,නිසලව මෙදා---<br>පිළිතුරටත් අහිමි , දිය පොදක් නොලද මුත්<br>කතරක මොහොතක් නතරවෙලා----<br><br>මෘදු වලාගැබක සතපවා රකින්නට<br>වරම් නොමැත මා නොවෙමි මුලා---<br>නිල් දියෙන් සුසැදි මිරිගුවක් පමණි මැවූ<br>සිහින මිහිරි පෙම් ප්‍රාර්ථනා----<br><br>බැඳි යද දමින් උණු කඳුලි නිවා<br>දුක දරා හිඳිමි කල්පයක් පුරා-<br>මදහසත් අහිමි, නෙතු අගින් මෙලෙස තව<br>බැලුම් එපා නිති, හැඬෙන නිසා---- |
| 136 | වැහි පොද----<br>පුරහඳ සිහිල දැවටුන<br>සොඳුරු අහසද අතහැර<br>එසැනින් වැටෙයි වැහි පොද<br>නන්නාදුනමන පොළොවට---<br>ගංදැල දොඩමළුව හිඳ<br>සෙත් කවියක්ය අසනිය<br>කොඳ මල් කැකුළු පාවුන<br>නිල්දියවරක අසිරිය---<br>නිම් හිම්නොවූ සෙනෙහස<br>මල් සුවඳකට මුසුකර<br>නියඟක අරුම සිඳි බිඳ<br>තුරුහිස් නිලෙන් පුදින<br>වස්සානවෙන් සැනසුන<br>මිහිකත සිනා දැක දැක<br>සමුදුරු දියෙහි වැද<br>බලනු නිසලව මියෙන අරුමය---- |
| 137 | සුරා කමින් සුළු පිරිසක් විඳිති සැපා<br>වැඩි පිරිසකට එය මුත් එය දුකකි අපා<br>ඉල්ලුම් ඔබෙන් ඉල්ලීමක් වැලද දෙපා<br>වීරයෝ මිසක් නිකමුන් බිහිකරනු එපා |
| 138 | විකසිත මලට එයි බඹරුන් රොන්රොන් ගන්න<br>උන් දගලන්නේ මල තලලා රොන් ගන්න<br>මුකුලිත මලට යලි බෑ විකසිත<br>වන්න<br>මල දැන ගත යුතුයි විකසිත බව රැක<br>ගන්න |
| 139 | ලෙක්චර් ගියත් විභාග කිසි දිනක නැති<br>සතුටින් සැපින් නිදහසේ දුව පැනිය හැකි<br>සුරඟන ලොවකි මා සිතු සරසවියේ නිති<br>1 year එකත් දැන්නම් හොඳටෝම ඇති |
| 140 | සා. පෙළ උ.පෙළ නිසි දිනුවෝ සමතෙකි<br>එන්නට කලින් කැම්පස් එක සිහිනයකි<br>ඇතුලේ දුකකි පිටතට එක සුර ලොවකි<br>හොස්ටල් ජිවිතය දැන් නම් සිරගෙයකි |
| 141 | තෙල් බැම්මේ බැම් ලෙහිලා ගැලවියන්<br>කසා ගහේ කොල හැලිලා මැලවීයන්<br>සයිබාවේ නයි පොළගුන් බෝවීයන්<br>මට ඇණදුන් තෝ කණවැන්දුන් වීයන් |

| | |
|---|---|
| 142 | ටියුෂන් කඩේ පැදකුනු කොට උදේ හවා<br>A/L ගොඩගියා නිරතුරු ද ගිරවා<br>පෙරකරුමයක් පලදී මම මෙහි ආවා<br>මේ මළ මගුල ඇරියට වැඩියෙන් වැහුවා |
| 143 | නරියා හූ තියයි ඌ ලග ඩිග්රි නැති<br>එළුවට රැවුල ඇත වාසිටි අවේ නැති<br>මම ඒ දෙකම ඇති එනමුත් නුවන නැති<br>සහතික වලට මිස ඩිග්රිය පලක් නැති |
| 144 | පානුයි පරිප්පුයි මතුවට බුදු වේවා<br>ගෝවයි අලයි සැරියුත් මුගලන් වේවා<br>කැන්ටින් හොද්ද නේරංජන ගඟ වේවා<br>හිල්ටන් මුදලාලි කන්තක අසු වේවා |
| 145 | සංසාරේ පැතු පැතුමන් නිමා නොවෙනා<br>මෙතේ බුදුන් දැක නිවන් මඟට බසිනා<br>මගේ මවුන් ලෙස භවෙන් භවේ වඩිනා<br>අම්මා සදාදර ඔබයි මගෙ අම්මා |
| 146 | සඳවතියක් නොවී නම් මා නුඹ අහසේ<br>තරු කැකුලියන් වන කෙලෙසද සඳක් මිස<br>සුසුමක් නැගෙන මුදු නගමින් කඳුලු ඇස<br>තවමත් ඔබයි මට පෙනෙනා දුරු අහස. |
| 147 | කැම්පස් මොටද හොස්ටල් කැඳ බුදින්නට<br>සහතික කුමට ගිනිගත් කුස නිවන්නට<br>Lectures කුමට ලොක්කන් පය දොවන්නට<br>Digry ය කුමට pikating වල තපින්නට. |
| 148 | මල් පිපිච්ච පෙති හැලිච්<br>මිදුල පුරා පෙති ඉහිච්ච<br>හිගන්නට දුක හිතිච්ච<br>අතිතයකි ඇන තිබිච්ච. |
| 149 | ගැනු ළමයි පාරේ යන බස් වැනිය<br>එකක් මිස් උනොත් අනෙකේ යාහැකිය<br>පිරිමි ළමයි කොන් දොස්තරලා වැනිය<br>නග්ග ගන්න තුරු ආලය පන වැනිය. |
| 150 | කන්ද බලා දිරි නොබඳ ගනිවු<br>කඳුපාමුල සිට සුසුම් හෙලවු<br>අතිතයෙන් නැගි බලන විට<br>මුදුනෙන්මතුවන බැව් සලකවු |
| 151 | කැම්පස් ආවේ පුරුවේ කළ පව හන්දයි<br>වාටඩ් කලේ එපව තව වැඩි වෙන්නයි<br>දාඩිය දදා ලෙක්චර් ගියේ ඒ හින්දයි<br>මේ හැම කලේ අම්මේ ඔබ හන්දයි |
| 152 | කැම්පස් කැන්ටිමේ තොරතුරු රසබරය<br>සැමදා කන්නේ පලාව සහ පරිප්පුය<br>කුසගිනි නිවෙන්නේ මලකඩ වතුරෙන්ය<br>මෙහෙමයි ගෙවෙන්නේ සරසවි ජිවිතය |
| 153 | මී හරකුන් ලැඟ සිටි මේ බිම සුද්දකොට<br>හෙට මිනිසුන් ලෙස ඉන්නට සිසුන් හට<br>කරනා මෙහෙය ඉටු කොට දිවිපුදන්නට<br>සතුටකි උපාධිය මට හිමි නොවුනාට |
| 154 | එක අත්තකින් නියං ගඟ දෙතනේ කිරි බොම්මා<br>දසකඩ මස දුක් විදලා වැදුවේ අපේ අම්මා<br>සැකක් නැතුව බණ ඇසුවොත් සසරින්<br>ගොඩයම්මා<br>දුකක් නැතිව නිවන් දසන් පින්වත් අපේ අම්මා |

| | |
|---|---|
| 155 | අහපන් නංගියේ වදනෙහි නුඹලාට<br>විෂමයි ඉන්න මිනිසුන් මේ පොලව මත<br>අඟේ ඉඳන් කන කනවා නොදැනිම<br>මේ බව උගෙන කල් ගෙව්වත් අගනේය |
| 156 | අසංහිඳුන මැන මගේ සිත මා වෙත යැවී<br>වෙනස් වෙන්නෙපා නෙතු කැල්මකට මුවාවී<br>යෞවනයේ සොඳුරු පැතුම් මිලිනව යාවි<br>අවිහිංසක තරු නෙතු කඳුලින් බොඳ වේවී |
| 157 | කුරුළු වුවන කෙටි වරලස උඩ නැගුන<br>නොවැඩුනු දෙතන උල් රට බොඩියේ වැසුන<br>විසිවන කොටු දෙකකුල් යන එන ගමන<br>ඇසිපිය හෙලන පමනින් නොවෙති හොල්මන |
| 158 | කැම්පස් ජීවිතේ මට දැන් එපා වෙලා<br>යන්නට හිතෙනවා මට දැන් නිවස බලා<br>අම්මේ ඔබේ ඔය ආදර මුහුන බලා<br>ඉන්නද මම හැමදා ඔබ ළඟට වෙලා |
| 159 | සිනි බනිසකින් බඩගිනි නිවාගෙන<br>ඔළුවේ අමාරුව තනියම දරාගෙන<br>පාඩම් කලේ මම එකහිත දරාගෙන<br>අදට වඩා හෙට හොඳ යැයි හිතාගෙන. |
| 160 | අම්මා තාත්තා සිහියට නගාගෙන<br>කොපමණ පැමිණියත් දුක්ගිනි නිවාගෙන<br>තනියට නුඹේ මතකය සිත තියාගෙන<br>පාඩම් කලේ රැයම නිදි වරාගෙන |
| 161 | නොදැනිම ගෙවී ගිය කාලය බොහො කෙටී<br>සතුටින් සමගියෙන් හිනැහුනු කලේ කෙටී<br>ඩිග්රිය ගන්න කල වැයම බොහොම වැඩි<br>ගොඑ්ටිය අල්ලන්න යන කාලය ඊට වැඩි |
| 162 | මලක් සිරි වතක් මම සිඹින්නෙකි<br>මල මාහට පිනි කඳුලු හෙලන්නෙකි<br>මල් සුවඳ මලින් මට ලැබෙන්නෙකි<br>ඒ සුවඳ වෙන්දෙසි කරන්නෙකි |
| 163 | මිණි මිතුරු වනගුරු මිතුරු<br>පතන්නෙමි පිවිතුරු මිතුරු<br>පුරමි පාරමී නිරතුරු මිතුරු<br>වෙමි දිවි ඇති තුරු මිතුරු |
| 164 | සඳ එලියට කුමුදු කැකුලු පිපෙන විට<br>නුඹේ සුවදට මා හෙම්හිට ඇදෙන විට<br>මගේ හදවතට නුඹ ආදා පටන් සිට<br>සත්තයි දැනෙනවා සිසිලසක් අනේ මට |
| 165 | පාළු රැයේ කවි මල පිදෙන කලට<br>මා සිත දුවනවා නුඹ ඉන්නා දුරට<br>මටත් හොරෙන් සිතුවිලි නුඹ වෙත එන්ට<br>මෙලෙස අපගෙ සිත් බැදුනේ ඇයි කුමට |
| 166 | නුඹ රැදෙනා මගේ දිවි වාසනාවන්<br>නුඹ නැතිදා සිත් නැත පා සිනාවන්<br>මා පිය සෙනෙහස හේ නුඹේ දයාවන්<br>සසරේ සිහිනයක් මේ සුභ දසාවන් |
| 167 | සැදෑ සමෙහි පිපෙනා මුදු සිය පතක<br>දහසක් පැතුම් ලියුවා ආදර සිතක<br>සැමට හොරා විදගත් සිහිනෙක මතක<br>ඇවිදින් හොරෙන් සැගවුනේ ඇයි මා ලගක |
| 168 | වනමල් පියලි විල්ලුද බුමුතුරුනු උඩ<br>යන මිනිසකුගේ ගමනින් නැත ලොවට වැඩ<br>ඇත උල් මුගුරු ගල් කටුවල මුණන මැඩ<br>යන ගමනෙහි කොපමණ හිතවතද හැඩ |
| 169 | එක් පෙති මලක් විය නුඹ මගේ අත් දෙකට<br>නෙලා නොගත්තේ මගේ බොසත් කමට<br>හැරගිය දිනයේ නාවත් මා ගම් දොරට<br>ඇයි පැමිණියේ විරහි සිත අද්දරට |
| 170 | මිතුරියන් කීවත් සතුරියන් ලදේ<br>නව වුනත් වැඩ හරි අගේ<br>කංසා නම් වවනවා සරුවට අනේ<br>වැවු කංසා මදිවට මං පලිද නගේ |
| 171 | ගම් දනවි පහු කර ආවත් සරසවියට<br>යන්නට හිතෙනවා ආයෙත් ගෙදරට<br>එහෙම කලොත් කන්නට දෙන්නෙ කවුද<br>අපට<br>බෑ බෑ ඉගෙන ගතයුතු පොලොවේ පය<br>ගහන්නට. |
| 172 | මේ ලේන්සුවට පුළුවන්නම් කතා කරන්න<br>මගේ කාන්සියට කියයි අපේ කතා අහන්න<br>යලි හෙට හමු වෙන තුරු පුළුවනි සුවඳ<br>විඳින්න<br>මේ රාත්‍රියම මට පුළුවනි හීන දකින්න. |
| 173 | නාරිලතා මල නම් හරි ලස්සනලු<br>දැහැනක් බිදෙන බවනම් ඇත්තයිලු<br>තපසට සිද්දවුදේ කාටත් අවුලක්ලු<br>ඔරොප්පු කියනු මැන එය මහ පිනක්ලු. |
| 174 | කුරුටු ගිත දැක ඔබේ සිත රිදුනාද<br>මේවා විහිලු බව අනේ දැනගන්නවාද<br>පිළිතුරු ගිය අමුනන්නට නොදනින්ද<br>බිත්තියේ කුරුටු ගා ඔබේ කවි ලියනවාද. |
| 175 | උදේ පාන්දර හා මහ රාත්‍රියේ<br>හු හඩ තලනවා නිතරම දිවා රැයේ<br>නිදිමත නැද්ද කෑ ගසන්නේ හැම පැයේ<br>අනෙක් අයට කරදරයක් මේක ප්‍රියේ |
| 176 | මිතුදමේ නාමයෙන් දුක් කඳුළු දරන්නෙමී<br>සෙනෙහසේ නාමයෙන් මගේ පෙම පුදන්නෙමී<br>සිනා මල් වැසිරුවා පිවිතේ ගෙවන්නෙමී<br>විහිළුවෙන් දෑස් රතු වු බවක් කියන්නෙමී |
| 177 | පෙම්බර ලමැද මැද හොවමින් සුභ මුහුණ<br>පින්කද ගුණ සිසිල සිඹ සිඹ සැනසෙන්න<br>පුන්සද ලගින් තරුවක් වී උපදින්න<br>රන්කද ඉතින් මෙහෙසුන වී ලඟ ඉන්න. |
| 178 | මල් පිපිච්ච-පෙත් හැලිච්ච<br>මිදුල පුරා පෙති පිරිච්ච<br>පාගන්නට දුක හිතිච්ච<br>අතිතයක් ඇත ගෙවිච්ච. |
| 179 | කැලණි කන්ද තරණය කල ආ අපට<br>වෙන් වන්නට සිදුවෙයි දැන් මේ ලෙසට<br>වෙන්ව ගියත් අප දැන් හැම මේ ලෙසට<br>මිතුදම තබා ගනිමු සැමදා අපි එකට. |
| 180 | campas ආවේ මොන හේතුවකටද අනේ<br>මගේ පෙර පවක් පල දුන්නද මගේ අම්මේ<br>සිදුවන හැමදේම දුකටයි බර වෙන්නේ<br>පිවිතයම දුකක් බවයි හැගෙමින් යන්නේ. |
| 181 | ලස්සනේ බැරිය බඹරුන් රොන් ගන්න<br>උස්උනේ ලමැද සෙනෙහස උතුරන්න<br>ඇස් රිදේ බැරිය මග බල බල ඉන්න<br>එල වතෙන් ඇවිත් මා කැන්දන් යන්න . |

| | |
|---|---|
| 182 | පාඩම් කරලම මට දැන් එපා වෙලා<br>exam එක මට නම් දැන් තිත්ත වෙලා<br>මොනවා කරන්නද මම දැන් කොටු වීලා<br>යනවා යන්න exam 1 ගොඩ දාලා |
| 183 | බලාපොරොත්තු ලංවෙනවා සිත් කොනට<br>සිනා කැකුළු ගෙන එනවා මුව අගට<br>නොකියා පැතුම නුඹ ගිය කල උඩු සුළඟකට<br>බොඳවෙනවා නෙතු පුරා උණු කඳුළු කැට. |
| 184 | අඩ සඳක් සැඟවෙන තැනක් ඔබ<br>රල පෙලක් පෙරලෙන තැනක් ඔබ<br>සිසිලසක් දනවන තැනක් ඔබ<br>උණුසුමක් ගෙන දෙන තැනක් ඔබ. |
| 185 | කැම්පස් ඇවිල්ලත් අවුරුද්දක් ගෙවුනා<br>බණ්ඩාර නායකේ වසරක් ගත කෙරුවා<br>කැන්ටින් බුවාලගේ ජරාව ගිල දැම්මා<br>අපටත් නොදැනී අප හොඳටම කෙට්ටු උනා. |
| 186 | තණ්ඩලේ වගේ සයිබා දක්කනවා<br>කටුකැලේ ගිහින් එහේ මෙහේ දඟලනවා<br>කවුරුත් දකිදෝ බඩ පපුවම දනවා<br>යනකොට ඉතිං මේවා අරගෙන යනවා |
| 187 | මා වගේ එවුන් මේ කාමරේ ඉන්න ඇති<br>නිදි මර මරා රෑ ක්‍රමත් දමන්නැති<br>කැමට කියා ඔහු අඩුවක් කන්නඇති<br>රස්සාවක් නැතිව ඔහු තාමත් ගෙදරඇති. |
| 188 | නැවතී වතුර මල යට සිට නල වතුර<br>තාමත් සිතින් කිමිදෙමි ගඟ දිය වතුර<br>කැවත් කැන්ටිමේ බත හොඳ නෑ මිතුර<br>තාමත් සිහිවේය පෙර කෑ අල බතල. |
| 189 | බැලුම් බලා දෙදෙනම මඳ හසින් අඩ<br>ඇලුම් බරව සිටි මින්දද පෙළඳ මැඩ<br>නෙළුම් පොහොට්ටුවක් උඩ හංසයෙකුගේ තුඩ<br>තැලුම් පෙලුම් නැතුවම රින්ගවන හැඩ. |
| 190 | ලොකයට එලිය දී හිරු කලේ වරදක්ද<br>රෑ අඳුර නැතිනිසා සඳු කලේ වරදක්ද<br>අපේ හද දුක අඳුර හැඳින ඔබ පෙරටම වින්ද<br>එ අඳුර නසන්නට පෙර වැඩුම වරදක්ද |
| 191 | බුද්ධියේ තෝ තැන්න ඉඩෝරෙට අහුවෙලා<br>තෙතමනය නොමැති බිම මිනිමල් පිබිදිලා<br>අනාගත සුභසිහින නෙතු දැලින් ගිලිහිලා<br>පෙර මඟට යා හැකිද කටු කොහොල් ඉඹුල් බිහිවෙලා |
| 192 | සමහර එවුන් නම් කොක්කක් ගැහුවා යකෝ<br>තව තව එවුන් ඇණ පිට ඇණ ගත්තා යකෝ<br>තව කට්ටියක් කවුන්සිලියේ ගියා ගියා යකෝ<br>මේකේ ඉඳන් අපි මොනවද කෙරුවෙ යකෝ. |
| 193 | ක්‍රමක් දමන්නට සිතුවත් ගොඩ යන්න<br>නින්දක් ඇවිත් පවසයි මට නිදියන්න<br>මක් කරන්නදැයි මිතුරනි පවසන්න<br>නුඹලට පුළුවන්ද ටිකකින් ඇහැරන්න. |
| 194 | විභාගය දිනෙන් දින ලංවෙනවා<br>අභාගය වේද හදවත වදදෙනවා<br>නිමාවිය කලක් දමනට ගිරවා<br>ප්‍රමාදය නිසයි සිදුවූයේ මේවා |
| 195 | පොදින් පොද පිණි වැටෙන<br>බිඳෙන් බිඳ හිරු නැගෙන<br>මුවින් මුව හස නැගෙන<br>සරසවිය මේ කැළණිබිම. |

| | |
|---|---|
| 196 | තෙල් මුහුණේ ගඳ දැනුනේ<br>ප්‍රිය ලඳුනේ මට විතරද?<br><br>ගඳ පපුවේ සුව දැනුනේ<br>හිමි සඳුනේ මට විතරද? |
| 197 | අනේ මිනුවන්<br>ඔබේ දෙසුමන්<br>අපේ දෙනුවන්<br>කරයි අඩවන්. |
| 198 | තුරුළු කරන් පොත් මිටිය අතකින් කිමිද නගෝ<br>වසා ගෙන දෙපා දිගටම කිමද නගෝ<br>කොක්කක් නැතිව මහ මඟ තනිව කිමද නගෝ<br>තෙල් බැම්මේ නැවතිලා කිමද යමිද නගෝ. |
| 199 | තුරුළු කරන් පොත් මිටිය Lecture 1 හින්දා<br>වසා ගෙන දෙපා දිගටම අපේ අක්කලා හොඳ හන්දා<br>කොක්කක් ගමේ මග බලමින් ඉන්න හන්දා<br>අහින්නම් අයියණ්ඩි බාංඩේ ළඟ හන්දා |
| 200 | සොඳුරුකවක මිහිරිය සිතේ රැඳෙන විට<br>සිත සුළං මා සිපගෙන හමන විට<br>නුඹේ සෙනෙහේ මා සිත තුළ මැවෙන විට<br>සොඳුරුලොවක් හද නුඹ හැර මෙලොව මට |
| 201 | ආදර මව්නි බැහැ නුඹ තනිකර යන්න<br>දරුවන් හදනවා නුඹේ දිවි රැකගන්න<br>තවත් කළක් නුඹ සමගින් හිනැහෙන්න<br>ලොව මැවි දෙවියනේ අපහට ඉඩදෙන්න |
| 202 | පෙම් ලොවේදි ලද සරදම් අතීතය වෙත විසිකරන්න<br>හිනයේ මුදුවදන් මුසුවෙන් බිඳුනු හදවත් සුවකරන්න<br>තුරුණු බව රැඳි ඔබෙ සිතුවිලි සරසවිය ලංකරන්න<br>ඔබේ ගතහිත සනහලන්නට සමාධිය වෙත පියනගන්න |
| 203 | නැවුම් බව රැඳි සුමුදු මදනල මියුරු තනු හා එක්කරත්<br>සොඳුරු පදවැල් තියුණු ස්වරයෙන් ගැයෙන මිහිරිය ලංකරත්<br>විරහ සොම්නස පිරුණු සිත්තුළ නැවුම් පැතුමන් පුබුදුවත්<br>ඔබේ ගතසිත සනහලන්නටසමාධිය වෙත පියනගත් |
| 204 | අහිමි වුනත් නුඹ ලදේ<br>නුඹ ලගයි හිත තව මගේ |
| 205 | ඔබ හිනැහෙන විට<br>මුළු ලොව<br>ඔබ සමගත් සිනාසෙයි<br>ඔබ වැලපෙන විට මුළුලොවම<br>ඔබ අතහැර සිනාසෙයි |
| 206 | එදා සෙනෙහසේ සුවය දුන්<br>කණට කොඳුරු<br>හිතට ලංකල මිහිරි සිතුවිලි<br>වියලිලා ඇත කාලයේ<br>මතක සලකුණු මතක පමනකි<br>මැකී ගියදා ආදරේ |

| | |
|---|---|
| 207 | හැම පාට කුඩ අතර<br>මම කළු කුඩයක් |
| 208 | ඔබත් මමත් අතර ඇතතේ හුදු ගනුදෙනුවකි<br>ඔබ මාහට දුක අලෙවි කරයි<br>මා ඔබ හට සමාව නොමිලේ දෙයි<br>නමුත්<br>මා හට සමාව අවශ්‍ය වු විට<br>එය<br>ඔබ ලග නොමිලේ නැත<br>ඉරබටු තරුව උනානම් නුඹ මට<br>මට දරා ගන්නනට හැකි කළුවර<br>පිටුපා යන්න ගියාවේ පුරහඳ<br>එක තරුවක් ඇති මගෙ අහසට<br><br>මගේ ලොව හිරු මඩල<br>නුඹයි සම්දුනේ |
| 209 | අමාවක  වන බව දැක<br>සඳට පෙම් බැන්දා<br>මලානික වන බව දැන<br>මලට පෙම් බැන්දා<br>දවාලන බව දැන දැන<br>හිරුට පෙම් බැන්දා<br>වෙන්වී යන බව දැන දැන<br>නුඹටම පෙම් බැන්දා<br><br>පිදුවෙමි අපිරිමිත සෙනෙහසක්<br>පැතුවෙමි එපමනක්<br>නොලදිමි බිඳක්වත්<br>ඉතින් උපදි සැකයක්<br>තෙවන නියමය ගැන<br>නිව්ටන්ගේ |
| 210 | කුණු ඇළ පිස එනමදනල අතරමගකදි<br>මා එන මග වලකන්නට බලාඋනි රැදි<br>දසත කටු ගසා සෙව්වෙමි බෙස්එක පුරා<br>නොදැක ඔබේ රුව ශෝකය නැගෙයි හද පුරා<br><br>රසය විදිමි කුණුගොඩවල එය නොවේ සුවේ<br>ගින්න නිවන රසට කෑම එලගි තෙල් ප්‍රියේ<br>තිත්ත නොම බලා කැවෙමි කොත්තුවක් පවා<br>කොත්තු කන්නවත් ඔබ මා ලගට එයි කියා<br><br>ආමි<br>බැලිමි<br>බැලුබැලු බොහෝ දෙනා<br>ලියුයෙන්<br>මාත් ලිමි |
| 211 | දොනෝ දහක් ගැවසෙන අප කවියක<br>පාළුව තනිකම දැනෙනවානම්<br>කුටියේ කවුළුව විවර කරනු මැන<br>කපුටෙක් වී ඔබ වෙත එන්නම්<br><br>කෑම නැතුව ඉන්නට බැරි අපේ පොරියා<br>කැමක් දුටුවිටදි පිම්මට දුවන කද බඩයා<br>වලිකාලෙට නැගිටින්නැති කම්මැලියා<br>මොනවා වුනත් මු අපේ ආදර පොරියා |
| 212 | පෙම් කවක් ලියු නුඹ සිත්<br>එකී මකාදමා ගියදා<br>ඔබ මෙතෙක් රැදි උන් මා මතකයේ<br>පෙම් පුරා සිත කා සතුද |

| | |
|---|---|
| 213 | **සිද්ධාර්ථ**<br>ඔබ මෙන් මම නුපන්නෙමි රජ පවුලක<br>ඉර්තුවෙන් ඉර්තුවට මලිගා තිබුණද<br>රජ ඉසුරු අපට නැත<br>එබැවින් ඔබට මෙන් සිහි මනසින්<br>නොහැකිය පහසුවක් මට |
| 214 | මේ ලොවට එනතුරු<br>විශ්වයේ නුඹ කොතනකට වී හෝ<br>බලා ඉන්න බව දනිමි තිරලෙස<br>නුඹේ සුම්හිරි මතකයන් සැගවිලා ගිය<br>සයුරක්ය මගේ හදවත<br>කිසිදා කිසිවෙකු<br>නොදැක සැගවුණු<br>අපේ සෙනෙහස<br>සොයා එන්නෙමි<br>නුඹේ ලොව වෙත |
| 215 | මා මියදින මතුයම් දිනකදි<br>සිතල නිසසල මා අභියස හිද<br>පැන් වත්කරමින් පිරිත්කරන්නට<br>නුඹේ චපල සිත නුඹට කියාවිද |
| 216 | අප ඉතින් යන්න යමු<br>තව මාස පහකින්<br>සියලු දේ<br>ඉන්න උන්ට පවරලා<br>හදපියව් ඉතිරි ටික<br>දිපියව් මේ දිගේ<br>ජිළග සෙට් එකට |
| 217 | මලානික වු ලෝකය<br>දෙස<br>නෙත් යොමා බලා සිටිව්<br>කොතරම් ගොරහැඩිද<br>මං අවුරා බලා සිටින<br>අසංවර මානවයන්<br>තම වර්ගයක් මිහිමත<br>ජනිත වු තරමටම<br>අහෝ<br>හඩයි ජනිත වු<br>ජනනවු<br>බිලිදාගේ ලෝකය<br>නැතිකරමි<br>ඔහුගේ සතුට වෙනුවෙන්<br>තැනුනු ආදරණීය හෙට දිනක්<br>කුමක් කරමුද<br>කුමක් සිතමුද<br>ලොවට බියපත්ව පලායමුද<br>සියලු වගකිම් යුතුකම් හැරදමා<br>නොදැක සිටිනු බැරිය<br>පලායා නොහැකිය<br>මිහිමත බරක් පමනක්<br>ඉතිරි කර<br>කවුරු කුමක් කීවත්<br>කම් නැත. |

| | |
|---|---|
| 218 | තම යුතුකම් තමන් හොදින් දැන<br>ඇදින ගෙන ඇත්නම්<br>පිවත්වන්න<br>උත්සාහ කරන්න<br>ආත්මයම එක්ටැම් කරගෙන<br>මිහිමත සිටින<br>එක් මානවයකුටවත්<br>අවම ලෙස<br>ජීවත් වීමේ අයිතියවත්<br>රැකදෙන්න<br>විටක ඔහු මට ජනිත වුවකුද<br>විය හැකි බැවිනි |
| 219 | ගිනි අව්වක මහ කම් හල මැද<br>නුල නූල ගෙන එකිනෙක ඇදෙන<br>මැස්මට හුරු උනා අස් සළු පිලි<br>ජේලි ජේලියට ගොඩනැගෙන<br><br>සත් මහ සමුදුර පිට යන සළු පිලි<br>කුමාරියන් ගත වට සැලෙනා<br>අඩනිරුවත් නුඹේ නුල නූල ගෙන<br>නව රන් සළුවක් මුල පුරනා<br><br>මෙහෙය නිමා වී සැන්දෑ අදුරේ<br>තනියම සෙයිලමේ පසුකරනා<br>නුඹේ දෑතින් මැසූ සළුපිලි රකුසන්<br>කිතු කිතු කර ගිලදමනා |
| 220 | මිහිරි අම්හිරි මතකයන්<br>හදතුල<br>රදවාගෙන<br>මිතුරන් ඔබ ගැන<br>සිත තුල රදවා ගෙන<br>ඉදින් යන්නෙමි<br>සමුගෙන |
| 221 | නැති බැරි කෙනෙකු රජකුළයක ඉපදීමෙන්<br>කුළමානයෙන් ආසාවෙන් මත් වීමෙන්<br>පැතුවිට රජ පුටුව ඉහළ හිත යාමෙන්<br>අවසන් වේය ඔහුගේ දිවි පිරිහිමෙන් |
| 222 | සමාජය කෙතරම්ම ගොරහැඩි වුවද කම්නැත<br>හදවතේ නගනු මැන එකම පහන් සිතුවිල්ලක්<br>තවත් කෙනෙකුද තමන් මෙන්ම අහිංසකබව |
| 223 | නින්ද නැති රැයේ<br>පොත දෙස බලා සිටියෙමි මම<br>දෑස් දල්වා<br>සියලු දුක් වේදනාවන් ඉවසා<br>දෑස රිදුම ඉවරයක් නැත<br>කුසගින්න කියනු නොහැකිය<br>දිනුම ඇත පෙනෙන දුර<br>නැත කිසිවෙකු මා තුල<br>එකම එක දෙයක්<br>ඇත මා හදවත තුළ<br>මාගේ ලේ මස් නහර<br>ඇට මිදුළු වලට<br>කා වැදි<br>ඒ නුඹයි මගේ<br>සුදු අම්මේ<br>නුඹේ කුසගින්දරයි<br>සුදු අම්මේ |

| | |
|---|---|
| 224 | අභිම්ව තිබු ආදරය<br>සොයා නුඹ වෙත<br>පියමං කළද<br>සිතෙහි උන්<br>නොසන්සුන් කම<br>දුකින් කිම්දු අප<br>සතුරු වෙසකින්<br>වසා හද මුව<br>නොනැවති<br>සිතනු මැන<br>තවත් එක් වරක් වත්<br>කිනම් කරුනක් තිබුණිද<br>අප හද විමතිය<br>සසල කරවණ නෙතු යුග<br>ඉකි බිදින<br>නිහැඬියාව<br>හැගේ එයමදැයි ඒ<br>සෙවු<br>අපරිමිත සෙනෙහස<br>කළ පින් මදි උනාදෝ<br>දිවි ඇතිතුරා සතුටින්<br>කල් ගෙවන්නට |
| 225 | නොමිනිසුන්<br>වෙසෙන සමාජයක<br>මිනිසකු ලෙස<br>පෙනීසිටිම<br>දැලිපිහියෙන් කිරිකෑමකි<br>නොමිනිසුන් වෙසෙන<br>මේ සමාජයේ<br>මනුෂ්‍යත්වය කරා රැගෙනයාම<br>හදවත කිරිගසන<br>අපවාද නින්දා සහිත<br>කිසිවෙකුත් දිරිනොකරන<br>ජිවිතය කළකිරවන<br>අදුරු හුදකලාව<br>රජ කරයවන<br>කෙටියෙන්ම පවසතොත්<br>අසිපත් තුඩමත<br>ලය තබා<br>දෑත් දෙපා දෙසට විහිදුවිමක්ද |
| 226 | සඳක් වගේ සිනා සලන මුව මඩලට මම කැමතියි<br>සිතින් හඩන කියන කතා අහන් ඉන්න මම කැමතියි<br>හොරෙන් බලාඉගි කරන නෙත් සඟලට මම කැමතියි<br>මම හිතන්නේ හැමට වඩා මගේ හදට නුඹ කැමතියි |
| 227 | රතු කුඩයෙන් ලාහිරු රැස් වැටෙන කොට<br>නුඹ එලියයි කුමුදු මලක් වගේ මට<br>හමුවෙයි නම් නුඹ මගේ හදමඩල යට<br>පෙම් කවි ලියන්නෙමි එලිවෙන තුරු නුඹට |
| 228 | පෙම්වතුන් රන්හුයෙන් බැන්දද<br>ආදරේ පරවෙලා මල් මැද<br>මල් පහන් අත ඇතත් මින්දද<br>තවම තනියෙන් කවුරු හින්දද |

| | |
|---|---|
| 229 | රැයක් පහන් වුනි<br>යහන පෙනෙන මානයේ සිටි<br>කල්පනා ලොව තුළද<br>තනිවුනෙමි<br>මා සමග සිටියේ<br>ඇය පමනි<br>නමුත්<br>ඇය සමග සිටියේ<br>වෙන කෙනෙකි |
| 230 | නා දළු වැනි දෙතොල් තිබෙන රිෂාක්<br>අද නෑ මුතු<br>කෙට්ටු උනත් හොද හිත ඇති කොමා එත්<br>අද නෑ මුතු<br>හොද හිත ඇති එය ගෙව්ලා අද නැනේ<br>මුතු<br>කවුරු නැතත් කළුවුනාට මට වටිනවා නුඹනම්<br>මුතු |
| 231 | නුඹ නැති මේ රැයට<br>පුරහඳ එලිය කුමටද<br>ඔබ නැති මේ බිමට<br>නලමුදු සුවය<br>කුමටද |
| 232 | සිත රිදවන<br>සොදුරු මතක<br>සිත ඇතුලෙම මියැදුනාට<br>නෙතු හඬවන<br>මුතුකදුලැලි<br>නෙතු සෙවනේ රැදවුනාට<br><br>හැගුම් මිටක් හද පුරවා<br>සිතුම් මිලාන වී ගියාට<br>සිත හඬන්නේ ඇයි මේතරම්<br>මගේ ලොවට නුඹ නාවට |
| 233 | රැය පහන් වුනි<br>යහන පෙනෙන<br>මානයේ<br>සිට<br>කල්පනා ලෝකයේ<br>තනිවුනි<br>සිහියට නැගුනේ කවුරුන්ද<br>දයාබර මව්නි<br>දයාබර පියානෙනි<br>නුඹ නොවෙද ඉතින්<br>මගේ ඉරු සඳු |
| 234 | නිල දෙනෙතින්<br>නැගුනු බැල්මෙන්<br>ඔබ මගේ සිත ගෙන ගියා<br>නුඹේ දෙතොලග<br>රැඳි සිනහවෙන්<br>මගේ හදවත<br>පිබිදුනා<br>ආදරෙයි මා කියන්ට පෙර<br>ඔබේ හද වෙනතක ගියා<br>හැඩු කදුළැලි<br>සෝසුම් මැද<br>පෙර ලෙසින්<br>මා තණිවුනා |
| 235 | ඔබේ ලොවේ හිද මා රැඳි මා<br>බලා හිඳිමි සැනසුම පතලා<br>සෙනෙහස සැනසුම් සොයලා |

| | |
|---|---|
| 236 | කැම්පස් එකට ආවේ මම සතුටු සිතින්<br>ඇසුරු කලේ මිතුරන් හැම එක විලසින්<br>ආපසු යන විටදි උන්නාම නොසිතු ලෙසින්<br>අමතක කලේ මිතුදම බිදදමා සතොසින් |
| 237 | ගෙම්බෙක් උනත් පිම්බුන විට උඩ යන්නේ<br>උඩ යනකොට ඌ රජෙකුයි හිතෙන්නේ<br>මුල අමතක වී මෝඩ අමන ගති මතුවන්නේ<br>පිවත් වෙන්න මහපොළ මේ බව නොසිතන්නේ |
| 238 | මිනිසෙකුට හරියන විට සිත දුක්වෙන්නේ<br>කුහක කම සැමවිට එලියට මතුවන්නේ<br>පිවත්වෙන්න තවමත් හරියට තව නෑ දන්නේ<br>අනුනට ඊර්ෂයා නොකරම් එවිටයි හරියන්නේ |
| 239 | වෙර දරා උසස්පෙළ ඉහලින්ම සමත් වීමි<br>සරසවිය නමැති<br>සොදුර<br>නෙත් පෙමට ආවෙමි<br>එහි නෙත පරයන<br>අගපසග රුව<br>අධ්‍යාපනය අභිභවා<br>නැගි ආවේය<br>මසිත<br>සුළගට අකිකරු<br>රුවලක්<br>නොවිය<br>අවසානයේ හැමදෙයක්ම<br>පිවිතයේ<br>එක් මතකයක් පමණක් විය |
| 240 | අප<br>අම්මට පෙම් කරන්න<br>පෙම්වතියක් අහිමි විය<br>උපාධිය<br>ගිලෙන්නට යන<br>මැඩියෙකුට හසුවු<br>පන්ගසක් මෙන් විය<br>පරාජය සගවා ගෙන<br>අභියෝග ජයගත නොහැක<br>පිරවිය යුත්තේ<br>භාජනය හිස් වී ඇති බැවිනි<br>සරසවියෙන් සමුගත් මට<br>හුදකලා ආත්මයක්<br>පමණක් උරුමවිය<br>ඒත්<br>දෙනෙතින් කඳුළු කැට<br>වැහෙන්නේ නැත. ඇයි? |
| 241 | සරා සඳ බැස ගොස්<br>මගේ මේ පුංචි ලොව<br>කුමුදු මල් පිපුනේ නැහැ<br>රෑ වගේ සවස<br>පියනැගි ආයේ නෑ<br>එදා වගේ අහස<br>නුඹ කොහෙද සැගව ගොස්<br>මේ සියළු දේ සමග<br>ඔබද මා ගෙනගියේ<br>මා කළ වරද කිම |

| | |
|---|---|
| 242 | සිත සිතුවම් වන්<br>නුඹගේ නෙතුයුග<br>මගේ දෙනුවන පුරා<br>දහසක් රැගුම් රගත්<br>විසිරී ගියත්<br>නිල්වන් රත්වන් වර්ණයෙන්<br>දෙනෙත් වැසීමෙන්<br>සිතුවමක් වී<br>හැමදාම<br>මගේ හදවත් ගැබතුල |
| 243 | ඔබ වෙනුවෙන්<br>ඔබේ ආදරය වෙනුවෙන්<br>මගේ ආදරය දහස් වර<br>සැලි සැලි යයි<br>ඔබගේ එක් පෙම් වදනක් පතා<br>ඔබගේ එක් හසරැල්ලක් පතා<br>මගේ දෙනෙතේ<br>මගේ දෙසවන්<br>මහා ලෝබකමකින්<br>වේදනා දෙයි<br>මේ හේතු අගින් ඉහිරුනු<br>කඳුළු පහස ලැබ<br>සැබෑ සමුදුර කිරි මුහුද<br>කැළඹී වේදනා හඬනගයි<br>ප්‍රේමය යනු කුමක්දැයි<br>මගේ සිතම පසක් කලේ<br>නුඹමැයි |
| 244 | වධකාගාරක් ඔවුහු ලා<br>මල් පෙති නියෙහි දරා<br>ගිම්හානයට<br>පසු එළඹෙන<br>සමය සොයා<br>ගුමු ගුමුනදින් විකසිත<br>හඳමඩල දරා<br>මල්වර සමය පසුකරයන්නෙමි<br>නුඹේ සුවඳ සොයා<br>ළඟ ළඟ දැනෙන සුවඳක් දැනී<br>ඔබේ බව දනිමි<br>දෙනෙතින් වට කඳුළු<br>දෙකොපුල් සිඹිනු දැනේ<br>දැනේ වෙළී අප ගිය දුර<br>උණුසුක් දැනේ<br>නික්ම යන්න ගොඩ මගේ උණුසුම ගෙන<br>සතුටු සිනා කැන් කැරලි පිටින් ගෙන<br>මේ උණුසුම් පාර අඳුරු ලොවට හෙට<br>පිවිසෙන්නට මට සුවඳ පිටින් නුඹ<br>සඳ මඩලෙහි උණුසුම නික්මෙන්නට පෙර<br>එන්න එක්වරක් තව මේ නෙතු ඉමවෙත |

| | |
|---|---|
| 245 | අම්මේ තාත්තේ - මේ අහන්න<br>අක්කේ අයියේ - මේ අහන්න<br>අධ්‍යාපනේ - බේරගන්න<br>අපිත් එක්ක - එකතුවන්න<br><br>කැම්පස් ටික - විකුණනවා<br>පෙළපොත් ටික - විකුණනවා<br>ප්‍රතිපාදන - කපාදමා<br>ආණ්ඩුවත් - නිදියනවා<br><br>ගනිව් ගනිව් - හකුළ ගනිව්<br>උපාධි කඩ - හකුළ ගනිව්<br>අධ්‍යාපනේ - බිල්ලට දෙන<br>උපාධි කඩ - හකුළ ගනිව්<br><br>පාල පාල - වර්ණපාල<br>දාල දාල - උපාධි කඩ<br>අධ්‍යාපනේ - විකුණං කන<br>පාළු පාළු - මොට්ට පාල |
| 246 | අපි ආවේ - ඉගෙන ගන්න<br>අපිට උනේ - පාරේ ඉන්න<br>ආණ්ඩුවේ - බහිරවයන්<br>පිස්සු කෙලින - හැටි බලන්න<br><br>මොනද උනේ - චින්තනේට<br>මහින්දගේ - චින්තනේට<br>අධ්‍යාපනේ - විකුණන්නට<br>ඉඩදුන්නේ - කවුරුද බොල<br><br>දමනු -දමනු ඉහළ දමනු<br>ශිෂ්‍යාදාර - ඉහළ දමනු<br>කරනු කරනු - නතර කරනු<br>සිසු මර්ධන - නතර කරනු<br><br>මේක හරිම - ආණ්ඩුවක්<br>පිස්සු කෙළින - ආණ්ඩුවක්<br>අධ්‍යාපනේ - විකුණං කණ<br>මේක හරිම - පාංඩුවක් |
| 247 | එපා එපා - අපට එපා<br>සෙබළ සමරේ - අපට එපා<br>එපා එපා - අපට එපා<br>වර්ණපාල - තියරි එපා<br>එපා එපා - අපට එපා<br>සුසිල් ආඳා - අපට එපා<br><br>කනවා කනවා - හොරා කනවා<br>පාලකයන් - හොරා කනවා<br>රට කරනා - පාලකයින්<br>ඇති පදමට - හොරා කනවා<br>කනවා කනවා - ලෙව කනවා<br>නොකා නොබී - ලෙව කනවා<br>සරසවි තුල - අපි ඔක්කොම<br>නොකා නොබී - ලෙව කනවා<br><br>මෙන්න බොලේ - මාර පොතක්<br>අරුම පුදුම - මාර පොතක්<br>නව බුදු ගුණ - දාපු පොතක්<br>චතුර් සත්‍ය - කාපු පොතක්<br>මතු පරපුර - මොට්ට කරන<br>මොට්ටයන්ගේ - පොට්ට නෙතක් |

| | |
|---|---|
| 248 | අධ්‍යාපනේ - මුදල් කැපේ<br>ඇමති නඩය - පැටව් ගැසේ<br>සරසවි ටික - වැසී යතේ<br>අධ්‍යාපනේ - ඉවර වෙතේ |
| 249 | කරවි කරවි - නතර කරවි<br>සිසු මර්ධන - නතර කරවි<br>ගනිවි ගනිවි - හකුළ ගනිවි<br>වදක  පනත - හකුළ ගනිවි |
| 250 | ගනිවි ගනිවි - හකුළ ගනිවි<br>උපාධි කඩ - හකුල ගනිවි<br>ඇක්වයිනාස් - හකුළගනිවි<br>ACBT -  හකුළගනිවි<br>ඇපිට් එකක් - හකුළ ගනිවි<br>ස්ලිට් කඩයක් - හකුළ ගනිවි<br>RT එක - හකුළ ගනිවි<br>පොලිමස් කඩ - හකුළ ගනිවි<br>සිතෙක් එකක් - හකුළ ගනිවි<br>ඔක්කොම කඩ - හකුළ ගනිවි<br>නැත්තන් අපි - හකුළනවා |
| 251 | අපියන්නේ - කොයි පාරේ<br>ත්‍රිමා වෙනුර - ගිය පාරේ<br>අපියන්නේ - කොයි පාරේ<br>නිශ්මි බාලේ - ගිය පාරේ<br><br>කපා කපා - කැලි කපා<br>අප වලකනු - සිතනු එපා<br>ලේ හැරුනත් - පාර දිගේ<br>අපේ ගමන - අපි යනවා |
| 252 | පානුයි පරිප්පුයි දවසක බුදු වේවා<br>ගෝවයි අලයි සැරියුත් මුගලන් වේවා<br>කැන්ටින් හොද්ධ නේරංජන ගග වේවා<br>මේ ගග ලගදී මගේ පැතුමන් ඉටුවේවා |
| 253 | ගැහැනු ළමයි පාරේ යන බස් වැනිය<br>එකක් මිස් උනොත් අනෙකේ යා හැකිය<br>පිරිමි ළමයි කොන්දොස්තරලා වැනිය<br>ගැහැනු සියළු ඒ බසයට නගින්නෝය |

| | |
|---|---|
| 254 | නිම නොකළ කවිය<br>මල් පෙත්තක සුවඳ බවඳ<br>පිනි බිඳුවක මුදුබවද<br>සඳ කිරණක සෞම්‍ය බවද<br>මහ පොළොවක තෙත බවද<br>පහන් තරුවේ ආත්ම ශක්තියද<br>අහස් ගැඹ සේ රැකවරණයද<br>හිරුමඩලක ප්‍රභාලෝකයද<br>සමනළ තටුවක මොලොක් බවද<br>තරුමඩලක සජීවිබවද<br>සැදෑවක සුන්දරත්වයද<br>සියොත් සරයක ලාලිත්‍යද<br>නිසොල් විල්තෙරක උපශාන්ත බවද<br>හිම කිනිත්තක තෙත් බවද<br>වසන්තයේ ප්‍රාණවත් බවද<br>දෙව්දුවකගේ දයාබරත්වයද<br>ගලන දොළපාරක සිනහවද<br>සයනයේ උණුසුමද<br>දිය ඇල්ලක කාන්තියද<br>නිලුපුල් මලෙක කාන්තියද<br>නිලුපුල් මලෙක සංවේදිත්වයද<br>මහසයුරක නොසිදෙන අපරිමිත සෙනෙහසද<br>එකට කැටිකොට මුසුකොට<br>සොබාදම් මහී මාතාව බිහිකරන ලද<br>ඒ උත්කර්ෂවත් වුත් - අසමසම වුත්<br>මහානිර්මාණය - ඇය - 'අම්මා'<br>යන නාමය සනිටුහන් කළාය |
| 255 | සරසවි නොබැදි මිතුරෝ<br>සංවේගයෙන් දැනුම් දීමයි<br>අන්දමන් (ද)<br>දූපතක<br>f .m වෛරසයෙන්<br>musick උණ සැදි<br>හුදී තරුණ ජනයා<br>රෝගාතුරව<br>බුද්දිය<br>හීනවී<br>මනස විකල්ව ඇත |
| 256 | සැත්කමක්<br>සරසවි නොබැදි මිතුරෝ<br>ඉගිළ එයි මවෙත<br>ලෙසින් පියකරු බඹරෙකු<br>කිමද මේ වෙනස<br>මුහුණෙහි අපුරුව<br>පෙර මා නොදැක්ක<br>වෙනසක්<br>සැබෑ වෙනසක්<br>දකිමි<br>පෙම්බරයාණෙනි<br>හදුනාගනිමි දැසින් එය<br>ප්ලාස්ටික් සැත්කමක් කළ<br>නුඹේ කොඳ මළයි<br>එදා මෙන් අදත්<br>කම් නොමැත<br>සැත්කමට |

| | |
|---|---|
| 257 | දුකට ලියූ කව<br><br>නිල් අහස කළුකරං<br>අහසෙහි වැහි ඇද හැලෙන කලට<br>නෙතු දවන මේ කඳුළු<br>ඉවසන්න බෑ බරයි<br>කප්පරක් හීන පොදි<br>හිස් අහසේ පාවෙද්දි<br>ජිවිතය පැටලිලා<br>ආත්මය කැගසයි<br>මියැදෙන්න පණඅදින<br>සුසුමක් ඉකිබිඳිද්දි<br>දුක අහන්න උන්නු මං<br>මගෙන් බොහොමත්<br>ඈතයි |
| 258 | දැක්ම<br><br>මැයි මල් පිපි පාරදිගේ<br>හිමින්සැරේ නුඹ එනවා<br>මැයි මල් සුලගට ඇවිදින්<br>නුඹේ දෙපා සනසනවා<br><br>සුදු සැරයටිය දෙඅත දරා<br>නුඹේ පෙරමග විමසනවා<br>දෙනෙත් ලැබූ මටත් වඩා<br>නුඹ පෙරමග හඳුනනවා<br><br>නුඹි දෙනෙත් වලින් නුඹට<br>නුඹව දකින්නට හැකිනම්<br>සුන්දර කව නිකලැල්බව<br>නුඹට හැගෙවී කොතරම්<br><br>දෙනෙත් ලදත් නොලැබූ සේ<br>ලොවම දකින කුරිරු සතන්<br>ඒ අතරින් මගේ නගේ<br>නුඹ මට අදහන පැතුමන් |
| 259 | අවනඩුව<br><br>ඇය නිසා<br>උන්සිත ඔකඳ වුනේ<br>එක් මොහොතක්ය<br>උන් නිසා<br>ඈ සිත වැළඳපෙනුයේ<br>සඳා කාලිකවය |
| 260 | සිත දිය මුදාහැරේ<br>සතර අත<br>සුවපත් කළ හැකිනම්<br>දනන් හැම<br>පිපාසිත ලෝකයට<br>වැසී ගිය නුවණැසඳ<br>පුබුදු කළ හැකිවේවි<br>නුඹට මට<br>ඉදින් කල් කුමට<br>මේ අපේ කාළයයි<br>පෙළ ගැසෙමු එක්ව සැම |

| | |
|---|---|
| 261 | **දෙවන වසර සහෝදරත්වය**<br>දිවා රෑ වෙහෙසී<br>නිදිවරා<br>දහසකුත් පැතුමන්<br>සිත තුළ පොදිබැඳන්<br>දැගිලි ගනින්නට ඇති<br>පිය නගන්නට<br>සරසවි අසපුවට<br>පැතූ පැතුමන්<br>අඳදින ඉටුවෙලා<br>දෝර ගලායයි<br>සතුටින් නුඹේ නෙතු<br>පියනගනු මැන<br>අත්වැල් පටලන්<br>තනන්නට අළුත් ලෝකයක් |
| 262 | පියාපත් මංගල්‍යය 2007<br>උඹලගේ අහස මේ<br>සිහිල් සිලි සිලිය රැඳි<br>ගය ගයා ගී<br>පියඹපල්ලා<br>නවමු ලොවකට<br>සිරුවෙන්<br>අප දුන්නු අත්තටු<br>අරං |
| 263 | ලද දිවි මහිමයෙන්<br>සිනිඳු සඳු සේ හිර<br>දුක් සයුර පිහිනන්නට<br>දෙසුදම් පහද රැඳි<br>හෙළ මුදුන් මල්කඩ නමින්<br>දුරුවේවා සියළු දුක්<br>ලද දෙරණේ සතුට රැඳි<br>මනු සතුන්නේ |

# පේරාදෙණිය සරසවිය

| අංකය | ගීතය |
| --- | --- |
| 1 | ඔබ ශුද්ධවන්තයෙක්ද<br>ඔසේ නම් මම ඔබට ගරු කරමි<br>ඔබ ශුද්ධ වන්තයෙක් නොවන්නේද ?<br>එසේ නම් මම ඔබට ගරු කරන්නේ<br>අනෙකාගේ වරදේදි<br>උපේක්ෂා වන්නේ නම් පමණි. |
| 2 | නිමාවිය වසන්තය සරසවිය සැරිසරා<br>ගම රටට යා යුතුයි දැන් ඉතින් පය ගසා<br>කාටවත් නොපෙනෙන්න සිතින් ඉකි ගස ගසා<br>නුඹෙන් සමු ගනිමි සමු නොගෙන බැරි නිසා |
| 3 | දහවල් කලට ඇඳිරිඳු වාසනාවන්<br>සැන්දෑ කලට කෙල්ලන් පනාවන්<br>රෑ තුන් යමේ මදුරුවගෙ ගායනාවන්<br>එලිවෙන පැයට නිදි දුව වාසනාවන් |
| 4 | සිරිපාලගේ දේශනාව<br>අපට හරිම වේදනාව<br>කිමද ඊට කාරනාව<br>මාරි ගැනයි කල් පනාව |
| 5 | ගිම්හාන කාලයට බෝ ගසකින් බෝ කොලයක්<br>වැටීම අරුමයක්ද ? |
| 6 | ලස්සන නැති කෙල්ලන් ආවයි  වා සිටියේ<br>ලස්සන නැති නමුත් සීදේවිය  වාසිටියේ<br>ගියෙමි ගියෙමි පස්සෙන් සිත ගන්නට<br>බැරියේ<br>මම පමණයි කෙල්ලන් නැති කොල්ලා<br>වාසිටියේ |
| 7 | දේශ ද්‍රෝහි ජනපති මළ සොහොන් යකා<br>වැජඹෙනහැටි බලව් අප මල මිනී කකා<br>තව කල් බලනු කුමටද මේ අයුරු දැකා<br>ජනයනි වරෙව් කන්නට උගෙ බොටුව විකා |
| 8 | අප වෙනුවෙන් ඉදි වන යදම් පවුරු බිඳ දමා<br>අපේ අයිතීන් දිනන්නෙමු<br>තොපේ ජිවිත බිදගෙන වුවද ? |
| 9 | විභාගය අත ළග<br>අත පොත ළග<br>පොත හිත ළග<br>හිත ඈ ළග<br>ඈ ඌ ළග |
| 10 | ශිල්ප කබලෙන්<br>ලිපට වැටුනි<br>ඇය මගෙන් වෙන් වු දිනේ |
| 11 | ගුණේ අයියා පැමිණෙන්නේ<br>බුත් සරණ අර ගන්නේ<br>හොඳින් කියවන්නේ<br>අපිට නිදි දෙව් දුව ළගා වෙන්නේ<br>නින්ද නොයන අය හොඳ හැටි අහගන්න<br>ගුණේ අයියාගේ දේශනයට පැමිනෙන්න<br>අසුනක් අරා හිඳ දෙසුමට කන්දෙන්න<br>නිදි දෙව් දුව උරයි තොල් පෙති සැනෙකින්න |
| 12 | බඩ මැද කලිසම ඇඳගෙන<br>තට්ටේ තෙල් තවරාගෙන<br>ව්‍යාකරන පොත අරගෙන<br>විජේ අයියා එයි විගසින<br>තට්ටයා ව්‍යාකරණ කරයි<br>කෙල්ලෝ කොල්ලෝ<br>ජොලියේ කතාකරයි<br>උන්ගේ කෑ කෝ ගැසීම් අස්සේ<br>තට්ටයා ව්‍යාකරණ කරයි<br>“තට්” ධාතුවට ‘ට’ යන්න<br>ආදර්ශ වීමෙන් හා<br>“යා” ප්‍රත්‍ය එකතු විමෙන්<br>තට්ටයා පදය සෑදෙන බවත්<br>ඔහු අපට උගන්වයි |
| 13 | පෙම් කරනා හැටි මා හට<br>කියාදුන්නෙ ඔබය සොඳුර<br>එසේ නමුත් ඔබ තවමත්<br>කියා දුන්නෙ නැහැ නොවේද<br>ඉන් ගැලවෙන අන්දම ගැන |
| 14 | වාසිටියේ ‘පවගස“ බිම වැටියන්<br>කැන්ටින් එක කරන නෝනා මැරියන්<br>ගුණෙ අයියගෙ දෙසුම් අදවත් ඉවරවෙයන්<br>බූට් දුන්නු කෙල්ලම මට වැටියන් |
| 15 | නැත යන්න සිතක්<br>දමා ඔබ සරසවිය<br>අද ඔබට සහ මට<br>සෙවනක් දුන් හන්තාන<br>සිහිල දුන් මහ වැලිය<br>මා ඔබ දමා ගිය පසු<br>සරසවියේ තනිකර<br>පවිරක් වේවි හන්තාන<br>ඔබෙ දුක් මගෙන් සඟවන්නට බැඳි<br>සෝ ගඟක් වේවි මහවැලිය<br>ඒ දුක කියා දිව ඇදෙන |
| 16 | අනේ මිනුවන්<br>ඔබේ දෙසවන්<br>මගේ දෙනුවන්<br>කරයි අඩවන් |
| 17 | පානුයි පරිප්පුයි දවසක බුදුවේවා<br>ගෝවයි අලයි සැරියුත් මුගලන් වේවා<br>කැන්ටින් හොද්ද නේරන්ජා ගඟ වේවා<br>සුප්පයියා මුදලාලි කන්ථක අසු වේවා |
| 18 | ජිවිතය<br>ගෙවී යනුයේ<br>පොත් පිටු අතරේය<br>කැත්තයි උදැල්ලයි උරුම වු<br>අප හට<br>පොතයි පෑනයි හුරු වී ඇති<br>ඵලය කුමටද |
| 19 | එම්බා පොත් ගොන්න මා ඔබට කෘතඥ<br>වන්නේ<br>මා දැනුම දියුනු කලාට නොව<br>ඇයත් මාත්<br>සිප වැළඳ ගන්නා විට<br>ලොව කුරිරු ඇසින්<br>අප මුලා කලාටය |
| 20 | වැදූනත් හිසට හෙන<br>දත් ටික ඇතොක් නිසි තැන<br>නොතකා හෙනය ගැන |

| | |
|---|---|
| | සිනාසෙනු උඩ පැන පැන |
| 21 | නරියා හූ කියයි ඕග්රිය ඌට නැත<br>එළුවට රැවුල ඇත වාසිටි ආවෙ නැත<br>මේ දෙක අපට ඇත එනමුදු දැනුම නැත<br>සහතික මිසක් ඕග්රිය නම් වැඩක් නැත |
| 22 | 'කළකෙනි පකද්කඩා<br>ලෙකචර්ස් එන්නේ<br>දුකකිනි 'ලෙක්චරස්"<br>පලෝ කරන්නේ<br>කරත්තෙනුයි ඔහු<br>ගමන් කරන්නේ<br>ඇල්වතුරෙන් ජිවිතය<br>ගෙවන්නේ<br>කරත්තෙ බැඳලයි<br>ලෙක්චර්ස් එන්නේ<br>ගොනාට තණකොළ<br>චොක්ලට් දෙන්නේ<br>මෙහෙමයි පකද්කඩගේ<br>කාලෙ ගෙවන්නේ<br>දින සති ක්‍රමයෙන්<br>ගෙවිලා යන්නේ<br>පකද්කඩා කරත්තෙන්<br>බීමට වැටෙන්නේ<br>ඔහු නෑ කොයි කවුරුත්<br>රුස්සන්නේ<br>ලයිබ්රියේමයි ඔහු<br>මිය යන්නේ" |
| 23 | 'පිපාසය සන්සිඳුවන්න<br>මඩ වගුරකට හැකි වුවද<br>මහ සයුරට එය කළ නොහැකිය<br>එනමුත්<br>මහ සයුරෙන් ලාභ ප්‍රයෝජන ගොඩක් ලැබිය<br>හැකිය<br>එනිසා<br>මඩ වගුර ඉවතලා<br>සයුරට පත් වෙමි ' |
| 24 | "උපන් දා සිට විඳි දුක්<br>අහවරයි සිතා ගෙන<br>අම්මේ ඔබ එනවා අපි<br>හන්තාන පියස්සට<br>එහෙත් අපටද උරුමයි<br>කටුක වසන්තයක්<br>අයියලා අපට පිරිනමන<br>දන්නවා නම් ඔබ මිහිර එහි<br>පැළී මිය යාවි<br>ලේ ගලා<br>හදවතින්"" |
| 25 | "දෙවියන්ට එපා වු අඥෝනාව<br>ඉර හඳ ඉල්ලා<br>හඬන්නේ නෑ මම<br>මිණි කැට ඉල්ලා<br>හඬන්නේ නෑ මම<br>දෙවියනි -----<br>ඔබනේ පතනා එකම දෙය<br>කලු බට්ටිච මට<br>ලබා දෙන ලෙසයි" |

| | |
|---|---|
| 26 | 'කොපමණ වෙහෙසී<br>බුද්ධිය ලැබුවත්<br>බුද්ධින් හීනවුන්<br>මන්ත්‍රිවරුනට<br>හිස නමන්නට සිදුවී ඇත<br>බුද්ධිමතුනට<br>යදින්නකුට හිස<br>නැමිය හැක<br>මානයෙන් අභිමානයෙන්<br>හිස උදුම්මාගත් මොවුනට<br>හිස නැමිය නොහැකි මට" |
| 27 | විදුලි එලියයි පඬුවු පැහැයෙන් රැයේ (සිත)<br>නෙත පෙළන්නේ<br>පාට බොඳවුණු අකුරු මතු වී දුක කිසා (ගෙන)<br>ඉකි බිඳින්නේ<br>ඇත පැල තුල කුප්පි එලියෙන් අකුරු කරනා<br>ළමුන්නේ<br>විසල් ලෝකෙක අතර මං මට එන්න පාරක්<br>කියන්නේ |
| 28 | උපාධිය<br>පුස්කා<br>යෞවනය වියපත්ව<br>ජිවිතය හරසුන්ව<br>මිය යයිද<br>අතර මග |
| 29 | දැහැනින් මිදිම<br>ටොක ටොක ගා<br>කුර ගැටෙයි<br>අශ්වයෙක්ද<br>හරකෙක්ද<br>නැත නැත<br>පුස්තකාලයේ<br>එහා මෙහා ඇවිදින<br>ආඩම්බර කතකගේ<br>පාවහන් රිද්මයයි |
| 30 | මා විශ්වවිද්‍යාලයට පැමිණීමෙන්<br>දත් එකම දෙය<br>මා කිසිවක්<br>නොදන්නා බවය |
| 31 | තඩි රැවුල කරකවන<br>හඬ මහත්වු<br>ගෝනි බිල්ලෙකුවන්<br>විභාගය අත ලගය |
| 32 | තට්ටු පහක් උඩ පිට වැඩ හිඳිනා<br>බොග මරුවන් උදේ හවස වඩනා<br>ඉහල මාලේ කපල් කපල් ඉඹිනා<br>සාදු සාදු පොත් ගුල් හිමි වඳිනා |
| 33 | මගේ ගෙපැල ඔබය<br>මගේ යහන ඔබය<br>මගේ පෙම්වතිය ඔබය<br>සදාදර පොත් ගුල් රාජයාණෙනි<br>(තවත් එක් බොග මරුවෙක් නොවෙද?) |
| 34 | උපාධි දරය<br>මහා දැනුම ඇත්තකි<br>පොත් රාක්ක මැදින්<br>කලබලෙන් දිව ගිය නිසා... |
| 35 | ලෙඩෙක් වෙන්න පොත් වල කොල කඩාපිය<br>Class ගන්න ජෙල හොඳ හැටි කරාපිය<br>Exam එකෙන් A-B ගොඩ දමාපිය<br>ලෙඩෙක් ඩොකෙක් වී මිනිසුන් මිනිසුන් මරාපිය |

| | |
|---|---|
| 36 | සිංහල බී සී හොඳ හැටි උණු කරලා<br>Econ, Logic දෙක ඒකට වක් කරලා<br>අම්බානෙකට තුන් වසරක් ජප කරලා<br>Campus ආවෙ එලිවෙනකම් නිදි වරලා |
| 37 | අපේ දුක<br>ලොවින් වසන් කිරීමට<br>බැඳි පවුර හන්තාන -----<br>අපේ දුක<br>ලොවට හඬ ගා කියමින්<br>ගලනා නිදිය මහවැලිය ----- |
| 38 | ආලයට මං බයයි<br>ඇස් රතු වන නිසයි<br>නිදිමත මට හිතයි<br>සිහින ලස්සන නිසයි<br>සෙමෙස්ටර් නම් හොඳයි<br>හුදකලා වන නිසයි . |
| 39 | සටහන් අතරේ<br>නෙත් සිර වෙනවා<br>හදවත මාගේ<br>ඔබ වෙත එනවා<br>මා මෙහි තනිවම<br>ඔබ මෙහි තනිවම<br>දෙදනා දෙතැනක<br>සුසුම් හෙලනවා |
| 40 | සුදෝ සුදු ඔබේ කලුවන් කොණ්ඩෙ සුදෝ<br>සුදෝ සුදු ඔබේ නිල්වන් දෙනෙත් සුදෝ<br>සුදෝ සුදු ඔබේ පියකරු මුහුණ සුදෝ<br>සුදෝ සුදු ඔබේ මුලු ඇගම කලුයි සුදෝ |
| 41 | තුරු ලතා ඉකි බිදියි<br>ගිම්හාන රාත්‍රියේ<br>සඳ කිරන ඔබ වන්න<br>සඳ සිසිල ඔබ වන්න |
| 42 | තෙවසරක අවසානය උදවිය<br>නමුත් සරසවිය මවුනි<br>ඔබ හැරදමා ගමට යන්නේ කේසේද?<br>නමුත් අප යා යායුතුය<br>තවත් පිරිසකට ඉඩ දි<br>මේ සරසවි බිම |
| 43 | සරසවි කල්කයේ යථාර්ථය පරිදි<br>සාවුන් මුවන් සේම නයි පොළගුන්ද<br>සිටින බව වටහා ගැනීමට හැකි විය<br>එයට බෙහෙවින් තුටු වෙ<br>“එයයි මම අවසානයේ උගත් එකම දෙය" |
| 44 | ඔබ හිනයක්<br>රැයක් දවාලක් නැතිව<br>දෙනෙත් ඉම බිදෙන<br>නැකත් වෙලවක් නැතිව<br>සිත වල්මත් කරවන<br>පාලුවේදිත් නොතනියේ දිත්<br>හදවතේ රැදෙන<br>ඔබ ලස්සනම ලස්සනම හිනයක්<br>කිසිදා සැබෑ නොවන |
| 45 | ඔබ මලක් වෙලා පිපුනත්<br>සුවඳක් වී ළග ඉන්නට බැරිනම්<br>මට කුමටද මල් උයනක්<br>ඔබ සුවඳක් වීහැමුවත්<br>වෙන මලක් පත්ලේ නම් මල් රොම්රුදුනේ<br>කුමටද මලක් වී මං<br>ඔබ මල් කැකුලක් වී නම්<br>අන්සතු මල් උයනක<br>ඔබව දකින්නට<br>කුමට දෙනෙත් ලැබ මං |
| 46 | සෙව්වා මම<br>කල්පයකට පෙරාතුව සිට<br>මම දකින දීප්තිය<br>සතු වුනා නුඹට එය<br>ඒ සොඳුරු නිල් දෙනෙත<br>මගේ ලෝකය<br>මටම අමතක කල<br>සතුවුනා සදහටම මම<br>ඒ නුඹේ ආදර දෙනෙත |
| 47 | අධිෂ්ඨානය සෘජු නම්<br>උත්සහය දැඩි නම්<br>පැතුමන් අවංක නම්<br>හෙට දවස සුන්දර වනු නොඅනුමානය |
| 48 | හිරු මියෙන<br>සඳු පිපෙන<br>නිල් රැයක<br>කඳුලකට<br>ඉව කරන<br>නෙතු කොනට<br>සිනාවක<br>මුදු සුවඳ<br>තුරුලු කර<br>වඩිනු මැන<br>සිහිනයක<br>එළි නොවෙන |
| 49 | විමසුමට හමා ආ මඳ පවන<br>ආවෙහිද රැගෙන සුපුරුදු සුවඳ<br>සෙවුයෙම් රැයේ තරු රැසි කර<br>විදුල නෙතු පහන් යුග තිබුණාද<br>පිරිමදිම් කුසුම් පෙති සෙනෙහසින<br>දුර සසර හුරු පහස දැනේවිද<br>විදිම් නිරන්තර මා තුලට<br>දකිනු නොහැකි කොහේ නැලවුනිද |
| 50 | හදවතේ රිද්මය<br>ආදරය නිසාමය<br>නොඑන නින්දක්<br>ආදරය නිසාමය<br>නොමැති නම් ආදරය<br>නොපවතී කිසිවක් මේ දෙරණ<br>ඔබත් නැත<br>මමත් නැත<br>බිඳෙන සුසුමන්<br>ආදරය නිසාමය<br>මෙතුවක් කඳුලු වැල්<br>ආදරය නිසාමය<br>ආදරය පුදුමාකාරය<br>ඔබව නොදැක<br>සිටිය නොහැක්කේ<br>ආදරය නිසාමය |

| | |
|---|---|
| 51 | හයියෙන් හිනාවෙන්න<br>පුලුවන්නම් ලස්සනට<br>ඒත්<br>ඒ හඩ අතරින් කඩා හැලෙන<br>කඳුළු බිංදු හංගන්න<br>වෙන මගක් හොයා ගන්න<br><br>මා වෙතට ලං වෙන්න<br>නුඹේ හිත දෝරෙ ගලන දුක<br>මගේ හදවතට බරක් නොවේ ඉන්<br>දරා ගන්නම් මම<br>සැහැල්ලු වේ නම්<br>නුඹේ හදවත ඉන් -----! |
| 52 | <br><br>මන්දාරම් මෝසම් වැහි<br>බිරුම් දෙන පාලු මැදියමේ<br>තනි නොතනියට ළග උන්නු<br>නුඹේ නම කුරුටු ගෑ<br>නිල්පාට තරු කිනිති<br>අනේ අද<br>දුර ඈත තනිවෙලා |
| 53 | **රවී** -----<br>නුබෙන් පිපෙන්නට<br>වරම් ලැබෙන්නේ<br>ආඩම්බර නෙලුමක් මිස<br>අවිහිංසක<br>කුමුදු නොවේ |
| 54 | දැඩි තාපයෙන්<br>මා දවාලන<br>රිවි මඩලක් නොවී<br>බැරිද නුඹට<br>මා ළග පායන<br>සෞම්‍ය සඳ වන්න |
| 55 | ගල් ඇති බතී<br>කිරි නැති හොද්ද<br>හොවා දී මට<br>එපා කෙරුවා සරසවි දිවියම |
| 56 | විභාගය ලංලංව පැමිණෝ<br>නොසිතාම අන් දෙයක් ජීවිතේ<br>යලිදු පොත සිබිනු සොදවා<br>වේලාව නොවරදවා |
| 57 | **සරසවිය**<br>පින් ඇත සබඳ<br>ඔබ හා ඉන්නට<br>එනමුදු ඇත්තට<br>නැත සුවයක්<br>නුඹේ ලයේ<br>පොත් මිටිය ලමැදෙ හොවා<br>නුබ සමග ගෙවන මේ<br>දිවිය කටුකය, තිත්තය |
| 58 | මං ජිවිතේ හින දකිනවා සුදු<br>මාත් ආසයි අම්මා කෙනෙක් වෙන්න<br>පුංචි දඟකාර හුරු බුහුටි<br>කොලු පොඩ්ඩෙක් අතින් අල්ලගෙන<br>ආඩම්බරයෙන් ඇවිද යන්න<br>පාට පිරුනු හැන්දෑ වරුවල<br>ඔයාගේ අතේ එල්ලිලා<br>ඈත සිතිජය දිහා<br>පැය ගණන් බලන් ඉන්න<br>කවදාවත් ඉටුනොවන<br>දඟකාර සුන්දර හීන<br>මම හැමදාම දකිනවා සුදු |
| 59 | සරසවියේ බොග දැම්මට දිගට හරහට<br>සත්තකටම මට තිබුනේ C- ටික<br>උසස් පෙලින් ගොඩ ගිහිල්ලා ආපු දසාව<br>හැඩුවා කන කොකා වගේ ආපු ගමන්ම<br>සටහන්වල අකුරක්වත් බෑ මතකේ තබා න්න<br>end එක ලග ලගම උනත් මට බෑ පොර<br>නොදැක ඉන්න<br>වැදලා කියන්නම් ගැටඹෙට කඩ්ඩ රිපිට්<br>යවන්න<br>අවසර දෙනවට මට 2nd රෙපි වෙන්න<br><br>දෙවියන් ප්‍රතිපල හොදවී බැජ් එකෙම බඩුව<br>වෙන්න<br>පඩුරු අනේ ගැට ගැහුවත් තව බැරිවුනි එය<br>කරන්න<br>ප්‍රතිඵල මගෙ අඩු උනාට එපා අම්මේ එය<br>අහන්න<br>ඒ ඇති වගේ ඉන්න තුරා මගේ මේ හිත<br>හදාගන්න |
| 60 | සදෙව් ලොවක් පිට ඉන්නා දනන් හට<br>මහදුක් ගොඩක් මෙලොව ආ දනාහට<br>නිදහස් ගඟකි හැමදෙන පවසනා ලෙස<br>සටහන් පැවරුම් ගොඩ ගැසුනයි දිනෙන් දින |
| 61 | ගගනයෙන් වැටෙන පිණ තණ පියස<br>සිපගද්දි<br>සුවදකින් පිපුනු මල් නටු අගදි<br>සරසද්දි<br>හැඩවෙමින් සදමඩල අහස් ගැබ<br>සිප ගද්දි<br>පිටවුනා කදුලු කැට සරසවිය<br>සිහිවෙද්දි |
| 62 | සිහිනෙන් පවා ඇවිදින් රස වින්ද<br>සරසවි බිමට එන්නට මට පින්ලන්ද<br>සිහිනෙන් පවා ගම රට යන්නට බැරිව<br>සටහන් ගොඩට යටවී කදුලැලි වින්ද |
| 63 | සරසවියට පැමිණුනා එය දුක් ගොඩක් වුනා<br>සරසවි බිමේ ඔබ මට සොහොයුරෙක් වුනා<br>අපේ ඇසුර දැන නොයෙකුත් පද හැදුනා<br>අපේ හොදට අපි දෙන්නම පිටි වුනා |
| 64 | කන්න බෑ කියයි<br>මාළුව රස නැතෙයි කියයි<br>නින්ද නෑ කියයි<br>සටහන් ගොඩ ගැසී ඇතෙයි<br>මටත් ඉන්න නෑ<br>මට මං ගැනම කල කිරෙයි |

| | |
|---|---|
| 65 | ඔබ<br>සුලඟට නොසැලෙන<br>හන්තාන වගෙයි<br>මම<br>වතුරට බොරවෙන<br>මහවැලිය වගෙයි |
| 66 | ජීතේ විඩාවෙන්<br>සිරවෙලා පිටු අතර<br>යොමා සිටියද දෙනෙත්<br>සිත දුවයි දහස් අත<br>කවදාද නිමවෙන්නේ<br>යෞවනේ ඉකිබිඳුම |
| 67 | හිරු මියෙන සැඳෑවක<br>නිමා වී නම් සතුට<br>ඒ දුකට හඬන්නට<br>හදවතට නොකියන්න<br>යලිදු එයි හෙට දිනක්<br>දෝතින්ම පිළිගන්න |
| 68 | **ජීවිතේ**<br>මහා වාලුකා තලයක්ම<br>හඬා වැටෙන කොට<br>පුංචි දිය බිඳිත්තක්ම<br>කඩා වැටුනෙණ මැයි නුඹ<br>මහා මේඝ වැස්සක් නුඹ යැයි<br>හිතාගෙන ----- |
| 69 | නියං කුරුල්ලෝ හඬවාවී<br>තුරුලතා වියැකී හැලේවී<br>සරසවියම ඉරිතලා<br>නිවන්නට ගිණිගත් දහය<br>කඳුලු වැස්සක් වැටේවි ----- |
| 70 | හිත් පිණි බිඳු සමඟ<br>අතිනත ගෙන<br>හන්තාන මද පවන<br>මෙහි එන්න-----<br>සෝ ගින්නෙන් ඉකිබිඳින<br>මගේ හදට වැද ගන්න<br>හන්තාන කඳු පියස -----<br>මැණියන් අහක නැති නිමේෂයක<br>මගේ හද ස්නේහයෙන්<br>එක බිඳක් සොරාගෙන<br>මගේ ඉහට වියන වන්න----- |
| 71 | ගිලි යන කඩදහියේ<br>කවියක්ව ඔබ ඉන්න<br>මා ලියන පෙම් ගීයේ<br>තනුව වී නුබ ඉන්න<br>ආදරයේ සිතාරයේ<br>ස්වරය වී නද දෙන්න<br>ජීවිතයේ යුග ගිය<br>මා සමඟ මුමුනන්න |
| 72 | සෙනෙහස මඟ ඉහිරිණි<br>සසර කළ පවකට<br>අඳුරැය මුළු ජීවිතයම<br>පුංචි තරුවක්වත්<br>නැති තරමටම |
| 73 | සුභ පැතුමක් සේ හන්තානයේදී<br>සිතට තුරුළු වී මැවිසිනා<br>මහවැලි නදියේ ගඟ දිය අතරේ<br>සැගවිණ නොසිතුව විලස එදා<br>තැනු වැලි මාලිඟා රැදූ රළ පහරින්<br>සුණු විසුණුව ගිය විටෙක හඬා<br>කිරි දරුවෙකු සේ වැලපුණ මුත් අද<br>දුර ඇතයි නෙතු ඉමට එහා |
| 74 | A නාවත් කමක් නැතේ C+ මට ඇතේ<br>B නාවත් කමක් නැතේ C- මට ඇතේ<br>ඕනෙ දුකක් ඉහිලිය හැකි තරුණ ජීවිතේ<br>ඒත් ඉතින් පොර නාවොත් දුක වැඩියි හිතේ<br><br>කුසගින්නට රස මසවි තිබුනත් මොකටද<br>ගෙදරින් කන ලුනුයි බතුයි වටිනවනෙ මට<br>හොස්ටල් එක දග ගෙයක්ද දගගෙයි ලැමට<br>ලොකුම වරද උසස් පෙලින් අපි ගොඩ යැමද<br><br>පසලොස්වක පොහොය දාට ගැටබේ විහාරෙට<br>ගිහින් පැතුවේ විභාගයෙන් අපි ගොඩ යැමට<br>Econ සර් මතු බුදුවෙයි එකක් කලොත් හෙට<br>ඔබේ අතින් ලකුණු ටිකක් ලබාදෙන්න මට |
| 75 | **විභාගය අපට කල හදියක්**<br>දිය බිඳක්<br>සොයා ගිය සඳ<br>පිපාසයෙන් එදා<br>සාදරෙන් පිළිගනී<br>දෑත පා බදා ගත් නුඹේ<br>රළුපහස දැනුනෙන් මෙදා<br>නොපත නම් - නැවතනම්<br>නො එනුමැන<br>යළි ඉතින්<br>ජීවිතය නුඹේ නොවේ<br>අපේමය |
| 76 | පුංචි කුටිය<br>නුඹට තුති<br>ගෙවුණ යුගයට<br>දුන් ඒ සෙවණට<br>මා වෙන්ව යන විට<br>එපා නුඹ වැලපෙන්න<br>නුඹට දයාබර<br>මුදු සිතැත්තියක්<br>ඒවි නෙවැ හෙට<br>මා මෙන්ම<br>නුඹව තනිකර යන සඳ<br>නුඹ වැලපේවි නැවත<br>හමුවීම වෙන්වීම<br>ලොව දහම නම්<br>කෙලෙස අපි එය දිනමුද ? |
| 77 | ඔය නෙත් අහිංසකයි<br>ඒ අහිංසක නෙතින් නුබ<br>සිනහ වන විට<br>මහද සන්තානයේ<br>සතුටු අරවින්දයක්<br>සනසයි නිවාලයි<br>හැම දුක් වේදනාවක්ම ----- |
| 78 | විභාගය<br>නුඹ අපිව<br>නොමරා මරණවා<br>කුමක්ද මේ<br>සතුටක් සැපක් නැති<br>ජිවිතය |
| 79 | මෙතුවක් ආමි මගු කඳුළැල් ලකුණු තියා<br>නොදනිමි තාම ආවේ මොනදේද සොයා<br>හැම මොහොතකම විසිතුරු රස සිහින වියා<br>මම එය කඩා දැමුවෙමි එය මදිය කියා |

| | |
|---|---|
| 80 | විභාගය හිතට මහ බරක්<br>අවකලනය කිරීමට නොහැකිව<br>ඔද්දල් වී ඇත මසිත<br>සාපේක්ෂවාසි නිරපේක්ෂවාසි<br>නිශ්චායක අතරගෙවී යයි යෞවනය<br>Mid , END, Semester දක්කයි<br>අරුත් සුන් ලොවකට ----- |
| 81 | සටහන් මිටිය සමනළ කඳු මුදුන වැනියි<br>නිදිමත දැනේ නෙත්දෙක කඳු වැටිය වැනියි<br>දහඩිය මුගුරු සාගරයේ ජලය වැනී<br>ඇණුනොත් විභාගේ අපි බලු පැටවි වැනි |
| 82 | ඒමට පෙර<br>සිහිනයකි - දෙව්ලොවකි<br>අනාගත දෛවයකි<br>පැමිණි පසු<br>මුලාවකි මිරිඟුවකි<br>කාලේකන ගුහාවකි<br>සරසවිය |
| 83 | නපුරු ඇස් ළඟ දැහැන් ගත වුණා<br>හීන හරි මනරම්<br>යන්න යන විට හිත රිදෝගෙන<br>නුඹ හුඟක් ඉක්මන්<br>මහා තනියක ගිලි කඳුළක<br>සංසාර සක්මන්<br>නුඹ ගියා මා දමා තනිකර<br>අතීතේ සිතුවම්<br>තබා මා දුක මා දෙපා මුල<br>කියා දුන් කවිකම්<br>එක ඇසිල්ලක ගොලුව ගිය වග<br>කෙලෙස මා අදහම්<br>නුඹෙන් හිස් වු හිස් අහස යට<br>කොයිද මට සැනසුම්<br>මහ මෙරක් දුක උහුලගන්නෙමි<br>කියා මගේ පව්කම් |
| 84 | සරසවිය කෙම් බිමකි<br>නමුත් එහි රැදෙන්නට<br>වරම් ලද මුත් අපත්<br>අහෝ !කලකිරුනි<br>මේ දිවිය කටුකයි<br>අම්හිරියි හද රිදුම් දෙයි<br>මේ කටුක මාවතෙන් ගොස්<br>සිප් සතෙහි දුටුවොත් තෙරක්<br>මම නොව තුටු වන්නේ<br>මාගේ රත්තරන් දෙමා පියන්ය |
| 85 | දුරකථන ඇමතුම ලැබෙන තුරු<br>බලා සිටියෙමි<br>ඇසෙන තුරු ඔබේ හඬ<br>දුරකථනය නාදදෙන නේක වර<br>තිගැස්සුනු සිත වහන් කරගෙන<br>බලාපොරොත්තුව දෝත දරා<br>ඇවිද ගියෙමි ඔබේ හඬ<br>අසන්නට -----<br>නමුදු පෙම් පැතුම්<br>විසුණු කර<br>මගේ ඇස් අද්දරට කඳුලු දී<br>ඇයිද ඔබ<br>නිහඬව සිටින්නේ -----? |

| | |
|---|---|
| 86 | සොදුරු පැතුමන් පොදි බැඳන්<br>හන්තාන පාමුල කල් යවන්නට<br>අහිංසක සිත් තුරුළු කරගෙන<br>කුරුළු දෙනෙත් ඉහිලුණා -----<br>මහා කුණාටුව පැමිණෙන තුරු<br>නෙදත් ඒ විහඟුන් සියල්ලන්<br>සුළඟ හමන දිශාවන් හට<br>දස අතේ උන් ඉහිලුණා-----<br>තෙරක් නොපෙනෙන අනන්තය දෙස<br>දෑස් දල්වා මුව අයාගෙන<br>යනෙන සීමා අත බදාගෙන<br>අනේ උන්හැම විදි දුකක් -----<br>නොමැත කිසි සරණක් අදත් ----- |
| 87 | **පරාජිතයාගෙන් තෙවැන්නාට**<br><br>පලා ගිය ජිවිතය<br>ගලා ගිය සෙනෙහස<br>වියලා දැමු<br>ගිම්හානය නුඹ<br><br>සරසවිය සුන්දරයි<br>සරසවි නාවා නම්<br>ආලය සුන්දරයි<br>ආලය නොකරානම්<br><br>තවත් කෙනෙකුගේ<br>ප්‍රාර්ථනා පහනට<br>තෙල් දමා<br>පහන දල්වන්නට<br>තරම්<br>මා ප්‍රබල වුවා නොවේ<br>ඔබ මාව<br>වැරදියට තේරුම් ගත්තා මීස |
| 88 | <br>සහසක් මාවතින් පිරුනු<br>හන්තාන අඩවියේ<br>ඔබ දුටුවේ<br>අරගලයේ විප්ලවීය මාවත<br>පමණි<br>සහසක් මල් පිපුණු<br>සරසවි පින්බිමේ<br>ඔබ දුටුවේ<br>රතු මැයි මල් පමණි<br>ලොව සියල්ල දුටු<br>ඔබ<br>නුදුටුවේ<br>මගේ ආදර නෙත් පමණි |
| 89 | **සමාසිනේ**<br>එසයිමන්ට් ගගේ ගිලේ<br>ලකුණු නොලැබෙනේ<br>සෝසෝ පොලිටිකල් අනේ<br>දෑස් නිදි කිරා වැටේ |
| 90 | අද නොවේ හෙටත් ගෙවේ<br>මේ සමාසිකේ<br>තාම එන්ඩ බෑ ගමේ<br>පෙම්වතානෙනි<br>ජිවිත අනේ අපේ<br>මේකදැයි සිතේ<br>හෙට උදේම ලෙක්චර් එකට<br>යා යුතුව තිබේ |
| 91 | විභාගය වනාහි මිනිසෙකු<br>මරා උපදවන මහත් වු පාප කර්මයකි |

| | |
|---|---|
| 92 | සංඛ්‍යාන මහා විද්‍යං<br>ඒ බිද්‍යං අනේ භයං<br>විශ්ව විද්‍යාලං එපා කරං<br>ප්‍රශ්න පත්‍රං පිස්සු වට්ටං |
| 93 | හා හා හරි හාවා<br>ගෙදර ගිහින් ආවා<br>රෙස්ට් ගනිව්යි කිවා<br>ඇඳ උඩ දිග ලෑවා<br><br>එළාම් එකත් වැදුනා<br>පොත දිග හැර ගත්තා<br>නිදිමත වගෙ දැනුනා<br>ආයෙත්----- මම නිදියම් කිවා |
| 94 | පුරන් වූ<br>ජීවන කෙතේ<br>ඔබ වැපුරූ<br>සෙනෙහසේ බෝග<br>මල් එල ගැනුනා<br>සිතම සන්සුන් කොට<br>ආදරයේ කැටයම්<br>සිති සඳකඩ පහණෙහි<br>නෙලූ<br>දයාබර ඔබ<br>කවියක් වූ අපූරුව<br>හිස් වූ හදවත්<br>පත් ඉරූ මත |
| 95 | ඔබ ගාත්‍රාක්ෂරයක් වූ සඳ<br>මම ස්වරයක් විමි<br>එ සඳ උපසර්ග වී<br>ඉකුත් වත්<br>කල් ඉකුත්-----<br><br>ආගම වියැ<br>තවත් ස්වරයක්<br>ඔබ අසලටම<br>එකල්හි ඔබ<br>අන්තස්ථ අකෂර්යක්ම වී----<br><br>ඉදින් නුඹ<br>පූර්ව ස්වරය ලොප්කොට<br>පරස්වරයම සමඟ<br>සන්ධි වූයේ කිම----- |
| 96 | **ආදරණීය විප්ලවය**<br>නුඹ මට හිමි කලෙත්<br>අහිමි කළෙත්<br>මනුෂ්‍යත්වයේ නාමෙන්<br>ආදරය<br>ආදරයම පමණයි |
| 97 | **සරසවි බිම**<br><br>වීසිරුනු ඇහැල මල් යායට<br>ඔච්චම්රකර හිනාහුනා විනා<br>උනේඅපෝයි කියන්නට<br>කම්පිත නොවන<br>දරදඬු සිතක්<br>උරුම වූයේ<br>උඹ කරපු<br>මම කරපු<br>කුමන පවටද? |

| | |
|---|---|
| 98 | කාමරයට ආමි<br>බැලුබැලූ බොහෝදෙනා<br>නිදි හෙයින්<br>මම නිදාගතිමි |
| 99 | බෝග යනු කුමකුද?<br>කැමක්ද? බිමක්ද?<br>සිතාගනු බැමට<br>සියලු දෙනාම<br>එක්වී<br>දිවා රෑ රස බලයි<br>නමුත්<br>ඇයි මට පමණක්<br>බෝග කැමක්වත් බිමක්වත්<br>නොවන්නේ |
| 100 | මා මේ සරසවියට<br>පැමිණ දැනගත්<br>එකම දෙය නම්<br>මා කිසිවක් නොසදන්නා බවයි |
| 101 | ලග සිටියා නම්<br>පොළවේ ගැසිය හැකි<br>ජංගම දූරකථනයක් ඔබ<br>කිසිදු ප්‍රතිචාරයක් නොමැති |
| 102 | ඔබ තල් ගස<br>නම්<br>මම<br>එගස මල වෙමි<br>මන්ද<br>මට ඔබ සමග<br>මිය යෑමට අවැසි බැවින්<br><br>එදා නිදිවැරූ<br>දැසින්<br>සිහින දුටු<br>සරසවිය<br>මෙදා<br>යථාර්තයක් වූ<br>අරුමය<br>කරුමයක<br>තරමය |
| 103 | විභාග ශාලාව තුළ<br>සමාධි පිළිම සේ<br>දැහැන් ගත වීමු අපි<br>කෙසේ ලියමිද<br>කුමක් ලියමිද<br>නොසිතේය මට |
| 104 | ආදරය වංචාවකි බොරුවකි<br>මංමුලා නොවන්න |
| 105 | සරසවි ඇවිත් කල් මැරුවේ අපි එකට<br>පැකල්ටියේ වාත වුනේ අපි එකට<br>ගෙදර ගිහින් හිටි සතියේ පමාවට<br>ඇයි බැජියේ හිමි උනේ ඔය ලෙසට |
| 106 | **ප්‍රශ්නාර්ථය**<br>හේතු ප්‍රත්‍ය<br>ඇතත් නැතත්<br>දෙපැත්තම<br>පෙති ගසන<br>කඩුවක් |

| | |
|---|---|
| 107 | සරසවි බිම  පුරා මල් වැසි වසින විට<br>සිරි සරසවිය කොහි සැගවුනි කියන් මට<br>ගිල්පය පසෙකලා පෙම් සුව විඳින කොට<br>අනේ අපොයි End එනවා අත ලගට |
| 108 | සිද්ධාර්ථ බුදුවන විට බෝ සෙවනේ<br>නේරංජනා ගඟ සුපුරුදු ලෙස ගැලුවේ<br>මා සරසවියේ ඇවිත් ඩිග්‍රිය ගත් දවසේ<br>මහවැලියම ඇයි ඉකි බිඳ බිඳ හැඬුවේ<br><br>බුදුබව ලැබුදා දෙවියොත් ඇවිදින් වැන්දා<br>ඩිග්‍රිය ගත්දා සරසවියත් දොර වැහුවා<br>රැකියා පොලිමේ අහුමුල්ලක් අල්ලා<br>බුදු සවි පෙරහැරත් සිහිකරමින් උන්නා<br><br>වසරක් පසුව ඔබ සරසවි පැමිණි නමුත්<br>හදවත පිලිනොගනි ඔබ හමුවේ හිත යටපත්<br>ලැම්බට් වෙන්න හිතුනත් මල්ලියෙ මටත්<br>නංගිත් එක්ක උඹ හිටියා අද හවසත් |
| 109 | **පිළිතුර**<br>අක්කන්ඩියේ නුඹ නොසලන් කඳුළු කැට<br>පෙම්වත් කුමාරෙක් ඒවිය හෙට නුඹ වෙතට<br>ලැම්බට් වේවි පව් නොකරන් ඔය ලෙසට<br>හිටියෙත් මෙය යහපත නුඹේ අනාවට |
| 110 | **අභියෝගය**<br>දෙන්නා කැමතිනම් නංගියේ හෙම නොසිතන්<br>ඊර්ෂ්‍යාව හදතුල සඟවා හිටපන්<br>උඹට මොකද මල්ලිත්හරි කැමතිනම්<br>අයියලා වග කියද්දිත් මොකටද නොතරවී<br><br>හැගිම් පහළවේ අක්කේ හැම මොහොතේ<br>හැමටම ඉඩදිම අනුවණ කමක් හිතේ<br>ඉරිසියා නොවේ ලැජ්ජාවයි මට ඇත්තේ<br>දෙනකම් අයියලද පස්සෙන් එනු ඇත්තේ<br><br>ඇත්තම තමයි නංගියේ උඹ කියන හැම<br>එක නැට්ටේ දෙහිවල ඇති අසම සම<br>කියන්න ඕනේ නැහැ නංගියෙ යලියලිම<br>අයියා මලෝ හැම එන්නේ අතින්නම |
| 111 | **සමතය**<br>තර්ක කලා ඇති දැන්නම් අක්කා නගෝ<br>නැත්නම් වේය මහා ගැටමක් හනික සබේ<br>ලව් පලහිලව් ගැන නම් නැත කියනු හැකේ<br>දෙදෙනම කිව්දියන් බව නම් සැකක් නැනේ<br><br>ලැම්බට් වෙන්න හිතුවත් මුළු ලොවට හොරා<br>ආල පලහිලව් සඟවනු කොහෙද ඔයා<br>අඩියක් තියා ඉස්සරහට ගත්ත නිසා<br>අක්කණ්ඩියේ නුබ ගැලවුනේ පිනක් නිසා |
| 112 | Assiment භයංකාරං<br>බලන්නට පොත් දුර්ලභං<br>ලියන්නට කාලය සීමිතං<br>සදා කල්හිම අපි අතරමං |
| 113 | කාලය = පිවිතය<br><br>අතිතය = ඊයේ ගෙවී ගොසිනි - මතකය<br>වර්තමානය-----= අද ගෙවි යමිනි - මධ්‍යස්ථය<br>අනාගතය ? = හෙට උදා වෙමිනි –<br>අවිනිශ්චිතය |

| | |
|---|---|
| 114 | නුඹ -----<br>රෝස කටුවකි<br>ලංව විත්<br>මගේ සිත<br>සිදුරු කළ |
| 115 | නිදිවරන් වෙහෙස වී<br>අකුරු කළ මුත් අපට<br>ගිය පසුව නික්මී<br>ලද හැකිද?<br>ජයක් හෙට<br>Exam නැත<br>සිත නිරවුල්ය<br>ගත සැහැල්ලුය<br>සැමදේම සරිය |
| 116 | පැය ගණන් නිදිවරා<br>ලබාගත් උපාධිය<br>සොච්චන් පඩියකට<br>හැල්ලු වී යද්දි<br>විටෙක මට සිතේ<br>ජිවිතේ මා ලැබූ<br>ලොකුම පරාජය<br>උපාධිය ලබා ගත් බව |
| 117 | නිදි දෙව්දුව කලු සලුවෙන් නෙත සරසනවා<br>පාඩම් පොතට හිරවුණු සිත විසිරෙනවා<br>බොග නොදමා ගොඩ යන්නට බැරිවෙනවා<br>බොගෝ උඹට Class අරන් පිටවෙනවා |
| 118 | දරමි තැත්<br>අර ඈත ජේන<br>පහන් කණුව යට<br>අඳුර නොවී<br>එහි එන ආලෝකයක් විමට |
| 119 | බැහැ පොත දෙස බලන්නට මුළු ඇග<br>වෙව්ලනවා<br>හිස කැක්කුමයි ඔලුවත් බරවී එනවා<br>හිත චංචලයි Exam ළගළග එනවා<br>දිවි තොර වුනත් බොග ගැන සිතුමට එනවා |
| 120 | බොග්ගෝ හමස්මි ලෝකස්ස<br>විෂයෝ හමස්මි ලෝකස්ස<br>ක්ලාසෝ හමස්මි ලෝකස්ස<br>සමාසෝ ජාති<br>නත්ත්දාහෝ පුනබ්බෝ |
| 121 | වෙන්කර ඇතත් උරුමයි මගේ අගේ කියා<br>පිම්මේ දුවයි රියදුරු මාරයා සොයා<br>අන්තිම කැමති පත්තරයක් ලියා තියා<br>රන්කඳ ඔන්න මම කහඉර දිගේ ගියා |
| 122 | සතයක් නැති - පොකුරක් නැති<br>කැමක් නැති - බොග නම් ඇති<br>මේ කරුම වසන්තයේ<br>අපි අසරණ වෙලා වගේ<br>හිතට දැනෙනවා<br>උපකුලපති තුමනේ ------ |
| 123 | ලැබිය යුතු දෙයක් වේ නම්<br>සුදුස්සාටම ලැබිය යුතු මැයි<br>උපාධිය ගෙන කරපිටින්<br>අපිත් ඉමු හෙට පෝලිමේ |
| 124 | සරසවි ආමි<br>හොස්ටල් කුරුටු ගී බැලිම්<br>ආපු ආපු හැමදෙන<br>කවි ලියූ හෙයින්<br>නොලිම් |

| | |
|---|---|
| 125 | නංගියෙ මේ බිමට නුඹ ආගන්තුකය<br>වීටකදි ගල් බොරලු මෑදූ පාවඩ වැනිය<br>එනමුදූ විටෙක මල් වල මුව වස විෂය<br>ඒබව ඉතින් දැනගෙන හිටියොත් හොඳය |
| 126 | Frist year ගොන් පාටි<br>Second year බෝඩිං බොගට<br>Third year full සීනියර්<br>Fourth year යන්නං මචං |
| 127 | අපට - එරෙහිව<br>තාඩන - පීඩන<br>දැවැදි - දූෂණ<br>කුමරී - බඹසර<br>සොයුරිය - අත්වැල්<br>තවතව තරකර<br>ඉදිරිය යමු<br>පවිටු වදන් බිඳ |
| 128 | ජීවිතයම විභාගයක් ලෙස<br>සිතූ මා<br>දහසක් පැතුම්<br>හද පුරවා ගෙනම<br>ලිවා<br>ඒත්<br>අසිරුතම වු Semester එක නිසා<br>අවසානයේ<br>උරුම දුකකි මට |
| 129 | බුද්ධිමතුන්ගේ පරාදීසයට<br>පැමිණියේ දහසක් පැතුම්<br>තුරුලු කරමිනි<br>ඒත්<br>දින සති ගෙවියන විට<br>සරවිස දිවිය මේ යැයි<br>වැටහෙන විට<br>නෙතට කඳුළක් නැගෙන්නේ<br>නිරයාසයෙනි<br>පිරපුන් මිනිසෙකු වීමේ<br>පරම අදිටනින් යුතුව<br>වෙහෙස විය<br>දැඩි සිතින් |
| 130 | පොත අතට ගත්තට පාඩම් කරන්නට<br>හිත ඇදි යන්නේ වල්පල් දොඩන්නට<br>දැන්නම් හදන්නේ මා නම් නිදන්නට<br>මොනවා ලියන්නද මා දැන් විභාගෙට<br>මන්ද ? ----- මා<br>පසුපසම<br>නිදිමත |
| 131 | සෙනෙහස සෙවිල්ලක් කරන්<br>එක කුඩුවක් වන දිනක්<br>වෙනකන් පරිස්සම් වෙමු<br>කවුරුත් දකින්නට කලින්<br>පදයක් හදන්නට කලින්<br>ඉවසන්න කියා වෙන්වෙමු |
| 132 | Special සිහිනයක් පමණයි<br>සැබෑ සුවදක් නෑ<br>එදා Political නොකෙරුවා නම්<br>මෙදා වියවක් නෑ |

| | |
|---|---|
| 133 | ජීවිතයේ මේ කෙටි කාලය තුළ<br>මාරාන්තික බොග විකාරයෙකු<br>නොවන්න<br>පසුවට පසුතැවි<br>ඔබම<br>තනියම බුදූවන්න<br>නොවන්න<br>අනෙකටත් මාර්ගය<br>කියා දෙන්න |
| 134 | ඉසිඹුලන නිමේෂයේ<br>හන්තාන අඩවියේ<br>පෑයුසරා සඳ<br>නොසලන්න මුතු කඳුළු<br>දිරි ගන්න ජයගන්න<br>ගැහැණු කමේ<br>වටිනාකම<br>පරයමින්<br>බමුණු මත<br>ඒ<br>පුරුෂාධිපත්‍යය |
| 135 | ශාස්ත්‍ර පීඨයේ කුරුටු ගීත ලස්සනයි<br>ඒ ලස්සන ගී ලියන්න බෑ මට දුකයි<br>මුලු බිත්තිය පුරා ලීවේ එක ජේලියයි<br>මුලු හදවතින්ම මං මේකට ආදරෙයි |
| 136 | අනේ අනේ සමාසිකය<br>අපව කෑව සමාසිකය<br>කවදද අපි ගොඩ එන්නේ<br>කාලකන්නි සමාසිකය |
| 137 | සිහනයක අග<br>කඳුළු තැවරුව<br>එකම පැතුමක<br>මල් පුබුදූ කළ<br>ජීවිතය තුළ<br>බරක් තැවරුම<br>සරසවිය තුළ<br>දැනෙයි පාළුව |
| 138 | යහලුවො නම් ඇත<br>නමුත්<br>සිතාගන්නට අපහසුය<br>හදවතින්ම මිතුරුද කියා<br>හමුවූනිය<br>යහලුවන් මටද<br>නමුත්<br>හදවත් ඇත්තේ<br>අතලොස්සකට පමණි<br>හැඬුවෙමි වැලපුනෙමි<br>හිත හැදූවේ යහලුවන්ය<br>හඩන්නට නෙතට කඳුලැලි දූන්නේ<br>සැබෑවටම<br>මිතුරියන්මද?<br>කියාදෙන්න මට<br>කෙලෙසින් වටහා ගම්ද?<br>මිතුරියන් ගැන |
| 139 | දෑසේ නිදිමත සිඹ සනසන්නට<br>ටියුබ් බල්බ් එක එලිය ගෙනෙයි<br>සම්ප පුටු දෙක හිස් වී ඇති සඳ<br>ඇදට යන්න සිත සුසුම් හෙලයි |
| 140 | දෙනයනට නැග එන කඳුළු කැට<br>පිසලන්න මුදූ දෙඅත් එක්කොට<br>සිටිය සකිසඳ නුඹ නොමැත අද<br>මෙය නොවෙද ජිවිතයේ තනිකම |

| | |
|---|---|
| 141 | **විභාගය**<br>විඩාබර නෙත් සඟල<br>නොසන්සුන් හඳ මඩල<br>ජීවයෙන් සමුදෙන්න<br>නිවහනට ගොඩවෙන්න<br>අනේ මට ඉඩ දෙන්න<br>තවතවත් දුර නොයා<br>හෙට දිනෙන් සමුදෙන්න |
| 142 | විශ්ව දැනුමක් පතා ආ මුත්<br>නොලැබ මද දැනුමක්<br>පතා ආ මග නොලැබ දැනුමක්<br>යන්නට නොදී ඉඩ හසර<br>බොග දමන්නට පටන් ගත්තෙමි<br>තවත් එක සැරයක් |
| 143 | නිදිමත දැනුන මුත්<br>නිදියන්න<br>බැරි හින්දා<br>එපා නිදිමත එන්න<br>මගෙ හිතට<br>දුක්දෙන්න |
| 144 | රිදුම් දෙන ජීවිතය<br>නිබන්ධන අතර සඟවා<br>ලෝකයෙන් සැඟවෙන්න<br>දිරි ගනිමි දිවා රෑ<br>සමාජය විසකරුයි |
| 145 | සමාජයේ ඇති සම්මතය මත<br>අපගේ<br>අසම්මතය විය<br>සම්මතය පරදා<br>ජය ගැනිමට<br>නුඹට මෙන්ම මටද<br>නොහැකි වූ කළ<br>වෙන්වීම මිස<br>කුමක් කරන්නෙමුද<br>අප දෙදෙනා |
| 146 | යට ගියාවේ<br>මියුරු සත්සරයක් බඳුවූ<br>ප්‍රේමය<br>වත්මනේ<br>රුදුරු සිවිපා<br>ගෙරවිලි හඬක් ලෙස<br>මා පෙලයි |
| 147 | පොත වෙත සිත<br>යොමු කරනා හැම විට<br>සිත දිව යන්නේ<br>නිවස කරා<br>තව කොතරම් කල්<br>මෙලෙස සිටින්නද<br>ඔබේ තුරුල්ලෙන් ඈත්වෙලා |
| 148 | සෑම කෘෘර ක්‍රියාවක් මදුර්වල තාවය නිසා<br>හටගන්නකි |

| | |
|---|---|
| 149 | පෙනෙන නොපෙනෙන තරම්<br>දුර ඈත නැවතිලා<br>නුඹ වෙතින් නොමැකී ගලා එන<br>සිහිල් සෙනෙහස් දියර<br>නැති කරයි<br>ගිනියම් රසනහයෙන් පරඬැලක් වී<br>මගේ හදවතට<br>දරාගන්න බැරි තරම් සීතලයි මට<br>නිදහසේ කියාගන්න බැරිව<br>සිත හඬයි හැමදාම<br>මගේ හදවතේ තෙරපෙන<br>ඔබට බැඳි සෙනෙහස<br>මහ මේරුවටත් වඩා<br>බර වැඩියි මට<br>එනමුදු රත්තරං<br>දිවි තිබෙන තුරාවට<br>ආදරෙයි මං |
| 150 | අනිච්චා මට තම්මානා<br>උප්පාද කළ දැනුම්නෝ<br>උපාධි අරගෙන ඕන තරං<br>අපි වැන්නන් තව නිකං බලං |
| 151 | හඳ මඩල සසල සඳ<br>සිත පොතට යාවේද<br>මට මාද අහිමි වේද<br>නොපායන් සුපුන් සඳ<br>තරු එළිය මෝදුවන<br>අමාවක හොඳයි මට |
| 152 | අතරමං වුණා<br>පාළු කුටියේ<br>කවුළු සිප එන<br>පවන් අහපන්<br>ඇයත් නොසිටිය නම්<br>මාග් ළග<br>අසරනයි මං<br>හන්තාන ඉම----- |
| 153 | ඇකිලෙන තුරු<br>ගින්නෙන් කුස<br>නිදිවරමින් සොයා ආව<br>සොඳුරිය ඔබ ?<br>කොහද ?<br>නිසලව දෙඅත<br>පන්හිඳ උරණව<br>ඈතට ගියාද ඔබ ?<br>වඩින් නැවතත්<br>සරස්වතිය ! |
| 154 | පුජේමි බුදුධං<br>කියා කිව්වත් මං<br>බුදුන් දැක නැත්නම්<br>වැදීමේ ඵලය කිම<br>බුදුන් අදහත් නම්<br>කෙලෙහි ගුණ ඇත්නම්<br>මව්පියන් වේමය<br>පුජේමි බුද්ධං----- |
| 155 | ඊයේ රෑ පොල් කිරිවල<br>ඉතිරි වූ පොල් රොඩු<br>උදෑසන හසුවීමේ<br>ප්‍රීතිය නිමිත්තෙන්<br>මගේ කුස තුල<br>සාදයක හඬ ඇසේ |

| | |
|---|---|
| 156 | පොත් ගත්තට<br>පඩම් කරන්නට<br>කියවගෙන කියවගෙන ගියේ<br>ඇගේ හිත<br>දරා ගන්න බෑ |
| 157 | අහෝ දෙවියනේ<br>දෙනෝ දාහක්<br>යාමිතම් කුස පුරවගෙන<br>අකුරු කරනා සඳ<br>නුඹේ පඩුපුල් අසුන<br>උනු නොවන්නේ<br>එයද පුද්ගලිකරණය වුණාවත්ද ? |
| 158 | ඉටි පහනින්<br>මව්පියන්ගේ<br>දහඩිය කොළ දවා<br>සෙමෙස්තරයක්<br>එළිය කල හැකිද?<br>මිනිසුනේ-----<br>කියා දියල්ලා මට<br>බොග දමන හැටි<br>අන්ධකාරයේ----- |
| 159 | පැවරුම ලියද්දි<br>ඇය මතකයට ආ බැන්<br>බත් කද්දි ඇණුන<br>කරවල කට්ටේ වේදනාව<br>දෙවන තැන ලැබුවේය |
| 160 | නපුරුකමට බැඳි බැඳි<br>සිතුවිලි නොයයි නුඹගෙන් මිදි<br>හිතුවක්කාර හිත මාගේ<br>තිබුණාවේ ඔහේ රිදිරිදි<br>ඉසව්වක නැති ලතැවිලි<br>නුඹට ඇහුණොත් මට ඇති |
| 161 | ඔබ නැති මේ රැයට<br>පුරහඳ එළිය කුමටද<br>ඔබ නැති මේ බිමට<br>නල මුදු සුවඳ කුමටද |
| 162 | අවිවේකි අධ්‍යාපනය පරමාර්ථකාමීයා<br>ආත්මාර්ථය වෙත රැගෙනයයි<br>ඇතැම් විට ඔබද එහි ගොදුරක් වු අයෙක්<br>විය හැකියි |
| 163 | අස්ථර ස්ත්‍රී වින්යෙන්<br>ස්ථිර වු ප්‍රේමයක් ලැබිය හැකිනම්<br>පුත්තලමේද ගෝවා වගාකල හැක |
| 164 | වෙහෙසෙන විට - කැඩපත ඔබ ගැන<br>පුද දෙන්නට<br>කියනවා ප්‍රේමය<br>පුරවා ගත්තත්<br>හද තුළ ඔබ ගැන<br>තෙල් බැම්මෙදි<br>ගොලු වී යයි ප්‍රේමය |
| 165 | මීවිතින් දෙනුවන් තෙමුණු සඳ<br>කාගේ රුවදෝ ඇදෙන්නේ<br>සොයා ඒ රුව මදු  බඳුන් තුළ<br>පිහින පිහිනා කිම්දෙමින්නේ<br>ජීවිතයේ අවසන් සුසුම් පොඳ<br>රුදෙන තුරු මට තනි රකින්නේ<br>මගේ සෞමය නුඹයි මධුවිත<br>නැතේ කිසිදා දුරස් වන්නේ |

| | |
|---|---|
| 166 | හෙමි හෙන් ළංවෙලා<br>හිතගාව උණුහුමට<br>අත් බැඳන් ඇවිද ගිය<br>ජීවිතය මල් දෙවැට<br>පැටලිලා වැරදිලා<br>ගොලුවෙලා ගිය පෙමට<br>නෙතු සිබින මේ කඳුළු<br>නුඹට මිස වෙන කාට |
| 167 | නංගි මිය ගියා එය දුක්<br>ගොඩක් වුණා<br>සරසවි බිමේ නුඹ මට නැගනියක්<br>වුණා<br>අපේ ඇසුර දැන නොයෙකුත්<br>පද බැදුණා<br>නුඹේ හොදට මම මෙහි<br>හුදකලා වුණා |
| 168 | පුන් සඳුනි----- අඹරින් බැස එන්න<br>මසිතේ ඇති දෑ පවසන්නද ඔබේ සවනේ<br>කිමද? මනස පුස්තකාලයක්ද?<br>කියවා බලන-----<br>කිමද? ආදරය ගොඩනැගිල්ලක්ද?<br>කඩා නැවත ගොඩනගන----- |
| 169 | නදියේ පෙනෙන සඳේ සෙවණැල්ල<br>නදියට අයිති නොවේ<br>සිතුම් පැතුමන් සසල වන දිවියක්<br>කාටත් අයිති නොවේ<br>මිහිමඩල දෙදරා ගියත්<br>ආදරය දෙදරා යන්නක් නොවේ----- |
| 170 | තග දැමු තෙල වැදුණු<br>එක ගොඩක ගොඩ ගැසුණු<br>සුන්දරම නුඹේ සෙවන<br>අහිමි වන දිනය අද<br>වාන් දැමුවා කඳුළු<br>නෙත් කෙවෙනි බිඳ දමා<br>සත්තමයි නුඹ සුවඳ<br>අතැර යායුතු නිසා |
| 171 | බිතු සිතුවම් රූ මෙන් පැවති<br>හිත මිතුරන් විරසක නොවෙති<br>එක මලකට පෙම් බැඳි පවින්<br>මිතුරු දමින් සමු ගමුද ඉතින්<br>සෙවණැල්ලෙන් සමු ගමුද ඉතින්<br>මල කීවේ නෑ ඔබ පෙම් කල වග<br>කීවා නම් පෙම් කරන්නේ නෑ තව<br>මොකටද පෙමකට සොහොයුරු කම් බිඳ<br>අප දෙන්නා සමු ගත යුතු නෑ නෑ<br><br>මලට කියන්නම් මා පෙම් කරනා වග<br>සමාවෙයන් මට ගිනෑ මිතුදම<br>බැඳි පෙම ජය ගෙන සතුටින්<br>ඉනු මැන<br>මා නම් හිත රිදවන්නේ නෑ නෑ |
| 172 | **නුඹ**<br>මම<br>හදවතින්ම පෙම්කර<br>හදවතේම සැගවුණ<br>අරවින්දය----- |
| 173 | ප්‍රෙෂියක් හෝදන්න බඩුවට බුටි තියා<br>ඩිග්රිය ගන්න පේරාදෙණිය වෙතට ගියා<br>ආ දා පටන් සින්නන් හට කඩේ ගියා<br>බඩුවක් තියා ඩිග්රිය වත් නැතිව ගියා |

| | |
|---|---|
| 174 | ලස්සනයි සිනා පද්දන<br>නුඹේ සෙම චරිත මහා තඩි<br>වත දැකීමෙන්<br>මට කවි සිතක් නම් පහල වුණේ නෑ<br>පිළි කුලට ඇති වෙච්ච<br>ඔක්කාරයක් මිසක් |
| 175 | ආදා කොතෙක් රැග් බිය තිබුණාද දෙනෙතේ<br>ආවේ සතුටිනුයි නුඹ සෙවණටදාසේ<br>මතුවට සිංහයෙක් සේ සමුගත්තද නුඹ ගෙන්<br>යනදා දුකයි කියනට බෑ දමා මෙසේ |
| 176 | **උපාධිධාරියා**<br>මහදැනමුත්තෙකි<br>පොත්ගුලේ රාක්ක මැදින්<br>කලබලයෙන්<br>ඇවිද ගිය නිසා |
| 177 | **ප්‍රාර්ථනාව**<br>සති අන්තය එනතුරා<br>ඇඟිලි ගනින්නේ<br>පෙම්බරිය දකින්නට<br>නොව<br>පෙම්බරියන්ගෙන් ගැලවී<br>නිදහසේ ඉන්නටය |
| 178 | **ගජේට ඇඳීම**<br>මගේ කමිසෙට<br>උදේට එක කෙල්ලෙක් හේත්තු වෙනවා<br>දවල්ට තවත් කෙල්ලෙක්<br>හේත්තු වෙනවා<br>හැන්දෑවට තවත් එකක්<br>කොහොමද සැප? |
| 179 | හිතේ ඇදෙන්නටත් පෙර<br>යන්තමින් ඔහේ ඇඳි<br>සිතුවමකි නුඹ<br>සිතේ රැඳි දහසකුත්<br>සිතුවම් අතහැර |
| 180 | ජීවිතේ පුරාවට<br>මුලු හදම සසල කර<br>සොරාගත් ආදරය<br>නෙත් දෙකින් බැල්ම දී<br>මා නෙතද පොළඹවා<br>ඇයි කියන් සොඳුරියේ<br>නොකියාම හැර ගියේ |
| 181 | Before marrge<br>නුඹයි රම්‍ය සඳ කිරණ<br>ගිම්හාන කාලේ<br>After marrge<br>නුඹයි චණ්ඩ හිරු කිරණ<br>මධ්‍යහ්න කාලේ |
| 182 | **ආදරය**<br>හෙම්බිරිස්සාවකි<br>ඔසු සොයන මුත්<br>සුව නොවන |
| 183 | පෙම් කළෙමි ඇයට<br>ආ දා පටන් සිතින්<br>නමුත් එය<br>පස්කණ්ඩියේ ඉපදී<br>එහිම අවසන් වූ<br>පුංචි පස් ස්ථරයකි<br>ආකියෝලෝජි වල එන |
| 184 | මහද වීණාවේ<br>තත්සර ඔබයි<br>හඬ නොනංවෙන<br>රබර් පටි මෙන් වූ |
| 185 | හදවතට දැණුනු ආදරය නුඹගේ<br>එය ආදරේ හසුනකට<br>වේදනාවෙන් උණත් ලියා නුඹටම<br>නුඹ අතටම<br>දෙන්න වූ පව මගේ<br>ඉවසුම් නොමැති වුතැන<br>ගාලු කඳුළු ගඟ දිගේ<br>බොඳවෙලා නොයන් කවදවත්<br>කවම කවදවත්<br>එය ප්‍රථම ප්‍රේමය මගේ |
| 186 | සසර පුරුදු දුක තමයි<br>අපිට උරුම පැරදුමයි<br>නෙතට කඳුළු බිඳු දමයි<br>හැමදමත් දුක තමයි |
| 187 | සිසිවන වුවන ඉග සුග ගත හැක මිටින<br>ලියපු එකාගේ අත කැපුමට අතින<br>විසිවන සියවසේ කලු දැලි මුහුණ<br>ඉග සුග ඇගේ අද ගත හැකි සොඬින |
| 188 | පියමං කෙරුවෙමි සැරයටි මැද්දෙන්<br>බකටි තැබුවෙමි දොරින් දොරට ගොස්<br>ආතල් ගත්තෙමු ෆන් ලැබ ගත්තෙමු<br>දෙපා වාරු නැත ඔබ හැර යන්නට |
| 189 | ඉල්ලුමට සැපයුම<br>ජේදනය වී<br>සමතුලිත නොවූ<br>ආදරයකි<br>ඇගෙත් මගෙත්<br>ආදරය |
| 190 | ඔබ මා හැරදා ගියද<br>මම නොයෙමි<br>මන්ද<br>මගේ නොවුනත්<br>මගෙම වූ ඔබගෙන්<br>ආදරය අරුත දුටු නිසාවෙනි |
| 191 | අපත වූ මිතුරු කැලක්<br>අසංවර වූ ලිගුවක්<br>අසාමාන්‍ය වූ නිදිමතක්<br>නොමැති වුයේ නම්<br>අපිත්<br>ලෙවාලාය<br>ප්‍රොපලාය |
| 192 | හදවතේ නැගි කඳුලු නැත පිටත     පැමිණිලා<br>දහවලේ ගිරිස්මෙට හදවතම     තැම්බිලා<br>තව කෙසේ හිඳින්නද වේදනා     ඉවසලා<br>හිතේ ලෙඩ තිබුනාට බෙහෙත් නැත     සොයාලා |
| 193 | කියූ දෙය වසාගෙන<br>නොකියූ බොහෝ දේ ඇත අප අතර<br>නමුත් දැන්<br>ගොනා පොල් පැළය කා හමාරය |
| 194 | පලවා හරිම් ලෝකය කිව් නව හින්දා<br>වෙනතක ගියෙන් ඔහු හා දෙනුවන් බැන්දා<br>නුවරම හිනැහුනා මට අද ඔබ හින්දා |

| | |
|---|---|
| 195 | ඉඩදෙන්න එක වතාවක්<br>ඔබට ආදරය කරන්න<br>අවසරයක් නොලැබුනද<br>හුදකලා මගෙ සිත<br>ඔබ සිත සමග<br>ඔබට හොරෙන්<br>කථා කරයි<br>වෙන්ව සිටියද<br>සොඳුරිය<br>සිහිනයක් නොවී<br>නොකලද ඔබ මට ආදරය<br>ඒ හුදකලා බව<br>අමෘතයක්<br>මගේ ආදරයට |
| 196 | ඈ මදෙස බැලුවාය<br>යළිත් ඈ බැලුවාය<br>මා ඉන් නොසෙල්වුනෙමි |
| 197 | දෙනෙතින් අපගෙ නෙතු කඳුලැලි වැගිරෙනවා<br>හදේ ඇති වේදනා සුළඟට මුසු වෙනවා<br>සරසවි දිවිය ටික ටික අපෙ වියකෙනවා<br>මොනවා කරන්නද බැජියො ඇණ දෙනවා |
| 198 | දුනු හිය ඇද්දෙමි<br>හියක් නොමැතිව<br>දිටිමි<br>එළා යන මුවැත්තිය |
| 199 | දුක හබා සැප යනු<br>ජිවිතය නැමති කුණාටු සයුරේ<br>හබලක් නැත රුවලක් |
| 200 | **මල්ලි**<br>ජිවිතයේ ප්‍රශ්න වලට වඩා<br>ඇණ ගැනිම මහ ලොකු දෙයක්ද<br>සංසාර චක්‍රය පුරා නුඹ ගත් ඇණ<br>Hilda 128 'අනාවරණ" වුවද නිමක් නැත<br>ඉවසපන්<br>ආදරය යනු සංසාර Wheel එකේ එක<br>දැත්තකි<br>වාහනය පදිනා තුරු Wheel එක කැරකෙයි<br>හැගීම් යනු ඉන්දනයයි<br>ඉවසපන් |
| 201 | තනිකමට, පාළුවට<br>සැපට දුකට<br>හැමදාම එකට ඉන්නට<br>හැකි නම් නුඹ ගාව<br>මට<br>තවත් හැගුමක්<br>කුමකටද<br>ආදරයකට |
| 202 | සුදෝ සුදු ඔබේ කලුවන් කොණ්ඩේ සුදෝ<br>සුදෝ සුදු ඔබේ නිල්වන් දෙනෙත් සුදෝ<br>සුදෝ සුදු ඔබේ පියකරු මුහුණ සුදෝ<br>සුදෝ සුදු ඔබේ මුලු ඇග තඩියි සුදෝ |
| 203 | **නො (පැමිණිම)**<br><br>නො එන බව දැන දැනම<br>හිත හොදටම පෙරටු කොට ගෙන<br>සීතල මා ජීවිතයට<br>අනාවක් නැති හෙය්න්<br>උණුසුම් මරණය<br>නුඹ එනතුරු<br>මම මග බලා හිදිමි |
| 204 | සතුරා බලවත් නම් විරයා පසු බැසිම නුවණට<br>හුරුය |

| | |
|---|---|
| 205 | පැයක් දෙකක් පොත බලන්න<br>වතුර බෝතලෙත් අරගෙන<br>බොහොම උනන්දුවෙන් අනේ<br>මම මෙතනට ආවා<br><br>පැයක් දෙකක් ගතව ගියා<br>වතුර ටිකත් ඉවර වුනා<br>අන්තිමේදි ඉතුරු වුනේ<br>වූ බරකුයි නිදිමතකුයි |
| 206 | වැදුනත් හිසට හෙණ<br>දත් ටික ඇතොත් හිසි තැන<br>නොතකා හෙනය ගැන<br>සිනාසෙනු උඩ පැන පැන |
| 207 | වැහිබර මෝසම<br>හිරිගඩු සීතල<br>මනසේ සිතුවිලි<br>එක්වී ගුලිවී<br>සසලව මුලුලොව<br>අවැසි කරනට<br>පාඩම් බොහෝ ලෙස<br>කුමක් කරන්නද<br>සසලව ඇත මගෙ<br>මුළු ලොව |
| 208 | තනියෙන් බුදුවෙන්නට<br>බොහෝ දෙනා උත්සහ කළද<br>ඒ යන මාවතේ<br>කිසිදු මග පලක් නොලැබු<br>අනේක විද මනුෂ්‍යයෝ<br>බුදුවීම පසෙකලා<br>මග එලක් ලබන බැවි<br>දත හැකිය කෙසේ වුවද<br>චේතනාහං හිකබවේ<br>කම්මං වදාමි<br>සිහිකර ගැන්ම<br>මැනවි |
| 209 | මැලවුණු මල් බිම පතිත කරන්නට<br>සුළඟට ඉඩදෙන ගහට දුකක් නෑ<br>හදවත සැනසූ එකම මලක් ගැන<br>මට ඇති කැක්කුම ලොවට දැනෙන් නෑ |
| 210 | හන්තානට වඩා උසට<br>බොග දැම්මේ එලිවෙන තුරු<br>මහවැලියට වඩා වතුර<br>බඩ පිරෙන්න බිම් නිතර<br>කටු ඔටුන්න B . A ගෙන<br>පළඳින්නයි රජෙකු ලෙසින්<br>අපි ආවේ සරසවිය<br>පුරුවෙ පවකටයි ඉතින් |
| 211 | පැහැසර කිරනින් නැහැවුණු<br>ජිවිත මංතලාවම අභියස<br>නුඹ පහනක් නම් නොව<br>බුද්ධිය.......<br>මගේ මුළු ලොවම එකලු කල<br>හිරුත් සඳුත් ඔබ මැයි<br>බුද්ධිය |

| | |
|---|---|
| 212 | වීභාගය නම්<br>හුදෙක් මේ ජීවිතයට<br>නොවේ<br>සිතැගි සාගරයක් විලස<br>දිවි ගමනේ<br>විභාග නම්<br>අල්ප මාත්‍රයකි<br>දිවි තුරු වටිනුයේ<br>මනුෂ්‍යත්වයම පමණකි |
| 213 | කල්කයක් ඇත සරසවිය තුළ<br>උගන්වයි එය මුල් දවස් වල<br>බයට කීවත් කට පාඩමින්<br>ටික කාලයකින් වැටහිලා යයි<br>එහි අරුත කොතරම් වේද යත්<br>නොතිබුණත් වලිගයක් පසුපස<br>ඇවිද්දත් දෙපයින් පොළව මත<br>තිරිසනුන්ටත් නිගා ගෙන දෙන<br>හැගෙයි සතුනුත් මෙහි සිටින වග<br>සියොලගම විෂ පතුරුවා ගත්<br>රුදුරු විෂඝෝර සපුන් කැලටත්<br>වඩා විෂඝෝර සපුන් ඇති බව<br>වැටහේවි දිනකදි නුඹලටත්<br>නපුරු සටකපටියන් බොහෝමයි<br>මිනිස්කම දන්නවුන් විරලයි<br>පැතුම් පොදිබැද ආව පින්බිම<br>අරුත එලෙසම වේද සිත්වෙයි<br>උගන්නට ඇත බොහෝ දේවල්<br>විභාගයට අමතර දිවියට<br>කපටි සිවලුන් මෙන්ම විසකරු<br>සපුන්ගෙන් වන්නට සුරක්ෂිත |
| 214 | ඇත්තමයි<br>ඇහැ පියන්නෙම නැහැ<br>හිතල හිරිකඩ<br>මදුරුවන්ගෙ හොරණෑව<br>සංසාර ගැට්ට මත<br>ගුලි වුණි ජීවිතය<br>අතිඋත්තම ජ්‍යේෂ්ටතුමනි<br>කෙසේ නම් පිළි නොගන්නද<br>බොගාට ක්ලාස් නැති වග |
| 215 | **විභාගය**<br>නුඹ නිසා<br>ආවස්ථික පිරිවැයක්<br>දැරීමට සිදුවිය<br>“නින්ද”<br>නුඹගේ උපයෝගිතාවය<br>අහිමි වූ කල<br>හිනවන පලදායිතාවය විය<br>විභාගය විභාගය |
| 216 | නිදි දෙවිදුව නුඹ<br>පැමිණියා ඉක්මන් වැඩිය<br>මම තවම බොග දමමි<br>නුඹට හැකිද තව මොහොතක්<br>ප්‍රමාද වී පිය මනින්න |
| 217 | විභාගය ළංවෙමින්<br>හිතට දෙන වධ වේදනා<br>දැනෙන විට අන්තවත්<br>කුමන නම් කරුමයක්<br>පලදිලා ඇද්ද යැයි<br>සිතෙනවා අනන්තවත් |
| 218 | කලෙම් වනපොත්<br>නෝට් එක දිගඇරන්<br>මහාපතරංග ජාතකය ලෙසිනි<br>කේන්ස්ගේ බහුබූත<br>මාක්ස්ගේ ඉටිගොසය<br>ඉතිං අපිට Pද<br>උන් යැපෙනවා අපි මත්තේ<br>එතකොට උන් පරාධීනයි<br>අපි ස්වාධීනයි<br>ඇත්තටම<br>අපි නැත්තම් උන් කවුද ?<br>නිකම්ම නිකමො<br>කාලයට විතරක් අයිති වුන<br>උන් අදත් ජීව මානයි<br>අපි නිසාම<br>ඔව්<br>අපි නිසාම |
| 219 | සරසවි පහස<br>සුන්දර යැයි සිතා සිටියද<br>අන්දනන් නොදනිති<br>මෙහි අරුම<br>සෙමෙස්ටර් Exam කට උඩට ආවහම<br>බෝසත්වරු අප දුටුවොත්<br>නියතයි<br>අභිනිෂ්ක්‍රමණය කරනවා<br>කැන්ටිමේ ඇන්ටිගෙ බත්කාලා<br>ඉඟ සුඟ දැන් ගතහැකිය මිටින<br>අඩසද බඳු පටු නලලත<br>කුරුලෑ බිබිලෙන් පිරිඇත<br>අක්බඩරුවන් කෙස් කලබ<br>නරකෙසින් පිරී ඇත<br>පුන් සද සේ දිස් වුවන<br>දුටුවිට<br>සසරම කලකිරෙයි<br>මහාමේරුව උසුලාගත් සේය<br>අද පෙනෙනුයේ<br>කඩු දුණු හරබයට වඩා<br>කලාස් හරබය<br>බොහෝ දුෂ්කරය<br>මෙයද අපමනවු දුක් පිරි<br>දුෂ්කර ක්‍රියාවක්මය |
| 220 | කොටියා සිංහයා ගොරවා රවා පනී<br>ඒ නිසා ඔවුන් රුදු බව ලෝකයා දනී<br>මිනිසා සිනාසෙයි කරුණා දයාවෙනි<br>හදපපු කැවුතු අමු අමුවේ කඩා ගනී |
| 221 | ශිල්ප උගත්තෙමු<br>තව මොට වුවෙමු<br>ඇතිවූ දෙයක් නැත<br>මෝඩයා වනු හැර |
| 222 | නිබන්ධන ඉවරයක් නෑ<br>Mid එනවා<br>End එනවා<br>Exam ඉවරයක් නෑ<br>ඔළුව බරයි නිතර<br>යෞවනය දිරාපත්වී<br>අජීවී පොත් අතර |
| 223 | බඩගිනි වෙලා මා ගිය කල කැන්ටිමට<br>දහයේ බත් එකක් දුන්නයි මා අතට<br>ගන්දෝ නොගන්දෝ කියලා සිතුනි මට<br>බඩගිනි නිසා ගත්තයි එය මා අතට |

| | |
|---|---|
| 224 | පෙරුම් පිරුවේ කැම්පස් යන්නයි<br>පැතුම් පැතුවේ ඩිග්‍රිය ගන්නයි<br>සිතා සිටියේ ස්ටාෆ් යන්නයි<br>මේවා ලිව්වේ හිනා යන්නයි |
| 225 | ඇවිත් නුගපිටිය<br>දෙසනා දුටුව කටිය<br>මතක් වී කුටිය<br>ඇරිඇනුම් සිය දෙසිය |
| 226 | සරසවි සිහිකර කර බොග දැම්මානේ<br>බොහෝ දෙනා අතරින් අපි ගොඩ ආවානේ<br>අම්මා සිහිකර කර මෙහි ඉන්නවනේ<br>හොස්ටල් ජීවිතය දැන් මට එපා වෙලානේ |
| 227 | සැමදා මම සින්නන් හට කඩේ ගියා<br>Mid.End වලට මම බයකින් ඉදගත්තා<br>First year මෙහෙමයි කියලා සතුටු වුණා<br>Special නැතිවෙයි සැමදා තැවුණා |
| 228 | අම්මේ ඔබේ සනා සපිරුනු මුව මඩල<br>මතක් වෙනවා මෙහි ඉන්නා සැම විට<br>පින්මේ දුවන් යන්නට සිත කියයි මට<br>යන්නේ කවදාද ඔබේ රුව දකින්නට |
| 229 | පොත් අතර රැදුනු සිත<br>උලමන්ගෙ කෑ ගැසිමෙන්<br>තඩි බලලුන්ගෙ භයංකාර හඩින්<br>සලිත වී<br>ගත හිරිගඩු පිපුන මුත්<br>උපාධිය රැගෙන<br>මව්පියන් බැහැ දකින්නට<br>යා යුතු නිසාවෙන්<br>තද කරන් ගැහැනු සිත<br>නිදි වරමි පොත් අතර<br>වෙන කලයුතු යමක්<br>නැති වූ නිසාවෙන්. |
| 230 | **අසව් අසව්**<br>අනේ දෙවියනේ මට වුනු වියෝයා<br>මාස 2 නොදැනිම Rag වුනෝයා<br>කළයුතු නොකළ යුතු දේ නොදැනුනෝයා<br>මට සහතිකයි End ඇන ගන්නවොයා |
| 231 | **තරු**<br>රෑ සඳ ඇවිදින්<br>මා ගැන ඇහුවොත්<br>කියන්නෙපා මා<br>දුක් කඳු අතරේ<br>හැංගී සිටි වග<br>මෙතුවක් කල් |
| 232 | සංසාරයේ අපමණ මල් ඇතුවාට<br>එකම මලක් කපන්න පින් නැතුවාට<br>දිගට හරහට පෙරලෙමි දුටු දුටුවන්ම<br>යන්න රටක් මට ඇද්දෝ හෙට දිනට |
| 233 | රතු පාටින් කහ පාටින් මල් ඇතුවත්<br>තෝර ගන්නෙ කොහොමද මා එකම මලක්<br>පැණි බේරෙන මල් සේරම මගේ උනත්<br>බලාගෙනයි ඇණ තියන්නේ වඩි උලක් |
| 234 | ටිපෙක්ස් කළ නොහැකි දෙය පතිවතයි |
| 235 | දහදුක් විදලා අනේ මම<br>කැම්පස් ආවා<br>තව දුක් විදින්නට මම<br>ආයෙම වලට ගියා<br>දුප්පත් අපට මහපොළ තාමත්<br>නැතුවා<br>රැකියාවකට කවදා අපි<br>යොමුවේවා. |
| 236 | නංගි මගේ දුක් විදිනවා අර ගෙදර<br>මමත් මෙහේ දුක් විදිනවා හැම නිතර<br>ඩිග්‍රිය තමයි මේ හැම එකටම පිහිට<br>අනේ මගේ ඩිග්‍රිය නුඹ දුක් ගොඩක. |

# සෞන්දර්ය සරසවිය

| අංකය | ගීතය |
|---|---|
| 1 | **The God You Lied Us**<br>The people died<br>No anyone as light<br>Everyone goes to fight<br>How do you tell us<br>You are right<br>The god you lied us<br>Someone pleads that<br>You are the moon<br>Someone pleads that<br>You are the wind<br>but<br>the god you lied us<br>everyone goes to war<br>our hope- peace no more<br>why cant you cant you get down to floor<br>the god you lied us<br>the god<br>you lied us… |
| 2 | **He is a prisoner**<br>He is a man<br>But<br>He doesn’t have a heart<br>His chest is very strong<br>But, he doesn’t have a chest<br>He loves to hate<br>His lover is the dead<br>No one can quwell him<br>It can’t be done<br>By gods<br>He loves to get lives<br>From others<br>But why<br>He is a prisoner<br>Of someone |
| 3 | **පුදසුන අසල**<br>පවතින නොනිමෙනා පහනින් ලෙලෙන පබා<br>මදුනත් කොට වදින යදියන් සමග තබා<br>දෙවනත් කර කියන තියු ගීතිකා ලබා<br>තවමත් නිහඬ ඇයි පවසනු මැනවි නොබා<br><br>බිළිඳුන් මුව වියලවා කිරි ගෙනෙනු දැක<br>කප්රුක පල නෙලා පොලොවේ ගසනු දැක<br>විකලෙන් දොඩන තක්කඩියන් පුදනු දැක<br>පැන ගොස් සැගවුනෙමි කුමකටද මුන් රැක |
| 4 | **මල් මාල**<br>දරුණුව තරගයට පිපි නෙළුම් රැය පුරා<br>හඳ විල පුරා පැතිරිනි සුවඳ හල හලා<br>පිපුනා පිච්ච මල් උදයේම හිස පුරා<br>පෙති ඉහිරි සැලී ඉන් හිසම බරකලා<br><br>දහවල් හිරු රැසින් දහදියෙන් ඇහැරිලා<br>සියොලග රෝස මල්කැකුලින්ම ගැවසුවා<br>පෙනහළු කුහරයේ අතුපතර අරලියා<br>ගනු අප නෙලා අමුනනු කියා පිබිදුනා<br><br>පාටයි පෙති ගලපා තබා බල බලා<br>හොදවා නෙලා අමුනා පැනින් පුබුදුවා<br>සගවා තව බලා ඉන්නෙමිද නෙතු පෙලා<br>ඊයේ මෙන් අදත් නොබලාම යනු බලා |
| 5 | **Black**<br>There are black<br>Kids, men and women<br>But they have no faces<br>I tought my face<br>I have mouth "nose and<br>Eyes<br>They talk with me<br>I know<br>I have seen lot of things<br>And<br>Always I see<br>Therefore I could identify<br>Them<br>I love to my life<br>Im always dreaming<br>In my blind<br>Eyes…… |
| 6 | **I CLOSEDTHESHUTTER**<br>I couldn’t love to anyone<br>None got my hand<br>I’m looking till someone<br>Comes to my life""<br><br>No one came<br>But, my fellow<br>Who was a yellow<br>Than I<br>He could touch and peep<br>Everywhere<br><br>Sometimes<br>He goes on the roof<br>Sometimes<br>He goes on the wall<br>Sometimes<br>He lays on the floor<br>Sometimes<br>He vanishes""<br><br>I was lonely person |

| | |
|---|---|
| | In that beautiful night<br>I was looking till someone<br>Comes to my life""<br><br>In a long time<br>She came giving<br>Bright and soft light<br>I opened the window<br>She was waiting<br>But , not fore me<br>Till my fellow""<br><br>Before I look at the out<br>He ran out and crawled<br>Oh…it hurt me<br>Because of<br>Libidinous love of theme<br>I closed the shutter<br><br>He will.hate me""" |
| 7 | සුනු සහලේ කැඳ උයලා<br>අප්පච්චිට පොවා<br>අම්මා තනිව හිල්ලුවා<br>ගෙයි මුල්ලට වෙලා<br>එහා වත්තේ වැටකොළු වැල්<br>හොරෙන් එබී බලා<br>පුරන් කුඹුර ළගට වෙලා<br>ඔච්චමකුත් කළා....<br>හිත් ඇඳිරිය නෙතු පුරවා<br>ඔත්පොළටම වෙලා<br>අප්පච්චිගෙ ඇඳ පාමුල<br>හොරෙන් මුකුලු කලා<br>දුප්පත් කම ගෙට නැවිත්<br>පිලික්කනට වෙලා<br>එක දවසක් දෙකක් පුරා<br>අපට විහිළු කලා .....<br>උදේ රැයින් අවදිවෙලා<br>නිදි ගැට කඩ කඩා<br>අපේ අම්මා දොළට නොයා<br>උදේ හවා පුරා<br>ගෙයි ගින්දර පිටට නොදි<br>ලිබ්බොක්කට වෙලා<br>මුව දෙනවා මං දැක්කා<br>අපට මුවාවෙලා..... |

| | |
|---|---|
| 8 | **"ඇට මස් නහර"**<br>තාත්තා<br>ගස් කපා උලුප්පා<br>අත්තම් හතරකින් හම ගැසූ<br>බෝකන්ද ඉඩමේ<br>ඇට මස් නහර දියකර<br>බඩගායි උජාරුවෙන්<br>වැහි වතුර<br>තාත්තාගේ සොහොනද යටකර<br><br>කන්ද උරණව<br>බිම දමාඇත<br>වරිච්චි බිත්ති හතර<br>තාත්තා<br>වැල් කැඩී ගිය ලණු ඇදේ<br>නිඳා ඉදිද්දිම<br>තනිවම<br><br>පෙනෙයි<br>වරිච්චි මැටි අතරින්<br>හිනාවෙන තාත්තාව<br>රාමුකල පින්තූරයේ<br>බිඳුණු විදුරුව යට හිඳගෙන<br><br>දර ඉපල් අතර<br>බුරා බුරා නැගෙන ගින්දර<br>බඳ වටා ඔතාගෙන<br>දුඹුළු බැදුණු කේතලය<br>ගොප ගොප ගා නටවයි වතුර<br>අම්මා තවමත්<br>බලාගත් අත බලාගෙන<br>ගමේ අය ඉදිකල |
| 9 | සසර සැරිසරා මා හා<br>නුඹ<br>නොයයි කිසිදිනෙක<br>මා හැරදා<br>ගෙවෙත්ම<br>ජිවිතය<br>නුඹ<br>මටම පෙම් බැඳ<br>මා ළගින් ම<br>දැවටී<br>ඔය තරම් ලෙන්ගතුව<br>ඉගි පාමින් සිනහසෙන්නෙ<br>ඇයි<br>මට<br>සෙනෙහසින් නුඹ මරණයේ<br>දෙව්දුව |

| | |
|---|---|
| 10 | **ඔයා**<br>ඔය විදියට<br>සිනාසෙනවිට<br>ගොඩක් ලස්සනයි<br>ඒත් ඔයා<br>සිනා වෙන්න එපා<br>ඔයා සිනාසෙන විට<br>දෙවරක් හිතන්න<br>ඉන්පසු සිනාසෙන්න<br>සිනාවක අවසානය<br>කඳුලක ඇරඹීමය උනොත්<br>එය ඔයාට දරාගන්න<br>අපහසු වේවි<br>හිතන්න<br>මොහොතක්<br>දුකත් සතුටත්<br>අපහට උරුමයි<br>දුක පරාජය කර<br>සතුට ලගා කරගැනීමයි<br>අප කලයුත්තේ<br>එයයි<br>ඔබේත් මගේත්<br>ජයග්‍රහණයයි |
| 11 | දොඩමළු වීලා මොහොතක්<br>මොහොතක් සැනසීලා<br>වෙන්වීලා කල්පයක්<br>දුක්වීලා මහ මෙරක්<br>ඉන්නවාට වඩා<br>අපි වෙන්නෙලා ඉඳිමු<br>මේ මුළු දිවිය පුරා<br><br>ඔබට මාත් මා ඔබටත්<br>හිමි නොවනා බව<br>දැන දැන තවත්<br>ඇයිද අප මෙසේ<br>තව තව ලං වෙන්නේ<br><br>මා ඔබ හට හිමි නෑ<br>කුමරියනේ<br>සෙනෙහස පුරවා<br>ඔය නෙතු<br>මා දෙස යොමන්නෙපා<br><br>මා නිසා ඔබ හට<br>කිසිදා දුකක් නම්<br>වෙන්න එපා |
| 12 | වෙන් වෙන්නට හිතක් නැත.<br>එක් වන්නට හිතක් ඇත.<br>සොයුරු දමින්<br>මිතුරන් ලෙසින් සැමදා.<br><br>ඔබත් මමත් හමු වූ<br>සරසවි විදු පියසේ<br>ගත වූ කෙටි කලතුලදී.....<br>ඔබ මා හඳුනාගත්තා.<br>මා ඔබ හඳුනාගත්තා.<br><br>ඔබ හා මා අතරේ<br>ඇතිවූ මිතුදම මිහිරියි<br>එය එලෙසින්<br>පවතින ලෙස පවතිමි. |

| | |
|---|---|
| 13 | **කැලෑ මලි**<br>කොළඹ ඇයෝ<br>කැලෑ මල්<br>රැගෙන විත්<br>මාවතේ<br>ලස්සනට<br>සිටුවාවි<br>පිපෙන මල් විඳින්නට<br>හැකිවේද<br>කොළඹ ඇයන්ට<br>දූලි වැදි<br>අවු රස්නේ<br>දඹර කරණ මල්<br>දැක......<br>කැලෑ ඇයෝ නම්<br>හඬාවි |
| 14 | ඔය ඇස්දෙකින්<br>මේ ඇස් දෙක<br>නොදුටුවාට<br>අහිතක් නෑ<br><br>ඔය ඇස්දෙකින්<br>වෙන ඇස් දෙකක්<br>දකිනවාද?<br>මම දන්නේනැහැ<br><br>ඔය ඇස්දෙකේ<br>කඳුළු දකින්න<br>මම කැමති නැහැ<br>නුඹ කොහේ හිටියත් ,<br>නුඹ කාගේඋනත්. |
| 15 | **ටියුෂන් මල් පිපිලා**<br>ටියුෂන් මල් පිපිලා<br>ගාලු පාර දිගේ<br>බඹරුන් වැහි වැහැලා<br>සුවඳ ගන්න වගේ<br><br>ගේ මුල්ලේ පිපුණු මලක<br>කොටු බැම්මේදි සුවඳ නැතිද<br>ගල් පවුරක් වගේ හිතක්<br>සුවඳ සොයනවා<br><br>සුළඟිල්ලේ එතුණු අතක<br>වෙඳගිල්ලට මුදු කුමටද<br>ගල් පවුරක් වගේ හිතක්<br>සුවඳ ගන්නවා |
| 16 | **කරඳිය රැලිමත**<br>කරදිය රැලි මත රැය ගෙවා<br>ඔබ දුර ඇතයි මට සිතුනා<br>රෑ සුළඟට හිරි ගඩු පිපෙනා<br>සිතල ගත උණුසුම සොයන<br><br>දෑළ දෙනෙත් යුග ඉඟිකරමි<br>පැළ දොරින් එයි මල් පිරිමින්<br>නිල ගැබේ සඳ යන්න කලින්<br>ආල වැඩු සඳ පැලට වඩින්<br><br>තාල නොවූ කවි ගී අසමින්<br>බාල කෙලි හීනහෙයි නින්දේ<br>මාල පබළු වැල් කුමට ඉතින්<br>ආල වැඩු සඳ පැලට වඩින් |

| | |
|---|---|
| 17 | **සුභදාණනේ**<br>සඳක සිසිල මගෙන් පතන<br>මලක සුවඳ පතා හිඳින<br>සුභදාණනේ<br>සඳක සිසිල මලක සුවඳ<br>දැන් මං ලග නෑ<br>කඳුළු බිංදු මේ තරමට<br>දෙනෙත් තෙමන බව හනිකට |
| 18 | **නිකිණි මහේ සඳට කලින්**<br>නිකිණි මහේ සඳට කලින් ගමට එනවානම්<br>මං ඉන්නම් මඟ බලමින් මගේ රත්තරං<br>බකිණි ගහේ මල් පිපිලා බොහෝ කල් ගිහින්<br>නුඹ තවමත් පමා ඇයිද මගේ රත්තරං<br><br>සඳ නැති රෑ අහස වගෙයි<br>ගම්මානේ<br>නුඹේ සිනා හඬ නෑසෙයි<br>දොළ අයිනේ |
| 19 | **ඩඩා වාදය**<br>මොකක්ද මේ<br>බටහිර යුරොපයේ<br>නිර්මාණය වූ කලා<br>සම්ප්‍රදායක් වනඅතර<br>20 සියවසේ මුල්<br>භාගයේ ලෝක භාවිතයේ<br>තිබිණ<br>සම්ප්‍රදායික<br>සංස්කෘතික විධි<br>සෞන්දර්ය වෙනස්<br>කරමින් ප්‍රතික්ෂේප<br>කරමින් ශුද්ධ වු<br>යථාර්ථයක් සොයා<br>යෑම මෙහි අරමුණයි<br>මෙයින් නව අදහස්<br>නව අමුද්‍රව්‍යයන්<br>තව දිශානතින් හා<br>නව මිනිසුන් ඉදිරියට<br>ගෙනාවේය |
| 20 | බිත්ති පුවරුව පාලු<br>නොකල කොලු ගැටයාගේ<br>වැඩ කොහොමද<br>අර්ථවත් කවි පංති !<br>නිසදැස් ! බැලුවද !<br>1 වන වසරේ එහෙම අය නැද්ද? |
| 21 | ලොකු මහත්තයා අළුත් වැඩ<br>කරන්න පටන් ගත්තා විතරයි<br>ආරොන්<br>ඒ වුනාට විනය පරික්ෂණ ඉවර නැතිලු නේද? |

| | |
|---|---|
| 22 | No one is like earlier<br>Why?<br>How did you change?<br>You face is very pritty<br>When you smile beautiful<br>I thought that<br>You are a triend of mine<br>Like other<br>J was trind<br>No one is like earlirer<br>I don't worry<br>Every one and every thing<br>Is changing every day<br>You also like that<br>I was foolish<br>that me<br>Why? why couldn't<br>Understand me? |
| 23 | මගේ අර යාළුවා....<br>පුංචි කුඹියා....<br>මට කියනවා....<br>........උඹ ඔය හැටි<br>සැහැල්ලු වෙන්න හදන්නේ ඇයි?<br>පියාඹන්නද?<br>තරු අතරින්........වලාකුළු අතරින් ....<br>හඳ ගාවට<br>ලං වෙලා ආදරෙයි කියන්න.... |
| 24 | මගේ පුංචි ගිරවත් එක්ක<br>උඹ හුරතල් වෙනව දකින කොට<br>මට හිතෙනව.....<br>උැයි මම ගිරවෙක් උනේ නැත්තේ කියලා<br>හැබැයි....<br>කූඩු නොවෙච්ච |
| 25 | **අම්මා එනතුරු**<br>තෙල් නැතිව පණ ගැහුන<br>ලාම්පුව නිවිලා ය.<br>ගේ පුරා කළුවර ය<br>මම හිඳිමි අදුරේම<br>කඩපිලට ගියේ අපෙ අම්මා ය<br>තඩි කඹය ගැටගැසුණු යටලිය<br>දිරලා ය<br>අප්පච්චි තව තවත්<br>හිත කොනේ දඟලාය<br>උන්දැව බිම දාපු<br>දඬු කිතුල<br>මැද මිදුල වැජඹේය<br>වැල් පෙනෙල දලු කෙටුවේ අම්මාය තෙල්<br>නැතිව ලාම්පුව නිවිලා ය අද උදේ පොළට<br>ගිය<br>කිර මිටි<br>අම්මාගේ දහඩියට තෙමිලාය<br>කළුවරය<br>කිර මිටි නොපෙනේ ය<br>හිතට බිය ගෙනෙන්නේ පමාවෙන අම්මාය<br><br>උල ලේනියක් ඈත වැළපේ ය<br>කම්පිත ව ලැම මඩල ගැහුනා ය. |

| | |
|---|---|
| 26 | **පිළිතුරු**<br>මායාව කොච්චර උනත් සුන්දරයි<br>කවදාවත් එක් කරන්න බැරි දේවල්<br>එක් කරනව<br>එකිනෙකාට වෙන්වෙන්න බැරි විදිහට<br>ඒත්....<br>ලං වෙන්න දෙන්නෙ නෑ<br>ලං නොවෙන්න බාධා කරන දේවල්<br>එයිටත් වඩා සුන්දරයි<br>අව්ව වැස්ස සුළඟ......<br><br>මං දන්නෙ නෑ<br>මං ආසයි පියාඹන්න<br>අහසටයි පොළොවටයි ජේන්න<br>පුංචි කිරිල්ලියක් වගේ<br>මං ආසයි පුංචි මලක් වෙලා<br>පොළව උඩ ඉඳන්<br>අහස දිහා බලාන ඉන්න<br>එතකොට ......<br>මට හිතේවි<br>මේ අහසයි පොළොවයි අතර ඉන්න<br>වාසනාවන්තම කෙනා මං කියලා |
| 27 | අහස දුරයි තමයි පොළොවට<br>ඒත්.....<br>වැස්සක් වැටුන කියලා .......<br>පොළව තරහ වෙනවද?<br>ගහක් හැදුන කියලා<br>අහස අමනාප වෙනවද?<br>වෙන්වෙලා හිටියට දුරින්<br>අල්ලන්න බැරි තරම් ඈතින්<br>වෙන්කරන්න බෑ අහස පොළොවෙන්<br>එක් නොවන බව දැන දැනත්<br>හිතත් නෑ වෙන් වෙන්න<br>අහසවත් පොළොවවත්<br>එකිනෙකාගෙන්<br>එහෙම උනොත්.....<br>චුටි කුරුල්ලො සිංදු කියන්නේ කොහොමද?<br>පාට පාට මල් පිපෙන්නේ කොහොමද?<br>එක් නොවුනට<br>අහසට පොළොව<br>ලස්සනයි<br>වෙන්කරන්න බෑ කාටවත් |
| 28 | මහන්සියෙන් කරන ලද දෙයක් සේ<br>අපි විප්ලවයට ආදරය කරමු<br>සිත්තරෙකු මූර්ති ශිල්පියෙකු හෝ<br>ලේඛකයෙකු ඔහුගේ<br>කෘතියට ආදරයට කරන්නා සේම<br>අපි ඊට ආදරය කරමු.....<br><br>ඔහුගේ මෙන් අපේ ක්‍රියාවටද<br>නිරන්තර වටිනාකමක් අවශ්‍යයි.<br><br>විප්ලවයද කලාවකි.....<br><br>දේශපාලනයද කලාවකි<br>ඉතාම වැදගත් දෙය එයයි<br>මම සිතමි. |

| | |
|---|---|
| 29 | කාන්තා දිනයට පිලිතුරු.<br>එකම වස්තුවක දෙපැත්තක්<br>දෙපෙත්තක් තියෙන වග.......<br>විචාරන්නට ඇතත්<br>දහසකුත් මිනිසුන්ට<br>එසේ වූ දහසක්ම<br>බෙදී අඩකට වඩා<br>හරියටම “ගැහැණියට”<br><br>සොයුරියක , යෙහෙලියක<br>පතිනියක වන නුඹට<br>මව් නමින් පිදුම් ලද<br>උත්තරීතර කමට.....<br><br>වැරදි දහසක් ඇතත්<br>වැරදිමත් නොවේ ඇය<br>නිවැරදි ද නොවේ ඇය<br>එය එසේ වන කළට<br>අසම්මත මේ ලොව්<br>පිරිමින්ගෙ සම්මතය<br>වැරදි නොකරන්නේ නම්<br>මොන තරම් අගේ වෙද?<br>ලොවේ හැම වස්තුවක<br>අවම වූ වශයෙන් ම<br>දෙපැත්තක් තියෙන වග<br>සම්මතය වූ විටක<br>පිළිගන්න වන නමුත්<br>විචාරණ ඇතැම් දෑ<br>නොවිසඳන සොයුරනේ<br>කුමක් කරන්නෙද නුඹත්<br>මෙසේ පවසන මමත්.......<br>මිනිස් යැයි පටබැඳුණු<br>මිනිස් කම් ඇති නොමැති<br>වාරයක් නොහඳුනන<br>ගැහැණු මෙන් මිනිසුනුත්<br>ඬෙනිම් කවරය මගට<br>ඔසවමින් එක් අතින්<br>අනෙක් අත කෙහෙ රැලට<br>මත් මතින් සිහිසුන්ව<br>කෙළ හෙළන බලු ලෙඩට<br>විසඳුමක් ලැබේවිද<br>පන්හිඳක් සෙලෙව්වට.......<br>වෙනස් වන ලෝකයේ<br>නොවෙනස්ව පවතින<br>එකම දෙය එය නම්<br>වෙනස් වන ලොව දෙසට<br>ඇඟිලි දික් කරන විට<br>අඳුරසිට අඳුරටම<br>පැන බලන පිම් වැනිය..... |

| | |
|---|---|
| 30 | හැරී බැලුවෙමි<br>දුක් කම්කටොලු මැද<br>ගලා ආ<br>පිවිතය දෙස<br>ආපසු<br>සිදුවූ බොහෝ දෑ ඇත,<br>ආ ගමන තුළ<br>සිත් රිදවිමි . ... හැඩිමි ...... සිනාසීමි........<br>ලද දෙයක් නොමැත<br>නැවුම් අරුත්බර<br>දුක් විදිමුත්<br>සැනසුම කවදාද<br>පිවිතය දිගුවෙත්ම<br>සැනසුම.... අනන්ත දුරකය,<br>ඒත්.....<br>“බලාපොරොත්තුව ”<br>පිවිතය දිගුකරනු නිසැකය |
| 31 | **වස් දඩු රාවය**<br>ඔබේ වස් දඩු රාවයෙන්<br>මගේ හදවත සැනසුණා<br>සියුම් හදවත එයින් මත්වී<br>සිහින ලොකෙක තනිවුණා<br><br>ඇසේ මට එහි මිහිරි රාවය<br>හමන මද පවනේ පවා<br>දැනේ මට එහි සියුම් ශෝකය<br>ගෙවෙන හැම මොහොතක් පුරා<br><br>නීල නුබ ගැබ වළා අතරින්<br>විහග ගියක පැටලිලා<br>ලතෙත් වු හදවත් සොයාගෙන<br>මිහිරි රාවය යයි ගලා |
| 32 | අර කොනෙන් මේ කොනෙන්<br>එල්ලිච්චි රෙදි කෑලි<br>වැද්දොවත් ඇන්දෙ නැති<br>හෙළුවැල්ලේ පාංකඩ<br>තෙල්ගාලා වෙර දාලා<br>වෙහෙස වි බැහැගත්තු<br>කිටි කිටියේ හිරවෙච්චි<br>බිම බට දෙපා යුග<br>නිතඹටම පලාගත්<br>විලුඹටම දිග ගවුම<br>බය ඇත්තෝ අගලකට<br>නවත්වපු දික් පැලුම<br>දගමයක් නැවුනොතින්<br>අපේ උන්ට ඉන්නබැරි<br>අඟල් පහේ සාය පොඩි<br>ඇඳගෙනත් අට වෙනිදා<br>කෑ ගසයි මුළුලොවට<br>අපට මගයන්න නෑ<br>බස් එකක ඉන්න බෑ<br>මුන් ඉන්න දෙන්නෙ නෑ<br>පෙන්නගෙන ලොකෙටම<br>විකුණගෙන තමාවම<br>බඩ වෙච්චි දාකටම<br>බුරපියවි අප හටම |
| 33 | ජන්න එන්නැති<br>ඇවිත් නුඹ හා යන්න යන්නැති<br>ඇත්කුලේ නොව සනුහරේ උන්<br>විරසකයි මැණිකේ<br>ඉතින් නුඹ කැඩපතේ හැංගු<br>කිරි කොයිද මැණිකේ |
| 34 | හඩන මා අස්වසන්නට<br>බොරළු කැට ගස /නිදිකුම්බා පඳුරු වලට<br>නිදිගත් කල<br>හඩන මා අස් වැසු<br>තාත්තේ<br>නිදිකුම්බා පඳුරු ඇස් අරින්නට ඇති<br>තවමත් නිදි නැහැ නේද<br>අපි නොදුටුවට<br>එහෙනම් ඇය ඔබ තවමත්<br>ඇස් වසාගෙනම |
| 35 | නුඹේ ඩාදිය පුසුඹ<br>වසා පස්ගල් දමා තද කර<br>හැම තැනම ඉහිරිලා<br>මිනී මල්සුවඳ |
| 36 | සෙනේදිය ගලා ගිය<br>දයා ළය නුඹේමය<br>ළයේ කිරි තිරේවිය<br>කිරේ ලෙය නුඹේමය<br>මෙතේ බුදු පදවි ලද<br>මගේ අම්මේ<br><br>විල පතුල සිප<br>ඉන් උඩට නැග<br>මා පිපුනා දින<br>උණුසුමට ගෙන<br>නෙතු කදුළු පිසු<br>අම්මාය නුඹ<br>විල මතම නොව<br>ඉන් එහා ඉම<br>මා සුවද පොද<br>මුසු කෙරූ නුඹ<br>මා උගත නැත<br>කොතැනද අද... |
| 37 | පස් වසරක් ගෙවෙන දින<br>දල්වමි බකටි පහනක්<br>පස් පිඩැලි යට සැගවී<br>ඔබ නිදන සොහොන මත<br><br>ඒ දවස<br>ඉහිරිලා තිබුනි හැමතැනම<br>ඔබේ ඩාදිය පුසුඹ<br>ඒත් අද ඒ වෙනුවට<br>මිනි මල් සුවඳ<br>හැම තැනම<br><br>කුඩා කල මා හැඩු විට<br>වැලිගසා නිදිකුම්බා පදුරුවලට<br><br>වැලිගසා නිදිකුම්බා පදුරුවලට<br>නිදිගත් කල<br><br>හඩන මා නැලවු<br>ඔබේසොහොන මත හඩමි<br>හඩමි අද<br>නිදිකුම්බා පදුරුවලට ගල් ගසා<br>මා නලවන්න<br>ඔබ නොඑන්නේ මන්ද |
| 38 | මහද<br>කම්පිතය<br>නුඹේ ඔය<br>නෙත් සරින් |

| | |
|---|---|
| 39 | එකම අහසක් යට<br>නුඹට මට<br>එකම පැතුමක් පිරුනා<br>නුඹට මට<br>එකම සුසුමක් නගිනා<br>නුඹට මට<br>ඉතින් දෙහදක් කුමට |
| 40 | එකම අහසක් යට<br>එකම පැතුමක් ළග<br>එකම සුසුමක් එකම මොහොතකදි<br>ගැහෙන විට<br>ඉතින් දෙහදක් කුමට<br>නුඹට මා |
| 41 | **වැස්ස**<br>සීත රළු මහවැස්සේ<br>සිදුරු දියවේ පොල් අතු අස්සේ<br>පෙගුණු පොත් පෙරළෙයි ඇමටිය මැස්සේ<br>රැළි මැකුණු සුදු ගවුම වෙල් පැළළි<br>දොරඅස්සෙ<br>මුමුණු වදන් නොරුදේ බේබදුකම අස්සේ<br>පන්හිද රැගෙන එනු අග හිග පිරි මැස්සේ<br>අරමු ගමන් යන්නට අපි සරසවි මැස්සේ |
| 42 | එකා පිට එකා<br>ඉහලට ගොස්<br>ගොඩ විමි වස්<br>වරක් සනසා<br>වරක් රවටා<br>වියලි දෙරණම<br>අතහැරීද ? |
| 43 | එකම වහලක් යට<br>හමු නොවන පමනක<br>එපා කෙළි තවම සිනා<br>මට.......<br>තවත් මේ වහල යට<br>දැවි දැවී තිබුන ලිප<br>තෙත් කළේ නුඹ<br>එහෙත් අළුයම ගිනිපුළිගු නැත<br>ගිනි පෙලෙමි සමග පොර ඇඳ මත<br>බිය කනාමැදිරියට නොව |
| 44 | රිදී ඉරි වැටෙත්ම<br>පිය නගයි බස් නැවතුමට<br>තැලි පොඩි උනු දිළිදුකම<br>දොනත් පියවෙත්ම<br>සිඹි පවස සුසුමින් මහපොළොව<br>නිදිකුම්බා මල් වඩම<br>සුවඳ දෙයි හුරතල් කමට |
| 45 | ඇසළ සඳ එලියයි මට ලොවම<br>අමාවකයි තවමත් මගේ ලොවට<br>පායයිද ඇසළ සඳවත් සරුවට<br>කියන්න දැන්වත් දැවෙන සඳවතට |
| 46 | ඇයි නුඹමට මෙතරම් රිද්දන්නේ<br>දෙව්දුනි ඔබ මොන දෙවොලෙද ඉන්නේ |
| 47 | හදේ තනිකම<br>සොරාගත් නුඹ<br>සොයා එමි මම<br>මගේ තනිකම<br><br>එපා මට සඳ එළිය<br>හුරුයි තවමත් කළු එළිය<br>හදේ තවමත් නොකියු කවිය<br>කොහිද හිරු නැති දා සඳ එළිය |
| 48 | මිසර මූර්ති කලාවේ<br>ශිල්පක්‍රම හා මානව<br>නිර්මාණය හි ස්වාභාවය |
| 49 | එදාවගේ අදත් පොද වැස්ස වැටෙනවා<br>මල් පිපුණු ගහ ගාව තව ඉඩ තියෙනවා<br>නුඹ මගේ ලයේ නැති අඩුව මට දැනෙනවා<br>මට තවම මං අහිමි මගේ කවිය මම ලියනවා |
| 50 | සුදු වතින් සැරසී අවුත්<br>පවිකාර ආත්මය<br>මගේ හද අසපුවම<br>අපිරිසිදු කළ සැටිය.....<br><br>පින්සාර ආත්මය<br>නොවැඩියේ ඇයිද ඔබ<br>ඔබ නමින් මා තැනු<br>නවමු හද අසපුවට ...<br><br>පෙරුම් දම් නොපිරිද<br>වතාවත් නොකළාද<br>මා තැනු හද කුටිය<br>කිළිටි යැයි හැඟුනාද.... ?<br><br>මේ භවේ නොවන්නෙද<br>මතු භවේ පතන්නෙද<br>අවසාන සුසුම් පොද<br>වියැකෙන්න බොහො දුරද.......? |
| 51 | “ialවුටි ඔයාට මම ඉස්සරවෙලා පොඩි<br>උපක්‍රමයක්<br>කියා දෙන්නම්. එතකොට ඔයාට ඕනම තැනක<br>ඕනම කෙනෙක් එක්ක පිවිත් වෙන්න පුළුවන්<br><br>පිවිතේ දිහා ඒ අනිත් මනුස්සයා බලන විදිහට<br>බලන්න දුවේ<br>ඒ කියන්නෙ?<br>එයාගේ සපත්තුවට බැහැලා ඇවිදින්න<br>ගත්තහම එයාලා<br>හිතන හැටි ඔයාට අවබෝධ වෙයි දරුවෝ |
| 52 | නෑ<br>මං ඒ ගැන කවි කියන්නේ නෑ<br>මොකද....<br>කුරුල්ලො තාමත් මට කවි කියන නිසා<br>හිමි වෙන්න ඕනෙ කියලා හිතුවත් වෙන<br>කෙනෙකුට<br>මා ගාව ඉන්න ඕනම කිව්වා<br>ඒ ලෙන්ගතු කම මට දැනෙනවා<br>ඒත්..... ඒ අතීතය මට ඕනේ නැහැ.<br>මට දැන් තියෙනවා ලස්සන වර්ථමානයක්<br>දැනෙනවා තියෙනවා කියලා<br>ලස්සන අනාගතයක්<br>ඉන්නවා මට ආදරේ කරන්න කෙනෙක්<br>බලාන ඉන්නවා මගේ දිහා<br>ආදරෙන්<br>ලොකු ලෙන්ගතුකමක් එක්ක<br>මට හිතෙනවා<br>මේ ලොකේ ඉන්න<br>වාසනාවන්තම පෙම්වතිය මම කියලා |

| | |
|---|---|
| 53 | එක් වෙන්න හිතුවට<br>වෙන්වෙන්න නොහිතුවට<br>මං ආසයි<br>මේ ලොකේ ඉන්න<br>ලොකුම හතුර නුඹ වෙනව නම්<br>නුඹ මාව වත්<br>මා නුඹ වත්<br>නෑ හඳුනන්නේ<br>හිතුවට හඳුනනව කියල<br><br>ක්ෂිතිජය විතරක් නෙමෙයි<br>හැම දෙයක් ම<br>මේ ලොකේ මායාවක්<br>ඇස් රවටා මිරිඟුවක්<br><br>ඒත් ......<br>ලස්සනයි.<br>සුන්දරයි. |
| 54 | දුර අහසට වෙලා<br>තනියම ඉන්නේ ඇයි?<br>ආස නැද්ද......මං ගාවට ඇවිත්<br>අහස දිහා බලාන ඉන්න .<br>හැබැයි ඉතින් එතකොට .......<br>නුඹට හඳ දකින්න බැරිවෙයි.<br>හඳ පායන කොට<br>අහසේ ලස්සන දකින්න බැරි වෙයි.<br>මොකද.....<br>නුඹ මා ගාව නිසා |
| 55 | පුළුවන්නම් ඈත් වෙන්න<br>හැම දේකින්ම<br>වෙන්වෙන්න.<br>දුරින් ඉන්න<br>පුළුවන් වේවි මට<br>ලේසි වේවි<br>සොයාගෙන යන්න<br>අවසානයක්<br>ආයිත් කවදාවත් නොඑන්න. |
| 56 | මට දැනෙනව<br>මා දිහා බලාන ඉන්න වග<br>මං කවදත් ආදරය කරන<br>ඔය ඇස් දෙක<br>මං දන්නව<br>ළඟ නොහිටියට<br>මා දිහා බලාන ඉන්නව කියලා<br>මේ ලොකේ<br>හෙම්බත් උනාම<br>දකින දකින කෙනාගෙන්ම<br>මං හොයනව ඔය ඇස් දෙක<br>තාත්තේ...<br>මං දන්නව<br>තාත්තට වද දිදී<br>බලාන ඉන්නව කියල<br>ඔය ඇස්දෙක<br>මං එනකන් පාරදිහා<br>තාත්ත තරහ නෑ නේද<br>මා එක්ක<br>දෝණි එනවා තාත්තේ<br>නුඹ ගාවට<br>ඉක්මනින්ම |
| 57 | **කටු මැටි ගෙපැලේ**<br>කටු මැටි ගෙපැලේ බිම වැතිරී<br>සිහිනෙක තනිවෙන අප්පච්චී<br>යන්තම් හේනට එළිවෙද්දී<br>හේනේ තනිවෙයි අප්පච්චී<br><br>සෙනෙහස ළඟ දුක සෙනෙහස<br>හිතසපුරා දුක අතුරාවී<br>සුදු රැලි ගවුමේ මඩ තැවරී<br>කාට කියන්නද අප්පච්චී<br><br>කළුවර ළඟ හිත කළුවර වී<br>හැන්දෑවට ගෙට ගොඩවේවී<br>හැර ගිය සෙනෙහස සුවඳ දිදී<br>ඔබ රිදවනවද අප්පච්චී |
| 58 | **බාල වියේ**<br>බාලවියේ වැලි කෙළියේ<br>පෑ ළෙංගතුකම්<br>ආලවියේ වෙල් එළියේ<br>බැඳුණු හාදකම්<br>බාල මස්සිනේ නුඹගෙන්<br>ඈත්වෙලා දැන්<br>ආලවන්තකම්<br><br>සුපෙම් කැදැල්ලට රහසින්<br>ගොයම් කිරිල්ලක ඇවිදින්<br>නුඹ දන්නේ නෑ<br>මට දැනුනේ නෑ<br><br>නුඹෙන් පැතුව ආල පැතුම්<br>මගෙන් ඈත පාව ගිහින්<br>නුඹ දන්නේ නෑ<br>මට දැනුනේ නෑ |
| 59 | පුංචි කුඹියෙක්<br>මංගාවට ඇවිත්<br>හොඳටම ලංවෙලා<br>මගෙන් අහනවා<br><br>"මොනවද ඔයා කල්පනා කරන්නේ....<br>කියන්නකෝ මටත්<br>හවුල් වෙන්න ඔයාටම" |
| 60 | තුරුළු වෙන්න<br>සිප ගන්න<br>හිනා වෙන්න<br>දෑස පියාගෙන<br>ම්....<br>විඳින්න ඒ සුවඳ<br>කෝ<br>ඇත්තටම කෝ<br>ම්.....<br>හිනාවෙන්න<br>ආසයි හිනාවෙන්න<br>දෑස පියාගෙන.... ම්....<br>හිනාවෙන්න |

| | |
|---|---|
| 61 | **රෑ මනමාලිය**<br>වළා යහනක<br>අමාවක සඳ<br>බඳා සිප<br>හඬා වැළපෙන<br>මලානික තරු<br>කැකුළියේ<br>විරාමය අත ළගයි<br>නුඹගේ<br>සරාගික වූ<br>ප්‍රේමයේ... |
| 62 | **රත්රනින් ආදරයක්**<br>රත්රනින් ආදරය හැරදා ආ මා<br>ඉමිටේෂන් ආදරයක් ඔහුගෙන් ලැබුවා<br>ඉමිටේෂන් ආදරයේ කැලි කැඩුනු දා<br>රත්තනේ ඔබ ඉන්නේ කොහොමද සිතුනා<br><br>රත්රන් නික්ම ආවත් මා පියාපත් සලා<br>සිඳිලා අද ගත සිත විඩාපත් වෙලා<br>ඔබත් නොමැති ඔහුත් නොමැති<br>කතරක තනිවෙලා |
| 63 | **කතරගමේ දෙවොල් බිමේ**<br>කතරගමේ දෙවොල් බිමේ<br>නෑ දෙවියන් දුටුවේ<br>සිඟා යදින මල් කැකුළකි<br>නෙතු අද්දර පිපුනේ<br>කතර ගමේ දෙවිවරුණේ<br>පතළ වෙලා දෙරණේ<br>සිනු හඬයි ඉකිබිඳුමට<br>වඩා තදින් ඇසුනේ<br><br>මැණික් ගගේ දිය දෝතක<br>මලේ කඳුළු තිබුණේ<br>දෝතට ගත් කඳුළක තෙත<br>නෑ හිතකට දැණුනේ |
| 64 | **සිපද තාලෙට**<br>සිපද තාලෙට නැළවිලි ගී කිව්වා<br>ගී පද තාලෙට මගෙ හිස අතගෑව<br>මා නිදනා තුරු නොනිදාගෙන උන්න<br>ආදර අම්මේ මතු දා බුදු වෙන්න<br>මවක උසුලනා ලොවක වේදනා<br>මා කුස දරමින් වින්ද දිනේ<br>නොදන්න හින්දා දඟ කෙරුවම මං<br>රිදුනද අම්මේ කියන් ඉතින්...<br><br>කුසට ඔබේ අහරක් නැතිදාටත්<br>ළයට ඉබේ කිරි එරෙන බැවින්<br>සෙනෙහස මුසුකර ඒ කිර පෙවි පින<br>බුදුවෙන්නට මදි වේද ඉතින්... |

| | |
|---|---|
| 65 | **දිලිසෙන රන්වැට**<br>කිරි කළ ගෙන පිරුවට බැඳ<br>සිරි මහ බෝ මළුවට එන<br>පිරිවර තවමත් හිමියනි<br>දිලිසෙන රන්වැට පාමුල<br><br>හිමි ඔබ පිට දුන් එදවස<br>රන්වැට නැත බෝ හිමි වැට<br>බෝ හිමි අද රන් වැට මැද<br>පිරිවර රන්වැට පාමුල<br><br>ඇති හැකි අය රන්වැට පැන<br>සිතු ලෙස බෝ හිමි වැන්දට<br>නැති බැරි පිරිවර හමියනි<br>තවමත් රන්වැට පාමුල |
| 66 | Flowers are not flying<br>But<br>Bees are flying<br>to the flowers.<br>that is the truth<br>Bees come to the<br>flowers<br>Althongh they wherever<br>born. If they<br>fragrance and<br>nutrient. |
| 67 | මලක් තියෙනව මෙහෙම<br>මේ ලස්සන දැන් විතරයි<br>හවස් වන විට<br>මා පරවී යනවා<br>බඹරෙක් කියනවා<br>ඔය මල මගේ<br>ඔය මලත් එක්ක<br>මමත් මැරෙනවා කියල<br><br>මල කියනවා<br>බඹරෝ ඔයාට මැරෙන්න<br>තව කල් තියෙනව<br>මාත් එක්ක මැරෙන්න<br>ඔයා එන්න ඕන නෑ කියල<br><br>බඹර කියනවා<br>ඔය මල වාගේ මලක්<br>මම ජිවිතේට දැකලා නෑ<br>ඔය මලට<br>මම ආදරෙයි<br>ඔය මල නැතිව මට<br>ජිවත් වෙන්න බෑ කියලා<br>එතකොට මල මොනවා කියයිද? |

| | |
|---|---|
| 68 | **අහස යට**<br>මේ විසල් අහස යට<br>අපි අපි වී<br>තනිතනිව ම<br>බලා හිදිමු<br>හිරු මිය යන හැන්දෑවේ<br>මකා දමා නිල සිතුම්<br>අදිමින් සිත්තමට තතු කියම්<br>කිම යන්නේ අප අතැර<br>අඳුරට අප පමණ දී<br>අකා මකා රතු නිම්නය<br>ගසා බසා අප පල්ව<br>අඳුරු දෙනෙත් දිප්තව<br>මුසළ සිත් පැහැයෙන් නැහැවී<br>ආයෙත් හිරු උපදිනවා සහතිකයි<br>අප හිටි තුරු හිස් හිස් මුදුනෙම<br>කවදාහරි දිනයක<br>නවහිරු උපදිනවා සහතිකයි<br>ඔව් සැබැවක්මයි<br>යලි කිසිදින නොමියෙන ලෙස<br>නව හිරු උපදිනවා සත්තයි |
| 69 | **වංගුව**<br>සියල්ල මා පසුකර<br>යනු කිම ?<br>සියල්ල මා අතැර<br>යනු කිම<br>අඳුරින් දෙනෙත් විඩාපත් කර<br>මිහිදුමින් සිත්තම් කර<br>යන්නේ කොයිබටද???<br>නුඹට නුහුරු වේගය<br>රතු දිප්ත පහන්<br>නිවි නිවි දැල් වී<br>ඉස්සරහ වංගුවක් !!!<br>එකවර මගේ සිත ගැස්සුනා....<br>කියක් නම් වංගු පසුකලේද යත්<br>එපමණ වර මසිත ගැස්සී ගැස්සී<br>රිදුම් දී හැඩුවා මට මතකයි...<br>ඉස්සරහා වංගුවක් !!!<br>හා! ඉතිං මට කම් නැත<br>කොපමණ වංගු ආවත්<br>සොයම් පිළිතුරු<br>අද ගැස්සුන ද<br>හෙට පිපි සිනා කැන්<br>බර වේවී බිමටම... |
| 70 | **සංගිද පාමුල**<br>සංහිද පාමුල<br>නිවුණු පාන ළග<br>කිමැයි හඩන්නේ අප්පච්චි<br>නොහඩා කියපන් උලලෙනි<br><br>බටහිර අහසේ<br>ඉරබටු තරුව නිවී<br>සංහිද පාමුල<br>කළුවර දිගාවුනි<br>ගමටම හඩගා කියපන් උලලේනි<br><br>පොරි මල් විසිරී<br>සිල්ලර කාසිවැටේ<br>සංහිද පාමුල<br>නොනිදා නිදන හැටි<br>ගමටම හඩගා කියපන් උලලේනි. |

| | |
|---|---|
| 71 | ගිරා පැටියා<br>උඹට තටු ලැබුණා කියලා<br>ඔය හැටි පියාඹන්න<br>හදන්න එපා<br>ඉර ගාවට ගියොත්<br>උඹව පිච්චිලා යාවි.<br>හඳට ගියොත් හඳට ගියොත්<br>උඹට කන්න නැතිව<br>මැරිලා යාවි.<br>පියඹල පියඹල ගිහිල්ලා<br>ඔය අත්තටු දෙක<br>දවසක විඩාවට පත්වේවි<br>එදාට නුඹට<br>මගේ පුංචිකුරුලු කූඩුවේ<br>දොර ඇරල තියෙවි. |
| 72 | අහිංසක පුංචි<br>පලගැටියෙක්<br>මගේ අතේ වැසුවා<br>දගකරන්න<br>එපා පැටියෝ<br>එක තැනක<br>වහලා ඉන්නකෝ<br>මම කිව්වා<br>ඔයත් එක්ක මම<br>සෙල්ලම් කරන්න ආසයි<br>පලගැටියා කිව්වා<br>පලගැටියත් එක්ක<br>මම සෙල්ලම් කලා<br>මේ පුංචි පලගැටියා<br>මා එක්ක වාගේ<br>දවසක ගින්දරත් එක්ක<br>සෙල්ලම් කරයි කියලා<br>මට බය හිතුනා<br>පලගැටි පැටියො<br>ගින්දර ලගටනම්<br>කිට්ටු වෙන්නවත් එපා<br>මම කිව්වා<br>පලගැටි පැටියා හිනාවුනා<br>ගින්දරට මම ආසයි<br>මේ හිතල රාත්‍රියේ<br>ගතට උණුසුමක් ලබන්නට<br>ඇත්නම් කදිමයි කියා<br>කිව්වා<br>එපා එපා<br>හිතන්නවත් එපා<br>මගේ අත් දෙක එක්කර<br>ඔයාව වසා ගන්නම්<br>මුළු රැය පුරාම<br>මගේ අත්දෙකේ උණුසුමින්<br>ඔයාට තවත් සීතලක්<br>දැනෙන එකක් නැහැ<br>මම කිව්වා<br>පලගැටි පැටියා<br>එය ඇසුබවත් මට<br>පෙනුනේ නැ<br>පලගැටි පැටියා ටික<br>වේලාවකින් අසල තිබු<br>ලාම්පු දැල්ල වෙත පැන්නා<br>එහි දැඩි රස්නයට<br>හසුවී අත්තටු දෙක<br>පිලිස්සී යන අයුරුත්<br>මගේ දැසටම දුටුවවා<br>එකෙනෙහිම ඇද වැටුනු |

| | |
|---|---|
| | පළගැටි පැටියා<br>වේදනාවෙන් දැගළුවා<br>කෑ ගැසුවා<br>මට දුක හිතුනා<br>පළගැටි පැටියා බේරා ගන්න<br>බැරිවීම ගැන |

| | |
|---|---|
| 73 | වැස්ස කාලේ<br>මගේ අතු<br>දළු දාලා හැදුනා<br>මල් පිපුන<br>මා ඉක්මනින්ම හැදුන වැඩුන<br>අකාසේ වලාකුළුවලින්<br>ඒ කාලේ පිරිලා තිබුනා<br>මට ඇති තරම්<br>වතුර තිබුනා<br>මා අවට පරිසරය<br>ඉතාම  සිසිල්ව තිබුනා<br>සිසිල් සුළන්<br>මාගෙ අතු පතර<br>සොලවා හමා යනවිට<br>මට කොතරම් සතුටක්ද?<br>එත් දැන්<br>නියගය ඇවිල්ලා<br>ආකාසේ ආසාවකට<br>එක වලාකුළක්වත් නෑ<br>ගිනිරස්නෙට මුළු<br>ගතම පිච්චෙනවා වගෙයි<br>හමා එන රස්නේ සුලං<br>වලින් මාව පිච්චිලා යනවා<br>උදේ ඉඳලා රෑ වෙනතුරු<br>ඉර තදින් පායනවා<br>ජල බිදක් නැතිව<br>පොලොව කරවෙලා ගිහිල්ලා<br>ඉරිතලා ගිහිල්ලා<br>මගේ මුල් ටික<br>වතුර ඉල්ලනවා හඩමින්<br>අනේ ආකාසේ<br>මට වතුර බිඳක් ලබාදෙන්න<br>නැතිනම් තව සුවල්ප දිනකින්<br>මාගේ තිබු<br>අවසාන කකුලෙත්<br>ඉතා අපහසුවෙන් වැඩුනු<br>ඒ<br>රතු රෝස මල<br>අද උදේ පිපුණ<br>එය සමහර විට<br>මගේ ජිවිතේ<br>අවසාන මලද<br>විය හැකියි |
| 74 | ඔබ අපෙන් වියොවී<br>නොසැලු කදුලැලි මගේ හද<br>විටින් විට නෙතු අගට ගෙනෙයි ඔබ<br>පියාණනි ඔබ සුසුම් අද අපෙන් වෙන්වෙලා<br><br>අතුල තරුමල් පොකුරු එකින් එක මැලවිලා<br>පුරහදේ සොම් සිසිල වළාවක සැඟවිලා<br>නොපතනා වියොවෙන් දෙනෙත් අප හඬවලා<br>මන්ද අප තනිකලේ පිය සෙනෙහෙ තවරලා. |

| | |
|---|---|
| 75 | **දුක් සුසුම්**<br>කඳුළු කැට වියැළිලා<br>මහපොළව ඉරිතලා<br>තල් වැටේ මායිමේ<br>දුක් සුසුම් තනිවෙලා<br><br>මහපොළව වියැලිලා<br>ගොහොරු මඩ කැලතිලා<br>මහළු ඇගේ දෙඅත් පතෙ<br>දිය බිඳක් තැවරිලා<br><br>සෝ සුසුම් ඉකි ගසයි<br>මිණිබිරිය තනිවෙලා<br>කිරි නොමැති තණ පුඩුවෙ<br>සෙනෙහෙ දිය කැටිවෙලා. |
| 76 | සඳ එළිය වැක්කෙරෙන<br>රාත්‍රිය දැන්<br>මට තනිය හොඳටෝම<br>නුඹ නැතිව ඇත්තටම<br>මේ ගෙවන වසන්තය<br>මිහිරි නෑ එච්චරම<br>සබඳ නුබ මා එක්ක<br>හිනැහෙන්න ඇත්තටම<br>ජීවිතේ තනිකමට<br>නුඹට හැකි මගට එන්න<br>සඳ එළිය බිම වැටුනා<br>වැව් බැම්මේ ඇවිදින්න<br>එන්න නුඹ මගෙ ළගට. |
| 77 | මේ මිහිරි වසන්තයේ<br>මම තනිව හිඳින්නද<br>තවත් කල් යන තෙක්ම<br><br>නුඹට නුඹේ ඇස් දෙකට<br>මම තවම පෙම් කරමි<br>දරාගෙන සියලු දුක්<br>මම තවම පෙම් කරමි<br><br>නොදැන නුඹ මගේ හිතට<br>දුන්න බෝ දුක් සැවොම<br>දරාගෙන පෙම් කරමි<br><br>වසන්තය නිම නොවන<br>සිහිනයක් වී පිපෙන<br>නිමක් නැති නෙත් අයා<br>මග බලා ගෙන හිඳිමි. |
| 78 | **ඈ .....**<br>බලා හිඳිමි<br>දුර ඈත ඈ....ත ඈ............ත<br>දෙනෙත් හකුළුවා<br>දැල්වෙන තෙක් රතු එළිය<br>පාර හරහා යන්නට<br>ඉඩ නොලැබේ<br>ඉහින් කොනින් දාදිය<br>දරාගත හැකිද යම් දෙයක්<br>අසල කාණුවකි හමන දුගඳ<br>දරාගත නුහුනු තැන<br>එහි!<br>සිරස්ව පිදුම් දේ<br>පොදු දහදිය<br>පෙමින් තැබුවෙමි සිත්වෙයි<br>තනුව හඬනාන්තය<br>ඇතින් දිස්වන ගමනාන්තය<br>සන්දාහලකයන් දිස්වන ඒ ගමනාන්තය<br>ඔව් මම යමි<br>එකදවසම<br>කඳු ඉහිල් කඩා බිඳ ගෙන<br>කොතරම් දුව දුව කම් නැත<br>ඔව් |
| 79 | **නුඹට**<br>තබා බර අඩි<br>මගේ හිත උඩ<br>යන්න යනවද<br>යළි නොයෙන්නම<br>මේ වසන්තයේ<br>මල් පිපෙන වග<br>දන්නේ නෑ මම<br>දකින තුරු නුඹ<br>මියුරු වදනක<br>පටලලා නුඹ<br>කියනවද මට<br>ආදරේ බව<br>මග බලා ගෙන<br>ඉන්නේ මගේ නෙත<br>දකින තුරු නුඹ. |
| 80 | දියවුණු වසත් සඳවත<br>සඳදිය බෝම අරගෙන<br>ආයෙත් ඇවිත් පායන<br>හේවුඩි අහස පාමුල<br>කොවුලන් නොවු කොවුලන්<br>සත්සර තුඩිනි ඇහිඳින<br>මොහොතට ඇවිත් යනු මැන.... |
| 81 | හිරු එළියයි<br>උදේට පායා<br>හවසට බැස යන<br>නුඹ මට... |

| | |
|---|---|
| 82 | **අවසර බුදු හාමුදුරුවනේ**<br>ඉසිපතනේ මිගදයේ<br>මෙත් මුදිතා කරුණා සයුරේ<br>සම්දු වදින්නට සිසිල ලබන්නට<br>මට අවසර ඇත්නම්<br><br>විසිරුණු හදවත පිපි නෙළුමක් වී<br>බුදු සම්දුගෙ පාමුල වැටෙමින්<br>බුදු බණ පදයක් අහන්න ඇත්කම්<br>රජ කිරුළකි මට මෙලොවේ<br><br>දෙදහස් පන්සිය වසරක් ගෙවුණා<br>තවමත් අපි මේ සංසාරේ<br>ආයෙත් නොයෙන්න මොක් සුවලබන්න<br>අවසර බුදුහාමුදුරුවනේ..... |
| 83 | **මකරන්ද**<br>මකරන්ද සිනාසි<br>ඉඟිමරයි හොඳටම<br>ගැස්සුණ සිත් අහස<br>නොසිතූ විලසින්ම<br>පාවී ආ නමුදු කළු වළා<br>කාලය නොවේ වස්සානයට<br>පොළොව බදාගත්<br>නුග මුල් දාරා<br>යලි ලිහනු කෙලෙසින්<br>අහසට විහිදි අතු<br>පාහිනු මිස කපනු බැරිය සැබවින්<br>පිදෙන්නට පෙර අස්වනු<br>වනසනු මොන හිතකින්<br>නුරා කැන් පොඩිකර<br>විසිකලා අහසටම<br>හිත් කඳුළු ඇරී<br>යලි වැසෙයි තදටම<br>මගේ ලොවේ අධිපති හිරු<br>කතරමැදින් එළියට නම්<br>කොහෙත්ම නෑ ඉඩක් |

| | |
|---|---|
| 84 | **මකුළුවාගේ මලගම**<br>මළ මකුළුවෝ උඹ<br>ප්‍රේමයේන් වෙළෙන්නැති<br>උඹේ ළඟ ඇති<br>අන්තිම උණුසුමත්<br>ඇයට දෙන්නැති<br>ඇයට දිලම<br>උඹ මැරෙන්නැති<br><br>මුදල් කරදර වෙලාවට<br>දවා රෑ දෙකේ දිම<br>දැල් වියන්නැති<br>රැකෙන්නට මිස<br>මරන්නට නොව<br>බොහෝ වෙහෙසි<br>දැල් වියන්නැති<br>මැදියම් රැය වෙද්දි ඈ<br>උඹ නැතිව නිදන්නැති<br><br>උඹ වියපු දැල්<br>හොරෙන් විකුණා<br>ඈ අදින්නට සළු මහන්නැති<br>උඹට ගන්නට<br>බැරිව යන්නැති<br><br>ප්‍රේමයේ මුදු ඊතලය වැද<br>නුඹත් අකලට මැරෙනතට ඇති<br>ප්‍රේමය ම තව<br>විෂ දතක් බව<br>මකුළුවෝ උඹ<br>දන්නෙ නැතුවැති |
| 85 | **තුරුණු සිත**<br>වසන්තය විසින් විකසිතකළ උයන<br>හිමි වන්නේ කාටද<br>වසන්තය විසින් විනාශ කල උයන<br>විකසිත කරන්නේ කව්රුද<br>තුරුණු විය මෙතරම්ම උණුසුම් කරන්නේ<br>කවුරුන්ද<br>මහ සයුර කඳුළු සේද<br>එහි රැලි සිනා සේද<br>තුරුණු වියට මෙතරම්ම<br>කඳුළු සිනා කුමටද<br>හද සැලි සැලි නොසැලෙන<br>තේරුම් ගත හැකි සේ නොහැකි<br>මේ අපේ තුරුණු වියයි<br>සසල වී නිසසල වන<br>නිසල වී සසල වන<br>නිහඬතාවයෙන් විප්ලවයකි<br>සීමා වැටකඩුළු නැති තුරුණු අප සිත්<br>අනන්තයටත් අනන්තයි<br>වසන්තය විකසිත වූ උයන<br>මිලින වෙයි හෙට දිනේ<br>වසන්තය විසින් විකසිත කළ උයන<br>හිමිවන්නේ කාටද |

| | |
|---|---|
| 86 | මුළු ලොවට ඉහලින් සදාකාලික පායන හිරු සඳු<br>මහි මාතාවගේ හිසේ කිරුළ පලඳින වනමල්<br>ගොරහැඬි ගල්ගෙඩි පසුකර සයුර වෙත යන ගංගාවන්<br>ගෙන්වා අපේ ආදරයට උපමාවන්<br>මිහිලියගේ උණුසුම ගන්න ඇදහැලෙන වර්ෂාවන්<br>මිහිරි සිතුවිලි සිතට කොඳුරන මද සුළඟ<br>දෙනෙත සනසන තුරු මුදුන්වල නිල්පැහැය<br>ගෙනාවා අපේ ආදරයට මතක සුවඳ<br>මඩ දියෙහි ඉපදි සුවඳ දෙන රත් නෙළුම්<br>පෙති හැකිලෙන්න කලියෙන් මලේ සැගවෙන වන බඹරුන්<br>දේදුණු පාටින් පිවිතේ බර අරන් ඉගිලෙන සමනලුන්<br>ගෙනාවා අපේ ආදරයට පැවතුමක්<br>උදයේ පිපිදී හවසට පරවෙන වන මල්<br>කුහුඹින් ගෙන යන දේදුණු පාටැති සමනල් තටු<br>පැටව් නැති වු මුව දෙනකගෙ අදෝනා හඬ<br>ගෙනාවා අපේ ආදරයට නිමාවක් |
| 87 | නුඹේ සුසුම් වලට උන්ගේ පපු කැවුතු<br>පුපුරාවි යයි බියෙන්<br>නාස් පුඩු වසා පුළුන් ගුලිදෙකකින්<br>දැත් බැද නාභිය මත තබා<br><br>කෑගසා කියාපන් තාත්තේ<br>නුඹට උණ විනාසය<br>දෙතොල් එක්කර මැසු<br>නුල් පට කඩාබිඳ  දමා<br><br>මිනි පෙට්ටි මුදලාලි<br>උදයටත් උවසටත්<br>බුදු පාන් ළග වැඳ වැටි<br>ඇඬිය<br>සරුසාර හෙට දිනත් |
| 88 | **නුඹ**<br>බොහෝ දුර ගොස්ය<br>අවසරයි යන්නට නුඹට<br>හිසලූ ලූ අත<br>එවිට<br>හැකිවේවි නුඹට<br>අවැසි අවැසි දේ කරන්නට<br>හමුවු දා පටන්<br>නුඹට කළ ගුණ කම්<br>නුඹ සිතින් මැකී ගිය හැටි<br>ඉක්මනින්<br>පුදුමයි<br>මනු ලෝ නම් ගති<br>කමක් නෑ නුඹට හොඳනම්<br>තව දෙයක්<br>සාපයක් වී නම්<br>අප නුඹට<br>මරා දැමු අප ලබැදි සිත්<br>කිසිම කිසි දිනෙක<br>නොඉප දෙම් නුඹ වෙනුවෙන්<br>සහතිකයි |
| 89 | **සකි නුඹ ලිහිණියෙකි**<br>වසන්තයේ නිල් අහසට<br>හිත පෙමිනි<br>සරන්නට හැදුව නුඹ ගැන<br>හිත දුකෙනි<br>ලියන්නට පමා වුවාදැයි<br>දැනුනි<br>නොලියා ඉන්න දැන් මට බෑ<br>සකි සඳුනි<br><br>බොහෝ කැකුළු පිදුනු<br>තුරුවියන් මත<br>නොපිපුනු මලකි නුඹ<br>නෙළුවේ පුදන්නට<br>සුවඳ නොදැන මල් කැකුලක<br>හැඩරුවට<br>නුඹට වඩා රුවටුනේ අපි<br>හිනාවට<br><br>සිහින පිපෙන මල්ගොමුවක<br>අතු පතර<br>බොහොම දුකින් අතු ඉතිගෙන<br>නුඹ නිතර<br>තනා නුඹේ කුඩුව එහි<br>යුහුසුළුව<br>තනිව ඇවිත් නුඹේ මුහුණ<br>දොරකඩට<br>හෙලන්නට කදුළු නැතිවග<br>කියනකොට<br>අඩන්නට කරුණු පවසනු<br>බෑ අපට |
| 90 | **සුවඳ**<br>නුහුරුයි මට<br>මේ විදහ<br>සැගවුනිද නුඹ<br>මල්පෙති අතර<br>මට දැනෙනවා<br>නුඹ ඉන්නවා<br>නුඹේ සිනහව<br>කතා කරන නුඹේ ඇස්දෙක<br>හැර නොයයි මා<br>නුඹට පෙම් බැඳි<br>නිසාවෙන් ම<br>මතකයි මට<br>ඒ පුරුදු සුවඳ<br>තවම |

| | |
|---|---|
| 91 | **“ඉරටු මල් ” සංග්‍රහය අද දොරට වඩී**<br>සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයීය දෘෂ්‍ය කලා පීඨ<br>සිසුන්ගේ නිර්මාණ ඇතුළත් ඉරටු මල් කාව්‍ය සංග්‍රහය<br>අද (11 වැනිදා ) උදේ 10ට එම පීඨයේ හේවුඩ්<br>ශාලාවේදි එළිදැක්වේ<br>එම විශ්වවිද්‍යාලයේ උප කුලපති මහාචාර්යය සරත් අමුණුගම දෘෂ්‍ය කලා පීඨාධිපති<br>සුසිරිපාල මාලිම්බඩ<br>සංගීත පීඨයේ මහාචාර්‍ය සනත් නන්දසිරි ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය<br>ආචාර්යය ප්‍රනිත් අබේසුන්දර ප්‍රවීණ නාට්‍යවේදි ජයලාල්<br>රෝහණ යන මහත්වරු මෙම අවස්ථාවට සහභාගි වෙති |
| 92 | ඉනු වරල රටා ගොතා<br>මල් ගවසා තිලක තියා<br>පාන්දරම කොවිල් ළග<br>මල් අහුලන ඉන්දුමති<br><br>මීන නිල නෙතු අද්දර<br>කාන්තිමත් බැලුම් තියං<br>කෝළ මුවින් දිගු පියසින්<br>බඹර රුවක පැහැය සොයන<br>පාන්දරම කෝවිල ළඟ<br>මල් අහුලන ඉන්දුමතී. |
| 93 | දන්නෙමි ඔබ කුමට දැවටෙන්නීද ලගින්<br>පිටුපා යන්නීද සැගවී කෝල ලෙසින්<br>කුමකට තැවෙන්නෙමි කිසිවක් නොවේ වෙනින්<br>මා වෙහෙසවා ඉන් සතුටක් ලබනු රිසින්<br><br>කුමකට රවන්නේ ද මුනට බනිනු මුවින්<br>ඉගි බිඟි තොරන්න වෙහෙසෙනු නොහැක ඉතින්<br>කඳුලැලි සයුර පිහිනා තෙර පැමිණි බැවින්<br>හැකිනම් රිදවන්න ඇයෙත් පුරුදු ලෙසින්. |
| 94 | කපුරු දුම් සුවඳ විඳ<br>නුඹට මට හිඳින්නට<br>මරතෝණ්ඩි රටාවන්<br>නුඹ වටා අඳින්නට<br>තිලක තියන්නට<br>ඇයි දැයි කියන් මට<br>අහස් කුසේ නුඹ<br>නොසිට මා හැර යන්නේ<br>දීපාවලි රෑට<br>අමතක වීද<br>මා බලා හිඳින වග. |
| 95 | **රාත්‍රිය දැන් නුඹගෙයි**<br>මේ පුරහඳ<br>අතගා එන<br>සුළං පොදක්<br>සිපගති මම<br><br>අඳුර මකා<br>එළිය එන්න<br>මියුරු සිහින<br>පළඳවන්න<br>රාත්‍රියම<br>දැන් නුඹගෙයි. |
| 96 | ගැටපිච්ච මල් දාපු<br>වතුර එකක්<br>එළිපත්තෙන් තිව්වේ<br>නුඹ එන කොට<br>පිළිගන්න<br>ආදරේන්. |
| 97 | **දුක් ගීතය**<br>උන්ට පාවඩ එලන්නට<br>කොඩිවැල් අදින්නට<br>පාට වලින් පිල් බෙදී<br>තබන්නට උන්<br>සැප පුටුවල යහමින්<br>දරදිය ඇද්ද සකිසඳ<br>හැකිළුණු උදර දිග හැරේ<br>දණි පණි ගසා නැගිටින්නට<br>කුසට හරි අහරක්<br>ලැබෙන්නේ කවදාද<br>නුඹට නුඹේ පැටවුන්ට. |
| 98 | **නොබිඳුණු ලේ සුවඳ**<br>සසර පුරුදු ලෙස<br>ඉපිද එක මව් කුස<br>විඳිදුක් නොසැලි<br>දම් වැලක පුරුක් අමුණා<br>පැතූ ඒ දිව්‍ය විමානයට<br>තවටිකයි දුර<br>නොහරිනු මා අත<br>තනිව යන්නට බෑ<br>ඉතින් මට.... |
| 99 | දෙනෙත අන්ධව<br>සකල විකලව<br>පවිටු සිතැති<br>සකි,<br>නුඹත්<br>නුඹ හමුවේ මමත්<br>නොමැරි මැරිය, |
| 100 | **ඇයට ලියු කව**<br>සළුපිළි ඇඳි මුදු සෙළු ගත<br>අභරණ පැළඳි කනකර රජත<br>රහමෙර සේය ඉඟ සුඟ ලලිත<br>දුටුමණ බැඳුණු ගිරිළඳුන වෙත<br><br>දිව සළු එලා පාවඩ සේ අතුරන්නම්<br>සල් මල් සලා පෙති ගෙන හිස දවටන්නම්<br>පුන්සඳ රැයේ සඳකැන් දිය නාවන්නම්<br>එනු සිහලියේ හදයහනේ සතපන්නම්<br><br>කසුප් රජුන් නැත කිසිතැනදුටිමි ලියේ<br>මී මැසි දනන් නුඹ ගැන කවි ලියති ප්‍රියේ<br>මිහිදුම් සළුව නුඹ අතුරාපන්කො ලයේ<br>මා හඳ අරන් හද මඩලට වඩිනු ප්‍රියේ |

| | |
|---|---|
| 101 | **මියැදුන වසන්තය**<br>සරසවි පාළු වී<br>තුරුසෙවන වෙලද්දී<br>මුළු ලොවම වෙලද්දී<br>මුළු ලොවම නිසල වී<br>රැහැයි හඬ නගද්දී<br>දැඟිලි වෙලාගිය<br>මතක මං පෙත අතර<br>බක් මහේ කොවුල් හඬ<br>ගයන තනුවක් අසමි<br>උනුහුමට තුරුළු වී<br>පෙම් තනුව කියා දුන්<br>කොවුලාන ඉගිලගොස්<br>ඈත දුර ඈතටම<br>රතුපාට මල් පිපුන<br>මල් යාය සලිත වී<br>සොයන මුත් පෙරමගම<br>නොඑයි සරසවි බිමට<br>බක් මහේ වසන්තය යලිත්, |
| 102 | කැමතිම තරුවක්<br>බැස ගිහින් අහසින්<br>මේ විසල් අහසට<br>පාළුයි දැන් ඉතිං<br><br>නිදාගෙන පිච්ච මල්<br>වසා තොල් පෙති වලින්<br>නුඹේ සුවඳ අවුරාද<br>මා වෙතින්<br><br>මලානික එලිය<br>බොඳ කරන්<br>නුඹත් දැන් බැස ගිහින්<br>කළුවර නිසා අහසින්<br>බැස යා හැකි ද<br>සඳුනේ මේ ජීවිතෙන්... |
| 103 | **කොහොම සරණද සකි**<br>**නුඹ ලිහිණියෙකි**<br>වසන්තයේ නිල් අහසට<br>හිත පෙවිනි<br>සරන්නට හැදුව නුඹ ගැන<br>හිත දුකෙනි<br>ලියන්නට පමා වුවා දැයි<br>දැනුනි<br>නොලියා ඉන්න දැන් මට බැ<br>සකි සඳුනි<br><br>බොහෝ කැකුළු පිදුනු<br>තුරු වියන් මත<br>නොපිපුණ මලකි නුඹ<br>නෙළුවේ පුදන්නට<br>සුවඳ නොදැන මල් කැකුළක<br>හැඩරුවට<br>නුඹට වඩා රැවටුණේ අපි<br>හිනාවට<br><br>සිහින පිපෙන මල් ගොමුවක<br>අතුපතර<br>බොහොම දුකින් අතු ඉති<br>ගෙන නුඹ නිතර<br>තනා නුඹේ කුඩුව එහි යුහුසුළුව<br>තනිව ඇවිත් නුඹේ මුණ<br>දොරකඩට<br>හෙළන්නට කඳුළු නැති වග<br>කියනකොට<br>අඬන්නට කරුණු පවසනු<br>බැ අපට.... |
| 104 | **විමන**<br>පෙනේ විදා නාග සෙන්<br>දිවි අගන පරදවන<br>නිල නෙත් යුගලකින්<br>කාල දිගු වරලකින්<br>කෝල මුදු නෙත් පාන<br>නාග කන්‍යාවියක<br>නැත එතැන නා රජුන්<br>පෙනෙ විදා නාගසෙන් |
| 105 | සුදු ගවුමේ සුදු අරලිය පිපුණා<br>පිනිදිය ඇහැරන හිරුට කලින්<br>වතුසුදු පදුරම මුවමත පිපුණා<br>විසිරුණු පොඩි කැඩපතට හොරෙන්<br><br>දණබිම ඔබලා වරම් ගන්නවා<br>උදේට අම්මගේ හිත පතුලෙන්<br>ඉදිකඩුල්ල ළඟ අම්මගේ ඇස් දෙක<br>උදේ ගිහින් හවසට එනකන්<br><br>ළය ගිනි මොළවා කඳුළින් පොගවා<br>මව් සෙනෙහේ පිසවා සැණෙකින්<br>කුසගිනි නිමවා නැළවූ සැතපූ<br>අම්මේ ඔබ මතු නිවන් දකින් |

| | |
|---|---|
| 106 | බක්මී ගහයට මල් හැලිලා<br>බඹරු එන්ට කලියෙන්<br>හිමිදිරියෙම මල් නෙළුවෝ කවුරුද<br>හිරු පුදින සැණෙකින්<br><br>දැහැකම් මැද බක්මීමල් නෙළුවද<br>ගග යට ඔපදමමින්<br>හිස ගවසන්නට මල්නෙළුවද ඈ<br>නුඹේ හිත ගන්න ඇවිත්<br>බට්ටිත්තෝ නිවහන හැඳුණද රෑ<br>බට්ටිත්තිට සුපෙමින්<br>අහක බලාගෙන ඈ හිනැහෙනවා<br>නුඹේ දැහැකම් වලට හොරෙන් |
| 107 | අනඟ දෙනුවන්<br>නඳුන් උයනේ<br>දෑ සමන් මල<br>දෙසට නැමුණේ<br><br>සිහිදු පෙතිවත<br>සුවැති පවනේ<br>උනග පිනිපොද<br>ළමැදෙ වැටුණේ<br><br>සේද තන පට<br>පත් විදා හැර<br>මලවී හි සැර<br>මලෙහි රැඳුණේ |
| 108 | මගේ දොත<br>මත පිපුණ<br>නුඹේ සුරත<br>හුරු පුරුදු<br>උණුහුමයි<br>තවම මට<br>මගේ මුහුණ<br>මත ඇඳුණ<br>නුඹේ දෑස<br>සිහිලසයි<br>හෙටත්මට |
| 109 | දිමුතු දසන් පිදෙන මුදු හිනාවා<br>ඇත ඉඳන් නුඹ වෙහෙසී ගෙනාවා<br>දෑත දෙපා අවුරා මුදු කතාවා<br>තම හිතේ පැටලි හැර නොයාවා<br><br>මුදුසිතින් එපිටට ඉහිලු තියා<br>කැකුළ දතටකිරි කොයිබින් වරේයා<br>ඉපල් ඉරටු මල් මට තව කොහේයා<br>තටු පැටලි මා කදුළින් පෙණේයා<br><br>ලිපේ ගින්න තුන් වේලම නිවේයා<br>හිතේ ගින්න දළු මෝරා වැඩේයා<br>පාලු සාංකාවෙන් ගේ පිරේයා<br>කවුළු පියන් හැර නුඹකොයි ගියේයා |
| 110 | නුඹේ ගැඹුරු වදන් තුළ නිසළවන විට මසිත<br>නුඹේ සිතම පැතුවා මම රැගෙන ගිය විට<br>මසිත<br>නුඹේ සිහින් හසරැල්ලක සිර වෙන විට මසිත |

| | |
|---|---|
| 111 | අම්මාය නුඹ<br>සෙනේ දිය ගලා ගිය<br>දයා ළය නුඹේමය<br>ළයේ කිරි එරේවිය<br>කිරේ ලෙය නුඹේමය<br>මෙතේ බුදු පදවි ලද<br>මගේ අම්මාය<br><br>විල පතුල සිප<br>ඉන් උඩට නැග<br>මා පිපුණු දින<br>උනුහුමට ගෙන<br>නෙතු කඳුළු පිසූ<br>අම්මාය නුඹ<br><br>විල මතම නොව<br>ඉන් එහා ඉම<br>මා සුවඳ පොද<br>මුහු කෙරූ නුඹ<br>මා ළඟක නැත<br>කොතැනකද අද |
| 112 | මං සුළඟට ආදරය කරනවට<br>නුඹ බයද?<br>බය වෙන්න එපා<br>මං ඈත්වෙන්නෙ නෑ නුඹෙන්<br><br>දන්නවද.....<br>ඔහු ආදරය කරනවා<br>මගේ අවුල් වෙච්චි කොණ්ඩෙට<br><br>ඉතින් කියන්න ......<br>මං කොහොමද<br>සුළඟට ආදරය කරන්නේ නැතුව<br>ඉන්නේ කියලා |
| 113 | ආල වඩන නිල නුවන්<br>පැළ දිගින්<br>කෝල ලෙසින්<br>බැලුම් හෙළයි...<br><br>මුතු මාල පළන්<br>වේලයටින්<br>කෝළ ලෙසින්<br>සිනා සලයි.......<br><br>ආල වඩන නිල රුවන්<br>කාළ ගැබේ<br>කෝළ ලෙසින්<br>සැගවී යයි.....<br><br>මාන බලන් මා ඉන්නේ<br>වැට අද්දර<br>සේල පොටින්<br>අල්ලන්නයි..... |

| | |
|---|---|
| 114 | **රාගය**<br>ලව් සිත<br>වෙව්ලන දැතින්<br>ඉරා<br>h k.ak කර<br>ගිරි ඇතුන් සේ<br>උන්ව<br>නිසල බව<br>රිදවා සසල කරමින්<br>තරුණ ජීවය මත<br>වදන් මුමුණමින්<br>උන්මාදය<br>විය මොහොතකින් |
| 115 | ක්ෂිතිජය දෙස<br>බලාසිටින විට<br>අහසත් පොලොවත්<br>එක් වුනා වගෙයි<br><br>එය මායාවක් විතරයි<br>මේ මහ පොලොවත්<br>මේ මහ අහසත්<br>ඔය විදිහටම තිබුනාවේ<br><br>මේ මහ අහසත්<br>මේ මහ පොළොවත්<br>වෙන් කරන්න බෑ කාටවත්<br>එක් කරන්නත් බෑ කාටවත් |
| 116 | **නොඑන ගමන් ගිය අප්පච්චි**<br>අප්පච්චියේ නුඹ ගියාට<br>අපි හැමොටමත් ඉස්සර<br>තාමත් දුක් වෙනවද අපි<br>දන්නවාද නුඹ කොච්චර<br>සරම් පොටත් අතට අරං<br>නුඹ ගෙට එනකොට ඉස්සර<br>මල් පිපුණද තැන් තැන්වල<br>කොච්චර නම් අපේ හිත්වල<br>නුඹේ දැතින් ඇති දැඩි කළ<br>ගස්වැල් වල මල් කොච්චර<br>බිම හැලි හැලි දුක්වෙනවද<br>නුඹට දැනෙනවද කොච්චර<br>අව් වැසි නොබලා වැඩකළ<br>අප්පච්චියේ ඉක්මන් කර<br>ගෙදරට එන්න තාමත්<br>පමා වුනේ ඇයි මෙච්චර<br>කඳුලැලි බොනවා අපි හැම<br>නුඹ ගියදා පටන් තාමත්<br>තුන් මස පිරිලා වුණාට<br>නුඹ ආවේ නෑ මෙහාට<br>පාර බලා ඉන්නේ අපි<br>හැමදාමත් ගෙළ දික්කර<br>ගෙදර එන්ට පාර තොටත්<br>නුඹට අමතක ද එච්චර |
| 117 | අතපය හැඩුවත් පිලිසරණක් නෑ<br>ඔය නිදි ඇස් නැරෙන බව දැනුණත්<br>ලිස්සා යන පය කලද නපුරුකම්<br>විකසිත හඳවත් කොතැනකදෝ<br><br>තුරුණු වියේ ජව බලයෙන් පිරුණත්<br>සම රැලි වැටිලත් දෑස බොඳවුනේ<br>මේ රිය තුල අසුනක් මට දෙන්නට<br>පින්ඇති හදවත් කොතැනකදෝ<br><br>අබලන් හදවත් අකිකරු වුණත්<br>තොල් පෙති වියලි දහඩිය ගැලුවත්<br>මේ රිය තුල අසුනක් මට දෙන්නට<br>පින්ඇති හදවත් කොතැනකදෝ |
| 118 | මුළු ගතම ගිලන් වී<br>මුළු සිතම ගිලන් වී<br>ගිලන් යහනට වෙලා මම<br>ගිලන් හද පාරවමි...<br>නෙතු පියන් ඔබ සොයායි<br>නැහැ පෙනෙන මානයේ<br>සිත කිරි ගා සැලෙයි<br>දිනෙන් දින ගෙවෙද්දි<br>දිනන්ට දෙයක් පතමි<br>පතන්නට යමක් සොයමි<br>පතන හැම දෙයම ලොව<br>දිනිය නොහැකි බව දනිමි<br>එහෙත්<br>දිනන්ට ඔබව පතමි<br>පතන්නට ඔබව සොයමි<br>පතන පැතුමන් ගොන්නෙ<br>එකම පැතුමක් පමණි |
| 119 | කටු ඇණුන දෙපා<br>හිතලට ගැහෙනකොට<br>තටු ගසා ඉගිලෙන්නට වද<br>ඒ තරමටම හිතේ බර<br>ගංගාවේ ඇවිදගෙන<br>සතා ගහකොළ ඇඳින<br>පුතේ ගෙදර වරෙන්<br>ගොම්මනට පෙම් නොබැඳ<br>අක්කලා අඬනකොට<br>රෙදි වැරලි බරවැඩිව<br>අනේ අහකට වෙයන්<br>මූණකට ඇද නොකර<br>කුස්සියට එබි එබි<br>නොබලපන් ලිබ්බොක්ක<br>මහළුවී උඹේ අම්මා<br>බොන්නේ උණු වුණ කඳුළු<br>හිතත් සතුටින් තිබ්බා<br>අනේ පැල්පත් පොඩ්ඩ<br>ගිනිලාපු බඩගින්න<br>නුඹට බඩගිනි ඇත්ද? |

| | |
|---|---|
| 120 | **සමුගැන්ම**<br>අදුර ඝනකමට කැටි ගැසි<br>කොපුල් මත රැඳී<br>වෙලා සියුමැලි සිහින<br>තටු සලා යා නොදී<br><br>ඒත් මට පෙම් කරමි<br>මේ මිහිරි කළුවරට<br>නුඹට නුඹේ නෙත් දෙකට<br>වඩා මේ කලුවරට<br><br>කලාසොලසෙන් සපිරි<br>දිනක සඳ බැස ගියද<br>මම තවත් පෙම් කරමි<br>එත් මේ කළුවරට |
| 121 | සෞන්දර්ය කලා විෂ්වවිද්‍යාලය පූර්ණ<br>විශ්ව විද්‍යාලයක් බවට පත්වීමෙන් පසුව එයට<br>ප්‍රවේශ වූ පලමු ශිෂ්‍ය කණ්ඩායම ලෙස<br>අප ඉතිහාසගතවීමත් සමග විශ්ව විද්‍යාල<br>මැත<br>ඉතිහාසයේ නුවු විරු සාර්ථක ක්‍රියාදාමයන්<br>රැසක නියැලෙන්නට අපට අවකාශ සැලසිනි ඒ<br>ආරම්භයේ සිට අප ශිෂ්‍ය කණ්ඩායමේ සියලු<br>දෙන එකාවන්ව කටයුතු කිරිමත් විවිධ කුසලතා<br>වලින් හෙබි සහෘදයන් රැසක් අපට එක්වී<br>සිටීමත් නිසා විය යුතුය. ඉන් අත්වූ ප්‍රතිඵල<br>බොහෝය. ඉරටු මල් නිර්මාණ එකතුවද එකි<br>ක්‍රියාදාමයක ඵලයක් බව සඳහන් කල යුතුමය. |
| 122 | ගතට නිර්මාණ එක්කල සියලු නිර්මානකරුවන්<br>අගයන්ගේ ඔවුන්ගේ<br>ඉදිරි ගමන සාර්ථක වේවා යන ප්‍රාර්ථනාවෙනි<br>සමගියයි<br>ගෙන සම්පාදනයේදි හා එළිදැක්වීමෙදී<br>නන් අයුරින් සහය දුන් සැමට අපගේ<br>කෘතවේතාව පුදකරමු<br>මේ හෙතු තුල දුර්වලතා කොතෙකුත්<br>තියෙන්නට<br>පුළුවන<br>හේතු සංස්කාරය කලේ විලස තිබුනත්<br>අති මහත් දැනුමක් නොවේ<br>එනිසා මේ කොතෙකුත් අඩුපාඩු තිබෙන්නට<br>පුළුවන<br>ගෙනේ අඩුපාඩු පෙන්වා<br>දුනහොත් ඒ අපකෙරේ මැදහත් සකිය යා<br>අපිදකිමු<br>මේපොතේ යම් සාර්ථකත්වයක් වේනම් එහි<br>ගෞරවය<br>නිර්මාණකරුවා ඇතුළු 2001/2002 අධ්‍යන<br>වර්ෂයේ සියළු සිසුනට හිමිවිය යුතුය. |
| 123 | සඳ මැරිලා<br>මළගම ද<br>තරුැදිය වී<br>රේණු සැලි<br>බිම වැටිලා තිබුණු....<br><br>එන්න හෙමින්<br>අඩිය තියා<br>මේ අදුරෙම<br>අත පතගා...<br><br>නිදා ඉන්න<br>මේ ගහකොල<br>ඇහැරෙන්නට කලින්ම නුඹ<br>එන්න ඉතිං<br>කළුරේම<br><br>එළිය ඇවිත් හෙට උදේම<br>අරන් යාවී ජිවිතයම..... |
| 124 | **පරාජිත ප්‍රේමය**<br>සියුමැලිය<br>මා පැතු<br>ආදරවන්තිය<br>එන්න<br>මා කරා<br>පැමිනෙන්න<br>ඔය සියුමැලි දෑතන්<br>මාගේ ගෙල සිරකර<br>මාව මරා දමන්න<br>පරාජිත ප්‍රේමයේ<br>ශෝකයෙන්<br>තවත්<br>මා හට<br>ජිවත් වීමට<br>ඉඩ නොතබන්න<br>මරණය<br>සැපයත්<br>එය මා<br>ආදරයෙන්<br>වැළඳගනිමි |
| 125 | ආකාසේ නුඹ දිහාම<br>බලා ඉදං සිංදු කියපු<br>හඳමාමේ නුඹත් එක්ක<br>කිරිපැණි ගැණ කතා කරපු<br>ආදරයෙන් වෙනස් වෙලා<br>නෑ නුඹලා හැර දමලා<br>නිල් අහසත් මගේ හදත්<br>පෑයු සඳ මගේ තනියට<br>අහස වගේ නුඹට මගේ<br>ආදරයෙන් කතා කරමි<br>හුරතලයෙන් නැලවි නැලවි<br>එදාහිටපු පුංචි දොණි<br>තවමත් මම හඳ මාමේ<br>මගේ ආදර නිල් අහසේ |

| | |
|---|---|
| 126 | වේදනා කදුළු වැල්<br>හඳ පෙලන සෝසුසුම්<br>සතුට සිනහව<br>ජිවිතයේ වින්දනය<br>මගේ ලොවට උරුම වූ<br>ඒ සියලු වේදනා<br>නිම කොට<br>හෙට දිනේ<br>වැළඳ ගනු මැනවි මා<br>ආදරයෙන් දයාවෙන්<br>දයාබර මරණය<br>ඔබ මගේ<br>බලාපොරොත්තුවයි |
| 127 | මොකද මාමේ හිනා....<br>ගුරුවරු ජෝකි නුඹයි<br>ව්‍යාපෘති කල් යයි<br>අපි වයසට යයි<br>ඉරටු මල් දොරට වඩී |
| 128 | **සංහිඳ පාමුල**<br>සංහිඳ පාමුල<br>නිවුණු පාන ළඟ<br>කිමැයි හඬන්නේ<br>හඬන්නේ අප්පච්චි<br>නාඩා කියපන් උලලේනි<br><br>බට හිර අහසේ<br>ඉරබටු තරුව නිවි<br>සංහිඳ පාමුල<br>කළුවර දිගාවුනි<br>ගමටම හඬගා කියපන් උලලේනි<br><br>පොරිමල් විසිරි<br>සිල්ලර කාසි වැටි<br>සංහිඳ පාමුල<br>නොනිඳා නිඳන හැටි<br>ගමටම හඬගා කියපන් උලලේනි |
| 129 | ලස්සන හිරු කිරණ දැවටුන මුහුදු ජලේ<br>ක්ෂිතිජය පෙනේවි ඇතින් නිසල ජලේ<br>සියළු දෙනාගේ සිත් එය දැක වශී කලේ<br>ලස්සන උනත් ක්ෂිතිජය මිරිගුවක් බොලේ |
| 130 | ඉරටු මල් පිපුණේ හේවුඩ් ශාලාවේ<br>බිත්ති පුවරුවකය ඒ බොහො දෙනෙකුගේ<br>උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙසය දෘෂ්‍ය කලාවේ<br>සියළුම<br>වසරවල සහෘදයින්ගේ නියෝජනය ඒ තුළ විය<br>කවියද<br>කවියද ගීතයයි කවිකමට ආදි වූ නිර්මාණයන්ට<br>හැකියාවක් දැක්වූ අයටත් නිර්මාණ එක්කය<br>දෘෂ්‍ය කලාපීටය ප්‍රජාව වෙත ඉදිරිපත් කිරීමට<br>දැනට දෙවන වසර ලෙස කටයුතු කරන අප<br>අධ්‍යාපන වර්ෂය බලාපොරොත්තුවයි.<br>අප පලමු වසරේදි බිත්ති පුවත්පත ලෙස<br>ආරම්භ කල මේ කාර්යය පොතක් ලෙස<br>එලිදක්වා දෘෂ්‍ය කලාපීඨ ප්‍රජාවෙන් ඔබ්බට<br>අපේ සහෘධයින්ගේ කුසලතාවය ඉදිරිපත් අපට<br>අවැසි විය. |

| | |
|---|---|
| 131 | **ඔත්පළ පියා කී කව**<br>ගල්වැඩ පලේ මහ පොල් අතු බැන්දාය<br>පොල් අතුපෙලේ සෙවණේ ගල් බින්දාය<br>ගල්පිරි වලේ අපමණ දුක් වින්දාය<br>පත්තිනි කුලේ ඇය නුඹගේ අම්මාය<br><br>පොල් ලෙලි වලේ අමු ලෙලි හම ගැහුවාය<br>පොල් අතු පැලේ හිඳ කොහු මිටි බැන්දාය<br>මහජන පොලේ ඉරිදට කොහු වික්කාය<br>ඒ හැම කලේ පුත නුඹගේ අම්මාය<br><br>අංගිරි ඇළේ ඉවුරේ පන් සෙව්වාය<br>තුන්ඉරි කුලේ පන් මිටි මිටි බැන්දාය<br>ලන්තැරුමේ එලියේ පන් වියිවාය<br>රන්කිරි පුතේ ඒ රන් කඳ අම්මාය<br><br>මහනෙල් විලේ අපටත් මල් පිපුණේය<br>මහ දහවලේ මල් එක දෙක කැඩුණේය<br>නෙළු මහනෙල් සුවඳින් හිත පිරුණේය<br>මහ පන්සලේ හවසට මල් විකිණේය<br><br>බුදු බණ පොතේ බණ පද මට මතුලාය<br>වෙස්සන්තරේ එන කවි පද කොදුළේය<br>මහබෝ පැලේ තුන් වරුවක් වැන්දාය<br>බලපන් පුතේ ඒ නුඹගේ අම්මාය |
| 132 | **වාසනාවන්ත වෙමි**<br>අගය කරන්න<br>අවට ඇති පුංචිම පුංචි දේ පවා<br>කරදර ?<br>නෑ කරදර ගනන් ගන්න එපා<br>ගණන් කරන්න මේ වගේ පුංචි පුංචි ආශිර්වාද<br>ස...තු.....ට සොයා ගෙන පිම්මේ දුවන විට<br>හමුවුණොත් පාර අයිනේකැලෑ මලක්<br>අමතක කරන්න තරම් එහිසුන්දරත්වය<br>කාර්යය බහුල වෙන්නඑපා<br>මොකද<br>ජිවිතේ සැනසිම බොහෝවිට රැඳිලා තියෙන්නේ<br>අප නොසිතන<br>එවැනි පුංචි දේවල් මතකයි<br>ඒවා<br>අගය කරන්න පුරුදුවෙන්න<br>හිතනවාට වඩා<br>වාසනාවන්න වේවි |

133 **වංකගිරියක යාදිනි වළප**
ඉරි තැලුණු රැළි නළල
යට ගිලුණු නෙතු යුගල
නිති සැලසෙන පටු දෙතොල
කිම නගන මැසිවිල්ල

නේක දුම් රොටු අතර
ගොර සපුන් විළිස්සන
වංකගිරියක හඬන
මදි දේවිය නුඹ ය

හඳ නහර කිඳා බැස
ඇට මිදුලු සොයා ගිය
සේනේහය නුඹේමය
පුතුසිතින් මැකිගිය

මුල් දරා දුක් විඳින
විසල් නුග රැකක් විණ
මල් වඩා සුව විඳින
වරම් ඇකයෙන් වැටුණ

දරුපෙමට කිරි එරුණ
මුදු පියයුරන් දෙදෙන
උණුහුමට තුරුළු වුණ
පුතු කොතැන නුඹ කොතැන?
ළය හිස කකියවන
ඇග සහලවයි උණ
ගිනි පිඹින නලල මත
අත තියන්නේ කවුද
ගැබ්බරව කළු අහස
විලිබරව බිම වදන
තද වැසිය නුඹ තෙමන
කොහිද මුවලින්ද පෙණ
නුඹට බුදුබව නියත
කපුටු බෝ සෙවන
එකම අම්මා නුඹද?
ගෙදර බුදුබව නොලද

134 මහ මෙරවන් දුක උහුලාගෙන මම
සුසම් හෙළන කොට මගේ අම්මේ
දැවි දැවි ළය මඩල පුරාගෙන
දුක ඉහිරෙනු දුටුවද අම්මේ

ලේ කිරි කර දුන් අම්මගෙ සෙනෙහස
දැන හඬන කොට මගේ අම්මේ
හෙට දවසෙත් මගෙ ළගට වෙලා
දුක් ගියක් ගයාපන් අම්මේ

මව්පිය සෙනෙහස හඬාවැටෙනකොට
නුඹ විතරයි මගේ ළග උන්නේ
වැළපෙන හිතකට සෙනෙහස දුන් ඔබ
සංසාරේ බුදු වනු අම්මේ

135 සුදු පරවියන් ළග නැදැයින් මැරෙනු
හෙම්බත් බැවින් වියලුණු දෑසින් බලනු
අනියතේ බිමේ පෙර මහ සෑ ගොඩ නැගුනු
නිදියන් පුතේ තව වකුටුව දුටු ගැමුණු

136 බොරපාට ගංදැල
තොන්තුවාවෙන් බැස යන්නේ
මසිත දැනහැඳිනදෝ මන්දා
ලදළු තුරුපත් සැලි
හමාඑන මද නලේ
එනු මැනවි මා හදට
ගොම්මනේ උණුහුම රැගෙන
පෙම් කවක් ලියන්නට
පත් ඉරුව ගනු කෙලෙස
පත්ඉරුව පුරාවට ගලායන
බොර පැහැ කඳුළු බිඳු දැක
පාළු සීතල රැයේ
කණ කොක් හඬ මැදින්
හෙට පහන් වන දිනය
සුහම සුභ දිනයක් නොවෙද ?
ගෙත්තමින් හැඩවැටුණු
රන්පාට රන්හුයෙන්
දැගිලි බැඳන් නුඹ
වස්සාන දොරකඩ නේද?

137 සත් දිනක රතුපස් උඩ
ඇහැළ පෙති මැලවී නිදන

පරමල් සුවඳ විතරමද
සිතේ සාංකාව
යන්තම් හෝ නොදමන

සීතලයි මේ එලිපත්තේ
අම්මේ මට
ගෙට ගොඩවෙන සුළග
නිමා දැම්මා පහන
පත්තුකර තිබූ
නුඹේ රූපයට

කළුවර හිමින් ගස්යට
නුඹ නිතර ගැවසුන
දෙණියේ පලාකොටු ළග
හිස තබා හිමිහිට
නිදියි දිගු රැයකට

කිරා වැටෙන ගොක් රැන් මත
නුඹ විකුණපු වට්ටියක
රටා දැක්කා
අදුරේම අම්මේ මම

138 **අතීතය අනතීතය**
අතීතය වන වනා
මහ උජාරුවට
මවන ඒ වත්මන් සිහින මහා වංශය
වමාරා වමාරා
එකම පම් පොරය
අතීතය අනාගතය
කරන්නට
තොප දරන පුහු වීර්යය
අතීතය අනාගතය කළදාක
කෝ තොපට අනාගතය
අත්හැර දැමා
සිඳ බිඳ දමා
දිනත්වය
සිතාපන් අදයි
පැරකුම් යුගය.

| | |
|---|---|
| 139 | **සුවඳ**<br>නුහුරුයි මට<br>මේ විදිහ<br>සැගවුණිද නුඹ<br>මල්පෙති අතර<br>මට දැනෙනව<br>නුඹ ඉන්නව<br>නුඹේ සිනහව<br>කතා කරන නුඹේ ඇස්දෙක<br>හැර නොයයි මා<br>නුඹට පෙම් බැඳි<br>නිසාවෙන්ම<br>මතකයි මට<br>ඒ පැරණි සුවඳ<br>තවම. |
| 140 | **නිදිකුම්බා මල**<br>රිදි ඉරිවැටෙත්ම<br>පිය නගයි බස්නැවතුමට<br>තැලි පොඩි වුණු දිළිදුකම<br>දෙනෙත් පියවෙත්ම<br>සිඹි හංස සුසුමින් මහ පොළව<br>නිදිකුම්බා මල්වඩම<br>සුවඳ දෙයි හරතල් කමට. |
| 141 | වළාතුළින් එබී බලා<br>නුඹද අව්ව වැසිදෙවන්නෙ<br>මහ පොළොවක් තරමට රළු<br>දුක් කන්දක් මගේ සිතේ<br>ඒ හිත ගෙන ඔට්ටු දුවන<br>මට හිමි මගේ ජිවිතයේ<br>දිනුම් කනුව පහු කරගෙන<br>ආරණ්‍යයේ සිල් සුවඳට,<br>ළංවී කහවත දමන්න<br>හැකිවේ නම් නුඹේ මහිමෙන්<br>ඔවදුදෙව සිතවෙනුවට,<br>ලැබෙවී මට මං දන්නවා<br>බවුන් වඩන සිත් පොඩ්ඩක්....., |
| 142 | **"අසම්මත ජිවිතයම"**<br>සඳ මැරිලා<br>මළගම ද<br>තරුදියවී<br>රේණු සැලි<br>බිම වැටිලා තිබුණා<br><br>එන්න හෙමින්<br>අඩිය තියා<br>මේ අදුරෙම<br>අත පත ගා<br><br>නිදා ඉන්න<br>මේ ගහ කොළ<br>ඇහැරෙන්නට කලින්ම නුඹ<br>එන්න ඉතිං<br>කළුවරේම<br>එළිය. |
| 143 | නුඹදන්නවාද?<br>අවදියෙන් සිටින හැම මොහොතකම<br>නුඹේ මතකය සිතට තනි රකියි<br>රැය පුරා සිහිනයක දැවටෙමින්<br>නිදියහන අද්දරම නුඹ හිඳියි<br>දන්නවද නුඹ?...<br>නුඹ... දිනෙක පිටමංව<br>ගියොතින් මගේ ලොවින්<br>ජිවිතය නවතිවි<br>මොහොතකින්..... |
| 144 | **සිත රළු මහ වැස්ස**<br>සිදුරු දියවේ පොල් අතු අස්සේ<br>පෙගුණ පොත් පෙරළෙයි ඇමටිය වැස්සේ<br>රැළි මැකුණු සුදුගවුම වේළේ දුම්මැස්සේ<br>මුමුණන වදන් නොරුදේ බේබදු හඬ අස්සේ. |
| 145 | ලොවට වහංවී සඳමත හැංගි<br>ඔබ පුදනා උණුසුම් සෙනෙහේ<br>ලැබෙන තුරා මගේ ලයට දැනේ ඔබ<br>අන්සන්තක නොව මගේ ලෙසේ<br>ඈත අනන්තයේ ඈතම කෙලවර<br>දිලුණත් ඔබ මට සේනේ දිදී<br>සිතන්නේ කෙලෙසද අන්සන්තක බව<br>බලාන ඔය නෙතු පියන් දිහා<br>ගුවන් ගැබේ නැගි රුවන් තාරකා<br>දිලුනේ ඇයි ඔබේ සෙනෙහේ සොයා<br>සිත රැයේ එන උණුසුම අරගෙන<br>වඩිනු මැනවි සිත් යහන කරා<br>ළයට තුරුළු වූ උණුසුම් සිහිනයේ<br>සත්තකින් මගෙම තමා. |
| 146 | සොයා ඇවිද්දෙමි<br>උදෑසන ගෙවෙන තෙක්<br>දහවලද ගෙවෙන තෙක්<br>ඉනික්බිති<br>තරුද නැති<br>සඳු ද නැති<br>වළා පමණක්ම ඇති<br>රාත්‍රියද උදාවී ඇත<br><br>එහෙත් නැත කිසිතැනක<br>සැගවුණේ කොහිද<br>එකමත් එක කාලයක<br>මසිත සුවපත් කළ<br>දිව ඔසුව "නුඹ". |
| 147 | සුබ දවසක් පෙන්වූ<br>එසඳ පායා ඇත<br>පිරිවරා ගත් තරුද සහිතව<br>කිසිදු තනියක් නොමැත<br>තරු සඳුට පෙම් බැඳන්<br>රහසෙම<br>ඔබ දන්නවද ඒම වග<br><br>එසඳ සේද නොව<br>තරුද සේද නොව<br>ඔබත් නැත<br>මමත් නැත<br>අපට හිමි අපේ සිත් මල. |

| | |
|---|---|
| 148 | ප්‍රේමය බරට<br>මිදුම සේ බිම පතිත<br>නල ලත සිඹින<br>නුඹ කොයිබද<br>ප්‍රිය සොදුර<br><br>කළුවර කැටි ගැසි<br>ඇස් යට නිදි කිරන<br>ගොරහැඬි හීන විතරක්<br>මට තනි රකින<br>මිහිරද සොදුර<br>මේ කළුවර තනි නුඹට<br><br>මල් පෙති මල හට<br>දිය වී යන දිනක<br>සුවඳට සුළග විට<br>කවුරුද තනිකමට<br>ගිලිහි යන බව දැනම<br>දෑතින් නුඹේ දෑත<br>උණුසුම තබාගෙන කුමටද?<br>හිත ගාව. |
| 149 | වළා තුළින් එබී බලා<br>නුඹද අව්ව වැසි දෙවන්නෙ<br>මහ පොළොවක් තරමට රළු<br>දුක් කන්දක් මගේ සිතේ<br>ඒ හිත ගෙන ඔට්ටු දුවන<br>මට හිමි මගේ ජිවිතයේ<br>දිණුම් කණුව පහුකරගෙන<br>ආරණ්‍යයේ සිල් සුවඳට<br>ළංවී කහවත දමන්න<br>හැකි වේ නම් නුඹේ මහිමෙන්<br>ඔට්ටු දිම හිත වෙනුවට<br>ලැබෙවි මට මං දන්නවා<br>බවුන් වඩන සිත් පොඩ්ඩක්. |
| 150 | **අම්මේ මට**<br>ගෙට ගොඩවෙන    සුළඟ<br>නිමා දැම්මා පහන<br>පත්තුකර තිබූ<br>නුඹේ රූපයට<br><br>සත් දිනක රතුපස් උඩ<br>ඇහැළ පෙති මැලවී නිදන<br><br>පරමල් සුවඳ විතරමද<br>සිතේ සාංකාව<br>යන්තම් හෝ මකා දමන<br><br>කළුවර හිමින් ගස්යට<br>නුඹ නිතර ගැවසුන<br>දෙණියේ පලාකොටු ළග<br>හිස තබා හිම්හිට<br>නිදියි දිගු රැයකට. |
| 151 | **සරා සඳ**<br>එකලු කර<br>අහස් ගැබ<br>කොහිද බැස ගිය<br>සරා සඳ<br><br>මොහඳුරු දුර ලූ මහැඳුරු<br>නුඹ මිස කවුරු<br><br>මොහඳුර දුරු කෙරු<br>මහැඳුරු කවුරු<br>නුඹ මිස. |
| 152 | මේ පුරහඳ<br>අත ගා එන<br>සුළං පොදක්<br>සිපගති මම<br><br>අඳුර මකා<br>එළිය එන්න<br>මියුරු සිහින<br>පලදවන්න<br><br>රාත්‍රියම<br>දැන් නුඹගෙයි. |
| 153 | **කොහොමද සරාසඳ සකි**<br>**නුඹ ලිහිණියෙකි.....**<br>වසන්තයේ නිල් අහසට<br>හිත පෙම්ණි<br>සරන්නට හැදුව නුඹ ගැන<br>හිත දුකෙනි<br>ලියන්නට පමා වුවාදැයි<br>දැනුනි<br>නොලියා ඉන්න දැන් මට බෑ<br>සකි සඳුනි<br><br>බොහො කැකුළු පිදුනු<br>තුරු වියන් මත<br>නොපිපුණ මලකි නුඹ<br>නෙළුවෙ පුදන්නට<br>සුවඳ නොදැන මල් කැකුලක<br>හැඩරුවට<br>නුඹට වඩා රැවටුනේ අපි<br>හිනාවට<br><br>සිහින පිපෙන මල්ගොමුවක<br>අතුපතර<br>බොහොම දුකින් අතු ඉති<br>ගෙන නුඹ නිතර. |
| 154 | ලැබෙන  තුරා මගේ මගේ ළයට දැනේ ඔබ<br>වුන්සන්තක නොව මගේ ලෙසේ<br>ඈත අනන්තයේ ඈතම කෙලවර<br>දිලුනත් ඔබ මට සෙනේ දිදී<br>සිතන්නේ කෙලෙසද අන්සන්තක බව<br>බලාන ඔය නෙතු පියන් දිහා<br>ගුවන් ගැබේ නැගී රුවන් තාරකා<br>දිලුනේ ඇයි ඔබේ සෙනෙහෙ සොයා<br>සිත රැයේ එන උණුහුම අරගෙන<br>වඩිනු මැනවි සිත් සහන කරා<br>ලයට තුරුළුවු උණුසුම් සිහිනයේ<br>මතකින්ම ඔබ මගෙම තමා. |

155 සිරි සිරි ඇවිදින්
මගේ ගෙපැලේ දොරකඩින්
නාඩපන් නුඹ කොබෙයියෝ
තාම තනිනෑ මට ඉතිං

දොරේ තලමින් පිල් කයින්
ගලා යන වැහි වතුරකින්
සිහිකලත් නුඹ යටි හිතින්
නාඩපන් නුඹ කොබෙයියෝ
තාම තනි නෑ මට ඉතිං

වසන්තේ ඉරඑළියකින්
ඉගිලෙනා නුඹ කුඩුවෙන්
සුරත් විලිකුන් අනුහසින්
බොහොම සතුටින් ඉගිලියන්

දෝරේ ගලනා වැසි සමෙත්
යාවි පෙර ලෙස මා කෙරෙන්
දැන් ඉතිං ගිම්හානයයි
ඒත් තනිනෑ මට ඉතිං.

156 මේ ගෙවන්නේ
වසන්තයමයි
ඒකා ගහකොළ
නිර්වත්‍ර වී
අංග භාගයට නිදා වැතිරි
ඉන්න සඳ දෙස
හොරෙන් බලමින්
මේ ගෙවෙන්නේ
වසන්තයමයි

මලානික අය
බලෙන් අරගෙන
තාරකාවන් බලා ඉන්නේ
ජිවිතේ අම්හිරිතම ඇත්තක්
තබා අහසින්
සඳේ අහසින්
සඳේ නුඹ
නිවී යන තෙක්.

157 **කුඩැල්ලෙක් ගිය දුර**
**අනේ අපොයි**
බෑ බෑ කියා යන්නෙම ඇය මාතරට
පොල් හේනේ ඉන්නා අපේ කොල්ලන්ට
වහවැටිලාද දන්නෙ නෑ මාතරට
ආවේ නැත්තේ ඇයි අද හොස්ටල් එකට .

158 ඔහොම තමයි කාගෙත් හැටි කියන කොට
කට දෙඩුවාට යන්නෙම හිත මාතරට
එක්කන් ගිය අපෙ අර කොල්ලාට
වද දෙනවාද කොල්ලකු සොයන
ලෙසට

159 උඹ දැනගත්තාද දකුණේ කොල්ලන්ගේ
අගේ
අරගෙන වරෙන් මාතර කොල්ලකුගේ
සෙනේ
වටිනව නංගි වටිනව ඒ අමා
සෙනේ
අහිතක් නැනේ අපිදකුණේ
යාළුවොනේ.

160 වැඩවර්ජන කළත් ගෙදරට නොයන්නෙමි
හොස්ටල් එකේ ඉඳගෙන නිදි වරන්නේමි
නැනට කවන්නට රසබත් උයනන්නෙමි
මගේ අයියා බලන්නට හිස්අතින් යමි.

161 හවසට එනව කියලයි උදයෙම යන්නේ
අයියගෙ ගෙදර නවතින්නයි හිත දෙන්නේ
දම්මිල කඩල තියලද දන්නෑ කන්නේ
අයියේ මම ගිහින් වෙන දවසක එන්නේ.

162 රාජගිරියේ බහිනු සිතා බස් එකට
බඹරෙක් බඹරි සමගින් නැග ලංගමට
ලං ලං වනවිටදි බස්එක බොරැල්ලට
පස්සෙ දොරින් බැස බජිරියා ඉදිරියට.

කුඩයක් ඉහලගෙන දුවගොස් අනික් දොරින්
බජිරියා නගිනු දැක නැත බඹරියා සරින්
ඌ බය වෙලා සිදුවූ ඒ හුටස් පරින්
හනිකට බැහැලා සෙව්වා ඒ සගයා බැවින්.

මළ කෙලියකි මට වන්නේ
මගේ දුක කව්දො දන්නේ
සිදුවු දෙය දැන ගන්නේ
ෆුඩ් බෝඩයේ එල්ලෙන්නේ.

163 **පමුණු ගියාදෝ කොටුවෙ ගියාදෝ**
උදයෙම නැගිට බත් හා සම්බෝල උයා
බඩගින්නට පාන් කාලක් බඩට දමා
දැන් බෑ නාන්නට නාමු එහෙන් කියා
බඹරි බජරි එක්කන් සොකඩි පමුණු ගියා.

දැන් දැන් නානවා ඇති තිදෙනා උඩ පනිමින්
කුණු ඇලවල් වලින් එන පණුවන්
අතුල්ලමින්
නැවා ඇති අනේ යමු කොටුවට
විගසින්
පෙරදින රැයේ දුටු සිහිනය සිහි කරමින්.

බැලුවා කැරකි කැරකි සොකඩි හති දමමින්
බෝගහ ලග නැද්ද කුමරා වෙලි පෙමින්
බඹරි බජරි එක්ව ඇගෙ හිත හදමින්
එක්කන් වරෙන් ඇගේ සොකඩි පරිස්සමින්.

164 බජිරිට උදව්වට මග තනි නොතනියට
යන ලෙසටයි යන්නේ අයියගෙ බෝඩිමට
අයියගේ කතාවට පෙම්බර හිනාවට
බඹරි වහ වැටිඇති හැටි හැබැවට.

උදයෙම උයා නාලා බජිරියා ගියා
නාගන්නට කියා බමරි එහේ ගියා
තව දවසක් යන්නට හැදුවොත් එහේ එයා
බමරිට හයි කරමි මැටි තටු දෙකක් තියා.

165 උදේ පාන්දර මහ වැසි ඇද හැලෙන්නා
සොදපු ඇඳුම් නැහැ තවමත් වේලිලා
කවදා මේ වැසි නවතිදෝ කියලා
අපේ වස්සා තවමත් හඩන්නා.

166 බත් ගෙඩියක් උස්සාගෙන
ලගට එනකං බුම්මාගෙන
අපි කාපුව මොනවත් නෑ
උඹ එනතුරු හංගාගෙන

167 අකුරු කරන්නට ඇවිදින් කොළඹට
බුම්මැට්ටියි බජිරියි මේ හනිකට
නගර සභාවේ වැඩ ටික අරගෙන
දවසේ පඩියට වැඩ ගජරාමෙට

| | |
|---|---|
| 168 | **පෝදා දින රැය**<br>ලෙඩුන් බලන්නට යැයි හනිහනිකට මම ආවා<br>කවුරුත් නැත කාමරයේ දැන් ඇත මම<br>තනිවීලා<br>කරනට දෙයක් නොමැති හෙයින් දැන් මම<br>ඉවසා<br>තනියම හිදිම් තොපි එනතුරු මග<br>බලලා<br><br>වෙනදා මෙන් කලබලයක් නැත අදනම්<br>කාමරයේ<br>සොදපු රෙදි ඔක්කොම ඇතුලේ මේ<br>කාමරයේ<br>බොලා ඇවිත් විසි කලොත් ඒ ටිකනම්<br>හදපානේ<br>මමත් යනවා වේල ගන්න රෙදි ටික ගෙන රෑ<br>යාමේ<br><br>අපට කන්න ඉඳිආප්පයි අද මම අරගෙන<br>ආවේ<br>කන්නට කෙනෙක් නැත අද ඒවා<br>ආවේ<br>දුකම දුකයි මට නම් මේ රෑ<br>යාමේ<br>ටිකක් දීලා ටිකක් කෑවා මේ<br>වේලේ |
| 169 | කුකුළා අතින් ගෙන පාන්දර නැගිට්ලා<br>තිදෙනෙක් හැදුවා ගම යන්නට සැරසීලා<br>පාන්දරම තුනේ සිට සැරසීලා<br>ගියාය බඩ පණුවන් රවටාලා |
| 170 | බැරි බර<br>ඇදගෙන<br>දෙපයට වාරු<br>අරන් අපි<br>බර කරත්තේ<br>අදිනා<br>කැම්පස් සිපද කියමින්<br>අව්වේ වේලිමට ටෙරා<br>කොටා යන්නා. |
| 171 | අගුවේ පිලේ සැමදා එකටයි ලැග්ගේ<br>පිදුවේ නහරවැල් උඹලට<br>අගුවේ පිලේ ලැග ලැග මා ලගම සිටි<br>අගුවේ පිලේ මා හා ලැග්ගා<br>පුතුනේ කොහේ කොතැනද නුඹලගේ සද්ද<br>සිතුනේ කොහොම අතහැර යන්නද<br>පුතුනේ කොහොම වාවම් මේ දුක් කන්ද. |
| 172 | <br>අනේ මගේ දරුවන් කොයි ගියාදෝ<br>කඩපිලේ අගුවේ තනි උනාදෝ |

| | |
|---|---|
| 173 | **කිරි මුට්ටිය ගඟේ ගියා**<br><br>සීතලයි මේ එළිපත්තේ<br>අම්මේ මට<br>ගෙට ගොඩ වෙන සුළඟ<br>නිවා දැම්මා පහන<br>පත්තු කර තිබූ<br>නුඹේ රූපයට<br><br>සත් දිනක් රතු පස් උඩ<br>ඇහැළ පෙති මැළවී නිදන<br><br>පරමල් සුවඳ විතර ම ද<br>සිතේ සාංකාව<br>යන්තම් හෝ මකා දමන<br><br>කළුවර හෙමින් ගස් යට<br>නුඹ නිතර ගැවසුණ<br>දෙණියේ පලා කොටු ළඟ<br>හිස තබා හෙම්හිට<br>නිඳයි දිගු රැයකට<br><br>කිරා වැටෙන ගොක් රැන් මත<br>නුඹ වියා විකුණූ වට්ටියක<br>රටා දැක්කා<br>අඳුරේම අම්මේ මම |
| 174 | **අසම්මතයි ජීවිතය ම**<br>සඳ මැරිලා<br>මලගම දා<br>තරු දිය වී<br>රේණු සැලි<br>බිම වැටිලා තිබුණා<br><br>එන්න හෙමින්<br>අඩිය තියා<br>මේඅඳුරෙ ම<br>අත පත ගා<br><br>නිඳා ඉන්න<br>මේ ගහ කොල<br>ඇහැරෙන්නට කලින් ම නුඹ<br>එන්න ඉතින්<br>කළුවරේ ම<br><br>එලිය ඇවිත් හෙට උදේ ම<br>අරන් යාවි ජීවිතය ම |
| 175 | **හැර යාම**<br>දිමුතු දසන් පීදෙන මුදූ          සිනාවා<br>ඇත ඉදන් නුඹ වෙහෙසි       ගෙනාවා<br>දෑත දෙපා අවුරා මුදූ           කතාවා<br>තාම හිතේ පැටලි හැර        නොයාවා<br><br>මූලු සතින් එපිටට               ඉගිලුනේයා<br>කැකුළු දතට කිරි කොයිබින         එරේයා<br>ඉපල් ඉරටු මල් මට තව        නොදේයා<br>තටු පැටලි මා කඳුළින්           පෙහේයා<br><br>ලිපේ ගින්න තුන් වේලෙ ම       නිවේයා<br>හිතේ ගින්න දලු මෝරා          වැඩේයා<br>පාළු සංකාවෙන් ගේ             පිරේයා<br>කවුළු පියන් හැර නුඹ කොයි   ගියේයා |

| | |
|---|---|
| 176 | **සමුගැන්ම**<br>අඳුර ගනකමට කැටිගැසී<br>කොපුල් මත රැඳි<br>වෙලා සියුමැලි සිහින<br>තටු සලා යා නොදී<br><br>ඒත් මම පෙම්<br>මේ මිහිරි කළුවරට<br>නුඹට නුඹේ නෙත් දෙකට<br>වඩා මේකළුවරට<br><br>කලා සොළොසින් සපිරී<br>දිනෙක සඳ බැස ගිය ද<br>මම තවත් පෙම් කරමි<br>ඒත් මේ කළුවරට |
| 177 | **අවසර බුදු හාමුදුරුවනේ**<br>ඉසිපතනේ මිගදායේ<br>මෙත් මුදිතා කරුණා සයුරේ<br>සම්දු වඩින්ට සිසිල ලබන්නට<br>මට අවසර ඇත්නම්<br><br>විසිරුණු හදවත සුදු නෙළුමක් වී<br>බුදු සම්දුගෙ පාමුල වැටෙමින්<br>බුදු බණ පදයක් අහන්න ඇත්නම්<br>රජ කිරුළට මට මෙලොවේ<br><br>දෙදහස් පන්සිය වසරක් ගෙවුණා<br>තව මත් අපි මේ සංසාරේ<br>ආයෙත් නොයෙන්න මොක් සුව ලබන්න<br>අවසර බුදු හාමුදුරුවනේ |
| 178 | **විකසිත හදවත්**<br>අත පය හැඩුවත් පිළිසරනක් නෑ<br>ඔය නිදි ඇස් නැරෙන බව දැනුණත්<br>ලිස්සා යන පය කළ ද නපුරුකම්<br>විකසිත හදවත් කොතැනද දෝ<br><br>තුරුනු වියේ ජව බලයෙන් පිරුණ<br>සම රැලි වැටිලා දැස බොඳ වුණත්<br>මේ රිය තුළ අසුනක් මට දේන්නට<br>පින් ඇති හදවත් කොතැනකදෝ<br><br>අබලන් හදවත් අකිකරු වුණත්<br>තොල් පෙති වියළී ඩාදිය ගැලුවත්<br>මේ රිය තුල අසුනක් මට දෙන්නට<br>පින් ඇති හදවත් කොතැනකදෝ |
| 179 | **ඉඩෝරය**<br>නුඹ සොයා ආවෙ මා<br>පිපාසය නිසා ම යි<br>එදා පුරුද්දට දැනුණ<br>අපෙ දෙපා පොඩි තෙමු<br>නුඹේ ජීවය කොහෙ ද?<br>හැර ගියෙ ද නුඹ ඈ<br>ඇගෙ දරුවන් සමග<br><br>සිසිල දුන් කුඹුක් ගස<br>කොළ හැළී වියළිලා<br>වෙල් පිටියෙ කටු පඳුරු<br>බෝ තැතින් නැගිටගෙන<br>වැහි බිඳක පහස නොම ලැබු<br>රුදුරු අහස් කුස<br>සිපගන්න හදන හැටි |
| 180 | **නුඹ**<br>නිල් අහස් කුස පුරා<br>හිනැහෙමින් සරන නුඹ<br>කලෙක හඳහාමි විය<br>කිරි පැණිත් ගෙනත් දෙන<br><br>තුරුණු කල<br>සරා සඳක් වී<br>පෙමට අත වැනුව ද<br>ඇත්ත ම යි නුඹ<br>පින්සාර සඳක් මැයි<br>මල් සුවඳ ගෙන<br>ඉහි පාන සිහින් මඳනලෙන්<br>පළින් පළ<br>සුදු වූ කෙහෙරැලි<br>තාලයට නැටුව ද<br>නුඹ දැකුමෙන්<br>උපන් ශිලය<br>නොබිඳුණේ මැයි |
| 181 | **සරදම්**<br><br>සුනු සහලේ කැඳ උයලා<br>අප්පච්චි පොවා<br>අම්මා තනිව හිල්ලුවා<br>ගෙයි මුල්ලට වෙලා<br>එහා වත්තේ වැටකොළු වැල්<br>හොරෙන් එබී බලා<br>පුරන් කුඹුර ළඟට වෙලා<br>ඔච්චමකුත් කළා<br><br>හිත් ඇඳිරිය නෙතු පුරවා<br>ඔත්පළට ම වෙල<br>අප්පච්චිගෙ ඇඳ පාමුල<br>හොරෙන් මුකුළු කළා<br>දුප්පත්කම ගෙට නැවිත්<br>බිත්තක්කනට වෙලා<br>එක දවසක් දෙකක් පුරා<br>අපට විහිළු කළා<br><br>උදේ රැයින් අවදි වෙලා<br>නිඳ ගැට කඩ කඩා<br>අපේ අම්මා දොළට නොයා<br>උදේ හවා පුරා<br>ගෙයි ගින්දර පිටට නොදී<br>ලිබ්බොක්කට වෙලා<br>මුව දෝනවා මං දැක්කා<br>අපට මුවාවෙලා |

182 **අරුණෝදය**

බක් මී ගහ යට මල් හැලිලා
බඹරු එන්ට කලියෙන්
හිමිදිරියෙ ම මල් නෙළුවෝ කවුරු ද
හිරු පුදින සැණෙකින්

දැඟකම් මැද බක් මී මල් නෙළුව ද
ගහ යට ඔප දමමින්
හිස ගවසන්නට මල් නෙළුව ද ඇ
නුඹෙ හිත ගන්න අටින්

බට්ටිත්තෝ නිවහන හැදුව ද රෑ
බට්ටිත්තිට සුපෙමින්
අහක බලාගෙන  ඇ හිනහෙනවා
නුඹෙ දැඟකමට හොරෙන්

183 **එපා පුතේ**

කටු ඇනුණ දෙපා
හීතලට ගැහෙනකොට
තටු ගසා ඉගිලේන්නට බෑ
ඒ තරමටම හිතේ බර

ගංගොඩේ ඇවිද ගෙන
සතා ගහකොළ ඇඳින
පුතේ ගෙදරට වරෙන්
ගොම්මනට පෙම් නොබැඳ

අක්කලා අඩන කො
රෙදි වැරලි බර ඩැඩිව
අනේ - අහකට වෙයන්
මූණ කට ඇද නොකර

කුස්සියට එබි එබී
නොබලපන් ලිබ්බොක්ක
වහන් වී උඹේ මවු
බොන්නෙ - උණු වුණ කඳුළ

හිතේ සතුටින් තිබ්බ
අපේ පැල්පත් පොඩ්ඩ
ගිනිලාපු බඩගින්න
නුඹට බඩගිනි ඇත්ද?

184 **සෙනෙහස**

සුදු ගවුමේ සුදු අරලිය පිපුණා
පිනිදිය ඇහැරණ හිරුට කලින්
වතුසුදු පඳුර ම මුව මත පිපුණා
විසිරුණු පොඩි කැඩපතට හොරෙන්

දණ බිම ඔබලා වරම් ගන්නවා
උදේට අම්මගෙ හිත පතුලෙන්
ඉඳිකඩුල්ල ළඟ අම්මගෙ ඇස් දෙක
උදේ ගිහින් හවසට එනකම්

ළය ගිනි මෙළවා කඳුළින් පොඟවා
මව් සෙනෙහේ පිසවා සැණකින්
කුසගිනි නිමවා නැළවූ සැතපූ
අම්මේ ඔබ මතු නිවන් දකින්

185 **දෙවන මවුන් ඔබ**

මහ මෙරක් වන් දුක උහුලා ගෙන මා
සුසුම් හෙළන කොට මගෙ අම්මේ
දැවි දැවි ළය මඬල පුරාගෙන
දුක ඉහිරෙනු දුටුව ද අම්මේ

ලේ කිරි කර දුන් අම්මාගෙ සෙනෙහස
ඈත හඬන කොට මගෙ අම්මේ
හෙට දවසෙත් මගෙ ළඟට වෙලා නුඹ
දුක් ගියක්වත් ගයපන්නේ

මව්පිය සෙනෙහස හඬා වැටෙන කොට
නුඹ විතරයි මගෙ ළඟ උන්නේ
වැලපෙන හිතකට සෙනෙහස දුන් ඔබ
සංසාරේ බුදු වෙනු අම්මේ

186 **දුක් සුසම්**

කඳුළු කැට වියලිලා
මහ පොළොව ඉරිතලා
තල් වැටේ මායිමේ
දුක් සුසුම් තනිවෙලා

මහ පොළොව වියළිලා
ගොහොරු මඩ කළතලා
මහලු ඇගෙ දෙ අත්පතෙ
දිය බිඳක් තැවරිලා

සෝ සුසුම් කෑ ගසයි
මිණිබිරිය තනි වෙලා
කිරි නොමැති තන පුඩුවෙ
සෙනෙහෙ දිය කැටි වෙල

187 **ඇයට ලියූ කව**

සළුපිළි ඇඳි මුදු සෙළු ගත
අබරණ පැලඳ කනකර රජත
රහ මෙර සේය ඉඟ සුඟ ලලිත
දුටු මන බැඳුන් ගිරි ළඳුන් වෙත

දිව සළු රැගෙන පාවඩ සේ අතුරන්නම්
සල් මල් සලා පෙති ගෙන හිස දවටන්නම්
පුන්සඳ රැයේ සඳකැන් දිය නාවන්නම්
එනු සිහ ලියේ හද යහනේ සතපන්නම්

කසුප් රජුන් නැත කිසි තැන දුටිම් ලියේ
මී මැසි දනෝ නුඹ ගැන කවි ලියති ප්‍රියේ
මිහිඳුම් සළුව නුඹ අතුරාපන්කෝ ළයේ
මා හද අරන් හද මඬලට වඩිනු ප්‍රියේ

188 **මලවි හි සර**

අනඟ දෙනුවන්
නඳුන් උයනේ
දෑසමන් මල
දෙසට නැමුණේ

සිනිඳු පෙති වත
සුවැති පවනේ
උනඟ පිණි පොද
ළමැදෙ වැටුණේ

සේද තන පට
පත් විදා හැර
මලවි හි සර
මලෙහි රැඳුණේ

189 **අතීත කුසුම**

නිහඬ බවේ දෝංකාරය
දෙසවන වසා
පැතිරෙද්දි

තනිකමේ අඳුරු සෙවණැලි
ආත්මය ගොදුරු කර
ජිවිතයම මිහිදන් වුණි

හිස් බවේ පොළොව මත
බුර බුරා නැඟුණු
අතීතයේ කඳුළු
පොහොර වි ඒ මත ම
වැටි සරු සාර වි
හිස් බවේ මිහිතලය

සරු සාර ඒ බිමේ
මල් කුසුම් දිලිසුනේ
නෙළා ගනු හැකි වේද
අතීත කටු පතර
ඒ කුසුම....

190 **තනිකම තනියට**

හඬමින්
අඳෝනා කියමින්
පැමිණ කාලය
මගේ තනියට
තනි නොතනියට
මගේමසිහින හැර
අන් කිසිවත්
නොමැතිව
තනි වම මම
ඔබ මා දමාගොස්
බොහෝ......... දුර

191 **අහිමි සිත**

ඔබ දවසක් පෙන්වූ
ඒ සඳ පායා ඇත
පිරිවරා ගත් තරු ද සමඟින්
කිසිදු තනියක් නොමැත
තරු සඳුට පෙම් බැඳන්
රහසේ ම
ඔබ දන්නව ද ඒ වග

සඳ සේ ද නොව
තරු ද සේ නොව
ඔබත් නැත
මමත් නැත
අපට හිමි අපේ සිත්වල

192 **නුඹ කොතැනද අද**

සොයා ඇවිද්දමි
උදෑසන ගෙවන තෙක්
දහවල ද ගෙවන තෙක්
ඉනික්බිති

තරු ද නැති
සඳු ද නැති
වලා පමණක් ද ඇති
රාත්‍රිය ද උදා වී ඇත

එහෙත් නැත කිසි තැනක
සැඟවුණේ කොහිද
එකමත් එක කාලයක
මසිත සුවපත් කල
දිව ඔසුව නුඹ

193 **අප අතැර ගිය සබඳ**

නුඹ
බොහෝ දුර ගොස් ය
අවසරයි යන්නට නුඹට
හිස් ලූ ලූ අත
එවිට
හැකි වේවි නුඹට
අවැසි අවැසි දේ කරන්නට
හමු වූ දා පටන්
නුඹට කළ ගුණ කම්
නුඹ සිතින් මැකී ගිය සැටි
ඉක්මනින්
පුදුමය
මනු ලොවේ ගති
කමක් නෑ නුඹට හොඳනම්
තව දෙයක්
සාපයක් වී නම්
අප නුඹට
මරා දැමූ අප ළබැඳි සිත්
කිසි ම කිසි දිනක
නො ඉපදේවි නුඹ වෙනුවෙන්
සහතිකයි

| | |
|---|---|
| 194 | **අහිමි වුවොත් මට හිමි තැන**<br><br>වලා තුළින් එබී බලා<br>නුඹ ද අව්ව වැසි දෙවන්නෙ<br>මහ පොළොවක් තරමට රළු<br>දුක් කන්දක් මගේ සිතේ<br>ඒ සිත ගෙන ඔට්ටු දුවන<br>මට හිමි මගෙ ජීවිතයේ<br>දිනුම් කනුව පහු කරගෙන<br>ආරණ්‍යයේ සිල් සුවඳට<br>ළං වී කහ වත දමන්නට<br>හැකි වේ නම් නුඹෙ මහිමෙන්<br>ඔට්ටු දුවපු සිත වෙනුවට<br>ලැබේවි මට මං දන්නව<br>බවුන් වඩන සිත් පොඩ්ඩක් |
| 195 | **පරාජිත ප්‍රේමය**<br>සියුමැලිය<br>මා පැතූ<br>ආදරවන්තිය<br>එන්න<br>මා කරා<br>පැමිණෙන්න<br>ඔය සියුමැලි දෑතින්<br>මගේ ගෙල සිරකර<br>මා මරා දමන්න<br>පරාජිත ප්‍රේමයේ<br>ශෝකයෙන්<br>තවත්<br>මාහට<br>ජිවත් විමට<br>ඉඩ නොතබන්න<br>මරණය<br>සැපයක්<br>එය මම<br>ආදරයේන්<br>වැලඳ ගනිමි |
| 196 | **නිදිකුම්බා මල**<br><br>රිදී ඉරි වැටෙත් ම<br>පිය නඟයි බස් නැවතුමට<br>තැලි පොඩි වුණු දිළිඳුකම<br>දෙනෙත් පියවෙත් ම<br>සිඹි හංස සුසුමින් මහපොළොව<br>නිදිකුම්බා මල් වඩම<br>සුවඳ දෙයි භූරතල්කමට |

| | |
|---|---|
| 197 | **හෙට දින**<br>බොර පාට ගං දෑළ<br>තෝන්තුවාවෙන් බැස යන්නෙ<br>මසිත දැන හැඳිනදෝ මන්දා<br>ළදලු තුරුපත් සැලී<br>හමා එන මඳ නලේ<br>එනු මැනවි මා හදට<br>ගොම්මනේ උණුහුම රැගෙන<br><br>පෙම් කවක් ලියන්නට<br>පන්තිරුව ගනු කෙලෙස<br>පන්තිරුව පුරාවට ගලයන<br>බොර පැහැ කඳුළු බිඳක<br><br>පාළු සීතල රැයේ<br>කණ කොක් හඬ මැදින්<br>හෙට පහන් වන දිනය<br>සුබ ම සුබ දිනක් වෙද?<br>ගෙත්තමින් හැඩ වැටුණු<br>රන් පාට රන් හුයේන්<br>දෑඟිලි බැඳන් නුඹ<br>වස්සාන දොරකඩ ද ..........? |
| 198 | **පැතුම**<br>මුළු ගතම ගිලන් වී<br>මුළු සිතම ගිලන් වී<br>ගිලන් යහනට වෙලා මම<br>ගිලන් හද පාරවමි<br>නෙතු පියන් ඔබ සොයයි<br>නැහැ පෙනෙන මානයේ<br>සිත කිරි ගා සැලෙයි<br>දිනෙන් දින ගෙවෙද්දි<br>දිනන්නට දෙයක් පතමි<br>පතන්නට යමක් සොයමි<br>පතන හැම දෙයම ලොව<br>දිනිය නොහැකි බව දනිමි<br><br>එහෙත්<br><br>දිනන්නට ඔබ පතමි<br>පතන්නට ඔබ සොයමි<br>පතන පැතුමන් ගොන්නේ<br>එකම පැතුමක් පමණි |

| | |
|---|---|
| 199 | මියැදුණු වසන්තය<br>සරසවිය පාළුවී<br>තුරු සෙවණ වෙළෙද්දී<br>මුළු ලොවම නිසල වී<br>රැහැයි හඬ නඟද්දී<br>දැඟිලි වෙළා ගිය<br>මතක මං පෙත් අතර<br>බක් මහේ කොවුල් හඬ<br>ගයන තනුවක් අසමි<br>උනුහුමට තුරුලු වී<br>පෙම් තනුවක් අසමි<br>උනුහුමට තුරුළු වී<br>පෙම්තනුව කියාදුන්<br>කොවුලාණ ඉගිල ගොස්<br>ඈත දුර ඈතටම<br>රතුපාට මල් පිපුණ<br>මල් යාය සලිතවී<br>සොයන මුත් පෙරමඟම<br>නොඑයි සරසවි බිමට<br>බක්මහේ වසන්තය යළිත් |
| 200 | **නිකලෙස් සිත් මල**<br>සිනිඳු මුදු පිය පතුල්<br>මැවූ දහසක් සිඟිති සිතුවම්<br>දෙනයනේ අහිංසක හසරැල්<br>ගෙතු දහසක් පබැදුම්<br>ගණනකටවත් නොගත් නුඹ<br>හදිසියේ වියරුවී කළ විපතකම තරම<br>එහෙත් ......<br>සුන්දර ය නුඹ නිශ්චල ය<br>එලෙසින්ම අදටත්<br>නිකලෙස් ළදරු සිත් මල්<br>වෛරය නොදත් දෙනුවන්<br>දහසක්......<br>මොහොතකින් මිහිදන් කළ නුඹම<br>යළිඳු සිපගන්නා අපුරුව |
| 201 | සුදු පරෙවියන් ළග නෑදැයන්  මැරෙනු<br>හෙම්බත් බැවින් වියළුණු දෑසින් බලනු<br>අනියත බිමේ පෙර මහ සෑ ගොඩ නැගුණු<br>නිදියන් පුතේ තව වකුටුව දුටුගැමුණු |

| | |
|---|---|
| 202 | ආරාධනා<br>සිනාසී දෙනෙතින් වැරෙන් ගෙන බදා ගනු මා නෙත්<br>වියළි නෙත් සපුරා බබළවනු දී කඳුළු සම්පත්<br>නැගී නිති උතුරා ගලන්නට තෙමා බිම හදවත්<br>සොයා දෙනු පා සිඳි ගිය ප්‍රේමයේ උල්පත්<br><br>සෝසුසුම් රැසකින් වෙළනු මා පැතුම් මල් දැලකින්<br>කඩා දා පියාපත් මා පය බඳිනු යදමින්<br>උනුන් පෙරලා සිය ගණන් දිව යන මගක පසෙකින්<br>වරු ගණන් නොසැලී හිඳින්නට ඔබ දකියෙන් රිසියෙන්<br><br>බල පවුරු ගොඩනගා මාතුළ රැඳි රැජිනක මෙන්<br>නසා පලවා නිජබිමේ සත්‍යයේ පුරවැසියන්<br>උතුම් අදිටන් මකා සකසා නව සරල පැතුමන්<br>ජිවිතය පුරවන්න අලුතින් ඔය බොළඳ වදනින් |
| 203 | කැකෑරෙන ලේවලින් පිච්චෙන<br>මේ නහරවැල් මගේ නොවෙයි<br>පපු කුහරයේ පිළිස්සී<br>ගුලි ගැහෙන පෙණහළු මගේ නොවෙයි<br>ඔබේ හිස යළි අතගාන්නම්<br>පිවිතුරුයි මම පිරිසිදුයි<br>පෙර ලෙසම ආයෙත් ශ්‍රේෂ්ඨයි |
| 204 | **සොඳුරුද ඔබ මට කෙතරම්**<br>ඔබ ඔබේ දෙතොලින්<br>මගේ ළමැදේ තැබූ හාදුව<br>අතැගිලි තුඩින් මම<br>හිමින් පිරිමැද බැලුවා<br>අනේ තව එක ම එක<br>වතාවක්<br>ඒ සුවය විඳින්නට<br>තිබුණ නම්<br>ඔබට මෙන් මටද<br>අමතක නැති<br>එකම එකම දවසක<br>මම ඔබේ පපුවට<br>තුරුළු වී උන්නා<br>අනේ තව එකම එක<br>වතාවක්<br>ඒ සුවය විඳින්නට තිබුණ නම් |

| | |
|---|---|
| 205 | **සිහනය**<br>ගෙවී ගිය වස්සාන රාත්‍රියක<br>දුටිමි එක් සිහිනයක්<br>නුඹේ ඇස් ළඟදී වටහා ගතිමි<br>ජිවිතේ එක් දෙයක්<br>නුඹේ ඇස්වලට ලං වී දුටිමි<br>මගේ රුව දස දහස් වාරයක්<br>සත්ත මයි හිනැහිලා ඉන්නේ මං<br>නුඹේ ළෙන්ගතුකමින්<br>මට කියන් ඇයි ද මේ තරමට ම<br>මගේ ගැන ඔය හිතේ සෙනෙහසක් |
| 206 | **බලාපොරොත්තුව**<br>වේදනා කඳුළු වැල්<br>හද පෙළෙන සෝ සුසුම්<br>සතුට සිනහව<br>ජිවිතයේ වින්දනය<br>මගේ ලොවට උරුම වු<br>සම්පත් ය මහගු වු<br>ඒ සියලු වේදනා<br>නිම කොට<br>හෙට දිනේ<br>වැළඳ ගනු මැනවි මා<br>ආදරෙන් දයාවෙන්<br>දයාබර මරණය<br>ඔබ මගේ<br>බලාපොරොත්තුවයි |
| 207 | **සඳ**<br>අකාසේ නුඹ දිහා ම<br>බලා ඉඳන් සිංදු කියපු<br>හඳ මාමේ නුඹත් එක්ක<br>කිරි පැණි ගැන කතා කරපු<br>ආදරයෙන් වෙනස් වෙලා<br>නෑ නුඹලා හැර දමලා<br>නිල් අහසත් මගෙ හදත්<br>පැයු සඳ මගේ තනියට<br>අහස වගේ නුඹට මගේ<br>ආදරයෙන් කතාකරමි<br>හුරතලයෙන් නැළවී නැළවී<br>එදා හිටපු පුංචි දොණි<br>තව මත් මම හඳ මාමේ<br>මගේ ආදර නිල් අහසේ |
| 208 | **අතිතය සහ අනතිතය**<br>අතිතය වන වනා<br>මහ උජාරුවට<br>මවන ඒ වත්මන් සිහින මහාවංසය<br>වමාරා වමාරා<br>එකම පම්පොරියක<br>අතිතය අනාගතය<br>කරන්නට<br>තොප දරන පුහු වීර්යය<br>අතීතය අනාගතය කළ දාක<br>කෝ තොපට අනාගතය<br>අත් හැර දමා<br>සිඳ බිඳ දමා<br>දිනත්වය.....<br>සිතාපන්.........අදයි<br>පැරකුම් යුගය. |
| 209 | **වසන්තය**<br>හද කන්ද පාමුලක<br>හෙම්හිට<br>හුදකලා ඉමක<br>තනි ව ම<br>දහසක් මල් පල දෙන්න<br>එනමුදු<br>නුඹ සුළඟ සමඟ මිතුරුව<br>නුඹේ ම<br>අතු රිකිලි කඩා දමා ගෙන<br>පුදුම පාළුවක්<br>සුළං හැපෙන විට<br>නිසල පිනි බිම පතිත වෙයි<br>වසන්තය කාලය<br>එනමුදු<br>මල් පල බෝ දුරකය. |
| 210 | **වංකගිරි යාදිනි වළප**<br>ඉරිතැළුණු රැලි නළල<br>යට ගිළුණු නෙතු යුගල<br>නිති සැලෙන පටු දෙතොල<br>කිම නගන මැසිවිල්ල<br><br>නෙක දුම් රොටු අතර<br>ගොර සපුන් විලිස්සන<br>වංකගිරියක හඬන<br>මිදි දේවිය නුඹ ය<br><br>හද නතර කිදා බැස<br>ඇට මිදුළු සොයා ගිය<br>සෙනෙහෙය නුඹේ මය<br>පුතු සිතින් මැකී ගිය<br><br>මුල් දරා දුක් විඳින<br>විසල් නුග රුකක් විණ<br>මල් වඩා සුව විඳින<br>වරම් ඇකයෙන් වැටුණ<br><br>දරු පෙමට කිරි එරුණ<br>මුදු පියයුරන් දෙදෙන<br>උණුහුමට තුරුළු වුණ<br>පුතු කොතැන ? නුඹ කොතැන?<br><br>නුඹට බුදු බව නියත<br>කපුටු බෝ සෙවන යට<br>එකම අම්මා නුඹද?<br>ගෙදර බුදු බව නොලද |

| | |
|---|---|
| 211 | **මිනිමල් සුවඳ**<br>පස් වසක් ගෙවෙන දින<br>දල්වමි බකටි පහනක්<br>පස් පිඩලි යට සැඟවී<br>නුඹ නිදන සොහොන මත<br><br>එ දවස<br>ඉහිරිලා තිබුණි හැම තැනම<br>නුඹේ ඩාදිය පුසුඹ<br>ඒත් අද<br>මිනි මල් සුවඳ<br>හැම තැනම<br><br>මා කුඩා කල<br>නුඹ<br>බොරලු කැට ගසා<br>නිදිකුම්බා පඳුරුවලට<br>උන් නිඳා ගත් විට<br>මට පෙන්වා<br>හඩන මා අස්වැසූ තාත්තේ<br>නිදිකුම්බා පඳුරු අතරින්<br>පා තියා හෙමිහිට<br>ඇවිත් නුඹේ සොහොනට<br>වැලපුණෙමි ගෙවුණු පස්වසම<br>ඒත් එක දිනක් වත්<br>මා අස්වසන්නට<br>නුඹ නාවේ මන්ද? |
| 212 | රේමන් පලුවා කොමලි බිල්ලා ටුංකා කලතා<br>මල්ගාමා<br>බාමන් පැදුරා කැකුලි කුඹලා ඩොංකා පෙත්තා<br>වල්බාවා<br>කාමන් පුලුටා කිකිලි කදිරා දණ්ඩා ඇන්ටා<br>තල්ලු බුවා<br>සමගින් තව අය රැග් වී සිටි හැටි පවසන්නට<br>දැන් කල්ආවා<br><br>මෙහේ වර කැසිල්ලා<br>වර වර ළගට බිල්ලා<br>හොඳට දුම් පිඹලා<br>කෙසෙල් කැන් ටික ඉදවපල්ලා<br><br>දිමියා ඇඟිල්ලා<br>දෙන්න සෙටි වෙයල්ලා<br>පොල් ගෙඩි ගනිල්ලා<br>කලතා කලතා හිඳවපල්ලා<br><br>හිතා ගන්න බෑ රැග් එක කාලෙට<br>කැම්පස්වල හරි වැඩ කෙරෙති<br>දෙකේ අයියලා අමුතු බැලුන් ගෙන<br>එකේ අයට පුම්බන්න දෙති<br><br>බාමන්ගේ සිනා වැලයි<br>රේමන්ගේ කතා පෙලයි<br>වල්බාවගෙ යොග වැඩයි<br>රැගේ තියෙන අගේ වැඩි කරයි<br><br>රැග් ආනුභාවේන පොඩ්ඩක් පහත් වී<br>පොත් පත් කියෙව්වා දරුවන් විලාසේ<br>නංවා තබානේක ඩෙස් බංකු තොරා<br>තෙල බෙදන තග ධාන කල් යලි නො ඒවා |

# ජයවර්ධනපුර සරසවිය

| අංකය | ගීතය |
|---|---|
| 1 | උසස් පෙල ආතලං චේවං<br>කැම්පස් ජිවිතං හියං<br>බී.ඒ නම්අරහං තං<br>රැකියා පොලිං ගතං සිතං |
| 2 | ඉතින් ඉවරයි ගෙවු කාලය<br>සදා ආදර විදු දැයේ<br>නෙතින් මතුවන කදුළු අතරින්<br>සමුගණිමු අප සොයුරනේ. |
| 3 | මද පවන මොටද<br>ඔබේ සුවඳ මුසුවී නැත්නම්<br>සඳ කිරණ මොටද<br>මගේ තනියට ඔබ ලග නැත්නම් |
| 4 | මලක්මය ඔබ පිපුණු<br>ක්ෂිතජය<br>නෙලාගනු මට නෑනේ<br>අත දිග<br>පෙනි පෙනී නුඹ අහිමි වන වග<br>හද ගන් මං කොහොම මේ හිත |
| 5 | කන් අඩි පැලෙන ලය පුපුරන<br>වෙඩි සද්දේ<br>නොසැලෙන පිරිස අප සමගින්<br>එද්දෙන්<br>එන්නට දෙපා පනනැති අය<br>නවතිද්දෙන්<br>අප යන ගමන අපි යමු පෝරක<br>මැද්දෙන් |
| 6 | මේ උඹලා දන්නවද<br>අපි ලගදීම යනවා<br>යන්න ඉස්සරින් කියන්න<br>දෙයක් තියෙනවා<br>අනේ රන්ඩු වෙන්නැතිව<br>ඉඳපල්ලා |
| 7 | ගහනකං ඉවසිලි නෑ<br>ගහ ගත්තම විසුමක් නෑ<br>ඇත්තටම නැතුවත් බෑ<br>මට නම් මෙහෙ කොක්කක් නෑ |
| 8 | ඉන්නේ බොඩිමක මහ ලොකු ලිදක් ලග<br>කන්නේ පිම් එකෙන් රුපියල් 20 කට<br>බොන්නේ ප්ලේන්ටි එහි කිසි රහක් නැත<br>ඩිග්රිය නිසා මා විදින දුක |
| 9 | ඇදුම් මැසුමේ අක්කා සත් වසරක් තිස්සේ<br>ඒ පිහිටෙන් තමයි අද මේ පුටුවේ ඉන්නේ<br>හොරව් පතානේ ඇය අද ජිවත් වෙන්නේ<br>මගේ පැතුම ඇය පන මෙන් රැකගන්නේ |
| 10 | අධ්‍යාපන සුදුසුකම්<br>ක්‍රිඩාව<br>අධ්‍යාපනය තුලින් ලැබු =වෘත්තිය<br>අධ්‍යාපනය<br>එඩිතර බව<br>මිතුරුකම |
| 11 | ප්‍රතිලාභ පිරිවැය<br>අතර සැරි සරන සිත්<br>මිනිස්කම කරුණාව<br>ප්‍රතිලාභ වගී කල සමීකරනයෙන්ම<br>ශුන්යට සමන කලෝය. |
| 12 | ඔබේ ඇකයෙන් වෙන්වී ආදර අම්මේ<br>කල් ගෙවනවා කවුරුත් නැති සරසවියේ<br>කුස ගිනි දැනෙන විට අම්මේ<br>නුඹේ බත්පතේ මිහිර සිහි වෙනවා අම්මේ |
| 13 | දහවල රාත්‍රිය උදාවෙනවා<br>නුඹ නොදැක දින සති මාස ගත වෙනවා<br>විභාගය මාසයෙන් මාසය ලං වෙනවා<br>සිත දැඩිකර ලියනවා ඔබ සිහි කර අම්මේ |
| 14 | මොනතරම් හොඳද<br>ලොකයේ හැමදේම<br>ඇතිවෙලා පැවතිලා නැවතිලා<br>යනඑක |
| 15 | පුදදුන් ආදරය ඔබ හට මෙමා සතු<br>හැකිවෙද අපහට එක්වන්නට දිනක මතු<br>ඉටුනොවු නමුත් සිතුමන් අප සිතුපැතු<br>වෙන් වී යන්න සසරේ යලි හමු නොවෙමු මතු |
| 16 | මා වැනි බිළින්දා<br>ඇණ වුනේ ඇයිද මන්දා<br>පාඩම් නොකල හින්දා<br>නැගඟටපං විභාගය අනිද්දා |
| 17 | වැස්ස වහිනවා<br>කම්මැලි හිතෙනවා<br>විභාගය අමතක වෙනවා<br>නිදිමත හැදෙනවා |
| 18 | නිදි වරා දුක්විද<br>සරසවි ආ සද<br>යලි විදින දුක් කද<br>නොදනිද දෙවී රද |
| 19 | අනුන් දකින අපි නොදකින දෙයක්<br>තමා PHD<br>නෙලා ගන්න බැරි අත්තක පිපුනු<br>මලකි M S C<br>අමාරුවෙන් ලැබෙන දෙයකි<br>HSC<br>දෙලොවක් මැද අතරමංව අපි ලියනවා<br>ලියනවා BCS |
| 20 | හිගා කන්න බෑ අතපය ඇති හින්දා<br>මැරි වැඩක් නෑ යලි ඉපදෙන හින්දා<br>ඉගෙනිමත් දුකයි බර බර වැඩි හින්දා<br>අනාගතයේ මොනවා වෙයිද මන්දා |
| 21 | ෆොටෝ කොපි පොලිමේ<br>ඉදලා මට ඇති වෙලා<br>ආයේනම් ෆොටෝ කොපි<br>මෙහෙන් නම් මට එපා |

| | |
|---|---|
| 22 | අස්ථිර වු<br>ස්ත්‍රි චින්තනය<br>තුල ස්ථිර ප්‍රේමයක් ගොඩනැගිය හැකිනම්<br>පුත්තලමේද ගෝවා<br>වගාකල හැක |
| 23 | පොත් කදු හිසේ<br>සුසුමක් හැපේ<br>නාය යනදා යෞවනේ<br>අම්මලා දුක් විදින දැතට<br>ඇයි තවත් අප බරවුනේ |
| 24 | පොත් අරං පොලිමට<br>ෆොටො කොපි ගහන්නට<br>ඇයිද මේ කරුමයක්<br>මෙහෙම අපි ගෙවන්නේ |
| 25 | අනේ දෙවියනේ මට උන වියෝයා<br>තවත් මසක් කැම්පස් එක වැසුවෝයා<br>මේකෙන් අපි පිටවෙන්නේ හැරමිටියෙන්<br>යනදායා<br>අපේ අම්මට චිත්තයක් මම දෙන්නේ කවදායා |
| 26 | ඉවසන දනා රැපුයුදයට ජය කොඩිය<br>මේ කී එකාගේ කට කැවත් මදිය<br>ඉක්මන් වුනු එකා ලඟ කොකු හත අටය<br>ඉවසුපු මෙමා තවමත් තනිකඩය |
| 27 | අනේ කෙල්ලනේ මේ බස අසාපන්<br>ඇඟ පේන්න අඳින්නෙපා අසාපන්<br>පාඩම් කරන්නට ආවත් අනේ ඉතිං<br>ඇස දුවනවා නුඹලගෙ සුදු කකුල් සොයන් |
| 28 | කියන්නට කිසිත් නැත<br>යන්නට තැනක් නැත<br>මේ පාලු ලෝකයේ<br>මගේ හද තනිව ඇත |
| 29 | ජපුරට ආවා කොල්ලෝ<br>එලකිරි පොරවල් රැල්ලෝ<br>සටනට ආවත් බොග බල්ලෝ<br>කවදත් පෙරමුණේ රැල්ලෝ |
| 30 | ලයිබ්‍රියට ආවේ වැඩ කරන්ටයි<br>ආපුගමන් දැක්කේ සුදු කකුල් දෙකයි<br>ඇඳුමක් අඳින්නට දන්නැතිවදැයි සිතෙයි<br>කකුල් බලලා Exam ඇණවෙයිද සිතෙයි |
| 31 | කන් අඩි පැලෙන ලය පුපුරන<br>වෙඩි සද්දේ<br>නොසැලෙන මහ පිරිස අප සමගින්<br>එද්දෙන්<br>එන්නට දෙපා පනනැති අය<br>නවතිද්දෙන්<br>අප යන ගමන යන්නෙමු පොරක<br>මැද්දෙන් |
| 32 | ශ්‍රී ජයවර්ධන පුර නව සරසවියේ<br>එපිට වත්ත නම් බල්ලෙක් සිටියේ<br>අතකොලුවකි මිනිමරු එජන්සියේ<br>ජපුර වනසන්ට පෙර වුත කෙරුවෙ |
| 33 | සරසවි පෙරැහැර අවසන්<br>නැටු නැටුමක් නැත<br>නමුත්<br>සුන්දර මතකයක් ඇත<br>එත්<br>එකට job නැත |

| | |
|---|---|
| 34 | සිනා සදිසි හෙටක් දකින<br>පැතුම් තුරුලු කරන්<br>දැයක් රකින ලොවක් දිනන<br>දුවෙක් පුතෙක් වෙයන්<br>හිරුත් නැගෙන සඳත් දිලෙන<br>දැයක දිනුම රිසින්<br>දියක් ලෙසින් ගලා හැලන්<br>මව් සිහිනෙක නමින් |
| 35 | ආවේ ගෙදර සිට ඩිග්රිය අරගන්න<br>කෑවේ පාං අපහට නැත බත් කන්න<br>කොක්කක් ගැහුවොත් හැක මට බත් කන්න<br>කව්රුද කැමති මට බත් අම්මා වෙන්න |
| 36 | පැතුම් ඉටුවන දිනක් එවිද<br>පෑ පැතුම් හැම බොදවෙලා<br>සිනා සෙන්නට වරම් නෑ මට<br>කදුලු නෙතු අග පරවෙලා<br>සුසුම් ලන්නට නෑ තවත් ඉඩ<br>සුසුම් හද තුල සිරවෙලා<br>නික්ම යන්නට අවසරයි මට<br>නුඹේලෝකෙන් වෙන් වෙලා |
| 37 | මගේ පැතුම් බොල් අහසේ පාවි යාදෝ<br>නුඹේ සිතින් මා අමතක වී යාදෝ<br>සරසවියේ බැඳි සිහිනය නිමා වේවිදෝ<br>හෙට දිනයේ නුඹ මගෙන් වෙන්ව යාවිදෝ |
| 38 | හිරු කිරණ බැස ගියා<br>මැයි මලත් පර උනා<br>විදුදැයේ පින් බිමෙන්<br>ඔබ අපව හැර ගියා |
| 39 | රතුමල් පිපෙන්නේ<br>නුඹ නමිනි හැමදිනම<br>එහි සුවද ගෙනෙන්නේ<br>නුඹව පාවඩ වෙමිනි |
| 40 | අහස උසයි ගොඩ ගැසුවොත් මේපාත් සේරම<br>කියවන්නට නියම කරයි හැම දේශයක්ම<br>මේවයේ ඇති පල්හරුප නොවැටනෙ හින්දම<br>නිදා ගනිම් ඔලුවට යන්නට පතාගෙනම |
| 41 | ඉකොන් ,සෝ සෝ මල තිබෙනා සැම පල<br>ස්ටැටි නියායෙන් කෙරුවේ තහවුරුය<br>මගේ හිතේ මේ එක එක පටලැලිය<br>අනේ අපොයි ඩිග්රිය මට නැති වෙයිද |
| 42 | සොඳුරු ජිවිත ගමනේ<br>ගිමන් හලවු මේ පිදු බිමේ<br>මා ලද කටුකම අත් දැකිම්<br>නුඹ දැකීමෙන් දැණුන වේදනාවන්<br>පමණමය |
| 43 | 1st year එක ගෙවුනේ රැග් කෑමෙන්<br>2nd year එක ගෙවුනේ රැග් දීමෙන්<br>3rd year එක ගෙවුනේ සිහින වලින්<br>Final year එක ගෙවි ගියා research<br>වලින් |
| 44 | කොණ්ඩේ කොටට දාලා<br>හැම උදේම එනවා<br>කකුල් දෙකට හිරවෙන්නට<br>ඩෙනිම ගහනවා<br>අත් නැති ටි ෂර්ට් එකක්<br>ඇඳලයි ඉන්නේ<br>එයාට අපි බඩුවක් කියලයි අමතන්නේ |

| | |
|---|---|
| 45 | සිරි සුමංගල සම්දුට<br>කියම් පුවතක් වැදි සිට<br>1st year යකෙකුට<br>අහෝ ඇණ විය කරපු පිනකට |
| 46 | මුලු සේසතම බෑගය තුල දමාලා<br>ගමනක් ගියා බස් රථයක රෑ විලා<br>කොහොදෝ ඉඳන් ආ කෙල්ලෙක් ලං වීලා<br>ලග හිටි පරයා බෑගය අරගෙන බැහැලා |
| 47 | බෝ දුර ගෙවාගෙන ජපුරට ආ කරුණ<br>සමහර අයට අමතක වේ ඒ කරුණ<br>මුලාවේ නොගොස් යාලුවේ කිසිම දින<br>ආ දෙය කරන් පලයන් මෙය හිතට ගෙන |
| 48 | තනිකඩං විනෝදං<br>ඩබලං අතිභයං<br>ආදරන් අනියතං<br>බූටිනං නොතියපං |
| 49 | අඳුරු දත් පාලා<br>කොක් හඬින් සිනා සීලා<br>වැඳිරිය හංසමාලා<br>දුවයි දවසක ජ.පුර දා |
| 50 | අඹරේ උසට දිලිසෙන මිරිඟුව අතර<br>මගියෙකු නොවෙමි මැද වැද යන මරුකතර<br>පණනල ගසා හදවත කෙරුවත් නතර<br>සත්‍යය රකිමි අවසන් හුස්මත් අතැර |
| 51 | කියන තර සුන්දර නැත සරසවිය<br>ආවා කියලා වෙනසක් නැත ජිවිතය<br>මහ ලොකුවට ලැබුනට මේ උපාධිය<br>සිතේ සතුට නැති එකමයි අභේනිය |
| 52 | ඕනම තැනක අපි ගේමට නම් ගේම<br>මොකටද මව් පියන් ගැන මෙහි පැවසීම<br>වැරදියි හැමදේම Rag එක පිට ලෑම<br>දීපන් මුහුණ ප්‍රශ්නෙට හැර පොන්නකම |
| 53 | නෙත් හසරැල්ල නුඹ දුන් ගත සිත නිවන<br>මුව හසරැල්ල නුග සෙවනකි හද පිනන<br>දොඩ මලු මුදු වදන් අම්මි ලෙස හැගුන<br>අද මතකයන් පමණකි සියො ලඟ දවන |
| 54 | ගැහැනිය ගිනි ගොඩකි පිදුරුත් අඩු නොවන<br>ගැහැනිය  මාරයෙකි ගෙල සිර කර දමන<br>ගැහැනිය   සිගමනකි පාරට ඇද   දමන<br>ගැහැණිය ඇණ ගොඩකි අප සැම ඇණ කරන |
| 55 | ඇඳිවත ඉවතලා දමනා ලීලාවෙන්<br>කෙල්ලට හැකිද ගැලවීමට අවමානෙන්<br>වැරහැලි පටලවා කිම මේ අඩමානෙන්<br>සැලවිය යුත්ත සගවාලා තිබුණාදෙන් |
| 56 | A /L මොකටද මෙඩිමෙක් වෙන්න බැරි<br>degree මොටද රස්සාවක් ගන්න බැරි<br>හොස්ටල් මොටද සුවසේ නිදියන්න බැරි<br>කොක්ක මොටද කසාද බැඳ ගන්න බැරි |
| 57 | මා මළ කලට නිදහස මත්තේ<br>විදුදය මවට ගෞරවයක් විය යුත්තේ<br>සිහ ධජ නොඑලුවත් මගේ මල කද මත්තේ<br>ජපුරට හිස දමා මිහිදන් කලයුත්තේ |
| 58 | ඇණ ඇත දාන්නට ගොඩ තව එකෙකු වෙවී<br>funඑක තියා ගන්නට මෙහි කිසිත් නැති<br>ගන්නට හැකිවේද ඩිග්රිය මම නොදනී<br>අම්මේ එනවා අද හෙට මම මෙයින් මිදී |
| 59 | Lectur  නොයා හොර අත්සන් ගහපු එවුන්<br>ලියයි<br>Exam ලියයි කරදරයක් නැතුව ඉතින්<br>මුන්වගේ එවුන් හට Degree ය දුන්නොතින්<br>බිහිවෙයි ජ'පුරෙන් පල්හොරු බූරුතු පිටින් |

| | |
|---|---|
| 60 | කටට ආපු පලියට නෙක පල් හැලි<br>නොලියා ලියාපන් රසබර පද පේලි<br>නැතහොත් එළබෙන වසරෙහි මස ජුලි<br>දිනයක දෙනවා විසිවෙන්නට තොගෙ කැල |
| 61 | තැනු යකඩින් පොරෝ තලයට<br>හැකිද මහගස් බිම පොලන්නට<br>ගසක අත්තක් උදව් නොවිනම්<br>පොරෝ තලයට මිටක් වන්නට |
| 62 | ගල් පිට්ටනිය උඩ අහසේ පෙරදාක<br>දුටුවා සඳක් නැග තැබූ හැටි පෙර රැක<br>ඇවිට්ලි කරයි ඒකට මගෙ සිත බෝම<br>සඳ අහසෙමයි බිම හිඳ ලංවනු කෝම |
| 63 | Vc වෙලා මතු දින "එපිටා" ඒවී<br>ජ'පුර එදා මේ දිවයින බැබලේවි<br>Art Degree යට යලි නිසි තැන එවී<br>අප සැමදෙනා සතොසින් මෙතනින් යාවී |
| 64 | බොහෝ දේ දකින්නට<br>කාළය එළඹ ඇත<br>නොනැවතී මඟ යන්න<br>මණුසන් උයනට පායන එක ඉර<br>හිමවත් සහරාවල් මවමින්<br>සොම්නස් සුසුමන් දොම්නස් සුසුමන්<br>මං පෙත් කරනා යුරු බලපං |
| 65 | අවේ එදා සරසවිය කරගෙන සිත සවිය<br>කාෂ්මීර යුධ පිටියකි සරසවිය<br>අමතක වුනිය ගෙන එන්නට ගිනි අවිය<br>අම්මේ පිටත් වේවිද මගේ මල මිණිය |
| 66 | ගමෙන් රැගෙන ආ<br>    කොතරම් වටිනා මිණිකැට<br>මේ සරසවි බිම දමා යන්නට ඇත්ද<br>    ජිවිතය තරම් වටිනා ඒ මිණිපහන්<br>දල්වනු පිණිස<br>දෙමාපියන් කොතරම් සිහින දකින්නටද |
| 67 | මව්පිය ලේ කඳුළු දහඩිය<br>හරවා රුපියල් සත බවට<br>දමති පාටි<br>ගින්දරය බොක්ක කියා ගත් නිවටයන්<br>බුද්ධිමතුන්ගේ පරාදිසයක |
| 68 | Try කරලා ගත්තා දෙයක්<br><br>Ssc<br>අන්ද මන්ද වෙලා අපි ලිව්වා<br><br>Hsc<br>නෙලාගන්න බැරි අත්තක<br>        පිපුණු මලයි Bsc<br>අපි නොදකින හීනේ<br>        තමයි Msc |
| 69 | දූ පුත් ධනපති පන්තියට පැන පැන අරගත්තු<br>කලාපීඨ අධිපති ඕ අතපත්තු<br>තම නිල බලය ගිනි අවියක් කරගත්තු<br>නොමරා මරනවා සරසවි දූ පුතු |
| 70 | වැහිදාට හැමදාම අපේ ගේ තෙමෙනවා<br>අම්මගේ ජිවිතේ ළණු ඇදේ දිරණවා<br>අයියලා අක්කලා තව ගෙවල් හදනවා<br>අම්මේ මම කවදා හරි අපේ ගේ හදනවා |
| 71 | දහවල් කලට ඇදුරිදු වාසනාවන්<br>සැන්දෑ කලට කෙල්ලන්ගේ පනාවන්<br>රෑ තුන්යමට මදුරුගේ ගායනාවන්<br>එලිවෙන පැයට නිදිදුව වාසනාවන් |

| | |
|---|---|
| 72 | නලින්   විකාරය<br>පීරිස්    දුමාරය<br>ජේ.බී    සිරාමය<br>අහෝ   වී සී භයංකාරය |
| 73 | ශාලාව වෙත ඇදෙයි<br>ලොකු පොත් ගොඩක් පෙරලති<br>ඇස් බැන්දුමක් කරති<br>නොදත්තෙමු දේශනා කරති |
| 74 | නොම්හිරිද දේශන<br>ඇසුනද වඩා භාෂණ<br>නැතහොත් නැණ නුවණ<br>කියවූ නොසතුටු වන්ට කාරණ |
| 75 | පානුයි පරිප්පුයි දවසක බුදු වේවා<br>ගෝවයි අලයි සැරියුත් මුගලන් වේවා<br>කැන්ටින් හොද්ද නේරංජා ගඟ වේවා<br>කැන්ටින් මුදලාලි කන්තක අසු වේවා |
| 76 | මා මිය ගියත් දෙරණෙහි මේ අසම සම<br>රතු මල් පිපෙනු ඇත පොහොරට රැගෙන ලැම<br>ලෝකය පිටු දකින දිනයක දිලිඳුකම<br>නැගිටිමි ආත්මය සමගින් එදින මම |
| 77 | සිහිනෙන් පවා මගේ සුබ විහරණය පැතූ<br>රජකම ගන්න පුතු රජගෙට ගියැයි සිතූ<br>අම්මා දනීනම් මේ සරසවියේ තතු<br>ගෙනගොස් බොහෝ කල් මේ දුක් විඳින පුතු |
| 78 | සිතට සිතන්නට පුරුදු කළා නම්<br>ඉවත බලන්නට එපා<br>නෙතට බලන්නට පුරුදු කළානම්<br>එයින් මිදෙන්නට එපා |
| 79 | පැතුම් මල් පොදි බැඳන්<br>පාතැබූ සරසවිය<br>එකවිටම කැළඹිලා<br>ඇරඹුමක් නැති සරසවිය තුළ<br>තාරුණ්‍ය දියවෙලා |
| 80 | දහසක් කම් කටොලු මැදින්<br>ලබා උපාධිය දුකසේ<br>සරසවියෙන් ඔබ සැමගෙන්<br>සමුගෙන යන්නෙමි |
| 81 | සරසවියත් සොයුරු ඔබත්<br>දැකගන්නට හමුවන්නට<br>ආයෙත් දවසක් මල්ලියේ<br>අප එන්නම්<br>තරහ නොවනු මැන එදට<br>ගපේ ගසන්නම් |
| 82 | දුකත් කඳුළුත්<br>අතැර මම<br>සතුටක් සිනාවත්<br>වැළඳ ගමි<br>ඔබත් ප්‍රේමයත් විසිකර<br>හීනත් ප්‍රාර්ථනත් වළලමි<br>සහනයත් සැනසුමත්<br>නිවනත් විමුක්තියත් සොයා<br>අදම ගිහිගෙය අත හරිමි |
| 83 | කඳුලට මේ ඔහේ ගලන<br>කියාදෙමි<br>ආදරේ කළ තරම්<br>සුසුමට මේ පපුව දෙකඩ කරන<br>කියන්නේ කවුද දැනෙන දුක |
| 84 | සත්‍යක් අසත්‍යක්<br>ප්‍රේමයත් කැමැත්තක්<br>නිදහසත් තනිකමත්<br>විරහවත් වියෝවත්<br>හීනත් හැබැවත්<br>විභාගත් නිවාඩුත්<br>අතර සුසුම්ලන<br>සරසවි දියණිය |
| 85 | අයියලා<br>ජපුරට ආපුම දවසෙ<br>ගැලවුම්කාරයො<br>ඊළඟ දවසෙ<br>විහිළු කාරයො<br>සතියකට පස්සෙ<br>පෙරලිකාරයො<br>ආයෙ<br>තරගකාරයො<br>සතියක්<br>ප්‍රශ්නකාරයො<br>ඊට පස්සේ<br>වදකාරයෝ<br>ගෙදර ගිහින් ආපු සතියේ<br>වැඩකාරයෝ<br>සෙකන්ඩ් ඉයර්ලා<br>අයිතිකාරයෝ<br>පෙරේදට කලින්<br>වැරදිකාරයෝ<br>ඊයේ නිවැරදිකාරයෝ<br>බකට් කරපු අද<br>සහෝදරයෝ |
| 86 | වසන්තයක් ඇවිත් ගියා<br>හිතේ සතුට අරන් ගියා<br>හිතකුත් නෑ සතුටකුත් නෑ<br>අහිමි විජිතේ තනිවුනි මට<br>   වේදනාව වෙලාගන්න<br>   හිතවසන්තේ එක්ක ගියා<br>   සරත් කාලේ නියං පොලව<br>   වගේ හිතත් වියලී ගියා<br>වසන්තේ යලි කවදා එයිද<br>හිතේ සතුට යලි ලැබෙයිද-<br>අනේ මෙහෙම දුක දරාන<br>කවදා මං හිනා වෙයිද |
| 87 | දුක් වින්ද තරමටම<br>සරසවියේ ජිවිතේ<br>හැරයන්න බෑ ඉතින්<br>රාහුලේ ජිවිතේ |
| 88 | සංසාර චාරිකා<br>මංසලින් නික්මිලා<br>යන්න මට අවසරයි<br>මේ මතක සිත දරා |
| 89 | මේ සුවිසල් පුර<br>තනිව ඉන්නට<br>මට ඔය සිත<br>සවිය ගෙනෙයි |
| 90 | තරුමල් යායක් පිපිලා තිබෙනා<br>නිල්තන මත්තේ<br>ඒ මල් යායේ සුන්දරත්වයද<br>අද මම දැන ගත්තේ<br>නෙතුකුන් රැඳෙනා සිනා මල් ගොමුව<br>දෝතට නුඹ ගත්තේ<br>හිත්තුල තිබෙන ලෙන්ගතු කම<br>සැබවින් දැකලද අක්කේ |

| | |
|---|---|
| 91 | සඳ අහසේ හිනහුනාට<br>කොඳ මල් පොඩි පිබිදුනාට<br>කැකුළු මලට තනි රකින්න<br>සඳ රැදුනේ නෑ<br>මඳ පවනට තුරුළු වෙන්න<br>ගංදිය රැළි දගකළාට<br>දිය රැළි ළඟ සුළං පොදක්<br>නතර වුනේ නෑ |
| 92 | මයිනි මයිනගේ ඉන ලගටා<br>කීවොත් එන්නේ ඔහු ඇගටා<br>තැබුවොත් දෙන්නම එක ළගටා<br>උස් මිටි බේදය පෙනේ හොදටා |
| 93 | සැමවිට සැම දන නිතරම  කිපෙනා<br>සිදුවූ දෙය ගැන නිතරම සිතනා<br>මයිනිගේ පිටුපස සැමදා සිටිනා<br>මොහු වෙයි සෝරතේ මයිනිගේ මයිනා |
| 94 | නමක් දිනාගන්න ජ'පුර<br>මම දුටුවෙමි ඒ පුරවර<br>නැතිය රහක් මට මෙනුවර<br>යන්න හිතෙනවා අතහැර |
| 95 | තාරුණ්‍යයේ මල් සමය<br>පියමංච යයි සටහන් අතර<br>බිත්ති සතරකින් වටවූ<br>නේවාසිකාගාරයක් තුළ |
| 96 | වසන්තයේ ඒක සොදුරු නිමේෂයක<br>මගේ හද විමනට වැඩි ඔබමයි<br>ගිම්හානයේ එක් අදුරු නිමේෂයක<br>මා හඳ තනිකොට පලා ගියේ |
| 97 | **නිරුවත**<br>මල්ලියේ<br>සළුවෙන් නොවැසි නිරුවත<br>කුහක<br>ආත්මාර්ථකාමී<br>මුදලට වැසුණු මිනිස්කම<br>ධනවාදයේ නිරුවත<br>සාගතයෙන් මිය ගියත්<br>නොබිදෙන බකතපස්<br>කොස්වා ලිහිණි<br>වීදුරු ගෙවල් වල<br>දිය කහරු අතැර<br>බොතල් කළ වතුර<br>කාසියට ගිල දමන<br>බත් ඇට පිනුම් ගසන<br>මගෙ රටෙන්<br>මවු කිරිත්<br>වහලක්වත් නැති<br>නුඹ වැන්නවුන් පිරි<br>අනාගතයක්ද ? ඉදිරිය..... |
| 98 | **සරසවි බිම**<br>සිහින ලොවකි<br>සුර රැඟුමකි<br>හැගුම් ගොඩකි<br>එන්නට පෙර සරසවි බිම<br>පොත් මිටියකි<br>නොනිමි වැඩකි<br>හැමදාමත් විභාගයකි<br>කොක්ක නැති ජිවිතයකි |

| | |
|---|---|
| 99 | **එපාවෙලා සරසවි බිම**<br>දින  ගැහුමකි<br>අඳුරු ලොවකි<br>කෙදින යමිද මේ<br>සරසවි බිම |
| 100 | **ඉස්සර දවසක**<br>දුන්හිද සිරිපොද විසිරෙන තාලෙට<br>මා තුරුලේ හිද හිනහෙන කළ නුඹ<br>මතකද ඉගිබිගි පැවා පුරහඳ<br>සිහින අතර අපි තනිවුණ දවසක<br><br>හන්තානේ පිබිදෙන තුරු ගොමුපෙළ<br>විලියෙන් බරවුණු නුඹේ දෙනුවන් දැක<br>මතකද තාලෙට සෙලවුණු හැට් කොල<br>නුඹයි මායි තනිකර නැති විදිහට<br><br>කඩා හැලෙන ලස්සන රුව වට කර<br>කෙහෙරැලි රගදෙන සිහින් පවන් මැද<br>මතකද ඔය මුව දෙතොලට ළංකර<br>ජිවිතයම ලිව්වා නුඹ නමටම.... |
| 101 | අමාරුවෙන්<br>කට්ට කාපු එකා<br>දවසක<br>මදය කනවාමයි |
| 102 | සොඳුරු සරසවිය<br>ජිවිතය සුවඳවත් කළ සුරපුරය සේම<br>ව්‍යාජ ආදරය නම් වූ<br>මා රිදවූ මිථ්‍යාවද<br>මට මුණගැස්සු<br>සුසානයද විය |
| 103 | **සැබෑ මිතුර**<br>බොඩිමේ ජරමර මැද<br>සැම උදයට පිබිද<br>රැගෙන පොත් මිටියද<br>පැමිණියේ ජිම් වෙතය සකිසද<br><br>දෙවසක් තවත් අඩවස ඇත ගෙවීලා<br>ඩිග්රිය අපේ අතළගටම ඇවිල්ලා<br>පළමු වසරේ සිටි මේ අපි සියල්ලා<br>පාඩම් කළේ නිති ජිම් එකේ රැදිලා<br><br>මිතුරන් ටික අපේ රජ දරුවන් වාගේ<br>පාඩම් කලේ මවකගේ දරු    වාගේ<br>දැණුම බෙදාලන්නේ කිරි පැණි වාගේ<br>ජිම් එක පිහිට විය අපේ මව් පියො වාගේ<br><br>අයිබර් මේස පුටු තවතව දිලිසෙනවා<br>මේවා දකින විට තුනටිය කකියනවා<br>දෙපැයක් ගෙවන විට  හිරි එනවා<br>මොනවා කරන්නද මගේ හිස කකියනවා |
| 104 | කියන විටදි ජිම්එක යැයි පිට අයට<br>එ අය හිතනවා ඇති ඒගැන වැරදියට<br>ඇග හදනා තැනට ආවේ කළෙක සිට<br>නොවේ ඇඟ හදන්නට පාඩම් වලට |
| 105 | තෙරුවන් සරණ ඔබ හැමටම ලැබේවා !<br>ජයෙන් ජයට මං පෙත් නිති හෙලි වේවා!<br>තවත් සියක් දෙන හෙවනේ වැඩිවේවා!<br>සබඳ නිබද ජිම් එක නිති සුරැකේවා! |

| | |
|---|---|
| 106 | **ධර්මාධිකරණය**<br>පණ ගිලිහෙනතුරු එල්ලා මරණු<br>චණ්ඩාශෝකව<br>ධර්මාධිකරණයේ තීන්දුව!<br>සාක්ෂිය දුන්නේ හෘදය<br>තවත් බරපතල නියෝගයක්<br>ජාතක කරණු ධර්මාශෝකව<br>ජීවිතාන්තය දක්වා රකින ධර්මය<br><br>වස බී මිය යනු හිට්ලර්<br>සාක්ෂි කරු හෘදය<br>ධර්මාධිකරණයේ තීන්දුව!<br><br>ඉඩ අරිමින්<br>විදවනු ජීවිතය පුරා<br>ලෝකය හින්දා අපහාස<br>නපුරුකමට<br>බලයෙන් වහපු හෘදය<br><br>රමණයට ලොල්වූ රාවනා<br>අහිමි කරණු රාජ්‍යය |
| 107 | ධර්මාධිකරණයේ තීන්දුව<br>උඹලා මොනවද කලේ රටට<br>අපි ඉගෙනගත්තා<br>මොනවද<br>Theory part එක<br>ඇතිද ඒකා<br>හොඳටම propessionl ලුත් තියෙනවා<br>ජීවිතාන්තය දක්වා වැඩ කරනු<br>අම්බරුවන් මෙන්<br>ධර්මාධිකරණය<br>කලාව කොහොමද<br>මැල්ලුමට වගේ<br>දන්නවද මුකුත්<br>ඔව් කවි කතන්දර<br>වැඩක් තියෙනවද<br>වැඩක්ගත්ත කෙනෙක් නෑ<br>ඇයි සරසවිය<br>හොඳයි ටිකයි<br>ඉදිරි කාලය පුරාවට<br>රැඳෙනු අප සමග<br>අපි දෙමු වැඩක්<br>ඇස් ඇරෙන්ඩ<br>මනුසාර බවේ අධිකරණය<br>සරස්වති සාක්ෂිය! |
| 108 | **සිරි සුමංගල සම්දුට**<br>කියම් පුවතක් වැඳසිට<br>1st year යකෙකුට<br>අහෝ ! ඇණවිය කරපු පිනකට |
| 109 | මිනිසුන් අතර මිනිසුන් නොමිනිසුන්ද ඇත<br>ජපුරේ පවා මෙයට නිදසුන් ඇත |
| 110 | කඳුකරයේ සිට<br>බැඳුණ සිත දෙසට<br>සිදුවුණා පිවං වන්නට<br>ගලියා සමගින් අපටද |
| 111 | නෙතු කොනින් හිනාවෙලා<br>ඇති බැළුවා මගේ ඇස්දෙක<br>මගේ ලෝකෙන් උඹ පලයං<br>මගේ හිනෙට අවධිවෙන්න |
| 112 | මුලු සේසතම බෑගය තුළ දමලා<br>ගමනක් ගියා බස් රථයක රෑ විලා<br>කොහොදෝ ඉඳන් ආ කෙල්ලන් ළං වීලා<br>ළඟ හිටි පරයා බෑගය අරගෙන බැහැලා |
| 113 | කයින් මා ජපුරේ<br>සිතින් සබරගමුවේ<br>කෙදිනක හෝ අපි එක්වෙමු<br>තුරුලේ |
| 114 | සිතුවත් ඔබගැන රැයක් පුරා<br>පැතුවන් පැතුම් දහසක්<br>සෙවනැලිවල එළිය වැටී<br>මහ පොළවම බෝ විශාල විය |
| 115 | ජීවිතය කවියකි<br>රිද්මය තිබෙන තුරු<br>ජීවිතය නාට්‍යයකි<br>අපි එහි රගනතුරු<br>ජීවිතය ජීවිතයකි<br>අපි එහි ජීවත්වන තුරු |
| 116 | තනිතරුවක් අඳුරු ගුවන<br>ඉකිබිඳ නිශාමය හඳ නලියන සුසුම් පොද<br>රත්තරං නුඹම විය |
| 117 | දුටුවෙමි පවුර කැටපත්<br>ඇදුනෙමි මගේ නෙත් සිත්<br>පතුරවන්නේමි සැමට මෙත් සිත්<br>සබඳ කියවා බලන් පදරුත් |
| 118 | මලක් තනිව පිපිලා<br>බඹරුන් අහක බලා<br>යන්නේ ඇයි දැයි<br>වටහාගනු බෑ |
| 119 | දිනකදි මුදු පවන් රැල්ල<br>සැඟවීය ගිය කල මගේ පනනල<br>නුඹට පෙම්කළ රහස වැලපෙයි<br>මාත් සමගින් එකට සොහොනක |
| 120 | පාසල් සමයේ මා සිත<br>ඇඳි<br>සරසවිය<br>මෙයමද? |
| 121 | සඳපායා හිනැහෙනවා<br>ඔච්චම් කර මගේ පෙමට<br>හිරුට හොරා මල් පිපිලා<br>සුවඳ ගෙනේ මුළු රැටම<br>හිතට හොරා නුඹගියදා<br>ගිනි අවුලා මගේ හිතට<br>සියලු පැතුම් ඉටුවේවා<br>කටු මල් පිපි ඔබේ ලොවට |
| 122 | නුඹ නික්ම ගිය ලොවක<br>මා පරාජිත කොහෙද<br>මම එයින් ජිවිතේ<br>අරුත වටහා ගතිමි |
| 123 | අනන්තය දන්නෑ<br>නුඹ මා හැර ගිය දුර<br>වහින වැහිබිඳු තවම දන්නෑ<br>මගෙ නෙතින් ගලා ගිය<br>කඳුළු බිඳ......... |
| 124 | ගත රැඳි නහර එළියට ඇද බලනු මැන<br>එඩි රණවිරුවෝ එහි තැන තැන නිතර ඇති<br>දුන්නොත් ඉඩක් පෙන්වමි සරසවියේ බල<br>මියයමි ජ්පුර මාතාවගේ දෙපා මුල |
| 125 | බෝ දුර ගෙවාගෙන ජ්පුරට ආ තරුණ<br>සමහර අයට අමතකවෙයි ආ කරුණ<br>මුලාවෙ නොගොස් යාලුවෙ කිසිම දින<br>ආ වැඩේ කරන් පලයන් මෙය හිතට ගෙන |

| | |
|---|---|
| 126 | “නියගියකි ඉරි තැලුණු<br>රළු පොළොව මමම විය<br>වැස්ස මා නාදුනනන<br>සුන්දරිය වුවාය.<br>මින් ප්‍රථම කිසි දිනක<br>වැසි නොවැටි සිත් බිමට<br>නොදැන ඔබ මවෙත හෙළු<br>වතුර පොද වැස්ස විය....,, |
| 127 | ජීවිතය සිහිනයක් විය<br>ආදරයෙ බොළඳවිය<br>වසන්තය තවම ඇත<br>වුවත් අප වෙන්වි |
| 128 | මා මළ කලක සොයුරනි නිදහස මත්තේ<br>විදුදය මවට ගෞරවයක් විය යුත්තේ<br>සියලුන් නොබැලුවත් මගේ මළ කඳ මත්තේ<br>ජ'පුරට හිස නමා මිහිදන් කළ යුත්තෙ |
| 129 | සුමංගලේ ඇති පැල්ලම්<br>පවසයි ජ'පුරේ සෙල්ලම්<br>වේලි වේලි සිටි කොල්ලන්<br>භාරති හොඳ හොඳ ඉල්ලන් |
| 130 | සමනළුන්ට බිඟුන්ට රසදුනක් වී<br>දෙනෙත් වලට සුමිහිරි<br>දසුනක් වී<br>නැහැ පුඩුවට ඉමිහිරි<br>සුවඳක් වී<br>ඊයේ හිනැහුණ කුසුම<br>අද වැලපෙයි<br>පොලව මත පෙති විසිර දමා<br>ඉතින් සහෘදය<br>උපමා කුමට<br>තවත්<br>මේ ජිවිතයට |
| 131 | කියන තරම් සුන්දර නැත සරසවිය<br>ආවා කියා වෙනසක් නැත ජිවිතය<br>මහ ලොකුවට ලැබුණට මේ උපාධිය<br>හිතේ සතුට නැති එකමයි අභේනිය |
| 132 | නෙත් හසරැල්ල නුඹ දුන් ගත සිත නිවන<br>මුව හසරැල්ල නුග සෙවනකි හද පිනන<br>දොඩමලු මුදු වදන් අම මී ලෙස නැගුණ<br>අද මතකයන් පමණයි සියො ළග දවන |
| 133 | දෙනෙත් කදුලැලි - ගලයි නැහැවෙයි<br>සුසුම් හදවත - දවයි රිදවයි<br>මගේ ලොව අද - තනියි පාලුයි<br>ඇයි රිදෙව්වේ - මටයි හිතට |
| 134 | Deep black eyes<br>Tried to say sometimg<br>Not once but it happend<br>Every single day. I wish<br>If I could read those eyes<br>I wish be able to tell how much<br>I Love you. |
| 135 | ලිවීමට මෙය ඉඩක් මදිනිසා<br>අනෙකාට ඉඩක් දිය යුතුනිසා<br>පෑනේ තින්ත මදි නිසා<br>නොලියා යන්නම් තරහද ඔයා |
| 136 | ධම්මිකෝ පිස්සු ලෝකේන<br>සුභන්දො ඹුල් ආහලං<br>හංස මාලා විනාසාය<br>සේනානි අති උත්තමං |

| | |
|---|---|
| 137 | මනසින් ජ'පුරේ<br>හදවතේ වයඹේ<br>ඔබමය සොදුරේ<br>දවසක උරුමේ |
| 138 | මගේ ආදරය<br>හිට්ලර්ට ජාතක කල<br>ප්‍රභාකරන්<br>වගේලු |
| 139 | ගල් පිට්ටනියෙ උඩ අහසේ පෙරදාක<br>දුටුවා සඳක් නැගතිබු හැටි මහ රැක<br>ඇවිටිලි කරයි ඒකට මගෙ හිත බෝම<br>සඳ අහසෙමයි බිම හිඳ ළංවෙනු කෝම |
| 140 | පෙර කළ - සිහිගිරි දුටුවෙමි<br>ඒ කැටපතෙහි ඒදවස කවිලිමි<br>මෙතරම් කුඩාව නිසා ඉඩකඩ<br>:4*2 රාමුවකට)<br>මෙහි පමනක් ලිමි |
| 141 | පියමං කෙරුවේමි කසගස් මැද්දෙන්<br>පාඩම් කෙරුවෙමි වෙලේ කොනක හිඳ<br>ශිල්ප උගත්තෙමු<br>ඇණ ලැබගන්නෙමු<br>දෙපා වාරු නැත ඔබ හැර යන්නට |
| 142 | කඩා වැටෙන තුරුම දැන<br>නොසිටියෙමි<br>විදුරු මාලිගා<br>ශක්තිමත් නොවනබව |
| 143 | මා ඇට ආදරය කරමි<br>ඉගියෙන් පවසන්නේ<br>ඇ ආදරෙයි කියා<br>එනමුත් මුවින් නැ<br>ආදරෙයි කියා<br>ආදරය කරමි<br>දිවි ඇති තුරා |
| 144 | මට දුක නුඹ ගැන<br>සිතමින් ලතැවෙන<br>මගේ සිත ගැන |
| 145 | වෙසක් සඳ<br>පොසොන් සඳ<br>ඇසළ සඳ<br>කිමද මට<br>ඔබේ හඳ<br>නොමැති සඳ |
| 146 | මැවු සිහින බොඳවෙලා<br>ඔබ මා අතැර ගිහිල්ලා<br>ඔබ ඉදියි සතුටින් සිනාසිලා<br>අද මට හඬවන්නට කෙනෙක් නැ<br>අද මට වනසන්නට කෙනෙක් නැ<br>අද මට ළග ඉන්නට කෙනෙක් නැ<br>අනේ මම අද තනිවෙලා |
| 147 | අඹරේ අපට දිළිසෙන මිරිගුව අතර<br>මගියෙක් නොවෙමි වැඳ වැඳ යන මරු කතර<br>පණ නල ගසා හදවත කෙරුවත් නතර<br>සත්‍ය රකිමි අවසන් සුසුමත් අතැර |
| 148 | සොඳුර සොඳුර<br>අපි<br>කොඳුර කොඳුර- හොයමු<br>රැදුණ ඇසුර ඇති<br>හොඳම<br>පැඳුර |
| 149 | වැඳිරි දත් පාලා<br>කොක්හඩින් සිනාසිලා<br>වැඳිරිය හංසමාලා |

| | |
|---|---|
| | දුවයි දවසක ජ්පුරදාලා |
| 150 | නුඹද මා විය මාද නුඹ විය<br>නුඹ අන්සතු විය<br>මට කෙළවිය. |
| 151 | උස්සන් යනවා පෝලිම් වල රෙදි කෑලි<br>පෙන්නන් යනවා වහගත යුතු කෑලි<br>හන්ටින් යනව දමමින් කොළකෑලි<br>මෙහෙම කෙල්ලො බැඳගෙන මොකටද පේවී<br>ඇඳිවත ඉවතලා දමනා ලීලාවෙන්<br>කෙල්ලට හැකිද ගැලවීමට අවමානෙන්<br>වැරහැලි පටලවා කිම මේ අවමානෙන්<br>සැඟවිය යුත්ත සගවාලා තිබුණාදෙන්<br>කටට ආපු පලියට නෙක පල් කෑලි<br>නොලියා ලියාපන් රසබර පද පේලි<br>නැතහොත් එළබෙන වසරෙහි ජුලි<br>දිනයක දෙනවා විසිවෙන්නට තොගෙ කෑලි |
| 152 | <br>කලබලයක් නැතිව දුවන<br>ඇවිදින් සිල් බදින සිතේ<br>රත්තරනේ නුඹ හරියට<br>සෙංකඩගල සුළඟ වගේ |
| 153 | සරසවිය දිවිය කෙතරම් මිහිරිද<br>එත් විදින්නට ඇතිනම් හැමදාම<br>නමුත්<br>කාළය එළඹ ඇත<br>සමුගෙන යන්නට සරසවියෙන්<br>යලිත් කවදා එන්නද ඒ<br>සොදුරු දිවිය |
| 154 | කිරි සිනා පාලා<br>හිනහෙන හංසමාලා<br>ගුරු කමත් පාලා<br>ඉන්නේ හැමදා සිනා සීලා... |
| 155 | කදුළු හංගන වසන්තේ<br>ඔයතරම් එරබදු පිපේ නම්<br>නුඹ අරන් අද<br>මේ වසන්ත කාලයේ<br>ජිවිතේ මේ තරම්<br>සරදම් කිමැයි<br>විදින්නට බැරි<br>ආදරේ<br>ගී ගයන නුඹ<br>කෙවිලියේ<br>මට කියන් - උරුමයද මේ<br>නිමා නොවන ප්‍රේමයේ<br>රේණු ඉහිරෙන බක් මලේ<br>ඔය ලෙසින්<br>පියවර තබයි නම්<br>නුඹම හැර යන මේ සිත් මංසලේ<br>මතක වියැකී යාවී නම්<br>තවත් දුර මේ මාවතේ<br>කල්පයක් වුව බලා ඉන්නම්<br>මේ<br>හැබැ නොවන හීනයේ |
| 156 | ඔබ නිසා සරසවිය<br>මගුල් ගෙයකි<br>ඔබ නැතිදා සරසවිය<br>මළ ගෙයකි<br>එහි මිනිය මා වෙමි |

| | |
|---|---|
| 157 | **ඇත්ත**<br>එන්නට පෙර සිහිනයකි<br>ආ දින සුරපුරයකි<br>දැන්නම් අපායකි<br>ජ්පුර |
| 158 | අනේ මැණිකෙ උඹයි මමයි දැන් දුරදිග යනවා<br>උඹේ හිතට ගානක් නෑ නුඹ හුරතල් වෙනවා<br>ගන්ඩත් බෑ දෙන්ඩත් බෑ මම අසරණ වෙනවා<br>අහුවුනොතින් උඹේ මිනිහා මගේ ඕලුවත් කනවා |
| 159 | එදා ජ්පුරට ගම රට ඉදලා<br>දුටුවෙමි ලස්සන සුර අගනක්<br>කලකට පසු ඒ ලස්සන සුරඟන<br>වැරහැලි නොමැතිවූ යම බැල්ලක් |
| 160 | විදුලිය සේ මෘදු කෝල බැළුම් ඇති<br>මහ අකුණක් සේ කෝමල බස් ඇති<br>සිංහ දේනුවක් සේ හුරතල් ඇති<br>නුඹෙන් ලැබුණ උණුසුම පමණක් මදි |
| 161 | සීමාවක් නැති<br>කැටපත් පවුර<br>සීමා කළ ඔබට<br>නැත<br>කිසි දාක<br>වෛර<br>මම |
| 162 | **නංගියේ මල්ලියේ**<br>ගිරිදුර්ග මාවතේ<br>පසුකරන් දුරඇවිත්<br>ඔබ දකින<br>රිසිව නෙත්<br>හෙමිහෙමින් ඉඟිකර<br>පැහැදිලිව<br>ඔබට යන මාවතක්<br>සදන්නට<br>එන්න<br>අප යන මාවතේ<br>පැහැදිලිය එය<br>සයුර සේ |
| 163 | **මල් කැකුලියේ**<br>නෙතු කැළුම් නිදිවරන<br>මුළු ලොවම නිසසල වු<br>අසිරිමත් පුංචි ලොවක<br>මානෙතු මල් සිප ගත්තෙමි<br>එකම ගීතයක් මුළු විශ්වයම<br>නුඹ වැජඹෙන<br>පුංචි ලොවේ<br>කිරි කොඩුයි තවම නුඹ<br>එහෙත්<br>හෙට උදාවන නැවුම් දින<br>මල් කැකුලියක් නුඹ |

| | |
|---|---|
| 164 | **දයාබර මව්ණි**<br>සරාසඳ නිදාගත්<br>පාළු රෑ යාමෙදිත්<br>ඔබ එළිය ගුවන් ගැබ<br>අරා උන්නා සැනිණ<br>ගිම්හානය තුලදි<br>මහපොළව ඉරිතැලිණි<br>නමුත් ඔබෙ මුදු සෙනෙහෙ<br>හදවතට සිසිල විණි<br>අනොරා වැසි සමයෙ<br>හදවතින් ලගඉඳන්<br>උණුසුමක් විය ඔබ<br>ගැහෙන ගත පුරාවට<br>හිරු මඬල - සඳ මඬල<br>නිල් අහසේ පිපුණමුත්<br>ඔබේසෙනෙහේ රැඳි තිබුණි<br>හිත් අහස පුරාවට |
| 165 | **විභාග කැළවෙත**<br>මහෝඝයකට හසුව<br>පලාගිය වසන්තය<br>නැවත චිත් පිං බිමේ<br>මල් පුබුදුවන<br>සුයාමයක<br>ප්‍රිය සබඳ<br>රොඳ බැදෙමු<br>එක්සත්ම<br>නෙලාගන පැතුම් මල්<br>යලි යලිත්<br>විඳ ගන්න<br>ඒ.....සුවඳ |
| 166 | පිං බිමකි සරසවිය<br>ශිල්ප ලබන්නාට<br>යුධ බිමකි සරසවිය<br>ගැටුම් කරන්නාට<br>දෙව් ලොවකි සරසවිය<br>ප්‍රේම කරන්නාට<br>අපායකි සරසවිය<br>Boot කෑ එකාට |
| 167 | ලෙයින් යකඩින් නසන්නට හැකිවුවද රතු මල් පිපුනි පෙරදී<br>විසුල එසුවද තුරුළු කරගෙන පිපෙයි දහසක් කැකුළු<br>වෙරදී<br>තනන්නට සම බිමක් වයමින් අයුක්තියේ මළ බෙරය<br>හඬදී<br>බුරන බල්ලන් ඔහේ උන්දෙන් සොයුරනේ යමු පෙරට වෙරදී |
| 168 | ඔබ අප ඉන්නේ ගිනි ගෙන දැවෙනා රටක<br>ඔබ අද ඉන්නේ දැවෙනා ඒ රට කොනක<br>ගිනිදැල් සිසිල් වැස්සක් වෙනවා නිසැක<br>රතුමල් පිපෙන ඇත යන්නේ මැද දිනෙක |
| 169 | තාලෙට බෙර වයන තාලෙට පය තබන<br>කාලෙට මද වැටෙන කාලෙට අලි කිපෙන<br>කාරිලම ලෙක්ව යන ක්‍රමට වලට යන<br>වාලෙක් මෙන් ඉගෙන කුමකට ලොව නොදැන |
| 170 | හැඩුවා දිනක් නුඹ ගැබ මොහොතක තනිව<br>සඳ නැත සබඳ මා සිත පාළුව තනිව<br>ගැලු කඳුළු කැට පොගවා මහ පොළව<br>දැකලාවත් පායාවිද සඳ පලුව |

| | |
|---|---|
| 171 | පිවිතය නිදහසේ මාවතයි<br>පරාජය ඒ මාවතේ<br>ගිතයයි |
| 172 | ප්‍රේමය නම් අසෙනිය කුසුමක් වේ<br>රිසිවු කෙනෙකුට පුජා කෙරුමට<br>ලෝබ සිතින් තොර පිදුව මනාවේ<br>පෙරලා ලබනට නොසිතා කිසිවක් |
| 173 | කුසගින්නේ සිටිනා විට අපෙ අම්මේ<br>නෑ වැලපුනේ කිසිදා මම බඩ ගින්නේ<br>මේ හැම වෙලේ නුඹ සිහිවෙන විට අම්මේ<br>සරසවි උපාධිය කටු ඔටුන්නක් අම්මේ |
| 174 | පිවිතය යනු අසම්පූර්ණත්වය සම්පූර්ණ කිරීමට ගන්නා උත්සාහයයි<br>සැම උත්සාහයක්ම වඩවඩාත් හොඳ වේවී<br>වඩාවඩාත් පරිපූර්ණත්වයට ලංවේවී<br>නමුත් කිසි විටෙක පරිපූර්ණ නොවේවී<br>සියළු දෙයින්ම නිවැරදිව පිවත්වන්නා විශාල වේදනාවක් දරනවා මෙන්ම<br>ඊටත් වඩා වේදනාවක් අන්‍යන්ටත් දෙන්නේය. |
| 175 | උපාධි කොලපත මාත් සමඟ අද හඬනව කුසගින්නේ<br>මගේ උගත්කම බිඳක් නොදුටු හිස් සඳගේ බියක්<br>වැන්නේ<br>මසුරන් කෙතකට හිමිකම් නැති මට ඇයි ඔබ පෙම් බැන්දේ<br>මගේ උගත්නම ලිවෙමි කුමරියෙ සරසවියේ බැම්මේ |
| 176 | සිව් වසරක් ගත වී ඇත අප ඇවිදින්<br>අපි ලද දෙයක් නම් නැත කිවොත් සැබවින්<br>රැකියා ඉල්ල ඉල්ලා පිකටින් කරමින්<br>මහ මග මැරෙන්නට වේ මේ අධ්‍යාපනෙ තරමින් |
| 177 | නරි කැළක් ඇත ජ්පුරේ හූ කියන<br>බලු කැළක් ඇත ජ්පුරේ කටු හපන<br>ගොනු කැළක් ඇත ජ්පුරේ ගැල් අදින<br>සිසු කැළක් නැත ජ්පුරේ වැඩ කරන |
| 178 | ලෝගුව අඳින දින වැඩිදුර නෑ අම්මේ<br>සටහන් වලට මගේ නෙත් රිදෙනවා අම්මේ<br>මේ දුක් වින්දේ නුඹ ගැන හිතලයි අම්මේ<br>මා රජ කරල නුඹ සැගවුනේ ඇයි අම්මේ |
| 179 | මල් පිපෙනා කලට ජ්පුරේ කල එළිය<br>නැව් එන කලට ජ්පුරේ ගිනි කෙලිය<br>බරණැස දෙසට ගොස් විඳිනා සුරකෙලිය<br>කෙල්ලෙක් බඩ වෙලා බලපිය මළකෙලිය |
| 180 | සඳවත හැඳ පාර නොබැලූ ඔබ මක්කරන්නෙද අද<br>එක තැනට වී<br>එක්වරක් හරි<br>ඉගිකලේ නම්<br>මමත් ඇත දැන්<br>පිළිවෙලක් වී |
| 181 | ආදරය වේදනාවක් වු විට<br>ඉවසා ඉන්නට බෑනේ හදවත |
| 182 | මට ආවස්වික පිරිවැයක්<br>දරන්න තිබුණා<br>නුඹ හොඳම<br>විකල්පය වුවා නම් |
| 183 | එකට විප්ලවය<br>දෙකට විප්ලවය<br>ආදර වන්තියේ<br>නුඹට නැත අංකයක් |

| | |
|---|---|
| 184 | ජීවිතයේ අන්ත අසරණ අවස්ථාවලදී<br>මිනිස් අධ්‍යාත්මය උපරිම ශ්‍රේෂ්ට වේ |
| 185 | යම් මිනිසකු පීඩිත ජනතාව වෙනුවෙන් සේවය කරන්නේද<br>මගේ ලගම ඥාතියා ඔහුය |
| 186 | ලස්සන මල් මත සුවඳ රැදෙන්නෙත්<br>සුවඳ මල් මත ලස්සන රැදෙන්නෙත්<br>කලාතුරකිනි |
| 187 | ජාතිය ගොඩ නැගීම?<br>මහප්පා<br>අඩි ද බිම හප්පා<br>මැදල ඇන්ද<br>නැෂනල් එක<br>වලාපොට ගසා<br>“ජාතිය ගොඩනගම්” කියා<br>දුවයි ජපුර වටේ<br>“කඩිය වගේ<br>පුක කැඩිච්චි”<br>රැ දවල් - ඉති පුරුෑෂ ලිගු භේද<br>නොබලා - රිංගයි<br>බාත්රූම් වලටත්<br>නැගෙන හිරින් මේහට එවුව<br>පුංචි එවුන්ට<br>කුඩම්මාගෙ සැලකිල්ලලු<br>පුස්තකාලේ දෙන්නේ නෑ ලු<br>පිට්ටනියත් වාරණයිලු<br>කැරම් බෝඩ්<br>රැකට් , විකට්<br>පාවිච්චිය වාරණයිලු<br>තාමත් ඇකඩමි විතරයි ලු<br>අනේ අපොයි<br>මහප්පාගේ ජාතිය ගොඩනැගීම. |

# රුහුණ සරසවිය

| අංකය | ගීතය |
|---|---|
| 1 | මගේ සිත් අහස ලඟ<br>දුකේ දී සැපේ දී තනි රැක්ක<br>පුංචි ඉරබටු තරුව වේ නුඹ<br>සොයුරියේ........<br>අමතක කළ යුතු ද<br>පිපෙන සකුරා මියෙන බව ගිම්හානයේ |
| 2 | පිපාසයට දිය පොදක් ය<br>අඳුර නිවන පුන් සඳක් ය<br>පුරන් කුඹුර අස්වැද්දූ<br>ඔබ මගෙ ලොව දෙව් දුවක් ය<br>සුසුම් නිමා වී<br>සැනසුමට මග වී<br>සිටිනා වූ සැම දිනේ<br>ඔබය මගෙ ජීවිතේ<br>ඔබ සඳ ය<br>මා මුහුද- එනමුදු ඔබ පැහැය<br>වැටෙන තැන -බොහෝ සසලයි මා<br>බොහෝ සසලයි<br>මම නුඹට පෙම් කරමි<br>නුඹ නොදනියි එහි තරම<br>මල් පෙති විසිරුණු සරසවි මාවත<br>සිහින පැතුම් මල්<br>විකසිත කරවන<br>ඔබේ හදින්ම<br>ලද අපමණ සැනසුම<br>ගෙනෙමි දිවියට- සදා අමිල නුඹ<br>පන්හිඳ නුඹ කිම ද දඟේ<br>නොලිය තව ලියන්න<br>මේ පවුරු ලියන්න<br>ලීවත් නොලීවත් -ඒ පැදි පේලි අනේ<br>සිතිවිලි මගේ පැරෙනවා නිබඳ මා සිතේ |
| 3 | මහ මෙරක් ලෙසට<br>මා පැතු පැතුම් නුඹ ගැන<br>ගිරි කුලක් ලෙසට<br>බැඳි ඒ දෙමාපිය පැතුමන්<br>හිස් ලොවක් ලෙසේ<br>මා දැනෙන විටදි හැඟුමන්<br>නිල් දියඹ ලෙස<br>මට සරදම් නොකරන්<br>සිතන තරමට කඳුළු බිඳුවක්<br>මෝදු වන තරමට සිතේ<br>රිදව රිදවා කිමද සොයුරිය<br>ලැගුම් ගෙන මා හදවතේ |
| 4 | සඳ එළිය නුඹයි ජීවිතය<br>ජීවිතය ආලෝකමත් කළ<br>ඒ ආලෝකය දිගේ -දිගු ගමනක් යන්න<br>මා හිඳිම් මග බලාන- තවත් කල්පයක් වුවත්<br>මට ඉන්න හැකිය- නුඹ සඳ එලිය නම්<br>සඳ එලිය මගේ නම් |
| 5 | මේ කුරිරු ලෝකයේ- ඔබගෙ මෙන්<br>දයාබර හිතක් කොහේ සොයම් ද? |
| 6 | ආවත් උඩ පැන ඩිග්‍රිය අරගෙන යන්න<br>තාමත් බැරි වුණා මට ඩිග්‍රිය ගොඩ ගන්න<br>අවුරුදු දෙක තුනක් සිදුවිය මට ඇණ<br>ගන්න<br>ඩිග්‍රිය එපා මට මම යනවා යන්න |
| 7 | ලව් නම් අසාර ය<br>කෑම නම් සාර ය<br>බඩ කට්ට මාර ය<br>අහෝ චාටඩ් භයංකාරය |
| 8 | University ආව අපි කළ පිනට<br>Rag එකකුත් කැවා නියමෙට හොඳට<br>Digree ඇතත් කර පින්නා ගෙන යසට<br>Job එක නැතිව මොන ඉටි ගෙඩියද අපට |
| 9 | මදුරු පිරිස හැම තැනකම දැවටෙනවා<br>නෝට් පොදිය අත් තල මත වැජඹෙනවා<br>නිදිමත දැනේ නොදැනිම නෙතු පියවෙනවා<br>ඩිග්‍රිය ලැබෙන තුරු මේ දුක වළඳනවා |
| 10 | සරසවිවලට ක්‍රෑම වර්ග ගොඩක් ඇත<br>එනමුත් අනේ මෙන්ඩිස් ලා රුහුණෙ නැත<br>සැම කොකු වර්ගයට එලෙස්න්ම ලැම්බට් ද<br>ඇත<br>සරසවි වවන සැම තැනටම උචිත නැත |
| 11 | රැයක් විඳින්නට<br>වේලක් රසට කන්නට<br>මිතුරන් හා වෙසෙන්නට<br>දිනක් ඒවි ද හිනාවෙන්නට |
| 12 | පුරුවෙ කරුමෙකට විභාගෙ පාස් වෙලා<br>සරසවි ආවෙ නිවනත් මේකයි කියලා<br>පැනට පොතට ගත හිත උගසට තියලා<br>ඇති බව පෙනෙන කොට ජීවිතෙ සින්න වෙලා |
| 13 | කලා වැවේ නිල දියවර නුඹ අම්මා<br>එහෙම කියූ නුඹ වැරදිය අපෙ අම්මා<br>වරදක් වුණා නම් මා හට වෙන්න සමා<br>දියවර දකින නෙත් දෙක නුඹ අපෙ අම්මා |
| 14 | අපි ආවේ ඉගෙන ගන්න<br>අපිට වුණේ නොකා ඉන්න<br>ණය තියෙනව ඉහ පිරෙන්න<br>අපි යනවා ගෙදර යන්න |
| 15 | පාඩම් කර ඉවර නොමැත දෙවියනේ<br>කුමටද මා සරසවියට තේරුණේ<br>වැරදුනාම ඇණ ටොප් එක වදිනවා<br>ඊට පස්සෙ රෙස්පට් එක බහිනවා |
| 16 | පුරුවෙ කළ පවට සරසවි ආවාට<br>යන්නට වුණේ නැත ගම කලකින් බෝම<br>නිවාඩුවක් නැත ගම යන්නේ කෝම<br>නන් ඇකඩමිය වැඩ වරපන් හැමදාම |
| 17 | අට ලෝ දහම ජකබක ගා සෙලවෙනවා<br>කවදාහරි අපි කාටත් කෙළවෙනවා<br>ඒබ ව දැන දැනත් අපි කැම්පස් යනවා<br>එළියට ඇවිත් අට්ටාලේ බුදියනවා |
| 18 | මේ කොයි යන්නේ<br>කැම්පස් යන්නේ<br>කවදද එන්නේ<br>නැත අප දන්නේ |

| | |
|---|---|
| 19 | කැම්පස් එකේ බත් කෑවේ අපි එකට<br>ලයිබ්‍රරියේ නිදි කැරුවේ අපි එකට<br>අවුරුදු තුනක් කුප්පි දැම්මෙ අපි එකට<br>අපි යහළුවේ මෙහි ආවේ පෙර පවට |
| 20 | සුපිපුණ මලට එයි බමරුන් රොන් ගන්න<br>උන් දඟලන්නෙ රොන් අරගෙන පැන යන්න<br>මුකුලිත මලට බැහැ යළි විකසිත වෙන්න<br>මල දැනගත යුතුයි සුපිපුණ බව රැකගන්න |
| 21 | දින දින ගෙවෙනවා අපහට නොදැනී ම<br>පිස්සන් වගේ කොල්ලන්ගේ හැසිරීම<br>කරලත් බැරිය නොකරත් බැරිය ඉගෙනීම<br>කොහොම හරි කරමු එගොඩට පිහිනීම |
| 22 | කැම්පස් කැන්ටිමේ තොරතුරු සෝ බරය<br>හැමදාමත් කන්නෙ පරිප්පු හා පලා මය<br>කුසගිනි නිවෙන්නේ මලකඩ වතුරෙන් ය<br>මෙහෙමයි ගෙවෙන්නේ සරසවි ජීවිතය |
| 23 | පංති සමාජය පෙරළුණ දාකට<br>ඔබෙත් මගෙත් හදවත් සනසන්නට<br>ජීවිතයේ බර සැහැල්ලු වන තුරු<br>ඉවසිල්ලෙන් මේ ගමන යමු |
| 24 | ඉගෙන ගත්තෙ හිස කොස් මල් දරන්නයි<br>අපි පැතුවේ ලෝකෙට සෙත සදන්නයි<br>අහෝ මිතුර ඉගෙනුම ජය ලබන්නයි<br>අද සිදු වුණේ මහ මඟ දුක් විඳින්නයි |
| 25 | පාසැල් ගමන කරදර මැද නිම කරවා<br>දහසක් පැතුම් මැද මම සරසවි ආවා<br>හොඳ මිනිසෙකු වෙන්න සැම දා සිත කීවා<br>මා පැතූ පැතුම් මේ බිම තුළ ඉටු වූවා |
| 26 | කැටපත් පවුරෙ ගී ලීවා මට මතකයි<br>සරසවියේ මුලු හතරේ දුර බැලුවා මට මතකයි<br>පොත් මිටියේ බර බැලුවා මට මතකයි<br>ආදරයේ සුව වින්දා මට මතකයි |
| 27 | ක්‍රෑම දාන විට බොග සෙට් වෙන්න එපා<br>අතේ සතේ නැති විට බඩගිනි වෙන්න එපා<br>මෙදා පොටේ එග්සෑමට ඇණෙනු එපා<br>යළි මේ බිමට එන්නට සිදු වෙන්න එපා |
| 28 | එග්සෑම් ළඟ ළඟ ය සහනය නැත සිතට<br>වමරියෙ පාන් වත් නැත බඩගිනි වුණ කලට<br>ගපේට තුන්දෙනයි හරහට එක ඇඳට<br>මෙහෙම වෙලා මදි සරසවි ආවාට |
| 29 | වැහුවානම් කැම්පස් වැහුවා මය<br>ආවානම් කැම්පස් ආවා මය<br>කෙරුවා නම් අපතේ කෙරුවාමය<br>ගත්තා නම් එග්සැම් ඇණගත්තාමය |
| 30 | ් සඳ කැලුම් රැස් වෙලා<br>මල් පූදින පාන්දරට<br>මැණියනි පියාණනි<br>ඔබ අරුණැල්ලකි ගණඳුරු දිවියකට |
| 31 | ගොක් කොළ සැරසිලි<br>නෙක විසිතුරු පහන්<br>රතු පළස් මල් වඩම්<br>එප ා මා මළ දාට<br>රතු පාට මල් පිපුණු අරලියා ගසක් ළඟ<br>වළලන්න මගෙ මිනිය<br>මගෙ උන් වල දැමුණු |
| 32 | පද බැඳුනු එකින් එක<br>මැද මැවුණු විමන් සුර<br>සිතට ගෙනෙන සිහිල් සුවය<br>මුමුණන මුමුණන මොහොතට<br>දිවිය අලුත්වන<br>කවිය නුඹයි<br>නුඹේ මතකයයි |
| 33 | ජිවිතේ හුඟක් දේ කියා දුන්<br>නුඹ හැ රදා යන්න වෙලා<br>අපේ සිනහව අපේ කඳුල දිහා<br>නුඹ බලාගෙන හිටියා<br>ඒත් අපි අද වෙන් වෙලා<br>කවදාවත් මතකයෙන් හැර නොයාවි<br>නුඹ තුළ රැඳුණ කාලය<br>සිත් නැතත් හැර දා යන්න<br>සමු ගන්නම් මෙසේ |
| 34 | ජිවිතයේ පැතිකඩ<br>විවරණය කරන්නට<br>මඟ පෙහෙළි කළා වූ<br>නුඹ තුරුල<br>හැරදමා යමි<br>තවත් කල් හිඳින්නට<br>වරම් නැති හෙයින් |
| 35 | ජිවිතය<br>මගේ නොව<br>උරුමයට<br>සිනාසෙමු<br>හදවතින්<br>එකට හිඳ |
| 36 | සිව් වසරක සරසවි<br>දිවි මගේ<br>බොහෝ සන්ධිස්ථානයන්<br>පසු කොට<br>අද අප ඉන්නේ<br>කොතැනකද<br>හෙට දිනයේ සමුගන්නේ<br>කෙලෙසකද<br>අපේ අතීතය අමතක<br>කර දමා<br>සරසවි මවුනි<br>අප ඔබගේ දූ දරුවන්<br>ගොන්නෙන් තවත් එක්<br>කොටසකි<br>සමු ගන්නම් හෙට දිනයේ<br>ඔබ උණුසුම තුරුලු කරන් ˜ |
| 37 | <br>කැකෑරුණ බොර දියට<br>සුපිපි කුසුමක් ලෙසට<br>මේ විෂම ලෝකයට<br>හිමිය නුඹ යම් දිනක<br>පිපෙයි නම් ඒ ලොවේ<br>පිරුණු මිනිසෙකු ලෙසට<br>නුඹයි ඒ සුදු නෙලුම<br>බොර දියම අලුත් කළ |
| 38 | තග දමූ තෙල බෙදූ<br>ඔල් පාර ගොලු වෙලා<br>බෙන්චිවල ටේබල්වල<br>හිර වෙලා වාඩි වුණ<br>යුගය දැන් නිම වෙලා<br>නාඳුනන උන් ලෙසින්<br>අලුත් යුගයක් එළඹිලා |

| | |
|---|---|
| 39 | බඩගින්න කුසගින්න<br>ඇවිලෙයි ඉතින්<br>විඳවන්නෙ රිදවන්නෙ<br>ඇයි මේ ලෙසින්<br>කොයි කවුරු දුන්නා ද<br>මේ ගිනි ඉතින්<br>ඉවසන්න පුලුවන්ද බඩගිනි අපේ<br>බඩ දන්නෙ බඩගින්න වැඩි හන්ද නේ<br>පිටි බිව්වෙ ඒ ගින්න දුරලන්නනේ˜ |
| 40 | සිව් වසරක් ගෙවූ දිවිය අමතක කරලා<br>යන්නට වෙන බව දැනුනම මෙය අතහැරලා<br>වැටුණු කඳුලු ලේන්සුවෙන් නෙත පිස දාලා<br>සිනාසෙමු ද සොයුරිය අපි අත්පොඩි ගසලා |
| 41 | නිදිමත දැනේ දැන්නම් මට පෙරට වඩා<br>කුසගිනි දැනේ තුන් වේලම ඊට වඩා<br>බයකුත් දැනේ ඇණ වේ යැයි ක්‍රෑම නොදා<br>නිදිමත ඇවිත් බොඳ නොකරනු සිහින මෙදා |
| 42 | පිපුනු මල් කිසිත් නැති<br>සුවඳ මුසු බියක් ඇති<br>කඳුලින්ම පෙඟී ගිය<br>මල් පිර නුඹම විය |
| 43 | අල්ලට සිඟාවත් රස නැති කැවිලි කකා<br>ලෙක්චර් හෝල්වල ලැග්ගා මකුණෝ කකා<br>සිව් අවුරුද්ද ගෙවනට මරු පහර නොකා<br>පිං දී ගන්නවා මහපොල සිඟා කකා |
| 44 | කිරි නැති තේ එකයි බොන්නේ මිල දෙකකි<br>ලුණු නැති ව්‍යංජන කන්නේ සැර නොමැති<br>බත් බව පෙනෙන්නට මෙන් බත් පිඩක් ඇති<br>පෝෂණ ඌණ උගතුන්ගෙන් පලක් නැති |
| 45 | සිව් වසරක් ගෙවී ගියා<br>අප සැම අත විසිර ගියා<br>යළි ඔබ මුණ ගැසෙන තුරා<br>පතමි සතුට දිවිය පුරා |
| 46 | පොත් මිටිය මනරම්<br>විභාගය ළඟ නැත්නං<br>ඇස්දෙකත් රතුවෙලා දැං<br>මැදියමත් පහුවෙලා බං |
| 47 | නුඹ සහ මම<br>කෙනෙක් ලිවත්<br>ලියා අවසන්<br>කරන්නට අපොහොසත්<br>වචන දෙකකි<br>නුඹ සහ මම |
| 48 | ඔබ වැවකි<br>දිය පිරුණ<br>මම වෙලකි<br>පුරන් වුණ |
| 49 | දුරකථනය හා මම<br>අවසානයේ<br>ඉතිරි වූයේ<br>බිල පමණි |
| 50 | නැව ගොඩ බානවා ආවෙමි බඩු ගන්න<br>තෙල් ලීටර් ගණන් පෙව්වෙමි පොර වෙන්න<br>පස්සෙන් ගියෙමි කටු කෑවෙමි මද ගහගන්න<br>පෙම් කළ පවට පුදනෙමි ඩිග්‍රිය ගන්න |
| 51 | එක වමරියක වළඳන්නට එකම බත<br>ගස්යට නිදියමින් කියවමින් එකම පොත<br>දහසක් කඳුලු මැද කිසි දා නොතබා සිත<br>යළි මුණ ගැසෙමු මේ සරසවි දෙරණ මත |
| 52 | දහඩිය සුවඳ වැගිරෙන රතු දිනට මලේ<br>අපෙ උන් නැළවෙනව වැද ලොකු උන්ගෙ<br>දැලේ<br>පෙරමග ගන්න බැහැ මට සරසවියෙ මලේ<br>මතු දා දිනේවා කම්කරු සමගි බලේ |
| 53 | නිදිමරලා ක්‍රෑම දාල තට්ටෙ ටිකක් පැදිලාය<br>දවස තිස්සෙ වාඩිවෙලා ඇට කුට්ටම පොඩි<br>වෙලා ය<br>ක්‍රෑම දාල මුලු දවසෙම ඇස් දෙක ලොව්ගෙඩි<br>වෙලාය<br>කවදා හරි තෝ මැරෙන්නෙ පොතක් අස්සෙ<br>හිර වෙලාය |
| 54 | ෙගෙවන ජිවිතය දෙස<br>යළි වරක් බැලුවෙමි<br>කිසිම මාවතක් නැත<br>නොදැන ආවයි සිතේ |
| 55 | නිහඬව හමන<br>මද නලකට පුලුවනි ද<br>මට නුඹ සුවඳ ගෙන දෙන්නට<br>ඉදින් නුඹ මට<br>සුවඳක්ම නම් |
| 56 | ශිල්ප හොඳින් ලැබු මට මහ උගතෙක් වීමට<br>වසරකට පෙර<br>පැමිණියෙමි රුහුණු සරසවියට<br>උපාධිය නැමැති<br>කටු ඔටුන්නෙන් අබිසෙස් ලැබූ මට<br>සිව් වසරක්<br>දුෂ්කර ක්‍රියා කළ යුතුය අප<br>කුසට දළ අහර<br>කටු යහනේ සැතපෙන්නටවත්<br>නොමැත වරම්<br>රෑ තුන් යාමයේ නිදි වරා<br>වනපොත් කළ යුතුය විෂයයන්<br>සියල්ල ඉවත දා<br>දිව යන්න සිතේ<br>ඔවුනි මබ සොයා<br>නිදහසේ බත් පිඩක් කා<br>ඔබ තුරුලේ සැතපෙන්න |
| 57 | නිබන්ධන අත දරා<br>ඔක්කොටම ක්‍රෑම දෙද්දි<br>නිදි කුමාරි හොරෙන් විත්<br>මා වෙතට ඉඟි කරයි<br>නිදි ලොවට රැගෙන යන්නට<br>නිදිලොවේ දැහැන් බිඳ<br>මදුරුවන් මොර දෙද්දි<br>නැවතත්<br>අතට එයි නිබන්ධන<br>ඇස් දෙකට වද දෙන්න |
| 58 | යුනිට් ක්‍රමය<br>ඔහොම ටිකකට නවතින්න<br>අපිටත් ආසයි<br>කුප්පි එසයින්මන්ට්<br>කටු කම්බිවලින්<br>වට වෙච්ච ලයිබ්‍රියෙන්<br>එහා ලෝකය දකින්න |
| 59 | දකුණතින්<br>දකුණැස වසා<br>හ' නගවි<br>දකුණැස නොපෙනෙන<br>වග කියාම |

| | |
|---|---|
| 60 | ඩිග්රිය ගන්න කන කටු බලපන්කො බොලේ<br>කෙසඟ සිරුර පමණක් අන්තිමට මලේ<br>ක්‍රෑම දමන විට කවියක් ලියම් වලේ<br>කැම්පස් අයට වෙන ඉන්ටවි මොකද බොලේ |
| 61 | වසරක් ගෙවී නව වසරක් එළඹෙනවා<br>අපිටත් නොදැනි අපි තව වයසට යනවා<br>සරසවි බිමේ අපි තවමත් ලතැවෙනවා<br>අනාගත පැතුම් එකිනෙක බොඳ වෙනවා |
| 62 | නිර්මල ආදරයෙ පිවිතුරු රසය රැඳි<br>සරසවි පෙම්වතුන් මා ගරු කරන නිති<br>සලෙළුන් වෙසඟනන් වී දිව රෑ රැහැන නිති<br>දිව රෑ සිහිනයෙන් බිතු සිතුවම් අඳියි නිති |
| 63 | මසකට දෙතුන් වරක්වත් නංගිව දකින යකා<br>දැන් මක් වෙලාදැයි කම්පා කරන එකා<br>ඌ දමනය කරගන්නෙ අත වමනය කරන නිසා<br>අනේ මොනවා කරන්නද සෙමෙස්ත්‍රි කරන විනා |
| 64 | ධනපති පන්තියෙන් පැන තැන අරගත්තු<br>කලා පීඨ අධිපති ඕ අතපත්තු<br>තම නිල බලය ගිනි අවියක් කර ගත්තු<br>නොමරා මරණවා සරසවි දූ පුත්තු |
| 65 | සුරා කමින් සුළු පිරිසක් විඳිති සැපා<br>වැඩි පිරිසකට එනමුත් එය දුකකි අපා<br>ඉල්ලම් ඔබෙන් ඉල්ලීමක් වැළඳ දෙපා<br>විරයෝ මිසක නිකමුන් බිහි කරනු එපා |
| 66 | පානුයි පරිප්පුයි දවසක බුදු වේවා<br>ගෝවයි අලයි සැරියුත් මුගලන් වේවා<br>කැන්ටිමෙ හොද්ද නේරංජන ගඟ වේවා<br>කැන්ටින් මුදලාලි කන්ථක අසු වේවා |
| 67 | සිහිනෙන් පවා මගෙ සුබ විහරණය පැතු<br>රජකම පතා මම රජගෙට යතැයි සිතු<br>අම්මා දනි නම් මේ සරසවියෙ තතු<br>අදම අරන් යයි මේ දුක් විඳින පුතු |
| 68 | දුම්බර කන්ද බැසගෙන ආ ටිකිරි නගා<br>අන්දර කැලේ වැට ගාවදී දුටුව නගා<br>ගන්දර පාරෙ මකුළු පපා ආපු නගා<br>අපිට නොදී සීනියර්ට දීපු නගා |
| 69 | නොහ'න් සරසවියෙ හෙළමින් කඳුළු කැට<br>වැඩ නැති මොලේ ඇති උන්ගෙන් ඔවුන් හට<br>විරැකියාව අවසන් කොට දමයි හෙට<br>රැකියාවක් පතා මම යම් සිපිරි ගෙට |
| 70 | කළු ලෝගුවක් ගත දවටා ගෙන<br>උපාධිය නැමැති කිරුළු පළඳින දින<br>හින දම් පිරූ මුත් සොයුරනි නුඹට<br>තහනම් බිමක් වුයේ ඇයි සරසවිය |
| 71 | බිඳෙන රළ පෙළ මුසුව යා නම්<br>නැගෙන හද ගැබ තුරුණු වේ නම්<br>සොබා දහදත් රැසිරු වේ නම්<br>නගව් පියවර යන තැනකට |

| | |
|---|---|
| 72 | සරසවි මැණියනි<br>මගේ දයාබර<br>නුඹ අපට එක් කළා<br>මීට සිව් වසරකට පෙර<br>ඉතින් නැත් ද සරසවි මවුනි<br>අපව මෙලෙස<br>වෙන් කරන්නට<br>දුකින් නමුත්<br>හැර යන්නම්<br>භාර දී නුඹට<br>පුංචි නංගිලා මල්ලිලාට<br>යන මොහොතේ දී<br>තවත් එක් වරක්<br>හැරී බලන්නම්<br>දයාබරත්වයෙන්<br>නුඹ දෙස |
| 73 | සරසවි බිම මා කොතැනක වුවද<br>ඒ හැම තැන ඔබෙ මතක නොඒවි ද<br>සෙවනැලි එකිනෙක පැටලි පැටලි<br>යන්නට ආයෙත් දවසක් ඒවි ද |
| 74 | සිහින සැබෑ නොවුනා වේ<br>සිහින ලෙසම තිබුණා වේ<br>සිහින ලෙසම සිහින තිබී<br>සිහින වුනාවේ |
| 75 | හෙට හැදෙන උන්ගෙ අනාගත<br>පැතුම සුන්දර විය යුතුයි<br>කොන්ද පණ නැති මිනිසුන් ලෙස<br>එනමින් එක් විය යුතුයි |
| 76 | සකිය<br>අපි<br>යෞවනයෙ<br>කටුරොද<br>සෙනෙහසෙ අල්තාරය<br>මත හොවා<br>සුමට යයි<br>සිතමු |
| 77 | සරසවි මවුනි දයාබර<br>ඔබේ දරු දැරියන්<br>දස අතම විසිරිලා<br>නැණ ගුණය පිරිහිලා<br>විනාශය අත දරා<br>එනිසාම<br>මාතාවනි<br>සියලු දරු දැරියන්ට<br>යහ මගම පෙන්වන්න |
| 78 | සුන්දර වු සරසවි දිවිය<br>කටුක වු මතක සටහන්<br>සියල්ල හදවතේ රඳවාගෙන<br>ඉතින් අපි යන්නෙමු |
| 79 | රට එක් ඇසක් ලෙසින්<br>ඇය අනෙක් ඇසක් විලසින්<br>දැනට දැක නොනැසින්<br>නින්ද මේ ගැන රකිමු වෙසෙසින් |
| 80 | වලට ඇවිත් විලසින් ගොඩ දාන ඇණ<br>හරුප ලියයි බිත්තියෙ ඉඩ රැඳුන තැන<br>මෙහෙමත් රටක් මිනිසුන් ඉන්නා අමන<br>ශිෂ්‍ය නොවේ ශිෂ්ණයි මේ වැඩ කරන |
| 81 | ඇණ පිට ඇණ මා වෙත පැමිණෙන කලට<br>පිහිට උණා ගොඩ එන්නට ලෙස රළට<br>ආවත් බමරු එන්නාසේ පැණි මලට<br>ඉතින් ආයුබෝවන් සමු දෙම් වලට |

| | |
|---|---|
| 82 | බ්‍රහ්මචාරි වන්නයි ආවත් සරසවිය බලා<br>තනිකඩ මගේ සිත කකියයි ඔකඳ වෙලා<br>කවදා ලබන්නද පෙම් බස් දොඩනු සොබා<br>පිහිටක් වෙතොත් නුඹ විතරයි නංගි බබා |
| 83 | ආව නිසාම අපි ඩිග්‍රිය අරගන්න<br>මාසෙන් මාසෙට අපි විභාග ලිව්වා<br>දැනුමෙන් අපට කිසිවිට නැත වැඩ මෙච්චා<br>මොනවා කැන්නට වේවිද අනෙ මන්දා? |
| 84 | ක්‍රෑමක් දමන්නට ආ කළ වලට<br>බිත්තිය පුරා කවි පදවැල් බොහොම<br>පෙරදා සුරලොව ලෙස පෙනු සරසවිය අද<br>මිහිපිට අපායක් යැයි දැන් සිතෙයි මට |
| 85 | මාගේ මේ ව්‍යායාමය එය ලබා ගැනීමට නොව<br>ඇණ නොවී ගොඩ යාමටය |
| 86 | නොයවා මතක තවතව මළ ගිය දේට<br>ගෙනයනු මිසක බර පටවන්නද කාට<br>අයිතිය රකිනු මිස යළි නොනැමෙයි ඊට<br>කෙනෙකුගෙ කඳුලු මොනටද මා මළ දාට |
| 87 | රෙද්ද බැනියම ඇන්ද සිංහල කොල්ලො- අද<br>කොයි ගියා දෝ<br>ඩෙනිම ටී ෂර්ට් එකට බැස්සම සිංහලකම- මිය<br>යාදෝ<br>අමනකම් සිත් පුරෝ ගෙන ලැබු ශිල්ප -<br>දැයකට වටිදෝ<br>සුදනකම් යහපත් මිනිස්කම් සරසවිය හැර<br>ගියා දෝ |
| 88 | උතුරා යද්දි හදවත් ඉසිකෝ මානෙන්<br>වෙහෙසෙති මිනිස්කම පෙන්නන්නට මුහුණෙන්<br>මුහුනේ දුකකි රැය දුටු දේකට සිහිනෙන්<br>කුමටද එළිය මට තව කෙනෙකුගෙ පහනින් |
| 89 | කළල මොහොතින්ම නුඹ ගබ්සා කරල<br>මා උපදින්නෙ තිඹිරිගෙයි නොවූ නිසාවෙනි<br>කෑ ගැසුවෙමු කොටුවෙ ලිප්ටන් රවුමෙ<br>ගින්දර තැබුවෙමු පඹයන් හට නෝර්වේ<br>ඔස්ලො නොවේ දැන් පිනිවා යන රාවේ |
| 90 | ඉර හඳ කියයි නරකයි දා හත කියලා<br>මට නම් සැකයි මොනවා වේවිද මන්දාම |
| 91 | ඇණ වුනු විභාගය යලි ගොඩ දාගන්නේ<br>හිනැහුණු මුහුණු ගැන හිත හිත දුක් වෙන්නේ<br>මල් උගුරක් උරා සමහරු සැනසෙන්නේ<br>අපි මේ වලට තව සති හතරයි එන්නේ |
| 92 | **උපාධි සහතිකය**<br><br>නිදි වරාගෙන<br>දෑස රිදෙනකම්<br>කුසගින්න දා<br>කඳුලින්ම ගත්<br>උපාධි සහතිකය<br>නුඹ අද<br>බලවතුන් ඉදිරියේ<br>දණින් වැටී<br>විරැකියා පෝලිමේ<br>පිටුපසම සිටින<br>උපාධිකාරයාගේ<br>සහතික ගොන්නෙ<br>නොවටිනාම සහතිකයයිම |

| | |
|---|---|
| 93 | ඔබ හට කොපමණ බාධා ආවත්<br>නොසැලි යනු<br>ඉදිරියම කරා<br>මේ ලොව කටුකයි<br>විවිධයි<br>විෂමයි<br>ඒබ ව දැන වැඩ කරනු සිතා<br>ඔබ ලොව ජය ගනු<br>නිසැකව සැම දින<br>දෙනෝ දහක් මැද නුවණ අරා<br>සතුටින් ඉනුමැන<br>ජීවිත ගමනේ<br>බාධක සැම දුක් ඉවත දමා |
| 94 | විභාගය  අත ළඟ<br>ශිෂ්‍යත්වය  V.Cග ළඟ<br>පොලිසිය දොර ළඟ<br>ඩිග්‍රිය ගෙනෙන තුරු<br>මව්පියො ඉඳිකඩ ළඟ |
| 95 | සරසවි මවුනි නුඹ දරුවන් කුමක් වැනි<br>සුළඟට හසුව විසිරෙ මල් පොකුරු වැනි<br>මතකයෙ මැවෙන පෙර රූ ඡායාව වැනි<br>හමු වේ දෝ යළි සිත සනහා |
| 96 | දෙපා වාරු නැ<br>ඔබ හැර යන්නට<br>මා හැදු සරසවි<br>මවුනි දයාබර<br>මා වැඩු සරසවි<br>මවුනි දයාබර |
| 97 | බුමුතුරුණු විසිර ගිය<br>උඩු වියන් ඇඳි ගිය<br>මල් ඉහිරි මාවතක්<br>නොවේමැයි සරසවිය<br>නෙක් සිතුම් පැහැරගත්<br>ක්ෂිතිජ ඉම ඉක්ම ගිය<br>සිහිනයකි මිරිඟුවකි<br>කටු සහිත මාවතකි<br>මා දුටුව සරසවියම |
| 98 | ඉපිද තනියම මේ දියත<br>ඇවිද විරසකකම් මැද<br>රුදුරු මේ මහ ලෝ තුළ<br>නුඹට නුඹ මිස අන් කොඳ |
| 99 | ඔසවන පය පෙරට තබමු<br>පා විලංගු බිඳලන තුරු<br>පතුරන හ' එක්ව නගමු<br>මුකවාඩම් ගැලවෙන තුරු<br>එකින් එකට ඇඟිලි ගනිමු<br>බැඳුන යදම් ගිලිහෙන තුරු<br>සැම දා අපි එකට හිඳිමු |
| 100 | නිවහල් හිරු පායන තුරුම<br>අරුණ උදාවෙයි<br>පා තැබෙයි සරසවිය<br>yq~ ඇසෙයි සීනියර්<br>හද ගැහෙයි බය හිතෙයි<br>නෙතු කඳුළු පිට පැනෙයි<br>උදා වෙයි සැඳෑ හිරු<br>සිහි නැගෙයි උදය වරු<br>සිනහ යයි ඇති තරම්<br>නෙතු කඳුලු නැගෙන තුරුම |

| | |
|---|---|
| 101 | බොහෝ දුක්ගැහැට විඳ<br>ගියා පුතු සරසවිය වෙත<br>තවත් බොහෝ දේ ඉගෙනුමට<br>එහෙත්<br>මේ කිමද පුත?<br>ඇඟ පතද වැහැරිලා<br>ඇස් දෙකද යට ගිහින්<br>බැරිය මට හැඳිනීමට<br>ගෙදර ආ මා පුතු<br>අනේ මගෙ පුතුනේ<br>එපා ඒ ඉගෙනීම<br>එන්න ආපසු ගෙදරම |
| 102 | ඉවසන දනා රුපු යුදයට ජය කොඩිය<br>ඒ කිවි එකාගේ කට කැවත් මදි ය<br>ඉක්මන් වුනු එකා ළඟ බඩු හත අටය<br>බඩුවක් නොමැති මා තවමත් තනිකඩ ය |
| 103 | වලාවක් වෙලා නුඹ සිටිනා කල ට<br>කඳු මුදුනක් වෙලා මා සිටියා උසට<br>දවසක් සොයා ඇවිසින් නුඹ මා වෙතට<br>තුරුළු වෙනු ඇතැයි සිතුනා උණුසුමට |
| 104 | අධ්‍යාපනය විකුණන බලවතුන් හට<br>එරෙහිව එක්ව නැගී සටිබල බිඳින්නට<br>කල මේ ව්‍යසනය නම් අනුමත කරන්නට<br>බැහැ අප හැමොම සොයුරු ඔබ ළඟයි අද |
| 105 | බඩගිනි වෙලා මා ගිය කල කැන්ටිමට<br>10 නෝට්ටුව දී ඉල්ලාගත් බත් එකට<br>අඩු එළවලු සමග වැඩි පොල්කුඩු එකට<br>දිස්නය දිදී හිටියයි මැස්සන් කන ඇට එකට |
| 106 | එකයි දෙකයි රෑ වෙනතුරු අපි ක්‍රමේ යෙදුණා<br>විභාගය අත ළඟයි පොත් ටික ළඟ තුරුලු වුනා<br>කොක්කේ තුරුලු ටික දවසට ඇත්වුණා<br>ජොලියක් නැති ජීවිතය මට එපා වුණා |
| 107 | නිමා විය වසන්තය සරසවිය සැරිසරා<br>දැන් ඉතින් යා යුතුයි ගම රටට පය ගසා<br>කාටවත් නොපෙනෙන්න සිතින් ඉකි ගසගසා<br>නුඹේන් සමු ගනිමි මම සමු නොගෙන බැරි නිසා |
| 108 | හෙට ගැන සිතන විට බෑ කැම්පස් යන්න<br>ප්‍රතිඵල දකින විට බෑ කොහොමත් ඉන්න<br>ඇන වෙන බව දන්න හින්දා බෑ ඉවසන්න<br>ළඟදිම ඉතින් හිනෙව ගෙදරම යන්න |
| 109 | සිහිනෙන් පවා මගෙ සුබ විහරණය පැතූ<br>අම්මා දනී නම් මේ සරසවියෙ තතු<br>සිහිනෙන් ඇවිත් සිත කියවන මෙවැනි තතු<br>අම්මා දනී නම් ගන්නේ අතට කොසු |
| 110 | දෙනෝදහක් ගැවසෙන සරසවියේ<br>තනිකම පාලුව දැනුණා නම්<br>කුටියේ කවුළුව විවර කරනු මැන<br>පවනක් වී ඔබ ළඟ ඉන්නව නම් |
| 111 | අසරණ මා වැනුවන් ලද විගස සරසවිය<br>ඇයි පෙරලෙන්නේ නුඹ නවක වද සවිය<br>ජිවිතය ජය ගන්න එන්නට වුණේ සරසවියට<br>අසරණ මා පෙලුවේ නවක වදය |
| 112 | ආදරය කලාවකි<br>කෙරුවොත් මුලාවකි<br>කාලය කා දමන<br>මල හත්වලාමකි |

| | |
|---|---|
| 113 | ආලය මුලිවකි<br>නිලය කලාවකි<br>කාලය කාදමන<br>මල හත්වලාමකි |
| 114 | රැග් සීසන් චිත්ත රෙදි<br>බාටා දෙක තනි වුණා<br>හේදුනාට අයියලාට<br>මල්ලියෙකුට ගොඩ ගියා |
| 115 | කැන්ටිමේ බත් පතේ<br>ලුණු ඇඹුල් දෙකම නෑ<br>බත් කන්න හදන විට<br>ටැප් එකේ වතුර නෑ<br>විභාගය මතක් වී නිදන්නට හිතක් නෑ<br>උපාධිය ගත් දිනක<br>කොයි යම් ද දන්නෙ නෑ<br>ජිවිතය ජය ගන්න කියා<br>සරසවියටයි පිවිසුනේ<br>ඒත් මට ආ ලෙසට<br>ජිවිතය ජය ගන්න<br>ලැබේදැයි<br>මහා ප්‍රශ්නයකයි<br>පැටලුනේ |
| 116 | සබඳ අපි බොග නොවෙමු<br>සැම දේ අල කරන<br>ප්‍රගතිශීලීන් වෙමු<br>සදහටම සෙත සදන |
| 117 | කඩයිම් බිඳ දමා සරසවියට පැමිණ<br>පැතුවේ යස ඉසුරු නොව<br>හෙට දිනේ දිනන්නටය නොබියව<br>එවන් දිගු මග මා ලහින් හිඳ<br>සියත් මිතු දම් යදම් බැඳි ඔබ<br>හැර දමා කෙලෙස යන්නද<br>සතපවාලනු නොහැක මා සිත |
| 118 | ඔබ ගල් කුලක්<br>මා දිය බිඳක්<br>ඔබ ගල් කුලක් නොවී<br>වැලි කැටයක් වුනා නම්<br>තිබුණා මට ඔබ ළඟ<br>රැඳෙන්න<br>දුක ළඟ සිටි මා<br>අසරණ කර දා<br>සිනා සිසී නුඹ<br>සිටින අපුරුව |
| 119 | පාලමක් තනන්නද<br>පවුරක් බඳින්නද<br>ඔබත් මාත් අතර ඇති<br>පරතරය |
| 120 | සීනියර් කොල්ලන්ගෙ<br>චණ්ඩිකම්<br>කෙරුම්කම්<br>වීරකම්<br>ජුනියර් කෙල්ලන්ට<br>පවතින තුරු රැග් තෙමස<br>පසු අවධිය<br>බලු කුක්කන්<br>උන් ඉදිරියේ<br>නැට්ට හකුලුවා ගත්<br>අනේ රැග් එක<br>හරි හිනා |

| | |
|---|---|
| 121 | මෙහෙ වර ප්‍රෙෂි මෙහෙ වර ප්‍රෙසා<br>කැවද තෝ අසන විට<br>බත් නොව සිතුනි කන්නට තොගෙ<br>බොටුව මට<br>පල කැන්ටිමට දුවපිය දැන්<br>කාපන් කායන විට<br>අම්මප දෙන්න හිතුනා තොගෙ කටට මට<br>සෝෂල් බකට් දී සතියක් ගෙවුණ විට<br>නුඹ නෑ ඇහුවෙ කැවද බං බොලං අද<br>දැනුණා රහේ නුඹෙ ලෙංගතු රහේ මට<br>හිතුණා තිබුණ නම් කියලා රැග් තවත් අද |
| 122 | බිඳුණු තල් ගස පාමුලට වී<br>කඳුළු ඇහිඳින රාජිනී<br>කැලි සුන් වී විසිර ගිය දා<br>තනි තමයි නුඹෙ සාමිනී |
| 123 | කැඩුණු ගේ දොර නැගුණු විජිතය<br>අතැර දා ආ රාජිනී<br>ඉතින් කෙලෙසක සිනා සෙන්නද<br>ගැටෙන අවි හ' ලඟට වී |
| 124 | රිදුනු පපුවට හෙමින් කන් දී<br>අසම් නුඹ සිත ලඟට වී<br>ලඟට නොපෙනෙන සිහිනයක් ලඟ<br>නිහ'වම නුඹ<br>ඉකි බිඳී |
| 125 | ඇසෙන මළබෙර මැදින් ඇවිලෙන<br>එගිනි කවදා නිවේ දෝ<br>බිඳුණු තල් ගස යළිදු දලු ලන<br>සුවඳ කවදා දැනේ දෝ |
| 126 | සිය ජාතියේ ඉතිහාසය නැත දන්නේ<br>අභිමානයක් කෙලෙසද සිත මතු වන්නේ<br>ප්‍රගතිය පිණිස හෙට උපදින දරුවන්නේ<br>ඉතිහාසයෙනි පාඩම් ගත යුතු වන්නේ<br>රුපියල් ඩොලර් පසුපස නිති හඹා යන<br>ලෝකය තුළින් නොමිනිස්කම වගා විණ<br>සාහිත ඉතිහාස යන මේ රසායන<br>එන්නත් කළොත් එය සුරකියි නැසී යන |

| | |
|---|---|
| 127 | මං කැමතිම ඔයාගෙ ඔය ඇස් දෙකට<br>නිල්වන් පාටත් නෑ රතුම රතුත් නෑ<br>ලාවට බොර පාටට<br>ඒත් හිතන්න<br>උදේ ඉඳන් හවස් වෙනකන් බලං ඉන්නෙ<br>කොහොමද?<br>මං කැමතිම<br>ඔයාගෙ ඔය වචනවලට<br>හරිම අසාධාරණයි<br>ඒ මට ආදරේ නිසයි<br>ඒත් මතක තියා ගන්න<br>අසාධාරණය විනාසයට මුලයි<br>මං කැමතිම ඔයාගෙ ඔය රළු බවට<br>මගෙ සෙවනැල්ලට ආරක්ෂාව දෙන<br>ඒත් බලාගෙන<br>ආදරය රැකෙන්නේ<br>රළු බවට යටින් මෘදුබවක් තිබුණොත් පමණයි<br>මං කැමතිම<br>ඔයාගෙ ඔය උණුසුමට<br>ශක්තිමත් දෑත් තරෙ මාව හිරවෙද්දි<br>ඒත් පරිස්සමින්<br>උණුසුම වටින්නෙ සීතල තියෙනකං විතරයි<br>මං කැමතිම<br>ඔයාගෙ ඔය ආදරයට<br>මලක් මෙන් සුරකින<br>ඒත් වටහා ගන්න<br>ලෝකය පවතින්නෙ වෙනස්වීම මත පමණයි<br>කිසිදින වහන්නේ නෑ යයි සරසවිය<br>කුලපති තුමනි නුඹ කී හැටි මනහරය<br>එනමුදු ඇවිත් ගත වූයේ තුන් මසය<br>වැසුවේ කිම ද නුඹ කී දේ ස්ථිර ය |
| 128 | අනේ හොඳ තත්පරය<br>තව ටිකක් ලොකු වෙන්න<br>කල් වෙලා තව ඕනෙ<br>exam ගොඩ යන්න<br>මට නොවේ<br>මවුපියන් සනසන්න |
| 129 | සෝෂල් දුන්නෙ පොඩිවුන් හට<br>හිතේ රැඳුන සන්තෝසෙන්<br>ගොයින් ඩවුන් ඉල්ලගත්තෙ<br>කෙඳිරි ගාල අමාරුවෙන්<br>වෙනසක් පෙනේ ගත වූ ඒ<br>සිවු වසරක අතීතයෙන්<br>දුකයි දනේ සංස්කෘතිය<br>වෙනස් වෙලා සරසවියෙන් |
| 130 | තනිවම උපන්නෙමි<br>තනිවම මියෙන නිසා<br>දුක සැප හැඳින්නෙමි<br>මදහස පසෙක තබා<br>ඉඳහිට සිතුන මුත්<br>ලොව මා සමග කියා<br>මට මා මිසක වෙන කිසිවෙක්<br>නැතිය මෙදා |

| | |
|---|---|
| 131 | Notes ටිකයි<br>photo ටිකයි<br>උපාධියයි<br>විතරක් ගෙන<br>හෙට යන අපි<br>Notes ටිකෙන් වැඩක් නොමැත<br>එහි කිසිවක් හිතේ නොමැත<br>උපාධියත් ඒ වගෙමයි<br>කවුද ඕක ගණන් ගන්නෙ<br>ඉතිරි වෙන්නෙ Photo ටිකයි<br>කරුණාකර පාලකයිනි<br>දෙන්න අපට රැකියාවක්<br>සිවු වසරක Photo ටිකට |
| 132 | අනේ කෙල්ලනේ පොඩ්ඩක් හිතාපං<br>කෑ නොලසා ඉන්නට හිත හදා ගං<br>බැරිම වැඩේ ඒකයි නොම සිතාපං<br>පාඩම් කරන අයහ ට ඉඩ තබාපං |
| 133 | අපි ආවේ ඉගෙන ගන්න<br>අපිට වුණේ කෑ ගහන්න<br>විභාගෙ ඇණ නොම කරන්න<br>අද සිටවත් සිතට ගන්න |
| 134 | මැත ඇනලයිස් ටික අල්ලා ගනිල්ලා<br>සිංහල සෝසො සයිකොත් A ගනිල්ලා<br>English level one ගොඩ දාගනිල්ලා<br>කොකු ඇණ වුණත් විභාගෙ ගොඩ වෙයල්ලා |
| 135 | මාරාන්තික ක්‍රෑම දාල හුළං කන්දෙ ආවේ අපි<br>මල් පාරේ තගේ අහල මොලේ කවල් වෙච්ච අපි<br>1st year Lecture නොයා කැට කරන්න ගියපු අපි<br>Crama නොදා පිස්සු නටල exam ඇණ වේවි අපි |
| 136 | මිට මොලවා ගෙන රඳවා සිටියත්<br>අත නොරැඳෙන දේ නොරැඳේවී<br>රැඳෙන වරම් නැති රඳවා ගනු බැරි<br>සියල්ල දවසක නිම වේවී |
| 137 | අණබෙර ගසාගෙන<br>රටටම කියාගෙන<br>ඉතිං සැරසුනෙමි<br>diet කරන්නට මං<br>හරි යන්නේ නැතිය<br>බලන්නට බැරිය<br>මගෙ පංගුවත් ගෙන<br>මුං කන තරම<br>අදින් නවතිමි<br>diet නොකරමි<br>බඩට නොදැනෙන්න<br>diet කරන හැටි<br>සොයා ගන්න තෙක්<br>ඉතින් අත් හරිමි<br>තවත් තර වෙමි |
| 138 | "ජීවිතයට කිසිම දෙයක්<br>අයදින් නෑ<br>මින් මතුවට<br>සමන් දෙව්ඳු කමා වෙලා<br>විසිරුණු මගෙ සිත පමණක්<br>එක්තැන් කර දෙනු මැන මට" |
| 139 | ජීවිතයේ හැමදාමත්<br>සිහි වූයේ ඔබට මෙමා<br>සිත විසිරුනු විට පමණයි<br>කෙසේ වෙතත් ඔබ හට මං<br>කමා කළා හැමදාමත්<br>ඒ වුනාට ඔබ නැවතත්<br>කරන්නෙ ඒ ගොං වැඩමයි<br>ඒක නිසා මින් මතුවට<br>ලැබෙන්නෙ නෑ මගෙන් සමා<br>-සමන් දෙව්ඳු |
| 140 | හාල් 60යි පොල් 50 යි<br>ඒ දෙකටම සීය පනියි<br>හබුන් කටයි බත් දෙකටයි<br>තුන් වේලම එකම තමයි |
| 141 | මාලුපිනිත් නෑ වෙනසක්<br>තුන් වේලම එකම තමයි<br>ඇගේ පතෙත් නෑ වෙනසක්<br>හැමදාමත් එහෙම තමයි |
| 142 | මොනව කරන්නද රාළේ<br>පොල ඉවරයි මේ කාලේ<br>සිවු අවුරුදු අපි හිටියේ<br>මේ දුක් එයි නැහැ සිතුවේ |
| 143 | මම නැහැ මේව දන්නෙ<br>පොත් ගහන්න සල්ලි යන්නෙ<br>රුපියල් 1000යි ලැබෙන්නෙ<br>කණ කර බඩු උගස් වෙන්නෙ |
| 144 | රස්සාවක් හම්බ වෙයිද<br>මේ දුක් ගිනි හෙට නිවෙයිද<br>ඩිග්‍රිය මුල්ලට දාලා<br>හේනෙ කුඹුරෙ යන්න වෙයි ද |
| 145 | කවුරු ද මේවා දන්නේ<br>පොලිටිකලුයි ඒව දන්නෙ<br>ඒ වුනාට මං හිතන්නෙ<br>නැහැ දෙවියොත් ඒව දන්නෙ |

# මොරටුව සරසවිය

| අංකය | ගීතය |
| --- | --- |
| 1 | පැනපැනවිත් ඉදිරියට<br>විභාගය ඉදිරියේ<br>පරඬැලක් නොවී<br>කළුගලක් මටත්<br>දිරිය ගැනුම ශක්තියයි.....<br>විභාගය ඉදිරියේ<br>පරඬැලක් නොවී<br>දිරියගැන්මට<br>සිප්කිරින් මා ගතට<br>ශක්තියක් දුන්<br>නිබඳ සිටි මගේ<br>ගුරු ඇදුරන්ට<br>උදාවන තත්පරය<br>ගෙවන හැම මොහොතකට<br>මගේ ආයුත් රැගෙන<br>ඔබ සසර රැදේවා දයාබර<br>මවුනි ,<br>පියාණෙනි....... |
| 2 | ළමාවිය ඉක්මවා<br>යෞවනය වෙතයන්න<br>අවැසි වි ඇත මෙමට<br>දයාබර ගුරු මව්නි.....<br>රසදුනක් සොයා යන<br>විෂම වු මිනිස් සිත<br>කෙලෙස හදුනා ගනුද<br>දයාබර මැණියෙනි…<br>මිනිස් සිත බිහිසුණුය<br>මසිත තව ළාමකය<br>ඔවුන් හා වෙහෙසෙන්නට<br>ඔවදන් දෙනුමැනවි<br>දයාබර ගුරු මැණියනි…. |
| 3 | **ජිවිතය**<br>ඉගෙනුම තුලින්<br>නුවණ සිසාරා<br>බලන් ජිවිතය<br>චිත්තර පටියක<br>රූප පෙළක් තුල<br>නොවෙයි ජිවිතය.<br>වයින් හලක් තුල<br>වීදුරුක හිද<br>මනමත් කරනා<br>මධුවිතක් තුල<br>නොවෙයි ජිවිතය<br>දෑගිලි මැද හිද<br>හද මිටි දවනා<br>දුම්වැටියක් තුළ<br>නොවෙයි ජිවිතය<br>අත්වැඩ පරවැඩ<br>ගුණ දහමින් හෙබි<br>අමිල නිමල වූ<br>මිනිසත් බව වූ<br>එයයි ජිවිතය |
| 4 | **සබඳ,**<br>අනන්තයක් නොමැති මේ ලොව<br>තුල ගමන් කරන අප<br>එයින්<br>මම මෙලෙස පව්කාරිය වී ඇත්තේ<br>මන්ද<br>මම නොදනිමි<br>මේ සසර තුල මා<br>තනිවි ඇති බවක් මට දැනේ<br>මෙය සැබෑවක්ද? මේ ලොව තුල<br>මටම කියා කෙනෙකු නැද්ද<br>සිටියි එනම් එ මගේ දයාබර<br>මැණියන්ය<br>නමුත්<br>ඈ මා දමා බොහෝ දුර ගොසින්ය<br>මා කුමක් කරන්නද?<br>මට නොවැටහේ. |
| 5 | **ප්‍රාර්ථනා**<br>මල් සුවද විහිදු<br>මාගේ කෙළිලොල් ළමාවිය<br>පසුවන තෙක්ම මා අතින් අල්වාගෙන<br>ගිය ඒ මඟ දෙපස තවමත් සුන්දරය<br>මා ආදරණීය<br>මව්නි.....<br>ජිවිතය නැමැති කටු කෙහෙලින් මිදි<br>නෙල්ලි ගෙඩියක් වන් ජිවිත ගමන<br>අතදිගුකර පෙන්වු මාර්ගය දෙපස<br>මල් එල ලියලමින් පවති<br>ඒ නුඹගේ ආදරයෙණි ......<br>මව්නි......<br>ප්‍රාර්ථනා කරන්නෙමි ආදරයේ නාමයෙන්<br>නුඹ<br>මතු ජාති ජාතිත් මගේම<br>මෑණියන් වන්නට..... |
| 6 | **මව් ගුණ සුවද**<br>අඳුරු බර රාත්‍රියේ<br>තරු වියන යට තනිව<br>නුඹේ ඔය මෘදු හඬට කන් දෙමිය<br>දුල පිරිමාවතේ<br>සක්මනෙහි යනෙනතර<br>නුඹේ මුදු බැල්මට<br>නතු වේ යැයි<br>මට සිතුණි......<br>නෙත් කෙවෙනි අග රැඳුණු<br>තනිකමට ගැලු කඳුළු<br>නුඹේ සුදු මුදු අතින්<br>පිසින බව දැනේ මට<br>ගෙන් බැහැර නුඹේ දෝණි<br>ශිල්ප සොයනා අතර<br>මව්නි නුඹේ ගුණසුවඳ<br>ස්වප්නයක් නැමුදු<br>සුගන්ධයක්ම දැනේ මට. |

| | |
|---|---|
| 7 | නෙතු ලගම දැවටෙන<br>ඔබේ රුව<br>සිත ලගම ගැවසෙන<br>ඔබේ සුවඳ<br>සනසවයි මගේසිත<br>මතු දිනක ලං වෙලා<br>ලඟ ඉන්න හැමදාම<br>ඔබේ පෙම රුවන් මෙන්<br>රකිම් මම සැම දිනේ. |
| 8 | සහන් පැතුමක් රුගෙන<br>මේ පාළු මැදියම පුරාවට<br>නුඹ විත් සිත අරක්ගෙන<br>නිතියට පිරිමදියි මගේ ආත්මයට<br>කඳුලු පිරී දෙනෙත් වලට<br>දුකින් පිරී සිත් මඩලට<br>සහන් එලියක් වී<br>ඉතින් ඔබ වඩින්නට හෙට දිනත්<br>මංගල පැතුමන් රුගෙන<br>ජිවිතයේ උණුසුම රැඳි<br>අනාගත සිහින කැදැල්ලට<br>පහත් තරුවක් විලස<br>මං නුඹ ලගින් ඉන්නම්<br>හැමදාම. |
| 9 | හිරු නැගෙන යාමයේ<br>පැහැසරවු අරුණ නුඹ<br>සියොත් කැල මුමුණනා<br>සංගිත ස්වරයේ නුඹ<br>ගලන ගංගා දියේ<br>සිත පිනන සිසිල නුඹ<br>අනන්ත වු සාගරේ<br>නිසංසල වෙරල නුඹ<br>පෙති සැලෙන සියපතේ<br>සිනිදු මකරන්ද නුඹ<br>බඹර ගී නාදයේ<br>සොඳුරුතම තනුව නුඹ. |
| 10 | **මව් පිය සෙනෙහස -**<br>දසමාසයක් කුසතුල දරා<br>මා මෙලොවට බිහිකළ<br>මව්නි දයාබර<br>ජිවිතයේ සියලු දුක් විඳිමින්<br>යහපත් පුරවැසියකු කිරීමට<br>වෙහෙසුන.<br>මා දයාබර පියාණෙනි...<br>මා සියලු දෙනාගෙන්<br>වෙන්වී.....<br>දුරු කතරට පිය මැන්නේ<br>රටට යහපතක් සෙතක් සලසන<br>හෙදියක් වී<br>ඔබ දෙපලගේ ප්‍රාර්ථනා<br>ඉටුකරලිමටය.....<br>.මව්නි ,පියාණනි....<br>නිතරම මාසිත ඔබළඟ දැවම්<br>ශක්තිය ධෛර්ය මාහට<br>ලැබුනට ඔබ දෙන ශක්තිය මා හට<br>අපමණය.....මව්නි , පියාණනි |

| | |
|---|---|
| 11 | **සිංහල ගුරු පියාණනි-**<br>ගුත්තිලයන්ගේ පරම්පරාවට එන්න<br>මුසිලයන්ට අඩ ගසන්න<br>අපේකාලයේ දිසාපාමොක්වරයාණෙනි<br>ඔබටයි මේ තුති...<br>කොපි පොතේ තනිවෙන්න<br>සිංහලයන්ට ආදරය කරන්න<br>කියලාදුන්නේ ඒ අසනුවේ කථාව<br>ඇත මා හදවතේ.....<br>ජිවමාන චරිතයක් ලෙස...<br>හන්තාන කඳුමුදුන වගේ<br>හිතේ තියෙන බර අඩු කරපු<br>ආදරණීය ගුරු පියාණෙනි<br>උපහාරයක්ම වේවා මේ තුති ගී. |
| 12 | **අහිමි නුඹ**<br>රෑ අහසට තරු පායා<br>එළිය දෙනු නොඅනුමානය<br>පුන්සඳේ ආලෝකය පරයා<br>එය කිසිදිනෙක නොනැගෙනු ඇත<br>ළදු කැලැවක තරු පියන් වල<br>මල් පිපෙනු නොඅනුමානය<br>බඹරෙකු වෙනුවෙන් නොපිපි මලක්<br>කිසිදිනෙක හමු නොවනු ඇත<br>මිනිසුන් ජිවත් කරවන්නේ බලාපොරොත්තු බව<br>ඔබ පිලිගනු නොඅනුමානය<br>නමුත්<br>ඔබ මට හිමි නැති බව<br>ඔබට මානොව<br>හොඳ හිමිකරුවෙකු හමුවනු<br>නොඅනුමානය<br>නමුත්<br>ඔබට මා තරම් ආලය කල අයෙකු<br>කිසිදිනෙක හමුනොවනු ඇත. |
| 13 | ලගින් ඉන්නට සිතයි ආදරයෙන්<br>තුරුලට වෙලා<br>අසාගෙන ඔබේ වදන් මුව මඩල<br>දෙස බලා<br>තහනම්ය එය පවුරු පදනම්ය<br>අපවටා<br>දරාගන්න බැරි දුකක් පිරේ<br>හදවත පුරා<br><br>අතරමංවු ජිවිතයේ අත්වැල<br>වුයේ ඔබය<br>නොමිනිසුන් මැද මට හමුවු සැනසුම<br>ඔබය<br>වේදනාවෙන් මා මුදාගත් මගේ මුළු<br>ලොව ඔබය. |
| 14 | නුඹේ සන්සුන්<br>සිනහවත<br>නෙලුම් පුබුදි මගේ<br>හදවත<br>භාවනාවක් සිරිය<br>ප්‍රේමය<br>ඔබට පමණක්<br>සමවැදුන..... |

| | |
|---|---|
| 15 | පුරාපසක් රෑ අහසේ<br>සොඳුරු සිත්තමක්<br>හංස විලත් කොද යායත්<br>සුපෙම් ගීතයක්<br>නුඹේ පෙමත් අතීතයක්<br>තවම හීනයක්<br>පද ලෙහුනත් දුක පිරුනත්<br>නුඹ මට කවියක්........ |
| 16 | හිනා හිනා පිපුණාට මුවේ<br>නැත ආල හැගුම් සඟවාන හිතේ<br>හින ලොවේ දුර යන්නට එපා<br>ඉටු නොවන පැතුම් පුරවාන සිතේ<br>චාන්දමා පෙම වාවගනින්<br>උණු කඳුළු ගඟක් ගැලුවාට නෙතේ<br>හීනවගේ මම ඉන්න කේසේ<br>අමනාප නොවන් නුඹ මගේ නොවේ. |
| 17 | අහිංසක මගේ සිතට<br>දුන්නු මේ ගින්දරින්<br>වාවනු නොහැකිව<br>තවමත් මා වැලපෙන්නෙමි<br>මෙසේ මසිත රිදවන්නට<br>ඔබට සිත් වුයේ<br>අවංකවම මුළුහඳින්ම<br>පෙම් කල නිසාමද<br>දයාබර අහිමි කුමාරයෝ. |
| 18 | අතිතත ශේෂකල ඒ දවස් වගේ<br>ඉන්නට හැකිනම්<br>හැමදාම ආදරෙන්<br>ගනඳුරට පායන සඳ එලියක් වගේ<br>එලිය දෙන්නට හැකිනම්<br>නුඹේ ජිවිතයට<br>කනට වැටුනු දිය දොතක් වගේ<br>සිසිල දෙන්නට හැකිනම්<br>නුඹේ දිවි කතරට<br>හැමදාම ඉන්නම් නුඹේ<br>සෙවනැල්ලක් සේ<br>මියෙනතුරාවට<br>මේ ප්‍රථම ප්‍රේමයෙන්. |
| 19 | ඉන්නවද අහිංසකව<br>වගේ මගේ ලගින්<br>තවත් විටෙක දඟකාරව<br>වගේ ආදරෙන්<br>හිඳින්නට හැකිනම් මේ ලෙසින්<br>ඔයා මගේ ලගින් හැමදාම<br>සත්‍යයි මම ආදරෙයි<br>රත්තරං<br>මියෙන තුරාවට<br>මේ ලොවේ මං. |

| | |
|---|---|
| 20 | විහිදා ලස්සන අත්තටු<br>උජාරුවට ඉගිල ගියත්<br>නුඹේ ලොවේ විසිතුරු අපි<br>නැතිවද දන්නේ .....<br>රිදෙනවාද ඔය අත්තටු<br>දුර ගමනක් ආව නිසා<br>නවාතැන් පලක් නැතිවද<br>සොයා බලන්නනේ.....<br>මැලවුණ මල් වලින් කොහේද<br>කුසපිරෙන්න මල් මී පැණි<br>අමා පැන් බිදක් දුටු කල<br>ඇයි මග හැරියේ......<br>අප කාටත් ඔය ටිකමයි<br>ගිජුවු පස්කම් සැපයට<br>මලේරොනට වු සපන්ව<br>ඇයි වැලපෙන්නේ. |
| 21 | සුවහසක් සෙනග මැද<br>මිලට දෙනසිනා මැද<br>පැයට දෙන සෙනෙහේ ලඟ<br>තනිවෙලා මා මෙලොව<br>එක් අතක් මිතුරු ලෙස<br>සුහද බැමි තර කරන<br>අනෙක් අත පිටු පසින්<br>උගුරු දඬු සිරකරන<br>සෙත් පුරය තවරගෙන<br>සැබෑ රුව මකා ගෙන<br>මළ රකුසු මල් සරාගේ<br>හීය උදුරගෙන<br>සිනහ වෙනව නොවේ<br>සිනස්සනවා මාව<br>සිත යටින් සෝ තැවුල්<br>මර බිය කිලි පොලන<br>බැහැමවුනි ඉවසන්න<br>මේ සොදුරු තව ගැසුන<br>කුහකකම  රජ කරන<br>ලොව තවත් මට ඉන්න<br>රජ බොජුන් වලදන්න<br>ඔබේතුරුලේ නිදියන්න<br>අවසරයි හෙට දාට<br>නැවත ඔබ වෙත ඒන්න...... |
| 22 | සහෝදරත්වයේ උතුම් මාවතෙහි<br>සැරිසරමින්<br>ඔබත් මමත් ගෙවු ඒ සුන්දර<br>කාලය<br>කිසි දිනෙක<br>මා සිතින්<br>අමතක නොවන්නකි<br>ඔබ අතිනත ගත්දා<br>මා දෙනෙතට බරවු<br>අවිහිංසක කඳුළු කැට<br>මැඩ ගත්තේ<br>ඉතාමත් අසිරුවෙනි<br>එහෙත්<br>ඔබ මට දුන්<br>පියෙකුගේ<br>තරම් සෙනෙහසට,<br>ආදරයට,<br>ඔබගේ ආදරණීය<br>සහෝදරත්වයට<br>ගරුකරමි<br>සත්තයි,<br>සහෝදර ප්‍රේමයෙන්ම....... |

| | |
|---|---|
| 23 | ගල් මුල් වල හැපෙමින්<br>වාලුකා කතරට මැදිවී<br>සැඩසුලං රැලි තරණය කොට<br>මහා බාධක පසු කර<br>අව් රශ්මියෙන් කරවී<br>ගලායන ගංගාවක මහිමය<br>කොතරම්ද විසිතුරු<br>හිරු කිරණ රැස් ධාරා<br>සියොතින්ගේ ගී මාලා<br>ගංතෙරේ තුරුලතා<br>කොතරම් සුන්දරද<br>ගංගාවකට<br>ගංතෙරකට<br>මිනිස් ජිවිතය කෙතරම් සමානද.. |
| 24 | දිනෙන් දින ගෙවී<br>යයි හැමදාම එක ලෙසින්<br>අපි එතනමයි තවත්<br>කුමක් කරමුද ඉතින්<br>බිය වෙලා ජිවිතේ<br>පසුපසට හෙම නොයන්<br>ඉදිරියට එක පයක්-<br>තබාබලමුද ඉතින්<br>තැබුපය ඉදිරියට<br>ජය පරාජය වුවත්<br>තුටු වෙමු නොසින් සිත්<br>තැබුවෙමුයි පියවරක්. |
| 25 | ඕනැම දෙයකට වඩා මා විශාල වේ<br>සියලු දේ ඇත්තේ මගේ දොරින්      පිටතය,<br>නමුත් දොරේ යතුර ඇත්තේ මා අතය<br>එම නිසා මට සිදුවිය යුතු ඕනැම<br>දෙයකට වඩා මා ශක්තිමත් විය යුතු<br>අවස්ථා,ඉරණම,වාසනාව යන<br>මේ සියල්ල බාහිරවේ<br>මට එවා වෙනස් කිරිමට<br>නොහැකි විය හැකිය<br>එත් එවා පරාජය කිරිමට මට<br>පුළුවන..... |
| 26 | ආදරෙන් මන් හැමදාම<br>ඔය  දෙනෙත් පැවසුවත්<br>ආදරෙයි මන් හැමවිටම<br>ඔය දෙනෙත් අභියසම<br>වැටී මට පය පැටලි<br>ඔබ ඉදිරියට එද්දි<br>ඒ වෙනුවෙන් තමයි<br>මම හැමදාම<br>මඟ බලන් ඉන්නේ<br>මම හරි නේද?. |
| 27 | කලුවර රැක වැස්ස වී වහින්නම්<br>තෙමෙන්නට එනවාද අතින්අත<br>අල්ලාන හුගක් දුර ඇවිදින්න නෙමෙයි<br>ලංවෙලා මට<br>අඩන්නට එනවාද? |
| 28 | පියෙන් පිය ඔසවන පා පොඩි<br>පසුපසට නොයවන්න<br>හෙටක් කියා දිනක් නොමැත<br>අද කලයුතු දේ අදම කරන්න<br>සැමදා සිනහ මුවින් සැමදෙනා දෙසම<br>එකම ඇසින් බලන්න<br>පලමුව නැතහොත් දෙවනුව<br>ප්‍රතිඵල සාර්ථක කරගෙන<br>ඉලක්ක කරා පියනගන්න<br>එවිට ඔබට<br>සාර්ථක අනාගතයකට<br>මුහුණ දිමට හැකිවිම<br>හැමදාම අහිංසකව ලොව<br>දෙස බලන්න. |
| 29 | නුහුරුයි මං පෙත කටුකයි දිවිමඟ<br>නමුදු දිනෙක සිතුනා ජය ගැන්මට<br>කඩ ඉමක සිතෙහි ඇඳි ගිය<br>පියාපත් සුන්ව අත්තටු සැලුවට<br>ඉඟිල්ලෙන්න බැරි බව දැනුනත්<br>දෙමාපිය කඳුලු දැක<br>උණු උණා මගේ සිත<br>ඉසුරින් පිරි ලොවක්<br>සිහිනෙන් දකිමින්<br>පියවර තැබුවෙමි<br>අධිෂ්ඨාන මං තලාව වෙත....... |
| 30 | නිහඬ නිසංසල විහාර මළුවේ<br>සමාධි සුවවිදිනා<br>හමනා සුළගට සැලෙන බොපත්<br>සිතට පවන් සලනා...<br>සිල් සුවදයි මුළුවිහාර මළුවට<br>පෙහෙවත් සුව විදිනා අම්මේ<br>මල් සුවදැති බෝ මළුව පුරාවට<br>සඳුන් සිසිල නුඹමයි අම්මේ<br>රත්මාලි සැයේ රන් සද කිරණින්<br>නැහැවෙනු පෙනුනා නුඹ අම්මේ |
| 31 | **ඔබට කියන වගනම්**<br>තනිව ආ මේ ගමනේ<br>නවාතැන් පොළකි මේ  බිම<br>සුමිතුරු සුවය පතා<br>දකිමි යනෙන හැමවිට<br>ඒ බිමේ ඔබ<br>මා සිත පුබුදුවන<br>කියාපාන මුහුනු ඒ හැගුම<br>අතේ තෙරපගෙන<br>කවදානම් ඉවරවේද<br>ඒ ගොළු හදවත<br>බලා හිදිමි මම . |

| | |
|---|---|
| 32 | එරෙහි අයුක්තියට<br>එරෙහිව වංචාවට<br>හිසනමා සත්‍යයට<br>මිට මොලවන යථාර්ථයට<br>එසවෙයි සුවහසක් දෑත්<br>ඉහලම අහසට<br>පියවර 2ක් 3ක්<br>පස්සට තල්ලුවෙයි<br>එකවරම<br>එතෙක් එසවෙයි<br>යලි පියවරක්<br>යලි ඉදිරියට<br>තබපන්<br>අතිත ගමනට<br>ගැඹුරු පාසටහන් මත<br>දිරියෙන් සිටගනින්<br>පෙනේවි නුඹට ලෝකය<br>සියල්ලටම ඉහලින්<br>පෙරට එන නුඹ<br>යලි මේ ගොහුරු සමාජය<br>හිසට නැති දේශයම<br>අවියක් කොට<br>පා පහරක් සමාජයට<br>ආදරෙන් විසිවෙයි<br>මානව සමාජයම<br>සෙවු ශාන්තවයම ඉදිරියට |
| 33 | **ප්‍රාර්ථනා**<br>හෙට උපදින දරුවනේ<br>අද දැය නුඹ පන වැන්නේ<br>මම මෙන් නුඹෙ රට රැකගන්නේ<br>අතිතයේ හෙළ විරුවන්<br>තව නුපන් හෙළ දරුවන්<br>පැතුමට හෙල දස වසරක<br>සිරි සවි දෙනවා සත්තයි<br>ඒ දිරි ලැබ මගේ පුතා<br>පෙරට ඇවිත් සුපුන් නසා<br>දෙස කිතු ගොස බබලවාවි<br>නිල් අඹරේ. |
| 34 | **සමාජය හා කලාව**-<br>පවතින සමාජ ක්‍රමය තුල අදාල යම්<br>ගුනාත්මක<br>තත්වයක් අත්පත් කර නොගත් තැන සමස්ට<br>සමාජය දුගමාන වනුයේ පසුගාමි ස්වරූපයකි.<br>ලාංකිය සමාජයේ කලාවේ භාවිතයටද සිදුවි<br>ඇත්තේ මෙයයි. |
| 35 | **කුකුලු මිතුරා-**<br>නැගිට ඔය ලෙස අළුයම<br>නිදිමත උන් එයි නේද<br>කුපිතව පොලගෙන<br>නැගෙන මුත් ඉර<br>තවමත් ආදරේ දසතම<br>අනතුරු දායකයි<br>කල්තියා පිබිද හැඩලුම<br>එත් නිහඬව කොහොමද? |
| 36 | අපි අපිට ආදරේ නම්<br>අපිට පුළුවනි තව<br>කෙනෙකුට ආදරය<br>දෙන්න එහෙම නේද? |

| | |
|---|---|
| 37 | පරංගිද ලන්දේසි<br>පරදේස ඉංග්‍රිසි<br>සිව්සියක් වසරක්ම<br>මුළුරටම වැනසිය<br>මුතු මතින් ලේ<br>මතින් දිනා ගත් නිදහසින්<br>පලක් ගන්නට නොදි<br>සිහලුන්ට කිසි ඉඩක්<br>අදත් මෙරටට බැලුම් හෙලනා<br>පරදේශ අවතාර<br>දරයි උපරිම තැත්<br>අසන්නට සිහලුන්<br>අතිතෙන් උරුම වු<br>වෙර විරිය හා දිරිය<br>ගෙන යවු පෙරටම . |
| 38 | **කලාකාරියගේ ගබ්සාව**<br>ඔහු මා සයනය<br>කලලක් වන්නටද<br>මට ගබ්සාව විලිරුදා විට<br>කැගසා ඉකිලමින්<br>ඉකිලමින් ඉවසමින්<br>නුඹ බිහිකර පල නෑ<br>හිස් මිනිසුන් කුමටද<br>ගුණ නැන පිරි දරුවෙක්<br>නොදත් හිස තුරුත්තක්<br>අස අසා නැලවෙන<br>නැලවෙවි හිනැහෙන<br>උන්ට කුමටද නුඹ<br>දරාගෙන කඳුළු<br>ඉරාගෙන හදවත<br>මරා දමන්නෙමි නුඹ<br>අවජාතක කතා අසන්නට<br>කුනුකානුවේ මියැදෙන්නට<br>නුඹ බිහිකර පලනෑ<br>ගබ්සා කර නුඹ<br>ගැබ සොදා හැර<br>සයනය කරන්නෙමි<br>හිසම හිස් මිනිසුන් හා<br>විද විද ඔහු පසු<br>මාතාවකගේ කිරි<br>එයද ඉවසමි<br>ගැටිස්සියන් ගැටවරයන්<br>ඌත් එක්ක බියර ගසයි<br>ලමිස්සියන් ලැම හප්පා<br>ඌත් එක්ක dance කරයි<br>එයද ඉකිලමි<br>සිහිවි ගබ්සාකර නුඹ<br>පිළිසිදෙන තුරු<br>ලොවට ඕනැද එකෙක්<br>ළය ලේ කිරි කර පොවමින් |
| 39 | **නුපන් පුතුට**-<br>පන්සල් දාගැබ් රන් කොත් නිල් අහසේ<br>ගැවෙන්නේ<br>අතිත හෙල විරුවන්ගේ වෙර විරියෙන් බව<br>දැන ගන්නේ මුතුන් හෙල දහඩිය බිඳුකඳුළු<br>පවා නොමියෙන්නේ යෝද අමුනු වැවපියවර<br>බලා නෙතට පන දෙන්නේ<br>පරසතුරන් පලවාහැර රණගොස ඒ විරුවන්ගේ<br>ඇලදොල ගංගාවල හැඩ සමග අවට<br>මිම්නෙන්නේ එදා සුසුම් සුවද වෙලා අප සනහා<br>ගෙන යන්නේ නිල්වන් හිදිනා පොලවේ රන්<br>අස්වනු පිදෙන්නේ. |

| | |
|---|---|
| 40 | **රට රකිනා නුඹට** -<br>පුරාසමුදුර මහා බියකරු ගුවන් ගැබ හා<br>මිහිමතින් වඩාදිරි සිත බරා නෙත ගිනි අවි<br>අතින්<br>පතා සුබ සිත දනගසා රකින ලක්මව<br>නෙතසිතින් විරුවනේ හෙල මෙලෙස ඔබ<br>ගැනසිහිකරන්නෙමි අතිතෙන්. |
| 41 | **සුදු සමනලිය** -<br>මල් කැනින් සුවපත්<br>සිහිල් සඳ කිරණ නුඹ<br>නුඹේ සියුමැලි පියාපතේ<br>මහිම අහස සිඹ<br>සුළඟට කියන රහස කිම<br>සිනිඳු සදලිය නුඹ<br>පින්බර සදිසි වරාමල<br>ගිනි නිවන ඇසිල්ලට<br>ඉතින් මා හැරගිහින්. |
| 42 | ලෙයින් කඳුලින් තෙත්වු<br>මහා පොලව විකසිත වු<br>පොපි මල ඔබයි<br>මවකගේ කඳුළු<br>බිරිඳකගේ සුසුම් වැනි<br>මව්බිමට වාසනාව ගෙනෙන<br>හිරුකිරන නුඹයි<br>හිරු විකසිත වන හෙට දිනක<br>ජය කෙහෙලි නංවනු නියතය. |
| 43 | **කඳුළු මල්**<br>මගේ දෑත් අද<br>නලියන කඳුළු මල<br>මගේ තනි නොතනියට<br>නුඹ විතරමයි අද<br>නොවැටි ඉදින්නට බලාපන්<br>මගේ නෙතු අගින්.. |
| 44 | **අහිමි නුඹ**<br>රෑ අහසට තරු පායා<br>එළිය දෙනු නොඅනුමානය<br>නමුත් පුන්සඳේ ආලෝකය පරයා<br>එහි එළිය කිසිදිනෙක නොනැගෙනු ඇත<br>ලදු කැලෑවක තුරුපියන් වල හමන<br>සුළඟ මට කිසිදිනෙක හමුනොවනු ඇත<br>බඹරෙකු වෙනුවෙන් නොපිපි මලක්<br>කිසිදිනෙක හමුනොවනු ඇත<br>මිනිසුන් පිවත් කරවන්නේ<br>බලාපොරොත්තු බව ඔබ පිළිගනු<br>නොඅනුමානය<br>නමුත් ඔබ මට හිමි නැති බව<br>මම තේරුම් ගෙන හමාරය<br>ඔබට මා මෙන් තවත් මිනිසකු<br>හමුවනු ඇත<br>නමුත්,<br>ඔබට මා තරම් ආදරය කල<br>අයෙකු කිසි දිනෙක හමුනොවනු ඇත. |
| 45 | **අහිමි මල නුඹ-**<br>අහිමි මල නුඹ<br>කිමද අන්සතු හදක පිපුනේ<br>අහිමි බව නුඹ දැනදැනත් සිත<br>කියන් කුමරිය<br>මගේ නොවෙද නුඹ. |
| 46 | අමාවක සහ අඳුර කිම නුඹ<br>මගේ තනියට ලග ඉන්න<br>ඉකිබිඳින මේ සිහින් මදනල<br>සිහිල් සුළඟයි නැගෙන්නේ<br>ගෙවෙන මොහොතක් පවා අද මට<br>කල්පයක් ලෙස මට දැනෙන්නේ<br>පෙරදවස අප ගෙවනු කාලයේ<br>සොවින් වුන් අප සිනාසෙන හැටි<br>මගේ සිතතුල රැව් නගන්නේ<br>ඔබේ ලස්සන සිනා සමගින්<br>මගේ දිවියම එළිය වන්නේ<br>යලිත් ඔබ මගෙ ලගට<br>ඇවිදින්<br>නෙත් කොනින් මට සිනා<br>සෙන්නේ<br>ලොව නොලැබුනත්<br>ඔබව ලැබුනොත්<br>එයම පමනයි<br>මම පතන්නේ. |
| 47 | හද ගිනි ඇවිලේ තවම දැවේ<br>නොදනිමි ඔබ දුර කොහෙද ගියේ<br>සඳ සිසිල ගලාවිත්<br>දෙනෙත තෙමෙන විත්<br>මසිත නිවන්නට බැරිව තැවේ<br>තරු කැට වලින් පෙම්ගිතයක්<br>ලියුවේ දකින්නයි හිනයක්<br>දුර තැනෙක සිටියදි ඔබ ලොවේ<br>වෙන මක් කරන්නද මං ප්‍රියේ. |
| 48 | **ඇයි**<br>වසන්තයේ එක් දිනයක හිටියා<br>ඔබ<br>දෝරේ ගලා ගිය සෙනෙහස<br>සුවදයි තව හිත අද්දර<br>නටුවක පිපි මල් සුන්දර<br>මිලින වුනා මෙන් හවසට<br>මගේ ලොවේ ඒ පින්බර<br>දෙලොව ගිහින් නිති හඳුනන<br>සෙනෙහස නිමාවුනානම්<br>නුඹ සිත මා හැර දමලා<br>මාහඩ කන වැටුනු මොහොතේ<br>ඇයි මේ ලෙස කඳුළු සැලුවේ. |
| 49 | **දිනක්-**<br>සිත කැගැසුවා ලොවට නොපෙනෙන්නට<br>මනස හැඩුවා මටම නොදැනෙන්න<br>එත් එනමුත්<br>සිතම සසල විය<br>කඳුල බොඳ විය<br>ඒ සොඳුරු දිනේ<br>අපේ රැගුම් අපේ වැයුම්<br>ලොවම දකිනකල<br>දැනුන හැගුමන් අප සිතේ<br>ආ ගමනෙ සොඳුරු සොඳුරු බව හැගේ<br>පියමනින්නට විදුබිමේ<br>හැඩුම නවතා<br>සිනාසුමු අපි<br>මව් තුරුලේ. |

| | |
|---|---|
| 50 | **සරසවිය**<br>ගිම්හානයේ උදැසනක<br>සුපිපි රොස කුසුම<br>ලතැවුල් කිමද<br>අද නැතත් හෙට දිනක<br>වසන්තය උදාවේ නම්<br>දොතින්ම දරාගෙන බලාපොරොත්තු<br>පෙලගැසි බලා හිඳි<br>ඇස් කෙවෙනි යට රැඳි<br>තුන් කඳුළු ඉහිරවන්න. |
| 51 | දෛවයේ කඳු මතින්<br>අනාගත ලොකයට<br>වාසනා අරුණුරැස්<br>ගලනා නව උදැසනක<br>යහතින් පිබිදවිත්<br>ඔබ දෙපා තබන බිම<br>තණපතක් අගරැඳි<br>දෙපතුලට සිසිල දෙන<br>දිය බිඳක් වන්න වත්<br>මට ඉඩක් දෙනු මැනවි. |
| 52 | තරුකැටයක නැති ලස්සන<br>තරු පොකුරක දකින්න නැති<br>මල් කැකුලක නැති සුවදක්<br>මල් උයනක දකින්නක හැකි<br>එක් ස්වරයක නැති මිහිරින්<br>ස්වර ඇමුන තනුවක  ඇති<br>වෙනසක් නැත සැම එකලෙස<br>පරපුර අපි<br>අනාගතය වෙනුවෙන් නුඹ<br>වැටෙන අරමුනු දුක්<br>නෙතු කඳුලැලි පිරෙන්න ඇති<br>ගල් කුලකින් කුමන පලද<br>පිළිරුවටයි  වදින්නේ නිති<br>ගලක් පිලිරුවක් වන්නට<br>පුදුම දුකක් විදිනවා සකි. |
| 53 | **පුංචි කුරුල්ලනි**<br>පියාඹන්න තටු ලද මුත් අහස නොලද<br>කුරුල්ලනි<br>එපා කරන්නට වෛර<br>නිල් අහසට ,අහසේ සරන කුරුල්ලන්ට<br>ඒ අහස ඔබටද හිමිය<br>මතුයම් දිනෙක ඔබට හිමි වේවි අහස<br>සැරිසරන්නට සැම අත<br>තටු ලදමුත් පියාඹන්නට<br>නුඹ නොදනි අහස<br>හැමදාම අහස නිල් නැත /අහස කළු නැත<br>අහසේ සරන කුරුල්ලනේ ඔබට කියාදෙනු ඇත<br>ජිවය දිවි ලබන්නට සරන්න<br>අහස ලබන දිනය ඔබ අතේ<br>ඉතිං පුංචිකුරුල්ලනිඅහස ඕනැද? |
| 54 | සිනාසෙන්නට වරම් නැති අහස<br>කඳුල තැවරු සලනවා<br>දුරින් සිටියද යොදුන් ගනනක් නුඹේ හඬ මට<br>ඇසෙනවා<br>නුඹට පෙම් බැද කරපු වරදින්<br>තවම හදවත දැවෙනවා<br>මෙතෙක් දඩුවම් දෙන්න මගේ දුක<br>නුඹට නැතිවග දැනෙනවා<br>කරපු වරදට නොදැන මගෙ සිත<br>පිරෙයි නෙතු කඳුලැලි නිති<br>වෙනස් නැති පෙම හිතේ හිතේ ඇති මුත්<br>පැතුම් කිසිවක් නම් නැති<br>නුඹේ ලස්සන නෙතු පියන් යට<br>වෛරයේ ගිනිදැල් නැති<br>දිනක් මතු දින උදාවේවි<br>තවම සිත නොදනිමි. |
| 55 | තනිවුන දවසක හුල්ලන<br>නැතිවුන දවසක හෙලන සුසුමකි ආදරය<br>සමුගැනිමක් අතිතය බාරදෙන<br>ඒ අතිතයම දවසක නෙතු අද්දර<br>අඩා වැටෙනා කදුලකි ආදරය<br>අනාගතයම සිහිනයක් වන<br>අතිතයේ යම් දිනෙක මියැදුන<br>අවන්කත්වයයි ආදරය<br>ජිවිතයේ අරමුනක් ගෙනදෙන<br>සඳ නැති රැයක පහන් තරුවකි ආදරය<br>සිතකින් සිතකට ආදරය කරන<br>ලොව ඇති සුන්දරම හැගිමක් ආදරය. |
| 56 | **තුලාව-**<br>ඝන මේඝයෙන් වැනසෙන පුන්සද අහසේ<br>සඳ වගේමයි සිහියෙන් අප සිත් අහසේ<br>මෙබඳු නැව් නොතිබෙයි සිහියද රහසේ<br>ඝන මේසයෙන් පුන්සඳ වැනසෙන විලසේ<br>අද හරි දුරකයි අද සතුටෙයි නිමක් නැත<br>අද  සිතල උණුසුමින් දැහැවෙයි ගත<br>අද පඩිදවස අද නම් කිසි ගමක් නැත<br>මේ හැම දේම බෝතල් විසදුමක් ඇති<br>මිනිසත් නුඹේ බේබදු කම නිගාවකි<br>පව්කල දෙන වේයන් සතු වගාවකි<br>තොලගා දොඩවන සමහරු අමාවැකි<br>පිබිනා දේය විදිනා දිවි වුවා සකි<br>වැටිලා මොඩයෙකු විලසින් මුලාවට<br>ලක්වි ලොකයා ට සරදම් සිනාවට<br>නුඹ කැමති නම් එන්නට දිවි තුරාවට<br>ඇසුරන් සමග පිටවියන් උදාවට. |
| 57 | තෙත මලින් බරවී ගිය තුරුලතා වියලිලා<br>දසතත් අතින් හමා ගිය මද පවන වියලිලා<br>ගුණ දම් සරාදති සිත් තුලින් ගිලිහිලා<br>විදු නැන අනු හඩින් නව ලොවක් බිහිවෙලා<br>කුරිරු යුද්දයෙන් රුදිරු ගංගා ගලන<br>ක්ලොනිකරනයක් කාර්මිකරනයේ නව නිපැයුමකි<br>කරන උතුම් වු මිනිස්කම නිපදවිය හැකිවේද? |
| 58 | ගිම්හානය නිමා වි වසන්තය උදා වු සඳ<br>වැලපෙන මල් කැකුළු වල අති ප්‍රේම සුවදින්<br>සරසවි බිම වේලන්නට කාලය එලඹ ඇත<br>එත් මල් සුවද සමගින්<br>මහා මෙරක් වන් දෑ අවුරුද්දක මතකයට<br>තනිවෙන්න අවසරයි සරසවි මව්නි. |

| | |
|---|---|
| 59 | බොන්නට තියෙන දිය පොද නවතන්නේ කවුරු<br>නැවතුන බවක් නැත නිහින කෝටි සතුරු<br>බිඳලිය යුතු බැවින් කොටි බලමුලු යුද පවුරු<br>සටන් කලේ ජය ගන්නට මාල් ආරු<br>උදාකරනු නියතයි සාමය මෙවර<br>නොනිදා කරන මෙහෙයකි අමර<br>විහිදන ගසක් මෙන් සුවිසල් අතුපතර<br>මුදවා දුන්නේ කිලිනොච්චිය මා මිතුර<br>දිනයෙන් දිනය යයි පෙරටම අපේ විරුවෝ<br>බිය නොහදුනයි ලක් මවගේ විරු දරුවෝ<br>දැන් වෙව්ලන්නේ අවසන දැන කොටි හතුරෝ<br>ජය වෙයි ඔබට සිරිලක් දරුවෝ. |
| 60 | **ජීවන මඟ**<br>ජීවන මගේ සොඳුරුතම නිමේශයේ<br>මතුදම් හින දොරකට ලගින්<br>ඇවිද ආවා ආදරෙන්<br>නිල් කඳුලැලි නෙතු පියන්<br>මගේ දැසින් දුර ගියාට<br>රත්රං පාට සුන්දර හිනෙක<br>මතකයන් තිබේ නුඹහිටි වගට<br>සඳට තරු වෙන් කොට සගවා<br>හඳ ගැබේ නිදන්කර නුඹ<br>මට මතක සුවදකි හැමදාම. |
| 61 | ජීවිතය නම් නිල්දිය රැදි<br>පිපි මල් රැදි දිය දහර සේ ගලායති<br>විටෙක ගල් පර රැදි මාවතේ<br>සිරු මාරුවෙන් ගලාබසි<br>සිදිගොස්නැවත පිරියන සේ පෙනි<br>නිමක් නොපෙනෙන මහ සයුර ඒ වැනි<br>මනින්නට බැරි අහස් වියනද<br>වැලිකතර සේ රුදුරු වුවද<br>අමාවක සේ අඳුරු වුවද<br>විවිධාකාර වූ මේ ජීවිතයටමයි සකි. |
| 62 | දස දහස් වේදනා කම් කටුළු ඇස ගැටුනු<br>නන් වර්නයෙන් සිහින පෙන බුබුලු<br>මතු කරන විශ්වයේ<br>රුදු අඳුරු ගැබ තුලින්<br>සැනින් සැනින් මතු වී නැසෙන<br>මහා දිග සුසුමක්ය ජීවිතය. |
| 63 | සිහිනයකි ඔබ මට සිතේ<br>අවදි නොවනා නෙතු පියන්<br>සුවදක්ය මට සිතේ<br>වෙන්ව නොයනා කුසුමකින්<br>දිය දහර ඔබ මට සිතේ<br>සසර සරන තුරු ඉතින් . |
| 64 | වු බර හැඳුන විට කවුරුත් එන්නෙ මෙතනට<br>වට පිට කැත නොකොට<br>වු කරන්නකෝ හිතේ හැටියට. |

| | |
|---|---|
| 65 | පැය දහසක්<br>නෙත දල්වා<br>පොත් පිටුතුල<br>සැඟවි ගෙන......<br>අදහස් දහසක්<br>පරදා<br>ජය ලැබුවත්<br>පිලිතුරකින්....<br>තවමත් ඔබ දිනුවේ<br>නැත<br>නුඹහදවත<br>ජයඅරගෙන....<br>නගේ මලේ<br>හෙට දිනකට<br>පුබුදුවන්න<br>යහපත් ලොව.... |
| 66 | සොයා දෙන්න<br>අතරමං වූ මගේ<br>කවි සිත<br>චුම්බකයක ඇලවිලාද<br>ආහාර ජාලයක<br>පැටලිලාද<br>සිතා ගන්න බෑ |
| 67 | කිසිදා නොදුටු ඔබ<br>නොසිතූ නිමේෂයක<br>මා දෙනෙත් අභියසට<br>එබී කියූ ආදරය<br>මහද නැගි ප්‍රේමයයි ප්‍රථම<br>අල්ප මාත්‍රාවකින්වත්<br>අඩු නොවෙයි<br>පවතින තුරාවට<br>දිවි මේ ඉර හඳ දෙකම<br>දහසකුත් කම් කටොළු<br>ආදරයෙන් ජය ගන්න<br>ඔබ මගේ හදවතේ<br>හැමදාම ළග ඉන්න. |
| 68 | සුලෝහිත රුදිරය හෙලා<br>හෙලු දැ පිපාසිත හදවතින්<br>වැගිරෙන දා බිඳු වැටෙන<br>දෙරනත නැගි වැද රණමතින්<br>අවි දරා රැපුන් තෙද බිඳ<br>පෙරට ඇදිනා සිව්දිගින්<br>එඩි පතමි<br>ජය දද නගන්නට<br>නුඹ නොදත් නුඹ සොයුරෙකි. |
| 69 | විවිද ජාතින් . විවිද ආගම් ,<br>විවිද භාෂා , විවිද මතවාද<br>නමුත් එකම රටක්<br>ශ්‍රී ලංකා<br>රණ විරුවනි කිසිවෙකුත් නොමැත<br>මෙරට ජයගන්න<br>නුඹලා අපට මහත් ගෞරවයකි. |
| 70 | දෙරණ ගගුලා හැලෙන<br>ගිනි අවි හඬින් තැති ගත්<br>හිසට වහලක් අහිමි මිනිසුන්ට<br>එකම පිහිට නුඹමයි. |
| 71 | විදිමින් සතුරු කොටි බලමුලු සතර අතේ<br>ලෙලදෙයි සිංහ දජ නැගෙනහිරේ<br>ගනිමින් අනසකට දවමින් වන්නිකරේ<br>විරුවනි නුඹ අතෙහි නිදහස ලක් දෙරනේ. |

| | |
|---|---|
| 72 | කෙලි කවට සිනා මැද<br>ගත කල ඒ සොඳුරු ළමාවිය<br>සඳු හිරු වන් මා පිය තුරුලේ<br>අඳත් රැඳී ඇත මා සිත පතුලේ<br>එවන් වූ සෙනෙහස සමගින් ගත කල කාලය<br>පස් හෝ සය වසරකට සීමාවුවකි<br>කඳුලින් බොඳවුණු ඒ සොඳුරු අතීතය<br>එනවා නම් යලි මා ඉදිරියට<br>නෙත් පිරුනත් කඳුළු වලින්<br>ඉන්නම් ඒ කඳුළු වලට<br>පොලොව සිපගන්නට නොදී<br>දුක තිබුනත් හද පුරාම<br>හදපතුලේ රදවා ගන්නෙමි<br>සඳේ තනියම තරු දෙකක් සේ<br>උන්නත් මා සමග ඉතා කෙටි කාලයක්<br>සැගවුනා ඔබ දෙදෙන<br>ඝන මේඝ වලාකුළු අතරේ<br>තනිකමින් පිරුණු ලොව<br>අතීත සිතුවම් සිතෙහි සැරිසරන කල<br>ඔබ දෙදෙන සිහිවෙලා<br>සිත ඉකිබිඳින කල<br>නෙතු කඳුලැලි ගලනවා<br>සිහිවෙලා සාගරය වන් මාපිය සෙනෙහස<br>මේ භවේ මිරිගුවක් වන් ඒ සෙනෙහස සොයා<br>යම් මුවැත්තියක සේ<br>පුරම් පාරම් මින් මතු හැම භවයෙම<br>අහිමි වන්නට එපා කිසි දිනෙක, කිසිකලෙක<br>,කිසිවකුට මාපිය සෙනෙහස. |
| 73 | දුක සතුට දැරිය යුත්තේ<br>මා විසින්මය<br>මන්ද යත්<br>කුඩා කල සිට<br>විදි දුක් කන්දරාව නිමා වි ඇති බව<br>මා සිතුවද<br>මගේ නිගමනය වැරදිය<br>මා දුක් විදින්නට ආරම්භ වන්නේ<br>දැන් බව විටෙක මට සිතේ<br>මා සිතන පතන දෙය බොහෝ දුරය<br>මා කුමක් කරන්නද<br>මේ අවස්ථාවේදි<br>මගේ තනියට මගේ පැනය<br>ඉදිරිපත් කරන්නට<br>මා ලග කිසිවෙකු නැත<br>කිසිදා හෝ මා එ දෙය ලබා ගත යුතුමය<br>මා මේ පැනය කාට කියන්නද<br>කවුරුත් එය පිලිගනිද<br>කම් නැත, ඒ සතුට මගේම බැවින්<br>දුක විදිය යුත්තේ මා විසින්මය<br>එයට වෙන කිසිවකු වගකිව යුතු නැත. |
| 74 | **අම්මා**<br>ආදරය නිසා ලොව එළිය කල පායන හිරු සඳු<br>දෙවෙනි නොවෙයි කවදත් නුඹ නම් මගේ<br>ලොවට නුඹේ තුරුලේ උණුසුම් මැද උතුරා යන සතුට<br>තවම දැනෙනවා අම්මේ නුඹේ ආදර පුතුට<br>නුඹ සෙවනේ රුව පෙන්වා සතුටින් අපි බැල්මේ<br>ආදරයක් තිබේ නුඹ හෙලනා බැල්මේ<br>කල ඇවිදින් නිතර වදියි නිසසල ගල් බැම්මේ<br>ඊට වඩා මගේ සිතට නුඹ එනවා අම්මේ<br>නුඹේ තුරුලේ රැඳි උණුසුම සොයම්ද මම<br>කොතැනේ සරසවියක වරම් ලබා නුඹ මා අද<br>පුදුම දුකකි ජිවිතය සෝ දුක් නැති නිම්මා<br>පව්පින් ගැන කියා දෙමින් අප නිසිමග දැම්මා<br>දනින් වැටි දෙපා වදිමි<br>මතු බවයෙත් නුඹ වේයන් මගෙ ආදර අම්මා . |
| 75 | **තාත්තා**<br>රවා මා දෙස බැලු<br>තැබූ පා වන රොදේ<br>රැගෙන මල් මාවතේ<br>තැබූ සෙනෙහස් මහිමේ<br>කියන් මට තාත්තේ<br>ගිලන් වී සියොලගම<br>වාරු නැති වු දිනේ<br>ලගින් සිටි සෙවනැල්ල<br>ඇගේ සෙනෙහස නොවෙද<br>කියන් මට තාත්තේ<br>රුවන් සරසවි දොරටු<br>පහන් දැල්වු දිනේ<br>නෙතු කඳුළු පැවසුවා<br>මගේ සෙනෙහස නොවැ<br>කියන් මට තාත්තේ<br>ඔබෙන් ලත් සැන්ඩියර්<br>මගෙන් ඔබ පා දොවේ<br>නිති ඔබ සනසන්න<br>මා ගෙදර එනතුරා,<br>ඉතින් පෙර මඟ බලා<br>ඉදින් මගෙ තාත්තේ. |
| 76 | පිපුණු ද සිට<br>මා මෙලොවේ<br>තව සුපිපෙන්නට<br>රැක ගත්තේ ඔබයි<br>ආදරයේ දෙනෙතින්<br>කරුණාවේ දැතපා<br>මිනිසත් බව මට දුන්නේ ඔබයි<br>දියුණුවේ මං පෙතේ<br>පෙන්වා දි<br>මට ලොකය දකින්නට<br>ඉඩදුන්නේ ඔබයි<br>බුදු රද අභියස<br>අතැගිලි එක්කර<br>සැමවිට පතන්නෙමි<br>වෙන්න මගෙ පියා වී<br>හැම වාරේ. |

| | |
|---|---|
| 77 | මේඝ වලාවක<br>නැගිලා හෙම්හිට<br>වැහි නැති කතරට<br>වහින්න ආසයි<br>ගිනියම්අව්වේ<br>දැවෙනා පොලොවට<br>මද පවනක් වී<br>හමන්න ආසයි<br>මල් නොපිපෙන<br>කටු අකුල් මානෙක<br>කුසුමක් සේ<br>සුපිපෙන්නම ආසයි<br>යුධබිම සැහැසිව<br>අවි ගැටෙනා විට<br>මෙන් දැහැනක් වී<br>හිඳින්න ආසයි . |
| 78 | හින් හිනා පිපුණාට මුවේ<br>නැත ආල හැඟුම සඟවා හිතේ<br>හින ලොවේ දුර යන්න එපා<br>ඉටුනොවන පැතුම් පුරවාන සිතින්<br>වාන් දමා පෙම වාවා ගනින්<br>උණු කඳුළු ගඟක් ගැලුවාට නෙතේ<br>පහන වගේ මම ඉන්න තැනේ<br>අමනාප නොවන් නුඹ මගේ නොවේ. |
| 79 | **මව්නි දයාබර**<br>සමහරක් දවසට හවසට<br>රැට හඳ වට කොට<br>තරුමල් පිපෙන කොට<br>නැගෙයි මගෙ සිහියට<br>මවුනි, ඔබේ ගුණ සුවඳ.......<br>දහස් ගව්වක් දුර<br>ඉමක් නොපෙනෙන ඈතක<br>සිටියත් මවුනි , මට<br>ඇසෙයි දෙසවනට<br>ඔබේමෘදු කටහඬට.....<br>එන්න හිතයි පියාඹා<br>ඔබව දැක ගන්නට<br>අනේ....! ඔබ තරමට<br>මගේ දිවිය සනහන්නට...<br>වෙහෙසනා දුක්බර මවක්<br>අහෝ මෙලොවෙම නැත<br>මව්නි , මගේ ආදර...... |
| 80 | **දයාබර නුඹ**<br>අමාවක අහසට<br>පෑ පුන් සඳකි නුඹ<br>ගන අඳුර දවාලන<br>නොනිමි පහනකි නුඹ<br>ඉඩෝරය දුරු කරන<br>සිහිල්වැහි බිඳුව නුඹ<br>වසන්තය කැන්දන<br>සුමුදු පිණි බිඳුව නුඹ<br>හදෙහි දුක නිවාලන<br>මුවේ හසරැල්ල නුඹ. |

| | |
|---|---|
| 81 | මෙය විටක<br>කියා ගන්න බැරි තරම්<br>සුවදින් යුත්<br>සුන්දර ලොකයකි<br>තවත් විටක<br>කුරිරු වූ අසුන්දර<br>ලොකයකි<br>කෙසේ නමුදු<br>ජිවිතය ජිවිත් කල හැක්කේ<br>මේලොව ආදරය සමගය |
| 82 | බෙර ,Music ,Announcing,Drama<br>නැටුම්සද්දේ රැව්දුන්නා සරසවි බිම මෙතුවක් කල්තිස්සේ<br>වෙහෙස වෙලා රැපුරා වීදි කරදර මැද්දේ<br>මතක නේද උගුර පවා සැගවුවා සද්දේ<br>නැටුනැටුම් මතකද නුඹ වැයූ බෙර හඬ මැද්දේ<br>නිදිමත ඇස නැති කරන්න මතකද ගත්<br>කල්කේ අමතක නෑ නේද එදා Dj වල<br>සද්දේ<br>එ මතකෙට නැගෙනා විට හදවත මගෙ<br>ගැස්සේ<br>දෙමාපියන් නෙතග කඳුළු පුරවා රැ<br>සිත්සේ<br>නුඹ දස්කම් ගත සැලුවා තුටු සගවා<br>විත්තේ<br>අලුත් යමක් හෙට කරන්න පැතුම් මවා<br>සිත්සේ<br>69 වන පරපුර ඈත<br>අද හසරැලි නැති<br>සියල්ලොම එකට සිටින<br>වාද බේද නැති<br>ගතට වඩා සවිබරවූ<br>දිරිය සිතක් ඇති<br>69ට ගම දෙනවා අපි. |
| 83 | වනු නොහැකි නම් ඔබට<br>උසම උස ෆන්නස් ගසක්<br>වනු මැන මිටියාවතක<br>පුංචිම පුංචි තුරු වදුලක්<br>හැබැයි හොඳම තුරු වදුලක්<br>ලොවෙහි කවුරු වුව කම් නැත<br>සිටිය යුත්තේ හොඳම විලසිනි<br>දිනුම පැරදුම මැන බැලනුයේ<br>ලොකුම නොව<br>හොඳම යන මිනුමෙනි. |
| 84 | සිප්හලෙන් ඉගෙන ගෙන<br>දැනුම දොතක් සිතට ගෙන<br>ගතින් පාසල හැර දමා<br>ගියත් විදුමවුනි මා<br>සිතින් පාසල හැරදමා<br>නොයන්නෙමි දිවිඇති තුරා<br>හොඳ සිරිත් මට කියාදි<br>නිසි මඟ යන්නට මඟ පහදා දි<br>කෙසේ තුති පුදම්ද මා. |

| | |
|---|---|
| 85 | ජිවිතයට අරුතක් එක් කල<br>වාසනාව ඔබයි මගේ........<br>අභියොගයක පෙරමුණ ගන්න<br>වලාගැබින් මිදි පායන පුන් සඳසේ<br>ගණ අඳුරෙන් මුදවාගෙන<br>මිණි පහනක් කල විල් කලාව ඔබයි<br>නියඟයට අසුවු<br>මුවැත්තියක සේ<br>ජල බිංදුවක් සොයාගෙන යන ගමනේ<br>දිය බිඳකින් මා පෝෂණය කර<br>ඉදිරි ගමන් මගේ<br>නැණ පහන් දැල් වුයේ ඔබයි....<br>මා කොනක සිටියත්<br>දසත ආලෝකය විහිදුවන්නට<br>මට මුල් අඩිතාලම වු මගේ විදු විමන<br>මගේ සිතින් ගිලිහි නොයේ..... |
| 86 | තනිකමට සින්න වුණු<br>මගේ යොවුන් ජිවිතේ<br>පැතුම් ගොන්නක් නොවි<br>සුසුමක්ව දැවටෙන්න<br>අඳුරු මගේ කුටිය තුල<br>තනි වුණත් සඳකිරණකදෝ<br>පැණියකු විලස පහන් එලි<br>දල්වන්න.<br>තුටු සිනා මල් තොදිසි<br>වාලුකා දිවි කතර<br>කඳුළු බින්දුවක් වෙලා<br>සිසිලසක් ලැබ දෙන්න<br>සිත හිරිගඩු පිපෙන<br>හුදෙකලා නිශාවේ<br>ගතට උණුසුම දැනෙන දුරක ලංවි ඉන්න මගේ<br>දෙනෙත් නිසල වි වැතිර ගත් හෝරාවේමගේ<br>කවියක් වෙන්න. |
| 87 | උපමා රූපක නැති<br>සදැස් නිසදැස් නැති<br>කවියක් නැතිමුත්<br>රිද්මයක් නැති<br>විටෙක දුක ඇතිවේ<br>විටෙක සැප ඇති වේ<br>එයම අනුප්‍රාසය වේ<br>කිම මේ සංධිය<br>පුරව අපර සන්ධි ගැලපු කල<br>සමාසයකි ජිවිතය. |
| 88 | දෑල නෙතුසලා හිමිහිට<br>කීව මෘදුකතා එදවසක<br>පාවගොස් හෙමිහිට<br>කොහෙද නැවතුනේ....<br>කප්පරක් පැතුම් එක්කර<br>ළය මතේ තබා හෙමිහිට<br>දුන්න පෙම්තිලිණ ඇතට<br>යන්නටම ගිහින් තිබුනට<br>බිංදුවක තරම් අහිතක්<br>නොවේ මගේ සිතේ..... |
| 89 | පහන් සිලක් වනු මැන<br>මුළු ලොව එලිය කරන<br>මඩ ගොහොරු මත පිපෙන<br>සියපතක් වනුමැන<br>මුළු ලොවක් සුවඳ කරන<br>අඳුරට එලියක්ව<br>කටු අකුල් මැද මලක්ව<br>පිබිදෙන්න හෙට ලොව<br>සුවදවත් කරන්නට. |

| | |
|---|---|
| 90 | දිරිය සවි දුන් මා හට<br>මේ ලොකය ජයගන්නට<br>බුදුන් නොදුටු මගේ ලොවේ<br>බුදු හිමියන් ඔබදෝ අම්මේ....<br>සඳ කිරණයි එලිය දුන්න<br>දිය දොතයි සිසිල දුන්න<br>බුදු හිමි ලෙස මෙත් පැතිරුන<br>විශාබාව ඔබදෝ අම්මේ...<br>හොඳ මගකට යන්න කියා<br>දුන් ඔවදන් තුරුලේ හොවා<br>අඳුරු මගෙහි මඟ පෙන්වු<br>පහන් සිසිල ඔබදෝ අම්මේ..... |
| 91 | ජිවිතයේ සැබෑ අරුත<br>සොයා යන ගමනේදි<br>නොයෙක් කම්කටොළු<br>බාධක පැමිණියද<br>ඉදිරියට ගමන්කල යුතුය<br>ඉඩෝරයෙන් පසු<br>නව පනක් ලබන තුරුලතා සේ<br>බාධකයක් ජය ගන්නෙකුගේ<br>සිතට දැනෙන සතුට අපමණය<br>අධ්‍යාපනයෙන් ජය ලැබිමට<br>එහි පන්නරයෙන් යා යුතුය<br>හිමිදිරියේ විකසිත වන<br>පුෂ්පයෝ මනහරය<br>එහි සුගන්දය දසත පැතිරේ<br>අධ්‍යාපනයෙන් ජය ලබන්නේ<br>සදාකල්හිම විකසිත වන්නාය<br>එහි සුවද සදා අමරණියයි . |
| 92 | මේ දිවි කතරේ හමුවු<br>එකම බොසත් ආත්මය ඔබයි ,<br>මේ වාලුකාවේ ඇති<br>එකම දිය විල ඔබයි<br>දයාබර මව්නි පියතුමනි .....<br>බිහිවුදා සිට මෙලොවට<br>කවා පොවා ඇති දැඩි කල මව<br>නෙතට නිදි නොලැබ<br>කුසට අහරක් නොමැතිව<br>ශිල්ප සතර ලැබ දෙන්නට<br>විදු මව් තුරුලට මම යොමුකර<br>දැගිලි ගත්තා ඔබ දෙදෙනා<br>තරණය කරන තුරු ශිල්ප තොටුපොල<br>ණය ගැතිය ඔබට මම<br>සෙනෙහසින් පෙවු කිරි කඳුලට<br>කාශ්ඨක අව්වේදි හෙලුදාබිඳුම<br>නුපුරුදු මාවතක පියමං කරන විට<br>චංචල වුණා මගේ සිත<br>ඔබේ සෙනෙහස සිහිවි<br>බුදුන් වදින මේ දැතින්<br>නමදින්නෙම් ඔබ දෙදෙනාගේ<br>පින්වත් පායුග.... |

| | |
|---|---|
| 93 | ඝණඳුරට පුං සදක් වෙලා<br>සිත් මලට රොන් පොදක් වෙලා<br>නෙත් දෙකට දිදුලන තරු කැටයක් වෙලා<br>මගේ හදට රෝස කුසුමක් පෙලා<br>පිපුණා නුඹ මහද පිපුනා<br>මල් සුවඳ ගුවන හැර නොයයි<br>වන බඹරු වන මල් සොයයි<br>හිම වතට මීදුම වගෙයි<br>ඔබේ සුවඳ මාහද රැඳෙයි<br>සියපතට හිරු කුමරු සේ<br>දෙව්ලොවට සුරවිමන සේ<br>සුරගනට රන් සළුව සේ<br>මා නෙතට රසඳුන ඔබයි. |
| 94 | ජිවිතය ජිවත් කරවන්නට<br>පැතුම් එක්කල<br>නුඹ ආදරය නම්<br>කිමැයි මට පසක් ගැන්විය<br>මහද ගැහෙන රාවය<br>හැඳින ගත් එකදු<br>සෙනෙහෙබර හඳවතක්<br>මා අඳුරු සිත් ගැබේ<br>ආලෝකමත් පහන් සිළුව වු නුඹ<br>ගත දැවටිහමා ආ<br>මුදු සිහිලැල් මඳ පවනයි<br>ආත්මය වසා පැතිරුන<br>විශ්වාසයේ සෙවනැල්ලයි මා<br>ජිවිතයේ පිදුම් ලද<br>ඔබේසෙනෙහස<br>දෙවොලක්මයි. |
| 95 | මා මළ පසු මගේ සොහොනේ<br>තනි වු කුසුමක් වි පිපෙන්න<br>මා මෙතුවක් හෙලු කඳුලැල්<br>පිණිබිඳු වී එහි රැඳෙන්න<br>දිවි ඇතිඳ නැති සෙනෙහස<br>එපා කඳුලු නැවති සිනහවකින්<br>මගේනමට සුභ පතන්න<br>මළ බෙර මල් වඩම්එපා<br>සුදුවැලි ඉසිරු මල් පාරේ<br>ඔබ විතරක් ඇවිත් යන්න.... |
| 96 | ක්ෂිතිජ ඉමේ ඈත කොනේ<br>පුංචිතරුව වී දිලෙන්න<br>අහස් ගඟේ ජල තලයේ<br>කුසුමක් වි පාව යන්න<br>පුංචි වලාකුලක් වෙලා<br>ගඟන තලය පිරී යන්න<br>තුන් ලෝකයෙම ජය අරගෙන<br>නුඹේ දෙපා වැලඳ ගන්න<br>පුංචි පුංචි හීන පොකුරු<br>බිංදු බිංදු ඇහිඳ ගන්න<br>සිහින් හිනා මන්දහාස<br>නිතර දෙතොල් අග රැඳෙන්න<br>අනාගතේ පුංචි පැතුම්<br>පුංචි සිතේ රඳව ගන්න<br>මම ආසයි ඔබේ හදේ<br>පොඩි කුටියක ලැගුම්ගන්න. |

| | |
|---|---|
| 97 | ජිවිතය ජිවත් කරවන්නට<br>පැතුම් එක්කල නුඹ<br>ආදරය නම් කිමැයි<br>මට පසක් ගැන්විය<br>මහද ගැහෙන රාවය<br>හැඳින ගත් එකදු<br>සෙනෙහෙබර හදවතක්<br>මා අඳුරු සිත් ගැබේ<br>ආලෝකමත් පහන් සිළුව වු නුඹ<br>ගත දැවටි හමා ආ<br>මුදු සිහිලැල් මඳ පවනයි<br>ආත්මය වසා පැතිරුන<br>විශ්වාසයේ සෙවනැල්ලයි<br>මා ජිවිතයේ පිදුම් ලද<br>ඔබේ සෙනෙහස<br>දෙවොලක්මයි.. |
| 98 | කෝපි මල් සිනා පිපෙනා<br>පින්නෙ මේ උදේ- ගුම්නද දී ගීත ගයයි<br>මේ මැයි මාලේ - සිත සුලං හමා ඇදෙන<br>අරුණලු යාමේ නැවුම් හැගුම් සිතට දැනේ<br>කිම මේ අරුමේ<br>සිතිවිලි සයුරෙහි රල පෙළ<br>නැගෙන යාමයේ<br>දකුනත සිරව් නැලවෙන<br>පන්හිඳ තුඩගේ<br>සමනල නටුවක ලියැවෙන<br>සොඳුරු ගීතයේ<br>ජිවිතයට අවැසි අකුරු<br>හතර ලියැවුණේ<br>කිසිදා නොදුටු ඔබ<br>නොසිතු නිමේෂයක<br>මා දෙනෙත් නිමේෂයක<br>එබී කියු ආදරය<br>මහද නැගි ප්‍රේමයයි ප්‍රථම. |
| 99 | ආදරණිය නගේ මලේ<br>ඇත්තටම අළුත්<br>වෙනසක්<br>දැනෙන දවසක්<br>අද.........<br>කෙච්චර සතුටක් ඇත්ද ඔය පුංචි හිත්<br>පොඩිවලට හා හා පුරා කියලා සරසවි බිමට<br>පිය නගන්න පුංචි බයක් නොදැනුනා මත්<br>නොවෙයි නේද?.....<br>ඒත් ඒ හැම දේකටම වඩා වඩා<br>අනාගතේ ගැන මහ හුගක් බලාපොරොත්තු<br>ජිවිතේ ගැන<br>මැවෙන මල් හීන මේ හැම දෙයක්ම නුඹේ<br>හිතේ කැකැරෙන බව දන්නවා අපි......<br>විශ්වාස කරන්න......<br>සතුට දොර ගලනවා අපේ හිත් වලත් නුඹ<br>තරමට<br>සමහරවීට ඊටත් වඩා ,මොකද අපේ පරපුරේ<br>ඊළඟ පුරුක වෙලා නුඹ අපි ළගට එන<br>නිසාවෙන්ම..... |
| 100 | සුන්දර වු සරසවි සහිනය බොඳව යා නොදි<br>නුඹසිත් මලෙන් සැබැවුවා නොවේ ද අද දිනේ<br>දනිමි අප....නව සිහින ගොන්නක්ම ඇති බව<br>නුඹ මොලොක් සිත් මලේ සැබෑ කර ගැන්මට<br>එම සිහින හෙට දිනේ දිරිය ගෙන පිය නගමු<br>සුන්දර මල් පියලි මෙන්ම අසුන්දර ගල්මුල්ද<br>රැඳුණු ඒ......<br>ජයමාවතේ ....... |

| | |
|---|---|
| 101 | එසේ වී නම් ආදරෙන් මට<br>සුරගෙන වලදිති නුඹ<br>බෙදාගත් බත් පත<br>පුළුවන්ද පුදන්නට<br>දොරකඩ පුලන්නෙකු<br>දුටු විට<br>නව කැළනි පාළම යට<br>ගඳගහන මුඩුක්කුවක<br>නාවර හෙළුපෙරාගත්<br>දරුවකුගේ හිසආදරෙන් අත ගා<br>"පුතේ " යැයි කියන්නට<br>හැකිනම් නුඹට<br>ඔහු ගැන අහිතක් නොහිතාම<br>මා නුඹට ආදරෙයි |
| 102 | **දඬුවම**<br>නුවන් යුග රතුවෙලා<br>දොඩමළුව සිටි ඔබ<br>දැන් සැවොම ගොළුවෙලා<br>අරුත් නැති ගීතයේ<br>පැතවම තනිවෙමු<br>සමාවක් අයැද ඔබ<br>දඬුවමක් හිමිවෙලා |
| 103 | **සදාදර පියාණෙනි**<br>සුදුගවුම පොඩිය ඇඳගෙන<br>අතේ එල්ලී ඔබේ<br>අකුරට පිය නැගුවා එදා<br>මතකයි අද මාගේ<br>එදා මෙදා තුර අපේ සෙනෙහස<br>මහ මෙරක් වී<br>ලොවක් දිනන්නට<br>දිනක් ඔබ හඩවා<br>මා පිය නැගුවෙමු<br>ගෙන්දගම් පොළවට<br>සැපක් යැයි සිතා<br>පියනැගුවෙමු එයට<br>එහෙත් සොදුරු පියාණෙනි<br>සැපතක් නොවුණත් මෙදා<br>වෙරගනිමි මම<br>එය ඔබට සැපතක් කරන්නට |
| 104 | **සුනංගු මිතුරාගේ සිතුවිල්ල**<br>කෙල්ලේ<br>නුඹට වගේම මටත් ආදරය කරන්න අතිතයක් තිබුනා<br>ඒ වගේම අනාගතයකුත් තියෙනවා<br>අපි හැමෝටම ඒ අනාගතය වටිනවා කෙල්ලේ<br>එම නිසාම සුනංගු වී පැමිණි සුනංගු<br>සිතුවිල්ලට තිතතියමු |

| | |
|---|---|
| 105 | සමුගනිමු බිඳකට<br>නෙතු හැරයන්න<br>නෙතු නොහඩන්න<br>හුරු වෙන්න<br>දිරි ගන්න කියලා<br>තව නොකියන්න<br>කාලය දෙන්න<br>කියන්න මා ළගම එතිලා<br>පෙම් දොරරින්න<br>දොරගුළු ලන්න<br>හැකිදෝ මගේම<br>ඔබ කියනා<br>බිය නොම වන්න<br>හැකි ඉවසන්න<br>නොවේදෝ මේ අපි<br>සැමට බදා<br>ඉතිරෙන්න<br>කඩතොළුවෙන්න<br>නොමදෙන්න නිති<br>සිහිකරලූ<br>තව කොදුරන්න<br>අහගෙන ඉන්න<br>සමුගන්න පෙර<br>ඔබව සිඹලා |
| 106 | I saw you<br>When you close you eyes<br>How win see you<br>It dear<br>You lovely face<br>You lovely smile too<br>Tried to remember<br>What are you thinking<br>With<br>How could do it when<br>Tired to remember you<br>My eyes also closed |

| | |
|---|---|
| 107 | ආවර්ජනාව<br>නෑ තවත් ආයවනා නම්<br>අකම්පිත නියොග මිස<br>මායිමක් නොහදුනන<br>දගකාර සිතක හිතුවක්කාරකම්<br>තේරුම් ගනිද<br>නුඹත් එවන් සඳකට<br>පෙම්වතියක් වීනම්<br>අහිංසක ආදරය<br>අවලම් ආලයක් කර<br>නුඹේ අර්ථ දැක්වීම<br>ඒ අරුත් මග නොදත්<br>නුඹ කළ කීදෑ හුදෙක්<br>ද්‍රොහි කමක්ම පමනක්<br>බව දැනගනීවී<br>නුඹට අසනිස වූ<br>අසරණ තත්වය<br>යලි පණලැබුදාට<br>නැවත සිතන්න<br>දයාබර හොදම මිතුරිය<br>දිනක් පහන්වෙයි<br>නුඹ වැරදි බව<br>සුරගනක් වී නමුත්<br>නුඹ සුරගනක් නම් නොවෙවී<br>චපල මිතුරියක් මිස<br>දැනගනි තොප<br>සාපලත් බව<br>නුඹ විරසක කළ සිත<br>වැලපුනදාට |
| 108 | දුක සතුට සිදුවන අරුමය<br>මද පවනේ මැවි මැවී<br>මවයි බෝ රූ රටා<br>මට දැනෙයි<br>මට සිතෙයි<br>මිරිගුවක් දෝ<br>මිතුරෙකුට හැකිවුනා<br>ළංවෙන්න ඔබ ළගට<br>මත්වෙලා ඔබේ රුවට<br>මා මිතුර<br>එලෙස ඔබ දන්නෑ<br>මටද එය වැටහුනේ<br>මා මිතුර අළුවෙලා<br>යනවිටදි ඔබතුලින්<br>ඇතත් තව සතිබොහෝ<br>මෙලේසටම යයි<br>නසීවි ඔබතුලින්<br>මා කෙලෙස උන් රකිම්<br>මා සිතද උන් සොරාගෙන ඇති<br><br>මට සිතේ මට දැනේ<br>නුඹද චපලස්ත්‍රියක් ලෙසද<br>දිලෙමින් බැබලෙමින්<br>වශිකුත සිත් අපේ<br>සොරාගෙන ආදරෙන්<br>දිනෙක යයි සිත දවා |
| 109 | නිදහසේ දුටිම්<br>සිත පැවත ආ නමුදු<br>කොටිවදය කෙළවරක් වූනා අද<br>සැමදෙසින් ඇසෙන්නේම ජය හඩය<br>පුදුම මල් මිටි අපේ විරුවනට<br>යාපනය කිළිනොච්චි මුලතිව්<br>තම නගර ග්‍රහනයට ගෙනතිබුනු<br>රුදුරු කොටි අවිබලය<br>නිරතුරු ඇසුනේ එහි එහි අපේ<br>දෙමළ ජනයාය<br>අරන්තලා පන්සලේ සිදුකලේ<br>ගාතනය<br>තිස්නමක් නැතිවුනා<br>අපේ දැයට<br>මෙහෙමවු ත්‍රස්තවාදින් රජකලේ<br>උතුරු දෙස<br>මේවා දෙස බලා සිටි දෙවිවරුන්<br>ඇත්දලොව වැසුවා කොටි ගොවියන්ගේ මාවිල් ආරුවද<br>එයම විය කොටියන්ගේ පළමුවන මෝඩකම<br>දුන්නා එම මෝඩකම නැවත සිදුනොකරන්න<br>ලොවම දනගැහුවේ අපේපුංචි ලක්මැණියට<br>පෙරට ආවේ අපේ සේනාදි රජවරුන්<br>ලැබුනා නිසි මග පෙනුම අපේ රජතුමාගෙන්<br>යෝධබල යොධ එඩි ඇතිවුනේ හදවතේ<br>එලෙසින්<br>අපේ සෙබලු පෙරට ගියේ දුටුගැමුනුවන්<br>එකා පිට එකා වැටුනි කොටිසෙබළ රණබිමෙන්<br>සුසි ඇතුළු ලොකුඋන්ට ලැබුන හොද<br>උන්ඩයෙන්<br>මහ කොටියා හැංගුනේ උණ්ඩයට බියවෙමින්<br>මලකුනත් හම්බවුනේ නච්චිකුඩා කලපුවෙන්<br>මහ කොටියා දැකගන්න ලැබුනු ඉඩ අපසැමට<br>සතුටු වුනා අපසැවොම බත් මස පැමිනි ලෙස<br>දන්සල්දී පිංකම්ද සිදුකලා රටතුලම<br>දෙමල මුස්ලිම් සිහල එක්වුනා අපිසැවොම<br>සුනුකලා කඳවුරක් 96 අගහාගේ<br>තිබුනි පිහිටුවා මුලතිව් අගනගරේ<br>එහිමහ ඝාතකයා සිටි දියවන්නාවේ<br>ඒක මළ දවසට වී අවසන් කොටිනැසුම |
| 110 | පුංචි බණ්ඩියක් පරෙන තුරු ඔබගේ<br>තනකිරි උරා බිව්වා ඔබ මව් තුරුලේ<br>අදදින තුරුණු විය ගෙවනා සරවියේ<br>විසදුම උරණු කියපන් නුඹ මිතුරේ<br>දහඩිය බිදුහෙලා වෙහෙසන පියතුමන්<br>උපයන මුදල් ඉගෙනිමට දුන් නමුත්<br>මතට දුමට යොදවනු කිම මෝඩයන්<br>නුඹට සමාවක් නැතපුතු මතු මතුත්<br>මල් සුරුට්ටු ගත් දැතින් කිසිදිනේ<br>වදිනු එපා මව්පිය පා දරුවනේ<br>මල් පොහොට්ටු බැතියෙන් ගෙන අතේ<br>පලයන් පන්සලට පව්කල මිතුරනේ |
| 111 | මිතුරු දම<br>මිතුරු නැති දවසට<br>අත්වැලක් විය කටුවැලක් යන මග<br>අහඹුවෙන් හමුවු දයාබර සොයුරනේ<br>යනමග අහඹුවෙන් හමුවන<br>සිනහවක් නොවේ මිතුදම<br>යන මග වරුවන්ට<br>මල්වැලක් වී නම් එයයි මිතුදම |

| | |
|---|---|
| 112 | සිහිනය සිහිනයක්ම පමණයි<br>වසන්තයේ එකදිනෙක<br>ඔබ හමුවුනා<br>එකට සිනාසී කෙලි කවට කම්කල<br>යුගයක්ද තිබුණා එදා<br>සිනා කෙලි අද<br>ඔබසමග ගෙවුසේ<br>අතිතය සිහිකර<br>සිහිනය සිහිනයක්ම<br>බව නොවැටහෙන<br>ඒ අකිකරු කිමට<br>ඔබ හැරගිය බව<br>කෙසේ පසන් කරමී දැරිය<br>නොවැටහෙන මට |
| 113 | **සමනලිය**<br>සුරතල් කතා බොහොමයි<br>කෙලි කවට අපමණයි<br>මුතුසිනා මණ බදියි<br>දග මල්ල නුඹ තමයි<br>හැමගේ පුංචි සුරතලි<br>අත්තම්මගේ මිණිබිරි<br>දඟකාර සුරතලි<br>ඒ තමයි සමනලි |
| 114 | වෙරළ හමුවෙන සයුරු රළ පෙළරැගෙන<br>යයි පොළොවෙන් බිඳක්<br>මල් හමුවන හැම මොහොතකදිම රැගෙන<br>යයි මහදෙන් එකක්<br>දැවෙන දැවෙන ගින්දර දවයි මුළුලොව<br>ඉතරි කරමින් මහ බරක්<br>මුණගැහෙන හැම මොහොතකදිම ඔබ<br>ඉතිරි කර යයි මහ දුකක් |
| 115 | නොලැබී රුව<br>රුවක් දුටුවෙමි හැර<br>හැඳින ගත්තෙමි<br>ඇය කවුද<br>කොහොමද කියා<br>කිමද මාසිත<br>නිතර ඇවෙත<br>ඇදි යන්නේ<br>නොදැනිමා<br><br>නෙතට සැනසුම<br>ගෙනෙන ඇඳසුන<br>නොදැක සිටින්නට<br>නොහැකිවා<br>සගව ගන්නේමි<br>මගේ සිතුවිලි<br>මගේ සොයුරියක<br>යැයි සිතා |
| 116 | **සඳ නුඹට**<br>ඇත තරුවක්ව දිලිසී ඉන්නට<br>හමන මද සුළඟකම ඔබ සුවද දවටන්න<br>භාවනාවක් වගේ සිත තුලින් ඔබ ඉන්න<br>වැරදිලාවත් හිතට පාළුවක් නොදැනෙන්න<br><br>හදේ ඇති හැමදේම සඳරුවට පවසන්න<br>සඳකියන කතාවෙන් සිතේ තනියම ඉන්න |

| | |
|---|---|
| 117 | ආදරණීය bnddy ට<br>ආගන්තුක සිතුවිල්ලක පැටලී<br>කල්පනා ලොවක අතරමංවී<br>සිත සොයන සැනසිසිල්ල ලබන්නට<br>දනිමි ඔබට හැකිබව ඉවසන්න<br>රැඳි ඉන්නට වරම් ලැබු මට<br>පතනා සිත් අහස් යට<br>දිරිදෙන්නම් නුඹට<br>සෙවනැල්ල වී ලගින් ඉඳ<br>කඳුළු උණුහුම සුව දැනුන මොහොතක<br>දැනෙවී හදවතට නුඹ මහ මෙරක් බව |

# රජරට සරසවිය

| ංකය | ගීතය |
|---|---|
| 1 | **වාසිටිය**<br>බිත්ති සතරකට කොටුනොවුනු<br>අඳුර නැති එළිය ඇති<br>නිදහසද උපරිමව ඇති<br>සිව් වසරක දඬුවමකි<br>පොදු සමාවක්වත් නැති<br>සිරගෙයකි |
| 2 | **පුනර්භවය**<br>නිදන්නම් ඔබ නමින්<br>ඒවි නම්<br>සැම රැයෙහිම සුන්දර<br>සිහිනයක්ම වත්<br>අහිමි වුව නුඹ<br>පතන්නට ඉඩක් නෑ<br>තව භවයක<br>විශ්වාසයක් නෑ මට<br>පුනර්භවයක් නැත |
| 28 | | ස්වර්ණමාලි නේවාසිකාගාරය | අහිමි පැතුමන්<br><br>මම ඔබට ප්‍රේමකරමි<br>ඔබ නොදන්නා මුත්<br>හැබැව එයයි<br>මා විශ්වාශ කරන්න<br>ඒ ඇයිදැයි<br>මගෙන් නොඅසන්න<br>මමත් නොදනිමි<br>සෙනෙහසේ අනන්තය පැතුවද<br>ඔබ මට අහිමි බව<br>දනිමි මම හොදටෝම<br>නමුදු ---<br>මම  ඔබට ප්‍රේම කරමි<br>ඒ මන්ද යත්<br>ඔබ මට ප්‍රේම නොකරන නිසාවෙනි |
| 29 | | හිල්ටන් ආපන ශාලාව | ශිෂයයෝ<br><br>අපේ අයිතිය උදුර ගන්නට<br>එන එවුන් දැන ගනිවුනේ<br>අපේ ශක්තිය අහස සිඹ යයි<br>බලම් අම්නිස් ගති ඇත්තෝ |

| | | | |
|---|---|---|---|
| 30 | | | Jony ජොනි<br>වරෙකට මම A/L කරා<br>නොසිතූ අයුරින් campas ආවා<br>වරෙක මම මහණ උණා<br>නොසිතූ අයුරින් සිවුරත් ඇරියා<br>වරෙක මම බාබුල් කෑවා<br>බුලත් අතුරුපස සිතා<br>සත්‍ය මට තේරුනා<br>බිබිලේ කෙල්ලක් Set උනා |
| 31 | 1 | Kannatiya Hostel | බක්කරේ බුන්නා වරෙන් පිට්ටු<br>ගන්න ආතල් Dramak Rap කරන්නට<br>දෙන්න ආතල් එකක්<br>කියපං පිට්ටු බොරුවක් |
| 32 | | Kannatiya Hostel | බිදුණුදායි දැනුනේ ප්‍රේමයේ අරුම<br>රැඳුණ නෙත් කඳුළු රුරා වැටුණාම<br>සැලුනු සිත අමතා කියනු කිම<br>පිරුණු දුක් පොදිය ගුලිකරමි මම |
| 33 | | පණ්ඩුල නේවාසිකාගාරය | අපේ දහඩිය බිම වැටෙන්නේ<br>හෙට උපදින සරුබිම රකින්නයි<br>අපේ ඇස්වල කඳුළු නැත්තේ<br>දිනා ලොව හෙට හිනා වෙන්නයි |
| 34 | | අමරදේව ශාලාව | උපාධිය<br><br>ගොඩක් වියදම් කරා<br>හුගක් මහන්සි උනා<br>Account Zero උනා<br>මම උපාධි ගත්තා<br>ඒත්<br>මේකද මගේ උරුමේ |
| 35 | 1 | Hunting bench | සදාචාරයෙන් තොර ඉගෙනීම<br>වටී සුනඛ අසුචි තරමට<br>කරන්නේ නම් පෙම් කරපව්<br>වෙනත් ඇසකට නොපෙනෙන<br>ඉසව්වක |

| | | | |
|---|---|---|---|
| 36 | | අනුලාදේවි නේවාසිකාගාරය | තරුණියකගේ ඉරණම<br><br>සිහිල් පවන් පොදක් - මුළු ගතපුරාම වෙලි<br>ඈතට හමා යන්නේ - නිමක් නැති සයුරු ඉමේ<br>නෙත් කොනට යාකරමින් - මැකි නොමැකි යන<br>නෞකාවක් ලෙසම - තව මොහොතකින්<br>පිවිතය ඇගේ ---    බිලිවනු ඇත<br>තත්පරයක් ගතවිය<br>සියල්ලෝම නිහඬය<br>සංසාරය නැමැති<br>ශ්‍රේෂ්ඨාධිකරනය ඉදිරියේ<br>සියල්ලන්ගේ දෙනෙත් වසා<br>අවාසනාවන්ත කන්‍යාවිය<br>ගැහැණියක් වුවාය------ |
| 37 | | අනුලාදේවි නේවාසිකාගාරය | අහම්බෙන් හමුවෙච්චි දවසක<br>සිනාවක්වත් නොදි පිට වුණ<br>දුකටවත් හිත උතුරා ගිය<br>නුඹ මැකුණා නම්-----<br>දැනුත් නන්නාදුනන තරමට<br>හමුවුනත් දුක බිඳක් නොහිතම<br>පාඩුවේවත් ඉන්න හැකි අපි<br>අපට හිමි නැති නම් ---- |
| 38 | | අනුලාදේවි නේවාසිකාගාරය | හිතුනා නම්<br><br>බොහොම කලකට පෙරක ඇවිලුණ<br>මගේ හිත කියවලා යන්නට<br>නොවේ තව දුක කියන්නටවත්<br>එන්න හිතුනා නම්---<br>තවත් එකම එක වරක් නුඹ දැක<br>ඇස්වලින් පිටමං කරන්නට<br>දැනුත් මගේ හිත හදාගෙන මට<br>මියෙනු හැකි එහෙනම් |

| | | | |
|---|---|---|---|
| 39 | | අනුලාදේවි නේවාසිකාගාරය | උනානම්<br><br>නුඹ කවියක් සේ<br>ගොතන්නද පද වැල් කෙසේ<br>නුඹ සිතුවමක් සේ<br>අඳින්නද රිදියෙන් කල සේලයක් සේ කෙසේ<br>පෙර දිනකදි<br>නුඹ අහිම්වුනේ  මට විතරක්ම නම්<br>කුමක් කරන්නද බලාහිඳුනු හැර මෙසේ |
| 40 | | අනුලාදේවි නේවාසිකාගාරය | පරව ගිය පෙම<br>බිඳුණු දායි දැනුනේ ප්‍රේමයේ  අරුම<br>රැඳුණු නෙත් කඳුළු රැරා  වැටුනාම<br>සැලුණු සිත අමතා කියනු  කිම<br>පිරුනු දුක් පොදිය ගුලි කරමී  මම<br>සිනා රැඳුණ මුව මුකුලිත  වුනාදෝ<br>සිනා පිරුන නෙත කඳුලින් බොද  කලාදෝ<br>වසා සිටින දුක කවදා  ඒදෝ<br>සඳා රැඳුන නුඹ සෙනෙහේ  මියෙම්දෝ<br><br>අමාසඳකි යැයි සිතුවේ  ඇයිද<br>සඳා රැදෙන ලෙස පැමිණි  නිසාද<br>වලාරොදක පාවී ඉගිල  ගියාද<br>සඳා හඬන ලෙස මට මුලා  කලාද |
| 41 | 1 | කන්නට්ටිය නේවාසිකාගාරය | කරඹ මල් කැකුලි<br>කරඹ මල් කැකුලි<br>නිසල හඳ සසල කළ<br>මගේ සිහින කුමාරි<br>මගේ සිහින කුමාරි |
| 42 | 1 | කන්නට්ටිය නේවාසිකාගාරය | අමාවක නොවී මා හදෙහි<br>වලාවසා රැස් විහිදුවනා<br>සුදු සඳ වී පායන් ඒ<br>සොඳුරු නිසයුරුව නුඹයි මගේ |
| 43 | | Reading Hall | බිඳුනු තැලුනු සිත<br>වැරදුන මාවත<br>අවියක් කරගෙන නොතලන්න මාසිත---<br>ලබමින් කුරිරු සතුටක්--- |

| | | | |
|---|---|---|---|
| 44 | 1 | Reading Holl | දියකර හරිම් කදුලකින්<br>පාකර හරිම් සුසුමින්<br>නැගෙන ආවේගය<br>සිදුවිය හැකි නිසා අවැඩක් |
| 45 | | Reading Holl | නිදහස<br>ඉක්ම ගොස් සියවසක් අඩ<br>නිදහස ලැබි අප වෙත<br>වටී මදකට සිතා බලනුව<br>පැතූ ලෙස නිදහස<br>පවතිද අද දෙරන තුල |
| 46 | | Reading Holl | නව මාවත<br>ජිවිතේ තණී වුණා යැයි සිතුණෝ<br>පලමු වරටයි<br>මා තනිකර සරසවි බිමේ<br>ඔබ ගිය විටයි<br>කාටත් හොරා කදුළු සළමින්<br>හැඩුවා මම අම්මේ<br>මා මෙහි තනිවුණ මුල් දිනයේ<br>නොනිම් දුක් දැනුනා අම්මේ<br><br>දින සති මාස ගෙවි ගියා<br>හිතේ දුක ටිකෙන් ටික අඩුවිලා<br>සොයුරු දමින් අප ලං වෙලා<br>පොතේ කදුළු මැකි මුවේ සිනා මැවුනා |
| 47 | | | N.G.O<br>නොමිල සම්පත් ගහනව<br>ඇති මගේ පිංකාරිය<br>ර්නියා සංවර්ධනය<br>ගතියි බද්දට භුමියේ ප්‍රාණය<br>වෙසින් එන මිතුරන්<br>හදුනා ගනිවු ඔවුහුය<br>ජාතියේ නියම හතුරන් |

| | | | |
|---|---|---|---|
| 48 | 1 | Hillton ආපන ශාලාව | බිමේ උරුම කරුවෝ<br>කැකුළුය අපේ දරුවෝ<br>බිදි වෙන්ව ගිය<br>ශාපලත් දේශයක<br>කේසේ දකිනුව<br>හෙටට පායන<br>නැවුම් අරුණෑළු |
| 49 | 1 | Hillton ආපන ශාලාව | ශිෂ්‍යයෝ<br>අපේ අයිතිය උදුරා ගන්නට<br>එන එවුන් දැන ගනිවුනේ ---<br>අපේ ශක්තිය අහස සිඹ යයි<br>බලම් අම්නිස් ගති ඇත්තෝ--- |
| 50 | 1 | පණ්ඩුල නේවාසිකාගාරය | එක්වන්න<br>අපේ අත්වල හිතේ හයියෙන්<br>මේ රටම හෙට අප ගොඩනගන්නේ<br>අපේ හිත්වල නැගෙන ගිනිසිළු<br>නොනිවේව් යුක්තිය රැව්දෙන තුරාවට<br>අපේ කටහඬ බොල්නොවේ දැන්<br>රැව් දෙන්නේ ඉල්ලා යුක්තියයි |
| 51 | | ශිෂ්‍යය සංගමය Hillton ආපන ශාලාව | බිමේ උරුමකරුවෝ<br>කැකුළුය අපේ දරුවෝ<br>බිදි වෙන්ව ගිය<br>ශාපලත් දේශයට<br>කේසේ දකිනුව<br>හෙටට පායන<br>නවුම් අරුණෑළු---- |
| 52 | 1 | ශිෂ්‍යය සංගමය | නිදහස<br>( ලාභයට තළු මරණ අකුරුහතර)<br>ඉක්මගොස් සියවසක් අඩ<br>නිදහස ලැබි අප වෙත<br>වටී මදකට සිතා බලනුව<br>පැතු ලෙස නිදහස<br>පවතිද අද දෙරන තුල |

| | | | |
|---|---|---|---|
| 53 | | ශිෂ්‍ය සංගමය | බලාපියව්<br>නිදහස් ස්වාධින ගවේශණශිලි<br>මේක උත්තම සමාජයක්<br>සහෝදරත්වය සහෝදරත්වය<br>මේක නියම පරාදිසයක් |
| 54 | | ශිෂ්‍ය සංගමය | මහපොළ බසරි - විනෝද චාරිකා මදුවිත<br>සංඛ්‍යාව නිවාඩු දින - අවරගිර හන්ටින්<br>1st class 2nd class - ඕවා මොටද මොන පිස්සුද<br>අරමුණ target – ඒ මොකටද ජොලිය නැතිව |
| 55 | | ශිෂ්‍ය සංගමය | සත්‍යය<br><br>තුන්වසරක අවසානය - සිහිනයක් පියවි ලොවට<br>ගොයින් ඔවුන් එක - අතිත ආවර්ජනය<br>හන්ටින් යාම - පතිවත<br>තරුණ විය අහවරයි - ඩව්රිය<br>බොදු ගොවි උපාධි ධාරිණි - දිනමින මංගල යෝජනා<br>මගේ කෙරුම් අහවරයි - මාතුපාදන් නමාමී--- |
| 56 | | ශිෂ්‍ය සංගමය | අම්බලම<br><br>News පත්තර සංවාදය - කොණ්ඩේ බැදපු චින්නුන්ට<br>ෆිල්ම් මැච් social night - නිමයි ජොලිහලෝ<br>දකින්නනට ආසයි පුතේ - අම්මගේ ලියමනක්<br>කෝ එත් විවේකය - මට මෙහේ හරි හරි වැඩ |
| 57 | | ශිෂ්‍ය සංගමය | විවේකය<br><br>අවිවේකය පලමු පරම සත්‍යය වේ<br>රෑ නිදියන තුරු දවස පුරාම<br>සිතේ සෑම විටම ඇත්තේ අවිවේකයයි<br>සිහිය ඇතිතුරු<br>සිතේ ඇත්තේ අවිවේකයයි<br>සිහිය කීවත් අවිවේකය කීවත්<br>එකම එක දේමයි |

| | | | |
|---|---|---|---|
| 58 | | Reading Hall | අහිමි ආදරය<br><br>සිත පුරා විසුරුණු<br>ලබැඳි ඔබේ ආදරය<br>දිවියේ වරින්වර<br>මා හදේ ලැගුම් ගෙන<br>කවුළු දොර ඇත් කර<br>සඳ රැස් ගලන විට<br>දෙනෙතේ කඳුලින් පිරුණු<br>නුඹේවත සිහිවෙන්නට<br>සිත පුරා හිනැහෙන්<br>පැතුම් මැව්වේ නුඹයි--<br>ආදරය හදවතේ<br>මොදුකෙරුවේ නුඹයි<br>හඳවතට බිඳෙන්නට<br>සුසුම් දුන්නේ නුඹයි<br>ඒත් ඒ ආදරය<br>විසඳුවේ නුඹ නොවෙයි. |

| | | | |
|---|---|---|---|
| 59 | | Reading Hall | My secret love<br><br>I’m  a one moment<br>I talk about you<br>With my treads<br>I don’t know what<br>Happens to me<br>My hart days<br>Exprdicuce<br>I nearer tilled<br>Like  love<br>I cant talk<br>With you us editor<br>I wont to express my<br>Tending in torrent are you boot<br>I know t preachy<br>Talk you<br>I know are thing really<br>I love   you so much<br>I wont to keep my love<br>Anted you understand<br>My love    you thru love<br>I leap you is my what<br>Heart untidy the day<br>Idée |
| 60 | 1 | හිල්ටන් | සිව් වසර පස්වසර වී<br>මම කවි ලියන කිව්දා<br>පෙම වඩා විඳවනා බොහෝ<br>සිව් වසර පස් වසරක්ව<br>ගිය දිනෙක නුඹේ කිව්දා<br>රැලි වැටුනු මගේ මුව<br>සිප ගනිව්ද? සෙමින්<br>ලියු කවි හැම විසිකර<br>තව පෙම් කවියක් ලියාවිදෙ? |

| | | | |
|---|---|---|---|
| 61 | 1 | පණ්ඩුල නේවාසිකාගාරය | නුඹ මටම විතරයි ආදරේ<br><br>නුඹ කොතරම් දුරද<br>මා වෙතින්<br>නුඹ කොතරම් සුන්දරද<br>මට<br>නුඹ කොතරම් රළුද<br>වෙරළේ සිටිය වුනට<br>මට පසක් විය<br>නුඹට මම ආදරය කරනවාට වඩා<br>මට ආදරය කරන බවට---<br>නිදා සිටි මා කැඳවා<br>මා ආ බව කාමරේ<br>පුරාවට එහේ මෙහේ යන<br>අපුරුවට----<br>මුහුද ගෙදර ඇවිත්<br>මම බලන්න! |
| 62 | | Reading Hall | හෙට දිනෙක<br><br>කර්කශව ඉරි තැළුනු<br>කතරක<br>සංසිදුවන්න<br>දැනුම පමනක්ම නොව<br>මිනිස්කමේ<br>සා පිපාසාව<br>සොයා ආවෙමි<br>කෙම් බිමක්<br>මටම පමණක් නොවේ<br>අවැසිය<br>සංසිදුවන්නට<br>සුවහසක් පිපාසිතයන්<br>හෙට දිනෙක-- |

| | | | |
|---|---|---|---|
| 63 | | Reading Hall | ප්‍රතිඵලය<br><br>කුස වැඩුණු රන් බිජුව<br>කිරි පොෂණයෙන් වැඩුණි<br>මුල අගද සරුව<br>අතු පතර විහිදමින්<br>නොවුනි කිසි හානියක්<br>දෙවුර නිදිනැතිව<br>මහ ගසක් වී<br>සේවනලත් ඒ<br>ගසෙන් නෑ තවම<br>සැරයටි<br>දෙකක්-- |
| 64 | | Reading Hall | Death<br>Death a word makes people afraid but comes to all of us To sweep us all from this world most people do not think about this word and and live us if never to go to death .<br>They cry with fear when it's near warning about the wealth they name collected , but , doesn't come with them<br>People cry one or two days to show their sorrow to the world,<br>Some people name no one to cry who lived along,<br>At the same time some people are happy about their enemy's death,<br>And celebrate eating oil cakes all bodies are buried in the earth or brut.<br>Because there is nothing to take and remain only the history of them<br>The memories of history grandly fable day by the day.<br>As the bodies make soil to the earth, if you can return to this world after hundred and twenty years.<br>There will be no one who lives today<br>All mill have gone to death. |

| | | | |
|---|---|---|---|
| 65 | | Reading Hall | මීලින පැතුම<br>දින ගනනක් සිනා රැල්ලක්<br>හදවතින් පිට නොකල නිසාදෝ<br>සිනාවට කැදර කමක් සිති<br>දෙතොල් ලෙල දුන්නත්<br>කෙසේ සිනාසෙන්නද<br>හදවතින් ඔහු----<br>අතිතය මතකයක් නිරායාසයෙන්<br>සිත තුලට විත්<br>සුපුරුදු දුක මුසු කලත්<br>දුක සැපක් සේ සලකා<br>කල්පනා ලොවෙහි<br>අදුරේ අතපත ගාන්නක් මෙන්<br>සතුට සෙව්වත්<br>නොලැබුනේ------<br>තෙවසරකට පෙර පියවුනු නෙත්<br>අවදිකල නොහැකි බැවින්<br>ආදරයේ අම්හිරිම වේදනාවක්<br>දරා සිටින ඔහුට<br>කරන්නට දෙයක් අවසානයේ නැතිනිසා<br>කෙරුවෙමි<br>වේවා : ඔබ මගේම මතු භවයේ------ |
| 66 | 1 | Reading Hall | අමා  සඳක් යැයි සිතුවේ ඇයි  ද<br>සදා රැදෙන ලෙස පැමිණි නිසා  ද<br>වලාරොදක පාවී ඉහල ගියා  ද<br>සදා හඩන ලෙස මංමුලා කලා  ද |
| 67 | | Reading Hall | ප්‍රාර්ථනා<br><br>හිරු සදු මිය ගිය<br>මළවුන් ලොකයේ<br>යලි හමුවෙලා අපි<br>දොනත් අයාගෙන<br>ලංව බලා ඉමු<br>සමුගෙන යන්න නොදි---- |

| | | | |
|---|---|---|---|
| 68 | 1 | Reading Hall | ප්‍රාර්ථනා<br><br>අහසට උසට බැදි<br>පැතුම් මාලිගා<br>නටඹුන් වී ගියේ අපේ කථාවෙයි<br>යලි හමුවෙන විට<br>දැත වෙලා ඉමු<br>සමුගෙන යන්න නොදි |
| 69 | | Reading Hall | සදාදර අම්මා<br><br>ගිරි හිස සුළගින් නොනැවෙන<br>සියපත සුවදින් ඔප කල<br>දෙරණත එලිකල රණගිය නුඹය---<br>වාවනු නොහැකිව ජිවිතයේ තනිකම මා<br>හඩනා විට සුළගින් නුඹ සෙනෙහස<br>දැනුනා අම්මේ |
| 70 | | Reading Hall | සදාදර පියානන්ට<br><br>දුටුදා මෙලොව ආලොකය<br>දැනුනා හදට ඔබේ උණුසුම<br>හදුනන්නෙම් ඔබේ සෙනෙහස<br>සිමා මායිම් නොපෙනෙනා<br>ඔබගෙන් ලැබුවෙම් පන්නර<br>ජයගන්නට ජිවිතය<br>ඔබගේ සිත ඇදි ශක්තිය<br>පහන් සිලක් විය මාහට----<br>ඔබ හෙලනා දහදිය බිදු<br>කදුලැල්ලකි මගේ නෙතට<br>ඔබගෙන් ලද රැකවරණය<br>රජ කිරුළකි මගේ හිසට----<br>ඉටුකරමින් ඔබේ පැතුමන්<br>ලැබ දෙන්නම් හසරැල්ලක්<br>දෙපානැමැද අද ඔබගේ<br>වන්නෙම් මතු දින හරනක්<br>දිනනා මුත් ලොව මතු දින<br>රජිදා ඔබයි මගේ ලෝකේම<br>ලැබෙනා හැම තුටු පැසසුම්<br>අප්පච්චියේ හිමි ඔබටයි---- |

| | | | |
|---|---|---|---|
| 71 | 1 | Reading Hall | රහස් සෙනෙහස<br><br>නෙතු පියන් වැසෙන ඇසිල්ලේ<br>රැඳි ඉන්න ඔබ සිහිනේ<br>සඳ වඩින අහසේ<br>තරු බිඳක් වත් එන්න නිබඳේ -----<br>මල් පැතුම් පුරවාගෙන එදා<br>හද පතුලේන්ම පුද දුන් නිසා<br>සසර ගමනක පුරා<br>හිනැහෙන්න හමු වූ දිනෙක<br>සුපුරුදු ලෙසින් සදා ---- |
| 72 | 1 | Reading Hall | අම්මා<br><br>ගීයක පදවැල ස්වරයක පැටලී<br>හදවතට ගයයි<br>ජිවිතය සිහිනය නෙතු අග විහිරෙන විට<br>එක්කල නින්ද සුවය අදුරේ-----<br>ඇවිදින විට හැපි හැපි අතගා<br>පහන් සිලක් වී නුඹ පිපුනා අම්මේ-----<br>මා වෙත පියමැන මා යන කල ඇ<br>නුඹ තනිවයි මගේ අම්මේ |

| | | | |
|---|---|---|---|
| 73 | | Reading Hall | **නුඹ මට අමිලයි**<br><br>ලේ කිරි දහරක්<br>අමිල සෙනෙහසින්<br>පණ පෝවාලා<br>ලෝකයට මා<br>පුබුදු කල අම්මේ---<br>නොමග මාවතේ<br>යන්න සිතුනු දා<br>අමිල නුඹේ වදනයි<br>මා සිත් මඩල<br>වෙලා උන්නේ<br>අම්මේ-------<br>ගව් ගනන් සිත දුර ගියා<br>නුඹේ මායිම<br>මට හමුවුනේ නෑ<br>මට සිතා ගන්නටවත්<br>බැරි වුණා<br>අම්මේ ------<br>පුදන්නට නුඹ හට<br>මලක් මාසෙව්වා<br>මිහි පිටට කොයින්දෝ<br>හදේ පිපුණු නිර්ව්‍යජ පිවිතුරු<br>සෙනෙහසේ මල් කැකුල මා<br>දොතින් නුඹට පිදුවා<br>අම්මේ---- |

| | | | |
|---|---|---|---|
| 74 | | Reading Hall | හැමදාම ඉතිං මං<br><br>සංසාරේ පුරුද්දට<br>මා ළගට ලං වෙලා<br>සොදුරු කවි කම් කියා<br>හිත සැනසුවේ නුඹයි ----<br>ජිවිතේ වුණු වැරදි<br>නුඹ ලගට යාකරලා<br>ඔය සිතට දඩුවමක්<br>හැමදාම දුන්නේ මමයි-----<br>හද උපන් පැතුම් මල්<br>මිලින වන්නට නොදි<br>අදුර බිද එලිය දී<br>නිශායම වුණේ නුඹයි----<br>මං මුලා වූ දිවිය<br>නුඹ ලගින් කැපකරලා<br>හිත ලගින් ආදරෙන්<br>හැමදාම ඉදිම් මං---- |
| 75 | | Reading Hall | මරතොඩි රටා<br><br>සීත ගණදුරට නුදුරින්<br>රාම් සාන් සදවතිය ආවඩන<br>මැදියම් නිශාචර සේ------<br>පැල දොර අභියසින්<br>දෑ පියන් අග වත්තු කල<br>උණුහුම කැටිව----<br><br>ඉදින් ;<br><br>නීල නෙතගින් සඳවතියේ<br>පෙම් නද කැටිකර<br>රහසේ විදි අනුහස<br>නින්නාද දෙන හදින්<br>සන්තානය පුරාවට ඉරිතැලිගිය<br>සුසාන මායිමේ<br>ඔප මට්ටම් වුයේද නොදැනිමම<br>අසම්මතයක් කැටිව<br>නුහුරු බසින් -----<br>නුහුරු හැගුමකට----- |

| | | | |
|---|---|---|---|
| 76 | | Reading Hall | සදාදර මැණියනි<br><br>අළුයම වැටෙන ළහිරු කිරනින්<br>දිනය එකාලෝක වුයේ<br>ඉමක් නොපෙනෙන ඔබේ සෙනෙහෙන්<br>මගේ ජිවය අවදිවුයේ<br>අනන්ත වු හැඩ සුළගින්<br>නොසැලෙන පර්වතයක් සේ<br>ඔබ විදි ගින්දර දහදිය<br>ගැඹුරුම සාගරය වගේ<br>අපමණ ඔබේ ගුණ මහිමෙන්<br>ආත්ම ගනනක් ගෙවුනේ<br>ගී පද ගෙතුමට බැරි වී<br>මා නෙතු තෙත් වී යන්නේ<br>වන්දි ගෙවන්නට කිසි දින<br>මට නම් බැරි බව දන්නේ<br>ජිවිතේම ඔබ පාමුල තබමින්<br>ඔබේ දෙපා නමදිම් අම්මේ |
| 77 | | Reading Hall | අම්මා<br><br>වැටි වැටි නැගිටින්නට<br>වෙර දරන කල මා නෙත නිදි වැරුවේ<br>නුඹයි-----<br>ඒ සවියෙන් මා හෙට දිනනා තුරු<br>යලි යලි නෙත වෙහෙසුවෙත් නුඹයි----<br>නුඹ බුදු වු දවසක මා<br>සසරෙන් එතෙරට නිවන් දකියි---- |

| | | | |
|---|---|---|---|
| 78 | | Pandula Hostal | අපේ ජිවිතේ රිදම් එක කාලකන්නියි ---- අම්මයි අප්පච්චියි අවිකාස්ටකේ කොටලා හම්බ කරපු හැම සතේම වියදම් කරේ අපේ අධ්‍යාපනයට ---- උසස් පෙළ උසස් ලෙස සමත් උනත්--- රේස් එකෙදි අපි finish කලේ prize නැතිව --- ඊට පස්සේ අපේ ජිවිතයට රිංගුවෙ කාලකන්නිකම, පරාජිත බව, හැම වේලාවෙම ඔළුවට ආවේ වේ සමාජයේ පය ගහලා මනුෂ්‍යයෙක් වාගේ ඉන්නේ කොහොමද කියලා---- හවසට joint එකක් ගහලා කපුගේගේ සිංදුවක් කියලා ---- ඇගේ ලේ සිතල කරගන්න එක අපිට සිරියස්.<br>වෙලාවකට හිතෙනවා Army<br>එකට යන්න. Army එකට<br>ගිහිල්ලා T-56 උස්සාගෙන<br>කමිසේ අත්දෙක උරගාවට<br>නවලා. හඬුගද ගහන කලිසමක්<br>බඩ මැද්දට ඇදලා මේ ජිවිතේ<br>රිදම් එක වෙනස් කරන්න<br>හිතෙනවා----<br>යුධ පිටියේ ඉදලා ගමට ඇවිල්ලා යාළුවන් එක්ක Army වචන දාලා කථා කරලා වීරයෙක් වෙන්නත් පුළුවන්. මේ Hostal<br>වල ගෙවන කාලකන්නි රිදම් එකට වඩා Army එක මරු කියලා දැන් දැන් හිතෙනවා ----<br>අනික මම මැරුණාම ජාතියේ වීරයෙක් වෙනවා, අවමංගල්‍යයට රාජ්‍යය ගෞරවයත් හම්බවෙනවා .ඒ විතරදක්ද ලොකු වන්දිමුදලක් ගෙදරට දෙනවා එකෙත් මටත් වඩා වටින අත් ට්‍රැක්ටරයක් ගත්තාම අපේ |
| 79 | | Pandula Hostal | මදහස<br>සෙනෙහස පුරන හදවත<br>ලග නිසසලය<br>අම්හිරි කටුක සිතුවිලි<br>කැල විරසකය<br>දෙනෙතේ කඳුළු බිඳු තවමත්<br>විරසකය<br>වෙනසක් නොමැත ඒ දුටු රුව මදහසය<br>සෙනෙහස සතුට රැදි<br>හද ලග සෙමිනසය<br>විරහව කඳුල රැදි හද<br>ලග දුක්බලය<br>සැනසුම විටක<br>හඬවන විට නෙත් බරය<br>වෙනසක් නොමැත ඒ දුටු රුව<br>මදහසය!! |

| | | | |
|---|---|---|---|
| 80 | 1 | Hilton Canting | සිතුවිල්ලක්<br>පිබිදුනාවු සිතින්<br>අනන්ත සිහින දකිමින්<br>වියනැගි පින්බිම<br>සුන්දරයි දස අතින්<br>නිදහසේ නිදන්නට<br>ඉඩ ලැබුන දින අදයි<br>එකාමෙන් සිතන්නට<br>එකම සිහිනය දකින්නට<br>කවදා ලැබෙව්ද<br>නොආවනම් පුණ්‍ය භූමියට<br>මේ තරම් ලෙන්ගතුව<br>පරපුරක් හදන්නට<br>ජිවිතය දකින්නට<br>කම්කටොලු දරන්නම<br>හැකිවේද ඔබ නැතිව----<br>දිනෙන ලොව ජයගන්න<br>එකම එක මග යන්න<br>සපතවෙම් මා ඔබට<br>මා ලබැදි සොහොයුරනි---- |

| | | | |
|---|---|---|---|
| 81 | | Hilton Canting | කොටුකාර පැතුමන<br><br>පාලකයින්ට භීෂණයක් වූ<br>දෙමාපියන්ට සිරගෙයක් වූ<br>නවකයන්ට බියකරු සිහිනයක් වූ<br>කිමන්ද මේ නවක වදය<br>සිහිනය අවියක් වුවද<br>සිරගෙය කොටු පවුරක් වුවද<br>සිහිනය සොදුරු මතකයක් වේ<br>නවකයින් හට කිම<br>නොදන්නා භූමියක<br>නොදන්නා වුන් අතර<br>සොදුරු සෙනෙහස වඩන<br>සොදුරු එනමුදු කටුක<br>පාඩමකි එය<br>සිව් වසරක් පුරාවට<br>ජිවිතය ගෙවන්නට<br>ලබන්නා වූ<br>අභිසෙස<br>මිහිරි නොවෙද දිනක<br>හිස තැවෙන විට අපගේ<br>ජේෂ්ඨයින් ඉදිරියේ<br>දැනෙන්නේ බියක් නොව<br>සෙනෙහසකි සරසවියට<br>යම් දිනෙක අනාථවේ<br>අපිත් ඒ තැන ඉදිවී<br>නවකයින් හිස නමාවි<br>අප මෙන්ම යහමගට යාවී<br>ලෙසින් දැනෙන හැගුම<br>හුදෙක් කඩේ යාමක් නොව |
| 82 | 1 | Amaradewa auditorioum | සිහිනයක අරුමය<br><br>අනෝරා වැස්ස මෙන් කන් රිදවනා<br>යුද්ධයේ මියුරු හඬ පාවෙලා ගියා ඈතට<br>මද පවන හා මුසුව----<br>දෙනාසාපුඩුවලට වද දුන් මිනී ගද<br>අශෝභන මිනී ඇටකටු මොහොතකින්<br>නැතිවුනා දේශයේම-----<br>අදුරු සෙවනැලි අතර සැගව වුන්<br>යුද්ධයේ රුදුරු රකුසන්<br>පලාගියා මගේ දේශයම දමා ---<br>ඒ නිසාම අසරණවුන් අඩුකලා දේශයේම නිදිගැට හැර----<br>!! |

| New_id | Selected | ස්ථානය | Location | ගිතය |
|---|---|---|---|---|
| 1 | | | Jim/ Canteen/ Samar hut / Toilet | උපාධිය සිහිනයක් පමණි<br>ලැබෙන දිනයක් නෑ<br>එදා දිණමිණ නොබැලුවානම්<br>මෙදා මෙදා මේ දුක නෑ |
| 2 | 1 | | Jim/ Canteen/ Samar hut / Toilet | අනුබද්ධය මලබද්ධය<br>අනබද්ධ වාසිටිය<br>වසාගණ කඩතුරාව<br>ලබාගත් මෙලෝ දෙයක් නැත |
| 3 | | | Jim/ Canteen/ Samar hut / Toilet | දිනෙන් දින හදට ලංවන<br>නොනිමි බලාපොරොත්තවකි ආදරය<br>ඒ වගේමයි උපාධිය |
| 4 | 1 | | Jim/ Canteen/ Samar hut / Toilet | හදවතින් විවෘත නොවන්නා<br>මුහුණින් පෙන්වන්නේ බොරුවකි<br>ඔහු මිතුරු වෙසින් ආ<br>සතුරෙකි<br>අනුබද්ධයේ මුන් බහුලයි<br>කුහකයිනේ<br>සැමදා හදවතින් හඩාපියව් |
| 5 | 1 | | Jim/ Canteen/ Samar hut / Toilet | අනුබද්ධය යනු සර්ප විමානයකි<br>සාර්ථකව එයින් පිටවීම යනු<br>'දෙව්ලොව යාමකි |
| 6 | 1 | | Jim/ Canteen/ Samar hut / Toilet | ආදරණීය ඩිප්ලෝමාව<br>නොකරන් සරදම්<br>නුඹත්<br>අපට |
| 7 | | | Jim/ Canteen/ Samar hut / Toilet | අපි තනමු අත්වැලක්<br>හෙට පරපුරට එතෙර වෙන්නට<br>මේ බිමෙ<br>ගෞරවාන්විතව කම්නැත<br>වුව ඉතා සෙමෙන් |

| | | | | |
|---|---|---|---|---|
| 8 | | | Jim/ Canteen/ Samar hut / Toilet | සරසවි පිවිසුම් පෙල වුවද සමත්<br>නොමැති වූ සරසවී වරම්<br>නමුත් ලැබ ආවේ<br>වරම් සරසවි අනුබද්ධයේ<br>සරසවියකි මෙය නොලැබුනත්<br>උපාධිය |
| 9 | 1 | | Jim/ Canteen/ Samar hut / Toilet | දෛවයේ කඩතුරාව<br>ජිවිතයේ හරි අඩක්ම<br>පත් ඉරුව හා පන්හිද සමගින්<br>සපථ කෙරුවට ඉදිරියේ<br>කැප කරමි - ලබනට උපාධිය |
| 10 | | | Jim/ Canteen/ Samar hut / Toilet | බැලූ පාපෙට එදා දිණුම්ණු<br>මෙදා සරසවි බිමට ආවා<br>කෙරූ  පාපෙට විෂය වාණිජ<br>අතරමං වි පාර සෙව්වා<br>නොවූ පාපෙට තද පැමිලියක<br>බැරුව පරවස වාත වූවා<br>මලලසේකර ළග තබාගෙන<br>උපාධියේ සිහින මැව්වා |
| 11 | | | Jim/ Canteen/ Samar hut / Toilet | ප්‍රාර්ථනා පොදි බැදගෙන<br>සරසවියට අපි ආවා<br>සිහින ලෝකෙ කිරුළු දැරූ<br>මිනිස් පැටව් අපි වූවා |
| 12 | 1 | | Jim/ Canteen/ Samar hut / Toilet | සබඳ සිතන්න බිදක්<br>ඔබ පසු පස<br>අනුබද්ධ දයාවක්<br>තවම<br>ඇත |
| 13 | | | Jim/ Canteen/ Samar hut / Toilet | ජිවිතේ නියං සායට අසුවෙලා<br>මැලවිලා මියැදිලා<br>නමුත්<br>එකම එක කිනිත්තක<br>මල් එකක් පීදිලා<br>කියන් සොඳුරිය නුඹද ඒ<br>බාඳුරා මල |
| 14 | | | Jim/ Canteen/ Samar hut / Toilet | නිමේශයකදි හදට ලංව<br>පලායන මිරිගුවකි ආදරය |

| | | | | |
|---|---|---|---|---|
| 15 | | | Jim/ Canteen/ Samar hut / Toilet | තුන් සිතින් ලංවුනේ<br>දෑසමෙන් ළඟ ඉන්න<br>බෝසතෙක් නොවේ<br>දයාවෙන් සමුදෙන්න<br>සුදුරෝස මල් පිපෙන<br>වසන්තය පැමිණි විට<br>සුදු සිනහ මල් රැගෙන<br>සුදා මා වෙත එන්න |
| 16 | | | Jim/ Canteen/ Samar hut / Toilet | සිත් ගංඟාවට මා යට වුන දා<br>මගෙම අඳුරැ ලොව මා තනිවෙන්නම් ඔබට<br>සැපක් වෙනදා |
| 17 | | | Jim/ Canteen/ Samar hut / Toilet | ආදරයේ වේදනාව දන්නේ<br>ආදරය කරන අය පමණි |
| 18 | | | Jim/ Canteen/ Samar hut / Toilet | *(----)didn' t come to see<br>I think she will never come<br>See me |
| 19 | | | Jim/ Canteen/ Samar hut / Toilet | මිරිඟුවක් පසුපස<br>ලුහුබැද යනවාට වඩා<br>ඈත දිස්වෙන්නේ<br>මිරිඟුවක් බව<br>මුලදි ඔබ මට<br>පෙන්වා දුන්නේ නම්<br>නෑ මට කිසිවිටෙකින්<br>අන්සතු ආදරයකින්<br>තෘප්තිමත් වීමට<br>වෙර දරන්නේ |
| 20 | 1 | | Jim/ Canteen/ Samar hut / Toilet | මලක් සේ පිබිදෙන්න<br>සඳක් සේ නැගඑන්න<br>සසර සරනා තරු<br>යලි යලිත් හමුවන්න |
| 21 | | | Jim/ Canteen/ Samar hut / Toilet | Before failing love<br>It s a sweet dreem<br>When the time runs away<br>Is it sweet ? |

| | | | | |
|---|---|---|---|---|
| 22 | 1 | | Jim/ Canteen/ Samar hut / Toilet | සගයිනේ තොපි තවමත්<br>නිදි වැදිලාද බලව් මේ<br>අවසාන පැයේ දේශයේ<br>පිවනාලිය වු සුජාත දු පුතුන්හට<br>සිදුවන්නට යන විපත බල මහිම<br>තොපට නොහැකි නම් ඉල්ලා<br>අස්වමී වහාම දියවී කලහැකි වුවන් හට |
| 23 | | | Jim/ Canteen/ Samar hut / Toilet | අපට අහිමි කල<br>අපෙන් හොරාගත් නිදහස<br>කෑ ගසා කියන්නේ<br>දිනාගනිල්ලා හෙටක්<br>පුගතිශිලිත්වය ළග වුත්<br>පුගතිශිලි නොවන<br>පුතිගාමින් හදුනා ගනිල්ලා<br>වයව් මළබෙර හඩ උන්ට |
| 24 | | | Jim/ Canteen/ Samar hut / Toilet | ඉල්ලා හඩයි කිරි<br>දරුවන් මෙලෙක<br>නාවයි කිරි වලින්<br>පාකාර බෝධි වල<br>හඬයි ඉල්ලා නිදහස<br>සුවහසක් තරුණ කැල<br>නමුත්<br>පුදා ඇත පාලකයින්<br>අප වෙතට<br>පුනරුත්තාපනයේ<br>හිර ගෙවල් තල |
| 25 | | ආපන ශාලාව | Jim/ Canteen/ Samar hut / Toilet | අසාධාරණය විසින්<br>ලක් මව ගිල දමමින් සිටියි<br>ඇගේ දරුවන් මුනිවතින්<br>මුව අයාගෙන සිටියි<br>ජාතියේ සැබෑ දරුවනි නිදිවැද්දා<br>හොඳටම ඇති<br>නැගිටියව් වීදි බසිව් අරගල කරව්!<br>විනාශ කරව් ලක්මව විනාශ කරන<br>අවමයින්ම<br>තනන්නට මතු<br>ලක් මවගේ සුජාත දරුවන්ට<br>සැබෑ සුන්දර ලොවක් |

| | | | | |
|---|---|---|---|---|
| 26 | | | Jim/ Canteen/ Samar hut / Toilet | ලෝක බැංක නියෝගයන්ට<br>බිලිදෙන බුද්ධියේ නිදහස<br>සමග එක්වුණු මේඝ මාරුතය<br>හමා යයි වරින් වර කඳු ශිඛර<br>මතහබි මේ ඉසවුවේ<br>නිර්මාණශිලිත්වයක හැගුම්<br>විසුරුවා හැම තැනම උන්<br>සොයයි වපුරන්න යාන්තික<br>අධ්‍යාපනයට බිජු<br>මේ බිමේ කඹේ<br>එ' බිජ පැලවෙලා<br>වීසල් ගස් තැනුනොතින්<br>දිවයයි එකි |
| 27 | 1 | | Jim/ Canteen/ Samar hut / Toilet | මට අපහාස කරන බව කියන්නවත්<br>මට දැන් කවුරුවත් නෑ<br>මට දැන් කවුරුවත් නෑ<br>දැනෙනවනම් සිත හඩනා තරම |
| 28 | 1 | | Jim/ Canteen/ Samar hut / Toilet | කඩෝර සුළග හමනා විට<br>ගිනි අව්ව දැනෙන විට<br>කරවටක් ගිලෙන තරු<br>වන පොත් කරමින්<br>ඇල්මැරුනු බත් පතේ<br>හැම දාම ගත වැටෙන<br>කඩ මලු කම්සයට<br>කිසි දිනෙක දොස් නොගා මැද සිතින් ඉවසමින්<br>රෑ යාමේ බෝඩිමේ<br>රලු ඇදන් මතට වි<br>දුම්වැටිය උරමින්<br>මදුරුවන් පලවමින්<br>අනේක දුක් සිහිකරමි |

| | | | | |
|---|---|---|---|---|
| 29 | 1 | | Jim/ Canteen/ Samar hut / Toilet | ලියන්නට කිසිවෙකුත්<br>පිටු පුරා නැතිවෙලා<br>ගලා යන සිතිවිල්ල<br>රදවන්නට කිසිවෙකුත්<br>සිත පුරා නැති වෙලා<br>ගලායන සිතිවිල්ල<br>ගලන්නට ඉඩතබා<br>ඉඳින්නම් බලාගෙන<br>අසරනව හුදකලා |
| 30 | | | Jim/ Canteen/ Samar hut / Toilet | උපන් දා සිට<br>කරපු පින් ටික<br>හේදිලා<br>බෙලි හුල් ඔයේ |
| 31 | | | Jim/ Canteen/ Samar hut / Toilet | සඳ එපා පායන්න<br>සඳ එපා හිනැහෙන්න<br>ඉකිබිඳින මගේ සිත<br>ආයෙමත් පාරන්න<br>හැම දෙනම නිදි ගත්ත<br>මේ පාළු යාමයේ<br>මගේ සිත සනසන්න<br>මතක සජ්ඣායනාවේ<br>ඉතින් මට ඉඩදෙන්න |
| 32 | | | Jim/ Canteen/ Samar hut / Toilet | නිවි යන්නට සෙමින් ළංවන<br>පහන් සිලසේ සුළගෙ තනිවුණ<br>ඔබෙන් ලද මා එකම තිලිණය<br>වේදනාවේ කදුල පමණකි |
| 33 | | | Jim/ Canteen/ Samar hut / Toilet | දෙඅත රැඳිලා සිතට එබිලා<br>පුදපු ඉඟි බිඟි බොදවෙලා<br>පුංචි කඳුලක් නෙතට ඉනුවා<br>මිනිස් කම මිය ගිය නිසා |
| 34 | | | Jim/ Canteen/ Samar hut / Toilet | ඌ පැමිණිලා මගෙ රන්කඳ  අරංගියා වස් කවි<br>කියම් පුපුරන්නට  අනංගයා |
| 35 | 1 | | Jim/ Canteen/ Samar hut / Toilet | ඔයා මයි හොයා ආවේ<br>මම නොවෙයි<br>මම නොවෙයි<br>ඔයාමයි අතහැර යන්නේ |
| 36 | | | Jim/ Canteen/ Samar hut / Toilet | වසන්තය නිමාවිය<br>සදාතනික යැයි සිතූ |

| | | | | |
|---|---|---|---|---|
| 37 | | | Jim/ Canteen/ Samar hut / Toilet | සඳ එපා හිනැහෙන්න<br>තරු එපා පායන්න ඉකිබිඳින<br>මගේ සිත<br>ආයෙමත් පාරන්න<br>සැමදෙනාම නිදි ගත්ත<br>මේ පාළු යාමයේ<br>මගේ සිත සනසන්න<br>මතක රැඳී ඉසව්වේ<br>ඉන්න මට දෙන්න<br>මට නපුරු උනේ ඇයි දයාවියේ<br>මේ කඳුළු බිංදු ප්‍රථම ප්‍රේමයේ |
| 38 | | | Jim/ Canteen/ Samar hut / Toilet | ඔබ සිත කළඹවයි<br>දෑස දවයි<br>නොඑනු මැන කිසි<br>දිනෙක<br>මා හමුවන්නට |
| 39 | 1 | | Jim/ Canteen/ Samar hut / Toilet | අම්මා මට මට මල් සුවදක් මේවා<br>ඉපදෙන සංසාරේ<br>භවෙන් භවේ |
| 40 | 1 | | Jim/ Canteen/ Samar hut / Toilet | අම්මා හරි හොඳයි |
| 41 | 1 | | Jim/ Canteen/ Samar hut / Toilet | ප්‍රමාද වී ආවා grammr පාඩමට<br>ඕ ඒ එකක් දී තිබුනා ලියන්නට<br>හොදට කල යුතයි බැහැ නොව නොව<br>ඇනෙන්නට<br>Too difficult දෙවියන් සිහි උනාමට |
| 42 | | | Jim/ Canteen/ Samar hut / Toilet | විභාගය විවාහය මෙනි<br>වෙනසකට ඇත්තේ ප්‍රතිපල පැමිණීමට<br>මාස දහයකට වඩා ගත වීමයි |
| 43 | 1 | | Jim/ Canteen/ Samar hut / Toilet | විවාහයට බේත කොන්ඩම් පැළඳීම<br>විභාගෙට බේත එළිවෙන තුරු ක්‍රෑම |
| 44 | | | Jim/ Canteen/ Samar hut / Toilet | විභාගය අත ගඟ<br>පොත මා ළඟ<br>සිත ඇද ළඟ<br>ඈ ඌ ළඟ |

| | | | | |
|---|---|---|---|---|
| 45 | 1 | | Jim/ Canteen/ Samar hut / Toilet | දැස් පියවි පොත ළඟ<br>නින්දකට අත වනනවා<br>සිහිනෙන් පෙණේවි<br>විභාගය හොල්මනක් වී<br>තිගැස්සි අවදි වෙයි<br>බේරෙන්න හොල්මනෙන් |
| 46 | | | Jim/ Canteen/ Samar hut / Toilet | ජීවිතය දුකක්<br>පාඩම් කිරීම අති මහත් දුකක්<br>ඉංග්‍රිසි අරහං<br>ඇස් රිදුම පාපයකි<br>පොත් කියවීම කරුමයකි<br>විභාගය අරුමයකි<br>පාස් වීම විස්මයකී |
| 47 | 1 | | Jim/ Canteen/ Samar hut / Toilet | රැයක් පුරා නිදි වරා<br>වනපොත් කෙරූ පාඩම්<br>පැයක් පුරා මතකෙට<br>නොනැග්ගේ නම්<br>කුමක් ලියා සැනසෙන්නද<br>පලක් නැහැ කිසිත් |
| 48 | 1 | | Jim/ Canteen/ Samar hut / Toilet | ගැඹුරු ලෙස  බැලිය යුත්තේ<br>සුන්දර මුහුණක් දෙස නොව<br>අවංක හදවතක් ලෙසය |
| 49 | | | Jim/ Canteen/ Samar hut / Toilet | ජීවිතයේ යථාර්තය අවබෝධ කරගත හැක්කේ<br>අත්දැකීම් තුළිනි |
| 50 | | | Jim/ Canteen/ Samar hut / Toilet | දහසක් සිතුවිලි ඉපදෙන<br>දහසක් සිතුවිලි<br>මියැදෙන ලොවක<br>අමතක වීම පහසුය<br>අමතක කිරීම අපහසුය |

| | | | | |
|---|---|---|---|---|
| 51 | | | Jim/ Canteen/ Samar hut / Toilet | අත්දැකිම් ලබාගත හැකියි<br>ඒවායේ වටිනාකම<br>මේ යැයි ගිණිය නොහැකියි<br>එහෙත් ඒ සදහා<br>අප විසින් මෝඩකම් කල යුතුමය<br>මෝඩකම් තලින් ලබන අත්දැකිම්<br>දිනෙක අප ජිවිතය හරවත් කරනු ඇත<br>හරවත් ජිවිතය සුන්දරය<br>එසේ නම්<br>අප විසින් ජිවිතය සුන්දර කරගනු පිණිස<br>මෝඩකම් කල යුතය |
| 52 | | | Jim/ Canteen/ Samar hut / Toilet | මලක සුවඳ මල සුරකි<br>පිබිඳ විකසිත වනතරු<br>ඔබෙ සුවඳ රැකගනු මැන<br>හෙට පතිකුලයට යනතුරු |
| 53 | 1 | | Jim/ Canteen/ Samar hut / Toilet | කාසි වලට දෙන්නෙත් නෑ<br>කාසි වලට ගන්නෙත් නෑ<br>වනවරකම<br>මිනිසුන්නේ |
| 54 | 1 | | Jim/ Canteen/ Samar hut / Toilet | විවාහය යනු<br>කාන්තාවක් තලාපෙලා<br>පොඩිකර මිරිකා වදහිංසා<br>කිරිම සදහා දෙනු ලබන<br>බලපත්තයකි |
| 55 | | | Jim/ Canteen/ Samar hut / Toilet | ජිවිතය සුන්දරයි<br>උපාධිද<br>උපාධිය දුෂ්කරයි<br>රැකියාව පරස්පරයි<br>පරස්තාව ප්‍රමාද වෙයි |
| 56 | | | Jim/ Canteen/ Samar hut / Toilet | ජිවිතය අපට දුන්<br>යෞවනය සුන්දරය<br>යෞවනය අපට දුන්<br>ආදරය සුන්දරය<br>විටෙක සිත හඩවාවි<br>වීටෙක සිත සනසාවි<br>ඉමක් නැති කොනක් නැති<br>සාගරය තරම් දුර |
| 57 | | | Jim/ Canteen/ Samar hut / Toilet | ජිවිතයේ ලොකම මිහිර<br>දුක් විදිමට හුරුවිමයි |

| | | | | |
|---|---|---|---|---|
| 58 | | | Jim/ Canteen/ Samar hut / Toilet | සමනළයන් බමරුන් මී මැස්සන්<br>සරසවියේ අවිහිංසක මීමැස්සන්<br>ඇති කලහොත් අන් වෙදනටරස්සන්<br>සරසවි මැස්සන් මින්පසු පිස්සන් |
| 59 | 1 | උපුටාගැනිම සබරගමුවේ සරසවි කුරුටුගී | Wall paper/Poster/ other publications | ඉතිං අවසන්<br>ශරීරයට සැපදායි වු<br>සැහැල්ල බව තුල<br>සැඟවුනු විඩාබර ජීවිතය |
| 60 | | | Wall paper/Poster/ other publications | ආදර ගඟ ගලන දෑස<br>දිහා බලන් සිටියා මම<br>මෑත මතක මල් සුවඳට<br>තුරුලු වෙලා සිටියා මම කාලයේ වැලි තලා යටින්<br>ආදර ගඟ ගලන තුරා |
| 61 | | | Wall paper/Poster/ other publications | ආදරේ කරපු මුල් දවස් වල<br>මෙතරම් ගින්දරක් නොදී<br>අනේ ඔබ වෙන්ව ගියා ගියා නම්<br>හිත හදා ගන්න තිබුනා මට |
| 62 | | | Wall paper/Poster/ other publications | ඉතින් අවසන්<br>ශරීරයට සැපදායි වු<br>මනසට වදයක් වු<br>සැහැල්ලු බව තුල<br>සැඟවුනා විඩාබර ජීවිතය |
| 63 | | | Wall paper/Poster/ other publications | මහවැලියක් නැතිවුනාට<br>බෙලිහුල් ඔය ගලාගියා<br>හන්තානක් නැතිවුණාට<br>ආදර කන්දක් තිබුණා<br>මහලොකවට නැති වුණාට<br>සබරේ අපිත් නම් තිබ්බා |
| 64 | | | Wall paper/Poster/ other publications | දෑස රිදෙනවා නිදිමතේ ඉදලා<br>විභාග ආයේ ඕනෙම නෑනේ |
| 65 | | | Wall paper/Poster/ other publications | පාසලේ දී මා පසු කලේ ඉලක්කයයි (A3) නමුත්<br>වි.විද්‍යාලයේදි මා පසු කරන්නේ<br>අභියොගයයී (Degree) |
| 66 | | | Wall paper/Poster/ other publications | ඔබයි මගෙයි මේ සෙනෙහස<br>සංසාරේ පුරුද්දක්ද |

| | | | | |
|---|---|---|---|---|
| 67 | | | Wall paper/Poster/ other publications | ජිවිතේ කියන්නේ හරි පුදුම දෙයක්<br>අපි කොතරම් ප්‍රතිපත්ති තියාගෙන හිටියත්<br>කාලය විසින් හරි පුදුම විදිහට<br>ඒවා වෙනස් කරනවා<br>සිතටකට හරි දුකකට හරි<br>ඒත් ජිවිතේ ඉවරවෙනකම්<br>දුකක්ද<br>සතටක්ද කියලා<br>හිතාගන්න බැරි විදිහට |
| 68 | 1 | | Wall paper/Poster/ other publications | මට පාඩම් කරන්න බෑ<br>කවදාද මේදේ ඉවරවෙන්නෙ<br>ඉතින් නුබ නෑ<br>මමත් හෙට නෑ<br>මේ සමනලයේ |
| 69 | 1 | | Wall paper/Poster/ other publications | කඳුල නුඹ අමතාවි<br>ඉවසාගෙන හිනාවෙයන්<br>වේදනාව ඒවී සිතට<br>ඉවසාගෙන හිනාවෙයන්<br>මල් යායේ සුවදට මල<br>ඔබයි නැගනි හිනාවෙයන් |
| 70 | 1 | | Wall paper/Poster/ other publications | මේසයක් සේ හුදකලා වී<br>නීල අම්බරයේ<br>නොදැන මඟතොට සොයා<br>දවසක අයාලයේ යන<br>ගමන කොතැනකදෝ |
| 71 | 1 | | Wall paper/Poster/ other publications | පෙරදා මතක මංපෙතේ ඇදිරුව  තවද<br>නොමැකී රැදී ඇත සිත්තෙර   නිබද<br>හදවත් වෙන්ව ගිය බව වින්දට  මහද<br>වෙනසක් කමට සිනහව කදුලක් බැන්ද |
| 72 | 1 | | Wall paper/Poster/ other publications | කලෙක ලොව අතැර<br>මම<br>ඔබට ආදරය<br>කලෙමී<br>ඒ අතර<br>මා අතැර<br>ඔබ ගියෙත්<br>ලොව දිනා ගනු පිණිස<br>මුල සිටන් පුහුණු වෙමී |

| | | | | |
|---|---|---|---|---|
| 73 | | | Wall paper/Poster/ other publications | සඳ දිය වැක්කෙරිලා නිශාන්තය අරුත් බරයි<br>ජීවිත මංපෙතේ තවත් පියවර ගොඩයි<br>කළල් දිය මත සුපිපි කොඳ කැකුළු පිංබරයි<br>කඳුළු පිරිසඳ ලබන සිනහව මිල වැඩියි |
| 74 | 1 | | Wall paper/Poster/ other publications | මහවැලි<br>කුසට අහරක් නැතිව<br>නෙතට නින්දක් නොලැබ<br>පොත් ගුලක් මැද<br>යෞවනය මකනවා |
| 75 | | | Wall paper/Poster/ other publications | මගෙ ජීවිතයේ මට හමුවුන<br>හොඳම කෙනා...<br>මගේ ජීවිතය මට මට දුන්න<br>මගේ අම්මා... |
| 76 | | | Wall paper/Poster/ other publications | නුඹ මට<br>හිමි වෙන දවසක්<br>තිබේද<br>හිතාගන්න බෑ මට තාමත්<br>නිර්මානය නම් වු පුර්න ශාඛාවේ එක්<br>ශාඛාවකි කාව්‍ය රචනාව<br>හැම සත්වයෙක්ම සෞන්දර්ය තලින් |
| 77 | | | Wall paper/Poster/ other publications | වස්සානයේ තුරු වදුරු අතර<br>පිපී පරවු රතු ලිලී මලක් සේ<br>සැමට රහසක් වු මගේ ආදරය |
| 78 | | | Wall paper/Poster/ other publications | මගේ කවියක තිබෙන කොහෝ නද<br>මගේ වසන්තය මිසක අනෙක කිම<br>මගේ කවියක රුදුන තිත්ත යුෂ<br>මා හදවත් වේදනාවේ පත අටය<br>කොයි බටද<br>මගේ කවිවල තියන පිය හසර<br>ඒ මගේ ගම රටට යන පාර |

| | | | | |
|---|---|---|---|---|
| 79 | 1 | | Wall paper/Poster/ other publications | නොපළදදයි කැටයම් කල වේලයක්<br>මගේ කවිය<br>සේල ඉනුවේ නැතිය මගේ කවිය<br>මුසුප්පුව නොයනු මැන |
| 80 | | | Wall paper/Poster/ other publications | සාදර ඇරයුමකි<br>එන්න මගේ කැදැල්ලට<br>බත් බුලත් රැගෙන මට<br>බෙදන්නෙමි මගේ කවිය |
| 81 | | | Wall paper/Poster/ other publications | ගිම්හානයේ ගිලන් වි කෘෂව සුදු මැලිව<br>ඇදි ඇදි ඉකිගැසු ගම තවම පිරිපුන්ය<br>දුෂ්කරය කියා හැරයායුතු ජිවිතය<br>කටු පොකුරු සිප ගනිමි හෙට මලක් වනු පිණිස |
| 82 | 1 | | Wall paper/Poster/ other publications | සිනා සරදම් පිරුණු<br>මහවැලියෙ කාමර අතර<br>ගෙවි ගිය මල් සමය සිහිනෙකි<br>සදට ඉකි බිද හඩන<br>නොදරුවන් නොවි අපි<br>සිනාසෙමු අතීතෙට සෙනෙහසින් |
| 83 | | | Wall paper/Poster/ other publications | හීනයක් වගේ ඇවිදින් නුඹ මගේ හිත ළඟ<br>දැඟලනකොට මට පෙනෙන<br>මට දැනෙන ලෙස<br>පරිස්සමට තියාගන්න<br>මගේ මුඳානම් සිත<br>දෝරගලන්නට හදනවා<br>දහසක් බැමි බිඳ |
| 84 | | | Wall paper/Poster/ other publications | සිහින නිම්තෙර නිසළ මොහොතක<br>සීතලම මුදු පිනි පලස මත<br>බිදුනු සමනල පියාපත් ගෙන<br>පැතුම් ලෝකය තනනු කෙලෙසදරැ |
| 85 | | | Wall paper/Poster/ other publications | සිහින මායා දැලේ<br>පැටලිලා නොගිහින්<br>සිහිනයක් නොවේ නම් ජිවිතේ |

| | | | | |
|---|---|---|---|---|
| 86 | | | Wall paper/Poster/ other publications | අපා දුක්විද<br>පරිස්සම් කළ<br>මගේ ප්‍රේමය<br>මගේ ළයේ<br>තබා ගෙන මම මියෙම්<br>දවසක<br>ඇවිත් ගෙනියන්<br>එය ඔබේ |
| 87 | | | Wall paper/Poster/ other publications | දවස තවමත් යෞවනයයි<br>ඉතින්<br>ආදරණීය නංගි<br>ඔබ<br>සතුටින් ඉන්න |
| 88 | | | Wall paper/Poster/ other publications | මේ ජීවිතේ කටුක දුක්ගොඩ<br>මේ පුංචි හිතින් විඳගෙන<br>අහිංසක මගේ ලෝකය මැද<br>ජීවත්වෙන්න මට ඉඩදෙන්න |
| 89 | | | Wall paper/Poster/ other publications | සඳ පහන් රැයක<br>හමා එන මද පවන<br>සුන්දරයි නුඹ මෙන්ම<br>කළුවර වූ හිත් අගට<br>පෑයූ සඳක් සේම |
| 90 | | | Wall paper/Poster/ other publications | අරමුණයි ඔබයි ජීවිතයට<br>අලුයම මා අවදි කරන |
| 91 | 1 | | Wall paper/Poster/ other publications | මහා වරුෂාවට<br>සඳ මිලිනව තරු වැලපෙද්දි පුංචිතරු මල්<br>ඔබයි<br>කුමාරිකා මල් ඔබය<br>මගෙ අම්මේ ------- |
| 92 | 1 | | Wall paper/Poster/ other publications | සෙනෙහසේ<br>නාමය<br>සිත තුල දරා<br>නමදිමි<br>මෑණියනි<br>දෙපා |

| | | | | |
|---|---|---|---|---|
| 93 | | | Wall paper/Poster/ other publications | නැවුම් අරුණාක පිපෙන<br>සුබ සිහින මල් පතන<br>යොවුන් විය පොත පතට<br>දිය වුණෝ<br>ඒ නමුදු<br>ජිවිතය<br>සුන්දරය සගයිනේ------- |
| 94 | 1 | | Wall paper/Poster/ other publications | ජිවිතය යනු<br>හමුවීම හා වෙන්වීම<br>යන්න මත පදනම් වුවකි |
| 95 | | | Wall paper/Poster/ other publications | ආලවන්ත හිතක නැගෙන<br>ලෙන්ගතු සිතුවිලි<br>අකුරු කොරන්නට<br>මේ මගුල් රැගත් හින්දා<br>බෑ අම්මපා<br>මං උඹට ලෙන්ගතුයි |
| 96 | 1 | | Wall paper/Poster/ other publications | නිරුදක කතරක වියමැන යන සඳ<br>බුද්ධියෙන් අකුරු කරන<br>ජිවිත සොයන මට<br>දිය සොයා සැරසරන<br>වෙර සිඳුනු බල සිදුනු<br>මා සිතට මා ගතට<br>එකම ශක්තිය ඔබයි<br>නෙක කුරුරු දනන් මැද<br>හද රිද ඇඬෙන විට<br>ඉරි තැළුණු හදවතට<br>කදුලු පිරි නෙත් අඟට<br>එකම සැනසුම ඔබයි<br>ආදරණිය අම්මේ------- |
| 97 | | | Wall paper/Poster/ other publications | සිතත් මල වගේය<br>හමුවුන විට සිනාසෙන්න<br>එමගින් මගේ සිත පිරේය |

| | | | | |
|---|---|---|---|---|
| 98 | | | Wall paper/Poster/ other publications | හවින් හව පතා රන්<br>ආමී ඔබ සොයා මං<br>ඉතින් හිත මරාගම්<br>ඔබට මා එපා නම් |
| 99 | | | Wall paper/Poster/ other publications | අවසරයි සමු ගන්න<br>සමනල පිවිතෙන්<br>හැරියන්න<br>බෝ දුකයි<br>පැමිණ මුල් දිනමෙන්ම<br>නිවහනක් වුනා නුඹ<br>ගෙවුනු වසරක් තුල<br>දුන්නත් සමු නුඹට<br>සදා නොමැකේ<br>සමනල මතකය. |
| 100 | 1 | | Wall paper/Poster/ other publications | හමු නොවන බව<br>දැන දැනත්<br>ගියෙමු අපි බෝ දුරක් |
| 101 | 1 | | Wall paper/Poster/ other publications | මිනිස් කුලයේ<br>උපතේ සිට<br>අවසන් තත්පරය තෙක්ම<br>නොවෙනස් වෙන<br>සෙනෙහසේ හිමිකාරිය<br>ආදරණීය----- අම්මේ<br>ඔබය-----ඔබ පමණීය |
| 102 | 1 | | | දයාබර මිතුරියේ<br>සීතලට පරාදව බැදුණු<br>කඳුලු කැට අතරට<br>සිනහවේ කැකුලු මල්<br>මැවූ හැටි අරුමෙකි මට<br>අහිමි වී ගිය සෙනෙහෙ<br>රිදුම් දුන් මගේ සිතට<br>පිවිසුනා නුඹ<br>සිහිනයක් විලසකට<br>එසේ මුදු කාලයක්<br>ඈත පසුකර මා ඇදී ගොස්<br>නොපිවිසෙමි යලිත් මා<br>රිදුම් දෙනබැදුනු සිනහව<br>නුඹේ සිත |
| 103 | | නන්ලාල් නේවාසිකාගාරය | | දෛවයේ දෝංකාරය<br>සිතෙහි හොවාගෙන<br>මල් මිටියාවත<br>සුසුම් හෙලනා<br>ලදුනේ |

| | | | | |
|---|---|---|---|---|
| 104 | | නන්ලාල් නේවාසිකාගාරය | | ගෙදරින් ගෙනා වැලි තලපේ අපට නොදී<br>රස බැලුවේ කෙල්ලන් හා සිනාසිසී<br>ජංගිය සරද ඇයි උඹ මේ වෙනස්ගති<br>අවුරුද්දක් ගියත් උඹ නම් නෑ අපට ලැදි |
| 105 | 1 | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | අමාවක සඳක් සේ<br>එළියයි ඔබ මගේ<br>ජීවිතයෙට! |
| 106 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | අමාවක සඳක් සේ<br>එළියයි ඔබ මගේ<br>ජීවිතයෙට<br>මල් පිපෙන්නේ කොහොම<br>නුඹ හිරුඑළිය නොවුනානම්<br>මල් සුවඳ විඳින්නේ කොහොම<br>නුඹ මද පවන නොවුනා නම්<br>නැගිටගන්නෙ කොහොම<br>නුඹ මග හෙලි නොකලානම්<br>හිනාවෙන්නේ කොහොම<br>නුඹ හසරැල්ල නොවුනානම්<br>ලොව දකින්නේ කොහොම<br>නුඹ ඇස්දෙක නොවුන |
| 107 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | Campus ආවේ<br>පෙරකල පවකට |
| 108 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | පිවිතයට පිවත්වෙන්න<br>ඉඩදෙන්න |
| 109 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | ආදරය බොහෝ සුන්දරය<br>එය නිසිලෙස බුද්ධියෙන් වැළදගත් කළ<br>වඩා සුන්දර වන්නේය<br>පිවිතය වරද්දාගන්නට මත්තෙන්<br>රැක ගතයුතු මිළකළ නොහැකි දෙයක්<br>තමන් සතුව ඇත<br>එය නම්<br>ගැහැණියකගේ ආත්ම ගෞරවය රැකදෙන<br>පිවිතුරු බවයි |
| 110 | 1 | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | සමනළයට සමුදෙන දවස ඇවිදින්<br>දුකින් වුවත් යථාර්ථයට අපි<br>මුහුණ දියයුතුය<br>ඉතිං සමනළයෙනි පියමං කරන්නට<br>අවසරයි<br>තවත් සමනළයන් පිරිසකට<br>සමනලයෝ පහස විඳගන්නට<br>ඉඩදී |

| | | | | |
|---|---|---|---|---|
| 111 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | සිත්<br>බලාසිටි<br>ඉකිලෙන දැයට<br>සැනසුම ගෙන<br>ඔබ වඩින<br>තුරා<br>සිත්... |
| 112 | 1 | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | පැතුම් පොදි<br>පුරාගෙන<br>මා තනිවූ දිනයක<br>නුඹේ ලොවේ<br>සේපාලිකා මල් සුවඳක දැවටී<br>නුඹ ඉන්න මගේ ළඟින්<br>නුඹත් තනිවී<br>මගේ ලොව තුළ |
| 113 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | සාර්ථකත්වයේ<br>අඩිතාලම<br>ගෞරවනීය<br>නිශ්ශබ්දතාවයයි |
| 114 | 1 | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | කැම්පස් එන්න පෙර නම් සුරලොව මැවුනි<br>ආදින පෙනුනේ වධකාගාරයක් මෙනි<br>දවසින් දවස ගොස් විභාගය ළඟා වුනි<br>ප්‍රථම වසර අගදි මෙහි රඟ දැනුනි |
| 115 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | මොකද මුචෝ අද දුවන් නැද්ද<br>දුවල වැඩක් නෑ මගේ පස්සෙන් කවුරුත් නෑ |
| 116 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | සමනළ රැනක් සේ ඉගිලී<br>කැම්පස් ගිය ඒ කාලේ |
| 117 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | ඒයි කොළ 16 මෙහෙට වර<br>මහින්ද රාජපක්ෂ උඹේ කවුද?<br>අපේ බාප්පා ජ්‍යේෂ්ඨ උත්තමාචිය. |
| 118 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | Class එක සිහිනයක් පමණයි<br>මෙලෝ ගාණක් නෑ<br>එදා A/L fail වුණානම්<br>මෙදා වියොවක් නෑ<br>but<br>එදා A/L fail වුණානම්<br>සුදු හමුවෙන්නෙත් නෑ |

| | | | | |
|---|---|---|---|---|
| 119 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | ගලා හැලුණු සිනහ ගගුල්<br>හඬා වැටුණු බොළඳ පැතුම්<br>ගයා නැටුම් සතුටු පැතුම්<br>එන්නේ නෑ අපි නැතිනම් |
| 120 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | සෙනෙහෙබර ලෙන්ගතු හදවත උපදින<br>ආසිරි ප්‍රාර්ථනා පිළිගෙන<br>නැවත නැවුම් කරමු පෙරමෙන්<br>සදාදරණීය අපේ සෙනෙහස |
| 121 | 1 | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | සිහින සුසුම් හදට ඇවිත්<br>කියනා සොඳ සුසුදු වදන්<br>පාටපාට හින ගොඩක<br>තවරා ඇත මතක නැවුම් |
| 122 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | සිහිල් සුළං සෙමින් ඇවිත්<br>කොදුරා කී ප්‍රේම වදන්<br>දෙනෙත් පුරා කියා ගොසින්<br>මා කළඹා පෙනේ සිතින් |
| 123 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | Try to be pure as pure as snow<br>Try to be gentle as genetic as the Moon<br>Try to be understand what's love<br>Love is sacrifice the sonly<br>Though thousand boys class to me<br>They can't given me<br>I know it<br>But ,<br>What can I do only<br>Say to you<br>Good bay-------- |
| 124 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | ජ්‍යේෂ්ඨ උත්තමයාණෙනි අපි<br>කොක්කක් ගහමුද?<br>"ගහමු බං ගහමු"<br>උඹේ ගම කොහේද?<br>Colombo 16 |
| 125 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | සමනළ පිරුළු<br>පිනා කවි කියුවා වගේ<br>tissa ගේ girl friends ගලා වාගේ<br>ලේනි ඇල්ලුවා වාගේ |

| | | | | |
|---|---|---|---|---|
| 126 | 1 | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | මාමළ පසු සොහොන් කොතේ<br>දුක් ගීයක් ලියනු මැනවි<br>නොමළ මගේ පෙම වෙනුවෙන්<br>දුක් කදුලක් සලනු මැනවි<br>මිහිදන් වූ මගේ කයට<br>සුසුම් පවන් සලනු මැනවි<br>මා වෙනුවෙන් ඔබේ හදේ<br>පුංචි ඉඩක් තබනු මැනවි<br>සබරගමු සිහිනයෙන්<br>කොළඹට |
| 127 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | මැවැනි බෙකියා<br>වර වර ළගට කැන්දා<br>සුවදුක් විමසුවා<br>තිස්සගේ නහයෙන් මිරිකා |
| 128 | 1 | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | මට වගේම<br>මගේ සිතේ සුවඳ දැනේනම්<br>මට වගේම<br>මගේ පැතුම් ඔබට දැනේනම් |
| 129 | 1 | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | The most beautiful this<br>In this world is<br>Smile that straggle<br>Thought the tcats |
| 130 | 1 | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | මේ මුළු ලොකේම මහ රැවටිල්ලක්<br>මේ රැව මිල්ලට අහු නොවී<br>ජිවත් වෙන්න පුළුවන්<br>මිනිහෙක් කවදාවත්<br>ලෝකයේ ඉපදෙන<br>එකක් නෑ |
| 131 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | යාළුවෝ ආශ්‍රය කරනකොට ගොඩක්<br>පරිස්සමින්... ගොඩක් වෙලාවට<br>යාලුවෝ ආත්මාර්ථකාමියි වෙලාවකට<br>මේ මුළු ලොකෙම මහ රැවටිල්ලක්<br>කියලා හිතෙන්න පුළුවන්..., |
| 132 | 1 | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | පුදින්න අර අදින<br>සුදු සුවද මල් පොකුර<br>නුඹව සිහි කරනවා<br>සත්තයි හැමදාම |
| 133 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | There is no right ways<br>To do wrong things |

| | | | | |
|---|---|---|---|---|
| 134 | 1 | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | You can fool all of the people<br>Some of the time<br>Some of the people all of<br>The time<br>But you can’t fool<br>All of the people all of<br>The time |
| 135 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | වසන්තය උදාවිය<br>එහෙත්<br>හිටි හැටියේම<br>මහා ධාරානිපාත<br>වර්ෂාවකට<br>අසුවිය |
| 136 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | එපා කෙනෙකුට දුකක් දෙන්නට<br>එයින් හදවත රිදෙනවා<br>එපා කෙනෙකුට බොරු කියන්නට<br>එයින් හඳවත බිදෙනවා<br>එපා මානය හිතට ගන්නට<br>ඔබේ හොඳගුණ මැකෙනවා<br>එපා ආගා පොදි බඳින්නට<br>මැරෙනවා අපි මැරෙනවා |
| 137 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | උපාධිය සිහිනයක් පමණයි<br>සැබෑ දිනුමක් නෑ |
| 138 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | හිතන්න හැම වෙලාවෙම<br>අවාම සබරෙට<br>I should achieve my goal<br>කරන්න හැම මොහොතකම<br>යාළුවෝ limit එකට<br>love එක limit එකට<br>එත් ,<br>හැමවෙලාවෙම මතකේ තියාගන්න<br>“තමා අතට තම අතමය සෙවනැල්ල” |
| 139 | 1 | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | Think big<br>Do big<br>You will definitely big |

| | | | | |
|---|---|---|---|---|
| 140 | | නන්ලාල්<br>නේවාසිකාගාරය | Hostel | Smirk is a sim card<br>And life is a phone<br>If you insert you<br>Sim card in to your phone<br>A beautiful day is<br>Activated |
| 141 | | නන්ලාල්<br>නේවාසිකාගාරය | Hostel | කලා රාණි රුැලි විරි<br>මිනු කිතු බිංදු පුංචි<br>ආශා මීනා ඩේලි තිර |
| 142 | | නන්ලාල්<br>නේවාසිකාගාරය | Hostel | දිවිරා කියන්නම් මෙසේ<br>ඔබට මා ආදරේ |
| 143 | 1 | නන්ලාල්<br>නේවාසිකාගාරය | Hostel | ලං නොවන්නට දහස් බැමි ඇත<br>ඔබ නොදන්නා මගේ ලොවේ |
| 144 | | නන්ලාල්<br>නේවාසිකාගාරය | Hostel | උපන්දා සිට කරපු පිං ටික<br>හේදිලා බෙලිහුල් ඔයේ |
| 145 | | නන්ලාල්<br>නේවාසිකාගාරය | Hostel | යාන්තම් සුදු පෙනෙන දත් අතර<br>සිනාවක් ඇතොත් සැගවී හිදින<br>ඒ අපේ බැදුණු එක හිත මිතුර<br>කිසිදාක කාවයට හසුනොවන<br><br>රණවරා ගසේ මල් පිපෙන කාළයට<br>සරාසඳ පායලා මගේ ලොවට<br>අතවනයි ළං වෙන්න පහන් තරුවට<br>ලංවෙන්නෙ කෙලෙසද දුරයි තව එලිවෙන්න |
| 146 | | නන්ලාල්<br>නේවාසිකාගාරය | Hostel | ජිවිතෙ හැම පියවරක්ම නැර<br>පැළවෙලා බින්න බැහැගෙන ඉන්න<br>වේදනා සමීපම මුහුණ<br>ලතු තුලා බෑ මිතුර හංගන්න |
| 147 | | නන්ලාල්<br>නේවාසිකාගාරය | Hostel | අහස් කුස සිසාරා<br>පැයු පුන්සඳ විලස<br>නුඹ හැරගියායින්<br>බොඳවුනේ ජිවිතය<br>සත්තමයි අනන්තයි<br>ස්නේහය නුඹනමට<br>නමින්මයි නුඹේ ඒ<br>දයාබර පියාණෙනි |

| | | | | |
|---|---|---|---|---|
| 148 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | මිනිසෙකු විනාශ<br>කළ හැකි වුවද<br>පරාජය කළ නොහැක |
| 149 | 1 | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | ගෙවෙන හැම මොහොතක්ම<br>කල්පයක් සේ දැනෙනවා<br>රත්තරං අම්මා<br>හිතලග ඉන්නවා |
| 150 | 1 | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | ගලන වටා අවලස්සන<br>ආදරයයි දියර සඳුන<br>ගැලුන ඔබේ නෙත එසඳුන<br>සියලු දෙයම වෙයි ලස්සන |
| 151 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | බුදුන් ලගට අපගේ<br>දුක දන්නේ<br>මව්නි පියාණෙනි<br>ඔබ පමණයි |
| 152 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | කොඩු හිත පුරා ඉහිරුනු<br>හිතලේ පැතුම් පුබුදන<br>රත්තරං පාට පුරසඳ |
| 153 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | පැතුම් ලෝකය<br>හැමදාම හීනයක්<br>සැබෑ දෛවය |
| 154 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | මත්තබං දුර්ලභං<br>සමිකරණං අරභංච<br>ලේංසු කැලි සරණංච<br>සංඛ්‍යාපාතං අතිභයං |
| 155 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | බක්මහේ<br>එක්තරා දවසක<br>පියනැගුවෙමු සරසවියට<br>දුක්කම් කටොලු මැදින්<br>අවසන් කලා<br>පලමුවසර පියනැගුවෙමු<br>දෙවන වසරට<br>සිතුම් පැතුම්<br>පොදි බැඳ<br>පියනගන්නට<br>තෙවන වසරට<br>අවසරයි<br>දයාබර දෙවන වසර |

| | | | | |
|---|---|---|---|---|
| 156 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | පරෙයියන් ගල<br>කඳුවලල්ල<br>සිපගන්න සැරසෙන්න<br>සුදු මීදුම<br>ළංවෙන්න මාවෙතට<br>නුඹ හැමදාම<br>මං හැමදාම<br>මං ආසයි<br>නුඹේ පහසට<br>මං බලාන් ඉන්නවා<br>නුඹ එනතුරු<br>හැම හවසම |
| 157 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | මේ සුළං රැල් හමා එන්නේ<br>කොහෙන්දැයි නොදනිමි<br>මගෙන් වෙන්ව ඔබත් ඉන්නේ<br>කොහේදැයි නොදනිමි |
| 158 | 1 | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | ජය නියතයි<br>ඔබට යමක් කළහැකියැයි<br>විශ්වාශ කරන්නේ නම්<br>එය අනිවාර්යයෙන්ම කළ හැකියි |
| 159 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | ආදරය වූකලි<br>බැඳීමක් බිඳ දමා<br>තවත් බැඳීමකට<br>මුල පුරණ<br>හිතක් හඩවා<br>තවත් හිතක් සුවපත් කරන<br>මයාවක්ම වෙද |
| 160 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | Please love me<br>That is my ambition<br>Love me as your sole<br>That’s my dream<br>Don’t keep on me<br>That’s my which |
| 161 | 1 | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | මම කාටවත් බොරු කියන්නේ<br>නැහැ<br>අද ඉදලා මං හැදෙනවා<br>මම හොදයි |

| | | | | |
|---|---|---|---|---|
| 162 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | සක පටාස්<br>හරියනවාමයි<br>අපිට promises<br>චොකලට් එකක් ඕනමයි |
| 163 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | නිල්ල නිලනා තඹුයාය<br>මිහිදුමෙන් වැසුනු ලස්සන<br>අනේ මා රැවටුනු තරම<br>සුරවිමනක සිහිනය<br>ඉරිතැලි ගියා<br>දුටු විට<br>සබරගමු හිරගෙය |
| 164 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | දෙසද පිපෙන<br>පසලොස්වක<br>සඳදිය පොදක<br>සෞම්‍ය සුසුදු<br>සඳ අහුරක් තරමටම<br>සුන්දරයි මම |
| 165 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | හිතට ළගයි<br>ගතට දුරයි<br>දිනාගන්න බෑ<br>එත්<br>නුඹ අයිති මටයි |
| 166 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | There’s hand<br>I love to hold<br>Two eyes I love to see<br>There’s a voice<br>I love to here<br>That miens the world tome<br>And all of these<br>Be louse to you<br>The wonder full one<br>I love |
| 167 | 1 | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | අපේ මතක<br>අමතක කරන්න<br>මතකයට<br>අමතක වෙවී |

| | | | | |
|---|---|---|---|---|
| 168 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | පිපෙන්න නුඹ<br>රෑට පමණි බිම<br>නොව<br>සුවඳ පිරි<br>මලක් වී |
| 169 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | Nothing certain in<br>Dynamic world |
| 170 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | ගිනිකඳු බලා<br>ඉන්නේ පුපුරන්න<br>හිම කඳු එකම<br>උත්සාහය දියවෙන්න<br>උඳුරත් ගිතලත්<br>මට බෑ වලකන්න<br>සඳටත් ඕනිනම්<br>පුළුවන් පායන්න |
| 171 | 1 | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | දිනක අපි හමුවෙමු<br>නොදන්නා මිතුරියන් ලෙසින්<br>නමුදු<br>ලං වුනෙමු එකිනෙකාට<br>කිවනොහැකි සෙනෙහසින්<br>කාළය පැමිණ ඇත<br>වෙන්ව යන්නට මෙයින්<br>පතන්නෙමු නැවතත්<br>හමුවන්න මේලෙසින් |
| 172 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | ජිවිතය සුන්දර වරදකි<br>කිසිදා ගෙවිය නොහැකි |
| 173 | 1 | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | වෛරයෙන් වෛරය නොසන්සිදේ<br>අවෛරයෙන් වෛරය සන්සිදේ<br>එයින් ජිවිතයේ යථාර්ථ ස්වභාවය<br>අවබෝධ කරගත හැකිය |
| 174 | 1 | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | පිණිබිංදු විසිරිලා<br>තණබිස්ස තෙත් කරන්<br>කදුළුමල් පිබිදිලා<br>නෙත් කෙවෙනි බොඳකරන්<br>කෝපි මල් මැලවිලා<br>සුවඳ වියැකි ගිහින්<br>තනිවෙලා හිත හඩයි<br>සෙනෙහෙ හිතා දුර ගිහින් |

| | | | | |
|---|---|---|---|---|
| 175 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | ඔබ නෙදකින්න<br>දැඩි කරගත් සිත<br>ඔබ නෙදකින දා<br>හඬා වැටෙයි |
| 176 | 1 | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | සියල්ල සිදුවෙන්න ඇරලා<br>ඉන්නවා හැරෙන්නට<br>මං මොනවා කරන්නද<br>දෛවය උනත්<br>ඉරණම උණත්<br>ජිවිතය මොන විදියක<br>වෙනස් කරයිද කියලා<br>මං කොහොම හිතන්නද |
| 177 | 1 | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | සුපුන් සඳ පිපි මේ නිගාවේ<br>බෙලිහුල් ඔය කඳුපියසින්<br>හමා එයි මඳ පවන්<br>නොපෙනෙන අනාගතයට<br>පෙරමග පෙන්වමින්<br>පොත් අතර දුවන විඩාබර නෙතුපියන්<br>මොහොතකට සනසවයි<br>සමනල වැවේ දසුන ඉතින්<br>බෙලිහුල් ඔයෙ කුමරියේ<br>ජිවිතය හරිදුරයි<br>ජය ගන්න දිරියෙන්ම<br>මේ කටුක සත්‍යයෙන් |
| 178 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | හංසයන් වතුට දැම්මාම<br>උන්ට පිනන්න<br>උගන්වන් ඕන නෑ |
| 179 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | හවාට නින්ද ගියේ ඉබ්බාගේ<br>වරදින් නොවේ |
| 180 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | ලොව අසිරුම දෙය<br>ජිවිතයේ සත්‍යය හා යථාර්ථය<br>අවබෝධ කිරිම මිස<br>වෙන කිසිවක් නොවේ |

| | | | | |
|---|---|---|---|---|
| 181 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | එදා පියනැගුවෙමි සරසවිය වෙත<br>වෙන් වී මාපිය සෙනෙහසින්<br>වෙන්වී ඇසිල්ලෙන් මාප්‍රියයන්ගෙන්<br>දුටුදින ඔබ සරසවි බිමදී<br>මසිත ඇතිවුනි පෙම්බර හැගුමක්<br>එහෙත් මෝදුවන්නට පෙර<br>සුපෙම් හැගුමක්<br>නැත තවම වියැකී<br>සිතුනි හැම විටම මා ඔබට ආලය කළ බව<br>එහෙත් කෙලෙස මා පවසන්නද<br>එය |
| 182 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | දෛවයේ දොංකාරය<br>සිත්හි හොවාගෙන<br>මල් මිටියාවතක සුසුම් හෙලන |
| 183 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | ආල මාගේ පේන හීනේ<br>පාට පබඳු මාල බැන්දේ<br>මාල ගිරව් පාර පැන්නේ<br>හීන මාවතේ<br>සරා සඳකි දෑස<br>කෝඩුකාර රෑන<br>පියාසලා හීනඅස්සේ<br>අපේ ආදරේ |
| 184 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | මතකයි සදා අදමෙන්<br>නතර වුන හැටි<br>සිත නුඹේ දෙනුවන් ලග |
| 185 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | How to succeed<br>Be positive<br>Accept the challenge<br>Communicate skillfully<br>Enthusiast work<br>Be competent<br>Professional appearance<br>Physical shape<br>Personal integrity<br>Time management<br>Keep the promise<br>No personal mixters important<br>Privet confidential<br>Be independen |

| | | | | |
|---|---|---|---|---|
| 186 | 1 | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | ආසයි උනත්<br>ළදේ මට හඩන්න<br>අවසර නෑ |
| 187 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | පිස්සු කෙළපු කාලේ ඉවරයි<br>මැට් වැඩ කරපු කාලේ ඉවරයි<br>I am kostha |
| 188 | 1 | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | එක බත් පතේ බත් කෑවේ<br>අපි එකට<br>chat room එකේ chat කෙරුවෙත්<br>අපි එකට<br>ඇයි ලිනෝ love කෙරුවේ kc ට |
| 189 | 1 | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | තබන තබන පියවර මල් සුපිපේවා<br>මල් පැණි බොන්න සමනළයන් පැමිනේවා<br>හයෙන් එකක්වත් රිපීට් නොවේවා<br>මැතිඳු සිරිලක වැජඹේවා |
| 190 | 1 | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | තුටින් හමුවී<br>සරසවිය තුළ<br>ගෙවූ අතීතය<br>නිමාවී<br>එකට එක්වී<br>සිටිය අප සැම<br>නිබඳ මතකය<br>නිමාවී |
| 191 | | නන්ලාල් නේවාසිකාගාරය | Hostel | ගතින් වෙන්වී<br>ගියත් මතුදින<br>හදෙහි මිතුදම<br>රැදේවී |
| 192 | 1 | සිරිමැදුර නේවාසිකාගාරය | Hostel | සඳ කැන් දිය මත ඉඳගෙන<br>දැහකරනා හද<br>ළග ඉදගෙන පෙනෙන්නට<br>ඔබ නැත මා ළග<br>කදුළු වලින් පුරවා ගෙන<br>අව්හිංසක නෙත<br>බලා හිදි ඔබ එනතුරු<br>බෙලිහුල් ඔය ලග |

| | | | | |
|---|---|---|---|---|
| 193 | | සිරිමැදුර නේවාසිකාගාරය | Hostel | ඔබේ සඳනැත<br>මැකී යන්නේ<br>සඳ තැටි දියෙන් නිති<br>ඔබ දොවන්නේ<br>කඳුළු ඇයිදෝ ඔබ හෙලන්නේ<br>හෙළු කඳුලැලි පිසදමන්නේ<br>ඔබේ හද සකි සඳ<br>ඔබේ තුරුලේ |
| 194 | | සිරිමැදුර නේවාසිකාගාරය | Hostel | නිවහල්ව ලියන<br>කව<br>නොමැත වඩා<br>රස<br>ලියන එක කවිපෙල<br>කේසේ ලිවද<br>කම්නැත |
| 195 | 1 | සිරිමැදුර නේවාසිකාගාරය | Hostel | නිදහසේ කවිපෙලක්<br>ලියන්නට ගලාඑන<br>වෙලාවක් නැතිවෙලා<br>දැන් 3rd year හංදා |
| 196 | | සිරිමැදුර නේවාසිකාගාරය | Hostel | මා දමා ගියත්<br>නුඹ මට දුන්<br>හිත මා ළගයි |
| 197 | 1 | සිරිමැදුර නේවාසිකාගාරය | Hostel | සිත ඔබ ලග තබා යමි<br>ගතනම් මම රැගෙන යමි<br>නොසිතන ලොව පතා ඉමි<br>පතන ලොව යමි දිනක ඔතා ගමි<br>ඔතන දින ඔබටත් කියන්නෙමි |
| 198 | 1 | සිරිමැදුර නේවාසිකාගාරය | Hostel | වාටර් පද ගලපන හිතං<br>bcat එකට ලියපං<br>beat එකට බැරිනම්<br>අඩුගානේ කැරට් එකටවත්<br>ලියපන්කො |
| 199 | | සිරිමැදුර නේවාසිකාගාරය | Hostel | මේ සබරේ අපි මුණගැසුනා<br>campus එකයි<br>මේ සබරේ අපිවෙන්කෙරුනේ<br>campus එකයි |

| | | | | |
|---|---|---|---|---|
| 200 | | සිරිමැදුර නේවාසිකාගාරය | Hostel | නෙතු පියාගත් පුංචි මෝතක<br>පුංචි රුවවිත් දග කරනවිට<br>සත්තමයි මම දෙනෙත් නොඇරම<br>ඉන්න හිතුනා හැමදාම |
| 201 | | සිරිමැදුර නේවාසිකාගාරය | Hostel | ජිවිතය මෙය නම්<br>හරිනු බැරි යුතුකම්<br>කරන කළ රුදුකම් |
| 202 | | සිරිමැදුර නේවාසිකාගාරය | Hostel | ලයිට් නිවා කේක් කෑ වගයි |
| 203 | | සිරිමැදුර නේවාසිකාගාරය | Hostel | මට ආදරේ කරන්න<br>විදින්න<br>ඉගැන්නුවේ ඔබ |
| 204 | | සිරිමැදුර නේවාසිකාගාරය | Hostel | මේ කඳු යාය<br>සාක්ෂි හැම මොහොතකම<br>මම හිතින්<br>ඔයා ලග බවට |
| 205 | | සිරිමැදුර නේවාසිකාගාරය | Hostel | ඔයාගේ ආදරේ තියෙන<br>ඇස් දෙක තුළ<br>මං මාව දකින්නේ |
| 206 | | සිරිමැදුර නේවාසිකාගාරය | Hostel | මං ඇඩුවෙත්<br>සිනාසුනෙත්<br>සැනසුනෙත් ඔයා ළග |
| 207 | | සිරිමැදුර නේවාසිකාගාරය | Hostel | ඔයාගේ ජිවිතේ හැම මොහොතකම<br>ඔයාට පහනක් දෙන්න<br>ඔයා ළගම මම ඉන්නම් |
| 208 | 1 | සිරිමැදුර නේවාසිකාගාරය | Hostel | ඔය උරේ හිස තියන්<br>නෙතු පියා සිටින විට<br>ආදරේ දෝර ගැලුවා<br>මලක් වගේ මාව රැක ගන්නට<br>දොලක් වගේ සෙනේ පිරුවට<br>මට සිනා දුන්නට<br>හැම සතුටම පිදුවට<br>මගේ කදුළු<br>ඔය ඇස්වලට වාවන්න බැරිවුණා |

| | | | | |
|---|---|---|---|---|
| 209 | | සිරිමැදුර නේවාසිකාගාරය | Hostel | No one cant<br>Be like my අප්පච්චි |
| 210 | | සිරිමැදුර නේවාසිකාගාරය | Hostel | සොඳුරුතම ප්‍රේමය වු කලි<br>අහිමි ප්‍රේමයයි |
| 211 | 1 | සිරිමැදුර නේවාසිකාගාරය | Hostel | ප්‍රේමය වු කලි සිතුවිලි වල<br>පරිත්‍යාගශිලිත්වය ක්‍රියාවෙයි<br>අවංකත්වය ආත්මාර්ථයෙන් තොර<br>සුදු කළු චරිත මැද<br>සගවත් මනුෂ්‍යත්වයේ<br>යථාර්ථය |
| 294 | | පුස්තකාලය | Library/ Lecture hall | ගෙළු බෙල්ලාගේ<br>කටුව,<br>මගේ ඔළුව වැනිය. |
| 295 | | පුස්තකාලය | Library/ Lecture hall | සඳගිමන් නිවා<br>සුදුවලාකුලක වැතිරී<br>පෙම්කතාවක් තියනවා<br>ආදරයට නොනිමි....<br>ඒ සදට වඩා.....<br>තනි තනි තරුවත් දනිමි<br>ඒ තරුව නුඹයි<br>මම නිති නුඹට<br>තනි රකිමි..... |
| 300 | | පුස්තකාලය | Library/ Lecture hall | ජිවිතය බොහො දුරයි<br>නොපෙනෙන මානයට විහිදෙන<br>ඇස් කෙවෙනි බොද කරන්<br>වෙහෙස වුවත් සොයන්නට.....ජිවිතය<br>පෙනෙන මානයක නෑ<br>සුන්දර දසුනක්<br>එකොමත් එක අතිත දිනයක<br>දෙනයනට සුවය ගෙන<br>සිත අද්දර රැඳුනු<br>ඒ සොඳුරු රුවම<br>තවමත් සිත තුල රැදෙමින්<br>හදවත හා දවන කල<br>පවනේ විද<br>පවිකාර මගේ ෙ |
| 302 | | පුස්තකාලය | Library/ Lecture hall | හද සිසිල ගෙන දෙන්න<br>මුදු සුවද විදගන්න<br>සිත සතුට පුරවන්න<br>මගෙ සතුට ඔබ ගන්න |
| 304 | | පුස්තකාලය | Library/ Lecture hall | ප්‍රේමය නම් අසෙනිය කුසුමක් වේ<br>රිසි වු කෙනෙකුට පුජා කරන්නට<br>ලොභ සිතින් තොර<br>පිදුව මනා වේ<br>පෙරලා ලබනට<br>නොසිතා බිදකුත් |

| | | | | |
|---|---|---|---|---|
| 306 | | පුස්තකාලය | Library/ Lecture hall | කොහෙදෝ<br>ඈතක සිට පියඹා ගෙන එන<br>පේලි පේලි එන රන් සමනළුනේ<br>නිවන් පුරට පාරසොයනවාද<br>කඳුමුදුනේ<br>සමනල කඳුමුදුනේ...... |
| 307 | | පුස්තකාලය | Library/ Lecture hall | නුඹ ලබා ගන්න කැපකල<br>හැමකවි පදයක<br>කඳුළු කඩා හැලෙව්<br>පැතුමක එළිවැට බිඳ<br>හමුවූ බව මීස එකමත් එක<br>දවසක අප<br>වෙන්වූ දුක කියන්න<br>හරි....දිළිඳු කවිපද..... |
| 308 | | පුස්තකාලය | Library/ Lecture hall | දහස් දනන් සරනා මේ නුවර මැද<br>තනිකම දැනෙ නුඹ නැති දා මගේ<br>සිතට<br>සොයා නුඹේ රුව සැරමුවත් මගේ නෙත<br>මගෙ ලොවට බොහෝ දුරයි ඉන්නේ<br>නුඹ... |
| 309 | | පුස්තකාලය | Library/ Lecture hall | තෙවසරක් අකුරු කළ<br>සොඳුරු සරසවිය<br>යළි කවදා කෙලෙස ඔබ<br>වෙත එන්නද? |
| 310 | | පුස්තකාලය | Library/ Lecture hall | දහස් දනන් සරණා<br>මේ නුවර මැද<br>තනිකම දැනේ නුඹ නැතිදා<br>මගේ සිතට |
| 313 | | පුස්තකාලය | Library/ Lecture hall | ජීවිතය නම් සයුරේ<br>තරනය කරන්නට<br>අවැසි<br>හබල<br>ආලයද ? ප්‍රේමයද? හබලද? |
| 314 | | පුස්තකාලය | Library/ Lecture hall | කඳුළු බිඳු දෙකක්<br>පාරමී පුරා<br>මල් දෙකක් වෙලා පිපුනයි<br>කටු කම්බි මාවතේ |
| 316 | | පුස්තකාලය | Library/ Lecture hall | අතිතයට වඩා පැරණි<br>මගේ ආදරේ....<br>මං ඔබ ගැන පැතු පැතුම්<br>දනියි සාගරේ.... |

| | | | | |
|---|---|---|---|---|
| 317 | | පුස්තකාලය | Library/ Lecture hall | සුමුදු සඳරැස් ගලන<br>සරාසඳ වගෙයිනුඹ<br>නුඹේ ළඟ මලානික<br>තාරුකා ඇසකි මට |
| 318 | | පුස්තකාලය | Library/ Lecture hall | ගනන් අතින් මට වැඩි බර දුන්නා<br>ලකුණු ටිකක් මට වැඩි පුර දෙන්න<br>ගනන් සර්..... මගේ හිටි තැන මට දෙන්න<br>අනේ .සර්.... කරුනාවෙන් සලකන්න. |
| 320 | | පුස්තකාලය | Library/ Lecture hall | මතකය දෙස වරක්<br>හැරි බලන්නට මට සිතේ<br>සිය දහස් වර ඔබ<br>ඇතැයි මට සිතේ<br>මතකය මළගමත්<br>ඒ මතකයෙහිම හිද<br>මීය යන්න සිතේ..... |
| 321 | | පුස්තකාලය | Library/ Lecture hall | හෙට ගලන නැවුම් ගඟ<br>නරඹන්න.....<br>අපිත් එමු.......ගංතෙරට<br>මා නොවන මා එක්ක<br>නුඹ නොවන නුඹ එක්ක<br>අපි නොවන අපි එක්ක |
| 322 | | පුස්තකාලය | Library/ Lecture hall | ඔබ යන්න මධුර ස්වර අරං<br>මගේ රට මැදිරියට මගේ ඉරහඳ අරං<br>ඔබ යන්න මහද තෙත් වැහි වලාකුළ අරං<br>කමක් නැ ඔබ යන්න මගේ ආයුං අරං |
| 325 | | පුස්තකාලය | Library/ Lecture hall | සඳුට සදහටම සෙනෙහ පැමුත්<br>උදුල තරු කැටයම්<br>හිරුට පෙම්බැදි එකද තරුවක්<br>සිටිය නොහැකිද යම් |
| 326 | | පුස්තකාලය | Library/ Lecture hall | ආදරේ සුන්දරයි<br>පිවිතේ මල් මිටයි<br>ආදරේ ඔබටමයි |
| 327 | | පුස්තකාලය | Library/ Lecture hall | පැතුම් පිවිතුරු ප්‍රේමය නාමෙන්<br>සහස් සුවහස් පැතුම් ඔබ මහිමෙන්<br>ඉනු කඳුලද සිදෙන්නට<br>යදින්නම් ඔබ මැකි යනු මතකෙන්. |

| | | | | |
|---|---|---|---|---|
| 328 | | පුස්තකාලය | Library/ Lecture hall | මට වඩා<br>ඔබ සුව විදින<br>ඔබේ ගම් පියස<br>වඩා පින්කර ඇතැයි<br>මට හැඟේ. |
| 330 | | පුස්තකාලය | Library/ Lecture hall | දෙවියන් විසින්<br>දුන් පඩුරක් ලෙසින්<br>ප්‍රියාණනේ ඔබ<br>සුරකිමි බැතින්..... |
| 331 | | පුස්තකාලය | Library/ Lecture hall | මල් පොකුරු<br>සිත පිණි මියැදෙයි<br>නිදහසේ මළගමට<br>දින ලගයි. |
| 332 | | පුස්තකාලය | Library/ Lecture hall | මල් සුවඳ වගේ මල මතම රැඳි<br>විලේ ජලය වාගේ විල තුලම රැඳි<br>සඳේ සඳාතන ආදර සිසිල වැදි<br>අපේ ආදරේ පවති සුවඳ දිදි |
| 333 | | පුස්තකාලය | Library/ Lecture hall | ආදරේ කියා කියන්නේ<br>හරිම වාතයක් |
| 335 | | පුස්තකාලය | Library/ Lecture hall | උපාධිය ඇයි මෙතරම්<br>වෙහෙසකර? |
| 336 | | පුස්තකාලය | Library/ Lecture hall | Don’t look out<br>My face<br>My fece like a<br>Galde face"" |
| 337 | | පුස්තකාලය | Library/ Lecture hall | සඳ පෙම් කරන්නට<br>ළග රැඳුණු තරුවකට<br>කියා ගනු හැකිවේද<br>සඳට පෙම් කරන වග |
| 338 | | පුස්තකාලය | Library/ Lecture hall | ළග නැති වුනත්<br>සිත ළග ඇති<br>ආදරේ භාවනාවකි |
| 339 | | පුස්තකාලය | Library/ Lecture hall | තව එකම එක වරක්<br>පරදින්න දිනුම දි<br>දිනවන්නම් ඔබ<br>ජිවිතය පුරා |

| | | | | |
|---|---|---|---|---|
| 340 | | පුස්තකාලය | Library/ Lecture hall | කඳුළ හිනැහෙන විටදි<br>නෙතු අග<br>අසරණයි යලි තනියි<br>පෙම් ලොව. |
| 342 | | පුස්තකාලය | Library/ Lecture hall | ජීවිතද කවියක්<br>ආදරය එහි සොඳුරුතම වදනක් |
| 343 | | පුස්තකාලය | Library/ Lecture hall | නඩුපද වගන්තිය ඇතුලත් නිතියට<br>පි.එල්. දුන්නු ක්‍රිමිනල් වහකදුරුමට<br>නිදිවර වරා පාඩම් කල අපේ උන්ට<br>ලෙඩා දුන්නේ D විතරයි කොළයකට |
| 348 | | පුස්තකාලය | Library/ Lecture hall | මා දන්නේ ඔබම පමනයි<br>එයම සිහිනයකි |
| 350 | | පුස්තකාලය | Library/ Lecture hall | වෙන්ව යන ඉමට<br>ඇවිත් අප<br>දුක දරන්නට බැරි තරම්<br>මේ දුකම ඔබටත් දැනෙනවාද<br>මට හිතා ගන්නට බැරි තරම් |
| 351 | | පුස්තකාලය | Library/ Lecture hall | සරසවියේ අසරන වී සිටින විට<br>ඔබ හමුවුයේ දිය බිඳුවක් විලස මට<br>පැමිණිය නමුඳුසිවු වසරක්<br>කෙලවරට<br>යම්දෝ කෙසේ ඔබ හැර මම<br>ගමට |
| 353 | | පුස්තකාලය | Library/ Lecture hall | සිහිනයකි ප්‍රේමය<br>රෝස පැහැ කම්මුල් අතර රූටා<br>වැටෙන<br>කඳුළු බිදකට පබැඳුවේ<br>මාවතේ යනෙන<br>ඉඳුල් යදින අයගේ නෙතු අතර<br>හෙමින් හෙමින් රූටා වැටෙන<br>කඳුලු බිඳු නොදකින්න<br>ඔබේ කවි බස කිමද<br>සබඳ පින් මදි වුයේ |

| | | | | |
|---|---|---|---|---|
| 355 | | පුස්තකාලය | Library/ Lecture hall | මීන්මතු අප හමුවේද ආයේ<br>කසගස් සෙවනෙදි<br>ආදරයෙන්<br>හින් සැරෙ ඔබ සිතටම එනවා<br>දයාබරයි මා එදා වගේ |
| 356 | | පුස්තකාලය | Library/ Lecture hall | සිප්සතර දැන උගෙන<br>මගේ ලොවට ඔබ රැගෙන<br>හදවතේ ගිනි නිවන<br>ඒ සොඳුරු දින කොතැන |
| 357 | | පුස්තකාලය | Library/ Lecture hall | සුදු වලා කැටිව ගත්<br>අඳුරු අහස් කුසයට<br>සිහිල් මද පවන් මදින්<br>දුවයි සිත ඇවෙතට |
| 358 | | පුස්තකාලය | Library/ Lecture hall | ආදරය තුළින් එන<br>ඉම්හිර වූ සතුට මෙන්ම<br>ඒතුළින් ඇතිවන වේදනාව ද<br>හදවතට බොහෝ සේ උණුසුම්ය |
| 359 | | පුස්තකාලය | Library/ Lecture hall | ඔළු කුහර කකියන<br>ගිල්ප කතරේ<br>දිය බිඳකි සොඳුරිය<br>දුම්වලා ගිනි පිඹින<br>කොන්ක්‍රිට් කතරේ<br>නුඹ මට<br>සිහිල් පවනකි සොඳුරිය |
| 360 | | පුස්තකාලය | Library/ Lecture hall | සටහන් අතරේ නෙත් සීර<br>වෙනවා<br>හදවත මාගේ ඔබ වෙත<br>එනවා<br>මා මෙහි තනිවම ඔබ මෙහි<br>තනිවම<br>දෙදෙනා දෙතැනක සුසුම්<br>හෙලෙනවා |
| 361 | | පුස්තකාලය | Library/ Lecture hall | මා ද ඔබ විය<br>ඔබ ද මා විය<br>ඔබ අන්සතු විය<br>මට කෙල විය |

| | | | | |
|---|---|---|---|---|
| 363 | | පුස්තකාලය | Library/ Lecture hall | ඇලක දොළක ගංගාවක ගැඹුරු දියේ<br>යම් දිනෙක මා සතු සිරුර<br>තියේ<br>ඒ රුදුජලතරයට නොවෙයි<br>බියේ<br>ඒ රුදු ගැහැණියට සැඟවී සිටිමි<br>බියේ |
| 364 | | පුස්තකාලය | Library/ Lecture hall | කැදැල්ලේ උන් කිරිල්ලි මා<br>චණ්ඩ මාරුතයේ හැපි ගියා<br>ආලයේ දඬයකට හසුවී<br>සොවින් ඉකි ගසමින්<br>සිනාසි උනිමි |
| 365 | | පුස්තකාලය | Library/ Lecture hall | නංගි මිය ගියා එය දුක් ගොඩක් උනා<br>සරසවි බිමේ නුඹ මගේ නංගියෙක් උනා<br>අපේ ඇසුර දැන නොයෙකුත් පදබැදුනා<br>නුඹේ හොදට මම මෙහි හුදකලා වුනා |
| 366 | | පුස්තකාලය | Library/ Lecture hall | සුවඳ විහිද මල් පුබුදින වෙලාවට<br>පවන් පොදින් නව සුවදක් දැනේ මට<br>සිනා කවට සපිරුණු පිරි සැදැවක<br>දෙනෝ දහක් මදිකම දැනේ මට |
| 368 | | පුස්තකාලය | Library/ Lecture hall | කඳුලැල් සලා<br>මමත් වැලපෙමි<br>ආදරය නිසා<br>ඔබ දන්නේනෑ<br>සෙනෙහෙ කඳුලක<br>වෙදනා පවා |
| 369 | | පුස්තකාලය | Library/ Lecture hall | ගනඳුර කැටි වුන හදවත්<br>කුටියේ<br>බලාහිදින්නෙමි තනිය දරා<br>ගනඳුර දුරලන සඳරුල්ලක් වී<br>මගේ ලොවට ඔබ වඩින තුරා |
| 370 | | පුස්තකාලය | Library/ Lecture hall | ගිල්ප කබලෙන්<br>ලිපට වැටුනි<br>ඇය මගෙන්<br>වෙන් වු දිනේ |

| | | | | |
|---|---|---|---|---|
| 371 | | පුස්තකාලය | Library/ Lecture hall | නිමා විය වසන්තය සරසවියේ සැරි සරා<br>ගම රටට යායුතුය දැන් ඉතිං පය ගසා<br>කාටවත් නොපෙනෙන්න සිතින් ඉකි ගස ගසා<br>නුඹෙන් සමුගනිමි මම සමුනොගෙන බැරි නිසා |
| 372 | | පුස්තකාලය | Library/ Lecture hall | දවසක් එක් සැදෑවක<br>අපි උන්නා මෙහි තනි වී<br>ජිවිතය තේරුම් ගැනිමට අසිරුව<br>බලා සිටිය උනුන් දිහා |
| 373 | | පුස්තකාලය | Library/ Lecture hall | ජිවිතයේ එක්වරක්<br>එකම එක වතාවක්<br>මුදු දෙතොල් විවර කොට<br>මිමුණුවොත් ආදරයෙන්<br>වැලද ගෙන අනාගතය<br>ඒ මොහොත පටන් යලි<br>ලබන්නෙමි ජිවිතය |
| 375 | | පුස්තකාලය | Library/ Lecture hall | ලවර්ස් ලෙන් එකේ සුදුමල් පිබිදේවා<br>වෙනදා වගෙ සවසට වැසි නොවැටෙවා<br>මගේ කාමරය ගනඅදුරින් නොවැසේවා<br>ප්‍රවිණතා ප්‍රතිඵල පිට නෙවේවා |
| 377 | | පුස්තකාලය | Library/ Lecture hall | සිරිපාලගේ දේශනාව<br>අපට හරිම වේදනාව<br>කිමද ඊට කාරනාව<br>මාජි ගැනයි කල්පනාව |
| 378 | | පුස්තකාලය | Library/ Lecture hall | පෙම් කරනා හැටි මාහට<br>කියා දුන්නේ ඔබය සොඳුර<br>එසේ නමුත් ඔබ තවමත්<br>කියා දුන්නේ නැහැ නොවේද?<br>ඉන් ගැලවෙන අන්දම ගැන |

| | | | | |
|---|---|---|---|---|
| 379 | | පුස්තකාලය | Library/ Lecture hall | නැත යන්නට සිතක්<br>දමා ඔබ සරසවියෙ<br>අද ඔබට සහ මට<br>සෙවන දුන් හන්තාන<br>සිහිල දුන් මහවැලිය<br>මා ඔබ දමා ගිය පසු<br>සරසවියේ තනිකර<br>පවිරක් වෙවී හන්තාන<br>ඔබේ දුක් මගෙන් සගවන්නට බැදි<br>සෝ ගඟක් වෙවී මහ වැලිය<br>ඒ දුක කියා දිව ඇදෙන |
| 381 | | පුස්තකාලය | Library/ Lecture hall | ප්‍රේමය සාගරයක් වගෙයි<br>ගැඹුරුයි රුදුරුයි<br>චංචලයි පියකරුයි<br>විඩාවට ප්‍රයෝජන නැත<br>ලුණු රස වැඩියි |
| 382 | | පුස්තකාලය | Library/ Lecture hall | ආදරය විද්වතුන්ට<br>පඬිවරුන්ට<br>දර්ශනිකයින්ට<br>හෝ<br>මිහිමත කිසිවෙකුට<br>නිර්වචනය කල නොහැකි<br>එකම දෙයවේ |
| 385 | | පුස්තකාලය | Library/ Lecture hall | පහන් කණුව මම<br>දැවී ගිය දියබුබුළ ඇය |
| 386 | | පුස්තකාලය | Library/ Lecture hall | වෙන තරුණියකගේ දැත් අරන් ඔබ<br>පියමන් කරනා සරසවියේ<br>කෙසේ බලන්නද ඔබ යනෙන මග<br>දැස හඩයි මගේ කඳුළු නැතත් |
| 387 | | පුස්තකාලය | Library/ Lecture hall | සඳුන් ගැටක් මා අත නම් නැ රැඳුනේ<br>පියුම් හතක් පා යට නම් නැ පිපුනේ<br>මුඩුක්කු සල්ගස හෙම නැ වැඩුනේ<br>සිද්ධාර්ථ නම පමනයි මට තිබුනේ |

| | | | | |
|---|---|---|---|---|
| 390 | | පුස්තකාලය | Library/ Lecture hall | ගල්බැම්ම වට කරපු අඳුරු සිර කුටියේ තුල<br>නිතර මසිතට නැගෙයි සොයුර නුඹ විදින දුක<br>පොත් ගුලට වැදෙන මුත් අපේ ගත<br>ගත සිතට පණ නැතිව බිම වැටෙයි අං තබා පොත |
| 391 | | පුස්තකාලය | Library/ Lecture hall | එස්.එස්.සි විනාශාය<br>සම්මානෝ අති දුර්ලභා<br>රැකියා විරහිතං දුක්කං<br>බි.ඒ ඩිග්රී මහා භයං |
| 392 | | පුස්තකාලය | Library/ Lecture hall | නිතර හමුවන ඔබේ සුවදයි මගේ හිත යට ඇති හැගුම්<br>කෙලෙස සිතුවත් බැහැ මකන්නට නැගි එයි කුළුදුල් පැතුම්<br>රුදුරු මිනිසුන් සිටින මේලවේ කෙලෙස ඉටුවෙව්ද පැතුම්<br>පැතුම්ඉටුවෙන තුරු ඉදින්නෙම් වෙලා යැම විට දුක් සුසුම් |
| 393 | | පුස්තකාලය | Library/ Lecture hall | ඈත අතිතයේ සිහින මැවු<br>සරසවි දිවිය සුන්දර සිහිනයකි<br>සිනහවක් වත් නොව<br>කඩු පහරින් තුවාල ලද තුවාලයක<br>කැලලක් මෙනි |
| 394 | | පුස්තකාලය | Library/ Lecture hall | පාඩමං අරහං තානං<br>විභාගං භයං කරං<br>බඩගින්න ඉවසං බොලං<br>නින්දනං පරමං සුබං |
| 396 | | පුස්තකාලය | Library/ Lecture hall | ලබන්නට උපාධිය ඇන නොගන්නට<br>නිදිමරයි ලියන්නට අප සැම විභාගය<br>ඇඟ බසියි අඳින්නට බැරිය කලිසම<br>සැමදා පිම්එකේ කන්නට බැරිය<br>පරිප්පුව |
| 397 | | පුස්තකාලය | Library/ Lecture hall | ඉගෙන ගත්තේ හිසේ කොඩිමල් බඳින්නයි<br>අපිපැතුවේ ලෝකෙට සෙත කරන්නයි<br>අහො මිතුර ඉගෙනුම ඵල ලබන්නයි<br>අද සිදුවුනේ මහ මග දුක් විදින්නයි |

| | | | | |
|---|---|---|---|---|
| 399 | | පුස්තකාලය | Library/ Lecture hall | සරසවි බිමේ සත් වසරක් ගත කෙරුව<br>මගෙ ලොකු දුවේ ඇයි අද ඔබ මට බැරුව<br>කුමරෙක් සොයා දෙන්නට මා නිදි මැරුව<br>අත් දෙක වන වනා ආවේ කිම දරුව |
| 400 | | පුස්තකාලය | Library/ Lecture hall | අනේ සුසානෝ ඉස්සර වාසිටියේ<br>මේසේට කැම ඇරලලු දිලා හිටියේ<br>අලුතින් හිලක් විදලා ඉනවට පටියේ<br>බඩ තදකර ගනින් හොදහැටි කිටි කිටියේ |
| 401 | | පුස්තකාලය | Library/ Lecture hall | අල්ලට සිඟාමෙන් දෙවරුව පාන් කකා<br>පස්ස ඉරුණු කලිසම දූලියෙන් වකා<br>නැති බැරි කමුත් ඉවසා දත් කුරු  විකා<br>ලැක් වැස් දුවමු බී. ඒ. අකුරු දෙක තකා |
| 402 | | පුස්තකාලය | Library/ Lecture hall | පානුයි පරිප්පුයි දවසක බුදු    වේවා<br>ගෝවයි අලයි සැරියුත් මුගලන් වේවා<br>කැන්ටින්  හොද්ද නේරංජා ගඟ වේවා<br>සුප්පයියා මුදලාලි කන්ථක අසු  වේවා |
| 403 | | පුස්තකාලය | Library/ Lecture hall | පිදුරු සෙව්ලි කළ පැල්පතේ ඇත<br>මිට සැප අනෙ දෙවියනේ |
| 404 | | පුස්තකාලය | Library/ Lecture hall | කැන්ටිමේ පල්වෙව්චි<br>හොද්ද ගා පාංකා<br>ශිල්ප කලත් හත් අවුරුද්දක්<br>බඩපනුවෝ නිදැල්ලේ<br>පුටි  බොල් කෙලිනවෝ |

| | | | | |
|---|---|---|---|---|
| 407 | | පුස්තකාලය | Library/ Lecture hall | දහවල් කලට ඇදිරිදූ වාසනාවන්<br>සැන්දෑ කලට කෙල්ලන්ගේ පනාවන්<br>රෑ තුන්යමේ මදුරුගෙ ගායනාවන්<br>එලිවෙන පැයට නිදි දූව වාසනාවන් |
| 408 | | පුස්තකාලය | Library/ Lecture hall | කුසට නැත අහරක්<br>නෙත නොදනි නිදි සුවය<br>සරසවිය සරසවිය<br>මරා දැමුවේය නුඹ අපේ<br>සොඳුරුවූ යෞවනය |
| 409 | | පුස්තකාලය | Library/ Lecture hall | එන්නේ කැම්පසුයි හොස්ටල් එකේ සිට<br>කන්නේ වතුර සහ බත් කැන්ටිමේ සිට<br>මාස ගනන් නැත දිය බිඳු නාන්නට<br>මේ දිවි කතර දුක් උසුලන්නේ කුමට ? |
| 410 | | පුස්තකාලය | Library/ Lecture hall | අපි ආවේ ඉගෙන ගන්න<br>අපිට උනේ නොකා ඉන්න<br>ණය තිබෙනවා ඉහ පිරෙන්න<br>අපි යනවා ගෙදර යන්න |
| 411 | | පුස්තකාලය | Library/ Lecture hall | පිපි මල් පරව විසිරී ඇත දෙරණ මත<br>විහිදූ සුවඳ තවදුරටත් මියෙනු නැත<br>ඔපවත් කරන්නට එසුවඳ අපරී මීත<br>නිමා නැති තර තව මල් පිපෙනු ඇත |
| 412 | | පුස්තකාලය | Library/ Lecture hall | ආදරයේ කඳුලකට ජිවිතය උකස් කර<br>සුසුම්ලන යෙහෙළියේ<br>තියා ගන් නුඹ නේතේ රැඳි කඳුල<br>අපේ ලෙව ගොඩනඟන උන් නන්<br>පුදන්නට |
| 414 | | පුස්තකාලය | Library/ Lecture hall | සුදුසරමේ ලේ හැලුවේ තොප බව<br>අමතක වුනාද?<br>බුලත් විටේපස් පංගුව ජාතියකට අයිත්<br>වේද?<br>ඔසිගේ මඩ වලේ ඉදං සැබෑ වෙනස<br>ඇතිකලාද?<br>ඊලාමය දිනා ගන්නට කැණහිල් හඩ<br>තවනැගේද? |

| | | | | |
|---|---|---|---|---|
| 415 | | පුස්තකාලය | Library/ Lecture hall | ටයරය ගිනි දළුව යෞවන සිරුර මැඩ<br>දුටුවෙමු දකින්නෙමු බුරමින් නැඟෙන<br>හඬ<br>අවනිතිය එරෙහිව උන් නගන<br>හඬ<br>යලියලි ඇසෙයි දළුවල සිරස මැඩ |
| 416 | | පුස්තකාලය | Library/ Lecture hall | කන්හිරි වැටෙන ළයපුපුරන වෙඩි<br>සද්දෙන්<br>ඡනාසැලෙන පිරිස පමණක් අප හා<br>එද්දෙන්<br>යන්නට දෙපා පණ නැති වුන්<br>නවතිද්දෙන්<br>ජය බිම කරා අපි යමු පෝරක<br>මැද්දෙන් |
| 417 | | පුස්තකාලය | Library/ Lecture hall | නේවාසිකාගාරයෙ වන පොත්<br>කරන<br>මැදියම් රැයේ ඇසුනා නම්<br>දෙඩන<br>දුටුවෙම් රුහිරු බිත්තියෙ පෙරදිග<br>ගැටුන<br>සැඟවු මලනුවෙනි සිහිවිය නුඹ<br>වුවන |
| 418 | | පුස්තකාලය | Library/ Lecture hall | අපේ අරුනළු නෙලා ගන්නට<br>හැකි වුනොත් මේ භවයේ<br>ගොඩනගනු නවලෝකය<br>සද රැකගමු දිවි දෙවෙනි කොට |
| 419 | | පුස්තකාලය | Library/ Lecture hall | විප්ලව කාරයින් බනින්නේ<br>දුප්පත් කම නිසා නොව<br>දුප්පත් කම ලඟින් ධනවත්කම<br>පෙනෙන්නට තිබෙන නිසාය |
| 420 | | පුස්තකාලය | Library/ Lecture hall | සිද බිද දමා දිවි මග සහ අදුරු වැල<br>ශිල්පය පිබිදියන් පුරහද මඬල වෙලා<br>ඒ පුර හඳ මඬල සිරිලක හැඩය වෙලා<br>අනුරපුරේදි ජනපතියට පිස්සු කලා |

| | | | | |
|---|---|---|---|---|
| 422 | | පුස්තකාලය | Library/ Lecture hall | වඳුරන් ඇවිත් රට අල්ලන වෙලාවේ<br>කොල්ලන් මරන්නේ ඇයි හත් වලාමේ<br>පාදඩ එවුන් ඉන්නා අප හමුදවේ<br>ජාතක කළේ බල්ලොද ඉන්දියාවේ |
| 423 | | පුස්තකාලය | Library/ Lecture hall | මාමිය ගියත් දෙරනෙණ් අසම සම<br>රතුමල් පිජේවා පොහොරට රැගෙන<br>ලැම<br>ලෝකය පිටු දකින දිනයක  දිළිඳු කම<br>නැගිටිම් ආත්මය සමගින් එදින මම |
| 424 | | පුස්තකාලය | Library/ Lecture hall | යුක්තිය පතා මවුබිම රතුලෙයින් තෙමු<br>සතුරන් ඉදිරියේ නොසැලි සිටින්නෙමු<br>මිනි කඳුළඩින් අපි පිය මනින්නෙමු<br>මව්බිම නැතොත් මරණය අපි<br>දිනින්නෙමු |
| 426 | | පුස්තකාලය | Library/ Lecture hall | බැටන් පොලු කර පිටම දෙං<br>කඳුළු ගැස් වෙඩි උන්ඩ දුං<br>කොයිද සගයින් එරං<br>නැතිය ඉහිලුම් කරන තෙක් සුං |
| 427 | | පුස්තකාලය | Library/ Lecture hall | නැවත වතුර මල යට හිඳ නල වතුර<br>තාමත් සිතින් කිදෙයි ගඟ දිය වතුර<br>කැම්පස් කැන්ටිමේ බත හරි නැහැ<br>මිතුර<br>තාමත් සිහි වෙතිය පෙර කෑ අල බතල |
| 428 | | පුස්තකාලය | Library/ Lecture hall | ජිවිතය<br>ගෙවි යනුයේ<br>පොත් පිටු අතරේ ය<br>කැත්තයි උදැල්ලයි උරුමවූ<br>අප හට<br>පොතයි පෑනයි හුරු වී ඇති<br>ඵලය කුමටද? |

| | | | | |
|---|---|---|---|---|
| 430 | | පුස්තකාලය | Library/ Lecture hall | විදුලි එළියයි පඩුවු පැහැයෙන් රැයෙ සිත නෙත පෙළන්නේ<br>පාට බොඳවුණු අකුරු මතු විදුක කියා ගෙන ඉකි බිඳින්නේ<br>ඈත පැළ තුළ කුප්පි එළියෙන් අකුරු කරනා ළමුන්නේ<br>විසල් ලෝකෙක අතරමං මට එන්න පාරක් කියන්නේ |
| 431 | | පුස්තකාලය | Library/ Lecture hall | ඈත විලේ රන් වන් රන් නෙළුම් මල ගෙන ගියා නගරයට<br>විෂමයි පුදුමයි දඟකාරයි<br>මම නොදනිමි මේ කිසිවක්<br>ඉතිං කියාපං සබඳ මම කොහොම<br>නුඹව ආමන්ත්‍රණය කරන්නද<br>මටම නොතේරේ<br>ඉඩ දිපං සහොදරය<br>මට නුඹව සත්‍ය තුළින්<br>යම් දුරක් ප්‍රතිරූපනය දැක ගන්න<br>ඉන් අනතුරුව මට නුඹ ශාප කරපන්<br>මාව අමුනුෂ්‍යය |
| 432 | | පුස්තකාලය | Library/ Lecture hall | මිනිසුන් අතර තනි විම<br>මිනිසුන් නොමැති පරිසරයක<br>තනිවිමට වඩා<br>ඛේද ජනකය |
| 433 | | පුස්තකාලය | Library/ Lecture hall | දේශන මොටද මතකයේ රඳවන්න බැරි<br>සටහන් මොටද කියවා නිමවන්න බැරි<br>බුද්දිය මොටද සත්‍යය ජයගන්න බැරි<br>ඩිග්‍රිය මොටද රක්ෂාවක් ගන්න බැරි |
| 434 | | පුස්තකාලය | Library/ Lecture hall | සතුට සැනසුම<br>සුහදතාවය<br>නොමැත සැමවිට<br>මෙලොව අප සතු<br>කඳුළු අතරින් සිනාසෙන්නට<br>නොහැක එනමුත්<br>එයයි කළයුතු |

| | | | | |
|---|---|---|---|---|
| 435 | | පුස්තකාලය | Library/ Lecture hall | උදුරා විසි කොට වසන්තය මහපාරට<br>හාමතේ ගියෙ කුමකටද?<br>කඳු හෙල් අතර පිපී පරවෙන්නට-<br>රහසේ<br>නොකියාම නුඹෙ සුවඳ<br>නොහඳුනන මිනිසුන් වෙනුවෙනි<br>දෑත පාලය දි ආදරයෙන් වැලඳගෙන<br>වෙඩි උණ්ඩ කෑවේ කුමකටද? |
| 437 | | පුස්තකාලය | Library/ Lecture hall | ප්‍රථම වසරින් පාස් වී බිමට පැමිණි<br>නුඹ විප්ලවයේ රතු කොඩිය ඔසවා<br>සමාජයට කියාපාන්නේ යහපත්<br>සමාජයක් හද දිපල්ලා<br>නිදහසේ ඉන්න දිපල්ලා කියා<br>නමුත් නුඹ<br>සරසවි බිමෙන් අවසන් වසරින්<br>සමාජයට ගොස් රතු ධජය<br>ඔසවා යන්නේද?<br>ප්‍රථම වසරේ කියූ කරපු දේ<br>අවසන් වසරින් පසු ක්‍රියාත්මක වන්ෙ |
| 438 | | පුස්තකාලය | Library/ Lecture hall | ජිවිතය නැවතිලා<br>සරසවිය මවු කටේ<br>හැල්ලුවට ලක් වුයේ<br>උපාධිය නුඹනොවේ<br>බුද්ධි යැයි මේ රටේ<br>මන්ද බුද්දිය රජ වෙලා<br>නාඬන්න උපාධිය<br>නාඬන්න සරසවිය<br>ජනසවි හිනැහිලා |
| 439 | | පුස්තකාලය | Library/ Lecture hall | හිතමිතුරු මානවකය<br>මේ දළ සිවුරු පටින් වසා ඇති තරුණ<br>සිරුර<br>ඔබ පතන බොහෝ දේ පැතිමට<br>නොහැකිව බොහෝ දේ<br>ප්‍රතික්ෂේප කර බොහෝ දේ ඉවසා<br>දරාසිටිනු ඇත.<br>භික්ෂුවක් |
| 441 | | පුස්තකාලය | Library/ Lecture hall | දිවි ඇති තුරා මේ දිවියෙහි පසුවන්න<br>සිතු මුත් නිදහසක් නැත මෙහි විදගන්න<br>යන එන තැනක සිදුවෙයි දෙස්<br>අහගන්නට<br>මට බැහැ ඉන්න සම්දූනි යන්නෙම් යන්න |

| | | | | |
|---|---|---|---|---|
| 442 | | පුස්තකාලය | Library/ Lecture hall | එකෙකුගෙ සැපට තවකෙකු ඉරිසියා කොට<br>අරගල කරනවා මත නැති කිරීමට<br>ආගම දහම යටවීඇති පගාවට<br>මිනිසුන් අපේ බය නැත අද අපායට |
| 443 | | පුස්තකාලය | Library/ Lecture hall | ගුනයේ ගුණය අගුණය අගුණය ගුණය<br>ගුණයේ ගුණය දුටු මිනිසා අසරණය<br>මම ගුණමකුය එ මගේ පුරුවෙ පිනය<br>මට දුක නුඹට ඒ පින නැති එක ගැනය |
| 445 | | පුස්තකාලය | Library/ Lecture hall | ගන්නට සිතා සිටියත් අපි ඉහළ අතු<br>නැත්නම් පෙර පිනක් ඉටුවෙයි පැතුම් සිතු<br>කල පවිනිසා ගිලිහුනොතින් ඉහළ අතු<br>ලද හැටියකට සැනසුම මයි මෙයින් මතු |
| 446 | | පුස්තකාලය | Library/ Lecture hall | අලුත් ලොවක් ගැන සිතිම<br>දඬුම් දෙන වරද නම්<br>කුමට එරට අධිකරනය නිතිය මිනිසුනේ |
| 447 | | පුස්තකාලය | Library/ Lecture hall | ලේ කඳුළු මල් පිපුනු<br>නිලමය රාත්‍රිය<br>රතැස් යුග බමවමින්<br>නුඹ වටා රැක සිටියි<br>නෙතු පියන් විවර කර<br>අසාපන් නුඹ නමින්<br>නැගු හඬ<br>නුඹනමින් මිය ඇදුණු<br>උන් නමින්<br>දුබල වී අසරණ වු<br>දේශයේ මාතාව<br>අත් ගසා ලෙහි නිබඳ<br>හඬ නඟනවිලාපය<br>සම වතට සමවැදි<br>රුක් මුලක බුදුනොවී<br>නැගි සිට හදවතින්<br>අසාපන්<br>හෙට |

| | | | | |
|---|---|---|---|---|
| 450 | | පුස්තකාලය | Library/ Lecture hall | කාලයත් පඩයක් හා සමානය<br>ගියොත් ගියාමය. |
| 451 | | පුස්තකාලය | Library/ Lecture hall | සිහිනෙන් පවා මගේ සුබ විහරණය පැතූ<br>අම්මා දනිනම් මේ සරසවියේ තතු<br>වර බොල කොළුවො යයි දෙනතින් කඳුළු යුතු<br>ගෙනගොස් බොහො කල් මේ දුක් විඳින පුතු |
| 452 | | පුස්තකාලය | Library/ Lecture hall | අව පස ඝන තිමිර ඉරා<br>පුරපස සඳ නැඟෙන තුරා<br>මහ පෝ ගණනක් යන තුරු<br>මා වෙනුවෙන් වින්ද දුකට<br>වන්දි ගෙවන්නට හෙටදින<br>උපාධිලෝගුව පොරවන්<br>මං එන තුරු ලොවම දිනා<br>බලං ඉන්න අම්මේ<br>ඉදිකඩ ළගට වෙලා. |
| 453 | | පුස්තකාලය | Library/ Lecture hall | ජිවිතයේ තුරුණු බව<br>මා වෙනුවෙන් කැප කළ<br>මගේ ආදර අම්මේ<br>සසර සැරි සරන තෙක්<br>සදා ණය ගැතිය ඔබට<br>ඉතිං<br>කෙලෙස අදහන්නද<br>ඔබට දැක්වු ලබැඳි<br>සෙනෙහස ඔහුට මා. |
| 454 | | පුස්තකාලය | Library/ Lecture hall | ඇදුරු දිසාපාමොක් ආගිය තැනක් නැත<br>සාමා අමර වැලිකඩ හිරගෙදර ඇත<br>හෝඩිය බොදව සිතුවම් පොත මැකි ඇත<br>දින නියමයක් නැත සරසවි වැසි ඇත |
| 457 | | පුස්තකාලය | Library/ Lecture hall | කැම්පස් එන්න පෙර නම්සුරලොව මැවුණි<br>ආ දින පෙනුනෙ වධකා ගාරයක් මෙනි<br>දවසින් දවස ගොස් විභාගයලඟා වුනි<br>ප්‍රථම වසර අගදි මෙහි රඟ දැනුනි |

| | | | | |
|---|---|---|---|---|
| 461 | | පුස්තකාලය | Library/ Lecture hall | කවි පැනය<br>වසර හතරක් නොයෙක් දුක් විඳ<br>ඇතත් කාලය නිමවෙලා<br>ගමට යන්නට<br>හිතක් නැමට තට්ටයද<br>හොදටම පැදිලා |
| 462 | | පුස්තකාලය | Library/ Lecture hall | පිලිතුර<br>තට්ට හිසගැන කුමට කම්පා<br>පිරුණු මොලයක් තිබේ නම්<br>මොලය යොදවා<br>සිතා සැනසෙනු<br>ගමට ගොස් සතුටින් ලොලේ |
| 463 | | පුස්තකාලය | Library/ Lecture hall | කවි පැනය<br>ලයිබ්‍රියේ ඉඳගෙන මට ක්‍රැම බැරි<br>බඩුවක් ලගින් යනකොට ඇස් නොහැර<br>බැරි<br>බැලුවොත් එවිට කොහොමටවත් ඉන්න<br>බැරි<br>සිත ඒ වෙතය පොත වෙත නම් ගන්න<br>බැරි |
| 466 | | පුස්තකාලය | Library/ Lecture hall | පිලිතුර<br>නොම්හිරිද දේශන<br>ඇසුනද වඩා භාෂණ<br>නැතහොත් නැන නුවන<br>කියවිනොසතුට වන්න කාරන |
| 467 | | පුස්තකාලය | Library/ Lecture hall | පිලිතුර<br>නොලැබුන විටදි කවුරුත් ඔහොමයි<br>කියන්නේ<br>තත්ත්වය නම්බුවයි කවුරුත්<br>සොයන්නේ |
| 468 | | පුස්තකාලය | Library/ Lecture hall | කවි පැනය<br>මල් මල් කිවාට හැම මල් සුවඳ<br>නැත<br>සමන් පිච්ච මල මුදුනේ රේණු<br>නැත<br>පිටතට තිබෙන හිතවත් කම් ඇතුලේ<br>නැත<br>ආදිම මිනිසවත් මෙතරම් දරුණු<br>නැත |

| | | | | |
|---|---|---|---|---|
| 469 | | පුස්තකාලය | Library/ Lecture hall | පිලිතුර<br>එසේ වුවත් සුවඳැති මල් එමට<br>ඇත<br>රේණු නැතත් මලපුරාම සුවඳ<br>ඇත<br>ඇතුලේ තිබෙන දේ පිටතට පෙනෙනු<br>නැත<br>එදාතරම් අද නිසා දරුණු<br>නැත |
| 470 | | පුස්තකාලය | Library/ Lecture hall | එම්බා පොත් ගොන්න<br>මා ඔබට කෘතඥවන්නේ<br>මා දැනුම දියුණු කළාට නොව<br>ඇයත් මාත්<br>සිප වැළඳ ගන්නාවිට<br>ලොව කුරිරු ඇසින්<br>අප මුවා කළාටය |
| 471 | | පුස්තකාලය | Library/ Lecture hall | දයාබර වු පුස්තකය<br>තොප පිරිපුන්ය<br>මානුෂික ගතියෙන්<br>තොප ළඟට එන්නවුන්<br>පිරිපුන්ය තිරිසන් ගතියෙන්<br>තොප තුරුලෙහි රදනා පුස්තක<br>නොයෙක් තැන්වල සඟවන්නට<br>ඒ තිරිසනුන් හට<br>තොප අවසර දෙන්නේද?<br>එසේ නම් තොප ද<br>ඔවුන්ට ම<br>සම කළ යුතුය |
| 472 | | පුස්තකාලය | Library/ Lecture hall | සරසවි පියසේ<br>දෙවැනි කඩුල්ලෙන්<br>එතෙර වීමට<br>අවකාශය<br>රිසියේ ලබා දුන්<br>මා හැඟි පොත් ගුල<br>ඔබට අප<br>සද ණයගැතියි |
| 473 | | පුස්තකාලය | Library/ Lecture hall | පොත් කඳුමැදින් වටවු මේ පුටු<br>මේස<br>අප දෙදෙනාට සෙනෙහස පැවා<br>නිබඳ<br>දහසක් නෙතු වලින් අප සඟවා<br>ගන්නට<br>ඔබ කළ මෙහෙය අප හට අමතක<br>වේද? |

| | | | | |
|---|---|---|---|---|
| 475 | | පුස්තකාලය | Library/ Lecture hall | වැදුනත් හිසට හෙන<br>දත්ටික ඇතොත් නිසි තැන<br>නොතකා හෙනය ගැන<br>සිනාසෙනු උඩ පැන පැන |
| 476 | | පුස්තකාලය | Library/ Lecture hall | මලක් වෙලා ඔබ පිපුනා සරසවියේ<br>කලක් ගියා හති වැටුනා රුවැති මලේ<br>නිලක් කොලක් නොදකින මේ යකඩ කැලේ<br>මලක් වෙලා ඔබ පිපුනේ කිමද මලේ |
| 478 | | පුස්තකාලය | Library/ Lecture hall | ආදරය තුල ඇති මුත් බොහෝ අරුතක්<br>සැඟව ඇතිමුත් ලොවට නොදැනෙන<br>ජිවිතේ නව මං පෙතක හිද<br>ආදරේ හට නොකරං දෙවැනි තැන |
| 479 | | පුස්තකාලය | Library/ Lecture hall | පඩිපෙලේ හිද<br>සිහින සරුංගල් අරිනා<br>මානවිකාවියනේ සිතවි<br>මලපොතේ අකුරකුත්<br>නොදත්තවුන්<br>මේ බිමේ ඇත කියා |
| 481 | | පුස්තකාලය | Library/ Lecture hall | අතුරු මිතුරු දඹදිවතුරු එකට ඉදිල්ලා<br>උඩින් මිතුරු යටින් හතුරු අත ඇරපල්ලා |
| 482 | | පුස්තකාලය | Library/ Lecture hall | ලෙවෙක් වෙන්න පොත්වල කොල කඩාපිය<br>ක්ලාස් ගන්න ජෙල හොදහැටි කරාපිය<br>එක්සැම් එකෙන් ඒ.බී ගොඩදමාපිය<br>ලෙඩෙක් ඩොකෙක් වී මිනිසුන් මරාපිය |
| 484 | | පුස්තකාලය | Library/ Lecture hall | කවියක් ලියන්නම් මතු සැම දැන ගන්න<br>ලස්සන කෙල්ලො ඇත අප සැම බිලි ගන්න<br>උන්ගෙ ගොඩට වදනට රුවටි මන්ද<br>බාඳුරා මලට ගිය බිගුවකු නොම වන්න |

| | | | | |
|---|---|---|---|---|
| 486 | | පුස්තකාලය | Library/ Lecture hall | ළබැඳි මිතුරන් හදවතින් නිරතුරුවම<br>රහස් ගිවිසුමකට බැඳි සිටි<br>අවංක මිතුරන් ජිවිතයට ඖෂධයකි |
| 487 | | පුස්තකාලය | Library/ Lecture hall | හැදියාවක් ඇතැයි සලකා මේ දිය<br>දම<br>කිරුලක් ලබා සරසවියට අසම<br>සම<br>ඔළුවක් ඇතත් හිතුවට හරි වැරදි<br>කිම<br>නොසරුප් ලියනු කිම සරසවි මවගෙ<br>ලැම |
| 488 | | පුස්තකාලය | Library/ Lecture hall | ගන්නට සිතා සිටියත් දිග ඉහල   අතු<br>ඇත්නම් පෙර පිනක් තුටුවෙයි පැතුම<br>සිතු<br>කළ පව් නිසා ගිලිහුන හොත් ඉහල අතු<br>ලද හැටියකට සැනසුමමයි මෙයින් මතු |
| 489 | | පුස්තකාලය | Library/ Lecture hall | වානේ පන්නරය ලබන්නේ ගින්දරෙනි<br>එහෙත් වානේ මෙන් ශක්තිමත් වීමටත්<br>සැපතේදි ගින්දර මෙන් උණුසුම්<br>නොවීමටත්<br>මිනිස් සිත පන්නරය ලබන්නේ<br>අත්දැකිමෙනි |
| 490 | | පුස්තකාලය | Library/ Lecture hall | මරණය සොයා වෙන් වුනඅය අපට<br>කලිං<br>අතපත් කරන්නට තොරතුරු සුවද<br>මලින්<br>ආපසු නොආවෝ එහි ගිය පරිදි<br>මුලින්<br>තොරතුරු සොයා යමු මරණයේ දොරටු<br>තුළින් |

| | | | | |
|---|---|---|---|---|
| 491 | | පුස්තකාලය | Library/ Lecture hall | සුදුසරමක් ඇන්දා කියා සිසු ලේ පිස දැමිය හැකිද?<br>බුලත් විටක් කැවාකියා සිංහල කම රැකිය හැකිද?<br>මඩ පහරක් ගැසුවා කියා චින්තන ගොඩ නැඟිය හැකිද?<br>තුවක්කුවක් ගත්තා කියා සිසු හඬයට ගැසිය හැකිද? |
| 492 | | පුස්තකාලය | Library/ Lecture hall | මැත කඩුවලට සි ඩි ලැබෙන විට<br>කොස් සයින් උඩ පනිමින් ඇදෙන විට<br>හිච්චිමට ආසා ඇනගන්න විට<br>කැම්පස් මොකට ආවාදැයි සිතුනි මට |
| 493 | | පුස්තකාලය | Library/ Lecture hall | සිංහල බි සි හොදහැටි උණුකරලා<br>ඉකොන් ලොජික් දෙක එකට වත්කරලා<br>අමබානකට තුන්වසරක් ජපකරලා<br>කැමපස් ආවේ එලිවෙනතුරු නිදිමරලා |
| 494 | | පුස්තකාලය | Library/ Lecture hall | අහඹු වු අනුගැටුමක<br>ප්‍රතිඵලයක් වුනි අප පිවය<br>නැත එහි දෛවයක්<br>ශාප කරමි මා වේදනා හදින්<br>අධෝ රක්ත කිරණවලට<br>ඇයි නිර්මාණය කළේ<br>ඔක්සිකාරක වායුගෝලය |
| 495 | | පුස්තකාලය | Library/ Lecture hall | නැත ලොවේ අන් රසඳුනා<br>පුමතිරිලිඟුදෙක විනා |
| 496 | | පුස්තකාලය | Library/ Lecture hall | දිනක අප මියයාවි<br>පිරිවැය වක්‍රයක හිරවි |
| 497 | | පුස්තකාලය | Library/ Lecture hall | බුද්දියේ හිස ගසා<br>වැමැරු මන්තර<br>එකින් එක පෙළ ගසා<br>ගහුවා මං<br>කලාස් එකක් |
| 499 | | පුස්තකාලය | Library/ Lecture hall | දෙව්ලොවකැයි සිතා<br>ආ නමුත් මේ බිමට<br>අපායක සිරි ඇත්තේ<br>දෙව්ලොවකි මට මේක |

| | | | | |
|---|---|---|---|---|
| 501 | | පුස්තකාලය | Library/ Lecture hall | සිනහව කඳුල පරදා රජයන<br>මෙබිම<br>කඳුලක් නැගෙන්නට නොමදි<br>ගෙනම<br>දහසක් පැතුම් වෙනුවෙන් දුක්<br>පැරදීම<br>මේ බිම එදා මෙන් පවතී<br>හැමදාම |
| 502 | | පුස්තකාලය | Library/ Lecture hall | කිරිල්ලියක් වාගේ මව්පිය<br>අතරින්<br>ඉගිල්ලිලා ආවට සරසවි<br>එතෙරින්<br>ගොඩවී යන්න වෙහෙසෙන හැටියට<br>කතරින්<br>සුවයක් ලබනු බැහැ කිසිවකුටත්<br>මෙතනින් |
| 503 | | පුස්තකාලය | Library/ Lecture hall | සරසවිය වනාහි -කටුක රළු<br>දුක් ගෙනෙනා<br>උණ්ඩ හද පසා යන -අවමන්ද<br>දෝර ගලනා<br>මරණයද සැඟව ඇවිදින -වියතුන්ට<br>උරුම කළ<br>එළිමහන් සිරගෙයයි<br>මිලේච්ඡයන්ගේ බිලි පුදට ගොදුරු<br>සොයන අඩවියයි<br>□ |
| 504 | | පුස්තකාලය | Library/ Lecture hall | අවසානයයි<br>සිවි වසරක යුද්ධය<br>නමුත්<br>සුදු පරවියා නම් රැකියාව<br>අහලකවත් නැත |
| 505 | | පුස්තකාලය | Library/ Lecture hall | සටන් , අරගල, වර්ජන,නිබන්ධන<br>පෙළපාලි, පිකටිං, උද්ඝෝෂණ, දේශන<br>පත අට එකට සිඳගෙන<br>සීනි මී පැණි දමා වළදනු |

| | | | | |
|---|---|---|---|---|
| 508 | | පුස්තකාලය | Library/ Lecture hall | දිසාපාමොක් ඇදුරිඳුනි<br>ඔබ කෙරෙහි කෝපයෙන්<br>මා මෙය ලියනුයේ<br>ඔබ ශිල්පයේ අනුහසින්<br>සිප් සතර පරතෙරට<br>පැමිනියෙමි පසු වු දිනෙක<br>එද පටන් මම<br>සහතික පොදි බැදන්<br>රට වටේ සැරිසැරුවෙමි<br>රැකියාවක් සොයා<br>සහතික පොදියගෙන<br>තොප ඉදිරියේ දවා අළු කරමි<br>දිසාපාමොක් ඇදුර<br>තොපට ඒ දෙ |
| 509 | | පුස්තකාලය | Library/ Lecture hall | සාමා අමර අමතක කර හෝඩි<br>පොතේ<br>මහ පොත් ඇතුළෙ සිර කෙරුවා<br>අනාගතේ<br>සය වසරකුත් දැන් ඉක්මවා ගොස්<br>ඇත්තේ<br>මේකෙන් වැඩක් වෙන පාටක් නම්<br>නැත්තේ |
| 510 | | පුස්තකාලය | Library/ Lecture hall | නොහඩන් සරසවිය සලමින් කඳුළු<br>කැට<br>වැඩ නැත මොලේ ඇති වුන්ගෙන් ඔවුන්<br>හට<br>විරැකියාව අවසන් කොට දැනෙන<br>හෙට<br>රැකියාවක් ලබා ආවෙමි සිපිරි<br>ගෙට |
| 511 | | පුස්තකාලය | Library/ Lecture hall | විභාගයේ මහා මේරු පර්වතයෙන්<br>පහලට පැන<br>කටු පඳුරක මල් නෙලන්න සරසවියට<br>අප ආදින<br>ගෙවා ගන්න පින් නැත මහා පවක් උනා<br>අප කල පින<br>සිහිනෙන් පමණකි යන්නේ අනාගතය<br>වෙත පිය මැන (1-ඒ) |
| 512 | | පුස්තකාලය | Library/ Lecture hall | අවසන් දෙදින අප අද සරසවිය<br>තුළ<br>බලමින් සතුටු වෙමි මතු දින ලබන<br>ඵල<br>වෙන්වී යන්න අතරින් හෙට මිතුරු<br>කැළ<br>කෙලෙසක සිතනවද සිහිවෙයි ගැසුව<br>වල |

| | | | | |
|---|---|---|---|---|
| 514 | | පුස්තකාලය | Library/ Lecture hall | පෙර කාලේ කරපු අකුසල්වල අපලා<br>මෙමකාලේ විදිමු කැම්පස් එකට වෙලා<br>මට බාලේ පටන් පුරුදුයි බොරු කරලා<br>එමු රාලේ ගොසින් පේපර් එක ලියලා |
| 515 | | පුස්තකාලය | Library/ Lecture hall | ලෙක්චර්ස් යනවා -හොස්ටල් එනවා<br>බෙල් එක වැදුනම -නිදි මත යනවා<br>පහළට එනවා<br>බතා බලනවා<br>බතාගෙ පරිප්පුව-කව්පිය වෙනවා<br>කව්පි ජලාසේ අපි පීනනවා<br>වේළුණු පානා දියේ ගිලෙනවා<br>බතා උඹත් මතු නිවන් දකිනවා |
| 516 | | පුස්තකාලය | Library/ Lecture hall | භීෂණය ලඟම ඇත<br>දේශනය ඉවර නැත<br>භාෂණය කවර සෙත<br>සාසනය සාසනය |
| 517 | | පුස්තකාලය | Library/ Lecture hall | සොම්නස පිරි බලාපොරොත්තුවකි සරසවිය<br>දොම්නස සමග අවතැන් වන කතරකි සරසවිය<br>ජිවිතයෙ තවත් එක් නොලැබූ පාර්ථනයකි සරසවිය<br>පැමිණි උන් සිනාසෙන ගියාවුන් තැවෙන බිමකි සරසවිය |
| 518 | | පුස්තකාලය | Library/ Lecture hall | සිව් වසරක් ගෙවූ කාලය<br>නිමාවිය<br>සිනාසිම ඔරොප්වීම<br>අලුත්ය<br>මාසයකින් අවසානය<br>විභාගය<br>ගෙදර යමන් මගෙ හොඳ පුත<br>උපාධිය |
| 519 | | පුස්තකාලය | Library/ Lecture hall | කැපස් තේරුණේ පෙර පව් කළ හන්දා<br>තට්ටය පැදුනේ එහි සැර වැඩි හින්දා<br>නිවනක් හිතට කවදා ඒවිද මන්දා<br>අන්නන්ට එපා පිරිස් මම වැන්දා |

| | | | | |
|---|---|---|---|---|
| 521 | | පුස්තකාලය | Library/ Lecture hall | නලින් විකාරය<br>පිරිස් දුමාරය<br>ජේ බි සිරාමය<br>අහෝ වී සි භයංකාරය |
| 523 | | පුස්තකාලය | Library/ Lecture hall | විභාග භයින් වෙව්ලා<br>සටහන අතට ගත් විට<br>නිදිමත දැනුනි මා හට<br>මා හිස මේසය මතහෙලිය<br>නිදිමත<br>නමුදු නැවත මා<br>හිස එසවිය<br>විභාග භිතිය විසින් |
| 524 | | පුස්තකාලය | Library/ Lecture hall | එච් එස් සි විභාගයං ච<br>සම්මානෝ අතිදුර්ලභංච<br>රැකියා විරහිතං දුක්ඛං<br>බි ඒ ඩිග්රි මහාභයං |
| 525 | | පුස්තකාලය | Library/ Lecture hall | සිහින දකින අපි නොදකින දෙයක් තමා<br>එම් එස් සි<br>නෙලාගන්න බැරිඅත්තක පිපුන මලක්<br>බී එස් සි<br>දෙලොව මැද අතරමං ව අපි ලිව්වා<br>එච් එස් සි<br>අමාරුවෙන් ලබාගත්තු දෙයක් තමයි<br>එස් එස් සි |
| 526 | | පුස්තකාලය | Library/ Lecture hall | විභාගය ලගයි මම ලයිබ්‍රරි<br>ආවා<br>වැඩවර්ජනය දිගටම යනබව<br>පෙනුනා<br>කාලගුණෝ අද මරු බව මට<br>දැනුනා<br>විභාගය කොහෙද කොක්ට තුරුළු<br>වුනා |
| 527 | | පුස්තකාලය | Library/ Lecture hall | විභාගය කරුමය<br>පාඩම් කරනු බැරිමය<br>එය නොවේ අරුමය<br>ක්‍රම දැම්මත් ඇනෙන එකමය. |

| | | | | |
|---|---|---|---|---|
| 528 | | පුස්තකාලය | Library/ Lecture hall | මදුරුපිරිස හැමතැනම දැවටෙනවා<br>නෝටිපොදිය අත්තල මත වැලපෙනවා<br>නිදිමත දැනි නොදැනිම නෙතු පියවෙනවා<br>ඩිග්‍රිය ලැබෙනතුරු මේ දුක පලදෙනවා |
| 529 | | පුස්තකාලය | Library/ Lecture hall | අහෝ සක් දෙවි රජින්ද<br>දිග වේට්ටියක් ඇන්ද<br>විනිවිද පෙනෙන හින්ද<br>යටින් කොට කලිසමක් ඇන්ද |
| 530 | | පුස්තකාලය | Library/ Lecture hall | අවසන් දෙදින අපි අද සරසවිය තුල<br>බලමින් සතුටු වෙමි මතුදින ලබන<br>එල<br>වෙන්වි යන්න අතරින් හෙට මිතුරු<br>කැල<br>කෙලෙසක සිතනවද සිහිවෙයි ගැසුව<br>වල |
| 531 | | පුස්තකාලය | Library/ Lecture hall | හඳුනා ගනිමු බැඳුනෙමුසෙනෙහසින්<br>අපි<br>මුමුනා ගතිමු කිවෙමු ගිතුටින්<br>අපි<br>උයා ගතිමු කැවෙමු රස කරන්<br>අපි<br>වෙන් වී නොයමු දිවියෙන් තොර වුවත්<br>අපි |
| 532 | | නිතිපිධය | Jim/ Samar hut / Toilet | නොකී ප්‍රේමය<br>පුංචිම පුංචි කැබලි එකතු කර<br>ගේ තුළ තැනූ<br>විශාල එළිය කුසුම<br>කඩා බිඳ දමන්නත් බැරි<br>එළියට ගන්නත් බැරි |
| 533 | | නිතිපිධය | Jim/ Samar hut / Toilet | අසම්මත ප්‍රේමය<br>සමාන ආරෝපිත<br>චුම්බක දෙකක්<br>ලංකරන්න ලංකරන්න<br>ඈත් වෙනවා |

| | | | | |
|---|---|---|---|---|
| 534 | | නිතිපිඩය | Jim/ Samar hut / Toilet | ඇටෝනි<br>හිතේ තියෙන දේ<br>ලියා ගන්න බැරි<br>කැමති කුමක් දැයි<br>සිතාගන්න බැරි<br>ට්‍රයි කෙරුවොතින්<br>දා ගන්නට හැකි<br>දා ගත්තොත්<br>හොඳ හැටි වැඩ ඇති<br>අහංකාර<br>හැඩනැති බඩුව<br>ඇටෝනි |
| 535 | | නිතිපිඩය | Jim/ Samar hut / Toilet | අද රාත්‍රියේ මම<br>ඔබ වෙත එන්නෙමි<br>කිසිවකුට එය<br>නොපෙනෙනු ඇත<br>කිසිවෙකු එය ගැන<br>නො අසනු ඇත<br>දොර හැර තබන්න<br>අමතක නොකරන්න |
| 536 | | නිතිපිඩය | Jim/ Samar hut / Toilet | දුරකථනය<br>ඉදලා හිටලා<br>මගේ කනට<br>සුවය ගෙනෙන<br>යන්තරයයි<br>හිස රුදාවට<br>ඇස්ප්‍රින් දෙන |
| 537 | | නිතිපිඩය | Jim/ Samar hut / Toilet | දුකේදි හැඩුවෙමු<br>සතුටෙදි සිනාසුනෙමි<br>එකිනෙකා වැලද ගතිමු<br>සොයුරු පෙමින්<br>මහමෙරක් පැරයු අපි<br>සරසවිය වෙන් කලත්<br>නැවත භවයක උපදිමු<br>අපි<br>එකම මව් කුස සොයුරන්<br>ලෙසින් |
| 538 | | නිතිපිඩය | Jim/ Samar hut / Toilet | කැන්ටින් තේ එක<br>අද හරිම රස්නෙයි<br>කොප්පෙට උනත් දැනෙනවා<br>අඩුව නැති එකේ<br>පාඩුව |

| | | | | |
|---|---|---|---|---|
| 539 | | නිතිපිඩය | Jim/ Samar hut / Toilet | උඹ අපට ඉගැන්වුයේ<br>මාක්ස් ගැන<br>අපි උඹට කියලා දුන්නේ<br>මල්වලට පිණිවැටෙන හැටි |
| 541 | | නිතිපිඩය | Jim/ Samar hut / Toilet | කම්බි වැටකට වලාකාලිය හැකිද<br>අපව<br>තිමිර පට ඉරා එන<br>පුරුෂ ලිංගයක් සේ<br>අප ඔබව සොයාඑන්නෙමු |
| 542 | | නිතිපිඩය | Jim/ Samar hut / Toilet | වළාකුලු පලාගෙන<br>ඇපලෝව ඇදෙනකොට<br>අමතකයි මට<br>පෙති දෙකක් සොයාගන්න<br>මම විදපු දුක |
| 543 | | නිතිපිඩය | Jim/ Samar hut / Toilet | රතුතොල් සිඹින<br>පෙති ගිලින<br>වැහිකබා ඇඳගෙන<br>අහසේම හමුවෙන<br>අනේ පව්<br>අසම්මත ප්‍රේමය |
| 545 | | නිතිපිඩය | Jim/ Samar hut / Toilet | අතට ගෙන ලැබූ අධ්‍යාපනය<br>තබලා මල් වැටෙට ඉහලින්<br>වෙරළු මල් සුවදකට ඉවකර<br>අපිත් යමු සයිබිරියාවෙන් |
| 548 | | නිතිපිඩය | Jim/ Samar hut / Toilet | අනේ බුදුහාමුදුරුවනේ<br>මලක් පහනක් තියා<br>කවියක්වත් ලියන්නේ කොහොමද<br>සමර වගේ නොවෙයි<br>රබර් පේන්ටි<br>හරි ගණන් |
| 549 | | තෙලවල නේවාසිකාගාරය | Hostel | මට කියලා හිටපු එකම<br>බඩුව<br>අපේ සර් දා ගත්තා |
| 550 | | තෙලවල නේවාසිකාගාරය | Hostel | සිගන්නෙක් තුන්මුල්ලෙදි සිගමන් යදියේ<br>පිහිටක් නැතිව මා වෙත හැරුනයි<br>හදියේ<br>යමක් ලැබේදැයි ඔහු තුල සැක ඇතියේ<br>රටක් ඇතත් අනාථයෙකි මා සරසවියේ |

| | | | | |
|---|---|---|---|---|
| 551 | | තෙලවල නෙවාසිකාගාරය | Hostel | සාර්ථකව ප්‍රේමයෙන් ජය ගැනිමට නම්<br>ප්‍රේම නොකර ඉන්න |
| 553 | | තෙලවල නෙවාසිකාගාරය | Hostel | මලක් පිපෙතැයි සිතෙන තැනක<br>ඇති කටුව ගලවා<br><br>එතැන<br><br>මලක් සිටවූ අයෙකු ලෙස<br>මා සමුගන්නා දිනෙක<br>මා ගැන සදහන් කරනවා නම්<br>මා ඉතා කැමතිය |
| 554 | | තෙලවල නෙවාසිකාගාරය | Hostel | කුරුලෑ වූවන කෙටි වරලස උඩ නැගුන<br>නොවැඩුන දෙතන උල් රට බොඩියෙන් වැසුනු<br>හිනි කොටු දෙකකුල් යන එන ගමන<br>දුටුවේය මිහිපිට ඇති සරසවි හොල්මන |
| 555 | | තෙලවල නෙවාසිකාගාරය | Hostel | අවුරුද්ධ ආවා නේද<br>ඒත් අපට කවදා අවුරුදු එයිද<br>පාර තොටේ බඩු මලු කරපින්නා ගෙන<br>දෙනෝ දාහක් යන දෙස<br>බලා සිටින්නද මේ කාළ කන්නි<br>අවුරුද්ද  එන්නේ |
| 557 | | තෙලවල නෙවාසිකාගාරය | Hostel | අවසන් මාස තුන අපි සරසවිය තුළ<br>බලමින් සතුටු වෙමි මතුදින ලබන ඵල<br>වෙන්වී යන්න පෙර සමගින් මිතුරු කැළ<br>සිහාවෙයි එදා අප එකතුව ගැසුව වල |
| 558 | | තෙලවල නෙවාසිකාගාරය | Hostel | එළිය හදුනන<br>රෑ කුරුල්ලනි<br>ඵල නෙලා ගන්නට<br>උදෑසනක වරෙල්ලා |

| | | | | |
|---|---|---|---|---|
| 559 | | තෙලවල නෙවාසිකාගාරය | Hostel | විසල් තුරු අතු පතර වියනින්<br>සඳුගේ මුදු රැස් නොලද මේ<br>බිම් කඩ<br>අන්ධකාරයේ ගිලී වැලපෙන<br>නිසල තණ පත් තිරුවේ<br>සොඳුරු සඳු වෙත සාප නොකරමි<br>තිමිර පට හැර කිරණ ලන්නට<br>තුරු වියන සිඳ දමාපන් |
| 560 | | තෙලවල නෙවාසිකාගාරය | Hostel | මෙහෙට පායන සඳ<br>මහ විසල් මැදුරු වලට<br>සඳළුතල වලටත්<br>පායලා ඇත්නම් |
| 561 | | තෙලවල නෙවාසිකාගාරය | Hostel | ඔබ මට ආදරය කරන කළ<br>ඔබට මා ආදරය කලේ නැත<br>මා අද ඔබට ආදරය කරමි<br>ඒත් අද<br>ඔබ මට ආදරේ නැත |
| 562 | | තෙලවල නෙවාසිකාගාරය | Hostel | දුරාතිතේ අපේ බුල්කං<br>ආවර්ජනං කරතං<br>කාලෝ ඝට්ටනෝ චිත්තං<br>අනාගත බිය වඩ්ඩති |
| 563 | | තෙලවල නෙවාසිකාගාරය | Hostel | සොදුරු වූ පැතුම් මැද තනි වේවි<br>මාවතේ<br>පැතුම් බිඳ නුවන් යුග නුඹ වෙතට යා<br>වෙතේ<br>මානයෙන් වැට බැන්ද ලොකයා අභිමන්<br>හමුවෙමුද අපි නිතර හදවතින්<br>හිතුමතේ |
| 564 | | තෙලවල නෙවාසිකාගාරය | Hostel | පින් නුඹ ලබන්නට පෙර කල මදිවුවා<br>තුන් යාමයේ නුඹ සිහිනෙන් නොපෙනේවා<br>දැන් සමුගනිමි දෙනුවන් කදුලින් නහවා<br>මං නැති ලොවක නුඹ සතුටින්<br>හිනැහේවා |
| 565 | | තෙලවල නෙවාසිකාගාරය | Hostel | රොඩු කුණු ගසාගෙන<br>මහමුහුදට යාවි<br>කෙදිනක නමුදු හොඳ<br>රතුමල් පිදේවි |

| | | | | |
|---|---|---|---|---|
| 566 | | තෙලවල නේවාසිකාගාරය | Hostel | පිහිටක් නොමැත ඇත්තේ මහපොළ පිහිටයි<br>සරණක් නොමැත ඇත්තේ නුඹගේ සරණයි<br>සෙවනක් නොමැත ඇත්තේ ගස්යට සෙවණයි<br>සැපක් කොහිද දුකනම් නිරතුරු උරුමයි |
| 567 | | තෙලවල නේවාසිකාගාරය | Hostel | ඔබ ගොඩනැගූ සියල්ල<br>බිඳවැටුණු කල<br>සුන්බුන් එකතුකර<br>යලිගොඩනැගිය හැකිනම්<br>ඔබ<br>සැබෑ විප්ලව වාදියෙකු වනු ඇතත |
| 568 | | තෙලවල නේවාසිකාගාරය | Hostel | සරසවි ඇවිත් සති දහයක් ගෙවිල ගියා<br>වන පොත් කරන්නට ඇත බොහෝ දේ ඉතිරි වෙලා<br>වැසිදිය රැගෙන යයි සිහිනය දෙගොඩතලා |
| 569 | | තෙලවල නේවාසිකාගාරය | Hostel | දිවා රෑ ඔබේ නම රැව්දිදි ඇතසිතේ<br>එදත් මම ආදරෙයි<br>අදත් මම ආදරෙයි<br>හෙටත් මම ආදරෙයි<br>මැරෙන තුරුආදරෙයි |
| 570 | | තෙලවල නේවාසිකාගාරය | Hostel | සඳට පැතු නියාවෙන් තරුද හිමි නොවුනි මට<br>මලම පැහැ නියාවෙන් තුරුද හිමි නොවුණිටි මට<br>ගගම පැතු නියාවෙන් සයුර හිමි නොවුණි මට<br>නුඹම පැතු නියාවෙන් හිමි නොවුණි කෙනෙකු මට |
| 572 | | තෙලවල නේවාසිකාගාරය | Hostel | මිනිසුනේ<br>අහපල්ලා<br>නුඹලාට ජිවිතයක්<br>ලැබිලා තියෙන්නේ<br>එක එකාට වහල් වෙලා<br>ජිවත් වෙන්න<br>නෙවෙයි<br>දුක සැප බෙදාගෙන<br>එකට ජිවත් වෙන්න |

| | | | | |
|---|---|---|---|---|
| 573 | | තෙලවල නේවාසිකාගාරය | Hostel | කුසට සාගිනි හදට සෝගිනි ඉහට<br>වැරහැලි කැබලි එල්ලා<br>සතුට සොම්නස අහිමි කරවූ අඳුරු<br>දිගුකාලය ගිහිල්ලා<br>නෙසිට මැරි මැරි සතුටු පායට වකුටු වී<br>අතපය හකුල්ලා<br>නැගිට පල්ලා උඹලගේ වාරය ඇවිල්ලා |
| 574 | | තෙලවල නේවාසිකාගාරය | Hostel | ජිවිතේ බොහෝ දුරයි<br>අරපේන දුර ඈත<br>නෙත් කෙවෙනි බොඳ කරයි<br>කෙසේ නම් නවතිම්ද හතිවැටී<br>දොතින් ගත් නුඹ සෙනෙහස<br>පවන් සලනවා<br>සත්තකයි |
| 575 | | තෙලවල නේවාසිකාගාරය | Hostel | සීතම සීත රාත්‍රියක<br>සඳටත් අමතක<br>තනි තරුවකි<br>මම |
| 576 | | තෙලවල නේවාසිකාගාරය | Hostel | ජිවිතය තුල<br>හැඩුවෙමු සිනාසුනෙමු<br>නමුත්<br>ධෛර්‍යය කර ගතිමු<br>එවන් ගමනක සොදුරුතම<br>නවාතැන් හමු විය<br>සැබැවින්ම මෙය<br>සොදුරුතම නවාතැනකි |
| 577 | | තෙලවල නේවාසිකාගාරය | Hostel | අඳුර පැමිණි විටදී<br>සුපුරුදු පරිදි ගෙවී යන<br>දිනය<br>අදට සමුදී නොයන<br>විඩාබර මගේ සිත<br>සමු නොදී වැලපෙන්නේ<br>මගේ ප්‍රාණය අදයි<br>කෙසේ එය හැරයම්ද |

| | | | | |
|---|---|---|---|---|
| 578 | | තෙලවල නෙවාසිකාගාරය | Hostel | මැවුනේ නුඹේ රුවයි<br>දිවා රැයේ<br>කල් යැවුයේ වැඩිපුර<br>දොඩමළු වෙන්නටයි<br>මගේ අම්මේ<br>සිත හැඩුවේ නුඹ<br>විඳිනා දුක සිහිවීලා<br>නමුත්<br>කාසිය සිරවුණි<br>දු .ක . යන්තරේ<br>සිහිනය බිඳිමින් |
| 579 | | තෙලවල නෙවාසිකාගාරය | Hostel | ප්‍රේමය නම්<br>අසෙනිය කුසුමක් වේ<br>රිසිවූ කෙනෙකුට<br>පුජාකරනට<br>ලෝභ සිතින් තොර<br>පිදුව මනා වේ<br>පෙරලා ලබන්නට<br>නොසිතා බිදකුදත් |
| 580 | | තෙලවල නෙවාසිකාගාරය | Hostel | සසර මග කොහේ හෝ<br>නුඹ මගෙම වී<br>සිටියද<br>එන කාටත් මා දවන<br>මහ ගින්න<br>නුඹ මටම දුන්නද |
| 583 | | තෙලවල නෙවාසිකාගාරය | Hostel | දුම්රියකදි හමු වූ ඔබ<br>දුම්රියේදිම මගෙන් වෙන්වූ<br>අපුරුව<br>කොහොම හිතන්නද<br>උඩරට මැණිකේ<br>මේ ජිවිතයට කල<br>සරදමක තරම |
| 584 | | තෙලවල නෙවාසිකාගාරය | Hostel | අහස උසින් තනා ගත්ත<br>මහමන්දිර ගිලිහෙන විට<br>පොලොවට ඇද වැටෙන්න පෙර<br>මම ආවා මහ පොලොවට<br>උඩ නගිද්දි බලා උන්න<br>අම්මා ලය දරා ගන්න<br>පරණ පුරුදු මහ පොලොවම<br>අදත් ඉදි පුරුදු ලෙසම<br>ඉතින් සමාවී අවසර<br>මෙතැන මගේ තැන තනන්න |

| | | | | |
|---|---|---|---|---|
| 585 | | තෙලවල නේවාසිකාගාරය | Hostel | නින්දට ණයවී<br>වණ පොත් කල දෑ<br>සුදු පාට කඩදාසියක වමාරන<br>පැය දෙක තුනක කාලය<br>විභාගයයි |
| 586 | | තෙලවල නේවාසිකාගාරය | Hostel | සුදු සීත හිමට වී<br>ඉසිඹුලන පියාපත්<br>උණුහුමත දවටමින්<br>විදාපන් කුරුල්ලනි<br>තුඩග ලූ බිජු අහුර<br>ගම් නියම් ගම් සිසාරා<br>පුරන් වූ කේත් යලිත්<br>අස්විදින් වපුරන්න<br>තෙරපෙනා පොලෝ කුස<br>සුවද මල් පුබුදන්න<br>ඔන්න කාලයක් ඇවිත් |
| 587 | | තෙලවල නේවාසිකාගාරය | Hostel | උඩ ඉද ලේ බිව්ව බිහිසුනු මදුරුවන්ට<br>යට ඉද ලේ බිව්ව ගොරහැඩි මකුනන්ට<br>අද සිදුවේය වෙන කෙකු වෙත යන්නට<br>මම සමුගනිම් ආයෙත් මෙහි නොම<br>එන්ට |
| 588 | | තෙලවල නේවාසිකාගාරය | Hostel | වල්මත් වුනුදාට අපි සැම කොළොම්පුරේ<br>හොස්ටල් එකට එනවාමයි හෙමින් සැරේ<br>රස්නෙයි දාඩියයි දුවිලි යටින් පෙරේ<br>ජය වෙයි කෙලවලට දමසකම නගමු<br>හුරේ |
| 589 | | තෙලවල නේවාසිකාගාරය | Hostel | සරසවියට වෙලා ගෙවු පසුගිය<br>අවුරුද්ද<br>කීදවසක් මගේ බඩ වේලෙන්නට ඇත්ද<br>දැනෙන විදියට හෙට දිත් මට කුසයුද්ධ<br>අම්මා දුන්න බත්පත සිහි නොම වෙද්ද |

| | | | | |
|---|---|---|---|---|
| 591 | | තෙලවල නේවාසිකාගාරය | Hostel | බස්වල ගනන් තවතව වැඩි වෙන්න එපා<br>කැන්ටිමෙ කැම වල මිල වැඩි වෙන්න එපා<br>ජිවිත සටන සැමදා පරදින්න එපා<br>සෙමෙස්තරේ මේ සැරේ ඇණ වෙන්න එපා |
| 592 | | තෙලවල නේවාසිකාගාරය | Hostel | බඩගිනි වෙලා මා ගිය කල කැන්ටිමට<br>පානුයි පරිප්පුයි දුන්නයි විස්සකට<br>කම්දෝ නොකම්දෝ කියලා සිතුනි මට<br>මෙහෙමද යකෝ කන්නට දෙන්නේ අපිට |
| 593 | | කිතුයාගාර නේවාසිකාගාරය | Hostel | ඉවසනා දනා රුපු යුධයට ජයකොඩිය<br>මේ කිව් එකාගේ කට කැවත් මදිය<br>ඇත්තන් හට එකා නොව බඩු හත අටය<br>මට බඩුවක් නොමැත මම දැන් කොට උඩය |
| 596 | | කිතුයාගාර නේවාසිකාගාරය | Hostel | අනේ මිණිවන්<br>ඔබේ දෙසුමන්<br>උසා දෙනුවන්<br>කරයි අඩවන් |
| 598 | | කිතුයාගාර නේවාසිකාගාරය | Hostel | කළුවර ඇතිදා ඇවිදින කොට මා<br>දත්ටික පමණයි බැබලෙන්නේ<br>social දවසේ හොදටම බීගෙන හතර වටේ දැම්මනේ වමනේ<br>වගුරක් ගහගෙන හෙමිහිට ඇණගෙන කාළය ගෙවෙනව දුකින් අනේ<br>මකුළුව කිව්වම මුලු සරසියම හදුනනවා මා හොදට අනේ |
| 600 | | කිතුයාගාර නේවාසිකාගාරය | Hostel | වෙන්නප්පුවේ සිට ආවේ කලු ඉම්ටි මට<br>මටත් වැඩිය වයස වැඩිය ඉතිං මොකද බං<br>පළමු වසරේ දෙන්නොක්නෙන් ඇනයක්නේ මං<br>ලබන නැවෙන් හොද කෙල්ලෙක් පාරයිද බං |

| | | | | |
|---|---|---|---|---|
| 601 | | නිත්‍යාගාර නේවාසිකාගාරය | Hostel | හරියටමයි මට ගමක් නෑ බං ගෙමේ ඉඳලයි කොළඹ ආවේ<br>පලමු වසරට ඇණ තුනක් බං මගේ කෙරුවෙට උරුම මුවේ<br>අලුත් බේත් එක ආපු දා සිට පරණ බඩු අමතක වුයේ<br>ජයියා මං සැලය එක්කන් නිතර හවසට කුඩු වුයේ |
| 602 | | නිත්‍යාගාර නේවාසිකාගාරය | Hostel | කාගෙන් වුණත් වැඩ ගැනිම කලාවකි<br>දුන්දේ වුණත් ගන්නට වෙන වෙලාවකි<br>නගරේ වුණත් ඇවිදින්නට වීදියකි<br>පන්සල වුණත් හරියට එය කැලැවකි |
| 603 | | නිත්‍යාගාර නේවාසිකාගාරය | Hostel | ප්‍රිතියි දුකයි අසලා එය මට මිතුර<br>මිතුරි මෙමට ඇය නම් වේ දිවිකතර<br>නොකලා නම් එදා ඔබෙ බදගේ විවර<br>නොදනම් යොදන බව ප්‍රිති කර කවර |
| 605 | | නිත්‍යාගාර නේවාසිකාගාරය | Hostel | ලත් දේ නොලත් දේ අපමෙහි බොහෝ ඇත<br>සිත්සේ ගෙවුකාලය දැන් නිමා විය<br>උගත් සිතින් කාලය අපි ගෙවා ඇත<br>නුගත් අයට මෙහි ඒමට ඉඩක් නැත |
| 607 | | නිත්‍යාගාර නේවාසිකාගාරය | Hostel | දෙතොලග සුවය වින්දත් සිව්වස් නුවගේ<br>නඩ බද තරයේ සිපගන්නත් සේ ලදගේ<br>විලිකුන් රහස් බව දෙඩුවත් සුරගනගේ<br>අමුතු රහස හෙයවිත් ලෙලදේ සුළගේ |
| 608 | | නිත්‍යාගාර නේවාසිකාගාරය | Hostel | දුන්න දුන්න පලියට අරගන්න එපා<br>හොරෙන් හිතින් බඩු ලා පීවං වෙන්න එපා<br>නැව්වල ගේන බඩු ගැන දුක හිතන්නෙපා<br>මේ හැම කළොත් මෙතැනද නුඹ ඉන්න එපා |

| | | | | |
|---|---|---|---|---|
| 610 | | කිත්‍යාගාර නේවාසිකාගාරය | Hostel | පහන් සිතුවිලි පිපෙන යාමේ<br>නපුරු අදහස් මැකෙන යාමේ<br>විඩාබර නෙත් නිදන මොහොතින්<br>ඔබත් හෙමිහිට සිහිලුණාවේ |
| 611 | | කිත්‍යාගාර නේවාසිකාගාරය | Hostel | සම්පත් වුවත් වැඩකට නැති ඒවා ඇති<br>හොරබඩුවලින් ඔබ මොනවත් කරන් ඇති<br>නොසිතුව නේද තනි කිසි ආගල් එයන් ඇති<br>සම්පත් තුමාව කිසි වැඩකට අරන් නැති |
| 614 | | කිත්‍යාගාර නේවාසිකාගාරය | Hostel | ලේ දන්දුන්නම පලමුව පිං සිදුවෙනවා<br>ස්වස්නය වුනත් මගේ හිත ගත ලතවෙනවා<br>කෙල්ලන් නිසා මගෙ හිත ගත බේරෙනවා<br>යාළුවො නිසා මම උදයට අස්වෙනවා |
| 615 | | කිත්‍යාගාර නේවාසිකාගාරය | Hostel | විමානය<br>සුදුරෙදි<br>ඇදින්<br>කාමර<br>ආලෝකය<br>සංගීතය<br>නිශ්කලංකබව<br>බීර සහ ස්ථිරය |
| 616 | | කිත්‍යාගාර නේවාසිකාගාරය | Hostel | කුණුමාළු පෙත්තක<br>මඩ වගුරු කඩිත්තක<br>නොමැති කැත ඇති ගැණුවුණා |
| 618 | | කිත්‍යාගාර නේවාසිකාගාරය | Hostel | සිත් ගන්න<br>නිල්අහස<br>බිය කරැයි<br>සොදුරියේ<br>නොයමු අපි දුරඇත<br>මගේ මල් කැකුලියේ |
| 619 | | කිත්‍යාගාර නේවාසිකාගාරය | Hostel | ගී ගයන රැහැයි හඩ නුඹ<br>රැහැයි හඩන රාත්‍රිය නුඹ<br>රාත්‍රියේ දුටු සිහිනය නුඹ<br>සිහිනයේ රජවුනු කුමරිය නුඹ |

| | | | | |
|---|---|---|---|---|
| 620 | | කිත්‍යාගාර නේවාසිකාගාරය | Hostel | තට්ටු පහයි කීනස්කර හිර ගෙදර<br>ඒ වුනාට මෙහි නම් ඉඩ කඩ මදිය<br>බිත්තිවලට සවිකර ඇති පයිප්ප වතුර<br>ඔට්ටු නොවී මම යන්නයි හෙට ගෙදර |
| 622 | | කිත්‍යාගාර නේවාසිකාගාරය | Hostel | එක කාමරයක් එක නිවසක් ලෙස සිතමු<br>අපි සැම අතර බැදිම් ඇතිකර නොගමු<br>හැම දෙනම මිතුරන් ලෙස ඇසුරු කරමු<br>මෙයින් පිටවන තුරු එකටම වාසය<br>කරමු |
| 625 | | කිත්‍යාගාර නේවාසිකාගාරය | Hostel | නැවත් වතුර මළ යට නිදන නල වතුර<br>නෑමක් සිතින් කිම්දෙයි ගගදිය පතුල<br>හොස්ටල් කැන්ටිමේ බත නම් හරිනැහැ<br>මිතුර<br>කෑමක් නිශ්චිත පෙර කෑ අල බතල |
| 626 | | කිත්‍යාගාර නේවාසිකාගාරය | Hostel | යන එන තැන්වල සෙට්ටි තැනෙවා<br>ඒ සැම තැන්වල මෙට්ට ලැබේවා<br>මෙට්ටෙ නිදන්නට දෙක තුන කොට්ට<br>ලැබේවා<br>හතරවරම් දෙවි පිහිටෙන් ආපසු එන්න<br>ලැබේවා |

| අංකය | Selected | ස්ථනය | Location | ගීතය |
|---|---|---|---|---|
| 1 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | ගුරුපාර පහුකරන්<br>කඩුළු ඉම පැනලා<br>සිප් කරන්නට කොලොම්පුර ආහැටි<br>සිහිනයක් වගෙයි මට මාත් එක්ක රංඩුවෙන<br>මගේ පුංචි මල්ලියේ....<br>නුබේ උණුවෙන සිතතරම්වත්<br>දයාබර හිතක් දකින්න නෑ මේ ඉමේ<br>කැකුල සිත් හිත් පෙලන හිත් මිසක්<br>ඉතින් මගේ සුදු අම්මේ<br>හැම දෙයක්ම සිහිවෙලා<br>නෙතු පොකුනු කලතනවා<br>හඬනුබැහැ ඒ හිතේ දුක නිවන්නට<br>බොහො අය ඒවි- චාටුබස් කියාගෙන<br>මගේ හිත රවටන්න- ඉතින් මගේ සුදු අම්මේ<br>එපා දුක්වෙන්න සිතා මා ගැන<br>අමතක නෑ මට තවම<br>ඉඩ ලැබුනු විගසින්ම<br>නුඹ වැලඳ හාදුවක් ගන්න<br>උණුසුමේ වැතිරෙන්න<br>එ චුටී දුව විලසින්ම<br>සත්තකයි එනවා හනික මම |
| 2 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | ජිවිතය නුඹ<br>සිතූ දේ එලෙස නොවන<br>පැතූ පැතුමන් ඉටු නොවන<br>මෙයමද සරසවිය<br>මා ලැබූ මිණි කිරුළ. |
| 3 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | වසන්තය මලක් වි පෙති සලයි<br>පෙති සලයි නුඹ වටා දැවටේවි<br>මුදුලෙසින් රැකගන්න<br>වෙර ගනින් බොහෝ කල්<br>සොඳ ලෙසින්<br>එම නොව වටින්නේ<br>මලෙහි ඇති මල් සුවද. |

| | | | | |
|---|---|---|---|---|
| 4 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | ඉර හංගා වලාකුලකි<br>අහස ඔරවයි තරහින්<br>ගස් අතු අඹරවාගෙන<br>මඳ මරුත් සැඩවෙයි රළුවෙයි<br>ටියුෂන් ඇරියන නූතන විශාකාවන්<br>ඇවිද යති<br>පාර දිග<br>ඉවසිල්ලෙන් සෙමෙන්<br>පටු සාය ඉරේවිදො බියෙන්<br>උල් අඩි සෙරෙප්පු වැටෙවිදෝ<br>සැකයෙන්. |
| 5 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | හන්තාන පිස එන<br>සුවඳ මඳනල<br>විතරක්ම නොවි<br>කන් බිහිරි කරවන<br>නලාහඬ මැද<br>දහඩියෙන් තෙත බරිත වන<br>සරසවි යෞවනයට<br>කඳුල සිනහ ගෙන එන<br>බිම් කඩට . |
| 6 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | නිශ්මී එකේ යාල් දේවි පොත් කියවනවා<br>එ අතරේ මොන්ටිගෙ රුව හිතේ ඇදෙනවා<br>ෆෑන් එකේ මද සුළගට පිටු පෙරලෙනවා<br>පෙරලන පිට හොදයි කියා ඇය කියවනවා |
| 7 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | පරතෙරක් නැති විසල් මනු ලොව<br>අහිමි කවි මිස නොවීද පුර සැප<br>නෙතක හසරැල් නගන සෝ ගී<br>යා ද අතහැර නෙතු පියන් සදහට<br>උතුම් බණ පද සිතට සම වැද<br>බෝ මළුව යට බවුන් වඩනා<br>මෙහෙනි ඔබ මුව ශාන්තයි මට<br>ගිනි සදක් ලෙස පෙලන ගතසිත<br>නිවන සැනසුම කසාවත ඔබ<br>මළුව සිපලන වියළි බොපත්<br>හදට සොයුරනි අහිංසක ලෙස..... |

| | | | | |
|---|---|---|---|---|
| 8 | | බණ්ඩාරනායක<br>නේවාසිකාගාරය<br>(කාන්තා) | Hostel | දෙපයින් නැගී සිටින්නට වෙර දුන්නේ නුඹයි<br>කඳුල වෙනුවට සිනහව<br>කියාදුන්නේ නුඹයි<br>ජිවියේ ගැඹුරුතම<br>අරුත දුන්නෙත් ඔබයි<br>මා පුදන එකම දෙවි<br>මගේ තාත්තා නුඹයි ..... |
| 9 | | බණ්ඩාරනායක<br>නේවාසිකාගාරය<br>(කාන්තා) | Hostel | වසන්තය ලෙස සිතට පැමිණ<br>දුරින් හිඳගෙන සුවඳ විහිදන<br>නෙලන්නට බැරි දුරක සුපිපුන<br>මලක් විය නුඹ රුවට දිදුලන |
| 10 | 1 | බණ්ඩාරනායක<br>නේවාසිකාගාරය<br>(කාන්තා) | Hostel | නිල ඉදුවර<br>පැම කාල්මෙක්<br>බොඳවෙලා වැටුනේ<br>සිනා මල් පෙති<br>පිපුණ මුව අග<br>කළු වලා නැගුනේ<br>පහන් දැල්ලක<br>අළුවෙලා යන<br>සොඳුරුතම සිහිනේ<br>හින් හෙම්හිට<br>දෑස් බොඳ කර<br>යනු මෙනි දැනුනේ. |
| 11 | 1 | බණ්ඩාරනායක<br>නේවාසිකාගාරය<br>(කාන්තා) | Hostel | තරුවක් වෙන්න එපා මට<br>ඈත අහසේ<br>අඳුර මැද<br>මං<br>පුංචිම පුංචි බිම්මලක්<br>විතරයි<br>කෙතරම් දුරස් බවක්ද<br>අනේ ඔබ<br>තනිතරුවක් නොවි<br>දුර නැති<br>පිනි බිංදුවක් වුවානම්... |
| 12 | 1 | බණ්ඩාරනායක<br>නේවාසිකාගාරය<br>(කාන්තා) | Hostel | බත් ඇටවලට වැඩියෙන් ගල් අහුවෙනවා<br>පලා මැල්ලුමේ පණුවන් දඟලනවා<br>පරිප්පු හොද්දේ ඇට හොයලා පිනනවා<br>කැන්ටින් බත කද්දි අම්මා සිහිවෙනවා |

| | | | | |
|---|---|---|---|---|
| 13 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | ශේෂ වූ වෘක්ෂයේ<br>නිලෙන් පිරි අතු අතර<br>වියපත්ව යන්නට පෙර<br>ගල් පරලු අභිබවා<br>දෙපාපොඩි ඔසවන්න<br>නිසල ගං දිය තුලින්<br>සැඟව ඇත බොහෝ දේ<br>දිනෙක<br>නුඹ ගෙන ගියත්<br>තුරුලතා ගැවසි ගත්<br>ක්ෂේම භූමිය කරා<br>දිරි ගනින් රැදෙන්නට<br>හොයා හිස්<br>අහස වෙත..... |
| 14 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | පරස්පර විරොධි වූ<br>ජිවිතය<br>ව්‍යුත්පන්නයෙන්<br>අභ්‍යාගම්‍ය වූ<br>දිවියේ<br>ගම්‍ය<br>සදා<br>අමරණියයි. |
| 15 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | මිතුරන් අතර මිනිසකු වන්නට හැකිනම්<br>දෙවියෙක් නුඹත් මේ ලෝකයට වේ උතුම්. |
| 16 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | අහස් කුස නිහඬයි<br>ඔබ සේම<br>පරිසරය අඳුරුයි<br>මම සේම<br>සඳඑළිය සිසිලස්<br>පෙරසේම. |

| | | | | |
|---|---|---|---|---|
| 17 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | සිහින නම්තෙර<br>කඳුලු පිරුවට<br>නුවන් දැහැනේ<br>සැගවුනාදෙන්<br>සිතුම් අහුරක<br>පැතුම්සුන්කල<br>හැඩුම් කවියක්<br>නොම උනාදෙන්<br>සවන් පත් මත<br>ගොළු වුනාදෙන්<br>සදාකාලික<br>අපේ මිතුදම<br>හදේ ගැරැඹුරක<br>ලියවුනාදෙන් |
| 18 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | සරසවි දිවිය මෙහෙමද අපේ ගත වෙන්නේ<br>ඩෙංගු බරවා සහ අපි ඇඳයට ඉන්නේ<br>අල්මාරියද අපේ නිවහන වන්නේ<br>අපි වැඩකාරයෝ කවුරුත් නැහැ දන්නේ. |
| 19 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | උඳුවප් සිතලට<br>ගුලිවෙන්න නම් හිතෙයි<br>විභාගය ලග නිසා<br>නිදියන්න නම්බයයි<br>පොරව ගෙන හිසේ සිට<br>ඉදගත්තේ නිදියන්න නොවේ නම්<br>කිමද මේ<br>ඔළුව හොලවන්නෙ<br>ගොනිබිල්ලකු මෙන්<br>නිදිමත නිදිමත පාඩමක් උගන්වනවද? |
| 20 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | මහ ඉඩෝරයට<br>හසුව<br>කොලොම්තොට<br>පොලොව ගිණිගෙන<br>දැවෙන්නෙ<br>යම්සේද<br>මාසිතක් එසේමය<br>විභාගය<br>විභාගය. |

| | | | | |
|---|---|---|---|---|
| 21 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | රෑන් රෑන් ඉගිල එන දග සිතුවිලි<br>සේනාවෝ සිත් අහසේ කළබලෙන් ඒ මේ අත පියඹනවා<br>හීන් හීන් හඩක් නගා මොනවාදෝ ඉල්ලනවා<br>ඉල්ලු දේ නොලැබෙන විට කඳුළු සලා යැදෙනවා. |
| 22 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | වසන්තයේ පිපුණු කුසුම් සියොතුන් හා හිනැහෙන විට සිසිල් සුළග ගී ගයමින් තුරුපත් හා නැලවෙන විට<br>සඳවත මත දුහුල් වලා තුරුළු වෙන්න දිවයන විට<br>මතකෙට හිමි නුඹේ මුහුණ මකා දමයි හනි හනිකට . |
| 23 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | පිපෙන තෙක් මා උනනත් - කටු අකුලේ රෝස කුසුම<br>නෙලා ගන්න මට ලැබුනේ - මල නොව විස කටු අත්ත. |
| 24 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | විනාසවන්නට දෙයක් නුඹ<br>ඉපැද්දුවේද<br>අද ඔබ සතු දෙය<br>ඊයේ කවරකුගේ හෝ<br>විය හැකිය<br>මන්ද වෙනස්විම. |
| 25 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | ජිවිතයේ මහ ගිරි දඹ<br>තරණයට<br>සෙවනැල්ලක්ව සිටිනා<br>මතකයයි<br>අඳුරු ජිවිතයේ<br>පහන් එලියවී<br>ආලොකයක්ව<br>ජිවිතයේ ගමන් මගට<br>පන්නරයක්ම විය<br>නුඹ මා හට<br>දයාබර<br>තනිකම |

| | | | | |
|---|---|---|---|---|
| 26 | | බණ්ඩාරනායක<br>නේවාසිකාගාරය<br>(කාන්තා) | Hostel | ළමාවිය<br>තුරුණුවිය<br>සතුට සොම්නස ආදරය<br>සියල්ල උකස් කොට<br>ලබාගත් සියල්ලෙන්<br>සැරසුනෙමි විභාගයට<br>Tuet මිටි හිස තබා<br>පන්ති යමින් දුෂ්කර ක්‍රියාකොට<br>මුහුණ දුනි භාගයට<br>අවසාන විභාගය සමත් වීමි<br>ජයග්‍රහනයෙන් උදම්ව<br>ආපසු හැරි බැලුවෙමි<br>අවසනාව<br>සියල්ල සින්න වී හමාරය. |
| 27 | 1 | බණ්ඩාරනායක<br>නේවාසිකාගාරය<br>(කාන්තා) | Hostel | පැනි මිරි සොයන<br>නෙක මල් සිඹින<br>රන් සමනලුන් යන<br>මගපිපෙන<br>අතු අග දිසිලෙන<br>මල් කැකුල නුඹ<br>නැත නැත<br>මල් සුවඳ නුඹ. |
| 28 | | බණ්ඩාරනායක<br>නේවාසිකාගාරය<br>(කාන්තා) | Hostel | අල්ලට සිල්ප ගෙන<br>රොන්සුනු පිරුනු දිනේ<br>නුඹ මා ළග උන්නා<br>වල් කොළ අතුද නිගා<br>වැරහැලි ඇගළු දා<br>නුඹ මා ළග උන්නා<br>කල් ගිය සිහින මකා<br>වල් වැද මිලින උනත්<br>පෙම් සිත හැදින ඇතත්<br>අපි අපි ළග ඉන්නා. |
| 29 | 1 | බණ්ඩාරනායක<br>නේවාසිකාගාරය<br>(කාන්තා) | Hostel | අනන්තය සිසාරා<br>දෙනෙත ගෙන ගිය විටෙක<br>බොඳව ගිය දෙනෙත් යුග පෙනෙයි<br>ගිම්හානයක<br>වසන්තය උගත නැත<br>විහග හඩ මෙතෙක් නද<br>කෙසේ කවදා ඒද<br>පතන ඒ සදෙව්ලොව . |

| | | | | |
|---|---|---|---|---|
| 30 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | සහොදරයෝ තාරෝ සහ මුරුද අයියා<br>කැන්ටිම කරන්නට ආයෙත් පැමිනිලා<br>ආයෙත් බඩට තද පාරක් වැදිලා<br>බඩ පණුවන්ට රජකරනට කාලය ඇවිල්ලා. |
| 31 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | ඈත ඉමේ<br>තරු මඩලේ<br>සත් සමුදුරු වලින් එහා<br>ඇති නොලැබෙන දෙයම පතා<br>නිරන්තරේ බැදෙන සිතට<br>සදාකල්හි නැත සැනසුම |
| 32 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | ජිවිතයේ දුක් ගීතය<br>හඩ නගා කියන්නට<br>අත් වැලක් වු ආදරණීය<br>මැණියනි<br>හදවතින් හඩනා<br>ශෝක ගීතය<br>ඉකිබිදින හඩ අසන්නට<br>හදවතට තුරුළු වු පියාණෙනි<br>අ - ආ - යනු කියන්නට<br>ජිවිතයේ දුක සැප බෙරාගන්නට<br>අම්මා තාත්තා වෙහෙසෙනු සිහිව<br>සරසවි බිම අතරමං විමී<br>මම. |
| 33 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | ජිවිත ගමනේ "අ" යනු<br>"ආ" යනු කියාදි<br>සෙනෙහසේ අස්වනු ලබාදුන්<br>ආදරණීය මව්නි<br>දැත් කරගැට වන තෙක්<br>අප වෙනුවෙන් දහදිය වැපුරු<br>ආදරණීය පියතුමණි<br>සිහිවන වාරයක් වාරයක් පාසා<br>සරසවි බිම හැරදා<br>ඔබ තුරුලට එන්න සිතුනු වාර<br>අනන්තය<br>එහෙත් කුමක් කරම්ද . |

| | | | | |
|---|---|---|---|---|
| 34 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | දං ඕවිටිය දෙවැට මතින්<br>අපි ආවා ලක්දිව හතර කොනින්<br>කාලය ගියා අපට නොදැනිම අපට හොරෙන්<br>බොරු කිය කියා පුටු රත් කල පෙර දවසක<br>සාරා තමයි අම්මා උනේ දුක සැප හමුවේ. |
| 35 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | දහසකුත් පැතුම් පොදි බැදන්<br>සුපුරුදු පරිසරයෙන් දුස් වී<br>සතුට දුක හා පුංචි බියක්ද<br>මේ පුංචි හිත්වල තබාගෙන<br>පිය නැගුවෙමි සොඳුරු කලණ අසපුව වෙත. |
| 36 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | මාගේ මිතුරියනි<br>ආවෙමි හමුවුනෙමි<br>සතුටු වුනෙමි- වෙන්වෙනවද<br>ජිවිතය තුලම<br>ජිවිතයට දුකක් වන්නද<br>ඈ යන්න වුනෙද යන්නද<br>හෙට හමුවෙයිද නුඹ<br>නංගියේ අපි යන්නෙමු<br>ඔබව බලන්නට එන්නෙමු<br>එහෙත් නොමැත අවසර. |
| 37 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | එක් සුන්දර දවසක<br>පිය නැගුවා කැලණි සරසවි අසපුවට<br>සිව් දෙසින් පැමිණි<br>ආදරණිය තුරියන් සමග<br>ගත කල ඒ අවසන් කාලය<br>කෙතරම් සුන්දරද. |
| 38 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | ඉගිලෙන්නට කාක්කන්ට අයිතියක් ඇත<br>අහස උසින්<br>අහස අපේ නොවන හන්ද<br>එත් අපේ හිස මුදුනේ<br>කුඩු තනන්න<br>බිජු දමන්න<br>අයිතිය නැත කාක්කන්ට<br>ඔළුව තාම අපේ හන්ද. |
| 39 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | නොලද නොලැබෙන<br>සියළු සම්පත්<br>මතකයෙන් ඈතට මුදා හැර<br>ලැබෙන දේ ඒ ලෙසින්<br>පිලිගත් විටදි<br>හි නුඹයි<br>පරමවු තෘප්තිය |

| | | | | |
|---|---|---|---|---|
| 40 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | මගේ හදවත බිම වැටී ඇත<br>පාග පාගා නටාපන්<br>එයින් වැගිරෙන උණුම උණුලේ<br>ඇගේ තවරා නටාපන්<br>මගේ ළයෙහිම වැයෙන බෙර හඬ<br>තාලෙටම නුඹ නටාපන් |
| 41 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | දේශන මොටද මතකයේ රදවන්න බැරී<br>සටහන් මොටද කියවා නිමවන්න බැරී<br>බුද්ධිය මොටද සිතනා දේ කරනු බැරී<br>ඕග්රිය මොටද රැකියාවක් ගන්න බැරී |
| 42 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | නිශ්චල වැඩක සිව්වසරක නිරත වෙලා<br>ආපසු යනවා අපි ගම්රටවල් සොයලා<br>බැහැ අදුරන්න ගම නගරය වෙනස් වෙලා<br>අරමුණු නොමැති මේ ගමනක නිරත වෙලා. |
| 43 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | සබඳ මේ පෙර යමයි<br>නිසල උවද රාත්‍රියයි<br>ලහිරු රැස් නැගව්වී<br>සෙනෙහසින්<br>පැනසර කෙලින්නෙක්<br>නුවන් පෙත්<br>සිත් පහන් වෙයි<br>දල්වන්ට කාලයයි. |
| 44 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | පාඩම් කරලම්<br>ඇතිවන තුරු<br>පොත් දිහා<br>නෙතු පියන්<br>විභාගයට ගිය<br>කළට<br>සියලු දේ<br>සිහිවෙයන් . |
| 45 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | ජිවිතයට අගයක්<br>නැති තැන<br>මරණයට මිලක් තියෙන<br>මිනිස් දඩයක්කරුවන්<br>බිහි වුයේ ඒනිසාය. |

| | | | | |
|---|---|---|---|---|
| 46 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | කෝටු පිරුණු ජනේලය<br>හුදකලා පියන්පත්<br>ඉකිගසයි තුන්යමේ කාමරේ<br>නිඳිවරන පොත් අතර<br>වකුටු නිදන සිත<br>සැනසෙන්න මොහොතකට<br>නිගාවී. |
| 47 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | සිත චංචලයි - බියකරුයි<br>වෙනස්වෙයි - දුක්බරයි<br>මේ වෙනස කිමද<br>කියා ගන්න බැහැ දෙවියනි<br>ලියන්නට පුළුවන්නම් මේ වෙනස<br>බැහැ ලියන්නට මේ වෙනස<br>කිමද කියා<br>තේරෙන්නේ නැති කල . |
| 48 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | දෑස නිදිබරයි වෙහෙස වැඩි හන්දා<br>ක්‍රමෙන් දැන්නද Exam ළග හන්දා<br>දින ගෙවෙනවා නොදැනිම වැඩ වැඩි හන්දා<br>තව ටික දිනයි අපි යාළුවෝ ලග ඊන්නා |
| 49 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | උදේ හිටන් වකුටු කොන්ද දිග ඇරපල්ලා<br>අතේ තිබෙන අයිල් කවර බිම දාපල්ලා<br>හිසේ තියෙන ඔක්කොම බර අහක දමල්ලා<br>ඇදේ ටිකක් හාන්සි වී විඩා හරිල්ලා. |
| 50 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | තියාගන්න හිස පොඩ්ඩක් ඇදක් අපට නැද්දෝ<br>දුක බලන්න කෙනෙක් අපේ ලොවේ ඉපිද නැද්දෝ<br>තෙල් ගාන්න හිස අතගා කෙනෙක් අපට නැද්දෝ<br>හැමදා මම මේ විදිහට මෙහෙමම ගත<br>වෙයිදෝ . |
| 51 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | උදේ හිටන් වකුටු කොන්ද දිග ඇරුමත්<br>නැත්තේ<br>පොත් බැලුමෙහි ඇස් රිඳුමෙන් ගැලවීමක්<br>නැත්තේ<br>හිතේ තියෙන දුක් ගින්නට සිසිල බිදක්<br>නැත්තේ<br>හිතේ තියෙන කාන්සියට සැනසිමක්<br>නැත්තේ |

| | | | | |
|---|---|---|---|---|
| 52 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | ළංවෙන්නට මට සිතෙන<br>එත් ළංවෙන්න බැරී<br>දුර ඇත හිනහ වෙන<br>පුර පෝය අහස් කුස<br>එළිය කළ නුඹව දැක<br>පහන් වූ මගේ සිත<br>බවුන් වඩවයි මෙලෙස<br>අතිතය සමග බැඳි<br>සොඳුරු වත්මනද මට<br>මැව් මැව් නැගේ යලි<br>දුක සිතුන හදවතට<br>කනක හෝ පැහැසරව<br>අහස් ගං තෙර මතින්<br>සිනහ පා එබෙන සඳ<br>හැමදාම මේ ලෙසම<br>මගේ මතක අවදි කරවයි. |
| 53 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | තවම නොගැයුන තනුව  වයමී<br>නොලියවුනු ගිතයක් ගයමී<br>මගේ මියැදෙන හදවතේ ගිනමී<br>නිසල අහසට සුසුම් පාරමී<br>සිනා සැගවී ඇත ගොසිනි<br>එත් සද සේ සිසිල ගෙනෙමි<br>මගේ හද රැඳි වේදනාවන්<br>කඳුළු දිය කර ගලා යවමී<br>සබඳ දුක් ගී තවම ගයමී<br>අසන්නට කිසිවකුද නොමැති<br>මගේ ලෝකය සුනුවිසුනු කර<br>අනන්තය වෙත පලා ගොසිනි . |
| 54 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | මල් තියන්න හිතෙන පංසලක් දුටුවාම<br>දෑත එසවෙන්නේ භව හුරුවක්ද මන්ද<br>දෑස නොපෙනෙන දෙපා සොර දනෝ දුටුවාම<br>නිබඳ දත් දෙන්න හිත් දෙව්ද මන්ද. |
| 55 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | දුක නිසා ඉකිබිදින දෑත අපේ සනසන<br>මුළු හිතට දැනෙන දුක හිතිලද මන්දා<br>කඳුළු දොතින් පිසින සිනාවෙන් මුව සිබින<br>කියන් සඳ මගෙන් වරදක් උනිද මන්දා . |
| 56 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | සඳ ඉතින් නුඹට යන්න කියන්නේ කෙලෙසින්ද<br>දස දහස් වර හිතම වැලපෙයිද මංදා<br>සිත් කලත් සංසාරේ නොකල සිත මේ නොමද<br>ඒ දනන් දෙන්නේ මං විතරද මංදා |

| | | | | |
|---|---|---|---|---|
| 57 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | මව්පිය සෙනෙහසින් මිදි<br>අතිතයේ දිනකදි<br>පියඹා ලගාවූ<br>මේ සංසාරයේ දි<br>ඔබෙන් ලද මිතුදම<br>සදා සොඳුරුයි<br>ඉතින් වසරක් ගෙවෙන<br>හෙට දින<br>ඔබෙන් මිදි සමුගන්න වෙයි. |
| 58 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | හිනා මල් පෙත්තක<br>නුහුරු හැගුම් එකිනෙක ගෙන<br>පේලියකට ගොතා ගත්ත<br>පුංචි පද අතරටය<br>සත්සර මුසු නාද රටා<br>වෙන පරදා මුසු කරන්න<br>මේ සෙනෙහස<br>හැර තනුවක්<br>මිහිපිට මට තියෙනවද. |
| 59 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | කට පාඩම්<br>කට පාඩම්<br>ගියන්න මුඛවාඩම්<br>අම්මේ මට තෙරවමු දරා ගන්න බෑ<br>තරග බිමේ මට වෙහෙසයි<br>තව දුවන්න බෑ . |
| 60 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | මොන කරුමයක්ද මේ පඩිසන් දෙන්නේ<br>කැම්පස් දමායන්න මගේ සිත දෙන්නේ. |

| | | | | |
|---|---|---|---|---|
| 61 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | නෙතු පලා එන කඳුළු වගුරන දරු සොවින් ඉකිබිඳින<br>සිතා පා එම කඳුළු පාකර සෙනෙහසම පොදිබඳින<br>මහා සාගර සිසිල අරගෙන උණුසුමට පණ පොවනා<br>සඳා නමදිමි දෙපා පාමුල පුදා සුදුමල් පිපෙනා<br>සඳා කාලික අරුත නුඹ වෙයි අඳි අඳුරම හඬනා<br>මහා පන්හිඳ කුරුටු ගෑ බැති සිලෝ ගීතය සෝබනා<br>පතා මහනක් නිවන සඳහට හෙලා වනමල් පුදනා<br>බුදුන් නොදුටිමි භවේ මිනිසත් ගිය නුඹ මැයි ගැයෙනා<br>කවා රසමුසු පුතුනගේ කුසට සෙනෙහස පොවනා<br>මවා ලොකය කිරට දියකර සෙනෙහසට කවි කරනා<br>දයා දිය ගෙන දෙතොලට පෙරලන සිනා දුක් විඳිනා<br>සඳා කාලික බුදුන් වේ නුඹ මගේ ලොකය නිවනා . |
| 62 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | නිරුදක කතරේ ගිනිදැල් අතරේ<br>ලස්සන ගමනක් අපි යනවා<br>සිතුම් පැතුම් පොදි බැඳන් වලාවක්<br>අහසෙ ඈතට පාවෙනවා----<br>ඉමක් කොනක් නැති මේ භව කතරේ<br>කෙදිනක හෝ අපි වෙන් වෙනවා<br>යහ මඟ සොයමින් මගේ මිතුරිය<br>යන මගට ආසිරි ගෙනෙනවා. |
| 63 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | ජිවිතයේ ලස්සනම දේවල් දරාගන්න<br>ඒ ලස්සනම දේවල සතුට සැනසුම<br>විඳගන්න හදවත<br>ඒත්<br>ඒ ලස්සනම දේ අහිමි උනාම<br>හඬන්නට වෙන්නෙ<br>ඇස් දෙකට . |

| | | | | |
|---|---|---|---|---|
| 64 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | ගෙවුන පෙරදින<br>ගෙවෙන අද දින<br>එළඹෙන හෙට දින<br>කෙසේ වේවිද<br>අනාගතය. |
| 65 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | සෙවන ඇති ගසක් මුලට ගොස්<br>විඩාව සංසිඳුවා ගන්නා තැනැත්තා<br>එම ගසෙහිම අත්තක්<br>කඩාදමන්නේ නම්<br>හෙතෙම මිත්‍ර ද්‍රෝහියෙකි<br>අධමයෙකි<br>මිත්‍ර ඝාතකයෙකි. |
| 66 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | මිතු දමේ මල්පිපී<br>සෙවන ලෙස මගෙ හදේ<br>මා සමග අකුරු කළ<br>මගේ කළණ මිතුරියේ<br>ආසිරි සෙනෙහෙ මල්<br>හදපිරි සතුටින්<br>පුදනුයේ.... |
| 67 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | ගිරිදුර්ග ජිවිතේ<br>ගෙවන්නට ඉසිඹුවක්<br>පැමිණියා පෙරදිනක<br>මේ පුංචි කැළණියට .....<br><br>මාපියන් ලග පනාමැති<br>ජිවිතේ තනිකමට<br>අපිට අපි එක්වුවා<br>දයාබර මිතුරියේ .....<br><br>සිතබැදුනු මිතුදමට<br>කෙලිකවට සිනහවට<br>සත්තමයි දුර ගියා<br>මනෙත රැදි කදුළු බිදු ......<br><br>කුසගිණ දැනෙන මුත්<br>කෙලිකවට වදන් වැල්<br>එපා දුර හරින්නට<br>අපිට අපි සිටින තුරු.....<br><br>රැහැනක රැදි කඳුළු බිදු<br>උඩු සුළගේ පාකරන්<br>සිනාසියන් සොයුරියේ<br>මේ අපේ වසන්තයයි...... |

| | | | | |
|---|---|---|---|---|
| 68 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | දහසක් නෙත්වලට<br>හොරෙන් බැඳි සෙනෙහසින්<br>ඉතිරි තනි මතක පොද<br>පමණක්ම කර තියන් . |
| 69 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | ඉකිගසා හඬන සිත<br>නුඹ දුකින් උදුරගෙන<br>පරවෙච්ච මල් රැදුන<br>මලසුනක තබන්නට<br>පුර පසක් අතවැනූ<br>කවි පැතුම් අකුලාන<br>අඩසඳ ගුලිවෙලා<br>නුඹ නමින් සිතන්නට. |
| 70 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | අද පුදුම දුකක් වින්දේ<br>කැම්පස් එනවා කියන්නේ<br>දුක්විඳින්න පුරුදු වෙනවා<br>කියන එකටද<br>එහෙමත් නැතිනම් මැරෙන්න<br>පුරුදුවෙන එකටද |
| 71 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | බඹර සෙනෙහස පතා ඇදි යන<br>වන මලේ<br>අවැසිද සුවහසක් ....<br>මදිද? එක් බඹරෙක්<br>නොදනිද ආයු අඩුබව<br>මල්පෙතිවල<br>දැන ගනුව<br>රුව නෙව<br>සුවඳ.....<br>බඹර පැතුම |
| 72 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | වරද හැමදාමත්<br>කළයුත්තක් නොවේ<br>වරද අත් හල යුත්තේය<br>කවුරුන් වැරදි කළද<br>වටින්නේ වැරද හඳාගන්නා<br>පුද්ගලයාය. |
| 73 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | තරහ ඇත්තවුන් මෙතින් පිරේවා<br>ගැටිම ඇත්තවුන් ගැටි නැතිවෙත්වා<br>බොරුව කියනවුන් සත්‍ය දකිත්වා<br>සියලු දෙනාටම සත්‍ය වඩත්වා |

| | | | | |
|---|---|---|---|---|
| 74 | | බණ්ඩාරනායක<br>නේවාසිකාගාරය<br>(කාන්තා) | Hostel | පාලුව හුදෙකලාව<br>මසිත වෙලාගත් මොහොතක<br>සිතුනෙුඹ ගැනයි මෙලෙස<br>තනි කරන බව මසිත<br>මිරිගුකි පිවිතය<br>මායාව අතවනන<br>කවුරුවත් මට නොමැත<br>මා මිසක මගෙ සිතට |
| 75 | 1 | බණ්ඩාරනායක<br>නේවාසිකාගාරය<br>(කාන්තා) | Hostel | අපි සරසවි බිමට පිය නැගුවේ<br>කොතරම් බලාපොරොත්තු<br>පොදි බැදගෙනද<br>නමුත්<br>විඳින්නට ඇත්තේ<br>කොතරම් කටුක<br>අත්දැකිම්ද යයි<br>කනගාටුවක්<br>මසිත නැගේ..... |
| 76 | 1 | බණ්ඩාරනායක<br>නේවාසිකාගාරය<br>(කාන්තා) | Hostel | හෙට වැරදුනත්<br>ඊලග දවසේ හැදෙන්න<br>දවසින් දවස හැදි හැදි යන<br>මේජිවිත ගමන<br>බොහොම සුන්දරයි. |
| 77 | | බණ්ඩාරනායක<br>නේවාසිකාගාරය<br>(කාන්තා) | Hostel | ගෙවී ගිය දේ ගැන<br>දුක්වෙලා පලක් නැහැ<br>කදුළු පිරුනු අතිතය ගැන<br>සිහිනොකර<br>පැහැබර හෙට දිනකට<br>සැරසෙන්න |
| 78 | | බණ්ඩාරනායක<br>නේවාසිකාගාරය<br>(කාන්තා) | Hostel | කැලණි ආවේ දහමට ආස හන්දා<br>කැම්පස් ආවේ ඩිග්රිය ඕනැ හන්දා<br>picket කලේ අපගේ පොදුකම හන්දා<br>කදුළු ගැස් ගැහුවේ මොකටද මංදා |
| 79 | | බණ්ඩාරනායක<br>නේවාසිකාගාරය<br>(කාන්තා) | Hostel | අතීතයේ එක් දවසක<br>දයාබර ඔබෙන් ලැබු<br>සෙනෙහසේ ආනන්දය<br>ඇතින් හමා එන<br>සුළං කෝඩයක දැවට්ලා<br>බොහෝ දුරකට පාවෙලා ගිහිං<br>සිතින් නම් තනි වෙලා නෑ මං<br>නුඹේ සෙනෙහස සුවඳ<br>දැනෙනවා මට තවම. |

| | | | | |
|---|---|---|---|---|
| 80 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | මේ බිත්ති හතර<br>නවාතැන් පලක් පමණිය<br>සංසාර ගමන තුල<br>එක් ආත්මයක් බදූ<br>ආදරය කරමි මම<br>මේ පුංචි කුටිමට<br>මක්නිසාද යත්<br>ජිවිතයට අලුත් දෙයක්<br>මේ කුඩා කාමරය<br>මට කියා දූන් බැවින්. |
| 81 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | මේ කැම්පස් ජිවිතයේ<br>එකම අරමුණ උපාධිය නොව<br>මේ විශ්වයේ ඇති දැනුම<br>සොයා යන්නයි<br>එහෙත් මෙම අධ්‍යයන<br>ක්‍රමයෙන් එය ලැබේ දැයි<br>ගැටළුවකි. |
| 82 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | සිත් මල් යායේ<br>කොද කැකුළු විල්තෙරේ<br>ගෙවුනු සුන්දර නිමේෂක්<br>අතිතම මතකයන්ට එක්කර<br>සමුගෙන යන්න සිදුවෙයි<br>සුවඳ නුඹ ලගින්<br>අතිතයේ පැතුම් පරවි<br>සිනහ වසා හඩා වැටෙයි<br>නුඹ සිතින් හැර දමා<br>යන්නේ කෙලෙසකද<br>කියනු මැන<br>සිතින් දුක් වේදනා<br>නෙතින් දුක් කදුළු බිද<br>මා කෙසේ දරන්නද<br>වසත් සමේ යොවුන් වියේ<br>නුඹට මවු වූ වග. |
| 83 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | පුංචි කදු ගැටය නැග<br>බලාපොරොත්තුතු සිතේ දරත් ආවෙමි<br>සියල් බාධක බිද දමා<br>කල්‍යාණි සරසවි මව්නි<br>ආවෙමි නුඹ තුරුලට<br>ඉතින් සිව් වසරක් රුදෙන්නට<br>දෙනු මැන මට අවසර |

| | | | | |
|---|---|---|---|---|
| 84 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | නිමල පැහැ මෘදු හදින් පැතූ<br>සුදු පැහැ පැහැ පැතුම්<br>පාට දේදුනු යටින්<br>ගිලි ගිය මුත් තදින්<br>කිම නොවුනි පැහපත්<br>හඬන්නද මා ඉතිං<br>අඳුරු පැහැ වළාකුළු<br>වසන්තය වෙනු<br>නුඹ නොවෙයි<br>බොඩිම සතර කොන<br>සිර ගතව<br>කල්ගතව<br>රාත්‍රියක<br>ගෙවුනු<br>තනිකම....... |
| 85 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | ජීවිතයේ අලුත් පැතුමක් පොදිබැදන්<br>පිය නැගු මේ සරසවි බිමට<br>ලෙන් ගතුවන්නට සිතුවත්<br>අපට එරෙහිව<br>මිතුදම සදා එරෙහි වෙයි<br>බුරබුරා නැගෙන ගිනිදැල් සේ...... |
| 86 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | කැකුළු මල් පෙල ගැසී<br>නුඹ වෙන්න<br>සඳ කුමරි තරුවරා<br>ළය සැනසී යන්න<br>වලාපෙල සේදිනා<br>කිරි සුදට බබලනා<br>අහුරු මීදුම ඉරා<br>රන් තාරකා විහිදන්න<br>විහග දුඩු පොඹයන<br>ගී සින්දු පවසන්න<br>බඹර තුඩු මත්වෙනා<br>මී බිංදු පුරවන්න<br>පිනි බිංදු සිපගන්න<br>සිසිල් සුලගක් වෙලා<br>මුළුඅහස පිසයන්න<br>දුක් කදුළු වියළිලා<br>සිනාමල් පුදින්න<br>මුවින් මුව රැව්දෙනා<br>සුහපැතුම් ඉටුවන්න<br>නුවුම් සිතුවිලිවෙලා<br>සිතින්සිත පිබිදෙන්න<br>අලුත් දවසක්වෙලා<br>අපේ ලෝකයට එන්න. |

| | | | | |
|---|---|---|---|---|
| 87 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | ඉඩොරය ගලාවිත්<br>ඉරි අඳිද්දි වැව් පතුලක<br>ගැබ්බන් .....<br>අහස් කුසහඬන හැටි බලාගෙන<br>හිනා වෙද්දිත් කලාවැව<br>කඳුළු පොරෝගෙන<br>රුක් අත්තන<br>මල් සුවඳ උරාගෙන හමන<br>මද නලින් සමවත්ව<br>කලාවැව බලාගෙන<br>අනිමිස ලොචනය කරන<br>අවුකන බුදුහිමි සදිසිව<br>මම දැක<br>නෙතු පියන් රදවාන<br>සමවත්ව සිටි බවත්<br>නුඹ දිගු හදවතින්<br>අබැටක් තරම්වත්<br>මතකයක් ඉතිරිනම්<br>පිං සිද්ධ වෙයි නුඹට. |
| 88 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | දවසින් දවස දිරුවා<br>ඇග හොදටම කෙට්ටු උනා<br>සැනසිමක් නැහැ තවමත්<br>මහත් වෙන්න බැරිම හැඩයි<br>හරි හරියට වැඩ කෙරුවා<br>ඩිග්‍රිය මහතට ගත්තට. |
| 89 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | සේද සිහින සුදු දුන්හිද නුඹ<br>දුර සිත නුමුන කුල ගිරි හිස නුඹ<br>මුණ බලාගෙන මෙලෙස<br>ජාති ජාති යලි උපදින්නට |
| 90 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | දැහැනක බැදුණු නුඹ වෙන<br>සසර දිගු කරති<br>රැහැනක් වී බැදුනාම<br>දසුනක් පමණක්ය<br>මම. |

| | | | | |
|---|---|---|---|---|
| 91 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | සහසක් පැතුම් දරා<br>පුදින්න වෙර අදින<br>නෙක විද මල් කැකුළු<br>පැමිණියා අසපුවට<br>බඹර කැල මත්වන්නට<br>නෙලා ගන්නට සිතන<br>තවකෙකුට ඉස්සරව<br>රඟති<br>මල්වෙලා<br>මල් කැකුළු සිපගන්න<br>අසරණයි සිතුන විට. |
| 92 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | මා<br>සුළැඟිල්ලෙන් ගෙන<br>ලක සිසාරා ඇවිදුවා<br>පොත පතෙහි දිමෙහි කිමෙහි<br>ගිජු කරවූ ඔබ පිය පද<br>මා නියත වියරනයක් ලදිමි<br>දෑස්<br>අඳුරු පටලයෙන්<br>වැසි යන තෙක්ම<br>නිඳිවරා මා සඳ සෙවනැල්ලක් වූයේ<br>මෑණියෙනි නුඹයි<br>ඔබෙන් දිවි ලද නිසාම<br>ඔබ පුතු ලොව ගොඩනගා ගන්නට<br>දිරිදෙන දිවිදෙන<br>දියණියයි මම.... |
| 93 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | හාද වී සොඳුරු හැගුමන්<br>කීව මිතුරු ගී අසමින්<br>සාර සිප් සොයා වෙහෙසින්<br>ශිල්ප කලාදෝ<br><br>තක්සලාවියන් නිමවී<br>මිතුරු සිත් සොවින් ගොළුවී<br>බාල කාලයක් නොකියාම සැගව ගියාදෝ<br><br>සොයුරියන් ලෙසින් බැඳි සිත<br>මුදාගෙන යන්නට බැරිවීම<br>බාලිකාවියන් සැවොම<br>කඳුළු සලයිදෝ |

| | | | | |
|---|---|---|---|---|
| 94 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | අනන්තයට යන පාර දිගේ<br>පුංචිම පුංචි නවාතැනක පිපුන<br>ලස්සනම ලස්සන මල් ටිකක්<br>එකතු වුනේ හරිම සුන්දර විදිහට<br>ඒත්<br>ඒ මල් මිටේ මල් ටික<br>ඉහිරිලා යන්න කාලය ඇවිත්<br>මහ ගොඩක් දුක තුරුළු කරගෙන<br>අපි වෙන්ව යමු ඉතින්. |
| 95 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | කැරටි, අල, බෝංචි,බිත්තර<br>හිටරයෙන් තම්බලා කන මේ සොදුරු<br>වසන්තයේ හෙට මල් පිපේවි<br>ලස්සනම ලස්සන. |
| 96 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | ජිවිතයේ වස්සානය එළඹී ඇතත්<br>වසන්තය ඉක්ම ගොස්<br>වස්සානය නෙතු මානයේ රැදෙයි<br>එත් මම වසන්තයට බිය වුනෙමි<br>කටුක සමාජයේ රුදුරු වගවලසුන්ට. |
| 97 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | ඉපලක් උනත් නුඹ මට මහ බෝධියකි<br>වියනක් නැතත් ඔය හද ගැඹ දාගැඹකි<br>මට පමනක්ම හිමි නොඉදුල් දාහයකි<br>ඔබ මගේ කසුන් පුදසුනමත බුදුරුවකි. |
| 98 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | අද වලි දවසක් අපේ DH එකට<br>Lectur ගිය අපේ කෙට්ටු සරා<br>මූණ රතු කරන් ආපහු ආවා<br>අලයෝ අපේ Lectur එකක් දාලා |
| 99 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | අකාල සුසුමින් හද නද නොරිදා<br>මා ලග සිටි බව බිදකුදු නොසිතා<br>සැනසුම් සුසුමින් ඉසුරින් සැනහි හැමවර<br>හැමදා හිනැහෙන් ජය ලැබ දිවි මග . |
| 100 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | පුරා වසරක් -සරසවි ගැඹ තුල<br>සැපසම්පත් අතරින් - දුකද උරුමව<br>සදාදර මිතුරියන්ගේ - අමිල සෙනෙහස<br>කිසිදා අමතක නොවේ මට. |

| | | | | |
|---|---|---|---|---|
| 101 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | රැග් සියක් එක ගෙවමින් සිටින විට<br>ආවා අපිට හොල්ලන්නට යන්න<br>උදේපාන්දර නැගිටලා අපි සැවොම<br>ලැස්ති වී ගිය ඔක්කොම ජිම් එකට<br>team එකක් වශයෙන් යන්නට සිතුවත්<br>අපි කට්ටිය ගියේ වාරිය පොල යන්න<br>යන්න වුනේ set එක කුලියා පිටියේ<br>යැව්ව දෙන්න දෙන්නා කැටේ හොල්ලන්න<br>මායා බිලේඩ් තොක්ටො හා සැගියා<br>සියඹලි මඩුවා ගියේ පොල දෙසට<br>කොවුලි පොඩි පිනේ දිල් පොන්ටින්<br>දිබුලි මරුෂි ගියේ බස් හොල්ලන්න<br>අපි තාම විනොදෙන් කැට හොල්ලා<br>මුදල් එකතු කර ආපහු ආවා<br>ගෙවී ගියත් ඒ දිනය පසු වීලා<br>අමතක නොවේ බැනු ඇසුමෙන් කන් පිරිලා. |
| 102 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | ජිවිතයේ එක්වූ<br>තීරණාත්මක කඩ ඉමක් පසු කොට<br>සුවහසක් පැතුමන්<br>හදගැබෙහි රදවාගෙන<br>දෙමාපිය ආශිර්වාදය මැද<br>ගැහෙන හදවතින් යුතුව<br>පා තැබූ මේ සරසවි බිමේ<br>හදවත බදු වූ<br>බණ්ඩාරනායකය<br>සැබවින්ම සුන්දරය<br>දිවයිනේ නන් දෙසින් පැමිණි සොයුරියන්<br>නොබෝ දිනකින්<br>එකම මවකගේ සොයුරියක් ලෙස<br>දුක සතුට බිය රැදුන සැම විටම<br>සැම දෙන එක් විය.<br>සැබවින්ම මෙය අපේ නිවහනයි<br>රජ බොජුන් නැතත්<br>මා පියන් නැතත්<br>අප අපට පිලිසරණවන . |
| 103 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | කාලය උදා වූ විට කාටත් කරද ඇතිවෙනවා<br>දවස උනත් ඉද හිට වැඩ දෙල් වෙනවා<br>යන්නට සිතා සිටි දුර යන්නට බැරි වෙනවා<br>අද බැරි උනත් හෙට තව දවසක් එනවා |

| | | | | |
|---|---|---|---|---|
| 104 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | නිදිමත දැනේ දහවල මට රැයට වඩා<br>වෙනසක් එහි තිබේ චර්යා මාරු වෙලා<br>පාඩම් කල නිසා මනසත් අවුල් වෙලා<br>දෙවියනි අහනවද මගේ දුක කමා වෙලා. |
| 105 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | කුසට සාගිනි හදට සෝගිනි ඉනට වැරහැලි කැබලි එල්ලා<br>සතුට සැනසුම අහිමි කරලූ අඳුර දිනූ කාලය ගිහිල්ලා<br>නොසිට මැරි මැරි සතුරු පායට වකුටු වී අතපය හකුල්ලා<br>නැගිටපල්ලා නැගිටපල්ලා නුඹේ වාරය ඇවිල්ලා |
| 106 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | පැම්ණියා එක කැදැල්ලකට<br>තුරුළු උනේ එක මවකගේ<br>දරුවන් ලෙසින්<br>එක් කාලය පියඹලා ගිහින්<br>බණමෙන් සමුගන්න වෙයි හෙට<br>දුක් ගැහැට නම් අපමණයි<br>ඒත් කාලය සොඳුරුයි |
| 107 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | යහළුවන් පිරි සිටි අපේ කාමරේ<br>අද කිසිවකුද නැත<br>තනිව ඇත මා පාළුවේ<br>තනිකමින් හුදකලාව<br>අදමා දවයි<br>ගත සිත. |
| 108 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | වෙන සැප කුමකට නිදියන්නට හැකි වේ නම්<br>රස ගුණ කුමට ද ඇති පමණට ලැබේ තවනම්<br>මැසිවිලි කුමට හොඳ ක්‍රමත් දන වනම්<br>ඇණ මට කුමට මේතරමට කැප වේනම් |
| 109 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | පෑනට පොතට පෙම් කෙරුවේ එදා සිට<br>පෙම් කළ පවට එය උරුමයි සඳහටම<br>කුරුටු ගෑම කියවීමයි සඳහටම<br>සරසවි හැර මේ දුක වෙන කොහිද මට |

| | | | | |
|---|---|---|---|---|
| 110 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | සඳ ඈත සිනාසෙයි<br>දිගු කතාවක් කියා<br>තරු කැකුළු දිලිසෙයි<br>සිතට රහසක් කියා<br>සෙනෙහසින් ළං වෙලා<br>දෑත දෑතෙහි තියා<br>ඉන්නා නුඹ වගේ |
| 111 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | රන්වැට මැද රනේ රුවට වැජඹෙනවා සාමී<br>සඳ එළියට රන් බෝපත් ලෙළදෙනවා සාමී<br>පුදසුන මත මල් පිපුනා අපට වරම් දෙන්න සාමී<br>වැලි මළුවේ වැලි තරමට අපේ පැතුම් බෝවේ |
| 112 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | දයාබරවු සෙවනින්<br>සමුගන්න අවසරයි<br>වෙන්වුවද අප<br>ආදරයෙන් ඇසුරු කළ<br>සහෝදරත්වය ජිවත් කළ<br>සැබෑම වු සහෝදරත්වයෙන් මිදුනෙමු අප<br>හමුවේවිද අප නැවත මේ පුංචි විශ්වයේ<br>මතු දවසක<br>පුංචිම පුංචි ලදරුවන් සේ<br>එකට සිටියෙමු අපි<br>අතැගිලි බැඳපු සහෝදරත්වය<br>ඒ දයාබරත්වය<br>එකම මච්කුස නොයිපදුනමුත්<br>එකම බත් පත බෙදා ගනිමින්<br>අප සැබැවින්ම ජිවත් කල සහෝදරත්වය<br>නැවත මුණ නොගැහේවි<br>මගතොට හමු වුනොත්<br>එදිනට ළඟ තිබේවිද<br>අද අප හැඳිනු දයාබරත්වය<br>කාලයේ ළඟ දිනක සමුගත්තාවු<br>මෙවන් නිමේෂයක<br>හදේ දුක ළඟතියන්<br>අප අපේම දයාබරත්වය<br>සදා හදවත් තුල<br>රඳවා ගනිමු |

| | | | | |
|---|---|---|---|---|
| 113 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය (කාන්තා) | Hostel | විදුබිමට සමුදීලා - ඔබ මතකය අරන්<br>තල් වැටෙන් හිරු එබෙන - සරසවිය වෙත ආවා<br>දෙමාපිය සිත් නොරිද - තුරුණු අප දෙසිත<br>සත් වසක ප්‍රේමයට - අවසන් තිත තැබුවා<br>අභිමි වන මා ගැන -ඔබේ සිතුම් දුක් දෙන්න<br>එපා කුමරුවනි නිබඳවම<br>කියා අවසන් දිනයේ<br>නෙතින් කඳුලැලි හැලුවා. |
| 114 | | විද්‍යා පීඨය නවකසාදය 2008 සමරු කලාපය | Wall paper/Poster/ other publications | හෙටට පිපි මල්......<br>මං හසර දැනගත්තද<br>ගමනාන්තය නෙදත්<br>නොනිමි අහසක සැඩ සුළං මැද<br>ඉමක් සොයා<br>සරණ විහඟක තටු සැලී.....<br>නමුදු<br>ගෙවා යන්නට තවත් සිය ගව්<br>වළාවෙන් විවරණ යදී......<br>පියාඹන්නට සරසරින් වරම් නොලද සියොත් රල පෙල<br>මගට නෙතු දල්වා හිඳී....<br>පිදෙන්නට හෝ මියෙන්නට මිස නැවුම්<br>කැකුලක්ව යලි පිදෙන්නට මලක් යාවිද කෙදින<br>නටුව අතහැර.... |
| 115 | 1 | විද්‍යා පීඨය නවකසාදය 2008 සමරු කලාපය | Wall paper/Poster/ other publications | පිපී නිල්නෙළුම<br>තනිවම......<br>ගඟ දිය නොදනී<br>තනිකම....<br>බලා පෙම් නොකර<br>දුර සිට.....<br>අනේ ! සඳ ඇවිත්<br>මං වෙතට....<br>තනිකම නිවා දමාපන්<br>විඩාබර පෙති මතින්<br>පහලට....<br>ගලා යන කඳුළු<br>පිණි කැට<br>අනේ ! තවදරනු<br>බැහැ මට<br>සිහිනය නිමා වුනාදෙන්...... |

| | | | | |
|---|---|---|---|---|
| 116 | | විද්‍යා පීඨය<br>නවකසාදය 2008<br>සමරු කලාපය | Wall paper/Poster/ other publications | නුඹ නැතිදා......<br>ඈත එපිට හේන පුරා<br>කුරහන් මල් පිපුණා<br>කුරහන් මල් යාය උඩින්<br>නුඹේ සුවඳ දැනුනා.....<br><br>තනිකම කවියක් වීලා<br>යාය පුරා ඇසුණා<br>නුඹේ මතක සිහිනෙන් විත්<br>නෙතු අද්දර රැඳුනා.....<br><br>සඳ නැතිදා රෑ අහසේ<br>සඳ සේ නුඹ නැගුණා<br>මල් නැතිදා වන ගොමුවේ<br>මල සේ නුඹ පිපුණා....<br><br>නුඹේ සුවඳ වැටට උඩින්<br>රෑ යාමේ දැනුණා<br>ඒ සුවඳින් සිත සැලුණා<br>සත්තයි මං හැඬුවා...... |
| 117 | 1 | විද්‍යා පීඨය<br>නවකසාදය 2008<br>සමරු කලාපය | Wall paper/Poster/ other publications | මානව අතෘප්තිය .......<br>නිල් කැටේට<br>හෝ ගා ගලන<br>ගඟ හැඬුවා<br>තිබහයි කියා....! |
| 118 | | විද්‍යා පීඨය<br>නවකසාදය 2008<br>සමරු කලාපය | Wall paper/Poster/ other publications | නොහඳුනන ඔබ....<br>කැලණි පාලම ලඟදි හමුවුනා<br>දයාබර යැයි හැඟුන හදවත<br>කොතැනකද ඔබ සොයනු රිසිවෙමි<br>අඳුරු කළුවර සමග මුසුවුනු<br>අමුතු අඳුරකි එදා කළුවර<br>බැඳුණු මිතුදම නොමැත කෙළවර<br>නමදු ඔබ මම නොහඳුනන කල<br>අරුම පුදුමයි නේද මිතුදම<br>එද වෙන්වී ගියත් ඔබේ ඒ හඬ<br>ඉඩක් ලැබුණොත් තවත් දවසක<br>කැලණි පාළම ළඟට එනවද/..... |

| | | | | |
|---|---|---|---|---|
| 119 | 1 | විද්‍යා පීඨය<br>නවකසාදය 2008<br>සමරු කලාපය | Wall paper/Poster/<br>other publications | මතු බුදුවන මව්වරුනි<br>මාවැනිම ගැබි දැරූ<br>නුඹ විදි විළිරුදා<br>මමද වින්දෙමි<br>භයමසක ගැබ උසුල<br>දරදියද ඇද්දෙමි<br>නුඹ නෙවිදි අපා දුක්<br>පරිභවද වින්දෙමි<br>සිදි ගිය කිරකට<br>තොල් සලන පුතනුවනි<br>නුඹේ නෙත කඳුළු දැක<br>මැරි මැරි උපදිමි....<br>පලා ගිය කල්හිදි<br>උරුම කරු පිය පදවි<br>මතු බුදුවන මව්ම<br>වේද අවලම් ගැහැණි..... |
| 120 | 1 | විද්‍යා පීඨය<br>නවකසාදය 2008<br>සමරු කලාපය | Wall paper/Poster/<br>other publications | අරුමය<br>හදේ හැගුම්වලින් නැහැවූ<br>සසිලසක් වනේ රුදවූ<br>සරසවියට පය එසවූ<br>ඒ සොඳුරු නිමේෂයේ<br>ගුරු දෙගුරුන් පොදි බැද<br>සොඳුරු පාරමිතා පෙරු<br>අප රජ වන සැටි බලන්නට<br>මායිමේ ඔබ තවම සිටී -<br>පය ඔසවා තව ඉදිරියට<br>තල්වැටේ සිසිලසින්<br>බියගුලු හදවත් තුල<br>මිලින වූ ප්‍රාර්ථනා<br>නොබෝ දිනකින් ආපු ඒ<br>සොඳුරුතම නිමේෂයකින්<br>ජිවිතයම වෙනස්විය<br>ප්‍රාර්ථනා එක්ටැම්විය<br>කෙසේද මෙම ජිවිතය<br>අරුමයක් යැයි සිතේ මට. |

| | | | | |
|---|---|---|---|---|
| 121 | | විද්‍යා පීඨය<br>නවකසාදය 2008<br>සමරු කලාපය | Wall paper/Poster/ other publications | ඔබ තුරුලේ හිද<br>වපල වදන් තෙපලන<br>මායාකාරි පෙම්වතිය<br>මටද ඉගිවරා<br>විලක් නොලද කල<br>දැලේ පැටලුණු<br>නුඹ ගැන<br>මගේ<br>ලබැදි සකි සඳ<br>වාවනු නොහැකිමට.... |
| 122 | 1 | විද්‍යා පීඨය<br>නවකසාදය 2008<br>සමරු කලාපය | Wall paper/Poster/ other publications | අපි හරක්ද ?<br>Lectures , Practical<br>Tute ගොඩ මල වදේ<br>උදේට රැයකට<br>නිදන්නටවත් කෙසේ<br><br>ගව රැලක් මතක් වෙයි උදයට<br>දි හේලි කරන<br>බොඩිමේ වමාරන<br>ආතල්ද Campus<br>ගමට ගොස් අසන විට<br>කෙසේ නම් කියන්නද<br>අපි සැවොම කන කට්ට. |
| 123 | 1 | විද්‍යා පීඨය<br>නවකසාදය 2008<br>සමරු කලාපය | Wall paper/Poster/ other publications | සිහිනය<br>නිහඬවම මා<br>සෙවු ඒ රුව<br>ලැබුණි දක්නට<br>මිරිගුවක් ලෙස<br><br>අහෝ කෙලෙස මම<br>ලබන්නද එය<br>මගෙන් ඈතට-<br>නොපෙනි යනකොට<br><br>සිතේ සැම විට<br>ළංව ඉන්නට<br>නමුත් කාලය<br>වලක්වයි එය<br><br>තවත් නොහැක මට<br>බලා ඉන්නට<br>කෙලෙස හෝ එම්<br>වැළඳ ගන්නට. |

| | | | | |
|---|---|---|---|---|
| 124 | | විද්‍යා පීඨය<br>නවකසාදය 2008<br>සමරු කලාපය | Wall paper/Poster/ other publications | නිල් තුරු ගොමු මල් වැල් මැද<br>සොඳුරු සිහින සිතේ වඩන<br>මේ සරසවි බිම නුඹේය<br>සතුටු කඳුළු මුහුව තැනුණ<br><br>නුඹ හිනැහෙන හෙටක් පතා<br>හදට දිරිය නිතින දෙමින<br>නගේ මලේ අපි ඉන්නෙමු<br>නුඹ පසුපස පුරුදු ලෙසින<br><br>නුඹ හැමමය අද සොයුරෝ<br>සරසවි මග සතුට විඳින<br>හෙට දිනයේ අත් වැල් බැද<br>ජයගත් ලොව නැණනුවණින.... |
| 125 | | විද්‍යා පීඨය සමාධි තුන්සිතක ගි දැහැන | Wall paper/Poster/ other publications | සිහිනය හා ඔබ-<br>පුංචි තරු අතර දඟකරන සමනලිය<br>ඔබ.....<br>නිදි සුවය බිඳ දමන සිහිනයයි<br>ඔබ...<br>මතකයි තිබුණ පුරුකක දුරක් අතර<br>අප අතර....<br>තිබුනා සොඳුරු මතකයන් රැසක්<br>ඉතිරිව...<br>සුදු කොඩි මැදින් ගිය ද දුර ඈතක<br>ඔබ....<br>ඉතිරි වුණා සිතල උණු කඳුළු<br>මට....<br>ඈත අප අතර අනන්තයක දුරක්<br>අද.....<br>ගෙවී ගිය පසු මේ රැයත්<br>බොඳ වුණු තවත් සිහිනයකි. |

| | | | | |
|---|---|---|---|---|
| 126 | | විද්‍යා පීඨය සමාධි තුන්සිතක ගී දැහැන | Wall paper/Poster/ other publications | සඳවතිය.....<br>සඳවතිය එපා එන්න<br>සරසන්න මගේ හද<br>නුඹ රැස් කිරණින්<br>ගණදුරු රැයට නොව<br>අරුණෝදයේ විකසිත වන<br>අරවින්දයකි ඇය<br>විලියෙන් ඔකද වූ<br>රිවි බලයි ඇගේ අරුම<br>එපා නුඹ යලි එන්න<br>මල හිරුත් සමග හෙට<br>සුන්දරව විකසිත ඇගේ මුතු වතකමල<br>මුකුලිත කරනට...... |
| 127 | | විද්‍යා පීඨය සමාධි තුන්සිතක ගී දැහැන | Wall paper/Poster/ other publications | campම නිදහස<br>ලොකු පිම්මක් නේද<br>ඔව් පළවෙනි පාරනේ<br>ලොකුම ලොකු පිම්මක්<br>chemistry දBiology ophysics ද<br>නැහැ ඊටත් වඩා<br>බලාපොරොත්තුවේ සිහින මවාගෙන<br>ලිව්වා නොවෙයි ලියැවුණා<br>හරිම සතුටුයි එත් මාස තුනයි<br>result එනවලු හෙට<br>හිතට බයයි<br>නැහැ ඒ අදලු<br>ආවා""B2""C1"".<br>අනේ<br>මටම කියවුණා<br>මොනවා කරන්නද?<br>කම්මැලි කමේ ආපහු පොත්ගුල් අතර<br>බැහැ බැහැ මේ දුක ....<br>වාසනාව cut off mark.....<br>කැලණියට.....ඔව්මයි හරි සතුටුයි<br>නිදහස ඔව් සැබෑ නිදහස<br>ඒත් නම්නිකරළය විතරයි<br>මම ආපහු පොත්ගුල් අතර<br>නිදිවරාන......<br>මේකද campම් නිදහස<br>අප වල්මත්ව බුක්ති විදින<br>එළිය අඳුරන<br>රෑ කුරුල්ලෙනි<br>උදෑසනකට වරෙල්ලා...... |

| | | | | |
|---|---|---|---|---|
| 128 | | විද්‍යා පිඨය බේස් කැන්ටිම බිත්ති පුවරුව | Wall paper/Poster/ other publications | හඬන්නට වරම් නැති මලක් හිනැහෙන කලට<br>බඹරිදුට දැණුනෙ නෑ එමල උහුලන තරම<br>දරන්නට නොහැකි තැන විදින්නට වු ගැහැට<br>මලක් මිය ගිය වගයි ලොවට නොදැනි දුකට<br><br>පිපුණ මල් දස දෙසම සුවද පතුරන කලට<br>බඹරිදුට දැනේවිද එක මලක් මැරුණු වග<br>සුමුදු පෙති මුකුලිතව විසිරිලා යන කලට<br>එකම කදුලක්වත් හෙලාවිද මල නමට<br><br>නව කැකුළු විකසිතව වසන්තය එළඹිවිට<br>බඹරිදුට සිහිවේද මගහැරුණු වසන්තය<br>මල්වරවු මකරන්ද ඇරයුපක් කරනවිට<br>එන්නවත් හැකිවේද ඒ මලේ මලගමට<br><br>මල්වරවු නව කුසුම් දැනගනිවිද දිනෙක<br>බඹරිදුට පෙම් බැද මලක් මිය ඇදුන වග<br>ඒ මලේ උණුහුමින් මිදෙන්නට වත් පෙරම<br>බඹරිදුට නව මලක පහස හිමි වු පුවත. |
| 129 | | විද්‍යා පිඨය බේස් කැන්ටිම බිත්ති පුවරුව | Wall paper/Poster/ other publications | පිය සෙනෙහස<br>පුජනියයි ,තේජනියයි<br>පියාණනි ඔබේ ආදරේ<br>හදේ ගිනි කන්දක් නිවාලයි<br>ඔබේ උතුම්කරුණා ගුණේ<br>මහ බඹුන් විසින්<br>මවා තබන ලද<br>උතුම්ම වස්තුව ඔබයි සිතේ<br>ආදර වදනින් මා සනසන්නට<br>ඔබ සිටියානම් කියා සිතේ..... |

| | | | | |
|---|---|---|---|---|
| 130 | | විද්‍යා පීඨය බේස් කැන්ටිම බිත්ති පුවරුව | Wall paper/Poster/ other publications | සඳ.<br>සඳ රැස් විසිරී නැහැවී<br>ගස් වැල් මනරම්<br>මුළු ලොව නිදියයි<br>නෑ පිබිදෙන්නේ<br>දැනුනේ නම් මේ සඳෙ අගේ<br>බලවන්ත මේ රාත්‍රියේ<br>නිසලයි නිහඬයි මේසඳ<br>නිහඬව නිසලව සිටියත් ඒ සඳ<br>දකියි බොහෝ දේ මැදියම සිදුවන<br>මිහිර නොවින්දත් සැමදෙන එක ලෙස<br>කිරණ බෙදා දෙයි ලොවටම එක ලෙස<br>සඳ හිමි අහසට<br>කිරණෙහි අයිතිය පමණයි පොළවට<br>හිමිවන්නේ මිහිර<br>විඳින්නෙට සීමාවක් නැත ! දුරටයි එය ලස්සන<br>වන්නේ..... |
| 131 | 1 | විද්‍යා පීඨය බේස් කැන්ටිම බිත්ති පුවරුව | Wall paper/Poster/ other publications | -පිළිගන්න ඉඩදෙන්න-<br>ඔබටද මටද හමු නොවූ යමක්.....<br>ඔබටද මටද එකවිට හමු වූ විට....<br>ඔබද මමද එකවිටම තිගැස්සුනු බව<br>පිලිගන්නට ඔබ සූදානම්ද ?<br>අපිට අපි හමුවෙලා !!!<br>ඒ බව ගැස්සුනු මගේ හිත කියනවා<br>ඒ බව ඔබේ කතාකරන ඇස් කියනවා<br>ඒ ඇස් කටාකලාට ......<br>ඒ බව හිතට කිවම.....<br>අමාවක සඳකට පුන්සඳක් පායපු වග<br>ඉරි තලා ගිය වියලි පොලවට වැසි බිඳු වැටුනු වග<br>පිලිගන්නට,<br>සොඳුරිය ඔබ සූදානම් නම්?.....<br>අසීමිත වූ ලෙන්ගතු කම<br>කොන්දේසි විරහිත ස්නේහය<br>සේනාවක් බඳු ආරක්ෂාව<br>පාරාදීසයක් බඳු සතුට<br>සදාකාලික ආදරය,<br>ඔබට පුද දෙමි , සෙනෙහසින් ......<br>මගේ නිහඬබව....<br>ඔබේ කතාකරන ඇස් කොඳුරන රහස, අහන්නයි! |

| | | | | |
|---|---|---|---|---|
| 132 | 1 | විද්‍යා පීඨය බේස් කැන්ටීම බිත්ති පුවරුව | Wall paper/Poster/ other publications | කොටු වෙලා ගිය මා ගත තෙමන්න<br> අනේ නුඹේ නෙත හැඩුතරම්<br>පමා වුණා මා මම පමා වුණා යයි<br> නුඹේ මුවින් ගිලිහුණ සුසුමන්<br>එහෙත් මගේ පණ සුරැකිව ඇති බව<br> දුටුව නුඹේ වතකමල මතින්<br>රිදී හුයෙන් කල විසිතුරු මැස්මක<br> සොබා මවන හසරැල් දුටුවෙමි......<br><br>අනේ මගේ ගත වසා සිටිය පත්<br> කොලපැහැයෙන් මඩ පැහැ වෙද්දී<br>මගේ හිසේ රැදි මගේ අතේ රැදි<br> මල්දම් එකිනෙක මැලවෙද්දී<br>උජාරුවට සුදු පිලි ඇදගෙන නුඹ<br> සුළඟ එක්ක හුරතල් වෙද්දී<br>නියං පොළොව මෙන් හිත ඉරිතැලුණා<br> මා මිය යන බව වැටහෙද්දි ....<br><br>ඔය තරමට නුඹ වියලුණු අරුමය<br> තාමත් මිතුරිය දන්නැ මං<br>දැන් ඔය පහුගිය දේවල් මොකටද<br> යලි දල්ලම් නුඹ දුන් කදුලින්<br>මෙතුවක් කලකට අපට පෙලු ඉර<br> හෙටත් නැගෙනවිට නැගෙනහිරින්<br>මා හිස පිදෙන මලේ පැහැය ගෙන -<br>හැන්දෑ අහසේ රැදි ඉදින්..... |
| 133 | | විද්‍යා පීඨය බේස් කැන්ටීම බිත්ති පුවරුව | Wall paper/Poster/ other publications | ඔබ නිහඩයි !ලොවම හඩයි !<br>දයාබර සොයුර.....!<br>ජිවිතය නැමැති කටු ඉත්තෙහි සුපිපි කුසුම ඔබයි<br>ගනදුරු අහසේ පැයු තාරකාව ඔබයි.<br>Aqua විදු බිමේ ,මිතුදමේ පහන් දැල්වුයේ.....<br>නෙක වර ජිවිතයේ මුණගැසුනේ මෙලෙස<br>ජිවිතයට සමුදෙන්නද?<br>සබඳ......<br>නෙතට නැගෙනා කදුළු බිදු අමෝරා<br>වැස්සක් වී ඔබේ සොහොනේ ගලා ගියේ,<br>ඔබේ සොයුරු පෙම දරාගනු බැරිවම නොවේ....<br>ඔබ වැනි සුන්දර මිනිසකු මෙලොව කිසිම දිනක<br>මා හට......<br>මුණ නොගැසෙන බැවිනි...... |

| | | | | |
|---|---|---|---|---|
| 134 | | විද්‍යා පීඨය බේස් කැන්ටිම බිත්ති පුවරුව | Wall paper/Poster/ other publications | මං නැති දා----<br>මං නැතිදා<br>මා නිදනා මිහිමත<br>දල්වනු මැන පහන් සිලක්<br>මතක මගේ බොඳව ගියත්<br>දැසට නැගෙව් කඳුලක්<br>මතකයන් සිත අද්දර මැවී<br>මා ඔබ අතගෙන තෙපලන වදන්<br>මතකයේ ඇඳි<br>මේ මදනල පවසයි<br>මා ඔබට ආදරය කලවග------ |
| 135 | 1 | විද්‍යා පීඨය බේස් කැන්ටිම බිත්ති පුවරුව | Wall paper/Poster/ other publications | සිසිලසක් ලදත් ,සඳ කැණින් පුරත්......<br>සඳ දුරයි දනිම් අසරණයි මෙමා....<br>තරුකැලක් අතර දිලි සඳක් වුවත් නුඹ....<br>කුමක් කරම් ආදරෙයි සඳා---<br>ගඟන දසත සැරූ , පවන හමන යුරු---<br>සැසඳි හැගුම් ,නිසලව මෙදා---<br>පිළිතුරටත් අහිම් , දිය පොදක් නොලද මුත්<br>කතරක මොහොතක් නතරවෙලා----<br><br>මෘදු වලාගැබක සතපවා රකින්නට<br>වරම් නොමැත මා නොවෙම් මුලා---<br>නිල් දියෙන් සුසැදි මිරිගුවක් පමණි මැවූ<br>සිහින මිහිරි පෙම් ප්‍රාර්ථනා----<br><br>බැඳි යද දමින් උණු කඳුලි නිවා<br>දුක දරා හිඳිම් කල්පයක් පුරා-<br>මදහසත් අහිමි, නෙතු අගින් මෙලෙස තව<br>බැලුම් එපා නිති, හැඩෙන නිසා---- |

| | | | | |
|---|---|---|---|---|
| 136 | 1 | විද්‍යා පීඨය බේස් කැන්ටීම බිත්ති පුවරුව | Wall paper/Poster/ other publications | වැහි පොද----<br>පුරහඳ සිහිල දැවටුන<br>සොඳුරු අහසද අතහැර<br>එසැනින් වැටෙයි වැහි පොද<br>නන්නාදුනමන පොළොවට---<br>ගංදැල දොඩමළුව හිද<br>සෙත් කවියක්ය අසනිය<br>කොඳ මල් කැකුළු පාවුන<br>නිල්දියවරක අසිරිය---<br>නිමි හිමිනොවු සෙනෙහස<br>මල් සුවදකට මුසුකර<br>නියඟක අරුම සිදි බිද<br>තුරුහිස් නිලෙන් පුදින<br>වස්සානවෙන් සැනසුන<br>මිහිකත සිනා දැක දැක<br>සමුදුරු දියෙහි වැද<br>බලනු නිසලව මියෙන අරුමය---- |
| 137 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | සුරා කමින් සුළු පිරිසක් විදිති සැපා<br>වැඩි පිරිසකට එය මුත් එය දුකකි අපා<br>ඉල්ලුම් ඔබෙන් ඉල්ලීමක් වැලද දෙපා<br>වීරයෝ මිසක් නිකමුන් බිහිකරනු එපා |
| 138 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | විකසිත මලට එයි බඹරුන් රොන්රොන් ගන්න<br>උන් දගලන්නේ මල තලලා රොන් ගන්න<br>මුකුලිත මලට යලි බෑ විකසිත වන්න<br>මල දැන ගත යුතුයි විකසිත බව රැක ගන්න |
| 139 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | ලෙක්චර් ගියත් විභාග කිසි දිනක නැති<br>සතුටින් සැපින් නිදහසේ දුව පැනිය හැකි<br>සුරඟන ලොවකි මා සිතු සරසවියේ නිති<br>1 year එකත් දැන්නම් හොදටොම ඇති |
| 140 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | සා. පෙළ උ.පෙළ නිසි දිනුවෝ සමතෙකි<br>එන්නට කලින් කැම්පස් එක සිහිනයකි<br>ඇතුලේ දුකකි පිටතට එක සුර ලොවකි<br>හොස්ටල් ජීවිතය දැන් නම් සිරගෙයකි |
| 141 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | තෙල් බැම්මේ බැම් ලෙහිලා ගැලවියන්<br>කසා ගහේ කොල හැලිලා මැලවීයන්<br>සයිබාවේ නයි පොළගුන් බෝවීයන්<br>මට ඇණදුන් තෝ කණවැන්දුන් වීයන් |

| | | | | |
|---|---|---|---|---|
| 142 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | ටියුෂන් කඩේ පැදකුනු කොට උදේ හවා<br>A/L ගොඩගියා නිරතුරු ද ගිරවා<br>පෙරකරුමයක් පලදී මම මෙහි ආවා<br>මේ මළ මගුල ඇරියට වැඩියෙන් වැහුවා |
| 143 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | නරියා හූ තියයි ඌ ලග ඩිග්රි නැති<br>එළුවට රැවුල ඇත වාසිටි අවේ නැති<br>මම ඒ දෙකම ඇති එනමුත් නුවන නැති<br>සහතික වලට මිස ඩිග්රිය පලක් නැති |
| 144 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | පානුයි පරිප්පුයි මතුවට බුදු වේවා<br>ගෝවයි අලයි සැරියුත් මුගලන් වේවා<br>කැන්ටින් හොද්ද නේරංජන ගඟ වේවා<br>හිල්ටන් මුදලාලි කන්තක අසු වේවා |
| 145 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | සංසාරේ පැතු පැතුමන් නිමා නොවෙනා<br>මෙතේ බුදුන් දැක නිවන් මඟට බසිනා<br>මගේ මවුන් ලෙස භවෙන් භවේ වඩිනා<br>අම්මා සදාදර ඔබයි මගෙ අම්මා |
| 146 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | සදවතියක් නොවී නම් මා නුඹ අහසේ<br>තරු කැකුලියන් වන කෙලෙසද සඳක් මිස<br>සුසුමක් නැගෙන මුදු නගමින් කදුලු ඇස<br>තවමත් ඔබයි මට පෙනෙනා දුරු අහස. |
| 147 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | කැම්පස් මොටද හොස්ටල් කැඳ බුදින්නට<br>සහතික කුමට ගිනිගත් කුස නිවන්නට<br>Lectures කුමට ලොක්කන් පය දොවන්නට<br>Digry ය කුමට pikating වල තපින්නට. |
| 148 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | මල් පිපිච්ච පෙති හැලිච්<br>මිදුල පුරා පෙති ඉහිච්ච<br>හිගන්නට දුක හිතිච්ච<br>අතිතයකි ඇන තිබිච්ච. |
| 149 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | ගැනු ලමයි පාරේ යන බස් වැනිය<br>එකක් මිස් උනොත් අනෙකේ යාහැකිය<br>පිරිමි ලමයි කොන් දොස්තරලා වැනිය<br>නග්ග ගන්න තුරු ආලය පන වැනිය. |
| 150 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | කන්ද බලා දිරි නොබඳ ගනිවු<br>කඳුපාමුල සිට සුසුම් හෙලවු<br>අතිතයෙන් නැගි බලන විට<br>මුදුනෙන්මතුවන බැව් සලකවු |

| | | | | |
|---|---|---|---|---|
| 151 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | කැම්පස් ආවේ පුරුවේ කළ පව හන්දයි<br>වාටඩ් කලේ එපව තව වැඩි වෙන්නයි<br>දාඩිය දදා ලෙක්චර් ගියේ ඒ හින්දයි<br>මේ හැම කලේ අම්මේ ඔබ හන්දයි |
| 152 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | කැම්පස් කැන්ටිමේ තොරතුරු රසබරය<br>සැමදා කන්නේ පලාව සහ පරිප්පුය<br>කුසගිනි නිවෙන්නේ මලකඩ වතුරෙන්ය<br>මෙහෙමයි ගෙවෙන්නේ සරසවි ජිවිතය |
| 153 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | මී හරකුන් ලැඟ සිටි මේ බිම සුද්දකොට<br>හෙට මිනිසුන් ලෙස ඉන්නට සිසුන් හට<br>කරනා මෙහෙය ඉටු කොට දිවිපුදන්නට<br>සතුටකි උපාධිය මට හිමි නොවුනාට |
| 154 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | එක අත්තකින් නියං ගඟ දෙතනේ කිරි බොම්මා<br>දසකඩ මස දුක් විඳලා වැදුවේ අපේ අම්මා<br>සැකක් නැතුව බණ ඇසුවොත් සසරින් ගොඩයම්මා<br>දුකක් නැතිව නිවන් දසන් පින්වත් අපේ අම්මා |
| 155 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | අහපන් නංගියේ වදනෙහි නුඹලාට<br>විෂමයි ඉන්න මිනිසුන් මේ පොලව මත<br>අහේ ඉඳන් කන කනවා නොදැනිම<br>මේ බව උගෙන කල් ගෙව්වත් අගනේය |
| 156 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | අසංහිදුන මැන මගේ සිත මා වෙත යැවී<br>වෙනස් වෙන්නෙපා නෙතු කැල්මකට මුවාවී<br>යෞවනයේ සොදුරු පැතුම් මිලිනව යාවි<br>අවිහිංසක තරු නෙතු කදුලින් බොඳ වේවි |
| 157 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | කුරුළෑ වුවන කෙටි වරලස උඩ නැගුන<br>නොවැඩුනු දෙතන උල් රට බොඩියේ වැසුන<br>විසිවන කොටු දෙකකුල් යන එන ගමන<br>ඇසිපිය හෙලන පමනින් නොවෙති හොල්මන |
| 158 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | කැම්පස් ජිවිතේ මට දැන් එපා වෙලා<br>යන්නට හිතෙනවා මට දැන් නිවස බලා<br>අම්මේ ඔබේ ඔය ආදර මුහුන බලා<br>ඉන්නද මම හැමද ඔබ ලඟට වෙලා |

| | | | | |
|---|---|---|---|---|
| 159 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | සිනි බනිසකින් බඩගිනි නිවාගෙන<br>ඔළුවේ අමාරුව තනියම දරාගෙන<br>පාඩම් කලේ මට එකහිත දරාගෙන<br>අදට වඩා හෙට හොඳ යැයි හිතාගෙන. |
| 160 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | ඇඳුරු දිසාපාමොක් ගිය අතක් නැත<br>සාමා අමර වැලිකඩ හිර ගෙදර ඇත<br>හෝඩිය බොදව ගොස් සිතුවම් මැකී ඇත<br>දින නියමයක් නැත සරසවි වසා ඇත |
| 161 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | නොදැනිම ගෙවී ගිය කාලය බොහො කෙටී<br>සතුටින් සමගියෙන් හිනැහුනු කලේ කෙටී<br>ඩිග්රිය ගන්න කල වැයම බොහොම වැඩි<br>ගොට්ටිය අල්ලන්න යන කාලය ඊට වැඩි |
| 162 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | මලක් සිරි වනක් මම සිඹින්නෙකි<br>මල මාහට පිනි කඳුලු හෙලන්නෙකි<br>මල් සුවඳ මලින් මට ලැබෙන්නෙකි<br>ඒ සුවඳ වෙන්දෙසි කරන්නෙකි |
| 163 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | මිණී මිතුරු වනගුරු මිතුරු<br>පතන්නෙමි පිවිතුරු මිතුරු<br>පුරම් පාරමී නිරතුරු මිතුරු<br>වෙමි දිවි ඇති තුරු මිතුරු |
| 164 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | සඳ එලියට කුමුදු කැකුලු පිපෙන විට<br>නුඹේ සුවදට මා හෙමිහිට ඇදෙන විට<br>මගේ හදවතට නුඹ ආදා පටන් සිට<br>සත්තයි දැනෙනවා සිසිලසක් අනේ මට |
| 165 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | පාළු රැයේ කවි මල පිදෙන කලට<br>මා සිත දුවනවා නුඹ ඉන්නා දුරට<br>මටත් හොරෙන් සිතුවිලි නුඹ වෙත එන්ට<br>මෙලෙස අපගෙ සිත් බැඳුනේ ඇයි කුමට |
| 166 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | නුඹ රැදෙනා මගේ දිවි වාසනාවන්<br>නුඹ නැතිදා සිත් නැත පා සිනාවන්<br>මා පිය සෙනෙහස හේ නුඹේ දයාවන්<br>සසරේ සිහිනයක් මේ සුභ දසාවන් |
| 167 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | සැදෑ සමෙහි පිපෙනා මුදු සිය පතක<br>දහසක් පැතුම් ලියුවා ආදර සිතක<br>සැමට හොරා විඳගත් සිහිනෙක මතක<br>ඇවිදින් හොරෙන් සැගවුනේ ඇයි මා ලගක |

| | | | | |
|---|---|---|---|---|
| 168 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | වනමල් පියලි විල්ලුද බුමුතුරුනු උඩ<br>යන මිනිසකුගේ ගමනින් නැත ලොවට වැඩ<br>ඇත උල් මුගුරු ගල් කටුවල මූණත මැඩ<br>යන ගමනෙහි කොපමණ හිතවතද හැඩ |
| 169 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | එක් පෙති මලක් විය නුඹ මගේ අත් දෙකට<br>නෙලා නොගත්තේ මගේ බොසත් කමට<br>හැරගිය දිනයේ නාවත් මා ගම් දොරට<br>ඇයි පැමිණියේ විරහි සිත අද්දරට |
| 170 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | මිතුරියන් කීවත් සතුරියන් ලදේ<br>නව වුනත් වැඩ හරි අගේ<br>කංසා නම් වවනවා සරුවට අනේ<br>වැවු කංසා මදිවට මං පලිද නගේ |
| 171 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | ගම් දනවි පහු කර ආවත් සරසවියට<br>යන්නට හිතෙනවා ආයෙත් ගෙදරට<br>එහෙම කලොත් කන්නට දෙන්නෙ කවුද අපට<br>බා බා ඉගෙන ගතයුතු පොලොවේ පය ගහන්නට. |
| 172 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | මේ ලේන්සුවට පුළුවන්නම් කතා කරන්න<br>මගේ කාන්සියට කියයි අපේ කතා අහන්න<br>යලි හෙට හමු වෙන තුරු පුළුවනි සුවඳ විඳින්න<br>මේ රාත්‍රියම මට පුළුවනි හීන දකින්න. |
| 173 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | නාරිලතා මල නම් හරි ලස්සනලු<br>දැහැනක් බිදෙන බවනම් ඇත්තයිලු<br>තපසට සිද්දවුදේ කාටත් අවුලක්ලු<br>ඔරොප්පු කියනු මැන එය මහ පිනක්ලු. |
| 174 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | කුරුටු ගිත දැක ඔබේ සිත රිදුනාද<br>මේවා විහිලු බව අනේ දැනගන්නවාද<br>පිළිතුරු ගීය අමුනන්නට නොදනින්ද<br>බිත්තියේ කුරුටු ගා ඔබේ කවි ලියනවාද. |
| 175 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | උදේ පාන්දර හා මහ රාත්‍රියේ<br>හූ හඬ තලනවා නිතරම දිවා රැයේ<br>නිදිමත නැද්ද කෑ ගසන්නේ හැම පැයේ<br>අනෙක් අයට කරදරයක් මේක ප්‍රියේ |

| | | | | |
|---|---|---|---|---|
| 176 | 1 | බණ්ඩාරනායක<br>නේවාසිකාගාරය<br>ප්‍රසිද්ධ<br>කුරුටු ගී පලමු<br>මහළ | Hostel | මිතුදමේ නාමයෙන් දුක් කඳුළු දරන්නෙමි<br>සෙනෙහසේ නාමයෙන් මගේ පෙම පුදන්නෙමි<br>සිනා මල් වැසිරුවා ජිවිතේ ගෙවන්නෙමි<br>විහිළුවෙන් දෑස් රතු වු බවක් කියන්නෙමි |
| 177 | | බණ්ඩාරනායක<br>නේවාසිකාගාරය<br>ප්‍රසිද්ධ<br>කුරුටු ගී පලමු<br>මහළ | Hostel | සිරිපාලගේ දේශනාව<br>අපට හරිම වේදනාව<br>කිමද ඊට කාරනාව<br>මාපි ගැනයි කල්පනාව |
| 178 | | බණ්ඩාරනායක<br>නේවාසිකාගාරය<br>ප්‍රසිද්ධ<br>කුරුටු ගී පලමු<br>මහළ | Hostel | මල් පිපිච්ච-පෙත් හැලිච්ච<br>මිදුල පුරා පෙති පිරිච්ච<br>පාගන්නට දුක හිතිච්ච<br>අතීතයක් ඇත ගෙවිච්ච. |
| 179 | | බණ්ඩාරනායක<br>නේවාසිකාගාරය<br>ප්‍රසිද්ධ<br>කුරුටු ගී පලමු<br>මහළ | Hostel | කැලණි කන්ද තරණය කල ආ අපට<br>වෙන් වන්නට සිදුවෙයි දැන් මේ ලෙසට<br>වෙන්ව ගියත් අප දැන් හැම මේ ලෙසට<br>මිතුදම තබා ගනිමු සැමදා අපි එකට. |
| 180 | 1 | බණ්ඩාරනායක<br>නේවාසිකාගාරය<br>ප්‍රසිද්ධ<br>කුරුටු ගී පලමු<br>මහළ | Hostel | campas ආවේ මොන හේතුවකටද අනේ<br>මගේ පෙර පවක් පල දුන්නද මගේ අම්මේ<br>සිදුවන හැමදේම දුකටයි බර වෙන්නේ<br>ජිවිතයම දුකක් බවයි හැගෙමින් යන්නේ. |
| 181 | | බණ්ඩාරනායක<br>නේවාසිකාගාරය<br>ප්‍රසිද්ධ<br>කුරුටු ගී පලමු<br>මහළ | Hostel | ලස්සනේ බැරිය බඹරුන් රොන් ගන්න<br>උස්දනේ ලමැද සේනෙහස උතුරන්න<br>ඇස් රිදේ බැරිය මග බල බල ඉන්න<br>ඵල වතෙන් ඇවිත් මා කැන්දන් යන්න . |
| 182 | | බණ්ඩාරනායක<br>නේවාසිකාගාරය<br>ප්‍රසිද්ධ<br>කුරුටු ගී පලමු<br>මහළ | Hostel | පාඩම් කරලම මට දැන් එපා වෙලා<br>exam එක මට නම් දැන් තිත්ත වෙලා<br>මොනවා කරන්නද මම දැන් කොටු වීලා<br>යනවා යන්න exam 1 ගොඩ දාලා. |
| 183 | 1 | බණ්ඩාරනායක<br>නේවාසිකාගාරය<br>ප්‍රසිද්ධ<br>කුරුටු ගී පලමු<br>මහළ | Hostel | බලාපොරොත්තු ලංවෙනවා සිත් කොනට<br>සිනා කැකුළු ගෙන එනවා මුව අගට<br>නොකියා පැතුම නුඹ ගිය කල උඩු සුළගකට<br>බොඳවෙනවා නෙතු පුරා උණු කදුළු කැට. |
| 184 | | බණ්ඩාරනායක<br>නේවාසිකාගාරය<br>ප්‍රසිද්ධ<br>කුරුටු ගී පලමු<br>මහළ | Hostel | අඩ සඳක් සැඟවෙන තැනක් ඔබ<br>රල පෙලක් පෙරලෙන තැනක් ඔබ<br>සිසිලසක් දනවන තැනක් ඔබ<br>උණුසුමක් ගෙන දෙන තැනක් ඔබ. |

| | | | | |
|---|---|---|---|---|
| 185 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | කැම්පස් ඇවිල්ලත් අවුරුද්දක් ගෙවුනා<br>බණ්ඩාර නායකේ වසරක් ගත කෙරුවා<br>කැන්ටින් බුවාලගේ ජරාව ගිල දැම්මා<br>අපටත් නොදැනි අප හොදටම කෙඨිටු උනා. |
| 186 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | තණ්ඩලේ වගේ සයිබා දක්කනවා<br>කටුකැලේ ගිහින් එහේ මෙහේ දඟලනවා<br>කවුරුත් දකිදෝ බඩ පපුවම දනවා<br>යනකොට ඉතිං මේවා අරගෙන යනවා |
| 187 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | මා වගේ එවුන් මේ කාමරේ ඉන්න ඇතිග<br>නිදි මර මරා රෑ ක්‍රැමත් දමන්නැති<br>කැමට කියා ඔහු අඩුවක් කන්නඇති<br>රස්සාවක් නැතිව ඔහු තාමත් ගෙදරඇති. |
| 188 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | නැවති වතුර මල යට සිට නල වතුර<br>තාමත් සිතින් කිම්දෙමි ගඟ දිය වතුර<br>කැවත් කැන්ටිමේ බත හොද නෑ මිතුර<br>තාමත් සිහිවේය පෙර කෑ අල බතල. |
| 189 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | බැලුම් බලා දෙදෙනම මද හසින් අඩ<br>ඇලුම් බරව සිටි මින්දද පෙළද මැඩ<br>නෙළුම් පොහොට්ටුවක් උඩ හංසයෙකුගේ තුඩ<br>තැලුම් පෙලුම් නැතුවම රින්ගවන හැඩ. |
| 190 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | ලොකයට එලිය දී හිරු කලේ වරදක්ද<br>රෑ අදුර නැතිනිසා සඳු කලේ වරදක්ද<br>අපේ හද දුක අදුර හැදින ඔබ පෙරටම වින්ද<br>එ අදුර නසන්නට පෙර වැඩුම වරදක්ද |
| 191 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | බුද්ධියේ තෝ තැන්න ඉඩෝරෙට අහුවෙලා<br>තෙතමනය නොමැති බිම මිනිමල් පිබිදිලා<br>අනාගත සුභසිහින නෙතු දැලින් ගිලිහිලා<br>පෙර මඟට යා හැකිද කටු කොහොල් ඉඹුල් බිහිවෙලා |
| 192 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | සමහර එවුන් නම් කොක්කක් ගැහුවා යකෝ<br>තව තව එවුන් ඇණ පිට ඇණ ගත්තා යකෝ<br>තව කඨිටියක් කවුන්සිලියේ ගියා ගියා යකෝ<br>මේකේ ඉදන් අපි මොනවද කෙරුවෙ යකෝ. |
| 193 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | ක්‍රැමක් දමන්නට සිතුවත් ගොඩ යන්න<br>නින්දක් ඇවිත් පවසයි මට නිදියන්න<br>මක් කරන්නදැයි මිතුරනි පවසන්න<br>නුඹලට පුළුවන්ද ටිකකින් ඇහැරන්න. |

| | | | | |
|---|---|---|---|---|
| 194 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | විභාගය දිනෙන් දින ලංවෙනවා<br>අභාගය වේද හදවත වදදෙනවා<br>නිමාවිය කලක් දමනට ගිරවා<br>ප්‍රමාදය නිසයි සිදුවුයේ මේවා |
| 195 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | පොදින් පොද පිණි වැටෙන<br>බිදෙන් බිඳ හිරු නැගෙන<br>මුවින් මුව හස නැගෙන<br>සරසවිය මේ කැළණිබිම. |
| 196 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | තෙල් මුහුණේ ගඳ දැනුනේ<br>ප්‍රිය ලදුනේ මට විතරද?<br>ගඳ පපුවේ සුව දැනුනේ<br>හිමි සඳුනේ මට විතරද? |
| 197 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | අනේ මිනුවන්<br>ඔබේ දෙසුමන්<br>අපේ දෙනුවන්<br>කරයි අඩවන්. |
| 198 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | තුරුළු කරන් පොත් මිටිය අතකින් කිමිද නගෝ<br>වසා ගෙන දෙපා දිගටම කිමද නගෝ<br>කොක්කක් නැතිව මහ මඟ තනිව කිමද නගෝ<br>තෙල් බැම්මේ නැවතිලා කිමද යමිද නගෝ. |
| 199 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය ප්‍රසිද්ධ කුරුටු ගී පලමු මහළ | Hostel | තුරුළු කරන් පොත් මිටිය Lecture 1 හින්දා<br>වසා ගෙන දෙපා දිගටම අපේ අක්කලා හොඳ හන්දා<br>කොක්කක් ගමේ මග බලමින් ඉන්න හන්දා<br>අනින්නම් අයියන්ඩි බාංඩේ ළඟ හන්දා . |
| 200 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | සොදුරුකවක මිහිරිය සිතේ රැදෙන විට<br>සීත සුළං මාසිපගෙන හමන විට<br>නුඹේ සෙනෙහේ මා සිත තුළ මැවෙන විට<br>සොදුරුලොවක් හද නුඹ හැර මෙලොව මට |
| 201 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | ආදර මව්නි බැහැ නුඹ තනිකර යන්න<br>දරුවන් හදනවා නුඹේ දිවි රැකගන්න<br>තවත් කළක් නුඹ සමගින් හිනැහෙන්න<br>ලොව මැව් දෙවියනේ අපහට ඉඩදෙන්න |

| | | | | |
|---|---|---|---|---|
| 202 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | පෙම් ලොවේදි ලද සරදම් අතීතය වෙත විසිකරන්න<br>හීනයේ මුදුවදන් මුසුවෙන් බිඳුනු හදවත් සුවකරන්න<br>තුරුණු බව රැදි ඔබෙ සිතුවිලි සරසවිය ළංකරත්<br>ඔබේ ගතහිත සනහලන්නට සමාධිය වෙත පියනගන්න |
| 203 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | නැවුම් බව රැදි සුමුදු මදනල මියුරු තනු හා එක්කරන්න<br>සොදුරු පදවැල් තියුණු ස්වරයෙන් ගැයෙන මිහිරිය ලංකරත්<br>විරහ සොමිනස පිරුණු සිත්තුළ නැවුම් පැතුමන් පුබුදුවත්<br>ඔබේ ගතසිත සනහලන්නටසමාධිය වෙත පියනගත් |
| 204 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | අහිමි වුනත් නුඹ ලදේ<br>නුඹ ලගයි හිත තව මගේ |
| 205 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | ඔබ හිනැහෙන විට<br>මුළු ලොව<br>ඔබ සමගත් සිනාසෙයි<br>ඔබ වැලපෙන විට මුළුලොවම<br>ඔබ අතහැර සිනාසෙයි |
| 206 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | එදා සෙනෙහසේ සුවය දුන්<br>කණට කෙදුරු<br>හිතට ලංකල මිහිරි සිතුවිලි<br>වියලිලා ඈත කාලයේ<br>මතක සලකුණු මතක පමනකි<br>මැකී ගියදා ආදරේ |
| 207 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | හැම පාට කුඩ අතර<br>මම කළු කුඩයක් |

| | | | | |
|---|---|---|---|---|
| 208 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | ඔබත් මමත් අතර ඇතතේ හුදු ගනුදෙනුවකි<br>ඔබ මාහට දුක අලෙවි කරයි<br>මා ඔබ හට සමාව නොමිලේ දෙයි<br>නමුත්<br>මා හට සමාව අවශ්‍ය වූ විට<br>එය<br>ඔබ ලග නොමිලේ නැත<br><br>ඉරබටු තරුව උනානම් නුඹ මට<br>මට දරා ගන්නනට හැකි කළුවර<br>පිටුපා යන්න ගියාවේ පුරහද<br>එක තරුවක් ඇති මගෙ අහසට<br><br>මගේ ලොව හිරු මඬල<br>නුඹයි සමිදුනේ |
| 209 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | අමාවක වන බව දැක<br>සඳට පෙම් බැන්දා<br>මලානික වන බව දැන<br>මලට පෙම් බැන්දා<br>දවාලන බව දැන දැන<br>හිරුට පෙම් බැන්දා<br>වෙන්වී යන බව දැන දැන<br>නුඹටම පෙම් බැන්දා<br><br>පිදුවෙමි අපිරිමිත සෙනෙහසක්<br>පැතුවෙමි එපමනක්<br>නොලදිමි බිඳක්වත්<br>ඉතින් උපදි සැකයක්<br>තෙවන නියමය ගැන<br>නිව්ටන්ගේ |

| | | | | |
|---|---|---|---|---|
| 210 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | කුණු ඇළ පිස එනමදනල අතරමගකදි<br>මා එන මග වලකන්නට බලාඋනි රැදි<br>දසත කටු ගසා සෙව්වෙමි බෙස්එක පුරා<br>නොදැක ඔබේ රුව ශෝකය නැගෙයි හද පුරා<br><br>රසය විදිමි කුණුගොඩවල එය නොවේ සුවේ<br>ගින්න නිවන රසට කෑම එලගි තෙල් ප්‍රියේ<br>තිත්ත නොම බලා කැවෙමි කොත්තුවක් පවා<br>කොත්තු කන්නවත් ඔබ මා ලගට එයි කියා<br><br>ආමි<br>බැලිමි<br>බැලුබැලූ බොහෝ දෙනා<br>ලියුයෙන්<br>මාත් ලීමි |
| 211 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | දොනෝ දහක් ගැවසෙන අප කවියක<br>පාළුව තනිකම දැනෙනවානම්<br>කුටියේ කවුළුව විවර කරනු මැන<br>කපුටෙක් වී ඔබ වෙත එන්නම්<br><br>කෑම නැතුව ඉන්නට බැරි අපේ පොරියා<br>කැමක් දුටුවිටදි පිම්මට දුවන කද බඩයා<br>වලිකාලෙට නැගිටින්නැති කම්මැලියා<br>මොනවා වුනත් වූ අපේ ආදර පොරියා |
| 212 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | පෙම් කවක් ලියු නුඹ සිත්<br>එකී මකාදමා ගියදා<br>ඔබ මෙතෙක් රැදි උන් මා මතකයේ<br>පෙම් පුරා සිත කා සතුද |
| 213 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | සිද්ධාර්ථ<br>ඔබ මෙන් මම නුපන්නෙමි රජ පවුලක<br>ඉර්තුවෙන් ඉර්තුවට මලිගා තිබුණද<br>රජ ඉසුරු අපට නැත<br>එබැවින් ඔබට මෙන් සිහි මනසින්<br>නොහැකිය පහසුවක් මට |

| | | | | |
|---|---|---|---|---|
| 214 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | මේ ලොවට එනතුරු<br>විශ්වයේ නුඹ කොතනකට වී කෝ<br>බලා ඉන්න බව දනිමි තිරලෙස<br>නුඹේ සුමිහිරි මතකයන් සැගවිලා ගිය<br>සයුරක්ය මගේ හදවත<br>කිසිදා කිසිවෙකු<br>නොදැක සැගවුණු<br>අපේ සෙනෙහස<br>සොයා එන්නෙමි<br>නුඹේ ලොව වෙත |
| 215 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | මා මියදින මතුයම් දිනකදී<br>සීතල නිසසල මා අභියස හිඳ<br>පැන් වත්කරමින් පිරිත්කරන්නට<br>නුඹේ චපල සිත නුඹට කියාවිද |
| 216 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | අපි ඉතින් යන්න යමු<br>තව මාස පහකින්<br>සියලු දේ<br>ඉන්න උන්ට පවරලා<br>හදපියවී ඉතිරි ටික<br>දිපියවි මේ දිගේ<br>ඊළග සෙට් එකට |

| | | | | |
|---|---|---|---|---|
| 217 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | මලානික වූ ලෝකය<br>දෙස<br>නෙත් යොමා බලා සිටිවී<br>කොතරම් ගොරහැඩිද<br>මං අවුරා බලා සිටින<br>අසංවර මානවයන්<br>තම වර්ගයක් මිහිමත<br>ජනිත වූ තරමටම<br>අහෝ<br>හඬයි ජනිත වූ<br>ජනනවූ<br>බිලිඳාගේ ලෝකය<br>නැතිකරමි<br>ඔහුගේ සතුට වෙනුවෙන්<br>තැනුනු ආදරණීය හෙට දිනක්<br>කුමක් කරමුද<br>කුමක් සිතමුද<br>ලොවට බියපත්ව පලායමුද<br>සියලු වගකිම් යුතුකම් හැරදමා<br>නොදැක සිටිනු බැරිය<br>පලායා නොහැකිය<br>මිහිමත බරක් පමනක්<br>ඉතිරි කර<br>කවුරු කුමක් කිවත්<br>කම් නැත. |
| 218 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | තම යුතුකම් තමන් හොදින් දැන<br>ගැදින ගෙන ඇත්නම්<br>පිවත්වන්න<br>උත්සාහ කරන්න<br>ආත්මයම එක්ටැම් කරගෙන<br>මිහිමත සිටින<br>එක් මානවයකුටවත්<br>අවම ලෙස<br>ජිවත් වීමේ අයිතියවත්<br>රැකදෙන්න<br>විටක ඔහු මට ජනිත වුවකුද<br>විය හැකි බැවිනි |

| | | | | |
|---|---|---|---|---|
| 219 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | ගිනි අව්වක මහ කම් හල මැද<br>නූල නූල ගෙන එකිනෙක ඇදෙන<br>මැස්මට හුරු උනා අස් සළු පිලි<br>පේලි පේලියට ගොඩනැගෙන<br><br>සත් මහ සමුදුර පිට යන සළු පිලි<br>කුමාරියන් ගත වට සැලෙනා<br>අඩනිරුවත් නුඹේ නූල නූල ගෙන<br>නව රන් සළුවක් මුල පුරනා<br><br>මෙහෙය නිමා වී සැන්දෑ අඳුරේ<br>තනියම සෙයිලමේ පසුකරනා<br>නුඹේ දෑතින් මැසූ සළුපිලි රකුසන්<br>කිතු කිතු කර ගිලදමනා |
| 220 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | මිහිරි අමිහිරි මතකයන්<br>හදතුල<br>රදවාගෙන<br>මිතුරන් ඔබ ගැන<br>සිත තුල රදවා ගෙන<br>ඉදින් යන්නෙමි<br>සමුගෙන |
| 221 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | නැති බැරි කෙනෙකු රජකුළයක ඉපදීමෙන්<br>කුළමානයෙන් ආසාවෙන් මත් වීමෙන්<br>පැතුවිට රජ පුටුව ඉහළ හිත යාමෙන්<br>අවසන් වේය ඔහුගේ දිවි පිරිහිමෙන් |
| 222 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | සමාජය කෙතරම්ම ගොරහැඩි වුවද කම්නැත<br>හදවතේ නගනු මැන එකම පහන් සිතුවිල්ලක්<br>තවත් කෙනෙකුද තමන් මෙන්ම අහිංසකබව |

| | | | | |
|---|---|---|---|---|
| 223 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | නින්ද නැති රැයේ<br>පොත දෙස බලා සිටියෙමි මම<br>දෑස් දල්වා<br>සියලු දුක් වේදනාවන් ඉවසා<br>දෑස රිදුම ඉවරයක් නැත<br>කුසගින්න කියනු නොහැකිය<br>දිනුම ඇත පෙනෙන දුර<br>නැත කිසිවෙකු මා තුල<br>එකම එක දෙයක්<br>ඇත මා හදවත තුළ<br>මාගේ ලේ මස් නහර<br>ඇට මිදුළු වලට<br>කා වැදී<br>ඒ නුඹයි මගේ<br>සුදු අම්මේ<br>නුඹේ කුසගින්දරයි<br>සුදු අම්මේ |
| 224 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | අභිම්ව තිබූ ආදරය<br>සොයා නුඹ වෙත<br>පියමං කළද<br>සිතෙහි උන්<br>නොසන්සුන් කම<br>දුකින් කිම්දූ අප<br>සතුරු වෙසකින්<br>වසා හද මුව<br>නොනැවති<br>සිතනු මැන<br>තවත් එක් වරක් වත්<br>කිනම් කරුනක් තිබුණිද<br>අප හද විමතිය<br>සසල කරවණ නෙතු යුග<br>ඉකි බිඳින<br>නිහැඩියාව<br>හැගේ එයමදැයි ඒ<br>සෙවු<br>අපරිමිත සෙනෙහස<br>කළ පින් මදි උනාදෝ<br>දිවි ඇතිතුරා සතුටින්<br>කල් ගෙවන්නට |

| | | | | |
|---|---|---|---|---|
| 225 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | නොමිනිසුන්<br>වෙසෙන සමාජයක<br>මිනිසකු ලෙස<br>පෙනීසිටීම<br>දැලිපිහියෙන් කිරිකෑමකි<br>නොමිනිසුන් වෙසෙන<br>මේ සමාජයේ<br>මනුෂ්‍යත්වය කරා රැගෙනයාම<br>හදවත කීරිගසන<br>අපවාද නින්දා සහිත<br>කිසිවෙකුත් දිරිනොකරන<br>ජිවිතය කළකිරවන<br>අඳුරු හුදකලාව<br>රජ කරයවන<br>කෙටියෙන්ම පවසතොත්<br>අසිපත් තුඩමත<br>ලය තබා<br>දෑත් දෙපා දෙසට විහිදුවිමක්ද |
| 226 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | සඳක් වගේ සිනා සලන මුව මඩලට මම<br>කැමතියි<br>සිතින් හඩන කියන කතා අහන් ඉන්න මම<br>කැමතියි<br>හොරෙන් බලාඉගි කරන නෙත් සඟලට<br>මම කැමතියි<br>මම හිතන්නේ හැමට වඩා මගේ හදට නුඹ<br>කැමතියි |
| 227 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | රතු කුඩයෙන් ලාහිරු රැස් වැටෙන කොට<br>නුඹ එලියයි කුමුදු මලක් වගේ මට<br>හමුවෙයි නම් නුඹ මගේ හදමඩල යට<br>පෙම් කවි ලියන්නෙමි එලිවෙන තුරු නුඹට |
| 228 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | පෙම්වතුන් රන්හුයෙන් බැන්දද<br>ආදරේ පරවෙලා මල් මැද<br>මල් පහන් අත ඇතත් මින්දද<br>තවම තනියෙන් කවුරු හින්දද |

| | | | | |
|---|---|---|---|---|
| 229 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | රැයක් පහන් වුනි<br>යහන පෙනෙන මානයේ සිටි<br>කල්පනා ලොව තුලද<br>තනිවුනෙමි<br>මා සමග සිටියේ<br>ඇය පමනි<br>නමුත්<br>ඇය සමග සිටියේ<br>වෙන කෙනෙකි |
| 230 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | නා දළු වැනි දෙතොල් තිබෙන රිෂාක්<br>අද නැ මුතු<br>කෙට්ටු උනත් හොද හිත ඇති කොමා එත්<br>අද නෑ මුතු<br>හොද හිත ඇති එය ගෙවිලා අද නැනේ<br>නැනේ මුතු<br>කවුරු නැතත් කළුවුනාට මට වටිනවා නුඹනවා<br>මුතු |
| 231 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | නුඹ නැති මේ රැයට<br>පුරහද එලිය කුමටද<br>ඔබ නැති මේ බිමට<br>නලමුදු සුවය<br>කුමටද |
| 232 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | සිත රිදවන<br>සොදුරු මතක<br>සිත ඇතුලෙම මියැදුනාට<br>නෙතු හඩවන<br>මුතුකදුලැලි<br>නෙතු සෙවනේ රැදවුනාට<br><br>හැගුම් මිටක් හද පුරවා<br>සිතුම් මිලාන වී ගියාට<br>සිත හඩන්නේ ඇයිමේ තරම්<br>මගේ ලොවට නුඹ නාවට |

| | | | | |
|---|---|---|---|---|
| 233 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | රැය පහන් වුනි<br>යහන පෙනෙන<br>මානයේ<br>සිට<br>කල්පනා ලෝකයේ<br>තනිවුනි<br>සිහියට නැගුනේ කවුරුන්ද<br>දයාබර මව්නි<br>දයාබර පියාණෙනි<br>නුඹ නොවෙද ඉතින්<br>මගේ ඉරු සඳු |
| 234 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | නිල දෙනෙතින්<br>නැගුනු බැල්මෙන්<br>ඔබ මගේ සිත ගෙන ගියා<br>නුඹේ දෙතොලග<br>රැඳි සිනහවෙන්<br>මගේ හදවත<br>පිබිදුනා<br>ආදරෙයි මා කියන්ට පෙර<br>ඔබේ හද වෙනතක ගියා<br>හැඩූ කඳුළැලි<br>සෝසුම් මැද<br>පෙර ලෙසින්<br>මා තනිවුනා |
| 235 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | ඔබේ ලොවේ හිද මා රැඳි මා<br>බලා හිදිම් සැනසුම පතලා<br>සෙනෙහස සැනසුම් සොයලා |
| 236 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | කැම්පස් එකට ආවේ මම සතුටු සිතින්<br>ඇසුරු කලේ මිතුරන් හැම එක විලසින්<br>ආපසු යන විටදි උන්නාම නොසිතු ලෙසින්<br>අමතක කලේ මිතුදම බිදදමා සතොසින් |
| 237 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | ගෙම්බෙක් උනත් පිම්බුන විට උඩ යන්නේ<br>උඩ යනකොට ඌ රජෙකුයි හිතෙන්නේ<br>මුල අමතක වී මෝඩ අමන ගති මතුවන්නේ<br>පිවත් වෙන්න මහපොළ මේ බව නොසිතන්නේ |
| 238 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | මිනිසෙකුට හරියන විට සිත දුක්වෙන්නේ<br>කුහක කම සැමවිට එලියට මතුවන්නේ<br>පිවත්වෙන්න තවමත් හරියට තව නැ දන්නේ<br>අනුනට ඊර්ෂ්‍යා නොකරම් එවිටයි හරියන්නේ |

| | | | | |
|---|---|---|---|---|
| 239 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | වෙර දරා උසස්පෙළ ඉහලින්ම සමත් වීම්<br>සරසවිය නමැති<br>සොඳුර<br>නෙත් පෙමට ආවෙමි<br>එහි නෙත පරයන<br>අගපසග රුව<br>අධ්‍යාපනය අභිභවා<br>නැගී ආවේය<br>මසිත<br>සුළගට අකිකරු<br>රුවලක්<br>නොවිය<br>අවසානයේ හැමදෙයක්ම<br>ජිවිතයේ<br>එක් මතකයක් පමණක් විය |
| 240 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | අප<br>අම්මට පෙම් කරන්න<br>පෙම්වතියක් අහිමි විය<br>උපාධිය<br>ගිලෙන්නට යන<br>මැඩියෙකුට හසුවූ<br>පන්ගසක්<br>පන්ගසක් මෙන් විය<br>පරාජය සගවා ගෙන<br>අභියෝග ජයගත නොහැක<br>පිරවිය යුත්තේ<br>භාජනයහිස් වී ඇති බැවිනි<br>සරසවියෙන් සමුගත් මට<br>හුදකලා ආත්මයක්<br>පමණක් උරුමවිය<br>ඒත්<br>දෙනෙතින් කඳුළු කැට<br>වැහෙන්නේ නැත ඇයි |
| 241 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | සරා සඳ බැස ගොස්<br>මගේ මේ පුංචි ලොව<br>කුමුදු මල් පිපුනේ නැහැ<br>රෑ වගේ සවස<br>පියනගී ආයේ නෑ<br>එදා වගේ අහස<br>නුඹ කොහෙද සැගව ගොස්<br>මේ සියළු දේ සමග<br>ඔබද මා ගෙනගියේ<br>මා කළ වරද කිම |

| | | | | |
|---|---|---|---|---|
| 242 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | සීත සිතුවම් වන්<br>නුඹගේ නෙතුයුග<br>මගේ දෙනුවන පුරා<br>දහසක් රැගුම් රගත්<br>විසිරී ගියත්<br>නිල්වන් රත්වන් වර්ණයෙන්<br>දෙනෙත් වැසිමෙන්<br>සිතුවමක් වී<br>හැමදාම<br>මගේ හදවත් ගැබතුල |
| 243 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | ඔබ වෙනුවෙන්<br>ඔබේ ආදරය වෙනුවෙන්<br>මගේ ආදරය දහස් වර<br>සැලි සැලි යයි<br>ඔබගේ එක් පෙම් වදනක් පතා<br>ඔබගේ එක් හසරැල්ලක් පතා<br>මගේ දෙනෙතේ<br>මගේ දෙසවන්<br>මහා ලෝබකමකින්<br>වේදනා දෙයි<br>මේ හේතු අගින් ඉහිරුනු<br>කදුළු පහස ලැබ<br>සැබෑ සමුදුර කිරි මුහුද<br>කැළඹී වේදනා හඬනගයි<br>ප්‍රේමය යනු කුමක්දැයි<br>මගේ සිතම පසක් කලේ<br>නුඹමැයි |

| | | | | |
|---|---|---|---|---|
| 244 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය | Hostel | වධකාගාරක් ඔවුහු ලා<br>මල් පෙති නියෙහි දරා<br>ගිම්හානයට<br>පසු එළඹෙන<br>සමය සොයා<br>ගුමු ගුමුනදින් වකසිත<br>හඳමඩල දරා<br>මල්වර සමය පසුකරයන්නෙමි<br>නුඹේ සුවඳ සොයා<br>ළග ළග දැනෙන සුවදක් දැනී<br>ඔබේ බව දනිමි<br>දෙනෙතින් බට කදුළු<br>දෙකොපුල් සිබිනු දැනේ<br>දැනේ වෙළී අප ගිය දුර<br>උණුසුක් දැනේ<br>නික්ම යන්න ගොඩ මගේ උණුසුම ගෙන<br>සතුටු සිනා කැන් කැරළි පිටින් ගෙන<br>මේ උණුසුම් පාර අඳුරු ලොවට හෙට<br>පිවිසෙන්නට මට සුවඳ පිටින් නුඹ<br>සඳ මඩලෙහි උණුසුම නික්මෙන්නට පෙර<br>එන්න එක්වරක් තව මේ නෙතු ඉමවෙත |
| 245 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය අන්තර් විශ්වවිද්‍යාලිය ශිෂය බළමණ්ඩලයේ අත් පත්‍රිකාවකිනි | Wall paper/Poster/ other publications | අම්මේ තාත්තේ - මේ අහන්න<br>අක්කේ අයියේ - මේ අහන්න<br>අයියේ අක්කේ - මේ අහන්න<br>අධ්‍යාපනේ - බේරගන්න<br>අපිත් එක්ක - එකතුවන්න<br><br>කැම්පස් ටික - විකුණනවා<br>පෙළපොත් ටික - විකුණනවා<br>ප්‍රතිපාදන - කපාදමා<br>ආණ්ඩුවත් - නිදියනවා<br><br>ගනිව් ගනිව් - හකුළ ගනිව්<br>උපාධි කඩ - හකුළ ගනිව්<br>අධ්‍යාපනේ - බිල්ලට දෙන<br>උපාධි කඩ - හකුළ ගනිව්<br><br>පාල පාල - වර්ණපාල<br>දාල දාල - උපාධි කඩ<br>අධ්‍යාපනේ - විකුණං කන<br>පාළ පාළ - මොට්ට පාල |

| | | | | |
|---|---|---|---|---|
| 246 | 1 | බණ්ඩාරනායක නේවාසිකාගාරය අන්තර් විශ්වවිද්‍යාලිය ශිෂය බළමණ්ඩලයේ අත් පත්‍රිකාවකිනි | Wall paper/Poster/ other publications | අපි ආවේ - ඉගෙන ගන්න<br>අපිට උනේ - පාරේ ඉන්න<br>ආණ්ඩුවේ - බහිරවයන්<br>පිස්සු කෙලින - හැටි බලන්න<br><br>මොනද උනේ - චින්තනේට<br>මහින්දගේ - චින්තනේට<br>අධ්‍යාපනේ - විකුණන්නට<br>ඉඩදුන්නේ - කවුරුද බොල<br><br>දමනු -දමනු ඉහළ දමනු<br>ශිෂ්‍යාදාර - ඉහළ දමනු<br>කරනු කරනු - නතර කරනු<br>සිසු මර්ධන - නතර කරනු<br><br>මේක හරිම - ආණ්ඩුවක්<br>පිස්සු කෙළින - ආණ්ඩුවක්<br>අධ්‍යාපනේ - විකුණං කණ<br>මේක හරිම - පාංඩුවක් |
| 247 | | බණ්ඩාරනායක නේවාසිකාගාරය අන්තර් විශ්වවිද්‍යාලිය ශිෂය බළමණ්ඩලයේ අත් පත්‍රිකාවකිනි | Wall paper/Poster/ other publications | එපා එපා - අපට එපා<br>සෙබළ සමරේ - අපට එපා<br>එපා එපා - අපට එපා<br>වර්ණපාල - තියරි එපා<br>එපා එපා - අපට එපා<br>සුසිල් ආඳා - අපට එපා<br><br>කනවා කනවා - හොරා කනවා<br>පාලකයන් - හොරා කනවා<br>රට කරනා - පාලකයින්<br>ඇති පදමට - හොරා කනවා<br>කනවා කනවා - ලේවා කනවා<br>නොකා නොබී - ලේවා කනවා<br>සරසවි තුල - අපි ඔක්කොම<br>නොකා නොබී - ලේවා කනවා<br><br>මෙන්න බොලේ - මාර පොතක්<br>අරුම පුදුම - මාර පොතක්<br>නව බුදු ගුණ - දාපු පොතක්<br>චතුර් සත්‍ය - කාපු පොතක්<br>මතු පරපුර - මොට්ට කරන<br>මොට්ටයන්ගේ - පොට්ට නෙතක් |

| | | | | |
|---|---|---|---|---|
| 248 | | බණ්ඩාරනායක<br>නේවාසිකාගාරය<br>අන්තර්<br>විශ්වවිද්‍යාලිය<br>ශිෂය<br>බළමණ්ඩලයේ අත් | Wall paper/Poster/<br>other publications | අධ්‍යාපනේ - මුදල් කැපේ<br>ඇමති නඩය - පැටව් ගැසේ<br>සරසවි ටික - වැසී යතේ<br>අධ්‍යාපනේ - ඉවර වෙතේ |
| 249 | 1 | බණ්ඩාරනායක<br>නේවාසිකාගාරය<br>අන්තර්<br>විශ්වවිද්‍යාලිය<br>ශිෂය<br>බළමණ්ඩලයේ අත් | Wall paper/Poster/<br>other publications | කරව් කරව් - නතර කරව්<br>සිසු මර්ධන - නතර කරව්<br>ගනිව් ගනිව් - හකුළ ගනිව්<br>වදක පනත - හකුළ ගනිව් |
| 250 | | බණ්ඩාරනායක<br>නේවාසිකාගාරය<br>අන්තර්<br>විශ්වවිද්‍යාලිය<br>ශිෂය<br>බළමණ්ඩලයේ අත්<br>පත්‍රිකාවකිනි | Wall paper/Poster/<br>other publications | ගනිව් ගනිව් - හකුළ ගනිව්<br>උපාධි කඩ - හකුල ගනිව්<br>ඇක්වයිනාස් - හකුළගනිව්<br>ACBT - හකුළගනිව්<br>ඇපිටි එකක් - හකුළ ගනිව්<br>ස්ලිට් කඩයක් - හකුළ ගනිව්<br>සෘඹ එක - හකුළ ගනිව්<br>පොලිමස් කඩ - හකුළ ගනිව්<br>සිතෙක් එකක් - හකුළ ගනිව්<br>ඔක්කොම කඩ - හකුළ ගනිව්<br>නැත්තන් අපි - හකුළනවා |
| 251 | 1 | බණ්ඩාරනායක<br>නේවාසිකාගාරය<br>අන්තර්<br>විශ්වවිද්‍යාලිය<br>ශිෂය<br>බළමණ්ඩලයේ අත්<br>පත්‍රිකාවකිනි | Wall paper/Poster/<br>other publications | අපියන්නේ - කොයි පාරේ<br>ත්‍රිමා වෙනුර - ගිය පාරේ<br>අපියන්නේ - කොයි පාරේ<br>නිග්මි බාලේ - ගිය පාරේ<br><br>කපා කපා - කැලි කපා<br>අප වලකනු - සිතනු එපා<br>ලේ හැරුනත් - පාර දිගේ<br>අපේ ගමන - අපි යනවා |
| 252 | | බණ්ඩාරනායක<br>නේවාසිකාගාරය<br>අන්තර්<br>විශ්වවිද්‍යාලිය<br>ශිෂය<br>බළමණ්ඩලයේ අත් | Wall paper/Poster/<br>other publications | පානුයි පරිප්පුයි දවසක බුදු වේවා<br>ගෝවයි අලයි සැරියුත් මුගලන් වේවා<br>කැන්ටින් හොද්ධ නේරංජන ගග වේවා<br>මේ ගග ලගදි මගේ පැතුමන් ඉටුවේවා |
| 253 | | බණ්ඩාරනායක<br>නේවාසිකාගාරය<br>අන්තර්<br>විශ්වවිද්‍යාලිය<br>ශිෂය<br>බළමණ්ඩලයේ අත් | Wall paper/Poster/<br>other publications | ගැහැනු ළමයි පාරේ යන බස් වැනිය<br>එකක් මිස් උනොත් අනෙකේ යා හැකිය<br>පිරිමි ළමයි කොන්දොස්තරලා වැනිය<br>ගැහැනු සියළු ඒ බසයට නගින්නෝය |

| | | | | |
|---|---|---|---|---|
| 254 | 1 | විද්‍යා පීඨය<br>කැළණිය<br>විශ්වවිද්‍යාලය | Wall paper/Poster/ other publications | නිම නොකළ කවිය<br>මල් පෙත්තක සුවඳ බවඳ<br>පිනි බිඳුවක මුදුබවද<br>සඳ කිරණක සෞම්‍ය බවද<br>මහ පොළොවක තෙත බවද<br>පහන් තරුවේ ආත්ම ශක්තියද<br>අහස් ගැඹ සේ රැකවරණයද<br>හිරුමඩලක ප්‍රභාලෝකයද<br>සමනළ තටුවක මොලොක් බවද<br>තරුමඩලක සජීවිබවද<br>සැදැවක සුන්දරත්වයද<br>සියොත් සරයක ලාලිත්‍යද<br>නිසොල් විල්තෙරක උපශාන්ත බවද<br>හිම කිනිත්තක තෙත් බවද<br>වසන්තයේ ප්‍රාණවත් බවද<br>දෙවිදුවකගේ දයාබරත්වයද<br>ගලන දොළපාරක සිනහවද<br>සයනයේ උණුසුමද<br>දිය ඇල්ලක කාන්තියද<br>නිලුපුල් මලෙක කාන්තියද<br>නිලුපුල් මලෙක සංවේදිත්වයද<br>මහසයුරක නොසිඳෙන අපරිමිත සෙනෙහසද<br>එකට කැටිකොට මුසුකොට<br>සොබාදම් මහී මාතාව බිහිකරන ලද<br>ඒ උත්කර්ෂවත් වුත් - අසමසම වුත්<br>මහානිර්මාණය - ඇය - 'අම්මා'<br>යන නාමය සනිටුහන් කළාය |
| 255 | 1 | අඹර සගරාව | Wall paper/Poster/ other publications | සරසවි නොබැදි මිතුරෝ<br>සංවේගයෙන් දැනුම් දීමයි<br>අන්දමන් (ද)<br>දුපතක<br>f .m වෛරසයෙන්<br>musick උණ සැදී<br>හුදී තරුණ ජනයා<br>රෝගාතුරව<br>බුද්දිය<br>හීනවී<br>මනස විකල්ව ඇත |

| | | | | |
|---|---|---|---|---|
| 256 | | අඹර සගරාව | Wall paper/Poster/ other publications | සැත්කමක්<br>සරසවි නොබැදි මිතුරෝ<br>ඉගිළ එයි මවෙත<br>ලෙසින් පියකරු බඹරෙකු<br>කිමද මේ වෙනස<br>මුහුණෙහි අපුරුව<br>පෙර මා නොදැක්ක<br>වෙනසක්<br>සැබෑ වෙනසක්<br>දකිමි<br>දකිමි<br>පෙම්බරයාණෙනි<br>හඳුනාගනිමි දෑසින් එය<br>ප්ලාස්ටික් සැත්කමක් කළ<br>නුඹේ කොඳ මළයි<br>එදා මෙන් අදත්<br>කම් නොමැත<br>සැත්කමට |
| 257 | | අඹර සගරාව | Wall paper/Poster/ other publications | දුකට ලියූ කව<br><br>නිල් අහස කළුකරං<br>අහසෙහි වැහි ඇද හැලෙන කලට<br>නෙතු දවන මේ කඳුළු<br>ඉවසන්න බෑ බරයි<br>කප්පරක් හීන පොදි<br>හිස් අහසේ පාවෙද්දි<br>පිවිතය පැටලිලා<br>ආත්මය කෑගසයි<br>මියැදෙන්න පණඅදින<br>සුසුමක් ඉකිබිදිද්දි<br>දුක අහන්න උන්නු මං<br>මගෙන් බොහොමත්<br>ඇතයි |

| | | | | |
|---|---|---|---|---|
| 258 | | අඹර සගරාව | Wall paper/Poster/ other publications | දැක්ම<br><br>මැයි මල් පිපී පාරදිගේ<br>හිමින්සැරේ නුඹ එනවා<br>මැයි මල්සුලගට ඇවිදින්<br>නුඹේ දෙපා සනසනවා<br><br>සුදු සැරයටිය දෙඅත දරා<br>නුඹේ පෙරමග විමසනවා<br>දෙනෙත් ලැබු මටත් වඩා<br>නුඹ පෙරමග හඳුනනවා<br><br>නුඹ් දෙනෙත් වලින් නුඹට<br>නුඹව දකින්නට හැකිනම්<br>සුන්දර කව නිකලැල්බව<br>නුඹට හැගෙවී කොතරම්<br><br>දෙනෙත් ලදත් නොලැබු සේ<br>ලොවම දකින කුරිරු සතන්<br>ඒ අතරින් මගේ නගේ<br>නුඹ මට අදහන පැතුමන් |
| 259 | 1 | අඹර සගරාව | Wall paper/Poster/ other publications | අවනඩුව<br><br>ඇය නිසා<br>උන්සිත ඔකඳ වුනේ<br>එක් මොහොතක්ය<br>උන් නිසා<br>ඇ සිත වැළඳපෙනුයේ<br>සඳා කාලිකවය |
| 260 | 1 | අඹර සගරාව | Wall paper/Poster/ other publications | සිත දිය මුදාහැරේ<br>සතර අත<br>සුවපත් කළ හැකිනම්<br>දනන් හැම<br>පිපාසිත ලෝකයට<br>වැසී ගිය නුවණැසඳ<br>පුබුදු කළ හැකිවේවී<br>නුමට මට<br>ඉදින් කල් කුමට<br>මේ අපේ කාළයයි<br>පෙළ ගැසෙමු එක්ව සැම |

| | | | | |
|---|---|---|---|---|
| 261 | | අඹර සගරාව | Wall paper/Poster/ other publications | දෙවන වසර සහෝදරත්වය<br>දිවා රෑ වෙහෙසී<br>නිදිවරා<br>දහසකුත් පැතුමන්<br>සිත තුළ පොදිබැඳන්<br>දෑගිලි ගනින්නට ඇති<br>පිය නගන්නට<br>සරසවි අසපුවට<br>පැතූ පැතුමන්<br>අදදින ඉටුවෙලා<br>දෝර ගලායයි<br>සතුටින් නුඹේ නෙතූ<br>පියනගනු මැන<br>අත්වැල් පටලන්<br>තනන්නට අළුත් ලෝකයක් |
| 262 | | අඹර සගරාව | Wall paper/Poster/ other publications | පියාපත් මංගල්‍යය 2007<br>උඹලගේ අහස මේ<br>සිහිල් සිලි සිලිය රැදි<br>ගය ගයා ගී<br>පියඹපල්ලා<br>නවමු ලොවකට<br>සීරුවෙන්<br>අප දුන්නු අත්තටු<br>අරං |
| 263 | | අඹර සගරාව | Wall paper/Poster/ other publications | ලද දිවි මහිමයෙන්<br>සිනිඳු සඳු සේ හිර<br>දුක් සයුර පිහිනන්නට<br>දෙසුදම් පහද රැඳි<br>හෙළ මුදුන් මල්කඩ නමින්<br>දුරුවේවා සියළු දුක්<br>ලද දෙරණේ සතුට රැදි<br>මනු සතුන්නේ |

| ID | Selected | ස්ථානය | Location | ගීතය |
|---|---|---|---|---|
| 1 | 1 | සිංහල සංකෘතික සංගමය | Wall paper/Poster/ other publications | පැනපැනවිත් ඉදිරියට<br>විභාගය ඉදිරියේ<br>පරඬැලක් නොවි<br>කළුගලක් මටත්<br>දිරිය ගැනුම ශක්තියයි.....<br>විභාගය ඉදිරියේ<br>පරඬැලක් නොවි<br>දිරියගැන්මට<br>සිප්කිරින් මා ගතට<br>ශක්තියක් දුන්<br>නිබද සිටි මගේ<br>ගුරු ඇදුරන්ට<br>උදාවනතත්පරය<br>ගෙවන හැම මොහොතකට<br>මගේ ආයුත් රැගෙන<br>ඔබ සසර රැදේවා දයාබර<br>මවුනි ,<br>පියාණෙනි....... |
| 4 | 1 | සිංහල සංකෘතික සංගමය | Wall paper/Poster/ other publications | සබඳ,<br>අනන්තයක් නොමැති මේ ලොව<br>තුල ගමන් කරන අප<br>එයින්<br>මම මෙලෙස පව්කාරිය වී ඇත්තේ<br>මන්ද<br>මම නොදනිමි<br>මේ සසර තුල මා<br>තනිවී ඇති බවක් මට දැනේ<br>මෙය සැබැවක්ද? මේ ලොව තුල<br>මටම කියා කෙනෙකු නැද්ද<br>සිටියි එනම් එ මගේ දයාබර<br>මැණියන්ය<br>නමුත්<br>ඈ මා දමා බොහෝ දුර ගොසින්ය<br>මා කුමක් කරන්නද?<br>මට නොවැටහේ. |

| | | | | |
|---|---|---|---|---|
| 6 | 1 | සිංහල සංකෘතික සංගමය | Wall paper/Poster/ other publications | මව් ගුණ සුවඳ<br>අඳුරු බර රාත්‍රියේ<br>තරු වියන යට තනිව<br>නුඹේ ඔය මෘදු හඬට කන් දෙමිය<br>දුල පිරිමාවතේ<br>සක්මනෙහි යෙනෙනතර<br>නුඹේ මුදු බැල්මට<br>නතු වේ යැයි<br>මට සිතුණි......<br>නෙත් කෙවෙනි අග රැදුණු<br>තනිකමට ගැලු කඳුළු<br>නුඹේ සුදු මුදු අතින්<br>පිසින බව දැනේ මට<br>ගෙන් බැහැර නුඹේ දෝණි<br>ශිල්ප සොයනා අතර<br>මව්නි නුඹේ ගුණසුවඳ<br>ස්වප්නයක් නැමුදු<br>සුගන්ධයක්ම දැනේ මට. |
| 7 | 1 | සිංහල සංකෘතික සංගමය | Wall paper/Poster/ other publications | නෙතු ලගම දැවටෙන<br>ඔබේ රුව<br>සිත ලගම ගැවසෙන<br>ඔබේ සුවද<br>සනසවයි මගේසිත<br>මතු දිනක ලං වෙලා<br>ලඟ ඉන්න හැමදාම<br>ඔබේ පෙම රුවන් මෙන්<br>රකිමි මම සැම දිනේ. |

| | | | | |
|---|---|---|---|---|
| 11 | 1 | සිංහල සංකෘතික සංගමය | Wall paper/Poster/ other publications | සිංහල ගුරු පියාණනි-<br>ගුත්තිලයන්ගේ පරම්පරාවට එන්න<br>මුසිලයන්ට අඩ ගසන්න<br>අපේකාලයේ දිසාපාමොක්වරයාණෙනි<br>ඔබටයි මේ තුති...<br>කොපි පොතේ තනිවෙන්න<br>සිංහලයන්ට ආදරය කරන්න<br>කියලාදුන්නේ ඒ අසනුවේ කථාව<br>ඇත මා හදවතේ.....<br>ජිවමාන චරිතයක් ලෙස...<br>හන්තාන කඳුමුදුන වගේ<br>හිතේ තියෙන බර අඩු කරපු<br>ආදරණීය ගුරු පියාණෙනි<br>උපහාරයක්ම වේවා මේ තුති ගී. |
| 14 | 1 | සිංහල සංකෘතික සංගමය | Wall paper/Poster/ other publications | නුඹේ සන්සුන්<br>සිනහවත<br>නෙලුම් පුබුදි මගේ<br>හදවත<br>භාවනාවක් සිරිය<br>ප්‍රේමය<br>ඔබට පමණක්<br>සමවැදුන..... |
| 17 | 1 | සිංහල සංකෘතික සංගමය | Wall paper/Poster/ other publications | අහිංසක මගේ සිතට<br>දුන්නු මේ ගින්දරින්<br>වාවනු නොහැකිව<br>තවමත් මා වැලපෙන්නෙම්<br>මෙසේ මසිත රිදවන්නට<br>ඔබට සිත් වුයේ<br>අවංකවම මුළුහඳින්ම<br>පෙම් කල නිසාමද<br>දයාබර අහිමි කුමාරයෝ. |

| | | | | |
|---|---|---|---|---|
| 23 | 1 | සරසවි කලා සංගමය | Wall paper/Poster/ other publications | ගල් මුල් වල හැපෙමින්<br>වාලුකා කතරට මැදිවී<br>සැඩසුලං රැලි තරණය කොට<br>මහා බාධක පසු කර<br>අව් රශ්මියෙන් කරවී<br>ගලායන ගංගාවක මහිමය<br>කොතරම්ද විසිතුරු<br>හිරු කිරණ රැස් ධාරා<br>සියොතින්ගේ ගී මාලා<br>ගංතෙරේ තුරුලතා<br>කොතරම් සුන්දරද<br>ගංගාවකට<br>ගංතෙරකට<br>මිනිස් ජිවිතය කෙතරම් සමානද.. |
| 24 | 1 | සරසවි කලා සංගමය | Wall paper/Poster/ other publications | දිනෙන් දින ගෙවී<br>යයි හැමදාම එක ලෙසින්<br>අපි එතනමයි තවත්<br>කුමක් කරමුද ඉතින්<br>බිය වෙලා ජිවිතේ<br>පසුපසට හෙම නොයන්<br>ඉදිරියට එක පයක්-<br>තබාබලමුද ඉතින්<br>තැබූපය ඉදිරියට<br>ජය පරාජය වුවත්<br>තුටු වෙමු නොසින් සිත්<br>තැබුවෙමුයි පියවරක්. |

| | | | | |
|---|---|---|---|---|
| 26 | 1 | සරසවි කලා සංගමය | Wall paper/Poster/ other publications | ආදරෙන් මන් හැමදාම<br>ඔය  දෙනෙත් පැවසුවත්<br>ආදරෙයි මන් හැමවිටම<br>ඔය දෙනෙත් අභියසම<br>වැටී මට පය පැටලි<br>ඔබ ඉදිරියට එද්දි<br>ඒ වෙනුවෙන් තමයි<br>මම හැමදාම<br>මඟ බලන් ඉන්නේ<br>මම හරි නේද?. |
| 27 | 1 | Library | Library | කලුවර රැක වැස්ස වී වහින්නම්<br>තෙමෙන්නට එනවාද අතින්අත<br>අල්ලාන හුගක් දුර ඇවිදින්න නෙමෙයි<br>ලංවෙලා මට<br>අඬන්නට එනවාද? |

| | | | | |
|---|---|---|---|---|
| 29 | 1 | සරසවි කලා සංගමය | Wall paper/Poster/ other publications | නුහුරුයි මං පෙත කටුකයි දිවිමඟ<br>නමුදු දිනෙක සිතුනා ජය ගැන්මට<br>කඩ ඉමක සිතෙහි ඇඳි ගිය<br>පියාපත් සුන්ව අත්තටු සැලුවට<br>ඉඟිල්ලෙන්න බැරි බව දැනුනත්<br>දෙමාපිය කඳුලු දැක<br>උණු උණා මගේ සිත<br>ඉසුරින් පිරි ලොවක්<br>සිහිනෙන් දකිමින්<br>පියවර තැබුවෙමි<br>අධිෂ්ඨාන මං තලාව වෙත....... |
| 33 | 1 | සරසවි කලා සංසදය | Wall paper/Poster/ other publications | ප්‍රාර්ථනා<br>හෙට උපදින දරුවනේ<br>අද දැය නුඹ පන වැන්නේ<br>මම මෙන් නුඹෙ රට රැකගන්නේ<br>අතීතයේ හෙළ විරුවන්<br>තව නුපන් හෙළ දරුවන්<br>පැතුමට හෙල දස වසරක<br>සිරි සවි දෙනවා සත්තයි<br>ඒ දිරි ලැබ මගේ පුතා<br>පෙරට ඇවිත් සුපුන් නසා<br>දෙස කිතු ගොස බබලවාවි<br>නිල් අඹරේ. |
| 37 | 1 | සරසවි කලා සංසදය | Wall paper/Poster/ other publications | පරංගිද ලන්දේසි<br>පරදේස ඉංග්‍රිසි<br>සිවිසියක් වසරක්ම<br>මුළුරටම වැනසිය<br>මුතු මතින් ලේ<br>මතින් දිනා ගත් නිදහසින්<br>පලක් ගන්නට නොදි<br>සිහලුන්ට කිසි ඉඩක්<br>අදත් මෙරටට බැලුම් හෙලනා<br>පරදේශ අවතාර<br>දරයි උපරිම තැත්<br>අසන්නට සිහලුන්<br>අතීතෙන් උරුම වු<br>වෙර විරිය හා දිරිය<br>ගෙන යවු පෙරටම . |

| | | | | |
|---|---|---|---|---|
| 38 | 1 | සරසවි කලා සංසදය | Wall paper/Poster/ other publications | කලාකාරයගෙ ගබසාව<br>ඔහු මා සයනය<br>කලලක් වන්නටද<br>මට ගබ්සාව විලිරුදා විට<br>කෑගසා ඉකිලමින්<br>ඉකිලමින් ඉවසමින්<br>නුඹ බිහිකර පල නෑ<br>හිස් මිනිසුන් කුමටද<br>ගුන නැන පිරි දරුවෙක්<br>නොදත් හිස තුරුත්තක්<br>අසඅසා නැලවෙන<br>නැලවෙවි හිනැහෙන<br>උන්ට කුමටද නුඹ<br>දරාගෙන කඳුළු<br>ඉරාගෙන හදවත<br>මරා දමන්නෙමි නුඹ<br>අවජාතක කතා අසන්නට<br>කුනුකානුවේ මියැදෙන්නට<br>නුඹ බිහිකර පලනැ<br>ගබ්සා කර නුඹ<br>ගැබ සොදා හැර<br>සයනය කරන්නෙමි<br>හිසම හිස් මිනිසුන් හා<br>විද විද ඔහු පසු<br>මාතාවකගේ කිරි<br>එයද ඉවසම්<br>ගැටිස්සියන් ගැටවරයන්<br>ඌත් එක්ක බියර ගසයි<br>ලම්ස්සියන් ලැම හප්පා<br>ඌත් එක්ක dance කරයි |
| 39 | 1 | සරසවි කලා සංසදය | Wall paper/Poster/ other publications | නුපන් පුතුට-<br>පන්සල් දාගැබ් රන් කොත් නිල් අහසේ ගැවෙන්නේ<br>අතිත හෙල විරුවන්ගේ වෙර වීරියෙන් බව දැන<br>ගන්නේ මුතුන් හෙලු දහඩිය බිදුකඳුළු පවා<br>නොමියෙන්නේ යෝද අමුනු වැවපියවර බලා නෙතට<br>පන දෙන්නේ<br>පරසතුරන් පලවාහැර රණගොස ඒ විරුවන්ගේ<br>ඇලදොල ගංගාවල හැඩ සමග අවට මිමිනෙන්නේ<br>එදා සුසුම් සුවද වෙලා අප සනහා ගෙන යන්නේ<br>නිල්වන් හිදිනා පොලවේ රන් අස්වනු පිදෙන්නේ. |
| 43 | 1 | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | කඳුළු මල්<br>මගේ දෑත් අද<br>නලියන කඳුළු මල<br>මගේ තනි නොතනියට<br>නුඹ විතරමයි අද<br>නොවැටි ඉදින්නට බලාපන්<br>මගේ නෙතු අගින්.. |

| | | | | |
|---|---|---|---|---|
| 45 | 1 | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | අහිමි මල නුඹ-<br>අහිමි මල නුඹ<br>කිමද අන්සතු හදක පිපුනේ<br>අහිමි බව නුඹ දැනදැනත් සිත<br>කියන් කුමරිය<br>මගේ නොවෙද නුඹ. |
| 46 | 1 | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | අමාවක සහ අඳුර කිම නුඹ<br>මගේ තනියට ලග ඉන්න<br>ඉකිබිඳින මේ සිහින් මදනල<br>සිහිල් සුළගයි නැගෙන්නේ<br>ගෙවෙන මොහොතක් පවා අද මට<br>කල්පයක් ලෙස මට දැනෙන්නේ<br>පෙරදවස අප ගෙවනු කාලයේ<br>සොවින් වුන් අප සිනාසෙන හැටි<br>මගේ සිතතුල රැව් නගන්නේ<br>ඔබේ ලස්සන සිනා සමගින්<br>මගේ දිවියම එළිය වන්නේ<br>යලිත් ඔබ මගෙ ලගට<br>ඇවිදින්<br>නෙත් කොනින් මට සිනා<br>සෙන්නේ<br>ලොව නොලැබුනත්<br>ඔබව ලැබුනොත්<br>එයම පමනයි<br>මම පතන්නේ. |

| | | | | |
|---|---|---|---|---|
| 49 | 1 | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | දිනක්-<br>සිත කැගැසුවා ලොවට නොපෙනෙන්නට<br>මනස හැඬුවා මටම නොදැනෙන්න<br>එත් එනමුත්<br>සිතම සසල විය<br>කඳුල බොඳ විය<br>ඒ සොඳුරු දිනේ<br>අපේ රැගුම් අපේ වැයුම්<br>ලොවම දකිනකල<br>දැනුන හැගුමන් අප සිතේ<br>ආ ගමනෙ සොඳුරු සොඳුරු බව හැගේ<br>පියමනින්නට විදුබිමේ<br>හැඬුම නවතා<br>සිනාසුමු අපි<br>මවි තුරුලේ. |
| 50 | 1 | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | සරසවිය<br>ගිම්හානයේ උදැසනක<br>සුපිපි රොස කුසුම<br>ලතැවුල් කිමද<br>අද නැතත් හෙට දිනක<br>වසන්තය උදාවේ නම්<br>දොතින්ම දරාගෙන බලාපොරොත්තු<br>පෙලගැසි බලා හිඳි<br>ඇස් කෙවෙනි යට රැඳි<br>තුන් කඳුළු ඉහිරවන්න. |
| 61 | 1 | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | ජිවිතය නම් නිල්දිය රැඳි<br>පිපි මල් රැඳි දිය දහර සේ ගලායති<br>විටෙක ගල් පර රැඳි මාවතේ<br>සිරු මාරුවෙන් ගලාබසි<br>සිදිගොස්නැවත පිරියන සේ පෙනී<br>නිමක් නොපෙනෙන මහ සයුර ඒ වැනි<br>මනින්නට බැරි අහස් වියනද<br>වැලිකතර සේ රුදුරු වුවද<br>අමාවක සේ අඳුරු වුවද<br>විවිධාකාර වු මේ ජිවිතයටමයි සකි. |
| 63 | 1 | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | සිහිනයකි ඔබ මට සිතේ<br>අවදි නොවනා නෙතු පියන්<br>සුවදක්ය මට සිතේ<br>වෙන්ව නොයනා කුසුමකින්<br>දිය දහර ඔබ මට සිතේ<br>සසර සරන තුරු ඉතින් . |

| | | | | |
|---|---|---|---|---|
| 68 | 1 | පොස්ටර් | Wall paper/Poster/ other publications | සුලෝහිත රුදිරය හෙලා<br>හෙලු දෑ පිපාසිත හදවතින්<br>වැගිරෙන දා බිඳු වැටෙන<br>දෙරනත නැගි වැද රණමතින්<br>අවි දරා රැපුන් තෙද බිද<br>පෙරට ඇදිනා සිවිදිගින්<br>එඩි පතම්<br>ජය දද නගන්නට<br>නුඹ නොදත් නුඹ සොයුරෙකි. |
| 73 | 1 | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | දුක සතුට දැරිය යුතුමතා<br>මා විසින්මය<br>මන්ද යත්<br>කුඩා කල සිට<br>විදි දුක් කන්දරාව නිමා වි ඇති බව<br>මා සිතුවද<br>මගේ නිගමනය වැරදිය<br>මා දුක් විදින්නට ආරම්භ වන්නේ<br>දැන් බව විටෙක මට සිතේ<br>මා සිතන පතන දෙය බොහෝ දුරය<br>මා කුමක් කරන්නද<br>මේ අවස්ථාවේදි<br>මගේ තනියට මගේ පැනය<br>ඉදිරිපත් කරන්නට<br>මා ලග කිසිවෙකු නැත<br>[illegible] |

| | | | | |
|---|---|---|---|---|
| 75 | 1 | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | තාත්තා<br>රවා මා දෙස බැලු<br>තැබු පා වන රොදේ<br>රැගෙන මල් මාවතේ<br>තැබු සෙනෙහස් මහිමේ<br>කියන් මට තාත්තේ<br>ගිලන් වී සියොලගම<br>වාරු නැති වු දිනේ<br>ලගින් සිටි සෙවනැල්ල<br>ඇගේ සෙනෙහස නොවෙද<br>කියන් මට තාත්තේ<br>රුවන් සරසවි දොරටු<br>පහන් දැල්වු දිනේ<br>නෙතු කඳුළු පැවසුවා<br>මගේ සෙනෙහස නොවැ<br>කියන් මට තාත්තේ<br>ඔබෙන් ලත් සැන්ඩියර්<br>මගෙන් ඔබ පා දොවේ<br>නිති ඔබ සනසන්න<br>මා ගෙදර එනතුරා,<br>ඉතින් පෙර මඟ බලා<br>ඉදින් මගෙ තාත්තේ. |
| 84 | 1 | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | සිප්හලෙන් ඉගෙන ගෙන<br>දැනුම දොතක් සිතට ගෙන<br>ගතින් පාසල හැර දමා<br>ගියත් විදුමවුනි මා<br>සිතින් පාසල හැරදමා<br>නොයන්නෙමි දිවිඇති තුරා<br>හොඳ සිරිත් මට කියාදි<br>නිසි මඟ යන්නට මඟ පහදා දි<br>කෙසේ තුති පුදම්ද මා. |
| 87 | 1 | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | උපමා රූපක නැති<br>සදැස් නිසදැස් නැති<br>කවියක් නැතිමුත්<br>රිද්මයක් නැති<br>විටෙක දුක ඇතිවේ<br>විටෙක සැප ඇති වේ<br>එයම අනුප්‍රාසය වේ<br>කිම මේ සංධිය<br>පුරව අපර සන්ධි ගැලපු කල<br>සමාසයකි ජිවිතය. |

| | | | | |
|---|---|---|---|---|
| 91 | 1 | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | ජවිතයේ සැබෑ අරුත<br>සොයා යන ගමනේදි<br>නොයෙක් කම්කටොළු<br>බාධක පැමිණියද<br>ඉදිරියට ගමන්කල යුතුය<br>ඉඩෝරයෙන් පසු<br>නව පනක් ලබන තුරුලතා සේ<br>බාධකයක් ජය ගන්නෙකුගේ<br>සිතට දැනෙන සතුට අපමණය<br>අධ්‍යාපනයෙන් ජය ලැබිමට<br>එහි පන්නරයෙන් යා යුතුය<br>හිම්දිරියේ විකසිත වන<br>පුෂ්පයෝ මනහරය<br>එහි සුගන්දය උසත පැතිරේ |
| 93 | 1 | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | ඝනදුරට පුං සදක් වෙලා<br>සිත් මලට රොන් පොදක් වෙලා<br>නෙත් දෙකට දිදුලන තරු කැටයක් වෙලා<br>මගේ හදට රෝස කුසුමක් පෙලා<br>පිපුණා නුඹ මහද පිපුනා<br>මල් සුවද ගුවන හැර නොයයි<br>වන බඹරු වන මල් සොයයි<br>හිම වතට මීදුම වගෙයි<br>ඔබේ සුවද මාහද රැදෙයි<br>සියපතට හිරු කුමරු සේ<br>දෙව්ලොවට සුරවිමන සේ<br>සුරගනට රන් සළුව සේ<br>මා නෙතට රසඳන ඔබයි. |
| 97 | 1 | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | ජවිතය ජිවත් කරවන්නට<br>පැතුම් එක්කල නුඹ<br>ආදරය නම් කිමැයි<br>මට පසක් ගැන්විය<br>මහද ගැහෙන රාවය<br>හැදින ගත් එකදු<br>සෙනෙහෙබර හදවතක්<br><br>මා අදුරු සිත් ගැබේ<br>ආලෝකමත් පහන් සිළුව වු නුඹ<br>ගත දැවටි හමා ආ<br>මුදු සිහිලැල් මද පවනයි<br>ආත්මය වසා පැතිරුන<br>විශ්වාෂයේ සෙවනැල්ලයි<br>මා ජිවිතයේ පිදුම් ලද<br>ඔබේ සෙනෙහස<br>දෙවොලක්මයි.. |

| | | | | |
|---|---|---|---|---|
| 104 | 1 | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | සුනංගු මිතුරාගේ සිතුවිල්ල<br>කෙල්ලේ<br>නුඹට වගේම මටත් ආදරය කරන්න අතීතයක් තිබුනා<br>ඒ වගේම අනාගතයකුත් තියෙනවා<br>අපි හැමෝටම ඒ අනාගතය වටිනවා කෙල්ලේ<br>එම නිසාම සුනංගු වී පැමිණි සුනංගු සිතුවිල්ලට<br>තිතතියමු |
| 105 | 1 | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | සමුගනිමු බිඳකට<br>නෙතු හැරයන්න<br>නෙතු නොහඬන්න<br>හුරු වෙන්න<br>දිරි ගන්න කියලා<br>තව නොකියන්න<br>කාලය දෙන්න<br>කියන්න මා ළගම එතිලා<br>පෙම් දොරරින්න<br>දොරගුළු ලන්න<br>හැකිදෝ මගේම<br>ඔබ කියනා<br>බිය නොම වන්න<br>හැකි ඉවසන්න<br>නොවේදො මේ අපි<br>සැමට බදා<br>ඉතිරෙන්න<br>කඩතොළුවෙන්න<br>නොමදෙන්න නිති<br>සිහිකරලූ<br>තව කොදුරන්න<br>අහගෙන ඉන්න<br>සමුගන්න පෙර<br>ඹබව සඹලා |

| | | | | |
|---|---|---|---|---|
| 109 | 1 | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | නිදහසේ දුටම<br>සිත පැවත ආ නමුදු<br>කොටිවදය කෙළවරක් වුනා අද<br>සැමදෙසින් ඇසෙන්නේම ජය හඬය<br>පුදුම මල් මිටි අපේ විරුවනට<br>යාපනය කිළිනොච්චි මුලතිව්<br>තම නගර ග්‍රහනයට ගෙනතිබුනු<br>රුදුරු කොටි අවිබලය<br>නිරතුරු ඇසුනේ එහි එහි අපේ<br>දෙමළ ජනයාය<br>අරන්තලා පන්සලේ සිදුකලේ<br>ගාතනය<br>තිස්නමක් නැතිවුනා<br>අපේ දැයට<br>මෙහෙමවූ ත්‍රස්තවාදින් රජකලේ<br>උතුරු දෙස<br>මේවා දෙස බලා සිටි දෙවිවරුන්<br>ඇත්දලොව වැසුවා කොටි ගොවියන්ගේ මාවිල් ආරුවද<br>එයම විය කොටියන්ගේ පළමුවන මෝඩකම<br>දුන්නා එම මෝඩකම නැවත සිදුනොකරන්න<br>ලොවම දනගැහුවේ අපේපුංචි ලක්මැණියට<br>පෙරට ආවේ අපේ සේනාදි රජවරුන්<br>ලැබුනා නිසි මග පෙනුම අපේ රජතුමාගෙන්<br>යෝධබල යොධ එඩි ඇතිවුනේ හදවතේ එලෙසින්<br>අපේ සෙබලු පෙරට ගියේ දුටුගැමුනුවන්<br>එකා පිට එකා වැටුනි කොටිසෙබළ රණබිමෙන්<br>සූසි ඇතුළු ලොකුළන්ට ලැබුන හොද උන්ඩයෙන්<br>මහ කොටියා හැංගුනේ උණ්ඩයට බියවෙමින්<br>මලකුනත් හම්බවුනේ නච්චිකුඩා කලපුවෙන්<br>මහ කොටියා දැකගන්න ලැබුන ඉඩ අපසැමට |
| 116 | 1 | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | සඳ නුඹට<br>ඈත තරුවක්ව දිලිසී ඉන්නට<br>හමන මද සුළගකම ඔබ සුවද දවටන්න<br>භාවනාවක් වගේ සිත තුලින් ඔබ ඉන්න<br>වැරදිලාවත් හිතට පාළුවක් නොදැනෙන්න<br><br>හදේ ඇති හැමදේම සඳරුවට පවසන්න<br>සඳකියන කතාවෙන් සිතේ තනියම ඉන්න |

| | | | | |
|---|---|---|---|---|
| 2 | | සිංහල සංකෘතික සංගමය | Wall paper/Poster/ other publications | ළමාවිය ඉක්මවා<br>යෞවනය වෙතයන්න<br>අවැසි වි ඇත මෙමට<br>දයාබර ගුරු මව්නි.....<br>රසදුනක් සොයා යන<br>විෂම වු මිනිස් සිත<br>කෙලෙස හඳුනා ගනුද<br>දයාබර මැණියෙනි…<br>මිනිස් සිත බිහිසුණුය<br>මසිත තව ළාමකය<br>ඔවුන් හා වෙහෙසෙන්නට<br>ඔවදන් දෙනුමැනවි<br>දයාබර ගුරු මැණියනි…. |
| 3 | | සිංහල සංකෘතික සංගමය | Wall paper/Poster/ other publications | ජිවිතය-<br>ඉගෙනුම තුලින්<br>නුවණ සිසාරා<br>බලන් ජිවිතය<br>විත්තර පටියක<br>රූප පෙළක් තුල<br>නොවෙයි ජිවිතය.<br>වයින් හලක් තුල<br>වීදුරුක හිඳ<br>මනමත් කරනා<br>මධුවිතක් තුල<br>නොවෙයි ජිවිතය<br>දැගිලි මැද හිඳ<br>හඳ මිටි දවනා<br>දුම්වැටියක් තුළ<br>නොවෙයි ජිවිතය<br>අත්වැඩ පරවැඩ<br>ගුණ දහමින් හෙබි<br>අමිල නිමල වූ<br>මිනිසත් බව වූ<br>එයයි ජිවිතය |

| | | | | |
|---|---|---|---|---|
| 5 | | සිංහල සංකෘතික සංගමය | Wall paper/Poster/ other publications | ප්‍රාර්ථනා<br>මල් සුවඳ විහිදු<br>මාගේ කෙළිලොල් ළමාවිය<br>පසුවන තෙක්ම මා අතින් අල්වාගෙන<br>ගිය ඒ මඟ දෙපස තවමත් සුන්දරය<br>මා ආදරණීය<br>මව්නි.....<br>ජීවිතය නැමැති කටු කෙහෙලින් මිදි<br>නෙල්ලි ගෙඩියක් වන් ජීවිත ගමන<br>අතදිගුකර පෙන්වූ මාර්ගය දෙපස<br>මල් එල ලියලමින් පවති<br>ඒ නුඹගේ ආදරයෙණි ......<br>මව්නි......<br>ප්‍රාර්ථනා කරන්නෙමි ආදරයේ නාමයෙන්<br>නුඹ<br>මතු ජාති ජාතිත් මගේම<br>මෑණියන් වන්නට..... |
| 8 | | සිංහල සංකෘතික සංගමය | Wall paper/Poster/ other publications | සහන් පැතුමක් රැගෙන<br>මේ පාළු මැදියම පුරාවට<br>නුඹ චිත් සිත අරක්ගෙන<br>නිතියට පිරිමදියි මගේ ආත්මයට<br>කඳුලු පිරී දෙනෙත් වලට<br>දුකින් පිරී සිත් මඩලට<br>සහන් එලියක් වී<br>ඉතින් ඔබ වඩින්නට හෙට දිනත්<br>මංගල පැතුමන් රැගෙන<br>ජිවිතයේ උණුසුම රැඳි<br>අනාගත සිහින කැදැල්ලට<br>පහත් තරුවක් විලස<br>මං නුඹ ලඟින් ඉන්නම්<br>හැමදාම. |
| 9 | | සිංහල සංකෘතික සංගමය | Wall paper/Poster/ other publications | හිරු නැගෙන යාමයේ<br>පැහැසරවූ අරුණ නුඹ<br>සියොත් කැල මුමුණනා<br>සංගිත ස්වරයේ නුඹ<br>ගලන ගංගා දියේ<br>සිත පිනන සිසිල නුඹ<br>අනන්ත වූ සාගරේ<br>නිසංසල වෙරල නුඹ<br>පෙති සැලෙන සියපතේ<br>සිනිදු මකරන්ද නුඹ<br>බඹර ගී නාදයේ<br>සොඳුරුතම තනුව නුඹ. |

| | | | | |
|---|---|---|---|---|
| 10 | | සිංහල සංකෘතික සංගමය | Wall paper/Poster/ other publications | මව් පිය සෙනෙහස -<br>දසමාසයක් කුසතුල දරා<br>මා මෙලොවට බිහිකළ<br>මව්නි දයාබර<br>ජිවිතයේ සියලු දුක් වඳිමින්<br>යහපත් පුරවැසියකු කිරීමට<br>වෙහෙසුහ.<br>මා දයාබර පියාණෙනි...<br>මා සියලු දෙනාගෙන්<br>වෙන්වි.....<br>දුරු කතරට පිය මැන්නේ<br>රටට යහපතක් සෙතක් සලසන<br>හෙදියක් වි<br>ඔබ දෙපලගේ ප්‍රාර්ථනා<br>ඉටුකරලිමටය.....<br>.මව්නි ,පියාණනි....<br>නිතරම මාසිත ඔබළග දැවමි<br>ශක්තිය ධෛර්ය මාහට<br>ලැබුනට ඔබ දෙන ශක්තිය මා හට අපමණය.....<br>මව්නි , පියාණනි |
| 12 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | අහිමි නුඹ<br>රැ අහසට තරු පායා<br>එළිය දෙනු නොඅනුමානය<br>පුන්සදේ ආලෝකය පරයා<br>එය කිසිදිනෙක නොනැගෙනු ඇත<br>ලදු කැලැවක තරු පියන් වල<br>මල් පිපෙනු නොඅනුමානය<br>බබරෙකු වෙනුවෙන් නොපිපි මලක්<br>කිසිදිනෙක හමු නොවනු ඇත<br>මිනිසුන් පිවත් කරවන්නේ බලාපොරොත්තු බව<br>ඔබ පිලිගනු නොඅනුමානය<br>නමුත්<br>ඔබ මට හිමි නැති බව<br>ඔබට මානොව<br>හොඳ හිමිකරුවෙකු හමුවනු<br>නොඅනුමානය<br>නමුත්<br>ඔබට මා තරම් ආලය කල අයෙකු<br>කිසිදිනෙක හමුනොවනු ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| 13 | | සිංහල සංස්කෘතික සංගමය | Wall paper/Poster/ other publications | ලගින් ඉන්නට සිතයි ආදරයෙන්<br>තුරුලට වෙලා<br>අසාගෙන ඔබේ වදන් මුව මඩල<br>දෙස බලා<br>තහනම්ය එය පවුරු පදනම්ය<br>අපවටා<br>දරාගන්න බැරි දුකක් පිරේ<br>හදවත පුරා<br><br>අතරමංවූ ජීවිතයේ අත්වැල<br>වුයේ ඔබය<br>නොමිනිසුන් මැද මට හමුවූ සැනසුම<br>ඔබය<br>වේදනාවෙන් මා මුදාගත් මගේ මුළු<br>ලොව ඔබය. |
| 15 | | සිංහල සංස්කෘතික සංගමය | Wall paper/Poster/ other publications | පුරාපසක් රෑ අහසේ<br>සොඳුරු සිත්තමක්<br>හංස විලත් කොද යායත්<br>සුපෙම් ගිතයක්<br>නුඹේ පෙමත් අතිතයක්<br>තවම හිනයක්<br>පද ලෙහුනත් දුක පිරුනත්<br>නුඹ මට කවියක්........ |
| 16 | | සිංහල සංස්කෘතික සංගමය | Wall paper/Poster/ other publications | [illegible]<br>නැත ආල හැගුම් සඟවාන හිතේ<br>හින ලොවේ දුර යන්නට එපා<br>ඉටු නොවන පැතුම් පුරවාන සිතේ<br>වාන්දමා පෙම වාවගනින්<br>උණු කඳුළු ගඟක් ගැලුවාට නෙතේ<br>හිනවගේ මම ඉන්න කේසේ<br>අමනාප නොවන් නුඹ මගේ නොවේ. |

| | | | | |
|---|---|---|---|---|
| 18 | | සිංහල සංකෘතික සංගමය | Wall paper/Poster/ other publications | අතිතත ශේෂකල ඒ දවස් වගේ<br>ඉන්නට හැකිනම්<br>හැමදාම ආදරෙන්<br>ගනඳුරට පායන සඳ එලියක් වගේ<br>එලිය දෙන්නට හැකිනම්<br>නුඹේ ජිවිතයට<br>කනට වැටුනු දිය දොතක් වගේ<br>සිසිල දෙන්නට හැකිනම්<br>නුඹේ දිවි කතරට<br>හැමදාම ඉන්නම් නුඹේ<br>සෙවනැප්පක් සේ<br>මියෙනතුරාවට<br>මේ ප්‍රථම ප්‍රේමයෙන්. |
| 19 | | සිංහල සංකෘතික සංගමය | Wall paper/Poster/ other publications | ඉන්නවද අහිංසකව<br>වගේ මගේ ලගින්<br>තවත් විටෙක දඟකාරව<br>වගේ ආදරෙන්<br>හිඳින්නට හැකිනම් මේ ලෙසින්<br>ඔයා මගේ ළඟන් හැමදාම<br>සත්‍යයි මම ආදරෙයි<br>රත්තරං<br>මියෙන තුරාවට<br>මේ ලොන් මං. |
| 20 | | සිංහල සංකෘතික සංගමය | Wall paper/Poster/ other publications | [illegible]<br>උජාරුවට ඉගිල ගියත්<br>නුඹේ ලොවේ විසිතුරු අපි<br>නැතිවද දන්නේ .....<br>රිදෙනවාද ඔය අත්තටු<br>දුර ගමනක් ආව නිසා<br>නවාතැන් පලක් නැතිවද<br>සොයා බලන්නනේ.....<br>මැලවුණ මල් වලින් කොහේද<br>කුසපිරෙන්න මල් මී පැණි<br>අමා පැන් බිඳක් දුටු කල<br>ඇයි මග හැරියේ......<br>අප කාටත් ඔය ටිකමයි<br>ගිජුවු පස්කම් සැපයට<br>මලේරොනට වු සපන්ව<br>ඇයි වැලපෙන්නේ. |

| | | | | |
|---|---|---|---|---|
| 21 | | සිංහල සංකෘතික සංගමය | Wall paper/Poster/ other publications | සුවහසක සෙනග මැද<br>මිලට දෙනසිනා මැද<br>පැයට දෙන සෙනෙහේ ලඟ<br>තනිවෙලා මා මෙලොව<br>එක් අතක් මිතුරු ලෙස<br>සුහද බැම් තර කරන<br>අනෙක් අත පිටු පසින්<br>උගුරු දඬු සිරකරන<br>සෙත් පුරය තවරගෙන<br>සැබෑ රුව මකා ගෙන<br>මළ රකුසු මල් සරාගේ<br>හීය උදුරගෙන<br>සිනහ වෙනව නොවේ<br>සිනස්සනවා මාව<br>සිත යටින් සෝ තැවුල්<br>මර බිය කිලි පොලන<br>බැහැමවුනි ඉවසන්න<br>මේ සොඳුරු තව ගැසුන<br>කුහකකම  රජ කරන<br>ලොව තවත් මට ඉන්න |
| 22 | | සරසවි කලා සංගමය | Wall paper/Poster/ other publications | සහෝදරත්වයේ උත්තමාපතෙහ<br>සැරිසරමින්<br>ඔබත් මමත් ගෙවූ ඒ සුන්දර<br>කාලය<br>කිසි දිනෙක<br>මා සිතින්<br>අමතක නොවන්නකි<br>ඔබ අතිනත ගත්දා<br>මා දෙනෙතට බරවූ<br>අවිහිංසක කඳුළු කැට<br>මැඩ ගත්තේ<br>ඉතාමත් අසිරුවෙනි<br>එහෙත් |
| 25 | | සරසවි කලා සංගමය | Wall paper/Poster/ other publications | ඕනැම දෙයකට වඩා මා විශාල වේ<br>සියලු දේ ඇත්තේ මගේ දොරින්    පිටතය,<br>නමුත් දොරේ යතුර ඇත්තේ මා අතය<br>එම නිසා මට සිදුවිය යුතු ඕනැම<br>දෙයකට වඩා මා ශක්තිමත් විය යුතු<br>අවස්ථා,ඉරණම,වාසනාව යන<br>මේ සියල්ල බාහිරවේ<br>මට එවා වෙනස් කිරීමට<br>නොහැකි විය හැකිය<br>එත් එවා පරාජය කිරීමට මට<br>පුළුවන..... |

| | | | | |
|---|---|---|---|---|
| 28 | | සරසවි කලා සංගමය | Wall paper/Poster/ other publications | පියෙන් පිය ඔසවන පා පොඩි<br>පසුපසට නොයවන්න<br>හෙටක් කියා දිනක් නොමැත<br>අද කලයුතු දේ අදම කරන්න<br>සැමදා සිනහ මුවින් සැමදෙනා දෙසම<br>එකම ඇසින් බලන්න<br>පලමුව නැතහොත් දෙවනුව<br>ප්‍රතිඵල සාර්ථක කරගෙන<br>ඉලක්ක කරා පියනගන්න<br>එවිට ඔබට<br>සාර්ථක අනාගතයකට<br>මුහුණ දිමට හැකිවිම<br>හැමදාම අහිංසකව ලොව<br>දෙස බලන්න. |
| 30 | | සරසවි කලා සංගමය | Wall paper/Poster/ other publications | නිහඬ නිසංසල විහාර මළුවේ<br>සමාධි සුවවිදිනා<br>හමනා සුළගට සැලෙන බොපත්<br>සිතට පවන් සලනා...<br>සිල් සුවදයි මුළුවිහාර මළුවට<br>පෙහෙවත් සුව විදිනා අම්මේ<br>මල් සුවදැති බෝ මළුව පුරාවට<br>සඳුන් සිසිල නුඹමයි අම්මේ<br>රත්මාලි සෑයේ රන් සඳ කිරණින්<br>නැහැවෙනු පෙනුනා නුඹ අම්මේ |
| 31 | | සරසවි කලා සංසදය | Wall paper/Poster/ other publications | ඔබට කියන වගනම්<br>තනිව ආ මේ ගමනේ<br>නවාතැන් පොළකි මේ  බිම<br>සුමිතුරු සුවය පතා<br>දකිම් යනෙන හැමවිට<br>ඒ බිමේ ඔබ<br>මා සිත පුබුදුවන<br>කියාපාන මුහුනු ඒ හැගුම<br>අතේ තෙරපගෙන<br>කවදානම් ඉවරවේද<br>ඒ ගොළු හදවත<br>බලා හිදිම් මම . |

| | | | | |
|---|---|---|---|---|
| 32 | | සරසවි කලා සංසදය | Wall paper/Poster/ other publications | එරෙහි අයුක්තියට<br>එරෙහිව වංචාවට<br>හිසනමා සත්‍යයට<br>මිට මොලවන යථාර්ථයට<br>එසවෙයි සුවහසක් දෑත්<br>ඉහලම අහසට<br>පියවර 2ක් 3ක්<br>පස්සට තල්ලුවෙයි<br>එකවරම<br>එතෙක් එසවෙයි<br>යලි පියවරක්<br>යලි ඉදිරියට<br>තබපන්<br>අතිත ගමනට<br>ගැබුරු පාසටහන් මත<br>දිරියෙන් සිටගනින් |
| 34 | | Library | Library | සමාජය හා කලාව-<br>පවතින සමාජ ක්‍රමය  තුල අදාල යම් ගුනාත්මක තත්වයක් අත්පත් කර නොගත් තැන සමස්ථ සමාජය දුශමාන වනුයේ පසුගාමි ස්වරුපයකි. ලාංකිය සමාජයේ කලාවේ භාවිතයටද සිදුවී ඇත්තේ මෙයයි. |
| 35 | | සරසවි කලා සංසදය | Wall paper/Poster/ other publications | කුකුලු මිතුර-<br>නැගිට ඔය ලෙස අළුයම<br>නිදිමත උන් එයි නේද<br>කුපිතව පොලුගෙන<br>නැගෙන මුත් ඉර<br>තවමත් ආදරේ දසතම<br>අනතුරැ දායකයි<br>කල්තියා පිබිද හැඩලුම<br>එත් නිහඬව කොහොමද? |
| 36 | | සරසවි කලා සංසදය | Wall paper/Poster/ other publications | අපි අපිට ආදරේ නම්<br>අපිට පුළුවනි තව<br>කෙනෙකුට ආදරය<br>දෙන්න එහෙම නේද? |

| | | | | |
|---|---|---|---|---|
| 40 | | සරසවි කලා සංසදය | Wall paper/Poster/ other publications | රට රකිනා නුඹට -<br>පුරාසමුදුර මහා බියකරු ගුවන් ගැබ හා මිහිමතින්<br>වඩාදිරි සිත බරා නෙත ගිනි අවි අතින්<br>පතා සුබ සිත දනගසා රකින ලක්මව නෙතසිතින්<br>විරුවනේ හෙළ මෙලෙස ඔබ ගැනසිහිකරන්නෙමි<br>අතිතෙන්. |
| 41 | | සරසවි කලා සංසදය | Wall paper/Poster/ other publications | සුදු සමනලිය -<br>මල් කැනින් සුවපත්<br>සිහිල් සඳ කිරණ නුඹ<br>නුඹේ සියුමැලි පියාපතේ<br>මහිම අහස සිඹ<br>සුළගට කියන රහස කිම<br>සිනිඳු සඳලිය නුඹ<br>පින්බර සදිසි වරාමල<br>ගිනි නිවන ඇසිල්ලට<br>ඉතින් මා හැරගිහින්. |
| 42 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | ලෙයින් කඳුලින් තෙත්වූ<br>මහා පොලව විකසිත වූ<br>පොපි මල ඔබයි<br>මවකගේ කඳුළු<br>බිරිඳකගේ සුසුම් වැනි<br>මව්බිමට වාසනාව ගෙනෙන<br>හිරුකිරන නුඹයි<br>හිරු විකසිත වන හෙට දිනක<br>ජය කෙහෙලි නංවනු නියතය. |

| | | | | |
|---|---|---|---|---|
| 44 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | අහිමි නුඹ<br>රෑ අහසට තරු පායා<br>එළිය දෙනු නොඅනුමානය<br>නමුත් පුන්සඳේ ආලෝකය පරයා<br>එහි එළිය කිසිදිනෙක නොනැගෙනු ඇත<br>ලඳු කැලෑවක තුරුපියන් වල හමන<br>සුළඟ මට කිසිදිනෙක හමුනොවනු ඇත<br>බඹරෙකු වෙනුවෙන් නොපිපි මලක්<br>කිසිදිනෙක හමුනොවනු ඇත<br>මිනිසුන් පිවත් කරවන්නේ<br>බලාපොරොත්තු බව ඔබ පිළිගනු<br>නොඅනුමානය<br>නමුත් ඔබ මට හිමි නැති බව<br>මම තේරුම් ගෙන හමාරය<br>ඔබට මා මෙන් තවත් මිනිසකු<br>හමුවනු ඇත<br>නමුත්,<br>ඔබට මා තරම් ආදරය කල<br>අයෙකු කිසි දිනෙක හමුනොවනු ඇත. |
| 47 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | හද ගිනි ඇවිලේ තවම දැවේ<br>නොදනිමි ඔබ දුර කොහෙද ගියේ<br>සඳ සිසිල ගලාවිත්<br>දෙනෙත තෙමෙන විත්<br>මසිත නිවන්නට බැරිව තැවේ<br>තරු කැට වලින් පෙම්ගිතයක්<br>ලියුවේ දකින්නයි හිනයක්<br>දුර තැනෙක සිටියදි ඔබ ලොවේ<br>වෙන මක් කරන්නද මං ප්‍රියේ. |
| 48 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | ඇයි<br>වසන්තයේ එක් දිනයක හිටියා<br>ඔබ<br>දෝරේ ගලා ගිය සෙනෙහස<br>සුවදයි තව හිත අද්දර<br>නටුවක පිපි මල් සුන්දර<br>මිලින වුනා මෙන් භවසට<br>මගේ ලොවේ ඒ පින්බර<br>දෙලොව ගිහින් නිති හඳුනන<br>සෙනෙහස නිමාවුනානම්<br>නුඹ සිත මා හැර දමලා<br>මාහඩ කන වැටුනු මොහොතේ<br>ඇයි මේ ලෙස කඳුළු සැලුවේ. |

| | | | | |
|---|---|---|---|---|
| 51 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | දෛවයේ කඳු මතින්<br>අනාගත ලොකයට<br>වාසනා අරුණුරුස්<br>ගලනා නව උදැසනක<br>යහතින් පිබිදවිත්<br>ඔබ දෙපා තබන බිම<br>තණපතක් අගරැදි<br>දෙපතුලට සිසිල දෙන<br>දිය බිදක් වන්න වත්<br>මට ඉඩක් දෙනු මැනවි. |
| 52 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | තරුකැටයක නැති ලස්සන<br>තරු පොකුරක දකින්න නැති<br>මල් කැකුලක නැති සුවදක්<br>මල් උයනක දකින්නක හැකි<br>එක් ස්වරයක නැති මිහිරින්<br>ස්වර ඇමුන තනුවක ඇති<br>වෙනසක් නැත සැම එකලෙස<br>පරපුර අපි<br>අනාගතය වෙනුවෙන් නුඹ<br>වැටෙන අරමුනු දුක්<br>නෙතු කඳුලැලි පිරෙන්න ඇති<br>ගල් කුලකින් කුමන පලද<br>පිළිරුවටයි වඩින්නේ නිති<br>ගලක් පිලිරුවක් වන්නට<br>පුදුම දුකක් විදිනවා සකි. |
| 53 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | පුංචි කුරුල්ලනි<br>පියාඹන්න තටු ලද මුත් අහස නොලද කුරුල්ලනි<br>එපා කරන්නට වෛර<br>නිල් අහසට ,අහසේ සරන කුරුල්ලන්ට<br>ඒ අහස ඔබටද හිමිය<br>මතුයම් දිනෙක ඔබට හිමි වේවි අහස<br>සැරිසරන්නට සැම අත<br>තටු ලදමුත් පියාඹන්නට<br>නුඹ නොදනි අහස<br>හැමදාම අහස නිල් නැත /අහස කළු නැත<br>අහසේ සරන කුරුල්ලනේ ඔබට කියාදෙනු ඇත<br>ජිවය දිවි ලබන්නට සරන්න<br>අහස ලබන දිනය ඔබ අතේ<br>ඉතිං පුංචිකුරුල්ලනිඅහස ඕනැද? |

| | | | | |
|---|---|---|---|---|
| 54 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | සිනාසෙන්නට වරම් නැති අහස<br>කඳුල තැවරූ සලනවා<br>දුරින් සිටියද යොදුන් ගනනක් නුඹේ හඩ මට ඇසෙනවා<br>නුඹට පෙම් බැද කරපු වරදින්<br>තවම හදවත දැවෙනවා<br>මෙතෙක් දඩුවම් දෙන්න මගේ දුක<br>නුඹට නැතිවග දැනෙනවා<br>කරපු වරදට නොදැන මගෙ සිත<br>පිරෙයි නෙතු කඳුලැලි නිති<br>වෙනස් නැති පෙම හිතේ හිතේ ඇති මුත්<br>පැතුම් කිසිවක් නම් නැති<br>නුඹේ ලස්සන නෙතු පියන් යට<br>වෛරයේ ගිනිදැල් නැති<br>දිනක් මතු දින උදාවේවි<br>තවම සිත නොදනිමි. |
| 55 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | තනිවුන දවසක හුල්ලන<br>නැතිවුන දවසක හෙලන සුසුමකි ආදරය<br>සමුගැනීමක් අතිතය බාරදෙන<br>ඒ අතිතයම දවසක නෙතු අද්දර<br>අඩා වැටෙනා කඳුලකි ආදරය<br>අනාගතයම සිහිනයක් වන<br>අතිතයේ යම් දිනෙක මියැදුන<br>අවන්කත්වයයි ආදරය<br>ජිවිතයේ අරමුනක් ගෙනදෙන<br>සඳ නැති රැයක පහන් තරුවකි ආදරය<br>සිතකින් සිතකට ආදරය කරන<br>ලොව ඇති සුන්දරම හැගිමක් ආදරය. |

| | | | | |
|---|---|---|---|---|
| 56 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | තුලාව-<br>ඝන මේඝයෙන් වැනසෙන පුන්සඳ අහසේ<br>සඳ වගේමයි සිහියෙන් අප සිත් අහසේ<br>මෙබඳු නැව් නොතිබෙයි සිහියද රහසේ<br>ඝන මේඝයෙන් පුන්සඳ වැනසෙන විලසේ<br>අද හරි දුරකයි අද සතුටෙයි නිමක් නැත<br>අද  සිතල උණුසුමින් දැහැවෙයි ගත<br>අද පඩිදවස අද නම් කිසි ගමක් නැත<br>මේ හැම දේම බෝතල් විසඳුමක් ඇති<br>මිනිසත් නුඹේ බේබදු කම නිගාවකි<br>පව්කල දෙන වේයන් සතු වගාවකි<br>තොලගා දොඩවන සමහරු අමාවැකි<br>පිබිනා දේය විදිනා දිවි වුවා සකි<br>වැටිලා මොඩයෙකු විලසින් මුලාවට<br>ලක්වි ලොකයා ට සරදම් සිනාවට<br>නුඹ කැමති නම් එන්නට දිවි තුරාවට<br>ඇසුරන් සමග පිටවියන් උදාවට. |
| 57 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | තෙත මලින් බරවී ගිය තුරුලතා වියලිලා<br>දසතත් අතින් හමා ගිය මද පවන වියලිලා<br>ගුණ දම් සරාදති සිත් තුලින් ගිලිහිලා<br>විදු නැන අනු හඬින් නව ලොක බිහිවෙලා<br>කුරිරු යුද්දයෙන් රුදිරු ගංගා ගලන<br>ක්ලොනිකරනයක් කාර්මිකරනයේ නව නිපැයුමකි කරන<br>උතුම් වු මිනස්කම නිපදවිය හැකිවේද? |
| 58 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | ගිම්හානය නිමා වි වසන්තය උදා වු සඳ<br>වැලපෙන මල් කැකුළු වල අති ප්‍රේම සුවදින්<br>සරසවි බිම වේලන්නට කාලය එලඹ ඇත<br>එත් මල් සුවද සමගින්<br>මහා මෙරක් වන් දෑ අවුරුද්දක මතකයට තනිවෙන්න<br>අවසරයි සරසවි මව්නි. |
| 59 | | poster | Wall paper/Poster/ other publications | බොන්නට තියෙන දිය පොද නවතන්නේ කවුරු<br>නැවතුන බවක් නැත නිහීන කොටි සතුරු<br>බිදලිය යුතු බැවින් කොටි බලමුලු යුද පවුරු<br>සටන් කලේ ජය ගන්නට මාල් ආරු<br>උදාකරනු නියතයි සාමය මෙවර<br>නොනිදා කරන මෙහෙයකි අමර<br>විහිදන ගසක් මෙන් සුවිසල් අතුපතර<br>මුදවා දුන්නේ කිලිනොච්චිය මා මිතුර<br>දිනයෙන් දිනය යයි පෙරටම අපේ විරුවෝ<br>බිය නොහදුනයි ලක් මවගේ විරු දරුවෝ<br>දැන් වෙව්ලන්නේ අවසන දැන කොටි හතුරෝ<br>ජය වෙයි ඔබට සිරිලක් දරුවෝ. |

| | | | | |
|---|---|---|---|---|
| 60 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | ජීවන මඟ<br>ජීවන මගේ සොඳුරුතම නිමේශයේ<br>මතුදම් හින දොරකට ලගින්<br>ඇවිද ආවා ආදරෙන්<br>නිල් කඳුලැලි නෙතු පියන්<br>මගේ දෑසින් දුර ගියාට<br>රත්රං පාට සුන්දර හිනෙක<br>මතකයන් තිබේ නුඹහිටි වගට<br>සදට තරු වෙන් කොට සගවා<br>හඳ ගැබේ නිදන්කර නුඹ<br>මට මතක සුවදකි හැමදාම. |
| 62 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | දස දහස් වේදනා කම් කටුළු ඇස ගැටුනු<br>නන් වර්නයෙන් සිහින පෙන බුබුලු<br>මතු කරන විශ්වයේ<br>රුදු අඳුරු ගැබ තුලින්<br>සැනින් සැනින් මතු වි නැසෙන<br>මහා දිග සුසුමක්ය ජිවිතය. |
| 64 | | toilet | Jim/ Canteen/ Samar hut / Toilet | චු බර හැදුන විට කවුරුත් එන්නෙ මෙතනට<br>වට පිට කැත නොකොට<br>චු කරන්නකෝ හිතේ හැටියට. |
| 65 | | සිංහල සංස්කෘතික සංගමය | Wall paper/Poster/ other publications | පැය දහසක්<br>නෙත දල්වා<br>පොත් පිටුතුල<br>සැඟවි ගෙන......<br>අදහස් දහසක්<br>පරදා<br>ජය ලැබුවත්<br>පිලිතුරකින්....<br>තවමත් ඔබ දිනුවේ<br>නැත<br>නුඹහදවත<br>ජයඅරගෙන....<br>නගේ මලේ<br>හෙට දිනකට<br>පුබුදුවන්න<br>යහපත් ලොව.... |

| | | | | |
|---|---|---|---|---|
| 66 | | සිංහල සංස්කෘතික සංගමය | Wall paper/Poster/ other publications | සොයා දෙන්න<br>අතරමං වූ මගේ<br>කවි සිත<br>චුම්බකයක ඇලවිලාද<br>ආහාර ජාලයක<br>පැටලිලාද<br>සිතා ගන්න බෑ |
| 67 | | සිංහල සංස්කෘතික සංගමය | Wall paper/Poster/ other publications | කිසිදා නොදුටු ඔබ<br>නොසිතූ නිමේෂයක<br>මා දෙනෙත් අභියසට<br>එබී කියූ ආදරය<br>මහද නැගී ප්‍රේමයයි ප්‍රථම<br>අල්ප මාත්‍රාවකින්වත්<br>අඩු නොවෙයි<br>පවතින තුරාවට<br>දිවි මේ ඉර හඳ දෙකම<br>දහසකුත් කම් කටොළු<br>ආදරයෙන් ජය ගන්න<br>ඔබ මගේ හදවතේ<br>හැමදාම ළඟ ඉන්න. |
| 69 | | පොස්ටර් | Wall paper/Poster/ other publications | විවිද ජාතින් . විවිද ආගම් ,<br>විවිද භාෂා , විවිද මතවාද<br>නමුත් එකම රටක්<br>ශ්‍රී ලංකා<br>රණ විරුවනි කිසිවෙකුත් නොමැත<br>මෙරට ජයගන්න<br>නුඹලා අපට මහත් ගෞරවයකි. |
| 70 | | පොස්ටර් | Wall paper/Poster/ other publications | දෙරණ ගගුලා හැලෙන<br>ගිනි අවි හඬින් තැති ගත්<br>හිසට වහලක් අහිමි මිනිසුන්ට<br>එකම පිහිට නුඹමයි. |

| | | | | |
|---|---|---|---|---|
| 71 | | පොස්ටර් | Wall paper/Poster/ other publications | විදිමින් සතුරු කොටි බලමුලු සතර අතේ<br>ලෙලදෙයි සිංහ දජ නැගෙනහිරේ<br>ගනිමින් අනසකට දවමින් වන්නිකරේ<br>විරුවනි නුඹ අතෙහි නිදහස ලක් දෙරනේ. |

| | | | | |
|---|---|---|---|---|
| 72 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | කෙලි කවට සිනා මැද<br>ගත කල ඒ සොඳුරු ළමාවිය<br>සඳු හිරු වන් මා පිය තුරුලේ<br>අදත් රැඳි ඇත මා සිත පතුලේ<br>එවන් වූ සෙනෙහස සමගින් ගත කල කාලය<br>පස් හෝ සය වසරකට සීමාවුවකි<br>කඳුලින් බොඳවුණු ඒ සොඳුරු අතීතය<br>එනවා නම් යලි මා ඉදිරියට<br>නෙත් පිරුනත් කඳුළු වලින්<br>ඉන්නම් ඒ කඳුළු වලට<br>පොලොව සිපගන්නට නොදි<br>දුක තිබුනත් හද පුරාම<br>හදපතුලේ රදවා ගන්නෙමි<br>සදේ තනියම තරු දෙකක් සේ<br>උන්නත් මා සමග ඉතා කෙටි කාලයක්<br>සැගවුනා ඔබ දෙදෙන<br>ඝන මේඝ වලාකුළු අතරේ<br>තනිකමින් පිරුණු ලොව<br>අතීත සිතුවම් සිතෙහි සැරිසරන කල<br>ඔබ දෙදෙන සිහිවෙලා<br>සිත ඉකිබිදින කල<br>නෙතු කඳුලැලි ගලනවා<br>සිහිවෙලා සාගරය වන් මාපිය සෙනෙහස<br>මේ භවේ මිරිගුවක් වන් ඒ සෙනෙහස සොයා යමි<br>මුවැත්තියක සේ<br>පුරමි පාරමි මින් මතු හැම භවයෙම<br>අහිමි වන්නට එපා කිසි දිනෙක, කිසිකලෙක ,කිසිවකුට<br>මාපිය සෙනෙහස. |
| 74 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | අම්මා<br>ආදරය නිසා ලොව එළිය කල පායන හිරු සඳු<br>දෙවෙනි නොවෙයි කවදත් නුඹ නම් මගේ ලොවට<br>නුඹේ තුරුලේ උණුසුම් මැද උතුරා යන සතුට<br>තවම දැනෙනවා අම්මේ නුඹේ ආදර පුතුට<br>නුඹ සෙවනේ රුව පෙන්වා සතුටින් අපි බැල්මේ<br>ආදරයක් තිබේ නුඹ හෙලනා බැල්මේ<br>කල ඇවිදින් නිතර වදියි නිසසල ගල් බැම්මේ<br>ඊට වඩා මගේ සිතට නුඹ එනවා අම්මේ<br>නුඹේ තුරුලේ රැඳි උණුසුම සොයමිද මම කොතැනේ<br>සරසවියක වරම් ලබා නුඹ මා අද<br>පුදුම දුකකි ජිවිතය සෝ දුක් නැති නිම්මා<br>පව්පින් ගැන කියා දෙමින් අප නිසිමග දැම්මා<br>දනින් වැටි දෙපා වදිමි<br>මතු බවයෙත් නුඹ වේයන් මගෙ ආදර අම්මා . |

| | | | | |
|---|---|---|---|---|
| 76 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | පිපුණු ද සිට<br>මා මෙලොවේ<br>තව සුපිපෙන්නට<br>රැක ගත්තේ ඔබයි<br>ආදරයේ දෙනෙතින්<br>කරුණාවේ දෑතපා<br>මිනිසත් බව මට දුන්නේ ඔබයි<br>දියුණුවේ මං පෙතේ<br>පෙන්වා දි<br>මට ලොකය දකින්නට<br>ඉඩදුන්නේ ඔබයි<br>බුදු රද අභියස<br>අතැගිලි එක්කර<br>සැමවිට පතන්නෙමි<br>වෙන්න මගෙ පියා වී<br>හැම වාරේ. |
| 77 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | මේඝ වලාවක<br>නැගිලා හෙමිහිට<br>වැහි නැති කතරට<br>වහින්න ආසයි<br>ගිනියම්අව්වේ<br>දැවෙනා පොලොවට<br>මද පවනක් වි<br>හමන්න ආසයි<br>මල් නොපිපෙන<br>කටු අකුල් මානෙක<br>කුසුමක් සේ<br>සුපිපෙන්නම ආසයි<br>යුධබිම සැහැසිව<br>අවි ගැටෙනා විට<br>මෙන් දැහැනක් වි<br>හිදින්න ආසයි . |
| 78 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | හින් හිනා පිපුණාට මුවේ<br>නැත ආල හැඟුම සඟවා හිතේ<br>හීන ලොවේ දුර යන්න එපා<br>ඉටුනොවන පැතුම් පුරවාන සිතින්<br>වාන් දමා පෙම වාවා ගනින්<br>උණු කඳුළු ගඟක් ගැලුවාට නෙතේ<br>පහන වගේ මම ඉන්න තැනේ<br>අමනාප නොවන් නුඹ මගේ නොෙ. |

| | | | | |
|---|---|---|---|---|
| 79 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | මවිනි දයාබර<br>සමහරක් දවසට හවසට<br>රැට හඳ වට කොට<br>තරුමල් පිපෙන කොට<br>නැගෙයි මගෙ සිහියට<br>මවුනි, ඔබේ ගුණ සුවඳ.......<br>දහස් ගව්වක් දුර<br>ඉමක් නොපෙනෙන ඈතක<br>සිටියත් මවුනි , මට<br>ඇසෙයි දෙසවනට<br>ඔබේමෘදු කටහඬට.....<br>එන්න හිතයි පියාඹා<br>ඔබව දැක ගන්නට<br>අනෙ....! ඔබ තරමට<br>මගේ දිවිය සනහන්නට...<br>වෙහෙසනා දුක්බර මවක්<br>අහෝ මෙලොවෙම නැත<br>මවිනි , මගේ ආදර...... |
| 80 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | දයාබර නුඹ<br>අමාවක අහසට<br>පෑ පුන් සඳකි නුඹ<br>ගන අඳුර දවාලන<br>නොනිමි පහනකි නුඹ<br>ඉඩෝරය දුරු කරන<br>සිහිල්වැහි බිඳුව නුඹ<br>වසන්තය කැන්දන<br>සුමුදු පිණි බිඳුව නුඹ<br>හදෙහි දුක නිවාලන<br>මුවේ හසරැල්ල නුඹ. |
| 81 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | මෙය විටක<br>කියා ගන්න බැරි තරම්<br>සුවදින් යුත්<br>සුන්දර ලොකයකි<br>තවත් විටක<br>කුරිරු වූ අසුන්දර<br>ලොකයකි<br>කෙසේ නමුදු<br>පිවිතය පිවිත් කල හැක්කේ<br>මේලොව ආදරය සමගය |

| | | | | |
|---|---|---|---|---|
| 82 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | බෙර ,Music ,Announcing,Drama නැටුම්සද්දේ<br>රැව්දුන්නා සරසවි බිම මෙතුවක් කල්තිස්සේ<br>වෙහෙස වෙලා රැපුරා වීදි කරදර මැද්දේ<br>මතක නේද උගුර පවා සැගවුවා සද්දේ<br>නැටුනැටුම් මතකද නුඹ වැයු බෙර හඬ මැද්දේ<br>නිදිමත ඇස නැති කරන්න මතකද ගත් කල්කේ<br>අමතක නැ නේද එදා Dj වල සද්දේ<br>එ මතකෙට නැගෙනා විට හදවත මගෙ ගැස්සේ<br>දෙමාපියන් නෙතග කඳුළු පුරවා රැ සිත්සේ<br>නුඹ දස්කම් ගත සැලුවා තුටු සගවා චිත්තේ<br>අලුත් යමක් හෙට කරන්න පැතුම් මවා සිත්සේ<br>69 වන පරපුර ඇත<br>අද හසරැලි නැති<br>සියල්ලොම එකට සිටින<br>වාද බේද නැති<br>ගතට වඩා සවිබරවු<br>දිරිය සිතක් ඇති<br>69ට ගම දෙනවා අපි. |
| 83 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | වනු නොහැකි නම් ඔබට<br>උසම උස ෆන්නස් ගසක්<br>වනු මැන මිටියාවතක<br>පුංචිම පුංචි තුරු වදුලක්<br>හැබැයි හොදම තුරු වදුලක්<br>ලොවෙහි කවුරු වුව කම් නැත<br>සිටිය යුත්තේ හොදම විලසිනි<br>දිනුම පැරදුම මැන බැලනුයේ<br>ලොකුම නොව<br>හොදම යන මිනුමෙනි. |
| 85 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | ජිවිතයට අරුතක් එක් කල<br>වාසනාව ඔබයි මගේ........<br>අභියොගයක පෙරමුණ ගන්න<br>වලාගැබින් මිදි පායන පුන් සඳසේ<br>ගණ අදුරෙන් මුදවාගෙන<br>මිණි පහනක් කල විල් කලාව ඔබයි<br>නියඟයට අසුවු<br>මුවැත්තියක සේ<br>ජල බිංදුවක් සොයාගෙන යන ගමනේ<br>දිය බිඳකින් මා පොෂනය කර<br>ඉදිරි ගමන් මගේ<br>නැණ පහන් දැල් වුයේ ඔබයි....<br>මා කොනක සිටියත්<br>දසත ආලෝකය විහිදුවන්නට<br>මට මුල් අඩිතාලම වු මගේ විදු විමන<br>මගේ සිතින් ගිලිහි නොයේ..... |

| | | | | |
|---|---|---|---|---|
| 86 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | තනිකමට සින්න වුණු<br>මගේ යොවුන් ජීවිතේ<br>පැතුම් ගොන්නක් නොවී<br>සුසුමක්ව දැවටෙන්න<br>අඳුරු මගේ කුටිය තුල<br>තනි වුණත් සඳකිරණකදෝ<br>පැණියකු විලස පහන් එලි<br>දල්වන්න.<br>තුටු සිනා මල් තොදිසි<br>වාලුකා දිවි කතර<br>කඳුළු බින්දුවක් වෙලා<br>සිසිලසක් ලැබ දෙන්න<br>සිත හිරිගඬු පිපෙන<br>හුදෙකලා නිශාවේ<br>ගතට උණුසුම දැනෙන දුරක ලංවී ඉන්න මගේ<br>දෙනෙත් නිසල වී වැතිර ගත් හෝරාවේමගේ කවියක්<br>වෙන්න. |
| 88 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | දෑල නෙතුසලා හිම්හිට<br>කීව මෘදුකතා එදවසක<br>පාවගොස් හෙම්හිට<br>කොහෙද නැවතුනේ....<br>කප්පරක් පැතුම් එක්කර<br>ළය මතේ තබා හෙම්හිට<br>දුන්න පෙම්තිලිණ ඇතට<br>යන්නටම ගිහින් තිබුනට<br>බිංදුවක තරම් අහිතක්<br>නොවේ මගේ සිතේ..... |
| 89 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | පහන් සිලක් වනු මැන<br>මුළු ලොව එලිය කරන<br>මඩ ගොහොරු මත පිපෙන<br>සියපතක් වනුමැන<br>මුළු ලොවක් සුවඳ කරන<br>අඳුරට එලියක්ව<br>කටු අකුල් මැද මලක්ව<br>පිබිදෙන්න හෙට ලොව<br>සුවදවත් කරන්නට. |

| | | | | |
|---|---|---|---|---|
| 90 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | දිරිය සවි දුන් මා හට<br>මේ ලොකය ජයගන්නට<br>බුදුන් නොදුටු මගේ ලොවේ<br>බුදු හිමියන් ඔබදෝ අම්මේ....<br>සඳ කිරණයි එලිය දුන්න<br>දිය දොතයි සිසිල දුන්න<br>බුදු හිමි ලෙස මෙත් පැතිරුන<br>විශාබාව ඔබදෝ අම්මේ...<br>හොඳ මගකට යන්න කියා<br>දුන් ඔවදන් තුරුලේ හොවා<br>අඳුරු මගෙහි මඟ පෙන්වූ<br>පහන් සිසිල ඔබදෝ අම්මේ..... |
| 92 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | මේ දිවි කතරේ හමුවු<br>එකම බොසත් ආත්මය ඔබයි ,<br>මේ වාලුකාවේ ඇති<br>එකම දිය විල ඔබයි<br>දයාබර මව්නි පියතුමනි .....<br>බිහිවුදා සිට මෙලොවට<br>කවා පොවා ඇති දැඩි කල මව<br>නෙතට නිදි නොලැබ<br>කුසට අහරක් නොමැතිව<br>ශිල්ප සතර ලැබ දෙන්නට<br>විදු මව් තුරුලට මම යොමුකර<br>දැගිලි ගත්තා ඔබ දෙදෙනා<br>තරණය කරන තුරු ශිල්ප තොටුපොල<br>ණය ගැතිය ඔබට මම<br>සෙනෙහසින් පෙවු කිරි කඳුලට<br>කාශ්ඨක අව්වේදි හෙලුදාබිඳුම<br>නුපුරුදු මාවතක පියමං කරන විට<br>චංචල වුණා මගේ සිත<br>ඔබේ සෙනෙහස සිහිවි<br>බුදුන් වදින මේ දෑතින්<br>නමදින්නෙමි ඔබ දෙදෙනාගේ<br>පින්වත් පායුග.... |

| | | | | |
|---|---|---|---|---|
| 94 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | ජිවිතය ජිවත් කරවන්නට<br>පැතුම් එක්කල<br>නුඹ ආදරය නම්<br>කිමැයි මට පසක් ගැන්විය<br>මහද ගැහෙන රාවය<br>හැදින ගත් එකදු<br>සෙනෙහෙබර හදවතක්<br>මා අඳුරු සිත් ගැබේ<br>ආලෝකමත් පහන් සිළුව වු නුඹ<br>ගත දැවටිහමා ආ<br>මුදු සිහිලැල් මද පවනයි<br>ආත්මය වසා පැතිරුන<br>විශ්වාසයේ සෙවනැල්ලයි මා<br>ජිවිතයේ පිදුම් ලද<br>ඔබේසෙනෙහස<br>දෙවොලක්මයි. |
| 95 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | මා මළ පසු මගේ සොහොනේ<br>තනි වු කුසුමක් වි පිපෙන්න<br>මා මෙතුවක් හෙලු කඳුලැල්<br>පිණිබිදු වී එහි රුදෙන්න<br>දිවි ඇතිද නැති සෙනෙහස<br>එපා කඳුලු නැවති සිනහවකින්<br>මගේනමට සුභ පතන්න<br>මළ බෙර මල් වඩම්එපා<br>සුදුවැලි ඉසිරු මල් පාරේ<br>ඔබ විතරක් ඇවිත් යන්න.... |
| 96 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | ක්ෂිතිජ ඉමේ ඈත කොනේ<br>පුංචිතරුව වී දිලෙන්න<br>අහස් ගඟේ ජල තලයේ<br>කුසුමක් වි පාව යන්න<br>පුංචි වලාකුලක් වෙලා<br>ගඟන තලය පිරී යන්න<br>තුන් ලෝකයෙම ජය අරගෙන<br>නුඹේ දෙපා වැලඳ ගන්න<br>පුංචි පුංචි හීන පොකුරු<br>බිංදු බිංදු ඇහිද ගන්න<br>සිහින් හිනා මන්දහාස<br>නිතර දෙතොල් අග රැදෙන්න<br>අනාගතේ පුංචි පැතුම්<br>පුංචි සිතේ රදව ගන්න<br>මම ආසයි ඔබේ හදේ<br>පොඩි කුටියක ලැගුම්ගන්න. |

| | | | | |
|---|---|---|---|---|
| 98 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | කෝපි මල් සිනා පිපෙනා<br>පින්නෙ මේ උදේ- ගුම්නද දී ගීත ගයයි<br>මේ මැයි මාලේ - සිත සුලං හමා ඇදෙන<br>අරුණලු යාමේ නැවුම් හැගුම් සිතට දැනේ<br>කිම මේ අරුමේ<br>සිතිවිලි සයුරෙහි රළ පෙළ<br>නැගෙන යාමයේ<br>දකුනත සිරවී නැලවෙන<br>පන්හිද තුඩගේ<br>සමනල නටුවක ලියැවෙන<br>සොඳුරු ගීතයේ<br>ජිවිතයට අවැසි අකුරු<br>හතර ලියැවුණේ<br>කිසිදා නොදුටු ඔබ<br>නොසිතූ නිමේෂයක<br>මා දෙනෙත් නිමේෂයක<br>එබී කියූ ආදරය<br>මහද නැගී ප්‍රේමයයි ප්‍රථම. |
| 99 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | ආදරණීය නගේ මලේ<br>ඇත්තටම අළුත් වෙනසක්<br>දැනෙන දවසක් අද.........<br>කෙච්චර සතුටක් ඇත්ද ඔය පුංචි හිත් පොඩිවලට හා<br>හා පුරා කියලා සරසවි බිමට පිය නගන්න පුංචි බයක්<br>නොදැනුනා මත් නොවෙයි නේද?.....<br>ඒත ඒ හැම දේකටම වඩා වඩා අනාගතේ<br>ගැන මහ හුගක් බලාපොරොත්තු ජිවිතේ ගැන<br>මැවෙන මල් හීන මේ හැම දෙයක්ම නුඹේ හිතේ<br>කැකැරෙන බව දන්නවා අපි......<br>විශ්වාස කරන්න......<br>සතුට දොර ගලනවා අපේ හිත් වලත් නුඹ තරමට<br>සමහරවිට ඊටත් වඩා ,මොකද අපේ පරපුරේ ඊළඟ<br>පුරුක වෙලා නුඹ අපි ළගට එන නිසාවෙන්ම..... |
| 100 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | සුන්දර වු සරසවි සහිනය බොදව යා නොදි නුඹසිත්<br>මලෙන් සැබැවුවා නොවේ ද අද දිනේ දනිමි අප....නව<br>සිහින ගොන්නක්ම ඇති බව නුඹ මොලොක් සිත් මලේ<br>සැබෑ කර ගැන්මට එම සිහින හෙට දිනේ දිරිය ගෙන<br>පිය නගමු සුන්දර මල් පියලි මෙන්ම අසුන්දර<br>ගල්මුල්ද රැඳුණු ඒ......<br>ජයමාවතේ ....... |

| | | | | |
|---|---|---|---|---|
| 101 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | එසේ වී නම් ආදරෙන් මට<br>සුරගෙන වලදිති නුඹ<br>බෙදාගත් බත් පත<br>පුළුවන්ද පුදන්නට<br>දොරකඩ පුලන්නෙකු<br>දුටු විට<br>නව කැළනි පාළම යට<br>ගඳගහන මුඩුක්කුවක<br>නාවර හෙළුපෙරාගත්<br>දරුවකුගේ හිසආදරෙන් අත ගා<br>"පුතේ " යැයි කියන්නට<br>හැකිනම් නුඹට<br>ඔහු ගැන අහිතක් නොහිතාම<br>මා නුඹට ආදරෙයි |
| 102 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | දඬුවම<br>නුවන් යුග රතුවෙලා<br>දොඩමළුව සිටි ඔබ<br>දැන් සැවොම ගොළුවෙලා<br>අරුත් නැති ගීතයේ<br>පැතුවම තනිවෙමු<br>සමාවක් අයැද ඔබ<br>දඬුවමක් හිමිවෙලා |
| 103 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | සදාදර පියාණෙනි<br>සුදුගවුම පොඩිය ඇඳගෙන<br>අතේ එල්ලි ඔබේ<br>අකුරට පිය නැගුවා එදා<br>මතකයි අද මාගේ<br>එදා මෙදා තුර අපේ සෙනෙහස<br>මහ මෙරක් වී<br>ලොවක් දිනන්නට<br>දිනක් ඔබ හඬවා<br>මා පිය නැගුවෙමු<br>ගෙන්දගම් පොළවට<br>සැපක් යැයි සිතා<br>පියනැගුවෙමු එයට<br>එහෙත් සොදුරු පියාණෙනි<br>සැපතක් නොවුණත් මෙදා<br>වෙරගනිම් මම<br>එය ඔබට සැපතක් කරන්නට |

| | | | | |
|---|---|---|---|---|
| 106 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | I saw you<br>When you close  you eyes<br>How  win see you<br>It dear<br>You lovely face<br>You lovely  smile too<br>Tried to remember<br>What are you thinking<br>With<br>How could do it when<br>Tired to remember you<br>My eyes also closed |

| | | | | |
|---|---|---|---|---|
| 107 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | ආවර්ජනාව<br>නෑ තවත් ආයචනා නම්<br>අකම්පිත නියොග මිස<br>මායිමක් නොහදුනන<br>දෑගකාර සිතක හිතුවක්කාරකම්<br>තේරුම් ගනිද<br>නුඹත් එවන් සඳකට<br>පෙම්වතියක් වීනම්<br>අහිංසක ආදරය<br>අවලම් ආලයක් කර<br>නුඹේ අර්ථ දැක්වීම<br>ඒ අරුත් මග නොදත්<br>නුඹ කළ කිදෑ හුදෙක්<br>ද්‍රොහි කමක්ම පමනක්<br>බව දැනගනීවී<br>නුඹට අසනිස වූ<br>අසරණ තත්වය<br>යලි පණලැබුදාට<br>නැවත සිතන්න<br>දයාබර හොදම මිතුරිය<br>දිනක් පහන්වෙයි<br>නුඹ වැරදි බව<br>සුරගනක් වී නමුත්<br>නුඹ සුරගනක් නම් නොවෙවී<br>චපල මිතුරියක් මිස<br>දැනගනි තොප<br>සාපලත් බව<br>නුඹ විරසක කළ සිත<br>වැලපුනදාට |

| | | | | |
|---|---|---|---|---|
| 108 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | දුක සතුට සිදුවන අරුමය<br>මද පවනේ මැව් මැවී<br>මවයි බෝ රූ රටා<br>මට දැනෙයි<br>මට සිතෙයි<br>මිරිගුවක් දෝ<br>මිතුරෙකුට හැකිවුනා<br>ළංවෙන්න ඔබ ළගට<br>මත්වෙලා ඔබේ රුවට<br>මා මිතුර<br>එලෙස ඔබ දන්නෑ<br>මටද එය වැටහුනේ<br>මා මිතුර අළුවෙලා<br>යනවිටදි ඔබතුලින්<br>ඇතත් තව සතිබොහෝ<br>මෙලේසටම යයි<br>නසීව් ඔබතුලින්<br>මා කෙලෙස උන් රකිම්<br>මා සිතද උන් සොරාගෙන ඇති<br><br>මට සිතේ මට දැනේ<br>නුඹද චපලස්ත්‍රියක් ලෙසද<br>දිලෙමින් බැබලෙමින්<br>වශිකූත සිත් අපේ<br>සොරාගෙන ආදරෙන්<br>දිනෙක යයි සිත දවා |
| 110 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | පුංචි බණ්ඩියක් පරෙන තුරු ඔබගේ<br>තනකිරි උරා බිව්වා ඔබ මව් තුරුලේ<br>අඳදින තුරුණු විය ගෙවනා සරවියේ<br>විසදුම උරණු කියපන් නුඹ මිතුරේ<br>දහඩිය බිදුහෙලා වෙහෙසන පියතුමන්<br>උපයන මුදල් ඉගෙනිමට දුන් නමුත්<br>මතට දුමට යොදවනු කිම මෝඩයන්<br>නුඹට සමාවක් නැතපුතු මතු මතුත්<br>මල් සුරුට්ටු ගත් දැතින් කිසිදිනේ<br>වදිනු එපා මව්පිය පා දරුවනේ<br>මල් පොහොට්ටු බැතියෙන් ගෙන අතේ<br>පලයන් පන්සලට පව්කල මිතුරනේ |

| | | | | |
|---|---|---|---|---|
| 111 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | මිතුරු දම<br>මිතුරු නැති දවසට<br>අත්වැලක් විය කටුවැලක් යන මග<br>අහඹුවෙන් හමුවූ දයාබර සොයුරනේ<br>යනමග අහඹුවෙන් හමුවන<br>සිනහවක් නොවේ මිතුදම<br>යන මග වරුවන්ට<br>මල්වැලක් වී නම් එයයි මිතුදම |
| 112 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | සිහිනය සිහිනයක්ම පමණයි<br>වසන්තයේ එකදිනෙක<br>ඔබ හමුවුනා<br>එකට සිනාසී කෙලි කවට කම්කල<br>යුගයක්ද තිබුණා එදා<br>සිනා කෙලි අද<br>ඔබසමග ගෙවුසේ<br>අතිතය සිහිකර<br>සිහිනය සිහිනයක්ම<br>බව නොවැටහෙන<br>ඒ අකීකරු කීමට<br>ඔබ හැරගිය බව<br>කෙසේ පසන් කරමී දැරිය<br>නොවැටහෙන මට |
| 113 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | සමනලිය<br>සුරතල් කතා බොහොමයි<br>කෙලි කවට අපමණයි<br>මුතුසිනා මණ බදියි<br>දඟ මල්ල නුඹ තමයි<br>හැමගේ පුංචි සුරතලී<br>අත්තම්මගේ මිණිබිරි<br>දඟකාර සුරතලී<br>ඒ තමයි සමනලී |
| 114 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | වෙරළ හමුවෙන සයුරු රළ පෙළරැගෙන<br>යයි පොළොවෙන් බිඳක්<br>මල් හමුවන හැම මොහොතකදිම රැගෙන<br>යයි මහදෙන් එකක්<br>දැවෙන දැවෙන ගින්දර දවයි මුළුලොව<br>ඉතරි කරමින් මහ බරක්<br>මුණගැහෙන හැම මොහොතකදීම ඔබ<br>ඉතිරි කර යයි මහ දුකක් |

| | | | | |
|---|---|---|---|---|
| 115 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | නොලැබ් රුව<br>රුවක් දුටුවෙමි හැර<br>හැඳින ගත්තෙමි<br>ඇය කවුද<br>කොහොමද කියා<br>කිමද මාසිත<br>නිතර ඇවෙත<br>ඇදි යන්නේ<br>නොදැනිමා<br><br>නෙතට සැනසුම<br>ගෙනෙන ඇදසුන<br>නොදැක සිටින්නට<br>නොහැකිවා<br>සගව ගන්නේමි<br>මගේ සිතුවිලි<br>මගේ සොයුරියක<br>යැයි සිතා |
| 117 | | ප්‍රභාතය | Wall paper/Poster/ other publications | ආදරණිය bnddy ට<br>ආගන්තුක සිතුවිල්ලක පැටලී<br>කල්පනා ලොවක අතරමංවී<br>සිත සොයන සැනසිසිල්ල ලබන්නට<br>දනිමි ඔබට හැකිබව ඉවසන්න<br>රැඳි ඉන්නට වරම් ලැබූ මට<br>පතනා සිත් අහස් යට<br>දිරිදෙන්නම් නුඹට<br>සෙවනැල්ල වී ලගින් ඉඳ<br>කඳුළු උණුහුම සුව දැනුන මොහොතක<br>දැනෙව් හදවතට නුඹ මහ මෙරක් බව |

| අංකය | Selected | ස්ථානය | Location | ගීතය |
|---|---|---|---|---|
| 1 | | ප්‍රධාන පුස්තකාලය | Library/ Lecture hall | ඔබ ශුද්ධවන්තයෙක්ද<br>ඔසේ නම් මම ඔබට ගරු කරමි<br>ඔබ ශුද්ධ වන්තයෙක් නොවන්නේද ?<br>එසේ නම් මම ඔබට ගරු කරන්නේ<br>අනෙකාගේ වරදේදි<br>උපේක්ෂා වන්නේ නම් පමණි. |
| 2 | 1 | ජයතිලකශාලාව කාමර18 | Hostel | නිමාවිය වසන්තය සරසවිය සැරිසරා<br>ගම රටට යා යුතුයි දැන් ඉතින් පය ගසා<br>කාටවත් නොපෙනෙන්න සිතින් ඉකි ගස ගසා<br>නුඹෙන් සමු ගනිමි සමු නොගෙන බැරි නිසා |
| 3 | | කලාපිඨදේශනශාලාව | Library/ Lecture hall | දහවල් කලට ඇදිරිඳු වාසනාවන්<br>සැන්දෑ කලට කෙල්ලන් පනාවන්<br>රෑ තුන් යමේ මදුරුගෙ ගායනාවන්<br>එලිවෙන පැයට නිදි දුව වාසනාවන් |
| 4 | | කලාපිඨදේශනශාලාව | Library/ Lecture hall | සිරිපාලගේ දේශනාව<br>අපට හරිම වේදනාව<br>කිමද ඊට කාරනාව<br>මාරි ගැනයි කල් පනාව |
| 5 | | භික්ෂු නේවාසිකාගාරය | Hostel | ගිම්හාන කාලයට බෝ ගසකින් බෝ කොලයක්<br>වැටිම අරුමයක්ද ? |
| 6 | | ප්‍රධාන පුස්තකාලය | Library/ Lecture hall | ලස්සන නැති කෙල්ලන් ආවයි වා සිටියේ<br>ලස්සන නැති නමුත් සීදේවිය වාසිටියේ<br>ගියෙමි ගියෙමි පස්සෙන් සිත ගන්නට බැරියේ<br>මම පමණයි කෙල්ලන් නැති කොල්ලා වාසිටියේ |
| 7 | | වෛද්‍යපීඨය | Jim/ Canteen/ Samar hut / Toilet | දේශ දෝහි ජනපති මළ සොහොන් යකා<br>වැජඹෙනහැටි බලව් අප මල මිනී කකා<br>තව කල් බලනු කුමටද මේ අයුරු දැකා<br>ජනයනි වරෙව් කන්නට ඔබේ ඔබේ බොටුව විකා |
| 8 | | වෛද්‍යපීඨයආපනශාලාව | Jim/ Canteen/ Samar hut / Toilet | අප වෙනුවෙන් ඉදි වන යදම් පවුරු බිඳ දමා<br>අපේ අයිතීන් දිනන්නෙමු<br>තොපේ ජිවිත බිදගෙන වුවද ? |
| 9 | | ප්‍රධාන පුස්තකාලය | Library/ Lecture hall | විභාගය අත ළග<br>අත පොත ළග<br>පොත හිත ළග<br>හිත ඈ ළග<br>ඈ ඌ ළග |

| | | | | |
|---|---|---|---|---|
| 10 | | ජයතිලකශාලාව කාමර18 | Hostel | ශිල්ප කබලෙන්<br>ලිපට වැටුනි<br>ඈය මගෙන් වෙන් වු දිනේ |
| 11 | | ප්‍රධාන පුස්තකාලය 5වනමහල | Library/ Lecture hall | ගුණේ අයියා පැමිණෙන්නේ<br>බුත් සරණ අර ගන්නේ<br>හොඳින් කියවන්නේ<br>අපිට නිදි දෙවි දුව ළගා වෙන්නේ<br>නින්ද නොයන අය හොඳ හැටි අහගන්න<br>ගුණේ අයියාගේ දේශනයට පැමිනෙන්න<br>අසුනක් අරා හිඳ දෙසුමට කන්දෙන්න<br>නිදි දෙවි දුව උරයි තොල් පෙති සැනෙකින්න |
| 12 | 1 | පැරණි එකක් | Library/ Lecture hall | බඩ මැද කලිසම ඇඳගෙන<br>තට්ටෙ තෙල් තවරාගෙන<br>ව්‍යාකරන පොත අරගෙන<br>විජේ අයියා එයි විගසින<br>තට්ටයා ව්‍යාකරණ කරයි<br>කෙල්ලෝ කොල්ලෝ<br>ජොලියේ කතාකරයි<br>උන්ගේ කෑ කෝ ගැසිම් අස්සේ<br>තට්ටයා ව්‍යාකරණ කරයි<br>"තට්" ධාතුවට 'ට' යන්න<br>ආදර්ශ විමෙන් හා<br>"යා" ප්‍රත්‍ය එකතු විමෙන්<br>තට්ටයා පදය සෑදෙන බවත්<br>ඔහු අපට උගන්වයි |
| 13 | | ජේම්ස්පිරිස්ශාලාව | Library/ Lecture hall | පෙම් කරනා හැටි මා හට<br>කියාදුන්නෙ ඔබය සොඳුර<br>එසේ නමුත් ඔබ තවමත්<br>කියා දුන්නෙ නැහැ නොවේද<br>ඉන් ගැලවෙන අන්දම ගැන |
| 14 | | ප්‍රධාන පුස්තකාලය | Library/ Lecture hall | වාසිටියේ 'පවගස" බිම වැටියන්<br>කැන්ටින් එක කරන නෝනා මැරියන්<br>ගුණෙ අයියගෙ දෙසුම් අදවත් ඉවරවෙයන්<br>බුටි දුන්නු කෙල්ලම මට වැටියන් |

| | | | | |
|---|---|---|---|---|
| 15 | 1 | ප්‍රධාන පුස්තකාලය | Library/ Lecture hall | නැත යන්න සිතක්<br>දමා ඔබ සරසවිය<br>අද ඔබට සහ මට<br>සෙවනක් දුන් හන්තාන<br>සිහිල දුන් මහ වැලිය<br>මා ඔබ දමා ගිය පසු<br>සරසවියේ තනිකර<br>පවිරක් වේවි හන්තාන<br>ඔබෙ දුක් මගෙන් සඟවන්නට බැඳි<br>සෝ ගඟක් වේවි මහවැලිය<br>ඒ දුක කියා දිව ඇදෙන |
| 16 | | දේශනශාලාව | Library/ Lecture hall | අනේ මීනුවන්<br>ඔබේ දෙසවන්<br>මගේ දෙනුවන්<br>කරයි අඩවන් |
| 17 | 1 | දේශනශාලාව | Library/ Lecture hall | පානුයි පරිප්පුයි දවසක බුදුවේවා<br>ගෝවයි අලයි සැරියුත් මුගලන් වේවා<br>කැන්ටින් හොද්ද නේරන්ජා ගඟ වේවා<br>සුප්පයියා මුදලාලි කන්ටක අසු වේවා |
| 18 | | දේශනශාලාව | Library/ Lecture hall | ජීවිතය<br>ගෙවී යනුයේ<br>පොත් පිටු අතරේය<br>කැත්තයි උදැල්ලයි උරුම වූ<br>අප හට<br>පොතයි පෑනයි හුරු වී ඇති<br>ඵලය කුමටද |
| 19 | | ප්‍රධාන පුස්තකාලය | Library/ Lecture hall | එම්බා පොත් ගොන්න මා ඔබට කෘතඥ වන්නේ<br>මා දැනුම දියුනු කලාට නොව<br>ඇයත් මාත්<br>සිප වැළඳ ගන්නා විට<br>ලොව කුරිරු ඇසින්<br>අප මුලා කලාටය |

| | | | | |
|---|---|---|---|---|
| 20 | | ප්‍රධාන පුස්තකාලය | Library/ Lecture hall | වැදූනත් හිසට හෙන<br>දත් ටික ඇතොක් නිසි තැන<br>නොතකා හෙනය ගැන<br>සිනාසෙනු උඩ පැන පැන |
| 21 | | ජයතිලකශාලාව කාමර | Hostel | නරියා හූ කියයි ඩිග්‍රිය ඌට නැත<br>එළුවට රැවුල ඇත වාසිට් ආවෙ නැත<br>මේ දෙක අපට ඇත එනමුදූ දැනුම නැත<br>සහතික මිසක් ඩිග්‍රිය නම් වැඩක් නැත |
| 22 | 1 | ජයතිලකශාලාව කාමර | Hostel | 'කළකෙනි පකද්කදා<br>ලෙකචර්ස් එන්නේ<br>දූකකිනි 'ලෙක්චර්ස්"<br>පලෝ කරන්නේ<br>කරත්තෙනුයි ඔහු<br>ගමන් කරන්නේ<br>ඇල්වතුරෙන් ජීවිතය<br>ගෙවන්නේ<br>කරත්තෙ බැඳලයි<br>ලෙක්චර්ස් එන්නේ<br>ගොනාට තණකොළ<br>චොක්ලට් දෙන්නේ<br>මෙහෙමයි පකද්කදගේ<br>කාලෙ ගෙවන්නේ<br>දින සති ක්‍රමයෙන්<br>ගෙවිලා යන්නේ<br>පකද්කදා කරත්තෙන්<br>බීමට වැටෙන්නේ<br>ඔහු නෑ කොයි කවුරුත්<br>රුැස්සන්නේ<br>ලයිබ්රියේමයි ඔහු<br>මිය යන්නේ" |

| | | | | |
|---|---|---|---|---|
| 23 | | ජයතිලකශාලාව කාමර | Hostel | ‘පිපාසය සන්සිඳුවන්න<br>මඩ වගුරකට හැකි වුවද<br>මහ සයුරට එය කළ නොහැකිය<br>එනමුත්<br>මහ සයුරෙන් ලාභ ප්‍රයෝජන ගොඩක් ලැබිය හැකිය<br>එනිසා<br>මඩ වගුර ඉවතලා<br>සයුරට පත් වෙමි ’ |
| 24 | | ජයතිලකශාලාව කාමර | Hostel | “උපන් දා සිට විඳි දුක්<br>අභවරයි සිතා ගෙන<br>අම්මේ ඔබ එනවා අපි<br>හන්තාන පියස්සට<br>එහෙත් අපටද උරුමයි<br>කටුක වසන්තයක්<br>අයියලා අපට පිරිනමන<br>දන්නවා නම් ඔබ මීහිර එහි<br>පැළී මීය යාවි<br>ලේ ගලා<br>හදවතින්““ |
| 25 | | පැරණි එකක් | Hostel | “දෙවියන්ට එපා වූ අඥෝනාව<br>ඉර හඳ ඉල්ලා<br>හඬන්නේ නෑ මම<br>මිණි කැට ඉල්ලා<br>හඬන්නේ නෑ මම<br>දෙවියනි -----<br>ඔබනේ පතනා එකම දෙය<br>කලු බට්ටිව මට<br>ලබා දෙන ලෙසයි” |
| 26 | | | Library/ Lecture hall | ‘කොපමණ වෙහෙසී<br>බුද්ධිය ලැබුවත්<br>බුද්ධින් හීනවුන්<br>මන්ත්‍රිවරුනට<br>හිස නමන්නට සිදුවි ඇත<br>බුද්ධිමතුනට<br>යදින්නකුට හිස<br>නැමිය හැක<br>මානයෙන් අභිමානයෙන්<br>හිස උදුම්මාගත් මොවුනට<br>හිස නැමිය නොහැකි මට“ |

| | | | | |
|---|---|---|---|---|
| 27 | 1 | ප්‍රධාන පුස්තකාලය | Library/ Lecture hall | විදුලි එලියයි පඬුවු පැහැයෙන් රැයේ (සිත) නෙත පෙළන්නේ<br>පාට බොඳවුණු අකුරු මතු වී දුක කිසා (ගෙන) ඉකි බිඳින්නේ<br>ඇත පැල තුල කුප්පි එලියෙන් අකුරු කරනා ළමුන්නේ<br>විසල් ලෝකෙක අතර මං මට එන්න පාරක් කියන්නේ |
| 28 | | ප්‍රධාන පුස්තකාලය | Library/ Lecture hall | උපාධිය<br>පුස්කා<br>යෞවනය වියපත්ව<br>ජිවිතය හරසුන්ව<br>මිය යයිද<br>අතර මග |
| 29 | | ප්‍රධාන පුස්තකාලය | Library/ Lecture hall | දැහැතින් මිදිම<br>ටොක ටොක ගා<br>කුර ගැටෙයි<br>අශ්වයෙක්ද<br>හරකෙක්ද<br>නැත නැත<br>පුස්තකාලයේ<br>එහා මෙහා ඇවිදින<br>ආඩම්බර කතකගේ<br>පාවහන් රිද්මයයි |
| 30 | 1 | ප්‍රධාන පුස්තකාලය | Library/ Lecture hall | මා විශ්වවිද්‍යාලයට පැමිණිමෙන්<br>දත් එකම දෙය<br>මා කිසිවක්<br>නොදන්නා බවය |
| 31 | | ප්‍රධාන පුස්තකාලය | Library/ Lecture hall | තඩි රැවුල කරකවන<br>හඬ මහත්වූ<br>ගෝනි බිල්ලෙකුවන්<br>විභාගය අත ලගය |
| 32 | | ප්‍රධාන පුස්තකාලය | Library/ Lecture hall | තට්ටු පහක් උඩ පිට වැඩ හිඳිනා<br>බොග මරුවන් උදේ හවස වඩනා<br>ඉහල මාලේ කපල් කපල් ඉඹිනා<br>සාදු සාදු පොත් ගුල් හිමි වදිනා |

| | | | | |
|---|---|---|---|---|
| 33 | | ප්‍රධාන පුස්තකාලය | Library/ Lecture hall | මගේ ගෙපැල ඔබය<br>මගේ යහන ඔබය<br>මගේ පෙම්වතිය ඔබය<br>සදාදර පොත් ගුල් රාජයාණෙනි<br>(තවත් එක් බොග මරුවෙක් නොවෙද?) |
| 34 | | ප්‍රධාන පුස්තකාලය | Library/ Lecture hall | උපාධි දරය<br>මහා දැනුම ඇත්තකි<br>පොත් රාක්ක මැදින්<br>කලබලෙන් දිව ගිය නිසා... |
| 35 | | ප්‍රධාන පුස්තකාලය | Library/ Lecture hall | ලෙඩෙක් වෙන්න පොත් වල කොල කඩාපිය<br>Class ගන්න ජෙල හොඳ හැටි කරාපිය<br>Exam එකෙන් A-B ගොඩ දමාපිය<br>ලෙඩෙක් ඩොකෙක් වී මිනිසුන් මිනිසුන් මරාපිය |
| 36 | | ප්‍රධාන පුස්තකාලය | Library/ Lecture hall | සිංහල බී සී හොඳ හැටි උණු කරලා<br>Econ, Logic දෙක ඒකට වක් කරලා<br>අම්බානෙකට තුන් වසරක් ජප කරලා<br>Campus ආවෙ එලිවෙනකම් නිදි වරලා |
| 37 | | ප්‍රධාන පුස්තකාලය | Library/ Lecture hall | අපේ දුක<br>ලොවින් වසන් කිරීමට<br>බැඳි පවුර හන්තාන -----<br>අපේ දුක<br>ලොවට හඬ ගා කියමින්<br>ගලනා නිදිය මහවැලිය ----- |
| 38 | | ප්‍රධාන පුස්තකාලය | Library/ Lecture hall | ආලයට මං බයයි<br>ඇස් රතු වන නිසයි<br>නිදිමත මට හිතයි<br>සිහින ලස්සන නිසයි<br>සෙමෙස්ටර් නම් හොදයි<br>හුදකලා වන නිසයි . |
| 39 | 1 | ප්‍රධාන පුස්තකාලය | Library/ Lecture hall | සටහන් අතරේ<br>නෙත් සිර වෙනවා<br>හදවත මාගේ<br>ඔබ වෙත එනවා<br>මා මෙහි තනිවම<br>ඔබ මෙහි තනිවම<br>දෙදනා දෙතැනක<br>සුසුම් හෙලනවා |

| | | | | |
|---|---|---|---|---|
| 40 | | ප්‍රධාන පුස්තකාලය | Library/ Lecture hall | සුදෝ සුදූ ඔබේ කලුවන් කොණ්ඩෙ සුදෝ<br>සුදෝ සුදූ ඔබේ නිල්වන් දෙනෙත් සුදෝ<br>සුදෝ සුදූ ඔබේ පියකරු මුහුණ සුදෝ<br>සුදෝ සුදූ ඔබේ මුලු ඇගම කලුයි සුදෝ |
| 41 | 1 | ජේම්ස්පිරිස්ශාලාව | Hostel | තුරු ලතා ඉකි බිඳියි<br>ගිම්හාන රාත්‍රියේ<br>සඳ කිරන ඔබ වන්න<br>සඳ සිසිල ඔබ වන්න |
| 42 | 1 | ජේම්ස්පිරිස්ශාලාව | Hostel | තෙවසරක අවසානය උදිවිය<br>නමුත් සරසවිය මවුනි<br>ඔබ හැරදමා ගමට යන්නේ කේසේද<br>නමුත් අප යා යායුතුය<br>තවත් පිරිසකට ඉඩ දි<br>මේ සරසවි බිම |
| 43 | | ජේම්ස්පිරිස්ශාලාව | Hostel | සරසවි කල්කයේ යථාර්ථය පරිදි<br>සාවුන් මුවන් සේම නයි පොළගුන්ද<br>සිටින බව වටහා ගැනීමට හැකි විය<br>එයට බෙහෙවින් තුටු වෙ<br>"එයයි මම අවසානයේ උගත් එකම දෙය" |
| 44 | | ජේම්ස්පිරිස්ශාලාව | Hostel | ඔබ හිනයක්<br>රැයක් දවාලක් නැතිව<br>දෙනෙත් ඉම බිඳෙන<br>නැකත් වෙලවක් නැතිව<br>සිත වල්මත් කරවන<br>පාලුවේදිත් නොතනියේ දිත්<br>හදවතේ රැදෙන<br>ඔබ ලස්සනම ලස්සනම හිනයක්<br>කිසිදා සැබෑ නොවන |
| 45 | | ජේම්ස්පිරිස්ශාලාව | Hostel | ඔබ මලක් වෙලා පිපුනත්<br>සුවඳක් වී ළග ඉන්නට බැරිනම්<br>මට කුමටද මල් උයනක්<br>ඔබ සුවදක් විහැමුවත්<br>වෙන මලක් පත්ලෙ නම් මල් කෙමිරුදුනේ<br>කුමටද මලක් වී මං<br>ඔබ මල් කැකුලක් වී නම්<br>අන්සතු මල් උයනක<br>ඔබව දකින්නට<br>කුමට දෙනෙත් ලැබ මං |

| | | | | |
|---|---|---|---|---|
| 46 | | ජේම්ස්පිරිස්ශාලාව | Hostel | සෙව්වා මම<br>කල්පයකට පෙරාතුව සිට<br>මම දකින දීප්තිය<br>සතු වුනා නුඹට එය<br>ඒ සොඳුරු නිල් දෙනෙත<br>මගේ ලෝකය<br>මටම අමතක කල<br>සතුවුනා සදහටම මම<br>ඒ නුඹේ ආදර දෙනෙත |
| 47 | | ජේම්ස්පිරිස්ශාලාව | Hostel | අධිෂ්ඨානය ඍජු නම්<br>උත්සහය දැඩි නම්<br>පැතුමන් අවංක නම්<br>හෙට දවස සුන්දර වනු නොඅනුමානය |
| 48 | 1 | ජේම්ස්පිරිස්ශාලාව | Hostel | හිරු මියෙන<br>සඳු පිපෙන<br>නිල් රැයක<br>කඳුලකට<br>ඉව කරන<br>නෙතු කොනට<br>සිනාවක<br>මුදු සුවද<br>තුරුලු කර<br>වඩිනු මැන<br>සිහිනයක<br>එළි නොවෙන |
| 49 | | ජේම්ස්පිරිස්ශාලාව | Hostel | විමසුමට හමා ආ මඳ පවන<br>ආවෙහිද රැගෙන සුපුරුදු සුවඳ<br>සෙවුයෙම් රැයේ තරු රැසි කර<br>විදුල නෙතු පහන් යුග තිබුණාද<br>පිරිමදිම් කුසුම් පෙති සෙනෙහසින<br>දුර සසර හුරු පහස දැනේවිද<br>විදිම් නිරන්තර මා තුලට<br>දකිනු නොහැකි කොහේ නැලවුනිද |

| | | | | |
|---|---|---|---|---|
| 50 | | ජේම්ස්පීරිස්ශාලා<br>ව | Hostel | හදවතේ රිද්මය<br>ආදරය නිසාමය<br>නොඑන නින්දක්<br>ආදරය නිසාමය<br>නොමැති නම් ආදරය<br>නොපවතී කිසිවක් මේ දෙරණ<br>ඔබත් නැත<br>මමත් නැත<br>බිඳෙන සුසුමන්<br>ආදරය නිසාමය<br>මෙතුවක් කඳුලු වැල්<br>ආදරය නිසාමය<br>ආදරය පුදුමාකාරය<br>ඔබව නොදැක<br>සිටිය නොහැක්කේ<br>ආදරය නිසාමය |
| 51 | 1 | ජේම්ස්පීරිස්ශාලා<br>ව | Hostel | හයියෙන් හිනාවෙන්න<br>පුලුවන්නම් ලස්සනට<br>ඒත්<br>ඒ හඬ අතරින් කඩා හැලෙන<br>කඳුළු බිංදු හංගන්න<br>වෙන මගක් හොයා ගන්න<br><br>මා වෙතට ලං වෙන්න<br>නුඹේ හිත දෝරෙ ගලන දුක<br>මගේ හදවතට බරක් නොවේ ඉන්<br>දරා ගන්නම් මම<br>සැහැල්ලු වේ නම්<br>නුඹේ හදවත ඉන් -----! |
| 52 | | රාමනාදන්<br>ශාලාව කාමර<br>අංක 248 | Hostel | මන්දාරම් මෝසම් වැහි<br>බිරුම් දෙන පාලු මැදියමේ<br>තනි නොතනියට ළග උන්නු<br>නුඹේ නම කුරුටු ගෑ<br>නිල්පාට තරු කිනිති<br>අනේ අද<br>දුර ඈත තනිවෙලා |

| | | | | |
|---|---|---|---|---|
| 53 | | කාමරඅංක 248 | Hostel | රවී -----<br>නුබෙන් පිපෙන්නට<br>වරම් ලැබෙන්නේ<br>ආඩම්බර නෙලුමක් මීස<br>අවිහිංසක<br>කුමුදු නොවේ |
| 54 | 1 | කාමරඅංක 248 | Hostel | දැඩි තාපයෙන්<br>මා දවාලන<br>රිවි මඩලක් නොවී<br>බැරිද නුබට<br>මා ළඟ පායන<br>සෞම්‍ය සඳ වන්න |
| 55 | | කමරඅංක 245 | Hostel | ගල් ඇති බති<br>කිරි නැති හොද්ද<br>හොවා දී මට<br>එපා කෙරුවා සරසවි දිවියම |
| 56 | | කාමරඅංක 245 | Hostel | විභාගය ලංලංව පැමිණේ<br>නොසිතාම අන් දෙයක් ජීවිතේ<br>යලිදු පොත සිබිනු සොදවා<br>වේලාව නොවරදවා |
| 57 | 1 | කාමරඅංක 248 | Hostel | සරසවිය<br>පින් ඇත සබද<br>ඔබ හා ඉන්නට<br>එනමුදු ඇත්තට<br>නැත සුවයක්<br>නුඹේ ලයේ<br>පොත් මිටිය ළමැදෙ හොවා<br>නුබ සමග ගෙවන මේ<br>දිවිය කටුකය, තිත්තය |
| 58 | 1 | කාමරඅංක 248 | Hostel | මං ජීවිතේ හින දකිනවා සදු<br>මාත් ආසයි අම්මා කෙනෙක් වෙන්න<br>පුංචි දඟකාර හුරැ බුහුටි<br>කොලු පොඩ්ඩෙක් අතින් අල්ලගෙන<br>ආඩම්බරයෙන් ඇවිද යන්න<br>පාට පිරුනු හැන්දෑ වරුවල<br>ඔයාගේ අතේ එල්ලිලා<br>ඈත සිතිජය දිහා<br>පැය ගණන් බලන් ඉන්න<br>කවදාවත් ඉටුනොවන<br>දඟකාර සුන්දර හින<br>මම හැමදාම දකිනවා සදු |

| | | | | |
|---|---|---|---|---|
| 59 | | කාමරඅංක 45 | Hostel | සත්තකටම මට තිබුණේ C- ටික<br>උසස් පෙලින් ගොඩ ගිහිල්ලා ආපු දසාව<br>හැඩුවා කන කොකා වගේ ආපු ගමන්ම<br>සටහන්වල අකුරක්වත් බෑ මතකේ තබා න්න<br>end එක ලග ලගම උනත් මට බෑ පොර නොදැක ඉන්න<br>වැදලා කියන්නම් ගැටඹෙට කඩ්ඩ රිපිට් යවන්න<br>අවසර දෙනවට මට 2nd රෙපි වෙන්න<br><br>දෙවියන් ප්‍රතිපල හොදව් බැජ් එකෙම බඩුව වෙන්න<br>පඩුරු අනේ ගැට ගැහුවත් තව බැරිවුනි එය කරන්න<br>ප්‍රතිඵල මගෙ අඩු උනාට එපා අම්මේ එය අහන්න<br>ඒ ඇති වගේ ඉන්න තුරා මගේ මේ හිත හදාගන්න |
| 60 | | කාමරඅංක 44 | Hostel | සදෙව් ලොවක් පිට ඉන්නා දනන් හට<br>මහදුක් ගොඩක් මෙලොව ආ දනාහට<br>නිදහස් ගඟකි හැමදෙන පවසනා ලෙස<br>සටහන් පැවරුම් ගොඩ ගැසුනයි දිනෙන් දින |
| 61 | | කාමරඅංක 10 | Hostel | ගගනයෙන් වැටෙන පිණ තණ පියස<br>සිපගද්දි<br>සුවදකින් පිපුනු මල් නටු අගදි<br>සරසද්දි<br>හැඩවෙමින් සදමඩල අහස් ගැබ<br>සිප ගද්දි<br>පිටවුනා කදුලු කැට සරසවිය<br>සිහිවෙද්දි |
| 62 | | කාමරඅංක 44 | Hostel | සිහිනෙන් පවා ඇවිදින් රස වින්ද<br>සරසවි බිමට එන්නට මට පින්ලන්ද<br>සිහිනෙන් පවා ගම රට යන්නට බැරිව<br>සටහන් ගොඩට යටවි කදුලැලි වින්ද |
| 63 | | කාමරඅංක44 | Hostel | සරසවියට පැමිණුනා එය දුක් ගොඩක් වුනා<br>සරසවි බිමේ ඔබ මට සොහොයුරෙක් වුනා<br>අපේ ඇසුර දැන නොයෙකුත් පද හැදුනා<br>අපේ හොදට අපි දෙන්නම පිටි වුනා |
| 64 | 1 | කාමරඅංක44 | Hostel | කන්න බෑ කියයි<br>මාළුව රස නැතෙයි කියයි<br>නින්ද නෑ කියයි<br>සටහන් ගොඩ ගැසී ඇතෙයි<br>මටත් ඉන්න නෑ<br>මට මං ගැනම කල කිරෙයි |

| | | | | |
|---|---|---|---|---|
| 65 | | කාමරඅංක 70 | Hostel | ඔබ<br>සුලගට නොසැලෙන<br>හන්තාන වගෙයි<br>මම<br>වතුරට බොරවෙන<br>මහවැලිය වගෙයි |
| 66 | | කාමරඅංක 70 | Hostel | ජීතේ විඩාවෙන්<br>සිරවෙලා පිටු අතර<br>යොමා සිටියද දෙනෙත්<br>සිත දුවයි දහස් අත<br>කවදාද නිමවෙන්නේ<br>යෞවනේ ඉකිබිදුම |
| 67 | 1 | | Hostel | හිරු මියෙන සැදෑවක<br>නිමා වී නම් සතුට<br>ඒ දුකට හඩන්නට<br>හදවතට නොකියන්න<br>යලිදු එයි හෙට දිනක්<br>දෝතින්ම පිළිගන්න |
| 68 | 1 | කාමරඅංක 248 | Hostel | ජීවිතේ<br>මහා වාලුකා තලයක්ම<br>හඩා වැටෙන කොට<br>පුංචි දිය බිඳිත්තක්ම<br>කඩා වැටුනෙණ මැයි නුඹ<br>මහා මේඝ වැස්සක් නුඹ යැයි<br>හිතාගෙන ----- |
| 69 | | කාමරඅංක 248 | Hostel | නියං කුරුල්ලෝ හඬවාවි<br>තුරුලතා වියැකී හැලේවි<br>සරසවියම ඉරීතලා<br>නිවන්නට ගිණිගත් දහය<br>කඳුලු වැස්සක් වැටේවි ----- |
| 70 | | කාමරඅංක 249 | Hostel | හින් පිණි බිඳු සමඟ<br>අතිනත ගෙන<br>හන්තාන මද පවන<br>මෙහි එන්න-----<br>සෝ ගින්නෙන් ඉකිබිදින<br>මගේ හදට වැද ගන්න<br>හන්තාන කඳු පියස -----<br>මැණියන් අහක නැති නිමේෂයක<br>මගේ හද ස්නේහයෙන්<br>එක බිඳක් සොරාගෙන<br>මගේ ඉහට වියන වන්න----- |

| | | | | |
|---|---|---|---|---|
| 71 | 1 | කාමරඅංක 248 | Hostel | ගිලි යන කඬදහියේ<br>කවියක්ව ඔබ ඉන්න<br>මා ලියන පෙම් ගියේ<br>තනුව වී නුබ ඉන්න<br>ආදරයේ සිතාරයේ<br>ස්වරය වී නද දෙන්න<br>ජිවිතයේ යුග ගිය<br>මා සමඟ මුමුනන්න |
| 72 | | කාමරඅංක 249 | Hostel | සෙනෙහස මඟ ඉහිරිණි<br>සසර කළ පවකට<br>අඳුරුය මුළු ජිවිතයම<br>පුංචි තරුවක්වත්<br>නැති තරමටම |
| 73 | | කාමරඅංක 250 | Hostel | සුභ පැතුමක් සේ හන්තානයේදි<br>සිතට තුරුළු වි මැවිසිනා<br>මහවැලි නදියේ ගඟ දිය අතරේ<br>සැගවිණ නොසිතුව විලස එදා<br>තැනු වැලි මාලිගා රැදු රළ පහරින්<br>සුණු විසුණුව ගිය විටෙක හඬා<br>කිරි දරුවෙකු සේ වැලපුණ මුත් අද<br>දුර ඇතයි නෙතු ඉමට එහා |
| 74 | | කාමරඅංක 45 | Hostel | A නාවත් කමක් නැතේ C+ මට ඇතේ<br>B නාවත් කමක් නැතේ C- මට ඇතේ<br>ඕනෙ දුකක් ඉහිලිය හැකි තරුණ ජිවිතේ<br>ඒත් ඉතින් පොර නාවොත් දුක වැඩියි හිතේ<br><br>කුසගින්නට රස මසවි තිබුනත් මොකටද<br>ගෙදරින් කන ලුනුයි බතුයි වටිනවනෙ මට<br>හොස්ටල් එක දග ගෙයක්ද දගගෙයි ලැමට<br>ලොකුම වරද උසස් පෙලින් අපි ගොඩ යැමද<br><br>පසලොස්වක පොහොය දාට ගැටබේ විහාරෙට<br>ගිහින් පැතුවේ විභාගයෙන් අපි ගොඩ යැමට<br>Econ සර් මතු බුදුවෙයි එකක් කලොත් හෙට<br>ඔබේ අතින් ලකුණු ටිකක් ලබාදෙන්න මට |

| | | | | |
|---|---|---|---|---|
| 75 | 1 | කාමරඅංක 155 | Hostel | විභාගය අපට කල හදියක්<br>දිය බිඳක්<br>සොයා ගිය සඳ<br>පිපාසයෙන් එදා<br>සාදරෙන් පිළිගනි<br>දෑත පා බදා ගත් නුඹේ<br>රළුපහස දැනුනෙන් මෙදා<br>නොපත නම් - නැවතනම්<br>නො එනුමැන<br>යළි ඉතින්<br>පිවිතය නුඹේ නොවේ<br>අපේමය |
| 76 | | කාමරඅංක 250 | Hostel | පුංචි කුටිය<br>නුඹට තුති<br>ගෙවුණු යුගයට<br>දුන් ඒ සෙවණට<br>මා වෙන්ව යන විට<br>එපා නුඹ වැලපෙන්න<br>නුඹට දයාබර<br>මුදු සිතැත්තියක්<br>ඒවී නෙවැ හෙට<br>මා මෙන්ම<br>නුඹව තනිකර යන සඳ<br>නුඹ වැලපේවී නැවත<br>හමුවිම වෙන්වීම<br>ලොව දහම නම්<br>කෙලෙස අපි එය දිනමුද ? |
| 77 | 1 | කාමරඅංක239 | Hostel | ඔය නෙත් අහිංසකයි<br>ඒ අහිංසක නෙතින් නුබ<br>සිනහ වන විට<br>මහද සන්තානයේ<br>සතුටු අරවින්දයක්<br>සනසයි නිවාලයි<br>හැම දුක් වේදනාවක්ම ----- |
| 78 | 1 | කාමරඅංක241 | Hostel | විභාගය<br>නුබ අපිව<br>නොමරා මරණවා<br>කුමක්ද මේ<br>සතුටක් සැපක් නැති<br>පිවිතය |

| | | | | |
|---|---|---|---|---|
| 79 | | කාමරඅංක 246 | Hostel | මෙතුවක් ආමි මඟු කදුළැල් ලකුණු තියා<br>නොදනිමි තාම ආවේ මොන දේද සොයා<br>හැම මොහොතකම විසිතුරු රස සිහින වියා<br>මම එය කඩා දැමුවෙමි එය මදිය කියා |
| 80 | 1 | කාමරඅංක246 | Hostel | විභාගය හිතට මහ බරක්<br>අවකලනය කිරීමට නොහැකිව<br>ඔද්දල් වී ඇත මසිත<br>සාපේක්ෂවාසි නිරපේක්ෂවාසි<br>නිශ්චායක අතරගෙවී යයි යෞවනය<br>Mid , END, Semester දක්කයි<br>අරුත් සුන් ලොවකට ----- |
| 81 | | කාමරඅංක241 | Hostel | සටහන් මිටිය සමනළ කඳඳු මුදුන වැනියි<br>නිදිමත දැනේ නෙත්දෙක කඳු වැටිය වැනියි<br>දහඩිය මුගුරු සාගරයේ ජලය වැනි<br>ඇණුනොත් විභාගේ අපි බලු පැටවි වැනි |
| 82 | | කාමරඅංක247 | Hostel | ඒමට පෙර<br>සිහිනයකි - දෙව්ලොවකි<br>අනාගත දෛවයකි<br>පැමිණි පසු<br>මුලාවකි මිරිඟුවකි<br>කාලේකන ගුහාවකි<br>සරසවිය |
| 83 | 1 | කාමරඅංක 246 | Hostel | නපුරු ඇස් ළඟ දැහැන් ගත වුණා<br>හින හරි මනරම්<br>යන්න යන විට හිත රිදෝගෙන<br>නුඹ හුඟක් ඉක්මන්<br>මහා තනියක ගිලි කඳුළක<br>සංසාර සක්මන්<br>නුඹ ගියා මා දමා තනිකර<br>අතීතේ සිතුවම්<br>තබා මා දුක මා දෙපා මුල<br>කියා දුන් කවිකම්<br>එක ඇසිල්ලක ගොලුව ගිය වග<br>කෙලෙස මා අදහම්<br>නුඹෙන් හිස් වු හිස් අහස යට<br>කොයිද මට සැනසුම්<br>මහ මෙරක් දුක උහුලගන්නෙමි<br>කියා මගේ පව්කම් |

| | | | | |
|---|---|---|---|---|
| 84 | | කාමරඅංක 82 | Hostel | සරසවිය කෙම් බිමකි<br>නමුත් එහි රැදෙන්නට<br>වරම් ලද මුත් අපත්<br>අහෝ !කලකිරුනි<br>මේ දිවිය කටුකයි<br>අම්හිරියි හද රිදුම් දෙයි<br>මේ කටුක මාවතෙන් ගොස්<br>සිප් සතෙහි දුටුවොත් තෙරක්<br>මම නොව තුටු වන්නේ<br>මාගේ රත්තරන් දෙමා පියන්ය |
| 85 | | කාමරඅංක 83 | Hostel | දුරකථන ඇමතුම ලැබෙන තුරු<br>බලා සිටියෙමි<br>ඇසෙන තුරු ඔබේ හඬ<br>දුරකථනය නාදදෙන නේකවර<br>තිගැස්සුනු සිත වහන් කරගෙන<br>බලාපොරොත්තුව දෝත තරා<br>ඇවිද ගියෙමි ඔබේ හඬ<br>අසන්නට -----<br>නමුදු පෙම් පැතුම්<br>විසුණු කර<br>මගේ ඇස් අද්දරට කදුලු දී<br>ඇයිද ඔබ<br>නිහඬව සිටින්නේ -----? |
| 86 | 1 | කාමරඅංක 82 | Hostel | සොදුරු පැතුමන් පොදි බැඳන්<br>හන්තාන පාමුල කල් යවන්නට<br>අහිංසක සිත් තුරුළු කරගෙන<br>කුරුළු දෙනෙත් ඉඟිලුණා -----<br>මහා කුණාටුව පැමිණෙන තුරු<br>නෙදත් ඒ විහඟුන් සියල්ලන්<br>සුළඟ හමන දිශාවන් හට<br>දස අතේ උන් ඉඟිලුණා-----<br>තෙරක් නොපෙනෙන අනන්තය දෙස<br>දෑස් දල්වා මුව අයාගෙන<br>යනෙන සීමා අත බදාගෙන<br>අනේ උන්හැම විදි දුකක් -----<br>නොමැත කිසි සරණක් අදත් ----- |

| | | | | |
|---|---|---|---|---|
| 87 | | | Hostel | පරාජිතයාගෙන් තෙවැන්නාට<br><br>පලා ගිය ජීවිතය<br>ගලා ගිය සෙනෙහස<br>වියලා දැමූ<br>ගිම්හානය නුඹ<br><br>සරසවිය සුන්දරයි<br>සරසවි නාවානම්<br>ආලය සුන්දරයි<br>ආලය නොකරානම්<br><br>තවත් කෙනෙකුගේ<br>ප්‍රාර්ථනා පහනට<br>තෙල් දමා<br>පහන දල්වන්නට<br>තරම්<br>මා ප්‍රබල මුවා නොවේ<br>ඔබ මාව<br>වැරදියට තේරුම් ගත්තා මීස |
| 88 | | සංඝමිත්තා ශාලාව | Hostel | සහසක් මාවතින් පිරුණු<br>හන්තාන අඩවියේ<br>ඔබ දුටුවේ<br>අරගලයේ විප්ලවීය මාවත<br>පමණි<br>සහසක් මල් පිපුණු<br>සරසවි පින්බිමේ<br>ඔබ දුටුවේ<br>රතු මැයි මල් පමණි<br>ලොව සියල්ල දුටු<br>ඔබ<br>නුදුටුවේ<br>මගේ ආදර නෙත් පමණි |
| 89 | | සංඝමිත්තා ශාලාව | Hostel | සමාසිනේ<br>එසයිමන්ට් ගගේ ගිලේ<br>ලකුණු නොලැබෙනේ<br>සොසො පොලිටිකල් අනේ<br>දැස් නිදි කිරා වැටේ |

| | | | | |
|---|---|---|---|---|
| 90 | | සංඝමිත්තා ශාලාව | Hostel | අද නොවේ හෙටත් ගෙවේ<br>මේ සමාසිකේ<br>තාම එන්ඩ බෑ ගමේ<br>පෙම්වතානෙනි<br>ජිවිත අනේ අපේ<br>මේකදැයි සිතේ<br>හෙට උදේම ලෙක්චර් එකට<br>යා යුතුව තිබේ |
| 91 | | සංඝමිත්තා ශාලාව | Hostel | විභාගය වනාහි මිනිසෙකු<br>මරා උපදවන මහත් වු පාප කර්මයකි |
| 92 | | සංඝමිත්තා ශාලාව | Hostel | සංඛ්‍යාන මහා විද්‍යං<br>ඒ බිද්‍යං අනේ භයං<br>විශ්ව විද්‍යාලං එපා කරං<br>ප්‍රශ්න පත්‍රං පිස්සු වට්ටං |
| 93 | | සංඝමිත්තා ශාලාව | Hostel | හා හා හරි හාවා<br>ගෙදර ගිහින් ආවා<br>රෙස්ට් ගනිව්යි කිවා<br>ඇඳ උඩ දිග ලෑවා<br><br>එළාම් එකත් වැදුනා<br>පොත දිග හැර ගත්තා<br>නිදිමත වගෙ දැනුනා<br>ආයෙත්----- මම නිදියම් කිවා |
| 94 | | සංඝමිත්තා ශාලාව | Hostel | පුරන් වු<br>ජිවන කෙතේ<br>ඔබ වැපුරූ<br>සෙනෙහසේ බෝග<br>මල් ඵල ගැනුනා<br>සිතම සන්සුන් කොට<br>ආදරයේ කැටයම්<br>සිති සදකඩ පහණෙහි<br>නෙලූ<br>දයාබර ඔබ<br>කවියක් වු අපුරුව<br>හිස් වු හදවත්<br>පත් ඉරූ මත |

| | | | | |
|---|---|---|---|---|
| 95 | | සංඝමිත්තා ශාලාව | Hostel | ඔබ ගාත්‍රාක්ෂරයක් වු සඳ<br>මම ස්වරයක් විමි<br>එ සඳ උපසර්ග වී<br>ඉකුත් වත්<br>කල් ඉකුත්-----<br><br>ආගම වියැ<br>තවත් ස්වරයක්<br>ඔබ අසලටම<br>එකල්හි ඔබ<br>අන්තස්ථ අක්‍ෂර්යක්ම වී----<br><br>ඉදින් නුබ<br>පුර්ව ස්වරය ලොප්කොට<br>පරස්වරයම සමඟ<br>සන්ධි වුයේ කිම----- |
| 96 | 1 | සංඝමිත්තා ශාලාව | Hostel | ආදරණීය විප්ලවය<br>නුඹ මට හිමි කලෙත්<br>අහිමි කළෙත්<br>මනුෂ්‍යත්වයේ නාමෙන්<br>ආදරය<br>ආදරයම පමණයි |
| 97 | 1 | සංඝමිත්තා ශාලාව | Hostel | සරසවි බිම<br><br>විසිරුණු ඇහැල මල් යායට<br>ඔච්චම්රකර හිනාහුනා විනා<br>උණේඅපෝයි කියන්නට<br>කම්පිත නොවන<br>දරදඬු සිතක්<br>උරුම වුයේ<br>උඹ කරපු<br>මම කරපු<br>කුමන පවටද? |
| 98 | | සංඝමිත්තා ශාලාව | Hostel | කාමරයට ආමි<br>බැලුබැලු බොහෝදෙනා<br>නිදි හෙයින්<br>මම නිදාගතිමි |

| | | | | |
|---|---|---|---|---|
| 99 | | කාමර අංක 05 | Hostel | බෝග යනු කුමකුද?<br>කැමක්ද? බිමක්ද?<br>සිතාගනු බැමට<br>සියලු දෙනාම<br>එක්වි<br>දිවා රෑ රස බලයි<br>නමුත්<br>ඇයි මට පමණක්<br>බෝග කැමක්වත් බිමක්වත්<br>නොවන්නේ |
| 100 | | කාමර අංක 04 | Hostel | මා මේ සරසවියට<br>පැමිණ දැනගත්<br>එකම දෙය නම්<br>මා කිසිවක් නොසදන්නා බවයි |
| 101 | | කාමර අංක 04 | Hostel | ලග සිටියා නම්<br>පොළවේ ගැනසිය හැකි<br>ජංගම දූරකථනයක් ඔබ<br>කිසිදූ ප්‍රතිචාරයක් නොමැති |
| 102 | | කාමර අංක 05 | Hostel | ඔබ තල් ගස<br>නම්<br>මම<br>එගස මල වෙම්<br>මන්ද<br>මට ඔබ සමග<br>මිය යෑමට අවැසි බැවින්<br><br>එදා නිදිවැරූ<br>දැසින්<br>සිහින දුටු<br>සරසවිය<br>මෙදා<br>යථාර්තයක් වූ<br>අරුමය<br>කරුමයක<br>තරමය |

| | | | | |
|---|---|---|---|---|
| 103 | | කාමර | Hostel | විභාග ශාලාව තුළ<br>සමාධි පිළිම සේ<br>දැහැන් ගත වීමු අපි<br>කෙසේ ලියම්ද<br>කුමක් ලියම්ද<br>නොසිතේය මට |
| 104 | 1 | කාමර | Hostel | ආදරය වංචාවකි බොරුවකි<br>මංමුලා නොවන්න |
| 105 | 1 | කාමර | Hostel | සරසවි ඇවිත් කල් මැරුවේ අපි එකට<br>පැකල්ටියේ වාත වුනේ අපි එකට<br>ගෙදර ගිහින් හිටි සතියේ පමාවට<br>ඇයි බැජියේ හිමි උනේ ඔය ලෙසට |
| 106 | 1 | කාමර | Hostel | ප්‍රශ්නාර්ථය<br>හේතු ප්‍රත්‍ය<br>ඇතත් නැතත්<br>දෙපැත්තම<br>පෙති ගසන<br>කඩුවක් |
| 107 | 1 | කාමර | Hostel | සරසවි බිම  පුරා මල් වැසි වසින විට<br>සිරි සරසවිය කොහි සැගවුනි කියන් මට<br>ශිල්පය පසෙකලා පෙම් සුව විදින කොට<br>අනේ අපොයි End එනවා අත ලගට |
| 108 | | කාමර | Hostel | සිද්ධාර්ථ බුදුවන විට බෝ සෙවනේ<br>නේරංජනා ගඟ සුපුරුදු ලෙස ගැලුවේ<br>මා සරසවියේ ඇවිත් ඩිග්‍රිය ගත් දවසේ<br>මහවැලියම ඇයි ඉකි බිද බිද හැඩුවේ<br><br>බුදුබව ලැබුදා දෙවියොත් ඇවිදින් වැන්දා<br>ඩිග්‍රිය ගත්දා සරසවියත් දොර වැහුවා<br>රැකියා පොලිමේ අහුමුල්ලක් අල්ලා<br>බුදු සවි පෙරහැරත් සිහිකරමින් උන්නා<br><br>වසරක් පසුව ඔබ සරසවි පැමිණි නමුත්<br>හදවත පිලිනොගනී ඔබ හමුවේ හිත යටපත්<br>ලැම්බට් වෙන්න හිතුනත් මල්ලියෙ මටත්<br>නංගිත් එක්ක උඹ හිටියා අද හවසත් |

| | | | | |
|---|---|---|---|---|
| 109 | 1 | කාමර | Hostel | පිළිතුර<br>අක්කන්ඩියේ නුඹ නොසලන් කඳුළු කැට<br>පෙම්වත් කුමාරෙක් ඒවිය හෙට නුඹ වෙතට<br>ලැම්බට් වේවි පවි නොකරන් ඔය ලෙසට<br>හිටියෙත් මෙය යහපත නුඹේ අනාවට |
| 110 | | කාමර | Hostel | අභියෝගය<br>දෙන්නා කැමතිනම් නංගියේ හෙම නොසිතන්<br>ඊර්ෂ්‍යාව හදතුල සඟවා හිටපන්<br>උඹට මොකද මල්ලිත්හරි කැමතිනම්<br>අයියලා වග කියද්දිත් මොකටද නොතරවී<br><br>හැගීම් පහළවේ අක්කේ හැම මොහොතේ<br>හැමටම ඉඩදිම අනුවණ කමක් හිතේ<br>ඉරිසියා නොවේ ලැජ්ජාවයි මට ඇත්තේ<br>දෙනකම් අයියලද පස්සෙන් එනු ඇත්තේ<br><br>ඇත්තම තමයි නංගියේ උඹ කියන හැම<br>එක නැට්ටේ දෙහිවල ඇති අසම සම<br>කියන්න ඕනේ නැහැ නංගියෙ යලියලිම<br>අයියා මලෝ හැම එන්නේ අනින්නම |
| 111 | | කාමර | Hostel | සමතය<br>තර්ක කලා ඇති දැන්නම් අක්කා නගෝ<br>නැත්නම් වේය මහා ගැටමක් හනික සබේ<br>ලව් පලහිලව් ගැන නම් නැත කියනු හැකේ<br>දෙදෙනම කිවිදියන් බව නම් සැකක් නැනේ<br><br>ලැම්බට් වෙන්න හිතුවත් මුළු ලොවට හොරා<br>ආල පලහිලව් සඟවණු කොහෙද ඔයා<br>අඩියක් තියා ඉස්සරහට ගත්ත නිසා<br>අක්කණ්ඩියේ නුබ ගැලවුනේ පිනක් නිසා |
| 112 | 1 | කාමර | Hostel | Assiment භයංකාරං<br>බලන්නට පොත් දුර්ලභං<br>ලියන්නට කාලය සීමිතං<br>සදා කල්හිම අපි අතරමං |
| 113 | | කාමර | Hostel | කාලය = ජිවිතය<br><br>අතීතය = ඊයේ ගෙවී ගොසිනි - මතකය<br>වර්තමානය-----= අද ගෙවි යමිනි - මධ්‍යස්ථය<br>අනාගතය ? = හෙට උදා වෙමිනි – අවිනිශ්චිතය |

| | | | | |
|---|---|---|---|---|
| 114 | | කාමර | Hostel | නුඹ -----<br>රෝස කටුවකි<br>ලංව විත්<br>මගේ සිත<br>සිදුරු කළ |
| 115 | | කාමර | Hostel | නිදිවරන් වෙහෙස වී<br>අකුරු කළ මුත් අපට<br>ගිය පසුව නික්මී<br>ලද හැකිද?<br>ජයක් හෙට<br>Exam නැත<br>සිත නිරවුල්ය<br>ගත සැහැල්ලුය<br>සැමදේම සරිය |
| 116 | 1 | කාමර | Hostel | පැය ගණන් නිදිවරා<br>ලබාගත් උපාධිය<br>සොච්චන් පඩියකට<br>හැල්ලු වී යද්දි<br>විටෙක මට සිතේ<br>ජීවිතේ මා ලැබූ<br>ලොකුම පරාජය<br>උපාධිය ලබා ගත් බව |
| 117 | | කාමර | Hostel | නිදි දෙව්දුව කලු සලුවෙන් නෙත සරසනවා<br>පාඩම් පොතට හිරවුණු සිත විසිරෙනවා<br>බොග නොදමා ගොඩ යන්නට බැරිවෙනවා<br>බොගො උඹට Class අරන් පිටවෙනවා |
| 118 | | කාමර | Hostel | දැරම් තැත්<br>අර ඇත ජේන<br>පහන් කණුව යට<br>අඳුර නොවී<br>එහි එන ආලෝකයක් විමට |
| 119 | 1 | කාමර | Hostel | බැහැ පොත දෙස බලන්නට මුළු ඇග වෙව්ලනවා<br>හිස කැක්කුමයි ඔලුවත් බරවී එනවා<br>හිත චංචලයි Exam ළගළග එනවා<br>දිවි තොර වුනත් බොග ගැන සිතුමට එනවා |
| 120 | | කාමර | Hostel | බොග්ගෝ හමස්මී ලෝකස්ස<br>විෂයෝ හමස්මී ලෝකස්ස<br>ක්ලාසෝ හමස්මී ලෝකස්ස<br>සමාසෝ ජාති<br>නත්ත්දාහෝ පුනබ්බෝ |

| | | | | |
|---|---|---|---|---|
| 121 | 1 | කාමර | Hostel | වෙන්කර ඇතත් උරුමයි මගේ අගේ කියා<br>පිම්මේ දුවයි රියදුරු මාරයා සොයා<br>අන්තිම කැමති පත්තරයක් ලියා තියා<br>රන්කද ඔන්න මම කහඉර දිගේ ගියා |
| 122 | | කාමර | Hostel | සතයක් නැති - පොකුරක් නැති<br>කෑමක් නැති - බොග නම් ඇති<br>මේ කරුම වසන්තයේ<br>අපි අසරණ වෙලා වගේ<br>හිතට දැනෙනවා<br>උපකුලපති තුමනේ ------ |
| 123 | | කාමර | Hostel | ලැබිය යුතු දෙයක් වේ නම්<br>සුදුස්සාටම ලැබිය යුතු මැයි<br>උපාධිය ගෙන කරපිටින්<br>අපිත් ඉමු හෙට පෝලිමේ |
| 124 | | කාමර | Hostel | සරසවි ආමී<br>හොස්ටල් කුරුටු ගී බැලිමී<br>ආපු ආපු හැමදෙන<br>කවි ලියූ හෙයින්<br>නොලිමී |
| 125 | | කාමර | Hostel | නංගියෙ මේ බිමට නුඹ ආගන්තුකය<br>විටකදි ගල් බොරලු මෑදූ පාවඩ වැනිය<br>එනමුදූ විටෙක මල් වල මුව වස විෂය<br>ඒබව ඉතින් දැනගෙන හිටියොත් හොඳය |
| 126 | | කාමර | Hostel | Frist year ගොන් පාටි<br>Second year බෝඩිං බොගට<br>Third year full සීනියර්<br>Fourth year යන්නං මචං |
| 127 | | කාමර | Hostel | අපට - එරෙහිව<br>තාඩන - පීඩන<br>දැවැදි - දූෂණ<br>කුමරී - බඹසර<br>සොයුරිය - අත්වැල්<br>තවතව තරකර<br>ඉදිරිය යමු<br>පවිටු වදන් බිඳ |

| | | | | |
|---|---|---|---|---|
| 128 | | කාමර | Hostel | ජීවිතයම විභාගයක් ලෙස<br>සිතූ මා<br>දහසක් පැතුම්<br>හද පුරවා ගෙනම<br>ලීවා<br>ඒත්<br>අසිරුැතම වු Semester එක නිසා<br>අවසානයේ<br>උරුැම දූකකි මට |
| 129 | | කාමර | Hostel | බුද්ධිමතුන්ගේ පරාදීසයට<br>පැම්ණියේ දහසක් පැතුම්<br>තුරුැලු කරමිනි<br>ඒත්<br>දින සති ගෙවියන විට<br>සරවිස දිවිය මේ යැයි<br>වැටහෙන විට<br>නෙතට කදුළක් නැගෙන්නේ<br>නිරයාසයෙනි<br>පිරපුන් මිනිසෙකු වීමේ<br>පරම අදිටනින් යුතුව<br>වෙහෙස විය<br>දැඩි සිතින් |
| 130 | | කාමර | Hostel | පොත අතට ගත්තට පාඩම් කරන්නට<br>හිත ඇදි යන්නේ වල්පල් දොඩන්නට<br>දැන්නම් හදන්නේ මා නම් නිදන්නට<br>මොනවා ලියන්නද මා දැන් වීභාගෙට<br>මන්ද ? ----- මා<br>පසුපසම<br>නිදිමත |
| 131 | | කාමර | Hostel | සෙනෙහස සෙවිල්ලක් කරන්<br>එක කුඩුවක් වන දිනක්<br>වෙනකන් පරිස්සම් වෙමු<br>කවුරුැත් දකින්නට කලින්<br>පදයක් හදන්නට කලින්<br>ඉවසන්න කියා වෙන්වෙමු |
| 132 | 1 | කාමර | Hostel | Special සිහිනයක් පමණයි<br>සැබෑ සුවදක් නෑ<br>එදා Political නොකෙරුැවා නම්<br>මෙදා වියා්වක් නෑ |

| | | | | |
|---|---|---|---|---|
| 133 | | කාමර | Hostel | ජීවිතයේ මේ කෙටි කාලය තුළ<br>මාරාන්තික බොග විකාරයෙකු<br>නොවන්න<br>පසුවට පසුතැවි<br>ඔබම<br>තනියම බුදුවන්න<br>නෙවන්න<br>අනෙකටත් මාර්ගය<br>කියා දෙන්න |
| 134 | | කාමර | Hostel | ඉසිඹුලන නිමේෂයේ<br>හන්තාන අඩවියේ<br>පැයුසරා සඳ<br>නොසලන්න මුතු කඳුළු<br>දිරි ගන්න ජයගන්න<br>ගැහැණු කමේ<br>වටිනාකම<br>පරයමින්<br>බමුණු මත<br>ඒ<br>පුරුෂාධිපත්‍යය |
| 135 | | කාමර | Hostel | ශාස්ත්‍ර පීඨයේ කුරුටු ගීත ලස්සනයි<br>ඒ ලස්සන ගී ලියන්න බෑ මට දුකයි<br>මුලු බිත්තිය පුරා ලීවේ එක පේලියයි<br>මුලු හදවතින්ම මං මේකට ආදරෙයි |
| 136 | 1 | කාමර | Hostel | අනේ අනේ සමාසිකය<br>අපව කෑව සමාසිකය<br>කවදාද අපි ගොඩ එන්නේ<br>කාලකන්නි සමාසිකය |
| 137 | | කාමර | Hostel | සිහනයක අග<br>කඳුළු තැවරුව<br>එකම පැතුමක<br>මල් පුබුදු කළ<br>ජීවිතය තුළ<br>බරක් තැවරුම<br>සරසවිය තුළ<br>දැනෙයි පාළුව |

| | | | | |
|---|---|---|---|---|
| 138 | | කාමර | Hostel | යහලුවො නම් ඇත<br>නමුත්<br>සිතාගන්නට අපහසුය<br>හදවතින්ම මිතුරුද කියා<br>හමුවුනිය<br>යහලුවන් මටද<br>නමුත්<br>හදවත් ඇත්තේ<br>අතලොස්සකට පමණි<br>හැඬුවෙමි වැලපුනෙමි<br>හිත හැදුවේ යහලුවන්ය<br>හඩන්නට නෙතට කඳුලැලි දුන්නේ<br>සැබෑවටම<br>මිතුරියන්මද?<br>කියාදෙන්න මට<br>කෙලෙසින් වටහා ගම්ද?<br>මිතුරියන් ගැන |
| 139 | 1 | කාමර | Hostel | දෑසේ නිදිමත සිඹ සනසන්නට<br>ටියුබ් බල්බ් එක එලිය ගෙනෙයි<br>සමීප පුටු දෙක හිස් වී ඇති සද<br>ඇදට යන්න සිත සුසුම් හෙලයි |
| 140 | | කාමර | Hostel | දෙනයනට නැග එන කඳුළු කැට<br>පිසලන්න මුදු දෙඅත් එක්කොට<br>සිටිය සකිසද නුඹ නොමැත අද<br>මෙය නොවෙද ජිවිතයේ තනිකම |
| 141 | | කාමර | Hostel | විභාගය<br>විඩාබර නෙත් සඟල<br>නොසන්සුන් හද මඩල<br>ජිවයෙන් සමුදෙන්න<br>නිවහනට ගොඩවෙන්න<br>අනේ මට ඉඩ දෙන්න<br>තවතවත් දුර නොයා<br>හෙට දිනෙන් සමුදෙන්න |
| 142 | 1 | කාමර | Hostel | විශ්ව දැනුමක් පතා ආ මුත්<br>නොලැබ මද දැනුමක්<br>පතා ආ මග නොලැබ දැනුමක්<br>යන්නට නොදි ඉඩ හසර<br>බොග දමන්නට පටන් ගත්තෙමි<br>තවත් එක සැරයක් |

| | | | | |
|---|---|---|---|---|
| 143 | | කාමර | Hostel | නිදිමත දැනුන මුත්<br>නිදියන්න<br>බැරි හින්දා<br>එපා නිදිමත එන්න<br>මගෙ හිතට<br>දුක්දෙන්න |
| 144 | | කාමර | Hostel | රිදුම් දෙන ජීවිතය<br>නිබන්ධන අතර සඟවා<br>ලෝකයෙන් සැඟවෙන්න<br>දිරි ගනිමි දිවා රෑ<br>සමාජය විසකරුයි |
| 145 | 1 | කාමර | Hostel | සමාජයේ ඇති සම්මතය මත<br>අපගේ<br>අසම්මතය විය<br>සම්මතය පරදා<br>ජය ගැනිමට<br>නුඹට මෙන්ම මටද<br>නොහැකි වූ කළ<br>වෙන්වීම මිස<br>කුමක් කරන්නෙමුද<br>අප දෙදෙනා |
| 146 | 1 | කාමර | Hostel | යට ගියාවේ<br>මියුරු සත්සරයක් බඳුවූ<br>ප්‍රේමය<br>වත්මනේ<br>රුදුරු සිව්පා<br>ගෙරවිලි හඬක් ලෙස<br>මා පෙලයි |
| 147 | 1 | කාමර | Hostel | පොත වෙත සිත<br>යොමු කරනා හැම විට<br>සිත දිව යන්නේ<br>නිවස කරා<br>තව කොතරම් කල්<br>මෙලෙස සිටින්නද<br>ඔබේ තුරුල්ලෙන් ඈත්වෙලා |
| 148 | | හලසා<br>ඔබේසේකර<br>ශාලාව<br>කාමර අංක 81 | Hostel | සෑම කෲර ක්‍රියාවක් මදූර්වල තාවය නිසා<br>හටගන්නකි |

| | | | | |
|---|---|---|---|---|
| 149 | 1 | කාමර අංක 80 | Hostel | පෙනෙන නොපෙනෙන තරම්<br>දුර ඈත නැවතිලා<br>නුඹ වෙතින් නොමැකී ගලා එන<br>සිහිල් සෙනෙහස් දියර<br>නැති කරයි<br>ගිනියම් රසනහයෙන් පරඬැලක් වී<br>මගේ හදවතට<br>දරාගන්න බැරි තරම් සීතලයි මට<br>නිදහසේ කියාගන්න බැරිව<br>සිත හඬයි හැමදාම<br>මගේ හදවතේ තෙරපෙන<br>ඔබට බැඳි සෙනෙහස<br>මහ මේරුවටත් වඩා<br>බර වැඩියි මට<br>එනමුදු රත්තරං<br>දිවි තිබෙන තුරාවට<br>ආදරෙයි මං |
| 150 | 1 | කාමර අංක 25 | Hostel | අනිච්චා මට තම්මානා<br>උප්පාද කළ දැනුම්නෝ<br>උපාධි අරගෙන ඕන තරං<br>අපි වැන්නන් තව නිකං බලං |
| 151 | | කාමර අංක 77 | Hostel | හද මඬල සසල සඳ<br>සිත පොතට යාවේද<br>මට මාද අහිමි වේද<br>නොපායන් සුපුන් සඳ<br>තරු එළිය මෝදුවන<br>අමාවක හොදයි මට |
| 152 | | කාමර අංක 76 | Hostel | අතරමං වුණා<br>පාළු කුටියේ<br>කවුළු සිප එන<br>පවන් අහපන්<br>ඇයත් නොසිටිය නම්<br>මාග් ළග<br>අසරනයි මං<br>හන්තාන ඉම----- |

| | | | | |
|---|---|---|---|---|
| 153 | | කාමර අංක 76 | Hostel | ඇකිලෙන තුරු<br>ගින්නෙන් කුස<br>නිදිවරමින් සොයා ආව<br>සොඳුරිය ඔබ ?<br>කොහද ?<br>නිසලව දෙඅත<br>පන්හිද උරණව<br>ඈතට ගියාද ඔබ ?<br>වඩින් නැවතත්<br>සරස්වතිය ! |
| 154 | | කාමර අංක 25 | Hostel | පූජේමි බුදුධං<br>කියා කිව්වත් මං<br>බුදුන් දැක නැත්නම්<br>වැදීමේ ඵලය කිම<br>බුදුන් අදහත් නම්<br>කෙලෙහි ගුණ ඇත්නම්<br>මව්පියන් වේමය<br>පූජේමි බුද්ධං----- |
| 155 | | කාමර අංක 25 | Hostel | ඊයේ රෑ පොල් කිරිවල<br>ඉතිරි වූ පොල් රොඩු<br>උදෑසන හසුවීමේ<br>ප්‍රීතිය නිමිත්තෙන්<br>මගේ කුස තුල<br>සාදයක හඬ ඇසේ |
| 156 | | කාමර අංක 26 | Hostel | පොත් ගත්තට<br>පඩම් කරන්නට<br>කියවගෙන කියවගෙන ගියේ<br>ඇගේ හිත<br>දරා ගන්න බෑ |
| 157 | | කාමර අංක 25 | Hostel | අහෝ දෙවියනේ<br>දෙනොම් දාහක්<br>යාමිනම් කුස පුරවගෙන<br>අකුරු කරනා සඳ<br>නුඹේ පඬුපුල් අසුන<br>උනු නොවන්නේ<br>එයද පුද්ගලීකරණය වුණාවත්ද ? |

| | | | | |
|---|---|---|---|---|
| 158 | | කාමර අංක 25 | Hostel | ඉටි පහනින්<br>මව්පියන්ගේ<br>දහඩිය කොළ දවා<br>සෙමෙස්තරයක්<br>එළිය කල හැකිද?<br>මිනිසුනේ-----<br>කියා දියල්ලා මට<br>බොග දමන හැටි<br>අන්ධකාරයේ----- |
| 159 | | කාමර අංක 25 | Hostel | පැවරුම ලියද්දි<br>ඇය මතකයට ආ බැන්<br>බත් කද්දි ඇණුන<br>කරවල කටිටේ වේදනාව<br>දෙවන තැන ලැබුවේය |
| 160 | | කාමර අංක 25 | Hostel | නපුරුකමට බැඳි බැඳි<br>සිතුවිලි නොයයි නුඹගෙන් මිදී<br>හිතුවක්කාර හිත මාගේ<br>තිබුණාවේ ඔහේ රිදිරිදි<br>ඉසව්වක නැති ලතැවිලි<br>නුඹට ඇහුණොත් මට ඇති |
| 161 | | කාමර අංක 83 | Hostel | ඔබ නැති මේ රැයට<br>පුරහඳ එළිය කුමටද<br>ඔබ නැති මේ බිමට<br>නල මුදු සුවඳ කුමටද |
| 162 | 1 | කාමර අංක 143 | Hostel | වෙත රැගෙනයයි<br>ඇතැම් විට ඔබද එහි ගොදුරක් වූ අයෙක් විය හැකියි |
| 163 | | කාමර අංක 143 | Hostel | අස්ථිර ස්ත්‍රී වින්යෙන්<br>ස්ථිර වූ ප්‍රේමයක් ලැබිය හැකිනම්<br>පුත්තලමේද ගෝවා වගාකල හැක |
| 164 | | කාමර අංක 146 | Hostel | වෙහෙසෙන විට - කැඩපත ඔබ ගැන<br>පුද දෙන්නට<br>කියනවා ප්‍රේමය<br>පුරවා ගත්තත්<br>හද තුළ ඔබ ගැන<br>තෙල් බැම්මෙදි<br>ගොලු වී යයි ප්‍රේමය |

| | | | | |
|---|---|---|---|---|
| 165 | 1 | කාමර අංක 10 | Hostel | මීවිතින් දෙනුවන් තෙමුණු සඳ<br>කාගේ රුවදෝ ඇදෙන්නේ<br>සොයා ඒ රුව මදූ  බඳුන් තුළ<br>පිහින පිහිනා කිම්දෙමින්නේ<br>ජීවිතයේ අවසන් සුසුම් පොඳ<br>රුදෙන තුරු මට තනි රකින්නේ<br>මගේ සෞම්‍ය නුඹයි මධුවිත<br>නැතේ කිසිදා දුරස් වන්නේ |
| 166 | | කාමර අංක 10 | Hostel | හෙමි හෙන් ළංවෙලා<br>හිතගාව උණුහුමට<br>අත් බැඳන් ඇවිද ගිය<br>ජීවිතය මල් දෙවැට<br>පැටලිලා වැරදිලා<br>ගොලුවෙලා ගිය පෙමට<br>නෙතු සිබින මේ කඳුළු<br>නුඹට මිස වෙන කාට |
| 167 | | කාමර අංක 10 | Hostel | නංගි මිය ගියා එය දුක්<br>ගොඩක් වුණා<br>සරසවි බිමේ නුඹ මට නැගනියක්<br>වුණා<br>අපේ ඇසුර දැන නොයෙකුත්<br>පද බැදුණා<br>නුඹේ හොදට මම මෙහි<br>හුදකලා වුණා |
| 168 | 1 | කාමර අංක 13 | Hostel | පුන් සඳුනි----- අඹරින් බැස එන්න<br>මසිතේ ඇති දෑ පවසන්නද ඔබේ සවනේ<br>කිමද? මනස පුස්තකාලයක්ද?<br>කියවා බලන-----<br>කිමද? ආදරය ගොඩනැගිල්ලක්ද?<br>කඩා නැවත ගොඩනගන----- |
| 169 | | කාමර අංක 13 | Hostel | නදියේ පෙනෙන සඳේ සෙවණැල්ල<br>නදියට අයිති නොවේ<br>සිතුම් පැතුමන් සසල වන දිවියක්<br>කාටත් අයිති නොවේ<br>මිහිමඩල දෙදරා ගියත්<br>ආදරය දෙදරා යන්නක් නොවේ----- |

| | | | | |
|---|---|---|---|---|
| 170 | | කාමර අංක 15 | Hostel | තග දැමු තෙල වැදුණු<br>එක ගොඩක ගොඩ ගැසුණු<br>සුන්දරම නුඹේ සෙවන<br>අහිමි වන දිනය අද<br>වාන් දැමුවා කඳුළු<br>නෙත් කෙවෙනි බිඳ දමා<br>සත්තමයි නුඹ සුවඳ<br>අතැර යායුතු නිසා |
| 171 | | කාමර අංක 16 | Hostel | බිතු සිතුවම් රූ මෙන් පැවති<br>හිත මිතුරන් විරසක නොවෙති<br>එක මලකට පෙම් බැඳි පවින්<br>මිතුරු දමින් සමු ගමුද ඉතින්<br>සෙවණැල්ලෙන් සමු ගමුද ඉතින්<br>මල කිවේ නෑ ඔබ පෙම් කල වග<br>කීවා නම් පෙම් කරන්නේ නෑ තව<br>මොකටද පෙමකට සොහොයුරු කම් බිඳ<br>අප දෙන්නා සමු ගත යුතු නෑ නෑ<br><br>මලට කියන්නම් මා පෙම් කරනා වග<br>සමාවෙයන් මට ගිනෑ මිතුදම<br>බැඳි පෙම ජය ගෙන සතුටින්<br>ඉනු මැන<br>මා නම් හිත රිදවන්නේ නෑ නෑ |
| 172 | 1 | කාමර අංක 16 | Hostel | නුඹ<br>මම<br>හදවතින්ම පෙම්කර<br>හදවතේම සැගවුණ<br>අරවින්දය----- |
| 173 | 1 | කාමර අංක 16 | Hostel | ප්‍රෙෂියක් හෝදන්න බඩුවට බුටි තියා<br>ඩිග්‍රිය ගන්න පේරාදෙණිය වෙතට ගියා<br>ආ දා පටන් සින්නන් හට කඩේ ගියා<br>බඩුවක් තියා ඩිග්‍රිය වත් නැතිව ගියා |
| 174 | | කාමර අංක 16 | Hostel | ලස්සනයි සිනා පද්දන<br>නුඹේ සෙම චරිත මහා තඩි<br>වත දැකීමෙන්<br>මට කවි සිතක් නම් පහල වුණේ නෑ<br>පිළි කුලට ඇති වෙච්ච<br>ඔක්කාරයක් මිසක් |

| | | | | |
|---|---|---|---|---|
| 175 | | කාමර අංක 16 | Hostel | ආදා කොතෙක් රැග් බිය තිබුණාද දෙනෙතේ<br>ආවේ සතුටිනුයි නුඹ සෙවණටදාසේ<br>මතුවට සිංහයෙක් සේ සමුගත්තද නුඹ ගෙන්<br>යනදා දුකයි කියනට බෑ දමා මෙසේ |
| 176 | | කාමර අංක 16 | Hostel | උපාධිධාරියා<br>මහදැනමුත්තෙකි<br>පොත්ගුලේ රාක්ක මැදින්<br>කලබලයෙන්<br>ඇවිද ගිය නිසා |
| 177 | | කාමර අංක 16 | Hostel | ප්‍රාර්ථනාව<br>සති අන්තය එනතුරා<br>ඇඟිලි ගනින්නේ<br>පෙම්බරිය දකින්නට<br>නොව<br>පෙම්බරියන්ගෙන් ගැලවි<br>නිදහසේ ඉන්නටය |
| 178 | 1 | කාමර අංක 16 | Hostel | ගපේට ඇඳීම<br>මගේ කමිසෙට<br>උදේට එක කෙල්ලෙක් හේත්තු වෙනවා<br>දවල්ට තවත් කෙල්ලෙක්<br>හේත්තු වෙනවා<br>හැන්දෑවට තවත් එකක්<br>කොහොමද සැප? |
| 179 | 1 | කාමර අංක 16 | Hostel | හිතේ ඇදෙන්නටත් පෙර<br>යන්තමින් ඔහේ ඇඳි<br>සිතුවමකි නුඹ<br>සිතේ රැඳි දහසකුත්<br>සිතුවම් අතහැර |
| 180 | 1 | කාමර අංක 16 | Hostel | ජිවිතේ පුරාවට<br>මුලු හදම සසල කර<br>සොරාගත් ආදරය<br>නෙත් දෙකින් බැල්ම දී<br>මා නෙතද පොළඹවා<br>ඇයි කියන් සොඳුරියේ<br>නොකියාම හැර ගියේ |

| | | | | |
|---|---|---|---|---|
| 181 | | කාමර අංක 16 | Hostel | Before marrge<br>නුඹයි රම්‍ය සඳ කිරණ<br>ගිම්හාන කාලේ<br>After marrge<br>නුඹයි චණ්ඩ හිරු කිරණ<br>මධ්‍යහ්න කාලේ |
| 182 | | කාමර අංක 16 | Hostel | ආදරය<br>හෙම්බිරිස්සාවකි<br>ඔසු සොයන මුත්<br>සුව නොවන |
| 183 | 1 | කාමර අංක 16 | Hostel | පෙම් කළෙමි ඇයට<br>ආ දා පටන් සිතින්<br>නමුත් එය<br>පස්කණ්ඩියේ ඉපදි<br>එහිම අවසන් වූ<br>පුංචි පස් ස්ථරයකි<br>ආකියෝලෝජි වල එන |
| 184 | | කාමර අංක 16 | Hostel | මහද වීණාවේ<br>තත්සර ඔබයි<br>හඬ නොනංවෙන<br>රබර් පටි මෙන් වූ |
| 185 | | කාමර අංක 16 | Hostel | හදවතට දැණුනු ආදරය නුඹගේ<br>එය ආදරේ හසුනකට<br>වේදනාවෙන් උණත් ලියා නුඹටම<br>නුඹ අතටම<br>දෙන්න වූ පව මගේ<br>ඉවසුම් නොමැති වුතැන<br>ගාලු කඳුළු ගඟ දිගේ<br>බොඳවෙලා නොයන් කවදවත්<br>කවම කවදවත්<br>එය ප්‍රථම ප්‍රේමය මගේ |
| 186 | | කාමර අංක 73 | Hostel | සසර පුරුදු දුක තමයි<br>අපිට උරුම පැරදුමයි<br>නෙතට කඳුළු බිඳු දමයි<br>හැමදමත් දුක තමයි |
| 187 | 1 | කාමර අංක 74 | Hostel | සිසිවන වුවන ඉග සුග ගත හැක මිටින<br>ලියපු එකාගේ අත කැපුමට අතින<br>විසිවන සියවසේ කලු දැලි මුහුණ<br>ඉග සුග ඇගේ අද ගත හැකි සොඩින |

| | | | | |
|---|---|---|---|---|
| 188 | | | Hostel | පියමං කෙරුවෙමි සැරයටි මැද්දෙන්<br>බකටි තැබුවෙමි දොරින් දොරට ගොස්<br>ආතල් ගත්තෙමු ෆන් ලැබ ගත්තෙමු<br>දෙපා වාරු නැත ඔබ හැර යන්නට |
| 189 | | කාමර අංක 67 | Hostel | ඉල්ලුමට සැපයුම<br>ජේදනය වී<br>සමතුලිත නොවූ<br>ආදරයකි<br>ඇගෙත් මගෙත්<br>ආදරය |
| 190 | | කාමර අංක 67 | Hostel | ඔබ මා හැරදා ගියද<br>මම නොයෙමි<br>මන්ද<br>මගේ නොවුනත්<br>මගෙම වු ඔබගෙන්<br>ආදරය අරුත දුටු නිසාවෙනි |
| 191 | 1 | කාමර අංක 67 | Hostel | අපත වු මිතුරු කැලක්<br>අසංවර වු ලිගුවක්<br>අසාමාන්‍ය වු නිදිමතක්<br>නොමැති වුයේ නම්<br>අපිත්<br>ලෙවාලාය<br>ප්‍රොපලාය |
| 192 | 1 | කාමර අංක 68 | Hostel | හදවතේ නැගි කඳුලු නැත පිටත පැමිණිලා<br>දහවලේ ගිරිස්මෙට හදවතම තැම්බිලා<br>තව කෙසේ හිදින්නද වේදනා ඉවසලා<br>හිතේ ලෙඩ තිබුනාට බෙහෙත් නැත සොයාලා |
| 193 | | කාමර අංක 68 | Hostel | කියු දෙය වසාගෙන<br>නොකියු බොහෝ දේ ඇත අප අතර<br>නමුත් දැන්<br>ගොනා පොල් පැළය කා හමාරය |
| 194 | | කාමර අංක 68 | Hostel | පලවා හරිමි ලෝකය කිවි නව හින්දා<br>වෙනතක ගියෙන් ඔහු හා දෙනුවන් බැන්දා<br>නුවරම හිනැහුනා මට අද ඔබ හින්දා |

| | | | | |
|---|---|---|---|---|
| 195 | 1 | කාමර අංක 68 | Hostel | ඉඩදෙන්න එක වතාවක්<br>ඔබට ආදරය කරන්න<br>අවසරයක් නොලැබුනද<br>හුදකලා මගෙ සිත<br>ඔබ සිත සමග<br>ඔබට හොරෙන්<br>කථා කරයි<br>වෙන්ව සිටියද<br>සොදුරිය<br>සිහිනයක් නොවී<br>නොකලද ඔබ මට ආදරය<br>ඒ හුදකලා බව<br>අමෘතයක්<br>මගේ ආදරයට |
| 196 | | කාමර අංක 69 | Hostel | ඈ මදෙස බැලුවාය<br>යළිත් ඈ බැලුවාය<br>මා ඉන් නොසෙල්වුනෙමි |
| 197 | 1 | කාමර අංක 69 | Hostel | දෙනෙතින් අපගෙ නෙතු කඳුලැලි වැගිරෙනවා<br>හදේ ඇති වේදනා සුළගට මුසු වෙනවා<br>සරසවි දිවිය ටික ටික අපෙ වියකෙනවා<br>මොනවා කරන්නද බැපියො ඇණ දෙනවා |
| 198 | | කාමර අංක 69 | Hostel | දුනු හිය ඇද්දෙමි<br>හියක් නොමැතිව<br>දිටිමි<br>එළා යන මුවැත්තිය |
| 199 | | කාමර අංක 127 | Hostel | දුක හභා සැප යනු<br>ජිවිතය නැමති කුණාටු සයුරේ<br>හබලක් නැත රුවලක් |
| 200 | 1 | කාමර අංක 128 | Hostel | මල්ලි<br>ජිවිතයේ ප්‍රශ්න වලට වඩා<br>ඇණ ගැනිම මහ ලොකු දෙයක්ද<br>සංසාර චක්‍රය පුරා නුඹ ගත් ඇණ<br>Hilda 128 'අනාවරණ" වුවද නිමක් නැත<br>ඉවසපන්<br>ආදරය යනු සංසාර Wheel එකේ එක දැත්තකි<br>වාහනය පදිනා තුරු Wheel එක කැරකෙයි<br>හැගීම් යනු ඉන්දනයයි<br>ඉවසපන් |

| | | | | |
|---|---|---|---|---|
| 201 | | කාමර අංක 128 | Hostel | තනිකමට, පාළුවට<br>සැපට දුකට<br>හැමදාම එකට ඉන්නට<br>හැකි නම් නුඹ ගාව<br>මට<br>තවත් හැගුමක්<br>කුමකටද<br>ආදරයකට |
| 202 | 1 | කාමර | Hostel | සුදෝ සුදු ඔබෙ කලුවන් කොණ්ඩේ සුදෝ<br>සුදෝ සුදු ඔබෙ නිල්වන් දෙනෙත් සුදෝ<br>සුදෝ සුදු ඔබෙ පියකරු මුහුණ සුදෝ<br>සුදෝ සුදු ඔබෙ මුලු ඇඟ තඩියි සුදෝ |
| 203 | 1 | කාමර | Hostel | නො (පැමිණීම)<br><br>නො එන බව දැන දැනම<br>හිත හොඳටම පෙරටු කොට ගෙන<br>සිතල මා ජිවිතයට<br>අනාවක් නැති හෙයින්<br>උණුසුම් මරණය<br>නුඹ එනතුරු<br>මම මග බලා හිඳිම් |
| 204 | | කාමර | Hostel | [illegible] |
| 205 | | කාමර | Hostel | පැයක් දෙකක් පොත බලන්න<br>වතුර බෝතලෙත් අරගෙන<br>බොහොම උනන්දුවෙන් අනේ<br>මම මෙතනට ආවා<br><br>පැයක් දෙකක් ගතව ගියා<br>වතුර ටිකත් ඉවර වුනා<br>අන්තිමේදි ඉතුරු වුනේ<br>වු බරකුයි නිදිමතකුයි |
| 206 | | කාමර | Hostel | වැදුනත් හිසට හෙණ<br>දත් ටික ඇතොත් නිසි තැන<br>නොතකා හෙනය ගැන<br>සිනාසෙනු උඩ පැන පැන |

| | | | | |
|---|---|---|---|---|
| 207 | | කාමර | Hostel | වැහිබර මෝසම<br>හිරිගඩු සීතල<br>මනසේ සිතුවිලි<br>එක්වී ගුලිවී<br>සසලව මුලුලොව<br>අවැසි කරනට<br>පාඩම් බොහෝ ලෙස<br>කුමක් කරන්නද<br>සසලව ඇත මගෙ<br>මුළු ලොව |
| 208 | 1 | කාමර | Hostel | තනියෙන් බුදුවෙන්නට<br>බොහෝ දෙනා උත්සහ කළද<br>ඒ යන මාවතේ<br>කිසිදු මග පලක් නොලැබු<br>අනේක විද මනුෂයයෝ<br>බුදුවීම පසෙකලා<br>මග ඵලක් ලබන බැවි<br>දත හැකිය කෙසේ වුවද<br>චේතනාහං භිකඛවේ<br>කම්මං වදාමී<br>සිහිකර ගැන්ම<br>මැනවි |
| 209 | 1 | කාමර | Hostel | මැලවුණු මල් බිම පතිත කරන්නට<br>සුළඟට ඉඩදෙන ගහට දුකක් නෑ<br>හදවත සැනසු එකම මලක් ගැන<br>මට ඇති කැක්කුම ලොවට දැනෙන් නෑ |
| 210 | | කාමර | Hostel | හන්තානට වඩා උසට<br>බොග දැම්මේ එලිවෙන තුරු<br>මහවැලියට වඩා වතුර<br>බඩ පිරෙන්න බිම් නිතර<br>කටු ඔටුන්න B . A ගෙන<br>පළඳින්නයි රජෙකු ලෙසින්<br>අපි ආවේ සරසවිය<br>පුරුවෙ පවකටයි ඉතින් |
| 211 | | කාමර | Hostel | පැහැසර කිරනින් නැහැවුණු<br>ජිවිත මංතලාවම අභියස<br>නුඹ පහනක් නම් නොව<br>බුද්ධිය.......<br>මගේ මුළු ලොවම එකලු කල<br>හිරුත් සඳුත් ඔබ මැයි<br>බුද්ධිය |

| | | | | |
|---|---|---|---|---|
| 212 | | කාමර | Hostel | විභාගය නම්<br>හුදෙක් මේ ජීවිතයට<br>නොවේ<br>සිතැගි සාගරයක් විලස<br>දිවි ගමනේ<br>විභාග නම්<br>අල්ප මාත්‍රයකි<br>දිවි තුරු වටිනුයේ<br>මනුෂ්‍යත්වයම පමණකි |
| 213 | | කාමර | Hostel | කල්කයක් ඇත සරසවිය තුළ<br>උගන්වයි එය මුල් දවස් වල<br>බයට කීවත් කට පාඩමින්<br>ටික කාලයකින් වැටහිලා යයි<br>එහි අරුත කොතරම් වේද යත්<br>නොතිබුණත් වලිගයක් පසුපස<br>ඇවිද්දත් දෙපයින් පොළව මත<br>තිරිසනුන්ටත් නිගා ගෙන දෙන<br>හැගෙයි සතුනුත් මෙහි සිටින වග<br>සියොලගම විෂ පතුරුවා ගත්<br>රුදුරු විෂගොර සපුන් කැලටත්<br>වඩා විෂගොර සපුන් ඇති බව<br>වැටහේවි දිනකදි නුඹලටත්<br>නපුරු සටකපටියන් බොහොමයි<br>මිනිස්කම දන්නවුන් විරලයි<br>පැතුම් පොදිබැද ආව පින්බිම<br>අරුත එලෙසම වේද සිත්වෙයි<br>උගන්නට ඇත බොහෝ දේවල්<br>විභාගයට අමතර දිවියට<br>කපටි සිවලුන් මෙන්ම විසකරු<br>සපුන්ගෙන් වන්නට සුරක්ෂිත |
| 214 | 1 | කාමර | Hostel | ඇත්තමයි<br>ඇහැ පියන්නෙම නැහැ<br>හීතල හිරිකඩ<br>මදුරුවන්ගෙ හොරණෑව<br>සංසාර ගැට්ට මත<br>ගුලි වුණී ජීවිතය<br>අතිඋත්තම ජ්‍යේෂ්ඨතුමනි<br>කෙසේ නම් පිළි නොගන්නද<br>බොගාට ක්ලාස් නැති වග |

| | | | | |
|---|---|---|---|---|
| 215 | | කාමර | Hostel | විභාගය<br>නුඹ නිසා<br>ආවස්ථික පිරිවැයක්<br>දැරීමට සිදුවිය<br>“නින්ද”<br>නුඹගේ උපයෝගිතාවය<br><br>අහිමි වූ කල<br>හිනවන පලදායිතාවය විය<br>විභාගය විභාගය |
| 216 | | කාමර | Hostel | නිදි දෙවිදූව නුඹ<br>පැමිණියා ඉක්මන් වැඩිය<br>මම තවම බොග දමමි<br>නුඹට හැකිද තව මොහොතක්<br>ප්‍රමාද වි පිය මනින්න |
| 217 | | කාමර | Hostel | වීභාගය ළංවෙමින්<br>හිතට දෙන වධ වේදනා<br>දැනෙන විට අන්තවත්<br>කුමන නම් කරුමයක්<br>පලදිලා ඇද්ද යැයි<br>සිතෙනවා අනන්තවත් |
| 218 | | කාමර | Hostel | කලෙම් වනපොත්<br>නෝට් එක දිගඇරන්<br>මහාපතරංග ජාතකය ලෙසිනි<br>කේන්ස්ගේ බහුබූත<br>මාක්ස්ගේ ඉටිගොසය<br>ඉතිං අපිට Pද<br>උන් යැපෙනවා අපි මත්තේ<br>එතකොට උන් පරාධීනයි<br>අපි ස්වාධීනයි<br>ඇත්තටම<br>අපි නැත්තම් උන් කවුද ?<br>නිකම්ම නිකමො<br>කාලයට විතරක් අයිති වුන<br>උන් අදත් ජීව මානයි<br>අපි නිසාම<br>ඔව්<br>අපි නිසාම |

| | | | | |
|---|---|---|---|---|
| 219 | | කාමර | Hostel | සරසවි පහස<br>සුන්දර යැයි සිතා සිටියද<br>අන්දනන් නොදනිති<br>මෙහි අරුම<br>සෙමෙස්ටර් Exam කට උඩට ආවහම<br>බෝසත්වරු අප දුටුවොත්<br>නියතයි<br>අභිණිෂ්ක්‍රමණය කරනවා<br>කැන්ටිමේ ඇන්ටිගෙ බත්කාලා<br>ඉඟ සුඟ දැන් ගතහැකිය මිටින<br>අඩසඳ බඳු පටු නලලත<br>කුරුලෑ බිබිලෙන් පිරිඇත<br>අක්බඩරුවන් කෙස් කලබ<br>නරකෙසින් පිරි ඇත<br>පුන් සඳ සේ දිස් වුවන<br>දුටුවිට<br>සසරම කලකිරෙයි<br>මහාමේරුව උසුලාගත් සේය<br>අද පෙනෙනුයේ<br>කඩු දුණු හරබයට වඩා<br>කලාස් හරබය<br>බොහෝ දුෂ්කරය<br>මෙයද අපමනවු දුක් පිරි<br>දුෂ්කර ක්‍රියාවක්මය |
| 220 | | කාමර | Hostel | කොටියා සිංහයා ගොරවා රවා පනි<br>ඒ නිසා ඔවුන් රුදු බව ලෝකයා දනි<br>මිනිසා සිනාසෙයි කරුණා දයාවෙනි<br>හදපපු කැවුතු අමු අමුවේ කඩා ගනි |
| 221 | | කාමර | Hostel | ශිල්ප උගත්තෙමු<br>තව මොට වුවෙමු<br>ඇතිවු දෙයක් නැත<br>මෝඩයා වනු හැර |
| 222 | 1 | කාමර | Hostel | නිබන්ධන ඉවරයක් නෑ<br>Mid එනවා<br>End එනවා<br>Exam ඉවරයක් නෑ<br>ඔළුව බරයි නිතර<br>යෞවනය දිරාපත්වී<br>අජීවී පොත් අතර |

| | | | | |
|---|---|---|---|---|
| 223 | | කාමර | Hostel | බඩගිනි වෙලා මා ගිය කල කැන්ටිමට<br>දහයේ බත් එකක් දුන්නයි මා අතට<br>ගන්දෝ නොගන්දෝ කියලා සිතුනි මට<br>බඩගිනි නිසා ගත්තයි එය මා අතට |
| 224 | 1 | කාමර | Hostel | පෙරුම් පිරුවේ කැම්පස් යන්නයි<br>පැතුම් පැතුවේ ඩිග්රි ගන්නයි<br>සිතා සිටියේ ස්ටාෆ් යන්නයි<br>මේවා ලිව්වේ හිනා යන්නයි |
| 225 | | කාමර | Hostel | ඇවිත් නුගපිටිය<br>දෙසනා දුටුව කටිය<br>මතක් වි කුටිය<br>ඇරිඇනුම් සිය දෙසිය |
| 226 | | කාමර | Hostel | සරසවි සිහිකර කර බොග දැම්මානේ<br>බොහෝ දෙනා අතරින් අපි ගොඩ ආවානේ<br>අම්මා සිහිකර කර මෙහි ඉන්නවනේ<br>හොස්ටල් ජිවිතය දැන් මට එපා වෙලානේ |
| 227 | | කාමර | Hostel | සැමදා මම සින්නන් හට කඩේ ගියා<br>Mid.End වලට මම බයකින් ඉදගත්තා<br>First year මෙහෙමයි කියලා සතුටු වුණා<br>Special නැතිවෙයි සැමදා තැවුණා |
| 228 | 1 | කාමර | Hostel | අම්මේ ඔබේ සනා සපිරුනු මුව මඩල<br>මතක් වෙනවා මෙහි ඉන්නා සැම විට<br>පින්මේ දුවන් යන්නට සිත කියයි මට<br>යන්නේ කවදාද ඔබේ රුව දකින්නට |
| 229 | | කාමර | Hostel | පොත් අතර රැදුනු සිත<br>උලමන්ගෙ කෑ ගැසීමෙන්<br>තඩි බලලුන්ගෙ භයංකාර හඩින්<br>සලිත වී<br>ගත හිරිගඩු පිපුන මුත්<br>උපාධිය රැගෙන<br>මව්පියන් බැහැ දකින්නට<br>යා යුතු නිසාවෙන්<br>තද කරන් ගැහැනු සිත<br>නිදි වරම් පොත් අතර<br>වෙන කලයුතු යමක්<br>නැති වු නිසාවෙන්. |

| | | | | |
|---|---|---|---|---|
| 230 | 1 | කාමර | Hostel | අසව් අසව්<br>අනේ දෙවියනේ මට වුනු වියෝයා<br>මාස 2 නොදැනිම Rag වුනෝයා<br>කළයුතු නොකළ යුතු දේ නොදැනුනෝයා<br>මට සහතිකයි End ඇන ගන්නවොයා |
| 231 | | කාමර | Hostel | තරු<br>රෑ සඳ ඇවිදින්<br>මා ගැන ඇහුවොත්<br>කියන්නෙපා මා<br>දුක් කඳු අතරේ<br>හැංගී සිටි වග<br>මෙතුවක් කල් |
| 232 | | කාමර | Hostel | සංසාරයේ අපමණ මල් ඇතුවාට<br>එකම මලක් කපන්න පින් නැතුවාට<br>දිගට හරහට පෙරලෙම් දුටු දුටුවන්ම<br>යන්න රටක් මට ඇද්දෝ හෙට දිනට |
| 233 | 1 | කාමර | Hostel | රතු පාටින් කහ පාටින් මල් ඇතුවත්<br>තෝර ගන්නෙ කොහොමද මා එකම මලක්<br>පැණි බේරෙන මල් සේරම මගේ උනත්<br>බලාගෙනයි ඇණ තියන්නේ වදී උලක් |
| 234 | | කාමර | Hostel | ටිපෙක්ස් කළ නොහැකි දෙය පතිවතයි |
| 235 | | කාමර | Hostel | දහදුක් විදලා අනේ මම<br>කැම්පස් ආවාග<br>තව දුක් විදින්නට මම<br>ආයෙම වලට ගියාග<br>දුප්පත් අපට මහපොළ තාමත්<br>නැතුවා<br>රැකියාවකට කවදා අපි<br>යොමුවේවා. |
| 236 | 1 | කාමර | Hostel | නංගි මගේ දුක් විදිනවා අර ගෙදර<br>මමත් මෙහේ දුක් විදිනවා හැම නිතර<br>ඩිග්රිය තමයි මේ හැම එකටම පිහිට<br>අනේ මගේ ඩිග්රිය නුඹ දුක් ගොඩක. |

| ID | Selected | ස්ථානය | ගීතය |
|---|---|---|---|
| 1 | | | මගේ සිත් අහස ලඟ<br>දුකේ දී සැපේ දී තනි රැක්ක<br>පුංචි ඉරබටු තරුව වේ නුඹ<br>සොයුරියේ........<br>අමතක කළ යුතු ද<br>පිපෙන සකුරා මියෙන බව ගිම්හානයේ |
| 2 | | | පිපාසයට දිය පොදක් ය<br>අඳුර නිවන පුන් සඳක් ය<br>පුරන් කුඹුර අස්වැද්දූ<br>ඔබ මගෙ ලොව දෙවි දුවක් ය<br>සුසුම් නිමා වී<br>සැනසුමට මග වී<br>සිටිනා වූ සැම දිනේ<br>ඔබය මගෙ ජීවිතේ<br>ඔබ සඳ ය<br>මා මුහුද- එනමුදු ඔබ පැහැය<br>වැටෙන තැන -බොහෝ සසලයි මා<br>බොහෝ සසලයි<br>මම නුඹට පෙම් කරමි<br>නුඹ නොදනියි එහි තරම<br>මල් පෙති විසිරුණු සරසවි මාවත<br>සිහින පැතුම් මල්<br>විකසිත කරවන<br>ඔබේ හදින්ම<br>ලද අපමණ සැනසුම<br>ගෙනෙමි දිවියට- සදා අමිල නුඹ<br>පන්හිඳ නුඹ කිම ද දහේ<br>නොලිය තව ලියන්න<br>මේ පවුරු ලියන්න<br>ලීවත් නොලීවත් -ඒ පැදි පේලි අනේ<br>සිතිවිලි මගේ පෑරෙනවා නිබඳ මා සිතේ |

| | | | |
|---|---|---|---|
| 3 | 1 | | මහ මෙරක් ලෙසට<br>මා පැතු පැතුම් නුඹ ගැන<br>ගිරි කුලක් ලෙසට<br>බැඳි ඒ දෙමාපිය පැතුමන්<br>හිස් ලොවක් ලෙසේ<br>මා දැනෙන විටදි හැඟුමන්<br>නිල් දියඹ ලෙස<br>මට සරදම් නොකරන්<br>සිතන තරමට කඳුළු බිඳුවක්<br>මෝදු වන තරමට සිතේ<br>රිදව රිදවා කිමද සොයුරිය<br>ලැගුම් ගෙන මා හදවතේ |
| 4 | 1 | | සඳ එළිය නුඹයි ජිවිතය<br>ජිවිතය ආලෝකමත් කළ<br>ඒ ආලෝකය දිගේ -දිගු ගමනක් යන්න<br>මා හිඳිම් මග බලාන- තවත් කල්පයක් වුවත්<br>මට ඉන්න හැකිය- නුඹ සඳ එලිය නම්<br>සඳ එලිය මගේ නම් |
| 5 | | | මේ කුරිරු ලෝකයේ- ඔබගෙ මෙන්<br>දයාබර හිතක් කොහේ සොයම් ද? |
| 6 | 1 | | ආවත් උඩ පැන ඩිග්රිය අරගෙන යන්න<br>තාමත් බැරි වුණා මට ඩිග්රිය ගොඩ ගන්න<br>අවුරුදු දෙක තුනක් සිදුවිය මට ඇණ ගන්න<br>ඩිග්රිය එපා මට මම යනවා යන්න |
| 7 | | | ලව් නම් අසාර ය<br>කෑම නම් සාර ය<br>බඩ කට්ට මාර ය<br>අහෝ වාටඩි භයංකාරය |
| 8 | | | University ආව අපි කළ පිනට<br>Rag එකකුත් කෑවා නියමෙට හොඳට<br>Digree ඇතත් කර පින්නා ගෙන යසට<br>Job එක නැතිව මොන ඉටි ගෙඩියද අපට |
| 9 | | | මදුරු පිරිස හැම තැනකම දැවටෙනවා<br>නෝට්ටි පොදිය අත් තල මත වැජඹෙනවා<br>නිදිමත දැනේ නොදැනිම නෙතු පියවෙනවා<br>ඩිග්රිය ලැබෙන තුරු මේ දුක වළඳනවා |

| | | | |
|---|---|---|---|
| 10 | | | සරසවිවලට ක්‍රෑම වර්ග ගොඩක් ඇත<br>එනමුත් අනේ මෙන්ඩිස් ලා රැහුණෙ නැත<br>සැම කොකු වර්ගයට එලෙස්න්ම ලැම්බට් ද ඇත<br>සරසවි වචන සැම තැනටම උචිත නැත |
| 11 | | | රැයක් විඳින්නට<br>වේලක් රසට කන්නට<br>මිතුරන් හා වෙසෙන්නට<br>දිනක් ඒවි ද හිනාවෙන්නට |
| 12 | | | පුරුවෙ කරුමෙකට විභාගෙ පාස් වෙලා<br>සරසවි ආවෙ නිවනත් මේකයි කියලා<br>පැනට පොතට ගත හිත උගසට තියලා<br>ඇති බව පෙනෙන කොට ජීවිතෙ සින්න වෙලා |
| 13 | | | කලා වැවේ නිල දියවර නුඹ අම්මා<br>එහෙම කියූ නුඹ වැරදිය අපෙ අම්මා<br>වරදක් වුණා නම් මා හට වෙන්න සමා<br>දියවර දකින නෙත් දෙක නුඹ අපෙ අම්මා |
| 14 | | | අපි ආවේ ඉගෙන ගන්න<br>අපිට වුණේ නොකා ඉන්න<br>ණය තියෙනව ඉහ පිරෙන්න<br>අපි යනවා ගෙදර යන්න |
| 15 | | | පාඩම් කර ඉවර නොමැත දෙවියනේ<br>කුමටද මා සරසවියට තේරුණේ<br>වැරදුනාම ඇණ ටොප් එක වදිනවා<br>ඊට පස්සෙ රෙස්පට් එක බහිනවා |
| 16 | 1 | | පුරුවෙ කළ පවට සරසවි ආවාට<br>යන්නට වුණේ නැත ගම කලකින් බෝම<br>නිවාඩුවක් නැත ගම යන්නේ කෝම<br>නන් ඇකඩමිය වැඩ වරපන් හැමදාම |
| 17 | | | අට ලෝ දහම ජකබක ගා සෙලවෙනවා<br>කවදාහරි අපි කාටත් කෙළවෙනවා<br>ඒබ ව දැන දැනත් අපි කැම්පස් යනවා<br>එළියට ඇවිත් අට්ටාලේ බුදියනවා |
| 18 | | | මේ කොයි යන්නේ<br>කැම්පස් යන්නේ<br>කවදද එන්නේ<br>නැත අප දන්නේ |

| | | | |
|---|---|---|---|
| 19 | 1 | | කැම්පස් එකේ බත් කැවේ අපි එකට<br>ලයිබ්‍රිරියේ නිදි කැරුවේ අපි එකට<br>අවුරුදු තුනක් කුප්පි දැම්මෙ අපි එකට<br>අපි යහළුවේ මෙහි ආවේ පෙර පවට |
| 20 | | | සුපිපුණු මලට එයි බමරුන් රොන් ගන්න<br>උන් දඟලන්නෙ රොන් අරගෙන පැන යන්න<br>මුකුලිත මලට බැහැ යළි විකසිත වෙන්න<br>මල දැනගත යුතුයි සුපිපුණු බව රැකගන්න |
| 21 | | | දින දින ගෙවෙනවා අපහට නොදැනී ම<br>පිස්සන් වගේ කොල්ලන්ගේ හැසිරීම<br>කරලත් බැරිය නොකරත් බැරිය ඉගෙනීම<br>කොහොම හරි කරමු එගොඩට පිහිනීම |
| 22 | 1 | | කැම්පස් කැන්ටිමේ තොරතුරු සෝ බරය<br>හැමදාමත් කන්නෙ පරිප්පු හා පලා මය<br>කුසගිනි නිවෙන්නේ මලකඩ වතුරෙන් ය<br>මෙහෙමයි ගෙවෙන්නේ සරසවි ජීවිතය |
| 23 | | | පංති සමාජය පෙරළුණ දාකට<br>ඔබෙත් මගෙත් හදවත් සනසන්නට<br>ජීවිතයේ බර සැහැල්ලු වන තුරු<br>ඉවසිල්ලෙන් මේ ගමන යමු |
| 24 | 1 | | ඉගෙන ගත්තෙ හිස කොස් මල් දරන්නයි<br>අපි පැතුවේ ලෝකෙට සෙත සදන්නයි<br>අහෝ මිතුර ඉගෙනුම ජය ලබන්නයි<br>අද සිදු වුණේ මහ මඟ දුක් විඳින්නයි |
| 25 | 1 | | පාසැල් ගමන කරදර මැද නිම කරවා<br>දහසක් පැතුම් මැද මම සරසවි ආවා<br>හොඳ මිනිසෙකු වෙන්න සැම දා සිත කීවා<br>මා පැතු පැතුම් මේ බිම තුළ ඉටු වූවා |
| 26 | | | කැටපත් පවුරෙ ගී ලීවා මට මතකයි<br>සරසවියේ මුලු හතරේ දුර බැලූවා මට මතකයි<br>පොත් මිටියේ බර බැලූවා මට මතකයි<br>ආදරයේ සුව වින්දා මට මතකයි |
| 27 | | | ක්‍රෑම දාන විට බොග සෙට් වෙන්න එපා<br>අතේ සතේ නැති විට බඩගිනි වෙන්න එපා<br>මෙදා පොටේ එග්සෑමට ඇණෙනු එපා<br>යළි මේ බිමට එන්නට සිදු වෙන්න එපා |

| | | | |
|---|---|---|---|
| 28 | | | එග්සැම් ළඟ ළඟ ය සහනය නැත සිතට<br>වමරියෙ පාන් වත් නැත බඩගිනි වුණ කලට<br>ගජේට තුන්දෙනයි හරහට එක ඇඳට<br>මෙහෙම වෙලා මදි සරසවි ආවාට |
| 29 | 1 | | වැහුවානම් කැම්පස් වැහුවා මය<br>ආවානම් කැම්පස් ආවා මය<br>කෙරුවා නම් අපතේ කෙරුවාමය<br>ගත්තා නම් එග්සැම් ඇණගත්තාමය |
| 30 | | | සඳ කැලුම් රැස් වෙලා<br>මල් පුදින පාන්දරට<br>මැණියනි පියාණනි<br>ඔබ අරුණැල්ලකි ගණඳුරු දිවියකට |
| 31 | 1 | | ගොක් කොළ සැරසිලි<br>නෙක විසිතුරු පහන්<br>රතු පළස් මල් වඩම්<br>එප ා මා මළ දාට<br>රතු පාට මල් පිපුණු අරලියා ගසක් ළඟ<br>වළලන්න මගෙ විනිය<br>මගෙ උන් වල දැමුණු |
| 32 | | | පද බැඳුනු එකින් එක<br>මැද මැවුණු විමන් සුර<br>සිතට ගෙනෙන සිහිල් සුවය<br>මුමුණන මුමුණන මොහොතට<br>දිවිය අලුත්වන<br>කවිය නුඹයි<br>නුඹේ මතකයයි |
| 33 | 1 | | ජිවිතේ හුඟක් දේ කියා දුන්<br>නුඹ හැ රදා යන්න වෙලා<br>අපේ සිනහව අපේ කඳුල දිහා<br>නුඹ බලාගෙන හිටියා<br>ඒත් අපි අද වෙන් වෙලා<br>කවදාවත් මතකයෙන් හැර නොයාවි<br>නුඹ තුළ රැඳුණ කාලය<br>සිත් නැතත් හැර දා යන්න<br>සමු ගන්නම් මෙසේ |

| | | | |
|---|---|---|---|
| 34 | 1 | | ජිවිතයේ පැතිකඩ<br>විවරණය කරන්නට<br>මඟ පෙහෙළි කළා වූ<br>නුඹ තුරුල<br>හැරදමා යමි<br>තවත් කල් හිඳින්නට<br>වරම් නැති හෙයින් |
| 35 | | | ජිවිතය<br>මගේ නොව<br>උරුමයට<br>සිනාසෙමු<br>හදවතින්<br>එකට හිඳ |
| 36 | 1 | | සිව් වසරක සරසවි<br>දිවි මගේ<br>බොහෝ සන්ධිස්ථානයන්<br>පසු කොට<br>අද අප ඉන්නේ<br>කොතැනකද<br>හෙට දිනයේ සමුගන්නේ<br>කෙලෙසකද<br>අපේ අතීතය අමතක<br>කර දමා<br>සරසවි මවුනි<br>අප ඔබගේ දූ දරුවන්<br>ගොන්නෙන් තවත් එක්<br>කොටසකි<br>සමු ගන්නම් හෙට දිනයේ<br>ඔබ උණුසුම තුරුලු කරන් ˜ |
| 37 | 1 | | කැකෑරුණ බොර දියට<br>සුපිපි කුසුමක් ලෙසට<br>මේ විෂම ලෝකයට<br>හිමිය නුඹ යම් දිනක<br>පිපෙයි නම් ඒ ලොවේ<br>පිරුණු මිනිසෙකු ලෙසට<br>නුඹයි ඒ සුදු නෙලුම<br>බොර දියම අලුත් කළ |

| | | | |
|---|---|---|---|
| 38 | | | තග දමූ තෙල බෙදූ<br>ඹල් පාර ගොලූ වෙලා<br>බෙන්ච්වල ටේබල්වල<br>හිර වෙලා වාඩි වුණා<br>යුගය දැන් නිම වෙලා<br>නාඳුනන උන් ලෙසින්<br>අලුත් යුගයක් එළඹිලා |
| 39 | 1 | | බඩගින්න කුසගින්න<br>ඇවිලෙයි ඉතින්<br>විඳවන්නෙ රිදවන්නෙ<br>ඇයි මේ ලෙසින්<br>කොයි කවුරුැ දුන්නා ද<br>මේ ගිනි ඉතින්<br>ඉවසන්න පුලුවන්ද බඩගිනි අපේ<br>බඩ දන්නෙ බඩගින්න වැඩි හන්ද නේ<br>පිටි බිව්වෙ ඒ ගින්න දුරලන්නනේ˜ |
| 40 | | | සිව් වසරක් ගෙවූ දිවිය අමතක කරලා<br>යන්නට වෙන බව දැනුනම මෙය අතහැරලා<br>වැටුණු කඳුලු ලේන්සුවෙන් නෙත පිස දාලා<br>සිනාසෙමු ද සොයුරිය අපි අත්පොඩි ගසලා |
| 41 | | | නිදිමත දැනේ දැන්නම් මට පෙරට  වඩා<br>කුසගිනි දැනේ තුන් වේලම ඊට   වඩා<br>බයකුත් දැනේ ඇණ වේ යැයි ක්‍රෑම  නොදා<br>නිදිමත ඇවිත් බොඳ නොකරනු සිහින  මෙදා |
| 42 | 1 | | පිපුනු මල් කිසිත් නැති<br>සුවඳ මුසු බියක් ඇති<br>කඳුලින්ම පෙඟී ගිය<br>මල් පිර නුඹම විය |
| 43 | 1 | | අල්ලට සිඟාවත් රස නැති කැවිලි කකා<br>ලෙක්චර් හෝල්වල ලැග්ගා මකුණො කකා<br>සිව් අවුරුද්ද ගෙවනට මරුැ පහර නොකා<br>පිං දී ගන්නවා මහපොල සිඟා කකා |
| 44 | 1 | | කිරි නැති තේ එකයි බොන්නේ මිල දෙකකි<br>ලුණු නැති ව්‍යංජන කන්නේ සැර නොමැති<br>බත් බව පෙනෙන්නට මෙන් බත් පිඩක් ඇති<br>පෝෂණ ඌණ උගතුන්ගෙන් පලක් නැතී |

| | | | |
|---|---|---|---|
| 45 | | | සිව් වසරක් ගෙවී ගියා<br>අප සැම අත විසිර ගියා<br>යළි ඔබ මුණ ගැසෙන තුරා<br>පතමි සතුට දිවිය පුරා |
| 46 | | | පොත් මිටිය මනරම්<br>විභාගය ළඟ නැත්නං<br>ඇස්දෙකත් රතුවෙලා දෑං<br>මැදියමත් පහුවෙලා බං |
| 47 | 1 | | නුඹ සහ මම<br>කෙනෙක් ලිවත්<br>ලියා අවසන්<br>කරන්නට අපොහොසත්<br>වචන දෙකකි<br>නුඹ සහ මම |
| 48 | | | ඔබ වැවකි<br>දිය පිරුණ<br>මම වෙලකි<br>පුරන් වුණ |
| 49 | | | දුරකථනය හා මම<br>අවසානයේ<br>ඉතරි වූයේ<br>බිල පමණි |
| 50 | | | නැව ගොඩ බානවා ආවෙමි බඩු ගන්න<br>තෙල් ලීටර් ගණන් පෙව්වෙමි පොර වෙන්න<br>පස්සෙන් ගියෙමි කටු කෑවෙමි මද ගහගන්න<br>පෙම් කළ පවට පුදනෙමි ඩිග්රිය ගන්න |
| 51 | | | එක චමරියක වළඳන්නට එකම බත<br>ගස්යට නිදියමින් කියවමින් එකම පොත<br>දහසක් කඳුලු මැද කිසි දා නොතබ සිත<br>යළි මුණ ගැසෙමු මේ සරසවි දෙරණ මත |
| 52 | 1 | | දහඩිය සුවඳ වැගිරෙන රතු දිනට මලේ<br>අපෙ උන් නැළවෙනව වැද ලොකු උන්ගෙ දෑලේ<br>පෙරමග ගන්න බැහැ මට සරසවියෙ මලේ<br>මතු දා දින්වා කම්කරු සමගි බලේ |

| | | | |
|---|---|---|---|
| 53 | 1 | | නිදිමරලා ක්‍රෑම දාල තට්ටෙ ටිකක් පෑදිලාය<br>දවස තිස්සෙ වාඩිවෙලා ඇට කුට්ටම පොඩි වෙලා ය<br>ක්‍රෑම දාල මුලු දවසෙම ඇස් දෙක ලොව්ගෙඩි වෙලාය<br>කවදා හරි තෝ මැරෙන්නෙ පොතක් අස්සෙ හිර වෙලාය |
| 54 | | | ගෙවන ජීවිතය දෙස<br>යළි වරක් බැලුවෙමි<br>කිසිම මාවතක් නැත<br>නොදැන ආවයි සිතේ |
| 55 | | | නිහඬව හමන<br>මද නලකට  පුලුවනි ද<br>මට නුඹ සුවඳ ගෙන දෙන්නට<br>ඉදින් නුඹ මට<br>සුවඳක්ම නම් |
| 56 | | | ශිල්ප හොඳින් ලැබූ මට  මහ උගතෙක් වීමට<br>වසරකට පෙර<br>පැමිණියෙමි රුහුණු සරසවියට<br>උපාධිය නැමැති<br>කටු ඔටුන්නෙන් අබිසෙස් ලැබූ මට<br>සිව් වසරක්<br>දුෂ්කර ක්‍රියා කළ යුතුය අප<br>කුසට දළ අහර<br>කටු යහනේ සැතපෙන්නටවත්<br>නොමැත වරම්<br>රෑ තුන් යාමයේ නිදි වරා<br>වනපොත් කළ යුතුය විෂයයන්<br>සියල්ල ඉවත දා<br>දිව යන්න සිතේ<br>ඔවුනි මබ සොයා<br>නිදහසේ බත් පිඩක් කා<br>ඔබ තුරුලේ සැතපෙන්න |
| 57 | | | නිබන්ධන අත දරා<br>ඔක්කොටම ක්‍රෑම දෙද්දි<br>නිදි කුමාරි හොරෙන් විත්<br>මා වෙතට ඉඟි කරයි<br>නිදි ලොවට රැගෙන යන්නට<br>නිදිලොවේ දෑහැන් බිඳ<br>මදුරුවන් මොර දෙද්දි<br>නැවතත්<br>අතට එයි නිබන්ධන<br>ඇස් දෙකට වද දෙන්න |

| | | | |
|---|---|---|---|
| 58 | | | යුනිට් ක්‍රමය<br>ඔහොම ටිකකට නවතින්න<br>අපිටත් ආසයි<br>කුප්පි එසයින්මන්ට්<br>කටු කම්බිවලින්<br>වට වෙච්ච ලයිබ්‍රියෙන්<br>එහා ලෝකය දකින්න |
| 59 | | | දකුණතින්<br>දකුණැස වසා<br>හ' නගව්<br>දකුණැස නොපෙනෙන<br>වග කියාම |
| 60 | | | ඩිග්‍රිය ගන්න කන කටු බලපන්කො බොලේ<br>කෙසඟ සිරුර පමණක් අන්තිමට මලේ<br>ක්‍රෑම දමන විට කවියක් ලියම් වලේ<br>කැම්පස් අයට වෙන ඉන්ටව් මොකද බොලේ |
| 61 | | | වසරක් ගෙවී නව වසරක් එළඹෙනවා<br>අපිටත් නොදැනි අපි තව වයසට යනවා<br>සරසවි බිමේ අපි තවමත් ලතැවෙනවා<br>අනාගත පැතුම් එකිනෙක බොඳ වෙනවා |
| 62 | | | නිර්මල ආදරයෙ පිවිතුරු රසය රැඳි<br>සරසවි පෙම්වතුන් මා ගරු කරන නිති<br>සලෙළුන් වෙසඟනන් වී දිව රෑ රැහැන නිති<br>දිව රෑ සිහිනයෙන් බිතු සිතුවම් අඳියි නිති |
| 63 | 1 | | මසකට දෙතුන් වරක්වත් නංගිව දකින යකා<br>දැන් මක් වෙලාදැයි කම්පා කරන එකා<br>ඌ දමනය කරගන්නෙ අත වමනය කරන නිසා<br>අනේ මොනවා කරන්නද සෙමෙස්ත්‍රි කරන විනා |
| 64 | 1 | | ධනපති පන්තියෙන් පැන තැන අරගත්තු<br>කලා පීඨ අධිපති ඕ අතපත්තු<br>තම නිල බලය ගිනි අවියක් කර ගත්තු<br>නොමරා මරණවා සරසවි දූ පුත්තු |
| 65 | | | සූරා කමින් සුළු පිරිසක් විඳිති සැපා<br>වැඩි පිරිසකට එනමුත් එය දුකකි අපා<br>ඉල්ලම් ඔබෙන් ඉල්ලීමක් වැළඳ දෙපා<br>වීරයො මිසක නිකමුන් බිහි කරනු එපා |

| | | | |
|---|---|---|---|
| 66 | | | පානුයි පරිප්පුයි දවසක බුදු වේවා<br>ගෝවයි අලයි සැරියුත් මුගලන් වේවා<br>කැන්ටිමෙ හොද්ද නේරංජන ගඟ වේවා<br>කැන්ටින් මුදලාලි කන්ථක අසු වේවා |
| 67 | 1 | | සිහිනෙන් පවා මගෙ සුබ විහරණය පැතු<br>රජකම පතා මම රජගෙට යතැයි සිතූ<br>අම්මා දනී නම් මේ සරසවියෙ තතු<br>අදම අරන් යයි මේ දුක් විඳින පුතු |
| 68 | | | දුම්බර කන්ද බැසගෙන ආ ටිකිරි නගා<br>අන්දර කැලේ වැට ගාවදි දුටුව නගා<br>ගන්දර පාරෙ මකුළු පපා ආපු නගා<br>අපිට නොදී සීනියර්ට දීපු නගා |
| 69 | 1 | | නොහ’න් සරසවියෙ හෙළමින් කඳුළු කැට<br>වැඩ නැති මොලේ ඇති උන්ගෙන් ඔවුන් හට<br>විරැකියාව අවසන් කොට දමයි හෙට<br>රැකියාවක් පතා මම යමි සිපිරි ගෙට |
| 70 | 1 | | කළු ලෝගුවක් ගත දවටා ගෙන<br>උපාධිය නැමැති කිරුළු පළඳින දින<br>හීන දම් පිරූ මුත් සොයුරනි නුඹට<br>තහනම් බිමක් වූයේ ඇයි සරසවිය |
| 71 | | | බිඳෙන රළ පෙළ මුසුව යා නම්<br>නැගෙන හද ගැබ තුරුණු වේ නම්<br>සොබා දහදත් රුසිරු වේ නම්<br>නගවි පියවර යන තැනකට |
| 72 | | | සරසවි මැණියනි<br>මගේ දයාබර<br>නුඹ අපට එක් කළා<br>මීට සිව් වසරකට පෙර<br>ඉතින් නැත් ද සරසවි මවුනි<br>අපව මෙලෙස<br>වෙන් කරන්නට<br>දුකින් නමුත්<br>හැර යන්නම්<br>භාර දී නුඹට<br>පුංචි නංගිලා මල්ලිලාට<br>යන මොහොතේ දී<br>තවත් එක් වරක්<br>හැරී බලන්නම්<br>දයාබරත්වයෙන්<br>නුඹ දෙස |

| | | | |
|---|---|---|---|
| 73 | | | සරසවි බිම මා කොතැනක වුවද<br>ඒ හැම තැන ඔබෙ මතක නොඒවි ද<br>සෙවනැලි එකිනෙක පැටලි පැටලී<br>යන්නට ආයෙත් දවසක් ඒවි ද |
| 74 | 1 | | සිහින සැබෑ නොවුනා වේ<br>සිහින ලෙසම තිබුණා වේ<br>සිහින ලෙසම සිහින තිබී<br>සිහින උනාවේ |
| 75 | 1 | | හෙට හැදෙන උන්ගෙ අනාගත<br>පැතුම සුන්දර විය යුතුයි<br>කොන්ද පණ නැති මිනිසුන් ලෙස<br>එනමින් එක් විය යුතුයි |
| 76 | | | සකිය<br>අපි<br>යෞවනයෙ<br>කටුරොද<br>සෙනෙහසෙ අල්තාරය<br>මත හොවා<br>සුමට යයි<br>සිතමු |
| 77 | 1 | | සරසවි මවුනි දයාබර<br>ඔබෙ දරු දැරියන්<br>දස අතම විසිරිලා<br>නැණ ගුණය පිරිහිලා<br>විනාශය අත දරා<br>එනිසාම<br>මාතාවනි<br>සියලු දරු දැරියන්ට<br>යහ මගම පෙන්වන්න |
| 78 | | | සුන්දර වු සරසවි දිවිය<br>කටුක වු මතක සටහන්<br>සියල්ල හදවතේ රඳවාගෙන<br>ඉතින් අපි යන්නෙමු |
| 79 | 1 | | රට එක් ඇසක් ලෙසින්<br>ඇය අනෙක් ඇසක් විලසින්<br>දැනට දැක නොනැසින්<br>නින්ද මේ ගැන රකිමු වෙසෙසින් |

| | | | |
|---|---|---|---|
| 80 | | | වලට ඇවිත් විලසින් ගොඩ දාන ඇණ<br>හරුප ලියයි බිත්තියෙ ඉඩ රැඳුන තැන<br>මෙහෙමත් රටක් මිනිසුන් ඉන්නා අමන<br>ශිෂ්‍ය නොවේ ශිෂ්ණයි මේ වැඩ කරන |
| 81 | | | ඇණ පිට ඇණ මා වෙත පැමිණෙන කලට<br>පිහිට උණා ගොඩ එන්නට ලෙස රළට<br>ආවත් බමරු එන්නාසේ පැණි මලට<br>ඉතින් ආයුබෝවන් සමු දෙමි වලට |
| 82 | 1 | | බ්‍රහ්මචාරි වන්නයි ආවත් සරසවිය බලා<br>තනිකඩ මගේ සිත කකියයි ඔකඳ වෙලා<br>කවදා ලබන්නද පෙම් බස් දොඩනු සොබා<br>පිහිටක් වෙතොත් නුඹ විතරයි නංගි බබා |
| 83 | | | ආව නිසාම අපි ඩිග්‍රිය අරගන්න<br>මාසෙන් මාසෙට අපි විභාග ලිව්වා<br>දැනුමෙන් අපට කිසිවිට නැත වැඩ මෙව්වා<br>මොනවා කැන්නට වේවිද අනෙ මන්දා? |
| 84 | 1 | | ක්‍රැමක් දමන්නට ආ කළ වලට<br>බිත්තිය පුරා කවි පදවැල් බොහොම<br>පෙරදා සුරලොව ලෙස පෙනු සරසවිය අද<br>මිහිපිට අපායක් යැයි දැන් සිතෙයි මට |
| 85 | | | මාගේ මේ ව්‍යායාමය එය ලබා ගැනීමට නොව ඇණ නොවී ගොඩ යාමටය |
| 86 | | | නොයවා මතක තවතව මළ ගිය දේට<br>ගෙනයනු මිසක බර පටවන්නද කාට<br>අයිතිය රකිනු මිස යළි නොනැමෙයි ඊට<br>කෙනෙකුගෙ කඳුලු මොනටද මා මළ දාට |
| 87 | | | රෙද්ද බැනියම ඇන්ද සිංහල කොල්ලො- අද කොයි ගියා දෝ<br>ඩෙනිම ටී ෂර්ට් එකට බැස්සම සිංහලකම- මිය යාදෝ<br>අමනකම් සිත් පුරෝ ගෙන ලැබු ශිල්ප - දැයකට වටිදෝ<br>සුදනකම් යහපත් මිනිස්කම් සරසවිය හැර ගියා දෝ |
| 88 | | | උතුරා යද්දි හදවත් ඉසිකෝ මානෙන්<br>වෙහෙසෙති මිනිස්කම පෙන්නන්නට මුහුණෙන්<br>මුහුනේ දුකකි රැය දුටු දේකට සිහිනෙන්<br>කුමටද එළිය මට තව කෙනෙකුගෙ පහනින් |

| | | | |
|---|---|---|---|
| 89 | | | කළල මොහොතින්ම නුඹ ගබ්සා කරල<br>මා උපදින්නෙ තිඹිරිගෙයි නොවූ නිසාවෙනි<br>කෑ ගැසුවෙමු කොටුවෙ ලිප්ටන් රවුමෙ<br>ගින්දර තැබුවෙමු පඹයන් හට නෝර්වේ<br>ඔස්ලො නොවේ දැන් පිනිවා යන රාවේ |
| 90 | | | ඉර හඳ කියයි නරකයි දා හත කියලා<br>මට නම් සැකයි මොනවා වේවිද මන්දාම |
| 91 | | | ඇණ වුනු විභාගය යලි ගොඩ දාගන්නේ<br>හිනැහුණු මුහුණු ගැන හිත හිත දුක් වෙන්නේ<br>මල් උගුරක් උරා සමහරු සැනසෙන්නේ<br>අපි මේ වලට තව සති හතරයි එන්නේ |
| 92 | | | උපාධි සහතිකය<br><br>නිදි වරාගෙන<br>දෑස රිදෙනකම්<br>කුසගින්න දා<br>කඳුලින්ම ගත්<br>උපාධි සහතිකය<br>නුඹ අද<br>බලවතුන් ඉදිරියේ<br>දණින් වැටී<br>විරැකියා පෝලිමේ<br>පිටුපසම සිටින<br>උපාධිකාරයාගේ<br>සහතික ගොන්නෙ<br>නොවටිනාම සහතිකයයිම |
| 93 | | | ඔබ හට කොපමණ බාධා ආවත්<br>නොසැලි යනු<br>ඉදිරියම කරා<br>මේ ලොව කටුකයි<br>විවිධයි<br>විෂමයි<br>ඒබ ව දැන වැඩ කරනු සිතා<br>ඔබ ලොව ජය ගනු<br>නිසැකව සැම දින<br>දෙනෝ දහක් මැද නුවණ අරා<br>සතුටින් ඉනුමැන<br>ජීවිත ගමනේ<br>බාධක සැම දුක් ඉවත දමාම |

| | | | |
|---|---|---|---|
| 94 | | | විභාගය අත ළඟ<br>ශිෂ්‍යත්වය V.Cග ළඟ<br>පොලිසිය දොර ළඟ<br>ඩිග්‍රිය ගෙනෙන තුරු<br>මව්පියෝ ඉඳිකඩ ළඟ |
| 95 | | | සරසවි මවුනි නුඹ දරුවන් කුමක් වැනි<br>සුළඟට හසුව විසිරෙ මල් පොකුරු වැනී<br>මතකයෙ මැවෙන පෙර රූ ඡායාව වැනී<br>හමු වේ දෝ යළි සිත සනහා |
| 96 | 1 | | දෙපා වාරු නෑ<br>ඔබ හැර යන්නට<br>මා හැදූ සරසවි<br>මවුනි දයාබර<br>මා වැඩූ සරසවි<br>මවුනි දයාබර |
| 97 | | | බුමුතුරුණු විසිර ගිය<br>උඩු වියන් ඇඳී ගිය<br>මල් ඉහිරි මාවතක්<br>නොවේමැයි සරසවිය<br>නෙක් සිතුම් පැහැරගත්<br>ක්ෂිතිජ ඉම ඉක්ම ගිය<br>සිහිනයකි මිරිඟුවකි<br>කටු සහිත මාවතකි<br>මා දුටුව සරසවියම |
| 98 | | | ඉපිද තනියම මේ දියත<br>ඇවිද විරසකකම් මැද<br>රුදුරු මේ මහ ලෝ තුළ<br>නුඹට නුඹ මිස අන් කොඳ |
| 99 | 1 | | ඔසවන පය පෙරට තබමු<br>පා විලංගු බිඳලන තුරු<br>පතුරන හ' එක්ව නගමු<br>මුකවාඩම් ගැලවෙන තුරු<br>එකින් එකට ඇඟිලි ගනිමු<br>බැඳුන යදම් ගිලිහෙන තුරු<br>සැම දා අපි එකට හිඳිමු |

| | | | |
|---|---|---|---|
| 100 | | | නිවහල් හිරු පායන තුරුම<br>අරුණ උදාවෙයි<br>පා තැබෙයි සරසවිය<br>හ’ ඇසෙයි සීනියර්<br>හද ගැහෙයි බය හිතෙයි<br>නෙතු කඳුළු පිට පැනෙයි<br>උදා වෙයි සැඳෑ හිරු<br>සිහි නැගෙයි උදය වරු<br>සිනහ යයි ඇති තරම්<br>නෙතු කඳුලු නැගෙන තුරුම |
| 101 | | | බොහෝ දුක්ගැහැට විඳ<br>ගියා පුතු සරසවිය වෙත<br>තවත් බොහෝ දේ ඉගෙනුමට<br>එහෙත්<br>මේ කිමද පුත?<br>ඇඟ පතද වැහැරිලා<br>ඇස් දෙකද යට ගිහින්<br>බැරිය මට හැඳිනීමට<br>ගෙදර ආ මා පුතු<br>අනේ මගෙ පුතුනේ<br>එපා ඒ ඉගෙනීම<br>එන්න ආපසු ගෙදරම |
| 102 | | | ඉවසන දනා රුපු යුදයට ජය කොඩිය<br>ඒ කිව් එකාගේ කට කෑවත් මදි ය<br>ඉක්මන් වුනු එකා ළඟ බඩු හත අටය<br>බඩුවක් නොමැති මා තවමත් තනිකඩ ය |
| 103 | | | වලාවක් වෙලා නුඹ සිටිනා කල ට<br>කඳු මුදුනක් වෙලා මා සිටියා උසට<br>දවසක් සොයා ඇවිසින් නුඹ මා වෙතට<br>තුරුළු වෙනු ඇතැයි සිතුනා උණුසුමට |
| 104 | 1 | | අධ්‍යාපනය විකුණන බලවතුන් හට<br>එරෙහිව එක්ව නැගි සව්බල බිඳින්නට<br>කල මේ ව්‍යසනය නම් අනුමත කරන්නට<br>බැහැ අප හැමොම සොයුර ඔබ ළඟයි අද |
| 105 | 1 | | බඩගිනි වෙලා මා ගිය කල කැන්ටිමට<br>10 නෝට්ටුව දී ඉල්ලාගත් බත් එකට<br>අඹු එලවලු සමග වැඩි පොල්කුඩු එකට<br>දිස්නය දිදී හිටියයි මැස්සන් කන ඇට එකට |

| | | | |
|---|---|---|---|
| 106 | | | එකයි දෙකයි රෑ වෙනතුරු අපි කෑමේ යෙදුණා<br>වභාගය අත ලඟයි පොත් ටික ලඟ තුරුලු වුනා<br>කොක්කේ තුරුලු ටික දවසට ඇත්වුණා<br>ජොලියක් නැති ජීවිතය මට එපා වුණා |
| 107 | | | නිමා විය වසන්තය සරසවිය සැරිසරා<br>දැන් ඉතින් යා යුතුයි ගම රටට පය ගසා<br>කාටවත් නොපෙනෙන්න සිතින් ඉකි ගසගසා<br>නුඹෙන් සමු ගනිමි මම සමු නොගෙන බැරි නිසා |
| 108 | 1 | | හෙට ගැන සිතන විට බෑ කැම්පස් යන්න<br>ප්‍රතිඵල දකින විට බෑ කොහොමත් ඉන්න<br>ඇන වෙන බව දන්න හින්දා බෑ ඉවසන්න<br>ලඟදිම ඉතින් හිනෙව ගෙදරම යන්න |
| 109 | | | සිහිනෙන් පවා මගෙ සුබ විහරණය පැතු<br>අම්මා දනී නම් මේ සරසවියෙ තතු<br>සිහිනෙන් ඇවිත් සිත කියවන මෙවැනි තතු<br>අම්මා දනී නම් ගන්නේ අතට කොසු |
| 110 | | | දෙනෝදහක් ගැවසෙන සරසවියේ<br>තනිකම පාලුව දැනුණා නම්<br>කුටියේ කවුළුව විවර කරනු මැන<br>පවනක් වී ඔබ ලඟ ඉන්නව නම් |
| 111 | | | අසරණ මා වැනුවන් ලද විගස සරසවිය<br>ඇයි පෙරලෙන්නේ නුඹ නවක වද සවිය<br>ජීවිතය ජය ගන්න එන්නට වුණේ සරසවියට<br>අසරණ මා පෙලුවේ නවක වදය |
| 112 | | | ආදරය කලාවකි<br>කෙරුවොත් මුලාවකි<br>කාලය කා දමන<br>මල හත්වලාමකි |
| 113 | | | ආලය මුලිවකි<br>නිලය කලාවකි<br>කාලය කාදමන<br>මල හත්වලාමකි |
| 114 | | | රැග් සීසන් චිත්ත රෙදි<br>බාටා දෙක තනි වුණා<br>හේදුනාට අයියලාට<br>මල්ලියෙකුට ගොඩ ගියා |

| | | | |
|---|---|---|---|
| 115 | 1 | | කැන්ටිමේ බත් පතේ<br>ලුණු ඇඹුල් දෙකම නෑ<br>බත් කන්න හදන විට<br>ටැප් එකේ වතුර නෑ<br>විභාගය මතක් වී නිදන්නට හිතක් නෑ<br>උපාධිය ගත් දිනක<br>කොයි යම් ද දන්නෙ නෑ<br>ජීවිතය ජය ගන්න කියා<br>සරසවියටයි පිවිසුනේ<br>ඒත් මට ආ ලෙසට<br>ජීවිතය ජය ගන්න<br>ලැබේදැයි<br>මහා ප්‍රශ්නයකයි<br>පැටලුනේ |
| 116 | | | සබඳ අපි බොග නොවෙමු<br>සෑම දේ අල කරන<br>ප්‍රගතිශීලීන් වෙමු<br>සදහටම සෙත සදන |
| 117 | | | කඩයිම් බිඳ දමා සරසවියට පැමිණ<br>පැතුවේ යස ඉසුරු නොව<br>හෙට දිනේ දිනන්නටය නොබියව<br>එවන් දිගු මග මා ලඟින් හිඳ<br>සියත් මිතු දම් යදම් බැඳි ඔබ<br>හැර දමා කෙලෙස යන්නද<br>සතපවාලනු නොහැක මා සිත |
| 118 | | | ඔබ ගල් කුලක්<br>මා දිය බිඳක්<br>ඔබ ගල් කුලක් නොවී<br>වැලි කැටයක් වුනා නම්<br>තිබුණා මට ඔබ ලඟ<br>රැඳෙන්න<br>දුක ලඟ සිටි මා<br>අසරණ කර දා<br>සිනා සිසී නුඹ<br>සිටින අපුරුව |
| 119 | | | පාලමක්  තනන්නද<br>පවුරක් බඳින්නද<br>ඔබත් මාත් අතර ඇති<br>පරතරය |

| | | | |
|---|---|---|---|
| 120 | 1 | | සීනියර් කොල්ලන්ගෙ<br>චණ්ඩිකම්<br>කෙරුම්කම්<br>වීරකම්<br>ජූනියර් කෙල්ලන්ට<br>පවතින තුරු රැග් තෙමස<br>පසු අවධිය<br>බලු කුක්කන්<br>උන් ඉදිරියේ<br>නැට්ට හකුලුවා ගත්<br>අනේ රැග් එක<br>හරි හිනා |
| 121 | | | මෙහෙ වර ප්‍රෙසී මෙහෙ වර ප්‍රෙසා<br>කෑවද තෝ අසන විට<br>බත් නොව සිතුනි කන්නට තොගෙ<br>බොටුව මට<br>පල කැන්ටිමට දුවපිය දැන්<br>කාපන් කායන විට<br>අම්මප දෙන්න හිතුනා තොගෙ කටට මට<br>සෝෂල් බකට් දී සතියක් ගෙවුණ විට<br>නුඹ නෑ ඇහුවෙ කෑවද බං බොලං අද<br>දැනුණා රඟේ නුඹෙ ලෙංගතු රඟේ මට<br>හිතුණා තිබුණ නම් කියලා රැග් තවත් අද |
| 122 | 1 | | බිඳුණු  තල් ගස පාමුලට වී<br>කඳුළු ඇහිඳින රාජිනී<br>කැලි සුන් වී විසිර ගිය දා<br>තනි තමයි නුඹෙ සාමිනි |
| 123 | | | කැඩුණු ගේ දොර නැගුණු විජිතය<br>අතැර දා ආ රාජිනී<br>ඉතින් කෙලෙසක සිනා සෙන්නද<br>ගැටෙන අවි හ’ ළඟට වී |
| 124 | | | රිදුනු පපුවට හෙමින් කන් දී<br>අසමි නුඹ සිත ළඟට වී<br>ළඟට නොපෙනෙන සිහිනයක් ළඟ<br>නිහ’වම නුඹ<br>ඉකි බිඳී |
| 125 | | | ඇසෙන මළබෙර මැදින් ඇවිලෙන<br>එගිනි කවදා නිවේ දෝ<br>බිඳුණු තල් ගස යළිදු දළු ලන<br>සුවඳ කවදා දැනේ දෝ |

| | | | |
|---|---|---|---|
| 126 | | | සිය ජාතියේ ඉතිහාසය නැත දන්නේ<br>අභිමානයක් කෙලෙසද සිත මතු වන්නේ<br>ප්‍රගතිය පිණිස හෙට උපදින දරුවන්නේ<br>ඉතිහාසයෙනි පාඩම් ගත යුතු වන්නේ<br>රුපියල් ඩොලර් පසුපස නිති හඹා යන<br>ලෝකය තුළින් නොමිනිස්කම වගා විණ<br>සාහිත ඉතිහාස යන මේ රසායන<br>එන්නත් කළොත් එය සුරකියි නැසී යන |
| 127 | | | මං කැමතිම ඔයාගෙ ඔය ඇස් දෙකට<br>නිල්වන් පාටත් නෑ රතුම රතුත් නෑ<br>ලාවට බොර පාටට<br>ඒත් හිතන්න<br>උදේ ඉඳන් හවස් වෙනකන් බලං ඉන්නෙ<br>කොහොමද?<br>මං කැමතිම<br>ඔයාගෙ ඔය වචනවලට<br>හරිම අසාධාරණයි<br>ඒ මට ආදරේ නිසයි<br>ඒත් මතක තියා ගන්න<br>අසාධාරණය විනාසයට මුලයි<br>මං කැමතිම ඔයාගෙ ඔය රළු බවට<br>මගෙ සෙවනැල්ලට ආරක්ෂාව දෙන<br>ඒත් බලාගෙන<br>ආදරය රැකෙන්නේ<br>රළු බවට යටින් මෘදුබවක් තිබුණොත් පමණයි<br>මං කැමතිම<br>ඔයාගෙ ඔය උණුසුමට<br>ශක්තිමත් දෑත් තරෙ මාව හිරවෙද්දි<br>ඒත් පරිස්සමින්<br>උණුසුම වටින්නෙ සීතල තියෙනකං විතරයි<br>මං කැමතිම<br>ඔයාගෙ ඔය ආදරයට<br>මලක් මෙන් සුරකින<br>ඒත් වටහා ගන්න<br>ලෝකය පවතින්නෙ වෙනස්වීම මත පමණයි<br>කිසිදින වහන්නේ නැ යයි සරසවිය<br>කුලපති තුමනි නුඹ කී හැටි මනහරය<br>එනමුදු ඇවිත් ගත වයේ තුන් මසය |
| 128 | | | අනේ හොඳ තත්පරය<br>තව ටිකක් ලොකු වෙන්න<br>කල් වෙලා තව ඕනෙ<br>exam ගොඩ යන්න<br>මට නොවේ<br>මවුපියන් සනසන්න |

| | | | |
|---|---|---|---|
| 129 | | | සෝෂල් දුන්නෙ පොඩිවුන් හට<br>හිතේ රැඳුන සන්තෝසෙන්<br>ගොයින් ඩවුන් ඉල්ලගත්තෙ<br>කෙඳිරි ගාල අමාරුවෙන්<br>වෙනසක් පෙනේ ගත වූ ඒ<br>සිවු වසරක අතීතයෙන්<br>දුකයි දනේ සංස්කෘතිය<br>වෙනස් වෙලා සරසවියෙත් |
| 130 | | | තනිවම උපන්නෙමි<br>තනිවම මියෙන නිසා<br>දුක සැප හැඳින්නෙමි<br>මදහස පසෙක තබා<br>ඉඳහිට සිතුන මුත්<br>ලොව මා සමග කියා<br>මට මා මිසක වෙන කිසිවෙක්<br>නැතිය මෙදා |
| 131 | 1 | | Notes ටිකයි<br>photo ටිකයි<br>උපාධියයි<br>විතරක් ගෙන<br>හෙට යන අපි<br>Notes ටිකෙන් වැඩක් නොමැත<br>එහි කිසිවක් හිතේ නොමැත<br>උපාදියත් ඒ වගෙමයි<br>කවුද ඕක ගණන් ගන්නෙ<br>ඉතිරි වෙන්නෙ Photo ටිකයි<br>කරුණාකර පාලකයිනි<br>දෙන්න අපට රැකියාවක්<br>සිවු වසරක Photo ටිකට |
| 132 | | | අනේ කෙල්ලනේ පොඩ්ඩක් හිතාපං<br>කෑ නොලසා ඉන්නට හිත හදා ගං<br>බැරිම වැඩේ ඒකයි නොම සිතාපං<br>පාඩම් කරන අයහ ට ඉඩ තබාපං |
| 133 | | | අපි ආවේ ඉගෙන ගන්න<br>අපිට වුණේ කෑ ගහන්න<br>විභාගෙ ඇණ නොම කරන්න<br>අද සිටවත් සිතට ගන්න |
| 134 | | | මැත ඇනලයිස් ටික අල්ලා ගනිල්ලා<br>සිංහල සෝසො සයිකොත් A ගනිල්ලා<br>English level one ගොඩ දාගනිල්ලා<br>කොකු ඇණ වුණත් විභාගෙ ගොඩ වෙයල්ලා |

| | | | |
|---|---|---|---|
| 135 | | | මාරාන්තික ක්‍රෑම දාල හුළං කන්දෙ ආවේ අපි<br>මල් පාරේ තගේ අහල මොලේ කවල් වෙච්ච අපි<br>1st year Lecture නොයා කැට කරන්න ගියපු අපි<br>Crama නොදා පිස්සු නටල exam ඇණ වේවි අපි |
| 136 | 1 | | මිට මොලවා ගෙන රඳවා සිටියත්<br>අත නොරැඳෙන දේ නොරැඳේවී<br>රැඳෙන වරම් නැති රඳවා ගනු බැරි<br>සියල්ල දවසක නිම වේවී |
| 137 | | | අණබෙර ගසාගෙන<br>රටටම කියාගෙන<br>ඉතිං සැරසුනෙමි<br>diet කරන්නට මං<br>හරි යන්නේ නැතිය<br>බලන්නට බැරිය<br>මගෙ පංගුවත් ගෙන<br>මුං කන තරම<br>අදින් නවතිමි<br>diet නොකරමි<br>බඩට නොදැනෙන්න<br>diet කරන හැටි<br>සොයා ගන්න තෙක්<br>ඉතින් අත් හරිමි<br>තවත් තර වෙමි |
| 138 | | | ජිවිතයට කිසිම දෙයක්<br>අයදින් නෑ<br>මින් මතුවට<br>සමන් දෙවිඳු කමා වෙලා<br>විසිරුණු මගෙ සිත පමණක්<br>එක්තැන් කර දෙනු මැන මට˜ |
| 139 | 1 | | ජිවිතයේ හැමදාමත්<br>සිහි වුයේ ඔබට මෙමා<br>සිත විසිරුනු විට පමණයි<br>කෙසේ වෙතත් ඔබ හට මං<br>කමා කළා හැමදාමත්<br>ඒ වුනාට ඔබ නැවතත්<br>කරන්නෙ ඒ ගොං වැඩමයි<br>ඒක නිසා මින් මතුවට<br>ලැබෙන්නෙ නෑ මගෙන් සමා<br>-සමන් දෙවිඳු |

| | | | |
|---|---|---|---|
| 140 | | | හාල් 60යි පොල් 50 යි<br>ඒ දෙකටම සීය පනියි<br>හබුන් කටයි බත් දෙකටයි<br>තුන් වේලම එකම තමයි |
| 141 | | | මාලුපිනිත් නෑ වෙනසක්<br>තුන් වේලම එකම තමයි<br>ඇගේ පතෙත් නෑ වෙනසක්<br>හැමදාමත් එහෙම තමයි |
| 142 | | | මොනව කරන්නද රාළේ<br>පොල ඉවරයි මේ කාලේ<br>සිවු අවුරුදු අපි හිටියේ<br>මේ දුක් එයි නැහැ සිතුවේ |
| 143 | | | මම නැහැ මේව දන්නෙ<br>පොත් ගහන්න සල්ලි යන්නෙ<br>රුපියල් 1000යි ලැබෙන්නෙ<br>කණ කර බඩු උගස් වෙන්නෙ |
| 144 | | | රස්සාවක් හම්බ වෙයිද<br>මේ දුක් ගිනි හෙට නිවෙයිද<br>ඩිග්රිය මුල්ලට දාලා<br>හේනෙ කුඹුරෙ යන්න වෙයි ද |
| 145 | 1 | | කවුරු ද මේවා දන්නේ<br>පොලිටිකලුයි ඒව දන්නෙ<br>ඒ වුනාට මං හිතන්නෙ<br>නැහැ දෙවියොත් ඒව දන්නෙ |

| අංකය | Selected | ස්ථානය | Location | ගීතය |
|---|---|---|---|---|
| 1 | 1 | පුස්තකාලය | Library/ Lecture hall | උසස් පෙල ආතලං වේවං<br>කැම්පස් ජිවිතං හියං<br>බී.ඒ නම්අරහං තං<br>රැකියා පොලිං ගතං සිතං |
| 2 | | පුස්තකාලය | Library/ Lecture hall | ඉතින් ඉවරයි ගෙවු කාලය<br>සදා ආදර විදු දැයේ<br>නෙතින් මතුවන කදුළු අතරින්<br>සමුගණිමු අප සොයුරනේ. |
| 3 | | පුස්තකාලය | Library/ Lecture hall | මද පවන මොටද<br>ඔබේ සුවඳ මුසුවී නැත්නම්<br>සඳ කිරණ මොටද<br>මගේ තනියට ඔබ ලග නැත්නම් |
| 4 | | පුස්තකාලය | Library/ Lecture hall | මලක්මය ඔබ පිපුණු<br>ක්ෂිතජය<br>නෙලාගනු මට නෑනේ<br>අත දිග<br>පෙනි පෙනී නුඹ අහිමි වන වග<br>හඳ ගන් මං කොහොම මේ හිත |
| 5 | | පුස්තකාලය | Library/ Lecture hall | කන් අඩි පැලෙන ලය පුපුරන<br>වෙඩි සද්දේ<br>නොසැලෙන පිරිස අප සමගින්<br>එද්දෙන්<br>එන්නට දෙපා පනනැති අය<br>නවතිද්දෙන්<br>අප යන ගමන අපි යමු පොරක<br>මැද්දෙන් |
| 6 | | පුස්තකාලය | Library/ Lecture hall | මේ උඹලා දන්නවද<br>අපි ලගදීම යනවා<br>යන්න ඉස්සරින් කියන්න<br>දෙයක් තියෙනවා<br>අනේ රන්ඩු වෙන්නැතිව<br>ඉඳපල්ලා |

| | | | | |
|---|---|---|---|---|
| 7 | 1 | | Library/ Lecture hall | ගහනකං ඉවසිලි නෑ<br>ගහ ගත්තම විසුමක් නෑ<br>ඇත්තටම නැතුවත් බෑ<br>මට නම් මෙහෙ කොක්කක් නෑ |
| 8 | 1 | පුස්තකාලය | Library/ Lecture hall | ඉන්නේ බොඩිමක මහ ලොකු ලිදක් ලග<br>කන්නේ ජිම් එකෙන් රුපියල් 20 කට<br>බොන්නේ ප්ලේන්ටි එහි කිසි රහක් නැත<br>ඩිග්රිය නිසා මා විදින දුක |
| 9 | | පුස්තකාලය | Library/ Lecture hall | ඇදුම් මැසුමේ අක්කා සත් වසරක් තිස්සේ<br>ඒ පිහිටෙන් තමයි අද මේ පුටුවේ ඉන්නේ<br>හොරව් පතානේ ඇය අද ජිවත් වෙන්නේ<br>මගේ පැතුම ඇය පන මෙන් රැකගන්නේ |
| 10 | | පුස්තකාලය | Library/ Lecture hall | අධ්‍යාපන සුදුසුකම්<br>ක්‍රිඩාව<br>අධ්‍යාපනය තුලින් ලැබු =වෘත්තිය<br>අධ්‍යාපනය<br>එඩිතර බව |
| 11 | 1 | පුස්තකාලය | Library/ Lecture hall | ප්‍රතිලාභ පිරිවැය<br>අතර සැරි සරන සිත්<br>මිනිස්කම කරුණාව<br>ප්‍රතිලාභ වගී කල සමීකරනයෙන්ම<br>ශුන්යට සමන කලෝය. |
| 12 | | පුස්තකාලය | Library/ Lecture hall | ඔබේ ඇකයෙන් වෙන්වී ආදර අම්මේ<br>කල් ගෙවනවා කවුරුත් නැති සරසවියේ<br>කුස ගිනි දැනෙන විට අම්මේ<br>නුඹේ බත්පතේ මිහිර සිහි වෙනවා අම්මේ |

| | | | | |
|---|---|---|---|---|
| 13 | | පුස්තකාලය | Library/ Lecture hall | දහවල රාත්‍රිය උදාවෙනවා<br>නුඹ නොදැක දින සති මාස ගත වෙනවා<br>විභාගය මාසයෙන් මාසය ලං වෙනවා<br>සිත දැඩිකර ලියනවා ඔබ සිහි කර අම්මේ |
| 14 | 1 | | Library/ Lecture hall | මොනතරම් හොඳද<br>ලොකයේ හැමදේම<br>ඇතිවෙලා පැවතිලා නැවතිලා<br>යනඑක |
| 15 | | පුස්තකාලය | Library/ Lecture hall | පුදදුන් ආදරය ඔබ හට මෙමා සතු<br>හැකිවෙද අපහට එක්වන්නට දිනක මතු<br>ඉටුනොවු නමුත් සිතුමන් අප සිතුපැතු<br>වෙන් වී යන්න සසරේ යලි හමු නොවෙමු<br>මතු |
| 16 | | පුස්තකාලය | Library/ Lecture hall | මා වැනි බිළින්දා<br>ඇණ වුනේ ඇයිද මන්දා<br>පාඩම් නොකල හින්දා<br>නැගඟටපං විභාගය අනිද්දා |
| 17 | | පුස්තකාලය | Library/ Lecture hall | වැස්ස වහිනවා<br>කම්මැලි හිතෙනවා<br>විභාගය අමතක වෙනවා<br>නිදිමත හැදෙනවා |
| 18 | 1 | පුස්තකාලය | Library/ Lecture hall | නිදි වරා දුක්විද<br>සරසවි ආ සද<br>යලි විදින දුක් කද<br>නොදනිද දෙවී රද |

| | | | | |
|---|---|---|---|---|
| 19 | | පුස්තකාලය | Library/ Lecture hall | අනුන් දකින අපි නොදකින දෙයක්<br>තමා PHD<br>නෙලා ගන්න බැරි අත්තක පිපුනු<br>මලකි M S C<br>අමාරුවෙන් ලැබෙන දෙයකි<br>HSC<br>දෙලොවක් මැද අතරමංව අපි ලියනවා<br>ලියනවා BCS |
| 20 | 1 | පුස්තකාලය | Library/ Lecture hall | හිගා කන්න බැ අතපය ඇති හින්දා<br>මැරි වැඩක් නෑ යලි ඉපදෙන හින්දා<br>ඉගෙනිමත් දුකයි බර බර වැඩි හින්දා<br>අනාගතයේ මොනවා වෙයිද මන්දා |
| 21 | | පුස්තකාලය | Library/ Lecture hall | ෆොටෝ කොපි පොලිමේ<br>ඉදලා මට ඇති වෙලා<br>ආයේනම් ෆොටෝ කොපි<br>මෙහෙන් නම් මට එපා |
| 22 | 1 | පුස්තකාලය | Library/ Lecture hall | අස්ථිර වු<br>ස්ත්‍රි චින්තනය<br>තුල ස්ථිර ප්‍රේමයක් ගොඩනැගිය හැකිනම්<br>පුත්තලමේද ගෝවා<br>වගාකල හැක |
| 23 | | පුස්තකාලය | Library/ Lecture hall | පොත් කදු හිසේ<br>සුසුමක් හැපේ<br>නාය යනදා යෞවනේ<br>අම්මලා දුක් විදින දෑතට<br>ඇයි තවත් අප බරවුනේ |
| 24 | 1 | පුස්තකාලය | Library/ Lecture hall | පොත් අරං පොලිමට<br>ෆොටො කොපි ගහන්නට<br>ඇයිද මේ කරුමයක්<br>මෙහෙම අපි ගෙවන්නේ |

| | | | | |
|---|---|---|---|---|
| 25 | 1 | පුස්තකාලය | Library/ Lecture hall | අනේ දෙවියනේ මට උන වියෝයා<br>තවත් මසක් කැම්පස් එක වැසුවෝයා<br>මේකෙන් අපි පිටවෙන්නේ හැරමිටියෙන් යනදායා<br>අපේ අම්මට විත්තයක් මම දෙන්නේ කවදායා |
| 26 | 1 | පුස්තකාලය | Library/ Lecture hall | ඉවසන දනා රැපුයුදයට ජය කොඩිය<br>මේ කී එකාගේ කට කැවත් මදිය<br>ඉක්මන් වුනු එකා ලඟ කොකු හත අටය<br>ඉවසුපු මෙමා තවමත් තනිකඩය |
| 27 | | පුස්තකාලය | Library/ Lecture hall | අනේ කෙල්ලනේ මේ බස අසාපන්<br>ඇඟ පේන්න අඳින්නෙපා අසාපන්<br>පාඩම් කරන්නට ආවත් අනේ ඉතිං<br>ඇස දුවනවා නුඹලගෙ සුදු කකුල් සොයන් |
| 28 | 1 | | Library/ Lecture hall | කියන්නට කිසිත් නැත<br>යන්නට තැනක් නැත<br>මේ පාලු ලෝකයේ<br>මගේ හද තනිව ඇත |
| 29 | | පුස්තකාලය | Library/ Lecture hall | ජපුරට ආවා කොල්ලෝ<br>එලකිරි පොරවල් රැල්ලෝ<br>සටනට ආවත් බොග බල්ලෝ<br>කවදත් පෙරමුණේ රැල්ලෝ |
| 30 | | පුස්තකාලය | Library/ Lecture hall | ලයිබ්‍රියට ආවේ වැඩ කරන්ටයි<br>ආපුගමන් දැක්කේ සුදු කකුල් දෙකයි<br>ඇඳුමක් අඳින්නට දන්නැතිවදැයි සිතෙයි<br>කකුල් බලලා Exam ඇණවෙයිද සිතෙයි |

| | | | | |
|---|---|---|---|---|
| 31 | | පුස්තකාලය | Library/ Lecture hall | කන් අඩි පැලෙන ලය පුපුරන<br>වෙඩි සද්දේ<br>නොසැලෙන මහ පිරිස අප සමගින්<br>එද්දෙන්<br>එන්නට දෙපා පනනැති අය<br>නවතිද්දෙන්<br>අප යන ගමන යන්නෙමු පොරක<br>මැද්දෙන් |
| 32 | | පුස්තකාලය | Library/ Lecture hall | ශ්‍රී ජයවර්ධන පුර නව සරසවියේ<br>එපිට වත්ත නම් බල්ලෙක් සිටියේ<br>අතකොලුවකි මීනිමරු එජන්සියේ<br>ජපුර වනසන්ට පෙර චුත කෙරුවෙ |
| 33 | 1 | | Library/ Lecture hall | සරසවි පෙරැහැර අවසන්<br>නැටු නැටුමක් නැත<br>නමුත්<br>සුන්දර මතකයක් ඇත<br>එත්<br>එකට job නැත |
| 34 | | පුස්තකාලය | Library/ Lecture hall | සිනා සදිසි හෙටක් දකින<br>පැතුම් තුරුලු කරන්<br>දැයක් රකින ලොවක් දිනන<br>දුවෙක් පුතෙක් වෙයන්<br>හිරුත් නැගෙන සඳත් දිලෙන<br>දැයක දිනුම රිසින්<br>දියක් ලෙසින් ගලා හැලන්<br>මවි සිහිනෙක නමින් |
| 35 | | පුස්තකාලය | Library/ Lecture hall | ආවේ ගෙදර සිට ඩිග්‍රිය අරගන්න<br>කෑවේ පාං අපහට නැත බත් කන්න<br>කොක්කක් ගැහුවොත් හැක මට බත් කන්න<br>කව්රුද කැමති මට බත් අම්මා වෙන්න |

| | | | | |
|---|---|---|---|---|
| 36 | 1 | පුස්තකාලය | Library/ Lecture hall | පැතුම් ඉටුවන දිනක් එවිද<br>පෑ පැතුම් හැම බොදවෙලා<br>සිනා සෙන්නට වරම් නෑ මට<br>කඳුලු නෙතු අග පරවෙලා<br>සුසුම් ලන්නට නෑ තවත් ඉඩ<br>සුසුම් හද තුල සිරවෙලා<br>නික්ම යන්නට අවසරයි මට<br>නුඹේලෝකෙන් වෙන් වෙලා |
| 37 | 1 | පුස්තකාලය | Library/ Lecture hall | මගේ පැතුම් බොල් අහසේ පාවී යාදෝ<br>නුඹේ සිතින් මා අමතක වී යාදෝ<br>සරසවියේ බැඳි සිහිනය නිමා වේවිදෝ<br>හෙට දිනයේ නුඹ මගෙන් වෙන්ව යාවිදෝ |
| 38 | 1 | පුස්තකාලය | Library/ Lecture hall | හිරු කිරණ බැස ගියා<br>මැයි මලත් පර උනා<br>විදුදැයේ පින් බිමෙන්<br>ඔබ අපව හැර ගියා |
| 39 | | පුස්තකාලය | Library/ Lecture hall | රතුමල් පිපෙන්නේ<br>නුඹ නමිනි හැමදිනම<br>එහි සුවද ගෙනෙන්නේ<br>නුඹව පාවඩ වෙමිනි |
| 40 | | පුස්තකාලය | Library/ Lecture hall | අහස උසයි ගොඩ ගැසුවොත් මේපාත්<br>සේරම<br>කියවන්නට නියම කරයි හැම දේශයක්ම<br>මේවයේ ඇති පල්හරුප නොවැටනෙ<br>හින්දම<br>නිදා ගනිම් ඔලුවට යන්නට පතාගෙනම |

| | | | | |
|---|---|---|---|---|
| 41 | | පුස්තකාලය | Library/ Lecture hall | ඉකොන් ,සෝ සෝ මල තිබෙනා සැම පල<br>ස්ටැට් නියායෙන් කෙරුවේ තහවුරුය<br>මගේ හිතේ මේ එක එක පටලැලිය<br>අනේ අපොයි ඩිග්රිය මට නැති වෙයිද |
| 42 | 1 | පුස්තකාලය | Library/ Lecture hall | සොඳුරු ජිවිත ගමනේ<br>ගිමන් හලවු මේ පිදු බිමේ<br>මා ලද කටුකම අත් දැකිම්<br>නුඹ දැකීමෙන් දැණුන වේදනාවන්<br>පමණමය |
| 43 | 1 | පුස්තකාලය | Library/ Lecture hall | 1st year එක ගෙවුනේ රැග් කෑමෙන්<br>2nd year එක ගෙවුනේ රැග් දීමෙන්<br>3rd year එක ගෙවුනේ සිහින වලින්<br>Final year එක ගෙවි ගියා research<br>වලින් |
| 44 | 1 | පුස්තකාලය | Library/ Lecture hall | කොණ්ඩේ කොටට දාලා<br>හැම උදේම එනවා<br>කකුල් දෙකට හිරවෙන්නට<br>ඩෙනිම ගහනවා<br>අත් නැති ටි ෂර්ට් එකක්<br>ඇඳලයි ඉන්නේ<br>එයාට අපි බඩුවක් කියලයි අමතන්නේ |
| 45 | | කුරුටු ගි<br>පුවරුව | Wall paper/Poster/ other publications | සිරි සුමංගල සමිදුට<br>කියමි පුවතක් වැදි සිට<br>1st year යකෙකුට<br>අහෝ ඇණ විය කරපු පිනකට |
| 46 | | කුරුටු ගි<br>පුවරුව | Wall paper/Poster/ other publications | මුලු සේසතම බෑගය තුල දමාලා<br>ගමනක් ගියා බස් රථයක රෑ විලා<br>කොහොදෝ ඉඳන් ආ කෙල්ලෙක් ලං වීලා<br>ලග හිටි පරයා බෑගය අරගෙන බැහැලා |

| | | | | |
|---|---|---|---|---|
| 47 | | කුරුටු ගී පුවරුව | Wall paper/Poster/ other publications | බෝ දුර ගෙවාගෙන ජපුරට ආ කරුණ<br>සමහර අයට අමතක වේ ඒ කරුණ<br>මුලාවේ නොගොස් යාලුවේ කිසිම දින<br>ආ දෙය කරන් පලයන් මෙය හිතට ගෙන |
| 48 | | කුරුටු ගී පුවරුව | Wall paper/Poster/ other publications | තනිකඩං විනෝදං<br>ඩබලං අතිභයං<br>ආදරන් අනියතං<br>බුටිනං නොතියපං |
| 49 | | කුරුටු ගී පුවරුව | Wall paper/Poster/ other publications | අඳුරු දත් පාලා<br>කොක් හඩින් සිනා සීලා<br>වැඳිරිය හංසමාලා<br>දුවයි දවසක ජ.පුර දා |
| 50 | 1 | කුරුටු ගී පුවරුව | Wall paper/Poster/ other publications | අඹරේ උසට දිලිසෙන මිරිඟුව අතර<br>මගියෙකු නොවෙමි මැද වැද යන<br>මරුකතර<br>පණනල ගසා හදවත කෙරුවත් නතර<br>සත්‍යය රකිමි අවසන් හුස්මත් අතැර |
| 51 | | කුරුටු ගී පුවරුව | Wall paper/Poster/ other publications | කියන තර සුන්දර නැත සරසවිය<br>ආවා කියලා වෙනසක් නැත ජිවිතය<br>මහ ලොකුවට ලැබුනට මේ උපාධිය<br>සිතේ සතුට නැති එකමයි අභේනිය |
| 52 | | කුරුටු ගී පුවරුව | Wall paper/Poster/ other publications | ඕනම තැනක අපි ගේමට නම් ගේම<br>මොකටද මව් පියන් ගැන මෙහි පැවසීම<br>වැරදියි හැමදේම Rag එක පිට ලෑම<br>දීපන් මුහුණ ප්‍රශ්නෙට හැර පොන්කම |

| | | | | |
|---|---|---|---|---|
| 53 | 1 | කුරුටු ගි පුවරුව | Wall paper/Poster/ other publications | නෙත් හසරැල්ල නුඹ දුන් ගත සිත නිවන<br>මුව හසරැල්ල නුග සෙවනකි හද පිනන<br>දොඩ මලු මුදු වදන් අම්මි ලෙස හැගුන<br>අද මතකයන් පමණකි සියො ලඟ දවන |
| 54 | 1 | කුරුටු ගි පුවරුව | Wall paper/Poster/ other publications | ගැහැනිය ගිනි ගොඩකි පිදුරුත් අඩු නොවන<br>ගැහැනිය මාරයෙකි ගෙල සිර කර දමන<br>ගැහැනිය සිගමනකි පාරට ඇද දමන<br>ගැහැණිය ඇණ ගොඩකි අප සැම ඇණ කරන |
| 55 | 1 | කුරුටු ගි පුවරුව | Wall paper/Poster/ other publications | ඇඳිවත ඉවතලා දමනා ලිලාවෙන්<br>කෙල්ලට හැකිද ගැලවීමට අවමානෙන්<br>වැරහැලි පටලවා කිම මේ අඩමානෙන්<br>සැලවිය යුත්ත සගවාලා තිබුණාදෙන් |
| 56 | 1 | කුරුටු ගි පුවරුව | Wall paper/Poster/ other publications | A/L මොකටද මෙඩිමෙක් වෙන්න බැරි<br>degree මොටද රස්සාවක් ගන්න බැරි<br>හොස්ටල් මොටද සුවසේ නිදියන්න බැරි<br>කොක්ක මොටද කසාද බැඳ ගන්න බැරි |
| 57 | | කුරුටු ගි පුවරුව | Wall paper/Poster/ other publications | මා මළ කලට නිදහස මත්තේ<br>විදුදය මවට ගෞරවයක් විය යුත්තේ<br>සිහ ධජ නොඑලුවත් මගේ මල කද මත්තේ<br>ජපුරට හිස දමා මිහිදන් කලයුත්තෙ |

| | | | | |
|---|---|---|---|---|
| 58 | | කුරුටු ගී පුවරුව | Wall paper/Poster/ other publications | ඇණ ඇත දාන්නට ගොඩ තව එකෙකු වෙවී<br>funඑක තියා ගන්නට මෙහි කිසිත් නැති<br>ගන්නට හැකිවේද ඩිග්‍රිය මම නොදනී<br>අම්මේ එනවා අද හෙට මම මෙයින් මිදී |
| 59 | | කුරුටු ගී පුවරුව | Wall paper/Poster/ other publications | Lectur නොයා හොර අත්සන් ගහපු එවුන් ලියයි<br>Exam ලියයි කරදරයක් නැතුව ඉතින්<br>මුන්වගේ එවුන් හට Degree ය දුන්නොතින්<br>බිහිවෙයි ජ'පුරෙන් පල්හොරු බුරුතු පිටින් |
| 60 | | කුරුටු ගී පුවරුව | Wall paper/Poster/ other publications | කටට ආපු පලියට නෙක පල් හැලි<br>නොලියා ලියාපන් රසබර පද පේලි<br>නැතහොත් එළබෙන වසරෙහි මස ජුලි<br>දිනයක දෙනවා විසිවෙන්නට තොගෙ කෑල |
| 61 | | කුරුටු ගී පුවරුව | Wall paper/Poster/ other publications | තැනු යකඩින් පොරෝ තලයට<br>හැකිද මහගස් බිම පොලන්නට<br>ගසක අත්තක් උදවි නොවිනම්<br>පොරෝ තලයට මිටක් වන්නට |
| 62 | 1 | කුරුටු ගී පුවරුව | Wall paper/Poster/ other publications | ගල් පිට්ටනිය උඩ අහසේ පෙරදාක<br>දුටුවා සඳක් නැග තැබු හැටි පෙර රෑක<br>ඇවිට්ලි කරයි ඒකට මගෙ සිත බෝම<br>සඳ අහසෙමයි බිම හිඳ ලංවනු කෝම |
| 63 | 1 | කුරුටු ගී පුවරුව | Wall paper/Poster/ other publications | Vc වෙලා මතු දින "එපිටා" ඒවී<br>ජ'පුර එදා මේ දිවයින බැබලේවි<br>Art Degree යට යලි නිසි තැන එවී<br>අප සැමදෙනා සතොසින් මෙතනින් යාවී |

| | | | | |
|---|---|---|---|---|
| 64 | | කුරුටු ගි පුවරුව | Wall paper/Poster/ other publications | බොහෝ දේ දකින්නට<br>කාළය එළඹ ඇත<br>නොනැවති මඟ යන්න<br>මණුසන් උයනට පායන එක ඉර<br>හිමවත් සහරාවල් මවමින්<br>සොමිනස් සුසුමන් දොම්නස් සුසුමන්<br>මං පෙත් කරනා යුරු බලපං |
| 65 | | කුරුටු ගි පුවරුව | Wall paper/Poster/ other publications | අවේ එදා සරසවිය කරගෙන සිත සවිය<br>කාෂ්මීර යුධ පිටියකි සරසවිය<br>අමතක වුනිය ගෙන එන්නට ගිනි අවිය<br>අම්මේ පිටත් වේවිද මගේ මල මිණිය |
| 66 | 1 | කුරුටු ගි පුවරුව | Wall paper/Poster/ other publications | ගමෙන් රැගෙන ආ<br>කොතරම් වටිනා මිණිකැට<br>මේ සරසවි බිම දමා යන්නට ඇත්ද<br>ජිවිතය තරම් වටිනා ඒ මිණිපහන්<br>දල්වනු පිණිස<br>දෙමාපියන් කොතරම් සිහින දකින්නටත්ද |
| 67 | 1 | කුරුටු ගි පුවරුව | Wall paper/Poster/ other publications | මව්පිය ලේ කඳුළු දහඩිය<br>හරවා රුපියල් සත බවට<br>දමති පාට්<br>ගින්දරය බොක්ක කියා ගත් නිවටයන්<br>බුද්ධිමතුන්ගේ පරාදිසයක |
| 68 | | කුරුටු ගි පුවරුව | Wall paper/Poster/ other publications | Try කරලා ගත්තා දෙයක්<br><br>Ssc<br>අන්ද මන්ද වෙලා අපි ලිව්වා<br><br>Hsc<br>නෙලාගන්න බැරි අත්තක<br>පිපුණු මලයි Bsc<br>අපි නොදකින හීනේ<br>තමයි Msc |

| | | | | |
|---|---|---|---|---|
| 69 | 1 | නේවාසිකාගාරය | Hostel | දු පුත් ධනපති පන්තියට පැන පැන අරගත්තු<br>කලාපීඨ අධිපති ඕ අතපත්තු<br>තම නිල බලය ගිනි අවියක් කරගත්තු<br>නොමරා මරනවා සරසවි දූ පුතු |
| 70 | | නේවාසිකාගාරය | Hostel | වැහිදාට හැමදාම අපේ ගේ තෙමෙනවා<br>අම්මගේ ජිවිතේ ළඟු ඇදේ දිරණවා<br>අයියලා අක්කලා තව ගෙවල් හදනවා<br>අම්මේ මම කවදා හරි අපේ ගේ හදනවා |
| 71 | | නේවාසිකාගාරය | Hostel | දහවල් කලට ඇදුරිඳු වාසනාවන්<br>සැන්දෑ කලට කෙල්ලන්ගේ පනාවන්<br>රෑ තුන්යමට මදුරුගේ ගායනාවන්<br>එලිවෙන පැයට නිදිදුව වාසනාවන් |
| 72 | | නේවාසිකාගාරය | Hostel | නලින් විකාරය<br>පිරිස් දුමාරය<br>ජේ.බී සිරාමය<br>අහෝ වී සී භයංකාරය |
| 73 | | නේවාසිකාගාරය | Hostel | ශාලාව වෙත ඇදෙයි<br>ලොකු පොත් ගොඩක් පෙරලති<br>ඇස් බැන්දුමක් කරති<br>නොදත්තෙමු දේශනා කරති |
| 74 | | නේවාසිකාගාරය | Hostel | නොම්හිරිද දේශන<br>ඇසුනද වඩා භාෂණ<br>නැතහොත් නැණ නුවණ<br>කියවු නොසතුටු වන්ට කාරණ |
| 75 | | නේවාසිකාගාරය | Hostel | පානුයි පරිප්පුයි දවසක බුදු වේවා<br>ගෝවයි අලයි සැරියුත් මුගලන් වේවා<br>කැන්ටින් හොද්ද නේරංජා ගඟ වේවා<br>කැන්ටින් මුදලාලි කන්තක අසු වේවා |

| | | | | |
|---|---|---|---|---|
| 76 | | නේවාසිකාගාරය | Hostel | මා මිය ගියත් දෙරණෙහි මේ අසම සම<br>රතු මල් පිපෙනු ඇත පොහොරට රැගෙන<br>ලැම<br>ලෝකය පිටු දකින දිනයක දිලිඳුකම<br>නැගිටිම් ආත්මය සමගින් එදින මම |
| 77 | | නේවාසිකාගාරය | Hostel | සිහිනෙන් පවා මගේ සුබ විහරණය පැතූ<br>රජකම ගන්න පුතු රජගෙට ගියැයි සිතූ<br>අම්මා දනිනම් මේ සරසවියේ තතු<br>ගෙනගොස් බොහෝ කල් මේ දුක් විඳින<br>පුතු |
| 78 | | නේවාසිකාගාරය | Hostel | සිතට සිතන්නට පුරුදු කළා නම්<br>ඉවත බලන්නට එපා<br>නෙතට බලන්නට පුරුදු කළානම්<br>එයින් මිදෙන්නට එපා |
| 79 | | නේවාසිකාගාරය | Hostel | පැතුම් මල් පොදි බැඳන්<br>පාතැබූ සරසවිය<br>එකවිටම කැළඹිලා<br>ඇරඹුමක් නැති සරසවිය තළ<br>තාරුණ්‍ය දියවෙලා |
| 80 | | නේවාසිකාගාරය | Hostel | දහසක් කම් කටොලු මැදින්<br>ලබා උපාධිය දුකසේ<br>සරසවියෙන් ඔබ සැමගෙන්<br>සමුගෙන යන්නෙමි |
| 81 | | නේවාසිකාගාරය | Hostel | සරසවියත් සොයුරු ඔබත්<br>දැකගන්නට හමුවන්නට<br>ආයෙත් දවසක් මල්ලියේ<br>අප එන්නම්<br>තරහ නොවනු මැන එදට<br>ගජේ ගසන්නම් |

| | | | | |
|---|---|---|---|---|
| 82 | 1 | නේවාසිකාගාරය | Hostel | දුකත් කඳුළුත්<br>අතැර මම<br>සතුටක් සිනාවත්<br>වැළඳ ගම්<br>ඔබත් ප්‍රේමයත් විසිකර<br>හීනත් ප්‍රාර්ථනත් වළලමි<br>සහනයත් සැනසුමත්<br>නිවනත් විමුක්තියත් සොයා<br>අදම ගිහිගෙය අත හරිමි |
| 83 | 1 | නේවාසිකාගාරය | Hostel | කඳුලට මේ ඔහේ ගලන<br>කියාදෙමි<br>ආදරේ කළ තරම්<br>සුසුමට මේ පපුව දෙකඩ කරන<br>කියන්නේ කවුද දැනෙන දුක |
| 84 | 1 | නේවාසිකාගාරය | Hostel | සත්‍යක් අසත්‍යක්<br>ප්‍රේමයත් කැමැත්තක්<br>නිදහසත් තනිකමත්<br>විරහවත් වියෝවත්<br>හීනත් හැබැවත්<br>විභාගත් නිවාඩුත්<br>අතර සුසුම්ලන<br>සරසවි දියණිය |

| | | | | |
|---|---|---|---|---|
| 85 | | නේවාසිකාගාරය | Hostel | අයියලා<br>ජපුරට ආපුම දවසෙ<br>ගැලවුම්කාරයො<br>ඊළඟ දවසෙ<br>විහිළු කාරයො<br>සතියකට පස්සෙ<br>පෙරලිකාරයො<br>ආයෙ<br>තරගකාරයො<br>සතියක්<br>ප්‍රශ්නකාරයො<br>ඊට පස්සේ<br>වදකාරයෝ<br>ගෙදර ගිහින් ආපු සතියේ<br>වැඩකාරයෝ<br>සෙකන්ඩ් ඉයර්ලා<br>අයිතිකාරයෝ<br>පෙරේදට කලින්<br>වැරදිකාරයෝ<br>ඊයේ නිවැරදිකාරයෝ<br>බකට් කරපු අද<br>සහෝදරයෝ |
| 86 | | නේවාසිකාගාරය | Hostel | වසන්තයක් ඇවිත් ගියා<br>හිතේ සතුට අරන් ගියා<br>හිතකුත් නෑ සතුටකුත් නෑ<br>අහිමි විජිතේ තනිවුනි මට<br>වේදනාව වෙලාගන්න<br>හිතවසන්තේ එක්ක ගියා<br>සරත් කාලේ නියං පොලව<br>වගේ හිතත් වියලී ගියා<br>වසන්තේ යලි කවදා එයිද<br>හිතේ සතුට යලි ලැබෙයිද-<br>අනේ මෙහෙම දුක දරාන<br>කවදා මං හිනා වෙයිද |
| 87 | | නේවාසිකාගාරය | Hostel | දුක් වින්ද තරමටම<br>සරසවියේ ජිවිතේ<br>හැරයන්න බෑ ඉතින්<br>රාහුලේ ජිවිතේ |

| | | | | |
|---|---|---|---|---|
| 88 | | නේවාසිකාගාරය | Hostel | සංසාර චාරිකා<br>මංසලින් නික්මීලා<br>යන්න මට අවසරයි<br>මේ මතක සිත දරා |
| 89 | | නේවාසිකාගාරය | Hostel | මේ සුවිසල් පුර<br>තනිව ඉන්නට<br>මට ඔය සිත<br>සවිය ගෙනෙයි |
| 90 | | නේවාසිකාගාරය | Hostel | තරුමල් යායක් පිපිලා තිබෙනා<br>නිල්තන මත්තේ<br>ඒ මල් යායේ සුන්දරත්වයද<br>අද මම දැන ගත්තේ<br>නෙතුකුන් රැඳෙනා සිනා මල් ගොමුව<br>දෝතට නුඹ ගත්තේ<br>හිත්තුල තිබෙන ලෙන්ගතු කම<br>සැබවින් දැකලද අක්කේ |
| 91 | | නේවාසිකාගාරය | Hostel | සඳ අහසේ හිනහුනාට<br>කොඳ මල් පොඩි පිබිදුනාට<br>කැකුළු මලට තනි රකින්න<br>සඳ රැදුනේ නෑ<br>මඳ පවනට තුරුළු වෙන්න<br>ගංදිය රැළි දගකළාට<br>දිය රැළි ළග සුළං පොදක්<br>නතර වුනේ නෑ |
| 92 | | නේවාසිකාගාරය | Hostel | මයිනි මයිනගේ ඉන ලගටා<br>කීවොත් එන්නේ ඔහු ඇගටා<br>තැබුවොත් දෙන්නම එක ළගටා<br>උස් මිටි බේදය පෙනේ හොදටා |
| 93 | 1 | නේවාසිකාගාරය | Hostel | සැමවිට සැම දන නිතරම  කිපෙනා<br>සිදුවු දෙය ගැන නිතරම සිතනා<br>මයිනිගේ පිටුපස සැමදා සිටිනා<br>මොහු වෙයි සෝරතේ මයිනිගේ මයිනා |

| | | | | |
|---|---|---|---|---|
| 94 | | නේවාසිකාගාරය | Hostel | නමක් දිනාගන්න ජ'පුර<br>මම දුටුවෙමි ඒ පුරවර<br>නැතිය රහක් මට මෙනුවර<br>යන්න හිතෙනවා අතහැර |
| 95 | 1 | නේවාසිකාගාරය | Hostel | තාරුණ්‍යයේ මල් සමය<br>පියමංච යයි සටහන් අතර<br>බිත්ති සතරකින් වටවූ<br>නේවාසිකාගාරයක් තුළ |
| 96 | | නේවාසිකාගාරය | Hostel | වසන්තයේ ඒක සොඳුරු නිමේෂයක<br>මගේ හද විමනට වැඩි ඔබමයි<br>ගිම්හානයේ එක් අඳුරු නිමේෂයක<br>මා හඳ තනිකොට පලා ගියේ |
| 97 | 1 | ශිෂ්‍ය මධ්‍යස්ථාන පුවරුව | Wall paper/Poster/ other publications | නිරුවත<br>මල්ලියේ<br>සළුවෙන් නොවැසි නිරුවත<br>කුහක<br>ආත්මාර්ථකාමී<br>මුදලට වැසුණු මිනිස්කම<br>ධනවාදයේ නිරුවත<br>සාගතයෙන් මිය ගියත්<br>නොබිදෙන බකපස්<br>කොස්වා ලිහිණි<br>වීදුරු ගෙවල් වල<br>දිය කහරු අතැර<br>බොතල් කළ වතුර<br>කාසියට ගිල දමන<br>බත් ඇට පිනුම් ගසන<br>මගෙ රටෙන්<br>මවු කිරිත්<br>වහලක්වත් නැති<br>නුඹ වැන්නවුන් පිරි<br>අනාගතයක්ද ? ඉදිරිය..... |

| | | | | |
|---|---|---|---|---|
| 98 | | ශිෂ්‍ය මධ්‍යස්ථාන පුවරුව | Wall paper/Poster/ other publications | සරසවි බිම<br>සිහින ලොවකි<br>සුර රැඟුමකි<br>හැගුම් ගොඩකි<br>එන්නට පෙර සරසවි බිම<br>පොත් මිටියකි<br>නොනිමි වැඩකි<br>හැමදාමත් විභාගයකි<br>කොක්ක නැති ජීවිතයකි |
| 99 | | ශිෂ්‍ය මධ්‍යස්ථාන පුවරුව | Wall paper/Poster/ other publications | එපාවෙලා සරසවි බිම<br>දින ගැහුමකි<br>අඳුරු ලොවකි<br>කෙදින යම්ද මේ<br>සරසවි බිම |
| 100 | | ශිෂ්‍ය මධ්‍යස්ථාන පුවරුව | Wall paper/Poster/ other publications | ඉස්සර දවසක<br>දුන්හිඳ සිරිපොද විසිරෙන තාලෙට<br>මා තුරුලේ හිඳ හිනහෙන කළ නුඹ<br>මතකද ඉගිබිගි පැවා පුරහඳ<br>සිහින අතර අපි තනිවුණ දවසක<br><br>හන්තානේ පිබිදෙන තුරු ගොමුපෙළ<br>විලියෙන් බරවුණු නුඹේ දෙනුවන් දැක<br>මතකද තාලෙට සෙලවුණු හැටි කොල<br>නුඹයි මායි තනිකර නැති විදිහට<br><br>කඩා හැලෙන ලස්සන රැව වට කර<br>කෙහෙරැලි රඟදෙන සිහින් පවන් මැද<br>මතකද ඔය මුව දෙතොලට ළංකර<br>ජීවිතයම ලිව්වා නුඹ නමටම.... |
| 101 | 1 | ශිෂ්‍ය මධ්‍යස්ථාන පුවරුව | Wall paper/Poster/ other publications | අමාරුවෙන්<br>කට්ට කාපු එකා<br>දවසක<br>මදය කනවාමයි |

| | | | | |
|---|---|---|---|---|
| 102 | | ශිෂ්‍ය මධ්‍යස්ථාන පුවරුව | Wall paper/Poster/ other publications | සොඳුරු සරසවිය<br>ජිවිතය සුවඳවත් කළ සුරපුරය සේම<br>ව්‍යාජ ආදරය නම් වූ<br>මා රිදවූ මිථ්‍යාවද<br>මට මුණගැස්සූ<br>සුසානයද විය |
| 103 | | ශිෂ්‍ය මධ්‍යස්ථාන පුවරුව | Wall paper/Poster/ other publications | සැබෑ මිතුර<br>බොඩිමේ ජරමර මැද<br>සැම උදයට පිබිද<br>රැගෙන පොත් මිටියද<br>පැමිණියේ ජිම් වෙතය සකිසද<br><br>දෙවසක් තවත් අඩවස ඇත ගෙවීලා<br>ඩිග්‍රිය අපේ අතළගටම ඇවිල්ලා<br>පළමු වසරේ සිටි මේ අපි සියල්ලා<br>පාඩම් කළේ නිති ජිම් එකේ රැඳිලා<br><br>මිතුරන් ටික අපේ රජ දරුවන් වාගේ<br>පාඩම් කලේ මවකගේ දරු  වාගේ<br>දැණුම බෙදාලන්නේ කිරි පැණි වාගේ<br>ජිම් එක පිහිට විය අපේ මව් පියෝ වාගේ<br><br>ෆයිබර් මේස පුටු තවතව දිලිසෙනවා<br>මේවා දකින විට තුනටිය කකියනවා<br>දෙපැයක් ගෙවන විට  හිරි එනවා<br>මොනවා කරන්නද මගේ හිස කකියනවා |
| 104 | | ශිෂ්‍ය මධ්‍යස්ථාන පුවරුව | Wall paper/Poster/ other publications | කියන විටදී ජිම්එක යැයි පිට අයට<br>එ අය හිතනවා ඇති ඒගැන වැරදියට<br>ඇග හදනා තැනට ආවේ කළෙක සිට<br>නොවේ ඇඟ හදන්නට පාඩම් වලට |
| 105 | | ශිෂ්‍ය මධ්‍යස්ථාන පුවරුව | Wall paper/Poster/ other publications | තෙරුවන් සරණ ඔබ හැමටම ලැබේවා !<br>ජයෙන් ජයට මං පෙත් නිති හෙලි වේවා!<br>තවත් සියක් දෙන හෙවනේ වැඩිවේවා!<br>සබඳ නිබද ජිම් එක නිති සුරැකේවා! |

| | | | | |
|---|---|---|---|---|
| 106 | 1 | ශිෂ්‍ය මධ්‍යස්ථාන පුවරුව | Wall paper/Poster/ other publications | ධර්මාධිකරණය<br>පණ ගිලිහෙනතුරු එල්ලා මරණු<br>චණ්ඩාශෝකව<br>ධර්මාධිකරණයේ තීන්දුව!<br>සාක්ෂිය දුන්නේ හෘදය<br>තවත් බරපතල නියෝගයක්<br>ජාතක කරණු ධර්මාශෝකව<br>ජිවිතාන්තය දක්වා රකින ධර්මය<br><br>වසබී මිය යනු හිට්ලර්<br>සාක්ෂි කරු හෘදය<br>ධර්මාධිකරණයේ තින්දුව!<br><br>ඉඩ අරිමින්<br>විදවනු ජිවිතය පුරා<br>ලෝකය හින්දා අපහාස<br>නපුරුකමට<br>බලයෙන් වහපු හෘදය<br><br>රමණයට ලොල්වූ රාවනා<br>අහිමි කරණු රාජ්‍යය |

| | | | | |
|---|---|---|---|---|
| 107 | | අරුණෝදයට අරුණැල්ල පුවරුව : | Wall paper/Poster/ other publications | ධර්මාධිකරණයේ තින්දුව<br>උඹලා මොනවද කලේ රටට<br>අපි ඉගෙනගත්තා<br>මොනවද<br>Theory part එක<br>ඇතිද ඒකා<br>හොඳටම propessionl ලූත් තියෙනවා<br>ජිවිතාන්තය දක්වා වැඩ කරනු<br>අම්බරුවන් මෙන්<br>ධර්මාධිකරණය<br>කලාව කොහොමද<br>මැල්ලුමට වගේ<br>දන්නවද මුකුත්<br>ඔව් කවි කතන්දර<br>වැඩක් තියෙනවද<br>වැඩක්ගත්ත කෙනෙක් නෑ<br>ඇයි සරසවිය<br>හොඳයි ටිකයි<br>ඉදිරි කාලය පුරාවට<br>රැදෙනු අප සමග<br>අපි දෙමු වැඩක්<br>ඇස් ඇරෙන්ඩ<br>මනුසාර බවේ අධිකරණය<br>සරස්වති සාක්‍ෂිය! |
| 108 | | අරුණෝදයට අරුණැල්ල පුවරුව : | Wall paper/Poster/ other publications | සිරි සුමංගල සම්දුට<br>කියම් පුවතක් වැඳසිට<br>1st year යකෙකුට<br>අහෝ ! ඇණවිය කරපු පිනකට |
| 109 | | අරුණෝදයට අරුණැල්ල පුවරුව : | Wall paper/Poster/ other publications | මිනිසුන් අතර මිනිසුන් නොමිනිසුන්ද ඇත<br>ජපුරේ පවා මෙයට නිදසුන් ඇත |

| | | | | |
|---|---|---|---|---|
| 110 | 1 | අරුණෝදයට අරුණැල්ල පුවරුව : | Wall paper/Poster/ other publications | කඳුකරයේ සිට<br>බැඳුණ සිත දෙසට<br>සිඳුවුණා පිවං වන්නට<br>ගලියා සමගින් අපටද |
| 111 | | අරුණෝදයට අරුණැල්ල පුවරුව : | Wall paper/Poster/ other publications | නෙතු කොනින් හිනාවෙලා<br>ඇති බැළුවා මගේ ඇස්දෙක<br>මගේ ලෝකෙන් උඹ පලයං<br>මගේ හිනෙට අවධිවෙන්න |
| 112 | | අරුණෝදයට අරුණැල්ල පුවරුව : | Wall paper/Poster/ other publications | මුලු සේසතම බෑගය තුළ දමලා<br>ගමනක් ගියා බස් රථයක රෑ විලා<br>කොහොදෝ ඉඳන් ආ කෙල්ලන් ළං වීලා<br>ළග හිටි පරයා බෑගය අරගෙන බැහැලා |
| 113 | | අරුණෝදයට අරුණැල්ල පුවරුව : | Wall paper/Poster/ other publications | කයින් මා ජපුරේ<br>සිතින් සබරගමුවේ<br>කෙදිනක හෝ අපි එක්වෙමු<br>තුරුළේ |
| 114 | 1 | අරුණෝදයට අරුණැල්ල පුවරුව : | Wall paper/Poster/ other publications | සිතුවත් ඔබගැන රැයක් පුරා<br>පැතුවන් පැතුම් දහසක්<br>සෙවනැලිවල එළිය වැටී<br>මහ පොළවම බෝ විශාල විය |
| 115 | | අරුණෝදයට අරුණැල්ල පුවරුව : | Wall paper/Poster/ other publications | ජිවිතය කවියකි<br>රිද්මය තිබෙන තුරු<br>ජිවිතය නාට්‍යයකි<br>අපි එහි රගනතුරු<br>ජිවිතය ජිවිතයකි<br>අපි එහි ජිවත්වන තුරු |

| | | | | |
|---|---|---|---|---|
| 116 | | අරුණෝදයට අරුණැල්ල පුවරුව : | Wall paper/Poster/ other publications | තනිතරුවක් අඳුරු ගුවන<br>ඉකිබිඳ නිශාමය හද නලියන සුසුම් පොද<br>රත්තරං නුඹම විය |
| 117 | | අරුණෝදයට අරුණැල්ල පුවරුව : | Wall paper/Poster/ other publications | දුටුවෙමි පවුර කැටපත්<br>ඇඳුනෙමි මගේ නෙත් සිත්<br>පතුරවන්නේමි සැමට මෙත් සිත්<br>සබඳ කියවා බලන් පදරුත් |
| 118 | | අරුණෝදයට අරුණැල්ල පුවරුව : | Wall paper/Poster/ other publications | මලක් තනිව පිපිලා<br>බඹරුන් අහක බලා<br>යන්නේ ඇයි දැයි<br>වටහාගනු බෑ |
| 119 | | අරුණෝදයට අරුණැල්ල පුවරුව : | Wall paper/Poster/ other publications | දිනකදි මුදු පවන් රැල්ල<br>සැඟවිය ගිය කල මගේ පනනල<br>නුඹට පෙම්කළ රහස වැලපෙයි<br>මාත් සමගින් එකට සොහොනක |
| 120 | | අරුණෝදයට අරුණැල්ල පුවරුව : | Wall paper/Poster/ other publications | පාසල් සමයේ මා සිත<br>ඇඳි<br>සරසවිය<br>මෙයමද? |
| 121 | | අරුණෝදයට අරුණැල්ල පුවරුව : | Wall paper/Poster/ other publications | ඔච්චම් කර මගේ පෙමට<br>හිරුට හොරා මල් පිපිලා<br>සුවඳ ගෙනේ මුළු රෑටම<br>හිතට හොරා නුඹගියදා<br>ගිනි අවුලා මගේ හිතට<br>සියලු පැතුම් ඉටුවේවා<br>කටු මල් පිපි ඔබේ ලොවට |

| | | | | |
|---|---|---|---|---|
| 122 | | අරුණෝදයට අරුණැල්ල පුවරුව : | Wall paper/Poster/ other publications | නුඹ නික්ම ගිය ලොවක<br>මා පරාජිත කොහෙද<br>මම එයින් පිවිතේ<br>අරුත වටහා ගතිමි |
| 123 | 1 | අරුණෝදයට අරුණැල්ල පුවරුව : | Wall paper/Poster/ other publications | අනන්තය දන්නෑ<br>නුඹ මා හැර ගිය දුර<br>වහින වැහිබිදු තවම දන්නෑ<br>මගෙ නෙතින් ගලා ගිය<br>කඳුළු බිඳ......... |
| 124 | | අරුණෝදයට අරුණැල්ල පුවරුව : | Wall paper/Poster/ other publications | ගත රැඳි නහර එළියට ඇද බලනු මැන<br>එඩි රණවිරුවො එහි තැන තැන නිතර ඇති<br>දුන්නොත් ඉඩක් පෙන්වමි සරසවියේ බල<br>මියයමි ජ'පුර මාතාවගේ දෙපා මුල |
| 125 | | අරුණෝදයට අරුණැල්ල පුවරුව : | Wall paper/Poster/ other publications | බෝ දුර ගෙවාගෙන ජ'පුරට ආ තරුණ<br>සමහර අයට අමතකවෙයි ආ කරුණ<br>මුලාවෙ නොගොස් යාලුවෙ කිසිම දින<br>ආ වැඩේ කරන් පලයන් මෙය හිතට ගෙන |
| 126 | | අරුණෝදයට අරුණැල්ල පුවරුව : | Wall paper/Poster/ other publications | "නියගියකි ඉරී තැලුණු<br>රළු පොළොව මමම විය<br>වැස්ස මා නාදුනනන<br>සුන්දරිය වුවාය.<br>මින් ප්‍රථම කිසි දිනක<br>වැසි නොවැටි සිත් බිමට<br>නොදැන ඔබ මවෙත හෙළු<br>වතුර පොද වැස්ස විය...,, |
| 127 | | අරුණෝදයට අරුණැල්ල පුවරුව : | Wall paper/Poster/ other publications | පිවිතය සිහිනයක් විය<br>ආදරයෙ බොළඳවිය<br>වසන්තය තවම ඇත<br>වුවත් අප වෙන්වී |

| | | | | |
|---|---|---|---|---|
| 128 | 1 | අරුණෝදයට අරුණැල්ල පුවරුව : | Wall paper/Poster/ other publications | මා මළ කලක සොයුරනි නිදහස  මත්තේ<br>විදුදය මවට ගෞරවයක් විය යුත්තේ<br>සියලුන් නොබැලුවත් මගේ මළ කඳ<br>මත්තේ<br>ජ'පුරට හිස නමා මිහිදන් කළ  යුත්තෙ |
| 129 | | අරුණෝදයට අරුණැල්ල පුවරුව : | Wall paper/Poster/ other publications | සුමංගලේ ඇති පැල්ලම්<br>පවසයි ජ'පුරේ සෙල්ලම්<br>වේලි වේලි සිටි කොල්ලන්<br>භාරති හොඳ හොඳ ඉල්ලන් |
| 130 | | අරුණෝදයට අරුණැල්ල පුවරුව : | Wall paper/Poster/ other publications | සමනළුන්ට බිඟුන්ට රසඳුනක් වී<br>දෙනෙත් වලට සුමිහිරි<br>දසුනක් වී<br>නැහැ පුඩුවට ඉමිහිරි<br>සුවඳක් වී<br>ඊයේ හිනැහුණ කුසුම<br>අද වැලපෙයි<br>පොලව මත පෙති විසිර දමා<br>ඉතින් සහෘදය<br>උපමා කුමට<br>තවත්<br>මේ ජිවිතයට |
| 131 | | අරුණෝදයට අරුණැල්ල පුවරුව : | Wall paper/Poster/ other publications | කියන තරම් සුන්දර නැත සරසවිය<br>ආවා කියා වෙනසක් නැත ජිවිතය<br>මහ ලොකුවට ලැබුණට මේ උපාධිය<br>හිතේ සතුට නැති එකමයි අහේනිය |
| 132 | | අරුණෝදයට අරුණැල්ල පුවරුව : | Wall paper/Poster/ other publications | නෙත් හසරැල්ල නුඹ දුන් ගත සිත නිවන<br>මුව හසරැල්ල නුග සෙවනකි හද පිනන<br>දොඩමලු මුදු වදන් අම මී ලෙස<br>නැගුණ<br>අද මතකයන් පමණයි සියො ළග දවන |

| | | | | |
|---|---|---|---|---|
| 133 | 1 | අරුණෝදයට අරුණැල්ල පුවරුව : | Wall paper/Poster/ other publications | දෙනෙත් කදුලැලි - ගලයි නැහැවෙයි<br>සුසුම් හදවත - දවයි රිදවයි<br>මගේ ලොව අද - තනියි පාලුයි<br>ඇයි රිදෙව්වේ - මටයි හිතට |
| 134 | | | Wall paper/Poster/ other publications | Deep black eyes<br>Tried to say sometimg<br>Not once but it happend<br>Every single day. I wish<br>If I could read those eyes<br>I wish be able to tell how much<br>I Love you. |
| 135 | | | Wall paper/Poster/ other publications | ලිවීමට මෙය ඉඩක් මදිනිසා<br>අනෙකාට ඉඩක් දිය යුතුනිසා<br>පෑනේ තින්ත මදි නිසා<br>නොලියා යන්නම් තරහද ඔයා |
| 136 | 1 | අරුණෝදයට අරුණැල්ල පුවරුව : | Wall paper/Poster/ other publications | ධම්මිකෝ පිස්සු ලෝකේන<br>සුහන්දො ඡුල් ආහලං<br>හංස මාලා විනාසාය<br>සේනානි අති උත්තමං |
| 137 | | අරුණෝදයට අරුණැල්ල පුවරුව : | Wall paper/Poster/ other publications | මනසින් ජ’පුරේ<br>හදවතේ වයඹේ<br>ඔබමය සොදුරේ<br>දවසක උරුමේ |
| 138 | 1 | අරුණෝදයට අරුණැල්ල පුවරුව : | Wall paper/Poster/ other publications | මගේ ආදරය<br>හිට්ලර්ට ජාතක කල<br>ප්‍රභාකරන්<br>වගේලු |

| | | | | |
|---|---|---|---|---|
| 139 | | අරුණෝදයට අරුණැල්ල පුවරුව : | Wall paper/Poster/ other publications | ගල් පිට්ටනියෙ උඩ අහසේ පෙරදාක<br>දුටුවා සඳක් නැගතිබු හැටි මහ රැක<br>ඇවිට්ලි කරයි ඒකට මගෙ හිත බෝම<br>සඳ අහසෙමයි බිම හිඳ ළංවෙනු කෝම |
| 140 | | අරුණෝදයට අරුණැල්ල පුවරුව : | Wall paper/Poster/ other publications | පෙර කළ - සිහිගිරි දුටුවෙමි<br>ඒ කැටපතෙහි ඒදවස කවිලිමි<br>මෙතරම් කුඩාව නිසා ඉඩකඩ<br>:4*2 රාමුවකට)<br>මෙහි පමනක් ලිමි |
| 141 | | අරුණෝදයට අරුණැල්ල පුවරුව : | Wall paper/Poster/ other publications | පියමං කෙරුවේමි කසගස් මැද්දෙන්<br>පාඩම් කෙරුවෙමි වෙලේ කොනක හිඳ<br>ශිල්ප උගත්තෙමු<br>ඇණ ලැබගන්නෙමු<br>දෙපා වාරු නැත ඔබ හැර යන්නට |
| 142 | 1 | අරුණෝදයට අරුණැල්ල පුවරුව : | Wall paper/Poster/ other publications | කඩා වැටෙන තුරුම දැන<br>නොසිටියෙමි<br>විදුරු මාලිගා<br>ශක්තිමත් නොවනබව |
| 143 | | අරුණෝදයට අරුණැල්ල පුවරුව : | Wall paper/Poster/ other publications | මා ඇට ආදරය කරමි<br>ඉගියෙන් පවසන්නේ<br>ඈ ආදරෙයි කියා<br>එනමුත් මුවින් නෑ<br>ආදරෙයි කියා<br>ආදරය කරමි<br>දිවි ඇති තුරා |
| 144 | 1 | අරුණෝදයට අරුණැල්ල පුවරුව : | Wall paper/Poster/ other publications | මට දුක නුඹ ගැන<br>සිතමින් ලතැවෙන<br>මගේ සිත ගැන |

| | | | | |
|---|---|---|---|---|
| 145 | | අරුණෝදයට අරුණැල්ල පුවරුව : | Wall paper/Poster/ other publications | වෙසක් සඳ<br>පොසොන් සඳ<br>ඇසළ සඳ<br>කිමද මට<br>ඔබේ හඳ<br>නොමැති සඳ |
| 146 | 1 | අරුණෝදයට අරුණැල්ල පුවරුව gim | Wall paper/Poster/ other publications | මැවූ සිහින බොදවෙලා<br>ඔබ මා අතැර ගිහිල්ලා<br>ඔබ ඉදියි සතුටින් සිනාසීලා<br>අද මට හඩවන්නට කෙනෙක් නෑ<br>අද මට වනසන්නට කෙනෙක් නෑ<br>අද මට ළග ඉන්නට කෙනෙක් නෑ<br>අනේ මම අද තනිවෙලා |
| 147 | | අරුණෝදයට අරුණැල්ල පුවරුව gim | Wall paper/Poster/ other publications | අඹරේ අපට දිළිසෙන මිරිගුව අතර<br>මගියෙක් නොවෙමි වැඳ වැඳ යන මරු<br>කතර<br>පණ නල ගසා හදවත කෙරුවත් නතර<br>සත්‍ය රකිමි අවසන් සුසුමත් අතැර |
| 148 | | අරුණෝදයට අරුණැල්ල පුවරුව gim | Wall paper/Poster/ other publications | සොඳුර සොඳුර<br>අපි<br>කොඳුර කොඳුර- හොයමු<br>රැඳුණ ඇසුර ඇති<br>හොඳම<br>පැඳුර |
| 149 | | අරුණෝදයට අරුණැල්ල පුවරුව gim | Wall paper/Poster/ other publications | වැඳිරි දත් පාලා<br>කොක්හඩින් සිනාසීලා<br>වැඳිරිය හංසමාලා<br>දුවයි දවසක ජ්’පුරදාලා |
| 150 | 1 | අරුණෝදයට අරුණැල්ල පුවරුව gim | Wall paper/Poster/ other publications | නුඹද මා විය මාද නුඹ විය<br>නුඹ අන්සතු විය<br>මට කෙළවිය. |

| | | | | |
|---|---|---|---|---|
| 151 | | අරුණෝදයට අරුණැල්ල පුවරුව gim | Wall paper/Poster/ other publications | උස්සන් යනවා පෝලිම් වල රෙදි කෑලි<br>පෙන්නන් යනවා වහගන යත යුතු කෑලි<br>හන්ටින් යනව දමමින් කොළකෑලි<br>මෙහෙම කෙල්ලො බැඳගෙන මොකටද පේවී<br>ඇඳිවත ඉවතලා දමනා ලීලාවෙන්<br>කෙල්ලට හැකිද ගැලවීමට අවමානෙන්<br>වැරහැලි පටලවා කිම මේ අඩමානෙන්<br>සැඟවිය යුත්ත සගවාලා තිබුණාදෙන්<br>කටට ආපු පලියට නෙක පල් කෑලි<br>නොලියා ලියාපන් රසබර පද පේලි<br>නැතහොත් එළබෙන වසරෙහි ජුලි<br>දිනයක දෙනවා විසිවෙන්නට තොගෙ කෑලි |
| 152 | 1 | අරුණෝදයට අරුණැල්ල පුවරුව gim | Wall paper/Poster/ other publications | කලබලයක් නැතිව දුවන<br>ඇවිදින් සිල් බදින සිතේ<br>රත්තරනේ නුඹ හරියට<br>සෙංකඩගල සුළඟ වගේ |
| 153 | | අරුණෝදයට අරුණැල්ල පුවරුව gim | Wall paper/Poster/ other publications | සරසවිය දිවිය කෙතරම් මිහිරිද<br>එත් විදින්නට ඇතිනම් හැමදාම නමුත්<br>කාළය එළඹ ඇත<br>සමුගෙන යන්නට සරසවියෙන්<br>යලිත් කවදා එන්නද ඒ<br>සොදුරු දිවිය |
| 154 | | අරුණෝදයට අරුණැල්ල පුවරුව gim | Wall paper/Poster/ other publications | කිරි සිනා පාලා<br>හිනහෙන හංසමාලා<br>ගුරු කමත් පාලා<br>ඉන්නේ හැමදා සිනා සීලා... |

| | | | | |
|---|---|---|---|---|
| 155 | | අරුණෝදයට අරුණැල්ල පුවරුව gim | Wall paper/Poster/ other publications | කඳුළු හංගන වසන්තේ<br>ඔයතරම් එරබදු පිපේ නම්<br>නුඹ අරන් අද<br>මේ වසන්ත කාලයේ<br>ජිවිතේ මේ තරම්<br>සරදම් කිමැයි<br>විඳින්නට බැරි<br>ආදරේ<br>ගී ගයන නුඹ<br>කෙවිලියේ<br>මට කියන් - උරුමයද මේ<br>නිමා නොවන ප්‍රේමයේ<br>රේණු ඉහිරෙන බක් මලේ<br>ඔය ලෙසින්<br>පියවර තබයි නම්<br>නුඹම හැර යන මේ සිත් මංසලේ<br>මතක වියැකි යාවී නම්<br>තවත් දුර මේ මාවතේ<br>කල්පයක් වුව බලා ඉන්නම්<br>මේ<br>හැබෑ නොවන හීනයේ |
| 156 | | අරුණෝදයට අරුණැල්ල පුවරුව gim | Wall paper/Poster/ other publications | ඔබ නිසා සරසවිය<br>මගුල් ගෙයකි<br>ඔබ නැතිදා සරසවිය<br>මළ ගෙයකි<br>එහි මිනිය මා වෙමි |
| 157 | | අරුණෝදයට අරුණැල්ල පුවරුව gim | Wall paper/Poster/ other publications | ඇත්ත<br>එන්නට පෙර සිහිනයකි<br>ආ දින සුරපුරයකි<br>දැන්නම් අපායකි<br>ජ'පුර |
| 158 | | අරුණෝදයට අරුණැල්ල පුවරුව gim | Wall paper/Poster/ other publications | අනේ මැණිකෙ උඹයි මමයි දැන් දුරදිග යනවා<br>උඹේ හිතට ගානක් නෑ නුඹ හුරතල් වෙනවා<br>ගන්ඩත් බෑ දෙන්ඩත් බෑ මම අසරණ වෙනවා<br>අහුවුනොතින් උඹේ මිනිහා මගේ ඕලුවත් කනවා |

| | | | | |
|---|---|---|---|---|
| 159 | | අරුණෝදයට අරුණැල්ල පුවරුව gim | Wall paper/Poster/ other publications | එදා ජ්පුරට ගම රට ඉදලා<br>දුටුවෙමි ලස්සන සුර අගනක්<br>කලකට පසු ඒ ලස්සන සුරඟන<br>වැරහැලි නොමැතිවූ යම බැල්ලක් |
| 160 | 1 | අරුණෝදයට අරුණැල්ල පුවරුව gim | Wall paper/Poster/ other publications | විදුලිය සේ මෘදු කෝල බැළුම් ඇති<br>මහ අකුණක් සේ කෝමල බස් ඇති<br>සිංහ දේනුවක් සේ හුරතල් ඇති<br>නුඹෙන් ලැබුණ උණුසුම පමණක් මදි |
| 161 | | අරුණෝදයට අරුණැල්ල පුවරුව gim | Wall paper/Poster/ other publications | සීමාවක් නැති<br>කැටපත් පවුර<br>සීමා කළ ඔබට<br>නැත<br>කිසි දාක<br>වෛර<br>මම |
| 162 | | පියසිරි ප්‍රේමලාල් ආපනශාලා පුවරුව | Jim/ Canteen/ Samar hut / Toilet | නංගියේ මල්ලියේ<br>ගිරිදුර්ග මාවතේ<br>පසුකරන් දුරඇවිත්<br>ඔබ දකින<br>රිසිව නෙත්<br>හෙම්හෙමින් ඉඟිකර<br>පැහැදිලිව<br>ඔබට යන මාවතක්<br>සදන්නට<br>එන්න<br>අප යන මාවතේ<br>පැහැදිලිය එය<br>සයුර සේ |

| | | | | |
|---|---|---|---|---|
| 163 | | පියසිරි ප්‍රේමලාල් ආපනශාලා පුවරුව | Jim/ Canteen/ Samar hut / Toilet | මල් කැකුලියේ<br>නෙතු කැළුම් නිදිවරන<br>මුළු ලොවම නිසසල වූ<br>අසිරිමත් පුංචි ලොවක<br>මානෙතු මල් සිප ගත්තෙමි<br>එකම ගීතයක් මුළු විශ්වයම<br>නුඹ වැජඹෙන<br>පුංචි ලොවේ<br>කිරි කොඩුයි තවම නුඹ<br>එහෙත්<br>හෙට උදාවන නැවුම් දින<br>මල් කැකුලියක් නුඹ |
| 164 | | පියසිරි ප්‍රේමලාල් ආපනශාලා පුවරුව | Jim/ Canteen/ Samar hut / Toilet | දයාබර මව්ණි<br>සරාසඳ නිදාගත්<br>පාළු රෑ යාමෙදිත්<br>ඔබ එළිය ගුවන් ගැබ<br>අරා උන්නා සැනිණ<br>ගිම්හානය තුලදි<br>මහපොළව ඉරිතැලිණි<br>නමුත් ඔබෙ මුදු සෙනෙහෙ<br>හදවතට සිසිල විණි<br>අනොරා වැසි සමයෙ<br>හදවතින් ලගඉඳන්<br>උණුසුමක් වීය ඔබ<br>ගැහෙන ගත පුරාවට<br>හිරු මඩල - සඳ මඩල<br>නිල් අහසේ පිපුණමුත්<br>ඔබේසෙනෙහේ රැදි තිබුණි<br>හිත් අහස පුරාවට |

| | | | | |
|---|---|---|---|---|
| 165 | 1 | පියසිරි ප්‍රේමලාල් ආපනශාලා පුවරුව | Hostel | විභාග කැළවෙත<br>මහෝෂයකට හසුව<br>පලාගිය වසන්තය<br>නැවත විත් පිං බිමේ<br>මල් පුබුදුවන<br>සුයාමයක<br>ප්‍රිය සබඳ<br>රොඳ බැදෙමු<br>එක්සත්ම<br>නෙලාගන පැතුම් මල්<br>යලි යලිත්<br>විඳ ගන්න<br>ඒ.....සුවඳ |
| 166 | | පියසිරි ප්‍රේමලාල් ආපනශාලා පුවරුව | Jim/ Canteen/ Samar hut / Toilet | පිං බිමකි සරසවිය<br>ශිල්ප ලබන්නාට<br>යුධ බිමකි සරසවිය<br>ගැටුම් කරන්නාට<br>දෙව් ලොවකි සරසවිය<br>ප්‍රේම කරන්නාට<br>අපායකි සරසවිය<br>Boot කෑ එකාට |
| 167 | | පියසිරි ප්‍රේමලාල් නේවාසිකාගාරය පිරිමි 26 කාමරය | Hostel | ලෙයින් යකඩින් නසන්නට හැකිවුවද රතු මල් පිපුණි පෙරදි<br>විසුල එසුවද තුරුළු කරගෙන පිපෙයි දහසක් කැකුළු<br>වෙරදි<br>තනන්නට සම බිමක් වයමින් අයුක්තියේ මළ බෙරය<br>හඬදි<br>බුරන බල්ලන් ඔහේ උන්දෙන් සොයුරනේ යමු පෙරට වෙරදි |
| 168 | 1 | පියසිරි ප්‍රේමලාල් නේවාසිකාගාරය පිරිමි 26 කාමරය | Hostel | ඔබ අප ඉන්නේ ගිනි ගෙන දැවෙනා රටක<br>ඔබ අද ඉන්නේ දැවෙනා ඒ රට කොනක<br>ගිනිදැල් සිසිල් වැස්සක් වෙනවා නිසැක<br>රතුමල් පිපෙන ඇත යන්නේ මැද දිනෙක |

| | | | | |
|---|---|---|---|---|
| 169 | | පියසිරි ප්‍රේමලාල් නේවාසිකාගාරය පිරිමි 26 කාමරය | Hostel | තාලෙට බෙර වයන තාලෙට පය තබන<br>කාලෙට මඳ වැටෙන කාලෙට අලි කිපෙන<br>කාරිලම ලෙක්ව යන ක්‍රමට වලට යන<br>වාලෙක් මෙන් ඉගෙන කුමකට ලොව<br>නොදැන |
| 170 | | පියසිරි ප්‍රේමලාල් නේවාසිකාගාරය පිරිමි 26 කාමරය | Hostel | හැඩුවා දිනක් නුඹ ගැබ මොහොතක<br>තනිව<br>සඳ නැත සබඳ මා සිත පාළුව තනිව<br>ගැලු කඳුළු කැට පොගවා මහ පොළව<br>දැකලාවත් පායාවිද සඳ පලුව |
| 171 | | පියසිරි ප්‍රේමලාල් නේවාසිකාගාරය පිරිමි 26 කාමරය | Hostel | ජිවිතය නිදහසේ මාවතයි<br>පරාජය ඒ මාවතේ<br>ගිතයයි |
| 172 | 1 | හෙට්ටි ආරච්චි නේවාසිකාගාරය 1මු මහල -8කාමරය | Hostel | ප්‍රේමය නම් අසෙනිය කුසුමක් වේ<br>රිසිවු කෙනෙකුට පුජා කෙරුමට<br>ලෝබ සිතින් තොර පිදුව මනාවේ<br>පෙරලා ලබනට නොසිතා කිසිවක් |
| 173 | 1 | හෙට්ටි ආරච්චි නේවාසිකාගාරය පිරිමි 3වන මහල 23 කාමරය | Hostel | කුසගින්නේ සිටිනා විට අපෙ අම්මේ<br>නෑ වැලපුනේ කිසිදා මම බඩ ගින්නේ<br>මේ හැම වෙලේ නුඹ සිහිවෙන විට අම්මේ<br>සරසවි උපාධිය කටු ඔටුන්නක් අම්මේ |

| | | | | |
|---|---|---|---|---|
| 174 | | හෙට්ටි ආරච්චි නේවාසිකාගාරය පිරිමි 3වන මහල 23 කාමරය | Hostel | ජිවිතය යනු අසම්පූර්ණත්වය සම්පූර්ණ<br>කිරිමට ගන්නා උත්සාහයයි<br>සෑම උත්සාහයක්ම වඩවඩාත් හොඳ වේවී<br>වඩාවඩාත් පරිපූර්ණත්වයට ලංවෙවී<br>නමුත් කිසි විටෙක පරිපූර්ණ නොවේවී<br>සියළු දෙයින්ම නිවැරදිව ජිවත්වන්නා<br>විශාල වේදනාවක් දරනවා මෙන්ම<br>ඊටත් වඩා වේදනාවක් අන්‍යන්ටත්<br>දෙන්නේය. |
| 175 | 1 | හෙට්ටි ආරච්චි නේවාසිකාගාරය පිරිමි 3වන මහල 23 කාමරය | Hostel | උපාධි කොලපත මාත් සමඟ අද හඬනව<br>කුසගින්නේ<br>මගේ උගත්කම බිඳක් නොදුටු හිස් සඳගේ<br>බියක්<br>වැන්නේ<br>මසුරන් කෙතකට හිමිකම් නැති මට ඇයි<br>ඔබ පෙම් බැන්දේ<br>මගේ උගත්නම ලිවෙම් කුමරියෙ සරසවියේ<br>බැම්මේ |
| 176 | | හෙට්ටි ආරච්චි නේවාසිකාගාරය පිරිමි 3වන මහල 23 කාමරය | Hostel | සිව් වසරක් ගත වී ඇත අප ඇවිදින්<br>අපි ලද දෙයක් නම් නැත කීවොත්<br>සැබවින්<br>රැකියා ඉල්ල ඉල්ලා පිකටින් කරමින්<br>මහ මග මැරෙන්නට වේ මේ අධ්‍යාපනෙ<br>තරමින් |
| 177 | | හෙට්ටි ආරච්චි නේවාසිකාගාරය පිරිමි 3වන මහල 23 කාමරය | Hostel | නරි කැළක් ඇත ජ’පුරේ හූ කියන<br>බලු කැළක් ඇත ජ’පුරේ කටු හපන<br>ගොනු කැළක් ඇත ජ’පුරේ ගැල් අදින<br>සිසු කැළක් නැත ජ’පුරේ වැඩ කරන |

| | | | | |
|---|---|---|---|---|
| 178 | | හෙට්ටි ආරච්චි නේවාසිකාගාරය පිරිමි 3වන මහල 23 කාමරය | Hostel | ලෝගුව අඳින දින වැඩිදුර නෑ අම්මේ<br>සටහන් වලට මගේ නෙත් රිදෙනවා අම්මේ<br>මේ දුක් වින්දේ නුඹ ගැන හිතලයි අම්මේ<br>මා රජ කරල නුඹ සැගවුනේ ඇයි අම්මේ |
| 179 | | හෙට්ටි ආරච්චි නේවාසිකාගාරය පිරිමි 3වන මහල 23 කාමරය | Hostel | මල් පිපෙනා කලට ජ'පුරේ කල එළිය<br>නැවි එන කලට ජ'පුරේ ගිනි කෙලිය<br>බරණැස දෙසට ගොස් විඳිනා සුරකෙලිය<br>කෙල්ලෙක් බඩ වෙලා බලපිය මළකෙලිය |
| 180 | | හෙට්ටි ආරච්චි නේවාසිකාගාරය පිරිමි 3වන මහල 23 කාමරය | Hostel | සඳවත හැඳ පාර නොබැලු ඔබ<br>මක්කරන්නෙද අද<br>එක තැනට වී<br>එක්වරක් හරි<br>ඉගිකලේ නම්<br>මමත් ඇත දැන්<br>පිළිවෙලක් වී |
| 181 | | හෙට්ටි ආරච්චි නේවාසිකාගාරය පිරිමි 3වන මහල 23 කාමරය | Hostel | ආදරය වේදනාවක් වු විට<br>ඉවසා ඉන්නට බැනේ හදවත |
| 182 | | හෙට්ටි ආරච්චි නේවාසිකාගාරය පිරිමි 3වන මහල කාමරය 22 | Hostel | මට ආවස්ථික පිරිවැයක්<br>දරන්න තිබුණා<br>නුඹ හොඳම<br>විකල්පය වුවා නම් |

| | | | | |
|---|---|---|---|---|
| 183 | 1 | හෙට්ටි ආරච්චි<br>නේවාසිකාගාරය පිරිමි<br>3වන මහල 17කාමරය | Hostel | එකට විප්ලවය<br>දෙකට විප්ලවය<br>ආදර වන්තියේ<br>නුඹට නැත අංකයක් |
| 184 | | හෙට්ටි ආරච්චි<br>නේවාසිකාගාරය පිරිමි<br>3වන මහල<br>කාමරය 17 | Hostel | ජිවිතයේ අන්ත අසරණ අවස්ථාවලදී<br>මිනිස් අධ්‍යාත්මය උපරිම ශ්‍රේෂ්ට වේ |
| 185 | | හෙට්ටි ආරච්චි<br>නේවාසිකාගාරය පිරිමි<br>3වන මහල | Hostel | යම් මිනිසකු පීඩිත ජනතාව වෙනුවෙන්<br>සේවය කරන්නේද<br>මගේ ලගම ඥාතියා ඔහුය |
| 186 | | හෙට්ටි ආරච්චි<br>නේවාසිකාගාරය පිරිමි<br>3වන මහල | Hostel | ලස්සන මල් මත සුවඳ රැදෙන්නෙත්<br>සුවඳ මල් මත ලස්සන රැදෙන්නෙත්<br>කලාතුරකිනි |

| | | | | |
|---|---|---|---|---|
| 187 | | | Hostel | ජාතිය ගොඩ නැගීම?<br>මහප්පා<br>අඩි ද බිම හප්පා<br>මැදල ඇන්ද<br>නැෂනල් එක<br>වලාපොට ගසා<br>"ජාතිය ගොඩනගමි" කියා<br>දුවයි ජපුර වටේ<br>"කඩිය වගේ<br>පුක කැඩිච්චි"<br>රැ දවල් - ඉති පුරුස ලිගු භේද<br>නොබලා - රිංගයි<br>බාත්රූම් වලටත්<br>නැගෙන හිරින් මේහට එවුව<br>පුංචි එවුන්ට<br>කුඩම්මාගෙ සැලකිල්ලලු<br>පුස්තකාලේ දෙන්නේ නෑ ලු<br>පිට්ටනියත් වාරණයිලු<br>කැරම් බෝඩ්<br>රැකට් , විකට්<br>පාවිච්චිය වාරණයිලු<br>තාමත් ඇකඩමි විතරයි ලු<br>අනේ අපොයි<br>මහප්පාගේ ජාතිය ගොඩනැගීම. |

| අංකය | Selected | ස්ථානය | Location | ගීතය |
|---|---|---|---|---|
| 1 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | The God You Lied Us<br>The people died<br>No anyone as light<br>Everyone goes to fight<br>How do you tell us<br>You are right<br>The god you lied us<br>Someone pleads that<br>You are the moon<br>Someone pleads that<br>You are the wind<br>but<br>the god you lied us<br>everyone goes to war<br>our hope- peace no more<br>why cant you cant you get down to floor<br>the god you lied us<br>the god<br>you lied us…… |
| 2 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | He is a prisoner<br>He is a man<br>But<br>He doesn't have a heart<br>His chest is very strong<br>But, he doesn't have a chest<br>He loves to hate<br>His lover is the dead<br>No one can quwell him<br>It can't be done<br>By gods<br>He loves to get lives<br>From others<br>But why<br>He is a prisoner<br>Of someone |

| | | | | |
|---|---|---|---|---|
| 3 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | පුදසුන අසල<br>පවතින නොනිමෙනා පහනින් ලෙලෙන පබා<br>මදුනත් කොට වදින යදියන් සමග තබා<br>දෙවනත් කර කියන තියු ගීතිකා ලබා<br>තවමත් නිහඬ ඇයි පවසනු මැනවි නොබා<br><br>බිළිඳුන් මුව වියලවා කිරි ගෙනෙනු දැක<br>කප්රුක පල නෙලා පොලොවේ ගසනු දැක<br>විකලෙන් දොඩන තක්කඩියන් පුදනු දැක<br>පැන ගොස් සැගවුනෙමි කුමකටද මුන් රැක |
| 4 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | මල් මාල<br>දරැණුව තරගයට පිපි නෙළුම් රැය පුරා<br>හද විල පුරා පැතිරිනි සුවඳ හල හලා<br>පිපුනා පිච්ච මල් උදයේම හිස පුරා<br>පෙති ඉහිරි සැලී ඉන් හිසම බරකලා<br><br>දහවල් හිරු රැසින් දහදියෙන් ඇහැරිලා<br>සියොලග රෝස මල්කැකුලින්ම ගැවසුවා<br>පෙනහළු කුහරයේ අතුපතර අරලියා<br>ගනු අප නෙලා අමුනනු කියා පිබිදුනා<br><br>පාටයි පෙති ගලපා තබා බල බලා<br>හොදවා නෙලා අමුනා පැනින් පුබුදුවා<br>සගවා තව බලා ඉන්නෙමිද නෙතු පෙලා<br>ඊයේ මෙන් අදත් නොබලාම යනු බලා |
| 5 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | Black<br>There are black<br>Kids, men and women<br>But they have no faces<br>I tought my face<br>I have mouth "nose and<br>Eyes<br>They talk with me<br>I know<br>I have seen lot of things<br>And<br>Always I see<br>Therefore I could identify<br>Them<br>I love to my life<br>Im always dreaming<br>In my blind<br>Eyes…… |

| | | | | |
|---|---|---|---|---|
| 6 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | I CLOSEDTHESHUTTER<br>I couldn’t love to anyone<br>None got my hand<br>I’m looking till someone<br>Comes to my life"""<br><br>No one came<br>But, my fellow<br>Who was a yellow<br>Than I<br>He could touch and peep<br>Everywhere<br><br>Sometimes<br>He goes on the roof<br>Sometimes<br>He goes on the wall<br>Sometimes<br>He lays on the floor<br>Sometimes<br>He vanishes"""<br><br>I was lonely person<br>In that beautiful night<br>I was looking till someone<br>Comes to my life"" |

| | | | | |
|---|---|---|---|---|
| 7 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | සුනු සහලේ කැඳ උයලා<br>අප්පච්චිට පොවා<br>අම්මා තනිව හිල්ලුවා<br>ගෙයි මුල්ලට වෙලා<br>එහා වත්තේ වැටකොළු වැල්<br>හොරෙන් එබී බලා<br>පුරන් කුඹුර ළගට වෙලා<br>ඔච්චමකුත් කළා....<br>හිත් ඇඳිරිය නෙතු පුරවා<br>ඔත්පොළටම වෙලා<br>අප්පච්චිගෙ ඇඳ පාමුල<br>හොරෙන් මුකුලු කලා<br>දුප්පත් කම ගෙට නැවිත්<br>බිතක්කනට වෙලා<br>එක දවසක් දෙකක් පුරා<br>අපට විහිළු කලා .....<br>උදේ රැයින් අවදිවෙලා<br>නිදි ගැට කඩ කඩා<br>අපේ අම්මා දොළට නොයා<br>උදේ හවා පුරා<br>ගෙයි ගින්දර පිටට නොදි<br>ලිබ්බොක්කට වෙලා<br>මුව දොනවා මං දැක්කා<br>අපට මුවාවෙලා..... |

| | | | | |
|---|---|---|---|---|
| 8 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | "ඇට මස් නහර"<br>තාත්තා<br>ගස් කපා උලුප්පා<br>අත්තම් හතරකින් හම ගැසූ<br>බෝකන්ද ඉඩමේ<br>ඇට මස් නහර දියකර<br>බඩගායි උජාරුවෙන්<br>වැහි වතුර<br>තාත්තාගේ සොහොනද යටකර<br><br>කන්ද උරණව<br>බිම දමාඇත<br>වරිච්චි බිත්ති හතර<br>තාත්තා<br>වැල් කැඩි ගිය ලණු ඇදේ<br>නිඳා ඉදිද්දිම<br>තනිවම<br><br>පෙනෙයි<br>වරිච්චි මැටි අතරින්<br>හිනාවෙන තාත්තාව<br>රාමුකල පින්තූරයේ<br>බිදුණු විදුරුව යට හිඳගෙන<br><br>දර ඉපල් අතර<br>බුරා බුරා නැගෙන ගින්දර<br>බඳ වටා ඔතාගෙන<br>දුඹුළු බැදුණු කේතලය<br>ගොජ ගොජ ගා නටවයි වතුර<br>අම්මා තවමත් |
| 9 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | සසර සැරිසරා මා හා<br>නුඹ<br>නොයයි කිසිදිනෙක<br>මා හැරදා<br>ගෙවෙත්ම<br>ජිවිතය<br>නුඹ<br>මටම පෙම් බැඳ<br>මා ළඟින් ම<br>දැවටී<br>ඔය තරම් ලෙන්ගතුව<br>ඉගි පාමින් සිනහසෙන්නෙ<br>ඇයි<br>මට<br>සෙනෙහසින් නුඹ මරණයේ<br>දෙව්දූව |

| | | | | |
|---|---|---|---|---|
| 10 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | ඔයා<br>ඔය විදියට<br>සිනාසෙනවිට<br>ගොඩක් ලස්සනයි<br>ඒත් ඔයා<br>සිනා වෙන්න එපා<br>ඔයා සිනාසෙන විට<br>දෙවරක් හිතන්න<br>ඉන්පසු සිනාසෙන්න<br>සිනාවක අවසානය<br>කඳුලක ඇරම්භය උනොත්<br>එය ඔයාට දරාගන්න<br>අපහසු වේවි<br>හිතන්න<br>මොහොතක්<br>දුකත් සතුටත්<br>අපහට උරුමයි<br>දුක පරාජය කර<br>සතුට ලගා කරගැනිමයි<br>අප කලයුත්තේ<br>එයයි<br>ඔබේත් මගේත්<br>ජයග්‍රහණයයි |

| | | | | |
|---|---|---|---|---|
| 11 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | දොඩමළු වීලා මොහොතක්<br>මොහොතක් සැනසීලා<br>වෙන්වීලා කල්පයක්<br>දුක්වීලා මහ මෙරක්<br>ඉන්නවාට වඩා<br>අපි වෙන්නෙලා ඉඳිමු<br>මේ මුළු දිවිය පුරා<br><br>ඔබට මාත් මා ඔබටත්<br>හිමි නොවනා බව<br>දැන දැන තවත්<br>ඇයිද අප මෙසේ<br>තව තව ලං වෙන්නේ<br><br>මා ඔබ හට හිමි නෑ<br>කුමරියනේ<br>සෙනෙහස පුරවා<br>ඔය නෙතු<br>මා දෙස යොමන්නෙපා<br><br>මා නිසා ඔබ හට<br>කිසිදා දුකක් නම්<br>වෙන්න එපා |
| 12 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | වෙන් වෙන්නට හිතක් නැත.<br>එක් වන්නට හිතක් ඇත.<br>සොයුරු දමින්<br>මිතුරන් ලෙසින් සැමදා.<br><br>ඔබත් මමත් හමු වූ<br>සරසවි විදු පියසේ<br>ගත වූ කෙටි කලතුලදී.....<br>ඔබ මා හඳුනාගත්තා.<br>මා ඔබ හඳුනාගත්තා.<br><br>ඔබ හා මා අතරේ<br>ඇතිවූ මිතුදම මිහිරියි<br>එය එලෙසින්<br>පවතින ලෙස පවතිමි. |

| | | | | |
|---|---|---|---|---|
| 13 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | කැලෑ මලි<br>කොළඹ ඇයෝ<br>කැලෑ මල්<br>රැගෙන විත්<br>මාවතේ<br>ලස්සනට<br>සිටුවාවි<br>පිපෙන මල් විඳින්නට<br>හැකිවේද<br>කොළඹ ඇයන්ට<br>දූලි වැදි<br>අවු රස්නේ<br>දබර කරණ මල්<br>දැක......<br>කෑලෑ ඇයෝ නම්<br>හඩාවි |
| 14 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | ඔය ඇස්දෙකින්<br>මේ ඇස් දෙක<br>නොදුටුවාට<br>අහිතක් නෑ<br><br>ඔය ඇස්දෙකින්<br>වෙන ඇස් දෙකක්<br>දකිනවාද?<br>මම දන්නේනැහැ<br><br>ඔය ඇස්දෙකේ<br>කදුළු දකින්න<br>මම කැමති නැහැ<br>නුඹ කොහේ හිටියත් ,<br>නුඹ කාගේඋනත්. |

| | | | | |
|---|---|---|---|---|
| 15 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | ටියුෂන් මල් පිපිලා<br>ටියුෂන් මල් පිපිලා<br>ගාලු පාර දිගේ<br>බඹරුන් වැහි වැහැලා<br>සුවඳ ගන්න වගේ<br><br>ගේ මුල්ලේ පිපුණු මලක<br>කොටු බැම්මේදි සුවඳ නැතිද<br>ගල් පවුරක් වගේ හිතක්<br>සුවඳ සොයනවා<br><br>සුළගිල්ලේ එතුණු අතක<br>වෙඳගිල්ලට මුදු කුමටද<br>ගල් පවුරක් වගේ හිතක්<br>සුවඳ ගන්නවා |
| 16 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | කරඳිය රැලිමත<br>කරදිය රැලි මත රැය ගෙවා<br>ඔබ දුර ඈතයි මට සිතුනා<br>රෑ සුළගට හී ගඩු පිපෙනා<br>සීතල ගත උණුසුම සොයන<br><br>දෑළ දෙනෙත් යුග ඉඟිකරමි<br>පෑළ දොරින් එයි මල් පිරිමින්<br>නීල ගැබේ සඳ යන්න කලින්<br>ආල වැඩු සඳ පැලට වඩින්<br><br>තාල නොවු කවි ගී අසමින්<br>බාල කෙලි හීනෙහෙයි නින්දේ<br>මාල පබළු වැල් කුමට ඉතින්<br>ආල වැඩු සඳ පැලට වඩින් |
| 17 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | සුභදාණනේ<br>සඳක සිසිල මගෙන් පතන<br>මලක සුවඳ පතා හිඳින<br>සුභදාණනේ<br>සඳක සිසිල මලක සුවඳ<br>දැන් මං ලග නෑ<br>කඳුළු බිංදු මේ තරමට<br>දෙනෙත් තෙමන බව හනිකට |

| | | | | |
|---|---|---|---|---|
| 18 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | නිකිණි මහේ සඳට කලින්<br>නිකිණි මහේ සඳට කලින් ගමට එනවානම්<br>මං ඉන්නම් මඟ බලමින් මගේ රත්තරං<br>බකිණි ගහේ මල් පිපිලා බොහෝ කල් ගිහින්<br>නුඹ තවමත් පමා ඇයිද මගේ රත්තරං<br><br>සඳ නැති රෑ අහස වගෙයි<br>ගම්මානේ<br>නුඹේ සිනා හඬ නෑසෙයි<br>දොළ අයිනෙ |
| 19 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | ඩඩා වාදය<br>මොකක්ද මේ<br><br>බටහිර යුරොපයේ<br>නිර්මාණය වූ කලා<br>සම්ප්‍රදායක් වනඅතර<br>20 සියවසේ මුල්<br>භාගයේ ලෝක භාවිතයේ<br>තිබිණ<br>සම්ප්‍රදායික<br>සංස්කෘතික විධි<br>සෞන්දර්ය වෙනස්<br>කරමින් ප්‍රතික්ෂේප<br>කරමින් ශුද්ධ වූ<br>යථාර්ථයක් සොයා<br>යෑම මෙහි අරමුණයි<br>මෙයින් නව අදහස්<br>නව අමුද්‍රව්‍යයන්<br>තව දිශානතින් හා<br>නව මිනිසුන් ඉදිරියට<br>ගෙනාවේය |
| 20 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | බිත්ති පුවරුව පාලු<br>නොකල කොලු ගැටයාගේ<br>වැඩ කොහොමද<br>අර්ථවත් කවි පංති !<br>නිසදැස් ! බැලුවද !<br>1 වන වසරේ එහෙම අය නැද්ද? |
| 21 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | ලොකු මහත්තයා අළුත් වැඩ<br>කරන්න පටන් ගත්තා විතරයි<br>ආරොන්<br>ඒ වුනාට විනය පරික්ෂණ ඉවර නැතිලු නේද? |

| | | | | |
|---|---|---|---|---|
| 22 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | No one is like earlier<br>Why?<br>How did you change?<br>You face is very pritty<br>When you smile beautiful<br>I thought that<br>You are a triend of mine<br>Like other<br>J was trind<br>No one is like earlirer<br>I don’t worry<br>Every one and every thing<br>Is changing every day<br>You also like that<br>I was foolish<br>that me<br>Why? why couldn’t<br>Understand me? |
| 23 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | මගේ අර යාළුව....<br>පුංචි කුඹියා....<br>මට කියනව....<br>........උඹ ඔය හැටි<br>සැහැල්ලු වෙන්න හදන්නේ ඇයි?<br>පියාඹන්නද?<br>තරු අතරින්........වලාකුළු අතරින් ....<br>හඳ ගාවට<br>ලං වෙලා ආදරෙයි කියන්න.... |
| 24 | | ආරොන්ගේ බිත්තිපුවරුව | Wall paper/Poster/ other publications | මගේ පුංචි ගිරවත් එක්ක<br>උඹ හුරතල් වෙනව දකින කොට<br>මට හිතෙනව.....<br>උැයි මම ගිරවෙක් උනේ නැත්තේ කියලා<br>හැබැයි....<br>කුඩු නොවෙච්ච |

| | | | | |
|---|---|---|---|---|
| 25 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | අම්මා එනතුරු<br>තෙල් නැතිව පණ ගැහුන<br>ලාම්පුව නිව්ලා ය.<br>ගේ පුරා කළුවර ය<br>මම හිඳිම් අඳුරේම<br>කඩපිලට ගියේ අපෙ අම්මා ය<br>තඩි කඹය ගැටගැසුණු යටලිය<br>දිරලා ය<br>අප්පච්චි තව තවත්<br>හිත කොනේ දැඟලාය<br>උන්දැව බිම දාපු<br>දඬු කිතුල<br>මැද මිදුල වැජඹේය<br>වැල් පෙනෙල දළු කෙටුවෙ අම්මාය තෙල්<br>නැතිව ලාම්පුව නිව්ලා ය අද උදේ පොළට<br>ගිය<br>කිරි මිටි<br>අම්මාගේ දහඩියට තෙමිලාය<br>කළුවරය<br>කිරි මිටි නොපෙනේ ය<br>හිතට බිය ගෙනෙන්නේ පමාවෙන අම්මාය<br><br>උල ලේනියක් ඈත වැළපේ ය<br>කම්පිත ව ලැම මඬල ගැහුනා ය. |

| | | | | |
|---|---|---|---|---|
| 26 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | පිළිතුරු<br>මායාව කොච්චර උනත් සුන්දරයි<br>කවදාවත් එක් කරන්න බැරි දේවල්<br>එක් කරනව<br>එකිනෙකාට වෙන්වෙන්න බැරි විදිහට<br>ඒත්....<br>ලං වෙන්න දෙන්නෙ නෑ<br>ලං නොවෙන්න බාධා කරන දේවල්<br>එයිටත් වඩා සුන්දරයි<br>අව්ව වැස්ස සුළග......<br><br>මං දන්නෙ නෑ<br>මං ආසයි පියාඹන්න<br>අහසටයි පොළොවටයි පේන්න<br>පුංචි කිරිල්ලියක් වගේ<br>මං ආසයි පුංචි මලක් වෙලා<br>පොළව උඩ ඉඳන්<br>අහස දිහා බලාන ඉන්න<br>එතකොට ......<br>මට හිතේවි<br>මේ අහසයි පොළොවයි අතර ඉන්න<br>වාසනාවන්තම කෙනා මං කියලා |
| 27 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | අහස දුරයි තමයි පොළොවට<br>එත්.....<br>වැස්සක් වැටුන කියලා .......<br>පොළව තරහ වෙනවද?<br>ගහක් හැදුන කියලා<br>අහස අමනාප වෙනවද?<br>වෙන්වෙලා හිටියට දුරින්<br>අල්ලන්න බැරි තරම් ඈතින්<br>වෙන්කරන්න බෑ අහස පොළොවෙන්<br>එක් නොවන බව දැන දැනත්<br>හිතත් නෑ වෙන් වෙන්න<br>අහසවත් පොළොවවත්<br>එකිනෙකාගෙන්<br>එහෙම උනොත්.....<br>චුටි කුරුල්ලො සිංදු කියන්නේ කොහොමද?<br>පාට පාට මල් පිපෙන්නේ කොහොමද?<br>එක් නොවුනට<br>අහසට පොළොව<br>ලස්සනයි<br>වෙන්කරන්න බෑ කාටවත් |

| | | | | |
|---|---|---|---|---|
| 28 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | මහන්සියෙන් කරන ලද දෙයක් සේ<br>අපි විප්ලවයට ආදරය කරමු<br>සිත්තරෙකු මූර්ති ශිල්පියෙකු හෝ<br>ලේඛකයෙකු ඔහුගේ<br>කෘතියට ආදරයට කරන්නා සේම<br>අපි ඊට ආදරය කරමු.....<br><br>ඔහුගේ මෙන් අපේ ක්‍රියාවටද<br>නිරන්තර වටිනාකමක් අවශ්‍යයි.<br><br>විප්ලවයද කලාවකි.....<br><br>දේශපාලනයද කලාවකි<br>ඉතාම වැදගත් දෙය එයයි<br>මම සිතමි. |
| 29 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | කාන්තා දිනයට පිළිතුරු.<br>එකම වස්තුවක දෙපැත්තක්<br>දෙපෙත්තක් තියෙන වග.......<br>විචාරන්නට ඇතත්<br>දහසකුත් මිනිසුන්ට<br>එසේ වූ දහසක්ම<br>බෙදී අඩකට වඩා<br>හරියටම "ගැහැණියට"<br><br>සොයුරියක , යෙහෙලියක<br>පතිනියක වන නුඹට<br>මව් නමින් පිදුම් ලද<br>උත්තරිතර කමට.....<br><br>වැරදි දහසක් ඇතත්<br>වැරදිමත් නොවේ ඇය<br>නිවැරදි ද නොවේ ඇය<br>එය එසේ වන කළට<br>අසම්මත මේ ලොව්<br>පිරිමින්ගෙ සම්මතය<br>වැරදි නොකරන්නේ නම්<br>මොන තරම් අගේ වෙද?<br>ලොවේ හැම වස්තුවක<br>අවම වු වගයෙන් ම<br>දෙපෙත්තක් තියෙන වග<br>සම්මතය වු විටක<br>පිළිගන්න වන නමුත්<br>විචාරණ ඇතැම් දෑ<br>නොවිසඳන සොයුරනේ<br>කමක් කරන්නෙද නුඹත් |

| | | | | |
|---|---|---|---|---|
| 30 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | හැරී බැලුවෙමි<br>දුක් කම්කටොලු මැද<br>ගලා ආ<br>ජීවිතය දෙස<br>ආපසු<br>සිදුවූ බොහෝ දෑ ඇත,<br>ආ ගමන තුළ<br>සිත් රිදවීම් . ... හැඩීම් ...... සිනාසීම්........<br>ලද දෙයක් නොමැත<br>නැවුම් අරුත්බර<br>දුක් විඳිමුත්<br>සැනසුම කවදාද<br>ජීවිතය දිගුවෙත්ම<br>සැනසුම.... අනන්ත දුරකය,<br>ඒත්.....<br>"බලාපොරොත්තුව "<br>ජීවිතය දිගුකරනු නිසැකය |
| 31 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | වස් දඩු රාවය<br>ඔබේ වස් දඩු රාවයෙන්<br>මගේ හදවත සැනසුණා<br>සියුම් හදවත එයින් මත්වී<br>සිහින ලොකෙක තනිවුණා<br><br>ඇසේ මට එහි මිහිරි රාවය<br>හමන මද පවනේ පවා<br>දැනේ මට එහි සියුම් ශෝකය<br>ගෙවෙන හැම මොහොතක් පුරා<br><br>නිල නුබ ගැබ වළා අතරින්<br>විහග ගියක පැටලිලා<br>ලතෙත් වූ හදවත් සොයාගෙන<br>මිහිරි රාවය යයි ගලා |

| | | | | |
|---|---|---|---|---|
| 32 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | අර කොනෙන් මේ කොනෙන්<br>එල්ලිච්චි රෙදි කෑලි<br>වැද්දොවත් ඇන්දෙ නැති<br>හෙළුවැල්ලේ පාංකඩ<br>තෙල්ගාලා වෙර දාලා<br>වෙහෙස වි බැහැගත්තු<br>කිටි කිටියේ හිරවෙච්චි<br>බිම බට දෙපා යුග<br>නිතඹටම පලාගත්<br>විලුඹටම දිග ගවුම<br>බය ඇත්තෝ අගලකට<br>නවත්වපු දික් පැලුම<br>දශමයක් නැවුනොතින්<br>අපේ උන්ට ඉන්නබැරි<br>අඟල් පහේ සාය පොඩි<br>ඇඳගෙනත් අට වෙනිදා<br>කෑ ගසයි මුළුලොවට<br>අපට මගයන්න නෑ<br>බස් එකක ඉන්න බෑ<br>මුන් ඉන්න දෙන්නෙ නෑ<br>පෙන්නගෙන ලොකෙටම<br>විකුණගෙන තමාවම<br>බඩ වෙච්චි දාකටම<br>බුරපියව් අප හටම |
| 33 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | ජන්න එන්නැති<br>ඇවිත් නුඹ හා යන්න යන්නැති<br>ඇත්කුලේ නොව සනුහරේ උන්<br>විරසකයි මැණිකේ<br>ඉතින් නුඹ කැඩපතේ හැංගු<br>කිරි කොයිද මැණිකේ |
| 34 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | හඬන මා අස්වසන්නට<br>බොරළු කැට ගස /නිදිකුම්බා පඳුරු වලට<br>නිදිගත් කල<br>හඬන මා අස් වැසු<br>තාත්තේ<br>නිදිකුම්බා පඳුරු ඇස් අරින්නට ඇති<br>තවමත් නිදි නැහැ නේද<br>අපි නොදුටුවට<br>එහෙනම් ඇය ඔබ තවමත්<br>ඇස් වසාගෙනම |

| | | | | |
|---|---|---|---|---|
| 35 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | නුඹේ ඩාදිය පුසුඹ<br>වසා පස්ගල් දමා තද කර<br>හැම තැනම ඉහිරිලා<br>මිනී මල්සුවඳ |
| 36 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | සේනේදිය ගලා ගිය<br>දයා ළය නුඹේමය<br>ළයේ කිරි තිරේවිය<br>කිරේ ලෙය නුඹේමය<br>මෙතේ බුදු පදවි ලද<br>මගේ අම්මේ<br><br>විල පතුල සිප<br>ඉන් උඩට නැග<br>මා පිපුනා දින<br>උණුසුමට ගෙන<br>නෙතු කදුළු පිසු<br>අම්මාය නුඹ<br>විල මතම නොව<br>ඉන් එහා ඉම<br>මා සුවද පොද<br>මුසු කෙරූ නුඹ<br>මා උගත නැත<br>කොතැනද අද... |

| | | | | |
|---|---|---|---|---|
| 37 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | පස් වසරක් ගෙවෙන දින<br>දල්වමි බකටි පහනක්<br>පස් පිඩැලි යට සැගවී<br>ඔබ නිදන සොහොන මත<br><br>ඒ දවස<br>ඉහිරිලා තිබුනි හැමතැනම<br>ඔබේ ඩාදිය පුසුඹ<br>ඒත් අද ඒ වෙනුවට<br>මිනි මල් සුවඳ<br>හැම තැනම<br><br>කුඩා කල මා හැඩූ විට<br>වැලිගසා නිදිකුම්බා පදුරුවලට<br><br>වැලිගසා නිදිකුම්බා පදුරුවලට<br>නිදිගත් කල<br><br>හඩන මා නැලවූ<br>ඔබේසොහොන මත හඩමි<br>හඩමි අද<br>නිදිකුම්බා පදුරුවලට ගල් ගසා<br>මා නලවන්න<br>ඔබ නොඑන්නේ මන්ද |
| 38 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | මහද<br>කම්පිතය<br>නුඹේ ඔය<br>නෙත් සරින් |
| 39 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | එකම අහසක් යට<br>නුඹට මට<br>එකම පැතුමක් පිරුනා<br>නුඹට මට<br>එකම සුසුමක් නගිනා<br>නුඹට මට<br>ඉතින් දෙහදක් කුමට |
| 40 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | එකම අහසක් යට<br>එකම පැතුමක් ළග<br>එකම සුසුමක් එකම මොහොතකදි<br>ගැහෙන විට<br>ඉතින් දෙහදක් කුමට<br>නුඹට මා |

| | | | | |
|---|---|---|---|---|
| 41 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | වැස්ස<br>සීත රළු මහවැස්සේ<br>සිදුරු දියවේ පොල් අතු අස්සේ<br>පෙගුණු පොත් පෙරළෙයි ඇමටිය මැස්සේ<br>රැලි මැකුණු සුදු ගවුම වෙල් පැළලි<br>දොරඅස්සෙ<br>මුමුණු වදන් නොරුදේ බේබදුකම අස්සේ<br>පන්හිද රැගෙන එනු අග හිග පිරි මැස්සේ<br>අරමු ගමන් යන්නට අපි සරසවි මැස්සේ |
| 42 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | එකා පිට එකා<br>ඉහලට ගොස්<br>ගොඩ විම් වස්<br>වරක් සනසා<br>වරක් රවටා<br>වියලි දෙරණම<br>අතහැරීද ? |
| 43 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | එකම වහලක් යට<br>හමු නොවන පමනක<br>එපා කෙළි තවම සිනා<br>මට.......<br>තවත් මේ වහල යට<br>දැවි දැවී තිබුන ලිප<br>තෙත් කළේ නුඹ<br>එහෙත් අළුයම ගිනිපුළිගු නැත<br>ගිනි පෙලෙමි සමග පොර ඇඳ මත<br>බිය කනාමැදිරියට නොව |
| 44 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | රිදී ඉරි වැටෙත්ම<br>පිය නගයි බස් නැවතුමට<br>තැලී පොඩි උනු දිළිදුකම<br>දොනත් පියවෙත්ම<br>සිඹි පවස සුසුමින් මහපොළොව<br>නිදිකුම්බා මල් වඩම<br>සුවඳ දෙයි හුරතල් කමට |
| 45 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | ඇසළ සඳ එලියයි මට ලොවම<br>අමාවකයි තවමත් මගේ ලොවට<br>පායයිද ඇසළ සඳවත් සරුවට<br>කියන්න දැන්වත් දැවෙනසදවතට |
| 46 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | ඇයි නුඹමට මෙතරම් රිද්දන්නේ<br>දෙවිදුනි ඔබ මොන දෙවොලෙද ඉන්නේ |

| | | | | |
|---|---|---|---|---|
| 47 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | හදේ තනිකම<br>සොරාගත් නුඹ<br>සොයා එමි මම<br>මගේ තනිකම<br><br>එපා මට සඳ එළිය<br>හුරුයි තවමත් කළු එළිය<br>හදේ තවමත් නොකියූ කවිය<br>කොහිද හිරු නැති දා සඳ එළිය |
| 48 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | මිසර මූර්ති කලාවේ<br>ශිල්පක්‍රම හා මානව<br>නිර්මාණය හි ස්වාභාවය |
| 49 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | එදාවගේ අදත් පොද වැස්ස වැටෙනවා<br>මල් පිපුණු ගහ ගාව තව ඉඩ තියෙනවා<br>නුඹ මගේ ලයේ නැති අඩුව මට දැනෙනවා<br>මට තවම මං අහිමි මගේ කවිය මම ලියනවා |
| 50 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | සුදු වතින් සැරසී අවුත්<br>පවිකාර ආත්මය<br>මගේ හද අසපුවම<br>අපිරිසිදු කළ සැටිය.....<br><br>පින්සාර ආත්මය<br>නොවැඩියේ ඇයිද ඔබ<br>ඔබ නමින් මා තැනූ<br>නවමු හද අසපුවට ...<br><br>පෙරුම් දම් නොපිරීද<br>වතාවත් නොකළාද<br>මා තැනූ හද කුටිය<br>කිළිටි යැයි හැඟුනාද.... ?<br><br>මේ භවේ නොවන්නෙද<br>මතු භවේ පතන්නෙද<br>අවසාන සුසුම් පොද<br>වියැකෙන්න බොහො දුරද.......? |

| | | | | |
|---|---|---|---|---|
| 51 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | “ස්කවුට් ඔයාට මම ඉස්සරවෙලා පොඩි උපක්‍රමයක්<br>කියා දෙන්නම්. එතකොට ඔයාට ඕනම තැනක ඕනම කෙනෙක් එක්ක ජිවිත් වෙන්න පුළුවන්<br><br>ජිවිතේ දිහා ඒ අනිත් මනුස්සයා බලන විදිහට බලන්න දූවේ<br>ඒ කියන්නෙ?<br>එයාගේ සපත්තුවට බැහැලා ඇවිදින්න ගත්තහම එයාලා<br>හිතන හැටි ඔයාට අවබෝධ වෙයි දරුවෝ |
| 52 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | නෑ<br>මං ඒ ගැන කවි කියන්නේ නෑ<br>මොකද....<br>කුරුල්ලො තාමත් මට කවි කියන නිසා<br>හිම් වෙන්න ඕනෙ කියලා හිතුවත් වෙන කෙනෙකුට<br>මා ගාව ඉන්න ඕනම කිව්වා<br>ඒ ලෙන්ගතු කම මට දැනෙනවා<br>ඒත්..... ඒ අතිතය මට ඕනේ නැහැ.<br>මට දැන් තියෙනවා ලස්සන වර්ථමානයක්<br>දැනෙනවා තියෙනවා කියලා<br>ලස්සන අනාගතයක්<br>ඉන්නව මට ආදරේ කරන්න කෙනෙක්<br>බලාන ඉන්නවා මගේ දිහා<br>ආදරෙන්<br>ලොකු ලෙන්ගතුකමක් එක්ක<br>මට හිතෙනවා<br>මේ ලොකේ ඉන්න<br>වාසනාවන්තම පෙම්වතිය මම කියලා |

| | | | | |
|---|---|---|---|---|
| 53 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | එක් වෙන්න හිතුවට<br>වෙන්වෙන්න නොහිතුවට<br>මං ආසයි<br>මේ ලොකේ ඉන්න<br>ලොකුම හතුර නුඹ වෙනව නම්<br>නුඹ මාව වත්<br>මා නුඹ වත්<br>නෑ හදුනන්නේ<br>හිතුවට හදුනනව කියල<br><br>ක්ෂිතිජය විතරක් නෙමෙයි<br>හැම දෙයක් ම<br>මේ ලොකේ මායාවක්<br>ඇස් රවටා මිරිඟුවක්<br><br>ඒත් ......<br>ලස්සනයි.<br>සුන්දරයි. |
| 54 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | දුර අහසට වෙලා<br>තනියම ඉන්නේ ඇයි?<br>ආස නැද්ද......මං ගාවට ඇවිත්<br>අහස දිහා බලාන ඉන්න .<br>හැබැයි ඉතින් එතකොට .......<br>නුඹට හඳ දකින්න බැරිවෙයි.<br>හඳ පායන කොට<br>අහසේ ලස්සන දකින්න බැරි වෙයි.<br>මොකද.....<br>නුඹ මා ගාව නිසා |
| 55 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | පුළුවන්නම් ඈත් වෙන්න<br>හැම දේකින්ම<br>වෙන්වෙන්න.<br>දුරින් ඉන්න<br>පුළුවන් වේවි මට<br>ලේසි වේවි<br>සොයාගෙන යන්න<br>අවසානයක්<br>ආයිත් කවදාවත් නොඑන්න. |

| | | | | |
|---|---|---|---|---|
| 56 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | මට දැනෙනව<br>මා දිහා බලාන ඉන්න වග<br>මං කවදත් ආදරය කරන<br>ඔය ඇස් දෙක<br>මං දන්නව<br>ළඟ තනාහිටියට<br>මා දිහා බලාන ඉන්නව කියලා<br>මේ ලොකේ<br>හෙම්බත් උනාම<br>දකින දකින කෙනාගෙන්ම<br>මං හොයනව ඔය ඇස් දෙක<br>තාත්තේ...<br>මං දන්නව<br>තාත්තට වද දිදි<br>බලාන ඉන්නව කියල<br>ඔය ඇස්දෙක<br>මං එනකන් පාරදිහා<br>තාත්ත තරහ නෑ නේද<br>මා එක්ක<br>දෝණී එනවා තාත්තේ<br>නුඹ ගාවට<br>ඉක්මනින්ම |
| 57 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | කටු මැටි ගෙපැලේ<br>කටු මැටි ගෙපැලේ බිම වැතිරි<br>සිහිනෙක තනිවෙන අප්පච්චි<br>යන්තම් හේනට එළිවෙද්දි<br>හේනේ තනිවෙයි අප්පච්චි<br><br>සෙනෙහස ළග දුක සෙනෙහස<br>හිතසපුරා දුක අතුරාවි<br>සුදු රැලි ගවුමේ මඩ තැවරි<br>කාට කියන්නද අප්පච්චි<br><br>කළුවර ළග හිත කළුවර වී<br>හැන්දෑවට ගෙට ගොඩවේවි<br>හැර ගිය සෙනෙහස සුවඳ දිදී<br>ඔබ රිදවනවද අප්පච්චී |

| | | | | |
|---|---|---|---|---|
| 58 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | බාල වියේ<br>බාලවියේ වැලි කෙළියේ<br>පෑ ළෙංගතුකම්<br>ආලවියේ වෙල් එළියේ<br>බැඳුණු හාදකම්<br>බාල මස්සිනේ නුඹගෙන්<br>ඈත්වෙලා දැන්<br>ආලවන්තකම්<br><br>සුපෙම් කැදැල්ලට රහසින්<br>ගොයම් කිරිල්ලක ඇවිදින්<br>නුඹ දන්නේ නෑ<br>මට දැනුනේ නෑ<br><br>නුඹේන් පැතුව ආල පැතුම්<br>මගෙන් ඈත පාව ගිහින්<br>නුඹ දන්නේ නෑ<br>මට දැනුනේ නෑ |
| 59 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | පුංචි කුඹියෙක්<br>මංගාවට ඇවිත්<br>හොඳටම ලංවෙලා<br>මගෙන් අහනවා<br><br>"මොනවද ඔය කල්පනා කරන්නේ....<br>කියන්නකෝ මටත්<br>හවුල් වෙන්න ඔයාටම" |
| 60 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | තුරුළු වෙන්න<br>සිප ගන්න<br>හිනා වෙන්න<br>දෑස පියාගෙන<br>ම්....<br>විඳින්න ඒ සුවඳ<br>කෝ<br>ඇත්තටම කෝ<br>ම්.....<br>හිනාවෙන්න<br>ආසයි හිනාවෙන්න<br>දෑස පියාගෙන.... ම්....<br>හිනාවෙන්න |

| | | | | |
|---|---|---|---|---|
| 61 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | රෑ මනමාලිය<br>වළා යහනක<br>අමාවක සඳ<br>බඳා සිප<br>හඬා වැළපෙන<br>මලානික තරු<br>කැකුළියේ<br>විරාමය අත ළගයි<br>නුඹගේ<br>සරාගික වූ<br>ප්‍රේමයේ... |
| 62 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | රත්රනින් ආදරයක්<br>රත්රනින් ආදරය හැරදා ආ මා<br>ඉමිටේෂන් ආදරයක් ඔහුගෙන් ලැබුවා<br>ඉමිටේෂන් ආදරයේ කෑලි කැඩුණු දා<br>රත්රනේ ඔබ ඉන්නේ කොහොමද සිතුනා<br><br>රත්රන් නික්ම ආවත් මා පියාපත් සලා<br>සිඳිලා අද ගත සිත විඩාපත් වෙලා<br>ඔබත් නොමැති ඔහුත් නොමැති<br>කතරක තනිවෙලා |
| 63 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | කතරගමේ දෙවොල් බිමේ<br>කතරගමේ දෙවොල් බිමේ<br>නෑ දෙවියන් දුටුවේ<br>සිඟා යදින මල් කැකුළකි<br>නෙතු අද්දර පිපුනේ<br>කතර ගමේ දෙවිවරුණේ<br>පතළ වෙලා දෙරණේ<br>සීනු හඬයි ඉකිබිඳුමට<br>වඩා තදින් ඇසුනේ<br><br>මැණික් ගගේ දිය දෝතක<br>මලේ කඳුළු තිබුණේ<br>දෝතට ගත් කඳුළක තෙත<br>නෑ හිතකට දැණුනේ |

| | | | | |
|---|---|---|---|---|
| 64 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | සීපද තාලෙට<br>සීපද තාලෙට නැළවිලි ගී කිව්වා<br>ගී පද තාලෙට මගෙ හිස අතගෑව<br>මා නිදනා තුරු නොනිදාගෙන උන්න<br>ආදර අම්මේ මතු දා බුදු වෙන්න<br>මවක උසුලනා ලොවක වේදනා<br>මා කුස දරමින් වින්ද දිනේ<br>නොදන්න හින්දා දැඟ කෙරුවම මං<br>රිදුනද අම්මේ කියන් ඉතින්...<br><br>කුසට ඔබේ අහරක් නැතිදාටත්<br>ළයට ඉබේ කිරි එරෙන බැවින්<br>සෙනෙහස මුසුකර ඒ කිර පෙව් පින<br>බුදුවෙන්නට මදි වේද ඉතින්... |
| 65 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | දිලිසෙන රන්වැට<br>කිරි කළ ගෙන පිරුවට බැඳ<br>සිරි මහ බෝ මළුවට එන<br>පිරිවර තවමත් හිමියනි<br>දිලිසෙන රන්වැට පාමුල<br><br>හිමි ඔබ පිට දුන් එදවස<br>රන්වැට නැත බෝ හිමි වැට<br>බෝ හිමි අද රන් වැට මැද<br>පිරිවර රන්වැට පාමුල<br><br>ඇති හැකි අය රන්වැට පැන<br>සිතූ ලෙස බෝ හිමි වැන්දට<br>නැති බැරි පිරිවර හමියනි<br>තවමත් රන්වැට පාමුල |
| 66 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | Flowers are not flying<br>But<br>Bees are flying<br>to the flowers.<br>that is the truth<br>Bees come to the<br>flowers<br>Althongh they wherever<br>born. If they<br>fragrance and<br>nutrient. |

| | | | | |
|---|---|---|---|---|
| 67 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | මලක් තියෙනව මෙහෙම<br>මේ ලස්සන දැන් විතරයි<br>හවස් වන විට<br>මා පරවී යනවා<br>බඹරෙක් කියනවා<br>ඔය මල මගේ<br>ඔය මලත් එක්ක<br>මමත් මැරෙනවා කියල<br><br>මල කියනව<br>බඹරෝ ඔයාට මැරෙන්න<br>තව කල් තියෙනව<br>මාත් එක්ක මැරෙන්න<br>ඔයා එන්න ඕන නෑ කියල<br><br>බඹර කියනව<br>ඔය මල වාගේ මලක්<br>මම ජිවිතේට දැකලා නෑ<br>ඔය මලට<br>මම ආදරෙයි<br>ඔය මල නැතිව මට<br>ජිවත් වෙන්න බෑ කියලා<br>එතකොට මල මොනව කියයිද? |
| 68 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | අහස යට<br>මේ විසල් අහස යට<br>අපි අපි වී<br>තනිතනිව ම<br>බලා හිදිමු<br>හිරු මිය යන හැන්දෑවේ<br>මකා දමා නීල සිතුම්<br>අදිමින් සිත්තමට තතු කියමි<br>කිම යන්නේ අප අතැර<br>අඳුරට අප පමණු දී<br>අකා මකා රතු නිම්නය<br>ගසා බසා අප පල්ව<br>අඳුරු දෙනෙත් දීප්තව<br>මුසළ සිත් පැහැයෙන් නැහැවී<br>ආයෙත් හිරු උපදිනවා සහතිකයි<br>අප හිටි තුරු හිස් හිස් මුදුනෙම<br>කවදාහරි දිනයක<br>නවහිරු උපදිනවා සහතිකයි<br>ඔව් සැබැවක්මයි<br>යලි කිසිදින නොමියෙන ලෙස<br>නව හිරු උපදිනවා සත්තයි |

| | | | | |
|---|---|---|---|---|
| 69 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | වංගුව<br>සියල්ල මා පසුකර<br>යනු කිම ?<br>සියල්ල මා අතැර<br>යනු කිම<br>අදුරින් දෙනෙත් විඩාපත් කර<br>මිහිදුමින් සිත්තම් කර<br>යන්නේ කොයිබටද???<br>නුඹට නුහුරු වේගය<br>රතු දිප්ත පහන්<br>නිවි නිවි දැල් වී<br>ඉස්සරහ වංගුවක් !!!<br>එකවර මගේ සිත ගැස්සුනා....<br>කීයක් නම් වංගු පසුකලේද යත්<br>එපමණ වර මසිත ගැස්සි ගැස්සි<br>රිදුම් දී හැඩුවා මට මතකයි...<br>ඉස්සරහා වංගුවක් !!!<br>හා! ඉතිං මට කම් නැත<br>කොපමණ වංගු ආවත්<br>සොයමි පිළිතුරු<br>අද ගැස්සුන ද<br>හෙට පිපි සිනා කැන්<br>බර වේවි බිමටම... |
| 70 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | සංගිද පාමුල<br>සංහිද පාමුල<br>නිවුණු පාන ළග<br>කිමැයි හඬන්නේ අප්පච්චි<br>නොහඬා කියපන් උලලෙනි<br><br>බටහිර අහසේ<br>ඉරබටු තරුව නිවී<br>සංහිද පාමුල<br>කළුවර දිගාවුනි<br>ගමටම හඬගා කියපන් උලලේනි<br><br>පොරි මල් විසිරි<br>සිල්ලර කාසිවැටේ<br>සංහිද පාමුල<br>නොනිදා නිදන හැටි<br>ගමටම හඬගා කියපන් උලලේනි. |

| | | | | |
|---|---|---|---|---|
| 71 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | ගිරා පැටියා<br>උඹට තටු ලැබුණා කියලා<br>ඔය හැටි පියාඹන්න<br>හදන්න එපා<br>ඉර ගාවට ගියොත්<br>උඹව පිච්චිලා යාවි.<br>හඳට ගියොත් හඳට ගියොත්<br>උඹට කන්න නැතිව<br>මැරිලා යාවි.<br>පියඹල පියඹල ගිහිල්ලා<br>ඔය අත්තටු දෙක<br>දවසක විඩාවට පත්වේවි<br>එදාට නුඹට<br>මගේ පුංචිකුරුලු කූඩුවේ<br>දොර ඇරල තියෙවි. |
| 72 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | අහිංසක පුංචි<br>පලගැටියෙක්<br>මගේ අතේ වැසුවා<br>දගකරන්න<br>එපා පැටියො<br>එක තැනක<br>වහලා ඉන්නකො<br>මම කිව්වා<br>ඔයත් එක්ක මම<br>සෙල්ලම් කරන්න ආසයි<br>පලගැටියා කිව්වා<br>පලගැටියත් එක්ක<br>මම සෙල්ලම් කලා<br>මේ පුංචි පලගැටියා<br>මා එක්ක වාගේ<br>දවසක ගින්දරත් එක්ක<br>සෙල්ලම් කරයි කියලා<br>මට බය හිතුනා<br>පලගැටි පැටියො<br>ගින්දර ලගටනම්<br>කිට්ටු වෙන්නවත් එපා<br>මම කිව්වා<br>පලගැටි පැටියා හිනාවුනා<br>ගින්දරට මම ආසයි<br>මේ හිතල රාත්‍රියේ<br>ගතට උණුසුමක් ලබන්නට<br>ඇත්නම් කදිමයි කියා<br>කිව්වා<br>එපා එපා<br>හිතන්නවත් එපා |

| | | | | |
|---|---|---|---|---|
| 73 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | වැසස කාලෙ<br>මගේ අතු<br>දළු දාලා හැදුනා<br>මල් පිපුන<br>මා ඉක්මනින්ම හැදූන වැඩුන<br>අකාසෙ වලාකුළුවලින්<br>ඒ කාලේ පිරිලා තිබුනා<br>මට ඇති තරම්<br>වතුර තිබුනා<br>මා අවට පරිසරය<br>ඉතාම සිසිල්ව තිබුනා<br>සිසිල් සුළන්<br>මාගෙ අතු පතර<br>සොලවා හමා යනවිට<br>මට කොතරම් සතුටක්ද?<br>එත් දැන්<br>නියගය ඇවිල්ලා<br>ආකාසේ ආසාවකට<br>එක වලාකුළක්වත් නෑ<br>ගිනිරස්නෙට මුළු<br>ගතම පිච්චෙනවා වගෙයි<br>හමා එන රස්නේ සුලං<br>වලින් මාව පිච්චිලා යනව<br>උදේ ඉඳලා රෑ වෙනතුරු<br>ඉර තදින් පායනවා<br>ජල බිදක් නැතිව<br>පොලොව කරවෙලා ගිහිල්ල<br>ඉරිතලා ගිහිල්ලා<br>මගේ මුල් ටික<br>වතුර ලේලනවා හඬමින් |
| 74 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | ඔබ අපෙන් වියොවී<br>නොසැලු කඳුලැලි මගේ හද<br>විටින් විට නෙතු අගට ගෙනෙයි ඔබ<br>පියාණනි ඔබ සුසුම් අද අපෙන් වෙන්වෙලා<br><br>අතුල තරුමල් පොකුරු එකින් එක මැලවිලා<br>පුරහදේ සොම් සිසිල වළාවක සැඟවිලා<br>නොපතනා වියොවෙන් දෙනෙත් අප හඬවලා<br>මන්ද අප තනිකලේ පිය සෙනෙහෙ තවරලා. |

| | | | | |
|---|---|---|---|---|
| 75 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | දුක් සුසුම්<br>කඳුළු කැට වියැළිලා<br>මහපොළව ඉරිතලා<br>තල් වැටේ මායිමේ<br>දුක් සුසුම් තනිවෙලා<br><br>මහපොළව වියැලිලා<br>ගොහොරු මඩ කැලතිලා<br>මහළු ඇගේ දෙඅත් පතෙ<br>දිය බිඳක් තැවරිලා<br><br>සෝ සුසුම් ඉකි ගසයි<br>මිණිබිරිය තනිවෙලා<br>කිරි නොමැති තණ පුඩුවෙ<br>සෙනෙහෙ දිය කැටිවෙලා. |
| 76 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | සඳ එලිය වැක්කෙරෙන<br>රාත්‍රිය දැන්<br>මට තනිය හොඳටෝම<br>නුඹ නැතිව ඇත්තටම<br>මේ ගෙවන වසන්තය<br>මිහිරි නෑ එච්චරම<br>සබඳ නුබ මා එක්ක<br>හිනැහෙන්න ඇත්තටම<br>ජිවිතේ තනිකමට<br>නුඹට හැකි මගට එන්න<br>සඳ එලිය බිම වැටුනා<br>වැව් බැම්මේ ඇවිදින්න<br>එන්න නුඹ මගෙ ළගට. |

| | | | | |
|---|---|---|---|---|
| 77 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | මේ මිහිරි වසන්තයේ<br>මම තනිව හිඳින්නද<br>තවත් කල් යන තෙක්ම<br><br>නුඹට නුඹේ ඇස් දෙකට<br>මම තවම පෙම් කරමි<br>දරාගෙන සියලු දුක්<br>මම තවම පෙම් කරමි<br><br>නොදැන නුඹ මගේ හිතට<br>දුන්න බෝ දුක් සැවොම<br>දරාගෙන පෙම් කරමි<br><br>වසන්තය නිම නොවන<br>සිහිනයක් වී පිපෙන<br>නිමක් නැති නෙත් අයා<br>මග බලා ගෙන හිදිමි. |
| 78 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | ඇ .....<br>බලා හිදිමි<br>දුර ඈත ඈ....ත ඈ............ත<br>දෙනෙත් හකුළුවා<br>දැල්වෙන තෙක් රතු එළිය<br>පාර හරහා යන්නට<br>ඉඩ නොලැබේ<br>ඉහින් කොනින් දාදිය<br>දරාගත හැකිද යම් දෙයක්<br>අසල කාණුවකි හමන දුගද<br>දරාගත නුහුනු තැන<br>එහි!<br>කිරස්ව පිදුම් දේ<br>පොදු දහදිය<br>පෙමින් තැබුවෙමි සිත්වෙයි<br>තනුව හඬනාන්තය<br>ඈතින් දිස්වන ගමනාන්තය<br>සන්දාහලකයන් දිස්වන ඒ ගමනාන්තය<br>ඔව් මම යමි<br>එකදවසම<br>කදු ඉහිල් කඩා බිද ගෙන<br>කොතරම් දුව දුව කම් නැත<br>ඔව් |

| | | | | |
|---|---|---|---|---|
| 79 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | නුඹට<br>තබා බර අඩි<br>මගේ හිත උඩ<br>යන්න යනවද<br>යළි නොයෙන්නම<br>මේ වසන්තයේ<br>මල් පිපෙන වග<br>දන්නේ නෑ මම<br>දකින තුරු නුඹ<br>මියුරු වදනක<br>පටලලා නුඹ<br>කියනවද මට<br>ආදරේ බව<br>මග බලා ගෙන<br>ඉන්නේ මගේ නෙත<br>දකින තුරු නුඹ. |
| 80 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | දියවුණු වසත් සඳවත<br>සඳදිය බෝම අරගෙන<br>ආයෙත් ඇවිත් පායන<br>හේවුඩි අහස පාමුල<br>කොවුලන් නොවු කොවුලන්<br>සත්සර තුඩිනි ඇහිඳින<br>මොහොතට ඇවිත් යනු මැන.... |
| 81 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | හිරු එළියයි<br>උදේට පායා<br>හවසට බැස යන<br>නුඹ මට... |
| 82 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | අවසර බුදු හාමුදුරුවනේ<br>ඉසිපතනේ මිගදයේ<br>මෙත් මුදිතා කරුණා සයුරේ<br>සම්දු වඩින්නට සිසිල ලබන්නට<br>මට අවසර ඇත්නම්<br><br>විසිරුණු හදවත පිපි නෙළුමක් වී<br>බුදු සම්දුගෙ පාමුල වැටෙමින්<br>බුදු බණ පදයක් අහන්න ඇත්කම්<br>රජ කිරුළකි මට මෙලොවේ<br><br>දෙදහස් පන්සිය වසරක් ගෙවුණා<br>තවමත් අපි මේ සංසාරේ<br>ආයෙත් නොයෙන්න මොක් සුවලබන්න<br>අවසර බුදුහාමුදුරුවනේ..... |

| | | | | |
|---|---|---|---|---|
| 83 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | මකරන්ද<br>මකරන්ද සිනාසි<br>ඉඟිමරයි හොඳටම<br>ගැස්සුණා සිත් අහස<br>නොසිතූ විලසින්ම<br>පාවී ආ නමුදු කළු වළා<br>කාලය නොවේ වස්සානයට<br>පොළොව බදාගත්<br>නුග මුල් දාරා<br>යලි ලිහනු කෙලෙසින්<br>අහසට විහිදි අතු<br>පාහිනු මිස කපනු බැරිය සැබවින්<br>පීදෙන්නට පෙර අස්වනු<br>වනසනු මොන හිතකින්<br>නුරා කැන් පොඩිකර<br>විසිකලා අහසටම<br>හිත් කඳුළු ඇරී<br>යලි වැසෙයි තදටම<br>මගේ ලොවේ අධිපති හිරු<br>කතරමැදින් එළියට නම්<br>කොහෙත්ම නෑ ඉඩක් |

| | | | | |
|---|---|---|---|---|
| 84 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | මකුළුවාගේ මලගම<br>මළ මකුළුවෝ උඹ<br>ප්‍රේමයෙන් වෙළෙන්නැති<br>උඹේ ළඟ ඇති<br>අන්තිම උණුසුමත්<br>ඇයට දෙන්නැති<br>ඇයට දිලම<br>උඹ මැරෙන්නැති<br><br>මුදල් කරදර වෙලාවට<br>දවා රෑ දෙකේ දිම<br>දැල් වියන්නැති<br>රැකෙන්නට මිස<br>මරන්නට නොව<br>බොහෝ වෙහෙසී<br>දැල් වියන්නැති<br>මැදියම් රැය වෙද්දි ඈ<br>උඹ නැතිව නිදන්නැති<br><br>උඹ වියපු දැල්<br>හොරෙන් විකුණා<br>ඈ අදින්නට සළු මහන්නැති<br>උඹට ගන්නට<br>බැරිව යන්නැති<br><br>ප්‍රේමයේ මුදු ඊතලය වැද<br>නුඹත් අකලට මැරෙනතට ඇති<br>ප්‍රේමය ම තව<br>විෂ දතක් බව<br>මකුළුවෝ උඹ |

| | | | | |
|---|---|---|---|---|
| 85 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | තුරුණු සිත<br>වසන්තය විසින් විකසිතකළ උයන<br>හිමි වන්නේ කාටද<br>වසන්තය විසින් විනාශ කල උයන<br>විකසිත කරන්නේ කව්රුද<br>තුරුණු විය මෙතරම්ම උණුසුම් කරන්නේ<br>කව්රුන්ද<br>මහ සයුර කදුළු සේද<br>එහි රැලි සිනා සේද<br>තුරුණු වියට මෙතරම්ම<br>කදුළු සිනා කුමටද<br>හද සැලි සැලි නොසැලෙන<br>තේරුම් ගත හැකි සේ නොහැකි<br>මේ අපේ තුරුණු වියයි<br>සසල වී නිසසල වන<br>නිසල වී සසල වන<br>නිහඬතාවයෙන් විප්ලවයකි<br>සීමා වැටකඩුළු නැති තුරුණු අප සිත්<br>අනන්තයටත් අනන්තයි<br>වසන්තය විකසිත වු උයන<br>මිලින වෙයි හෙට දිනේ<br>වසන්තය විසින් විකසිත කළ උයන<br>හිමිවන්නේ කාටද |
| 86 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | මුළු ලොවට ඉහලින් සදාකාලික පායන හිරු<br>සදු<br>මහි මාතාවගේ හිසේ කිරුළ පලදින වනමල්<br>ගොරහැඩි ගල්ගෙඩි පසුකර සයුර වෙත යන<br>ගංගාවන්<br>ගෙන්වා අපේ ආදරයට උපමාවන්<br>මිහිලියගේ උණුසුම ගන්න ඇදහැලෙන<br>වර්ෂාවන්<br>මිහිරි සිතුවිලි සිතට කොදුරන මද සුළග<br>දෙනෙත සනසන තුරු මුදුන්වල නිල්පැහැය<br>ගෙනාවා අපේ ආදරයට මතක සුවඳ<br>මඩ දියෙහි ඉපදි සුවඳ දෙන රත් නෙළුම්<br>පෙති හැකිලෙන්න කලියෙන් මලේ සැගවෙන<br>වන බඹරුන්<br>දේදුණු පාටින් පිවිතේ බර අරන් ඉගිලෙන<br>සමනලුන්<br>ගෙනාවා අපේ ආදරයට පැවතුමක්<br>උදයේ පිපිදි හවසට පරවෙන වන මල්<br>කුහුඹින් ගෙන යන දේදුණු පාටැති සමනල්<br>තටු<br>පැටව් නැති වු මුව දෙනකගෙ අදෝනා හඬ<br>ගෙනාවා අපේ ආදරයට නිමාවක් |

| | | | | |
|---|---|---|---|---|
| 87 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | නුඹේ සුසුම් වලට උන්ගේ පපු කැවුතු<br>පුපුරාවි යයි බියෙන්<br>නාස් පුඩු වසා පුළුන් ගුලිදෙකකින්<br>දැත් බැඳ නාභිය මත තබා<br><br>කෑගසා කියාපන් තාත්තේ<br>නුඹට උණු විනාසය<br>දෙතොල් එක්කර මැසූ<br>නූල් පට කඩාබිඳ  දමා<br><br>මිනි පෙට්ටි මුදලාලි<br>උදයටත් උවසටත්<br>බුදු පාන් ළඟ නැඳ වැටි<br>ඇඬිය<br>සරුසාර හෙට දිනත් |
| 88 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | නුඹ<br>බොහෝ දුර ගොස්ය<br>අවසරයි යන්නට නුඹට<br>හිසලූ ලූ අත<br>එවිට<br>හැකිවේවි නුඹට<br>අවැසි අවැසි දේ කරන්නට<br>හමුවූ දා පටන්<br>නුඹට කළ ගුණ කම්<br>නුඹ සිතින් මැකී ගිය හැටි<br>ඉක්මනින්<br>පුදුමයි<br>මනු ලෝ නම් ගති<br>කමක් නෑ නුඹට හොඳනම්<br>තව දෙයක්<br>සාපයක් වී නම්<br>අප නුඹට<br>මරා දැමූ අප ලබැදි සිත්<br>කිසිම කිසි දිනෙක<br>නොඉප දෙම් නුඹ වෙනුවෙන්<br>සහතිකයි |

| | | | | |
|---|---|---|---|---|
| 89 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | සක් නුඹ ලිහිණියෙක්<br>වසන්තයේ නිල් අහසට<br>හිත පෙම්නි<br>සරන්නට හැදුව නුඹ ගැන<br>හිත දුකෙනි<br>ලියන්නට පමා වුවාදැයි<br>දැනුනි<br>නොලියා ඉන්න දැන් මට බෑ<br>සකි සඳුනි<br><br>බොහෝ කැකුළු පිදුනු<br>තුරුවියන් මත<br>නොපිපුනු මලකි නුඹ<br>නෙළුවේ පුදන්නට<br>සුවඳ නොදැන මල් කැකුලක<br>හැඩරුවට<br>නුඹට වඩා රුවටුනේ අපි<br>හිනාවට<br><br>සිහින පිපෙන මල්ගොමුවක<br>අතු පතර<br>බොහොම දුකින් අතු ඉතිගෙන<br>නුඹ නිතර<br>තනා නුඹේ කූඩුව එහි<br>යුහුසුළුව<br>තනිව ඇවිත් නුඹේ මුහුණ<br>දොරකඩට<br>හෙලන්නට කඳුළු නැතිවග<br>කියනකොට<br>ඇඬන්නට කරුණා පවසන |
| 90 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | සුවඳ<br>නුහුරුයි මට<br>මේ විදහ<br>සැගවුනිද නුඹ<br>මල්පෙති අතර<br>මට දැනෙනවා<br>නුඹ ඉන්නවා<br>නුඹේ සිනහව<br>කතා කරන නුඹේ ඇස්දෙක<br>හැර නොයයි මා<br>නුඹට පෙම් බැඳි<br>නිසාවෙන් ම<br>මතකයි මට<br>ඒ පුරුදු සුවඳ<br>තවම |

| | | | | |
|---|---|---|---|---|
| 91 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | “ඉරටු මල් ” සංග්‍රහය අද දොරට වඩී<br>සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයීය දෘෂ්‍ය කලා පීඨ<br>සිසුන්ගේ නිර්මාණ ඇතුළත් ඉරටු මල් කාව්‍ය සංග්‍රහය<br>අද (11 වැනිදා ) උදේ 10ට එම පීඨයේ හේවුඩ්<br>ශාලාවේදි එළිදැක්වේ<br>එම විශ්වවිද්‍යාලයේ උප කුලපති මහාචාර්යය සරත් අමුණුගම දෘෂ්‍ය කලා පීඨාධිපති සුසිරිපාල මාලිම්බඩ<br>සංගීත පීඨයේ මහාචාර්ය සනත් නන්දසිරි ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය<br>ආචාර්යය ප්‍රනිත් අබේසුන්දර ප්‍රවීණ නාට්‍යවේදි ජයලාල්<br>රෝහණ යන මහත්වරු මෙම අවස්ථාවට සහභාගි වෙති |
| 92 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | ඉනු වරල රටා ගොතා<br>මල් ගවසා තිලක තියා<br>පාන්දරම කොවිල් ළග<br>මල් අහුලන ඉන්දුමති<br><br>මීන නිල නෙතු අද්දර<br>කාන්තිමත් බැලුම් තියං<br>කෝළ මුවින් දිගු පියසින්<br>බඹර රුවක පැහැය සොයන<br>පාන්දරම කෝවිල ළඟ<br>මල් අහුලන ඉන්දුමති. |
| 93 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | දන්නෙම් ඔබ කුමට දැවටෙන්නීද ලගින්<br>පිටුපා යන්නීද සැගවී කෝල ලෙසින්<br>කුමකට තැවෙන්නෙම් කිසිවක් නොවේ වෙනින්<br>මා වෙහෙසවා ඉන් සතුටක් ලබනු රිසින්<br><br>කුමකට රවන්නේ ද මුනට බනිනු මුවින්<br>ඉගි බිඟි තොරන්න වෙහෙසෙනු නොහැක ඉතින්<br>කදුලැලි සයුර පිහිනා තෙර පැමිණි බැවින්<br>හැකිනම් රිදවන්න ඇයෙත් පුරුදු ලෙසින්. |

| | | | | |
|---|---|---|---|---|
| 94 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | කපුරු දුම් සුවඳ විඳ<br>නුඹට මට හිඳින්නට<br>මරතෝණ්ඩි රටාවන්<br>නුඹ වටා අඳින්නට<br>තිලක තියන්නට<br>ඇයි දැයි කියන් මට<br>අහස් කුසේ නුඹ<br>නොසිට මා හැර යන්නේ<br>දීපාවලි රෑට<br>අමතක වීද<br>මා බලා හිඳින වග. |
| 95 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | රාත්‍රිය දැන් නුඹගෙයි<br>මේ පුරහඳ<br>අතගා එන<br>සුළං පොදක්<br>සිපගති මම<br><br>අඳුර මකා<br>එළිය එන්න<br>මියුරු සිහින<br>පළඳවන්න<br>රාත්‍රියම<br>දැන් නුඹගෙයි. |
| 96 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | ගැටපිච්ච මල් දාපු<br>වතුර එකක්<br>එළිපත්තෙන් තිව්වේ<br>නුඹ එන කොට<br>පිළිගන්න<br>ආදරේන්. |
| 97 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | දුක් ගීතය<br>උන්ට පාවඩ එලන්නට<br>කොඩිවැල් අදින්නට<br>පාට වලින් පිල් බෙදී<br>තබන්නට උන්<br>සැප පුටුවල යහමින්<br>දරදිය ඇද්ද සකිසඳ<br>හැකිළුණු උදර දිග හැරේ<br>දණී පණී ගසා නැගිටින්නට<br>කුසට හරි අහරක්<br>ලැබෙන්නේ කවදාද<br>නුඹට නුඹේ පැටවුන්ට. |

| | | | | |
|---|---|---|---|---|
| 98 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | නොබිඳුණු ලේ සුවඳ<br>සසර පුරුදු ලෙස<br>ඉපිද එක මව් කුස<br>විඳිදුක් නොසැලි<br>දම් වැලක පුරුක් අමුණා<br>පැතූ ඒ දිව්‍ය විමානයට<br>තවටිකයි දුර<br>නොහරිනු මා අත<br>තනිව යන්නට බෑ<br>ඉතින් මට.... |
| 99 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | දෙනෙත අන්ධව<br>සකල විකලව<br>පවිටු සිතැති<br>සකි,<br>නුඹත්<br>නුඹ හමුවේ මමත්<br>නොමැරි මැරිය, |
| 100 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | ඇයට ලියූ කව<br>සළුපිළි ඇඳි මුදු සෙළු ගත<br>අභරණ පැළඳි කනකර රජත<br>රහමෙර සේය ඉඟ සුඟ ලලිත<br>දුටුමණ බැඳුණු ගිරිළඳුන වෙත<br><br>දිව සළු එලා පාවඩ සේ අතුරන්නම්<br>සල් මල් සලා පෙති ගෙන හිස දවටන්නම්<br>පුන්සඳ රැයේ සඳකැන් දිය නාවන්නම්<br>එනු සිහලියේ හදයහනේ සතපන්නම්<br><br>කසුප් රජුන් නැත කිසිතැනදුටිමි ලියේ<br>මී මැසි දනන් නුඹ ගැන කවි ලියති ප්‍රියේ<br>මිහිදුම් සළුව නුඹ අතුරාපන්කො ලයේ<br>මා හඳ අරන් හද මඩලට වඩිනු ප්‍රියේ |

| | | | | |
|---|---|---|---|---|
| 101 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | මියැදුන වසන්තය<br>සරසවි පාළු වී<br>තුරුසෙවන වෙලද්දී<br>මුළු ලොවම වෙලද්දී<br>මුළු ලොවම නිසල වී<br>රැහැයි හඬ නගද්දී<br>දෑගිලි වෙලාගිය<br>මතක මං පෙත අතර<br>බක් මහේ කොවුල් හඬ<br>ගයන තනුවක් අසමි<br>උනුහුමට තුරුළු වී<br>පෙම් තනුව කියා දුන්<br>කොවුලාන ඉගිලගොස්<br>ඈත දුර ඈතටම<br>රතුපාට මල් පිපුන<br>මල් යාය සලිත වී<br>සොයන මුත් පෙරමගම<br>නොඑයි සරසවි බිමට<br>බක් මහේ වසන්තය යලිත්, |
| 102 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | කැමතිම තරුවක්<br>බැස ගිහින් අහසින්<br>මේ විසල් අහසට<br>පාළුයි දැන් ඉතිං<br><br>නිදාගෙන පිච්ච මල්<br>වසා තොල් පෙති වලින්<br>නුඹේ සුවඳ අවුරාද<br>මා වෙතින්<br><br>මලානික එලිය<br>බොඳ කරන්<br>නුඹත් දැන් බැස ගිහින්<br>කළුවර නිසා අහසින්<br>බැස යා හැකි ද<br>සඳුනේ මේ පිවිතෙන්... |

| | | | | |
|---|---|---|---|---|
| 103 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | කොහොම සරණද සක<br>නුඹ ළිහිණියෙකි<br>වසන්තයේ නිල් අහසට<br>හිත පෙවීනි<br>සරන්නට හැදුව නුඹ ගැන<br>හිත දුකෙනි<br>ලියන්නට පමා වුවා දැයි<br>දැනුනි<br>නොලියා ඉන්න දැන් මට බෑ<br>සකි සදුනි<br><br>බොහෝ කැකුළු පිදුනු<br>තුරු වියන් මත<br>නොපිපුණු මලකි නුඹ<br>නෙළුවේ පුදන්නට<br>සුවඳ නොදැන මල් කැකුළක<br>හැඩරුවට<br>නුඹට වඩා රුවටුණෝ අපි<br>හිනාවට<br><br>සිහින පිපෙන මල් ගොමුවක<br>අතුපතර<br>බොහොම දුකින් අතු ඉති<br>ගෙන නුඹ නිතර<br>තනා නුඹේ කුඩුව එහි යුහුසුළුව<br>තනිව ඇවිත් නුඹේ මුණ<br>දොරකඩට<br>හෙළන්නට කදුළු නැති වග<br>කියනකොට<br>ඇඩන්නට කරුණා පවසන |
| 104 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | විමන<br>පෙනේ විදා නාග සෙන්<br>දිවි අගන පරදවන<br>නීල නෙත් යුගළකින්<br>කාල දිගු වරලකින්<br>කෝල මුදු නෙත් පාන<br>නාග කන්‍යාවියක<br>නැත එතැන නා රජුන්<br>පෙනෙ විදා නාගසෙන් |

| | | | | |
|---|---|---|---|---|
| 105 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | සුදු ගවුමේ සුදු අරලිය පිපුණා<br>පිනිදිය ඇහැරන හිරුට කලින්<br>වතුසුදු පදුරම මුවමත පිපුණා<br>විසිරුණු පොඩි කැඩපතට හොරෙන්<br><br>දණබිම ඔබලා වරම් ගන්නවා<br>උදේට අම්මගේ හිත පතුලෙන්<br>ඉදිකඩුල්ල ළඟ අම්මගේ ඇස් දෙක<br>උදේ ගිහින් හවසට එනකන්<br><br>ළය ගිනි මොළවා කඳුළින් පොගවා<br>මව් සෙනෙහේ පිසවා සැණෙකින්<br>කුසගිනි නිමවා නැළවූ සැතපූ<br>අම්මේ ඔබ මතු නිවන් දකින් |
| 106 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | බක්මී ගහයට මල් හැලිලා<br>බඹරු එන්ට කලියෙන්<br>හිමිදිරියෙම මල් නෙළුවෝ කවුරුද<br>හිරුපුදින සැණෙකින්<br><br>දඟකම් මැද බක්මීමල් නෙළුවද<br>ගග යට ඔපදමමින්<br>හිස ගවසන්නට මල්නෙළුවද ඈ<br>නුඹේ හිත ගන්න ඇවිත්<br>බට්ටිත්තෝ නිවහන හැඳුණද රෑ<br>බට්ටිත්තිට සුපෙමින්<br>අහක බලාගෙන ඈ හිනැහෙනවා<br>නුඹේ දඟකම් වලට හොරෙන් |
| 107 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | අනඟ දෙනුවන්<br>නඳුන් උයනේ<br>දෑ සමන් මල<br>දෙසට නැමුණේ<br><br>සිනිඳු පෙතිවත<br>සුවැති පවනේ<br>උනග පිනිපොද<br>ළමැදෙ වැටුණේ<br><br>සේද තන පට<br>පත් විදා හැර<br>මලවී හී සැර<br>මලෙහි රැඳුණේ |

| | | | | |
|---|---|---|---|---|
| 108 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | මගේ දොත<br>මත පිපුණ<br>නුඹේ සුරත<br>හුරු පුරුදු<br>උණුහුමයි<br>තවම මට<br>මගේ මුහුණ<br>මත ඇදුණ<br>නුඹේ දෑස<br>සිහිලසයි<br>හෙටත්මට |
| 109 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | දිමුතු දසන් පීදෙන මුදු හිනාවා<br>ඇත ඉදන් නුඹ වෙහෙසී ගෙනාවා<br>දෑත දෙපා අවුරා මුදු කතාවා<br>තම හිතේ පැටලි හැර නොයාවා<br><br>මුදුසිතින් එපිටට ඉහිලූ තියා<br>කැකුළ දතටකිරි කොයිබින් වරේයා<br>ඉපල් ඉරටු මල් මට තව කොදෙයා<br>තටු පැටලී මා කදුළින් පෙනේයා<br><br>ලිපේ ගින්න තුන් වේලම නිවේයා<br>හිතේ ගින්න දළු මෝරා වැඩේයා<br>පාලු සාංකාවෙන් ගේ පිරේයා<br>කවුළු පියන් හැර නුඹකොයි ගියේයා |
| 110 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | නුඹේ ගැඹුරු වදන් තුළ නිසළවන විට මසිත<br>නුඹේ සිතම පැතුවා මම රැගෙන ගිය විට මසිත<br>නුඹේ සිහින් හසරැල්ලක සිර වෙන විට මසිත |

| | | | | |
|---|---|---|---|---|
| 111 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | අම්මාය නුඹ<br>සෙනේ දිය ගලා ගිය<br>දයා ළය නුඹේමය<br>ළයේ කිරි එරේවිය<br>කිරේ ලෙය නුඹේමය<br>මෙතේ බුදු පදවි ලද<br>මගේ අම්මාය<br><br>විල පතුල සිප<br>ඉන් උඩට නැග<br>මා පිපුණු දින<br>උනුහුමට ගෙන<br>නෙතු කදුළු පිසු<br>අම්මාය නුඹ<br><br>විල මතම නොව<br>ඉන් එහා ඉම<br>මා සුවඳ පොද<br>මුහු කෙරූ නුඹ<br>මා ළගක නැත<br>කොතැනකද අද |
| 112 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | මං සුළගට ආදරය කරනවට<br>නුඹ බයද?<br>බය වෙන්න එපා<br>මං ඇත්වෙන්නෙ නෑ නුඹෙන්<br><br>දන්නවද.....<br>ඔහු ආදරය කරනවා<br>මගේ අවුල් වෙච්චි කොන්ඩෙට<br><br>ඉතින් කියන්න ......<br>මං කොහොමද<br>සුළගට ආදරය කරන්නේ නැතුව<br>ඉන්නේ කියලා |

| | | | | |
|---|---|---|---|---|
| 113 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | ආල වඩන නිල නුවන්<br>පැළ දිගින්<br>කෝල ලෙසින්<br>බැලුම් හෙළයි...<br><br>මුතු මාල පළන්<br>වේලයටින්<br>කෝළ ලෙසින්<br>සිනා සලයි.......<br><br>ආල වඩන නිල රුවන්<br>කාළ ගැඹේ<br>කෝළ ලෙසින්<br>සැගවී යයි.....<br><br>මාන බලන් මා ඉන්නේ<br>වැට අද්දර<br>සේල පොටින්<br>අල්ලන්නයි..... |
| 114 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | රාගය<br>ලවු සිත<br>වෙව්ලන දැතින්<br>ඉරා<br>ය නග්න කර<br>ගිරි ඇතුන් සේ<br>උන්ව<br>නිසල බව<br>රිදවා සසල කරමින්<br>තරුණ ජීවය මත<br>වදන් මුමුණමින්<br>උන්මාදය<br>විය මොහොතකින් |

| | | | | |
|---|---|---|---|---|
| 115 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | ක්ෂිතිජය දෙස<br>බලාසිටින විට<br>අහසත් පොලොවත්<br>එක් වුනා වගෙයි<br><br>එය මායාවක් විතරයි<br>මේ මහ පොලොවත්<br>මේ මහ අහසත්<br>ඔය විදිහටම තිබුනාවේ<br><br>මේ මහ අහසත්<br>මේ මහ පොළොවත්<br>වෙන් කරන්න බෑ කාටවත්<br>එක් කරන්නත් බෑ කාටවත් |
| 116 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | නොඑන ගමන් ගිය අප්පච්චි<br>අප්පච්චියේ නුඹ ගියාට<br>අපි හැමොටමත් ඉස්සර<br>තාමත් දුක් වෙනවද අපි<br>දන්නවාද නුඹ කොච්චර<br>සරම් පොටත් අතට අරං<br>නුඹ ගෙට එනකොට ඉස්සර<br>මල් පිපුණද තැන් තැන්වල<br>කොච්චර නම් අපේ හිත්වල<br>නුඹේ දෑතින් ඇති දැඩි කළ<br>ගස්වැල් වල මල් කොච්චර<br>බිම හැලි හැලි දුක්වෙනවද<br>නුඹට දැනෙනවද කොච්චර<br>අවි වැසි නොබලා වැඩකළ<br>අප්පච්චියේ ඉක්මන් කර<br>ගෙදරට එන්න තාමත්<br>පමා වුනේ ඇයි මෙච්චර<br>කඳුලැලි බොනවා අපි හැම<br>නුඹ ගියදා පටන් තාමත්<br>තුන් මස පිරිලා වුණාට<br>නුඹ ආවේ නෑ මෙහාට<br>පාර බලා ඉන්නේ අපි<br>හැමදාමත් ගෙළ දික්කර<br>ගෙදර එන්ට පාර තොටත්<br>නුඹට අමතක ද එච්චර |

| | | | | |
|---|---|---|---|---|
| 117 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | අතපය හැඩුවත් පිලිසරණක් නෑ<br>ඔය නිදි ඇස් නැරෙන බව දැනුණත්<br>ලිස්සා යන පයකලද නපුරුකම්<br>විකසිත හඳවත් කොතැනකදෝ<br><br>තුරුණු වියේ ජව බලයෙන් පිරුණත්<br>සම රැලි වැටිලත් දෑස බොඳවුනේ<br>මේ රිය තුල අසුනක් මට දෙන්නට<br>පින්ඇති හදවත් කොතැනකදෝ<br><br>අබලන් හදවත් අකිකරු වුණත්<br>තොල් පෙති වියලි දහඩිය ගැලුවත්<br>මේ රිය තුල අසුනක් මට දෙන්නට<br>පින්ඇති හදවත් කොතැනකදෝ |
| 118 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | මුළු ගතම ගිලන් වී<br>මුළු සිතම ගිලන් වී<br>ගිලන් යහනට වෙලා මම<br>ගිලන් හද පාරවමි...<br>නෙතු පියන් ඔබ සොයායි<br>නැහැ පෙනෙන මානයේ<br>සිත කිරි ගා සැලෙයි<br>දිනෙන් දින ගෙවෙද්දි<br>දිනන්ට දෙයක් පතමි<br>පතන්නට යමක් සොයමි<br>පතන හැම දෙයම ලොව<br>දිනිය නොහැකි බව දනිමි<br>එහෙත්<br>දිනන්ට ඔබව පතමි<br>පතන්නට ඔබව සොයමි<br>පතන පැතුමන් ගොන්නෙ<br>එකම පැතුමක් පමණි |

| | | | | |
|---|---|---|---|---|
| 119 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | කටු ඇණුන දෙපා<br>හිතලට ගැහෙනකොට<br>තටු ගසා ඉගිලෙන්නට වද<br>ඒ තරමටම හිතේ බර<br>ගංගාවේ ඇවිදගෙන<br>සතා ගහකොළ ඇඳින<br>පුතේ ගෙදර වරෙන්<br>ගෙම්මනට පෙම් නොබැද<br>අක්කලා අඩනකොට<br>රෙදි වැරලි බරවැඩිව<br>අනේ අහකට වෙයන්<br>මුණකට ඇද නොකර<br>කුස්සියට එබි එබි<br>නොබලපන් ලිබ්බොක්ක<br>මහළුවී උඹෙ අම්මා<br>බොන්නේ උණු වුණ කදුළු<br>හිතත් සතුටින් තිබ්බා<br>අනේ පැල්පත් පොඩ්ඩ<br>ගිනිලාපු බඩගින්න<br>නුඹට බඩගිනි ඇත්ද? |
| 120 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | සමුගැන්ම<br>අදුර ඝනකමට කැටි ගැසි<br>කොපුල් මත රැඳි<br>වෙලා සියුමැලි සිහින<br>තටු සලා යා නොදී<br><br>ඒත් මට පෙම් කරමි<br>මේ මිහිරි කළුවරට<br>නුඹට නුඹේ නෙත් දෙකට<br>වඩා මේ කලුවරට<br><br>කලාසොලසෙන් සපිරි<br>දිනක සඳ බැස ගියද<br>මම තවත් පෙම් කරමි<br>එත් මේ කළුවරට |

| | | | | |
|---|---|---|---|---|
| 121 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය පූර්ණ<br>විශ්ව විද්‍යාලයක් බවට පත්වීමෙන් පසුව එයට<br>ප්‍රවේශ වූ පලමු ශිෂ්‍ය කණ්ඩායම ලෙස<br>අප ඉතිහාසගතවීමත් සමග විශ්ව විද්‍යාල<br>මෑත<br>ඉතිහාසයේ නුවූ විරූ සාර්ථක ක්‍රියාදාමයන්<br>රැසක නියැලෙන්නට අපට අවකාශ සැලසිනි<br>ඒ ආරම්භයේ සිට අප ශිෂ්‍ය කණ්ඩායමේ<br>සියලූ දෙන එකාවන්ව කටයුතු කිරීමත් විවිධ<br>කුසලතා වලින් හෙබි සහෘදයන් රැසක් අපට<br>එක්වී සිටීමත් නිසා විය යුතුය. ඉන් අත්වූ<br>ප්‍රතිඵල<br>බොහෝය. ඉරටු මල් නිර්මාණ එකතුවද එකි<br>ක්‍රියාදාමයක ඵලයක් බව සඳහන් කල යුතුමය. |
| 122 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | ගතට නිර්මාණ එක්කල සියලූ නිර්මානකරුවන්<br>අගයන්ගේ ඔවුන්ගේ<br>ඉදිරි ගමන සාර්ථක වේවා යන ප්‍රාර්ථනාවෙනි<br>සමගියයි<br>ගෙන සම්පාදනයේදි හා එළිදැක්වීමෙදි<br>නන් අයුරින් සහය දුන් සැමට අපගේ<br>කෘතඥතාව පුදකරමු<br>මේ හෙතු තුල දුර්වලතා කොතෙකුත්<br>තියෙන්නට<br>පුළුවන<br>හේතු සංස්කාරය කළේ විලස තිබිනත්<br>අති මහත් දැනුමක්ය නොවේ<br>එනිසා මේ කොතෙකුත් අඩුපාඩු තිබෙන්නට<br>පුළුවන<br>ගෙනේ අඩුපාඩු පෙන්වා<br>දුනහොත් ඒ අපකෙරේ මැදහත් සකිය යා<br>අපිදකිමු<br>මේපොතේ යම් සාර්ථකත්වයක් වේනම් එහි<br>ගෞරවය<br>නිර්මාණකරුවා ඇතුළු 2001/2002 අධ්‍යන<br>වර්ෂයේ සියළු සිසුනට හිමිවිය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| 123 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | සඳ මැරිලා<br>මළගම ද<br>තරුදිය වී<br>රේණු සැලි<br>බිම වැටිලා තිබුණු....<br><br>එන්න හෙමින්<br>අඩිය තියා<br>මේ අඳුරෙම<br>අත පතගා...<br><br>නිදා ඉන්න<br>මේ ගහකොල<br>ඇහැරෙන්නට කලින්ම නුඹ<br>එන්න ඉතිං<br>කළුරේම<br><br>එළිය ඇවිත් හෙට උදේම<br>අරන් යාවී ජිවිතයම..... |
| 124 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | පරාජිත ප්‍රේමය<br>සියුමැලිය<br>මා පැතු<br>ආදරවන්තිය<br>එන්න<br>මා කරා<br>පැමිනෙන්න<br>ඔය සියුමැලි දෑතන්<br>මාගේ ගෙල සිරකර<br>මාව මරා දමන්න<br>පරාජිත ප්‍රේමයේ<br>ශෝකයෙන්<br>තවත්<br>මා හට<br>ජිවත් වීමට<br>ඉඩ නොතබන්න<br>මරණය<br>සැපයත්<br>එය මා<br>ආදරයෙන්<br>වැළඳගනිමි |

| | | | | |
|---|---|---|---|---|
| 125 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | ආකාසේ නුඹ දිහාම<br>බලා ඉදං සිංදු කියපු<br>හඳමාමේ නුඹත් එක්ක<br>කිරිපැණි ගැණ කතා කරපු<br>ආදරයෙන් වෙනස් වෙලා<br>නෑ නුඹලා හැර දමලා<br>නිල් අහසත් මගේ හදත්<br>පෑයු සඳ මගේ තනියට<br>අහස වගේ නුඹට මගේ<br>ආදරයෙන් කතා කරමි<br>හුරතලයෙන් නැලවි නැලවි<br>එදාහිටපු පුංචි දොණී<br>තවමත් මම හඳ මාමේ<br>මගේ ආදර නිල් අහසේ |
| 126 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | වේදනා කඳුළු වැල්<br>හඳ පෙලන සෝසුසුම්<br>සතුට සිනහව<br>ජිවිතයේ වින්දනය<br>මගේ ලොවට උරුම වු<br>ඒ සියලු වේදනා<br>නිම කොට<br>හෙට දිනේ<br>වැළඳ ගනු මැනවි මා<br>ආදරයෙන් දයාවෙන්<br>දයාබර මරණය<br>ඔබ මගේ<br>බලාපොරොත්තුවයි |
| 127 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | මොකද මාමේ හිනා....<br>ගුරුවරු ජෝකි නුඹයි<br>ව්‍යාපෘති කල් යයි<br>අපි වයසට යයි<br>ඉරටු මල් දොරට වඩී |

| | | | | |
|---|---|---|---|---|
| 128 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | සංහිඳ පාමුල<br>සංහිඳ පාමුල<br>නිවුණු පාන ළඟ<br>කිමැයි හඬන්නේ<br>හඬන්නේ අප්පච්චි<br>නාඬා කියපන් උලලේනි<br><br>බට හිර අහසේ<br>ඉරබටු තරුව නිවී<br>සංහිඳ පාමුල<br>කළුවර දිගාවුනි<br>ගමටම හඬගා කියපන් උලලේනි<br><br>පොරිමල් විසිරි<br>සිල්ලර කාසි වැටි<br>සංහිඳ පාමුල<br>නොනිඳා නිඳන හැටි<br>ගමටම හඬගා කියපන් උලලේනි |
| 129 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | ලස්සන හිරු කිරණ දැවටුන මුහුදු ජලේ<br>ක්ෂිතිජය පෙනේවි ඇතින් නිසල ජලේ<br>සියළු දෙනාගේ සිත් එය දැක වශී කලේ<br>ලස්සන උනත් ක්ෂිතිජය මිරිගුවක් බොලේ |
| 130 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | ඉරටු මල් පිපුණේ හේවුඩ් ශාලාවේ<br>බිත්ති පුවරුවකය ඒ බොහො දෙනෙකුගේ<br>උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙසය දෘෂ්‍ය කලාවේ<br>සියළුම<br>වසරවල සහෘදයින්ගේ නියොජනය ඒ තුළ<br>විය කවියද<br>කවියද ගීතයයි කවිකමට ආදි වු<br>නිර්මාණයන්ට හැකියාවක් දැක්වු අයටත්<br>නිර්මාණ එක්කය දෘෂ්‍ය කලාපීටය ප්‍රජාව වෙත<br>ඉදිරිපත් කිරිමට දැනට දෙවන වසර ලෙස<br>කටයුතු කරන අප අධ්‍යාපන වර්ෂය<br>බලාපොරොත්තුවයි.<br>අප පලමු වසරේදි බිත්ති පුවත්පත ලෙෂ<br>ආරම්භ කල මේ කාර්යය පොතක් ලෙෂ<br>එලිදක්වා දෘෂය කලාපීඨ ප්‍රජාවෙන් ඔබ්බට<br>අපේ සහෘධයින්ගේ කුෂලතාවය ඉදිරිපත්<br>අපට අවැසි විය. එහිදි අප වෙත නිර්මාණ<br>යොමුකළ |

| | | | | |
|---|---|---|---|---|
| 131 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | ඔත්පළ පියා කී කව<br>ගල්වැඩ පලේ මහ පොල් අතු බැන්දාය<br>පොල් අතුපෙලේ සෙවණේ ගල් බින්දාය<br>ගල්පිරි වලේ අපමණ දුක් වින්දාය<br>පත්තිනි කුලේ ඇය නුඹගේ අම්මාය<br><br>පොල් ලෙලි වලේ අමු ලෙලි හම ගැහුවාය<br>පොල් අතු පැලේ හිඳ කොහු මිටි බැන්දාය<br>මහජන පොලේ ඉරිදට කොහු වික්කාය<br>ඒ හැම කලේ පුත නුඹගේ අම්මාය<br><br>අංගිරි ඇළේ ඉවුරේ පන් සෙව්වාය<br>තුන්ඉරි කුලේ පන් මිටි මිටි බැන්දාය<br>ලන්තැරුමේ එලියේ පන් වියිවාය<br>රන්කිරි පුතේ ඒ රන් කඳ අම්මාය<br><br>මහනෙල් විලේ අපටත් මල් පිපුණේය<br>මහ දහවලේ මල් එක දෙක කැඩුණේය<br>නෙළු මහනෙල් සුවඳින් හිත පිරුණේය<br>මහ පන්සලේ හවසට මල් විකිණේය<br><br>බුදු බණ පොතේ බණ පද මට මතුලාය<br>වෙස්සන්තරේ එන කවි පද කොදුළේය<br>මහබෝ පැළේ තුන් වරුවක් වැන්දාය<br>බලපන් පුතේ ඒ නුඹගේ අම්මාය |

| | | | | |
|---|---|---|---|---|
| 132 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | වාසනාවන්ත වෙමි<br>අගය කරන්න<br>අවට ඇති පුංචිම පුංචි දේ පවා<br>කරදර ?<br>නෑ කරදර ගනන් ගන්න එපා<br>ගණන් කරන්න මේ වගේ පුංචි පුංචි ආශිර්වාද<br>ස...තු.....ට සොයා ගෙන පිම්මේ දුවන විට<br>හමුවුණොත් පාර අයිනේකැලෑ මලක්<br>අමතක කරන්න තරම් එහිසුන්දරත්වය<br>කාර්‍යය බහුල වෙන්නඑපා<br>මොකද<br>ජිවිතේ සැනසිම බොහෝවිට රැඳිලා තියෙන්නේ<br>අප නොසිතන<br>එවැනි පුංචි දේවල් මතකයි<br>ඒවා<br>අගය කරන්න පුරුදුවෙන්න<br>හිතනවාට වඩා<br>වාසනාවන්න වේවි |

| | | | | |
|---|---|---|---|---|
| 133 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | වංකගරයක යාදන වළප<br>ඉරි තැලුණු රැළි නළල<br>යට ගිලුණු නෙතු යුගල<br>නිති සැලසෙන පටු දෙතොල<br>කිම නගන මැසිවිල්ල<br><br>නේක දුම් රොටු<br>අතර<br>ගොර සපුන් විළිස්සන<br>වංකගිරියක හඬන<br>මදි දේවිය නුඹ ය<br>හද නහර කිඳා බැස<br>ඇට මිදුලු සොයා ගිය<br>සේනේහය නුඹේමය<br>පුතුසිතින් මැකිගිය<br><br>මුල් දරා දුක් විඳින<br>විසල් නුග රැකක් විණ<br>මල් වඩා සුව විඳින<br>වරම් ඇකයෙන් වැටුණ<br><br>දරුපෙමට කිරි එරුණ<br>මුදු පියයුරන් දෙදෙන<br>උණුහුමට තුරුළු වුණ<br>පුතු කොතැන නුඹ කොතැන?<br>ළය හිස කකියවන<br>ඇග සහලවයි උණ<br>ගිණි පිඹින නලල මත<br>අත තියන්නේ කවුද<br>ගැබ්බරව කළු අහස |
| 134 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | මහ මෙරවන් දුක උහුලාගෙන මම<br>සුසම් හෙළන කොට මගේ අම්මේ<br>දැවි දැවි ළය මඬල පුරාගෙන<br>දුක ඉහිරෙනු දුටුවද අම්මේ<br><br>ලේ කිරි කර දුන් අම්මගෙ සෙනෙහස<br>දැත හඬන කොට මගේ අම්මේ<br>හෙට දවසෙත් මගෙ ළගට වෙලා<br>දුක් ගීයක් ගයාපන් අම්මේ<br><br>මව්පිය සෙනෙහස හඬාවැටෙනකොට<br>නුඹ විතරයි මගේ ළග උන්නේ<br>වැළපෙන හිතකට සෙනෙහස දුන් ඔබ<br>සංසාරේ බුදු වනු අම්මේ |
| 135 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | සුදු පරවියන් ළග නැදැයින් මැරෙනු<br>හෙම්බත් බැවින් වියලුණු දැසින් බලනු<br>අනියතේ බිමේ පෙර මහ සෑ ගොඩ නැගුනු<br>නිදියන් පුතේ තව වකුටුව දුටු ගැමුණු |

| | | | | |
|---|---|---|---|---|
| 136 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | බොරපාට ගංදැල<br>තොන්තුවාවෙන් බැස යන්නේ<br>මසිත දැනහැඳිනදෝ මන්දා<br>ලදළු තුරුපත් සැලි<br>හමාඑන මද නලේ<br>එනු මැනවි මා හදට<br>ගොම්මනේ උණුහුම රැගෙන<br>පෙම් කවක් ලියන්නට<br>පත් ඉරුව ගනු කෙලෙස<br>පත්ඉරුව පුරාවට ගලායන<br>බොර පැහැ කඳුළු බිඳු දැක<br>පාළු සීතල රැයේ<br>කණ කොක් හඬ මැදින්<br>හෙට පහන් වන දිනය<br>සුහම සුභ දිනයක් නොවෙද ?<br>ගෙත්තමින් හැඩවැටුණු<br>රන්පාට රන්හුයෙන්<br>දෑගිලි බැඳුන් නුඹ<br>වස්සාන දොරකඩ නේද? |
| 137 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | සත් දිනක රතුපස් උඩ<br>ඇහැළ පෙති මැලවී නිදන<br><br>පරමල් සුවඳ විතරමද<br>සිතේ සාංකාව<br>යන්තම් හෝ නොදමන<br><br>සීතලයි මේ එලිපත්තේ<br>අම්මේ මට<br>ගෙට ගොඩවෙන සුළග<br>නිමා දැම්මා පහන<br>පත්තුකර තිබු<br>නුඹේ රූපයට<br><br>කළුවර හිමින් ගස්යට<br>නුඹ නිතර ගැවසුන<br>දෙණියේ පලාකොටු ළග<br>හිස තබා හිම්හිට<br>හිඳියි දිගු රැයකට<br><br>කිරා වැටෙන ගොක් රැන් මත<br>නුඹ විකුණපු වට්ටියක<br>රටා දැක්කා<br>අදුරේම අම්මේ මම |

| | | | | |
|---|---|---|---|---|
| 138 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | අතිතය අනතිතය<br>අතීතය වන වනා<br>මහ උජාරුවට<br>මවන ඒ වත්මන් සිහින මහා වංශය<br>වමාරා වමාරා<br>එකම පම් පොරය<br>අතීතය අනාගතය<br>කරන්නට<br>තොප දරන පුහු වීර්යය<br>අතීතය අනාගතය කළදාක<br>කෝ තොපට අනාගතය<br>අත්හැර දැමා<br>සිඳ බිඳ දමා<br>දිනත්වය<br>සිතාපන් අදයි<br>පැරකුම් යුගය. |
| 139 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | සුවඳ<br>නුහුරුයි මට<br>මේ විදිහ<br>සැගවුණිද නුඹ<br>මල්පෙති අතර<br>මට දැනෙනව<br>නුඹ ඉන්නව<br>නුඹේ සිනහව<br>කතා කරන නුඹේ ඇස්දෙක<br>හැර නොයයි මා<br>නුඹට පෙම් බැඳි<br>නිසාවෙන්ම<br>මතකයි මට<br>ඒ පැරණි සුවඳ<br>තවම. |
| 140 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | නිදිකුම්බා මල<br>රිදි ඉරිවැටෙත්ම<br>පිය නගයි බස්නැවතුමට<br>තැලී පොඩි වුණු දිළිදුකම<br>දෙනෙත් පියවෙත්ම<br>සිඹී හංස සුසුමින් මහ පොළව<br>නිදිකුම්බා මල්වඩම<br>සුවඳ දෙයි හරතල් කමට. |

| | | | | |
|---|---|---|---|---|
| 141 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | වළාතුළින් එබී බලා<br>නුඹද අව්ව වැසිදෙවන්නෙ<br>මහ පොළොවක් තරමට රළු<br>දුක් කන්දක් මගේ සිතේ<br>ඒ හිත ගෙන ඔට්ටු දුවන<br>මට හිමි මගේ ජිවිතයේ<br>දිනුම් කනුව පහු කරගෙන<br>ආරණ්‍යයේ සිල් සුවඳට,<br>ළංවී කහවත දමන්න<br>හැකිවේ නම් නුඹේ මහිමෙන්<br>ඔවදුදෙව සිතවෙනුවට,<br>ලැබෙවි මට මං දන්නවා<br>බවුන් වඩන සිත් පොඩ්ඩක්....., |
| 142 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | "අසම්මත ජිවිතයම"<br>සඳ මැරිලා<br>මළගම ද<br>තරුැදියවී<br>රේණු සැලි<br>බිම වැටිලා තිබුණා<br><br>එන්න හෙමින්<br>අඩිය තියා<br>මේ අඳුරෙම<br>අත පත ගා<br><br>නිදා ඉන්න<br>මේ ගහ කොළ<br>ඇහැරෙන්නට කලින්ම නුඹ<br>එන්න ඉතිං<br>කළුවරේම<br>එළිය. |
| 143 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | නුඹදන්නවාද?<br>අවදියෙන් සිටින හැම මොහොතකම<br>නුඹේ මතකය සිතට තනි රකියි<br>රැය පුරා සිහිනයක දැවටෙමින්<br>නිදියහන අද්දරම නුඹ හිඳියි<br>දන්නවද නුඹ?...<br>නුඹ... දිනෙක පිටමංව<br>ගියොතින් මගේ ලොවින්<br>ජිවිතය නවතිවි<br>මොහොතකින්..... |

| | | | | |
|---|---|---|---|---|
| 144 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | සීත රළු මහ වැස්ස<br>සිදුරු දියවේ පොල් අතු අස්සේ<br>පෙගුණු පොත් පෙරළෙයි ඇමටිය වැස්සේ<br>රැළි මැකුණු සුදුගවුම වේළේ දුම්මැස්සේ<br>මුමුණන වදන් නොරැදේ බේබදු හඬ අස්සේ. |
| 145 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | ලොවට වහංවී සඳමත හැංගි<br>ඔබ පුදනා උණුසුම් සෙනෙහේ<br>ලැබෙන තුරා මගේ ලයට දැනේ ඔබ<br>අන්සන්තක නොව මගේ ලෙසේ<br>ඈත අනන්තයේ ඈතම කෙලවර<br>දිලුණත් ඔබ මට සේනේ දිදී<br>සිතන්නේ කෙලෙසද අන්සන්තක බව<br>බලාන ඔය නෙතු පියන් දිහා<br>ගුවන් ගැබේ නැගි රුවන් තාරකා<br>දිලුනේ ඇයි ඔබේ සෙනෙහේ සොයා<br>සිත රැයේ එන උණුසුම අරගෙන<br>වඩිනු මැනවී සිත් යහන කරා<br>ළයට තුරුළු වූ උණුසුම් සිහිනයේ<br>සත්තකින් මගෙම තමා. |
| 146 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | සොයා ඇවිද්දෙමි<br>උදැසන ගෙවෙන තෙක්<br>දහවලද ගෙවෙන තෙක්<br>ඉනික්බිති<br>තරුද නැති<br>සඳුද නැති<br>වළා පමණක්ම ඇති<br>රාත්‍රියද උදාවී ඇත<br><br>එහෙත් නැත කිසිතැනක<br>සැගවුණේ කොහිද<br>එකමත් එක කාලයක<br>මසිත සුවපත් කළ<br>දිව ඔසුව “නුඹ”. |

| | | | | |
|---|---|---|---|---|
| 147 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | සුබ දවසක් පෙන්වූ<br>එසඳ පායා ඇත<br>පිරිවරා ගත් තරුද සහිතව<br>කිසිදු තනියක් නොමැත<br>තරු සදුට පෙම් බැදන්<br>රහසෙම<br>ඔබ දන්නවද ඒම වග<br><br>එසඳ සේඳ නොව<br>තරුද සේද නොව<br>ඔබත් නැත<br>මමත් නැත<br>අපට හිමි අපේ සිත් මල. |
| 148 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | ප්‍රේමය බරට<br>මීදුම සේ බිම පතිත<br>නලලත සිඹින<br>නුඹ කොයිබද<br>ප්‍රිය සොදුර<br><br>කළුවර කැටි ගැසි<br>ඇස් යට නිදි කිරන<br>ගොරහැඩි හීන විතරක්<br>මට තනි රකින<br>මිහිරද සොදුර<br>මේ කළුවර තනි නුඹට<br><br>මල් පෙති මල හට<br>දිය වී යන දිනක<br>සුවඳට සුළග විට<br>කව්රුද තනිකමට<br>ගිලිහි යන බව දැනම<br>දෑතින් නුඹේ දෑත<br>උණුසුම තබාගෙන කුමටද?<br>හිත ගාව. |

| | | | | |
|---|---|---|---|---|
| 149 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | වළා තුළින් එබී බලා<br>නුඹද අව්ව වැසි දෙවන්නෙ<br>මහ පොළොවක් තරමට රළු<br>දුක් කන්දක් මගේ සිතේ<br>ඒ හිත ගෙන ඔට්ටු දුවන<br>මට හිමි මගේ ජීවිතයේ<br>දිණුම් කණුව පහුකරගෙන<br>ආරණ්‍යයේ සිල් සුවඳට<br>ළංවී කහවත දමන්න<br>හැකි වේ නම් නුඹේ මහිමෙන්<br>ඔට්ටු දිම හිත වෙනුවට<br>ලැබෙවී මට මං දන්නවා<br>බවුන් වඩන සිත් පොඩ්ඩක්. |
| 150 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | අම්මේ මට<br>ගෙට ගොඩවෙන සුළඟ<br>නිමා දැම්මා පහන<br>පත්තුකර තිබූ<br>නුඹේ රූපයට<br><br>සත් දිනක රතුපස් උඩ<br>ඇහැළ පෙති මැලවී නිදන<br><br>පරමල් සුවඳ විතරමද<br>සිතේ සාංකාව<br>යන්තම් හෝ මකා දමන<br><br>කළුවර හිමින් ගස්යට<br>නුඹ නිතර ගැවසුන<br>දෙණියේ පලාකොටු ළග<br>හිස තබා හිම්හිට<br>හිදියි දිගු රැයකට. |
| 151 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | සරා සඳ<br>එකලු කර<br>අහස් ගැබ<br>කොහිද බැස ගිය<br>සරා සඳ<br><br>මොහදුරු දුර ලු මහැදුරු<br>නුඹ මිස කවුරු<br><br>මොහදුර දුරු කෙරූ<br>මහැදුරු කවුරු<br>නුඹ මිස. |

| | | | | |
|---|---|---|---|---|
| 152 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | මේ පුරහඳ<br>අත ගා එන<br>සුළං පොදක්<br>සිපගති මම<br><br>අඳුර මකා<br>එළිය එන්න<br>මියුරු සිහින<br>පලදවන්න<br><br>රාත්‍රියම<br>දැන් නුඹගෙයි. |
| 153 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | කොහොමද සරාසඳ සකි<br>නුඹ ලිහිණියෙකි.....<br>වසන්තයේ නිල් අහසට<br>හිත පෙම්ණි<br>සරන්නට හැදුව නුඹ ගැන<br>හිත දුකෙනි<br>ලියන්නට පමා වුවාදැයි<br>දැනුනි<br>නොලියා ඉන්න දැන් මට බෑ<br>සකි සදුනි<br><br>බොහො කැකුළු පිදුනු<br>තුරු වියන් මත<br>නොපිපුණු මලකි නුඹ<br>නෙළුවෙ පුදන්නට<br>සුවඳ නොදැන මල් කැකුලක<br>හැඬරුවට<br>නුඹට වඩා රුවටුනේ අපි<br>හිනාවට<br><br>සිහින පිපෙන මල්ගොමුවක<br>අතුපතර<br>බොහොම දුකින් අතු ඉති<br>ගෙන නුඹ නිතර. |

| | | | | |
|---|---|---|---|---|
| 154 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | ලැබෙන  තුරා මගේ මගේ ළයට දැනේ ඔබ<br>වුන්සන්තක නොව මගේ ලෙසේ<br>ඈත අනන්තයේ ඈතම කෙලවර<br>දිලූනත් ඔබ මට සෙනේ දිදී<br>සිතන්නේ කෙලෙසද අන්සන්තක බව<br>බලාන ඔය නෙතු පියන් දිහා<br>ගුවන් ගැබේ නැගි රුවන් තාරකා<br>දිලූනේ ඇයි ඔබේ සෙනෙහෙ සොයා<br>සීත රැයේ එන උණුහුම අරගෙන<br>වඩිනු මැනවි සිත් සහන කරා<br>ලයට තුරුළුවු උණුසුම් සිහිනයේ<br>මතකින්ම ඔබ මගෙම තමා. |
| 155 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | සිරි සිරි ඇවිදින්<br>මගේ ගෙපැලේ දොරකඩින්<br>නාඩපන් නුඹ කොබෙයියෝ<br>තාම තනිනෑ මට ඉතිං<br><br>දොරේ තලමින් පිල් කයින්<br>ගලා යන වැහි වතුරකින්<br>සිහිකලත් නුඹ යටි හිතින්<br>නාඩපන් නුඹ කොබෙයියෝ<br>තාමතනි නෑ මට ඉතිං<br><br>වසන්තේ ඉරඑළියකින්<br>ඉගිලෙනා නුඹ කුඩුවෙන්<br>සුරත් විලිකුන් අනුහසින්<br>බොහොම සතුටින් ඉගිලියන්<br><br>දෝරේ ගලනා වැසි සමෙත්<br>යාවි පෙර ලෙස මා කෙරෙන්<br>දැන් ඉතිං ගිම්හානයයි<br>ඒත් තනිනෑ මට ඉතිං. |

| | | | | |
|---|---|---|---|---|
| 156 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | මේ ගෙවන්නේ<br>වසන්තයමයි<br>ඒකා ගහකොළ<br>නිර්වත්‍ර වි<br>අංග භාගයට නිදා වැතිරී<br>ඉන්න සඳ දෙස<br>හොරෙන් බලමින්<br>මේ ගෙවෙන්නේ<br>වසන්තයමයි<br><br>මලානික අය<br>බලෙන් අරගෙන<br>තාරකාවන් බලා ඉන්නේ<br>ජිවිතේ අම්හිරිතම ඇත්තක්<br>තබා අහසින්<br>සඳේ අහසින්<br>සඳේ නුඹ<br>නිවි යන තෙක්. |
| 157 | | රාජගිරිය කාන්තා නේවාසිකා ගාරය | Hostel | කුඩැල්ලෙක් ගිය දුර<br>අනේ අපොයි<br>බෑ බෑ කියා යන්නෙම ඇය මාතරට<br>පොල් හේනේ ඉන්නා අපේ<br>කොල්ලන්ට<br>වහවැටිලාද දන්නෙ නෑ මාතරට<br>ආවේ නැත්තේ ඇයි අද හොස්ටල් එකට . |
| 158 | 1 | රාජගිරිය කාන්තා නේවාසිකා ගාරය | Hostel | ඔහොම තමයි කාගෙත් හැටි කියන කොට<br>කට දෙඩුවාට යන්නෙම හිත මාතරට<br>එක්කන් ගිය අපෙ අර කොල්ලාට<br>වද දෙනවාද කොල්ලකු සොයන<br>ලෙසට |
| 159 | 1 | රාජගිරිය කාන්තා නේවාසිකා ගාරය | Hostel | උඹ දැනගත්තාද දකුණේ කොල්ලන්ගේ<br>අගේ<br>අරගෙන වරෙන් මාතර කොල්ලකුගේ<br>සෙනේ<br>වටිනව නංගි වටිනව ඒ අමා<br>සෙනේ<br>අහිතක් නැනේ අපිදකුණේ<br>යාළුවොනේ. |

| | | | | |
|---|---|---|---|---|
| 160 | | රාජගිරිය කාන්තා නේවාසිකා ගාරය | Hostel | වැඩවර්ජන කළත් ගෙදරට නොයන්නෙමි<br>හොස්ටල් එකේ ඉඳගෙන නිදි වරන්නේමි<br>නෑනට කවන්නට රසබත් උයනන්නෙමි<br>මගේ අයියා බලන්නට හිස්අතින් යමි. |
| 161 | | රාජගිරිය කාන්තා නේවාසිකා ගාරය | Hostel | හවසට එනව කියලයි උදයෙම යන්නේ<br>අයියගෙ ගෙදර නවතින්නයි හිත දෙන්නේ<br>දම්මිල කඩල තියලද දන්නෑ කන්නේ<br>අයියේ මම ගිහින් වෙන දවසක එන්නේ. |
| 162 | | රාජගිරිය කාන්තා නේවාසිකා ගාරය | Hostel | රාජගිරියේ බහිනු සිතා බස් එකට<br>බඹරෙක් බඹරි සමගින් නැග ලංගමට<br>ලං ලං වනවිටදි බස්එක බොරැල්ලට<br>පස්සෙ දොරින් බැස බජිරියා ඉදිරියට.<br><br>කුඩයක් ඉහලගෙන දුවගොස් අනික් දොරින්<br>බජිරියා නගිනු දැක නැත බඹරියා සරින්<br>ඌ බය වෙලා සිදුවූ ඒ හුටස් පරින්<br>හනිකට බැහැලා සෙව්වා ඒ සගයා බැවින්.<br><br>මළ කෙලියකි මට වන්නේ<br>මගේ දුක කව්දො දන්නේ<br>සිදුවූ දෙය දැන ගන්නේ<br>ෆුඩ් බෝඩයේ එල්ලෙන්නේ. |
| 163 | | රාජගිරිය කාන්තා නේවාසිකා ගාරය | Hostel | පමුණු ගියාදෝ කොටුවෙ ගියාදෝ<br>උදයෙම නැගිට බත් හා සම්බෝල උයා<br>බඩගින්නට පාන් කාලක් බඩට දමා<br>දැන් බෑ නාන්නට නාමු එහෙන් කියා<br>බඹරි බජරි එක්කන් සොකඩ් පමුණු ගියා.<br><br>දැන් දැන් නානවා ඇති තිදෙනා උඩ පනිමින්<br>කුණු ඇලවල් වලින් එන පණුවන්<br>අතුල්ලමින්<br>නෑවා ඇති අනේ යමු කොටුවට<br>විගසින්<br>පෙරදින රැයේ දුටු සිහිනය සිහි කරමින්.<br><br>බැලුවා කැරකි කැරකී සොකඩ් හති දමමින්<br>බෝගහ ලග නැද්ද කුමරා වෙලි පෙමින්<br>බඹරි බජරි එක්ව ඇගෙ හිත හදමින්<br>එක්කන් වරෙන් ඇගේ සොකඩ්<br>පරිස්සමින්. |

| | | | | |
|---|---|---|---|---|
| 164 | 1 | රාජගිරිය කාන්තා නේවාසිකා ගාරය | Hostel | බපිරිට උදව්වට මග තනි නොතනියට<br>යන ලෙසටයි යන්නේ අයියගෙ බෝඩිමට<br>අයියගේ කතාවට පෙම්ඹර හිනාවට<br>බඹරි වහ වැටිඇති හැටි හැබැවට.<br><br>උදයෙම උයා නාලා බපිරියා ගියා<br>නාගන්නට කියා බමරි එහේ ගියා<br>තව දවසක් යන්නට හැදුවොත් එහේ එයා<br>බමරිට හයි කරම් මැටි තටු දෙකක් තියා. |
| 165 | 1 | රාජගිරිය කාන්තා නේවාසිකා ගාරය | Hostel | උදේ පාන්දර මහ වැසි ඇද හැලෙන්නා<br>සොදපු ඇදුම් නැහැ තවමත් වේලිලා<br>කවදා මේ වැසි නවතිදෝ කියලා<br>අපේ වස්සා තවමත් හඩන්නා. |
| 166 | | රාජගිරිය කාන්තා නේවාසිකා ගාරය | Hostel | බත් ගෙඩියක් උස්සාගෙන<br>ලගට එනකං බුම්මාගෙන<br>අපි කාපුව මොනවත් නෑ<br>උඹ එනතුරු හංගාගෙන |
| 167 | | රාජගිරිය කාන්තා නේවාසිකා ගාරය | Hostel | අකුරු කරන්නට ඇවිදින් කොළඹට<br>බුම්මැට්ටියි බපිරියි මේ හනිකට<br>නගර සභාවේ වැඩ ටික අරගෙන<br>දවසේ පඩියට වැඩ ගජරාමෙට |

| | | | | |
|---|---|---|---|---|
| 168 | 1 | රාජගිරිය<br>කාන්තා<br>නේවාසිකා ගාරය | Hostel | පෝදා දින රෑය<br>ලෙඩුන් බලන්නට යැයි හනිහනිකට මම ආවා<br>කවුරුත් නැත කාමරයේ දැන් ඇත මම<br>තනිවීලා<br>කරනට දෙයක් නොමැති හෙයින් දැන් මම<br>ඉවසා<br>තනියම හිඳිමි තොපි එනතුරු මග<br>බලලා<br><br>වෙනදා මෙන් කලබලයක් නැත අදනම්<br>කාමරයේ<br>සොදපු රෙදි ඔක්කොම ඇතුලේ මේ<br>කාමරයේ<br>බොලා ඇවිත් විසි කලොත් ඒ ටිකනම්<br>හදපානේ<br>මමත් යනවා වේල ගන්න රෙදි ටික ගෙන රෑ<br>යාමේ<br><br>අපට කන්න ඉඳිආප්පයි අද මම අරගෙන<br>ආවේ<br>කන්නට කෙනෙක් නැත අද ඒවා<br>ආවේ<br>දුකම දුකයි මට නම් මේ රෑ<br>යාමේ<br>ටිකක් දීලා ටිකක් කෑවා මේ<br>වේලේ |
| 169 | | රාජගිරිය<br>කාන්තා<br>නේවාසිකා ගාරය | Hostel | කුකුළා අතින් ගෙන පාන්දර නැගිටලා<br>තිදෙනෙක් හැදුවා ගම යන්නට සැරසීලා<br>පාන්දරම තුනේ සිට සැරසීලා<br>ගියාය බඩ පණුවන් රවටාලා |
| 170 | | රාජගිරිය<br>කාන්තා<br>නේවාසිකා ගාරය | Hostel | බැරි බර<br>ඇදගෙන<br>දෙපයට වාරු<br>අරන් අපි<br>බර කරත්තේ<br>අදිනා<br>කැම්පස් සිපද කියමින්<br>අව්වේ වේලිමට ටෙරා<br>කොටා යන්නා. |

| | | | | |
|---|---|---|---|---|
| 171 | | රාජගිරිය කාන්තා නේවාසිකා ගාරය | Hostel | අගුවේ පිලේ සැමදා එකටයි ලැග්ගේ<br>පිදුවේ නහරවැල් උඹලට<br>අගුවේ පිලේ ලැග ලැග මා ලගම සිටි<br>අගුවේ පිලේ මා හා ලැග්ගා<br>පුතුනේ කොහේ කොතැනද නුඹලගේ සද්ද<br>සිතුනේ කොහොම අතහැර යන්නද<br>පුතුනේ කොහොම වාවම් මේ දුක් කන්ද. |
| 172 | | රාජගිරිය කාන්තා නේවාසිකා ගාරය | Hostel | අනේ මගේ දරුවන් කොයි ගියාදෝ<br>කඩපිලේ අගුවේ තනි උනාදෝ |
| 173 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | කිරි මුට්ටිය ගඟේ ගියා<br><br>සීතලයි මේ එළිපත්තේ<br>අම්මේ මට<br>ගෙට ගොඩ වෙන සුළඟ<br>නිවා දැම්මා පහන<br>පත්තු කර තිබූ<br>නුඹේ රූපයට<br><br>සත් දිනක් රතු පස් උඩ<br>ඇහැළ පෙති මැළවී නිදන<br><br>පරමල් සුවඳ විතර ම ද<br>සිතේ සාංකාව<br>යන්තම් හෝ මකා දමන<br><br>කළුවර හෙමින් ගස් යට<br>නුඹ නිතර ගැවසුණ<br>දෙණියේ පලා කොටු ළඟ<br>හිස තබා හෙම්හිට<br>නිඳයි දිගු රැයකට<br><br>කිරා වැටෙන ගොක් රැන් මත<br>නුඹ වියා විකුණු වට්ටියක<br>රටා දැක්කා<br>අඳුරේම අම්මේ මම |

| | | | | |
|---|---|---|---|---|
| 174 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | අසම්මතයි ජීවිතය ම<br>සඳ මැරිලා<br>මලගම දා<br>තරු දිය වී<br>රේණු සැලි<br>බිම වැටිලා තිබුණා<br><br>එන්න හෙමින්<br>අඩිය තියා<br>මේඅඳුරෙ ම<br>අත පත ගා<br><br>නිදා ඉන්න<br>මේ ගහ කොල<br>ඇහැරෙන්නට කලින් ම නුඹ<br>එන්න ඉතින්<br>කළුවරේ ම<br><br>එලිය ඇවිත් හෙට උදේ ම<br>අරන් යාවි ජීවිතය ම |
| 175 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | හැර යාම<br>දිමුතු දසන් පිදෙන මුදු සිනාවා<br>ඈත ඉදන් නුඹ වෙහෙසී ගෙනාවා<br>දෑත දෙපා අවුරා මුදු කතාවා<br>තාම හිතේ පැටලි හැර නොයාවා<br><br>මුලු සතින් එපිටට ඉගිලුනේයා<br>කැකුළු දතට කිරි කොයිබින එරේයා<br>ඉපල් ඉරටු මල් මට තව නොදේයා<br>තටු පැටලි මා කඳුළින් පෙඟේයා<br><br>ලිපේ ගින්න තුන් වේලෙ ම නිවේයා<br>හිතේ ගින්න දලු මෝරා වැඩේයා<br>පාළු සංකාවෙන් ගේ පිරේයා<br>කවුළු පියන් හැර නුඹ කොයි ගියේයා |

| | | | | |
|---|---|---|---|---|
| 176 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | සමුගැන්ම<br>අඳුර ගනකමට කැටිගැසී<br>කොපුල් මත රැඳි<br>වෙළා සියුමැලි සිහින<br>තටු සලා යා නොදි<br><br>ඊත් මම පෙම්<br>මේ මිහිරි කළුවරට<br>නුඹට නුඹේ නෙත් දෙකට<br>වඩා මේකළුවරට<br><br>කලා සොළොසින් සපිරි<br>දිනෙක සඳ බැස ගිය ද<br>මම තවත් පෙම් කරමි<br>ඊත් මේ කළුවරට |
| 177 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | අවසර බුදු හාමුදුරුවනේ<br>ඉසිපතනේ මිගදායේ<br>මෙත් මුදිතා කරුණා සයුරේ<br>සම්දු වඩින්ට සිසිල ලබන්නට<br>මට අවසර ඇත්නම්<br><br>විසිරුණු හදවත සුදු නෙළුමක් වි<br>බුදු සම්දුගෙ පාමුල වැටෙමින්<br>බුදු බණ පදයක් අහන්න ඇත්නම්<br>රජ කිරුළට මට මෙලොවේ<br><br>දෙදහස් පන්සිය වසරක් ගෙවුණා<br>තව මත් අපි මේ සංසාරේ<br>ආයෙත් නොයෙන්න මොක් සුව ලබන්න<br>අවසර බුදු හාමුදුරුවනේ |

| | | | | |
|---|---|---|---|---|
| 178 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | විකසිත හදවත්<br>අත පය හැඬුවත් පිළිසරනක් නෑ<br>ඔය නිදි ඇස් නෑරෙන බව  දැනුණත්<br>ලිස්සා යන පය කළ ද නපුරුකම්<br>විකසිත හදවත් කොතැනද දෝ<br><br>තුරුනු වියේ ජව බලයෙන් පිරුණ<br>සම රැලි වැටිලා දෑස බොඳ වුණත්<br>මේ රිය තුළ අසුනක් මට දේන්නට<br>පින් ඇති හදවත් කොතැනකදෝ<br><br>අබලන් හදවත් අකීකරු වුණත්<br>තොල් පෙති වියළී ඩාදිය ගැලුවත්<br>මේ රිය තුල අසුනක් මට දෙන්නට<br>පින් ඇති හදවත් කොතැනකදෝ |
| 179 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | ඉඩෝරය<br>නුඹ සොයා ආවෙ මා<br>පිපාසය නිසා ම යි<br>එදා පුරුද්දට දැනුණ<br>අපෙ දෙපා පොඩි තෙමු<br>නුඹේ ජීවය කොහෙ ද?<br>හැර ගියෙ ද නුඹ ඈ<br>ඇගෙ දරුවන් සමග<br><br>සිසිල දුන් කුඹුක් ගස<br>කොළ හැළි වියළිලා<br>වෙල් පිටියෙ කටු පඳුරු<br>බෝ තැතින් නැගිටගෙන<br>වැහි බිඳක පහස නොම ලැබූ<br>රුදුරු අහස් කුස<br>සිපගන්න හදන හැටි |

| | | | | |
|---|---|---|---|---|
| 180 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | නුඹ<br>නිල් අහස් කුස පුරා<br>හිනැහෙමින් සරන නුඹ<br>කලෙක හඳහාමි විය<br>කිරි පැණිත් ගෙනත් දෙන<br><br>තුරුණු කල<br>සරා සඳක් වී<br>පෙමට අත වැනුව ද<br>ඇත්ත ම යි නුඹ<br>පින්සාර සඳක් මැයි<br>මල් සුවඳ ගෙන<br>ඉඟි පාන සිහින් මඳනලෙන්<br>පළින් පළ<br>සුදු වූ කෙහෙරැලි<br>තාලයට නැටුව ද<br>නුඹ දැකුමෙන්<br>උපන් ශීලය<br>නොබිඳුණේ මැයි |
| 181 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | සරදම<br><br>සුනු සහලේ කැඳ උයලා<br>අප්පච්චි පොවා<br>අම්මා තනිව හිල්ලුවා<br>ගෙයි මුල්ලට වෙලා<br>එහා වත්තේ වැටකොළු වැල්<br>හොරෙන් එබී බලා<br>පුරන් කුඹුර ළඟට වෙලා<br>ඔච්චමකුත් කළා<br><br>හිත් ඇඳිරිය නෙතු පුරවා<br>ඔත්පළට ම වෙල<br>අප්පච්චිගෙ ඇඳ පාමුල<br>හොරෙන් මුකුළු කළා<br>දුප්පත්කම ගෙට නැවිත්<br>බිත්තක්කනට වෙලා<br>එක දවසක් දෙකක් පුරා<br>අපට විහිළු කළා<br><br>උදේ රෑයින් අවදි වෙලා<br>නිඳ ගැට කඩ කඩා<br>අපේ අම්මා දොළට නොයා<br>උදේ හවා පුරා<br>ගෙයි ගින්දර පිටට නොදී<br>ලිබ්බොක්කට වෙලා<br>මුව දෝනවා මං දැක්කා<br>අපට මුවාවෙලා |

| | | | | |
|---|---|---|---|---|
| 182 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | අරුණෝදය<br><br>බක් මි ගහ යට මල් හැලිලා<br>බඹරු එන්ට කලියෙන්<br>හිමිදිරියෙ ම මල් නෙළුවෝ කවුරු ද<br>හිරු පුදින සැණෙකින්<br><br>දැඟකම් මැද බක් මී මල් නෙළුව ද<br>ගහ යට ඔප දමමින්<br>හිස ගවසන්නට මල් නෙළුව ද ඇ<br>නුඹෙ හිත ගන්න අටින්<br><br>බට්ටිත්තෝ නිවහන හැදුව ද රැ<br>බට්ටිත්තිට සුපෙමින්<br>අහක බලාගෙන ඇ හිනහෙනවා<br>නුඹෙ දැඟකමට හොරෙන් |
| 183 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | එපා පුතේ<br>කටු ඇනුණ දෙපා<br>හීතලට ගැහෙනකොට<br>තටු ගසා ඉගිලේන්නට බෑ<br>ඒ තරමටම හිතේ බර<br><br>ගංගොඩේ ඇවිද ගෙන<br>සතා ගහකොළ ඇඳින<br>පුතේ ගෙදරට වරෙන්<br>ගොම්මනට පෙම් නොබැඳ<br><br>අක්කලා අඬන කො<br>රෙදි වැරලි බර ඩැඩිව<br>අනේ - අහකට වෙයන්<br>මූණ කට ඇද නොකර<br><br>කුස්සියට එබි එබී<br>නොබලපන් ලිබ්බොක්ක<br>වහන් වී උඹේ මවු<br>බොන්නෙ - උණු වුණ කඳුළ<br><br>හිතේ සතුටින් තිබ්බ<br>අපේ පැල්පත් පොඩ්ඩ<br>ගිනිලාපු බඩගින්න<br>නුඹට බඩගිනි ඇත්ද? |

| | | | | |
|---|---|---|---|---|
| 184 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | **සෙනෙහස**<br><br>සුදු ගවුමේ සුදු අරලිය පිපුණා<br>පිනිදිය ඇහැරණ හිරුට කලින්<br>වතුසුදු පඳුර ම මුව මත පිපුණා<br>විසිරුණු පොඩි කැඩපතට හොරෙන්<br><br>දණ බිම ඔබලා වරම් ගන්නවා<br>උදේට අම්මගෙ හිත පතුලෙන්<br>ඉඳිකඩුල්ල ළඟ අම්මගෙ ඇස් දෙක<br>උදේ ගිහින් හවසට එනකම්<br>ළය ගිනි මෙළවා කඳුළින් පොඟවා<br>මව් සෙනෙහේ පිසවා සැණකින්<br>කුසගිනි නිමවා නැළවූ සැතපූ<br>අම්මේ ඔබ මතු නිවන් දකින් |
| 185 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | **දෙවන මවුන් ඔබ**<br><br>මහ මෙරක් වන් දුක උහුලා ගෙන මා<br>සුසුම් හෙළන කොට මගෙ අම්මේ<br>දැවි දැවි ළය මඬල පුරාගෙන<br>දුක ඉහිරෙනු දුටුව ද අම්මේ<br><br>ලේ කිරි කර දුන් අම්මාගෙ සෙනෙහස<br>ඈත හඬන කොට මගෙ අම්මේ<br>හෙට දවසෙත් මගෙ ළඟට වෙලා නුඹ<br>දුක් ගීයක්වත් ගයපන්නේ<br><br>මව්පිය සෙනෙහස හඬා වැටෙන කොට<br>නුඹ විතරයි මගෙ ළඟ උන්නේ<br>වැලපෙන හිතකට සෙනෙහස දුන් ඔබ<br>සංසාරේ බුදු වෙනු අම්මේ |

| | | | | |
|---|---|---|---|---|
| 186 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | දුක් සුසම්<br>කඳුළු කැට වියලිලා<br>මහ පොළොව ඉරිතලා<br>තල් වැටේ මායිමේ<br>දුක් සුසුම් තනිවෙලා<br><br>මහ පොළොව වියළිලා<br>ගොහොරු මඩ කැළතලා<br>මහලු ඇගෙ දෙ අත් පතෙ<br>දිය බිඳක් තැවරිලා<br><br>සෝ සුසුම් කෑ ගසයි<br>මිණිබිරිය තනි වෙලා<br>කිරි නොමැති තන පුඩුවෙ<br>සෙනෙහෙ දිය කැටි වෙල |
| 187 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | ඇයට ලියූ කව<br><br>සළුපිළි ඇඳි මුදු සෙළු ගත<br>අබරණ පැලඳ කනකර රජත<br>රහ මෙර සේය ඉඟ සුඟ ලලිත<br>දුටු මන බැඳුන් ගිරි ළඳුන් වෙත<br><br>දිව සළු රැගෙන පාවඩ සේ අතුරන්නම්<br>සල් මල් සලා පෙති ගෙන හිස දවටන්නම්<br>පුන්සඳ රැයේ සඳකැන් දිය නාවන්නම්<br>එනු සිහ ලියේ හද යහනේ සතපන්නම්<br><br>කසුප් රජුන් නැත කිසි තැන දුටිමි ලියේ<br>මී මැසි දනෝ නුඹ ගැන කවි ලියති ප්‍රියේ<br>මිහිඳුම් සළුව නුඹ අතුරාපන්කෝ ළයේ<br>මා හද අරන් හද මඩලට වඩිනු ප්‍රියේ |

| | | | | |
|---|---|---|---|---|
| 188 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | මලව් හි සර<br><br>අනඟ දෙනුවන්<br>නඳුන් උයනේ<br>දෑසමන් මල<br>දෙසට නැමුණේ<br><br>සිනිඳු පෙති වත<br>සුවැති පවනේ<br>උනඟ පිණි පොද<br>ළමැදෙ වැටුණේ<br><br>සේද තන පට<br>පත් විදා හැර<br>මලව් හී සර<br>මලෙහි රැඳුණේ |
| 189 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | අතීත කුසුම<br>නිහඬ බවේ දෝංකාරය<br>දෙසවන වසා<br>පැතිරෙද්දි<br><br>තනිකමේ අඳුරු<br>සෙවණැලි<br>ආත්මය ගොදුරු කර<br>ජීවිතයම මිහිදන් වුණි<br><br>හිස් බවේ පොළොව මත<br>බුර බුරා නැඟුණු<br>අතිතයේ කඳුළු<br>පොහොර වි ඒ මත ම<br>වැටි සරු සාර වි<br>හිස් බවේ මිහිතලය<br><br>සරු සාර ඒ බිමේ<br>මල් කුසුම් දිලිසුනේ<br>නෙළා ගනු හැකි වේද<br>අතීත කටු පතර<br>ඒ කුසුම.... |

| | | | | |
|---|---|---|---|---|
| 190 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | තනිකම තනියට<br><br>හඬමින්<br>අඳෝනා කියමින්<br>පැමිණ<br>කාලය<br><br>මගේ<br>තනියට<br>තනි නොතනියට<br>මගේම<br>සිහින<br>හැර<br><br>අන් කිසිවත්<br>නොමැතිව<br>තනි ව ම<br>මම<br><br>ඔබ මා දමාගොස්<br>බොහෝ......... දුර |
| 191 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | අහිමි සිත<br>ඔබ දවසක් පෙන්වූ<br>ඒ සඳ පායා ඇත<br>පිරිවරා ගත් තරු ද සමඟින්<br>කිසිදු තනියක් නොමැත<br>තරු සඳුට පෙම් බැඳන්<br>රහසේ ම<br>ඔබ දන්නව ද ඒ වග<br><br>සඳ සේ ද නොව<br>තරු ද සේ නොව<br>ඔබත් නැත<br>මමත් නැත<br>අපට හිමි අපේ සිත්වල |

| | | | | |
|---|---|---|---|---|
| 192 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | නුඹ කොතැනද අද<br>සොයා ඇවිද්දමි<br>උදෑසන ගෙවන තෙක්<br>දහවල ද ගෙවන තෙක්<br>ඉනික්බිති<br><br>තරු ද නැති<br>සඳු ද නැති<br>වලා පමණක් ද ඇති<br>රාත්‍රිය ද උදා වී ඇත<br><br>එහෙත් නැත කිසි තැනක<br>සැඟවුණේ කොහිද<br>එකමත් පක කාලයක<br>මසිත සුවපත් කල<br>දිව ඔසුව නුඹ |
| 193 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | අප අතැර ගිය සබඳ<br>නුඹ<br>බොහෝ දුර ගොස් ය<br>අවසරයි යන්නට නුඹට<br>හිස් ලූ ලූ අත<br>එවිට<br>හැකි වේවි නුඹට<br>අවැසි අවැසි දේ කරන්නට<br>හමු වූ දා පටන්<br>නුඹට කළ ගුණ කම්<br>නුඹ සිතින් මැකී ගිය සැටි<br>ඉක්මනින්<br>පුදුමය<br>මනු ලොවේ ගති<br>කමක් නෑ නුඹට හොඳනම්<br>තව දෙයක්<br>සාපයක් වී නම්<br>අප නුඹට<br>මරා දැමූ අප ළබැඳි සිත්<br>කිසි ම කිසි දිනක<br>නො ඉපදේවි නුඹ වෙනුවෙන්<br>සහතිකයි |

| | | | | |
|---|---|---|---|---|
| 194 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | අහිමි වුවොත් මට හිමි තැන<br><br>වලා තුළින් එබී බලා<br>නුඹ ද අව්ව වැසි දෙවන්නෙ<br>මහ පොළොවක් තරමට රළු<br>දුක් කන්දක් මගේ සිතේ<br>ඒ සිත ගෙන ඔට්ටු දුවන<br>මට හිමි මගෙ ජිවිතයේ<br>දිනුම් කනුව පහු කරගෙන<br>ආරණ්‍යයේ සිල් සුවඳට<br>ළං වී කහ වත දමන්නට<br>හැකි වේ නම් නුඹෙ මහිමෙන්<br>ඔට්ටු දුවපු සිත වෙනුවට<br>ලැබේවි මට මං දන්නව<br>බවුන් වඩන සිත් පොඩ්ඩක් |
| 195 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | පරාජිත ප්‍රේමය<br>සියුමැලිය<br>මා පැතූ<br>ආදරවන්තිය<br>එන්න<br>මා කරා<br>පැමිණෙන්න<br>ඔය සියුමැලි දෑතින්<br>මගේ ගෙල සිරකර<br>මා මරා දමන්න<br>පරාජිත ප්‍රේමයේ<br>ශෝකයෙන්<br>තවත්<br>මාහට<br>පිවත් විමට<br>ඉඩ නොතබන්න<br>මරණය<br>සැපයක්<br>එය මම<br>ආදරයේන්<br>වැලඳ ගනිමි |
| 196 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | නිදිකුම්බා මල<br><br>රිදී ඉරී වැටෙත් ම<br>පිය නඟයි බස් නැවතුමට<br>තැලි පොඩි වුණු දිළිඳුකම<br>දෙනෙත් පියවෙත් ම<br>සිඹි හංස සුසුමින් මහපොළොව<br>නිදිකුම්බා මල් වඩම<br>සුවඳ දෙයි හුරතල්කමට |

| | | | | |
|---|---|---|---|---|
| 197 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | හෙට දින<br>බොර පාට ගං දැළ<br>තෝන්තුවාවෙන් බැස යන්නෙ<br>මසිත දැන හැදිනදෝ මන්දා<br>ළදලු තුරුපත් සැලි<br>හමා එන මඳ නලේ<br>එනු මැනවි මා හදට<br>ගොම්මනේ උණුහුම රැගෙන<br><br>පෙම් කවක් ලියන්නට<br>පන්හිරුව ගනු කෙලෙස<br>පන්හිරුව පුරාවට ගලා යන<br>බොර පැහැ කඳුළු බිඳු දැක<br><br>පාළු සිතල රැයේ<br>කණ කොක් හඬ මැදින්<br>හෙට පහන් වන දිනය<br>සුබ ම සුබ දිනක් වෙද?<br>ගෙත්තමින් හැඩ වැටුණු<br>රන් පාට රන් හුයේන්<br>දැඟිලි බැඳන් නුඹ<br>වස්සාන දොරකඩ ද ..........? |
| 198 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | පැතුම<br>මුළු ගතම ගිලන් වී<br>මුළු සිතම ගිලන් වී<br>ගිලන් යහනට වෙලා මම<br>ගිලන් හඳ පාරවමි<br>නෙතු පියන් ඔබ සොයයි<br>නැහැ පෙනෙන මානයේ<br>සිත කිරි ගා සැලෙයි<br>දිනෙන් දින ගෙවෙද්දි<br>දිනන්නට දෙයක් පතමි<br>පතන්නට යමක් සොයමි<br>පතන හැම දෙයම ලොව<br>දිනිය නොහැකි බව දනිමි<br><br>එහෙත්<br><br>දිනන්නට ඔබ පතමි<br>පතන්නට ඔබ සොයමි<br>පතන පැතුමන් ගොන්නේ<br>එකම පැතුමක් පමණි |

| | | | | |
|---|---|---|---|---|
| 199 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | මියැදුණු වසන්තය<br>සරසවිය පාළුවී<br>තුරු සෙවණ වෙළෙද්දි<br>මුළු ලොවම නිසල වී<br>රැහැයි හඬ නඟද්දි<br>දැඟිලි වෙළා ගිය<br>මතක මං පෙත් අතර<br>බක් මහේ කොවුල් හඬ<br>ගයන තනුවක් අසමි<br>උනුහුමට තුරුලු වී<br>පෙම් තනුවක් අසමි<br>උනුහුමට තුරුළු වී<br>පෙම්තනුව කියාදුන්<br>සකාවුලාණ ඉගිල ගොස්<br>ඈත දුර ඈතටම<br>රතුපාට මල් පිපුණ<br>මල් යාය සලිතවී<br>සොයන මුත් පෙරමඟම<br>නොඑයි සරසවි බිමට<br>බක්මහේ වසන්තය යළිත් |
| 200 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | නිකලෙස් සිත් මල<br>සිනිඳු මුදු පිය පතුල්<br>මැවු දහසක් සිඟිති සිතුවම්<br>දෙනයනේ අහිංසක හසරැල්<br>ගෙතු දහසක් පබැදුම්<br>ගණනකටවත් නොගත් නුඹ<br>හදිසියේ වියරුවී කළ විපතකම තරම<br>එහෙත් ......<br>සුන්දර ය නුඹ නිශ්චල ය<br>එලෙසින්ම අදටත්<br>නිකලෙස් ළදරු සිත් මල්<br>වෛරය නොදත් දෙනුවන්<br>දහසක්......<br>මොහොතකින් මිහිදන් කළ නුඹම<br>යළිදු සිපගන්නා අපුරුව |
| 201 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | සුදු පරෙවියන් ළග නෑදැයන් මැරෙනු<br>හෙම්බත් බැවින් වියළුණු දෑසින් බලනු<br>අනියත බිමේ පෙර මහ සෑ ගොඩ නැගුණු<br>නිදියන් පුතේ තව වකුටුව දුටුගැමුණු |

| | | | | |
|---|---|---|---|---|
| 202 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | ආරාධනා<br>සිනාසී දෙනෙතින් වැරෙන් ගෙන බදා ගනු මා නෙත්<br>වියළි නෙත් සපුරා බබළවනු දී කඳුළු සම්පත්<br>නැගී නිති උතුරා ගලන්නට තෙමා බිම හදවත්<br>සොයා දෙනු පා සිඳි ගිය ප්‍රේමයේ උල්පත්<br><br>සෝසුසුම් රැසකින් වෙළනු මා පැතුම් මල් දැලකින්<br>කඩා දා පියාපත් මා පය බඳිනු යදමින්<br>උනුන් පෙරලා සිය ගණන් දිව යන මගක පසෙකින්<br>වරු ගණන් නොසැලී හිඳින්නට ඔබ දකියෙන් රිසියෙන්<br><br>බල පවුරු ගොඩනගා මාතුළ රැඳි රැජිනක මෙන්<br>නසා පලවා නිජබිමේ සත්‍යයේ පුරවැසියන්<br>උතුම් අදිටන් මකා සකසා නව සරල පැතුමන්<br>ජිවිතය පුරවන්න අලුතින් ඔය බොළඳ වදනින් |
| 203 | 1 | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | කැකෑරෙන ලේවලින් පිච්චෙන<br>මේ නහරවැල් මගෙ නොවෙයි<br>පපු කුහරයේ පිළිස්සී<br>ගුලි ගැහෙන පෙණහළු මගේ නොවෙයි<br><br>ඔබේ හිස යළි අතගාන්නම්<br>පිවිතුරුයි මම පිරිසිදුයි<br>පෙර ලෙසම ආයෙත් ශ්‍රේෂ්ඨයි |

<table>
<tr><td>204</td><td></td><td>බිත්ති පුවත්පත</td><td>Wall paper/Poster/ other publications</td><td>සොඳුරුද ඔබ මට කෙතරම්<br>ඔබ ඔබේ දෙතොලින්<br>මගේ ළමැදේ තැබූ හාදුව<br>අතැගිලි තුඩින් මම<br>හිමින් පිරිමැද බැලුවා<br>අනේ තව එක ම එක<br>වතාවක්<br>ඒ සුවය විදින්නට<br>තිබුණ නම්<br>ඔබට මෙන් මටද<br>අමතක නැති<br>එකම එකම දවසක<br>මම ඔබේ පපුවට<br>තුරුළු වී උන්නා<br>අනේ තව එකම එක<br>වතාවක්<br>ඒ සුවය විදින්නට තිබුණ නම්</td></tr>
<tr><td>205</td><td></td><td>බිත්ති පුවත්පත</td><td>Wall paper/Poster/ other publications</td><td>සිහිනය<br>ගෙවී ගිය වස්සාන රාත්‍රියක<br>දුටිමි එක් සිහිනයක්<br>නුඹේ ඇස් ළගදි වටහා ගතිමි<br>ජිවිතේ එක් දෙයක්<br>නුඹේ ඇස්වලට ලං වී දුටිමි<br>මගේ රුව දස දහස් වාරයක්<br><br>සත්ත මයි හිනැහිලා ඉන්නේ මං<br>නුඹේ ළෙන්ගතුකමින්<br>මට කියන් ඇයි ද මේ තරමට ම<br>මගේ ගැන ඔය හිතේ සෙනෙහසක්</td></tr>
<tr><td>206</td><td>1</td><td>බිත්ති පුවත්පත</td><td>Wall paper/Poster/ other publications</td><td>බලාපොරොත්තුව<br>වේදනා කඳුළු වැල්<br>හද පෙළෙන සෝ සුසුම්<br>සතුට සිනහව<br>ජිවිතයේ වින්දනය<br>මගේ ලොවට උරුම වු<br>සම්පත් ය මහගු වු<br>ඒ සියලු වේදනා<br>නිම කොට<br>හෙට දිනේ<br>වැළඳ ගනු මැනවි මා<br>ආදරෙන් දයාවෙන්<br>දයාබර මරණය<br>ඔබ මගේ<br>බලාපොරොත්තුවයි</td></tr>
</table>

| | | | | |
|---|---|---|---|---|
| 207 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | සඳ<br>අකාසේ නුඹ දිහා ම<br>බලා ඉඳන් සිංදු කියපු<br>හඳ මාමේ නුඹත් එක්ක<br>කිරි පැණි ගැන කතා කරපු<br>ආදරයෙන් වෙනස් වෙලා<br>නෑ නුඹලා හැර දමලා<br>නිල් අහසත් මගෙ හදත්<br>පැයූ සඳ මගේ තනියට<br>අහස වගේ නුඹට මගේ<br>ආදරයෙන් කතාකරමි<br>හුරතලයෙන් නැළවි නැළවි<br>එදා හිටපු පුංචි දොණි<br>තව මත් මම හඳ මාමේ<br>මගේ ආදර නිල් අහසේ |
| 208 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | අතිතය සහ අනතිතය<br>අතිතය වන වනා<br>මහ උජාරුවට<br>මවන ඒ වත්මන් සිහින මහාවංසය<br>වමාරා වමාරා<br>එකම පම්පොරියක<br>අතීතය අනාගතය<br>කරන්නට<br>තොප දරන පුහු වීර්යය<br>අතීතය අනාගතය කළ දාක<br>කෝ තොපට අනාගතය<br>අත් හැර දමා<br>සිඳ බිඳ දමා<br>දිනත්වය.....<br>සිතාපන්.........අදයි<br>පැරකුම් යුගය. |

| | | | | |
|---|---|---|---|---|
| 209 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | වසන්තය<br>හඳ කන්ද පාමුලක<br>හෙමිහිට<br>හුදකලා ඉමක<br>තනි ව ම<br>දහසක් මල් පල දෙන්න<br>එනමුදු<br>නුඹ සුළඟ සමඟ මිතුරුව<br>නුඹේ ම<br>අතු රිකිලි කඩා දමා ගෙන<br>පුදුම පාළුවක්<br>සුළං හැපෙන විට<br>නිසල පිනි බිම පතිත වෙයි<br>වසන්තය කාලය<br>එනමුදු<br>මල් පල බෝ දුරකය. |
| 210 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | ඉරිතැළුණු රැලි නළල<br>යට ගිළුණු නෙතු යුගල<br>නිති සැලෙන පටු දෙතොල<br>කිම නගන මැසිවිල්ල<br><br>නෙක දුම් රොටු අතර<br>ගොර සපුන් විලිස්සන<br>වංකගිරියක හඩන<br>මිදි දේවිය නුඹ ය<br><br>හද නතර කිදා බැස<br>ඇට මිදුළු සොයා ගිය<br>සෙනෙහෙය නුඹේ මය<br>පුතු සිතින් මැකි ගිය<br><br>මුල් දරා දුක් විඳින<br>විසල් නුග රැකක් විණ<br>මල් වඩා සුව විඳින<br>වරම් ඇකයෙන් වැටුණ<br><br>දරු පෙමට කිරි එරුණ<br>මුදු පියයුරන් දෙදෙන<br>උණුහුමට තුරුළු වුණ<br>පුතු කොතැන ? නුඹ කොතැන?<br><br>නුඹට බුදු බව නියත<br>කපුටු බෝ සෙවන යට<br>එකම අම්මා නුඹද?<br>ගෙදර බුදු බව නොලද |

| | | | | |
|---|---|---|---|---|
| 211 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | මිනිමල් සුවඳ<br>පස් වසක් ගෙවෙන දින<br>දල්වමි බකටි පහනක්<br>පස් පිඩලි යට සැගවී<br>නුඹ නිදන සොහොන මත<br><br>එ දවස<br>ඉහිරිලා තිබුණි හැම තැනම<br>නුඹේ ඩාදිය පුසුඹ<br>ඒත් අද<br>මිනී මල් සුවඳ<br>හැම තැනම<br><br>මා කුඩා කල<br>නුඹ<br>බොරලු කැට ගසා<br>නිදිකුම්බා පදුරුවලට<br>උන් නිඳා ගත් විට<br>මට පෙන්වා<br>හඩන මා අස්වැසූ තාත්තේ<br>නිදිකුම්බා පදුරු අතරින්<br>පා තියා හෙම්හිට<br>ඇවිත් නුඹේ සොහොනට<br>වැලපුණෙමි ගෙවුණු පස්වසම<br>ඒත් එක දිනක් වත්<br>මා අස්වසන්නට<br>නුඹ නාවේ මන්ද? |

| | | | | |
|---|---|---|---|---|
| 212 | | බිත්ති පුවත්පත | Wall paper/Poster/ other publications | රේමන් පලුවා කොමල බල්ලා ටුංකා කලතා මල්ගාමා<br>බාමන් පැදුරා කැකුලි කුඹලා ඩොංකා පෙත්තා වල්බාවා<br>කාමන් පුලුටා කිකිලි කදිරා දණ්ඩා ඇන්ටා තල්ලු බූවා<br>සමගින් තව අය රැග් වී සිටි හැටි පවසන්නට දැන් කල්ආවා<br><br>මෙහේ වර කැසිල්ලා<br>වර වර ළගට බිල්ලා<br>හොඳට දුම් පිඹලා<br>කෙසෙල් කැන් ටික ඉදවපල්ලා<br><br>දිමියා ඇගිල්ලා<br>දෙන්න සෙට් වෙයල්ලා<br>පොල් ගෙඩි ගනිල්ලා<br>කලතා කලතා හිඳවපල්ලා<br><br>හිතා ගන්න බෑ රැග් එක කාලෙට<br>කැම්පස්වල හරි වැඩ කෙරෙති<br>දෙකේ අයියලා අමුතු බැලුන් ගෙන<br>එකේ අයට පුම්බන්න දෙති<br><br>බාමන්ගේ සිනා වැලයි<br>රේමන්ගේ කතා පෙලයි<br>වල්බාවගෙ යොග වැඩයි<br>රැගේ තියෙන අගේ වැඩි කරයි<br><br>රැග් ආනභාවේන පොඩ්ඩක් පහත් වී |

සරසවි කුරුටු ගී කවිය පිළිබඳ
සාම්ප්‍රදායික නිර්වචන අභියෝගයට
ලක් කරයි. එහෙත් සුවිශේෂී සාහිත්‍යමය
ලක්ෂණවලින් ද සමන්විත සරසවි කුරුටු ගී
සරසවි ජීවිතය හා ඒ හා බැඳී
සමාජ ආර්ථික හා දේශපාලනික සන්දර්භයන්
අවබෝධකර ගැනීම සඳහා නව මානයක්
විවර කරයි. සරසවි ජීවිතය පිළිබඳ ජනප්‍රිය
අධිපති මතවාදයන්ගෙන්
ඔබ්බට ගොස් එහි යථාර්ථයේ යම් යම්
ස්වරූපයන් හඳුනා ගැනීමට
කුරුටු ගී ඉවහල් වේ. මෙම කෘතිය
මෙරට විශ්වවිද්‍යාල කිහිපයක්
ආශ්‍රිතව ලියැවී ඇති කුරුටු ගී
සාහිත්‍යමය හා සමාජවිද්‍යාත්මක කියවීමකට
ලක් කිරීමට ගත් උත්සාහයකි.

නන්දන අජිත්
ප්‍රභාත් ජයසිංහ
ඩබ්ලිව්.ඒ. අබේසිංහ


cepa
centre for poverty analysis

29, R. G. Senanayake Mawatha,
Colombo 7, Sri Lanka.

T +94 (011) 4690200, 2676955
F +94 (011) 2676959
E info@cepa.lk
W www.cepa.lk

9 789551 040949
ISBN: 978-955-1040-94-9

ThinkTank Initiative
Initiative Thinktank